

# පටිච්ච සමුප්පාද ධර්මය

## පුස්තකාල මුද්‍රණය

කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

# පටිච්ච සමුප්පාද ධර්මය

පුස්තකාල මුද්‍රණය

(1-4 වෙළුම්)

කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

ප්‍රකාශනය

කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය

2016

## ධර්ම දානයකි
මුදලට විකිණීම සපුරා තහනම් වෙයි.

ප්‍රථම මුද්‍රණය - 2016 මැයි

## සියලුම හිමිකම් ඇවිරිණි
මුදලට විකිණීම සඳහා හෝ ලාභ ලැබීම පිණිස වන සියලු ආකාරයේ උපුටා ගැනීම්, නැවත පළ කිරීම් සපුරා තහනම්ය. මෙම දහම් පොත ධර්ම දානයක් ලෙස නැවත පළ කිරීමට කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය වෙත විමසීම් යොමු කරන්න. ධර්ම ග්‍රන්ථ සහ දේශනා සඳහා පිවිසෙන්න

www.seeingthroughthenet.net

ISBN 978-955-3962-01-0

විමසීම්

කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය
කිරිල්ලවලවත්ත, දම්මුල්ල, කරඳන.
දුරකථනය: 0777127454
knssb@seeingthroughthenet.net

මුද්‍රණය

කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ.
දුරකථනය: 0114870333

# ධර්ම දානයකි

මුදලට විකිණීම සපුරා තහනම් වෙයි.

කතු හිමියන්ගේ දහම් පොත් ලබාගත හැකි ස්ථාන:

1. සුනිල් විජේසිංහ මහතා – 39/10, ශාන්ත රීටා පාර, ගල්කිස්ස.
2. හේමමාලා ජයසිංහ මහත්මිය
   29/8, පැඟිරිවත්ත මාවත, මිරිහාන, නුගේගොඩ.
3. චන්දන විජේරත්න මහතා
   23/79A, 1 වන පටුමග, ධර්මපාල පෙදෙස, තලවතුගොඩ.
4. ස්ටැන්ලි සූරියාරච්චි මහතා – 25, කඩ වීදිය, දේවාලේගම.
5. එස්. ඒ. ලයනල් මහතා
   140/19, රුහුණුසිරි උද්‍යානය, හක්මන පාර, මාතර.
6. සිරිමා විජේරත්න මහත්මිය – 15, ඇලපාත, රත්නපුර.
7. ඒ. ජී. සරත් චන්ද්‍රරත්න මහතා
   'සමන්', ඇරැවුල හංදිය, කන්ඩලම පාර, දඹුල්ල.
8. ජේ. ඒ. ඩී. ජයමාන්න මහතා
   ජයමාන්න වත්ත, ලබුයාය, කුරුණෑගල පාර, කුලියාපිටිය.
9. මහාචාර්ය කේ. එම්. විජේරත්න, දන්ත විද්‍යා පීඨය,
   පේරාදෙණිය විශ්ව විද්‍යාලය, පේරාදෙණිය.
10. වෛද්‍ය පී. වීරසිංහ මහතා
    බණ්ඩාර බුලංකුලම, ලංකාරාම පාර, අනුරාධපුර.
11. ආර්. ඒ. චන්ද්‍රි රණසිංහ මහත්මිය
    ස්ටුඩියෝ 'චායා', රෝහල හන්දිය, පොළොන්නරුව.
12. නේරා විජේසුන්දර මහත්මිය
    ඉළුක්පිටිය බෙහෙත් ශාලාව, ඉළුක්පිටිය, ගැටහැත්ත.
13. ඩී. සී. ඒ. නිශ්ශංක මහතා – 91A, වුඩ්වර්ඩ් පාර, ගාල්ල.
14. පියදස සමරකෝන් මහතා
    සුදුවැලි පැලැස්ස, කිරින්ද, තිස්සමහාරාමය.

www.seeingthroughthenet.net
www.facebook.com/seeingthrough

"යො පටිචචසමුපපාදං පසසති-
සො ධමමං පසසති
යො ධමමං පසසති -
සො පටිචච සමුපපාදං පසසති"

"යමෙක් පටිචච සමුපපාදය දකීද-
හේ ධර්මය දකියි.
යමෙක් ධර්මය දකීද
හේ පටිචචසමුපපාදය දකියි."

"කතමො ච භික්ඛවෙ පටිච්චසමුප්පාදො?
ජාති පච්චයා භික්ඛවෙ ජරා මරණං
උප්පාදා වා තථාගතානං
අනුප්පාදා වා තථාගතානං
ඨිතාව සා ධාතු
ධම්මට්ඨිතතා ධම්මනියාමතා ඉදප්පච්චයතා
තං තථාගතො අභිසම්බුජ්ඣති අභිසමෙති
අභිසම්බුජ්ඣිත්වා අභිසමෙත්වා
ආචික්ඛති
දෙසෙති
පඤ්ඤපෙති
පට්ඨපෙති
විවරති
විභජති
උත්තානිකරොති
පස්සථාතිචාහ
* * * * * * *
මහණෙනි, පටිච්චසමුප්පාදය යනු කිම?
උපත නිසාය මහණෙනි, දිරීම සහ මරණය,
තථාගතවරු උපදනේ හෝ වේවා
තථාගතවරු නූපදනේ හෝ වේවා
ඒ ධර්මධාතුව සිටියේමය.
ධර්ම ස්ථිතිතාව, ධර්ම නියාමතාව, ඉදප්පච්චයතාව.
එය තථාගත තෙම අවබෝධ කරගනියි, වටහා ගනියි.
අවබෝධ කරගෙන, වටහාගෙන,
කියාදෙයි
දෙසයි
පණවයි
පිහිටුවයි
විවරණය කරයි
බෙදා දක්වයි
ලිහිල් කොට දක්වයි
'බලවු' යයි කියයි.

# පටිච්ච සමුප්පාද ධර්මය

## පුස්තකාල මුද්‍රණය

පටිච්ච සමුප්පාද ධර්මය අළලා අප විසින් පවත්වන ලද විශේෂ පහන් කණුව ධර්ම දේශනා මාලාව (අංක 183 සිට 202 දක්වා දෙසුම් 20) වෙළුම් 4ක් වශයෙන් නිකුත්වී ඇති අතර සීමිත පිටපත් සංඛ්‍යාවකින් යුත් මෙම පුස්තකාල මුද්‍රණය, ධර්ම ශාස්ත්‍රීය පර්යේෂණ කටයුතුවල යෙදෙන විද්‍යාස්ථානවල මූලාශ්‍ර ග්‍රන්ථයක් වශයෙන් පරිහරණය කිරීමේ පහසුව තකා එළි දක්වෙයි.

පුස්තකාල මුද්‍රණයේ මුද්‍රණ කටයුතු මැනවින් නිම කළ 'කොලිටි ප්‍රින්ටර්ස්' සමාගමේ සී. ජයසෝම මහතා ඇතුළු සැමට අපගේ පුණ්‍යානුමෝදනාව හිමි වේ.

මෙම ධර්ම දානය පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ ත්‍රිවිධ ශාසනයේම චිරස්ථිතිය පිණිස හේතු වේවා!

මෙයට,
සසුන් ලැදි,
**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

සංසෝපසථාන සුව සෙවන
කිරිල්ලවලවත්ත, දම්මුල්ල,
කරඳන,

(2559) 2015 අගෝස්තු

# පටුන


| | | |
|---|---|---|
| හැඳින්වීම | | ix |
| ප්‍රකාශක නිවේදනය | | xi |
| අමා ගඟ | | xiii |
| 01. | **'යදා හවෙ පාතුභවන්ති ධම්මා'**<br>('නිසා - හටගැනීම්' ධර්ම න්‍යායය) | 1-27 |
| 02. | **'කුතො සරා නිවත්තන්ති'**<br>(දියසුළි නැති තැන) | 28-55 |
| 03. | **'එක මූලං ද්විරාවට්ටං'**<br>(පාතාලයෙන් එතර වීම) | 56-81 |
| 04. | **'අන්තොජටා බහිජටා'**<br>(ඇතුළත වෙළුම සහ පිටත වෙළුම) | 82-108 |
| 05. | **'අක්ඛෙය්‍යසඤ්ඤිනො සත්තා'**<br>(භාෂා ව්‍යවහාරයේ සීමාව) | 109-136 |
| 06. | **'ජාති මරණ සංසාරං'**<br>(සසර ගමන අවිද්‍යාවගේම ගමනයි) | 137-164 |
| 07. | **'අනත්තනි අත්තමානිං'**<br>(නාම රූපයේ මුළාව) | 165-190 |
| 08. | **'රූපා සද්දා රසා ගන්ධා'**<br>(සළායතන නිරෝධය නිවනයි) | 191-216 |
| 09. | **'යො උභන්තෙ විදිත්වාන'**<br>(දෙකොනයි මැදයි) | 217-243 |

10. 'ලොභජං දොසජං චෙව' 244-270
(කර්ම නිදානය)

11. 'යෙ ච රූපූපගා සත්තා' 272-299
(නිරෝධ සත්‍යය)

12. 'විරසසං වත පස්සාමි' 302-327
(සැඩ වතුරෙන් එතර වීම)

13. 'යං කිඤ්චි දුක්ඛං සම්භොති' 330-357
(සංස්කාර සන්සිඳීම)

14. 'ඉදං ජාතු වෙදගූ' 360-385
(සළායතන නිරෝධය)

15. 'තෙසං ඵස්සපරෙතානං' 388-414
(ස්පර්ශයේ රහස)

16. 'සුඛං වා යදි වා දුක්ඛං' 418-442
(වේදනානුපස්සනාවෙන් නිවන)

17. 'තණ්හාදුතියො පුරිසො' 446-471
(තණ්හා මැහුම්කාරියගේ ගැටය)

18. 'උපාදාන පච්චයා භවො' 474-499
(අල්ලාගත් තැන භවය)

19. 'යං කිඤ්චි දුක්ඛං සම්භොති' 502-526
(ආහාර හතරේ ගැඹුර)

20. 'යෙ මෙ පුබ්බෙ වියාකංසු' 530-555
(වර්තමානයේම පටිච්චසමුප්පාදය දකින්න)

# හැඳින්වීම

තථාගත සම්මාසම්බුදු රජාණන් වහන්සේ සම්බෝධි ලාභයෙන් අනතුරුව තමන් වහන්සේ ප්‍රත්‍යක්ෂ කරගත් ශාන්ත ප්‍රණීත අතක්කාවචර ධර්මයේ ගම්භීරතාවට සිත යෙදූ විට කෙලෙස් භරිත ලෝකයාට දැකීමට දුෂ්කර වූ ගැඹුරු තැන් දෙකක් දුටු සේක. එකක් 'ඉදප්පච්චයතා' නම් වූ පටිච්චසමුප්පාදයයි. අනෙක සියලු සංස්කාරයන්ගේ සන්සිඳීම, සියලු උපධීන් අත්හැර දැමීම, තණ්හාව ක්ෂය කිරීම, විරාගය, නිරෝධය නම් වූ නිබ්බානයයි.

පටිච්චසමුප්පාද ධර්මයේ ගම්භීරත්වය නිසාම සම්බුද්ධ පරිනිර්වාණයෙන් සියවසක් ගත වීමට පෙර පැන නැගි විවිධ බෞද්ධ නිකායයන් අතර විවිධාකාර අර්ථ විවරණ ඒ පිළිබඳව ඉදිරිපත් කෙරුණි. වචනයක් වශයෙනුත්, දර්ශනයක් වශයෙනුත් භාරතීය දර්ශන සම්ප්‍රදායයන්ට 'අමුත්තකු' වූ පටිච්චසමුප්පාදය හඳුනාගැනීමට දැරූ දාර්ශනික ප්‍රයත්නවල ප්‍රතිඵල වශයෙන් එකිනෙකට විරුද්ධ විග්‍රහ විවරණ අර්ථකථන රැගත් ප්‍රකරණ ග්‍රන්ථ රාශියක් බිහි විය. එක් එක් බෞද්ධ නිකාය තම තමන් ගත් දෘෂ්ටි කෝණයට අනුව පටිච්චසමුප්පාද ධර්මය විග්‍රහ කරන්නට විය. එනිසාම බුද්ධ දේශනාවට අනුකූල වූ නිවැරදි අර්ථකථනය කුමක්ද යන්න නිගමනය කිරීම දුෂ්කර කාර්යයක් වී ඇත.

මේ වාතාවරණය තුළ සූත්‍රාගත බුද්ධ දේශනා ඇසුරින් පටිච්චසමුප්පාද ධර්මය විවරණ කරමින් අප විසින් දැනට පවත්වාගෙන යනු ලබන 'පහන් කණුව පටිච්චසමුප්පාද දේශනා මාලාව' මෙසේ වෙළුම් වශයෙන් මුද්‍රණද්වාරයෙන් නිකුත් කිරීමට තීරණය කළෙමු. මෙයට විසි වසරකට පමණ පෙර මීතිරිගල නිස්සරණ වනයේ යෝගාවචර සඟ පිරිස හමුවේ අප විසින් පවත්වන ලද, 'නිවන' දෙසුම් පෙළ 'නිවනේ නිවීම' නමින් වෙළුම් එකොළොසකින් නිකුත්ව ඇති අතර එහිදීද නිවන ශීර්ෂයෙන් පටිච්චසමුප්පාද ධර්මය තරමක් දුරට

විවරණය වී ඇත. ඒ ග්‍රන්ථමාලාව හා අපගේ අනෙකුත් පොත පත කියවූ ඇතැමෙක් 'පටිච්චසමුප්පාදය' ශීර්ෂ කොට ගෙන වෙනම කෘතියක් සම්පාදනය කරන මෙන් ඇරැයුම් කළහ. මෙම විශේෂ පහන් කණුව දෙසුම් පෙළ ග්‍රන්ථයක් බවට පත් වීමෙන් ඒ ඉල්ලීමද ඉටු වනු ඇතැයි සිතමු. 'නිවන' දෙසුම් පෙළෙහිදී පටිච්චසමුප්පාදය විවරණය කිරීමට අප යෙදූ උපමා රූපක වඩාත් පැහැදිලිව ඉදිරිපත් කිරීමට මෙය අවස්ථාවක් කරගතිමු.

දෙස් විදෙස් වැසි සැදැහැවත් පරිත්‍යාගශීලී විශාල පිරිසකගේ නොමසුරු ආධාරයෙන් 'අමා ගඟ' දිනෙන් දින පුළුල් වෙමින් ගලායයි. එයින් ජනිත පුණ්‍ය ශක්තිය ඔවුන්හට පරම ශාන්ත නිර්වාණාවබෝධය පිණිස උපනිශ්‍රය සම්පතක්ම වේවා!

මෙම දෙසුම් පිටපත් කරදෙන සිරිමා විජේරත්න, කුසුමා විලේගොඩ යන මහත්මීන්ටද, අපගේ පොතපත ශෝභන ලෙස මුද්‍රණය කරදෙන කොලිටි ප්‍රින්ටර්ස් සමාගමේ සී. ජයසෝම මහතා ඇතුළු සැමටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමිවේ.

මෙයට<br>
සසුන් ලැදි,<br>
කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර,
දේවාලේගම.

(2558) 2014 ජුලි

# කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය
# ප්‍රකාශක නිවේදනය

'කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය' පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන් වහන්සේ විසින් සම්පාදිත සියලුම ධර්ම ග්‍රන්ථ හා දේශිත ධර්ම දේශනා පිරිසිදු ධර්ම දානයක් වශයෙන්ම ධර්ම පිපාසිත ලෝකයාහට ප්‍රදානය කිරීමේ උන්වහන්සේගේ අභිමතාර්ථය ඉටු කිරීමට ඇප කැප වී සිටියි. මේ අනුව ධර්ම ග්‍රන්ථ මුද්‍රණය සහ බෙදහැරීම පිළිබඳ කාර්යභාරයත්, ධර්ම දේශනා සංයුක්ත තැටිගත කිරීම සහ www.seeingthroughthenet.net වෙබ් අඩවිය, www.facebook.com/seeingthrough සමාජ ජාල අඩවිය පවත්වා ගෙන යාමත් කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරයේ වගකීම වනු ඇත.

දෙස් විදෙස් වැසි ධර්මකාමී පාඨක ශ්‍රාවක විශාල පිරිසක් වෙනුවෙන් ක්‍රියාත්මක වන මෙම පුළුල් ධර්ම දාන වැඩ පිළිවෙලට දායකවීමට කැමති පින්වතුන් හට පහත සඳහන් බැංකු ගිණුමට තම ආධාර මුදල් යොමුකිරීමට අවස්ථාව ඇත.

මෙම ධර්ම දාන වැඩපිළිවෙලට ආධාර එවීම පිළිබඳ සියලු විමසීම්:


කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය<br>
කිරිල්ලවල වත්ත, දම්මුල්ල, කරඳන.<br>
දුරකථන අංක: 0777127454<br>
ඊමේල් ලිපිනය: knssb@seeingthroughthenet.net


ආධාර මුදල් යොමු කිරීම:

කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය (K.N.S.S.B)<br>
ගිණුම් අංක: 007060000241<br>
සම්පත් බැංකුව, SWIFT: BSAMLKLX<br>
ශාඛා අංකය: 070<br>
ශාඛාව: ආර්. ජී. සේනානායක මාවත, කොළඹ 07.

# පුණ්‍යානුමෝදනාව

''ආරභථ නික්ඛමථ යුඤ්ජථ බුද්ධසාසනෙ,
ධුනාථ මච්චුනො සෙනං නළාගාරංව කුඤ්ජරො

**යො ඉමස්මිං ධම්මවිනයෙ අප්පමත්තො විහෙස්සති
පහාය ජාතිසංසාරං දුක්ඛස්සන්තං කරිස්සතී'' ති.**

සාසන පහන නිවීමට ආසන්න මෙවන් යුගයක
සසර දුක් නිම කිරීමේ තිර අදිටනින් දිරිමත්ව
නිවන් මග යෙදෙන උතුමන්ගේ සසුන් බඹසර අසිරිමත්ය.
මෙම ධර්ම දානය
සසුන් දායාදය උදෙසා වෙර දරන එවන් උතුමන්ගේ
නිවන් ගමනට පිදෙන බැති පියුමක් වේවා!
සසුන් දායාදය ළඟා කරගත් උතුමන්ගෙන්
ගෞතම බුදු සසුන බැබළේවා!

- සසුන් ලැදි දායක යුවළක්

# අමා ගඟ

මහවැලි ගඟ උතුරට හැරවීමෙන් පසු එතෙක් නිසරු මුඩු බිම් ලෙස පැවති පෙදෙස්වල සිදුවූයේ ඉමහත් වෙනසෙකි. පිපාසයට පැන් බිඳක් නොලබා සිටි ගොවීහු පෙදෙස පුරා නිහඬව ගලා යන සිසිල් දිය දහරින් පිනා ගියහ. මැලවුනු ගොයම සරුව නිල්වන්ව කරලින් බර විය. මල් පලින් ගැවසීගත් තුරු-ලිය බලා සැනසෙන පෙදෙස් වැසියෝ තුටු කඳුළු වගුළහ.

දහම් අමා ගඟ ''උතුරට'' හැරවීමේ වැඩ පිළිවෙළක් මෙයට තෙවසරකට පෙර ඇරඹුණි. දහම් පත-පොත තබා ''එදා-වේල'' සඳහාවත් වියපැහැදම් කිරීමට වත්කමක් නැත්තෝ, නිහඬව නොමිලයේ ගලායන අමිල දහම් අමා දිය දහරින් සදහම් පිපාසය සන්සිඳුවාගත්හ. අරිටු මිසදිටු හැර, සැදැහැයෙන් සරුව, ගුණ නුවණින් බරව පිළිවෙත් මඟට නැමීගත්හ. ලොවී - ලොවුතුරු මල් පල නෙළාගනිමින් හද පුරා පිරි බැතියෙන් නන් අයුරින් සොම්නස පළකළහ.

''ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය'' නමින් දියත් කළ මෙම ධර්මදාන වැඩ පිළිවෙළ සඳහා අපගෙන් වැය වුණේ පිරිසිදු ධර්මදාන සංකල්පය පමණි. අමා ගඟ ''උතුරට'' හැරවූවෝ සසුන් ගුණ හඳුනන පරිත්‍යාගශීලී සැදැහැවත්හුමය. ''නිවනේ නිවීම'' පොත් පෙළ එළි දැක්වීමෙන් නොනැවතී ''පහන් කණුව ධර්ම දේශනා'' පොත් පෙළෙහි ''බර පැන'' දැරීමටත්, දෙස් - විදෙස්වල දහම් පිපාසිතයින් උදෙසා අප අතින් ලියැවෙන අනිකුත් පොත - පත ඒ අයුරින්ම එළි දැක්වීමටත් ඔවුහු උත්සුක වූහ. ''දෙන දේ පිරිසිදුවම දීමේ'' අදහසින් අමිල වූ දහම ඊට නිසි ශෝභන මුද්‍රණයකින්ම ධර්මකාමීන් අතට පත් කිරීමට පියවර ගත්හ. මුද්‍රිත පිටපත් සංඛ්‍යාව අවසන් වනු හා සමගම ''නැවත මුද්‍රණ'' පළ කිරීමෙන් දහම් අමා ගඟ වියළී යා නොදීමට දැඩි අදිටනකින් ඇප කැප වූහ.

''පොත් අලෙවිය'' පිළිබඳව මෙකල බහුලව දක්නට ලැබෙන වාණිජ සංකල්පයට පිටුපා, තහංචිවලින් තොරව, තමන් අතට නොමිලයේම පත් කැරෙන ''දහම් පඬුර'' තුළින් ධර්මදාන සංකල්පයෙහි අගය වටහාගත් බොහෝ පාඨක පින්වත්හු තමන් ලද රස අහරක්, නෑ-හිතවතුන් සමග බෙදා-හදා ගන්නාක් මෙන් නොමසුරුව අන් දහම් ලැදියනටද දී ධර්ම දානයට සහභාගි වූහ. ඉනුදු නොනැවතී, ශක්ති පමණින් ''ධර්ම ග්‍රන්ථ මුද්‍රණභාරයට'' උරදීමටද ඉදිරිපත්වූහ, ඇතැමෙක් ලොකු කුඩා දහම් පොත් මුද්‍රණය කරවීමේ හා නැවත-නැවත මුද්‍රණය කරවීමේ බරපැන ඉසිලීමට පවා පසුබට නොවූහ.

සම්බුදු සසුන මේ ලක් පොළොවෙහි පවතින තාක් මේ දහම් අමාගඟ ලෝ සතුන් සිත් සනහමින් නොසිඳී ගලා යේවා යනු අපගේ පැතුමයි.

**''සබ්බදානං ධම්මදානං ජිනාති''**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම
2000 ජුනි 05 (2544 පොසොන්)

මෙයට,
සසුන් ලැදි
**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

# 01 වන දේශනය

# 01 වන දේශනය

## (පහන් කණුව ධර්ම දේශනා අංක 183)

## 'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

යදා හවෙ පාතුභවන්ති ධම්මා- ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස
අථස්ස කඞ්ඛා වපයන්ති සබ්බා- යතො පජානාති සහෙතුධම්මං

යදා හවෙ පාතුභවන්ති ධම්මා - ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස
අථස්ස කඞ්ඛා වපයන්ති සබ්බා -යතො ඛයං පච්චයානං අවෙදී

යදා හවෙ පාතුභවන්ති ධම්මා - ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස
විධූපයං තිට්ඨති මාරසෙනං - සූරියො'ව ඔභාසයමන්තලික්ඛං[1]

- උදාන පාළි, බෝධිවග්ග

සැදැහැවත් පින්වතුනි,

තිලෝගුරු භාග්‍යවත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ උරුවේලා ජනපදයෙහි නෙරංජරා නදී තෙර බොධි වෘක්ෂ මූලයෙහි සම්මා සම්බෝධිය ලබාගෙන එම පර්යංකයේම විමුක්ති සුවය විඳිමින් සත් දිනක් වැඩහුන්නා. ඒ සත්දින අවසානයෙදි ඒ තුන්යම් රැයම පටිච්චසමුප්පාද ධර්මය හොඳින් මෙනෙහි කළ බව උදාන පාළියේ බොධි වග්ගයේ එන මුල් සූත්‍ර තුනේ සඳහන් වෙනවා. තමන් වහන්සේ ඒ පටිච්ච සමුප්පාද ධර්මය ඒ තුන්යම් රැය තුළ තුන් ආකාරයකින් මෙනෙහි කළ බව ප්‍රීතිවාක්‍ය වශයෙන් ප්‍රකාශ කෙරෙන ගාථා තුනයි අපි මාතෘකාව වශයෙන් තැබුවේ.

මේ ගාථා තුන බැලූ බැල්මට ඒකාකර වගේ පෙනුණත් සැලකිල්ලෙන් කන්දුන්න පින්වතුන්ට තේරෙන්න ඇති පළමුවැනි ගාථාවට වඩා දෙවෙනි ගාථාව වෙනස් වන්නේ පද තුනකට පස්සේ තව අලුත් පදයක් එකතු වෙනවා. ඊළඟ තුන්වෙනි ගාථාවේ පද දෙකක් හැර අලුත් පද දෙකක් සඳහන් වෙනවා. මේ ගාථාවල වටිනාකම- ඒකාකාර නමුත් - කොයි තරම්ද කියතොත් ඒ එක් එක් ගාථාවකින් පෙන්නුම් කෙරෙන්නේ

පටිච්චසමුප්පාද ධර්මය බුදුරජාණන් වහන්සේ මෙනෙහි කළ ආකාර තුනක්. ඒ ඒ එක් එක් ආකාරයේ වැදගත්කම නිසාම වෙන්න ඕනෑ උදාන පාළිය කියන ග්‍රන්ථය මේ ආකාර තුන ඉදිරිපත් කරන්නේ එකම නිදාන කථාවක් සහිත කෙටි සූත්‍ර තුනකින්.

එතකොට ඒ පළමුවෙනිම සූත්‍රයේ අගට එන ගාථාවේ අර්ථය අපි ඉස්සර වෙලා කියලා සිටිමු. අපි ඒ ගාථා තුනේ සාමාන්‍ය අර්ථය තේරුම් ගත්තත් යම් අවබෝධයක් ලබන්න පුළුවන් මේ පටිච්ච සමුප්පාද ධර්‍මය පිළිබඳව. ආරම්භක වශයෙන් අපි සාමාන්‍ය අර්ථය කියනවා.

**යදා හවෙ පාතුභවන්ති ධම්මා**
**ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස**

යම් අවස්ථාවක කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව ධ්‍යාන වඩන්නා වූ බ්‍රාහ්මණයාට ධර්මයෝ පහළ වෙත් ද 'යදා හවෙ පාතුභවන්ති ධම්මා - ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස' මෙතන බ්‍රාහ්මණ කියලා කියන්නේ මේ ශාසනික ව්‍යවහාරය අනුව රහතන්වහන්සේටයි. රහතන්වහන්සේට බුදුරජාණන් වහන්සේට ඇතැම් තැන්වල බ්‍රාහ්මණ වචනය යොදනවා. මෙතනත් ඒ අර්ථයෙන් ගන්න තියෙන්නේ. ඊළඟට කියවෙන පද දෙකෙන් කියවෙන්නේ

**අථස්ස කඞ්ඛා වපයන්ති සබ්බා**
**යතො පජානාති සහෙතුධම්මං**

ඒ බ්‍රහ්මණයාට ඒ ධර්මයන් පහළ වෙනකොට ඒ බ්‍රාහ්මණයාගේ සැක ඉවත් වි යනවා. මක්නිසාද 'යතො පජානාති සහෙතු ධම්මං' හේතූන් අනුව සිදු වන ඒ ධර්මතාව දැකීමෙන්. ඒ පළවෙනි ගාථාවේ අර්ථයයි.

ඔන්න දෙවෙනි ගාථාව. අර විධියටමයි පටන්ගන්නෙ. යම් අවස්ථාවක කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව ධ්‍යාන වඩන්නා වූ බ්‍රාහ්මණයාට, එහෙම නැත්නම් රහතන්වහන්සේට, බුදුරජාණන් වහන්සේට, ධර්මයෝ පහළවෙත්ද එවිට ඔහුගේ ඒ සැක ඉවත් වෙනවා '**යතො ඛයං පච්චයානං අවෙදි**' ඒ ප්‍රත්‍යය ධර්මයන්ගේ ක්ෂය වීම තේරුම්ගැනීම නිසා. ඒ දෙවෙනි ගාථාවේ අර්ථයයි.

තුන්වෙනි ගාථාව, '**යදා හවෙ පාතුභවන්ති ධම්මා - ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස**' යම් අවස්ථාවක කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව ධ්‍යාන වඩන්නා වූ බ්‍රාහ්මණයාට ධර්මයෝ පහළ වෙත්ද, ඔන්න

ඊළඟට අමුතු දෙයක් කියවෙනවා. **'විධූපයං තිට්ඨති මාරසෙනං - සූරියො'ව ඔභාසයමන්තලික්ඛං'** මුළු අහස ආලෝකවත් කරන සූර්යයා මෙන් මාර සේනාව විසුරුවා හරිමින් සිටී. ඒ අවස්ථාවේ ඒ බ්‍රාහ්මණයා මාර සේනාව විසුරුවා හරිනවා **විධූපයං තිට්ඨති මාරසෙනං** උපමාව දෙන්නෙ **'සූරියො'ව ඔභාසයමන්තලික්ඛං'** අහස ආලෝකවත් කරන සූර්යයා මෙන්.

ඔය ඉතින් ගාථා තුනේ අර්ථයයි. දැන් ඉතින් මේක ආශ්‍රයෙන් අපි පටිච්ච සමුප්පාද ධර්මය තේරුම්ගන්න බලමු. දැන් මේ තුන් ආකාරය කෙටියෙන් සඳහන් වෙන්නේ මෙහෙමයි ඒ සූත්‍ර තුනේ.

පළමුවෙනි යාමය තුළ බුදුරජාණන් වහන්සේ පටිච්ච සමුප්පාද ධර්මය අනුලෝම වශයෙන් මෙනෙහි කළාය, දෙවෙනි යාමය තුළ - මධ්‍යම යාමය තුළ - එය පටිලෝම වශයෙන් මෙනෙහි කළාය, පශ්චිම යාමය කියලා කියන අළුයම කාලය තුළ ඒ දෙකම එකතු කරලා අනුලෝම පටිලෝම වශයෙන් ඒ දෙකම එකතු කරල මෙනෙහි කළාය කියලා. ඔන්න ඒක තේරුම් ගන්න උපකාර වන කාරණය අපි ඉදිරියට ඉදිරිපත් කරනවා.

දැන් අර ගාථාවේ කියවුණු **'යදා හවෙ පාතුභවන්ති ධම්මා'** යම් අවස්ථාවක ධර්මයෝ පහළ වෙත්ද කියලා කිව්වේ - මොනවද ඒ ධර්ම? ඒ ධර්ම මොනවාද කියන එක ඒ සූත්‍රයේම සඳහන් වෙනවා. දැන් මේ පින්වතුන් අහලා තියෙනවා පටිච්ච සමුප්පාද ධර්මය ගැන යම් අවබෝධයක් තියෙන අය දන්නවා අංග දොළසකින් සමන්විතයි, පටිච්ච සමුප්පාද ධර්මය. ඇතැම් අය ඉතින් භාවනාවටත් ඕක කියනවා. **අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං'** කියලා ඔය ආදී අංග දොළහ තමයි. ඒ ප්‍රත්‍ය ධර්ම දොළහේ පහළ වීමයි මෙතන තියෙන්නේ. **'යදා හවෙ පාතුභවන්ති ධම්මා'** කියන්නේ අන්න ඒ අංග දොළහම ප්‍රත්‍යය ධර්මයන්. මොකද ප්‍රත්‍ය ධර්මයන් කියන්නේ? එක එකක් තනිව ඇති වන්නේ නැහැ. හේතු ප්‍රත්‍ය නිසා ඇති වෙන්නේ. එතකොට යම් අවස්ථාවක ඒ ප්‍රත්‍ය ධර්ම දොළහ ඒ ධ්‍යාන වඩන බ්‍රාහ්මණයාට- නැත්නම් රහතන්වහන්සේට- පහළවෙත් ද ඔන්න ඊළඟට කියනවා 'යදා හවෙ පාතුභවන්ති ධම්මා' එතකොට ඒ ධර්ම පහළ වීමක් ගැන කියනවා වගේම ඒ පහළ වෙන්නේ කොහොමද කියන ප්‍රශ්නයත් කෙනෙකුට අහන්න පුළුවන්. ඒක අග පදයෙන් කියවෙනවා 'යතො පජානාති සහෙතුධම්මං' ඒ කියන්නේ හේතු ප්‍රත්‍ය පිළිබඳ ධර්මතාව අවබෝධ වීමෙන්. ඇත්ත වශයෙන්

පටිච්ච සමුප්පාද කියලා කියන්නේ ඒ ධර්ම න්‍යායයයි. ඒ ධර්මතාවයි. ඒ ධර්මතාව අර සූත්‍රයේ-ඇත්ත වශයෙන් ධර්මතාවයේ පද හතරක් තිබෙනවා. මේ පළමු සූත්‍රයේ එයින් දෙකකුයි එළියට එන්නේ.

**ඉති ඉමස්මිං සති ඉදං හොති**
**ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති**[2]

ඒ මුල් දෙක විතරයි පළමුවෙනි සූත්‍රයේ තියෙන්නේ **'ඉති ඉමස්මිං සති ඉදං හොති'** මෙය ඇති කල්හි මෙය වෙයි. මෙය හටගැනීමෙන් මෙය හටගනියි කියන එක තමයි පටිච්ච සමුප්පාදයේ අනුලෝම පැත්තට අයිති සිද්ධාන්ත දෙක. ඉතිං ඒ 'මෙය මෙය' කියලා කියන එකත් කෙනෙකුට සැකයක් වෙන්න පුළුවන්. අපි දැන් සාමාන්‍යයෙන් කියනවා නම් බලාපොරොත්තු වන්නේ 'මෙය ඇති කල්හි එය වෙයි' කියලා- එහෙම නේද? මෙය ඇති කල්හි එය වෙයි.' දැන් මෙතන මේ කියන්නේ මොකද දන්නවාද? 'අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං' කියන මේ අංග දොළහේ ඕනෑම යුගලයක් ගත්තොත්, එක සමීපයේ තියන යුගලයක් ගත්තොත්, ඒ යුගල අන්න අර ධර්මතාවට නිදර්ශන. ඒකයි අර මෙය මෙය කියලා කිව්වේ. අපි යම්කිසි දෙකක් ඉදිරියට අරගෙන මේ දෙක අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධතාව පෙන්නුම් කරන කොට අපි ඒකට ව්‍යවහාර කරන්නේ 'මෙය ඇති කල්හි මෙය' කියලා නේද? එයින් පිට තියෙන එකකටයි එය කියලා කියන්නේ. ඔන්න ඕක හොඳට වටහා ගන්න. දැන් අපි සාමාන්‍යයෙන් බලාපොරොත්තු වන්නේ මෙය ඇති කල්හි එය වෙයි කියලා. ඇයි මෙතන මෙය ඇති කල්හි මෙය වෙයි කියන එක? ඒක තේරුම්ගන්න තියෙන්නේ අර අංග දොළහේ ඕනෑම යුගලයක්, ඕනෑම ජෝඩුවක්, ඉස්සරහට අරගෙන මෙන්න මේ සිද්ධාන්තය ඒකට ඇතුල් කරන්න පුළුවන්. මොකක් ද **'ඉමස්මිං සති ඉදං හොති - ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති'** දැන් අපි නිදර්ශනයක් ගනිමු ඒකට. අර කියාපු ප්‍රත්‍යය ධර්ම නිදර්ශන පමණයි. "අවිද්‍යාව ඇති කල්හි සංස්කාරයෝ වෙත්; අවිද්‍යාවේ හටගැනීමෙන් සංස්කාරයෝ හටගනිත්" ඊළඟට තව ටිකක් ඈතට කියමු. සංස්කාරයන් ඇති කල්හි විඤ්ඤාණය වෙයි. සංස්කාරයන්ගේ ඉපදීමෙන් විඤ්ඤාණය උපදියි. ඒ විධියට විඤ්ඤාණය ඇති කල්හි නාමරූපය වෙයි. 'විඤ්ඤාණය හටගැනීමෙන් නාමරූපය හටගනියි.' ඔය විධියට අර දොළහේ ජෝඩු ජෝඩු අරගෙනයි මෙන්න මේ සිද්ධාන්තය පෙන්නුම් කරන්නේ. එතකොට මෙතන වැදගත් දෙය සිද්ධාන්තයයි. අන්න ඒ **'සහෙතු ධම්මං'** කියලා කියන ඒ සිද්ධාන්තය අවබෝධ කරගැනීම තමයි මේ පටිච්ච සමුප්පාදයේ වැදගත් දෙය.

නමුත් ඒ වෙනුවට බොහෝ දෙනා අර දොළහ කියලා එයින් සෑහීමට පත් වෙනවා. අර සිද්ධාන්තය කියලා දෙයක් තියෙන බවවත් දන්නේ නැහැ. නමුත් මෙන්න මේ සූත්‍රය ආරම්භ කරන්නේ තථාගත බුදුරජාණන් වහන්සේ ඒ පටිච්ච සමුප්පාද ධර්මය අනුලෝම වශයෙන් මෙනෙහි කළයි මෙන්න මේ විධියට. පටන්ගන්නේ අර සිද්ධාන්තයෙන්. **'ඉති ඉමස්මිං සති ඉදං හොති- ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති'** මෙය ඇති කල්හි මෙය වෙයි, මෙය හටගැනීමෙන් මෙය හටගනියි කියලා. ඊළඟට දක්වනවා ඒකට නිදර්ශන, **'අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං'**, ඒ විධියට දක්වනවා. එතකොට මෙතන කියන්නේ මොකක්ද කියන එක අගට එන්නේ, සූත්‍රයේ අර අවසානයේ ප්‍රකාශ කරනවා. **'එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති'** මේ මුළු මහත් සංසාර දුක් කඳෙහි හටගැන්ම. එතකොට හටගැන්ම පෙන්වන හරිය තමයි අනුලෝම කියලා කියන්නේ. දැන් අපි කිව්වනේ පටිච්ච සමුප්පාදය මෙනෙහි කරන තුන් ආකාරයක් තියනවා කියලා. පළමු යාමය තුළ බුදුරජාණන් වහන්සේ මෙනෙහි කළේ මේක හටගැනීම පිළිබඳ පැත්ත. එතකොට ඒක නිසා අර දෙකෙහි කියවුණේ, මෙය ඇති කල්හි මෙය වෙයි.මෙය හටගැනීමෙන් මෙය හටගනියි කියලා. ඒකට නිදර්ශන වශයෙන් අවිද්‍යාවේ හටගැනීමෙන් සංස්කාරයෝ හටගනිත්. සංස්කාරයන්ගේ හටගැනීමෙන් විඤ්ඤාණය හටගනියි කියලා. අවසාන කරන්නේ කොහොමද? මෙසේ මේ තනිකර ජාති ජරා මරණ ආදී දුක්ඛස්කන්ධයම ඇති වෙයි කියලා. ඔන්න ඕකට ගැලපෙන හැටියට තමයි අර පළමු ගාථාව.

ඉතිං මේ එක්කම අපි විස්තර කරන්න බලමු මේ ගාථාවේ කියවෙනවා **'අථස්ස කඞ්ඛා වපයන්ති සබ්බා'** ඒ බ්‍රාහ්මණයාගේ, ඒ රහතන් වහන්සේගේ, සැක ඉවත් වෙනවා. මොනවද මේ සැක? අන්න ඒ සැක ටික හඳුනාගන්න කෙනෙකුට මැදුම් සඟියේ **සබ්බාසව සූත්‍රය**[3] බලන්න වෙනවා. සබ්බාසව සූත්‍රයේ තියෙනවා සාමාන්‍ය පෘථග්ජනයා අතීත අනාගත වර්තමාන කියන කාලත්‍රය පිළිබඳව ඇති කරගන්නා සැක. විචිකිච්ඡා සැක. කඞ්ඛා. අතීතය පිළිබඳව, ඒ කියන්නේ මේ කියපු පටිච්ච සමුප්පාද ධර්මය නොදුටු සාමාන්‍ය පෘථග්ජනයා මමය මාගේය කියන ඒ දෘෂ්ටියේ, සක්කාය දිට්ඨියේ, ගැලිලා ඉඳගෙන අතීතය ගැන හිතන්නේ මෙහෙමයි. 'මම අතීතයේ හිටියෙද? අතීතයේ හිටියේ නැද්ද? අතීතයේ හිටියේ කවුරු හැටියටද? අතීතයේ හිටියේ කොහොමද? මම අතීතයේ කවුරු වෙලා ඉඳලා කවුරු වුනාද? ඔන්න පස් ආකාරය. ඔය 'මම' කියන එක ඉස්සරහට දාගෙනයි තර්ක

කරන්නේ සාමාන්‍ය පෘථග්ජනයා. ඒ වගේම අනාගතය පිළිබඳවත් පස් ආකාරයකින් ඒ විධියට මෙනෙහි කරනවා. ඒකට කියන්නේ 'අයෝනිසෝමනසිකාර' අනිසි මෙනෙහි කිරීම. සාමාන්‍ය පෘථග්ජනයා කරන මෙනෙහි කිරීම. අනාගතය පිළිබඳවත් එහෙමයි. 'මම අනාගතයේ ඉන්නවාද? මම අනාගතයේ ඉන්නේ නැද්ද? මම අනාගතයේ ඉන්නේ කවුරු හැටියටද? මම අනාගතයේ ඉන්නේ කොහොමද? මම අනාගතයේ කවුරුවෙලා කවුරු වෙනවාද? මේක නිකං විහිළුවක් වගේ බැලුවම. නමුත් ඔය විහිළුව තුළ තමයි හැම පෘථග්ජනයාම ඉන්නේ. නමුත් ඔන්න ඊළඟට වර්තමානය ගැන හය ආකාරයකින්. ඒක අරිටත් වඩා හාස්‍යජනකයි වගේ බැලුවාම. මම ඉන්නවාද? මම නැද්ද? මම කවුද? මම කොහොම කෙනෙක්ද? මේ සත්ත්වයා කෙහෙන්ද මෙතෙන්ට ආවේ? මේ සත්ත්වයා කියලා කියන්නේ ආත්ම අදහස. මේ සත්ත්වයා කොහෙන්ද මෙතෙන්ට ආවේ? මේ සත්ත්වයා මෙතනින් කොහාටද යන්නේ? අන්න ආත්ම දෘෂ්ටිය තුළ. ඉතින් ඔන්න ඔය දහසය ආකාර සැක ඉවත් වෙනවා මෙන්න මේ ප්‍රත්‍ය පිළිබඳ ධර්මතාව දැකීමෙන්. ඒකයි මේ සොවාන් මාර්ගයෙන් මේ පටිච්ච සමුප්පාද න්‍යායය අවබෝධ කරගත්තු ආර්ය ශ්‍රාවකයාට මේ සැක ඇති වන්නේ නැත්තෙ. මොකද මේ සැක අර මමය මාගේය කියලා කියන සක්කාය දිට්ඨිය බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා, ඔය සැක අන්තිමට කෙළවර වන්නේ හැට දෙකක් දෘෂ්ටිවලින්. අන්ත දෙකකට වැටෙනවා. එක්කෝ මම ඉන්නවා කියලා ගන්නවා. එහෙම නැත්නම් මම නැතැයි කියලා ගන්නවා අනාගතයේ. ඒක තුළ ශාස්වත දෘෂ්ටියට වැටෙනවා එක පැත්තකින්. මම සදාකාලික ආත්මයක් ඇති කෙනෙක් කියලා. අනික් අන්තය තමයි උච්ඡේද දෘෂ්ටිය කියලා කියන මම මරණින් පස්සේ මෙතනින් ඉවරය, මේ කයට තමා මම ආත්මය කියලා කියන්නේ. ඔය අන්ත දෙක මැද හැටදෙකක් දෘෂ්ටි තියෙන බව බ්‍රහ්මජාල සූත්‍රයේ දක්වලා තියෙනවා. එතකොට ඒ දෘෂ්ටි ඉවත් වෙනවා මෙන්න මේ සමුදය පැත්ත දැකීමෙන්මත්. ඒකයි මේ පළමුවෙනි ගාථාවෙන් හෙළි වන්නේ. ඔන්න එතකොට ඒ කිව්වේ අර පළමුවැනි ගාථාවට අදාළව. හිතාගන්න මේ පින්වතුන් පටිච්ච සමුප්පාදය මෙනෙහි කළ ආකාර තුනෙන් පළමුවෙනි ආකාරය අනුලෝම. අර ඇති වීම පිළිබඳව සමුදය පැත්ත.

ඔන්න ඊළඟට මධ්‍යම යාමයේ මෙනෙහි කළ ආකාරය තමයි අර දෙවැනි ගාථාවෙන් කියවෙන්නේ. **'යතො ඛයං පච්චයානං අවෙදි'** එතන අමුතුවෙන් කියවෙන්නේ මේ ප්‍රත්‍ය ධර්මයන්ගේ නිරෝධය, ක්ෂය වීම දුටුවා. ක්ෂය වීම දුටුවා කියන එක බුදුරජාණන් වහන්සේ පටිලෝම

වශයෙන් මෙනෙහි කළ අවස්ථාවේදී පෙනුණා අර හේතු ප්‍රත්‍යයන්ගෙන් ඇති වෙන නිසාම ඒවා නැති වෙනවා. හේතු ප්‍රත්‍ය නැතිකොට නැති වෙනවා. එතකොට ඒක දක්වන්නේ මෙහෙමයි. අන්න ඒකට කියන සිද්ධාන්ත දෙක

**ඉති ඉමස්මිං අසති ඉදං න හොති**
**ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති.**[4]

'මෙය නැති කල්හි මෙය නැති වෙයි මෙය නැති වී යාමෙන් මෙය නැතිවෙයි.' ඊළඟට ඒකට එකතු වන එක තමයි නිරොධ වචනය ඒකට නිදර්ශනය, අවිජ්ජා නිරොධා සංඛාර නිරොධො, සංඛාර නිරොධා විඤ්ඤාණ නිරොධො, විඤ්ඤාණ නිරොධා නාම රූප නිරොධො, නාමරූප නිරොධා සළායතන නිරොධො ආදී වශයෙන් අන්තිමට ජාති ජරා මරණ ඔක්කොම නිරුද්ධ වෙනවා, කියලා ඉවර කරන්නේ කොහොමද? '**එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති**.' අන්න නිරොධ පැත්ත. ඒකට තමයි පටිලෝම කිව්වේ. එතකොට පටිච්ච සමුප්පාදයේ අනුලෝම, පටිලෝම කියන දෙපැත්තම ඒවායේ වැදගත්කම අනුව අර මුල් යාමයේදී අනුලෝම දෙවෙනි යාමයේදී, මධ්‍යම යාමයේදී පටිලෝම.

ඔන්න තුන්වෙනි යාමය. ඒක ඊට වඩා ගැඹුරුයි. තුන්වෙනි යාමයේදී මොකද කළේ? මේ දෙකම එකතු කරලා අනුලෝම පටිලෝම- ඒක කෙනෙකුට හිතාගන්න බැරි විධියේ මහා ගැඹුරු දෙයක් එතැන තියෙන්නේ. අනුලෝම පටිලෝම දෙකම එක විට. ඒක දක්වන්නේ මෙහෙමයි. අන්න එතැනදී අර හතර දක්වනවා.

**ඉති ඉමස්මිං සති ඉදං හොති**
**ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති**
**ඉමස්මිං අසති ඉදං න හොති**
**ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති**[5]

ඔන්න දැන් හිතාගන්න අනුලෝම එකේදී මුල් දෙක විතරයි දැක්වූයේ. පටිලෝම එකේදී අග දෙක විතරයි දැක්වූයේ, සිද්ධාන්ත වාක්‍ය හතරෙන්. ඔන්න දැන් මේ අවස්ථාවේදී දක්වනවා ඒ හතරම පෙළගස්වලා.

මෙය ඇති කල්හි මෙය වෙයි

මෙය හටගැනීමෙන් මෙය හටගනී
මෙය නැති කල්හි මෙය නොවේ
මෙය නැති වී යාමෙන් මෙය නැති වේ

ඔන්න දැන් සම්පූර්ණයි පටිච්ච සමුප්පාද සිද්ධාන්තය. ඊළඟට ඒකට නිදර්ශන හැටියට අර අංග දොළහ පිළිබඳව සමුදය නිරෝධ දෙකම දක්වනවා. අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං ඔහොම කියලා ඊළඟට කියනවා අවිජ්ජා නිරොධා. අවිද්‍යාව නිරුද්ධ වෙනකොට ඒ ඔක්කොම ඉවරයි. ඒක අවසන් කරන්නේ මෙහෙමයි. 'අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා' අවිද්‍යාව නිසා සංස්කාර, සංස්කාර නිසා විඤ්ඤාණය ආදී වශයෙන් තනිකර දුක් කඳක් ඇති වෙනවා. එසේ වී නමුත් ඔන්න මේ වචනය ඉතාම වැදගත්. පින්වතුනි, '**අවිජ්ජායත්වෙව**' කියන එක විග්‍රහ කරල බැලුවොත් එතන ගන්න තියෙන්නේ අවිජ්ජාය තු එව මේ 'තු' කියලා කියන්නේ 'නමුත්' කියන අර්ථය එතන තියෙනවා. 'නමුත්' එතකොට අර සාමාන්‍ය ලෝකෙ මේ සංසාර ස්වභාවය අවිද්‍යාවේ ආරම්භයක් නැහැ කියලා කියන්නේ ඒ තරම් අපිට හිතාගන්න බැරි තරම් කාලයක් අවිද්‍යාව ඇවිල්ලා තියෙනවා. ඒ අවිද්‍යාව නිසා අර විධියට සංස්කාර, විඤ්ඤාණ, නාමරූප සළායතන ඔය විධියට අන්තිමට දුක් කඳක් ඇති වෙලා තියෙනවා. නමුත් ඔන්න ඔය 'නමුත්' ඉතාම වැදගත්, **නමුත්** අවිද්‍යාවගේම අසෙසවිරාගනිරෝධයෙන්, අවිද්‍යාව යම් විධියකින් සම්පූර්ණයෙන්ම නිරුද්ධ කළොත් එතනම සංස්කාර නිරෝධය, සංස්කාර නිරෝධයෙන් විඤ්ඤාණ නිරෝධය, විඤ්ඤාණ නිරෝධයෙන් නාමරූප නිරෝධය, ඒ ක්‍ෂණයෙන්ම. ආයේ භව කතන්දරයක් නැහැ මෙතන. දැන් කාලයේ පටිච්චසමුප්පාදය තෝරන හැටි මේ පින්වතුන් දන්නවා ඇති නේ? ඒ ක්ෂණිකවම අර අවිද්‍යාව නිරුද්ධ වෙනවත් එක්කම අර ජරාමරණ දක්වා ඔක්කොම නිරුද්ධ වෙනවා. ඔන්න එතකොට ඒ අනුලෝම පටිලෝම දෙකම. ඒක ඉතාම ගැඹුරු කාරණයක්.

ඒකට දීපු උපමාව හිතලා බලන්න. ඒකත් ඒ වගේමයි.

**විධූපයං තිට්ඨති මාරසෙනං**
**සූරියො'ව ඕභාසයමන්තලික්ඛං**

ඒවා ගැන විවරණය කරනවා නම් පැයක් කියන්න දේවල් තියෙනවා. ඒකෙ අදහස මේකයි. අර විධියට අනුලෝම පටිලෝම දෙකම පෙළ ගස්වලා මෙනෙහි කරන්නා වූ බ්‍රාහ්මණයාට ඇති වන වෙනසයි එතන

දක්වන්නේ. ඒ අවස්ථාවේ බ්‍රාහ්මණයා **'විධූපයං තිට්ඨති මාරසෙනං'** මාර සේනාව විසුරුවා හරිමින් සිටිනවා. **'විධූපයං'** කියන එක ඇත්ත වශයෙන් කියනවා නම් 'දුමවා හරිනවා' කියන්න පුළුවන්. අර යක්කු එහෙම දුම්මල ගහලා එළවනවා. අන්න ඒ වගේ. එතකොට මේ මාර පරාජය ගැන මේ කියන්නේ. **'විධූපයං තිට්ඨති මාරසෙනං'** ඒ බ්‍රාහ්මණයා- එහෙම නැත්නම් බුදුරජාණන් වහන්සේ - ඒ මාර සේනාව පලවාහරිමින් සිටිනවා. 'සූර්යයා අහස ආලෝකවත් කරනවා වගේ. අපි කෙටිකරන්න උපමා දෙකතුනක් විතරක් දෙනවා. මේ සූර්යයා කියන ආලෝකය තමා ප්‍රඥා ආලෝකය කියලා හිතාගන්න. මාරසේනාව කියලා කියන්නේ විතර්ක සේනාව. ඒක අපේ වචනයෙන් නොවේ සුත්ත නිපාතයේ පධාන සූත්‍රය කියවන පින්වතුන් දන්නවා බොධිසත්ත්වයන් වහන්සේම මාර සේනාව හඳුන්වන්නේ මෙන්න මේ විධියටයි. දස මාර සේනා.

**කාමා තෙ පඨමා සෙනා - දුතියා අරති වුච්චති**
**තතියා ඛුප්පිපාසා තෙ - චතුත්ථී තණ්හා පවුච්චති**[7]

ආදී වශයෙන් දස මාර සේනාව හඳුන්වලා තියෙන්නේ විතර්ක හැටියටයි. කාම, අරති කියලා කියන්නේ නොඇල්ම, සසුන් පිළිවෙතේ නොඇල්ම. කුසගිනි පිපාස පිළිබඳ සිතිවිලි, තණ්හාව ආදී වශයෙන් මේ විතර්ක. එතකොට මෙතන කියන්නේ මොකක්ද? අර විතර්ක පැන නගින්නේ අවිද්‍යාව නිසයි. සංස්කාර කියලා කියන්නේ. ඒ සංස්කාර තුළින් තමයි මේ ඔක්කොම මේ ලෝකයක් හැදිලා මේක තුළ දුක සැප හැම එකක්ම ඇති වෙන්නේ. එතකොට යම් වෙලාවක අර අනුලෝම පටිලෝම දෙකම එක මොහොතේ මෙනෙහි කරනවා නම්- ඒක ඉතාම සියුම් අන්දමින් - එතකොට අන්න අර විතර්කයන්ට තැන නැති වෙනවා. ඒක තුළින් වෙන්නේ අන්තිමට අර අපි බොහෝ අවස්ථාවල අපේ අනෙකුත් ධර්ම දේශනා ආදියෙ පෙන්නුවා අර විමුක්තිය කියන එක පරලොව ලබන එකක් නොවේ, මෙලොවම- අර කියාපු රහතන්වහන්සේගේ හිත තුළ විතර්ක සමනය වීමෙන් - මේ පින්වතුන් අහලා තියෙනවා නිවන කියලා කියන්නේ සියලු සංස්කාර සංසිඳීම, සියලු උපධීන් අතහැරදැමීම. අන්න ඒ අවස්ථාවේ මේ කියන්නේ අර්හත් ඵල සමාධිය. කෙටියෙන් කියතොත් ඒක බොහෝ තැන්වල **අවිතක්ක සමාධිය**[8] කියලා හඳුන්වලා තියෙනවා. **අවිතක්ක ඣාන**[9] කියලා හඳුන්වලා තියෙනවා. අන්න ඒ තත්ත්වයයි මේ කියපු අන්තිම උපමාවෙන් පෙන්නුම් කරන්නේ. මාර සේනාව නමැති විතර්ක සේනාව පලවා හරිනවා. අන්න අර කියාපු අනුලෝම පටිලෝම ශීඝ්‍රයෙන් මෙනෙහි කරන අවස්ථාවේදී.

ඒකට අපි උපමාවක් දුන්නා ඇතැම් තැන්වල ඔය දෙක එකතු කරන අවස්ථාව පෙන්නුම් කරන්න. දැලිපිහිය මදින්නා වාගේ. දැලි පිහිය ඉහළට, ඉහළට, ඉහළට. පහළට, පහළට, පහළට මැදලා අන්තිමට මුවහත තියුණු වන වෙලාවෙ හරියට ඉහළට පහළට බොහොම වේගයෙන් අදිනවා. අන්න ඒ වගේ ඒ දෙකම එකතු වුන අවස්ථාවේ විතර්කවලට තැනක් නැහැ. ඒ අවස්ථාවේ විඤ්ඤාණයේ අර කියාපු නාමරූප ඉවත් වෙලා **අනිදස්සන විඤ්ඤාණ** කියන ඒ විමුක්ත තත්ත්වය. අර්හත්ඵල සමාපත්තියයි ඔය තුන්වන අවස්ථාවේ කියන්නේ.

ඔන්න එතකොට ඒකට අදාළ ටික දැන් සැහෙන්න කියවෙලා තියෙනවා. ඉතින් එයින් අපට පෙන්නුම් කරනවා අර පටිච්චසමුප්පාද ධර්මය. මේක කවලම් කරගන්න නරකයි. මූලික න්‍යායය තමයි අන්න අර මුලින් කිව්වේ- අර පද හතර. එතනයි වැදගත්කම තියෙන්නේ. බොහෝ දෙනා අර දොළහ කිව්වට මොකද, මොකක්දවත් දන්නෙ නැහැ. **ඒ දොළහ නිදර්ශන පමණයි.** ඒවාට තමා **පච්චය ධම්ම**[10] කීවේ. එතකොට '**සහේතු ධම්ම**' අර ධර්මතාව අන්න අර කියාපු න්‍යායය. "මෙය ඇති කල්හි මෙය වෙයි. මෙය හටගැනීමෙන් මෙය හටගනියි. මෙය නැති කල්හි මෙය නොවෙයි. මෙය නැති වීමෙන් මෙය නැති වෙයි". ඒක බුදු කෙනෙක්මයි සොයාගන්න ඕනෑ. ඒ තරම් පුදුම දෙයක්. මොකද මෙතෙක් තම තමන් මමත්වය උඩ ගත්තු එක, ධර්ම පරම්පරාවක හේතු ප්‍රත්‍ය සම්බන්ධතාව උඩ සිදු වුන එකක් හැටියට අන්න බුදුරජාණන්වහන්සේ මතු කරලා දුන්නා. ඒක තමයි පටිච්චසමුප්පාද ධර්ම න්‍යායය.

දැන් මේකටම තව ඩිංගක් තේරුම් ගන්න මේ පින්වතුන්ට කිව්වොත් සමහරු අහලා ඇති - දන්නවා අග්‍රශ්‍රාවක සාරිපුත්ත මොග්ගල්ලාන ස්වාමීන්වහන්සේලා ගැන. උන්වහන්සේලා ගිහි කාලයේ ඒ බ්‍රාහ්මණ මානවකයින් හැටියට සත්‍යය සොයමින් ගිය අවස්ථාවේ උපතිස්ස කෝලිත කියන දෙන්නා. ඩිංගක් අහල ඇති සමහරු. එක් අවස්ථාවක දැන් මේ කාලයේ තියෙන්නා වාගේ විවිධ ප්‍රසංග වගේ වෙන්න ඇති ගිරග්ග සමජ්ජ කියලා යම්කිසි උත්සවයක් තිබුණා. ඒකට ගිහිල්ලා දෙන්නම අන්තිමට ඒ අයගෙ නුවණ මෝරලා තිබුණ නිසා ටික වේලාවක් බලනකොට - මේ බහුරූ කෝලම් බලන කොට -අන්තිමේ එපා වුණා. එපා වෙලා කලකිරිලා යම්කිසි විධියක- මේ භව නාටකයේ යථාතත්වය පිළිබඳ පුංචි පූර්ව දැක්මක් ඒ දෙන්නට ඇති වෙලා තියෙන්න ඇති. එබඳු අවස්ථාවක ඔන්න අහල ඇති මේ පින්වතුන් අස්සජී මහරහතන්වහන්සේ - ඒ පස්වග මහණුන්

වහන්සේලාගෙන් කෙනෙක්. අර උපතිස්ස බ්‍රාහ්මණයාට හදිසියේ හමු වුනා. මේ අස්සජී ස්වාමීන් වහන්සේ පිණ්ඩපාතයේ වඩිනවා. ඒ ශාන්ත ස්වරූපය දැකලා කිට්ටු වෙලා දානය වැළඳුවාට පස්සේ ඔබවහන්සේගේ ඉරියව් බොහොම ප්‍රසන්නයි ඔබවහන්සේගේ ශාස්තෘවරයා කවුද කියලා ඇහුවා. කොයි විධියේ ධර්මයක්ද ප්‍රකාශ කරන්නේ? එතකොට "අනේ මම ළඟදී මහණ වුනේ. මට වැඩි ධර්මයක් තේරෙන්නෙ නැහැ කිව්වාම, නෑ නෑ කෙටියෙන් කියන්න. මම උපතිස්ස මට පුළුවන් කෙටියෙන් කියාපු එක හරියට තේරුම්ගන්න කියලා. ඔන්න ඊළඟට වදාළ ගාථාව මේ පින්වතුන් බෙහෝ දෙනා අහලා තියෙනවා.

**යෙ ධම්මා හෙතුප්පභවා**
**තෙසං හෙතුං තථාගතො ආහ**
**තෙසං ච යො නිරොධො**
**එවං වාදි මහාසමණො**[11]

ඒ ගාථාවේ - හිතාගන්න - මුල් පද දෙක අහලා සෝවාන් වුනා. කෙහොමද සෝවාන් වුනේ. ඔන්න රහස දැන් මේ කියාපු විවරණය තුළ තියෙනවා, **'යෙ ධම්මා හෙතුප්පභවා - තෙසං හෙතුං තථාගතො ආහ'** යම් ධර්මයෝ හේතුන්ගෙන් ඇති වෙද්ද, ඒවායේ හේතුව තථාගතයන් වහන්සේ දේශනා කළ සේක. අන්න අර අනුලෝම පැත්ත විතරයි කිව්වේ. මේකත් බොහෝදෙනා, අටුවාචාරීන් වහන්සේලා, පටලවාගෙන, **යෙ ධම්මා හෙතුප්පභවා** කියලා කිව්වේ පින්වතුනි, හේතුන්ගෙන් හටගත් ධර්ම. ඒවා තමා අපි කිව්වේ අර **'පච්චය ධම්මා'** කියලා. හේතුන්ගෙන් හටගත් ධර්ම. ඒවායේ හේතුව තමයි, අටුවාචාරීන් වහන්සේලා කියන්නේ ඕක අවිද්‍යාව කියලා. අවිද්‍යාව නොවේ පින්වතුනි, අන්න ඒ හේතුව තමයි අර කියාපු ධර්ම න්‍යායය. ඒ ධර්ම න්‍යායය **'යෙ ධම්මා හෙතුප්පභවා - තෙසං හෙතුං තථාගතො ආහ'** කියන කොට උපතිස්ස බ්‍රාහ්මණයාට තේරුණා මෙන්න මේවා ඔක්කොම ප්‍රත්‍ය ධර්ම. මේවාට යටින් තියන ධර්මතාව තමයි අර 'මෙය ඇති කල්හි මෙය වෙයි' කියන එක. ඉතිං ඒ බුද්ධිය මුහුකුරා ගිහින් නිසා, ඥානය තියෙන නිසා, ඒ ටිකෙන්මත් තේරුම් ගත්තා යමක් හේතු ප්‍රත්‍යයන්ගෙන් ඇති වෙනවා නම් ඒකාන්තයෙන් නැති වෙන්න ඕන කියලා. අර පටිලෝම එක කියන්නත් කලින් ඒ ඥානය අනුවම තේරුම් අරගෙන තමයි ඒ. මේ පින්වතුන් කොතෙකුත් කියවලා ඇති ඔය සාමාන්‍ය පුද්ගලයෙක් වුණත් සෝවාන් වුණාම ඒ සෝවාන් වුන පුද්ගලයා පිළිබඳ සඳහන් වන කෙටිම පාඨය -පිරිසිදුම පාඨය- තමයි

සෝවාන් කෙනෙක් හඳුනාගන්න **'යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරෝධ ධම්මං'**[12]. අන්න ඒක තුළ ඔය සිද්ධාන්තය තියෙනවා. යම් තාක් දෙයක් හේතු ප්‍රත්‍යයන්ගෙන් ඇති වෙනවා නම් ඒ හැම දෙයක්ම නිරුද්ධ වන ස්වභාවය ඇත්තේය. එතකොට උපතිස්ස බ්‍රාහ්මණයාට ඒක අර ඩිංගෙන්මත් ඒ සෝවාන් ඵලය ලැබුණා. නමුත් කෝලිත බ්‍රහ්මණයාට පද හතරම කීවාට පස්සෙයි ඒ කෝලිත බ්‍රාහ්මණයා සෝවාන් වුණේ. අනික් පද දෙක මොකක්ද? **'යෙ ධම්මා හෙතුප්පභවා තෙසං හෙතුං තථාගතො ආහ - තෙසං ච යො නිරොධො'** අන්න ඒවායේ යම් නිරෝධයක් වේද ඒකත් තථාගතයන් වහන්සේ ප්‍රකාශ කළා. එතකොට අන්න ඒක තුළින් හිතාගන්න **'යෙ ධම්මා හෙතුප්පභවා' 'හෙතුප්පභවා ධම්මා'** කියලා කියන්නේ අර ප්‍රත්‍ය ධර්ම දොළහයි. ඒ ප්‍රත්‍යය ධර්ම දොළහම හේතුන්ගෙන් ඇති වුණ ඒවයි. ඒවායේ හේතුව තමයි අර කියාපු න්‍යාය, සිද්ධාන්තය. එතකොට මේ සිද්ධාන්තය ඕනෑම කුඩා දරුවෙක් ප්‍රත්‍යක්ෂ කරගත්තා නම් යම් අවස්ථාවක - ඒ දරුවා සෝවාන්.

ඔන්න එතකොට ඔතන ඉඳලා අපි යමු. දැන් එතකොට සාමාන්‍ය අවබෝධයක් මේ පින්වතුන්ට ලැබෙන්න ඇති. පටිච්ච සමුප්පාදයේ ද්වාදසාංගය කියන්නේ නිදර්ශනයි. ඒවායේ යට තියෙන්නේ ප්‍රත්‍ය සම්බන්ධතාවයි. අවිජ්ජාපච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, කියලා එතනින් ඉවර වෙන්නේ නැහැ ඒ සමුදය පැත්ත. නමුත් අන්න බුදුරජාණන් වහන්සේ පෙන්නුවා යම් අවස්ථාවක අවිද්‍යාව නිරුද්ධ වුණොත්, අවිද්‍යාව නිරුද්ධ වුනා කියන්නේ ප්‍රඥාව පහළ වීමයි. **අවිද්‍යාව නිරුද්ධ වෙනවා කියන්නේ ප්‍රඥාව පහළ වීමයි.** එතකොට ප්‍රඥා ආලෝකය පහළ වීමත් එක්කම ඒ ක්ෂණිකවම අර කියාපු සංස්කාරත් ඉවරයි. විඤ්ඤාණයත් ඉවරයි. නාමරූපයත් ඉවරයි. සළායතනය ඉවරයි. ඔක්කොම ඉවරයි. දැන් මෙහෙම කිව්වට මේවා තේරුම් ගන්න අමාරු වෙන්න පුළුවන්.

තේරුම්ගන්න අමාරු දේවල් තේරුම්ගන්න උපකාර වෙන්න බුදුරජාණන් වහන්සේ අවසර දීලා තියෙනවා උපමා දක්වන්න. අපි දැන් උපමා ලෝකයට යමු. දැන් මීට කලින් යමක් කියන්න ඕනෑ. අර විඤ්ඤාණ නාමරූප කියන දෙකේ මහා පුදුම ධර්මතාවක් තියනවා. ඒක බොහෝ තැන්වල දක්වලා තියෙනවා. අතීතයේ උගතුන් පිළිගෙන තියෙනවා, අපේ දාර්ශනික කට්ටිය- අඤ්ඤමඤ්ඤ පච්චය ධර්මතාවක් තියෙනවා කියලා අන්‍යෝන්‍ය ප්‍රත්‍යය බුදුරජාණන් වහන්සේම දක්වලා තියෙනවා. විපස්සී බුදුරජාණන් වහන්සේත් දක්වලා තියෙනවා, විඤ්ඤාණයත් නාමරූපත්

අතර. ඒ කියන්නේ විඤ්ඤාණය නිසා නාමරූපය, නාමරූපය නිසා විඤ්ඤාණය. ඔතන තමා බොහෝ දෙනා ගිහිල්ලා හිර වෙන්නේ, විඤ්ඤාණය නිසා නාමරූපය, නාමරූපය නිසා විඤ්ඤාණය. අග කෙළවරේ සිට සොයාගන ගියොත්, ජරා මරණ කුමක් නිසාද? ජාතිය නිසා, ජාතිය භවය නිසා. ඔහොම ඔහොම ගිහිල්ලා අන්තිමට නාමරූපයට ආවාම නාමරූපයට එහා බලනකොට විඤ්ඤාණය. විඤ්ඤාණයෙන් එහාට යන්නේ නැහැ. විඤ්ඤාණයෙන් එහා පැත්තේ නාමරූපය ඔය දෙක අතර තියෙනවා අන්‍යෝන්‍ය ප්‍රත්‍ය සම්බන්ධතාවයක්. ඔන්න ඔතනයි ගැටළුම තැන.

ඉතින් මේක තේරුම් කරන්න අපි නොයෙකුත් විධියේ උපමා දක්වලා තියෙනවා ඔය දිය සුළිය ආදී උපමා. දිය සුළියක් හැදෙන හැටි, දිය වැලක් මහා ජලකඳට එරෙහිව යන්න උත්සාහ කරලා ගිහිල්ලා ඒ ජල කඳේ හැපිලා කරකැවිලා ආවාම අර ගිහිල්ලා ආපසු එන එක අමතක වෙනවා. අරකට තියෙන සම්බන්ධය. ඉතින් පලු දෙකක් වගේ. නමුත් යම් වෙලාවක චක්‍රයක් වගේ හැදුණට පස්සේ මේක ඒකකයක් වෙනවා. ඒ වගේ මේ විඤ්ඤාණය තුළ මායාවක් තිබෙනවා. විඤ්ඤාණය කියලා කියන්නේ මායාවක් බව බුදුරජාණන්වහන්සේ ප්‍රකාශ කරලා තියෙනවා. මේ මායාවේ තියෙන ස්වභාවය කොයි තරම්ද කියතොත් මේ මායාවේ යමක් පිළිබිඹු වෙනවා. දැන් අපි දන්නවා සවිඤ්ඤාණක සත්ත්වයා තුළ ශක්තියක් තියෙනවා ආපසු හැරිලා බලන්න. ගස්කොළන්වලට ගල්වලට නැහැනේ. විඤ්ඤාණය ඇති හැම සත්ත්වයාටම ප්‍රත්‍යවේක්ෂා කිරීමේ, ආපසු හැරී බැලීමේ හැකියාවක් තියෙනවා. ආපසු හැරී බැලීම හරියට කරන්නත් පුළුවන්, වැරදියට කරන්නත් පුළුවන්. ඔය දෙක පෙන්නුම් කරන්න අපි යොදපු උපමාවක්. ඒක ඕනෑම කෙනෙකුට තේරෙන උපමාවක්. ඒදණ්ඩක් උඩින් යන බල්ලෙක්. අපි බොහෝ අවස්ථාවල කියන්නත් ඇති. ඒදණ්ඩක් උඩින් යන බල්ලෙක් හැරිලා බලනවා වතුරට, බැලූ හැටියෙ ඔන්න බල්ලෙක් ඉන්නවා. ඉතින් ඇල්ම නිසා වල්ගය වනනවා. එහෙම නැත්නම් ගොරවනවා. එහෙම නැත්නම් කුතුහලයෙන් බලනවා. බලන බලන වාරයක් පාසා බල්ලා ඉන්නවා. ඉතින් බල්ලා බලබලා ඉන්නවා. නමුත් බල්ලා තේරුම් ගන්නේ නැහැ. **බල්ලා හිතන්නේ පෙනෙන නිසා බලනවා කියලා. නමුත් ඇත්ත කාරණය බලන නිසායි පෙනෙන්නේ.** බලන බලන වාරයක් පාසා බල්ලෙක් ඉන්නවා. අන්න ඒ විධියේ මහා මායාකාරී ස්වභාවයක් විඤ්ඤාණයේ තියෙනවා. මොකද, විඤ්ඤාණයේ පිළිබිඹු වෙනවා. **පිළිබිඹු වෙන්නේ මොකක්ද? නාමරූපය.** ඔන්න දැන් ඉතින් ඒකත් විවරණය කරලා ඉදිමු, උපමා දෙන්න කලින්.

**නාමරූපය** කියලා කියන්නේ පින්වතුනි, නොයෙකුත් විධියට ඔය උගත්තු කියනවා. ඔය නැමීමක් වගේ කතන්තරයක් නොවේ. **නාමධර්ම**[13] කියලා කියන්නේ වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර කියන අතේ ඇඟිලි පහයි කියලා හිතාගනිමු. වේදනාව සුළැඟිල්ල කියලා හිතාගන්න.

වේදනා, සඤ්ඤා, චේතනා ඵස්ස මනසිකාර කියන ඒ නාම ධර්ම. මොකද මේවාට නාමධර්ම කියලා කියන්නේ. සාමාන්‍යයෙන් ලෝකයා යමක් හඳුනගන්නේ සම්මුති වශයෙන් ලෝකයා දීපු නාමයකින්. නමුත් අර පොඩි දරුවෙක් හඳුනාගන්නා වගේ යමක්- අන්ධයෙක් ගැන හිතලා බලන්න- අන්ධයා යමක් හඳුනාගන්නේ අතපත ගාලා නේ? ඒ එන වේදනාව අනුව සංඥාවක් දෙනවා. සංඥාව තුළින් චේතනාවක් මතු වෙනවා. චේතනාව තුළින් යම් තැනකට යොමු කරනවා. අන්න ස්පර්ශය. ඊළඟට මෙනෙහි කිරීම අගට තියෙනවා. ඉතින් වේදනාව නාමධර්ම අතර මුලට ගන්න හේතුවත් බොහෝ දෙනා ප්‍රශ්න කරනවා. ඒ වෙනුවට අපි අර කිව්ව සමහර අවස්ථාවල පැරණි විධියට ධර්මය තෝරන අය කරන්නේ 'ඵස්ස ඉස්සරහට දානවා' කියලා. මොකද ඵස්ස මුලට නොදැම්මේ. සැරියුත් ස්වාමීන් වහන්සේට වැරදිලාද? බුදුරජාණන් වහන්සේට වැරදිලාද? නැහැ පින්වතුනි, විඤ්ඤාණය - ඔන්න විඤ්ඤාණය ගැන යමක් කියන්න ඕනෑ මේ අවස්ථාවේදී.

ඒකත් සාරිපුත්ත ස්වාමීන් වහන්සේ එක් අවස්ථාවක - ඔය පොත් බලන පින්වතුන්ට බලාගන්න පුළුවන් **මහාවේදල්ල සූත්‍රයේ**[14]. මහා කොට්ඨිත ස්වාමීන් වහන්සේ නොදන්නවා වගේ සාරිපුත්ත ස්වාමීන්වහන්සේගෙන් අහනවා අපි සඳහා. '**විඤ්ඤාණං විඤ්ඤාණං**' කියලා කියනවා මොකක්ද මේ විඤ්ඤාණය කියලා කියන්නේ? එතකොට සාරිපුත්ත ස්වාමීන්වහන්සේ කියනවා '**විජානාති විජානාතීති ඛො ආවුසො**' වෙන් කර දැන ගන්නවා, වෙන් කර දැනගන්නවා කියන අර්ථයෙනුයි විඤ්ඤාණය කියලා කියන්නේ. ඊළඟට සාරිපුත්ත ස්වාමීන් වහන්සේ පෙන්නුම් කරනවා විඤ්ඤාණය මඟින් කෙරෙන මූලිකම වෙන් කිරීම. ඔන්න හොඳට අහන්න. මොකක්ද මූලික වෙන් කිරීම. '**සුඛන්තිපි විජානාති දුක්ඛන්ති විජානාති අදුක්ඛමසුඛන්තිපි විජානාති**'. එතකොට විඤ්ඤාණයේ පළමුවෙනි කෘත්‍යය වේදනාව දැනගැනීම. එතනදී තමා අවදි වන්නේ. ගස් කොළන්වලට නෑ නේ වේදනාවක්. හිතලා බලන්න. රබර් ගහට කිරි ආවට ඒක අඬන්නේ නැහැ නේ. ඒ වගේ විඤ්ඤාණයේ මූලිකම කෘත්‍යය තමයි වේදනාව. වේදනාව තුළිනුයි ආත්මය අවදි වන්නේ. ඒකත්

බොහෝ අවස්ථාවල පෙන්නුම් කරලා තියනවා. ආනන්ද හාමුදුරුවන්ගෙන් බුදුරජාණන් වහන්සේ අහනවා, 'යම් තැනක වේදනාව කිසිම ආකාරයකින් නැත්නම් එතන ආත්මයක් කියන හැඟීමක් තියෙනවාද? 'නැත.' ඔන්න ඕකයි හේතුව. අර ඵස්ස ඉස්සරහට දානවා වෙනුවට වේදනාව ඉස්සරහට දාලා තියෙන්නේ මොකද, විඤ්ඤාණයේ මූලිකම කෘත්‍යය සැප, දුක්, නොදුක් නොසුව කියන ඒ වේදනා තුන වෙන් කර දැනගැනීමයි. දැන් මේ ඉඳගෙන ඉන්න අවස්ථාවේ අනික් පැත්තට හැරෙන්නේ මොකද? අර වේදනාව නිසා නේ. අන්න හැම එකක්ම ඔය වේදනාවෙන් **සංඥාවක්** දෙනවා. ඊළඟට **චේතනාව.** බණ ඇහුවට කමක් නැහැ. ටිකක් හැරෙන්න ඕනෑ. චේතනාව. ඊළඟට හිත යන්නේ කොතෙන්ටද? මං කිව්වොත් වරදවා තේරුම් ගන්න එපා. **ඵස්ස.** ඊළඟට **මනසිකාරය** යෙදිලා.

ඔන්න එතකොට නාමධර්ම තේරුම්ගත්ත නේ දැන්. ඊළඟට රූපය කියන්නේ මොකක්ද? එතනත් පටලවාගෙන. රූපය කියලා කියන්නේ පින්වතුනි, **'චත්තාරි ච මහභූතානි චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං'**

උපාදාය කියන වචනය වෙන පැත්තකට හරවාගෙන. සතර මහා භූත ධර්මයන් අඳුනාගන්න බැරි භූතයෝ හතර දෙනෙක් වගේ. හඳුනාගන්නේ නාමධර්ම තුළින්. මහා භූතධර්ම **ආශ්‍රයෙන්** ඇති කරගන්නා රූපසංඥාව කියලා හිතාගන්න. මේ කියන අර විද්‍යාඥයින් හිතාගෙන තියන භෞතික දෙයක් නොවේ මෙතන තියෙන්නේ. ඒ ටික තේරුම් කරන්න අපි බොහෝ අවස්ථාවල වචන යෙදුවා. **'නාමරූපයෙහි නාමය නාම ස්වරූපයකි. නාමරූපයේ' එන රූපය නාමමාත්‍ර රූපයකි'** හොඳට හිතට කාවද්දගන්න නාමරූපයේ එන නාමය නාම ස්වරූපයකි, කියලා කිව්වේ ඔය අපි ලෝකයා කියන ඔරලෝසුවය පුටුවය කියන ඒ විදියේ නම් නොවේ. නමක ස්වරූපය- මුල් ස්වරූපය විතරයි. ප්‍රාථමික ස්වරූපය මොකක්ද අර අන්ධයා හඳුනාගන්නවා වගේ වේදනාව නිසා සංඥාව ඔය ආදී වශයෙන් දැන් කිව්ව නේ. ඊළඟට ඔන්න නාමරූපයෙහි එන රූපය අපි නාමමාත්‍ර රූපයක් කිව්වේ ඒකත් අර විධියට වෙන් කරලා හිතාගන තියන ලෝකයේ තියන දෙයක් හැටියට නොවේ. මේ නාමධර්ම ආශ්‍රයෙන් - නාමධර්ම ආශ්‍රයෙන් දැන් දන්නවා නේ පඨවි. තද ගතිය, බුරුල් ගතිය අනුවයි පඨවි හඳුනාගන්නේ. ඊළඟට උණුසුම් ගතිය සිසිල් ගතිය ඔය ආදී වශයෙන් මහා භූතධර්මයන් හඳුනා ගන්නෙත් නාමවලින්. ඒක නිසා ඇත්ත වශයෙන් **ඒක රූප සංඥාවක්** පමණයි. ඒක නිසයි අපි කිව්වේ

'**නාමමාත්‍ර රූපයක්**'. ඉතින් මේ නාමරූප කියන වචනය හරියට තේරුම්ගත්තා නම් ඒක තේරුම්ගන්න ඕනෑ අන්න අර විඤ්ඤාණයේ වැටෙන පිළිබිඹුවක් පමණයි. දැන් හිතල බලන්න, දැන් ඇහැට වැටෙන දේ. කැමරාව පටන්ගත්තෙත් ඇහේ බබාගෙන් නේ? ඇහේ වැටෙනවා නේ ඡායාවක්. එතකොට ඇහේ බබාගේ වැටෙන ඡායාවට තමා අපි මේ මොළයේ ලස්සණට පෙනෙනවා කියන්නේ. ඒක තමා බුදුරජාණන්වහන්සේ සංඥාව මිරිඟුවක් කීවේ. අතන ලස්සනට පෙනෙන්නේ ඒක එතන තියන නිසා නොවෙයි නේ. ඒ කීවේ ඇස ප්‍රත්‍යය කරගෙන ඇසේ යම් කිසි ස්වභාවයක් නිසා. කොළ පාට කණ්නාඩි දාලා තියෙනවා නම් ඒ විධියට පෙනෙනවා. අන්න ඒ විධියේ දෙයක් එතකොට. මේවා හේතු ප්‍රත්‍ය සම්බන්ධතාව - අර නාමරූපයත් විඤ්ඤාණයත්. අපි විශේෂ වචනයක් යෙදුවා. අපේ වචනයක් නොවේ. අතීතයේ ධර්මයේ සඳහන් වනවා ද්වයතාව. දෙකක් අතරෙයි පැවැත්ම තියෙන්නේ. දෙකක් අතර පැවැත්ම තමා '**වට්ටය**' නමින් හඳුන්වලා තියෙන්නේ. ඒකත් අපි යථා කාලයේ විස්තර කරනවා. වෙළඳ වට්ටම් වගේ. වෙළඳ වට්ටය මේ පින්වතුන් දන්නවා නේ? සැපයුමයි ඉල්ලුමයි අතර තමා මිල ගණන් තියෙන්නේ. ඒ වගේ මුළු මහත් ලෝකයම තියෙන්නේ ඔන්න ඔය විඤ්ඤාණයත් නාමරූපයත් අතර කෙරෙන වට්ටයෙන්.

මුළු මහත් ලෝකයම-හැම ලෝකයක් ගැනම හිතලා බලන්න. මම කෙටියෙන් මෙතන ඉඳලා යන්නේ මොකද, මේවා අපි වෙන තැන්වල කියලා තියෙනවා. හිතන්න සිනමා ලෝකය ගැන. එහෙම නැත්නම් දන් අනිත් 'ලෝක' හදාගන තියෙන්නේ. ක්‍රීඩා ලෝකය, ක්‍රිකට් ලෝකය, ඉස්සර වෙලා හිතමු ක්‍රිකට් ලෝකය ගැන. ක්‍රිකට් ලෝකයේ මොකක්ද වෙන්නේ. අර අහිංසක පිත්තයි බෝලයයි ආදියට පණගැන්වෙන්නේ පිල් දෙකක් බෙදුණාම නේද? එතකොට නීතිරීති තුළින් - ඒවා තමයි නාමධර්ම. ඊළඟට ජය පරාජය පිළිබඳ හැඟීම. ඒක නිසා අන්න ක්‍රිකට් ලෝකය ඇති වන්නේ අර මුළාව තුළයි. 'අපි දෙපිලක් වෙමු.' කියලා එතන ඉඳලයි ක්‍රිකට් ක්‍රීඩාව. එතකොට ක්‍රිකට් ලෝකය එහෙමයි.

ඊළඟට සිනමා ලෝකය ගැන හිතන්න. ඒ අස්ථිර වූ තිරයේ වැටෙන දෙයත් ප්‍රේක්ෂකයාත් අතර තමයි ඒ ලෝකය යන්නේ. අවිද්‍යා අන්ධකාරය ඒකට උපකාර වෙනවා. දැන් අතනදී ක්‍රිකට් ක්‍රීඩාවේදී අමතක කරගන්නවා තමන්ගේ සහෝදරකම්, යාළුකම් ඔක්කෝම අමතක කරලා ඔන්න දෙපිලක් වුණා. එතනදී අර යාළුකම් නැහැ. ඒ මුළාව තමයි අවිද්‍යාව. එතැන ඒ අවිද්‍යාව තුළින් කෙරෙන සංස්කාර තමයි. කාය

සංස්කාර වෙන්න පුළුවන්- දැන් හිතාගන්න ක්‍රිකට් ක්‍රිඩාව පිළිබඳ **කාය සංස්කාර, වචී සංස්කාර**[16]**, මනෝ සංස්කාර** ඒවා තුළින් නේද ඔය ක්‍රිකට් ක්‍රීඩාවක් ඇති වන්නේ. මිනිස්සු මුළා වෙලා දිවි නසාගන්නේ, ඒ ලෝකයක් හදාගෙන අන්තිම මුළාවක් කල්පනා කරලා බලනකොට. තමන්ම හදාගත්තු එකක් තුළ නීතිරීති තුළ, අන්න ඒ වගේ තමා සිනමා ලෝකයත්. ඒක්කෝ තමන් හඳුනන කට්ටිය වෙන්න පුළුවන් රඟපාන්නේ - නමුත් අන්ධකාරය තුළ- මම බොහෝදෙනාගෙන් අසන ප්‍රශ්නයක් චිත්‍රපටියේ රස විඳින වෙලාවට ඩිංගකටවත් හිතෙනවාද මං මේ රස විඳින්නේ අන්ධකාරයට පිං සිද්ධ වෙන්න කියලා. නැහැ. ඒ වෙලාවට අන්ධකාරය මතකත් නැහැ. මොකද අන්ධකාර පසුබිමේ තමයි චිත්‍රපටයක් ක්‍රියාත්මක වෙන්නේ. අර අවිද්‍යා අන්ධකාරය තේරුම්ගන්න පුළුවන්. ඉතින් ඒක නිසා ඔය චලන චිත්‍ර උපමාව- ඒක මගේ උපමාවක් නොවේ බුදුරජාණන් වහන්සේගේ උපමාව. මම ඒක වඩා සවිස්තරව පෙන්නුම් කරලා තියෙනවා. එතකොට ඒ චලන චිත්‍ර ලෝකයේ, සිනමා ලෝකයේ අවිද්‍යා අන්ධකාරය තුළ සංස්කරණයක් කෙරෙනවා ඒ ප්‍රේක්ෂකයා තුළ. ඒක තුළ තමයි සැප දුක් ආදී වින්දන තියෙන්නේ. එතකොට මේ විදියට ඕනෑ තරම් ලෝක හදාගන්න පුළුවන් මේ පින්වතුන්ට. පත්තරේ පෙරළලා බලනකොට එක් එක් ලෝකයක් වෙන්න පුළුවන්. ඒකට අදාළ නාමධර්ම රූපධර්ම තියෙනවා. ඕක තුළයි මේ ජීවිත මායාව යන්නේ.

එතකොට මේ මායාවේ තවත් පැත්තක් වටිනා පැත්තක්, හෙළි කරගන්න අපි ගනිමු උපමාවක්. දාම් ඇදිල්ලක්. දාම් පෙත. මේ ඉදිරියට මං කියන්න යන ටික ඇත්ත වශයෙන් මේකට මම ඒ මූලික ඉඟිය ලබා ගත්තේ - දැන් මේ පින්වතුන් සමහරු අහලා ඇති මහායාන බුද්ධාගම පැතිරිල යාමෙදි ඒ තර්ක විතර්ක ඔස්සේ සීමාන්තිකව යනවා දැකලා එක් පක්ෂයක් ධ්‍යාන විදර්ශනා ආදිය අවධාරණය කරලා, ඒ බුද්ධාගම මේ පින්වතුන් අහලා ඇති සෙන් බුද්ධාගම කියලා කියනවා. 'සෙන්' - ඔය සෙන් බුද්ධාගමේ ආචාර්යවරු මහ පුදුම කට්ටියක්. ඒ ගුරුවරු සමහරවිට ගෝලයින් හික්මවන්නේ ප්‍රහේලිකා දීලා. විසඳන්න බැරි ප්‍රහේලිකා දීලා. අන්තිමට ඒ ප්‍රහේලිකාව තුළින් ඒ අයට ධර්මාවබෝධය ලැබුණා කියලා කියනවා. ඒ ධර්මාවබෝධය- අපි සෝවාන් කියන්නා වාගේ ඒ අය කියන්නේ 'සටෝරි' කියලා. ඔන්න දැන් පසුබිම දුන්නා. ඔන්න ඊළඟට කියනවා යම්කිසි කතන්තරයක්. ඒක සත්‍ය දෙයක් නොවේවා හෝ වේවා යමක් ඉගෙනගන්න පුළුවන්. මෙහෙමයි කථාව. එක්තරා සෙන් ආචාර්යවරයෙක් ඉන්නවා, කීවොත් කරන විධියෙ. හරි සැරයි. ගෝලයින්

බොහොම සැරෙන් හික්මවන්නෙ. ඒ ගෝලයින් දෙන්නෙකුට පැවරුවා එක දවසක්දා පරදින්නේ නැතුව දාම් අදින්න කියලා. ගෝලයෝ දෙන්නට- මං කියවපු කතාවේ 'නම්' නැහැ- මම දැන් දෙනවා නම් දෙකක්. සිංහල නම් දෙකක්. එක්කෙනෙක් **අජිත්**. අනිත් එක්කෙනා **සුමිත්**. එතකොට ගුරුවරයාගේ ගෝලයෝ දෙන්නා- මතක තියා ගන්න එක්කෙනෙක් අජිත්, අනිත් එක්කෙනා සුමිත්. එතකොට මේ අජිත්ටයි සුමිත්ටයි පවරනවා ගුරුවරයා පරදින්නේ නැතිව දාම් ආදින්න ඕනෑ. පරදින කෙනාට මොකද වෙන්නේ? කඩුවකුත් අරගෙනයි මේ ඉන්නේ. බෙල්ල කපනවා එතනම. ඉතින් ගෝලයෝ දෙන්නා දන්නවා, කීවොත් කරන බව දන්නවා මේ ගුරුවරයා. ඉතින් මරබියේ අජිතුයි සුමිතුයි මේ දාම් ඇදිල්ල පටන්ගත්තා. ගුරුවරයා කඩුව අමෝරාගෙන ඉන්නවා. ඔහොම ක්‍රීඩාව යන අතරේ - අජිත් කවදාවත් පැරදුණු කෙනෙක් නොවේ. සුමිත් හොඳ මිත්‍රයෙක්. ඉතින් මම මේ නම් දාන්නේ මේක අර්ථවත් කරන්නයි. ඒ මුල් කථාවේ නැහැ. අජිත් බොහොම පහසුවෙන් ඔන්න දිනන තැනට එනවා. තව ඉත්තන් දෙන්නෙක් ඇද්ද හැටියේ අජිත් දිනනවා. මේ අවස්ථාවේ දැක්කා තමන්ගේ යාළුවා සුමිත් දැන් ඉතින් මැරෙනවා නේද ගුරුවරයා අතින්. මම මගේ ජීවිතය පරිත්‍යාග කරනවා කියලා අජිත් කළේ මොකක්ද? පරදින විධියට ඉත්ත බොරු ඇදිල්ලක් ඇද්ද. බොරු ඇදිල්ලක් ඇද්ද. ඔන්න දැන් ඊළඟ ඇදිල්ල තුළින් වෙන්නේ - ඔන්න හිතාගන්න බොහොම උණුසුම් අවස්ථාවකට එන්නේ. මේ පිරිසටත් විනිශ්චය කරන්න ප්‍රශ්නයක් එන්නේ. දැන් ඊළඟ සැරේ ඉත්ත ඇද්ද හැටියේ අර දිනන්න ගිය අජිත් පරදිනවා. පරදින්න ගිය සුමිත් දිනනවා. අර දිනන්න ගිය, කවදාවත් පැරදුණේ නැති අජිත්ගේ බෙල්ල කපනවා ගුරුවරයා. එක්කෝ ඔළුව පලනවා. දැන් මොකක්ද ගුරුවරයා කරන්නේ? **මොකක්ද ගුරුවරයා කරන්නේ?** මෙන්න මේකයි ගුරුවරයා කළේ. ඒක මහා පුදුම දෙයක් එතැන සිද්ධ වෙන්නේ. ගුරුවරයා පහතට නැමිලා අර දාම් පෙතේ ඉත්තෝ ඔක්කෝම විසුරුවා හැරියා. **ක්‍රීඩාව ඉවරයි. ජය පරාජය නැතිව ක්‍රීඩාව ඉවරයි.** හැබැයි මේ පින්වතුන් හිතන්න පුළුවන් ජය පරාජය නැති වුනා කියලා. නැහැ. **අජිතුත් දිනුවා. සුමිතුත් දිනුවා.** ඔන්න එතැන ඉඳලා වෙනින් පැත්තක් යන්නේ.

කොහොමද දිනුවේ? ඒ කථාව අවසාන වන්නේ ඒ දෙන්නම 'සටෝරි' කියලා කියන ධර්මාවබෝධය ලැබුවා -සෝවාන් වුණා - කියලා. ඇත්ත වශයෙන් සෝවාන් වුණා නම්, කෙහොමද සෝවාන් වුණේ කියන එකයි අපේ විවරණයේ තියෙන්නෙ. ඒ කියන ධර්මාවබෝධය ඇති

වුණේ කොහොමද අර විසුරුවා හැරියට පස්සේ? කවදාවත් පැරදුණේ නැති අජිත් තමන්ගේ ජීවිතය පරිත්‍යාග කළා සුමිත්ට. ඉතාම හොඳ මිත්‍රයෙක් වන සුමිත්ද ද්වේෂයෙන් තොරව තමාගේ ජීවිතය පරිත්‍යාග කළා. 'දැන් ඉතින් මම පරදිනවා, කමක් නැහැ මගේ යාළුවා දිනනවා' කියලා. **එතකොට දෙන්නම අතහැරලා ඉවරයි.** මේ දාම් පෙත තමයි ලෝකය. **ඒ දෙන්නාගේ ලෝකය දාම් පෙතයි.** දාම් පෙතේ ඉන්න ඉත්තන් **ඇත්තන්** වෙලා. **දාම් පෙතේ ඉන්න ඉත්තන් ඇත්තන් වෙලා.** එතකොට ඒ දාම් පෙතයි මේ දෙන්නාගේ ලෝකය. එතකොට මේක **භවයක්**. දාම් පෙත් භවයට හේතුව කුමක්ද? **උපාදානය නේ? උපාදානය නේ?** දෙන්නම ජය පරාජය බලාපොරොත්තුවෙන් නේ මේක අදින්නේ. ඔන්න උපාදානය. එතකොට දැන් මේ අයට අවබෝධය ආ හැටි - ඇත්ත වශයෙන් ඒක උනා නම්- එක පැත්තකින් සුමිත් භය නිසා 'දැන් ඉතින් මැරෙන එක කොහොමත් මැරෙන්න ඕනෑ' කියලා ඒ ජීවිත ආශාව අතහැරියා. **ඒ අතහැරීමත් සම්පූර්ණයි.** අජිත් තමන්ගෙ ජයග්‍රහණයත් එක්කම යාළුවා වෙනුවෙන් ජීවිත පරිත්‍යග කළා. **එතන අතහැරීම සම්පූර්ණයි.** නමුත් අන්තිමට වුනේ මොකක්ද? **කාටවත් මැරෙන්න වුණේ නැහැ. මරණයටයි මැරෙන්න වුනේ. මොකද?** ඒ දෙන්නම අර සෝවාන් ඵලයෙන් **අමෘත අවබෝධය** ලැබුවා ඒ කාරණය ඇත්ත නම්. කොහොමද ඒක වුනේ? අර ක්‍රීඩාව විසුරුවා හැරියාම මේ අයට තේරුණා මේක **මුළාවක්. මහ මායාවක්. හීනෙන් අවදි වුණා වගේ.** මෙච්චර මේ දාඩිය හලාගෙන මේ පෙත ලෝකයක් කරගත්තු නිසා නේ ඉත්තන්ට තැනක් දුන්න නිසා නේ. එතකොට ජය පරාජය නැති අර ක්‍රීඩාව තුළින් ගුරුවරයා කළේ අර මහා පුදුම අන්දමින් ධර්මාවබෝධය දුන්නා. ඒක කෙනෙක් හිතන්නෙ මේ සෙන් බුද්ධාගමේ විතරෙයි තියෙන්නේ කියලා.

දැන් ඔන්න මං කියනවා මේ පින්වතුන්ට ඔයිට කලින් අපි මතත් කරපු ධර්ම කතාවක් - කොතෙකුක් අහලා ඇති. නමුත් ඒකේ ගැඹුර හිතලා නැහැ. **උග්ගසේන නටපුත්‍රයා පිළිබඳ කථාව**. මම කෙටියෙන් මතක් කරනවා. ධම්ම පදයේ තියෙනවා ගාථාවක් **තණ්හා වග්ගයේ- උග්ගසේන** කියලා හැටරියන් උණ ගහ උඩ සර්කස් දක්වන විදියේ මහ පුදුම කෙනෙක්. ඒ සිටු පුත්‍රයෙක්. කොයි තරම් දක්‍ෂද කිව්හොත් හැටරියන් උස උණ ගහක් උඩ සමබරව සිටියා. ඒ අවස්ථාවේ මුගලන් මහරහතන් වහන්සේත් බුදුරජාණන් වහන්සේත් එතෙන්ට ඇවිල්ලා මුගලන් මහරහතන්වහන්සේ අභියෝග කළා. එතකොට නැග්ගට පස්සේ බුදුරජාණන් වහන්සේ ගාථාවක් දේශනා කළා. මොකක්ද ඒ ගාථාව. ටිකක් හිතන්න.

සමබරව ඉන්න නටපුත්‍රයාට බුදුරජාණන් වහන්සේ කළ අභියෝගය මොකක්ද? අර ආචාර්යවරයා කළ එකක් වගේ තමා.

**මුඤ්ච පුරෙ මුඤ්ච පච්ඡතො**
**මජ්ඣෙ මුඤ්ච භවස්ස පාරගූ**
**සබ්බත්‍ථ විමුත්ත මානසො**
**න පුන ජාති ජරං උපෙහිසි**[17]

ඒක අපි සිංහලට නඟලා තියනවා මේ විධියට. මේ පින්වතුන් කියවලත් ඇති.

පෙර - පසුව හැර දමව
මැදද අතහැර දමව
භවයෙ එතෙරටමැ යව
හැම තැනින් විමුත් සිත
ඇතිවැ යළි උපතකට
දිරුමකට පත් නොවෙව

ඔන්න ඔය අදහසයි එතැන තියෙන්නේ. ඒ කියන්නේ නට පුත්‍රයා අර සමබරව ඉන්න අවස්ථාව. මෙතන පෙර-පසුව කියලා කිව්වේ අතීතයත් අනාගතයත්. බැලූ බැල්මට පෙනෙන්නේ දැන් කොහොමද පෙර පසුව අතහරලා නේ ඉන්නේ. මැදත් අතහරින්න කියනවා. මැද අතහැරියොත් වැටෙනවා නේ. නමුත් ඒක දැනගත්තා. මේ බුදුරජාණන් වහන්සේ කියන්නේ අර සෙන් ආචාර්යවරයා කීවා වගේ මෙතන ගැඹුරු දෙයක් කියන්නේ. ඒක තේරුම් අරගෙන තමයි එතකොට - ඒ සමාධිමත් සිත - හැට රියන් උණගහක් උඩ ඉන්න කොයි කරම් සමාධියක් තියෙන්න ඕනැද? ඒ සමාධිමත් සිතට බුදුරජාණන්වහන්සේ අන්න අර විධියට සියුම් විධියේ විදර්ශනාත්මක පණිවුඩයක් දුන්නා. අතීතයයි අනාගතයයි පිළිබඳ කතන්දරයක් නේ අපි කලින් කීවේ. ලෝකයා තුළ තියෙන්නේ 'මම ඉන්නවද? අතීතයේ ඇති වුණාද? ඔය කතන්දර. 'මම' කථා මොකවත් නැහැ. අර උග්ගසේන නට පුත්‍රයාට තේරෙන්න ඇති දැන් එතකොට ඒ සමාධිමත් සිතට - ඒ විදර්ශනාව දියුණු කළ කෙනෙක් වෙන්න ඇති. පෙර පසුව කීවේ අතීතයත් අතහරින්න අනාගතයත් අතහරින්න. වර්තමානයත් අතහරින්න. ගැඹුරුම තැන තමයි වර්තමානය අතහැරීම. ඒක හරියට අර උණගහ උඩ හිටගෙන ඉන්න කෙනා වගේ. නමුත් ධර්මාවබෝධය තුළින්, පොතපතේ

කියන හැටියට, උග්ගසේන නට පුත්‍රයා රහත් වෙලා ඒ උණගහෙන් බැහැලා බුදුරජාණන් වහන්සේට වැන්දා කියලා කියනවා.

අන්න එබඳු අවස්ථාවක බුදුරජාණන්වහන්සේ ඔය කියාපු සියුම් අන්දමේ විදර්ශනාත්මක කර්මස්ථානයක් ඊට නිසි කෙනෙකුට දීම තුළින් මොකද මෙතන තියෙන්නේ. අර කියාපු ද්වයතාවම තමයි. **දෙකක්.** අතීතයත් අනාගතයත් අතරත් දෙකක්. ජය පරාජය අතරත් **දෙකක්.** අර ජය පරාජය ගැන කතාවට අදාළව ලස්සන ගාථාවක් තියෙනවා ධම්මපදයේ සුඛ වග්ගයේ. දැන් අර දෙන්න ජය ලබාගන්න නේ අර තරඟය කළේ. එතකොට ඒක තුළ තියෙන ඒ දුක් සම්භාරය මේ දෙන්නා තේරුම් ගත්තා. ප්‍රත්‍යක්ෂ කර ගත්තා. **උපාදානය නිසයි මේ ඔක්කොම- ජාති ජරා මරණ ඔක්කෝම ඇති වන්නේ කියන එක තේරුම් ගත්තා.** අන්න ඒ කාරණයට අදාළව ධම්ම පදයේ ලස්සණ ගාථාවක් තියෙනවා.

**ජයං වෙරං පසවති**
**දුක්ඛං සෙති පරාජිතො**
**උපසන්තො සුඛං සෙති**
**හිත්වා ජය පරාජයං**[18]

'ජයං වෙරං පසවති,' ජය වෛරය බිහි කරයි. ජය වෛරය ප්‍රසූත කරනවා. ඇති කරනවා. '**දුක්ඛං සෙති පරාජිතො**' පරාජිතයා දුක සේ හොවිනවා - නිදාගන්නවා. '**උපසන්තො සුඛං සෙති**' උපශාන්ත පුද්ගලයා සුවසේ නිදනවා. '**හිත්වා ජය පරාජයං**' ජයයි පරාජයයි දෙකම අතහැරලා. **ජයයි පරාජයයි දෙකම අතහැරලා.** අන්න ඒක තමයි අවසානයේ අර කට්ටිය තේරුම්ගත්තේ. ජය පරාජය කියන මේ ද්වයතාව තියෙන්නේ අවිද්‍යාව මුල් කරගෙනයි. අර ක්‍රිකට් ක්‍රීඩාවේ ජයග්‍රහණය වගේ. කීදෙනෙක් පිස්සු වැටෙන්න ඇත්ද? ඔය ක්‍රිකට් පිස්සුකාරයින්. අනිත් ඒවාත් එහෙමයි. සිනමා පිස්සුවත්, ඒ වගේම ටෙලි නාට්‍ය පිස්සුවත් ඔය විධියට ඔක්කෝම. ඇත්ත වශයෙන් ඒකයි බුදුරජාණන් වහන්සේ කීවේ ලෝකයා උන්මන්තකයි කියලා. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරලා තියෙනවා පෘථග්ජනයා '**සබ්බෙ පුථුජ්ජනා උම්මත්තකා**' කියලා. අපි ඒකට කැමති නැහැ එහෙම කියනවාට. අන්න අරකයි හේතුව. එතකොට අවිද්‍යාව තුළ අමතක වෙනවා. සිනමා ලෝකයේ අන්ධකාරය තුළ ඇති කරගත්තා වගේ ක්‍රීඩා ලෝකය තුළත් පිල්. පිල්වලට ආවඩන කට්ටියත්, පිල්වලට බෙදුනු කට්ටියත්, ඊළඟට ලෝකයක් හදාගෙන ඕක තුළ තමයි වෛර ක්‍රෝධ ඇති වන්නේ.

එතකොට මේ පින්වතුන් කල්පනා කරන්න ඕනෑ මේ පටිච්චසමුප්පාද ධර්මය පොතේ ගුරාගේ කොටසක් හැටියට හිතලා කටපාඩම් කරගෙන අනුලෝම පටිලෝම කීම නෙවෙයි. ඒක තුළ තිබෙන ගැඹුරු අර්ථය- අන්න අර කියන **අවිද්‍යාව** නිසා **සංස්කාර** ඇති වෙනවා කියන එක තේරුම් ගන්න ඕනෑ. සංස්කාර කියන වචනයේම තියෙනවා රැවටිලි ස්වභාවයක්. සකස් කරනවා. අතීතයේ සමහර විට යොදනවා සැරසීම්, අරඇඳීම් කියන අර්ථය තියෙන සංස්කාර. ඒවා කයෙනුත් කෙරෙනවා වචනයෙනුත් කෙරෙනවා මනසිනුත් කෙරෙනවා. නාට්‍යයේත් එහෙමයි. ක්‍රිකට් ක්‍රීඩාවේත් එහෙමයි. අනිත් ඒවායේත් එහෙමයි. එතකොට අන්න ඒ සංස්කාර තුළින් තමයි විඤ්ඤාණ මායාව. විඤ්ඤාණ මායාවට අනිත් පැත්තෙන් තියෙන්නේ අන්න අර කියපු නාමරූප ධර්ම. වේදනා සඤ්ඤා චේතනා ඵස්ස මනසිකාර. ඊළඟට අර රූපය ආශ්‍රයෙන් ගත්තු අර ඉත්තන් වගේ. දැන් බලන්න අර **ඉත්තන් ඇත්තන් වුනා නේ.** ඒත් පඨවි, ආපෝ, තෙජෝ, වායෝ. අර කොහෙවත් නැති ඉත්තෝ වගයක්. නමුත් ඒව ඇත්තන් වුනා නේ. ඒ අන්න අර කියාපු මහාභූත ධර්ම ආශ්‍රයෙන් ගත්තු රූපයයි. රූප සංඥාව. ඔය නාමරූපයත් විඤ්ඤාණයත් අතරෙයි පටිච්ච සමුප්පාදයේ ගැඹුරුම තැන තිබෙන්නේ. ඒකට තමා **දිය සුළිය** කියලා කියන්නේ, ඔය දිය සුළිය ගැන අපට පණ තිබුනොත්, මේ අයට පින තිබුනොත්, සමහර විට තව ටිකක් සවිස්තරව ඊළඟ සැරේ අහන්න ලැබේවි.

දැන් ඔන්න මේ තරමින් තේරුම් ගන්න පටිච්ච සමුප්පාද ධර්මය කියලා කියන්නේ දැන් මේ කාලයේ බොහෝ දෙනා තෝරන ආකාරයට අර දොළහ - අවිජ්ජා සංඛාරා එක පැත්තකට දාලා ඊළඟට භව ජාති ජරා මරණ අනිත් පැත්තට දාලා ඔය විධියට තෝරන තේරවිල්ලක් නොවේ. ඒ ක්ෂණිකවම අවිද්‍යාව නැති වෙනවත් එක්කම සංස්කාර නැති වෙනවා. සංස්කාර නැති වෙනවත් එක්කම විඤ්ඤාණය. විඤ්ඤාණය කිඳා බහිනවා වගේ දෙයක්. විඤ්ඤාණය නැති වෙනවා කියනකොට මැරෙනවා කියලා කෙනෙක් හිතන්න පුළුවන්. මැරෙන එකක් නොවේ ඒ කිව්වේ සංඛත විඤ්ඤාණය නැති වෙනවා. ඒ ටික තමයි අපි කිව්වේ අනිදස්සන විඤ්ඤාණය ආදී වශයෙන් ඔය ධර්මයේ යට වෙලා තිබුණ පැත්තක්. ඒ කියන්නේ නාමරූපයෙන් මිදුනු විඤ්ඤාණයක් තියෙනවා. ඒ කියන්නේ විඤ්ඤාණ සංසිඳීමක් ඒ රහතන්වහන්සේලා තුළ. මොකද විඤ්ඤාණය තුළයි ලෝකයා පටු වෙලා බැඳිලා ඉන්නේ.

මේ විඤ්ඤාණය කියන එක භය ආකාරයි.[19] ඇහෙන් දකින ලෝකය,

කනෙන් අහන ලෝකය එහෙම ගත්තොත් බුදුරජාණන් වහන්සේ ලෝකය දක්වලා තියෙන්නේ සළායතනය ආශ්‍රයෙන්. **සළායතන ලෝකයයි[20] ලෝකය ඇත්ත වශයෙන්ම.** ඔය දැන් විද්‍යාඥයින් දක්වන ලෝකය නොවෙයි. ඒ ගොල්ලන්ටත් දැන් තේරීගෙන ඇවිල්ල. ඇහින් දකින ලෝකය, කනින් ඇහෙන ලෝකය ඔය ආදී වශයෙන් අන්තිමට හිතෙන් මවන ලෝකය. **ඕකයි ලෝකය**. එතකොට මේ ලෝකය ඇති වුනේ මෙතන නම්- මතක තියාගන්න- සළායතනය නාමරූපය ප්‍රත්‍යය කරගෙනයි ඇති වෙන්නෙ. එතකොට විඤ්ඤාණයත් නාමරූපයත් අතර වෙච්ච අර බෙදීම, දෙබිඩි වීම, ඒ ද්වයතාව දිගටම යනවා. ඒක අජ්ඣත්ත, බාහිර වශයෙන්, ඇස ආධ්‍යාත්මික ආයතනයයි. රූපය බාහිර ආයතනයයි. දෙකම මහා භූත ධර්මවලින් හැදිල තියෙන්නේ. නමුත් මේකට වැඩි තැන දෙනවා, මේ **සවිඤ්ඤාණක කය** කියන එකට. ඊළඟට ඒක ඔස්සේ යන ඒ සංඥාව තමා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරලා තියෙන්නේ මිරිඟුවක් කියලා. මේ 'ඇහේ-බබාගේ', 'කනේ බෙරේට' හැඟෙන ශබ්දය තමයි අපි මේ සින්දුව කියලා ගන්නේ. ඔය විධියට අනෙක් ඉන්ද්‍රියයන් ඒ ඒ ස්පර්ශ අවස්ථාවේ තිබෙන අනවබෝධය නිසා අන්න අර වේදනා සංඥා ආදී වශයෙන් ඔහොම ලෝකයා භවයේ කරකැවෙනවා කියලා බුදුරජාණන් වහන්සේ ලෝකයාට ප්‍රථම වරට පෙන්වලා දුන්නා. එතකොට ඒ පෙන්වා දෙන්න කලින් **උන්වහන්සේ මේක ලෝකයාට කොහොමද තේරුම් කරන්නේ කියලා වෙන්න ඕනෑ සත් සතියක්ම ඒ කාලය තුළ මේ පටිච්ච සමුප්පාද ධර්මය අනුලෝම වශයෙන්, පටිලෝම වශයෙන්, අනුලෝම පටිලෝම වශයෙන් මෙනෙහි කළේ.** මේක ලෝකයාට මේ භාෂාවට දාලා පෙන්නුම් කරන්නේ කොහොමද කියලා. ඒ තරම් ගැඹුරු ධර්මයක්. ඒ නිසා මේ පින්වතුන් කල්පනා කරන්න ඕනෑ මේවා වචන හැටියට සලකන්නේ නැතුව තමන්ගේ ජීවිතවලට එකතු කරගෙන, එයින් නවතින්නේ නැතිව මේ ධර්ම මාර්ගයේ යමින්- ඒකට යන මාර්ගයට මේ පින්වතුන් අවතීර්ණ වෙලා තියෙන්නේ. සීල, සමාධි, ප්‍රඥා. ඒ හැරෙන්න වෙන කිසිම ක්‍රමයක් නැහැ මේ ධර්මය තේරුම්ගන්න. අතීතයේ යම් තාක් ඒ රහතන් වහන්සේලා ඇතුළු බෞද්ධ ගිහි පින්වතුන් හෝ ගිහි පින්වතියන් වේවා ධර්මාවබෝධය කළා නම් ඒ සීල, සමාධි, ප්‍රඥා තුළින්. අදත් එහෙමයි. ඒ නිසා මේක ඔය හිතන විධියට වෙන - ක්ෂණික විධියට කිච්චයි කියලා - ඒ අනියම් විධියට ලබන දෙයක් නොවේ.

කෙසේ හෝ වේවා මේ ධර්මතාව වෙනයි, ධර්මයේ නිදර්ශන වෙනයි, කියලා තේරුම්ගන්න ඕනෑ මේ දොළොස් ආකාර පටිච්ච සමුප්පාදයේ

පෙන්වලා තියෙන. ඒ සඳහා මේ පින්වතුන් ඉදිරියට සතිපට්ඨාන භාවනාදිය[21] කරනකොට ඉබේටම තේරෙයි මේ කියාපු **'අජ්ඣත්ත බහිද්ධා'** ඇතුළත පිටත ආදිය පිළිබඳව බුදුරජාණන් වහන්සේ 'ඇති වීම් නැති වීම්' ආදිය පිළිබඳව මතු කරලා දීලා තියෙන හැටි. ඒ විදර්ශනාත්මක අවබෝධය අතීතයේ ලබපු අයට, උග්ගසේන වගේ අයට, බුදුරජාණන් වහන්සේ ක්ෂණිකව ලබා දුන්නා. නමුත් හැම කෙනාම අර විධියට 'රිදී හැන්ද' කටේ ඇතිව උපන්නයි කියලා හිතන්නෙ නැතිව ඒ වෙනුවෙන් උත්සාහ කරන්න ඕනෑ, වෙහෙස දරන්න ඕනෑ, සීලයෙන්ම පටන්ගෙන.

එතකොට අද දවසේ හොඳ ආරම්භයක්. මේ පින්වතුන් බොහෝ දෙනෙක් වටිනා සීලයක් සමාදන් වුණා. ඊළඟට අපි හිතනවා බණ භාවනා කරන්න ඇති මේ කාලය තුළ. මේ පින්වතුන් බලාපොරොත්තු වන උත්තමාර්ථය වන අමා මහ නිවන ලබා ගැනීමට මේ අපේ දේශනාවත් විදර්ශනාත්මක වශයෙන් උපකාරවත් වේවා කියා ප්‍රාර්ථනා කරනවා. මෙතෙක් මේ දේශනාව තුළින් අවීචියේ සිට අකනිට්ඨාව දක්වා යම් සත්ත්වයෙක් ධර්ම දේශනාමය ධර්ම ශ්‍රවණමය කුසලය අනුමෝදන් වීමට කැමති නම්, ඒ අනුමෝදන් වීම තුළින් ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවනින් සැනසේවා. මේ පින්වතුන්ටත් මේ භවයේදීම කල් නොයවාම උතුම් තත්ත්වයන් ලබාගැනීමට මේ දේශනාව උපකාරවත් වේවා කියා ප්‍රාර්ථනා කරනවා. මේ ගාථා කියන්න.

**එත්තාවතා ච අම්හෙහි...**

## පාදක සටහන්

1. බොධි සූත්‍ර 1,2 සහ 3, උදාන පාළි, ඛුද්දක නිකාය - 1, 130, 132 සහ 134 පිටු (බු.ජ.ත්‍රි. 24)
2. බොධි සූත්‍රය - 1, උදාන පාළි, ඛුද්දක නිකාය - 1, 130 පිට (බු.ජ.ත්‍රි. 24)
3. සබ්බාසව සූත්‍රය, මජ්ඣිම නිකාය - 1, 18-28 පිටු (බු.ජ.ත්‍රි. 10)
4. බොධි සූත්‍රය - 2, උදාන පාළි, ඛුද්දක නිකාය - 1, 132 පිට (බු.ජ.ත්‍රි. 24)
5. බොධි සූත්‍රය - 3, උදාන පාළි, ඛුද්දක නිකාය - 1, 132 පිට (බු.ජ.ත්‍රි. 24)
6. බොධි සූත්‍රය - 3, උදාන පාළි, ඛුද්දක නිකාය - 1, 134 පිට (බු.ජ.ත්‍රි. 24)
7. පධාන සූත්‍රය, සුත්ත නිපාත, 128 පිට (බු.ජ.ත්‍රි. 25)
8. පරමත්ථදීපනී (හේ.මු.) - 6, 245 පිට
9. මාරධීතු සූත්‍රය, සංයුත්ත නිකාය - 1, 230 පිට (බු.ජ.ත්‍රි. 13)
10. පච්චය සූත්‍රය, සංයුත්ත නිකාය - 2, 40 පිට (බු.ජ.ත්‍රි. 14)
11. මහා වග්ගය - 1, 84 පිට (බු.ජ.ත්‍රි. 3)
12. ධම්මචක්කප්පවත්තන සූත්‍රය, සංයුත්ත නිකාය 5(2), 274 පිට (බු.ජ.ත්‍රි. 17(2)
13. සම්මා දිට්ඨි සූත්‍රය, මජ්ඣිම නිකාය - 1, 126 පිට (බු.ජ.ත්‍රි. 10)
විභඞ්ග සූත්‍රය, සංයුත්ත නිකාය - 2, 6 පිට (බු.ජ.ත්‍රි. 14)
14. මහාවෙදල්ල සූත්‍රය, මජ්ඣිම නිකාය - 1, 686 පිට (බු.ජ.ත්‍රි. 10)
15. ඵෙණපිණ්ඩූපම සූත්‍රය, සංයුත්ත නිකාය - 3, 244 පිට (බු.ජ.ත්‍රි. 15)
16. සංචෙතනා සූත්‍රය, අංගුත්තර නිකාය - 2, 306 පිට (බු.ජ.ත්‍රි. 19)
17. ධම්මපදය, 348 ගාථාව, ඛුද්දක නිකාය - 1, 110 පිට (බු.ජ.ත්‍රි. 24)
18. ධම්මපදය 201 ගාථාව, ඛුද්දක නිකාය - 1, 76 පිට (බු.ජ.ත්‍රි. 24)
19. විභඞ්ග සූත්‍රය, සංයුත්ත නිකාය - 2, 4 පිට (බු.ජ.ත්‍රි. 14)
20. ලොක සූත්‍රය, සංයුත්ත නිකාය - 1, 76 පිට (බු.ජ.ත්‍රි. 13)
21. මහා සතිපට්ඨාන සූත්‍රය, දීඝ නිකාය - 2, 436-503 පිටු (බු.ජ.ත්‍රි. 8)

# 02 වන දේශනය

# 02 වන දේශනය

## (පහන් කණුව ධර්ම දේශනා අංක 184)

## 'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

කුතො සරා නිවත්තන්ති - කත්ථ වට්ටං න වට්ටති
කත්ථ නාමං ච රූපං ච - අසෙසං උපරුජ්ඣති

යත්ථ ආපො ච පඨවී - තෙජො වායො න ගාධති
අතො සරා නිවත්තන්ති - එත්ථ වට්ටං න වට්ටති
එත්ථ නාමං ච රූපං ච - අසෙසං උපරුජ්ඣති

-සර සු., දෙවතා සංයුත්ත, සං.නි.[1]

සැදැහැවත් පින්වතුනි,

සසර පැවැත්ම එකම වට වළල්ලක යාමක් බව තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලෝකයාට හෙළි කර වදාළා. සංසාර වට්ට කියන වචනයේ නියම අර්ථයත් ඒකයි. සංසරණය නිස්සරණය කියන වචන දෙකෙන් එළිදරව් වෙන්නෙත් වට වළල්ලක කරකැවීම සහ එයින් මිදීම කියන අර්ථයයි. දීර්ඝ කාලයක් එකම වටවළල්ලක කරකැවෙන කොට එක්තරා '**කරකැවිල්ලක්**,' **ජවයක්**, ඇති වෙනවා. ඒ නිසාම ඒ වටවළල්ලෙන් මිදීම ඉතාමත් දුෂ්කර කාර්යයක්. තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ පටිච්ච සමුප්පාද ධර්මය තුළින් ලෝකයාට හෙළි කර වදාළේ ඒ වටවළල්ලේ යාමේ හේතුවත් එයින් මිදීමේ මාර්ගයත් කියන දෙකයි.

අද මේ අපි මාතෘකා කරගත්තු ගාථා දෙකේ අඩංගු වෙන්නෙත් අන්න අර සංසරණය නිස්සරණය කියන ඒ දෙපැත්තයි. මේ ගාථා දකින්න ලැබෙන්නේ සංයුත් සඟියේ දේවතා සංයුත්තයේ. මේ ගාථා දෙකෙන් පළමුවෙනි ගාථාවේ තියෙන්නේ එක්තරා දේවතාවෙක් බුදුරජාණන් වහන්සේගෙන් ඇසූ ගැඹුරු ධර්ම ප්‍රශ්නයක්. දෙවැනි ගාථාවේ බුදුරජාණන් වහන්සේ ඊට දුන්න පිළිතුර දැක්වෙනවා. ඒකේ අර්ථය, සාමාන්‍ය අර්ථය සලකාගන්න බලමු.

**කුතො සරා නිවත්තන්ති**
**කත්ථ වට්ටං න වට්ටති**

කොතනින් දියවැල් නවතීද? '**කුතො සරා නිවත්තන්ති -කත්ථ වට්ටං න වට්ටති**'. කොතැනක දිය සුළිය නොකරකැවේද?

**කත්ථ නාමං ච රූපං ච**
**අසෙසං උපරුජ්ඣති**

කොතනක නාමයත් රූපයත් සම්පූර්ණයෙන්ම උපරෝධනය වෙයිද? වළක්වාලනු ලැබේද? ඒ දේවතාවා ඇසූ ප්‍රශ්නයයි.

ඔන්න බුදුරජාණන් වහන්සේ දෙන පිළිතුර

**යත්ථ ආපො ච පඨවි**
**තෙජො වායො න ගාධති**

යම් තැනක ආපො, පඨවි, තෙජො, වායො කියන මහා භූත ධර්මයන්- න ගාධති කියල කියන්නේ ප්‍රතිෂ්ඨාවක් නොලබයිද? නොලබාද?

**අතො සරා නිවත්තන්ති.**

අන්න මෙතනිනුයි දියවැල් නවතින්නේ.

**එත්ථ වට්ටං න වට්ටති**

මෙතනයි ඒ දිය සුළිය කරකැවෙන්නේ නැත්තේ.

**එත්ථ නාමං ච රූපං ච**
**අසෙසං උපරුජ්ඣති**

මෙතනයි නාමයයි රූපයයි සම්පූර්ණයෙන්ම උපරෝධනය වන්නේ. වළක්වාලනු ලබන්නේ. ඔන්න එතකොට ඒ ගාථා දෙකේ සාමාන්‍ය අර්ථය අපි කිව්වා.

මේ පින්වතුන්ට පේනවා ඇති, තේරෙනවා ඇති, ඉබේටම මේක එක්තරා විධියක ප්‍රහේලිකා ගාථා දෙකක්. ඉතින් මේ ගාථා දෙකේම තියන වටිනාම වචනය අපට පේන හැටියට '**වට්ටං**' කියන වචනයයි. අර වටවළල්ලේ යාම කරකැවීම කියන අර්ථය ඒකේ තියෙනවා. ඒ වගේම දිය වැල් සම්බන්ධ වටවළල්ලේ යාමක් මෙතන කියවෙන්නේ. ඇත්ත වශයෙන්

මෙන්න මේ කාරණය නිසා තමයි අපි මේ මෑතක ඉඳලා 'පටිච්චසමුප්පාද ධර්මය' තේරුම් කරන්න දිය සුළිය උපමාවක් මතුකර ගත්තේ. බුද්ධ දේශනාවට විරුද්ධ එකක් නොවේ ඒක. නමුත් අවාසනාවකට වගේ මේ පින්වතුන් බැලුවොත් මේ ගාථාවේ අර්ථය ත්‍රිපිටක පරිවර්තන ග්‍රන්ථවල දකින්න ලැබෙන්නේ මෙන්න මෙහෙම එකක්.

'**කත්ථ වට්ටං න වට්ටති**' කියන්නේ සසර වැහි කොහි නොවසීද කියලා. කොයි තරම් දුර්වල එකක්ද? **කත්ථ වට්ටං න වට්ටති** කියන්නේ. සසර වැහි කොහි නොවසීද කියලයි. මේ වැහි කතාවෙන් පටිච්චසමුප්පාදයේ ගැඹුරු පැත්තක් ආවරණය වෙලා තියෙනවා, වැහිලා යනවා. ඉතින් මෙන්න මේ වට්ට පිළිබඳ කතන්දරයට අදාළව අපි නොයෙකුත් දේශනාවල මේ පින්වතුන්ට කියලා ඇති- ගිය දේශනාවෙත් යම් ප්‍රමාණයකට- අර දිය සුළිය පිළිබඳ උපමාව. අද වඩාත් සවිස්තරව ඒ ගැන කියන්න බලාපොරොත්තු වෙනවා.

දිය සුළියක් කියන එක, අපි හිතමු, ගඟක හැදෙන ආකාරය අපිට හිතාගන්න පුළුවන් නම් ඒක මේ විධියටයි වෙන්නේ. ගඟක වතුර මහ ජල කඳ සාමාන්‍යයෙන් පහළට ගලා බැසීමයි සිරිත. නමුත් යම් කිසි දිය වැලක් විපරීත අන්දමින්, අස්වාභාවික අන්දමින්, මහ ජලකඳට එරෙහිව යන්න යම් උත්සාහයක් දරනවා. ටික දුරක් ගියාට පස්සේ -කරන්න බැරි වැඩක් මේ කරන්න යන්නේ- ගිහිල්ලා අන්තිමට අර මහා ජල කඳේ හැපිලා, තෙරපිලා, වට රවුමේ ගිහිල්ලා, විසි වෙලා, වටරවුමේ ගිහිල්ලා ආපසු අර වතුරෙන්ම තල්ලු වෙලා ආයෙත් උත්සාහ දරනවා ඉස්සරහට යන්න. ටිකක් ඒක සලකාගන්න පුළුවන් මේ පින්වතුන්ට. හිතාගන්න. ඒ කරන නිෂ්ඵල ප්‍රයත්නය තුළින් වෙන්නේ අන්තිමට කලක් යනකොට දිය සුළියක් බවට පත් වෙනවා. ඒ දිය සුළිය ඉස්සරහට යන්න බැරි නිසා දිය සුළියේ ආව ජවය අන්තිමට එක තැන කරකැවෙන ජවයක් බවට පත් වෙනවා. ඒ එක්කම ඒක පහළට හාරගෙන හාරගෙන යනවා. පතුල පැත්තට හාරගෙන හාරගෙන ගිහිල්ලා ඒකට මේ පින්වතුන් දන්නවා යොදන වචනය **පාතාලයක්**. දියසුළියක් තියන තැනක පාතාලයක් යටින් තියෙනවා. එතකොට ඒ පාතාලයක් හැදෙනවත් එක්කම තවත් දෙයක් සිද්ධ වෙනවා. එක්තරා **ඌනතාවක්**. උඩින් වතුර හරියේ ඌනතාවක් - අඩුවක්- ඇති වෙනවා. ඒක පුරවා ගන්න මහ භයානක **ආකර්ෂණ ශක්තියක්** දිය සුළියකට ඇතිවෙනවා. ඒක තමයි කෙනෙක් භය වන්නේ, ඔය පීනන කොට එහෙම දිය සුළියකට අහු වුනොත් ඉවරයි කියලා. ඒ

එන එන එකක් ඔක්කොම ඇතුළට ඇදගන්න, ඒ නිම්වළල්ලට අහු වෙන හැම එකක්ම ඇදගන්න ආකර්ෂණ ශක්තියක් **උපාදානයක්** ඇති වෙනවා දිය සුළියට. ඉතින් ඒ වගේම මේ දිය සුළියේ ක්‍රියාකාරීත්වය ගැන හිතලා බලන කොට එතන තියෙන විශේෂත්වය, ඒක එක්තරා **ක්‍රියාකාරී මධ්‍යස්ථානයක්** බවට පත් වීම නිසාම අපට ගඟක 'අතන' 'මෙතන' කියලා පෙන්වන්න පුළුවන් ක්‍රියාකාරී මධ්‍යස්ථානයක් බවට පත් වෙනවා. 'අතන' 'මෙතන' කියලා පෙන්වන්න පුළුවන්.

ඉතින් මේ දිය සුළිය මේ විධියට යන අතරේ කාලයක් තිස්සේ අර නිම්වළල්ලත් පළල් වෙනවා. ඔක දැන් -අපි මේ කිව්වේ දිය සුළිය ආශ්‍රයෙන් කිව්වේ. හිතාගන්න දැන් ඒකට උපමේය හැටියට කිව්වොත් ලෝක ස්වභාවය අනිත්‍යතාවයි. නමුත් මේ සත්ත්වයා තුළ තියෙන විපල්ලාස ධර්ම[2] අනිත්‍යය නිත්‍ය හැටියට හැඟීම, අශුභ දේ ශුභ හැටියට හැඟීම, සැලකීම, දුක් සහිත දේ සැප හැටියට සැලකීම, අනාත්ම දේ ආත්ම හැටියට සැලකීම කියන ඒ විපල්ලාස ධර්මවලින් පෙන්නුම් කරන ඒ අවිද්‍යාව නිසා යම් කිසි සංස්කාර වේගයක් ඉස්සරහට තල්ලු වෙලා යනවා. ඉදිරියට යන්න බැරි වුනාම අර විධියට කරකැවිලා ඇවිල්ලා අන්න ඒ සංස්කාර ඒ ජවය තුළින් තමයි අන්න අර දිය සුළිය ක්‍රියාත්මක වෙන්නේ.

ඔන්න දැන් අර අවිද්‍යා, සංස්කාර දෙක තුළින් අර නාමරූප-විඤ්ඤාණ කියන එක තේරුම්ගන්න උපකාර වෙනවා. අපි කිව්වානෙ බොහෝ අවස්ථාවල විඤ්ඤාණයත් නාමරූපයත් අතරයි මේ දිය සුළිය පවතින්නේ කියලා. ඒ එක්කම අපි බොහෝ අවස්ථාවල පෙන්වා දුන්නා දැන් බොහෝ දෙනා තෝරන ආකාරයට නොවේ නාමරූප[3] කියන එක පෙන්නුවේ. කෙටියෙන් ගත්තොත් ඒ නියම නාමයක් නොවේ. **නාම ස්වරූපයක්**. නියම රූපයකුත් නොවේ. **නාමමාත්‍ර රූපයක්**. ඒ කිව්වේ නාම ධර්ම කියන ඒක තව දුරටත් පස්සේ තෝරනවා. සාමාන්‍යයෙන් දක්වනවා නම් වේදනා, සංඥා, චේතනා, ඵස්ස, මනසිකාර කියන ඒ හිත පිළිබඳ යම් ධර්ම පහක්. ඒක ආශ්‍රයෙන් තමයි ඊළඟට අර මහාභූත ධර්ම - පඨවි, ආපො, තේජො, වායො කියන මහා භූත ධර්ම හඳුනාගන්නේ, නාම ධර්ම තුළින්. ඒකයි ඒකට නාමය කියලා කියන්නේ. ඒ හැඳින ගැනීම තුළින් රූප පිළිබඳ සංඥාවක් ඇති කරගන්නවා. එතකොට මේ දිය සුළිය මිථ්‍යා -එහෙම නැත්නම්- ව්‍යාජ දෙයක්. ඇත්ත වශයෙන් සංස්කාර කියන වචනයේ පවා තියෙනවා හිතලා බැලුවොත් මේ පින්වතුන්ට

අර ඇදීම, සකස් කිරීම. ඒ විධියේ ව්‍යාජ බවක් හඟවන විශේෂයෙන්ම නාට්‍ය වේදිකා ආදියට අදාළව අපි නොයෙකුත් උපමා දීලා තියෙනවා. අවිද්‍යාව තුළින් උසිගැන්වෙන සංස්කාර වේගය අන්තිමට කරන්නේ අර විඤ්ඤාණයත් නාමරූපයත් අතර තියෙන අර තෙරපුම. අපි ඒක නොයෙකුත් ආකාරයෙන් පසුගිය දේශනාවේදීත් දාම් ඇදිලි, ඒදණ්ඩ උඩ බල්ලා ආදී නොයෙකුත් දේවල්වලින් පෙන්නුවා දිය සුළියේ ක්‍රියා කාරීත්වයම ද්වයතාවයක් බවට පත් වෙලා අන්තිමට මේ පැවැත්මක් මවා පානවා. කොටින්ම කියන්නේ අර විපරීත පැවැත්මක් මවා පානවා දිය සුළිය. ඒකයි අර **'අතන' 'මෙතන'** කියලා කිව්වේ. විපරීත පැවැත්මක් අර ගඟ තුළ. ඉතින් මෙන්න මේක ආශ්‍රයෙන් පටිච්ච සමුප්පාද ධර්මයේ අපි අර මූලික කාරණා ටික මතු කර දුන්නේ.

ඉතින් මේ උපමාව තව දුරටත් කල්පනා කරලා බලනකොට විඤ්ඤාණයේ සවභාවය, විඤ්ඤාණය බුදුරජාණන් වහන්සේ හඳුන්වන්නේ මායාවක් හැටියට.[4] එතකොට ඒ මායාව මොකක්ද? ඒ විඤ්ඤාණයේ පිළිබිඹු කරන ස්වභාවයක් තියෙනවා. හරියට වතුරක් වගේ. ඒ පිළිබිඹු කරන ස්වභාවය නිසා විඤ්ඤාණයේ අර නාම රූපය පිළිබිඹු වෙනවා. ලෝකයා මේක සත්‍යයක් හැටියට ගන්නවා. ඇත්ත නමක් ඇත්ත රූපයක් හැටියට අරගෙන ඔන්න එතැන ඉඳලා තමයි අර පටලැවිල්ල තියන්නේ. ඒකට අපි නොයෙකුත් විධියට ක්‍රිකට් ක්‍රීඩා, දාම් ඇදිලි ආදී වශයෙන් දෙපිලකට බෙදිලා කරන එක්තරා තරඟයක් හැටියටත් තේරුම් කළා. ඊට වඩා පැහැදිලි වශයෙන් අර 'ඒදණ්ඩ උඩ බල්ලා' උපමාව දැන් හුඟක් රටෙත් ගිහිල්ලා තිබෙන බව පෙනෙනවා. 'ඒ දණ්ඩ උඩ බල්ලා' නොයෙකුත් ආකාරයෙන් දේශනාවල අහන්න ලැබෙනවා.

ඉතින් ඒ වගේම ඊට වඩා මෑතකදී අපි මේ පින්වතුන්ට බොහොම රසවත් විධියේ උපමාවකුත් මතුකළා. ග්‍රීක දේව කතාවක් ආශ්‍රයෙන්. නාසිසස් කියන තරුණයා, රූමත් තරුණයෙක්, එතෙක් තමන්ගේ මූණ දැකලා නැති තරුණයෙක්. කැලේ යනකොට පොකුණකට නැඹුරු වුනාම ඒ දෙවඟනක් කියලා රැවටිලා තමන්ගේ රූපයට- නැවත නැවතත් වැළඳ ගන්න උත්සාහ කරලා අන්තිමට එතැනම ආලයෙන්ම ජීවිතය පූජාකළා, තමන්ගේම රූපයට, පිළිබිඹුවට. අන්න එතකොට ඒ විධියේ දෙයක් මේ විඤ්ඤාණයත් නාමරූපයත් අතර පවතින බව පෙන්නුම් කරන්නයි අපි ඒ ටික කිව්වේ.

ඊළඟට දැන් එතකොට එයින් මිදෙන්නේ කොහොමද? ඔන්න ඔය ප්‍රශ්නයයි දැන් ඊළඟට තියෙන්නේ. එතනදී අපට වටිනා සූත්‍ර රාශියක් දැක්වෙනවා කොටින්ම කියතොත් බුද්ධ දේශිත සූත්‍ර ගණනාවකම. අපි මේ කියාපු එක අපි අමුතුවෙන් හදපු එකක් නොවේ. විඤ්ඤාණයත් නාමරූපයත් අතර අඤ්ඤමඤ්ඤ පච්චයතාවක් -අන්‍යෝන්‍ය ප්‍රත්‍යතාවක් - තිබෙන බව බුද්ධ දේශනාවේ තිබෙනවා. බුද්ධ දේශනා කීපයකම විඤ්ඤාණයත් නාමරූපයත් අතර අන්‍යෝන්‍ය ප්‍රත්‍යතාවක් ඒ කියන්නේ විඤ්ඤාණය නිසා නාමරූපය පවතිනවා. නාමරූපය නිසා විඤ්ඤාණය පවතිනවා. ඒකයි අපි දිය සුළියකට උපමා කළේ. මේ දිය සුළියෙන් මිදීමේ මාර්ගය, එහෙම නැත්නම් සංසාර වටවළල්ලෙන් මිදීමේ මාර්ගය හරි ලස්සනට අපට දකින්න ලැබෙනවා මහාපදාන සූත්‍රයේ.[5] අපේම බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා අතීතයේ විපස්සී බුදුරජාණන් වහන්සේ අපේ බුදුරජාණන් වහන්සේ වගේ දීර්ඝ කාලයක් දුෂ්කර ක්‍රියා කරලා නොවේ. නමුත් යම් අවස්ථාවක ඒ සම්බෝධි ඥානයට සුදුසු අවස්ථාවට පැමිණියාම, ඒ බෝසතාණන් වහන්සේ යෝනිසෝමනසිකාරය තුළින් පටිච්චසමුප්පාද ධර්මය මෙනෙහි කරලා අර විඤ්ඤාණ නාමරූප- ඒ අඤ්ඤමඤ්ඤ පච්චයතාව- හෙළි කර ගත්තු ආකාරය කදිමට දැක්වෙනවා මහාපදාන සූත්‍රයේ. කෙටියෙන් දැක්වුවොත් මෙහෙමයි.

ඒ බෝසතාණන් වහන්සේ මෙන්න මෙහෙම හිතුවා කියලා කියනවා. කුමක් ඇති කල්හිද ජරාමරණ වෙන්නේ, කුමක් ප්‍රත්‍යය කරගෙනද ජරා මරණය? දැන් දන්නවා නේ. අර අංග දොළහ. කලින් දවසෙත් කිව්වා අවසානයට එන්නේ ජරා මරණ සෝක පරිදේව ඔය ආදිය. එතකොට ජරා මරණ ඇතිවන්නේ කුමක් ප්‍රත්‍ය කරගෙනද? කුමක් ඇති කල්හිද ජරා මරණ වෙන්නේ කියලා තමන් වහන්සේම මෙනෙහි කරලා බැලුවා. දැන් ඇත්ත වශයෙන්, පින්වතුනි, හිතාගන්න යෝනිසෝමනසිකාරය කියන වචනයේ අර්ථය. ඒක විග්‍රහ කළොත් 'යොනි' කියලා කියන්නේ යමක් හටගන්නා ස්ථානයයි. ප්‍රභව ස්ථානයයි. යෝනිසෝමනසිකාර කියලා කියන්නේ යමක් හට ගන්නා තැන අනුව මෙනෙහි කිරීමයි. ඒ කියන්නේ හේතු ප්‍රත්‍යය සැලකීමයි. එතකොට ජරාමරණ ඇති වන්නේ කුමක් හේතු කරගෙනද? කුමක් ඇති කල්හිද කියලා ඔහොම හිතුවාම ඒ බෝසතාණන් වහන්සේට වැටහුණා කියනවා, ජාතිය පවතින නිසා ජරා මරණ. ජාති කියලා කියන්නේ උපත බව දන්නවා නේ? එතකොට උපතක් කියලා දෙයක් තියන නිසා තමා ජරා මරණ තියෙන්නේ.

ඔන්න ඒ විධියටම ඊළඟට යොනිසෝමනසිකාරය විහිදුවලා බලනවා කුමක් ඇති කල්හිද ජාතිය වෙන්නේ. උපත වෙන්නේ. කුමක් ප්‍රත්‍යය කරගෙනද ජාතිය පවතින්නේ. ඊළඟට උන්වහන්සේට තේරුණා භවය. භවය කියලා කියන්නේ පින්වතුනි, පැවැත්ම. පැවැත්මක් ඇති කල්හි ජාතියක් වෙන්නේ. පැවැත්මක ආරම්භය තේ ජාතිය. ඒකයි පැවැත්මක් කියලා දෙයක් ඇති කල්හියි ජාතියක් උපතක් තියෙන්නේ. ඔන්න ඊළඟට බැලුවා කුමක් ප්‍රත්‍යය කරගෙනද භවය වෙන්නේ, කුමක් ප්‍රත්‍යය කරගෙනද භවය තියෙන්නේ? ඔන්න එතකොට වැටහුණා උපාදානය කියලා කියන අල්ලා ගැනීම මතයි, අල්ලාගැනීම තුළයි, භවය කියන පැවැත්මක් තියෙන්නේ. ඒකයි ප්‍රත්‍යය.

ඔන්න ඒ විධියට කෙටියෙන් සලකාගන්න. උපාදානයේ ප්‍රත්‍යය සොයන කොට අහු වුණා තණ්හාව. තණ්හාවේ ප්‍රත්‍යය සොයාගෙන යනකොට අහු වුණා වේදනාව, වේදනාවේ ප්‍රත්‍යය සොයාගෙන යනකොට අහු වුණා ස්පර්ශය. ස්පර්ශයේ ප්‍රත්‍යය සොයාගෙන යනකොට අහුවුනා සළායතනය. සළායතනය කියලා කියන්නේ පින්වතුනි, ආයතන හයකට අරගෙන තියෙන්නේ සමහරවිට දොළසක් හැටියට දක්වන ඇස, කන, නාසය, දිව, කය, මන කියන ඒ හයට එන අරමුණුත් එක්ක. ඒක හයක් හැටියට ගත්තොත් සළායතනය. ඇස, කණ, නාසය, දිව, කය, මන ඊළඟට රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම කියලා කියන ඒවා යුගල හැටියට ගත්තොත් ඒක සළායතනය. එතකොට ඒ ආයතන නිසයි ස්පර්ශයක් තියෙන්නෙ. ඔන්න ඊළඟට හිතනවා කුමක් ඇති කල්හිද සළායතනය, කුමක් ප්‍රත්‍යය කරගෙනද සළායතනය? නාමරූපය ඇති කල්හි සළායතනය. නාමරූපයයි ප්‍රත්‍යය. ඔන්න තේරුනා. ඊළඟට කල්පනා කරනවා කුමක් ඇති කල්හිද නාමරූපය තියෙන්නේ. කුමක් ප්‍රත්‍යය කරගෙනද නාමරූපය? විඤ්ඤාණය ප්‍රත්‍යය කරගෙනයි නාමරූපය. ඊළඟට තමන් වහන්සේම සොයලා බැලුවා. කුමක් ඇති කල්හිද විඤ්ඤාණය තියෙන්නේ? හිතලා බලනකොට ඔන්න නාමරූපය ඇතිකල්හියි විඤ්ඤාණය තියෙන්නේ. නාමරූපයයි විඤ්ඤාණයට ප්‍රත්‍යය වන්නේ. අන්න අඤ්ඤමඤ්ඤ පච්චයතාව.

එතකොට ඊළඟට උන්වහන්සේ හිතුවයි කියලා අපේ බුදුරජාණන් වහන්සේ කියනවා විපස්සී බෝසතාණන් වහන්සේ මෙන්න මෙහෙම හිතුවා. **'පච්චුදාවත්තති ඛො ඉදං විඤ්ඤාණං නාමරූපම්හා, නාපරං ගච්ඡති'**

ඒ කියන්නේ **පච්චුදාවත්තති** කියන්නේ ආපස්සට කරකැවිලා එනවා. මේ විඤ්ඤාණය ආපස්සට කරකැවිලා එනවා ඊට එහාට යන්නේ නෑ.

වෙන එකකට යන්නේ නැහැ. ආපසු නාමරූපයට එනවා. ඒ ටික සලකා ගන්න පුළුවන් නේද මේ පින්වතුන්ට. අපි අර කියාගෙන කියාගෙන ගිහිල්ලා නාමරූපයේ හේතු ප්‍රත්‍යය සොයන කොට විඤ්ඤාණයයි. ඊට පස්සේ විඤ්ඤාණයේ හේතු ප්‍රත්‍යය සොයනකොට ආයිමත් නාමරූපයයි. අන්න ඒකයි කිව්වේ. ඒක නිකම් ආපහු හැරිලා එනවා කියලා. ඊළඟට ඒක තුළින් හේතු ප්‍රත්‍යයන්ගේ සමුදය පැත්ත හෙළි කරගත්තු ආකාරයයි මෙතන කියන්නේ.

ඊළඟට උන්වහන්සේ හිතුවලු මේ විඤ්ඤාණය නාමරූපයෙන් ඔබ්බට යන්නේ නැහැ. ඊට එහාට යන්නේ නැහැ. නාමරූප ප්‍රත්‍යයෙන් විඤ්ඤාණය, විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූපය. හැබැයි ඔන්න එතන ඉඳලා තියෙනවා ආපහු නාමරූපය තියෙන නිසා තමයි සළායතනය. සළායතනය නිසා ඵස්ස, ඵස්ස නිසා වේදනා, තණ්හා ආදී වශයෙන් කියලා මෙසේ මේ සියලු දුක්ඛස්කන්ධයේ හටගැනීම වෙනවා. ඔන්න සමුදය පැත්ත. එහෙම තේරුම් අරගෙන බෝධිසත්ත්වයන් වහන්සේ 'සමුදයො' 'සමුදයො'-'හටගැනීම' 'හට ගැනීම' කියලා ඒක පිළිබඳ ඒ පටිච්චසමුප්පාද ධර්මය පිළිබඳ එතැන කියවෙනවා හරියට අර ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ[6] තියෙන ආකාරයට 'චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි' ආදී වශයෙන්. ඒ පටිච්ච සමුප්පාදයේ සමුදය පැත්ත උදා කරගෙන ඒ ගැන උදන් ඇනූ බවත්. ඒක සලකා ගත්තු හැටියට දැක්වෙනවා ඒ විපස්සී බෝසතාණන් වහන්සේ ඔන්න ඒ සමුදය පැත්ත.

ඊළඟට ඒ එක්කම උන්වහන්සේ- බෝසතාණන්වහන්සේ- ඊළඟට හිතනවා අනිත් පැත්ත. ඒ කියන්නේ නිරෝධය පැත්ත. ඒකත් අර කෙළවරේ ඉඳලා කුමක් නැති කල්හිද ජරා මරණ නොවෙන්නේ කුමක් නැති කල්හිද ජරා මරණය නොමැත්තේ. කුමක් නැති වීමෙන්ද ජරා මරණය නැතිවෙන්නේ? ඔන්න එතකොට තේරුණා ජාතිය නැති වීමෙනුයි ජරා මරණය නැති වෙන්නේ. ජාති නිරෝධයෙනුයි ජරා මරණ නිරෝධය වන්නේ. ඊළඟට දැන් සලකාගන්න පුළුවන්නේ ආපස්සට අර විධියට යනවා. කුමක් නැති කල්හිද ජාතිය නැති වන්නෙ, කුමක නිරෝධයෙන්ද ජාතිය නිරුද්ධ වන්නේ. භවය නැති කල්හිය ජාතිය නැති වන්නේ. භවය නිරෝධයෙන් ජාතිය නිරෝධයි. ඊළඟට ඒ වගේම උපාදානය නැති වීම නිසා භවය නැහැ. ඊළඟට තණ්හාව නැති වීමෙන් උපාදානයත් නැහැ. වේදනාව නැති වීමෙන් තණ්හාවත් නැහැ. ස්පර්ශය නැතිවීමෙන් වේදනාවත් නැහැ. සළායතනය නැති වීමෙන් ස්පර්ශයත් නැහැ. ඊළඟට කියනවා නාමරූපය නැති වීමෙන්,

නාමරූපය නැති තැන සළායතනය නැහැ. ඊළඟට කියනවා **විඤ්ඤාණය නැති කල්හි නාමරූපයත් නැහැ**. ඊළඟට ඊට එහාට යන්න බැහැ නේ? ඊළඟට කුමක් නැති කල්හිද? **නාමරූපය නැති කල්හි විඤ්ඤාණය නැහැ.** අන්න ආයෙත් අතනට ඇවිල්ලා අර අඤ්ඤමඤ්ඤ පච්චයතාව අවබෝධ කරගෙන, ඊළඟට ඒ එක්ක කියන වටිනා පාඨයක් ඒ බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා **'අධිගතො ඛො මේ‍යායං විපස්සනා මග්ගො බොධාය'** සම්බෝධිය සඳහා විදර්ශනා මාර්ගය මා සොයාගත්තා.

ඉතින් බලන්න මේ පටිච්ච සමුප්පාද ධර්මය- මේ හමස් පෙට්ටියට දාලා තියෙන එක -කෙළින්ම භාවනාවට අදාළ වන බව, සම්බෝධියට උපකාර වන බව කෙළින්ම පැහැදිලිව පෙනෙනවා.

එතකොට උන්වහන්සේ එහෙම නිරෝධ පැත්ත තේරුම්ගත්තට පස්සේ ප්‍රකාශ කරනවා, දැන් මම සම්බෝධියට අවශ්‍ය විපස්සනා මාර්ගය මේ තුළින් පහදාගත්තා. මොකක්ද? අර නැති වීම ගැන නේ අර කථා කළේ. එතකොට නාමරූපය නැතිවීමෙන් විඤ්ඤාණය නැති වෙනවා. විඤ්ඤාණය නැති වීමෙන් නාමරූපය නැති වෙනවා. ඊළඟට නාමරූපය නැති වීමෙන් සළායතනය නැති වෙනවා. ඵස්සත් නැති වෙනවා. වේදනාත් නැති වෙනවා. තණ්හාවත් නැති වෙනවා. මෙසේ සියලුම දුක්ඛස්කන්ධයේ නිරෝධය වෙයි කියලා ඔන්න ඔය න්‍යාය තේරුම් ගත්තට පස්සේ ඊළඟට සඳහන් වන්නේ මෙච්චරයි සූත්‍රයේ. ඒ විපස්සී බෝසතාණන් වහන්සේ විපස්සනා මාර්ගය උපකාර කරගෙන ඊළඟට පංච උපාදානස්කන්ධය, රූප, වේදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණ කියන උපාදානස්කන්ධයේ ඇති වීම් නැති වීම් - උදයබ්බය - සැලකුවයි මෙන්න මේය විධියට. මේය රූපය, මේය රූපයේ හට ගැන්ම, මේය රූපයේ නිරෝධය, මේය වේදනාව. මේය වේදනාවේ හටගැන්ම, මේය වේදනාවේ නිරෝධය. මේය සංඥාව, මේය සංඥාවෙ හටගැනීම, මේය සංඥාවේ නිරෝධය. ඒ විධියට විඤ්ඤාණය දක්වා ඇති වීම් නැති වීම් උදයබ්බය සැලකුවාය. එහෙම සලකලා නොබෝ කලකින්ම සම්බෝධිය ලබාගත්තා.

ඒක තුළින් අපට යමක් හිතාගන්න පුළුවන්. ඒ උදයබ්බය සැලකීම් කියන්නේ ඇති වීම් නැති වීම් සැලකීමයි. ඇති වීම් නැති වීම් සැලකීමේදී ඉබේටම මතු වෙනවා හේතු ප්‍රත්‍ය. ඒක අපි ගිය දවසෙත් කිව්වා. **මහා පුණ්ණම ආදි සූත්‍රවලින්**[7] රූපස්කන්ධයට හේතු ප්‍රත්‍ය හැටියට තියෙන්නේ පඨවි, ආපො, තේජො,වායො කියන මහා භූත ධර්ම සතර. වේදනා ස්කන්ධයට හේතුව ස්පර්ශයයි. සංඥා ස්කන්ධයට හේතුව ස්පර්ශයයි.

සංස්කාර ස්කන්ධයට හේතුව ස්පර්ශයයි. **නමුත් විඤ්ඤාණ ස්කන්ධයට හේතුව නාමරූපයයි.** ඔයින් අපට හිතන්න පුළුවන් විපස්සී බෝසතාණන් වහන්සේ අර විධියට උදයබ්බය බැලීමේදී අන්තිමට කළේ මොකක්ද? විඤ්ඤාණයෙ ඇති වීම නැති වීම බැලීමේදී ඉබේටම අහු වෙනවා නාමරූපය. ඒ නාමරූපය පිළිබඳ යෝනිසෝමනසිකාරය සියුම් වෙන්න, සියුම් වෙන්න උන්වහන්සේ අන්න අර කියාපු සියලු සංස්කාර නිරෝධ තත්ත්වය ප්‍රත්‍යක්ෂ කරගෙන සම්බෝධිය ලබාගත්තු බවයි එතන කියවෙන්නේ.

ඉතින් මේක -අපි මේ කියාපු විග්‍රහයෙන් අපට පෙනෙනවා පටිච්ච සමුප්පාද ධර්මය කොයි තරම් වටිනා දෙයක්ද කියා. දැන් අපි චතුරාර්ය සත්‍යය ගැන පමණයි බොහෝ විට කථා කරන්නේ. නමුත් මේ කථාවෙන් තේරෙනවා ඒ පටිච්ච සමුප්පාද ධර්මය ආශ්‍රයෙන,' මොකද, අර විඤ්ඤාණයේ හේතු ප්‍රත්‍ය සොයනකොට නාමරූප කියන එකයි මතු වෙන්නේ. අන්න ඒක ගැන තව ටිකක් අපි විස්තර කියමු. මේ කොතෙකුත් කිව්වත් අර බොහෝදෙනාට සම්මත සම්ප්‍රදායාගත මතයෙන් ඉවත් වෙන්න බැරි බවක් පෙනෙනවා. මම බොහෝ අවස්ථාවල පෙන්නුම් කරලා දීලා තියෙනවා සූත්‍ර දේශනා ආශ්‍රයෙන්, බුද්ධ දේශනාව ආශ්‍රයෙන්, නාම ධර්ම කියලා කියන්නේ වේදනා, සංඥා, චේතනා, ඵස්ස, මනසිකාර කියන ධර්ම පහ පමණක් බව. ඒ ධර්ම පහ ඒවා උපයෝගී කරගෙනයි පඨවි, ආපො, තේජො, වායො අඳුනාගන්නේ, ඒවායේ තද බුරුල් බව උණුසුම් සිසිල් බව ආදී වශයෙන් ඒවා ආශ්‍රයෙන් අඳුනාගන්නේ. ඒක නිසා තමයි අරක රූප සංඥාවක් වෙන්නේ. මේක නාම ස්වරූපයක්. මූලිකව හඳුනාගන්නේ භාෂාව ආශ්‍රයෙන් නොවේ. අන්න අර කියාපු වේදනා, සංඥා, චේතනා, ඵස්ස, මනසිකාර තුළිනුයි. ඉතින් ඒ ටික ඇතැම් කෙනෙක් පටලවාගන්නේ, **'ඇයි? වේදනාවට කලින් ඵස්ස තියෙනවා නේ?'** ඉතින් ඒක නිසා කොච්චර තේරුම් කළත් අර පොතපතේ තියනවයි කියලා, කියන්න සිද්ධ වෙනවා **ඵස්ස ඉස්සරහට දමනවා සමහරු.** මම තව තේරුම් කරන්නම් අඩු ගණනේ මේ පින්වතුන්ටවත් මේක අමතක නොවන ආකාරයට.

පුළුවන් නම් දකුණු අත දිගු කර ගන්න. ඇඟිලි ටික දිගු කර ගන්න. පොඩි අභ්‍යාසයක් දෙන්නේ නිදිමත යන්නත් එක්ක. අත්ල දිගු කර ගන්න- දකුණු අත. ඔන්න දැන් ඊළඟට ගණින්න සූදානම් වෙන්න. එකේ ඉඳලා. අංක එකට ගණින්නේ මොකක්ද? මහපට ඇඟිල්ලද? නැහැ නේද? සුළැඟිල්ල නේද? සුළැඟිල්ල මම අඳුනාගන්නේ මෙහෙමයි. කුඩා නමුත් දඟකාර සුළැඟිල්ල. එයා තමයි වේදනාව. ඔන්න ඊළඟට එනවා දෙවැන්නා.

කවුද? වේදනා, සංඥා. සංඥාව හඳුනාගන්න, හැඩකාර මුදු ඇඟිල්ල. ඒක කවුරුත් දන්නවා නේ? මුද්ද ඇති සමහර විට අතේ. හැඩකාර මුදු ඇඟිල්ල තමයි සංඥාව. එහෙම හඳුනාගන්න. ඊළඟට චේතනාව හඳුනාගන්න. හිතුවක්කාරය එයානෙ. අන්තිමට කාගෙන යන්නේ අත්ල, හිතුවක්කාර මැදැඟිල්ල. මැදැඟිල්ල දිගයි නේ? ඒ චේතනාව. චේතනාව ආවම නේ ඔක්කොම වැඩ කරන්නේ. ඔන්න ඊළඟට ඵස්ස. පහු වෙලා එන්නේ ඵස්ස. ඵස්ස තමයි දඹරකාර දඹරැඟිල්ල. එහෙම හිතාගන්න. දඹරකාර දඹරැඟිල්ල. අන්තිමට ඉන්නේ කවුද? මහපටැඟිල්ල නේද? එතකොට එයාට අපි කියමු ක්‍රියාකාරී මහපටැඟිල්ල කියලා. ඒක තමයි මනසිකාර. ඔන්න දැන් ඇඟිලි පහ තේරුම්ගත්තා නේද? ඒක තුළින් හිතාගන්න මිට මොළවා ගත්තට පස්සේ මහපටැඟිල්ල ළඟ තියෙන්නේ ඵස්ස නේ. ඔන්න ඕකයි. ඇත්ත වශයෙන් මේවා පොතක එන උපමා නොවේ. කාරණය තේරුම් කරන්න- ඇඟිලිවලින්වත් තේරුම් කරන්නයි මේ ටික හරි කියන්නේ. මීට පස්සේ නම් පින්වතුන්- අඩු ගණනේ මේ පින්වතුන්වත් සැක කරන්න එපා බුද්ධ වචනය ගැන. අන්න අර කියාපු නාම ධර්ම.

ඔන්න ඊළඟට තව ටිකක් හිතට කා වද්දන්න යමක් කියන්නම්. දැන් මේ පින්වතුන් සමහරු දන්නවා ඇති- මෙතන ඇති සමහරවිට නීතිවේදියෝ අරගොල්ලෝ මේගොල්ලෝ. අපට වැඩිය අවබෝධය ඇති අයත් ඇති. මෙහෙම එකක් තියෙනවා. ඔය හොරකමක් මිනීමැරුමක් වගේ නඩුවක් වුනාම, සමහර නඩු තියෙනවා සාක්ෂිකාරයෝ නැහැ. සාක්ෂිකාරයෝ නැති වෙනකොට නඩුව අහක දාන්න සිද්ධ වෙනවා. එතකොට කරන එක්තරා ක්‍රමයක් දීලා තියෙනවා නීති ශාස්ත්‍රයේ. මොකක්ද? අපි හිතමු විත්තිකාරයෝ පස්දෙනෙක් ඉන්නවා බරපතළ හොරකමක් කරලා. ඉතින් සාක්ෂි දෙන්න කෙනෙක් නැහැ. එතකොට අවසර දීල තියෙනවා එයින් එක්කෙනෙකුට සමාව දෙනවා, සමාව දෙන්නේ මොකද 'තමුසේ සම්පූර්ණ සත්‍යය කියන්න ඕනෑ. තමුසෙට නිදහස දෙනවා සම්පූර්ණ සත්‍යය කිව්වොත්' කියලා. ඒ විත්තිකාරයා සාක්ෂිකාරයෙක් කරගන්නවා. බුදුරජාණන් වහන්සේත් කළේ එහෙම කියලා හිතාගන්න.

මේක විසඳගන්න බැරි එකක් - මේ විඤ්ඤාණ මායාව පිළිබඳ ගැටළුව. **ඍෂිවරුන්ටවත්, මේ ලෝකයේ කාටවත් විසඳාගන්න බැරිවුණ එක, මැදුම් පිළිවෙතකින් බුදුරජාණන් වහන්සේ විසඳගන්න ආකාරය** පෙන්වන්නයි මේ උපමාව ගත්තේ. මම ඔය නීතිඥයින් තරම් ඔය මොකක්වත් දන්නේ නැහැ. ඔය ඩිංග දන්නවා. ඒක නිසා මම තේරුම් කරන්නම්.

එතකොට ඔය මහපට ඇඟිල්ල නේ ඔය මනසිකාරය. මනසිකාරයා තමයි මහපට ඇඟිල්ල. එයා තමයි මෙච්චර කාලයක් අයෝනිසෝමනසිකාර හැටියට- මේ මහපට ඇඟිල්ල තමයි අපව සංසාරයේ අරන් ආවේ. අයෝනිසෝමනසිකාරය. මොකද, එයා සුළැඟිල්ලටත් සම්බන්ධයි, මුදුඇඟිල්ලටත් සම්බන්ධයි, මැදැඟිල්ලටත් සම්බන්ධයි, දබරැඟිල්ලටත් සම්බන්ධයි, **එයා හුඟක්ම සම්බන්ධකම් පවත්වන්නේ අන්න අර කියාපු දබරැඟිල්ලත් එක්කයි.** ඉතින් බුදුරජාණන්වහන්සේ තේරුම් ගත්තා මේ පස්දෙනාගෙන් පෙනුමෙනුත් ලොක්කා තමයි මේ මනසිකාරය. එයා මෙතෙක් 'අයෝනිසෝ' හැටියට ඉඳලා තමයි මේ කියපු හොරකම කළේ. බුදුරජාණන් වහන්සේ කළේ මොකක්ද එයා **'යෝනිසෝමනසිකාර'** කර ගත්තා. අපට කතන්දරය හරියට කියන්න ඕනැ. එතකොට නිදහස දෙනවා. ඉතින් කොහොම හරි ඕන්න ඔය යෝනිසෝමනසිකාරය තුළින් තමයි යම් අවස්ථාවක මෙන්න මේ නාමරූප ගැටළුව විසඳ ගන්න පුළුවන් වන්නේ.

මේක පුංචියට තේරුම් ගන්නවා නම් අපි හිතමු ඒදණ්ඩ උඩ බල්ලා. ඒදණ්ඩ උඩ බල්ලා අර විධියට බලබලා ඉන්නේ අයෝනිසෝමනසිකාරය නිසා නේ. එහෙම බල බලා ඉන්න අතරේ හිටි ගමන්ම තේරෙනවා 'ආ මේ මම **බලන** නිසා නේ **පෙනෙන්නේ**.' අන්න අර අයෝනිසෝ කියන වැරදි ක්‍රමයෙන් ඉවත් වෙලා හරි දැක්මට හැරුණා නම් ඊට පස්සේ බලන්නේ නැහැ.

ඒ වගේම නාසිසස් ගැන හිතන්න දීලා තියෙනවා අපේ පොත පතේත්. දැන් අර නාසිසස් කතාවේ, ඒ ග්‍රීක තරුණයා පිළිබඳ කතාවේ, යම් නවීකරණයක් කරන්න අපට සිද්ධ වුණා. ඒ කතාවේ තියෙන්නේ ග්‍රීක තරුණයා දිවි පුදලා අන්තිමට ඒ දිවි පිදූ තැන තිබුන මලකට නාසිසස් කියන නමක් දුන්නා. කතාව එච්චරයි. අපි ඒක නවීකරණය කරලා ඒ මැරිච්ච තරුණයාට පණ දීලා, එයාව නැගිට්ටවලා අරගෙන ඊළඟට අර කියාපු සන්ධිස්ථානය -නොපෙනී ගිය දෙවඟන-දිය රැළි නිසා නොපෙනී යන දෙවඟන නැවත නැවත වැළඳ ගන්නවා. යම් වෙලාවක ඒ තරුණයාට හිතුණා නම් **අනේ ඇත්ත වශයෙන් දියේ ඉන්න කෙනෙක් නොවෙයි නේද මේ මම බලන නිසා නේද පෙනෙන්නේ** කියලා ඒ ටික තේරුම් ගත්තා නම් අන්න එතන ඉඳලා එයාට අර යෝනිසෝමනසිකාරය තුළින් සෝවාන් ඵලය දක්වාම යන්න තිබුණා. නමුත් ග්‍රීක තරුණයා මළා. ඉතින් කොහොම හරි මෙතනින් පෙන්නුම් කරන්නේ මනසිකාරය තමයි

ප්‍රධාන. ඒකයි බුදුරජාණන් වහන්සේ අර අයෝනිසෝ පැත්ත යොනිසෝ කරගත්තු හැටියේ ඔන්න යම් අවස්ථාවක පැහැදිලි වෙනවා.

අපි තව කථාවක් කියමු. තව ටිකක් අළුත් වෙන්න පුළුවන්. මේ පින්වතුන්ට ඔය පරණ කාලෙ ඔය ග්‍රීක කතන්දරවලින් වැඩක් නැහැ. උම්මග්ග ජාතකය කවුරුත් කියවලා ඇති. උම්මග්ග ජාතකය පරණ කට්ටිය කියවලා තියන දිග ජාතක කථාවක්. දැන් ඒවා බොහෝදෙනා දන්නෙත් නැහැ. නමුත් එක ලස්සන උපමාවක් තියෙනවා -මැණික් උපමාවක්. මණි ප්‍රශ්නය.[8] මණි ප්‍රශ්න කීපයක් තියෙනවා. ඒකෙ මෙහෙම කතාන්තරයක් තියෙනවා. මම කෙටියෙන් කියන්න බලන්නම්. මියුළු නුවර වෛදේහ රජ්ජුරුවන්ට අහන්න ලැබුනා ඒ නුවර දොරටුව ළඟ පොකුණේ මැණිකක් තියෙනවා කියලා. නගරවාසීන් ඇවිල්ලා කිව්වා. ඉතින් රජ්ජුරුවන්ට හිටියා පුරෝහිතයින් ගණනක්. ඉතින් රජ්ජුරුවෝ පරණ පුරෝහිත සේනකට කිව්වා, මේ මැණික ලබාගන්න කියලා. සේනක මොකද කළේ, ගිහිල්ලා නගරයේ මිනිසුන් එකතු කරගෙන ගිහිල්ල බැලුවම ඇත්ත තමයි. මැණිකක් තියෙනවා පොකුණේ. ඉස්සර වෙලාම පොකුණ හිස් කළා. වතුර හිස් කරලා බලනකොට හම්බ වුණේ නැහැ. ඒ සැරේ මඩත් අහක් කළා. ඒත් නැහැ. ඊළඟට හාරලත් බැලුවා. ඒත් නැහැ. ආයෙත් වතුර පිරෙනකොට මැණික තියෙනවා. ඔහොම ඔහොම කිහිප සැරයක් පොකුණ හිස් කරලා බලල බැරිම තැන ඇවිල්ලා රජ්ජුරුවන්ට කිව්වා. රජ්ජුරුවෝ මොකක්ද කළේ? මහා බෝධිසත්ත්ව මහෞෂධ පඬිතුමාට බාර දුන්නා වැඩය. බාල නමුත් මහෞෂධ පඬිතුමාම ගිහිල්ලා ඒක බැලුව හැටියෙ තේරුම්ගත්තා මෙතන නොවේ මැණික තියෙන්නේ. පොකුණ ළඟ තියෙන තල් ගහේ වෙන්න ඕන කියලා හිතලා රජ්ජුරුවෝ ඉදිරියේ තලිය වතුරට දාලා බලන්න කිව්වා. බලනකොට තලියෙත් තියෙනවා මැණික. රජ්ජුරුවන්ට සලකාගන්න බැහැ. එහෙනං කොහෙද මැණික කියලා ඇහුවා. අන්න අර තල් ගසේ කපුටු කැදැල්ලක මැණික තියෙනවා. ඔන්න මිනිහෙක් දාලා ගෙන්වගන්න කිව්වා. මිනිහෙක් ගිහිල්ලා ඒ මැණික ගෙනාවට පස්සේ රජ්ජුරුවන්ට දුන්නා.

ඔන්න එතකොට ඕක ආශ්‍රයෙන් මේ පින්වතුන්ට හිතාගන්න පුළුවන් අයෝනිසෝ මනසිකාරය තුළින් සේනක මොකද කළේ, අර වතුරේ මැණිකක් තියනවා කියලා ඒක හාරලා බැලුවා. මහෞෂධ පඬිතුමාගේ ප්‍රඥාවට විෂය වුණා මේක මේ වතුරේ ඡායාවක් පමණයි. ඉතින් ඔය කතන්දර තුළ තවත් ගැඹුරට යන කාරණයක් තියෙනවා. මේ පින්වතුන්ට අපි තේරුම් කළ ගාථාවේ තියෙනවා මෙහෙම එකක් '**කුතො සරා නිවත්තන්ති**'. ඒ

ගාථාව මතක් කරගත්තොත් - 'කොතනකද දිය වැල් නවතින්නේ. කොතනකද නාමරූපය නිරුද්ධ වන්නේ?' උත්තරය කොහොමද බුදුරජාණන් වහන්සේ දුන්නේ **'යත්ථ ආපො ච පඨවි තෙජො වායො න ගාධති - අතො සරා නිවත්තන්ති'** යම් තැනක පඨවි, ආපො, තෙජො, වායො කියන මහා භූත ධර්ම - **න ගාධති** කියන්නේ පිහිටීම් නැති, **ප්‍රතිෂ්ඨාවක් නොලබයිද** අර කියාපු රූප ධර්ම යම් තැනක ප්‍රතිෂ්ඨාවක් නොලබයිද අන්න එතනිනුයි දිය වැල් ආපසු හැරෙන්නේ. මේක මෙච්චර කාලයක් ඒ කට්ටියට තේරුම් ගන්න බැරිව තිබුණා. මොකක්ද මේ කියන්නේ කියලා. ඉතින් දැන් මේ උපමාවෙන් වුණත් කෙනෙකුට හිතාගන්න පුළුවන්. දැන් සේනකගේ දර්ශනයට අනුව වතුරේ මැණිකක් තියෙනවා. ඒක නිසා අර පඨවි, ආපො, තේජො, වායො **ඒවා තුළ ප්‍රතිෂ්ඨාවක් ලැබුවා මැණික.** නමුත් අන්න මහෞෂධ පඬිතුමාගේ දර්ශනය අනුව **මේක පිළිබිඹුවක් පමණයි.** ඒක නිසා හාරන්න දෙයක් නැහැ මෙතන. ඒක තුළ ඔන්න දැන් අපි ඒක මතක් කරගන්න. තව අර කලිනුත් අපි පෙන්නපු ඕකටත් ගැලපෙන වටිනා සූත්‍රයක් තියෙනවා. කේවඩ්ඪ සූත්‍රය[9] කියලා.

ඉතාම ගැඹුරුයි ඒක. ඒක බොහොම උගතුන්ට තේරුම්ගන්නත් අමාරුයි. ඒකේ තියෙන කතන්දරේ බැලුවාම හරි පුදුමයි. බුදුරජාණන් වහන්සේ එක් අවස්ථාවක ගෘහපතියකුට ඒක කියන්නේ. භික්ෂු සංඝයාගෙන් එක්තරා සහ නමක් - නමවත් දක්වලා නැහැ. එක්තරා භික්ෂුවක් - සිතුවිල්ලක් ආවලු, හරියට මේ කාලේ ඉන්න විද්‍යාඥයින් වගේ හිතලා තියෙනවා පඨවි ආපො තේජො වායො කියන **මහාභූත ධර්ම කොතනකද නිරුද්ධ වන්නේ**, සම්පූර්ණයෙන්ම නිරුද්ධ වෙන **'තැනක්'** තියෙනවා කියලා හිතාගෙන මේ භික්ෂුව ගියේ නැහැ බුදුරජාණන්වහන්සේ ළඟට. ඒ වෙනුවට කළේ මොකක්ද, ඒ තමාගේ තිබුන ධ්‍යාන ශක්තිය තුළින් ඇති කරගත්තු - ඒකට කියන්නේ දේවයාන කියලා - ශක්තියක් ඇති කර ගත්තා. ඒ ධ්‍යාන ශක්තිය තුළින් - අභිඥාලාභියෙක් වෙන්න ඕන. දිව්‍ය ලෝකයෙන් බ්‍රහ්ම ලෝකවලට යන්න ඕනෑ හැටියට, කිසිම වියදමක් නැතිව යන්න. ඉතින් ඒ විධියට දිව්‍ය ලෝකවලින් දිව්‍ය ලෝකවලට ගිහිල්ල ඇහුවා, කොතනද මේ මහාභූත ධර්ම නැති වෙන්නේ? ඒගොල්ලෝ කිව්වා අපි නම් දන්නේ නැහැ ඉහළ ලෝකවල අයගෙන් අහන්න. ඔහොම ඔහොම තල්ලු වෙලා තල්ලු වෙලා ගිහිල්ලා අන්තිමට මහා බ්‍රහ්මයා ළඟට ගියාම එයාට ලැජ්ජයි කියන්න දන්නේ නැහැ කියලා. එයා ටිකක් පැත්තකට කථා කරලා කිව්වා 'මම නම් ඕක දන්නේ නැහැ. ඇයි මෙච්චර දුර ආවේ? ගිහිල්ලා බුදුරජාණන් වහන්සේගෙන් අහන්න' කියලා.

ඔන්න මේ භික්ෂුව බුදුරජාණන් වහන්සේගෙන් ඇහුවා කොතනකද පඨවි ආපො තේජො වායො කියන මහාභූත ධර්ම නිරුද්ධ වෙන්නේ? මේවා සම්පූර්ණයෙන්ම නැති වෙන තැනක් ඇතෙයි කියලයි මේ හාමුදුරුවෝ හිතුවේ. ඉතින් බුදුරජාණන් වහන්සේ මෙහෙම එකක් කිව්වා. 'මහණ, ඔහොම නොවෙයි ඔය ප්‍රශ්නය අහන්න තියෙන්නේ' කියලා. ඇසිය යුතු ප්‍රශ්නය ඉස්සර වෙලා බුදුරජාණන් වහන්සේ දැක්වූවා. 'මෙන්න මෙහෙමයි මහණ ප්‍රශ්නය අහන්න ඕනෑ'.

**කත්ථ ආපො ච පඨවි - තෙජො වායො න ගාධති**
**කත්ථ දීඝං ච රස්සං ච - අණුං ථූලං සුභාසුභං**
**කත්ථ නාමං ච රූපංච - අසෙසං උපරුජ්ඣති**

ඔන්න ඉස්සර වෙලා ප්‍රශ්නය හැදුවා. ඒ ප්‍රශ්නයේ තේරුම ඉස්සර වෙලා කියලා හිටිමු. බුදුරජාණන් වහන්සේ අර භික්ෂුවට කියනවා මම උත්තර දෙන්නම් හැබැයි මේ ප්‍රශ්නයටයි මම උත්තර දෙන්නේ. ඔය ප්‍රශ්නය වැරදියි. එතකොට කියන්නේ මොකක්ද?

**කත්ථ ආපො ච පඨවි - තෙජො වායො න ගාධති**

අන්න එතනත් **ගාධති** කියන වචනය තියෙනවා. කොතැනද පඨවි ආපො තේජො වායො කියන ඒවා ප්‍රතිෂ්ඨාවක් නොලබන්නේ? විනාශ වී යාමක්, නැති වී යාමක් නොවෙයි. ප්‍රතිෂ්ඨාවක් නොලබන්නේ කොතැනද? '**කත්ථ ආපො ච පඨවි තෙජො වායො න ගාධති.**' ඒ වගේම ඔන්න ඊළඟට වටිනා වචන කීපයක් තියෙනවා. '**කත්ථ දීඝං ච රස්සං ච - අණුං ථූලං සුභාසුභං**' කොතැනද දිග කොට '**දීඝං ච රස්සං ච**' කියන්නේ දිග කොට 'අණුං ථූලං' කියන්නේ සියුම් මහත. ඊළඟට 'සුභ අසුභ' කියන මෙන්න මේ භේද. අන්න ඒක හොඳට මතක තියාගන්න. කොතනද මේ කියාපු දිග කොට රළු සියුම් ඊළඟට සුභා අසුභ ඒ භේදත්, අන්තිමට **කත්ථ නාමංච රූපංච අසෙසං** ඒ වගේම නාම රූපත් නැති වෙන්නේ? ඉතින් ඊළඟට බුදුරජාණන් වහන්සේ ප්‍රශ්නය හදලා එතන **උපරුජ්ඣති** කියන වචනයයි යොදන්නේ. අර **නිරුජ්ඣති** නොවේ. නිරුද්ධ වීමක් නොවේ. උපරුජ්ඣති. ඒවා වළක්වාලන්නේ කොහේද? ඒවා උපරෝධනය වන්නේ කොහේද? එහෙම අහන්න කියලා ඊළඟට බුදුරජාණන් වහන්සේ දෙන උත්තරය තමයි දීර්ඝ කාලයක් තිස්සේ බොහෝ උගතුන්ට ගැටලුවක්

වෙලා තිබුණේ. ඒ කියන්නේ බුදුරජාණන් වහන්සේ මෙන්න මේ විදියටයි ඒ ප්‍රශ්නයට උත්තර දෙන්නේ.

**විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතොපභං**
**එත්ථ ආපො ච පඨවි - තෙජො වායො න ගාධති**
**එත්ථ දීඝං ච රස්සං ච - අණුං ථූලං සුභාසුභං**
**එත්ථ නාමං ච රූපං ච - අසෙසං උපරුජ්ඣති**
**විඤ්ඤාණස්ස නිරොධෙන - එත්ථෙතං උපරුජ්ඣති**

ඉතින් එතන දෙන උත්තරය මහා ගැටලුවක් වෙලයි තියෙන්නේ බොහෝ උගතුන්ට. මේකයි අදහස අපි මේ තෝරන ආකාරයට. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා **අනිදස්සන විඤ්ඤාණ** කියලා දෙයක් තියෙනවා. දැන් මෙතන අපි අර පොකුණේ මැණික කිව්වම තේරුම්ගන්න පුළුවන් අනිදස්සන කියන්නේ මොකක්ද කියලා. එහෙම නැත්නම් නාසිසස් කථාව අනුව පින්වතුන්ට හිතාගන්න පුළුවන්. ඒ නාසිසස්ට අර වතුරේ නිදර්ශනයක් තිබුණා. යම් වෙලාවක ප්‍රඥාව ආවා නම් වතුර අනිදස්සනයි. වතුර පෙන්නුම් කළා නේ, දෙවඟනක්. යම් වෙලාවක ප්‍රඥාව ආවා නම් වතුරේ දෙවඟන නැහැ. දෙවඟන පිළිබඳ විඤ්ඤාණය ඉවරයි. ඒක ඉවරයි. ඊළඟට පොකුණේ තිබුණ මැණික. මැණිකේ විඤ්ඤාණය රජ්ජුරුවන්ට තිබුණා. සේනකට තිබුණා. ඊට පස්සේ ඒ පඨවි, ආපො, තේජෝ, වායො, සුභ, අසුභ දිග කොට කතන්දර ඔක්කොම ඉවරයි. මහෞෂධ පඬිතුමා දැක්කා මෙතන නෑ, ඒ වතුරේ නෑ. ඒක තමයි 'විඤ්ඤාණං අනිදස්සනං'. ඔන්න දැන් හිතාගන්න යමක් පෙන්නුම් කරන්නේ නැහැ. විදහා පාන්නේ නැහැ කියන එකයි. 'අනිදස්සනං' යමක් පෙන්නුම් නොකරන විඤ්ඤාණය මොනවද පෙන්නුම් නොකරන්නේ? අන්න රූපධර්ම. පඨවි ආපො තෙජො වායො ආශ්‍රයෙන් ගන්න රූප සංඥා. ඒ එක්කම අන්න අර වචන ටික දැන් උපකාර වෙනවා බුදුරජාණන් වහන්සේ අරකට එකතු කළ. බුදුරජාණන් වහන්සේ තව එකතු කළා නේ වචන කිහිපයක්. ඒක ඉතාමත් වැදගත් 'යත්ථ දීඝං ච රස්සං ච' දිග කොට, සියුම්, රළු, සුභ අසුභ, ඔය ඔක්කෝම රූපයක් එක්ක නේ යන්නේ. රූප ධර්ම එක්ක නේ යන්නේ. හොඳට තේරුම් ගන්න එතකොට. අන්න ඒ එක්කම අන්තිමට කියනවා එතනම තමයි නාමරූපය සමස්ත වශයෙන් උපරෝධනය වන්නේ. එතකොට විඤ්ඤාණස්ස නිරොධෙන එත්ථෙතං උපරුජ්ඣති, කිව්වේ අර කියාපු අභිසංඛත විඤ්ඤාණය, වැරදි විඤ්ඤාණය, මැණික් විඤ්ඤාණය, නාසිසස්ගේ දෙවඟන විඤ්ඤාණය- ඒක නිරුද්ධ වෙලා තමයි- ඒක නිරුද්ධ වෙන්නේ අන්න අර කියාපු **'සබ්බතොපභ විඤ්ඤාණයෙ, විඤ්ඤාණං අනිදස්සනං අනන්තං**

**සබ්බතොපහං'** කිව්වේ හැම පැත්තෙන්ම ආලෝකය ආවා නම්. දැන් ආයිත් මතක් කරගන්න දැන් මේ පින්වතුන්ට උපමා රාශියක් දීලා තියෙනවා.

සිනමා උපමාව දැන් මතක් කර ගන්න. අර තිරයේ ලස්සන නළඟනක් එහෙම දකින කොට මේ පින්වතුන්ට හිතෙනවා ඇති 'අනේ ගිහිල්ලා වැළඳ ගන්න ඇත්නම් හොඳයි' කියලා. අර නාසිසස් වගේ අන්න අර තිරයේ තියෙන ඒවා අතිර බව තේරෙන්නේ ආලෝකය ආවාම නේ. සිනමා ශාලාවේ ආලෝකය ආවාම නේ. තිරය වෙනම තියෙනවා. අරවා පළාතකවත් නැහැ. ඒවගේම තමා නාසිසස්ට වැටහුණේ. ඒ වගේම තමයි මහෞෂධ පණ්ඩිතයෝ අරක කිව්වට පස්සෙ රජ්ජුරුවන්ටත් සේනකටත් තේරෙන්න ඇති වතුරේ නෑ මේක. අන්න ඒකයි **'විඤ්ඤාණං අනිදස්සනං'.** ඒක වෙන්නේ **'අනන්තං සබ්බතො පහං'.** මොකක්ද ප්‍රභාව? ප්‍රඥා ප්‍රභාව. අපි බොහෝ අවස්ථාවල දක්වලා තියෙනවා. සමහරු මේ බුදුරජාණන් වහන්සේ නිකමට කිව්වා කියලා හිතන්නේ.

බුදුරජාණන් වහන්සේගේ ප්‍රභාව පිළිබඳ දේශනාව[10] මහා ප්‍රබල දේශනාවක්. **'චතස්සො ඉමා භික්ඛවෙ පභා'** මහණෙනි මේ ප්‍රභාවෝ සතර දෙනෙකි. **'කතමා චතස්සො'** කවර සතර දෙනෙක්ද? චන්දප්පභා, චන්ද්‍රප්‍රභාව, **සූරියප්පභා**, සූර්ය ප්‍රභාව **අග්ගිප්පභා**, අග්නි ප්‍රභාව, **පඤ්ඤාපභා** ප්‍රඥා ප්‍රභාව. අන්තිමට කියනවා පඤ්ඤාපභා. ඒක නිකම් වචනයක් කියලා මෙතෙක් හිතුවේ. අන්න ඒ ප්‍රඥා ප්‍රභාව තුළිනුයි එතකොට මේ සත්‍යය හැටියට පෙනෙන මායාත්මක පැවැත්ම ලෝකේ තියෙන- මේ ආයතන හය තුළින්- දැන් නාමරූපයක් අර විධියේ දෙයක් නම් නාම ස්වරූපයක් නම්, අරක නාමමාත්‍ර රූපයක් නම්, ඒක ආශ්‍රයෙන් සළායතනය තුළ කරන්නේ මොකක්ද? හයකට බෙදලා ඔන්න පිල් දෙකක් හැදුනා. ඇසයි රූපයයි, කනයි ශබ්දයයි. හැදිලා ඒ කරන හරඹයෙන් තමා මේ අපට ලෝකයක්- සළායතන ලෝකයක්- මැවිලා පෙනෙන්නේ. ඒකයි බුදුරජාණන් වහන්සේ ලෝකය හැඳින්වූවේ සළායතනයමයි ලෝකය කියලා[11]. ඒ ද්වයතාව, තුළ මුළු මහත් ලෝකය තිබෙනවා. අන්තිමට හිතයි හිතුවිල්ලයි. හිතයි හිතුවිල්ලයි. එතකොට ඒ සළායතන ලෝකය තුළ තමයි අන්න අර ඔක්කොම **'දේවල්'** අපි මේ හිතන **'දේවල්'** නිරුද්ධ වෙන්නේ. ඉතින් භය වෙනවා කෙනෙක් ශූන්‍යතාව කියලා. නමුත් කරන්න දෙයක් නැහැ. ඒකයි බුදුරජාණන් වහන්සේ කීවේ, ඒක නින්දෙන්, අවදිවීමක්. ලෝකයා නින්දක ඉන්නවා කියන්නේ හීනයකින් දකින දේ නැගිට්ටාට පස්සේ නැති වුණාම

ඉතින් අඩන්න දෙයක් නැහැ. **නැති දේ නැති හැටියට පෙනුණා.** ඒක නේ යථාභූත ඥානය. ඒ ප්‍රඥා ප්‍රභාවට තේරුණා.

මේක මේ නාමරූපය කියන එක ඒ ටික තමයි. බොහෝ අවස්ථාවල අපි උද්ධෘත පාඨ බොහෝ හිතට ආවත් ඔක්කොම කිව්වේ නැතත් මේ ටික කියමු. යම් තැනක තියෙනවා **"තං නාමරූපස්මිං අසජ්ජමානං - අකිඤ්චනං නානුපතන්ති දුක්ඛා"**[12] නාම රූපවල ඇලෙන්නේ නෑ කියලා. අකිඤ්චන තත්ත්වයක් ඒ තුළ තියෙන්නේ. ඊට පස්සේ ඇලුම් කරන්න දෙයක් නැහැ එතන. ඔය විධියට නාමරූපයෙහි ස්වභාවය ගැන ප්‍රකාශ කරලා තියෙනවා.

**අනත්තනි අත්තමානිං**
**පස්ස ලොකං සදෙවකං**
**නිවිට්ඨං නාමරූපස්මිං**
**ඉදං සච්චන්ති මඤ්ඤති**[13]

'ආත්මයක් නැති තැනක ආත්මයක් දකින දෙවියන් සහිත ලෝකයා දෙස බලව'. නාමරූපය තුළට ඇතුල් වෙලා මේක සත්‍යයයි කියලා ලෝකයා හිතනවා. අන්න අර නාසිසස් වගේ. සේනක වගේ. ඉතින් ඔන්න ඔය තත්ත්වයයි බුදුරජාණන් වහන්සේ පෙන්නුවේ. අර කියාපු ප්‍රඥා ප්‍රභාව ඔය විද්‍යාවේ තියෙනවා වගේ දෙයක් නොවේ. ඒක මහා පුදුම දෙයක්. අන්ධකාරය තුළයි - එතකොට අපිට හිතන්න තියෙන්නේ - මේ අන්ධකාරය තුළයි මේ සත්‍ය හැටියට ගන්නා මේ ඇහැට පෙනෙන රූප පෙනෙන්නෙ. බුදුරජාණන් වහන්සේ සංඥාවන් සියල්ල මිරිඟුවක් කියලා කිව්වේ ඒක නේ.

ඒ කියන්නේ ඒ ටිකටත් අපි තව ටිකක් කියමු. එතනදී වෙලාවේ හැටියට කිව්වොත් එක්තරා වටිනා සූත්‍රයක් කියෙනවා ඔය ද්වයතාව පිළිබඳව. අපි කලින් කිව්වා ඒකට අදාළ සූත්‍රයක්.

**යො උභන්තෙ විදිත්වාන**
**මජ්ඣෙ මන්තා න ලිප්පති**
**තං බ්‍රෑමි මහා පුරිසොති**
**සොධ සිබ්බනිමච්චගා**[14]

ඉතාම වටිනා සූත්‍රයක්. ඕකේ තේරුම කෙටියෙන් කීවොත් - සුත්ත නිපාතයෙ තිස්ස මෙත්තෙය්‍ය සූත්‍රයේ තියෙන්නේ - කොයි තරම් ගැඹුරුද

කිව්වොත් බුද්ධ කාලයේ සංඝයා වහන්සේලා හයනමක් මේ පුංචි ගාථාවට විවරණ හයක්[15] දීලා තියෙනවා. පුදුම සම්මන්ත්‍රණයක්. ඒ කියන්නේ, මොකක්ද **'යො උභනෙත විදිත්වාන, මජ්කෙධ මනතා නලිප්පති- තං බ්‍රෑමි මහා පුරිසොති-සො ඉධ සිබ්බනි මච්චගා'** යම් කෙනෙක් 'උභනෙත' කියන්නේ අන්ත දෙක, යම් කෙනෙක් අන්ත දෙක - කොන් දෙක හරියට තේරුම්ගෙන මැද ප්‍රඥාවෙන් නොඇලේද ඔහුට මම මහා පුරුෂයා යයි කියමි. ඔහු මේ තණ්හාව නමැති මැහුම්කාරියගෙන් බේරිලා ගියා. තණ්හාව නමැති මැහුම්කාරිය- ඕක ගැන අපි දීර්ඝ විවරණ කරලා තියෙනවා.

අවස්ථාවට අනුව කිව්වොත් අර කියාපු විවරණ හයෙන් විවරණ දෙකක් තියෙනවා මේ අවස්ථාවට ගැළපෙන. ඒ ටික කියන්නයි මේ කල්පනා කළේ.

ඒ විවරණ හයේම තියෙන්නේ කොන් දෙකේ තියන ධර්ම දෙකකුත් මැද එකකුත්. අන්තිමට ඒවා මහන්නේ මැද අමතක කරලා. මැහුම් ගෙතුම් ගැන දන්න කට්ටිය කවුරුත් දන්නවානෙ. ඒ කොන් දෙක ගැටලනවා මැද අමතක කරලා, මැද නොතකා හැරලා.

ඉතින් අපි කියන්න බලාපොරොත්තු වන එකේ තියෙන්නේ එක කොනක් නාමය. අනික් කොන රූපය. මැද විඤ්ඤාණය. මැහුම්කාරිය තණ්හාව. ඔන්න දැන් හිතාගන්න එතකොට නාමය එක කොනක තියනවා රූපය තව කොනක තියනවා. මැදින් තියෙනවා විඤ්ඤාණය. ඔන්න දැන් සලකාගන්න. බොහෝදෙනා නාමය තෝරනකොට විඤ්ඤාණයත් ඕක අස්සට දානවා නේ. කොයි තරම් වැරදිද? නාමරූප පිළිබඳ සම්ප්‍රදායාගත විවරණය තුළ තියෙන්නේ එහෙම පිටින්ම පටිච්ච සමුප්පාදය පිළිබඳ විපරීත අදහස් සමූහයක්. ඉතින් දැන් පැහැදිලිව පෙනෙනවා නාමය එක අන්තයක්. රූපය අනික් අන්තය. මායාත්මක විඤ්ඤාණය මැදින් ඉන්නවා. ඒක නිසා **තණ්හාව නමැති මැහුම්කාරිය කරන්නේ මොකක්ද, අර විඤ්ඤාණය තියෙන බව නොතකා හැර, විඤ්ඤාණය ඇති වන්නෙත් මේ දෙක නිසා බව නොතකා හැරලා ඇහැ වෙන් කරගන්නවා. රූපය වෙන් කරගන්නවා.** ඉතින් ඒක ඔස්සේ යනවා අර කියාපු **මිරිඟුව** ඔස්සේ දුවනවා. මුවා දුවන්නා වගේ. මෙතන මම ඉන්නවා. අතන වතුර තියෙනවා. මේක අතර තියෙන පරතරය ගැන හිතන්නේ නැහැ. අන්න ඒ වගේ දෙයක්. ඉතින් නාමය එක අන්තයක්. රූපය එක අන්තයක්. මැද විඤ්ඤාණය. ඒකෙන් හිතෙනවා ඒ කාලයේ හිටිය සංඝයා වහන්සේලාට

කොයි තරම් පුදුම විදියේ ගැඹුරු අවබෝධයක් එක ගාථාවක් තුළ තිබුණාද කියලා. දැන් මේ පණ්ඩිතයින්ට ගාථාවක තියෙන වචනයක්වත් තෝරාගන්න බැහැ. අර එක ගාථාවකට සංඝයා වහන්සේලා හයනමක් විවරණ හයක් දෙනවා. බුදුරජාණන් වහන්සේ කීවා ඒ ඔක්කොම, හයම හරි, හැබැයි මම ඒ අවස්ථාවේදී කීවේ මෙන්න මේ අර්ථය කියලා. හයම හරි කිව්වා. එයින් පේන්නේ ඒ හයම කර්මස්ථාන. ඔන්න එතකොට ඔය කිව්වෙ එක කර්මස්ථානයක්.

ඔන්න ඒ වගේ තවත් කර්මස්ථානයක්. ඒකේ තියෙනවා- මේ දෙකයි කියන්නේ අවස්ථානුකූලව. එක අන්තයක් තමයි ආධ්‍යාත්මික ආයතන හය. අනික් අන්තය බාහිර ආයතන හය. දැන් හිතාගන්න පුළුවන් නේ ආධ්‍යාත්මික ආයතන අපි කියාපු ඇස, කණ, නාසය, දිව, කය, මන කියලා හිතාගන්න. බාහිර ආයතන හය කිව්වේ ඒවාට අරමුණු වුණ රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ ධම්ම. එතකොට ඒ දෙක දෙපැත්තෙන් තියෙනවා. ආයිමත් විඤ්ඤාණය මැද. හැබැයි තණ්හාව ගැටලනවා. ඔය දෙක ගැටලනවා. ඒක නිසා තමයි අර නාමයයි, රූපයයි ගැටලන්නා වාගේ මෙතැන ඇහැයි රූපයයි. ඒක වෙන් කරගෙන දැන් නාමයයි රූපයයි පිළිබඳ නාමය වෙන් කරගෙන වෙනම දෙයක් හැටියට ගන්නවා. රූපයත් වෙන් කරගෙන ඒ විදියට මෙතන ආයතන පිළිබඳවත්. අර විධියට විඤ්ඤාණය මැදින් ඉන්නවා. අන්න ඒක ආශ්‍රයෙන් හිතාගන්න ඕනෑ එතකොට මේ විඤ්ඤාණ මායාවේ ඒ ක්‍රියාකාරීත්වයෙන් මේ පෙන්නුම් කරන්නේ ඒක වහන්නේ තණ්හාව. ඒක නිසාම තමයි එතකොට ප්‍රඥාව කියලා කියන්නේ මොකක්ද? ප්‍රඥාවේ කෘත්‍යය තියෙන්නේ මෙහෙමයි. විඤ්ඤාණයත් ප්‍රඥාවත් කියන්නේ මොනවද කියලා යම් අවස්ථාවක ප්‍රශ්න වශයෙන් නගලා තියෙනවා. සඤ්ඤා, විඤ්ඤාණ, පඤ්ඤා ඒ වගේ සමාන විදියෙ වචන එතෙන්දි තෝරලා තියෙනවා. මෙන්න මෙහෙම විඤ්ඤාණය පිළිබඳ කළ යුතු දෙය දක්වලා තියෙන්නේ. **'පඤ්ඤා භාවෙතබ්බා විඤ්ඤාණං පරිඤ්ඤෙය්‍යං'**[16], ප්‍රඥාව වඩන විට, ප්‍රඥාව වැඩෙන්න වැඩෙන්න විඤ්ඤාණයේ යථා තත්ත්වය අවබෝධ වෙනවා. විඤ්ඤාණයේ යථා තත්වය අවබෝධ වෙනවා කියන්නේ මොකක්ද? මායාවේ යථා තත්ත්වය අවබෝධ වෙනවා කියන්නේ මායාවේ නැති වීම නේද? සිනමා තිරයේ එහෙම නැත්නම් ටෙලිනාට්‍ය තිරයේ, ඇති වූ මුළාව නැති වෙනවා කියන්නේ ඒක එතනමම නැති වුණා නේද? අන්න එතකොට ප්‍රඥාව වැඩෙන්න වැඩෙන්න විඤ්ඤාණය කිඳාබහිනවා. ඒකයි 'විඤ්ඤාණස්ස

නිරොධෙන' කිව්වේ. ඔන්න දැන් තේරුම්ගන්න අර කියාපු නාසිසස්ගේ දෙවඟන විඤ්ඤාණයත් ඉවරයි. මැණික් විඤ්ඤාණයත් ඉවරයි සේනකගෙ. ඔන්න ඔහොම දෙයක් තියෙන්නේ. එතකොට ඒ ගාථාවේ අර්ථය සලකාගන්න පුළුවන්.

අර භික්ෂුව ඇහුවේ මහා භූත සතර කොහේ හරි දිව්‍ය ලෝකයේ හරි බ්‍රහ්ම ලෝකයේ හරි සක්වළේ හරි මහා භූත ධර්ම නැති තැනක් ඇත කියලා. බුදුරජාණන් වහන්සේ ඒ වෙනුවට පෙන්නුවා මේ මහා භූත කථාවම භූත කථාවක්. මොකද මහා භූත ධර්ම ආශ්‍රයෙනුයි මේ රූප සංඥාව අරගෙන තියෙන්නේ. ඒවා උපාදානය කරගැනීමෙනුයි. මේ රූපය කියන එකත් අන්තිමට දක්වනවා - ඒක හරි ගැඹුරු කාරණයක්. ඇත්ත වශයෙන් කියන්න හිටිය කරුණු ඔක්කොම කියන්න හම්බ වෙන්නේ නැහැ. අවස්ථානුකූලව ඒවා කෙටි කරලා කියන්නේ. ඉතින් මෙතන කියවුණා නේ **'කත්ථ නාමං ච රූපං ච අසෙසං උපරුජ්ඣති'**. නාමයත් රූපයත් දෙකම නිරුද්ධ වෙන්නේ කොහේද කියන එක මේ පින්වතුන්ට සලකාගන්න බැහැ රූපය කියන එක දැන් මේ කාලයේ භෞතික අර්ථයෙන් ගත්තොත්. නමුත් ඒක හොඳට පැහැදිලි වෙනවා ඇතැම් තැන්වල **රූප සංඥාව** බව එතැනත් අදහස් කරන්නේ. රූප සංඥාවයි නැති වන්නේ. මේ මහා භූත ධර්ම නැති කරන්න බැහැ. විනාශ කිරීමක් නොවේ මෙතන තියෙන්නේ. විමුක්තිය සඳහා නේ. විමුක්තිය තියෙන්නේ අර වටවළල්ලෙන් මිදීමෙන් නේ. දැන් අපි ආයෙත් අතනට එමු.

නාමරූපයත් විඤ්ඤාණයත් අතර ලෝකයා නිෂ්ඵල ජවයක, නිෂ්ඵල වට වළල්ලක, යෙදෙනවා නම් දැන් පාතාලය ගැන අපි කීවා. ඒ පාතාලය ගැන සලකාගන්න පුළුවන් නේ අර පටිච්ච සමුප්පාදයට කිට්ටු කළාම. මේ නාම රූප පාතාලයෙන් නැගෙන ඒ අඩුව- ඌනතාව- පුරවන්න තමයි අර තණ්හා, උපාදානාදී වශයෙන් අර අල්ලාගැනීම් තමයි පංචඋපාදානාස්කන්ධ හැටියට එන්නෙ. ඒවා අල්ලාගන්නවා ඊළඟට. ඉතින් ඔන්න ඔය ටික අර දිය සුළිය පිළිබඳ උපමාව තුළ තැන්පත්ව තියෙනවා. ඒ 'වට්ට' කියන කතාව. අපි කිව්වේ 'වට්ට' කියන වචනය වැස්ස කියලා ගත්තොත් මේ මොකක්වත් තේරුම්ගන්න බැහැ නේ. මෙතන කියන්නේ අර දිය වැල් නවතින්නේ ඒක යම් අවස්ථාවක අර අවබෝධය ආවා නම් එතකොට අර දියවැල් නැවතුනා කියලා කියන්නේ මොකක්ද? ඒ තැනැත්තාගේ දිය සුළිය එතැනින් ඉවරයි. සංසාර දිය සුළිය ඉවරයි.

සොයාගන්න බැහැ තවත් බලං හිටියට ආයේ එන්නේ නැහැ. එතනම ඉවරයි. එතකොට රහතන් වහන්සේලාගෙ දිය සුළිය ඉවරයි. අඬන්න දෙයක් නැහැ නේ. දිය සුළිය තිබුනෙත් වතුරේ. ජල කඳ තිබුනෙත් වතුරේ. එතකොට විපරීත පැවැත්මකුයි නැතිවුනේ.

දැන් බලන්න අපි මේ තෝරන සමහර ඒවාට උච්ඡේදවාදී යැයි කියනවා. බුදුරජාණන් වහන්සේත් උච්ඡේදවාදීයි කිව්වා. කොයි තරම් වැරදි අදහසක්ද? මේ එක ජල කඳේ ගලා යන එකේ විපරීත දිය සුළියක් තිබුණා. බුදුරජාණන් වහන්සේලාත් පසේ බුදුරජාණන් වහන්සේලාත් දීර්ඝ කාලයක් සංසාරයේ දිය වැල්. මේ නිෂ්ඵල රවුමක් යමින් ඉඳලා අන්න අර ප්‍රඥා අවබෝධය තුළින් යම් අවස්ථාවක එතකොට නාමරූපය අර විධියට නිරුද්ධ වුනා නම් ඊට පස්සේ අර දිය වැල් ගලන්නේ නැහැ නේ. අන්න ඒකයි එතකොට හිතාගන්න තියෙන්නේ. බුදුරජාණන් වහන්සේගේ කොයි තරම් ගැඹුරු ධර්මයක්ද මේක තුළ තියෙන්නේ. යම් අවස්ථාවක ප්‍රඥා ආලෝකයෙන් මේ මුළාව තේරුම් ගත්තා නම් අර විපස්සනා මාර්ගය තුළින් කෙරුණේ ඒකයි. අන්තිමේදී මනසිකාරය සියුම් කළ අවස්ථාවේදී තමයි - ඒ යෝනිසෝමනසිකාරය- ඒ නිසා තමයි ඒ සූත්‍රයේම සඳහන් වෙනවා 'යොනිසොමනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො' කියලා. යෝනිසෝමනසිකාරය තුළින් විපස්සී බෝසතාණන් වහන්සේට ප්‍රඥාවෙන් අවබෝධය ආවා කියලා. **යෝනිසෝමනසිකාරය තමයි ප්‍රඥාවේ බීජය.**

එතකොට ඒක දැනගෙන තමයි අර කියාපු මහපටැඟිල්ලට - මනසිකාරයට- සමාව දුන්නේ. වෙන කරන්න දෙයක් නැහැ මේ සංසාර ගැටළුව විසඳගන්න. ඒක නිසා අර මනසිකාරයා - හැබැයි එකක් තියෙනවා. ඒ මනසිකාරයා ඒ කාරණය හෙළි කරාට පස්සේ අන්තිමට '**බඩුත් එක්ක හොරා අහු වුණා**' වගේ දෙයක් වෙනවා. ඒකෙ සම්පූර්ණ කතාව පස්සේ අවස්ථාවක කියමු. මේ බඩුත් එක්ක සොරා කිව්වේ මොකද? මේ මනසිකාරයා නිසා තමයි ලෝකයේ දෙයක් **'දෙයක්'** බවට පත් වන්නේ. **'මනසිකාර සමභවා සබෙබ ධම්මා'**[17]. මනසිකාරයටයි හැම දෙයක්ම **හම්බ වෙන්නේ**. 'ඡන්දමූලකා'. ඔය විධියේ වෙනම සූත්‍රයක් තියෙනවා. අපි යම් අවස්ථාවක පින්වතුන්ට කියලත් ඇති. මේ මනසිකාරයේ විශේෂත්වය තියෙන්නේ මේ මනසිකාරය තුළින් තමයි 'දෙයක්' වෙන්නේ. ඒකමයි මාපටැඟිල්ලට අච්චර ලොකු තැනක් ලැබෙන්නේ. ලෝකයේ කෙනෙකුට **'දෙයක්'** වෙන්නේ මනසිකාරය -මෙනෙහි කිරීම- කළාම නේද? හිතලා බලන්න. තමන්ට තියෙන නානාවිධ ප්‍රශ්න තියලා මේ

අවස්ථාවේ මේ බණ අහනවා. ගෙදර ගිය හැටියේ ඔන්න ප්‍රශ්න මතු වුනා. කොහොමද ආවේ? මනසිකාරයා එතෙන්ට ගියා නේද? මෙනෙහි කිරීම ගියා නේද? අන්න ඒක තමන්ට **'දෙයක්'** වුනාට අසල් වැසියාට ඒක **දෙයක් ද?** තමන්ට තියන ප්‍රශ්නය අනිත් අයට නෑ නේ. ඒ ප්‍රශ්නය නිසා නේ දෙයක් තියෙන්නේ. ලෝකයා ඔන්න ඔය දෙය හදාගත්තේ. **ඉතින් අන්තිමට අර මනසිකාරයාට සමාව දුන්නට මොකද එයා කතාව කියනකොට අහු වෙනවා ලොකුම හොරා එයයි කියලා. බඩුත් එක්ක හොරා අහු වුනා. බඩුව මොකක්ද 'දෙය' 'ධම්මා, මනො-ධම්මා.** ඒක තමයි ගැඹුරුම එක. ඇහැට පෙනෙන රූප, කනට ඇහෙන ශබ්ද වගේ නෙවෙයි. **ඉතාම ගැඹුරු දේ තමයි හිතත් හිතුවිල්ලත් ගැටෙන තැන.** ඕක තමා අල්ලගන්න බැරි. හිතට එන දේ කියලා ගත්ත දේ මොකක්ද අන්තිමට. ඒ ටික කියලා තියෙනවා. ආයිත් මේ පින්වතුන්ට මතක් කරන්න වෙනවා ධම්ම පදයේ මුල් ගාථාව, මට නිතර කියන්න වෙන.

**මනො පුබ්බංගමා ධම්මා**
**මනො සෙට්ඨා මනොමයා**[18]

ඒ ටික අර ධම්මපදයේ ගාථා දෙකේම තියෙනවා. **'මනො පුබ්බංගමා ධම්මා'.** මෙච්චර කාලයක් හිතුවේ දේවල් කියන ඒවා වෙනම තියෙනවා, මනස පස්සෙයි එන්නේ. බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා 'මනො පුබ්බංගමා ධම්මා' මනස පෙරටු වෙනවා. ධම්ම පස්සේ එනවා. එපමණක් නොවෙයි 'මනොමයා' මනසින්මයි හැදෙන්නේ. **මනසින්මයි හැදෙන්නේ.** අර දියේ මැණික හැදුනේ **මනසින්.** නාසිසස්ගේ ඒ දෙවහන හැදුනේ **මනසින්.** අන්න ඒ තත්ත්වය බුදුරජාණන් වහන්සේ ලෝකයාට පහදා වදාළේ.

මුළු මහත් **සංඥා ස්කන්ධයම මිරිඟුවකට**[19] සමාන කිරීම මේ විද්‍යාඥයින්ට හිතන්න හොඳ දෙයක්. විද්‍යාඥයෝ තියා අපේ මෝඩ කට්ටියත් යන්නේ ඒ ඔස්සේ. ඉතින් ඒ කට්ටිය අවිද්‍යාව තුළයි විද්‍යාව කියලා ගන්නේ. ඒ ටික අවබෝධ කරගන්නේ නැහැ. නමුත් ඒ කට්ටිය සොයන ටිකට ඩිංගක් හරි ඉඟියක් වැටුණොත් ඔන්න ඒ අවබෝධය එයි. ඒ ගොල්ලෝ හිර වෙලා තියෙන්නේ යම් තැනක, අන්න අර කියාපු කාරණය නිසා. අන්තිමට බලනකොට අර **'මනසිකාර සම්භවා සබ්බෙ ධම්මා'.** මනසිකාරයා තුළින් තමයි හැම දෙයක්ම වෙන්නේ. අන්තිමට අවබෝධ වෙනවා එයා තමයි මේ ඔක්කොම හොරකම කළේ. අන්තිමට

බඩුවත් එක්ක අහුවුනා වගේ. ඒක වෙන්නේ මොකද? ඒකට හේතුව මොකක්ද? **'ඡන්ද මූලකා'** අන්න යටින් තියනවා ඒ ටික. ඒ සූත්‍රයේම කියනවා **ඡන්දය තමයි හැම එකකටම මුල**. ඡන්දය කියලා කියන්නේ පින්වතුනි, තණ්හාවේම ලා පාට. **ඡන්දය.** ඒක නිසා තමයි බුදුරජාණන් වහන්සේ කියන්නේ මේ පංචඋපාදාන ස්කන්ධයටම මුල ඡන්දයයි. ඒ ඡන්දය නිසාම නේද - ඡන්දය කියලා කියන්නේ ඔය දැන් මේ අය කථා කරන ඡන්දය නොවේ බව හිතාගන්න- ඡන්දය කියලා හිතාගන්න- ආශාව ඕනෑකම, කැමැත්ත. අන්න ඒ විධියේ අදහසක් තියෙනවා නේ ඡන්දය කියන කොට. ඒක හිතාගන්න. එතකොට ඡන්දය නිසා කමයි අර නාසිසස්ට දෙවහනක් පෙනුනේ. රජ්ජුරුවන්ට මැණික පෙනුණේ අර මැණිකට තියන ආලය නිසා නේ? අන්න ඒ වගේ ඒ ඡන්දය -තණ්හාවයි- යටින් තියෙන්නේ. ඒක නිසා තමයි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරලා තියෙන්නේ මේ විමුක්තිය ලබන්න නම් අපි කෙටියෙන් කියනවා නම් අවිද්‍යාවත්, තණ්හාවත් නැති කරන්න ඕන. **අපේ අම්මයි තාත්තයි මරන්න ඕන. සංසාරයේ තාත්තා තමයි අවිද්‍යාව. අම්මා තමයි තණ්හාව.** ඔන්න ඕකයි **'මාතරං පිතරං හන්ත්වා'**[20] ඔය විදියට ධම්මපද ගාථාවේ තියෙන්නේ. අම්මයි තාත්තයි මරන්න කියලා ධම්මපද ගාථාවේ කියන්නේ. ප්‍රහේළිකා ගාථාවකින්. එතකොට අවිද්‍යා තාත්තාගේ නීවරණයෙනුත් තණ්හා අම්මාගේ සංයෝජනයෙනුත් තමයි මෙච්චර කාලයක් මේ සංසාරයේ ඇවිල්ලා තියෙන්නේ. මේ 'වට්ටයේ' -කෙටියෙන් ගත්තොත්. ඉතින් ඒකෙම ඉතාම සියුම් පැත්ත තමයි, ලා පාට තමයි, ඡන්දය කියලා කියන්නේ. යම් ඡන්දයක් යමකට ඇති වුණා නම් -තමන්ට නොදැනුවත්වම ඒ ඡන්දය එන්නේ තමන්. දන්නේ නැහැ. ඔය හිතේ හැසිරීම් බලනවා නම් හිටි ගමන් සිතිවිල්ලක් එන්නේ මොකද කියලා. තමන්ටවත් කියන්න බැහැ. නමුත් බලනකොට යම් කිසි සියුම් ආකාරයකින් හරි අර හීනයකදී වගේ ඕනෑකමක් මතු වෙනවා. ඒ ඕනෑකම මතු වීමත් සමඟ ඒක **'දෙයක්'** වෙනවා. ඉතින් ඔය හුඟක් දේවල් අපි කෙටියෙනුයි කීවේ. අර ඉස්සර වෙලා කීවා වගේ අපිට කියන්න වෙන්නේ මේ පින්වතුන්ට පින තිබුණොත්, අපට පණ තිබුණොත්, තවත් සමහර විට මේ වගේ දේශනා අහන්න ඉඩකඩ සැලසෙන්න පුළුවන්.

එතකොට අද මේ කියාපු ටිකෙන් මේ පින්වතුන්ට මෙතෙක් මේ වටිනා සීලයක් රැකලා ධර්මයට හිත යොදාගෙන, භාවනාවට හිත යොදාගෙන, ඉන්නා වූ අවස්ථාවක්. අප හිතනවා අර උගතුන්ට නොතේරුණත් මේ පින්වතුන්ට මේ ධර්ම කාරණා තේරෙනවා ඇත කියලා. එතකොට ඒවා උපකාර කරගෙන මේ පින්වතුන්ගේ භාවනා මාර්ගය අර කියාපු

සම්බෝධිය සඳහා උපකාර වන විපස්සනා මාර්ගයෙන් තමන් බලාපොරොත්තු වන උත්තමාර්ථයන් සාක්ෂාත් කරගැනීමට මේ විදර්ශනා මාර්ගය විවෘත කරගන්න අපි ආරාධනා කරනවා. එතකොට මෙතෙක් කළ ධර්ම දේශනාව යම්තාක් අවීචියේ සිට අකනිටාව දක්වා සත්ත්ව කෙනෙක් ඉන්නවා නම් ධර්ම දේශනාමය ධර්ම ශ්‍රවණමය කුසලයක් අනුමෝදන් වීමට කැමති ඒ අනුමෝදන්වීම තුළින් බලාපොරොත්තු වන උත්තමාර්ථයන් සාක්ෂාත් කර ගනිත්වා. එසේම මේ පින්වතුන්ටත් හැකි තාක් ඉක්මනින් මේ ලැබූ බුද්ධ ශාසනයේදීම  පටිච්ච සමුප්පාද ධර්මය තුළින් චතුරාර්ය සත්‍යය අවබෝධ කර උතුම් අමා මහ නිවන් සාක්ෂාත් කරගැනීමට ශක්තිය බලය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා. මේ ගාථා කියන්න.

**එත්තාවතා ච අම්හෙහි ...**

## පාදක සටහන්

1. සර සූත්‍රය, සංයුත්ත නිකාය - 1, 3 පිට (බු.ජ.ත්‍රි. 13)
2. විපල්ලාස සූත්‍රය, අංගුත්තර නිකාය - 2, 100 පිට (බු.ජ.ත්‍රි. 19)
3. සම්මාදිට්ඨි සූත්‍රය, මජ්ඣිම නිකාය - 1, 126 පිටු (බු.ජ.ත්‍රි. 10)
4. ඵෙණපිණ්ඩූපම සූත්‍රය, සංයුත්ත නිකාය - 3, 244 පිට (බු.ජ.ත්‍රි. 10)
5. මහාපදාන සූත්‍රය, දීඝ නිකාය - 2, 2 සිට 79 පිටු (බු.ජ.ත්‍රි. 8)
6. ධම්මචක්කප්පවත්තන සූත්‍රය, සංයුත්ත නිකාය - 5(2), 270-275 පිටු (බු.ජ.ත්‍රි. 17 (2))
7. මහපුණ්ණම සූත්‍රය, මජ්ඣිම නිකාය - 3, 118 පිට (බු.ජ.ත්‍රි. 12)
8. ජාතකට්ඨකථා 7, 311 පිට (හේ.මු.)
9. කෙවඩ්ඪ සූත්‍රය, දීඝ නිකාය - 1, 484-538 පිටු (බු.ජ.ත්‍රි. 7)
10. පභා සූත්‍රය, අංගුත්තර නිකාය - 2, 268 පිට (බු.ජ.ත්‍රි. 19)
11. ලොක සූත්‍රය, සංයුත්ත නිකාය - 1, 76 පිට (බු.ජ.ත්‍රි. 13)
12. ධම්මපදය, කොධ වග්ගය, 221 ගාථාව, ඛුද්දක නිකාය - 1, 80 පිට (බු.ජ.ත්‍රි. 24)
13. ද්වයතානුපස්සනා සූත්‍රය, සුත්ත නිපාත, 236 පිට, ඛුද්දක නිකාය (බු.ජ.ත්‍රි. 25)
14. තිස්සමෙත්තෙය්‍ය සූත්‍රය, පාරායන වග්ගය, සුත්ත නිපාත, 318 පිට ඛුද්දක නිකාය (බු.ජ.ත්‍රි. 25)
15. මජෙක්ඨ සූත්‍රය, අංගුත්තර නිකාය - 4, 186 පිට (බු.ජ.ත්‍රි. 21)
16. මහාවෙදල්ල සූත්‍රය, මජ්ඣිම නිකාය - 1, 686 පිට (බු.ජ.ත්‍රි. 10)
17. කිංමූලක සූත්‍රය, අංගුත්තර නිකාය - 5, 344 පිට (බු.ජ.ත්‍රි. 22)
18. ධම්මපදය, යමක වග්ග 1 සහ 2 ගාථා, ඛුද්දක නිකාය - 1, 26 පිට (බු.ජ.ත්‍රි. 24)
19. ඵෙනපිණ්ඩූපම සූත්‍රය, සංයුත්ත නිකාය - 3, 244 පිට (බු.ජ.ත්‍රි. 15)
20. ධම්මපදය, පකිණ්ණක වග්ගය, 294 ගාථාව, ඛුද්දක නිකාය - 1, 98 පිට (බු.ජ.ත්‍රි. 24)

# 03 වන දේශනය

# 03 වන දේශනය

## (පහන් කණුව ධර්ම දේශනා අංක 185)
## 'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

එක මූලං ද්විරා වට්ටං
තිමලං පඤ්ච පත්ථරං
සමුද්දං ද්වාදසාවට්ටං
පාතාලං අතරී ඉසී

- එකමූල සූ. දෙවතා සංයුත්ත, සං.නි[1]

සැදැහැවත් පින්වතුනි,

පටිච්ච සමුප්පාද ධර්මය හරියාකාරව තේරුම්ගැනීමට විඤ්ඤාණයත් නාමරූපයත් අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධතාව ගැඹුරින් වටහාගත යුතුව තිබෙනවා. පහුගිය දේශනා දෙකකදීම අපි මේ අන්‍යෝන්‍ය සම්බන්ධතාව දිය සුළියකට උපමා කළා. දිය සුළියක ගැඹුරුම තැන තමයි පාතාලය. අද අපි මේ ඉදිරියට ගත්තු ප්‍රහේලිකා ගාථාවෙත් පාතාලයක් ගැන සඳහන් වෙනවා.

අපි විමසල බලමු මේ පටිච්ච සමුප්පාද ධර්මයත් මේ පාතාලයත් අතර යම් කිසි සම්බන්ධතාවක් තියෙනවාද කියලා. සංයුත් සඟියේ දේවතා සංයුත්තයේ එන ප්‍රහේලිකා ගාථාවක් මේ. එක්තරා දේවතාවෙක් ධර්ම කාරණා හතක් උපමා වශයෙන් -රූපක වශයෙන් -සම්පිණ්ඩනය කරලා මේ ගාථාවෙන් ඉදිරිපත් කළ බවයි පෙන්නුම් කෙරෙන්නේ. මේ ගාථාවේ මතුපිට අර්ථය ඉස්සර වෙලා අපි තේරුම් ගන්න බලමු.

**එක මූලං ද්විරාවට්ටං**
එක මුලක් ඇති දෙකක් අතර කරකැවෙන

**තිමලං පඤ්ච පත්ථරං**
කිළිටි මල තුනක් ඇති පස් ආකාර පැතිරීමක් ඇති

**සමුද්දං ද්වාදසාවට්ටං**
දියසුළි දොළොසක් ඇති සමුද්‍රයේ

**පාතාලං අතරී ඉසී**
පාතාලයෙන් ඍෂිවරයා එතෙර විය

එතකොට මේ ප්‍රහේලිකා ගාථාව විතරයි එතන තියෙන්නේ. ඕක තෝරාගන්න අමාරුයි. අටුවාවෙත් ඒ එක එක විධියේ තේරුම් දෙනවා. අපි මේ ඇත්ත වශයෙන් අමාරුයි කියලා කිව්වට මේ ගාථාවේ දැක්වෙන උපමා, සූත්‍ර දේශනාවල ඒ ඒ තැන්වල තිබෙනවා. කොටින්ම ආරම්භයක් වශයෙන් කිව්වොත්, පාතාලයෙන්ම පටන්ගත්තොත්, පාතාලය කියල සූත්‍රයක්[2] දකින්නට ලැබෙනවා සළායතන වග්ගයේ වේදනා සංයුත්තයේ. පාතාල නමින්ම සූත්‍රයක්. ඒකෙදී බුදුරජාණන් වහන්සේ මෙන්න මෙහෙම ප්‍රකාශ කරනවා. 'සාරීරිකානං බො එතං භික්ඛවෙ දුක්ඛානං වෙදනානං අධිවචනං යදිදං පාතාලොති' මහණෙනි, ශාරීරික දුක් වේදනාවලට වෙන නමක් තමයි පාතාලය කියලා කියන්නේ. ඔන්න එතකොට පාතාලය මේ පින්වතුන් හඳුනාගත්තා. ඊළඟට සමුද්‍රය කියන්නේ මොකක්ද? මුහුද කියන්නේ මොකක්ද කියන එකත්, ඒකත් අපට අහු වෙනවා ඒ සළායතන වග්ගයේම එන **සමුද්ද සූත්‍රයෙන්**[3]. ඒකෙ මේ විධියටයි දැක්වෙන්නේ.

'චක්ඛු භික්ඛවෙ පුරිසස්ස සමුද්දො. තස්ස රූපමයො වෙගො. යො තං රූපමයං වෙගං සහති අයං වුච්චති භික්ඛවෙ අතරි චක්ඛුසමුද්දං සඌමිං, සාවට්ටං, සගාහං, සරක්ඛසං තිණ්ණො පාරගතො ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො'

මේකේ තේරුම, "මහණෙනි, මේ ඇස පුරුෂයකුට සමුද්‍රයකි. මුහුදකි. මේ මූදේ රූප නමැති රළවේග තියෙනවා. යම් කෙනෙක් මේ රූපමය රළවේග දරාගනිත්ද, එහෙම නැත්නම් ඒවාට ඔරොත්තු දෙනවාද, එබඳු ඒ පුද්ගලයා හඳුන්වන්නේ ඒ පුද්ගලයා රළ සහිත, දිය සුළි සහිත, ග්‍රහණ සහිත, ඒ කියන්නේ අල්ලාගැනීම් සහිත, රකුසන් සහිත මේ චක්ඛු සමුද්‍රයෙන් එතෙර වෙලා එගොඩට ගිහිල්ලා ඉන්න බ්‍රාහ්මණයා හැටියටයි". රහතන් වහන්සේ ගැනයි මේ කියන්නේ.

ඒ විධියටම, ඇස ගැන කිව්වා වගේ කන ගැනත්, මේ පින්වතුන් දන්නවා ආයතන හය. ඇස, කන, නාසය, දිව, කය, මන. ඇත්ත වශයෙන් අපට ඉන්ද්‍රිය කියලා කියන්න පුළුවන්. මේ ඉන්ද්‍රියයන් හය. ඉන්ද්‍රියයන් හයට අදාළ අරමුණු හඳුන්වලා තියෙන්නේ රළ හැටියට. ඉතින් මේ රළ කියන වචනයට මේ කාලයේ පාවිච්චි කරනවා නේ 'තරංග'

කියලා. මේක අපි ටිකක් මේ විධියට හිතලා බලමු. මේක ඇත්ත වශයෙන් මේ සළායතන මුල් කරගෙන භාවනා කරන යෝගාවචරයින්ට වටිනා සූත්‍රයක්. මේ ඇහැ කියන මූදේ රූප නමැති රළ වේග තියෙනවා. තරංග තියෙනවා. මේ රූප තරංගවලට අහු වුණොත් දිය සුළියට ඇදිලා ගිහිල්ලා අන්තිමට ග්‍රහණයට අහු වෙලා රූප රකුසන්ට බිලි වෙනවා. ඒ වගේමයි කණ. ඔන්න තරංග කතාවට හොඳට ගැළපෙනවා. කණ නමැති මුහුදේ ශබ්ද තරංග තියෙනවා. මේ ශබ්ද තරංග වේගයට අහු වුණොත් මොකද වෙන්නේ? ඒ සුළියට අහු වෙලා ග්‍රහණයට අහු වෙලා ශබ්ද රකුසන්ට ගොදුරු වෙනවා. මනසට ධම්ම තරංග, ධම්ම රැළි ඉතින් ඒක විදර්ශනාවටත් උපකාරී වන දෙයක්. ඒක අපි එක් වරක් දැක්කයි, එක සැරයක් දැක්කයි, කිව්වට මොකද මෙතන රළ වේග ගොඩක්. අපි දන්නෙම නැතුව ඒ රළ ඒ රළ වේග -අන්තිමට ඒ රැළි රළගෙඩිවලට අපි අහු වෙනවා. ඔන්න ඒක අමතර දෙයක් මේක ආශ්‍රයෙන් ගත යුතු. ඉතින් ඔන්න සමුද්‍රය එහෙම තේරුම්ගන්න.

ඊළඟට 'ද්වාදසා වට්ටං' දොළොස් දිය සුළියක් ගැන කියනවා. දිය සුළිය. අමුතුවෙන් ඒකට සූත්‍රයක් ඕනේ නැහැ. ඔය සූත්‍රයෙන්ම හෙළි වුණා නේ. අර 'ආවට්ට' කියලා කීවේ 'සාවට්ටං' දිය සුළි සහිත මුහුදේ කියලා. දිය සුළි සහිත මුහුදේ කියන එක මෙතන දොළහක් වෙලා තියෙන්නේ කොහොමද? ඇසත් රූපයත්, කනත් ශබ්දයත් ඔය විධියට සලකා ගන්න. ඇස, කන, නාසය, දිව, කය, මන, -රූප, ශබ්ද, ගන්ධ, රස, ඓාට්ඨබ්බ, ධම්ම කියන ඒ එක එකක්ම ලෝකයා තුළ තියෙනවා. ඒවා ආත්ම හැටියට සලකනවා. ඇසත් ආත්මයක් හැටියට සළකනවා. රූපයත් ආත්මයක් හැටියට සලකනවා. කනත් ආත්මයක් හැටියට සලකනවා. ශබ්දයත් ආත්මයක් හැටියට සලකනවා. ඒක නිසා තමයි අනාත්ම පිළිබඳ සඤ්ඤාවේදී 'චක්ඛුං අනත්තා රූපං අනත්තා' කියලා භාවනා කරන්න කියන්නේ. එතකොට ඒ ආත්ම සංඥාව තුළින් ඇහැ වටෙත් රළවේග කැරකෙනවා. රූප වටෙත් කැරකෙනවා. ඔහොම කරකැවිලා තමයි දිය සුළියට අහුවෙන්නේ. ඔන්න ඉතින් එතකොට වට්ටය දොළොස් ආවට්ටය, දොළොස් දිය සුළිය, මේක තුළින් මේ පින්වතුන් හඳුනා ගත්තා.

ඊළඟට පැතිරීම් පහ මොනවද කියන එක 'පඤ්ච පත්ථරං' - මේ පැතිරීම් පහ අපට සංයුක්ත නිකායේ සගාථක වග්ගයේ මාරධීතු සූත්‍රයේ කියවෙනවා **'පඤ්චෝඝ තිණ්ණො අතරීධ ඡට්ඨං'** ඔය රහතන් වහන්සේ පිළිබඳව සැඩ වතුරු පහකින් එතර වුණා කියලා කියනවා. මේ සැඩ

වතුරු පහ, අපට ගන්න තියෙන්නේ, පංචකාම සම්පත්තියයි. පංචකාම සම්පත්තිය තුළයි පැතිරෙන්නේ. ඒ පැතිරීමේ ප්‍රතිඵලය මොකක්ද? මළ තුනකට අහුවෙනවා. කිලිටි තුනකට අහුවෙනවා. ඒ කිලිටි තුනත් අපට එක්තරා සූත්‍රයකින් හෙළි වෙනවා. ඒත් සළායතන සංයුත්තයේ **දුතිය සමුද්ද සූත්‍රයේ** මෙන්න මෙහෙම සඳහන් වෙනවා.

**'යසස රාගො ච දොසො ච අවිඡ්ජා ච විරාජිතා සො ඉමං සමුද්දං සගාහං සරකඛසං සඌම්හයං දුත්තරං අච්චතරි'**[5] ඒ කියන්නේ යමකු තුළ රාගයත්, දෝසයත්, අවිද්‍යාවත්, විරාජිතා කියන්නේ මැකී ගොස් ඇත්ද, මේ රහතන් වහන්සේ ගැන කියන්නේ. එබඳු ඒ රහතන් වහන්සේ ඔන්න එතර වුනා අර කියාපු ග්‍රහණ සහිත, දිය සුළි සහිත, ඊළඟට රළ සහිත, ඒ මුහුදෙන් එතර වුණා. මේ ඔක්කොම පෙළගැහිලා එන හැටි බලන්න. එතකොට ඔන්න ඒ රාග, දෝස, අවිජ්ජා කියන එක මළ හැටියට තේරුම් ගන්න.

ඊළඟට තියෙන 'ද්විරාවට්ටං' කියන එක 'ආවට්ට දෙක' ඒ කියන්නේ දෙකක් අතර කරකැවීම මොකක්ද කියන එකත් ඒකත් අපට අහුවෙනවා. ඒත් වේදනා සංයුත්තයේ මෙන්න මෙහෙම සඳහන් වෙනවා. 'සල්ල සූත්‍රයේ'[6] අශ්‍රැතවත් පෘථග්ජනයා පිළිබඳව. අශ්‍රැතවත් පෘථග්ජනයා කියලා කියන්නේ පින්වතුනි, ධර්මය තේරුම්ගන්නේ නැති සාමාන්‍ය පුහුදුනා. පෘථග්ජන පුද්ගලයා පිළිබඳව මෙහෙම සඳහන් වෙනවා. **'සො දුක්ඛාය වෙදනාය ඵුට්ඨො සමානො කාමසුඛං අභිනන්දති. තං කිසස හෙතු'** ඒ කියන්නේ අශ්‍රැතවත් පෘථග්ජනයා දුක් වේදනාවෙන් ස්පර්ශ කරනු ලැබුවේ කාමසුඛය පිළිබඳව සතුටු වේ. මක් නිසාද යත් **'න හික්ඛවෙ අසසුතවා පුථජ්ජනො පජානාති දුක්ඛාය වෙදනාය නිසසරණං අඤ්ඤත්‍ර කාමසුඛා'** ඒ පුහුදුනා දන්නේ නැහැ කාමසුඛය හැර මේ වේදනාවෙන් නික්මීමක්. ඒක නිසා මේ සාමාන්‍ය ලෝකයා සැප දුක් අතර කරකැවෙනවා. අපි අර 'සීසෝ පැදිල්ලක්' කියලා කීවේ. ඒ නොදුක් නොසුව වේදනාව පිළිබඳ අවිද්‍යාව තියෙනවා. ඒක දන්නේ නැහැ. ඒකට කැමතිත් නැහැ. එතන අවිද්‍යාව තියෙනවා. ඊළඟට සැප වේදනාව යටින් රාගානුසය තියෙනවා. දුක් වේදනාව යටින් පටිඝානුසය තියෙනවා. ඔන්න එතකොට ගැළපෙනවා රාග දෝස අවිජ්ජා කියන මල තුන වැඩෙනවා. ඔන්න එතකොට ඒකත් කිව්වා.

ඊළඟට ඔන්න එනවා අන්තිමට 'එකමූලං', මොකක් ද මේ තනි මූල. ඒකත් අපට හෙළි වෙනවා ඒත් වේදනා සංයුත්තයේ තියෙන, ඒ නමින්ම

තියෙන 'ඵස්සමූලක' සූත්‍රයෙන්.[7] ඒකේ මෙන්න මෙහෙම සඳහන් වෙනවා. **'තිස්සො ඉමා භික්ඛවෙ වෙදනා ඵස්සජා, ඵස්සමූලකා, ඵස්සනිදානා ඵස්ස සමුදයා කතමා තිස්සො. සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා'** මහණෙනි මෙන්න මෙහෙම වේදනා තුනක් තියෙනවා, ස්පර්ශයෙන් හටගත්, ස්පර්ශය මුල් කරගත්, ස්පර්ශය නිදාන කරගත්, ස්පර්ශය සමුදය කරගත්. මොනවාද වේදනා තුන? සැප වේදනාව, දුක් වේදනාව, නොදුක් නොසුව වේදනාව. දැන් අපට ඕන කරන කාරණය අන්න අර 'ඵස්ස මූලක' කියන එතන කියවෙනවා. ස්පර්ශය මුල් කරගෙනයි මේ වේදනා ඇති වන්නේ.

ඉතින් අපි මේ විධියට තේරුවට මොකද කවුරුත් වගේ පිළිගන්න මේ අටුවාචාරීන් වහන්සේගේ අටුවාවල සඳහන් වෙන්නෙ වෙන විවරණයක්. මේ පින්වතුන්ට ඕන නම් ඒකත් පිළිගන්න පුළුවන් වෙන්න අපි ඒකත් මේ අවස්ථාවේ සඳහන් කරනවා. අපි පාතාලයේ ඉඳලා උඩට විවරණය කළා. අටුවාචාරීන් වහන්සේ මුල ඉඳලා පාතාලය දක්වා විවරණය කරනවා මෙහෙම. 'ඒක මූලං' කියන එක අටුවාවේ තෝරන්නේ මෙහෙමයි. සංසාරයේ සත්ත්වයාගේ පැවැත්මට හේතු වන්නේ - ඒකට මූල - අවිද්‍යාවයි තණ්හාවයි කියලා මුල් දෙකක් තියනවා. හැබැයි මොන යම් හේතුවකින් හෝ අටුවාචාරීන් වහන්සේ කියනවා මොකක්ද අපි ගන්න ඕනෑ -තණ්හාවයි. හොඳට මතක තබාගන්න අටුවාවේ කියන්නේ එකම මූල නම් තණ්හාවයි. ඊළඟට **'ද්විරා වට්ටං'** දෙකක් අතර ඇති කරකැවීම කියන එක අටුවාවේ තෝරන්නේ ශාස්වත දෘෂ්ටියයි උච්ඡේද දෘෂ්ටියයි අතරෙයි ලෝකයා කරකැවෙන්නේ. ඔන්න ඔහොමයි තෝරන්නේ. **'ඒක මූලං ද්විරා වට්ටං'**. අපි කිව්වා වගේ පංචකාමය කියන එක අටුවාව පිළිගන්නවා. 'තිමලං' කියන මළ තුන කිලිටි තුන රාග, දෝස, මෝහ කියලා තෝරනවා. අපි කිව්වා අවිජ්ජා කියල. ඊළඟට සමුද්‍ද කියන එක, මුහුද කියන එක තෝරන්නේ ඒත් තණ්හාව හැටියට. මුහුද තණ්හාවමයි. **'සමුද්‍ද'**. ඊළඟට දොළොස් දිය සුළි හඳුන්වන්නේ අර අපි කිව්වා වගේම දොළොස් ආයතන හැටියට. අපි කිව්ව අදහසම තමා එතැනත් තියෙන්නේ. නමුත් ඔන්න අන්තිමට පාතාලය තෝරන්නේ ඒකත් තණ්හාව හැටියට. එතකොට අටුවාවේ කියන හැටියට මේ උපමා හතෙන් උපමා තුනක්ම තණ්හා හැටියට ගන්න ඕනෑ. ඒක කොච්චර සාධාරණද කියලා හිතලා බලන්න ඕනෑ. අර්ථවත්ද කියලා. මූලත් තණ්හාවයි. මුද්‍දත් තණ්හාවයි. පාතාලයත් තණ්හාවයි. තණ්හාව තුන් තැනක තියනවා. ඒක ගැළපෙන්නේ නැහැ. ඒකයි අපි කීවේ මේක වටිනාම සූත්‍රයක්.

මේ සූත්‍රය තුළින් අපි මතු කරගන්න වැදගත්ම කාරණය තමයි මේ **'ඵස්ස මූලක'** කියන වචනය. ස්පර්ශයේ තියෙන වැදගත්කම. එතකොට මේ ස්පර්ශය කියලා කියන වටිනා වචනය ගැන සූත්‍ර දේශනා අතරින් ගැඹුරුම විවරණය අපට හමුවන්නේ දීඝ නිකායේ මහා නිදාන සූත්‍රයේයි.[8] දැන් අපි ඒකටයි මාරු වෙන්නේ. මේ මහා නිදාන සූත්‍රය කොයිතරම් ශ්‍රේෂ්ඨද කියතොත් සතිපට්ඨාන සූත්‍රයට කිට්ටු කරන්න පුළුවන් යම් විධියකින් -යම් තරමකට. ඒ වගේම, සතිපට්ඨාන සූත්‍රය වගේම, ඒක දේශනා කරන්න යෙදුනේ කුරු රටේ කම්මාසදම්ම නමැති නියම්ගම්හි දී. මෙහෙමයි සඳහන් වන්නේ නිදාන කථාවේ දී. බුදුරජාණන් වහන්සේ කුරු රටේ වැඩ වාසය කරන අවස්ථාවක ආනන්ද ස්වාමීන් වහන්සේ බුදුරජාණන් වහන්සේ ළඟට ඇවිල්ලා මෙන්න මෙහෙම ප්‍රකාශයක් කරනවා. 'ස්වාමීනී ආශ්චර්යයි, අද්භූතයි, කොයිතරම් මේ පටිච්ච සමුප්පාද ධර්මය ගැඹුරු ද ඒ වගේම ගැඹුරු හැටියට පෙනෙනවාද කියන එක හරිම ආශ්චර්යවත්. හැබැයි භාග්‍යවතුන් වහන්ස එහෙම වුනාට මොකද මේ පටිච්චසමුප්පාදය මට බොහොම සරල හැටියට වැටහෙනවා. ''ඔන්න බුදුරජාණන් වහන්සේ ඒකට දක්වන ප්‍රතිචාරය මොකක්ද? මා හෙවං ආනන්ද' -ආනන්ද එහෙම කියන්න එපා. එහෙම කියන්න එපා ආනන්ද, මේ පටිච්චසමුප්පාද ධර්මය ගැඹුරුයි. පෙනුමත් ගැඹුරුය" "ඊළඟට කියනවා ඒකේ වැදගත්කම. ආනන්ද මෙන්න මේ ධර්මය නොතේරීම නිසා තමයි, වටහා නොගැනීම නිසා තමයි, මේ ප්‍රජාව, මේ සත්ත්ව ප්‍රජාව, මේ දීර්ඝ සංසාරයේ අවුල් වුණු නූල් බෝලයක් වාගේ, අවුල් වුණු බබුස් තණ මිටියක් වගේ, අපායෙන් දුගතියෙන් සංසාරෙන් මිදෙන්නේ නැත්තේ. ඒ තරම් ව්‍යාකූලත්වයට පත්ව තියෙන්නේ මේ පටිච්ච සමුප්පාද ධර්මය නොතේරීම නිසා" කියලා ඔන්න එතන ඉඳලා බුදු රජාණන් වහන්සේ හරියට ගෝලයකුට යමක් තෝරලා දෙන්නා වගේ මේ ධර්ම භාණ්ඩාගාරික ආනන්ද ස්වාමීන් වහන්සේට මේ පටිච්ච සමුප්පාදයේ ඉතාමත්ම ගැඹුරු අංශ කීපයක් විවරණය කරනවා. මහා නිදාන සූත්‍රය ඇත්ත වශයෙන්ම ගැඹුරුම සූත්‍රයක් හැටියට බොහෝදෙනා සලකන එකක්. අපි තේරුම් කරන්න බලමු. ගැඹුරුයි කියලා භය වෙන්න දෙයක් නැහැ.

ඉතින් මේකෙදී අපි කෙටියෙන් කීවොත්, ඒකෙ මූලික පරමාර්ථය පෙන්නුම් කරන්නේ, බුදුරජාණන් වහන්සේ -අර ඵස්ස ගැන නේ අපි කථා කළේ. නාම රූපය- නාම රූපය අපි කලින් කිව්වා නාමය කියන්නේ වේදනා, සංඥා, චේතනා, ඵස්ස, මනසිකාර බව රූපය, කියලා කියන්නේ මහාභූත ධර්ම කියන පඨවි, ආපො, තේජො, වායො ආශ්‍රයෙන් ගත්තු

රූප සංඥාව බව. එතකොට මෙතනදී බුදුරජාණන් වහන්සේ මේ සූත්‍රයේ දී නාමයත් රූපයත් අතර තියෙන අන්‍යෝන්‍ය සම්බන්ධතාවත් ඊළඟට නාමරූපයත් විඤ්ඤාණයත් අතර තියෙන අන්‍යෝන්‍ය සම්බන්ධතාවත් පුදුමාකාරයෙන් පැහැදිලි කරනවා, පියවරෙන් පියවරට, ආනන්ද ස්වාමීන් වහන්සේට ඒත්තු ගන්වමින් ප්‍රශ්නෝත්තර වශයෙන්. ඉතින් මෙතැනදී අපි මේ කාරණය මේ පින්වතුන්ට තේරුම්ගන්න පුළුවන් ආකාරයට ඉදිරිපත් කරන්න බලනවා.

ඉස්සර වෙලාම කියන්න තියෙන්නේ මේ සූත්‍රයේ විශේෂත්වය. දැන් බොහෝදෙනා පටිච්ච සමුප්පාදය තෝරනකොට අපි කිව්ව නේ ඒ සම්මත ක්‍රමයේ හැටියට අවිද්‍යාවේ ඉඳලනේ තෝරන්නේ. අවිජ්ජා සංඛාරා-එදා මහාපදාන සූත්‍රයේදීත්[9] අවිජ්ජා සංඛාරා සඳහන් වෙන්නේ නැහැ. මේ සූත්‍රයේත් අවිජ්ජා සංඛාරා සඳහන් වෙන්නේ නැහැ. ඒ වෙනුවට මූලික වැදගත්ම තැන හැටියට දැක්වෙන්නේ මෙන්න මේ නාමරූප විඤ්ඤාණ දෙකේ සම්බන්ධතාවයි. තවත් කාරණයක්. සාමාන්‍යයෙන් දැන් අපිට හුරු පුරුදු දන්නව නේ අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සො - නාමරූපයත් ඵස්සයත් අතර සාමාන්‍යයෙන් අපි බලාපොරොත්තු වෙනවා සළායතනය. නමුත් මේ සූත්‍රයේ බැලූ බැල්මට සළායතනය සඳහන් වෙන්නේ නැහැ. ඒ වෙනුවට සූත්‍රයේ එක තැනක සඳහන් වෙනවා ස්පර්ශය කියලා කියන්නේ මොකක්ද කියලා. ස්පර්ශය කියන්නේ චක්ඛු සම්ඵස්ස, සොත සම්ඵස්ස, ඝාණ සම්ඵස්ස, ජිව්හා සම්ඵස්ස, කාය සම්ඵස්ස, මනො සම්ඵස්ස. ඔන්න නොකිව්වා කියලා කියන්න බැහැ. එතකොට ස්පර්ශය තෝරන්නේ අන්න අර කියාපු ආයතන හය ආශ්‍රයෙනුයි. ඔන්න ඊළඟට මෙතන වැදගත්ම කාරණය තමයි අපි කිව්වා වගේ නාමයත් රූපයත් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාව පෙන්නුම් කිරීම. අපි එදත් තේරුම් කළා නාමය කියලා කියන්නේ යමක් හඳුනාගැනීම පිළිබඳ පැත්ත. මේ ස්පර්ශයේ තියෙනවා දෙපැත්තක්. ගැටීමත්, ගැටීම හඳුනාගැනීමත් කියන එක. එතකොට මෙතැනදී සියුම් කාරණයක් බුදුරජාණන් වහන්සේ ප්‍රශ්නෝත්තර වශයෙන් ආනන්ද ස්වාමීන් වහන්සේට පෙන්නුම් කරන්නේ.

එතැන මෙන්න මේ විධියට අමුතු වචනත් යොදනවා. ඒවා පුළුවන් තරම් සරල කරන්න බලන්නම්. ආනන්ද ස්වාමීන් වහන්සේට ඒත්තු ගන්වන්නේ මෙහෙමයි. 'ආනන්ද' කියලා තේරුම් කරනවා. අවසානයට යොදන්නේ

"යම් ආකාරවලින් යම් ලකුණුවලින්, යම් නිමිතිවලින්, යම් මාතෘකාවලින් නාමකායයක් පෙන්නුම් කළ හැකිද, ඒ ආකාර, ඒ ලකුණු, ඒ නිමිති, ඒ මාතෘකා නැතිනම් රූපකායයෙහි අධිවචන සම්ඵස්සයක් පෙන්නුම් කළ නොහැකිය. මේ සූත්‍රයෙහි විශේෂ වචන දෙකක් සඳහන් වෙනවා. අධිවචන සම්ඵස්ස, පටිඝ සම්ඵස්ස කියලා. අන්න ඒක කලින් මතක තියාගන්න ඕනෑ. ඒක තමයි බොහෝදෙනාට ගැටළුවක් වෙලා තියෙන්නේ. ස්පර්ශය කියන වචනය ගැන කතා කරනකොට බුදුරජාණන් වහන්සේ මෙතැනදී අමුතු විධියේ වචන දෙකක් යොදනවා - අධිවචන සම්ඵස්ස, පටිඝ සම්ඵස්ස. ඒතෙන්දී දැන් අපි නාමය කියන එක, නම් කිරීම හා සම්බන්ධ කිරීම නිසා ඔන්න තේරුම් කරන්න ලෙසියි. අධිවචන කියලා කියන්නේ පින්වතුනි, භාෂාව හා සම්බන්ධ දෙයක්. මොකද අධිවචන, නිරුත්ති, පඤ්ඤත්ති කියන ඒවා භාෂාවට අදාළයි. යමක් තේරුම් කිරීමේ දී උපකාර වන දේවල්. එතකොට මේ ස්පර්ශයේ තියෙනවා හඳුනාගැනීම් පැත්තක්. අධිවචන සම්ඵස්ස කියන්නේ ඒකයි.

ඊළඟට ගැටීම් පැත්ත තමයි පටිඝ සම්ඵස්ස කියන්නේ. ඔන්න ඔය දෙක එකිනෙකට උපකාර වන හැටි පෙන්නුම් කරන්න බුදුරජාණන් වහන්සේ මෙතනදී ඉස්සර වෙලා ප්‍රකාශ කරන්නේ යම් ආකාර, ලකුණු, නිමිති ආදියකින් නාමකායයක්, -නාමය කියන එකක් - පෙන්නුම් කරනවාද, ඒ ලකුණු, නිමිති නොමැතිව රූපකායයෙහි අධිවචන සම්ඵස්සයක් ගැන කතා කරන්නට බැරිය. රූපකාය පිළිබඳව අධිවචන කියලා කියන හැඳින්වීමත් පෙන්නුම් කරන්න බැහැ නාමකාය නැත්නම්. ඔන්න ඒකේ අනිත් පැත්ත කියනවා. යම් ආකාර, යම් ලකුණු, යම් නිමිති, යම් මාතෘකාවලින් රූපකාය පෙන්නුම් කළ හැකිද, ඒ ලකුණු ආකාර නිමිති ආදියක් නොමැති නම් නාමකායයෙහි පටිඝ සම්ඵස්සයක් පෙන්නුම් කරන්න බැහැ. මේක හොඳට ඇහුම්කන් දෙන කෙනාට තේරෙයි. මේක තේරුම් කරන්න කෙටි උපමාවක් කිව්වොත් ස්පර්ශය කියලා කියන්නේ නාමයෙත් රූපයෙත් 'දෙබිඩි දරුවෙක්' වගේ. මොකද නාමයෙහි නම් කිරීමත් අවශ්‍ය වෙනවා, රූපයෙහි ගැටීමත් අවශ්‍ය වෙනවා, ස්පර්ශය සම්පූර්ණයෙන්ම අවබෝධ කරගැනීමට. ඒ කියන්නේ සවිඤ්ඤාණක ලෝකයේ. අවිඤ්ඤාණක ලෝකයේ නොවේ. සවිඤ්ඤාණක ලෝකයේ ගැටීම කියන එක තේරුම්ගැනීමට නාමය - නාමය කියනකොට මතක තියාගන්න වේදනා, සංඥා, චේතනා, ඵස්ස, මනසිකාර කියන ධර්ම තුළින් තමා යමක් හඳුනාගන්නේ. ඒක දන්නවා නේ. එතකොට රූපය කියලා කියන්නේ ඒ හඳුනාගැනීම් තුළින් මහා භූතධර්ම කියන පඨවි, ආපො, තේජො, වායෝ. ඒවායේ ගැටීමකුත් තියෙන්න

ඕනෑ. අපි කලින් කිව්වා නේ - කියන්න ඇති මං හිතන්නේ -අර අන්ධයෙක් ගිහිල්ලා හිම කැටේක හැපුණොත් එහෙම ඉස්සරවෙලාම පඨවි සංඥාව ගන්නේ. ඒක ටිකක් දිය වෙනකොට පස්සෙ බලනකොට මෙන්න ආපෝ. ඊට පස්සේ ඔන්න වායෝ. ඒ විධියට මේ ලෝකයා හඳුනාගන්නේ මහාභූත ධර්ම අන්ධයා වගේම. ඊළඟට ඒවා නම් කරනවා. කොහොම හරි ඒ ගැටීම. ඒ ගැටීමකුත් අවශ්‍ය වෙනවා.

එතකොට මේක නාමකායයට උපකාර වන ලකුණු තුළින් රූපකායට හැඳින්වීමක් එනවා. රූපකායට අදාළ නිමිති තුළින් නාමකායට ගැටීමක් එනවා. ඔන්න ඊළඟට බුදුරජාණන් වහන්සේ ඒක සම්පූර්ණ කරන්න තව කියනවා "ආනන්ද යම් ආකාර ලකුණු, නිමිතිවලින් නාමකායක් හෝ රූපකායක් හෝ පෙන්නුම් කළ හැකිද? ඒ ඒ ආකාර ලකුණු, නිමිති ආදිය නොමැති නම් අධිවචන සම්ඵස්සයක්වත්, පටිඝ සම්ඵස්සයක්වත් පෙන්නුම් කරන්නට බැරිය.

ඔන්න ඊළඟට අවසාන වශයෙන් කියනවා යම් ආකාර ලකුණු නිමිති ආදියකින් නාම රූපයක් පෙන්නුම් කළ හැකිද? එහෙම එකක් නොමැති නම් 'ස්පර්ශයක්' කියන අවස්ථාවකුත් දැක්විය නොහැකි ය.

ඔන්න නිගමන හතර. ඉස්සර වෙලා කිව්වේ නාමයට අදාළ ලකුණු නොමැති නම් රූපයෙහි අධිවචන සම්ඵස්සයක් නැහැ. රූපයට ඕනෑ කරනවා නාමයේ පිහිට. ඊළඟට කියනවා රූපයට අදාළ ලකුණු නිමිති නොමැතිනම් නාමයට ගැටීම කියන සංකල්පයකුත් එන්නේ නැහැ. ඊළඟට කියනවා ඒ දෙකම නැත්නම් අධිවචන සම්ඵස්සය, පටිඝ සම්ඵස්සය ඒ දෙපැත්තක් නැහැ. අන්තිමට කියනවා, නාමරූපයක් නැත්නම් ඵස්සයකුත් නැහැ. ඔන්න එතකොට ඒක ගැන කීවා.

ඊළඟට කාලය තියන හැටියට අපි තව විවරණය කරන්න බලමු. ඊළඟට තව කාරණයක් බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා. එතන දී යන්නේ විඤ්ඤාණයත් නාමරූපයත් අතර සම්බන්ධතාව. එතන තමයි ඉතාමත්ම ගැඹුරු තැන. ඒතෙන්දිත් බුදුරජාණන් වහන්සේට පියවරෙන් පියවරට ආනන්ද ස්වාමීන් වහන්සේට කියන්න සිද්ධ වෙනවා, උත්තර දෙන්න සිද්ධ වෙනවා. ඉස්සර වෙලා පෙන්නුම් කරන්නේ - ඔව් කියන එක නොවේ, නැත කියන එකෙන් උත්තර දෙන විධියටයි අහන්නේ. බුදුරජාණන් වහන්සේ ඔන්න ඉස්සර වෙලාම පෙන්නුම් කරන්නේ නාමරූපයට විඤ්ඤාණය අවශ්‍ය බව. පෙන්නුම් කරන්නේ මේ විධියටයි. "ආනන්ද

විඤ්ඤාණය මව් කුසට බැසගත්තේ නැත්නම්, මව් කුසක නාමරූපයක් ඉතිරි වන්නේද? 'නැත ස්වාමීනී' කියලා ප්‍රකාශ කරනවා. ඉතින් එයින් පෙන්නුම් කරන්නේ මොකක්ද?

අපි ඩිංගක් කියලා හිටිමු. දැන් සමහරු හිතන්නේ - ඔය බටහිර මනෝවිද්‍යාඥයින් විඤ්ඤාණය ගැන විතර නේ කථා කරන්නේ. නාමරූපය ගැන කතා කරන්නෙම නැහැ නේ. මරණ අවස්ථාව ගැන හැමෝම කතා කරනවා. දැන් කාලේ ලස්සන වචනවලින් ඔය NDE, ADE, මොනවද මොනවද දාගෙන. නමුත් අවසානයේ බලනකොට බුදුරජාණන් වහන්සේ කියන්නේ මැරෙන්න කලින් මව්කුසක නාමරූප සටහනක් ඇවිල්ලා තියෙනවා. විඤ්ඤාණය ගිහිල්ලා එකතු වුණේ නැත්නම් අන්න නාම රූපය එතන වැඩෙන්නේ නැහැ. එහෙම නැත්නම්, විඤ්ඤාණයේ පිහිට නැත්නම් නාමරූපයක් එතැන මව්කුසේ ශේෂ වන්නේ නැහැ. ඊළඟට කියනවා එපමණක් නොවේ. ඊළඟට බුදුරජාණන් වහන්සේ අහන ප්‍රශ්නය ''යම්කිසි විධියකින් ආනන්ද ඒ විඤ්ඤාණය මව්කුසින් ගිළිහී ගියහොත් නාමරූපය වැඩිලා **'ඉත්ථත්ත'** කියලා කියන මෙන්න මේ භව තත්ත්වයක් -උත්පත්තියක් ලබනවාද? මව් කුසක අපි හිතමු ඉස්සරවෙලා අර මඩ පැල්ලම වගේ අර නාම රූපය. අවසාන හිතේ අරමුණ නාමරූපය බව දන්නවා නේ. ඔය ගති නිමිත්ත ආදී වශයෙන් කියන්නේ. ඒක ගිහිල්ලා සටහන තියනවා. නමුත් නාම - විඤ්ඤාණය යන තුරු - ඒක ජීවය බවට පත් වුණේ නැහැ. ඒක සජීවී වන්නේ විඤ්ඤාණයත් එකතු වුණාම. එහෙම සජීවී වුණාට මොකද අර ඉන්න කාලය තුළ - කොතෙකුත් මේ පින්වතුන් අහලා තියෙනවා නේ මූඪගබ්භ කතන්දර එහෙම. දරුවන් බලාපොරොත්තු වුණාට මව්පියෝ අන්තිමට බලනකොට නිකම් මස් ගුලියක් විතරයි එළියට එන්නේ. මොකද හේතුව? අර විඤ්ඤාණය බැහැර වුණා.

යම් කිසි කර්ම හේතුවක් නිසා විඤ්ඤාණය ගිලිහී ගියා නම්, එහෙනම් අර නාමරූපය **'ඉත්ථත්ත'** කියන මේ භව තත්ත්වයට උත්පත්තියක් ලබන්නේ නැහැ. ඒක ආනන්ද ස්වාමීන් වහන්සේ පිළිගත්තා.

ඔන්න එතනින් නවත්වන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ ඊළඟට ප්‍රකාශ කරනවා "යම්කිසි විධියකින් ආනන්ද දරුවකුගේ හෝ දැරියකගේ විඤ්ඤාණය ළාබාල කාලයේදීම ගිලිහී ගියොත්, ඒ දරුවාගේ හෝ දැරියගේ නාම රූපය මහත් බවට, විපුල බවට වැඩෙන්නේ ද?" 'නැතමය ස්වාමීනී' ඔන්න එතැනිනුත් හෙළි වෙනවා කාරණයක්. ඉතින් ඒ කියන්නේ අපි මේ සාමාන්‍ය ලෝකයා නාමරූපය කියලා කියන්නේ අන්න අර විඤ්ඤාණය

අපට පෙනෙන්නේ නැහැනේ- විඤ්ඤාණයෙන් ක්‍රියාත්මක කරවන නාමරූප කොටසයි. ඒතකොට ඒක උපන්නට පස්සේ විඤ්ඤාණය ගිලිහිලා ගියොත් ඒක මළ කඳක් මිසක් නාමරූපයක් නොවේ නේ. අන්න ඒකත් එතකොට තහවුරු වුණා.

ඔය කාරණා- ඔය සාධක තුන- ආනන්ද ස්වාමීන් වහන්සේට ඒත්තු ගන්වලා ඉවර වෙලා ඔන්න බුදුරජාණන් වහන්සේ නිගමනය දෙනවා. 'එම නිසා ආනන්ද' එතන වචන කීපයක් බුදුරජාණන් වහන්සේ අවධාරණය කරන්නේ- 'එසෙ ව හේතු, එස පච්චයො, එස සමුදයො නාමරූපස්ස යදිදං විඤ්ඤාණං' ඒක නිසා ආනන්ද මෙන්න මේකමයි හේතුව, ප්‍රත්‍යය, නිදානය, නාමරූපයට එනම් විඤ්ඤාණය. නාමරූපයට. විඤ්ඤාණය නැතිව බෑ කියන එක එහෙම ඒත්තු ගන්නනවා.

ඔන්න ඊළඟට අනිත් පැත්ත ප්‍රකාශ කරනවා. ඒ වගේම විඤ්ඤාණයටත් නාමරූපය නැතිව බෑ කියන එක. ඒකෙදී නම් එක වාක්‍යයකින් කාරණය පෙන්නුම් කරනවා. ඒක මොකක්ද? 'ආනන්ද, විඤ්ඤාණය නාමරූපයේ ප්‍රතිෂ්ඨාවක් නොලැබුවේ නම්- යම් හෙයකින් නොලැබුවේ නම්- එහෙම නම් නැවත ජාතියක් ජරා මරණ ආදියක් පෙන්නුම් කළ හැකි වේද?' 'නැතමය ස්වාමීනී.' ඒ කියන්නේ විඤ්ඤාණය නාමරූපයක පිහිටියේ නැතිනම් භව තත්ත්වයක් නැහැ. නැවත උත්පත්ති කථාවක් නැහැ. ඉතින් ඕක දිගින් දිගට කියන්න බැහැ. රහතන් වහන්සේලා කරන්නේ අන්න අර විඤ්ඤාණය නාමරූපයේ නොපිහිටන තත්ත්වයට, අප්පතිට්ඨිත තත්ත්වයට, ගෙන ඒමයි. ඔය විධියට විඤ්ඤාණයත්, නාම රූපයත් අතර තියෙන අන්‍යොන්‍ය සම්බන්ධතාව පෙන්නුම් කරලා ඉවර වෙලා ඔන්න ඊළඟට මහ පුදුම ප්‍රකාශයක්. ගැඹුරු ප්‍රකාශයකින් ඔන්න හකුළුවා දක්වනවා මේ කාරණය. "එම නිසා ආනන්ද, මෙතෙකින්මය ආනන්ද, කෙනෙක් උපදනේ -අපි මේ පාලි වචන වෙනුවට සිංහල වචන විතරක් කියමු- "එම නිසා ආනන්ද මෙතෙකින්මය කෙනෙක් උපදනේ හෝ දිරනේ හෝ මිය යන්නේ හෝ චුත වන්නේ හෝ නැවත උපදින්නේ හෝ, මෙතෙකින්මය ආනන්ද, අධිවචන මාර්ගයක්, නිරුක්ති මාර්ගයක්, ප්‍රඥප්ති මාර්ගයක් පෙන්නුම් කළ හැක්කේ. මෙතෙක් දුරටය, ආනන්ද ප්‍රඥාවගේ බැසගැන්ම ඇත්තේ. මෙතෙක් දුරටය, ආනන්ද **'ඉත්ථත්ත'** කියලා කියන මේ භව තත්ත්වයක් සඳහා- ඔන්න වචනය එනවා. **'වට්ටං වට්ටති'** වට්ටයක් කරකැවෙන්නේ, මෙතෙක් දුරටය. කෙතෙක් දුරටද **විඤ්ඤාණය සහ නාමරූපය.** අවසාන කරන්නේ කොහොමද? විඤ්ඤාණය සහ නාමරූපය අතර වට්ටයක් කරකැවෙන

නිසා තමයි, කෙනෙක් උපදින්නේත්, දිරන්නේත්, මැරෙන්නෙත්, චුත වන්නෙත්, නැවත උපදින්නෙත්. ඒ ඉපදීම පිළිබඳ අධිවචන සම්ඵස්සය - ඒ අධිවචන- ඒ පිළිබඳ ව්‍යවහාර මාත්‍රයක් පවා කරන්න පුළුවන් වන්නේ. අධිවචන නිරුක්ති. ඒ වගේම ප්‍රඥාව එතනින් ඉවර වෙනවා. ඊට එහාට යන්නේ නැහැ. මේ දෙක තුළ තමයි ඔක්කොම ගැටලුව තියෙන්නේ. ප්‍රඥාව මෙතනයි. අන්තිමට කියන්නේ මේ පැවැත්ම කියන එක- ඒකෙන් අපට පැහැදිලි වන්නේ- **දෙකක් අතර කරකැවීමයි. 'වටයක්'**.

අපි කලිනුත් කියන්න ඇති සමහර විට මිලක් නියම කරන්න බැහැ සැපයුමත් ඉල්ලුමත් අතර වටයක් නැත්නම්. ඒ වගේ මෙතැනත් විඤ්ඤාණ නාමරූප දෙකේ වට්ටය තුළයි සත්ත්වයෙක් පිළිබඳ ප්‍රඥප්තියක් -ඒ පිළිබඳ කතන්දර ඔක්කොම තියෙන්නේ. ඔන්න ඔය විධියට එතකොට ගැඹුරුම දේශනාවක් මහා නිදාන සූත්‍රයේ තියෙන්නේ.

මෙතන අපි මේ 'ඵස්ස' ගැන කියාපු එක වැඩි දෙනෙකුට පැහැදිලි නැති නිසා අපි ටිකක් බලමු. වෙනදා වගේ උපමා ලෝකයට යන්න බලමු මේක ටිකක් තේරුම් කරන්න. මේ ස්පර්ශය කියලා කියන ගැටීම- අපි සවිඤ්ඤාණක ලෝකයේ ගැටීම කියලා කියන එකේදී අර දෙකක් පිළිබඳ හැඟීම ඉබේටම එනවා. විඤ්ඤාණය- දන්නවා නේ මේ 'සවිඤ්ඤාණක ලෝකය' කියන්නේ විඤ්ඤාණය සහිතයි. අපි ඉස්සර වෙලා හිතමු අවිඤ්ඤාණක ලෝකය ගැන. ඒ කියන්නේ ගස් ගල් ආදිය ගැන. ඔන්න අපි හිතමු ගලක් අරගෙන වීසි කරනවා තවත් ගලක් උඩට. ඒ ගල මේ ගලේ හැපුණාම අර ගලේ පතුරු ගියත් **'අරගලයක්'** ඇති වෙන්නේ නැහැ නේ. අරගලයක් ඇති වෙන්නේ නැහැ 'තමුසෙ මොකද මගේ ඇඟේ හැපුනේ' කියලා. නමුත් ඒ තත්ත්වය නෑ නේ. ටිකකට හිතන්න මේ පින්වතුන් ඔය කලබලකාරී වෙලාවක නගරයේ ඔය පදික වේදිකාවක යන අතරේ හිටි ගමන්ම- තමන්ටත් ඉක්මන් අනිත් එක්කෙනාටත් ඉක්මන් නිසා -ගිහිල්ලා හැප්පුණ හැටියේ 'තමුසේ මොකද මගේ ඇඟේ හැප්පෙන්නේ' 'තමුසෙ නෙ මගේ ඇඟේ හැප්පුණේ' ඒ ඇති මහ කලබැගෑනියකට. අන්න බලන්න එතැනදී අධිවචන සම්ඵස්ස, පටිඝ සම්ඵස්ස. දැන් අර ගලේ කථාව. **ගලේ අරගලයක් නැහැ.**

ඒ වගේ තවත් උපමාවක් කියමු. ඒ උපමාව නම් අපේ දේශනා මාලාවේදිත් කියපු එකක්. ඔය වඩුබාස් උන්නැහැලට වුණත් තේරෙන එකක්. මොකක්ද ඒ. ඒක දැන් බොහෝදෙනා පාවිච්චි කරනවා. ඒ කියන්නේ ඔන්න වඩු බාස්උන්නැහැ කෙනෙක් ලෑලි පලු දෙකක් එකතු

කරලා දොරක් හදනවා. දොරක් හදන, ඒ දෙක පුරුද්දන, අවස්ථාවේ සමහර විට වඩුබාස් උන්නැහැ කියාවි ගෝලයාට මේකෙ මේ හේත්තුව හරි නෑ කියලා. ගෝලයාට අවබෝධයක් නැත්නම් සමහර විට අහවි - බාස් උන්නැහේ වම් පැත්තේ ලෑල්ලද දකුණු පැත්තේ ලෑල්ලේ හේත්තු වෙන්නේ. දකුණු පැත්තේ ලෑල්ලද වම් පැත්තේ ලෑල්ලේ හේත්තු වෙන්නේ? -ඒක මෝඩ ප්‍රශ්නයක් නේ. මොකද ඒකට හේතුව? කාර්මිකයන් තුළ සිරිතක් තියෙනවා. ඒ තමන් වැඩ කරන මෙවලම් ආදියට පණ දෙනවා. ප්‍රාණත්වාරෝපණය කරනවා. දැන් මට ආරංචියි- මම වැඩිය දන්නේ නැහැ ඕවා ගැන. පරිගණක ලෝකයෙත්, පරිගණක යන්ත්‍රය ඇතුළෙත් කවුදෝ ඉන්නවා කියලා කියනවා. ඒ අරකයි. මේ ලෝකයා තුළ තියන ඒ මුලාව තමයි අපි ආරෝපණය කරන්නේ ගස් ගල්වලට. හිත් පිත් නැති ගස් ගල්වලට. ඉතින් බලන්න අර ගලේ පතුරක් ගියත් අරගලයක් ඇති වුනේ නැහැ. නමුත් මනුස්සයෙක් අර විධියට හැපුනොත් එහෙම කොහොමද වෙන්නේ. ඔන්න 'ඵස්ස' ගැනත් ඔය ටික තේරුම්ගන්න. බාස් උන්නැහැට තේරුම් ගන්න පුළුවන් අර කියාපු පුරුද්දන එක ගැන කතා කරන විට. අපි පණ දෙනවා ඒවාට. ඉතින් ඔය විධියට ස්පර්ශය කියන අන්න ඒ ගැඹුරු පැත්ත තමයි අධිවචන සම්ඵස්ස. මේකේ හඳුනාගැනීම් පැත්තකුත් තියෙනවා. ගැටීම් පැත්තකුත් තියෙනවා. එතකොට අවිඥාණක ලෝකයේ නම් අර ගැටීම කියන එක පවා අපි ආරෝපණය කරන දෙයක්. **අපි ආරෝපණය කරන දෙයක්.** ගලක් ගලක හැපිලා තියෙනවා කියන්නේ අපිම ආරෝපණය කරන එකක්. ගලට විඥාණයක් නෑනේ, ඒක සලකාගන්න. අන්න කොහොම හරි. ඔන්න ඔය විධියෙ දෙයක් ස්පර්ශය පිළිබඳව තියෙන්නේ. ඉතින් මෙච්චර වැදගත් වුනේ, ඵස්ස මූලක සූත්‍රය ආශ්‍රයෙන් අපි ආපු නිසයි. ඒකම තමයි ඇත්ත වශයෙන් ගැඹුරුම කාරණය.

අපි මෙතෙන්දීම කියමු මේ බුදුරජාණන් වහන්සේගේ ධර්මයේ තියෙන විශේෂය. වෙන කිසිම ශාස්තෘවරයෙකුට යන්න බැරි වුණා ස්පර්ශයෙන් එහාට. ඒක නිසා තමයි මේ පින්වතුන් කියවලා තියෙනවා නම් දීඝ නිකායේ පළමුවැනි බ්‍රහ්මජාල සූත්‍රයේ[10] හැට දෙකක් දෘෂ්ටි බුදුරජාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළේ එකම පුංචි පාඨයකින්. **'තදපි ඵස්ස පච්චයා' "තදපි ඵස්ස පච්චයා' "තදපි ඵස්ස පච්චයා'.** 'ඒකත් ස්පර්ශය ප්‍රත්‍යය කරගෙන. ඒකත් ස්පර්ශය ප්‍රත්‍යය කරගෙන.' ඒකෙන් ඔක්කොම ප්‍රතික්ෂේප කළේ. එයින් පෙන්නුම් කරනවා බුදුරජාණන් වහන්සේ **ස්පර්ශයට එහා** ගිය බව. එහා ගියේ කොහොමද? අන්න පටිච්ච සමුප්පාද ධර්මය තේරුම් ගැනීම තුළින්. අන්න එතකොට මේකෙන්ම හෙළි වෙනවා පටිච්ච සමුප්පාදයේ

තියෙන වටිනාකම. එපමණක් නොවේ. දැන් ඒක ගැන කිව්ව නිසා ඇතැම් කෙනෙකුට සැකයක් ඇති වෙලා තියෙනවා බොහෝදෙනා අප මේ දෙන විවරණවලට විරුද්ධව කියන කථාවක් තමයි- මේ මව්කුසේ කථාව නිසා මේ සූත්‍රයේ බොහෝ දෙනෙක් කල්පනා කරනවා අර පරණ විධියට මේ භව තුනක් පිළිබඳ කතාවෙයි මෙතන තියෙන්නේ කියලා. මේ භවයට කලින් කතන්තරය.

ඉතින් ඕකට දක්වන සූත්‍රයක් තමයි අංගුත්තර නිකායේ තියෙන තිත්ථායතන සූත්‍රය.[11] තිත්ථ සූත්‍රය කියලා. ඒකෙ මෙන්න මෙහෙම සඳහන් වෙනවා. ඒකෙ විශේෂත්වය තියෙන්නේ පටිච්ච සමුප්පාද ධර්මය චතුරාර්ය සත්‍යය හා සම්බන්ධ කරනවා. කොහොමද? බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. **"ඡන්නං භික්ඛවෙ ධාතූනං උපාදාය ගබ්භස්ස අවක්කන්ති හොති ඔක්කන්තියා සති නාමරූපං නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සො, ඵස්ස පච්චයා වෙදනා, වෙදියමානස්ස ඛො පනාහං භික්ඛවෙ ඉදං දුක්ඛන්ති පඤ්ඤාපෙමි අයං දුක්ඛසමුදයොති පඤ්ඤාපෙමි, අයං දුක්ඛ නිරොධොති පඤ්ඤාපෙමි, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති පඤ්ඤාපෙමි"** ඒකේ තේරුම ඔන්න ප්‍රකාශ කරනවා සංඝයා වහන්සේලාට "ඡන්නං භික්ඛවෙ ධාතූනං උපාදාය" ධාතු හය මොනවාද? ධාතු හය තමයි පඨවි, ආපො, තේජෝ, වායො, ආකාශ, විඤ්ඤාණ. මේ ධර්මය ගැන හුඟක් දන්නා ඇතැම් අයට මතක් වේවි, ධාතු විභංග සූත්‍රයේ[12] බුදුරජාණන් වහන්සේ ආරම්භ කරන්නේ 'ඡධාතුරෝ අයං භික්ඛු පුරිසො' මේ පුරුෂයා කියලා කියන්නේ ධාතු හයක සම්පිණ්ඩනයක්. පඨවි, ආපො, තෙජො, වායො පමණක් නොවෙයි ආකාස විඤ්ඤාණද ඇතුළත්. එතකොට මේ සූත්‍රය බුදුරජාණන් වහන්සේ ආරම්භ කරන්නේ "ඡන්නං භික්ඛවේ ධාතූනං උපාදාය" කියන්නේ පින්වතුනි, ධාතු හයක් උපාදාන වශයෙන් ගෙන - ඒ මැරෙන්නට කලින් පුද්ගලයා තුළ ඒ උපාදානය තියෙනවා නම් - ඊළඟට කියන්නේ මොකක්ද "ගබ්භස්ස අවක්කන්ති හොති" ඒක හේතු කරගෙන ගර්භයකට බැසගැනීමක් වෙනවා. එතකොට විඤ්ඤාණය එතැන කියවුණානේ. විඤ්ඤාණයයි නාම රූපයයි කථාවයි තාම යන්නේ. මේක බොහෝ දෙනා වරදවලා කියනවා මේකෙන් හෙළි වෙනවයි අර භව තුනේ පටිච්ච සමුප්පාද විවරණය කියලා. නමුත් එහෙම පිටින්ම විරුද්ධයි මේක. මේ ධාතු හය ගන්නා තාක් දැඩිව, මේ ධාතු හය හිතෙන් මකා දාන්නේ නැත්නම්, අර ධාතු විභංග සූත්‍රයේ කියන ආකාරයට මකා නොදමන තාක්, සත්ත්වයා තුළින්, අන්න ගර්භයකට බැස ගත්තා. "ඔක්කන්තියා සති නාමරූපං" බැසගත්තු නිසා නාමරූපයක්

ඇති වෙනවා. නාමරූපය ප්‍රත්‍ය කරගෙන සළායතනයක් තියෙනවා. සළායතනය ප්‍රත්‍ය කරගෙන ස්පර්ශය තියෙනවා. ස්පර්ශය ප්‍රත්‍යය කරගෙන වේදනාව තියෙනවා. ඔන්න එතැනදීම අල්ලනවා චතුරාර්ය සත්‍ය ධර්මය. "වෙදියමානස්ස ඛො අහං' වේදනාව ඇති තැනැත්තාටයි "ඉදං දුක්ඛන්ති පඤ්ඤාපෙමි" ඒ පුද්ගලයා පිළිබඳ වේදනාව ඇති අවස්ථාවේ මේක දුකයි කියන කතාව එන්නේ. මේ දුක්ඛ නිරෝධගාමිනී පටිපදාව කියන කථාව එන්නේ. ඔහොම චතුරාර්ය සත්‍යයට පටිච්ච සමුප්පාද ධර්මය සම්බන්ධ වෙනවා.

ඉතින් මේ තරම් වැදගත් පටිච්ච සමුප්පාද ධර්මය. මේකේ වැදගත්කම තව කියවෙච්ච තැන් කොතෙකුත් තියෙනවා. එක් අවස්ථාවක සාරිපුත්ත ස්වාමීන් වහන්සේම බුදුරජාණන් වහන්සේගේ දේශනාවක් ඇසුරෙන් ඒත්තු ගන්වන්න මේ වාක්‍යය කියනවා. "වුත්තං හෙතං භගවතා" භාග්‍යවතුන් වහන්සේ මෙහෙම කියලා තියෙනවා. "යො පටිච්ච සමුප්පාදං පස්සති සො ධම්මං පස්සති[13] යො ධම්මං පස්සති සො පටිච්ච සමුප්පාදං පස්සති', 'යමෙක් පටිච්ච සමුප්පාදය දකීද හේ ධර්මය දකී. යමෙක් ධර්මය දකීද හේ පටිච්ච සමුප්පාදය දකී.' මේක ඇත්ත නම් කී දෙනෙක්ද ධර්මය දන්නේ. පටිච්ච සමුප්පාදය දන්නේ නැතිව ධර්මය දන්නවා කියලා කියන්න බැහැ කියන එකයි මේකෙන් හෙළි වන්නේ බුද්ධ වචනයක් හැටියට.

ඒක නිසාම තමයි පින්වතුනි, බුදුරජාණන් වහන්සේගේ මහා ප්‍රබල දේශනාවක් තියෙනවා මේ පින්වතුන් මට සමාව දෙන්න ඕනෑ මම මේක පාලියෙන් කියනවාට. දැන් බොහෝ දෙනා කැමති නැහැ පාලි වචනයට. ඉංග්‍රීසි වචන තියෙනවා නම් හරිම කැමතියි. පාලි වචනය හරි අරුචියි හැම දෙනාටම. ඉංග්‍රීසි වචනයක් දැම්ම හැටියේ කවුරුත් හරි ආසයි කියවන්න. මොකද 'ශාස්ත්‍රීය' ගතියක් තියෙනවා. ඒ වුනත් මගේ පරණ ගතියට - උද්ධෘත පාඨ ඔක්කොම කියන්න තරම් මගේ කල්පනාවත් අඩුයි. ඒ තරම් ප්‍රබල ධර්ම කාරණාවක් මේක. පටිච්ච සමුප්පාදය පිළිබඳව තෝරන්නේ මෙහෙමයි. **'ජාති පච්චයා භික්ඛවෙ ජරා මරණං. උප්පාදා වා තථාගතානං අනුප්පාදා වා තථාගතානං ඨිතාව සා ධම්මධාතු ධම්මට්ඨිතතා ධම්මනියාමතා ඉදප්පච්චයතා. තං තථාගතො අභිසම්බුජ්ඣති. අභිසමෙති. අභිසම්බුජ්ඣිත්වා අභිසමෙත්වා. ආචික්ඛති, දෙසෙති, පඤ්ඤපෙති. පට්ඨපෙති. විවරති විභජති උත්තානි කරොති පස්සථාති චාහ'**[14] ඔන්න ඒකේ තේරුම ඊළඟට කියමු. එක නිදර්ශනයයි බුදුරජාණන් වහන්සේ ඉස්සරවෙලා දෙන්නේ. 'ජාති පච්චයා භික්ඛවෙ ජරා

මරණං' උපත තියන නිසා ජරාමරණය. ඊළඟට ප්‍රකාශ කරනවා 'උප්පාදා වා තථාගතානං' තථාගතවරු උපදනේ හෝ වේවා, තථාගතවරු නූපදනේ හෝ වේවා, 'ඨිතාව සා ධාතු ධම්මට්ඨිතතා ධම්ම නියාමතා' ඒ ධර්ම ධාතුව, ඒ ධර්ම ස්ථිතිතාව ධම්ම නියාමයතාව ඉදප්පච්චයතාව සිටියේමය. තං තථාගතො 'අභිසම්බුජ්ඣති' ඒ ධර්මතාව තථාගත තෙම අවබෝධ කරයි. වටහාගනී. අවබෝධ කරගෙන වටහාගෙන 'ආචික්ඛති' කියාදෙයි. 'දෙසෙති' දෙසයි. 'පඤ්ඤාපෙති' පනවයි. 'පට්ඨපෙති' පිහිටුවයි. 'විවරති' විවරණය කරයි. 'විභජති' විභාග කර දක්වයි. 'උත්තානිකරොති' පහත් කරලා, සරල කරලා දක්වයි. සරල කරලා දක්වලා අන්තිමට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ 'පස්සථාතිචාහ' බලවු! යයි කියයි. **බලවු! යයි කියයි.**

එතකොට මේ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය ඒකයි. අර තරම් ගැඹුරු ධර්මයක්, අර නානා ප්‍රකාර විධියට විභාග කරලා, විග්‍රහ කරලා, විවරණය කරලා, පහත් කරලා දක්වලා **'බලවු' යැයි කියන්නේ අප වැන්නවුන් සඳහා බව මතක තියාගන්න.** එතකොට අන්න ඒ වගේ වටිනා ධර්මයක්.

ඒ වගේම පටිච්ච සමුප්පාදයේ ශ්‍රේෂ්ඨත්වය ප්‍රකාශ වන තැනක් තියෙනවා ඔක්කොම නොකීවත් "අවිජ්ජා පච්චයා භික්ඛවෙ සංඛාරා. යා තත්‍ර, තථතා, අවිතථතා, අනඤ්ඤථතා, ඉදප්පච්චයතා, අයං වුච්චති භික්ඛවෙ පටිච්චසමුප්පාදො".[15] ඔන්න පටිච්ච සමුප්පාදය හඳුන්වන තවත් තැනක්. 'මහණෙනි අවිද්‍යාව ප්‍රත්‍යයෙනි සංස්කාර. ඒ දෙක අතර 'යා තත්‍ර තථතා' කියලා කියන්නේ ඒ දෙක අතර යම් එසේ බවක්. 'තථතා' කියලා කියන්නේ එසේ බවක්. 'අවිතථතා' කියලා කියන්නේ නොඑසේ නොවන බවක්. 'අනඤ්ඤථතා' කියන්නේ අන්සේ නොවන බවක්. 'ඉදප්පච්චයතා' කියලා කියන්නේ මෙය නිසා මෙය වන බවක්. මෙය නිසා මෙය වන බවක් ඇද්ද මේකයි පටිච්ච සමුප්පාදය. ඔන්න තෝරපු හැටි, ඒක සනාතන ධර්මතාවක් බව, බුදු කෙනෙක් ඇතත්, නැතත් ලෝකයේ සනාතනව පවතින ධර්මතාවක් බව, බුදුරජාණන් වහන්සේ මහ පුදුම විදිහට දේශනා කරලා කියෙනවා. සිංහ නාදයක් වගේ.

ඉතින් ඔය වගේ ධර්මයක් අපි කල්පනා කරන්ට ඕනෑ මේක අපිට තේරෙන්නේ නැහැ කියලා, අහක දාන්නේ නැතිව මේ ධර්මය තේරුම් ගත් කෙනයි මාර්ග ඵල ආදිය ලබන්නේ. ඒක නිසා තමයි අර සුප්පබුද්ධකුට්ඨි රෝගියත් ඒ සෝවාන් වුනාට පස්සේ පටිච්ච සමුප්පාදය තේරුම්ගත් බව

හෙළි වෙන්නේ. දැන් කාලේ නම් සෝවාන් පුද්ගලයෙක් හඳුනාගන්න භාවනා මධ්‍යස්ථානයෙන් නිකුත් කරන සහතිකයක් අවශ්‍ය වෙනවා. ඉස්සර නම් එච්චර ඕනෑ නැහැ. මෙන්න මේ පාඨයෙන් ඒ තැනැත්තාගේ ප්‍රත්‍යක්ෂය පෙන්නුම් කරනවා. **"යං කිංචි සමුදයධම්මං - සබ්බං තං නිරෝධ ධම්මං"**[16] යම් තාක් දෙයක් හට ගන්නා ස්වභාවයක් ඇත් ද, ඒ හැම එකක්ම නිරුද්ධ වන ස්වභාවයක්ද ඇත්තේ ය. මේ ටික තේරුම්ගන්න පුළුවන් අර දෙකක් අතර. අපි කලින් දවසේ ප්‍රකාශ කළා මේ පින්වතුන්ට මතකයි. පටිච්ච සමුප්පාද ධර්මතාව කියන ධර්ම නියාමතාව වෙනමයි, ඒකේ නිදර්ශන වෙනමයි. ඒවා දැන් බොහෝ දෙනා පටලවාගෙන. එතකොට නිදර්ශන දෙකක් තුළ ගැබ් වෙනවා මේ පටිච්ච සමුප්පාද ධර්මය. ඒකමයි මෙතෙන්දිත් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළේ 'අවිජ්ජා පච්චයා සංඛාරා' කියලා. අන්න අර ටික කිව්වා. එහෙම නැත්නම් 'ජාති පච්චයා ජරා මරණං' කියලා ඒ දෙක අතරේ තියෙනවා ධර්මතාව. ඒ ධර්මතාව දැකීමයි පටිච්ච සමුප්පාද ධර්මය දැකීම. අර දොළහම කටපාඩම් කරගෙන කීම නොවේ. ඒ ඔක්කොම පටලැවිලි තවත් වැඩි වෙනවා අර භව තුනකට කඩල දැමීමෙන්, මේ ධර්මය සන්දිට්ඨික අකාලික බව කියලා තියෙද්දීත්. මේ ධර්මයේ ශ්‍රේෂ්ඨත්වය සන්දිට්ඨිකයි අකාලිකයි. මෙලොව මේ ජීවිතයට අදාළවමයි මේ ප්‍රශ්නය දුක පිළිබඳ ප්‍රශ්නය විසඳුවේ. ආයෙ මේක අතීතයට දාලා අතීත අවිද්‍යා අතීතයේ කතන්තරයක් නෑ මෙතන. ඒ අවිද්‍යා කතන්තරයට වැටුනේ මොකද? ඒක අපි කලින් අවස්ථාවකත් ප්‍රකාශ කළා. අර බොහෝ දෙනා දන් මේ උගතුන් පවා මහාපදාන සූත්‍රයේ, මහානිදාන සූත්‍රයේ ඒවායේ අඩුවක් පෙන්නුම් කරනවා. මොකද, අපිට පුරුදු අවිජ්ජා සංඛාරා දෙක නෑ නේ මෙතන. නැතුව නොවේ. **අන්න අර විඤ්ඤාණ නාමරූප දෙක පිළිබඳ යථා තත්ත්වය නොදැනීමමයි අවිජ්ජාව. ඒ නිසා මේ දෙක අතර වටරවුමේ යාමමයි සංස්කාර**. ඔන්න හිතාගන්න එතකොට අවිජ්ජා පච්චයා නොකීවා නොවේ. නියම **'මහා නිදානය'** විඤ්ඤාණයත් නාම රූපයත් අතරයි. අපි අර කිව්වා වගේ එන එන අය හැමෝම නොයෙකුත් හේතුන් නිසා එක එක යුගවල අහන ප්‍රශ්න තියෙනවා. හැමෝම එන්නේ විඤ්ඤාණයයි නාම රූපයයි ගැන අහන්න. නාමරූපය ගැන නම් දැන් කලාතුරකින්. බෙහෝ දෙනා විඤ්ඤාණය ගැනයි. මිය යනකොට වෙච්ච කතන්දර ඕවා තමයි අරගෙන එන්නේ. නමුත් බුදුරජාණන් වහන්සේ මෙච්චර ලස්සනට පටිච්ච සමුප්පාද ධර්මය පෙන්නුම් කරලා තියෙනවා. මෙතන කියෙන්නේ දිය සුළියක් පිළිබඳ කතන්තරයයි.

එතකොට මෙන්න මේ තත්ත්වයෙන් මිදීම - දැන් අර ආරම්භ කළ ගාථාවේ ඍෂිවරයා කියූ රහතන් වහන්සේ පාතාලයෙන් එතෙර වුනා කියලා කියන්නේ මොකද? අපි කිව්ව නේ පාතාලය කියන්නේ ශාරීරික දුක්ඛ වේදනා. මේ ශාරීරික දුක්ඛ වේදනා තමයි දුකේ තියෙන ලොකුම ගැඹුරුම මිදෙන්න බැරි විධියේ තත්ත්වය. නමුත් රහතන් වහන්සේලා එයිනුත් මිදුණු බව අර අපි කලින් අවස්ථාවේ පෙන්නුවා. අර දබ්බමල්ලපුත්ත මහ රහතන් වහන්සේ රහත් වුණු අවස්ථාවේ තමාගේ ශරීරයට ගිනි දල්වා ගත්තා. ඒක දිවි නසාගැනීමක් නොවේ නේ? ඒ හිත අන්න අර අර්හත් ඵල සමාපත්තියට වැදුණාට පස්සේ - ඒ ජීවමාන රහතන් වහන්සේ අපි නොයෙකුත් අවස්ථාවල පෙන්නලා තියෙනවා අර්හත් ඵල සමාපත්තියේ විශේෂත්වය තියෙන්නේ වේදනාවෙනුත් මිදුණා. සාමාන්‍ය කියමනක් තියෙනවා කවුරුත් දන්නවා නිවන කියන්නේ **'අවෙදයිත සුඛයක්'** කියලා. කවුරුත් වගේ දන්නවා. ඒ වගේම ඇතැම් අවස්ථාවල ඔය සාරිපුත්ත ස්වාමීන් වහන්සේගෙනුත් අහලා තියෙනවා 'මේ මොකක්ද ඇවැත්නි මේක සැපයයි කියන්නේ? යම් තැනක වේදනාවක් නැත්නම් මේකෙ ඇති සැපය මොකක්ද? සාරිපුත්ත ස්වාමීන් වහන්සේ කියනවා **'වේදනාවක් නැතිකමම තමයි මෙතැන ඇති සැපත'**[17] මොකද, සැප වේදනාවයි දුක් වේදනාවයි නොදුක් නොසුව වේදනාවයි කියන ඒ සියල්ලම දුකක්. ඉතින් ඔන්න ඒ විධියේ තත්ත්වයක් මේ ධර්මයේ දක්වන්නේ. පාතාලයෙන් එතෙර වුනා කියන්නේ අන්න අර අර්හත් තත්ත්වයයි. ඒක තුළ, ඒ ප්‍රත්‍යක්ෂයේ වටිනාකම මොකක්ද, එබඳු ඒ සිතෙහි - ඒ ටික මේ පින්වතුන් අහලා තියෙනවා - ඒ සිත හඳුන්වන්නේ අනිමිත්ත, අප්පණිහිත, සුඤ්ඤත කියලා. එහෙම නැත්නම් අප්පතිට්ඨිත විඤ්ඤාණය කියලත් කියනවා. දැන් අර විඤ්ඤාණයේ ප්‍රතිෂ්ඨාවක් ගැන කතා කෙරුණා නේ. විඤ්ඤාණය මවු කුසක ප්‍රතිෂ්ඨාවක් ලබනවා. ප්‍රතිෂ්ඨාවක් ලැබුවාට පස්සේ තමයි පුද්ගලයා හැටියට ගන්න පුළුවන්. නමුත් ප්‍රතිෂ්ඨාවක් නොලබන තත්ත්වයට විඤ්ඤාණය පත් කරගැනීම තමා මේ ශාසනයේ ඒ උතුම්ම ඉලක්කය. විමුක්තිය. හිත එයින් මුදා ගැනීම තුළින්.

ඒක නොයෙකුත් ආකාරයෙන් නොයෙකුත් සූත්‍රවල සඳහන් වෙනවා. දැන් ධාතු විභංග සූත්‍රයේ මේ ධාතු හයේ කථාව කිව්ව නිසා - ධාතු විභංග සූත්‍රයේ[18] මේ ධාතු හය මකා හැරීමක්. 'විරාජිතා' කියන්නේ මකා හැරියා. මකා හරින්නේ කෙහොමද? මේ ධාතු හැදිලා තියෙන්නේ අර මැනීම තුළින්. අපි ඔය ධාතු කර්මස්ථාන පිළිබඳ යම් යම් ලියකියවිලිවල ඒවායේ පෙන්නුම් කරල තියෙනවා සාරිපුත්ත ස්වාමීන් වහන්සේගේ දේශනා

ආශ්‍රයෙන් පඨවි, ආපො, තේජෝ, වායෝ කියන ඒවා අපේ හිතේ ඇදිලා තියෙන්නේ අන්න අර කියාපු මේ සවිඤ්ඤාණක සත්ත්වයාට ලැබෙන නාමරූප ආශ්‍රයෙන් ලැබෙන ප්‍රත්‍යක්‍ෂය තුළිනුයි මේවා ගොඩනැගිලා තියෙන්නේ. මේ මැනීමක් කොටින්ම. එතකොට මේ මැනීම නැති කරන්න අන්න සාරිපුත්ත ස්වාමීන් වහන්සේ පෙන්නුම් කරනවා මෙතන තියෙන්නෙත් පඨවි ධාතුව, කෙස් ලොම්, නිය දත් ආදිය නියෝජනය කරන්නෙත් පඨවි ධාතුව. බාහිරව තියෙන්නේ පඨවි ධාතුව. දෙකම එකයි. බාහිර පඨවි ධාතුව ලොකුයි. ඒ වගේම ආපො, තේජෝ, වායෝ ඔය විධියට මේ ශරීරය තුළ තිබෙන ඒ ධාතු ඒවා සමඟ බාහිර ලෝකයත් සමඟ සමාන කිරීම තුළින් යම් අවස්ථාවක අර ධාතූන්ගෙන් සිත මුදාගන්න පුළුවන් වෙනවා. ඒක තමයි ඒ ඇල්ම, ඒ ආසාව, නැති වුන අවස්ථාවේ සිත ඒ ධාතු සංඥාවෙන් මිදුනා. එහෙම මිදිච්ච හිතයි නැවත අර කියපු මවු කුසක උත්පත්තිය නොලබන්නේ. මොකද ඒවා තියෙන තාක්- ඒක නේ අර කිව්වේ 'ඡන්නං ධාතූනං උපාදාය' ධාතු හය ග්‍රහණය කරගෙන සිටින තාක් -අන්න මව් කුසක උපතක් ගැන කථා කරන්න පුළුවන්. දෙකක් අතර කරකැවීමයි අන්තිමට කෙරෙන්නේ.

ඉතින් ඒක නේ අපි කලින් අවස්ථාවක කිව්වේ- **දියසුළියක්.** දිය සුළියක් හඳුනාගන්න පුළුවන් වෙන්නේ, දියසුළියක් හඳුනාගන්නේ අර වටයක් තියෙනකන් නේ. මහ මූදේ 'අන්න අතනයි' කියලා අත දික් කළාට කොතැනද කියලා කියන්න බැහැ නේ දියසුළියක් නැතිනම්. දියසුළියක් ඇති තැන තමයි 'අතන' කියලා පෙන්නුම් කරන්න පුළුවන් වෙන්නේ. ඒ වගේ හිතාගන්න මේ සත්ත්වයා කියන ඒ එක එකක්ම දියසුළි. මේ සංසාරයේ දියසුළි. එතකොට මෙන්න මේ දියසුළි ඒවා යම් අවස්ථාවක -කලින් දේශනයෙන් අපි පෙන්නුවා. අර දියසුළිය නැතිවෙන විධිය. දියසුළියක් ඇතිවන හැටි අපි ප්‍රකාශ කරලා තියෙනවා නේ. ඒ විධියට මේ සත්ත්වයා ඒ දියසුළිය අපි අනික් පැත්තකින් කියනවා නම් ඒක තේරුම් කරන්න පුළුවන්. දැන් මේ පින්වතුන් දන්නවා ඔය දැනට ව්‍යවහාරයේ පවතිනවා ශරීරය පිළිබඳව උපාදින්න කියන වචනයක්. 'උපාදින්න කය' උපාදින්න කය කියන එක නොයෙකුත් නොයෙකුත් ආකාරයට උගතුන් විවරණය කළත් අපට හිතාගන්න තියෙන්නේ මරණ අවස්ථාවේ දී ග්‍රහණය කළ - පළමුවෙන්ම ග්‍රහණය කළ - ටික තමයි අපි මේ රැකගන්න බලන්නේ. මව්කුසේ අර මඩ පැල්ලම තුළින් ඒ අල්ලගත්තු ග්‍රහණය නේද අපි මේ ගර්භය කියලා කියන්නේ. ගර්භය කියලා කියන්නේ අම්මගේ හපන්කමක් නොවේ. දරුවගේ හපන්කම තමයි එතන තියෙන්නේ.

අම්මගේ හපන්කමත් තියෙනවා. ඉතින් අර ඒ පැත්තෙන් ඒ දරුවගේ හපන්කම. කෙසේ හෝ වේවා ඒ මෝහය තුළින් ඒ ග්‍රහණය නිසා ඒ අම්මගේ රුධිරය ඒවත් උරාගෙන මේ ගර්භය කියන මේක වැඩිලා අන්තිමට අර කිව්ව 'රත්තරන් පැටියෙක්' උපදිනවා. නමුත් අන්න ඒ දිය සුළියක්. එතකොට ඒ කියන ග්‍රහණය ඇතිවුණේ අන්න අර දෙකක් නිසානේ. විඤ්ඤාණයත් නාමරූපයත් නිසා. එතකොට සත්ත්වයා කියලා කියන්නේ මේ සංසාර මුහුදේ තියෙන අර කියාපු දියසුළි. අර විධියේ දියසුළි. උපාදින්න ශරීරය නියෝජනය කරන්නේ බාහිර ඒ මහාභූත ධර්මයන් තුළින් තමන් ග්‍රහණය කර ගත්තු ටිකයි. ඒක රැකගන්න නේ මේ අපි කොච්චරවත් බලන්නෙ. ඉතින් අපි මේ ශරීරය ඇතුලේ තියෙන වා පිත් සෙම් කෝප ආදිය එහෙම ඇතිවෙන්නේ මේ උපාදින්නය නිසා.

ඊළඟට අර කිව්වා වගේ ජදික වේදිකාවේ යනකොට අනිත් එක්කෙනා එක්ක ගැටිලා පොලිසි යන්නේ ඒ ඔක්කොම වෙන්නේ මේ ටික නිසා නේ. මේක ග්‍රහණය කරලා. ඒක නිසා සවිඤ්ඤාණක ලෝකයේ තියෙන මේ භයානකම තත්ත්වය තමයි ඕක. ඒක ජාති, ජරා, ව්‍යාධි, මරණ ඔය පාතාලයේ දුක් වේදනා විදිමින්. ඒකයි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළේ ආනන්ද මේ පටිච්ච සමුප්පාද ධර්මය නොදැනීම තුළිනුයි මේ ලෝක සත්ත්වයා අවුල් වුනු නූල් බෝලයක්, අවුල් වුනු හුවැටියක් වගේ මේක අවුල් කරගෙන සංසාරයේ අවුලෙන් අවුලට යමින් තවදුරටත් යන්නේ.

මේක බුදුරජාණන් වහන්සේ අන්න විසඳුවා. මේ අවුල විසඳුවා. කොහොමද? පෙන්නලා දුන්නා. මේ ස්පර්ශය කියන එකේ දෙපැත්තක් තියෙනවා. අධිවචන සම්ඵස්ස, පටිඝ සම්ඵස්ස කියලා. නාමයයි රූපයයි කියලා දෙකක් තියෙනවා ස්පර්ශය හා සම්බන්ධ වුනු. ඊළඟට අනික් අතට විඤ්ඤාණයත් නාමරූපයත් අතර දෙකක් තියෙනවා. අන්තිමට පෙන්නුවා 'විඤ්ඤාණය අනිදස්සන' කර ගන්න හැටි. අපි මීට කලින් දේශනාවල සැහෙන්න කියලා තියෙනවා විඤ්ඤාණයේ වැටෙන ඡායාවක් වගේ නාමරූපය කියලා කියන්නේ. වේදනා, සංඥා, චේතනා, ඵස්ස, මනසිකාර තුළින්. දැන් අර අන්ධයා ගිහිල්ලා අරකේ හැප්පුනාම හිම කැටයක ඒ ගන්න සංඥාව වගේ. ලෝකයා ඒක උපකාර කරගෙන ඒක තුළින් ලෝභ, දෝස, මෝහ ආදිය උපදවා ගන්නවා. ඒ ගැටීම තුළින්. ඊළඟට ඒක තුළින් තව තවත් අර නූල් බෝලය අවුල් වෙනවා. අතීතයෙන් ආපු කර්මවේග නිසා හට ගත්තු මේ ශරීරය ඊළඟට ඒක උපකාර කරගෙන ඒක රැක ගැනීම සඳහා අර විධියට පස්පව් කරමින් ලෝකයත් එක්ක නානා

විධියේ කලිකලහ කර ගනිමින් කෙලෙස් රැස් කරමින් නැවත නැවත අර දිය සුළිය තවදුරටත් ගෙන යනවා. නමුත් රහතන් වහන්සේලා කළේ මොකක්ද? අන්න අර ප්‍රඥාව තුළින් - ඒකයි මෙතන වැදගත් දේ- **'පඤ්ඤාවචරං'**[19] කියලා වචනයක් තියෙනවා. ප්‍රඥාවේ කෙළවර එතනයි. ප්‍රඥාවට දැක ගන්න පුළුවන් තැන ඔතැනයි. මොකක්ද විඤ්ඤාණයත් නාම රූපයත් අතර තියෙන මේ සම්බන්ධතාව. ඒක හරියාකාරව තේරුම් ගත්තා නම් ඒක තේරුම් අරගෙන යම් අවස්ථාවක අර බුදුරජාණන් වහන්සේ දක්වපු ප්‍රතිපදාව තුළින් පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන ඒ මහා භූත ධර්මයන්ගෙනුත් වේදනා, සංඥා, චේතනා, ඵස්ස, මනසිකාර කියන ධර්මයන්ගෙනුත් ඒවායිනුත් සිත මුදා ගත්තා නම් යම් අවස්ථාවක, අන්න එතකොට ඒ විමුක්ත තත්ත්වය තමයි අපි පෙන්නුම් කළේ ගිය සැරෙත්. ඔය 'අනිදස්සන විඤ්ඤාණ' 'අප්පතිට්ඨිත විඤ්ඤාණ' ආදී වශයෙන් දක්වන්නෙ එතැනයි. බුදුරජාණන් වහන්සේ පෙන්නන්නෙ මේ භවයේ කෙළවර.

එතකොට භවය කියලා කියන්නේ අන්න අර විධියේ මේ ලෝකයා හිතන විධියේ තැනක් නොවේ. මේක උපාදානය නිසා පවතින්නක්. මේ භව තත්ත්වයට තව වචනයක් යොදල තියෙනවා 'ඉත්ථත්ත'[19] කියලා. 'ඉත්ථත්ත' කියලා කියනවා. ඒකත් බොහෝ දෙනාට තේරුම් ගන්න බැරි දෙයක්. ඉත්ථත්ත කියලා කියන්නේ පින්වතුනි, 'ඉත්ථං' කියලා කියන්නේ 'මෙසේ'. 'ඉත්ථත්ත' කියලා කියන්නේ 'මෙසේ බව'. එතකොට මේ පැවැත්ම කියලා කියන්නේ මහ පුදුම ගැටුමක්. අර කිව්වා වගේ **දෙකක් අතර ගැටුමක්. 'මෙසේ බවත්' 'අන්සේ බවත්' අතර.** යමක් දෙයක් බවට පත්වුනාට පස්සේ ඒකට අපි 'මෙසේ බව' කියලා කියනවා. හැබැයි නිරන්තරයෙන්ම ඒක 'අන්සේ බවට' පරිවර්තනය වෙනවා. ඕක තමා 'ඉත්ථභාව අඤ්ඤථාභාව'. ඒක අවස්ථාවක බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා

**තණ්හාදුතියො පුරිසො - දීඝමද්ධාන සංසරං**
**ඉත්ථභාවඤ්ඤථාභාවං - සංසාරං නාතිවත්තති.**[20]

කියලා ඔය ද්වයතානුපස්සනා සූත්‍රයේ මේ තණ්හාව දෙවැන්නා කරගෙන යන මේ සාමාන්‍ය ලෝකයා, පෘථග්ජන ලෝකයා, දීර්ඝ කාලයක් සංසාරයේ සැරිසරනවා. ඒ තැනැත්තා ඉත්ථභාව අඤ්ඤථාභාව කියලා කියන මේ දෙකෙන් මිදෙන්නේ නැහැ. 'ඉත්ථභාව' කියලා- මේ තත්ත්වය කියලා- ගත්තු හැටියේ මොහොතක් පාසා අඤ්ඤථාභාවයට පත් වෙනවා. අනිත්‍යතා කියලා කියන්නේ ඒකයි. අනිත්‍යතාව කියලා කියන්නේ ඒ යම්

ස්ථාවරයක් ගන්නවා. මේක තමයි මගේ තත්ත්වය. මේකයි මගේ තත්ත්වය කියලා ගත්තු හැටියෙම ඒක ඊළඟට ලෝක ස්වභාවය අනුව අනිත්‍යතා ධර්මය තුළින් ඒක වෙනස් වෙනවා. ඔන්න ඔය දෙක අතරෙයි එතකොට පැවැත්මක් තියෙන්නේ. මේ ඉත්ථභාවය රැක ගැනීමටත්, අඤ්ඤථාභාවය වැළැක්වීමටත් ගන්නා නිෂ්ඵල ප්‍රයත්නය බුදුරජාණන් වහන්සේ පෙන්නුවා. මෙන්න මේ ඉත්ථත්වයට හේතුවන මේ දියසුළිය. මේ දියසුළිය ක්‍රියාත්මක වන බලවේග මොනවාද? අන්න ඊළඟට කෙටියෙන් ගත්තොත් ඒක තමයි අවිද්‍යාව හා තණ්හාව කියලා ගන්න පුළුවන් - අවිජ්ජා තණ්හා.

තවත් විධියකින් ගත්තොත් අර කියාපු විපල්ලාස ධර්ම හතර[21]. දැන් අපි දිය සුළිය ගැන කිව්වේ ලෝක ස්වභාවය අනිත්‍යයි. නමුත් 'අනිච්චෙ නිච්චසඤ්ඤා' අනිත්‍යය නිත්‍ය හැටියට සලකනවා. අශුභ දේ ශුභ හැටියට සලකනවා. දුක් සහිත දේ සැප හැටියට සලකනවා. තමාගේ නොවන අනාත්ම දේ ආත්ම හැටියට සලකනවා. ඔය කියාපු විපල්ලාස ධර්ම නිසා තමයි ඔය දියසුළියෙ පැවැත්මක් තියෙන්නේ. එතකොට යම් අවස්ථාවක අන්න ධර්ම මාර්ගයේ, ආර්ය අෂ්ටාංගික මාර්ගයේ, ගමන් කරලා අර කියාපු සමථයෙන් සමාධියක් ලබාගෙන ත්‍රිලක්ෂණය - අනිත්‍ය දුක්ඛ අනාත්ම කියන ත්‍රිලක්ෂණය - වඩා ඒක සන්තානය තුළ දියුණු කරලා යම් අවස්ථාවක විදර්ශනා ඥාන තුළින් මේ භවය ගැන කලකිරිලා - පංච උපාදනස්කන්ධය ගැන කලකිරෙන්නේ නැතිව මෙයින් මිදෙන්න බැහැ. ඒ වගේ අන්න යම් අවස්ථාවක හිත මුදාගත්තා නම් ඒ අවස්ථාවෙ තමයි අර කියූ විමුක්තියට, අනිදස්සන තත්ත්වයට හිත පත්වන්නේ. ඒක තුළින් උන්වහන්සේලා ප්‍රත්‍යක්ෂ කරගන්නවා භවය මෙතැනින් කෙළවරයි කියලා. **භවය මෙතැනම කෙළවරයි කියලා.** ඒ ප්‍රත්‍යක්ෂය නිසාම ඉපදීමට සුදුසුකමක් නැහැ. අපි කියමු 'සුදුසුකමක්' නැහැ. ඒ අර නාමරූපය ගිලිහිලා. ඒකනේ අතනදී කිව්වේ **'ආනන්ද යම් හේතුවක් නිසා යම් විධියකින් විඤ්ඤාණයේ නාමරූපය ප්‍රතිෂ්ඨාවක් නොලබයි නම් එහෙනම් නැවත ජාති, ජරා, මරණ ආදියක් පෙන්වාලිය හැකිද?' 'නැතමය ස්වාමීනි'**

ඔන්න එතකොට මේ පින්වතුන් සලකාගන්න අද මේ කිව්වේ ඉතාමත්ම වටිනා සූත්‍රයක් කියලා හිතාගන්න. මහා නිදාන සූත්‍රය විශේෂයෙන්ම. ඒකට මූලික හැටියටයි අපි ඒකමූල සූත්‍රය පෙන්නුවේ. එතකොට මේ කාරණා මේ පින්වතුන් ප්‍රායෝගික වශයෙන් මේවා අත්දකින තාක් මේවා උගතුන්ගේ ඒවා හැටියට සළකන්නේ නැතිව, තමන් මේ ධර්ම

මාර්ගය- අර කිච්ච චතුරාර්ය සත්‍යය අවබෝධය සඳහා මේ පටිච්චසමුප්පාද ධර්මය පාවිච්චි කරන හැටියට අපි මේ පින්වතුන්ට මතක් කරනවා.

අද දින මේ පින්වතුන් වෙනදා වගේ සෑහෙන පිරිසක් පෝය අටසිල් සමාදන් වුනා. අනික් අයත් යම් සීලයක් උඩ ඉඳගෙන නිවනට උපකාර වන ධර්ම දේශනාවක් මේ අවස්ථාවේ ඇසුවා. එතකොට ඒක උපකාර කරගෙන මේ පින්වතුන් ද උත්සාහවත්ව තමන් කරන බණ භාවනා සාර්ථක කර ගැනීමේ බලාපොරොත්තුවෙන් උත්තම තත්ත්වයන්ට මේ ජීවිතයේම පැමිණීමට මේ කුසල ශක්තියත් - මේ ධර්ම ශ්‍රවණමය කුසලශක්තියත් - හේතු වාසනා වේවා කියා ප්‍රාර්ථනා කරනවා. එසේම අවීචියේ සිට අකනිටාව දක්වා යම්තාක් සත්ත්වකෙනෙක් මේ ධර්ම දේශනාමය, ධර්ම ශ්‍රවණමය කුසලයක් අනුමෝදන්වීමට කැමති නම්, ඒ අනුමෝදන්වීම තුළින් ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවන් සාක්ෂාත් කරගනිත්වා කියා ප්‍රාර්ථනා කරගෙන මේ ගාථා කියන්න.

**එත්තාවතා ච අම්හෙහි ...**

## පාදක සටහන්

1. එක මූල සූත්‍රය, සංයුත්ත නිකාය - 1, 58 පිට (බු.ජ.ත්‍රි. 13)
2. පාතාල සූත්‍රය, සංයුත්ත නිකාය - 4, 392 පිට (බු.ජ.ත්‍රි. 16)
3. සමුද්‍ද සූත්‍රය, සංයුත්ත නිකාය - 4, 312 පිට (බු.ජ.ත්‍රි. 16)
4. මාරධීතු සූත්‍රය, සංයුත්ත නිකාය - 1, 230 පිට (බු.ජ.ත්‍රි. 13)
5. දුතිය සමුද්‍ද සූත්‍රය, සංයුත්ත නිකාය - 4, 314 පිට (බු.ජ.ත්‍රි. 16)
6. සලල සූත්‍රය, සංයුත්ත නිකාය - 4, 396 පිට (බු.ජ.ත්‍රි. 16)
7. ඵස්ස මූලක සූත්‍රය, සංයුත්ත නිකාය - 4, 410 පිට (බු.ජ.ත්‍රි. 16)
8. මහා නිදාන සූත්‍රය, දීඝ නිකාය - 2, 80-109 පිටු (බු.ජ.ත්‍රි. 8)
9. මහා පදාන සූත්‍රය, දීඝ නිකාය - 2, 2-79 පිටු (බු.ජ.ත්‍රි. 8)
10. බ්‍රහමජාල සූත්‍රය, දීඝ නිකාය - 1, 72-74 පිටු (බු.ජ.ත්‍රි. 7)
11. තිත්ථායතන සූත්‍රය, අංගුත්තර නිකාය - 1, 316 පිට (බු.ජ.ත්‍රි. 18)
12. ධාතුවිභංග සූත්‍රය - මජ්ඣිම නිකාය - 3, 498 පිට (බු.ජ.ත්‍රි. 12)
13. මහාහත්ථිපදොපම සූත්‍රය, මජ්ඣිම නිකාය - 1, 460 පිට (බු.ජ.ත්‍රි. 10)
14. පච්චය සූත්‍රය, සංයුත්ත සූත්‍රය - 2, 40 පිට (බු.ජ.ත්‍රි. 14)
15. පච්චය සූත්‍රය, සංයුත්ත සූත්‍රය - 2, 40 පිට (බු.ජ.ත්‍රි. 14)
16. ධම්මචක්කපපවත්තන සූත්‍රය, සංයුත්ත නිකාය - 5 (2), 274 පිට (බු.ජ.ත්‍රි. 17 (2))
17. නිබ්බාන සුඛ සූත්‍රය, අංගුත්තර නිකාය - 5, 476 පිට (බු.ජ.ත්‍රි. 22)
18. ධාතු විභංග සූත්‍රය, මජ්ඣිම නිකාය - 3, 500-502 පිටු (බු.ජ.ත්‍රි. 12)
19. මහා නිදාන සූත්‍රය, දීඝ නිකාය - 2, 80 පිට (බු.ජ.ත්‍රි. 8)
20. ද්වයතානුපස්සනා සූත්‍රය, සුත්ත නිපාතය, 232 පිට (බු.ජ.ත්‍රි. 25)
21. විපල්ලාස සූත්‍රය, අංගුත්තර නිකාය - 2, 100 පිට (බු.ජ.ත්‍රි. 19)

# 04 වන දේශනය

# 04 වන දේශනය

## (පහන් කණුව ධර්ම දේශනා අංක 186)

## 'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

අන්තොජටා බහි ජටා
ජටාය ජටිතා පජා
තං තං ගොතම පුච්ඡාමි
කො ඉමං විජටයෙ ජටං

සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො
චිත්තං පඤ්ඤඤ්ච භාවයං
ආතාපී නිපකො භික්ඛු
සො ඉමං විජටයෙ ජටං

යෙසං රාගො ච දොසො ච
අවිජ්ජා ච විරාජිතා
ඛීණාසවා අරහන්තො
තෙසං විජටිතා ජටා

යත්ථ නාමං ච රූපං ච
අසෙසං උපරුජ්ඣති
පටිඝං රූප සඤ්ඤා ච
එත්ථ සා ඡිජ්ජතෙ ජටා

-සංයුත්ත නිකාය, ජටා සූත්‍රය[1]

සැදැහැවත් පින්වතුනි,

මේ සත්ත්ව ප්‍රජාව අවුල් වූ නූල් බෝලයක් වගේ අවුලෙන් අවුලට පත් වෙලා මේ සංසාරයෙන් මිදෙන්න බැරිව නැවත නැවතත් අපායවල දුගතිවල උපදින්නේ පටිච්ච සමුප්පාද ධර්මය අවබෝධ කරගැනීමට නොහැකි වීමෙන් බව තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ මහා නිදාන සූත්‍රයේ[2] දී ආනන්ද ස්වාමීන් වහන්සේට වදාළා. ගියවර දේශනයේදී

අපි මේ පින්වතුන්ට පෙන්නුම් කරලා දුන්නා නාමයත් රූපයත් අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ වෙලා තියෙන හැටිත් ඒ මහා නිදාන සූත්‍රය ආශ්‍රයෙන්. ඒ වගේම නාම රූපයත් විඤ්ඤාණයත් අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙක සම්බන්ධ වී තිබෙන හැටිත්. ඒ විග්‍රහ මාර්ගය තව දුරටත් ඉදිරියට ගෙනියන්න උපකාර වන අන්දමේ ප්‍රස්තාවනාවක් වගේ ගාථා හතරකුයි අද අපි මාතෘකාව හැටියට තෝරාගත්තේ.

පළමුවෙන්ම අපි මේ ගාථාවල අර්ථය තේරුම්ගන්න බලමු. මේ ගාථා දකින්න ලැබෙන්නේ සංයුත් සඟියේ සගාථක වග්ගයේ දේවතා සංයුත්තයේ. එක්තරා දේවතාවක් බුදුරජාණන් වහන්සේගෙන් අහන ප්‍රශ්නය තමයි පළමුවෙනි ගාථාවේ තියෙන්නේ. ඊළඟ ගාථා තුනේ තියෙන්නේ බුදුරජාණන් වහන්සේ ඊට දුන්න පිළිතුරුයි. එතකොට ඒ ගාථාවල අර්ථය අපි සාමාන්‍යයෙන් සලකනවා නම් මෙහෙම ගන්න පුළුවන්.

**අන්තො ජටා බහි ජටා**
**ජටාය ජටිතා පජා**

ඇතුළතිනුත් වෙළුමක්. පිටතිනුත් වෙළුමක්. මේ ප්‍රජාව දෙයාකාර වෙළුමකින් වෙළිලයි ඉන්නේ.

**තං තං ගොතම පුච්ඡාමි**
**කො ඉමං විජටයෙ ජටං**

භවත් ගෞතමයන් වහන්සේගෙන් මම මේ කාරණය අහනවා. කවුද මේ වෙළුමේ වෙළුම් අරින්නේ? ඔන්න දේවතාවා ඇසූ ප්‍රශ්නය. බුදුරජාණන් වහන්සේ පළමුවැනි ගාථාවෙන් දෙන පිළිතුර මෙහෙමයි.

**සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො**
**චිත්තං පඤ්ඤඤ්ච භාවයං**

ප්‍රඥාවන්ත මනුෂ්‍යයා ශීලයෙහි පිහිටලා- චිත්ත කියන්නේ සමාධිය- සිතත් ප්‍රඥාවත් වඩන්නේ.

**ආතාපී නිපකො භික්ඛු**
**සො ඉමං විජටයෙ ජටං**

කෙලෙස් තවන වීර්යයෙන් යුක්ත දක්ෂ භික්ෂුවයි ඒ ජටාව, ඒ වෙළුම වෙළුම් හරින්නේ. ඊළඟට තව දුරටත් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ

කරනවා.

**යෙසං රාගො ච දොසො ච**
**අවිජ්ජා ච විරාජිතා**
**ඛීණාසවා අරහන්තො**
**තෙසං විජටිතා ජටා**

යම් කෙනෙකු තුළ 'රාගො ච දොසො ච' රාගයත් ද්වේෂයත් 'අවිජ්ජා ච' අවිද්‍යාවත් මකා දමන ලද්දේ ද, 'ඛීණාසවා අරහන්තො' ක්ෂීණාශ්‍රව වූ රහතන් වහන්සේලා තුළයි, 'තෙසං විජටිතා ජටා' මේ අවුල වෙළුම් ඇරලා තියෙන්නේ. ඔන්න හතරවෙනි ගාථාව.

**යත්ථ නාමං ච රූපං ච**
**අසෙසං උපරුජ්ඣති**
**පටිඝං රූප සඤ්ඤා ච**
**එත්ථ සා ඡිජ්ජතෙ ජටා**

යම් තැනක නාමයත්, රූපයත්, පටිඝයත්, රූප සඤ්ඤාවත් සම්පූර්ණයෙන්ම වළක්වාලනු ලැබේද, මෙතනයි ඒ ජටාව සිඳිනු ලබන්නේ. ඔන්න එතකොට ගාථාවල සාමාන්‍ය අර්ථය.

ඉතින් මේ ගාථා හතර අතුරෙන් මුල් ගාථා දෙක බොහෝ දෙනා දන්නවත් ඇති. මොකද ඔය විශුද්ධි මාර්ගයේ ඒ බුද්ධඝෝෂ අටුවාචාරීන් වහන්සේ විශුද්ධි මාර්ගයට පාදක කරගෙන තියෙන්නේ අර මුල් ගාථා දෙකයි. නමුත් අපට පෙනෙන හැටියට මේකෙ තියන අගම ගාථාව තමයි වටිනාම ගැඹුරුම ගාථාව. ඉතින් අපි පසුගිය දේශනයේ දී ඒ මහා නිදාන සූත්‍රය[3] ආශ්‍රයෙන් මේ පින්වතුන්ට පැහැදිලි කළා නාමයෙන් කෙරෙන හැඳින්වීම තුළින් රූපයට අධිවචන සම්ඵස්සයක් සැලසෙන බවත් රූපයෙන් ලැබෙන ගැටීම තුළින් නාමයට පටිඝ සම්ඵස්සයක් සැලසෙන බවත්. මේ දෙක එකතු වෙලයි ස්පර්ශය හැදෙන්නේ කියන ඒ කාරණය අපි ගියවර දේශනයේදී ප්‍රකාශ කළා.

ඉතින් කොටින්ම මේ නාමයත් රූපයත් ඒවාට අදාළ ආකාර, නිමිති ලක්ෂණවලින් වෙළුමක් වගේ බැඳිලා තියෙනවා. ඕක තමා අපට පෙනෙන හැටියට 'අන්තො ජටා'. ඊළඟට බුදුරජාණන් වහන්සේ පෙන්නා දුන්නා නාම රූපයත්, විඤ්ඤාණයත් අන්‍යෝන්‍ය වශයෙන් බැඳිලා පවතිනවා. ඕක තමයි 'බහි ජටා.' නමුත් අපි මෙහෙම තේරුවට මොකද, බුද්ධඝෝෂ

අටුවාචාරීන් වහන්සේ මේ සංයුත්ත සඟියේ ජටා සූත්‍රයට අටුවාව දෙන්නේ මෙහෙමයි. උන්වහන්සේ කියන්නේ ජටා කියල කියන්නේ තණ්හාවයි. 'අනෙතා ජටා' කියන්නේ තමන්ගේ පරිෂ්කාරවලට තියෙන තණ්හාව. 'බහි ජටා' කියන්නේ අනුන්ගේ පරිෂ්කාරවලට තියෙන තණ්හාව. තවත් විධියකට තෝරනවා තමන්ගේ ආත්ම භාවය, මේ ශරීරය, මේ ශරීරයට තියෙන තණ්හාව ආශාව තමයි 'අනෙතා ජටා'. අනුන්ගේ ශරීරවලට තියෙන ඇල්ම, අනුන්ගේ ආත්ම භාවයන්ට තියෙන තණ්හාව- බහි ජටාව. තවත් තේරුමක් දෙනවා. ආධ්‍යාත්මික ආයතන හය කියල කියන ඇස, කන, නාසය, දිව, කය, මන කියන ආයතන හය, අනෙතා ජටා. බහි ජටාව ඒවාට තියෙන අරමුණු. රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම. ඔන්න බහි ජටාව තෝරන හැටි බුද්ධඝෝෂ හාමුදුරුවෝ.

ඊළඟට නාමය කියන එක තෝරන්නේ උන්වහන්සේ නාමය කියලා කියන්නේ වේදනා, සඤ්ඤා සංඛාර, විඤ්ඤාණ කියන හතර ස්කන්ධයයි. අපි ගිය වර මේ පින්වතුන්ට ඇඟිලි ගනින්න සලස්වලා අමතක නොවන හැටියට බුද්ධ වචනය හිතට කාවැද්දුවා. නාම කියන්නේ - එතනට විඤ්ඤාණය අයිති නැහැ. වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර කියන ධර්ම පහ බව. නමුත් බලන්න ඉතින් අටුවා සම්ප්‍රදාය තුළ කවුරුත් කියන්නේ නාමය කියලා කියන්නේ අර ස්කන්ධ හතර. ඒක එහෙම පිටින්ම වැරදියි. මොකද විඤ්ඤාණය කිසි සේත්ම නාමයට ඇතුල් කරන්න බැහැ. ඉතින් එහෙම නාමය තෝරලා ඔන්න ඊළඟට සඤ්ඤා කියන එක තෝරන්නේ අටුවාචාරීන් වහන්සේ මෙහෙමයි. පටිඝ සඤ්ඤා කියන එකෙන් කාම භවය හැඟෙනවාය. රූපසඤ්ඤා කියන එකෙන් රූප භවය හැඟෙනවාය. ඒ දෙක කිව්වාම අරූප භවයත් නිකම්ම කියවුණා වෙනවාය. ඔන්න පටිඝං රූප සඤ්ඤා තෝරපු හැටි. ඊළඟට ජටාව කපා දමනු ලබන්නේ කොතනද කියන එක. නිවනට 'ආවාම' **නිවනට ආවාම** - ඒ වෙළුම කපා දමනවාය. ඔච්චරයි අටුවාවේ තියෙන්නේ. නමුත් අපට පෙනෙනවා මේ පටිඝං රූප සඤ්ඤා කියන වචනවලින්මත් පෙනෙනවා - මේ පටිඝං රූප සඤ්ඤා, වචන සඳහන් වීමෙන්ම පේනවා - මේ ජටා කතාව තේරුම් ගන්න ඕනෑ මහා නිදාන සූත්‍රය ආශ්‍රයෙන් කියලා.

ඉතින් අද දවසේ පැමිණිලා ඇති එදා ආවේ නැති අය. දැන් ඉදිරියට මම ප්‍රකාශ කරන්න යන කාරණා තේරුම්ගැනීම පහසු වීමටත් ඒ අලුතින් ආ අයට, ගියවර ඇවිල්ලා හිටි අයගේ ඒ අවබෝධයේ යම් අඩුපාඩුකම් තියෙනවා නම් ඒවා සම්පූර්ණ වීමටත්, නැවත මතක් කර ගැනීම් වශයෙන් මම බලාපොරොත්තු වෙනවා - අර මහා නිදාන සූත්‍රයේ

බුදුරජාණන් වහන්සේ ආනන්ද ස්වාමීන් වහන්සේට ඒ දේශනා කළ ආකාරයත් ආශ්චර්යවත්. ඒ කියන්නේ ආනන්ද ස්වාමීන් වහන්සේ බුදුරජාණන් වහන්සේ ළඟට ඇවිල්ලා කියනවා, මේ පටිච්ච සමුප්පාද ධර්මය බොහොම ගැඹුරුයි වගේ පෙනෙනවා. ඒ වුනත් මට සරලයි. බැලූ බැල්මට බොහොම ලේසියි කියලා. එතකොට තමයි බුදුරජාණන් වහන්සේ කියන්නේ "නෑ, නෑ, ආනන්ද එහෙම කියන්න එපා මේක ගැඹුරුයි. පෙනුමටත් ගැඹුරුයි."[3] කියලා. ඔන්න ඊළඟට තමයි පියවරෙන් පියවරට දක්ෂ ගුරුවරයෙක් වගේ දැන් දක්ෂ ගුරුවරයෙක් ගෝලයගෙන් ගන්නේ - ගෝලයා ලෑස්ති වෙලා ඉන්නේ ගුරුවරයා කියන එකට 'එහෙයි, එහෙයි' කියන්නයි. නමුත් බලන්න කොච්චර දක්ෂද කියලා බුදුරජාණන් වහන්සේ ඒ ප්‍රශ්නෝත්තර ක්‍රමය සකස් කරලා තියෙන්නේ දිගටම ප්‍රශ්න උත්තර යන්නේ. ගෝලයාට "නැතමය ස්වාමීනී" කියන හැටියට. නැහැ කියලා කියන්න වෙන විධියට. එතන ගෝලයාට හිතන්න පෙළඹෙන හැටියට. ඒ ප්‍රශ්නෝත්තර ක්‍රමය තුළින් අපි ඇතැම් තැනක මේ පින්වතුන්ට දිගින් දිගට කියන්න ගියාම මහා අවුල් වෙනවා. අර පොත කියවනවා වගේ නොවේ. ඒ නිසා අර නාමයත් රූපයත් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාව දක්වපු හැටි ඒ බුදුරජාණන් වහන්සේගේ කතා මාර්ගයෙන් ටිකකට ඉවත් වෙලා ඒක සම්පිණ්ඩනය කරලා දැක්වූවා එදා වගන්ති හතරකින්.

ඒ හතර තේරුම්ගන්න බලන්න ඉස්සරවෙලාම. අපි හඳුන්වලා දෙමු අර අටුවාව කිව්වා වගේ නාමය කියන්නේ අර ස්කන්ධ හතර නොවේ. ආයි මතක් කරගන්න. වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර බව. රූපය කියලා කියන්නේ ඇත්ත වශයෙන්ම රූප සංඥාවයි. එතනදී ඊට යටින් තියෙන්නේ පඨවි, ආපො, තෙජො, වායො කියන තනිව හිටින්න බැරි, තනිව හඳුනාගන්න බැරි, මහා භූත ධර්මයන්. නාම ධර්මයන් තුළිනුයි අපි හඳුනා ගන්නේ. එතකොට රූපයට යටින් තියෙන්නේ ඒ මහාභූත ධර්ම හතර බව මතක තබා ගන්න. ඔන්න ඊළඟට බුදුරජාණන් වහන්සේ ආනන්ද ස්වාමීන් වහන්සේට පළමුවෙන්ම ඒත්තු ගන්වන කාරණය මේකයි.[4] 'යම් ආකාරවලින්, යම් ලකුණුවලින්, යම් නිමිතිවලින්, යම් මාතෘකාවලින් නාමකායයක් පෙන්නුම් කළ හැකිද? ඒ ආකාර, ඒ ලකුණු, ඒ නිමිති ඒ මාතෘකා නැති කල්හි රූප කායයෙහි අධිවචන සම්ඵස්සයක් දැක්විය නොහැකියි. මේක තේරෙන භාෂාවෙන් කිව්වොත්, දැන් අපි කිව්වනේ නාමකායට අයිති දේවල් වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර කියලා. ඒවා නැතිව රූපකාය පිළිබඳව - අධිවචන කියලා කියන්නේ පින්වතුනි, අධිවචන, පඤ්ඤත්ති, නිරුත්ති කියන්නේ භාෂා

ව්‍යවහාරයට අදාළ යමක් හඳුනාගැනීමට, හඳුන්වා දීමට, උපකාර වන දේවල් කියලා තේරුම් ගත්තාම හරි. එතකොට අධිවචන සම්ඵස්ස කියලා කියන්නේ රූපකාය පිළිබඳව හඳුනාගැනීමක්, හැඳින්වීමක් කරන්න පුළුවන් වෙන්නේ නාමකායයේ ආධාරයෙන්ය. නාමකාය කිව්වේ නාම ධර්ම සමූහය. වේදනා, සඤ්ඤා ආදිය.

ඔන්න ඊළඟට දෙවෙනි වගන්තියෙන් කියනවා මෙහෙම. යම් ආකාරවලින්, යම් ලකුණුවලින්, යම් නිමිතිවලින්, යම් මාතෘකාවලින් රූපකායක් පෙන්නුම් කළ හැකිද? ඒ ආකාර, ඒ ලකුණු, ඒ නිමිති, ඒ මාතෘකා නැතිනම් නාම කායයේ පටිඝ සම්ඵස්සයක් දැක්විය නොහැකියි. ඒක අනික් පැත්තට හරවලා මේ කියන්නේ. ඒ කියන්නේ රූපකාය හඳුනාගන්න යම් නිමිති ලකුණු ආදියක් තියෙනවා නම් - මතක් කරගන්න පඨවි, ආපො, තේජො, වායො - ඒවා නොමැති නම් නාමකාය කිව්වේ අර වේදනා සංඥා ආදිය නේ. ඒවා පිළිබඳ පටිඝ සම්ඵස්සයක් දැක්විය නොහැකියි. ගැටීමක් පිළිබඳව කතා කරන්න බැහැ. ගැටීමක් ඕන වෙන්නේ රූප තියෙනවා නම් නේ. ඉතින් මේක තව ටිකක් පැහැදිලි කරන්න අපි බොහෝ අවස්ථාවල කරනවා වගේ එදා මේ පින්වතුන්ට අන්ධයාගේ උපමාවක් දුන්නා. ඒ අන්ධයා පිළිබඳ උපමාවත් අරගෙන නාමරූප තෝරන අටුවාවේ ක්‍රමයක් තියෙනවා. මේ අමුතු උපමාවක් මම මේ අවස්ථාවේ දුන්නේ. ටිකකට හිතන්න අන්ධයෙක් යනවා ලොකු හිම කුට්ටියක් ළඟට. ගිහිල්ලා හැපුණ හැටියේ හිතනවා පඨවි කියලා. එන්නේ පඨවි සංඥාව අරගෙන. ඊළඟ සැරේ අන්ධයා එතැනට යනකොට ඒ හිම කුට්ටිය දිය වෙන්න ගිහිල්ලා. ඊට පස්සේ එන්නේ ආපො සංඥාව අරගෙන. වතුර කියලා හිතාගෙන. ඊළඟ සැරේ යනකොට මේ හිම කුට්ටිය උණු වෙනවා. කිට්ටුවට යනකොට රස්නය නිසා තේජෝ සඤ්ඤාව අරගෙන එනවා, අන්තිමට යනකොට ඒක වාෂ්ප වෙලා. ඔන්න වායො සංඥාව. ඉතින් ඇත්ත වශයෙන් පෘථග්ජනයාත් ඔන්න ඔය විධියට තමයි මහා භූත සංඥාව හඳුනාගන්නේ. අන්ධ පෘථග්ජනයා. අර වේදනා සඤ්ඤා චේතනා ආශ්‍රයෙන්. අන්න ඒකයි කිව්වේ, ඒ දෙකේ සම්බන්ධතාව පෙන්වන්නයි මම මේ උපමාව දුන්නේ.

එතකොට ඔන්න දෙවෙනි වගන්තියෙන් පෙන්නුම් කරන්නේ නාමයත් රූපයත් ඔවුනොවුන්ට අදාළ ලකුණු නිමිතිවලින් එකිනෙක බැඳිලා තියෙනවා. එකකින් අනික් එකට උපකාර වෙනවා. ඔන්න ඊළඟට ඒක තවත් තහවුරු කරන්න තුන් වැනි වගන්තිය බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. යම්

ආකාරවලින් යම් ලකුණුවලින් යම් නිමිතිවලින් යම් මාතෘකාවලින් නාමකායක් හෝ රූපකායක් පෙන්නුම් කළ හැකි ද? ඒ ආකාර, ඒ ලකුණු, ඒ නිමිති, ඒ මාතෘකා නැතිනම් අධිවචන සම්ඵස්සයක්වත්, පටිඝ සම්ඵස්සයක්වත් දක්වන්න නොහැකියි. සියුම් තර්ක ක්‍රමයකට බුදුරජාණන් වහන්සේ මෙතන ඉදිරිපත් කරන්නේ. එතකොට ඉස්සරවෙලා කිව්වා එකකට එකක් උපකාර වන බව. ඊළඟට අර දෙකම නැත්නම් අධිවචන සම්ඵස්සයක්වත් පටිඝ සම්ඵස්සයක්වත් නැහැ.

ඔන්න හතරවෙනි නිගමනය ඊට වඩා ප්‍රබලයි. යම් ආකාර ලකුණු නිමිතිවලින් යම් නාම රූපයක් පෙන්නුම් කළ හැකිද ඒ ආකාර ලකුණු නිමිති නැත්නම් ස්පර්ශයක් පෙන්නුම් කරන්න බැහැ. 'ඵස්සයක්' නැත. නාමරූපය නැත්නම් ස්පර්ශයක් නැහැ කියලයි බුදුරජාණන් වහන්සේ කියන්නේ. ටිකක් හිතන්න බලන්න. මේක කෙනෙකුට ප්‍රශ්න කරන්න පුළුවන්. මොකද නාම කියල කියන්නේ වේදනා සඤ්ඤා චේතනා ආදිය නේ? එතකොට දැන් කෙනෙකුට අහන්න පුළුවන් එහෙනං ගස් ගල්වලට ස්පර්ශයක් නැද්ද? ගස් ගල්වලට ස්පර්ශයක් නැද්ද? ඉබේම ප්‍රශ්නයක් එනවා. ඒකටත් අපි පුංචි උපමාවක් දුන්නා. දැන් ඔන්න ඔය ගල් පෙරළාගෙන යනකොට මේ ගල ගිහිල්ලා අර ගලේ හැපෙනවා. අර ගලේ හැපිලා ගලේ පතුරක් යනවා. හැබැයි අරගලයක් හැදෙන්නේ නැහැ. 'තමුසේ මොකද මගේ පතුරක් ඇරියේ' කියලා. නමුත් ඔන්න ඕකේ අනිත් පැත්ත බලමු. සවිඤ්ඤාණක ලෝකයේ. අර අවිඤ්ඤාණක ලෝකයේ එහෙමයි. සවිඤ්ඤාණක ලෝකයටත් අපි නිදසුනක් දෙනවා. මේ පින්වතුන් හොඳින් දන්නවා ඔය පදික වේදිකාවේ කලබලයට යනකොට මූණට මූණ දෙන්නට දෙන්නා හැප්පෙනවා. හැප්පු හැටියෙ 'තමුසේ මොකද මගේ ඇඟේ හැප්පුණේ පාර බලාගෙන යන්න එපායැ' කියලා මෙන්න දෙන්න බහින් බස් වෙලා කලහ කරගෙන, ගහගෙන බැණගෙන අන්තිමට පොලිසියටත් යනවා. මොකද ඒ අර ගැටුම හඳුනාගත්තා. අර ගලට අරගලයක් නැති වුනේ මොකද, ඒක අපියි ආරෝපණය කරන්නේ. ගැටීම පිළිබඳ අදහස.

ඔන්න ඔතන තේරුම්ගන්න ගැටීම පිළිබඳ අදහස අවිඤ්ඤාණක ලෝකයට අපි ආරෝපණය කරන දෙයක්. ඒක තව දුරටත් පැහැදිලි වෙන්න තව කාරණයක් තවත් උපමාවක් කිව්වා. ඔය වඩුබාස් උන්නැහැ කෙනෙක් තමන්ගේ ගෝලයත් එක්ක දොරක් සවි කරන්න ගිහිල්ලා ලෑලි පලු දෙකක් පුරුද්දනකොට ගෝලයාට කියාවි මේකෙ මේ ලෑලි දෙකේ හේත්තුව හරි නෑ කියලා. ගෝලයාට අවබෝධයක් නැත්නම් මෙතන

ප්‍රාණඝාතාවාරෝපණයක්ය පණ දීමක්ය තියෙන්නේ කියලා ගෝලයා අහන්න පුළුවන්. වම් පැත්තේ ලැල්ලේ හේත්තු වෙන්නේ දකුණු පැත්තේ ලැල්ලද, වම් පැත්තෙ ලැල්ලද දකුණු පැත්තේ ලැල්ලේ හේත්තු වන්නේ කියලා. මොකද අර බාස්උන්නැහැගේ අවධානය දෙකක් හැටියට ගත්තු හැටියේ අපියි ඕක ආරෝපණය කරන්නේ හේත්තුවක් පිළිබඳව. ඒ වගේම තමා සමහර දොරක කලම්පු ගහලා දොර ඇද්දි ඇද්දී යනවා. බාස් උන්නැහෙ කියනවා මේ දොරට 'ගායක්' තියෙනවා කියලා. බාස්උන්නැහේටයි ගාය තියෙන්නේ දොරට නොවේ. අන්න ඒ වගේ මේ අපේ ව්‍යවහාරය තුළ අප්‍රාණික දේවල්වලට අපි පණ දෙනවා. ඉතින් ඒ වගේම ටිකක් හිතන්න මෙච්චර නිදර්ශන ඕනෑ නැහැ. නමුත් අපි හෙමින් යන්න ඕනෑ. හැල්මෙ යන්න ඕනෙ මේ ගැඹුරු ධර්මයක් නිසා. ඔය කියන ටික තේරුම් ගත්තොත් ඒ ඇති. ඒකයි මෙච්චර උපමා දෙන්නේ.

ඔන්න මහා ලැව් ගින්නක් ඇති වෙන හැටි බලන්න. මහා කුණාටුවක ගස් දෙකක් ගැටෙනවා. අපි කියන්නේ 'ගැටෙනවා'. ගැටිලා, ගැටිලා, ගැටිලා අන්තිමට ගිනි ගන්නවා. ගිනි අරගෙන ඒ ගස් දෙකත් පිළිස්සෙනවා. කැලෙත් පිළිස්සෙනවා. නමුත් අර ගස් දෙකට දැනුණාද? වේදනා සඤ්ඤා, චේතනා කිසිවක් නැහැ නේ. අපි ඒකට කියනවා ස්පර්ශය 'ගැටුම'. ඔය වචන ආරෝපණය කරනවා. ඉතින් ඔය ඇති උපමා වශයෙන් හිතනවා නම්. අපි අර කලිකලහ ගැන කියන එකට පුදුම විධියේ සම්බන්ධතාවක් තියෙනවා අපේ ධර්මයේ. මේවා අපි නිකම්ම ආරෝපණය කරපු ඒවා නොවේ.

ඔන්න ඊළඟට කියන්නේ ධර්ම කාරණයක්. සුත්ත නිපාත කියන ග්‍රන්ථයේ කියෙනවා කලහ විවාද කියලා සූත්‍රයක්[5]. මේ කලහ විවාද සූත්‍රයේ පළමුවෙනි ගාථාවේ අහනව එක්තරා ප්‍රශ්නයක්. ඒකත් අර ප්‍රශ්නෝත්තර වශයෙන් විකාශනය වන සූත්‍රයක්, ගාථාමය සූත්‍රයක්, කලහ විවාද සූත්‍රය. පළමුවැනිම ප්‍රශ්නය 'කුතො පහුතා කලහා විවාදා' 'කලහ විවාද ඇති වෙන්නේ මොකද?' කියලා. ඕකට පිළිතුරු වශයෙන් හේතු ප්‍රත්‍යය රාශියක් දක්වලා ඔන්න අග හරියේ මෙන්න මෙහෙම එකක් කියනවා. 'ඵසෙසා නු ලොකසමිං කුතො නිදානා'. ස්පර්ශය-ලෝකයේ ස්පර්ශය කියන එකට නිදානය හේතුව මොකක්ද කියලා. අන්න එතන පැහැදිලිවම කියනවා. 'නාමං ච රූපං ච පටිච්ච ඵසසා' නාමයත්, රූපයත් නිසා ස්පර්ශය ඇති වෙන්නේ. ඉතින් ඒක නිසා නේ අර දැන් කලහ විවාද ගැන කිව්වේ. නාමයත් රූපයත් දෙකම තියෙන නිසා තමයි අර දෙන්නා රණ්ඩු වුනේ. ඒක නිසා ඇත්ත වශයෙන් ස්පර්ශය කියලා

කියන්නේ සවිඤ්ඤාණක ලෝකයට අයිති දෙයක්. ඉතින් ඔන්න ඒ කාරණය. ඉතින් මේක තමයි පින්වතුනි, නාමයත් රූපයත් අතර ඔවුනොවුන් ලකුණුවලින් නිමිතිවලින් එකින් එක බැඳිලා තියෙන නිසා තමයි 'අන්තො ජටාව'. එහෙම හිතාගන්න 'අන්තො ජටා'.

ඊළඟට අපි බලමු 'බහි ජටා' මොකක්ද කියලා. ඒකේදීත් අර එදා කිව්වා වගේම බුදුරජාණන් වහන්සේ ආනන්ද ස්වාමීන් වහන්සේගෙන් ප්‍රශ්නෝත්තර වශයෙන් තේරුම් කරන ආකාරය[6] - එතෙනදීත් අපි නිගමන හතරකට ගත්තොත් මෙහෙම කියන්න පුළුවන්. ඉස්සර වෙලා බුදුරජාණන් වහන්සේ ආනන්ද හාමුදුරුවන්ගෙන් අහනවා "ආනන්දය යම් හෙයකින් විඤ්ඤාණය මව් කුසට බැස ගත්තේ නැත්නම් නාමරූපයක් මව් කුසේ ඉතිරි වේද". ඒ ඉතිරි වෙනවා කියන එකෙන් අපට තේරෙන්නේ නාමරූපය ඉස්සර වෙලා ගිහිල්ලා නේ. නාමරූපය ඉස්සර වෙලා ගිහිල්ලා නේ. එතකොට විඤ්ඤාණය මව් කුසට යනකොට -මේ කියන්නේ විඤ්ඤාණය යම් හෙයකින් මවු කුසට නොගියොත් නාම රූපයක් ඉතිරි වේද කියලා අහන්නේ. නාම රූපය කලින් ගිහිල්ලා තියෙනවා. කොහොමද ඒක වෙන්නේ?

ඔන්න දැන් මෙතැන ඉඳලා යන හරිය හැමෝම දැන් උගත්ය කියල සම්මත අය ඇවිල්ලා අහන ප්‍රශ්නය විඤ්ඤාණයයි, නාම රූපයයි, පුනර්භවයයි, පටලැවිල්ල තමයි කවුරුත් අහන්නේ. ඔන්න ඒකට අදාළ ටිකයි ඉදිරියට කියන්නේ. හොඳට තේරුම්ගන්න බලන්න. ඉතින් මේකටත් අපි නිදර්ශනයක් දුන්නොත් දැන් ටිකකට හිතන්න. නිරන්තරයෙන් සිද්ධ වෙන දේවල් නේ. රෝහලක බරපතල ශල්‍යකර්මයකට භාජනය වුණ රෝගියෙක් ජීවිතයත්, මරණයත් අතර සටනේ යෙදෙන අතරේ මොකක් හරි නිමිත්තක් දකිනවා සමහර විට උපදින තැනක - මව් කුසක කියලා හිතමු. ඉතින් දොස්තරලා මහන්සි වෙලා කොහොමහරි මේ මනුස්සයා ගන්නවා මෙගොඩට. ගත්තට පස්සේ මෙයා කියනවා මම ඒ අතරතුර අතනට ගිහිල්ලා හිටියා කියලා. ඒක අර්ධ සත්‍යයක් පින්වතුනි. එතනට ගියා නොවේ. සිතට ඒක අරමුණු වුනා පමණයි. කොටින්ම කියතොත් ඡායාව එතන වැටුණා. ඒකනේ කළළ රූපය කියලා කිව්වේ. කළල රූපය එතෙන්ට ගිහිල්ලා වැටුනා. නමුත් ඡායා රූපයත් වුණේ නැහැ. ඒක නෙගටිව් එක වගේ නාම රූපය ගිහින් වැටුනා. නමුත් විඤ්ඤාණය යන තුරු ඇත්ත වශයෙන් සජීව වෙන්නේ නැහැ. ඊළඟට ඔන්න බුදුරජාණන් වහන්සේ අහන ප්‍රශ්නයෙන් මේ කාරණය තහවුරු වෙනවා.

ඊළඟට ඔන්න බුදුරජාණන් වහන්සේ ආනන්ද හාමුදුරුවන්ගෙන් අහනවා "යම් හෙයකින් ආනන්ද විඤ්ඤාණය මව් කුසට බැසගෙන එයින් ගිලිහී ගියහොත් - එයින් ගිලිහී ගියහොත්- නාමරූපයක් මේ භව තත්වයක් සඳහා උත්පත්තියක් ලබයිද? "නැතමය ස්වාමීනී." ඔන්න එයින් පැහැදිලි වෙනවා හොඳටම, එතකොට යම් විධියකින් අර රෝගියා දොස්තරලාගේ ප්‍රයත්නය අසාර්ථක වෙලා මිය ගියා කියලා හිතමු. අන්න අර හිත අරමුණ එතනට ගිහිල්ලා තියෙන නිසා විඤ්ඤාණය එතැනට ගිහිල්ලා එකතු වුනා. මොකද අපි පෙන්නුම් කරලා තියෙනවා විඤ්ඤාණයයි නාම රූපයයි අතර තියෙන්නේ දිය සුළියක් වගේ 'වට්ට' වට රවුමේ යාමක්. ටිකකට හිතන්න රබර් කවයක් වගේ. මේක ඇදි ඇදී යන්නේ. ඉතින් නාම රූපය ඉස්සර වෙලාම ගියා විඤ්ඤාණය ඇද්දී ඇද්දී තිබිලා අන්න මෙතනින් පණ ගිය හැටියේ අන්න එතන ගිහිල්ලා එකතු වුනා. ඔන්න ඒ ගියාට මොකද මේ පින්වතුන් කෙතෙකුත් දන්නවා ගෙදර දොරවල්වල මව්පියො දරුවෙක් බලාපොරොත්තු වෙනවා. අන්තිමට මස් ගුලියක් එළියට එන්නේ. මොකද හේතුව අර දරුවගෙ කර්ම වේගය නිසා යම් වෙලාවක විඤ්ඤාණය එතැනින් ගිලිහිලා වෙන තැනකට යනවා. එතකොට දරුවෙක් නොවේ උපදින්නේ, මස් ගුලියක්. මූඪ ගර්භයක්. මූඪ ගර්භය කියන්නේ. අන්න ඒ තත්ත්වයයි බුදුරජාණන් වහන්සේ දෙවනුව පෙන්නුවේ.

ඔන්න ඊළඟට තුන්වෙනි ප්‍රශ්නයෙන් තව දුරටත් පැහැදිලි වෙනවා. ආනන්ද යම් හෙයකින් දරුවකුගේ හෝ දැරියකගේ ළාබාල අවධියේදීම විඤ්ඤාණය සිඳී ගියහොත් නාමරූපය වැඩීමට විපුලත්වයට පත් වෙයිද? නැතමය ස්වාමීනී, ඒ කියන්නේ දරුවා උපන්නාට පස්සේ යම් විධියකින් විඤ්ඤාණය නැති වෙලා ගියොත් අපි මේ නාමරූපය කියලා කියන ශරීරය නිකං මළකඳක් නේ. නාමරූපය වැඩෙන්නේ නැහැ. ඔන්න එතකොට ඒක අනුව අවසානයට බුදුරජාණන් වහන්සේ දක්වන නිගමනය, ඒ නිසා ආනන්ද මේකමයි හේතුව. මේකමයි සමුදය. මේකමයි ප්‍රත්‍යය, මේකමයි කාරණය, නාමරූපයට එනම් විඤ්ඤාණය. ඒ කියන්නේ මෙතැනින් පෙන්නුම් කරන්නේ නාමරූපයට විඤ්ඤාණය නැතිව බැරි බවයි. නාමරූපයට විඤ්ඤාණය නැතිව බෑ. ඒක තියෙන්න ඕනෑ නාමරූපය හරියට වැඩෙන්න නම්.

ඔන්න ඊළඟට අනික් පැත්ත ප්‍රකාශ කරනවා. ඒ කියන්නේ විඤ්ඤාණයට නාම රූපය නැතිව බැරි බව. ඒකට එක වාක්‍යයයි බුදුරජාණන්

වහන්සේ පාවිච්චි කරන්නේ. "ආනන්ද යම් කිසි විධියකින්, යම් කිසි ආකාරයකින්, විඤ්ඤාණය නාමරූපයේ පිහිටීමක් නොලබයිද එකල්හි එහෙම නැත්නම් ඒ අවස්ථාවේ, නැවත ජාති ජරා මරණ - නැවත උත්පත්තිය ආදියක් සිදු විය හැකිද?" "නැතමය ස්වාමීනී." එයින් පෙන්නුම් කරන්නේ මොනයම් ආකාරයකින් හෝ විඤ්ඤාණය නාමරූපයේ නොපිහිටන තත්ත්වයකට පත් කරන්න පුළුවන් නම් අන්න නැවත උපත ඉවරයි. සංසාරය ඉවරයි. මෙතන මේ කියාපු කාරණා ටික මේ පින්වතුන්ට වචන දෙකකින් කියතොත් 'නොරහත් විඤ්ඤාණය'. ධර්මයේ දැක්වෙන හැටියට කියතොත් නිරන්තරයෙන්ම 'පතිට්ඨිත විඤ්ඤාණයක්'.[7] විඤ්ඤාණය පිහිටලා තියෙන්නේ කොහේද නාමරූපයේ. නමුත් රහතන් වහන්සේලා පිළිබඳව සඳහන් වන්නේ, 'අප්පතිට්ඨිත විඤ්ඤාණං'[8] විඤ්ඤාණය නාමරූපයේ පිහිටලා නැහැ. නාම රූපයෙන් මිදිලා. ඒක නේ අර අතෙන්දි කිව්වේ, ඔන්න දැන් හොඳට තේරුම්ගන්න පුළුවන්.

**යත්ථ නාමං ච රූපං ච**
**අසෙසං උපරුජ්ඣති**
**පටිඝං රූප සඤ්ඤා ච**
**එත්ථ සා ඡිජ්ජතෙ ජටා**

අර කියාපු නාමයත් රූපයත් අතර තිබෙන අන්‍යෝන්‍ය ජටාවත්, නාම රූප-විඤ්ඤාණ අතර තියෙන බහි ජටාවත්, ඔක්කොම කපලා ඉවරයි. යම් තැනක ඒ කියන්නේ 'නිවන් හිතේ'. අපි පෙන්නුව අර්හත් ඵල සමාපත්ති අවස්ථාවේදී අර හිතේ එතකොට නාම රූපත් - ඉස්සර වෙලා දේශනාවක දී අපි පෙන්නුවා 'අනිදස්සන විඤ්ඤාණය.'[9] අනිදස්සන විඤ්ඤාණය කියන්නේ ඒ විඤ්ඤාණයේ, විමුක්ත විඤ්ඤාණයේ, නාමරූපයක් විදහා දක්වන්නේ නැහැ. තවත් වචන තියෙනවා. 'අප්පතිට්ඨිත විඤ්ඤාණ' කියනවා. ඒ තත්ත්වයට කියනවා 'අප්පතිට්ඨං අප්පවත්තං, අනාරම්මණං' ප්‍රතිෂ්ඨාවක් නැහැ. පැවැත්මක් නැහැ. අරමුණක් නැහැ. ඒ තත්ත්වයට ගියා නම් අන්න නැවත උත්පත්තියකුත් නැහැ.

ඔන්න ඔය කාරණයයි එතන පෙන්නුම් කරන්නේ. මෙතන බුදුරජාණන් වහන්සේ පෙන්නනවා නාමරූපයත් විඤ්ඤාණයත් එකිනෙක හා බැඳිලමයි පවතින්නේ සංසාරගත සත්ත්වයාගේ. ඒකයි සාමාන්‍ය රීතිය. නමුත් යම් හෙයකින් -ඒ ටික බුදුහාමුදුරුවෝ එක වාක්‍යයකින් කියලා

තියෙන්නේ -මොන යම් කාරණයකින් හෝ විඤ්ඤාණය නාම රූපයේ පිහිටීමක් නොලබන තත්ත්වයකට පත් කරගන්න පුළුවන් නම් එතනින් ම ජාති ජරා ඔක්කොම ඉවරයි. දැන් ඔය ටික තේරුණා නම් ඔන්න ඊළඟට තව දුරටත් දැන් කියාපු කාරණා පුනර්භවය පතිට්ඨිත විඤ්ඤාණය ආදිය තව ටිකක් පැහැදිලි වන්න කාරණා කිහිපයක් කියන්නම්.

මේ සම්බන්ධයෙන් ඉතාම වටිනා දේශනාවක් තියෙනවා සංයුත්ත සඟියේ නිදාන සංයුත්තයේ චේතනා සූත්‍රය[10] නමින්. ඒකෙදිත් බලන්න බුදුරජාණන් වහන්සේ මේ කාලයේ ඉන්න කිසිම තර්ක කාරයෙකුට ඉදිරිපත් කරන්න බැරි විධියට, මහ පුදුම විධියට, ඒ කාරණා ඉදිරිපත් කරන්නේ. එතන ඔන්න ඡේද තුනක් හැටියට දක්වනවා. අපි අදාළ ටික විතරයි මෙතනදී ඉදිරිපත් කරන්නේ. මෙතනදී මේ කතාව තියෙන්නේ විඤ්ඤාණය ප්‍රතිෂ්ඨාවක් ලබන හැටි. සිත පිහිටන හැටි. විශේෂයෙන්ම මරණ අවස්ථාවේ දී. මරණ අවස්ථාවේදී සිත අන්න අර කියාපු ඒ දෙකේ - මේ ජීවිතයත් ඊළඟ ජීවිතයත් අතර සම්බන්ධය පෙන්වන්න කියන එකක් වගේ. මෙහෙම ප්‍රකාශ කරනවා පළමුවෙන්ම. 'යංච භික්ඛවෙ චෙතෙති, යංච පකප්පෙති යංච අනුසෙති, ආරම්මණං එතං හොති විඤ්ඤාණස්ස ඨිතියා, ආරම්මණෙ සති පතිට්ඨා විඤ්ඤාණස්ස හොති, තස්මිං පතිට්ඨිතෙ විඤ්ඤාණෙ විරූළ්හෙ ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති හොති' ඕක තේරුවොත් මෙහෙමයි ගන්න තියෙන්නේ. 'මහණෙනි, කෙනෙක් යම් චේතනාවක් පවත්වනවා නම්, යම් කල්පනාවක් -ප්‍රකල්පන කියන්නේ කල්පනාවක් -ඇති කරගන්නවා නම් අනුසය වශයෙන්- අනුසය කියල කියන්නේ ඔන්න සියුම් එක. අනුසය කියලා කියන්නේ ප්‍රහීණ නොකළ කෙලෙස් නිසා අර ඉතිරි වෙලා තියෙන යට තට්ටුව. අනුසය ධර්මයක් තියෙනවා නම් ඒක අරමුණක් වෙනවා විඤ්ඤාණයට සිට ගැනීමට. එතකොට එහෙම අරමුණක් ඇති කල්හි - 'ආරම්මණෙ සති පතිට්ඨා විඤ්ඤාණස්ස හොති' අරමුණක් ඇති කල්හිම විඤ්ඤාණය පිහිටනවා. නැති කල්හි නොවේ. ඊළඟට 'තස්මිං පතිට්ඨිතෙ විඤ්ඤාණෙ විරූළ්හෙ එහෙම විඤ්ඤාණය පිහිටලා වැඩු නම ඔන්න නැවත උත්පත්තියක් ඇති වෙනවා. ඒ පළමුවැනි ඡේදයේ අදහස.

දෙවෙනි ජේදය බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ මෙහෙමයි. 'නො ච භික්ඛවෙ චෙතෙති, නො ච පකප්පෙති අථචෙ අනුසෙති ආරම්මණං එතං හොති විඤ්ඤාණස්ස ඨිතියා. ආරම්මණෙ සති පතිට්ඨා විඤ්ඤාණස්ස හොති, තස්මිං පතිට්ඨිතෙ විඤ්ඤණෙ විරූළ්හෙ ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති

හොති' ඔන්න එතැන අමුත්තක් තියෙනවා. යම් කෙනෙක් චේතනා ඇති කර ගන්නෙත් නැහැ. කල්පනා ඇති වෙන්නෙත් නැහැ. ඔය බොහෝ දෙනා අහන ප්‍රශ්නයක් නේ ක්ෂණික මරණ ආදියේදී කොහොමද හිතන්නේ, කොහොමද චේතනාවක් වෙන්නේ ඒ වෙලාවේ? එතකොට චේතනාවකුත් නැහැ. කල්පනා ආදියකුත් නැහැ. නමුත් අනුසය ධර්ම තියෙනවා. අනුසය ධර්ම ඉතිරිව තියෙනවා. ඒ අනුසය මාත්‍රය ප්‍රමාණවත්. 'ආරම්මණං එතං හොති විඤ්ඤාණස්ස ඨිතියා' විඤ්ඤාණයේ සිටගැනීමට ඒක අරමුණක් වෙනවා. අනුසය ධර්ම. ඔන්න අවම මට්ටමින් 'ආරම්මණෙ සති පතිට්ඨා විඤ්ඤාණස්ස හොති' අරමුණක් ඇති කල්හි විඤ්ඤාණය පිහිටියා වෙනවා. ආයෙත් පුනර්භවයක් වෙනවා. ඔය දෙවෙනි වගන්තිය.

ඔන්න තුන්වැනි එකේදී කියන්නේ ආයෙත් අර රහත් පැත්තට. ඊළඟට කියන්නේ 'යතො ච බො භික්ඛවෙ නො චෙව චෙතෙති නොච පකප්පෙති නොච අනුසෙති ආරම්මණං එතං න හොති විඤ්ඤාණස්ස ඨිතියා, ආරම්මණෙ අසති පතිට්ඨා විඤ්ඤාණස්ස න හොති තදප්පතිට්ඨිතෙ විඤ්ඤාණෙ අවිරූළ්හෙ ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති න හොති' ඔන්න ඔය කියන්නේ- සංසාරයෙන් මිදීම එතනින් පෙන්නුම් කරන්නේ. යම් හෙයකින් යම් පුරුෂයකු තුළ ඒ මරණ අවස්ථාවේදී චේතනාවකුත් නැහැ. කල්පනාවකුත් නැහැ. අනුසය මාත්‍රයකුත් නැහැ. එතකොට විඤ්ඤාණයට අරමුණක් නැහැ සිටගැනීමට. අරමුණක් නැති වෙනකොට අන්න නැවත උත්පත්තියක් නැහැ. එතනදිත් කිව්වේ අන්න පතිට්ඨිත විඤ්ඤාණයත් අප්පතිට්ඨිත විඤ්ඤාණයත් අතර වෙනස. ඉතින් මේ කාරණාවලට තව නොයෙකුත් සාධක තියෙනවා.

ඇතැම් තැන්වල බුදුරජාණන් වහන්සේ මෙහෙම කියනවා. ඒක අපේ එදිනෙදා ජීවිතයටත් වැදගත් දෙයක් නිසා කියන්නේ. ඇතැම් අවස්ථාවල බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා "මහණෙනි, මට කෙනෙක් පෙනෙනවා දූෂිත සිත් ඇතිව ඉන්නවා. මට ඒ වෙලාවේ හිතෙනවා දැන් මේ පුද්ගලයා මේ වෙලාවේ මැරුණොත්, මේ වෙලාවේ මරණයට පත් වුණොත්, හරියට අපායේ ගිහින් තිව්වා වගේ.[11] මොකද හේතුව දූෂිත සිත නිසා කෙනෙක් අපායේ උත්පත්තිය ලබනවා. අර අනුසය වගේ ඒක ටිකක්. ඊළඟට තියනවා අනික් පැත්ත. මට පෙනෙනවා කෙනෙක් ප්‍රසන්න සිතකින් ඉන්නවා. ප්‍රසාද සිතකින්. එතකොට හිතෙනවා මේ වෙලාවේ මේ පුද්ගලයා මැරුණොත් ඔන්න සුගතියේ ගිහින් තිව්වා වගේ.[12] මතක ඇති මේ පින්වතුන්ට මට්ටකුණ්ඩලී කථාව. ලොකු පිනක් නොකළත් අර ආසන්න සිත. අන්න එතන දී පෙන්නුම් කරන්නේ ආසන්න සිතේ ප්‍රබලත්වය. ආසන්න සිත- ඒකයි අපි

අර ඡායාව කියලා කිව්වේ.

ඒ ඡායාව වැටිලා ඡායාරූපයක් වෙන්නේ අන්න අර විඤ්ඤාණයත් එකතු වුනාම. ඒ විධියේ දෙයක්. මේ ඔක්කොම කථා කරන පුනර්භවය පිළිබඳ කතාන්තරයට අදාළ නිසා මේක කිව්වේ.

ඔන්න ඊළඟට තවත් පැත්තක් අපි ගනිමු. දැන් මේ විඤ්ඤාණයේ ගමන ගැන හැමෝම කතා කරනවා. විශේෂයෙන්ම ඔය සක්කාය දිට්ඨියට යට වුණු බටහිර මනෝවිද්‍යාඥයින් නැවත උත්පත්තිය ගැන කථා කරනකොට විඤ්ඤාණය ඒකඝන දෙයක් හැටියට- නාමරූප ගැන කථාවක්වත් නැහැ. විඤ්ඤාණය පැන පැන යන හැටියට පෙන්වනවා. මේක අද ඊයේ එකක් නොවේ. බුදුරජාණන් වහන්සේට කලින් ඒ හිටිය බ්‍රාහමණයෝ - කොටින්ම උපනිෂද් ග්‍රන්ථවල තියෙනවා, මේ පුනර්භවය කියන එක විස්තර කරන්නේ කුඩැල්ලාගේ උපමාවෙන්. හිතලා බලන්න කුඩැල්ලෙක් යන හැටි. කුඩැල්ලෙක් යන හැටි හිතන්න. මොකද විඤ්ඤාණය ආත්මයක් හැටියට ගත්තා. එක තැනක් අතහැරලා යන ගමනක් වගෙයි පුනර්භවය ඒ කට්ටිය දැක්වුවේ. නමුත් අපේ ධර්මයේ දැන් අපි පෙන්වලා දුන්නා ආත්මභාවය කියන එක ඇති වෙන්නේ නිරන්තරයෙන්ම 'වට්ටං වට්ටති'[13] දිය සුළියක් කරකැවෙන්නා වගේ. දියසුළිය හැදෙන්නේ. කොහොමද? 'විඤ්ඤාණ පච්චයා නාමරූපං- නාමරූප පච්චයා විඤ්ඤාණං' කලින් අපි දේශනාවල කියලා තියෙනවා. විඤ්ඤාණයත් නාමරූපයත් අතර අන්‍යෝන්‍ය ප්‍රත්‍ය සම්බන්ධතාව තුළින් බුදුරජාණන් වහන්සේ අන්න අර එතෙක් තිබුණ ආත්ම දෘෂ්ටිය එතැනම කඩලා දැම්මා. මෙතන එකක් නැහැ. දෙකක කරකැවිල්ලයි තියෙන්නේ. දෙකක කරකැවිල්ල කියන එක හිතාගන්න. දැන් අර වටරවුමේ යාමක් නේ ඒක. ඒක වටරවුමේ යාමක්, දිය සුළියක වගේ. නමුත් මේක පවා බොහෝ දෙනා වරදවා තෝරන එක්තරා බුද්ධ වචනයක් තියෙනවා. ඒකත් මේ අවස්ථාවේ කියන්න වෙනවා. "මහණෙනි මට වෙන කිසිම දෙයක් පෙනෙන්නේ නැහැ". 'නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං ලහුපරිවත්තං යථයිදං චිත්තං'[14] 'ලෝකයේ මට වෙන කිසිම දෙයක් පෙනෙන්නේ නැහැ- මේ තරම් "ලහුපරිවත්තං" කියන වචනය එතන බුදුරජාණන් වහන්සේ දක්වන්නේ මේ තරම් - ශීඝ්‍රයෙන් පරිවර්තනය වන, මේ තරම් ශීඝ්‍රයෙන් පරිවර්තනය වන වෙන කිසිම දෙයක් පෙනෙන්නේ නැහැ, සිත හැර. 'චිත්තං'. සිත හැර වෙන කිසිම දෙයක්. කොයි තරම්ද කියතොත් 'උපමාපි න සුකරා' උපමාවක් දෙන්න බැහැ, 'යාව ලහුපරිවත්තං චිත්තං' සිත වේගයෙන් කරකැවෙන

තරමට. ඉතින් මේ උපමාව පවා බෞද්ධ නිකායවල, ඒ වගේම අපේ බොහෝදෙනාත් ඒකට නිදසුන හැටියට දක්වන්නේ ගිනි පෙනෙල්ලක් කරකැවෙන්නා වගේ. 'අළාතචක්‍රවත්' කියල කියනවා ගිනිපෙනෙල්ලක් අරගෙන කරකවන එකයි, ඔය හිතේ වේගයට දක්වන්නේ. ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. විඤ්ඤාණයයි නාමරූපයයි අතර ඉතාම සීඝ්‍රයෙන් ඒ අරමුණ ග්‍රහණය කරනවා අතහරිනවා. වෙනෙකක් අල්ලනවා. අන්න ඒ විධියට යන ගමනක් මෙතන තියෙන්නේ. භවය කියල කියන්නේ මේ හැම මොහොතක් ගැනම හිතලා බලන්න, අපේ හිත කොයි තරම් වේගයෙන් අරමුණු අල්ලනවාද අතහරිනවාද?

ඉතින් ඒකටත් බුදුරජාණන් වහන්සේ දීපු උපමාවක් තියෙනවා. අර කාරණයම කියලා තමයි. වෙන සූත්‍රයක මෙන්න මෙහෙම බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා.[15] 'මහණෙනි මේ ධර්මය නොදත් අශ්‍රැතවත් පෘථග්ජනයා මේ අවුරුද්දක් දෙකක් අවුරුදු දහයක් පවා වැඩි වෙනසක් නොවී තියෙන ශරීරයට ආත්මය කියන එක හොඳයි. ශරීරයට ආත්මය කියන එක වැඩිය හොඳයි. සිතට කිසි සේත්ම ආත්මය කියන්න වටින්නේ නැහැ. මොකද? ඔන්න හේතුව බුදුරජාණන් වහන්සේ දක්වනවා. රැයෙත් දවාලෙත් මේ සිත එකක්ව උපදිනවා අනිකක්ව නිරුද්ධ වෙනවා. **'අඤ්ඤදෙව උප්පජ්ජති අඤ්ඤං නිරුජ්ඣති'**. සිත ඒ තරම් වේගයෙන් නිරුද්ධ වෙන නිසා සිතට කෙසේවත් ආත්මය කියන්න බැහැ. 'අඤ්ඤදෙව උප්පජ්ජති අඤ්ඤං නිරුජ්ඣති' **උපදින්නේ එකක් හැටියට. නැති වෙන්නේ වෙන එකක් හැටියට.** ඕක තේරුම්ගන්න බලන්න.

ඒක තේරුම්ගන්න උපකාර වන උපමාවකුත් එතෙන්දි බුදුරජාණන් වහන්සේ දක්වනවා. 'යම්සේ මහණෙනි, වඳුරෙක් කැලයේ වේගයෙන් හැසිරෙන්නේ එක අත්තක් අල්ලනවද, ඒක අතහැරලා වෙන අත්තක් අල්ලනවද, ඒක අතහැරලා වෙන අත්තක් අල්ලනවද- ටිකක් හිතන්න බලන්න. අපිට හිතෙන්නේ ඌ වැටෙයි කියලා. වේගයෙන් ඔය කැගහගහ යන වඳුරෙක් දුවනකොට කොයි තරම් වේගයෙන් අර අත්ත අල්ලනවාද, අතහරිනවාද,[13] එතන තියෙන්නේ උපාදානය. උපාදානය ඉතාම සීඝ්‍රයි. ඒක උපමාවකුත් නොවේ. අන්න ඒ වගේ විඤ්ඤාණය නාමරූප අල්ලනවා. ඒක අල්ලලා අතහැරලා වෙන එකක් අල්ලනවා. ඔය විධියට අරමුණු අල්ලන වේගයයි බුදුරජාණන් වහන්සේ එතන පෙන්නුම් කරන්නේ. නැතිව විඤ්ඤාණය කියලා එකක් තියාගෙන කරකවන එකක් නොවේ. විඤ්ඤාණයත් නාමරූපයත් අතර කෙරෙන ඉතාම සීඝ්‍ර **'ලහුපරිවත්තං'** කියන්නේ ඇත්ත

වශයෙන්ම **පරිවර්තනය** කියලා කියන්නේ අර මේ දෙක අතර කරකැවිල්ලයි. විඤ්ඤාණයත් නාමරූපයත් අතර. එතකොට ඒක මේ ජීවත්ව ඉන්න අවස්ථාවෙත් එහෙමයි. මැරෙන අවස්ථාවෙත් අන්න ඒ කියාපු නාමරූපය අවශ්‍ය වෙන්නේ විඤ්ඤාණය තනිව නැහැ. ඒ කුඩැල්ලාගේ උපමාව ගත්තු බුද්ධ ශ්‍රාවකයින් බුද්ධ කාලයේ සිටිය බව පෙනෙන වටිනා සූත්‍රයක් තියෙනවා. මේ පින්වතුන් කියවලත් ඇති. මජ්ඣිම නිකායේ මහා තණ්හා සංඛය සූත්‍රය.[16] මේ සූත්‍රය ඉතාම ප්‍රකටයි ඔය ගැන දන්නා අය අතර.

ඒ සූත්‍රයේ සඳහන් වෙනවා මෙහෙම එකක්. සාති කියලා භික්ෂුවක් හිටියා. ඒ සාති භික්ෂුව කියකියා ගියා මම භාග්‍යවතුන්ගේ දේශනාව තේරුම්ගත්තු හැටියට උන්වහන්සේ ප්‍රකාශ කරලා තියෙන්නේ 'තදෙවිදං විඤ්ඤාණං සන්ධාවති සංසරති අනඤ්ඤං'. ඔන්න ඒ පාඨය ගත්තාම තේරුම් ගන්න පුළුවන්. ඒ මේ විඤ්ඤාණයම 'අනඤ්ඤං' කියන්නේ වෙන කිසිවක් නැතිව මේ විඤ්ඤාණයම තනිකරම සන්ධාවති සංසරති සංසාරයේ දුවනවයි. සංසරණය කරනවයි. එහෙම කිව්වාම අනික් භික්ෂූන් වහන්සේලා කියනවා සාති භික්ෂුවට 'ඇවැත්නි එහෙම කියන්න එපා. භාග්‍යවතුන් වහන්සේට නොකිව්ව දෙයක් කිව්වයි කියලා නිග්‍රහ කරන්න එපා. භාග්‍යවතුන් වහන්සේ නොයෙකුත් ආකාරයෙන් 'අනෙකපරියායෙන පටිච්ච සමුප්පන්නං විඤ්ඤාණං' විඤ්ඤාණය පටිච්ච සමුප්පන්නයි කියලා ප්‍රකාශ කළා. විඤ්ඤාණය "**නිසා** හටගත්" දෙයක්. හේතු ප්‍රත්‍යයෙන් හටගත් දෙයක්. තනිකර දෙයක් නොවේ. මෙන්න මෙහෙම ප්‍රකාශ කරනවා. **'අඤ්ඤත්‍ර පච්චයා නත්ථි විඤ්ඤාණස්ස සම්භවො'** ප්‍රත්‍යයන්ගෙන් තොරව විඤ්ඤාණයක හටගැනීමක් නැත කියලා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරලා තියෙද්දි ඇයි මෙහෙම කියන්නේ? නමුත් සාති භික්ෂුව ඒ දෘෂ්ටිය අත්හැරියෙ නැහැ. සංඝයා වහන්සේලා ගිහිල්ලා බුදුරජාණන් වහන්සේට පැමිණිලි කළා. බුදුරජාණන් වහන්සේ සාති භික්ෂුව ගෙන්නුවා. ඇහුවා සාති භික්ෂුවගෙන් 'සාති මොකක්ද ඔය කියන විඤ්ඤාණය?' එතකොට එයා පිළිතුරු දුන්නේ හරියට අර බමුණන් කියන ආකාරයට 'කතා කරන ශක්තිය ඇති, විඳීමේ ශක්තිය ඇති යම් විඤ්ඤාණයක් 'වදො වෙදෙය්‍යො' ඒ ඒ තැන්වල, ඒ ඒ භවවල, කුසල් අකුසල් කර්ම විඳිනවාද අන්න ඒ විඤ්ඤාණයයි මම කියන්නේ. ඒ කියන්නේ -අර 'කුඩැල්ලාගේ' විඤ්ඤාණය ඔය කියන්නේ. නමුත් බුදුරජාණන් වහන්සේ 'මොඝ පුරිස' කියලා දොස් කියලා 'හිස් පුරුෂය කාටද මම ඔහොම බණක් කියලා තියෙන්නේ? මම කියලා තියෙනවා නේද නොයෙකුත් ආකාරයෙන් විඤ්ඤාණය පටිච්ච සමුප්පන්න බව. හේතු ප්‍රත්‍යයන්ගෙන් තොරව විඤ්ඤාණයක් පහළ වෙන්නේ

නැහැ කියලා. එතනදී බුදුරජාණන් වහන්සේ විඤ්ඤාණයේ පටිච්ච සමුප්පන්න බවට දෙන උපමාවත් ඉතාම වටිනවා. එතනදී මෙහෙමයි කියන්නේ. " ඇසත් රූපයනුත් නිසා ඇති වන විඤ්ඤාණය චක්ඛු විඤ්ඤාණය, කනත් ශබ්දයත් නිසා ඇති වන විඤ්ඤාණය සෝත විඤ්ඤාණය, නහයත් ගඳ සුවඳත් නිසා ඇති වන විඤ්ඤාණය ඝාන විඤ්ඤාණය ඒ විධියට හිතාගන්න අන්තිමට මනෝ විඤ්ඤාණය ගැනත් එහෙම කියනව - මනසත් ධර්මයනුත් නිසා ඇති වන විඤ්ඤාණය, මනෝ විඤ්ඤාණය කියලා. ඊළඟට සිද්ධාන්තය ප්‍රකාශ කරනවා. 'යඤ්ඤදෙව පච්චයං පටිච්ච' යම් යම් ප්‍රත්‍යයක් මුල් කරගෙන විඤ්ඤාණයක් ඇති වේද, විඤ්ඤාණය ඒ ඒ නමින් හැඳින්වෙනවා. එයින් පෙන්නුම් කරන්නේ මොකක්ද **'නිකං විඤ්ඤාණය'** කියලා දෙයක් නැහැ. **'නිකං විඤ්ඤාණය'** කියලා දෙයක් නැහැ. ඔන්න ඒකට ඊළඟට උපමාව දෙනවා. 'යම් සේ මහණෙනි, ලී නිසා ඇති වන ගින්නට ලී ගින්න කියලා කියනවාද. දර නිසා ඇති වන ගින්නට දර ගින්න කියනවාද. දහයියා නිසා ඇති වන ගින්නට දහයියා ගින්න කියා කියනවාද. ඔය විධියට උපමා කිහිපයක් දීලා බුදුරජාණන් වහන්සේ කියනවා යම් යම් දෙයක් ප්‍රත්‍ය කරගෙන ගින්නක් ඇති වෙනවාද අන්න එසේම ඒ වගේම තමා විඤ්ඤාණයත්. එයින් කියන්නේ දැන් මේ පින්වතුන්ට කියන්න පුළුවන්ද 'නිකන් ගින්නක්' කියලා. කොතනකවත් 'නිකන් ගින්නක්' තියෙනවාද? ඒ ඒ ගින්න හඳුන්වන්නේ, ඒ ඒ ගින්න උපාදාන කරගන්න දේ අනුව නේ. අරමුණ අනුව නේ. ඒ වගේ නිකං විඤ්ඤාණයකුත් නැහැ. විඤ්ඤාණයත් නිරන්තරයෙන් ඔය හයෙන් එකක් විය යුතුයි. නමුත් මේවා ඔක්කොම පටලවාගෙන මේ අපේ සම්ප්‍රදාය තුළ.

මේ පින්වතුන් දන්නවා දැන් කියවන පොත්පත්වල වැඩි හරිය තියෙන්නේ අනික් පැත්ත නේ? හරි පුදුම පටලැවිල්ලක් මේක තුළ තියෙන්නේ. මොකද, ආපසු දන්නෙම නැතුව අර වේදාන්ත දර්ශනයට ගිහිල්ලා. විඤ්ඤාණයත් අර විධියට පැන පැන යන හැටියට තමයි දැන් කවුරුත් කථා කරන්නේ- බෞද්ධ අබෞද්ධ දෙගොල්ලොම. කෙසේ වෙතත් බුදුරජාණන් වහන්සේ දක්වපු ගැඹුරුම තැන තමයි විඤ්ඤාණයයි නාමරූපයයි. ඒක ඇත්ත වශයෙන්ම අර දිය සුළිය වගේ ගැඹුරුම තැනක් මේ ධර්මයේ. ඒකයි පටිච්චසමුප්පාද ධර්මය. ඇත්ත වශයෙන් මහා නිදාන සූත්‍රයට **'මහා නිදාන'** කියලා කියන්නේ ඒකයි. **මහා නිදානයම එතැනයි.** නාමයත් රූපයත් එකිනෙක බැඳිලා තියෙනවා. ඒකත් 'ඒකඝන' නෑ. නාමය නැතිව රූපය පවතින්නේ නැහැ. රූපය නැතිව නාමය පවතින්නේ නැහැ. ඊළඟට නාමයයි රූපයයි. අන්න ඒකට තමයි අපි කිව්වේ ඇතුළත

වෙළුම කියලා. ඊළඟට පිටත වෙළුම තමයි නාමරූපයයි විඤ්ඤාණයයි. ඒකත් දැන් හිතාගන්න පුළුවන් මේ පින්වතුන්ට. අර කිව්ව නේ පිටත වෙළුම කියන්න හේතුවත්. මෙතන විඤ්ඤාණය තියෙනවා අතන මව් කුසේ නාමරූපය. නාමරූපය ඈත තියෙන්නෙ. නමුත් ඒකට අරක අවශයයි. ඒකයි මේ සංසාර ගමන ඇත්ත වශයෙන් හිතන්න තියෙන්නේ කුඩැල්ලාගේ ගමන වගේ දෙයක් නොවේ. ටිකකට උපමාවකට දෙනවා නම් කියන්න තියෙන්නේ කවාකාර රබර් වළල්ලක් වගේ මොකක් හරි ඒ විධියට ඇදි ඇදී යනවා. එක කොනක් අතහරින විට ඒක ගිහිල්ලා අනික් පැත්තට එකතු වෙනවා. අන්න ඒ වගේ ටිකකට හිතාගන්න. එහෙම නැත්නම් මේක දිය සුළිය වශයෙන් හිතනවා නම්, දියසුළිය විටින් විට -දැන් මේ අපේ පැවැත්ම කියලා කියන්නේ මේ අර මව් කුසේදී අපි යම් අවස්ථාවක ග්‍රහණය කළ ශරීරය ආශ්‍රිතව ඊළඟට බැහැරට අපේ හිත විහිදෙනවා. අර බූවල්ලා වගේ ඉන්ද්‍රිය හය තුළින් අරමුණු ගන්නවා නිරන්තරයෙන්. මේ බූවල්ලා එහෙම අල්ල අල්ල ගිහිල්ලා ඒත් ආපසු එනවා මෙතනට. මේ ශරීරය නේ අපි දැඩිව ගන්නේ උපාදින්න හැටියට. යම් වෙලාවක මේක අතහරින්න වෙනකොට ඔන්න අර නිමිත්ත ගිහිල්ලා සම්පූර්ණ වෙනවා මෙතන තියන විඤ්ඤාණයට. ඒක තමයි ධර්මයේ ඇතැම් තැන්වල තියෙන්නේ. 'ඉමස්මිංච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බ නිමිත්තෙසු'[17] මේ සවිඤ්ඤාණක කය කියල කියන්නේ අන්න අර මව් කුසේ නාමරූපයත් විඤ්ඤාණයත් එකතු වෙලා බිහි වුණු මේ ශරීරයයි. ඊට පසු මේක උපන්නට පස්සේ ඔන්න ඊළඟට අර සළායතනය තුළින් අන්න නාමරූප අරමුණු ඔස්සේ යනවා. අර දිය සුළියමයි යන්නේ. මධ්‍යස්ථානය වෙනස් වෙනවා විතරයි. ඉතින් ඔන්න ඔහොම තත්ත්වයක් තියෙන්නේ. ඉතින් ඒක තමයි අර 'පතිට්ඨිත විඤ්ඤාණය' කියලා කිව්වේ. ඔකෙනුයි මිදෙන්න අමාරු වෙන්නේ. ගැඹුරු තැන තියෙන්නේත් එතනයි. විඤ්ඤාණය නිසා නාමරූපය - නාමරූපය නිසා විඤ්ඤාණය.

නමුත් ඔන්න ඊළඟට තියෙනවා මේකට අදාළ ඉතාමත්ම වටිනා සූත්‍රයක්. අපි බලනවා මේ කාල වේලාව තුළ කියන්න. එතනදී සාරි පුත්ත ස්වාමීන් වහන්සේට ඇහුම්කන් දෙන්න බලමු. හොඳ වටිනා සූත්‍රයක් තියෙනවා. ඒත් සංයුත් සඟියේ නිදාන සංයුත්තයේ. එක් අවස්ථාවක සාරිපුත්ත ස්වාමීන් වහන්සේත් මහා කොට්ඨිත ස්වාමීන් වහන්සේත් ඉසිපතන මිගදායේ වැඩ වාසය කළා. මහා කොට්ඨිත ස්වාමීන් වහන්සේ හැන්දෑ වරුවේ භාවනා කරලා ඇවිල්ලා සාරිපුත්ත මහරහතන් වහන්සේ ළඟට ඇවිල්ලා ඔන්න ප්‍රශ්නයක් අහනවා. සමහර විට උන්වහන්සේට නොතේරෙන නිසා

නොවෙයි අපට තේරුම් කරන්න වෙන්න ඇති. ජරා මරණ කියන එක දන්නවා නේ. ජරා මරණ කියන එක පටිච්ච සමුප්පාද ප්‍රත්‍ය මාලාවේ අගට තියෙන එකක් නේ. 'ඇවැත්නි, සාරිපුත්ත ජරා මරණය තමා කරගත්තු දෙයක්ද 'සයං කතං' කියන වචනය යොදනවා. අතීතයේ ඕවා පිළිබඳ තර්ක විතර්ක පැවැත්වූ ආකාරයයි ඒ අන්තගාමීව. මේ ජරා මරණය කියන එක තමා විසින් කරගන්නා ලද්දක්ද? 'සයං කතං'. 'පරං කතං' අනුන් විසින් කරන ලද්දක්ද? ඔන්න ඊළඟට දෙකම එකට එකතු කරලා 'සයං කතං ච පරං කතං ච' දෙගොල්ලොම එකතු වෙලා කරපු එකක්ද? එහෙම නැත්නම් 'අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං' තමනුත් නොකළ අනුනුත් නොකළ ඉබේ හටගත්තු දෙයක් ද? කියලා ඔන්න සාරිපුත්ත හාමුදුරුවන්ගෙන් අහනවා. සාරිපුත්ත හාමුදුරුවෝ කියනවා 'නෑ ඇවැත්නි, ජරා මරණය කියන එක තමා කරගත්තු දේකුත් නොවේ. අනුන් කරගත්තු දේකුත් නොවේ. දෙගොල්ල කරගත්තු දේකුත් නොවේ. ඉබේ හටගත්තු දේකුත් නොවේ. නමුත් ජරා මරණය කියන එක ජාතිය ප්‍රත්‍යයෙන් ඇති වෙන්නෙ. සමහර විට කෙනෙක් හිනා වෙන්න පුළුවන්. නමුත් අන්න ප්‍රත්‍ය කතාව එතනයි තියෙන්නේ. මේ පටිච්ච සමුප්පාදය අග ඉඳලා මේ එන්නේ. ජරා මරණයට ප්‍රත්‍යය ජාතියයි. ඔන්න ඊළඟට මහා කොට්ඨිත ස්වාමීන් වහන්සේ අහනවා 'ඇවැත්නි සාරිපුත්ත මේ ජාති කියන එක - උපත කියන එක -තමා කරගත්තු දෙයක්ද අනුන් කළ එකක්ද? ඔන්න මේක සලකාගන්න කෙටියෙන් කියන්න පුළුවන්. මේ පින්වතුන් තේරුම්ගත්තාම 'සයං කතං, පරං කතං, සයං කතං ච පරං කතං ච, අසයංකාරං අපරංකාරං' ඔන්න හතර ආකාරය - තමා කළ දෙයක්ද අනුන් කළ දෙයක්ද? දෙගොල්ලම කළ දෙයක්ද? කවුරුත් නොකළ ඉබේ හටගත්තු දෙයක් ද? ඒ ජාතිය පිළිබඳවත් අහනවා එතනදිත් සාරිපුත්ත ස්වාමීන් වහන්සේගෙන් අහනවා. 'නැහැ ඇවැත්නි' අන්තිමට ඒකට දෙන උත්තරය මොකක්ද? 'භව පච්චයා ජාති. ජාතිය භවයෙන් ඇති වුණ දෙයක්. මතක තියාගන්න අර යෝනිසෝමනසිකාර ක්‍රමයට යන්නේ. අග කෙළවරේ ඉඳලා. එතකොට කවුරුත් කළා නොවේ. උපත ඇතිවුණේ භවය නිසා. ඊළඟට අහනවා භවය පිළිබඳවත් ප්‍රශ්නෝත්තර ආකාරයෙන් මහා කොට්ඨිත ස්වාමීන් වහන්සේ අහනවා. කෙටියෙන් සලකාගන්න මේ පින්වතුන්. එතකොට සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ඒක ප්‍රතික්ෂේප කරලා කියනවා 'නැහැ භවය උපාදානය නිසා' උපාදානය ප්‍රත්‍යය කරගෙන භවය. ඊළඟට අහනවා උපාදානය? ඒත් අර විධියටමයි අහන්නේ? උපාදානය තමන් කළ දෙයක්ද? අනුන් කළ දෙයක්ද කියලා අහනවා, මහා කොට්ඨිත ස්වාමීන්

වහන්සේ නොදන්නවා වගේ. සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ඔක්කොම ප්‍රතික්ෂේප කෙරුවා. 'නැහැ උපාදානය තණ්හාව ප්‍රත්‍යයෙනුයි. ඔන්න ඊළඟට තණ්හාව ගැන අහනවා. එතකොට කියනවා 'තණ්හාව වේදනා ප්‍රත්‍යයෙන්. දැන් කෙටියෙන් සලකාගන්න ඔන්න වේදනාවේ ප්‍රත්‍යය අහනවා. වේදනාවට ප්‍රත්‍යය ස්පර්ශයයි. ඊළඟට ස්පර්ශයට ප්‍රත්‍යය අහනවා සළායතනයයි. ඔන්න එතන ඉඳලා වැදගත් හරියටයි එන්නේ - ලෑස්ති වෙලා ඉන්න.

සළායතනයට ප්‍රත්‍යය අහනවා. 'නාමරූපයයි'. ඔන්න ඔතනදී ඊළඟට අහනවා ඒක හොඳට සලකාගන්න. නාමරූපය ගැනත් අර විධියට නොදන්නවා වගේ අහනවා. ඇත්ත වශයෙන් නොදන්න නිසාද? අපි නොදන්න නිසාද දන්නේ නැහැ. කොට්ඨිත ස්වාමීන් වහන්සේ එහෙම ඇහුවේ. ඒ දෙනමම මහා ශ්‍රේෂ්ඨ ස්වාමීන් වහන්සේලා දෙනමක්. කොට්ඨිත ස්වාමීන් වහන්සේ අහනවා මේ නාමරූපය තමන් කළ දෙයක්ද? අනුන් කළ දෙයක්ද? දෙගොල්ලොම කළ දෙයක්ද? ඉබේ හටගත් දෙයක්ද? 'නැහැ ඇවැත්නි, ඉබේ හටගත්තක් නොවේ. මේක නාමරූපය විඤ්ඤාණය ඇති කල්හි විඤ්ඤාණය ප්‍රත්‍යයෙන් ඇති වූ දෙයක්'. ඔන්න ඊළඟට විඤ්ඤාණය ගැනත් අහනවා. විඤ්ඤාණයටත් ඒ විධියට කියලා අන්තිමට කියනවා ඔන්න ඔතනදී ගැඹුරු තැනක් එන්නේ. විඤ්ඤාණය තමන් කළාද අනුන් කළාද කිව්වාම, 'නැහැ ඇවැත්නි විඤ්ඤාණය නාමරූපය ඇති කල්හි'. ඔන්න එතනදී බලන්න එතකොට නාමරූපයේ හේතුව ඇහුවම විඤ්ඤාණය කිව්වා. විඤ්ඤාණයේ හේතුව ඇහුවම නාමරූපය කිව්වා. ඔන්න එතනදී මහා කොට්ඨිත ස්වාමීන් වහන්සේ හරියට අර පරස්පර විරෝධී තැනක් පෙන්වන්නා වගේ 'ඇවැත්නි, දැන් ඔබවහන්සේම මට කිව්වා නාමරූපයේ ප්‍රත්‍යය විඤ්ඤාණය කියලා. ඔබවහන්සේම දැන් කියනවා විඤ්ඤාණයේ ප්‍රත්‍යය නාමරූපය කියලා. මම කොහොමද මේක තේරුම්ගන්නේ?' ඔන්න පරස්පර විරෝධය. එතකොට සාරිපුත්ත ස්වාමීන් වහන්සේ කියනවා 'එහෙනම් ආයුෂ්මතුනි, මම ඔබට උපමාවක් දෙන්නම්'. උපමාවෙනුත් ඇතැම් ඥානවන්ත පුද්ගලයින් කාරණයක් තේරුම්ගන්නවා. මෙතැනත් එහෙම කට්ටිය ඉන්නවා නම් මේ උපමාව තේරුම්ගනීවි. ඒ කියන්නේ හුඟක් ප්‍රසිද්ධ උපමාවක් තමා **'බට කෝටු මිටි දෙකේ උපමාව'**. අමතක නොවන උපමාව බට කෝටු මිටි දෙක. සාරිපුත්ත ස්වාමීන් වහන්සේ මේ කියන්නේ බුදුරජාණන් වහන්සේ නොවේ. 'යම් සේ ඇවැත්නි බටකෝටු මිටි දෙකක් තියෙනවා, ඉහළින් එකකට එකක් හේත්තු වෙලා තියෙනවා. එක බට කෝටු මිටියක් ඇද්දහම- අපි හිතමු මෙහා පැත්තේ

එක ඇද්දම එහා පැත්තේ එක වැටෙනවා. ඒකට කියන්නේ **'අඤ්ඤමඤ්ඤං නිස්සාය' එකිනෙකා උපකාර කරගෙන සිටින්නා වූ බට කෝටු මිටි දෙක.** අන්න ඒ වගේ තමයි ඇවැත්නි නාමරූප නිසා විඤ්ඤාණය, විඤ්ඤාණය නිසා නාමරූපය. නමුත් ඔතන ඉඳල තවත් වැදගත් එකක් තියෙනවා. නාමරූපය වැටෙනකොට විඤ්ඤාණය වැටෙනවා. විඤ්ඤාණය වැටෙනකොට නාමරූපය වැටෙනවා. හැබැයි නාමරූපය වැටෙනකොට ඔන්න ඊළඟට සාරිපුත්ත ස්වාමීන් වහන්සේ කියනවා සංසාර දුක කෙළවර වන හැටි. **නාම රූපය වැටෙනවාත් එක්කම සළායතනයත් වැටෙනවා. ස්පර්ශයත් වැටෙනවා. වේදනාවත් වැටෙනවා, තණ්හාවත් වැටෙනවා, උපාදානයත් වැටෙනවා, භවයත් වැටෙනවා, ජාතියත් වැටෙනවා. ඔක්කොම ඉවරයි.**

මේ පින්වතුන්ට අර වැටෙන වේගයවත් කියන්න බැහැ මට. ඒ තරම් හිතාගන්න. තව ටිකක් තේරුම් ගන්න බට කෝටු මිටි දෙක - හිතාගන්න - විඤ්ඤාණ බට කෝටු මිටිය වම් පැත්තේ තියෙනවා කියලා හිතාගන්න. නාම රූප බට කෝටු මිටිය දකුණු පැත්තේ කියනවා කියලා හිතාගන්න. නාමරූප බට කෝටු මිටියට හේත්තු කරලා තියෙනවා සළායතන ස්පර්ශ ආදී ඒ කියාපු ධර්ම ටික. එකක් ඇද්දට පස්සේ මේ පැත්තේ විඤ්ඤාණය ඇදුනට පස්සේ ඔතනයි වැදගත්ම කාරණය තියෙන්නේ. ඉස්සර වෙලාම නාමරූප නිරෝධයයි. අන්න ඒකයි මෙතන වැදගත්කම. **නාමරූප නිරෝධය කළ හැටියේ විඤ්ඤාණය නිරෝධ වෙනවා. විඤ්ඤාණ නිරෝධ කියන්නේ මැරුණා නොවේ. අනිදස්සන විඤ්ඤාණ තත්ත්වයට පත් වෙනවා.** ඒකයි ගැඹුරුම තැන. එතකොට ඒ අනිදස්සන විඤ්ඤාණය තුළ නාමරූපය පිළිබිඹු නොවන නිසාම සළායතනයත් නිරෝධයි. ස්පර්ශයත් නිරෝධයි. වේදනාවත් නිරෝධයි. ඔක්කොම නිරෝධයි. දැන් තේරුම්ගන්න බලන්න ඉතාම ගැඹුරු තැනක් මේ ධර්මයේ. අපිට නම් පුදුමයි මෙච්චර කාලයක් මේ අටුවා සම්ප්‍රදායවත් හිතුවේ නැති එක. **මේ කියාපු දිය සුළි කතන්තර ඔක්කොම මේ නළ කලාප උපමාව තුළම තියෙනවා.** ඒ කියන්නේ ඊළඟට හිතලා බලන්න සාරිපුත්ත ස්වාමීන් වහන්සේට ඕන නම් උපමාවට දෙන්න තිබුණා හොඳ හර ඇති ලී. හර ඇති ලී දෙකක් හේත්තු කරලා ඇයි නොකීවේ. මෙකේ ශූන්‍යත්වය පෙන්නුම් කරන්නයි. බට කෝටුවට පාලියෙන් කියන වචනයත් අපි කියමු. පාලියෙන් බට කෝටුව හඳුන්වන්නේ **'තචසාරං'** කියලා. මේ අපි වඩාත් ගැඹුරට ගියොත් තචසාර කියන්නේ යම් ලීයක හරය එහි පොත්ත නම් - තචසාර කියන්නේ පොත්තම හරය කොට ඇති දේවල්. තචසාර නමින් හඳුන්වනවා බට, උණ ආදී ගස්.

හරයක් නෑ නේ. එතකොට බට කෝටුවෙත් හරයක් නැහැ. බටකෝටු මිටියෙත් හරයත් නැහැ. නමුත් ඒක හේත්තු වෙලා තියෙනවා. එයින් පෙන්නුම් කරන්නේ මොකක්ද? **විඤ්ඤාණයත් ඒකඝන දෙයක් නොවේ. ඒකත් සමූහයක්. ඒකත් රාශියක්.** ඒක වැටහෙන්නේ නැහැ ලෝකයාට. **නාමරූපයත් රාශියක්.** ඒක තමයි ඔය විදර්ශකයා ඈතට ඈතට යන්න යන්න තේරෙන්නේ. ඒ තුළ තියෙන්නේ අනාත්ම දර්ශනයක්. මේවා අනිත්‍ය, දුක්ඛ, අනාත්ම බවයි තේරෙන්නේ. අර නාම රූපයෙත් මෙතන මේ ඇති වන නැති වන වේගයයි පෙන්නුම් කළේ.

නාමරූපයත් විඤ්ඤාණයත් අතර ඉතාම ශීඝ්‍රයෙන් කරකැවිල්ලක් තියෙනවා. 'ලහුපරිවත්තං' කීවේ ඒකයි. ඕක තුළයි භවයක් තියෙන්නේ. පැවැත්මක් තියෙන්නේ. එතකොට පැවැත්ම නැති කරන ක්‍රමය සාරිපුත්ත ස්වාමීන් වහන්සේ පෙන්නුවා, අර විධියට සොයාගෙන ගිහිල්ලා අන්තිමට නාමරූපය නැති කරන්නේ කොහොමද කියලා. ඒක ප්‍රකාශ කළාට පස්සේ ඔන්න වටිනාම උදාන වාක්‍යයක් මහා කොට්ඨිත ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරනවා. ඒක ඇත්ත වශයෙන්ම ප්‍රායෝගික අගයක් තියන නිසා ඒකත් ප්‍රකාශ කරනවා. මහා කොට්ඨිත ස්වාමීන් වහන්සේ සාරිපුත්ත ස්වාමීන් වහන්සේගේ උපමාව අහලා මෙන්න මෙහෙමයි ප්‍රතිචාරය දක්වන්නේ. 'අච්ඡරියං ආවුසො, අබ්භුතං ආවුසො' ආශ්චර්යයි ඇවැත්නි, අද්භුතයි ඇවැත්නි. ඔබ වහන්සේගේ සුභාෂිතය ආශ්චර්යයි අද්භුතයි කියලා මම මෙන්න මේ කාරණා තිස්හයකින් ඔබවහන්සේගේ මේ දේශනාව අනුමෝදන් වෙනවා කියලා ඔන්න ඊළඟට අමුතු දෙයක් කියනවා. ඒක ප්‍රායෝගික අගයක් තියෙන දෙයක්. යම් කිසි භික්ෂුවක් ජරා මරණය- දැන් කෙළවර නේ තියෙන්නේ ජරා මරණය - ජරා මරණය පිළිබඳව එතැන වචන තුනක් සඳහන් වෙනවා. නිබ්බිදාය, විරාගාය, නිරෝධාය, ජරා මරණ පිළිබඳව කලකිරීමට, නොඇල්මට, නිරෝධය පිණිස, ධර්මය දේශනා කරනවා නම් යම් භික්ෂුවක්, එපමණකින් ඒ භික්ෂුව හඳුන්වන්න වටිනවා '**ධම්මකථික' කියලා**. ධම්ම කථික කියන්න ඒකමඇති. වෙන අනම් මනම් නොවේ. ජරා මරණය ගැන කලකිරෙන්න. එහි නොඇල්ම ඇති කර ගන්න, එයින් මිදෙන්න යම් කෙනෙක් ධර්මය දේශනා කරනවා නම් එපමණකින් ඒ භික්ෂුව හඳුන්වන්න සුදුසුයි ධම්ම කථික කියලා. ඊළඟට ජරා මරණය පිළිබඳව නොඇල්මක් විරාගයක් ඇති වෙන ආකාරයේ ප්‍රතිපදාවේ යනවා නම් යම් භික්ෂුවක්, අන්න එහෙනම් උන්වහන්සේට කියන්න වටිනවා **'ධම්මානුධම්ම පටිපන්න'** කියලා. ධර්මය අනුව පිළිපදින භික්ෂුවක්. ඊළඟට යම් භික්ෂුවක් ජරාමරණය පිළිබඳව නිබ්බිදා, විරාග, කලකිරීම

තුළින් සම්පූර්ණයෙන්ම විමුක්ත වුණා. ඒ භික්ෂුවට **'දිට්ඨ ධම්මනිබ්බානප්පත්තො'** කියලා කියන්න වටිනවා. මෙලොවම නිවන දුටු භික්ෂුවක් කියලා. එතකොට දැන් සලකාගන්න පින්වතුනි, ඒ ජරා මරණය වගේම අර තිස්භයක් වෙන්නේ කොහොමද, අංග දොළහක් තියෙනවා නේ පටිච්ච සමුප්පාද ධර්මයේ. මේ පින්වතුන් දන්නව නේ. අවිජ්ජාවෙ ඉඳල ඒ එක එකක් ගැන දිගින් දිගටම මහා කොට්ඨිත ස්වාමීන් වහන්සේ අනුමෝදන් වශයෙන් මහා වර්ණනාවක් කරනවා. ඒ එක එකක් පිළිබඳවම යම් භික්ෂුවක් ධර්ම දේශනා කරනවා නම් ධර්ම - කථික කියන්න ඒ ටික වටිනවා. අර දොළහෙන් ඕනෑම එකක්. අවිද්‍යාව වේවා තණ්හාව වේවා ඕනෑම එකක්. ඊළඟට ඒ අනුව පිළිපදිනවා නම් ධම්මානුධම්මපටිපන්න. ඒ එක්කම ඇත්ත වශයෙන්ම ඒවා ගැන කලකිරිලා එයින් නිරෝධය ලබා ගත්තා නම් අන්න 'දිට්ඨධම්ම මෙලොවම නිවන් දුටුවා. එතකොට එයින් අපට පෙනෙනවා පටිච්ච සමුප්පාද ධර්මයේ වටිනාකම.

මේ එක් එක් අංගයක් පිළිබඳව හරියට තේරුම් අරගෙන, මේවායේ ප්‍රත්‍ය සම්බන්ධතාව හරියට තේරුම් අරගෙන, එක තැනක් කැඩුවාම ඔක්කොම කැඩිලා යනවා. අන්න ඒ විදියේ දෙයක් මෙතන. නමුත් වැදගත්ම තැන තමයි අපි කිව්වේ- සන්ධිස්ථානය- මහා නිදානය තමයි නාමරූපයත් විඤ්ඤාණයත් අතර, එහෙම නැත්නම් විඤ්ඤාණයත් නාමරූපයත් අතර තියෙන අන්‍යෝන්‍ය ප්‍රත්‍යතාව.

එතකොට අද දවසේ වැඩි වේලාවක් නැති නිසා අපි දැන් මේ වන විට දේශනා හතරක විතර ඔය මාතෘකාව ඇල්ලුවේ මොකද මේක ධර්මයේ මොන යම් හේතුවක් නිසා හෝ සැඟවී ඇති පැත්තක්. හුඟක් මිථ්‍යාදෘෂ්ටි ඇති වෙන්න හේතු වුනු එකක්. ඉතින් මේ පින්වතුන් කල්පනා කරන්න මේවා නිකම් ගැඹුරුයි ගැඹුරුයි කියලා හිතන්නේ නැතිව- ධර්මය ගැඹුරුයි අපට වළක්වන්න බැහැ. ඒකයි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළේ ඒ වගේම මතක තියාගන්න. දැන් මෙතන ඇති බොහෝදෙනෙක් බුදුන් දැක නිවන් දකින්නට බලාපොරොත්තු වෙන අය. අපි කලින් දවසේ කිව්වා බුදුරජාණන් වහන්සේ කියලා තියෙනවා 'යො පටිච්ච සමුප්පාදං පස්සති සො ධම්මං පස්සති' 'යො ධම්මං පස්සති සො පටිච්ච සමුප්පාදං පස්සති'[19] 'යමෙක් පටිච්ච සමුප්පාදය දකීද හේ ධර්මය දකී.' යමෙක් ධර්මය දකීද හේ පටිච්ච සමුප්පාදය දකී. ඒ වගේම බුදුරජාණන් වහන්සේ වක්කලී භික්ෂුවට කිව්වා වක්කලී භික්ෂුන් වහන්සේ බුදුරජාණන් වහන්සේගේ ශරීරය දිහා බලාගෙන ඉන්නකොට කිව්වා 'මොකද වක්කලී මගේ මේ

කුණු කය දිහා බලාගෙන ඉන්නේ.' 'යො ධම්මං පස්සති සො මං පස්සති' යමෙක් ධර්මය දකීද හේ මා දකී.[20] **එතකොට පින්වතුනි කවුරුවත් ඉන්නවා නම් මෙතන බුදුන් දැක නිවන් දකින්න කැමති. පටිච්ච සමුප්පාදය දකින්න. නිවනත් එතනයි. බුදුනුත් එතනයි.**

ඉතින් අද දවසට මේ පින්වතුන්ට ඇති ඔය කිව්වා. මේක ඉතින් අපි කියාපු එකක් නොවේ. ධර්මයේ ශක්තියක් තුළින් අපෙන් කියවුණා. තව කී දවසක් - අර කිව්වා වගේ - කියන්න ලැබෙයිද දන්නේ නැහැ. මේ ටිකෙන් ප්‍රයෝජන ගන්න බලන්න. එතකොට අද දින මේ පින්වතුන් පේවිලා සිල් සමාදන් වෙලා බණ භාවනා කරලා මතක තියාගන්න මේ ලබාගත්තු වටිනා ධර්ම කොට්ඨාශ. මේ ලබාගත්තු තම තමන්ගේ ජීවිතවලට එකතු කරගෙන අර මිච්ඡාදිට්ඨි විධියට තියෙන දේවල් තියෙනව නම් ඒවාත් ඉවත් කරලා හැකි තාක් දුරට සම්‍යක් දෘෂ්ටියේ පිහිටලා මේ ප්‍රතිපදාවේ ගිහිල්ලා අර කියාපු **දිට්ඨධම්ම - නිබ්බානපත්ත තත්ත්වයට** පත් වුණොත් තමයි මේවායේ වටිනාකම හරියටම ප්‍රත්‍යක්ෂ කරගත්තා වෙන්නේ. ඒතකොට මේ ධර්ම ශ්‍රවණමය කුසල ශක්තියත් මේ පින්වතුන්ට උපකාර වෙලා තම තමන්ගේ බණ භාවනා සාර්ථකත්වයෙන් බලාපොරොත්තු වෙන උත්තමාර්ථයත් මේ ජීවිතයේදීම සාක්ෂාත් කරගන්න ශක්තිය බලය ලැබේවා කියා අපි ප්‍රාර්ථනා කරන අතර, අවීචියේ සිට අකනිට්ඨාව දක්වා යම්තාක් සත්ත්ව කෙනෙක් ධර්ම දේශනාමය, ධර්ම ශ්‍රවණමය කුශලයක් අනුමෝදන් වීමට කැමති නම් ඒ අනුමෝදන් වීම තුළින් ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවනින් සැනසෙත්වා කියා ප්‍රාර්ථනා කරගෙන මේ ගාථා කියන්න.

## එත්තාවතා ච අම්හෙහි ...

## පාදක සටහන්

1. ජටා සූත්‍රය, සංයුත්ත නිකාය - 1, 26 පිට (බු.ජ.ත්‍රි. 13)
2. මහා නිදාන සූත්‍රය, දීඝ නිකාය - 2, 80 පිට (බු.ජ.ත්‍රි. 8)
3. මහා නිදාන සූත්‍රය, දීඝ නිකාය - 2, 90 - 92 පිටු (බු.ජ.ත්‍රි. 8)
4. මහා නිදාන සූත්‍රය, දීඝ නිකාය - 2, 80 පිට (බු.ජ.ත්‍රි. 8)
5. කලහවිවාද සූත්‍රය, සංයුත්ත නිකාය, ඛුද්දක නිකාය, 272-276 පිටු (බු.ජ.ත්‍රි. 25)
6. මහා නිදාන සූත්‍රය, දීඝ නිකාය - 2, 92 (බු.ජ.ත්‍රි. 8)
7. සම්පසාදනීය සූත්‍රය, දීඝ නිකාය - 3, 176 පිට (බු.ජ.ත්‍රි. 9)
8. සම්පසාදනීය සූත්‍රය, දීඝ නිකාය - 3, 176 පිට (බු.ජ.ත්‍රි. 9)
9. කෙවඩ්ඪ සූත්‍රය, දීඝ නිකාය - 1, 538 පිට (බු.ජ.ත්‍රි. 7)
10. චේතනා සූත්‍රය, සංයුත්ත නිකාය - 2, 102 පිට (බු.ජ.ත්‍රි. 14)
11. ශූක වර්ගය, අංගුත්තර නිකාය - 1, 16 පිට (බු.ජ.ත්‍රි. 18)
12. ශූක වර්ගය, අංගුත්තර නිකාය - 1, 16 පිට (බු.ජ.ත්‍රි. 18)
13. සර සූත්‍රය, සංයුත්ත නිකාය - 1, 30 පිට (බු.ජ.ත්‍රි. 13)
14. ශූක වර්ගය, අංගුත්තර නිකාය - 1, 18 පිට (බු.ජ.ත්‍රි. 18)
15. අස්සුතවන්තු සූත්‍රය, සංයුත්ත නිකාය - 2, 148 පිට (බු.ජ.ත්‍රි. 14)
16. මහා තණ්හාසඞ්ඛය සූත්‍රය, මජ්ඣිම නිකාය - 1, 602-632 පිටු (බු.ජ.ත්‍රි. 10)
17. මානානුසය සූත්‍රය, සංයුත්ත නිකාය - 2, 386 පිට (බු.ජ.ත්‍රි. 14)
18. නළකලාප සූත්‍රය, සංයුත්ත නිකාය - 2, 176-180 පිටු (බු.ජ.ත්‍රි. 14)
19. මහාහත්ථිපදොපම සූත්‍රය, මජ්ඣිම නිකාය - 1, 460 පිට (බු.ජ.ත්‍රි. 10)
20. වක්කලි සූත්‍රය, සංයුත්ත නිකාය - 3, 206 පිට (බු.ජ.ත්‍රි. 15)

# 05 වන දේශනය

# 05 වන දේශනය

## (පහන් කණුව ධර්ම දේශනා අංක 187)
## 'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

අක්ඛෙය්‍ය සඤ්ඤිනො සත්තා - අක්ඛෙය්‍යස්මිං පතිට්ඨිතා
අක්ඛෙය්‍යං අපරිඤ්ඤාය - යොගමායන්ති මච්චුනො

අක්ඛෙය්‍යඤ්ච පරිඤ්ඤාය- අක්ඛාතාරං න මඤ්ඤති
තඤ්හි තස්ස න හොතීති -යෙන නං වජ්ජා න තස්ස අත්ථි[1]

-සංයුත්ත නිකාය - දෙවතා සංයුත්ත

සැදැහැවත් පින්වතුනි,

ලෝකයේ තියෙන ගැටලු, මතභේද, වාද විවාද, රාශියක්ම භාෂා ව්‍යවහාරය නිසා පැනනඟින බව තිලෝගුරු සම්මා බුදුරජාණන් වහන්සේ පටිච්ච සමුප්පාද ධර්මය තුළින් හෙළි කර වදාළා. ලොකුම ගැටලුව වන සංසාර ගැටලුවටත් හේතුව ඒකයි. මේ බව ප්‍රකාශ කරන වටිනා ගාථා දෙකක් තමයි අද මේ අවුරුද්දක් ආරම්භ කරන දුරුතු පෝය දවසේ අපි මේ පින්වතුන්ට දේශනාවට මාතෘකාව හැටියට යොදාගත්තේ.

මේ ගාථා දෙක දකින්න ලැබෙන්නේ සංයුත් සඟියේ සගාථක වග්ගයේ දේවතා සංයුත්තයේ සමිද්ධි සූත්‍රයේ. මේ ගාථා දෙකට ධර්ම රසයක් ඇති නිදාන කතාවකුත් පොතේ දැක්වෙනවා. බුදුරජාණන් වහන්සේ රජගහ නුවර තපෝදාරාමයේ වැඩ වාසය කරන අවස්ථාවක සමිද්ධි ස්වාමීන් වහන්සේ අලුයම නැගිටලා තපෝදයට ගියා. තපෝදය කියල කියන්නේ පින්වතුනි, ඒ කාලයේ රජගහ නුවර තිබුන උණු වතුර ළිං. තපෝදයට වැඩම කරලා පැන්පාසු වෙලා එළියට ඇවිත් අඳනය පමණක් ඇතිව සිරුර වේලෙනකං ටිකක් හිටගෙන හිටියා එළියේ. එතකොට එක්තරා දේවතාවෙක් ඒ තපෝදය තමන්ගේ ශරීර ආලෝකයෙන් ආලෝකවත් කරලා සමිද්ධි ස්වාමීන් වහන්සේ ළඟට කිට්ටුවට ඇවිල්ලා අහසේ ඉඳගෙනම සමිද්ධි ස්වාමීන් වහන්සේ අමතලා මෙන්න මෙහෙම අභියෝග විධියේ ගාථාවක් ප්‍රකාශ කරනවා.

**අභුත්වා භික්ඛසි භික්ඛු - න හි භුත්වාන භික්ඛසි**
**භුත්වාන භික්ඛු භික්ඛස්සු - මා තං කාලො උපච්චගා**[2]

'අභුත්වා භික්ඛසි භික්ඛු' කියලා කියන්නේ 'මහණ ඔබ පංචකාම සම්පත්තිය අනුභව කරලා නොවේ මේ භික්ෂාවෙන් යැපෙන මහණකමට පැමිණියේ. මහණකම් කරන්නේ. 'න හි භුත්වාන භික්ඛසි' පංචකාම සම්පත්තිය අනුභව කරලා ඉවර වෙලා මහණකම් කරනවා නොවේ. 'භුත්වාන භික්ඛු භික්ඛස්සු' පංචකාම සම්පත්තිය අනුභව කරලා ඉවර වෙලා මහණකමට යන්න. භික්ෂාවෙන් යැපෙන මහණකමට යන්න. 'මා තං කාලො උපච්චගා' මේ පංචකාම සම්පත්තිය අනුභව කරන්න හොඳම තරුණ කාලය ඔබව ඉක්මවා යන්න දෙන්න එපා කියල ධර්මානුකූල නොවන ආරාධනාවක් කළා. එතකොට සමිද්ධි ස්වාමීන් වහන්සේ ඒකට දෙන පිළිතුර මේකයි.

**කාලං වො'හං න ජානාමි - ඡන්නො කාලො න දිස්සති**
**තස්මා අභුත්වා භික්ඛාමි - මා මං කාලො උපච්චගා**[3]

ඒකේ තේරුම, 'කාලං වො හං න ජානාමි' මම දන්නේ නැහැ මම මැරෙන වෙලාව. 'ඡන්නො කාලො න දිස්සති' ඒ මැරෙන වෙලාව මට ආවරණය වෙලයි තියෙන්නේ. මට ඒක පෙනෙන්නේ නැහැ. 'තස්මා අභුත්වා භික්ඛාමි' එම නිසා පංචකාම සම්පත්තිය අනුභව නොකරම මම මේ මහණකමට පැමිණිලා මේ භික්ෂාවෙන් යැපෙනවා. 'මා මං කාලො උපච්චගා' මෙන්න මේ අදහසින්. මේ මහණකම කරන්න හොඳ තරුණ කාලය මා ඉක්මවා නොයේවා, කියන අදහසින්. එතකොට දේවතාවා කිව්වේ තරුණ කාලය පංචකාම සම්පත්තිය විඳින්න හොඳයි කියලයි. සමිද්ධි ස්වාමීන් වහන්සේ කියන්නේ ජරා තත්ත්වයට පත්වුණාම බැහැ මහණකම් කරන්න, තරුණ කාලෙ තමයි කරන්න තියෙන්නේ කියලා. අරම කිව්වට මොකද, ඒ දේවතාවා එතැනින් නැවතුණේ නැහැ. ඊළඟට බිමට බැහැලා අර ගාථාවෙන් කළ ආරාධනාවට තවත් පෝර දමන්නා වගේ කියනවා 'මහණ ඔබ මේ තරුණ වයසේ ඉන්න, කළු කෙස් ඇතිව භද්‍ර යෞවනයේ ඉන්න කෙනෙක්. පංචකාම සම්පත්තිය අනුභව කරලා නැහැ. මේ මනුෂ්‍යයින්ට අයිති පංචකාම සම්පත්තිය අනුභව කරන්න. 'ඔන්න ඊළඟට එක්තරා උපදේශයක් කියනවා. අපි ඒක පාලි වචනයෙන්ම කිව්වොත් ඒක මෙහෙමයි කියන්නේ. 'මා සන්දිට්ඨිකං හිත්වා කාලිකං අනුධාවි' ඒකේ තේරුම, මේ සන්දිට්ඨික කියලා කියන දිටු දැමියෙහිම, ඇස් පනාපිටම තියෙන සම්පත් අතහැරලා 'කාලිකං අනුධාවි' කියන්නේ මේ

කල් යන මේ මහණකමේ ප්‍රතිඵල ඔස්සේ දුවන්න එපා.

ඔන්න එතකොට සමිද්ධි ස්වාමීන් වහන්සේ ඒකට දෙන පිළිතුර - 'නැහැ ඇවැත්නි මම මේ සන්දිට්ඨිකය අතහැර කාලිකය ඔස්සේ දුවනවා නොවෙයි. මම කාලිකය  අතහැරල සන්දිට්ඨිකය ඔස්සේ දුවනවා. භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කරලා තියෙනවා, මේ කාම සම්පත්තිය කියන දේවල් 'කාලිකා' කියලා. ඒ සංසාරයේ කල් ගතකරවන දේවල්. ඒ වගේම 'බහුදුක්ඛා, බහුපායාසා' බොහෝ දුක් උපායාස ආදීනව ඇති දෙයක් කියලා භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කරලා තියෙනවා. නමුත් ඒ එක්කම මේ ධර්මය 'සන්දිට්ඨිකයි අකාලිකයි, එහිඑස්සිකයි, ඕපනයිකයි, පච්චත්තං වේදිතබ්බ විඤ්ඤූහි' මේ වචන මේ පින්වතුන්ට කලින් තේරුම් කරලත් තියෙනවා. කෙටියෙන් කීවොත් මේ ධර්මයේ ප්‍රතිඵල මෙලොව ඇස් පනාපිට දැකිය හැකියි. අකාලිකයි. කල් නොයවා එහිපස්සිකං එව බලව කියන එකක් මේ ධර්මය තුළ තියෙනවා. ඕපනයික පියවරෙන් පියවර ඉදිරියට ගෙන යනවා. පච්චත්තං වේදිතබ්බො විඤ්ඤූහි' නුවණැත්තන් විසින් තමන්ම ප්‍රත්‍යක්ෂ කරගන්න පුළුවන් කියන එක. එතකොට ඒක ප්‍රකාශ කළාම මේ දේවතාවා කියනවා - ඒත් එයාගේ තර්කය ඉවර නැහැ. "කෙසේද මහණ, මේ භාග්‍යවතුන් වහන්සේ කාමයන් කල් යවන දේවල්, බොහෝ ආදීනව ඇති දේවල්, කියලා කිව්වේ? ආදීනව සහිත දුක් සහිත දේවල් කියලා කිව්වේ? කෙසේද මේ ධර්මය සන්දිට්ඨික කියලා භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කළේ?"

ඔන්න එතකොට සමිද්ධි ස්වාමීන් වහන්සේ කියනවා "ඇවැත්නි, මම මේ ළඟදී මහණ වෙච්ච කෙනෙක්. මේ ධර්ම විනයට අලුත් කෙනෙක්. මට ඔය ප්‍රශ්නයට දිගට සවිස්තර පිළිතුරක් දෙන්න බැහැ. අන්න භාග්‍යවතුන් වහන්සේ වැඩ ඉන්නවා රජගහ නුවර තපෝදාරාමයේ. ගිහිල්ලා භාග්‍යවතුන් වහන්සේගෙන් ඔය ප්‍රශ්න අහන්න. භාග්‍යවතුන් වහන්සේ කියන හැටියට ඒ පිළිතුර දරාගන්න." එතකොට දේවතාවා කියනවා "මහණ මට ඒ භාග්‍යවතුන් වහන්සේ ළඟට යන්න ලෙහෙසි පහසු නැහැ. මහේශාක්‍ය දේවතාවුන් විසින් නිතර පිරිවරන ලදුව ඉන්නේ භාග්‍යවතුන් වහන්සේ. මට කිට්ටු කරන්න බැහැ. මහණ ඔබ ගිහිල්ලා මා වෙනුවෙන් ඒ ප්‍රශ්නය ඇසුවොත් මමත් එන්නම් ධර්මය අහන්න."

එහෙම කිව්වම සමිද්ධි ස්වාමීන් වහන්සේත් 'හොඳයි' කියලා බුදුරජාණන් වහන්සේ ළඟට ගිහිල්ලා සම්පූර්ණ සිද්ධිය කිව්වා. දෙන්නා අතර, දේවතාවත් තමන් වහන්සේත් අතර, ඇති වෙච්ච සාකච්ඡාව, සංවාදය

කිව්වා. ඒ වෙලාවේ අර දේවතාවත් ඇවිල්ලා හිටියා. ඔන්න බුදුරජාණන් වහන්සේ අර දේවතාවට එල්ල කරලා තමයි අර අපි මාතෘකා කළ ගැඹුරු ගාථා දෙක වදාළේ.

**අක්ඛෙය්‍යසඤ්ඤිනො සත්තා - අක්ඛෙය්‍යස්මිං පතිට්ඨිතා**
**අක්ඛෙය්‍යං අපරිඤ්ඤාය - යොගමායන්ති මච්චුනො**

මේවා අමුතු වචන වෙන්න පුළුවන් මේ පින්වතුන්ට. 'අක්ඛෙය්‍ය' කියලා කියන්නේ පින්වතුනි, අපි ඒකේ නිරුක්ති ඔස්සේ කිව්වොත් තේරුම් ගන්න 'ඛ්‍යා' කියන ධාතුව තියෙනවා පාලියේ. 'ඛ්‍යා' ධාතුවෙ තියෙන්නේ 'කීම' කියන අදහස. දැන් 'ආඛ්‍යාත' කියලා කියන්නේ කියනු ලබනු දෙය. 'ආඛ්‍යාන' කියලා කියන්නේ. එතකොට 'අක්ඛෙය්‍යං' කියන්නේ කිව යුත්ත. ඒක සමහර විට තෝරන්න පුළුවන් නම් කර කිවයුත්ත. වචනයෙන් කිව යුත්ත. එතකොට අක්ඛෙය්‍යසඤ්ඤිනො සත්තා' කියන්නේ සත්ත්වයෝ වචනයෙන් නම් කර කිව යුතු දේ පිළිබඳ සංඥාව ඇත්තාහුය. 'අක්ඛෙය්‍යස්මිං පතිට්ඨිතා' කියලා කියන්නේ, නම් කර කිව යුතු දේ මතම පිහිටියාහුය මේ සත්ත්වයෝ. ඊට වැඩි දෙයක් නෑ. වචන විතරයි. ඊළඟට 'අක්ඛෙය්‍යං අපරිඤ්ඤාය' මේ නම් කර කිව යුතු දේ පිළිබඳව පිරිසිඳු අවබෝධය නැතිකම නිසා, හරි අවබෝධය නැති නිසා මොකක්ද වෙන්නේ. 'යොගමායන්ති මච්චුනො' මාරයාගේ වියගහ යටට එනවා. මාරයාගේ බැම්මට යට වෙනවා. සංසාරයේ දිගින් දිගට යනවා.

ඊළඟට අනික් පැත්ත කියනවා. 'අක්ඛෙය්‍යඤ්ච පරිඤ්ඤාය' යම් කෙනෙක්, ඒ රහතන් වහන්සේ පිළිබඳවයි කියන්නේ - ඒ කිව යුත්ත එහෙම නැත්නම් නම් කර කිව යුතු දේ පිළිබඳව පිරිසිඳු අවබෝධය, හරියාකාර අවබෝධය ලබාගෙන **'අක්ඛෙය්‍යං ච පරිඤ්ඤාය - අක්ඛාතාරං න මඤ්ඤති'** ඒකේ හරි අවබෝධය ඇත්නම්, 'අක්ඛාතාරං' කියන්නේ කියන්නා. කියන්නා කියන සංඥාවත් නැති වෙනවා. කතෘ කෙනෙක් පිළිබඳ අදහසත් නැති වෙනවා. හරියට තේරුම්ගත්තා නම් භාෂාව පිළිබඳව. 'අක්ඛාතාරං න මඤ්ඤති' කියන්නෙක් කියන හැඟීමත් ඒ 'මඤ්ඤනාවත් ඇති කර ගන්නේ නැහැ. 'තඤ්හි තස්ස න හොති' රහතන් වහන්සේට එවැන්නක්, ඒ සිතුවිල්ලක් එන්නේ නැහැ. 'යෙන නං වජ්ජා න තස්ස අත්ථි' ඒ කියන්නේ යමෙක් ඔහු පිළිබඳව, රහතන් වහන්සේ පිළිබඳව, කථා කරනවා නම්, කථා කරන්න මාතෘකා දෙයකුත් නැහැ එතන. ඒ රහතන් වහන්සේ ඒවායෙන් නිදහස් කියන එකයි - ඒ වාග් ව්‍යවහාරවලින්.

ඉතින් ඔය විදියට ප්‍රකාශ කරලා බුදුරජාණන් වහන්සේ මේ දේවතාවට කියනවා **'සචෙ විජානාසි වදෙහි යකඛ'** මේ ධර්මයේ සඳහන් වෙනවා දේවතාවන්ටත් ඇතැම් අවස්ථාවල යක්ෂ කියලා කියනවා. නිග්‍රහ කරන හැටියට නොවේ. බුදුරජාණන් වහන්සේට තරහ ගියා නොවේ. ශක්‍රයාට පවා සමහර විට යක්ෂයා කියලා යෙදිච්ච තැන් තියෙනවා. ඒක නිසා 'සචෙ විජානාසි වදෙහි යකඛ' කියලා කිව්වේ, මේ පින්වතුන් ඒක ඕන වචනයකින් කියාගන්න, නමුත් සාමාන්‍ය අදහස 'යක්ෂය ඔබට තේරෙනවා නම්, කියන්න' කියන එකයි. එහෙම කිව්වාම මේ යක්ෂයා කියනවා 'භාග්‍යවතුන් වහන්ස මට ඔය භාග්‍යවතුන් වහන්සේ කෙටියෙන් කියාපු එක තේරෙන්නේ නැහැ. මට මේක සවිස්තරව තේරුම් කරලා දෙන්න' කියලා කිව්වාම බුදුරජාණන් වහන්සේ ඊටත් වැඩිය අමාරු ගාථාවක් දේශනා කරනවා.

**සමො විසෙසී අථවා නිහීනො**
**යො මඤ්ඤති සො විවදෙථ තෙන**
**තීසු විධාසු අවිකම්පමානො**
**සමො විසෙසීති න තස්ස හොති**[4]

'සමො විසෙසී අථවා නිහීනො' කියලා කියන්නේ - මේ කියන්නේ මාන ගැන. මාන තුන ගැන කියන්නේ. සමය, විශේෂය, හීනය කියල කියන ඒ මාන යම් කෙනෙක් ඒ පිළිබඳ මඤ්ඤනාවල් ඇති කරගන්නවා නම්, හිතාගන්නවා නම්, ඒ මාන තත්ත්ව ගැන 'යො මඤ්ඤති සො විවදෙථ තෙන' ඒ නිසා විවාදවලට පටලැවෙනවා. අර කියාපු අර මාන තුන නිසා. 'තීසු විධාසු අවිකම්පමානො' 'තීසු විධාසු' කියලා අර කිව්වේ මානය පිළිබඳ කාරණා තුනයි. හීන, විශේෂ, සම - හිතාගන්න පුළුවන් නේ. ඒ කියාපු විධාන තුන පිළිබඳව කම්පා නොවන තැනැත්තා -තීසු විධාසු අවිකම්පමානො - සමො විසෙසීති න තස්ස හොති.' ඔහුට සම විශේෂ කියන භේදයක් ඇතිවන්නේ නැහැ. ඕක කියලා බුදුරජාණන් වහන්සේ 'සචෙ විජානාසි වදෙහි යකඛ' යක්ෂය මේක තේරෙනවා නම් කියන්න කිව්වා. ඔන්න එතකොට යක්ෂයා කරකැවිලා යන්න ඇති. යක්ෂයා කියනවා 'අනේ භාග්‍යවතුන් වහන්ස, මට ඕකත් තේරෙන්නේ නැහැ. මට මේක තව විස්තරව කියලා දෙන්න.' මේක තේරුම් ගන්න විස්තරව කියනවා ඔන්න බුදුරජාණන් වහන්සේ ඒකට වැඩිය බරපතළ ගාථාවක්.

**පහාසි සඞ්ඛං න ච මානමජ්ඣගා**
**අච්ඡෙච්ජි තණ්හං ඉධ නාමරූපෙ**
**තං ඡින්නගන්ථං අනීඝං නිරාසං**
**පරියෙසමානා නාජ්ඣගමුං**
**දෙවා මනුස්සා ඉධ වා හුරං වා**
**සග්ගෙසු වා සබ්බනිවෙසනෙසු**[5]

ඒකත් අපි තේරුම් කරමු. මෙහෙම සාමාන්‍ය තේරුම ඉස්සර වෙලා කියමු. 'පහාසි සඞ්ඛං' එතැන 'සඞ්ඛා' කියන වචනය යෙදෙනවා. අපි කලින් අවස්ථාවල මේ පින්වතුන්ට තේරුම් කරලා තියෙනවා. 'සඞ්ඛා' කියලා කියන්නේ - සාමාන්‍ය ව්‍යවහාරයේ තියෙන්නේ සංඛ්‍යාව කියලා කියන්නේ ඉලක්කම නේ. අපි පෙන්නල දුන්නා භාෂා ව්‍යවහාරයේ ප්‍රාථමිකම දේ තමයි ඉලක්කම. ඔය ගොලුවෝ එහෙම කථා කරන්නේ ඇඟිලිවලින් එහෙම. ඉලක්කම තමා ප්‍රාථමික. එතකොට ගිණීම කියලා ගත්තහම හරි. 'පහාසි සඞ්ඛං' කියන්නේ මේ රහතන් වහන්සේලා පිළිබඳව කියන්නේ. රහතන් වහන්සේලා ගිණීම් අතහැරලා. ගිණීම් කරන්නේ අර වචන ඔස්සේ නේ. ගිණීම් අතහැරියා. 'පහාසි සඞ්ඛං - න ච මානමජ්ඣගා' ඒ වගේම මානයට ගියේ නැහැ. එතකොට **ගිණීම්** අතහැරියා වගේම **මැනීමත්** අතහැරියා. ඔන්න රහතන් වහන්සේ, 'පහාසි සඞ්ඛං න ච මානමජ්ඣගා' ඊළඟට එහෙම උනේ මොකද 'අච්ඡේච්ජි තණ්හං ඉධ නාමරූපෙ' මේ නාම රූපය පිළිබඳ තණ්හාව අතහැරියා. කොටින්ම කියතොත් නාමරූප පිළිබඳව.

අපි තේරුම් කරලා තියෙනවා නේ නාමරූප කියන්නේ 'නැමීම' නොවේ. නාමය. ඒවා අපි කලින් තේරුම් කරලා තියෙනවා. ආයි නැවත කියන්න ඕනැ නැහැ. කෙටියෙන් සලකාගන්න. වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර කියන ඒ නාම ධර්ම ආශ්‍රයෙන් තමයි පඨවි, ආපො, තේජො, වායො කියන මහා භූත ධර්ම තුළින් යම් රූප සංඥාවක් ගන්නේ. එතකොට ලෝකයා බැඳෙන්නේ ඒ නාමරූපයේ. නාම රූපය පිළිබඳව තණ්හාව කපා හැරියා. 'අච්ඡේච්ජි තණ්හං ඉධ නාමරූපෙ'[6] ඔන්න 'තං ඡින්නගන්ථං අනීඝං නිරාසං' තණ්හා බන්ධනය, ඒ නාමරූපය පිළිබඳ තණ්හා ගැටය කපා දැමූ ඒ රහතන් වහන්සේ පිළිබඳව කියන්නේ 'අනීඝං -නික්ලේශී -නිරාසං' -ආශාව රහිත, ඒ රහතන්වහන්සේ පිළිබඳව 'පරියෙසමානා නාජ්ඣගමුං දෙවා මනුස්සා ඉධවා හුරං වා' දෙවියනුත් මනුෂ්‍යයනුත් ඒ රහතන් වහන්සේ හඳුනාගන්න, ඒ හිත මොකක් අරමුණු කරගෙන තියෙනවාද කියලා හඳුනාගන්න, 'පරියෙසමානා නාජ්ඣගමුං'

සොයන ඔවුන්ට හැකි වෙන්නේ නැහැ. රහතන් වහන්සේගේ හිත ගන්නා අරමුණ මොකක්ද කියලා දැනගන්න බැහැ දෙවියන්ටවත් මනුෂ්‍යයන්ටවත් – 'දෙවා මනුස්සා ඉධ වා හුරං වා සග්ගෙසුවා සබ්බ නිවෙසනෙසු' දිව්‍ය ලෝකවලවත් කිසිම භව තත්ත්වයකවත් රහතන් වහන්සේලාගේ හිත මොන අරමුණක් ගන්නවාද කියලා දෙවියන්ටවත් මනුෂ්‍යයින්ටවත් කියන්න බැහැ. එතකොට මේ දේවතාවට මොකක්ද වෙන්න ඇත්තේ. ඒකත් ඉවර කරන්නේ බුදුරජාණන් වහන්සේ 'සවෙ විජානාසි වදෙහි යක්ඛ' යක්ෂය තේරෙනවා නම් කියන්න. යක්ෂයාට කර කියාගන්න දෙයක් නැහැ.

පස්සේ එයාට තේරෙන මට්ටමින් කියනවා. මට මේ භාග්‍යවතුන් වහන්සේ කියන එක තේරෙන්නේ මෙහෙමයි. මේ විධියටයි මට තේරෙන්නේ. මේ සාමාන්‍ය අදහස දේවතාවා කියන්නේ. මට ඔබවහන්සේ කියන එක තේරෙන්නේ මෙහෙමයි. කාමයන් ආදිය අතහැරලා යම් කෙනෙක් සතිසම්පජඤ්ඤයෙන් යුක්තව සිටිනවා නම්, අන්න ඒ තැනැත්තා අර අනර්ථකාරී දුක්වලට පත් වෙන්නේ නැහැ කියලා කෙටි අදහස යක්ෂයා ප්‍රකාශ කළා. ඒ යක්ෂයා පිළිබඳ කථාව එහෙමයි.

ඉතින් කෙනෙකුට සැක හිතෙන්න පුළුවන් ඇයි මේ බුදුරජාණන් වහන්සේ අර යක්ෂයාට මේ ගැඹුරු ගාථා කිව්වේ කියලා. සමහර විට අර ශාසනය ලිහිල් කරලා අරගෙන සමිද්ධි ස්වාමීන් වහන්සේට ගිහි වෙන්න එහෙම නැත්නම් පංචකාම සම්පත්තියට පොළඹවන්න අර විධියට කිව්ව නිසා යක්ෂයාට මේ ශාසනයේ වටිනාකම පෙන්වන්න වෙන්න පුළුවන්. කොහොම නමුත් හිතන්න තියෙන්නේ බුදුරජාණන් වහන්සේ මේ ගැඹුරු ධර්මය ඇතැම් අවස්ථාවල ප්‍රකාශ කරලා තියෙන්නේ 'මොන යකෙකුට හරි වැටහේවා' කියන අදහසිනුයි. ඉතින් කොටින්ම කියතොත් අපි වුනත් මේ දේශනා පවත්වන්නේ ඒ අදහසිනුයි.

කොයි එක හරි වේවා අපි දැන් මේ ගාථාවල අර්ථය ටිකක් විග්‍රහ කරන්න බලමු. අර 'අක්ඛෙය්‍ය සඤ්ඤිනො' ගාථාව තවත් සවිස්තරව කිව්වොත් 'අක්ඛෙය්‍ය සඤ්ඤිනො සත්තා – අක්ඛෙය්‍යස්මිං පතිට්ඨිතා' කියන්නේ අර අපි කලින් කිව්වා වගේ භාෂා ව්‍යවහාරය. මේක ලෝකයා මේ භාෂා ව්‍යවහාරය ලොකුවට අරගෙන, මේ සංඥාව, ඔවුන්ගේ සංඥාව තියෙන්නේ මේ ව්‍යවහාරය උඩයි. 'අක්ඛෙය්‍ය සඤ්ඤිනො' ඒක නිසාම ඒවායේ පිහිටලා තිබෙනවා. 'අක්ඛෙය්‍යස්මිං පතිට්ඨිතා' ඒවායේ යථා ස්වභාවය දන්නේ නැහැ. මේ වචනවල. දැන් මොකද මේ භාෂාව කියන එක හැදිලා තියෙන්නේ මේ පින්වතුන් දන්නවා භාෂාවක් කර්තෘ, කර්ම, ආඛ්‍යාත ආදී

වශයෙන් ඔය ව්‍යාකරණයේ බෙදීම් තියෙනවා. නාමපද තියෙනවා. ක්‍රියාපද තියෙනවා. නාම විශේෂණ තියෙනවා. ක්‍රියා විශේෂණ තියෙනවා. නිපාත පද තියෙනවා. ඔය ඔක්කොම එකතු වෙලා තමයි භාෂාවක් හැදෙන්නේ. මේකෙදී කරන්නෙක්, කියන්නෙක් ඕකට කියනවා සාමාන්‍යයෙන් ග්‍රාහ්‍ය ග්‍රාහක භේදයක්, අල්ලගන්න දෙයක්, අල්ලගන්න කෙනෙක්. ඔය භේදය උඩයි භාෂාව හිර වෙලා තියෙන්නේ. නමුත් මේකයි ලෝකයා ලොකුවට ගන්නේ. 'අක්‍ඛෙය්‍යං අපරිඤ්ඤාය' ඒක හරියට තේරුම් නොගැනීම නිසා මාරයාට යට වෙනවා.

දැන් මේක ටිකකට හිතාගන්න මීට කලින් අවස්ථාවක- අවස්ථා කීපයක -අපි ඔය නාමරූපය ගැන කියනකොට 'ඒදණ්ඩ උඩ බල්ලා' දැන් ටිකක් පරණ වෙලා. ඊට වැඩිය හොඳ උපමාවක් මේ පින්වතුන්ට හිතට කාවදින 'නාසිසස් කතාව' කිව්වා. ඒ නාසිසස් කියන ග්‍රීක තරුණයා, රූමත් ග්‍රීක තරුණයා, තමන්ගේ මූණ කවදාවත් දැකලා නැහැ. දවසක් කැලේ ඇවිදිනකොට පොකුණකට නැඹුරු වෙලා තමන්ගේ රූමත් මුහුණ දැකලා රැවටිලා දෙවඟනක් කියලා වැළඳගන්න දින ගණනක් උත්සාහ කරලා අන්තිමට එතැන ජීවිත පූජා කළා. පූජා කළේ ආත්ම ස්නේහය නිසා. ඒක නිසා නාසිසස් කියන වචනය ශබ්ද කෝෂයේ දැන් දකින්න ලැබෙනවා. ඒ නාසිසස් කියන ඒ නම ආත්ම ස්නේහයට කියන වචනයක්. ඉතින් ඒ අතට හිතුවොත් අපට හිතන්න තියෙන්නේ අන්න නාමරූපය කියලා ගත්තොත් 'අක්‍ඛෙය්‍ය' කියන එකට 'අක්‍ඛෙය්‍ය සඤ්ඤිනො සත්තා' සාමාන්‍ය ලෝකයා අර නාමරූපය පිළිබඳ සංඥාව ඇත්තාහුය. නාම රූපයෙහිම පිහිටියාහුය. නාමරූපයේ යථා ස්වභාවය නොදැනීම නිසා නැවත නැවතත් මාරයාගේ විය ගහට යට වෙනවා. එතකොට නාසිසස් විතරක් නොවේ. අපි කවුරුත් සංසාරයේ මේ ජීවිතයක් අවසානයේදී ගන්න ආත්ම ස්නේහය මොකක්ද කියලා හිතලා බලන්න. මහ ධනවත් කෙනෙක්, දරු මල්ලන් ඇති වස්තුව ඇති කෙනෙක්, අවසාන හිත කොහොමද යන්නේ. මේ මං කියලා ගත්තේ ඒකට නේ. අනේ මට මේ ගෙවල් දොරවල් ධනය අතහැරලා, මගේ මේ භාර්යාව දරුවන් අතහැරලා යන්න වෙනවා කියලා ඒ අල්ලාගන්නෙත් අර කියාපු නාමරූපය නේ? අර හෙවනැල්ල නේ? එතකොට ඒක අල්ලගත්තු නිසා ඉතින් තව ආත්ම භාවයක් බලාපොරොත්තු වෙනවා. මේ ටික සම්පූර්ණ කරගන්න තව ටිකක් කල් දෙන්න කියලා. ඉතින් ඒ වෙනුවට මාරයා 'ඉඳා' කියලා දෙනවා. දෙන්නේ ඕන කරන දේ නොවේ.

කර්මානුරූපව ඊළඟට කොහේ හරි එක්කෝ ගැරඩියෙක් වෙලා හරි ගෙම්බෙක් වෙලා හරි ගෙදරට එනවා. එක්කෝ බල්ලෙක් වෙලා හරි ඉස්සරහ පුටුවට එනවා. ඔන්න එතකොට නාමරූපයේ **පිහිටීම**. ඔය ටික තමයි. අපි මේ පින්වතුන්ට තේරුම් කරන්න ඕන නිසයි ඔය ටික කියන්නේ. ගැඹුරු ධර්මයක්. නමුත් ඉතින් 'අකෙඛයාසම්ං පතිට්ඨිතා' කියන්නේ හිතාගන්න නම් කර කිය යුතු දේ තමයි නාමරූපය. ලෝකයා විඤ්ඤාණයත් නාමරූපයත් අතර හරඹයකයි සිටින්නේ. නාමරූපය සෙවණැල්ලක් බව ලෝකයා දන්නේ නැහැ. ඒකයි බුදුහාමුදුරුවෝ මතු කරලා දෙන්නේ. එතකොට ඒකෙ පිහිටියොත් වෙන්නේ අර ටිකයි. 'අකෙඛයාං අපරිඤ්ඤාය-යොගමායනති මච්චුනො'

ඉතින් අපි මේ ටික මතු කළේ මොකද? තවත් හේතුවක් තියෙනවා, මේ අද මාතෘකාවට ඕක ගන්න. මීට කලින් අවස්ථාවල මේ පින්වතුන්ට මතක ඇති අපේ අටුවා සම්ප්‍රදාය තුළ වැඩිය වැදගත් කමක් නුදුන්න මහා නිදාන සූත්‍රය නමැති මහා ශ්‍රේෂ්ඨ ධර්ම දේශනාව ගැන අපි සවිස්තරව යම් යම් දේවල් කිව්වා. විශේෂයෙන්ම නාමරූපය ගැන. නාමයත් රූපයත් එකිනෙකට සම්බන්ධ වන හැටිත් නාමරූපයත් විඤ්ඤාණයත් අඤ්ඤමඤ්ඤ වශයෙන් සම්බන්ධ වෙලා තියෙන හැටිත් බුදුරජාණන් වහන්සේ ඒ මහා නිදාන සූත්‍රයේ ආනන්ද ස්වාමීන් වහන්සේට ඒත්තු ගන්වලා අවසානයේදී ඒ සූත්‍රය හකුළුවා දක්වන වටිනා පාඨයක් අපි එදා කිව්ව නමුත් විවරණය කරන්න බැරි වුණා. අද අපි ඒක ඉලක්ක කරගෙනයි මේ ගාථා දෙක ඉස්සරහට ගත්තේ.

මොකක්ද ඒ පාඨය. **'එත්තාවතා ඛො ආනන්ද ජායෙථ වා ජියෙථ වා මීයෙථ වා චවෙථ වා උපපජ්ජෙථ වා. එත්තාවතා අධිවචනපථො එත්තාවතා නිරුත්තිපථො එත්තාවතා පඤ්ඤත්තිපථො එත්තාවතා පඤ්ඤාවචරං එත්තාවතා වට්ටං වත්තති ඉත්ථත්තං පඤ්ඤාපනාය යදිදං නාමරූපං සහ විඤ්ඤාණෙන'**[7]

ඔන්න දැන් අපි ඒක තෝරමු. ආනන්දය මෙතෙකින්මය ආනන්ද කෙනෙක් උපදනේ හෝ දිරනේ හෝ මිය යන්නේ හෝ චුත වන්නේ හෝ නැවත උපදනේ - මෙතෙකින්මය අධිවචන - ඔන්න භාෂාව පිළිබඳ කථාන්තරය - මෙතෙකින්මය අධිවචන මාර්ගයක්, නිරුක්ති මාර්ගයක්, ප්‍රඥප්ති මාර්ගයක් දැක්විය හැක්කේ. භාෂා ව්‍යවහාරයට ඉඩ ඇත්තේ මෙතෙකින්මය. කෙතෙකින් ද කියන එක අගටයි කියවෙන්නේ. ඒ වගේම මෙතෙකින්මය ප්‍රඥාවට බැසගත හැකි තැනක් ඇත්තේ. ඒ කියන්නේ

**විඤ්ඤාණයත් නාමරූපයත් අතරින් තමයි ප්‍රඥාව ක්‍රියාත්මක වන්නේ.** ඒකයි, ප්‍රඥාවට බැසගත හැක්කේ එතනයි. අන්තිමට කියනවා 'එත්තාවතා පඤ්ඤාවචරං එත්තාවතා වට්ටං වට්ටති ඉත්ථත්තං පඤ්ඤාපනාය' ඔන්න වැදගත්ම පාඨය. මෙතෙකින්මය 'ඉත්ථත්ත' කියන වචනය අපි කලින් තේරුම් කරලා දුන්නා මේ පින්වතුන්ට. 'ඉත්ථං' කියන්නේ මෙසේ 'ඉත්ථත්ත' කියන්නේ මෙසේ බව. මෙසේ බව කියන වචනය යෙදෙන්නේ මේ භවය කියන එකටයි. මේ භව තත්ත්වය. එතකොට භව තත්ත්වයත් පෙන්නුම් කිරීමට වට්ටයක් කරකැවෙනවා. හිතාගන්න අර දිය සුළිය උපමාව දුන්න නේ. දිය සුළිය කරකැවෙන තැන තමයි. ඒක පෙන්නුම් කළා - මුහුදේ දිය සුළියක් කරකැවෙනකොට විතරයි අපිට ඇඟිල්ල දික් කරලා පෙන්නුම් කරන්න පුළුවන්. 'අතන' 'මෙතන' කියලා. අන්න එතකොට ඒ යම් වට්ටයක් තුළයි. ඒක තේරුම් කරන්න මේ පින්වතුන්ට කිව්වා, දැන් ඔය ලෝක වෙළඳපොළේ මිල ගණන් වෙනස් වෙන්නේ මොකද, වෙළඳ වට්ටය නිසා. ඉල්ලුමත් සැපයුමත්. ඒ දෙක අතර වට්ටයක් තියෙනවා. කරකැවිල්ලක්. ඉතින් ඒ වගේ හැම ව්‍යවහාරයක්ම - මිල දර්ශනයක් විතරක් නොවේ- හැම දෙයක්ම තියෙන්නේ ඔන්න ඔය වට්ටයක් තුළයි. ඒක ගැඹුරින් ගත්තොත් අන්න විඤ්ඤාණයත් නාමරූපයත් අතරයි.

එතකොට විඤ්ඤාණයත් නාමරූපයත් අතර මෙන්න මේ වට්ටය නිසා තමයි 'ඉත්ථත්ත' කියන මේ භව තත්ත්වයක් පෙන්නුම් කළ හැක්කේ. ඉතින් අර දිය සුළි උපමාවෙන් අපි කිව්වේ ඒකයි. දිය සුළියක් කියලා කියන්නේ සංසාර දිය සුළිය තමයි මේ සත්ත්වයා කියලා කියන්නේ. විඤ්ඤාණයත් නාමරූපයත් අතර පුදුම කරකැවිල්ලක් තියෙන්නේ. අර නාසිසස් හෙවණැල්ලත් එක්ක කරපු හරඹය වගේ. ඉතින් ඔන්න ඔය ටික කියන්න තමයි මේ ගාථාව එළියට ගත්තේ.

ඉතින් මෙයිනුත් අපි ඉදිරියට ගනිමු. පළමුවෙන්ම අර අන්තිමට කියාපු නාමරූපයත් විඤ්ඤාණයත් අතර තියෙන මේ වට්ටය නම් වූ කරකැවිල්ල තුළයි 'ඉත්ථත්ත' කියලා කියන මේ භව තත්ත්වයක් පෙන්නුම් කළ හැක්කේ. මෙතන ඉතාමත්ම ගැඹුරු කාරණයක් තියෙන්නේ. දැන් බලන්න අර මුහුදේ එතන අපට පුළුවන් නේ -මුහුදේ හරි ගඟක හරි- දිය සුළියක් තියෙනකොට ඒක කරකැවෙන තැනක රොඩු ආදිය ඒකට ඇදිලා යනකොට අපට පුළුවන් අතන කියන්න. මෙතන කියන්න පුළුවන්. ඉතින් අතන මෙතන කියනව වගේ තමා පින්වතුනි දැනටත් ඔය 'තැනැත්තා' කියලා කියන්නේ මොකක්ද කියලා හිතලා බලන්න. තැනැත්තා කියන්නේ

'තැන ඇත්තා'. ඒ තැනැත්තා මේ තැනැත්තා. ඊළඟට සංඝයා වහන්සේලාට නම් අර තැන, මේ තැන කියලා කියනවා. ඔය දානෙ ගෙවල්වල එහෙම අහන්න ලැබෙන්නේ. 'අර තැනට බෙදන්න' කියලා. ඉතින් ඒ වගේ අරතැන මේ තැන කථාව තුළ තමයි ව්‍යාකරණයේ ආරම්භය තියෙන්නේ. ඉතින් අපි සමහර විට කියනවා අස්මිමානය කියලා. අස්මිමානය කියන මූලික මම පිළිබඳ සංඥාව - තමා පිළිබඳ සංඥාව - බුදුරජාණන් වහන්සේ කියනවා භවය පිළිබඳ අන්තිම කොන - ඉතිරි වෙන ටික තමා මේ 'වෙමි' කියන මානය. 'වෙමි' - කොහොම හරි ඒ පුද්ගල සංඥාව ඇති වුණාට පස්සේ තමයි ඔන්න ව්‍යාකරණයට පණ එන්නේ. කොහොමද 'මම මෙතන' 'ඔබ ඔතන' 'ඔහු එතන' එහෙම නේද? තියෙනවානෙ ඔය උත්තම පුරුෂ, උත්තම පුරුෂයා මම නේ. මධ්‍යම පුරුෂයා ඔබ. එතන ඉන්න ඔහු තමයි ප්‍රථම පුරුෂයා. ඔය කියන්නේ ව්‍යාකරණයේ සැකිල්ල. **ව්‍යාකරණයේ සැකිල්ල.** ඉතින් ව්‍යාකරණයේ සැකිල්ල සකස් වුණොත් ඔන්න ඕක තුළයි. ඕකයි බුදුරජාණන් වහන්සේ කියන්නේ ව්‍යාකරණයට යට වීම නිසයි, භාෂාවට යට වීම නිසයි මනුෂ්‍යයින්ට නිවන තෝරගන්නත් බැරි. මේ සංසාරයෙන් මිදෙන්නත් බැරි, ගැඹුරින් කල්පනාකර ගත්තොත්. නමුත් ව්‍යාකරණය තණ්හාවෙත් අවිද්‍යාවෙත් නිර්මාණ අනිත් පැත්තට. අමුතු දෙයක් නොවේ. අවිද්‍යාවත් තණ්හාවත් නිසා ලෝක සත්ත්වයා මේ ව්‍යවහාරයට ගැති වුණා. ව්‍යවහාරයට ගැති වුණා. ව්‍යවහාරයේ අර්ථය තේරුම්ගන්නේ නැහැ. මේක මොකක් සඳහාද කියලා. නමුත් බුදුරජාණන් වහන්සේ පෙන්නුවා මේක ව්‍යවහාර මාත්‍රයක් පමණයි.

මොකද, ඊළඟට මේ එක්කම තියෙන තවත් කාරණයක් කියමු. මේ පින්වතුන්ට වුණත් ඇති වෙන්න පුළුවන් සැකයක් එක්තරා අවස්ථාවක දේවාතාවෙක් බුදුරජාණන් වහන්සේට ඉදිරිපත් කළේ. ගාථාවකින් ඉදිරිපත් කළේ. දිගට ගාථාව නැතත් මෙහෙම කියමු. 'කොහොමද මේ රහතන් වහන්සේලා හැම එකක්ම, වැඩ කටයුතු අවසන් කළ රහතන් වහන්සේලා. 'අහං වදාමි' කියලා කියන්නේ 'මම කියමි' 'මමං වදන්ති' අනික් අය මට කියනවා කියලා කියන්නේ මොකද කියලා බුදුරජාණන් වහන්සේගෙන් ඇහුවා. මානයක් නිසාද එහෙම කියන්නේ. එතකොට බුදුරජාණන් වහන්සේ කිව්වා මානයක් නිසා නොවේ කියලා. ඒ ගාථාවේ අවසාන පද දෙක අපි කියමු.

**ලොකෙ සමඤ්ඤං කුසලො විදිත්වා**

## වොහාරමත්තෙන සො වොහරය්‍ය[8]

ලෝක ව්‍යවහාරය පිළිබඳව හරි අවබෝධයක් ඇති කරගෙන, ඒ දක්ෂකම ඇති කරගත් රහතන් වහන්සේලා, 'වොහාරමත්තෙන' හුදෙක් ව්‍යවහාර මාත්‍රයක් වශයෙන් පමණයි අර කියාපු 'මම' 'ඔහු' කියන භාෂා ව්‍යවහාරය පාවිච්චි කරන්නේ. බුදුරජාණන් වහන්සේ පවා මම කියලා යොදන්නේ - රහතන් වහන්සේලා පමණක් නොවේ. **අන්න එතකොට තේරුම්ගන්න මෙතන භාෂාව ව්‍යවහාර කිරීම නොවේ වරද. ව්‍යවහාරය ව්‍යවහාරයක් බව තේරුම් නොගැනීමයි.** ඒ ටික ලෝකයාට නැති නිසා තර්කකාරයන් දාර්ශනිකයන් විද්‍යාඥයින් ඔක්කොම මේ වචනය තුළ හිර වෙලා තමයි මෙච්චර මේ මහා අවුලක් ඇති කරගෙන අනික් අයගෙත් සංසාර දික් කර තමන්ගෙත් සංසාරය දික් කර ගන්නේ. ඔන්න ඕකයි කෙටියෙන් කියනවා නම්.

ඉතින් ඒකෙ රහස හෙළි වන තවත් මහා පුදුම කෙටි ධර්ම පාඨයක්- බුද්ධ වචනයක් -සඳහන් වෙනවා. ඒකත් අපි මතක් කරමු. දැන් අපි කිව්වා සඤ්ඤාව - අර 'අක්ඛෙය්‍ය සඤ්ඤිනො' කියන එකෙන් තේරෙනවා සඤ්ඤාවත් ව්‍යවහාරයත් සම්බන්ධ බව. ලෝකයා තුළ සඤ්ඤාව ගැනීමේ සිරිතක් තියෙනවා. සඤ්ඤාවත් ව්‍යවහාරයත් සම්බන්ධයි. ඒක මහ පුදුම විධියට දක්වනවා බුදුරජාණන් වහන්සේ එක්තරා පාඨයකින්. **'වොහාරවෙපක්කාහං භික්ඛවෙ සඤ්ඤං වදාමි යථා යථා නං සඤ්ජානාති තථා තථා වොහරති එවං සඤ්ඤී අහොසින්ති'**[9] අන්න අර සඤ්ඤාවත් ව්‍යවහාරයත් අතර පුදුම සම්බන්ධතාව බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ කොහොමද? 'වොහාරවෙපක්කාහං භික්ඛවෙ සඤ්ඤං වදාමි' 'මහණෙනි, මම කියනවා සඤ්ඤාවේ විපාකය ව්‍යවහාරයයි. විපාකය කියන වචනය කියනකොට මේ පින්වතුන්ට කර්ම විපාකය හිතෙන්නේ. එහෙම එකක් නොවේ මේ කියන්නේ. සඤ්ඤාව මෝරා යාමෙන් තමයි ව්‍යවහාරයක් හැටියට වචන ආදිය එළියට එන්නේ. 'වොහාරවෙපක්කාහං භික්ඛවෙ සඤ්ඤං වදාමි' ඒක තවත් පැහැදිලි කරනවා 'යථා යථා නං සඤ්ජානාති තථා තථා වොහරති'. යම් යම් ආකාරයකින් කෙනෙක් සඤ්ඤාවත් ඇති කරගන්නවාද ඒ තැනැත්තා. සඤ්ඤාව කියන්නේ හැඳිනීම බව දන්නවා නේ- මේ පින්වතුන් -හැඳිනීම විතරක් ඇති කරගෙන නවතින්නේ නැහැ නේ. ඒ හැඳිනීම අනිත් අයට කියන්නත් එපායැ. ඔන්න එතකොට **හැඳින්වීමක්** කරන්න වෙනවා. එතකොට තමයි ව්‍යවහාරය, භාෂාව, ඕනෑ වෙන්නේ. ඉතින් 'තථා තථා වොහරති එවං සඤ්ඤී අහොසින්ති' එයා ගිහිල්ලා

කියන්නේ කොහොමෙයි අනිත් එක්කෙනාට - 'මම මෙවැනි සඤ්ඤාවක් ඇතිව සිටියෙමි.' එතනම අහු වෙලා ඉවරයි. මෙවැනි සඤ්ඤාවක් ඇතිව සිටියෙමි කියලා අනිත් එක්කෙනාට කියනවා. අන්න බලන්න කොයි තරම් ගැඹුරුද මෙතන. 'වොහාරවෙපක්කාහං භික්ඛවෙ සඤ්ඤං වදාමි' ඒ කියන්නේ සඤ්ඤාවේ විපාකය -සඤ්ඤාව තුළින්. ඒ නිසා තමයි ගැඹුරින් අපේ පොතපත කියවපු පින්වතුන් දන්නවා ඇති 'පපඤ්චසඤ්ඤාසංඛා'[10] කියලා කියන්නේ පපඤ්ච සඤ්ඤාවෙන් මේ ලෝකයේ භාෂාව තුළ හිර වෙලා පපඤ්චසඤ්ඤාව නිසා ඇති වන සංඛා, සංඛා කියන්නේ ගිණීම්. ගිණීම් කියන්නේ ඉලක්කම් පමණක් නොවේ වචනය. වචනයෙන් කෙරෙන ව්‍යවහාර.

එතකොට ඔන්න ඔය විධියේ දෙයක් මහ ගැඹුරු පැත්තක් ඕකෙ තියෙනවා. 'යථා යථා නං සඤ්ජනාති' - මේ සඤ්ඤාවත් ව්‍යවහාරයත් අතර සම්බන්ධතාව තේරුම්ගැනීම ඉතාම වැදගත් කාරණයක්. මොකද මේක තුළින් තමයි අපට දැන් ඔය බොහෝදෙනාට තෝරාගන්න බැරි භවය පිළිබඳ තත්ත්වයක්. දැන් අර කිව්ව රහතන් වහන්සේලාට භවය නැත කිව්වේ මොකද ඒ, ඒ ලෝකයේ තියෙන- දැන් අර කලින් කිව්වා නේ සඤ්ඤාව නිසාය ව්‍යවහාරයට නැඹුරු වන්නේ කියලා. එතකොට මේකෙන් අත්මිදෙන්නේ කොහොමද කියන ප්‍රශ්නය කෙනෙකුට ඇති වෙනවා.

මහා ආශ්චර්යවත් දෙයක් තමයි ඇතැම් සූත්‍රවල තියෙනවා බොහෝ දෙනාගේ සැලකිල්ල යොමු නොවුණු මැතක් වන තුරු -රහතන් වහන්සේලාගේ අර්හත් ඵල සමාධි අවස්ථාවේදී උන්වහන්සේලා සම්පූර්ණයෙන්ම සඤ්ඤාවෙන් විමුක්ත වෙනවා. ලෝකයේ යම් දෙයක් තියෙනවා නම්, සඤ්ඤාවක් හැටියට ගන්න අරමුණක් තියෙනවා නම්, ඒ ඔක්කොම අරමුණුවලින් හිත මුදා ගන්නවා. ඒ තත්ත්වය පැහැදිලි වන එක්තරා සූත්‍රයක් අපි කියතොත්, හුඟක් සූත්‍ර තියනවා. 'සන්ධ' කියන ස්වාමීන් වහන්සේට එක අවස්ථාවක බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා ඒ රහතන් වහන්සේ එහෙම නැත්නම්, එතෙන්ට යොදලා තියෙන්නේ ආජානීය පුරුෂයා කියලා. ආජානීය පුරුෂයාගේ අමුතුම විධියේ ධ්‍යානයක්. අමුතුම විධියේ ධ්‍යානයක්. කෙබඳු එකක්ද කියලා තෝරන්නේ මෙහෙමයි. ඒ ආජානීය පුරුෂයාට පඨවිය පිළිබඳත් සඤ්ඤාව නැහැ. පඨවි සඤ්ඤාව විභූතයි. ආපො පිළිබඳ ආපො සඤ්ඤාවත් නැහැ. තේජෝ පිළිබඳ තේජෝ සඤ්ඤාවත් නැහැ. වායො පිළිබඳ වායෝ සඤ්ඤාවත් නැහැ.[11] මේක කිව්වාම ඒ පහුගිය දේශනා අහපු පින්වතුන්ට මතක් කරන්නම් අපි දීපු උපමාවක්. බොහෝදෙනාට ගැටළුවක් නිසා. දැන් බාහිර ද්‍රව්‍ය නැතෙයි කියනවද මේ ධර්මයේ. මේක

හිත විතරයි කියනවද? නෑ. ඒ ටික අපි තෝරන්න ගත්තෙ අන්ධයකුගෙ උපමාවක්. අපි හිතාගනිමු, අන්ධයෙක් හිම කුට්ටියක් ළඟට යනවා. හිම කුට්ටියක් ළඟට ගිහිල්ලා හිම කුට්ටියේ හැපෙනකොට එයාට පේන්නේ නෑ නේ. ආපහු එන්නේ පඨවි සංඥාව අරගෙන. ඊළඟ සැරේ යනකොට හිම කුට්ටිය උණු වෙගෙන යනවා. කිට්ටුවට යනකොට රස්නයි නේ. එන්නේ තේජෝ සංඥාව අරගෙන. තුන්වෙනුව යනකොට මේක වතුර වෙලා ගිහිල්ලා. එන්නේ ආපෝ සංඥාව අරගෙන. හතරවැනි සැරේ යනකොට මේක වාෂ්ප වෙනවා. එන්නේ වායෝ සංඥාව අරගෙන. ඔන්න දැන් කිට්ටු කරගන්න පුළුවන්. **එතකොට සාමාන්‍ය ලෝකයා අන්ධයි. අන්ධයි.** අර මහා භූත ධර්ම තනි තනිව හඳුනාගන්න බැරි දේවල්. මේවා සම්මිශ්‍රණය වෙලා තියෙන්නේ. නමුත් අවස්ථානුකූලව අර පොඩි දරුවා පින්තූරයක 'අ'යනු 'ඹ' යනු 'අඹ' කියලා ගන්නවා වගේ අර පඨවි සංඥාව තුළින් ඒවායේ අර නාම ධර්ම තුළින්, වේදනා සඤ්ඤා ආදියෙන්, **ඒවායේ තද ගතිය නිසා ඒකට ගිහිල්ලා හැපුණ නිසා, ඒක පඨවි කියලා හිතා ගත්තා.** දෙවෙනි සැරේ යනකොට අර කියාපු විධියට. නාමධර්ම තුළිනුයි මේවා හඳුනාගන්නේ. වේදනා, සංඥා, චේතනා, ඵස්ස, මනසිකාර. ඔය දෙක මහා පුදුම විධියට බැඳිලා තියෙනවා. එතනම තමයි අර පසුගිය සැරේත් කිව්වේ 'අන්තෝ ජටාව'. එතකොට ඒ 'අන්තෝ ජටාව' ඒ පැත්ත නේ. ඊළඟට 'බහි ජටාව' තමයි ඒ නාම රූපයයි විඤ්ඤාණයයි අතර කෙරෙන අර පෙරළිය. නාසිසස් කරපු පෙරළිය වගේ. එතැනයි මුළු මහත් සංසාර ගැටළුව තියෙන්නේ. ඒකට මේ සංකල්පය -වචනය- අත දෙන්නෙ කොහොමද? අන්න අර කියාපු විධියට මේ ලෝකයා හිතන්නේ පඨවි කියලා 'දෙයක්' තියෙනවා. ආපෝ තියෙනවා. කවුද නැතෙයි කියන්නේ. තේජෝ තියෙනවා. එපමණක් නොවේ. එතන මහ පුදුම සම්පූර්ණ ලේඛනයක් තියෙනවා. ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය ආදී අරූප තත්ත්ව පවා ඊළඟට තියෙනවා දිට්ඨ, සුත, මුත, විඤ්ඤාත. ඒ කිසිවක් පිළිබඳ සංඥාව නැහැ. ඒ අවස්ථාවේ, ඒ අර්හත් ඵල සමාධි අවස්ථාවේ, මුළු මහත් භවය නිරුද්ධයි කියන්නේ සම්පූර්ණ භවයට අයත් යම් සංඥාවක් තියෙනවද, භවයට අයත් යම් අරමුණක් තියෙනවද, ඒ හැම අරමුණකින්ම මිදුණ හිතක් තමා ඒ ආජානීය පුරුෂයාට තියෙන්නේ.

ඊළඟට ඒ බුදුරජාණන් වහන්සේ දේශනාව ඉවර කරන හැටි මහ පුදුමයි. අර දේවතාවා වුනත් කරකැවිලා යන විධියේ එකක් එතන තියෙන්නේ. අන්තිමට කියනවා අන්න එබඳු හැම සංඥාවකින්ම හිත විමුක්ත කරගෙන ධ්‍යාන වඩන්නා වූ - එතන ධ්‍යාන කියන වචනය

බුදුරජාණන් වහන්සේ කියනවා. පඨවි අරමුණු කරගෙන ධ්‍යාන වඩන්නේ නැහැ. ආපො අරමුණු කරගෙනත් නැහැ. ඒ කිසිවක් අරමුණු නැහැ. නමුත් ධ්‍යානයකුත් වඩනවා. ධ්‍යානයකුත් වඩනවා. ධ්‍යානයේ අරමුණ මොකක්ද කියලා මනුෂ්‍යයින්ට පමණක් නොවේ දෙවියන්ටවත් හඳුනාගන්න බැහැ කියලා බුදුරජාණන් වහන්සේ කියනවා. ඒක නිසා ඒ සූත්‍රය ඉවර වෙන්නේ මෙහෙමයි. ඒ විධියට ධ්‍යාන වඩන්නාවූ ඒ ආජානීය පුරුෂයා වෙත 'සඉන්‍දා දෙවා සබ්‍රහ්මකා සපජාපතිකා ආරකාව නමස්සන්ති' ඒ ශක්‍රයා, බ්‍රහ්මයා, ප්‍රජාපතී ආදී ඔක්කොම ඈත ඉඳගෙනම රහතන් වහන්සේට නමස්කාර කරනවා මෙන්න මේ ගාථාව කියලා.

**නමො තෙ පුරිසාජඤ්ඤ**
**නමො තෙ පුරිසුත්තම**
**යස්ස තෙ නාභිජානාම**
**යම්පි නිස්සාය ඣායසී**[12]

ඔන්න ලෝකෝත්තර ධර්මයේ ශ්‍රේෂ්ඨත්වය. හිතලා බලන්න එතකොට දෙවියෝ කියන ගාථාවයි මේ කියන්නේ. 'නමො තෙ පුරිසාජඤ්ඤ' ආජානීය පුරුෂයාණන් වහන්ස ඔබටනමස්කාර වේවා! 'නමො තෙ පුරිසුත්තම' පුරුෂෝත්තමයාණන් වහන්සේට නමස්කාරය වේවා! 'යස්ස තෙ නාභිජානාම - යම්පි නිස්සාය ඣායසී'. ඔබ වහන්සේ ධ්‍යාන වඩන අරමුණ අපට පෙනෙන්නේ නැහැ. අන්න එබඳු ඒ ලෝකෝත්තර ධර්මයක් බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කරලා තියෙන්නේ අර්හත් ඵල සමාධිය තුළින්. භව නිරෝධ තත්ත්වයයි. වෙන එකක් නොවේ. කෙටියෙන් කියතොත් භවනිරොධ කියලා කියන්න පුළුවන්. අනිත් පැත්තට සළායතන නිරෝධ තත්ත්වය. අපි බොහෝ විට පෙන්නුවා. ආයතන හයම ක්‍රියා විරහිතයි. ආයතන හය තුළ නේ ලෝකයා ඔක්කොම පටලැවිලි හදාගෙන තියෙන්නේ. අර ධ්‍යාන අවස්ථාවේ - ඒක කලින් ලබාගත්තු ප්‍රත්‍යක්ෂයට සමවැදිලා ඉන්න අවස්ථාව - භවය නිරුද්ධයි. ඒකයි අපි කිව්වේ රහතන් වහන්සේලා නැවත උපදින්නේ නැත්තේ ඒ අවසාන හිත- භව නිරෝධ තත්ත්වය. ඉතින් '**භව නිරොධො නිබ්බානං**' කියන එක මතක් කරන්න තමයි අපි හැම තිස්සෙම මේව කියන්නේ. ඒ ප්‍රත්‍යක්ෂය, භව නිරෝධය පිළිබඳ ප්‍රත්‍යක්ෂය, භුක්ති විඳින අවස්ථාව, නිවන් රස භුක්ති විඳින අවස්ථාව තමයි අර්හත් ඵල සමාපත්තිය. ඒක පිළිබඳවයි ඒ බුදුරජාණන් වහන්සේ දක්වලා තියෙන්නේ.

අන්න ඒ විධියේ මහා පුදුම ධර්මයක් මෙතන තියෙන්නේ. ඒකට අර

භාෂාව යටින් තිබෙන බව හෙළි වෙනවා. සඤ්ඤාවෙන් සම්පූර්ණයෙන් හිත මුදාගත් අවස්ථාවේ නිදහස්. කිසිම අරමුණක් නැහැ. ඒ හිත හඳුන්වන තව වචන මේ පින්වතුන්ට කලින් කියලා තියෙනවා. **අප්පතිට්ඨං, අප්පවත්තං, අනාරම්මණං**[13] ඒ හිත කොහෙවත් පිහිටලා නෑ. කිසිම පැවැත්මක් නැහැ. කිසිම අරමුණක් ගන්නේ නැහැ. භවයක් නැහැ. පැවැත්මක් නැහැ. නිරෝධයි. ඒ නිරෝධය ප්‍රත්‍යක්ෂ කරගත් අවස්ථාව තමයි විමුක්තිය. ඒකයි නිවන. අමුතු දෙයක් නොවේ. ඉතින් මේ නිවන පිළිබඳ උගතුන් අතර නා නා විධ ප්‍රශ්න තිබෙනවා. ඒ ගොල්ලො නොයෙකුත් විධියේ මතිමතාන්තර දක්වනවා. උච්ඡේදය කියලත් තියනවා.

අන්න ඒක නිසා අපි එතන ඉඳලා ගනිමු යම් කිසි දෙයක් විශේෂයෙන් කියමු. මේ පින්වතුන්ට කලින් අවස්ථාවක - පසුගිය දේශනාවේදී වෙන්න ඕනෑ - කිව්වා බුදුරජාණන් වහන්සේ මේ විඤ්ඤාණය ගැන කියපු ටික. එක පැත්තකින් අපි රහතන් වහන්සේගේ හිතත් විමුක්තියත් -නිවනින් පෙන්වන විමුක්තියත් -අර දිය සුළිය උපමාවෙන් ගත්තොත් ඒක ඉස්සර වෙලා කියලා හිටිමු. දිය සුළිය උපමාවෙන් ගත්තොත් මෙච්චර කාලයක් කරකැවෙමින් තිබුන දිය සුළිය නතර වුනා. දිය සුළිය නතර වුණා. ඇත්ත වශයෙන් මේ දිය සුළි කතාව අපි මතු කරගත්තු එකක් නොවෙයි. බුද්ධ වචනයක්. සූත්‍රවල හැඟවිලා වගේ තියෙන එකක්. මොන හේතුවකින් හරි අටුවාචාරීන් වහන්සේලාට අහු වෙලා නැති බවයි පෙනෙන්නේ. ඒකේ වැදගත්කම පෙනිලා නැහැ. උදාන පාළියේ තියෙනවා වටිනා ගාථාවක්. ඒකත් කියලා හිටිමු. බුදුරජාණන් වහන්සේ ලකුණ්ටකභද්දිය මහ රහතන් වහන්සේ අරමුණු කරලා වදාළා ප්‍රීති වාක්‍යයක් වශයෙන්.

**අච්ඡෙච්ඡි වට්ටං බ්‍යගා නිරාසං**
**විසුක්ඛා සරිතා න සන්දති**
**ඡින්නං වට්ටං න වට්ටති**
**එසෙවන්තො දුක්ඛස්ස**[14]

'අච්ඡෙච්ඡි වට්ටං' කියන්නේ අර වට්ටය කපා හැරියා. මොකක්ද වට්ටය? විඤ්ඤාණයත් නාමරූපයත් අතර තියෙන කරකැවිල්ල කපා හැරියා. 'අච්ඡෙච්ඡි වට්ටං බ්‍යගා නිරාසං' එනිසාම ආසා රහිත, තණ්හා රහිත, තත්ත්වයට පත් වුණා. ඔන්න ඊළඟට වචනයක් සඳහන් වෙනවා. අපේ මේ දිය සුළිය උපමාවට උපකාර වෙන 'විසුක්ඛා සරිතා න සන්දති' වියළී ගිය දිය වැල නොගලයි. **'විසුක්ඛා සරිතා න සන්දති', වියළී ගිය දිය**

**වැල නොගලයි.** 'ඡින්නං වට්ටං න වත්තති' ඒ සිඳින ලද වට්ටය නොකරකැවෙයි. 'එසෙවන්තො දුක්ඛස්ස' මෙයම දුකේ කෙළවරයි. ඒ රහතන් වහන්සේගේ හිත පිළිබඳව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා- ලකුණ්ටකභද්දිය රහතන් වහන්සේ පිළිබඳව. ඉතින් ඔය විධියේ ගාථාවලින් අපට පෙනෙනවා එක පැත්තකින් කියනවා නම් අන්න මහ මුහුදේ දිය සුළිය නතරවුණ අවස්ථාවක් ගැන හිතන්න. මේ නිවන ගැන හැමෝම ප්‍රශ්න කරන නිසා අපි කියන්නේ. දිය සුළියක් තියෙනකං අපට 'අතන' 'මෙතන' කියන්න පුළුවන්. 'අර තැන' කියන්න පුළුවන්. 'මේ තැන' කියන්න පුළුවන්. 'ඒ තැනැත්තා' මේ තැනැත්තා කියන්න පුළුවන්. දිය සුළිය නතර වුනාම කියන්න බැහැ නේ. **ඉස්සර තිබුනෙත් මුහුද දැන් තියෙන්නෙත් මුහුද.** වෙනස තියෙන්නේ අර දිය වැල- අර 'මෝඩ දියවැල'- උත්සාහ කරා අනිත්‍ය ලෝකයේ නිත්‍ය බවක් සොයා යන්න, අර කියාපු විදියට විපරීතව. යම් වෙලාවක දිය වැල සිඳී ගියා නම් වට්ටයත් එතනින්ම ඉවරයි. එතකොට වට්ට කථාවෙන් කිව්වෙත් ඒකයි. නමුත් අවාසනාවකට වගේ අටුවා සාහිත්‍යයේ තියෙන්නේ වෙන වට්ටයක්. ඔය පටිච්ච සමුප්පාදය තෝරන කොට කම්ම වට්ට, කිලෙස වට්ට, විපාක වට්ට කියලා ඔය විධියටයි තෝරන්නේ. ඒ වෙන වට්ට කථාවක් තියෙන්නේ. මෙන්න මේ වැදගත්ම වට්ට කථාව අතහැරිලා තියෙනවා. ඔන්න එතකොට මේ පින්වතුන්ට යමක් සලකාගන්න පුළුවන්, අර නිවන ගැන, රහත් සිත පිළිබඳව, අනාරම්මණ සිත පිළිබඳව.

ඊළඟට අපි තවත් පැත්තක් කියමු - මේ උච්ඡේදවාදී චෝදනාව එන නිසා. අපි කලින් අවස්ථාවක මහා තණ්හා සංඛය සූත්‍රය ගැන කියනකොට කිව්වා බුදුරජාණන් වහන්සේ ගින්නට උපමා කළ බව විඤ්ඤාණය.[15] ඒ කියන්නේ විඤ්ඤාණ හයක් තියෙනවා නේ. ඒ චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ ආදී වශයෙන්. දන්නවා නේ, මනෝ විඤ්ඤාණයත් ඇතුළත්ව. ඒ විඤ්ඤාණ හය එක එකක්ම බුදුරජාණන් වහන්සේ පෙන්වලා තියෙනවා හරියට එක් එක් ප්‍රත්‍යය ලබාගෙන ඇති වන ගින්නකට- ඒ කියන්නේ ගින්නකට සමාන කරලා. ඔන්න නැවත මතක් කරගත්තොත්, ඇසත් රූපයත් නිසා ඇති වන විඤ්ඤාණය චක්ඛු විඤ්ඤාණය. **'නිසා' ඇති වෙනවා මිසක් ඇසෙත් නෑ විඤ්ඤාණය. රූපයෙත් නෑ විඤ්ඤාණය.** ඇසත් රූපයත් **නිසා** චක්ඛු විඤ්ඤාණය. කනත් ශබ්දයත් **නිසා** සොත විඤ්ඤාණය ඒ ආදී වශයෙන් ඒකෙන් විඤ්ඤාණයට දීපු උපමාව මොකක්ද? හරියට ලී නිසා ඇති වන ගින්නට ලී ගින්න කියනවා. දර නිසා ඇති වන ගින්නට දර ගින්න කියනවා. දහයියා නිසා ඇතිවන ගින්නට දහයියා

ගින්න කියනවා. **නිකම් ගින්නක් කියලා දෙයක් නැහැ.** හැම තිස්සෙම **සුවිශේෂ** ගින්නක්. මේ විඤ්ඤාණ හයත් ඒ වගේ කියලා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා. නිකම් විඤ්ඤාණය කියලා දෙයක් නැහැ. ඒ නිසා දැන් හිතාගන්න තියෙන්නේ යම් දෙයක් හේතු ප්‍රත්‍යයන්ගෙන් ඇති වුණා නම් හේතු ප්‍රත්‍ය නැති වුණ අවස්ථාවේ ඒක නිවී ගියා. ඊට වැඩි දෙයක් නැහැ. **ඊට වැඩි දෙයක් නැහැ.** එතකොට චක්ඛු විඤ්ඤාණ, සොත විඤ්ඤාණ, ඝාණ විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ, මනො විඤ්ඤාණ කියන විඤ්ඤාණ හයම නිරුද්ධ වුණ අවස්ථාවේ ඒකට කියන්නේ **'විඤ්ඤාණූපසම'**. විඤ්ඤාණය සන්සිඳුන අවස්ථාවේ තමයි අන්න අර විමුක්තිය. ඒක උපමා කරලා තියෙන්නේ - මේ පින්වතුන් හොඳින් දන්නවා- **පහනක් නිවී ගියා සේ.**

ඒක නේ රතන සූත්‍රයේ තියෙන ගාථාව කවුරුත් දන්නවා.

**ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං**
**විරත්තචිත්තා ආයතිකෙ භවස්මිං**
**තෙ ඛීණබීජා අවිරූළ්හිච්ඡන්දා**
**නිබ්බන්ති ධීරා යථායං පදීපො**[16]

ඒ කියන්නේ රහතන් වහන්සේගේ විශේෂයෙන්ම අවසාන අවස්ථාව ගැන හිතනවා නම් 'ඛීණං පුරාණං' ඒක කොයි විධියටත් තෝරන්න ඇහැකි. අතීත කර්ම ඉවරයි. 'නවං නත්ථි සම්භවං' අලුත් දේවල් රැස් කරලත් නැහැ. 'විරත්ත චිත්තා ආයතිකෙ භවස්මිං' නැවත භවයක් පිළිබඳ ආශාවකුත් නැහැ. 'තෙ ඛීණබීජා' විඤ්ඤාණ බීජය ක්ෂය කරලා. විඤ්ඤාණය පැළවෙන්න බැහැ දැන් එතන. 'තෙ ඛීණබීජා අවිරූළ්හිච්ඡන්දා' තණ්හාව ආශාව පැන නගින්නේ නැහැ. 'නිබ්බන්ති ධීරා යථා අයං පදීපො' මේ පහන වගේ නිවී යනවා කියලා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා.

මේ නිවී යාම පිළිබඳ උපමාව ඊටත් වඩා ලස්සනට බුදුරජාණන් වහන්සේ උපසීව මාණවපුච්ඡා කියන පාරායන වග්ගයේ තියෙන ගාථාවක කියලා තියෙනවා.

**අච්චී යථා වාතවෙගෙන ඛිත්තො**
**අත්ථං පලෙති න උපෙති සංඛං**
**එවං මුනි නාමකායා විමුත්තො**
**අත්ථං පලෙති න උපෙති සංඛං**[17]

යම් සේ - 'අච්චි' කියන්නේ ගිනි සිල. 'අච්චි යථා වාතවෙගෙන ඛිත්තො' වාත වේගයෙන් තල්ලු කරන ලද ගිනි සිල යම් සේ 'අත්‍ථං පලෙති' අස්තයට යයිද, කෙළවර වෙයිද. 'න උපෙති සංඛං'ගිණීමට නොඑයිද,. හඳුන්වන්න බැහැ. කොහේ ගියාද කියලා කියන්න බැහැ. 'න උපෙති සංඛං. 'එවං මුනි නාමකායා විමුත්තො' එසේම මුනිවරයා නාමරූප ආදියෙන් මිදුණට පස්සේ 'අත්‍ථං පලෙති න උපෙති සංඛං' අස්තයට ගියා ආයෙ භාෂා ව්‍යවහාරයට ගේන්න බැහැ. එතකොට අර අහගෙන හිටිය උපසීව මානවකයා - එයාට තේරුම්ගන්න බැහැ.

**අත්‍ථංගතො සො උදවා සො නත්‍ථි**
**උදාහු වෙ සස්සතියා අරොගො**
**තං වෙ මුනි සාධු වියාකරොහි**
**තථාහි තෙ විදිතො එස ධම්මො**[18]

ඒ උන්වහන්සේ බොහොම භක්තියෙන් අහන නිසා ගෞරවයෙන් ආරාධනා කරනවා- 'ඇත්ත වශයෙන් භාග්‍යවතුන් වහන්ස, උන්වහන්සේ අස්තයට ගියාද? එහෙම නැතිනම් නැත්තටම නැති උනාද? එහෙම නැත්නම් සදාකාලික නිරෝගීව ඉන්න තත්ත්වයකට පත් වුණාද? ඒ කාරණය මට පහදලා දෙන්න. භාග්‍යවතුන් වහන්සේටයි මේ ධර්මය තේරෙන්නේ'. එහෙම කිව්වාට පස්සේ ඔන්න බුදුරජාණන් වහන්සේ ඊටත් වඩා පැහැදිලිව අවසාන වශයෙන් මේ සූත්‍රයේ දැක්වෙන්නේ මේ ගාථාවයි. ඒකත් උගතුන් පටලවාගෙන තෝරනවා.

**අත්‍ථංගතස්ස න පමාණමත්‍ථි**
**යෙන නං වජ්ජු තං තස්ස නත්‍ථි**
**සබ්බෙසු ධම්මෙසු සමූහතෙසු**
**සමූහතා වාදපථාපි සබ්බෙ**[19]

ඒ කියන්නේ **'අත්‍ථංගතස්ස න පමාණමත්‍ථි'** අස්තයට ගිය රහතන් වහන්සේ පිළිබඳව ප්‍රමාණ කරන්න බැහැ. මැනීමක් නැහැ. ගිණීමතුත් නැහැ. මැනීමකුත් නැහැ, 'යෙන නං වජ්ජු තං තස්ස නත්‍ථි' යමක් නිසා ව්‍යවහාර කරනවද එය ඔහුට නැත. ව්‍යවහාර කරන්නේ නාමරූපය නිසා නේ. එතකොට නාමරූපය නැහැ. කියන එකයි කිව්වේ. යමක් නිසා ව්‍යවහාර කරත්ද එය ඔහුට නැත. 'යෙන නං වජ්ජු තං තස්ස නත්‍ථි. **'සබ්බෙසු ධම්මෙසු සමූහතෙසු' සියලුම හිතට අරමුණු වන ධර්මයන් ඔක්කොම මුලිනුපුටා දැම්මට පස්සේ,** අර ඒ ධර්මයන් තමයි අර

ලේඛනයේ තියෙන්නේ - ආරම්මණ, අරමුණු - 'සබ්බෙසු ධම්මෙසු සමූහතෙසු- සමූහතා වාදපථාපි සබ්බේ' සියලුම 'වාදපථ' කියලා කියන ඔය දැන් තර්කකාරයින් නගන උභතෝකෝටික ප්‍රශ්න, චතුෂ්කෝටික ප්‍රශ්න, ඔක්කොම සේදිලා යනවා. **වාදපථ ඔක්කොම ඉවරයි. 'ඇත' 'නැත' දෙක තුළ හිරවෙලයි තියෙන්නේ තර්ක ශාස්ත්‍රය. ධර්මය අතක්කාවචරයි.**[20] ධර්මය අතක්කාවචර කියන්නේ ඒකයි. **නිවුණු ගින්න වගෙයි.** මේක බොහොම පැහැදිලි පිළිතුරක්. නමුත් මේ උගත්තු මේවා අවුල් කරගෙන.

නමුත් ඇතැම් විට බෞද්ධ දාර්ශනිකයින් මේක තේරුම්ගත්තු බව පෙනෙනවා. ඇතැම් දාර්ශනිකයින් - මේ කන පිනවන්න කියනවා නොවේ. නමුත් සෞන්දරානන්ද නමැති ඒ ශ්‍රේෂ්ඨ සංස්කෘත කාව්‍යයේ, අශ්වඝෝෂ කවියාගේ- ඒ මහා දාර්ශනිකයෙක්. මේ කියාපු පොතේ උපමාව ඉතාමත්ම ලස්සනට ප්‍රකාශ කරලා තියෙනවා.

**දීපො යථා නිර්වෘතිං අභ්‍යුපෙතො**
**නෛවාවනිං ගච්ඡති නාන්තරීක්ෂම්**
**දිශාං න කාංචිත් විදිශාං න කාංචිත්**
**ස්නෙහක්ෂයාත් කෙවලමෙති ශාන්තිම්**

**එවං කෘතී නිර්වෘතිං අභ්‍යුපෙතො**
**නෛවාවනිං ගච්ඡති නාන්තරීක්ෂම්**
**දිශාං න කාංචිත් විදිශාං න කාංචිත්**
**ක්ලෙශක්ෂයාත් කෙවලමෙති ශාන්තිම්**

මේකේ තේරුම - ඒ කවියා කියන්නෙත් අර උපමාවම තමයි. 'දීපො යථා නිර්වෘතිං අභ්‍යුපෙතො' යම් සේ පහන නිවී ගිය කල්හි 'නෛවාවනිං ගච්ඡති නාන්තරීක්ෂම්' ඒ පහන, ඒ පහන් දැල්ල පොළොවට ගියෙත් නෑ. අහසට ගියෙත් නෑ. 'දිශාං න කාංචිත් විදිශාං න කාංචිත්' දිශාවලට ගියෙත් නෑ අනුදිශාවලට ගියෙත් නැහැ. '**ස්නෙහක්ෂයාත් කෙවලමෙති ශාන්තිම්**' හුදෙක් තෙල් අවසන් වීම නිසා නිවී ගියා. ඔන්න ඊළඟට උපමේය දෙනවා.

'එවං කෘතී නිර්වෘතිං අභ්‍යුපෙතො' එසේම 'කෘතී' කියන්නේ කතකරණීය රහතන් වහන්සේ. එසේම රහතන් වහන්සේ. 'නිර්වෘතිං අභ්‍යුපෙතො' නිවනට ගිය රහතන් වහන්සේ, පොළවට ගියෙත් නෑ, අහසට ගියෙත් නෑ, දිශාවලට ගියෙත් නෑ, අනුදිශාවලට ගියෙත් නෑ. ක්ලේශ ක්ෂය කළ නිසා හුදෙක්

**ශාන්තියට පත් වුනා.**

ඉතින් මේ තුළින් මේ පින්වතුන්ට පෙනෙනවා අපි පටිච්ච සමුප්පාදයෙන් පටන්ගත්තාට පටිච්ච සමුප්පාදය ඉබේටම සම්බන්ධ වෙනවා නිවනට, නිවන පිළිබඳ කතන්තරයට. **නිවන කියන එක තේරුම්ගන්න බැහැ, පටිච්චසමුප්පාදය පිළිබඳ අවබෝධය නැතිව.**

ඒක නිසා මේ අවස්ථාවේ දේශනාවට එකතු කරන්න කල්පනා කළා විශේෂ පණිවුඩයක්- මේ බොහෝදෙනා දන්නව. සමහරු නොදන්නවා- මේ දේශනා අහන අයට උපකාර වීමට. දැන් මේ මීට අවුරුදු විස්සකට විතර කලින් මීතිරිගල නිස්සරණ වනයේ වැඩ වාසය කරන අවස්ථාවක යෝගාවචර සංඝයා වහන්සේලා පිරිස වෙනුවෙන් අපි 'නිවන' 'නිබ්බාන' යන මාතෘකාව යටතේ දේශනා තිස්තුනක් පැවැත්වුවා. වර්ෂ ගණනකට පස්සේ **කොළඹ ධර්ම ග්‍රන්ථ මුද්‍රණභාරය** මගින් ඒ දේශනා තිස්තුන වෙළුම් එකොළහකින් නිකුත් කරලා තියෙනවා. දැන් බොහෝ දෙනා කියවලත් තියෙනවා. ඒවා ඉංග්‍රීසියට නඟලත් අවසානයි. ඊළඟට **මහනුවර ධර්ම ශ්‍රවණ මාධ්‍ය භාරය** ඒ දේශනා කනින් අහන අය සඳහා සංයුක්ත තැටිගත කරලා ඉංග්‍රීසි ඒවත් එක්කම -දැන් ලෝකය පුරා බෙදා හරිනවා. එතකොට ඒ දේශනා මාලාව පැවැත්වූ කාලය අවුරුදු විස්සතට කලින්. අපි නිවන අරමුණු කරලා පටන්ගත්තා පටිච්ච සමුප්පාදය ගැනත් යම් යම් දේ කියවුනා. දැන් මේ අවස්ථාවේ **'පහන් කණුව' පටිච්ච සමුප්පාද දේශනා මාලාවක්** බවට දැන් පත් වෙච්ච අවස්ථාවේ. මේ පස්වන දේශනාවයි. කෙතෙක් කියවෙයිද කියලා මට හරියටම කියන්න බැහැ. ඒක කාලයා විසින් තීරණය කරනු ඇති. එතකොට මේ දේශනා මාලාවේ දී අපට පටිච්ච සමුප්පාද ශීර්ෂයෙන් නිවනත් කියන්න වෙනවා.

එතකොට මේ දෙක එකිනෙකට සම්බන්ධ වන බව තවත් හෙළි වෙන සිද්ධියක්. පොඩි කතන්දරයක් කියන්නම්. කතන්දර නොවේ ධර්මයට අදාළ දෙයක්. මේ පින්වතුන් අහලා තියෙනවා බුදුරජාණන් වහන්සේ සම්බෝධියෙන් පස්සේ ධර්ම ගම්භීරතාව ගැන සැලකූ බව. අර බ්‍රහ්මයා ඇවිල්ලා ආරාධනා කරන්න කලින්. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා අරිය පරියේසන සූත්‍රයේ දී තමන් මේ **මහා පරම ගම්භීර වූ දූරදර්ශ වූ දුරවබෝධ වූ, ශාන්ත වූ, ප්‍රණීත වූ මේ පුදුම ධර්මය තේරුම් ගත්තට පස්සේ කල්පනා** කළා ලෝකයා කොහොමද මේ ධර්මය තේරුම්ගන්නේ කියලා. එහෙම සලකන අවස්ථාවේ උන්වහන්සේට පෙනී ගියා ස්ථාන දෙකක් - කාරණා දෙකක් - ලෝකයාට තේරුම්ගැනීමට

අපහසු[21]. එකක්, **'ඉදප්පච්චයතා පටිච්ච සමුප්පාදය'** අර අපි කිව්වේ පටිච්චසමුප්පාද ධර්මයයි. ඉදප්පච්චයතා කියලා කියන 'මෙය ඇති කල්හි මෙය වෙයි. ආදී වශයෙන් තියෙන පටිච්ච සමුප්පාද ධර්මතාව තමයි ලෝකයාට තේරුම්ගන්න ඉතාම අමාරු. ඒ එක කාරණයක්. අනික් කාරණය තමයි **'සබ්බ සංඛාර සමථො සබ්බුපධිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං'** කියලා කියන ඒ පදවලින් හැඳින්වෙන සංස්කාරයන්ගේ සන්සිඳීම. නිරෝධය. ඒකත් ලෝකයාට තේරුම් ගන්න අමාරුයි. ඉතින් ඒ තේරුම්ගන්න අමාරු අන්න අර කියාපු භාෂා ව්‍යවහාරය තුළ හිර වෙලා ඉන්න නිසයි පටිච්චසමුප්පාදයේ අංග තේරුම් ගන්න බැරි. ලෝකයා අර තර්කය තුළ හිරවෙලා ඉන්නවා. එක්කෝ 'ඇත' එක්කෝ 'නැත' දෙකෙන් එකක් කියපන් කියාවි. ඇතැයි කියන්නවත් ඕන. නැතැයි කියන්නවත් ඕන. **නමුත් 'ඇතත්' නොවේ. 'නැතත්' නොවේ.**

මේ පින්වතුන්ට අපි තේරුම් කරලා දුන්නා පටිච්ච සමුප්පාද ධර්ම න්‍යායයේ තියන ගැඹුර තමයි 'ඉමස්මිං සති ඉදං හොති'. **මෙය ඇති කල්හි මෙය වෙයි. මෙය හට ගැනීමෙන් මෙය හටගනී. මෙය නැති කල්හි මෙය නොවේ. මෙය නිරුද්ධ වීමෙන් මෙය නිරුද්ධ වේ.**[22] මහා පුදුම දෙයක්. **ඔතනමයි අතක්කාවචර බව තියෙන්නේ.** තර්කය කියන්නේ එක්කෝ ඔව් කියන්න ඕනෑ. නැත්නම් නෑ කියන්න ඕනෑ. ඒ වෙනුවට බුදුරජාණන් වහන්සේ කියන්නේ ඔන්න ඔය ටික. ඉතින් ඔය ටික තේරුම්ගන්න අමාරුයි ලෝකයාට. ඒ වගේම තමයි අන්න රහතන් වහන්සේ නිවන් දැක්කට පස්සේ, කොහේ හරි හැංගිලා ඇතෙයි කියන හැඟීමක් තියෙනවා. ඒකට තමයි අපි මේ උපමාව කිව්වේ. එතකොට හිතාගන්න පටිච්ච සමුප්පාදයේ අනුලෝම පැත්තකුත් පටිලෝම පැත්තකුත් කියලා දෙකක් තිබෙන බව, මේ පින්වතුන් දන්නවා. අනුලෝම පැත්තෙන් කියන්නේ සංසාරයේ සාමාන්‍ය ස්වභාවය. දැන් ඔය හෙළි වන එකක් නේ 'යෙ ධම්මා හෙතුප්පභවා' සාරිපුත්ත ස්වාමීන් වහන්සේ සෝවාන් ඵලය ලැබුවේ අර ගාථාවේ මුල් පද දෙක අහලා. 'යෙ ධම්මා හෙතුප්පභවා තෙසං හෙතුං තථාගතො ආහ'[23] යම් ධර්මයක් හේතුන්ගෙන් හටගන්නවා නම් ඒවායේ හේතුව තථාගතයන් වහන්සේ ප්‍රකාශ කළා කියනවත් එක්කම සාරිපුත්ත ස්වාමීන් වහන්සේ තේරුම්ගත්තා හේතුන්ගෙන් ඇති වෙනවා නම් හේතු නැති වුනාම නැති වෙන්න ඕනෑ. 'තෙසං ච යො නිරොධො එවං වාදී'. අන්න දෙවෙනි පද දෙකෙන් කියවුනෙ නිවන ගැන.

පටිච්ච සමුප්පාද ධර්මය ගැන හිතාගන්න **යම්කිසි ප්‍රශ්නයක්**

**හරිහැටි තේරුම් ගත්තොත් ඒ ප්‍රශ්නය තුළම තියෙනවා විසඳුම.** එතකොට පටිච්ච සමුප්පාද ධර්මය අනුලෝම පැත්තෙන් තියෙන්නේ ප්‍රශ්නයයි. පටිලෝම පැත්තෙන් තියෙන්නේ විසඳුමයි. එතකොට ඒකම තමයි මේ පින්වතුන්ට බොහෝ විට තේරුම්ගන්න බැරි එකක් තමයි **මේ ලෝකයා හිර වෙලා තියෙන්නේ 'අස්ති' සහ 'නාස්ති' කියන දෙක තුළයි කියන එක.**

දැන් අවිද්‍යාව ගැන කියනවා නම් අනුලෝම පැත්තේ තියෙන්නේ අවිද්‍යාව නිසා මෙන්න මේ ධර්ම පරම්පරාවක් ඇති වෙනවා. නමුත් අවිද්‍යාවගේ නැති වීමෙන්ම නිරෝධය ඇති වෙනවා. ඉතින් මෙන්න මේ කාරණයටත් කදිම වටිනා සූත්‍රයක් තියෙනවා.[24] අපි ඒක යන්තමින් මතු කරමු මේ අවස්ථාවේ. කච්චානගොත්ත කියලා සූත්‍රයක් තියෙනවා. කච්චාන ගොත්ත ස්වාමීන් වහන්සේ බුදුරජාණන් වහන්සේ ළඟට ඇවිල්ලා අහනවා භාග්‍යවතුන් වහන්ස 'සම්මා දිට්ඨි සම්මා දිට්ඨි' කියලා කියනවා. කෙතෙකින් ද කෙනෙක් සම්මා දිට්ඨිය ඇත්තෙක් වෙන්නේ. සම්මා දිට්ඨිය ගැන නොයෙකුත් නිර්වචන මේ පින්වතුන් අහලා තියෙනවා. මෙන්න අමුතුම නිර්වචනයක්. 'සම්මා දිට්ඨි සම්මා දිට්ඨි' කියනවා, කෙතෙකින්ද සම්මා දිට්ඨි වෙන්නේ. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා 'කච්චායන මේ ලෝකයා වැඩිකොටම ද්වයනිශ්‍රිතයි. දෙකක් තුළ හිර වෙලා ඉන්නවා. ද්වය නිශ්‍රිත කියලා කියන්නේ දෙකක් පිළිබඳ කතාන්තරය නේ. අර අපි කිව්වේ 'ඇත' 'නැත' කියලා. අන්න ඒකයි. 'ද්වය නිස්සිතො ඛ්වායං කච්චාන ලොකො යෙභුය්‍යෙන අත්ථිතඤ්ච නත්ථිතඤ්ච, අස්තිත්වය නාස්තිත්වය' කියන දෙක තුළයි ලෝකයා ඒ අන්ත දෙක තුළයි ඉන්නේ. එහෙම කියලා බුදුරජාණන් වහන්සේ මේ මැදුම් මඟට ගන්න හැටි පෙන්නුම් කරනවා මේ විධියට. 'ලොකසමුදයං බො කච්චාන යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො, යා ලොකෙ නත්ථිතා සා න හොති' කච්චාන ලෝකයේ හට ගැන්ම, ලෝකය හට ගන්නා ආකාරය, යථා භූත වශයෙන් දකින විදර්ශකයාට ලෝකයේ නාස්තිත්වය කියන ලෝකය නැත කියන හැඟීම නැති වෙලා යනවා. ඒ එක පැත්තක්. ඊළඟට කියනවා 'ලොක නිරොධං බො කච්චාන යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො යා ලොකෙ අත්ථිතා සා න හොති' ලොක නිරෝධය බලන්න බලන්න තේරෙනවා ඒක දිහා බලන කෙනාට ලෝකයෙ අස්තිත්ව කියන අන්තයටත් ගන්න බැහැ. ඔන්න අන්ත ද්වයෙන් මිදෙන හැටි. එතකොට ලෝකයා කියන්නේ ඒකාන්තයෙන් තියෙනවා. එහෙම නැත්නම් ඒකාන්තයෙන් නැහැ. බුදුරජාණන් වහන්සේ කියන්නේ ඒකාන්ත කතාව නෙවෙයි. **හේතු ප්‍රත්‍යයන්ගෙන් 'නිසා' හටගැනීමක් පටිච්ච**

**සමුප්පනන කියන්නේ** 'නිසා හටගැනීමක්' තමයි අර දෙපැත්තම. එතකොට නිරන්තරයෙන්ම ලෝකය අලුත් වෙමින් යනවා. ඒ වගේම බිඳෙමින් යනවා. ඇති වීම් නැති වීම් සමූහයක් ලෝකය තුළ තියෙන්නේ. නමුත් ඒක ලෝකයා අරගත්තු ඝන සංඥාව උඩ, කෙලෙස් සංඥාව උඩ, ග්‍රහණය උඩ, උපාදානය උඩ, ලෝකයා දැඩිව ගන්නවා යමක් තියෙනවා කියලා. **යම් කිසි දෙයක් තියෙනවා කියලා. යම් කිසි දෙයක් තිබුණා නම් ඒක නැති වෙන්න ඕන.** එතකොට නිරෝධය. නිරෝධය කියන්නේ උච්ඡේදය කියලා සාමාන්‍ය ලෝකයා හිතන්නේ. නමුත් ඇත්ත වශයෙන්ම නැති වුණා නම් නැති වුණේ - අපි සමහර අවස්ථාවල ප්‍රකාශ කළා, **නැතිවුනා නම් නැති වුනේ 'යමක් ඇත' කියා හිතාගත්තු අවිද්‍යාවත්, තව මදි කියා හිතාගත්තු තණ්හාවත්ය. ඔච්චරයි නැති වුණේ.** අඩන්න දෙයක් නෑනේ. 'යමක් ඇත' කියලා හිතාගත්තු **අවිද්‍යාවත් 'තව මදි'** කියා හිතාගත්තු **තණ්හාවත්**. සැබෑ වශයෙන් තියෙන්නේ **ඇති වීමක්** හා **නැති වීමක්** පමණයි. **ඇති වීමක්** හා **නැති වීමක්** පමණයි. ඒකයි බුදුරජාණන් වහන්සේ ඒ ප්‍රත්‍යක්ෂය ලැබූ අවස්ථාවේ, විපස්සී බුදුරජාණන් වහන්සේ පවා ඒ ප්‍රත්‍යක්ෂය හෙළි කළේ "සමුදයො සමුදයොති ඛො පුබෙබ අනනුසසුතෙසු ධමෙමසු චකඛුං උදපාදි" ආදී වශයෙන්. හටගන්නවා හටගන්නවා. එහෙම නැත්නම් හටගැනීමක්. හටගැනීමක්. ඒ එක පැත්තක්. අනික් පැත්ත තමයි නිරුද්ධවීමක්. නිරුද්ධ වීමක්. එතකොට හට ගැනීමත් නිරුද්ධවීමත් නිරන්තරයෙන් සිදුවන ක්‍රියාදාමයක්. ඕක තුළ ලෝකයා අර වැරදි දිට්ඨිය නිසා **'සකකාය දිට්ඨිය'**[25] කියන්නේ **'සමූහය ඇත'** කියලා ගැනීම. ඒ දෘෂ්ටිය නිසා අන්න අර විදියට 'ඇත' 'නැත' කියන ඒ තර්කය මත හිර වෙලා **සාමාන්‍ය පෘථග්ජන පුද්ගලයා පමණක් නොවේ දෘෂ්ටිගතිකයාත් විද්‍යාඥයාත් ඔක්කොම හිර වෙලා තිනේනේ ඕතනයි.** තර්කය -උභතෝකෝටික තර්කය මදිවට චතුෂ්කෝටික[26] තර්කයකුත් හදාගෙන. එතැනත් හිරවෙලා. නමුත් මේ ඔක්කොම අතකකාවචර ධර්මය තුළින් බුදුරජාණන් වහන්සේ සමතික්‍රමණය කළා. කොහොමද? අන්න අර ඇතිවීම් නැතිවීම් කියන ප්‍රත්‍යක්ෂ අවබෝධය තුළින් ඒක දැක්ක අවස්ථාව. මෙතන **ස්ථාවරයක් ගන්න බැහැ** ඇතැයි කියලාවත් නැතැයි කියලාවත්.

මේක මේ පින්වතුන්ට තේරෙන මට්ටමින් කියතොත් අපි යම් අවස්ථාවක අර නිවන දේශනාවල පොඩි උපමාවක් දුන්න. උපමාවලට නේ බොහෝ දෙනා කැමති. ඒක තේරුම්ගන්න පහසුයි. සමහර විට සාප්පුවල එහෙම තියෙනවා නේ ඔය හිත් ඇදගන්න දේවල් පිටට පෙන්නන්න. සමහර විට තියෙනවා ඔය සාප්පුවල- දැන් කාලෙත් තියනවාද මම දන්නේ නැහැ. ඉස්සර තිබුනා ඔය කේතලේකින් වතුර වැක්කෙරෙනවා මොකක්හරි

භාජනයකට - අපි හිතමු බේසමකට. සාප්පුවෙන් එළියට ඇවිල්ලා බලනකොට පිටින් ඉන්න කෙනාට පෙනෙන්නේ කේතලෙන් වතුර වැක්කෙරෙනවා කෙළවර වෙන්නේ නැහැ. කේතලය හිස් වෙන්නෙත් නැහැ. අරක පිරෙන්නෙත් නැහැ. මොකද රහස? රහස මේකයි. අර වතුර ධාරාව තුළින් මොකක්දෝ සියුම් නලයක් යනවා. අර වතුර ආයෙත් කේතලයට යවන්න. ඔය මැජික් කේතලේ උපමාව අපි දුන්නේ ඔන්න ලෝකයත් මැජික් කේතලයක් කියලා හිතා ගන්න. **ලෝකයත් මැජික් කේතලයක්**. පොඩි මට්ටමින් ගත්තොත් සමුදය වය -සමුදය නිරෝධය -නිරන්තරයෙන් සිදු වෙනවා. මේ අපේ ශරීරයෙත් මේ හැම එකක් පිළිබඳව මේ පින්වතුන් දන්නවා. හිටි ගමන් මැරෙන්නේ නැහැ නේ. ඊළඟට ලෝකය පිළිබඳවත්. ඒක තමයි 'සංවට්ට-විවට්ට' කියන්නේ. ලෝකධාතු ඇති වෙනවා නැති වෙනවා. **ඇති වෙනවා නැති වෙනවා.** ඔය සත්‍යයයි තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලෝකයාට හෙළි කර දුන්නේ. ඒ වෙනුවට ලෝකයා අන්න අර සක්කාය දිට්ඨිය තුළ හිර වෙච්ච ඒ සංඥාව නිසාම ඇති කරගත්තු ඒ දෘෂ්ටිය තුළ හිර වෙලා තර්කය තුළ හිර වෙලා, නැවත නැවතත් '**යොගමායනති මච්චුනො.' මාරයාගේ විය කරට යට වෙනවා.**

ඉතින් මේ ටික ඇති මේ පින්වතුන්ට. ටික නොවේ හුඟක් කියවුණා. ඉතින් කෙසේ හෝ වේවා අපි හිතනවා අර අපි කිව්වේ '**මොන යකාට හෝ තේරේවා**' කියන අදහසිනුයි මේ ගැම්මට කියන්නේ. ඒක මේ කැහැ කැහැ හරි මම කියන්න බලාපොරොත්තු වෙනවා. ඉතින් මේ පින්වතුන් මට සමාධිය භජනය කරන්න ඕනෑ. අර යක්ෂයාට, දේවතාවට, කිව්වා වගේ. යම් දෙයක් නොතේරෙනවා නම්, යම් අවස්ථාවක මේ සංයුක්ත තැටිය අහනකොට තේරෙන්න පුළුවන්.

ඉතින් අද දවසෙත් මේ පින්වත් පිරිස වෙනදා වගේ වටිනා සීලයක් සමාදන් වෙලා නිවන් අදහසින් තම තමන්ගේ බණ භාවනා කටයුතු කරන්න ඇති. මේ ධර්ම දේශනාවත් මේ පින්වතුන්ට ඒ බලාපොරොත්තු වන උත්තමාර්ථයට ළං වීමට උපකාර උපනිශ්‍රය වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. අවීචියේ සිට අකනිට්ඨාව දක්වා යම් තාක් සත්ත්ව කෙනෙක් ධර්ම දේශනාමය ධර්ම ශ්‍රවණමය කුසලය අනුමෝදන් වීමට කැමති නම් ඒ අනුමෝදන් වීම තුළින් ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවනින් සැනසෙත්වා කියා ප්‍රාර්ථනා කරගෙන මේ ගාථා කියන්න.

**එත්තාවතා ච අමෙහහි ...**

## පාදක සටහන්

1. සමිද්ධි සූත්‍රය, සංයුත්ත නිකාය - 1, 22 පිට (බු.ජ.ත්‍රි. 13)
2. සමිද්ධි සූත්‍රය, සංයුත්ත නිකාය - 1, 18 පිට (බු.ජ.ත්‍රි. 13)
3. සමිද්ධි සූත්‍රය, සංයුත්ත නිකාය - 1, 18 පිට (බු.ජ.ත්‍රි. 13)
4. සමිද්ධි සූත්‍රය, සංයුත්ත නිකාය - 1, 22 පිට (බු.ජ.ත්‍රි. 13)
5. සමිද්ධි සූත්‍රය, සංයුත්ත නිකාය - 1, 22 පිට (බු.ජ.ත්‍රි. 13)
6. සමිද්ධි සූත්‍රය, සංයුත්ත නිකාය - 1, 22 පිට (බු.ජ.ත්‍රි. 13)
7. මහානිදාන සූත්‍රය, දීඝ නිකාය - 2, 94 පිට (බු.ජ.ත්‍රි. 8)
8. අරහන්ත සූත්‍රය, සංයුත්ත නිකාය - 1, 28 පිට (බු.ජ.ත්‍රි. 13)
9. නිබ්බේධික සූත්‍රය, අංගුත්තර නිකාය - 4, 206 පිට (බු.ජ.ත්‍රි. 21)
10. මධුපිණ්ඩික සූත්‍රය, මජ්ඣිම නිකාය - 1, 276 පිට (බු.ජ.ත්‍රි. 10)
11. සන්ධ සූත්‍රය, අංගුත්තර නිකාය - 6, 612 පිට (බු.ජ.ත්‍රි. 23)
12. සන්ධ සූත්‍රය, අංගුත්තර නිකාය - 6, 612 පිට (බු.ජ.ත්‍රි. 23)
13. පඨම නිබ්බාන සූත්‍රය, උදාන පාළි, ඛුද්දක නිකාය -1, 290 පිට (බු.ජ.ත්‍රි. 24)
14. දුතියභද්දිය සූත්‍රය, උදාන පාළි, ඛුද්දක නිකාය -1, 278 පිට (බු.ජ.ත්‍රි. 24)
15. මහාතණ්හාසඞ්ඛය සූත්‍රය, මජ්ඣිම නිකාය -1, 608 පිට (බු.ජ.ත්‍රි. 10)
16. රතන සූත්‍රය, ඛුද්දකපාඨපාළි, ඛුද්දක නිකාය - 1, 12 පිට (බු.ජ.ත්‍රි. 24)
17. උපසීව සූත්‍රය, සුත්ත නිපාතය, ඛුද්දක නිකාය, 328 පිට (බු.ජ.ත්‍රි. 25)
18. උපසීව සූත්‍රය, සුත්ත නිපාතය, ඛුද්දක නිකාය, 328 පිට (බු.ජ.ත්‍රි. 25)
19. උපසීව සූත්‍රය, සුත්ත නිපාතය, ඛුද්දක නිකාය, 328 පිට (බු.ජ.ත්‍රි. 25)
20. අරියපරියෙසන සූත්‍රය, මජ්ඣිම නිකාය - 1, 408 පිට (බු.ජ.ත්‍රි. 10)
21. අරියපරියෙසන සූත්‍රය, මජ්ඣිම නිකාය - 1, 408 පිට (බු.ජ.ත්‍රි. 10)
22. බොධි සූත්‍රය 3, උදාන පාළි, ඛුද්දක නිකාය - 1, 132 පිට (බු.ජ.ත්‍රි. 24)
23. මහා වග්ගය - 1, 84 පිට (බු.ජ.ත්‍රි. 3)
24. කච්චානගොත්ත සූත්‍රය, සංයුත්ත නිකාය - 2, 28 පිට (බු.ජ.ත්‍රි. 14)
25. සක්කාය දිට්ඨි සූත්‍රය, සංයුත්ත නිකාය - 3, 330 පිට (බු.ජ.ත්‍රි. 15)
26. චූලමාලුඞ්ක්‍ය සූත්‍රය, මජ්ඣිම නිකාය - 2, 152 පිට (බු.ජ.ත්‍රි. 11)
    අග්ගිවච්ඡගොත්ත සූත්‍රය, මජ්ඣිම නිකාය - 2, 256 පිට (බු.ජ.ත්‍රි. 11)

# 06 වන දේශනය

# 06 වන දේශනය

## (පහන් කණුව ධර්ම දේශනා අංක 188)
## 'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

ජාති මරණ සංසාරං - යෙ වජන්ති පුනප්පුනං
ඉත්ථභාවඤ්ඤථාභාවං - අවිජ්ජායෙව සා ගති

අවිජ්ජා හයං මහාමොහො - යෙනිදං සංසිතං චිරං
විජ්ජාගතාච යෙ සත්තා - නාගච්ඡන්ති පුනබ්භවං[1]

- ද්වයතානුපස්සනා සූ.සුත්ත නිපාත

සැදැහැවත් පින්වතුනි,

ජීවිතය කියල කියන්නේ උපතත් මරණයත් අතර කාල පරිච්ඡේදයයි. සංසාරය කියලා කියන්නේ උපතත්, මරණයත් අතර කරකැවිල්ලයි. මේ දෙක අතර සම්බන්ධතාව මතු කරලා දක්වන අන්දමේ ගාථා දෙකක් තමයි අද අපි මේ හයවෙනි පටිච්ච සමුප්පාද ධර්ම දේශනාවට මාතෘකාව හැටියට ඉදිරියට ගත්තේ.

මේ ගාථා දෙක ඇතුළත් වන්නේ සුත්ත නිපාතයේ ද්වයතානුපස්සනා සූත්‍රයේයි. ගැඹුරු ධර්ම කාරණා රාශියක් අඩංගු වන මේ සූත්‍රයේ කෙටි නිදාන කථාව තුළ මහා ධර්ම තේජසක් ගැබ් වෙලා තියෙනවා. තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර පූර්වාරාමයේ මිගාරමාතු ප්‍රාසාදයේ වැඩවාසය කරන අවස්ථාවක - මේ පින්වතුන් සිහියට නගා ගන්න බලන්න - පුන්සඳ බැබලෙන පුන් පොහෝ දවසක රාත්‍රියක භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා පිරිවරාගෙන එළිමහනේ වැඩ හිඳිනවා. නිහඬව නිසොල්මන්ව සාවධානව සිටින ඒ භික්ෂු සංඝයා වහන්සේලා වෙත බුදු ඇසින් සිසාරා බැල්මක් හෙළලා බුදුරජාණන් වහන්සේ ගැඹුරු දේශනාවකට මුල පුරනවා මේ විධියට. "මහණෙනි, සම්බෝධිය කරා ගෙන යන යම් ආර්ය නෛර්‍යාණික කුසල ධර්ම වෙත් නම් ඒවා ශ්‍රවණය කිරීමෙන් ලැබෙන ආසන්න ප්‍රතිඵලය මොකක්ද කියලා යම් කෙනෙක්

ඇහුවොත් මෙන්න මෙහෙම පිළිතුරු දිය යුතුයි. 'යාවදෙව ද්වයතානං ධම්මානං යථාභූතං ඤාණාය.' හුදෙක් යුගල වශයෙන් පිහිටි, දෙකක් වශයෙන් පිහිටි, ධර්මයන්ගේ යථාභූත අවබෝධය සඳහායි.

ඊළඟට බුදුරජාණන් වහන්සේ අහනව 'කිංච ද්වයතං වදෙථ' මොකක්ද මේ ද්වයතාව කියලා කියන්නේ. ඔන්න ද්වයතාව කියන එකට බුදුරජාණන් වහන්සේ නිදර්ශනයක් දීමෙන්ම තේරුම් කරනවා සංඝයා වහන්සේලාට ''ඉදං දුක්ඛං අයං දුක්ඛ සමුදයොති අයමෙකානුපස්සනා". 'මෙය දුක්ඛය, මෙය දුකෙහි හටගැන්මය යනු මේ එක අනුපස්සනාවකි. ''අයං දුක්ඛ නිරොධො අයං දුක්ඛ නිරොධගාමිනී පටිපදාති අයං දුතියානුපස්සනා'' මෙය දුක්ඛ නිරෝධයයි. මෙය දුක්ඛ නිරෝධගාමිනී පටිපදාවයි.' යන මෙය දෙවන අනුපස්සනාවයි''.

ඊළඟට බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලාට ප්‍රකාශ කරනවා. "මේ කියාපු ද්වයතානුපස්සනාව පිළිබඳව මැනවින් මෙනෙහි කරන, අප්‍රමාදීව වීර්ය වඩන, අකුසල් දුරු කරන, ඒ භික්ෂුවකට බලාපොරොත්තු විය හැකි ඵල දෙකක් තියෙනවා. එක්කෝ මෙලොවම අරහත් ඵලය. උපාදාන යමක් ශේෂ වී ඇත්නම් අනාගාමී ඵලය." මෙහෙම ප්‍රකාශ කරලා බුදුරජාණන් වහන්සේ අර චතුරාර්ය සත්‍යයට අදාළ ගාථා හතරක් දේශනා වශයෙන් ඊළඟට ප්‍රකාශ කරනවා ශ්‍රීමුඛ දේශනා වශයෙන්.

ඊළඟට නැවතත් සංඝයා වහන්සේලාට මෙහෙම වදාළා. "යම් කෙනෙක් ඇහුවොත් මැනවින් ද්වයතානුපස්සනාවෙහි යෙදීමෙහි තවත් ක්‍රමයක් තිබේද කියලා, තියෙනවා කියලා කියන්න ඕනෑ" කියලා ඔන්න ඊළඟට ඒ ක්‍රමය ප්‍රකාශ කරනවා. දෙවෙනි ක්‍රමය "යං කිංචි දුක්ඛං සම්භොති සබ්බං උපධි පච්චයාති උපධීනං ත්වෙව අසෙසවිරාගනිරොධා නත්ථි දුක්ඛස්ස සම්භවොති" යම් තාක් දුකක් හටගන්නවා නම් ඒ සියල්ල උපධි නම් වූ - මේ පින්වතුන් කෙටියෙන් මෙහෙම සලකාගන්න මේ දීර්ඝ සංසාරයේ අපි වත්කම් හැටියට රැස් කරගත්තු පංචඋපාදානස්කන්ධයමයි උපධි හැටියට දක්වෙන්නේ. එතකොට මේ සියලුම දුක්ඛස්කන්ධයට හේතුව හැටියට බුදුරජාණන් වහන්සේ දක්වන්නේ ඒ උපාදානස්කන්ධ පහමයි. එතකොට ඒ උපධීන්ගේ නිරවශේෂ ප්‍රහාණය, නැති කිරීම - අසෙසවිරාගනිරොධා - නිරුද්ධ කිරීමෙන් දුකෙහි හටගැන්මක් නැත.

ඉතින් ඔන්න ඔය විදියට මේ සූත්‍රයේ අනුපස්සනා දහසයක්ම අඩංගු

වෙනවා. ඒකේ විශේෂත්වය තියෙන්නේ හැම අනුපස්සනාවක්ම වාගේ අර විධියට ආරම්භ වෙනවා. තවත් අනුපස්සනාවක් තිබිය හැකිද කියා ඇහුවොත් මෙන්න මෙහෙම කියන්න කියලා ඒ විධියටයි ඉදිරිපත් කරන්නේ. බුදුරජාණන් වහන්සේ පළමුවෙන් ගද්‍ය පාඨයකින් ඒ කාරණය හඳුන්වලා ඊළඟට ඊට අදාළව වටිනා ගාථාවක් දෙකක් ගාථා තුනහතරක් පවා ඒ සූත්‍රයේ සඳහන් වෙනවා. ඒ දීර්ඝ සූත්‍රයේ ඔක්කොම කියන්න අපි බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් විශේෂත්වය තියෙන්නේ මේ දේශනාව අහලා ඉවර වෙනකොට ඒ අසා සිටිය හැට නමක්ම ආශ්‍රවයන් ක්ෂය කරලා උතුම් රහත් බව ලැබුවා, කියලා කියනවා. ඒ තරම් වටිනා දේශනාවක්.

අන්න ඒ කියාපු දේශනාවේ තුන්වෙනි අනුපස්සනාවයි. අපි අද මාතෘකාව හැටියට ගත්තේ. ඒ ගාථා ඉදිරිපත් කරන්න බුදුරජාණන් වහන්සේ පළමුවෙන්ම වදාළ ගද්‍ය පාඨය තමයි මෙන්න මේක.

"යං කිංචි දුක්ඛං සම්භොති සබ්බං අවිජ්ජා පච්චයා, අවිජ්ජායත්වෙව, අසෙසවිරාග නිරොධා නත්‍ථි දුක්ඛස්ස සම්භවොති"

'යම් තාක් දුකක් ඇති වෙනවා නම් ඒ අවිද්‍යාව ප්‍රත්‍යය කරගෙනයි. අවිද්‍යාව නිසයි. අවිද්‍යාවගේ අසේසවිරාගනිරෝධයෙන් දුකෙහි හටගැන්මක් නැත. එහෙම කියල තමයි අන්න අර අපි ප්‍රකාශ කළ ගාථා දෙක වදාළේ.

**"ජාති මරණ සංසාරං - යෙ වජන්ති පුනප්පුනං**
**ඉත්‍ථභාවඤ්ඤථාභාවං - අවිජ්ජායෙව සා ගති"**

'උපතත් මරණයත්, මෙසේ බවත් අන්සේ බවත් අතර මාරු වීමක් වන මේ සංසාරයේ යම් කෙනෙක් නැවත නැවත ගමන් කරත්ද එය අවිද්‍යාවගේම ගමනක්.'

**"අවිජ්ජා හයං මහාමොහො-යෙනිදං සංසිතං චිරං"** අවිද්‍යාවම තමයි මහා මෝහය, මුළාව. ඒ නිසයි මේ දීර්ඝ කාලයක් සංසාරයේ සැරිසැරුවේ.

**"විජ්ජාගතාච යෙ සත්තා නාගච්ඡන්ති පුනබ්භවං"** විද්‍යාව පහළ කරගත්තා වූ සත්ත්වයෝ නැවත පුනර්භවයට නොඑත්. ඔන්න එතකොට ගාථා දෙකේ අර්ථය.

මේ ගාථා දෙක පිළිබඳ හොඳ විවරණයක් කරන්න අපි අදහස් කරනවා. පසුගිය දේශනාවේ යන්තමින් මතු කරගත්තු ඉතාමත්ම වටිනා සූත්‍ර

දේශනාවක් වඩා සවිස්තරව ඉදිරිපත් කරනවා. මොකක්ද, කච්චායනගොත්ත සූත්‍රය[2] සංයුත් සඟියේ නිදාන සංයුත්තයේ දක්වෙන. ඒ සූත්‍රය එදා ඇවිත් නැති පින්වතුන්ටත් සලකාගන්න පුළුවන් වෙන්න සවිස්තරව කියනවා. මෙහෙමයි ආරම්භ වෙන්නෙ. කච්චායනගොත්ත කියන ස්වාමීන් වහන්සේ බුදුරජාණන් වහන්සේ ළඟට ඇවිත් අහනවා 'සමමා දිට්ඨි, සමමා දිට්ඨීති භන්‍තෙ වුච්චති කිත්තාවතානුඛො භන්‍තෙ සමමාදිට්ඨීති වුච්චති' "ස්වාමීනි සම්මා දිට්ඨි සම්මා දිට්ඨි" කියලා කියනවා. කෙතෙකින්ද ස්වාමීනි, මේ සම්මා දිට්ඨිය ඇත්තෙක් වෙන්නේ. ඔන්න එතකොට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. 'ද්වය නිසසිතො ඛො අයං කච්චාන ලොකො යෙභුයොන අත්‍ථිතඤ්චව නත්‍ථිතඤ්ච' මේ ලෝකය - එහෙම නැත්නම් මේ ලෝකයා - දෘෂ්ටි දෙකක් ඇසුරු කරගෙනයි සිටින්නේ. මොකක්ද, එක්කෝ අස්තිත්‍වය එහෙම නැත්නම් නාස්තිත්‍වය. 'ඇත සහ නැත' කියන දෘෂ්ටි දෙකකට හේත්තු වෙලයි ලෝකයා ඉන්නේ. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා පුදුම විධියේ මැදුම් මඟක්. 'ලොක සමුදයං ඛො කච්චාන යථාභූතං සමමපපඤ්ඤාය පසසතො යා ලොකෙ නත්‍ථිතා සා න හොති' කච්චායන, ලෝකයේ හටගැන්ම යථාභූත වශයෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දකින්නහුට ලෝකය පිළිබඳ නැත යන ඒ දෘෂ්ටිය නැති වෙලා යනවා. ඊළඟට අනික් පැත්තට කියනවා "ලොක නිරොධං ඛො කච්චාන යථාභූතං සමමපපඤ්ඤාය පසසතො" ලෝක නිරෝධය යථාභූත වශයෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දකින්නහුට. 'යා ලොකෙ අත්‍ථිතා සා න හොති' ලෝකයේ සියල්ල ඇත කියන දෘෂ්ටිය නැති වෙලා යනවා. මේ කියන්නේ - කෙටියෙන් සලකාගන්න ශාස්වත උච්ඡේද දෘෂ්ටි දෙකයි.

ඊළඟට තව දුරටත් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. ලෝකයාගෙන් වැඩි වශයෙන්ම මෙන්න මේ විධියටයි පුරුදු වෙලා තියෙන්නේ. අමුතු වචන කීපයක් සඳහන් වෙනවා. උපය, උපාදාන, අභිනිවෙස, අධිට්ඨාන ඔය විධියේ වචන මාලාවක්. සිංහලෙන් කීවොත් ලෝකයාගේ සිරිත නොයෙකුත් දෘෂ්ටිවලට ළං වෙනවා. අල්ලාගන්නවා. ඒවා ඇතුළට රිංගා ගන්නවා. ඇතුල් වෙනවා. ඊළඟට ඒවායේ දැඩිව පිහිටගන්නවා. ඔන්න ඔය විධියේ ස්වභාවයක් ලෝකයා තුළ තියෙනවා. නමුත් ඔන්න බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා යම් කෙනෙක් එහෙම ඒ විධියට දෘෂ්ටිවලට ළං වෙලා අල්ලාගෙන ඒවාට ඇතුල් වෙලා මේක මම, මගේ ආත්මයයි. මේ මගේ ආත්මයයි කියලා පිහිටන්නේ, නැත්නම්

එහෙම ස්ථාවරයක් ගන්නේ නැත්නම්, එතකොට ඊළඟට බුදුරජාණන් වහන්සේ වදාරනවා. 'දුකඛමෙව උපපජජමානං උපපජජති දුකඛං නිරුජඣමානං නිරුජඣතී ති න කඞඛති න විචිකිචඡති අපරපපචචයා ඤාණමෙවසස එත්ථ හොති' එහෙනම් ඒ භික්ෂුවට ඒ තැනැත්තාට මෙන්න මේ විධියේ අවබෝධයක් එනවා. 'උපදනේ දුකක්ම උපදී. නිරුද්ධ වන්නේ දුකක්ම නිරුද්ධ වෙයි' කියන ඒ ප්‍රත්‍යක්ෂ ඥානය ඇති වෙනවා. යථාභූත වශයෙන් ප්‍රත්‍යක්ෂ ඥානය ඇති වෙනවා. ඊළඟට ප්‍රකාශ කරනවා 'එත්තාවතාච ඛො කචචාන සමමා දිට්ඨි හොති' මෙතෙකිනුත් කච්චායන කෙනෙක් සම්මා දිට්ඨිය ඇත්තෙක් වෙනවා.

එයින් පෙනෙන්නේ දැන් මේ පින්වතුන් අහල තියෙනවා මධ්‍යම ප්‍රතිපදාව ධම්මචක්කපපවත්තන සූත්‍රයේ[3] තිබෙන - කාමසුඛල්ලිකානුයෝගය අත්තකිලමථානුයෝගය දෙකට මැදින් තිබෙන - ආර්ය අෂ්ටාංගික මාර්ගය. මෙන්න මේ සූත්‍රය මේකත් බුද්ධ දේශනාවක්. එතකොට මේ දේශනාවේ කියැවෙන්නේ අන්න අර විධියට ඒ අන්ත දෙකට නොගිහින් ඊළඟට ඒක කෙළවර කරනවා. ඒ පාඨය තමා වඩාත් වැදගත් වන්නේ මෙහෙම කියලා මෙතෙකිනුත් සම්මා දිට්ඨිය ඇති වෙනවා කියලා. ඊළඟට හකුළුවා දක්වනවා බුදුරජාණන් වහන්සේ "සබබං අත්ථීති ඛො කචචාන අයමෙකො අනෙතා සබබං නත්ථීති අයං දුතියො අනෙතා. එතෙ තෙ උභො අනෙතා අනුපගමම මජෙඣන තථාගතො ධමමං දෙසෙති අවිජජා පචචයා සංඛාරා සංඛාර පචචයා විඤඤාණං විඤඤාණ පචචයා නාමරූපං" කියලා ඒ විධියට "එවමෙතසස කෙවලසස දුක්ඛකඛනධසස සමුදයො හොති" ඊළඟට අනික් පැත්ත කියනවා. 'අවිජජායතෙවව අසෙසවිරාගනිරොධා සංඛාර නිරොධො සංඛාර නිරොධා විඤඤාණ නිරොධො' ආදී වශයෙන් කියලා 'එවමෙතසස කෙවලසස දුක්ඛකඛනධසස නිරොධො හොති'. ඔන්න හකුළුවා දක්වන පාඨය ඉතාමත්ම වැදගත්. 'සබබං අත්ථීති' සියල්ල ඇත යන මෙය එක අන්තයකි. සියල්ල නැත යන මෙය දෙවන අන්තයයි. මේ අන්ත දෙකටම නොපැමිණ මධ්‍යම මගකින්, මැදුම් මගකින් තථාගත තෙම ධර්මය දේශනා කරයි. මොකක්ද මැදුම් මග? අන්න පටිච්ච සමුප්පාද ධර්මයයි.

දැන් එතකොට මේ පින්වතුන් සලකාගන්න පටිච්ච සමුප්පාද ධර්මයෙ - කලිනුත් සඳහන් කළා - අනුලෝම වාරයක් තියෙනවා. පටිලෝම වාරයක් තියෙනවා. අනුලෝම පටිලෝම වශයෙන් අවිජජා පචචයා සංඛාරා සංඛාර පචචයා විඤඤාණං. මේ විධියට ගිහිල්ලා මෙසේ මේ සියලු දුක්ඛසකඛනධය

ඇතිවෙනවා කියලා ප්‍රකාශ කරනවා. ඊළඟට අනිත් පැත්තට කියනවා එසේ නමුත් අවිද්‍යාවගේම සම්පූර්ණ නිරෝධ වීමෙන් සංඛාරත් නිරුද්ධ වෙනවා. විඤ්ඤාණයත් නිරුද්ධ වෙනවා. අන්න හිතාගන්න මේ පටිච්ච සමුපපාදයේ තියෙන අනුලෝම පටිලෝම වාර දෙක. ඒක තුළින් අන්න අර කියාපු අන්ත දෙකටම මැදින් මැදුම් මගක් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කර වදාළා. ඉතින් මෙන්න මේ මැදුම් මග පිළිබඳ කථාවේදී අපි කල්පනා කරන්න ඕනෑ මෙතෙක් අර අපට පුරුදු වෙලා තියෙන්නේ ඒ කියාපු අෂ්ටාංගික මාර්ග මැදුම් මඟ. ඒකට හේතුවත් මේ පින්වතුන් සලකා ගන්න. ඒ පස් වග මහණුන් වහන්සේලාට දේශනා කළ ඒ දේශනාව ධම්මචක්කපපවත්තන සූත්‍රය ඇත්ත වශයෙන් ශ්‍රේෂ්ඨ හැටියට සලකන ප්‍රථම ධර්ම දේශනාව. නමුත් ඒකට හේතුව අරකයි. බුදුරජාණන් වහන්සේ කෙරෙහි සැක ඇති කරගත්තා පස් වග මහණුන් උන්වහන්සේ අර දුෂ්කරක්‍රියා අතහැරිය නිසා. ඒක නිසා අර කියාපු අන්ත දෙකින් මිදිලා ඒ ආර්ය අෂ්ටාංගික මාර්ගය - ඒක තුළත් පටිච්ච සමුප්පාද ධර්මය සියුම් අන්දමින් ගැබ් වෙනවා. නැතිව නොවේ. නමුත් ඒ හරිය මතු කළේ ඒ නිසයි.

නමුත් මේ කියාපු මැදුම් මග ගැන අවාසනාවකට වාගේ අපේ අටුවා සම්ප්‍රදාය සෑහෙන පමණ සැලකිල්ලක් යොමු කරලා නැහැ. ඒ නිසාම ඉතාමත්ම වටිනා නිවන පිළිබඳ සූත්‍ර දේශනා රාශියක් දුරවබෝධ වෙලා තියෙන බව කියන්න සිද්ධ වෙනවා. ඒක මෙන්න මේ කියාපු මැදුම් මග, අර අන්ත දෙකට මැදින් පටිච්ච සමුප්පාදය තුළින් ලෝකයේ ඇති වීමත් - නැති වීමත්. ඒක නිසාම තමා මේ පින්වතුන් දන්නවා අර අපි කලිනුත් කීවේ අර ප්‍රත්‍යක්ෂ ඥානය ආවාම බුදුවරුන් "සමුදයො සමුදයො" 'හටගන්නවා හටගන්නවා' 'නිරුද්ධ වෙනවා නිරුද්ධ වෙනවා' කියලා ඒ අන්තවලට මැදින් නිරන්තරව හටගන්නා ස්වභාවයත් නිරුද්ධ වන ස්වභාවයත් සලකා බැලීම තුළින් අන්න ඒ මැදුම් පිළිවෙතයි.

ඉතින් මේ මැදුම් පිළිවෙතට අදාළ වටිනා සූත්‍ර මීට කලිනුත් අපි දේශනා කරලා තියෙනවා නොයෙකුත් අවස්ථාවල. ඉතාමත්ම ජනප්‍රිය නමුත් ගැඹුරු සූත්‍ර දේශනාවක් තමා - කියනකොට මතක් වේවි - 'බාහිය සූත්‍රය'[4]. මේ බාහිය සූත්‍රයෙත් අඩංගු වෙන මැදුම් මග බොහෝදෙනාට සලකා ගන්න බැහැ. අපි ඒක මතක් කරගනිමු. බාහිය දාරුචීරිය කියන තාපසතුමා මහා සංසාරික පුණ්‍යස්කන්ධයක් ඇති කෙනෙක්. ඒ කතන්දරය අපි කියනවා

නොවේ. ඒ තාපසතුමා තමන්ම භාවනා කරලා රහත්ය කියලා හිතාගෙන ඉඳලා පස්සේ යම් කිසි දේවතාවකුගෙන් ලැබුන පණිවිඩයක් ඔස්සේ පුදුම විධියේ උනන්දුවකින් උද්‍යෝගයකින් ඉක්මන්කමකින් බුදුරජාණන් වහන්සේ සොයාගෙන ආවා. බුදුරජාණන් වහන්සේ පිණ්ඩපාතය වඩින වෙලාව. බුදුරජාණන් වහන්සේ යම් කිසි හේතුවක් නිසා - මහා කාරුණිකයන් වහන්සේ නමුත් - යම් කිසි හේතුවක් නිසා කීවා 'බාහිය අපි මේ පිණ්ඩපාතය වඩින වේලාව බණ කියන වේලාව නෙවෙයි' කියලා තුන්වරක්ම ප්‍රතික්ෂේප කළා. ඒ තුළින් බාහිය දාරුචීරිය තාපසතුමා ඊළඟට ඇවිටිලි කළා මට ටිකක් කියන්න කෙටියෙන් කියන්න දේශනා කරන්න. ඒ විධියට බොහොම සාවදානව කන්දෙන්න සූදානම් වුනාම ඔන්න එතකොට දේශනා කළා පුදුම විධියේ දේශනාවක්. එහෙමනම් බාහිය මෙන්න මෙහෙම හික්මෙන්න. "දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති - සුතෙ සුතමත්තං භවිස්සති - මුතෙ මුතමත්තං භවිස්සති - විඤ්ඤාතෙ විඤ්ඤාත මත්තං භවිස්සති" - ඉස්සර වෙලා ඒ ශික්ෂා මාර්ගය ප්‍රකාශ කරනවා. "එසේ නම් බාහිය මෙසේ හික්මෙන්න. කොහොමද, දුටුවෙහි දුටු මතින් නතර වෙන්න. දුටුවෙහි දුටු මත දුටු මාත්‍රය වන්නේය. දුටු බව පමණක්ම වන්නේය. ඒ වගේ ඇසුණෙහි ඇසුණ බව පමණක්ම වන්නේය. දැනුණෙහි දැනුණ බව පමණක් වන්නේය. සිතුණෙහි එහෙම නැත්නම් දැනගතුයෙහි දැනගත් පමණක්ම වන්නේය."

ඊළඟට ප්‍රකාශ කරනවා ඒ ශික්ෂණයෙහි අවසාන ප්‍රතිඵලය. "යම් අවස්ථාවක බාහිය ඔබ මෙන්න මේ විධියට මෙන්න මේ ශික්ෂණය සම්පූර්ණ කළොත්" බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා "තතො ත්වං බාහිය න තෙන, යතො ත්වං බාහිය න තෙන, තතො ත්වං බාහිය න තත්ථ, යතො ත්වං බාහිය න තත්ථ, තතො ත්වං බාහිය නෙව ඉධ න හුරං න උභය අන්තරෙන එසොව අන්තො දුක්ඛස්ස" යම් අවස්ථාවක බාහිය අර විධියට ඔබ දුටුවෙහි දුටු මතින් නතර වෙනවා නම් දුටුව දුටුවක් මිසක් දුටු දෙයක් හැටියට ගන්නේ නැත්නම්, අපි ටිකක් තේරුම් කළොත් දුටුදෙයක් හැටියට ගන්නේ නැත්නම්, ඇසුණ දෙයක් හැටියට ගන්නේ නැත්නම්, දැනුන දෙයක් හැටියට ගන්නේ නැත්නම්, සිතුණ දැනගත්තු දෙයක් හැටියට ගන්නේ නැත්නම්, ඒ විධියට මඤ්ඤනා වශයෙන් එහෙම හිතාගන්නේ නැත්නම් එතකොට තතො ත්වං බාහිය න තෙන - එහෙම නම් බාහිය ඔබ එයින් නොවන්නේය. ඒක මහ පුදුම විධියේ කියමනක් එතන තියෙන්නේ. බොහෝ දෙනාට සලකාගන්න බැහැ. වීජ ගණිතමය ප්‍රශ්නයක් වගේ. එවිට බාහිය

ඔබ එයින් නොවන්නේය. යම් විටක බාහිය ඔබ එයින් නොවන්නේද, එවිට බාහිය ඔබ එහි නොවන්නේය. යම් විටක බාහිය ඔබ එහි නොවන්නේද එවිට බාහිය ඔබ මෙහිත් නැත, එහිත් නැත, මේ දෙක අතරෙත් නැත. මෙයම දුකෙහි කෙළවරයි. මහ පුදුම දේශනාවක් මේ පින්වතුන්ට සලකාගන්න බැරි තරම් ගැඹුරුයි. ඉතින් අරකයි අදහස. සාමාන්‍ය ලෝකයා දුටුව දුටුව හැටියට සලකන්නේ නැහැ. දුටුව දුටු දෙයක් හැටියට නේ. මේක අපි හිතමු. පුටුව පුටුවෙන් පුටුවෙහි කියන අදහස තියෙනවා. ඒ වගේම හිතන්න ඇසුණෙහි ඇසුණ මාත්‍රයෙන් නවතින්නේ නැතිව සංගීතයක් හදාගත්තා නම් සංගීතයෙහි සංගීතයෙන් ඔන්න ඔය විධියට හිතාගන්න, කෙටියෙන්. ඒ වගේ අර දුටු මතින් නතර වෙන්නේ නැතිව ඒ පිළිබඳව දෙයක් කියලා ගත්තු තැන අන්න එතකොට ඒ දෙය ආශ්‍රයෙන් 'තෙන' කිව්වේ එයින් හිතන්න පුළුවන්. ඊළඟට 'ඒ තුළ' කියලා හිතන්න පුළුවන් අන්න එහෙම චින්තන මාර්ගයකුයි. අපි කලින් කිව්ව, භාෂා ව්‍යවහාරය තුළයි මේ සංසාර ගැටළුව තියෙන්නේ කියලා හැංගිලා. ඉතින් හිතාගන්න පුළුවන් ඒ විධියට පුටුවෙහි ආදී වශයෙන් ඒ වගේ ගත්තෙ නැති නම් ඔන්න එතකොට මෙහිත් නැත එහිත් නැත අර කියාපු අන්ත දෙකම නැත. ඊළඟට මැදත් නැහැ. අන්ත දෙක නිසානෙ මැදක් තියෙන්න. "න උභයමන්තරෙන" අර කියාපු අන්ත දෙකෙනුත් මිදිලා මැදත් ස්ථාවරයක් නොගන්නා එක එතන තමයි කච්චානගොත්ත සූත්‍රයේ කිව්වේ මේ මගේ ආත්මය කියලා ගන්නෙත් නැහැ උපදනේ දුකක්ම උපදී. නිරුද්ධ වන්නේ දුකක්ම නිරුද්ධ වෙයි. අන්න එතනම නිවන. අන්න ඒකයි දුකේ කෙළවරයි කියලා කිව්වේ. අන්න එතකොට ඒ සූත්‍රය අපට තව දුරටත් තේරුම්ගන්න පුළුවන්.

ඊළඟට ඒ වගේම වටිනා සූත්‍රයක් තියෙනවා. ඒත් කෙටි එකක්. උදාන පාළියේම, දැන් අරක - බාහිය සූත්‍රය - තියෙන්නෙත් උදාන පාළියේම. ඒ වගේම උදානපාළියේ ඉතාම වටිනා සූත්‍රයක් තියෙනවා පාටලී ගාමිය වග්ගයේ. බුදුරජාණන් වහන්සේ නිවන පිළිබඳව - නිබ්බානපටිසංයුත්ත - නිවන පිළිබඳ ධර්ම දේශනාවක් සංඝයා වහන්සේලාට දේශනා කරනවා. දිග දේශනාවක් නෙවෙයි හරිම කෙටියි. ඒකත් අර වගේම මේ කාලයේ වීජ ගණිතමය ප්‍රහේලිකාවක් වගේ. කොහොමද ඒ දේශනාව.

නිස්සිතස්ස චලිතං
අනිස්සිතස්ස චලිතං නත්‍ථි

චලිතෙ අසති පස්සද්ධි
පස්සද්ධියා සති නති න හොති
නතියා අසති ආගති ගති න හොති
ආගති ගතියා අසති චුතුපපාතො න හොති
චුතුපපාතෙ අසති නෙවිධ න හුරං න උභයමන්තරෙන
එසෙවන්තො දුක්ඛස්සාති[5]

අර වගේ පුදුම දේශනාවක්. මෙන්න මේ පළමුවෙන්ම කියාපු වචනය මේ පින්වතුන්ට දැන් හුරුයි. "නිස්සිතස්ස චලිතං" නිස්සිත කියන වචනය අපි කිව්වානේ ද්වයනිස්සිත කථාව. ඒ කියන්නේ නිස්සිත කියල කියන්නේ මොකකට හරි හේත්තු වෙලා. මොකක් හරි බදාගෙන හරි - අපි කිව්වේ ශාස්වත උච්ඡේද වගේ ඒ දෘෂ්ටිවලට හේත්තුවෙලා ඉන්න කෙනාට චලිතයක් තියෙනවා. සලිතයක් තියෙනවා. දැන් හිතාගන්න මොකකට හරි හේත්තු වෙලා ඉන්නවා නම් ඒක සෙලවෙනකොට තමනුත් සෙලවෙනවා නේ. ඒ ඩිංග පළමුවෙන් මතු කරලා දෙනවා බුදුරජාණන් වහන්සේ. 'නිස්සිතස්ස චලිතං' යමකට හේත්තු වෙලා ඉන්න කෙනාටයි සලිතයක් තියෙන්නේ. හෙලවීමක් තියෙන්නේ. හේත්තු වන්නේ දෘෂ්ටියට. දෘෂ්ටියකට හේත්තුවෙනවා. ඊළඟට අනික් පැත්ත කියනවා "අනිස්සිතස්ස චලිතං නත්ථි" ඒ විධියට යමකට හේත්තු වන්නේ නැත්නම් අර කච්චානගොත්ත සූත්‍රයේ කිව්වා වගේ යමකට හේත්තු වන්නේ නැත්නම් මැදුම්මගින් 'අනිස්සිතස්ස චලිතං නත්ථි' චලිතයක් නැහැ. චලිතයක් නැත්නම් 'පස්සද්ධි' කියලා කියන්නේ සන්සුන් බවක් ඇත. 'පස්සද්ධියා සති නති න හොති' සන්සුන් බවක් ඇත්නම් නති කියන නැඹුරු වීමක් නැත. ඒකත් ගැඹුරින් ගත්තොත් තණ්හාවක් නැඹුරු වීමක් නැත. ඊළඟට කියනවා නැඹුරු වීමක් නැති කල්හි 'ආගති ගති න හොති' - මහ පුදුම දේශනාවක් නැඹුරු වීමක් ඇති කල්හි නේ යාමක් හා ඊමක් තියෙන්නේ. නැඹුරු වීමක් තියෙන්නේ කොහාට හරි වැටෙන්නනේ. නැඹුරුවීමක් නැත්නම් ඊමක් සහ යාමක් නැත. ඔන්න ඊළඟට ඊමක් සහ යාමක් නැත්නම් චුතියක් හා උත්පත්තියක් පිළිබඳ කතාවකුත් නැත. චුත වීමක් සහ නැවත ඉපදීමක් පිළිබඳ කථාවකුත් නැත. එතකොට 'චුතුපපාතෙ අසති' චුතියක් සහ උත්පත්තියක් නැත්නම් එහෙම නම් 'නෙවිධ න හුරං න උභයමන්තරෙ.' මෙතනත් නැහැ එතනත් නැහැ. ඒ දෙක අතරත් නැහැ. මෙයම දුකෙහි කෙළවරයි.

අන්න එතැනටත් එන්නෙ අපි කලින් කිව්වානේ භාෂා ව්‍යවහාරය

තුළයි මේ සංසාර ගැටලුව හිර වෙලා තියෙන්නේ කියලා. ඒකත් අපිම හදාගත්තු ගැටලුවක්. භාෂා ව්‍යවහාරය තර්ක ආදිය. ඉතින් ඒක ඉක්මවා යනවා. අතක්කාවචර ධර්මය කියන්නෙම ඒක නිසයි කියලා හිතාගන්න. අර කියාපු දෘෂ්ටි අර කියාපු කොන් දෙක අල්ලන්නේත් නැහැ මැද අල්ලන්නෙත් නැහැ. මහ පුදුම ධර්මයක්. එතකොට ඒ විධියට හික්මෙනවා නම් අන්න එතැනම නිවනයි කියන එකයි.

ඉතින් ඔන්න ඔය අදහස් ටික අපි ඉදිරිපත් කළේ අර කිව්ව වගේ ගාථා දෙකට අටුවාවක් වගේ. දැන් අපි ගාථා දෙකට ආයෙත් හිත යොමු කරමු. ජාති මරණ සංසාරං - යෙ වජනති පුනප්පුනං- ඉත්ථභාවඤ්ඤථාභාවං' අන්න අමුතු වචන දෙකක් එතැන තියෙන්නේ. 'මෙසේ බව අන්සේ බව' උපත සහ මරණය කියලා කියන්නේ මෙසේ බව හා අන්සේ බව. උපතත් මරණයත් අතර මාරු වීමම තමා මෙසේ බවත් අන්සේ බවත් අතර මාරු වීම. ටිකක් හිතා බලන්න එතකොට මෙසේ බව හා අන්සේ බව. ඉත්ථභාවඤ්ඤථාභාවං මේකම තමා අවිද්‍යාවගේ ගමන. කාගේවත් ගමන නොවේ. අවිද්‍යාවගේ ගමන. ඒක නිසා අවිද්‍යාව මහා මෝහයක්. ඊළඟ ගාථාවේ කීවා. ඉතින් මෙතන තිබෙන මේ කාරණය - මෙතන වැදගත් වචන දෙක තමයි 'ඉත්ථභාව අඤ්ඤථාභාව.'

මේක මේ පින්වතුන්ට මහා නිදාන සූත්‍රය විවරණය කරන අවස්ථාවේ මතක ඇති සමහර විට අර බුදුරජාණන් වහන්සේ ආනන්ද ස්වාමීන්වහන්සේට පියවරක් පියවරක් පාසා පටිච්ච සමුප්පාදය පිළිබඳව විශේෂයෙන්ම විඤ්ඤාණයත් නාමරූපයත් පිළිබඳ අන්‍යෝන්‍ය සම්බන්ධතාව පෙන්නුම් කරන අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා "ආනන්ද, විඤ්ඤාණය මව්කුසට බැහැලා එයින් ගිලිහී ගියොත් නාම රූපයක් ඉත්ථත්තයක් සඳහා උපදීද?"[6] අන්න එතන ඉත්ථත්ත වචනය තියෙනවා. ඉත්ථත්ත කියන්නේ පින්වතුනි ඉත්ථභාවයමයි. දැන් නානත්ත කියන්නේ නානාභාවය නේ. ඉත්ථත්ත කියන්නෙත් ඉත්ථභාව කියන්නෙත් එකයි කියලා හිතාගන්න. දැන් අතන කියපු ඉත්ථත්තය එයින් අපට යමක් හිතාගන්න පුළුවන්. එතකොට විඤ්ඤාණයත් නාමරූපයත් මව්කුසේ එකතුව තියෙන වෙලාවේ තමයි බලාපොරොත්තු වන්න පුළුවන් දරුවෙක්. විඤ්ඤාණය ගිලිහී ගියොත් අපි කලින් කියලා තියෙනවා මස්ගුලියක් එළියට එන්නේ. එතකොට ඒ දෙක එකට යනවා නම් තමයි අන්න ඊළඟට ලෝකයට උපන්නට පස්සේ 'මෙසේ බවක්.' මොකද, උපන්න

දරුවා වටපිට බලනකොට සළායතන ලෝකයක ඉපදිලා. එතන තමයි 'මෙසේ බව'. එතකොට මෙසේ බව කියන්නේ උපතටයි. අන්සේ බව කියන්නේ එතන ඉඳලා යන ජරා මරණ ගමනයි. එතකොට ඉත්ථභාව අඤ්ඤථාභාව කියන දෙක ඈඳුත්තක්. ලෝකයා බැලුවා මරණයෙන් වෙන් කරලා ජාතිය විතරක් තියාගන්න. ඒක බෑ කරන්න. ඒ දෙක ඈඳුත්තක්.

එතකොට ඉත්ථභාව කියන්නේ උපතයි. යමක් පිළිබඳව ග්‍රහණය කළ හැටියේ 'මෙසේ' හැටියට මෙය 'දෙයක්' හැටියට ගත්තු හැටියේ එතන ඉඳලාම තමා වෙනස් වීම තියෙන්නේ. අනිත්‍යතා ධර්මයට යට වෙලා. ඉත්ථභාව අඤ්ඤථාභාව කියන්නේ උපතත් මරණයත් කියන දෙකයි. ඒ දෙකෙන් හැඳින්වෙන්නේ ඉත්ථභාවඤ්ඤථාභාවං-අවිජ්ජායෙව සා ගති අර කිව්වෙත් ඒකයි.

එතකොට මෙන්න මේ ඉත්ථභාව අඤ්ඤථාභාව තුළ තියෙන ඔය අදහස දුන් තව දුරටත් ප්‍රකාශ කරන වටිනා සූත්‍රයක් තියෙනවා. සූත්‍ර හුඟක් කිව්වට මේ පින්වතුන් බරක් හැටියට හිතන්න එපා. ඒත් ඉතාමත්ම වටිනා සූත්‍රයක් නිසා අපි කලින් අවස්ථාවකත් දේශනා කළ නමුත් මතු කරන්නේ. බුදුරජාණන් වහන්සේ සම්බෝධි ලාභයෙන් පස්සේ ඒ බෝධි පර්යංකයෙන්ම ඉඳගෙන උරුවෙලාවෙ නෙරංජනා නදී තෙර සමාධියෙන් වැඩ ඉඳලා සත් දිනකට පසු නැගිටලා ලෝකය දෙස බුදු ඇසින් බලා වදාරළා මෙන්න මෙහෙම ප්‍රකාශ කළා කියනවා. මහපුදුම උදාන ගාථාවක්. පුදුම විධියේ උදාන ගාථාවක්. ප්‍රබල උදාන ගාථාවක්. කියනකොට ඇත්ත වශයෙන් බුදුරජාණන් වහන්සේට ලෝකය දෙස බලන විට කොයි තරම් සංවේගයක් තිබුණද කියලා හිතෙනවා.

**අයං ලොකො සනතාපජාතො එසසපරෙතො - රොගං වදති අතතතො**
**යෙන යෙනහි මඤ්ඤති - තතො තං හොති අඤ්ඤථා**[7]

ඒ කියන්නෙ ඒකේ තේරුම ඉස්සර වෙලා කියලා හිටිමු. මේ ලෝකයා සනතාපජාතො. සන්තාපයට පැමිණ - එතන සූත්‍රයේ තියෙන්නෙ බුදුරජාණන් වහන්සේ බුදු ඇසින් දැක්කයි ලෝකයා රාග දෝස මෝහවලින් නානාවිධ සන්තාපයන්ගෙන් තැවෙනවා, පරිලාහයන්ගෙන් දැවෙනවා. ඒ දැකලයි මේ ගාථාව ප්‍රකාශ කළා කියලා ඒ සූත්‍රයේ සඳහන් වන්නේ. එතකොට පළමුවෙන් කිව්වේ මේ ලෝකය එහෙම නැත්නම් මේ ලෝකයා සන්තාපයට පත් වෙලා "සනතාපජාතො එසස පරෙතො" ස්පර්ශයට

ගැති වෙලා "රොගං වදති අත්‍තතො" රෝගයකටයි ලෙඩකුඩුවකටයි ආත්මය කියලා කියන්නේ. ලෙඩ කුඩුව මොකක්ද කියලා හිතාගන්න පුළුවන් නේ. ලෙඩ කුඩුවකට ආත්මය කියලා කියනවා. ඒ ලෙඩකුඩුව ආත්මය හැටියට ගැනීම නිසා මොකක්ද වෙන්නේ කියන එක ඔන්න වටිනා පාඨයක් තියෙනවා. 'යෙන යෙන මඤ්ඤති තතො තං හොති අඤ්ඤථා' අන්න 'යෙන' කියන වචනය එතන තියනවා. යම් යම් දේකින් මඤ්ඤනා කරත්ද වටිනා වචනයක් එතන - මඤ්ඤනා කියන්නේ හිතාගනින්ද යම් යම් දේකින් මඤ්ඤනා කරත්ද කියන්නේ අර කිව්ව ආත්මය කියලා ගත්තා. මේ උපන්න දරුවා මේ මම, ලෝකයේ ඉන්න කෙනෙක් කියලා ගත්තා. "යෙන යෙනහි මඤ්ඤති." ඒ ගත්තු අවස්ථාවේ ඉඳලාම "තතො තං හොති අඤ්ඤථා" ඒ එක්කම අනිත්‍යතා විෂ බීජය ඒකට කාවැදිලා වෙනස් වෙන්න පටන්ගන්නවා. බලාපොරොත්තු නැතත්. "යෙන යෙනහි මඤ්ඤති තතො තං හොති අඤ්ඤථා"

ඊළඟට 'අඤ්ඤථාභාවී භවසත්තො ලොකො භවපරෙතො භවමෙවාභිනන්‍දති, යදභිනන්‍දති තං භයං. යස්‍ස භායති තං දුක්‍ඛං භවවිප්‍පහානාය ඛො පනිදං බ්‍රහමචරියං වුස්‍සති'[8] මහ පුදුම විධියේ දේශනාවක් ඒක. "අඤ්ඤථාභාවී භවසත්තො ලොකො භවපරෙතො භවමෙවාභිනන්‍දති" ඒකෙ තේරුම අන්සේ බව, එහෙම නැත්නම් වෙනස් වන ස්වභාවය ඇති මෙ භවයේ ඇලුණු ඊට ගැති වුණු ලෝකයා භවයෙහිම තුටු වෙනවා. භවයේ ස්වභාවය වෙනස්වීමයි. නමුත් මේ භවයේ ඇලුණු ලෝකයා භවයට ගැති වුණු ලෝකයා භවයම පතනවා. "යදභිනන්‍දති තං භයං" යමක් පිළිබඳව සතුටු වෙනවා නම්, ඒ භයක්, අනතුරාවක්. "යස්‍ස භායති තං දුක්ඛං" යමකට බිය වෙනවාද එය දුකක්. මොකටද බියවන්නේ? භවය ගැන සතුටු වෙනවා නමුත් භවය වෙනස්වීම ගැන කැමති නැහැ. ඒකට බයයි. ඔන්න එතකොට දැන් සළකාගන්න **භවයේ ස්වභාවය වෙනස් වීමයි. නමුත් ලෝකයා භවය පතනවා වෙනස්වීමට කැමති නැහැ.** ඒක නිසා දුකට පත් වෙනවා. කොච්චර වටිනා කියමනක් ද? " යස්‍ස භායති තං දුක්ඛං" ඒක නිසා බුදුරජාණන් වහන්සේ ලෝකයට ඉදිරිපත් කරන්නේ විවරණය "භවවිප්‍පහානාය ඛො පනිදං බ්‍රහමචරියං වුස්‍සති" මේ ශාසන බ්‍රහ්මචරියාවේ පරමාර්ථය 'භවවිප්‍පහානාය' භව ප්‍රහානයයි කියලා ඒ දේශනාව අගදී කෙටියෙන් සඳහන් කළොත් මෙහෙමයි කියන්නේ. යම්තාක් මේ ලෝකයා - ලෝකයේ ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයින් භවයෙන් භවය, භවය උපකාර කරගෙන භවයෙන් මිදීමට තැත් කළා නම්

ඒ අය භවයෙන් මිදුනේ නැහැ. මේ කියන්නේ ශාස්වත දෘෂ්ටිය. යම් තාක් ලෝකයේ ශ්‍රමණ බ්‍රාහ්මණයින් විභවයෙන් භවයෙන් මිදීමට - විභවය කියන්නේ - උච්ඡේද දෘෂ්ටිය මගින් මේ භවයෙන් මිදෙන්න උත්සාහ කරා නම් ඒකත් හරිගියේ නැහැ. එහෙම කියලා අවසාන වශයෙන් කියනවා උපධි කියන උපාදාන අතහැරිය අවස්ථාවෙයි භවයෙන් මිදෙන්නේ කියල.

ඔන්න එතකොට හිතාගන්න අමුතු වචනයකුත් මතු වුනා. 'මඤ්ඤති' කියලා. අපි කලිනුත් කිව්වා සිතාගැනීම 'සිතාලුව' කියන්නේ 'සිතලුව' කියලත් කියන්නේ සිතාගත් දෙයක් කියලා. එතකොට අවිද්‍යාව නිසා ලෝකයා හිතාගන්නවා ලෝකෙට උපන්න අර දරුවා හිතාගන්නවා මමත් මිනිහෙක් කියලා මමත් මිනිහෙකුගෙ පොඩි එකෙක් කියලා දරුවෙක් කියලා. අම්මලා තාත්තලා දරුවකු කියලා හිතාගන්නවා. මේ නාමරූප විඤ්ඤාණ දෙක එකතු වුණ තැන. ඊළඟට හිතාගන්නවා ඊට පස්සේ ඉතින් කැමති වුණත් නැතත් වැඩීම කියලා කියන්නෙත් ජරාවයි. ජාති ජරා මරණ කියනවා මිසක් ආයේ වැඩීමක් ගැන කියන්නේ නෑනේ බුදුරජාණන් වහන්සේ. උපතේ ඉඳලම උපන් කෙසේ ඉඳලම වෙනස් වෙනවා. ඉතින් ජාතිය ඉඳලම තියෙන්නේ ජරා මරණ. මේ දෙක තුළයි තෙරපිලා ඉන්නේ. මේ ද්වයතාව තුළ ලෝකයා හිර වෙලයි ඉන්නේ. ඉතින් මේකට තමා බුදුරජාණන් වහන්සේ දුක්ඛ කීවේ. මේ දුක්ඛ කියන කෙටි වචනයට නානාවිධ නිරුක්ති ඒ ඒ උගතුන් දෙනවා. අපිත් අපේ පොඩි තරමින් අර නිවන දේශනාවලදී යම් කිසි නිරුක්තියක් දුන්නා. 'දුඃ' කියලා කියන්නේ දුක සේ, 'ඛ' කියලා කියන්නේ දරාසිටිනවා. එතකොට දුඃඛ කියන්නේ දුක සේ නමුත් දරාසිටිනවා. දරා සිටින නමුත් දුකක්. **දුක සේ නමුත් දරා සිටිනවා. දරා සිටින නමුත් දුකක්.**

අපි මේක තේරුම් කරන්න දන් මේ පින්වතුන්ට පොඩි උපමාවක් කීවොත්. අපි එක්තරා අවස්ථාවක සර්ප චක්‍රය පිළිබඳව උපමාවක් කීවා. ඒ කියන්නේ ඇත්ත වශයෙන්ම කියනවා නම් අපි කුඩා අවදියේදී පුවත් පතක දක්ක කාටුන් චිත්‍රයක් උපකාර කරගෙන ඒ අදහසයි ඉදිරිපත් කළේ. ඒ කාටුනයේ තියෙනවා - හිතාගන්න මේ පින්වතුන් කවුළු තුනක්. එහෙම නැත්නම් කොටු තුනක්. ඒ පළමුවෙනි කොටුවේ තියෙනවා සර්පයෝ දෙන්නෙක් එකිනෙකා ගිලගන්න උත්සාහ කරනවා. අපි කියමු නයයි පොළඟයි කියලා. එතකොට නයාගේ කටේ පොළඟගෙ වල්ගය. පොළඟගෙ කටේ නයාගේ වල්ගය. ඒ පළමුවැනි කවුළුව. දෙවෙනි කවුළුව

- මේ අර චිත්‍ර ශිල්පියාගේ දක්ෂකම. දෙවෙනි කවුළුවෙහි තියෙනවා නයා බාගයක් ගිලගෙන පොළඟව - පොළඟ භාගයක් ගිලගෙන නයාව. දැන් තියෙන්නේ **සර්ප චක්‍රයක්**. තුන්වෙනි කවුළුවේ මොකක්ද තියෙන්නේ? කලින් අවස්ථාවක පළමුවැනි දේශනාවේ අර අජිත්ගෙයි සුමිත්ගෙයි දාම් ඇදිල්ල ගැන කියනකොට වගේ මේ පින්වතුනුත් හිත යොදලා බලන්න. තුන්වැනි කවුළුවේ මොකක්ද තියෙන්නේ? අපි කියමු නයා පොළඟා ගිලගත්තොත් පොළඟා පෙනෙන්නේ නැහැ. පොළඟා නයා ගිලගත්තොත් නයා පෙනෙන්නේ නැහැ. ඒක නිසා තුන්වෙනි කවුළුවේ තියෙන්නේ **ශූන්‍යතා හිස් බවක් පෙන්වන ඉරි කෑලි ටිකක්.** නමුත් ඕක සිදු විය හැකි දෙයක්ද? තර්කයෙන් විතරයි ඒක සිද්ධ වෙන්නේ. තර්කයෙන් හිතන දෙයක් නමුත් ඒක සිද්ධ වන්නේ නැහැනේ. අන්න ලෝක තත්ත්වය තියෙන්නෙ අර මැද කියාපු සර්ප චක්‍රයෙමයි. හිර වෙලා. ඒකයි අපි කිව්වේ 'දුඃඛ' දූක සේ නමුත් දරා සිටිනවා. නයා දූකසේ නමුත් දරා සිටිනවා. කරගන්න බැහැ ගිලගන්න ගිහිල්ලා ඉවර කරගන්න බැහැ. අරයා පොළඟටත් එහෙමයි. දූක සේ නමුත් දරාගෙන - දරාගෙන නමුත් දූකක්.

ඉතින් මේකම තමා මේ පින්වතුන්ට හිතාගන්න කියන්නේ. දැන් මේ පින්වතුන් ඔය අය-වැය ගැන කථා කරනවා නේ. ඒ වගේම ගිලගැනීමක් තමයි. ඒක රාජ්‍ය මට්ටමින් ගත්තත්, ගෙදරදොරේ මට්ටමින් ගත්තත්, ඔය ස්වාමියත් භාර්යාවත් අතර නොයෙකුත් කලකෝලාහල ඇති වෙන්නේ මොකද? හේතුව, ආදායම වියදම ගිලගන්න උත්සාහ කරනවා. වියදම ආදායම ගිලගන්න උත්සාහ කරනවා. ඊළඟට හිතන්න ආර්ථිකය ගැන. උද්ධමනය ආදිය ගැන. සැපයුමයි ඉල්ලුමයි අතර ඒත් අර වගේ සර්ප චක්‍රයක්. ඊළඟට සමාජයේ නොයෙක් ආයතන ගැන හිතන්න. යුතුකම් අයිතිවාසිකම් ගිලගන්න බලනවා. අයිතිවාසිකම් යුතුකම් ගිලගන්න බලනවා. ඉතින් **වැඩවර්ජන**. ආර්ථික උද්ධමන. ඊළඟට අපේ ආශ්වාස ප්‍රශ්වාස ගැනත් හිතන්න. එතනත් හිර වෙලා. ලේ ධාවනය. නොයෙකුත් ආකාරයෙන් හැම පැත්තෙන්ම හිර වීමක් තියෙන්නේ. එතකොට අන්න එතැනමයි දූක. **එතනමයි** දූක. ඉතින් ඔය තත්ත්වය ලෝකයා අවබෝධ කරගත්තේ නැහැ. නමුත් අර භවය පතනවා. උපත පතනවා. **උපත පතනවා. මරණයට කැමති නැහැ.**

මරණයට කැමති නැති කතන්දරය කියනකොට තවත් පොඩි උපමාවක් කියමු. දැන් මේ පින්වතුන්ට කොයි තරම් ගැඹුරු දේවල් කිව්වත් සමහර

විට උපමාව තුළින් තේරුම්ගන්න පුළුවන්. මේ වේලාවේ ඔය ගමේ ගොඩේ උපමාවක්ම කියමු. **නිතර කසිප්පු බොන සියදෝරිස් අප්පු හදිස්සියේ මළා.** සාමාන්‍යයෙන් හදිසි මරණයක් වුනාම හදිසි මරණ පරීක්ෂණයක් තියෙනවා. නමුත් නිල වශයෙන් හදිසි මරණ පරීක්ෂණය පැවැත්වෙන්න කලින් එක එක්කෙනා තම තමන්ගේ මරණ පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කරන සිරිතක් ගමේ ගොඩේ තියෙනවා. අපි ඉස්සර වෙලාම ගමේ හාමුදුරුවන්ගෙන් අහමු සියදෝරිස්ගෙ මරණයට හේතුව. හාමුදුරුවෝ කියාවි සියදෝරිස් දායක මහත්මයා මළේ පස්වෙනි ශික්ෂා පදය රැක්කේ නැති නිසා. ඊළඟට විදුහල්පතිතුමාගෙන් අහමු. මේ මනුස්සයා මළේ නූගත්කම නිසයි කියාවි. මන්ත්‍රීතුමාගෙන් අහමු. මන්ත්‍රීතුමා කියාවි මේ සියදෝරිස් ඡන්දදායක මහත්මයා මළේ දුප්පත්කම නිසා. මැරුණ වේලාවේ ඇඳ ළඟ හිටිය සියදෝරිස්ගේ භාර්යාවගෙන් අහමු. කියාවි හුස්ම ගන්න බැරිවුණ නිසා කියලා. ඊළඟට නමුත් මරණ පරීක්ෂක මොකක්ද කියන්නේ? අධික ලෙස මත්පැන් බීම නිසා ඇති වන යම් කිසි රෝගයක් නිසා නැති වුණා කියලා. මේ ඔක්කොම **අර්ධ සත්‍ය. ඔක්කොම අර්ධ සත්‍ය. බුදුරජාණන් වහන්සේගෙන් ඇහුවොත් කියන්නේ සියදෝරිස් මළේ උපන්න නිසයි.** අරවා ඔක්කොම සියදෝරිස්ට මරණයෙන් නිදහස්වෙන්න කාරණා විතරයි. නියම හේතුව උපන්න නිසයි. සියදෝරිස් උපන් නිසයි මැරුණේ. මේ පින්වතුන් හිනා වුනාට මොකද. ඕන කෙනෙක් අහන්න පුළුවන්. ඕක අපට කියන්න දෙයක්ද? අපි දන්නවා නේ. **නමුත් ඕකමයි කියන්න තියෙන්නේ ලෝකයාට. ඕකමයි දන්නේ නැත්තේ.**

ඕකමයි-අර මේ පින්වතුන් මතක් කරගන්න මහාපදාන සූත්‍රයේ විපස්සී බෝසතාණන් වහන්සේ - අපි පටිච්ච සමුප්පාදය ගැන විග්‍රහ කරන්න යනකොට පටන්ගන්නේ මුලින් "අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං" අපිට දැන් ලේසියි. නමුත් බුදු කෙනෙක් ඒ මහා පුදුම සත්‍යය මතු කරගත්තේ කොහොමද? යෝනිසෝමනසිකාරයෙන්. යෝනිසෝමනසිකාර කියලා කියන්නේ පින්වතුනි යමක් හටගන්නා තැනට යොමු කරලා මෙනෙහි කිරීම යෙදවීමයි. ඒක නිසා ඒ බුදුරජාණන් වහන්සේලා - අපේ බුදුරජාණන් වහන්සේත් ඒ විපස්සී බුදුරජාණන් වහන්සේත් පටිච්ච සමුප්පාදය හෙළි කරගත්තේ කොහොමද? ජරා මරණයේ ඉඳලා. **ජරා මරණයේ ඉඳලා**. අපි මීට කලින් කියලා තියෙනවා. මේ විධියට උන්වහන්සේ තමන් වහන්සේගෙන් ප්‍රශ්න කළා. "කිම්හි නු ඛො

සති ජරාමරණං හොති කිං පච්චයා ජරාමරණං" කුමක් ඇති කල්හිද ජරාමරණය? කුමක් ප්‍රත්‍යය කරගෙනද ජරාමරණය? ඔන්න එතකොට 'ජාතියා සති ජරා මරණං හොති ජාති පච්චයා ජරා මරණං' උපත ඇති කල්හි ජරා මරණය අන්න බලන්න ඉතින්. හිනා වෙන්න දෙයක් නොවේ නේ. ඒතෙක් මේ ලෝකයා තේරුම්ගත්තේ නැහැ ඒක. ඒ වෙනුවට නිදහසට කාරණා පෙන්නුම් කරනවා. ඉතින් ජරා මරණයට හේතුව බුදුකෙනෙක් කියන්නේ මොකටද කියන්න පුළුවන්. නමුත් බුදුවරු මතු කර ගත්තේ යෝනිසෝමනසිකාරයෙන් මූලිකම හේතුව මොකද මේ දුක නැති කරගැනීම සඳහා යොමුකර ගන්නව. අරගොල්ලෝ දුක නැතිකර ගැනීමට නොවේ නේ. පන්සිල් ගත්තත් නැතත්, මත්පැන් බීවත් නැතත් සියදෝරිස් මැරෙනවා. උගත් වුනත් නූගත් වුනත් සියදෝරිස් මැරෙනවා. පොහොසත් වුනත් දුප්පත් වුනත් සියදෝරිස් මැරෙනවා. හුස්ම හිර කර ගත්තත් නැතත් මැරෙනවා. අර රෝගය නැත්නම් වෙන රෝගයකින් හරි මැරෙනවා. නමුත් **උපත නැති කරගත්තොත් සියදෝරිස් මැරෙන්නේ නැහැ.**

ඉතින් ඊළඟට තව ටිකක් මතක් කරගන්න අර කියාපු පටිච්ච සමුප්පාද ධර්මය දැන් අර්ථවත් කරගන්න පුළුවන්නේ. මොකද යෝනිසෝමනසිකාරය අග කෙළවරේ ඉඳලා යන්නේ. ඊළඟට තමන්වහන්සේම ප්‍රශ්න කරනවා. 'කිම්හි නු ඛො සති ජාති හොති. කිං පච්චයා ජාති'[9] එතකොට ඊළඟට කියනවා 'භවෙ ඛො සති ජාති' සිංහලෙන් කියමු එතකොට හිතාගන්න. උපතට ප්‍රත්‍යය භවය නම් වූ පැවැත්මයි. පැවැත්මට හේතුව උපදානයයි. අල්ලගත්තු තැන නේ පැවැත්ම. ඊළඟට උපාදානයට හේතුව තණ්හාවයි. තණ්හාව නිසානේ අල්ලාගත්තේ. තණ්හාවට හේතුව වේදනාවයි. වේදනාවක් තියන නිසා නේ තණ්හාව තියෙන්නේ. වේදනාවට හේතුව ස්පර්ශයයි. ස්පර්ශයක් ඇති තැන නේ වේදනාව තියෙන්නේ. ස්පර්ශයට හේතුව සළායතනයයි. ස්පර්ශ ආයතන හයක් තියන නිසා නේ ස්පර්ශ කරන්නේ. සළායතනයට හේතුව නාමරූපයයි. ඔන්න ගැඹුරු තැනට ආවා. ඕවා කලිනුත් අපි ප්‍රකාශ කරලා තියෙනවා. නාමරූපයට හේතුව විඤ්ඤාණයයි. ආපහු කරකැවිලා එන නිසා තමයි "නාමරූප පච්චයා විඤ්ඤාණං විඤ්ඤාණ පච්චයා නාමරූපං" ඔන්න අඤ්ඤමඤ්ඤ-පච්චයතාවෙන් නතර වෙලා තමයි නැවතුණේ. **නමුත් ඒ අඤ්ඤමඤ්ඤ පච්චයතාව තේරුම් නොගැනීමමයි අවිද්‍යාව. ඒ අවිද්‍යාව නිසා ඇතිවන ක්‍රියා දාමයම තමයි සංස්කාර.** අපි ඔය දාම් ඇදිලිවලින්, ඔය

නොයෙකුත් උපමාවලින් පෙන්නුවේ ඒකයි. ඔය නානාවිධ උපමාවලින් අර දෙපිළක් බෙදිලා කරන ඒ මුළාව. ඊළඟට නාසිසස්ගේ ඒ ප්‍රේම ජවනිකාව. ආත්ම ස්නේහය තුළින්. ඒ හැම එකකින්ම පෙන්වන්නේ. අන්න අර අතන අන්තිමට බුදුරජාණන් වහන්සේට අසු වෙනවා රහස - පටිච්ච සමුප්පාද ධර්‍මය. ඒ දක්වා උපකාර වුනේ අර කියාපු යෝනිසෝමනසිකාරයයි.

ඔන්න එතකොට මෙන්න මේ ආශ්‍රයෙන් හිතාගන්න මේ ගැඹුරුයි හිතන මේ සූත්‍ර දේශනාව තුළ තියෙනවා පටිච්ච සමුප්පාදය මැදුම්මඟක් බව. ඇත්ත වශයෙන්ම ගැඹුරින් කල්පනා කරලා බලනකොට මෙන්න මේ ටික තේරුම් නොගැනීම නිසා තමයි බොහෝදෙනාට නිර්වාණය පිළිබඳ එහෙම නැත්නම් භව නිරෝධය නිවනයි කියන එකවත් තේරුම් ගන්න බැරි මේ ධර්මයේ සමහර වටිනා ගැඹුරු දේශනා නොතකා හැරියොත්. තව ඉදිරියට ඔය විධියට අපට මතු කරගන්න සිද්ධ වෙනවා. ඉතින් මේකෙන් කල්පනා කරන්න.

ඒ වගේම **මඤ්ඤනා** ගැන කියාපු එක. මඤ්ඤනා ගැන කිව්වනේ. 'මඤ්ඤනා' කියන්නේ සිතාගැනීම. මේ වචනය ගැන යමක් මතු කර ගැනීමටත් ඉත්ථභාව අඤ්ඤථාභාව ගැන තව පැහැදිලි කරගැනීමටත් අපි තව පොඩි දේශනාවක් ගනිමු ඉදිරියට. ඒකෙදී දැන් අපි කිව්වනේ මඤ්ඤනා කියන්නේ සිතාගැනීමක් කියලා. දැන් බුදුරජාණන් වහන්සේ දක්වන හැටියට අපි ඉන්නේ හිතෙන්ම මවාගත්තු මිරිඟුවක. **හිතෙන්ම මවාගත්තු මිරිඟුවක.** ඒ බව පෙන්නුම් කරන්න බුදුරජාණන් වහන්සේ මහ පුදුම දේශනාවක් දේශනා කරනවා. සංයුත් සඟියේ වේපචිත්ති අසුරේන්‍ද්‍රයා පිළිබඳ පුදුම දේශනාවක්.[10] මේ උපමා කතාවක්. නමුත් ඒක තුළ ගැඹුරු දෙයක් සඳහන් වෙනවා. සංඝයා වහන්සේලාට ප්‍රකාශ කරනවා ඇත්ත සිද්ධියක් හැටියට තමයි ප්‍රකාශ කරන්නේ. ඔය අහල තියනවානේ සුර - අසුර යුද්ධය ගැන. මෙහෙමයි තියෙන්නේ - කෙටියෙන් සලකාගන්න. සූත්‍ර දේශනාවල නිතර සඳහන් වෙනවා සුර අසුර යුද්ධයක් ගැන. දෙවියනුත් අසුරයිනුත් අතර යුද්ධයක්. දැන් මෙතන කියවෙන හැටියට සුර අසුර යුද්ධයේදී අසුරයින් පැරදුණා දෙවියන් දිනුවා. එතකොට අසුරේන්ද්‍රයා වන වේපචිත්ති - වේපචිත්ති කියන අසුරේන්‍ද්‍රයාව දෙවියන් පංචවිධ බන්ධනයකින් බැන්දයි කියලා කියනවා. අත් දෙකයි පාදෙකයි බෙල්ලයි. බැඳලා සුධම්මා දේවසභාවට ගෙනාවා ශක්‍රයා ඉදිරියට. ගෙනාවම මෙන්න ඊළඟට කාරණයක් කියනවා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා මේ

වේපචිත්ති අසුරේන්‍ද්‍රයාගේ බන්ධනය මහ අමුතු බන්ධනයක්. ඒක කොයි හැටියද කියතොත් යම් වෙලාවක වේපචිත්ති අසුරේන්‍ද්‍රයා හිතුවොත් දෙවියන් ධාර්මිකයි අසුරයින් අධාර්මිකයි මම දිව්‍යලෝකයේම ඉන්නවා. දිව්‍යලෝකයේම ඉන්නවා කියලා හිතුවොත් හිතුව හැටියෙ අර පංචවිධ බන්ධනයෙන් මිදිලා දිව්‍යසම්පත්ති ඒ අසුරේන්‍ද්‍රයා විඳිනවා. නමුත් යම් වෙලාවක හිතුවොත් දෙවියන් අධාර්මිකයි අසුරයින් ධාර්මිකයි මම යන්න ඕනෑ ආයෙ අසුර ලෝකයට කියලා, එතකොට ආයෙමත් අර පංචවිධ බන්ධනයෙන් බැඳෙනවා. එහෙම ප්‍රකාශ කරලා - බුදුරජාණන් වහන්සේ එයින් පෙන්නුම් කරන්නේ මොකක්ද? මේ බන්ධනය හිතෙන්ම ඇති වන එකක්. එහෙම කියලා අවසාන කරන්නේ කොහොමද 'එවං සුඛුමං ඛො භික්ඛවෙ වෙපචිත්ති බන්‍ධනං තතො සුඛුමතරං මාරබන්‍ධනං' 'වේපචිත්ති බන්ධනය ඉතාම සියුම් දෙයක්. සිත හා සම්බන්ධ දෙයක්. ඊටත් වඩා සියුම් මාර බන්ධනය.' ඊළඟට ප්‍රකාශ කරනවා වටිනා කියමනක්. "මඤ්ඤමානො ඛො භික්ඛවෙ බද්ධො මාරස්ස අමඤ්ඤමානො මුත්තො පාපිමතො" **''මඤ්ඤනා කිරීම තුළින් මාරයාට බැඳෙනවා. මාරයාගේ බැම්මට අහු වෙනවා** අමඤ්ඤමානො මුත්තො පාපිමතො'' **මඤ්ඤනා නොකිරීම තුළින් මාරයාගෙන් මිදෙනවා."**

ඔන්න ඊළඟට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා, මොනවද මේ 'මඤ්ඤිත' කියලා කියන්නේ. ඔය දැන් මෙතන කියාපු වචනයට නිදර්ශන දක්වනවා. මහ පුදුමයි ඒ දේශනාව. "අස්මීති භික්ඛවෙ මඤ්ඤිතමෙතං. අයමහමස්මීති මඤ්ඤිතමෙතං. භවිස්සන්ති මඤ්ඤිතමෙතං. න භවිස්සන්ති මඤ්ඤිතමෙතං. රූපීභවිස්සන්ති මඤ්ඤිතමෙතං, අරූපීභවිස්සන්ති මඤ්ඤිතමෙතං, සඤ්ඤී භවිස්සන්ති මඤ්ඤිතමෙතං, අසඤ්ඤී භවිස්සන්ති මඤ්ඤිතමෙතං, නෙවසඤ්ඤීනාසඤ්ඤීභවිස්සන්ති මඤ්ඤිතමෙතං, මඤ්ඤිතං භික්ඛවෙ රොගො මඤ්ඤිතං ගණ්ඩො මඤ්ඤිතං සල්ලං" අන්න ඒ විධියට නවයක් තියෙනවා. ඔන්න දැන් තේරුම්ගන්න අස්මීති භික්ඛවෙ මඤ්ඤිතමෙතං. පළමුවෙනිම මඤ්ඤිතය මොකක්ද? 'වෙමි' කියන එක. හරි පුදුමයිනේ. අපි දැන් වෙමි කියලා නොයොදා පුළුවන්ද ව්‍යාකරණයේ. නමුත් 'වෙමි' කියන එකම බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා සිතළුවක්. හිතාගත් දෙයක්. - වෙමි කියන එකම හිතාගැන්මක් පමණයි. එතකොට ඊළඟට අයමහමස්මීති - වෙමි කියලා මදිනේ. මෙය 'මම වෙමි' මේ මම වෙමි. එක්කෝ උපාදාන ස්කන්‍ධයෙන් එකක් අරගෙන 'මම රූපය

වෙමි'. 'මම වේදනාව වෙමි'. ඒකත් මඤ්ඤිතයක් පමණයි. ඔන්න බලන්න 'වෙමි' කියන එකත්. මඤ්ඤිතයක් 'මෙය මම වෙමි' කියන එකත් මඤ්ඤිතයත්. ඊළඟට එපමණක් නොවේ 'භවිසසනති' 'මම අනාගතයේ වන්නෙමි' කියන එකත් මඤ්ඤිතයක්. නොවන්නෙමි කියන එකත් මඤ්ඤිතයක්. 'රූපී වන්නෙමි' කියන එකත් මඤ්ඤිතයක්. ඔය රූප ලෝක ගැන හිතලා බලන්න. බ්‍රහ්මයොත් ඔක්කොම අහුවෙලා මේකට 'අරූපී වන්නෙමි' කියන එකත් මඤ්ඤිතයක්. රූප-අරූප බ්‍රහ්මලෝක ඔක්කොම ඉවරයි. 'රූපීභවිසසනති' රූපලෝකවල බ්‍රහ්මයො. ඒකත් මඤ්ඤිතයක් 'අරූපීභවිසසනති'. ඒකත් මඤ්ඤිතයක් සඤ්ඤීභවිසසනති" සඤ්ඤාව ඇත්තෙත් නැත. 'නැත්තෙත් නැත අපි කීවේ අර සීසෝ පැදිල්ල - ඒකත් මඤ්ඤිතයක්.'

ඔන්න මුළු මහත් භවයම මඤ්ඤිතය උඩ තියෙන බව පෙන්නුම් කරලා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. "මඤ්ඤිතය ගඩක්, රෝගයක්, උලක්. ඒක නිසා සංඝයාවහන්සේලාට කියනවා ''තසමාතිහ භික්ඛවෙ අමඤ්ඤමානෙන චෙතසා විහරිස්සාමීති එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං" එම නිසා මහණෙනි මඤ්ඤනාවෙන් තොර හිතකින් වාසය කරන්නෙමු. කියන ඒ ශික්‍ෂණය ඇති කරගන්න. අන්න ඒ විදියට චේපචිත්තිබන්ධන කථාවෙන් අපට පේනවා. ඒකයි අපි කිව්වේ භාෂා ව්‍යවහාරය තුළ මෝහය පුදුම විධියට ගැබ් වෙලා තියෙනවා කියලා. අපට ඒක ප්‍රතික්ෂේප කරන්න බැහැ. ඒකයි බුදුරජාණන් වහන්සේ ඒක ව්‍යවහාර කරන්නෙ **ග්‍රහණය නොකර**.

එදා අපි කියන්න ඇති මේ පින්වතුන්ට අපි දිය සුළිය කථාව කියනකොට 'අර තැන' 'මේ තැන' කථාව කිව්වා මතකයි නේද? එතකොට ඒ 'තැන' කථාවත් එක්කම යන එකක් තමයි අපි කිව්වනේ පුරුෂ තුන. මම උත්තම පුරුෂයා, ඉස්සරහින් ඉන්න කෙනා මධ්‍යම පුරුෂයා. අර එහායින් ඉන්න කෙනා ප්‍රථම පුරුෂයා. ඒ ව්‍යාකරණයේ. දැන් හිතලා බලන්න එතකොට ඒකට අදාළ ක්‍රියා පද තමයි 'වෙමි' 'වෙහි' 'වෙයි'. ඔය විධියට තියෙනවා. ඒවා ඔක්කොම ඉවරයි එතකොට. ඒවා හැම එකක්ම බුදුරජාණන් වහන්සේගේ වචනයට අනුව මඤ්ඤිත. ඒවා පාවිච්චි කරන්න වෙනව. අන්න එතනයි ඒ කිව්වේ භාෂාවත් තර්කයත් තුළ හිර වෙලා ඉන්නවා කියලා. අතක්කාවචර ධර්මයක් බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළේ. අන්න අර කියාපු පටිච්ච සමුප්පාද ධර්මය නමැති මැදුම් මග. ඒක අපි කිව්ව.

මැජික් කේතලයේ උපමාව ආයිත් මතක් කරගන්න. ඒකත් මේ නොදන්නා අයට කියමු. ඒක පොතක පතක එන එකක් නොවේ. අපේ මේ පුංචි අත්දැකීම් තුළින් පොඩි කාලේ දැකපු සිද්ධියක් ආශ්‍රයෙන්. මම ලෝකය පුරා ගිහින් නැහැ. මම ඔය යන්තම් දැකපු එකක් ආශ්‍රයෙන් තමයි ඔය කියන උපමා අර සර්ප චක්‍රය වගේ. ඒ කාලයේ මම දැක්කා මතකයි පොඩිකාලයේ සාප්පු ඉස්සරහින් යනකොට අපිත් ඔය නැවතිලා බැලුවා මොකක්ද මේ කේතලයකින් වතුර වැක්කෙරනවා භාජනයකට. භාජනය පිරෙන්නෙත් නැහැ වතුර හිස් වෙන්නෙත් නැහැ. පස්සෙයි දන්නේ අර වතුර ධාරාව තුළින් මොකක්දෝ නලයක් යනවා. ඉතින් මේ ලෝකෙත් මැජික් කේතලයක් නේ.

'සමුදයො' 'සමුදයො'. නිරන්තරයෙන් 'හටගැනීමක්' 'හටගැනීමක්' තියෙනව. නිරන්තරයෙන් 'නිරොධො' 'නිරොධො'. නිරුද්ධ වීමක් තියෙනවා. නමුත් ඒක නිරොධ පක්ෂය අමතක කරලා සමුදය පක්ෂය මතු කරගෙන මේ පෘථග්ජන ලෝකයා සක්කාය දිටඨිය තුළ ඉන්නවා. සක්කාය දිට්ඨි කියන වචනයේ ඒකේ නිරුක්තියත් හිතලා බලන්න. සත්-කාය දිට්ඨි. 'සත්' කියන්නේ 'ඇත'. 'කාය' කියන්නේ 'සමූහය'. මුළු සමූහයම ඇත. මුළු සමූහයම ඇත කියලා ගත්තු නිසානේ අපි මේ නැති අනන්‍යතාවක් ඔප්පු කරන්න ආණ්ඩුවට ඔප්පු කරන්න - ඔය දන්නවනේ ඒ හරිය කියන්න ඕනෑ නැහැ. අයිඩෙන්ටිටි කාඩ් කියලා එහෙම තියාගෙන ඉන්නේ. ඔය හැඳුනුම් පත්. නමුත් මොන අනන්‍යතාවක්ද හැම එකක්ම අඤ්ඤඤථාභාවී නම්, ලෝකය අඤ්ඤඤථාභාවී නම් ? ඕක කියන්න යන්න ඕනෑ නෑ ආණ්ඩුවට. නමුත් අඤ්ඤඤථාභාවී භවසත්තො. අඤ්ඤඤථාභාවී බව අමතක කරලා අපි අනන්‍යතාව මතු කරගෙන තමයි මේ මගේ රූපය කියලා මේ රූපය පමණක් නොවේ. කුඩා අවදියේ හෝ වේවා, විවාහ වෙන අවස්ථාවේ හෝ වේවා, ගත්ත ලස්සන රූපත් මගේ කියලා ගන්නවා. ඔන්න එතැනම හිතාගන්න පුළුවන් ඒක. ඉතින් අන්න වෙමි කියන ස්ථාවරය තුළ අර ඝන සංඥාව කියලා අපි කීවේ ඒකයි. ඝන සංඥාව කියලා කිව්වෙත් ඒකයි. මේක ලෝකයා අමතක කරනවා. මේක නිරන්තරයෙන්ම ඇති වීමක් නිරන්තරයෙන්ම නැති වීමක් කියන එක. ඒක මේ ව්‍යවහාරයට අල්ලා ගන්න බැහැ. ගඟ ගලයි කියනකොට ගැලීමක් විතරයි. නමුත් අපි ඒකට ගඟ කියලා ව්‍යවහාර කළාට පස්සේ, නමක් දුන්නට පස්සේ, මොන ගඟ ද? ගිං ගඟද? කැළණි ගඟද? ඊට පස්සේ ඉතින් ගඟ ගලනවා. ඒ වගේම

තමා අපිත්. අපි මොහාන්ධකාරයෙන් වැහිලා ඉන්නේ. බුදුරජාණන් වහන්සේ මතු කළේ මේ ටික. අපේ සමහර අටුවා - කියන්න නරකයි. නමුත් අපේ අටුවාචාරීන් වහන්සේලාට හසු නොවුණත් ඇතැම් බෞද්ධ නිකායවල මේක මතු කරලා දීලා තියෙනවා, මේ අන්ත දෙකෙන් මිදුණු මැදුම් මඟ පටිච්ච සමුප්පාදය බව බෞද්ධ දර්ශනවල. ඒවයේ තියෙන හැම එකක්ම පිළිගන්නවා නොවේ. ඇතැම් බෞද්ධ දර්ශනවල ඒ ටික මතුකරලා දීලා තියෙනවා. ඒකට ශූන්‍යතාව කියලත් සමහරු පාවිච්චි කරනවා. නමුත් අතන අර කාරණයයි තියෙන්නේ. නිරන්තරයෙන් ලෝකයේ ඇති වීමත් නැති වීමත් තියෙනවා. ඒක වචනයට හසු වන්නේ නැහැ. මොකද තර්කය නම් දෙකක්. එක්කෝ ඇත. එක්කෝ නැත. **එක්කෝ ඇත. එක්කෝ නැත.** එහෙම නැත්නම් චතුෂ්කෝටික කියල එකක් හදාගෙන තියෙනවා. අත්‍ථි නත්‍ථි. ඒ දෙක තුළම තමා හතර දක්වා යන්නේ. ඇත්තේත් නැත නැත්තේත් නැත. ඔය විධියට හදාගෙන. නමුත් හැම එකක්ම තියෙන්නේ ඇත නැත කියන අන්න අර ද්වයතාව තුළයි. ඒ වෙනුවට බුදුරජාණන් වහන්සේ අන්න අර ලෝකයේ නිරන්තරයෙන් වෙනස් වීම මතුකර දෙනවා 'සමුදයො සමුදයො - නිරොධො නිරොධො'. ඒ ටික මතු කරලා දෙනවා ලෝකයාට.

ඊළඟට අපි තව ටිකක් හිතලා බලමු. මේ 'අස්මි' කියන එක අපි හිතාගත්තු දේ. මොකද මේකට හේතුව? ඒකත් හෙළි වන වටිනා සූත්‍රයක් තියෙනවා. මේ පින්වතුන්ට සමහර විට කියන්න ඇති. වටිනා සූත්‍රයක කියන්නේ මෙහෙමයි. ආනන්ද ස්වාමීන් වහන්සේ යම් අවස්ථාවක උන්වහන්සේ ඇසුරු කරන සංඝයා වහන්සේලාට ප්‍රකාශ කරනවා " ඇවැත්නි අපි මහණ වුණ ළඟදී අපට මේ පුණ්ණමන්තානිපුත්ත ස්වාමීන් වහන්සේ හුඟක් උපකාර වුණා. මට පුණ්ණමන්තානිපුත්ත ස්වාමීන්වහන්සේ මෙන්න මෙහෙම අනුශාසනාවක් කළා. කොහොමද? 'ආනන්ද' එහෙම කියලා කියනවා. 'උපාදාය අස්මීති හොති නො අනුපාදාය'[11] ඔන්න ප්‍රධාන වශයෙන් අස්මි කියන හැඟීම ඇති වන්නේ උපදානයක් නිසයි. උපාදාය කියන්නේ පින්වතුනි උපදාන කරගැනීම. එතකොට යමක් අල්ලාගැනීම තුළිනුයි එහෙම කියමු. යමක් අල්ලාගැනීම තුළිනුයි වෙමි කියන හැඟීමක් එන්නේ. නො අනුපාදාය' අල්ලා නොගැනීමක් තුළින් නොවේ. එතකොට හේතු ප්‍රත්‍ය තුළිනුයි ඒ 'අස්මි' කියන එක - අල්ලා ගැනීම තුළිනුයි. ඉබේ නොවේ. අස්මි කියන එක ඇති වන්නේ හේතු ප්‍රත්‍යය ඇතිව. මොකක්ද

හේතු ප්‍රත්‍යය උපාදානය. 'උපාදාය අසමීති හොති නො අනුපාදාය. කිංච උපාදාය අසමීති හොති නො අනුපාදාය' මේ පුණ්ණමන්තානිපුත්ත ස්වාමීන් වහන්සේගේ වචනයි ආනන්ද ස්වාමීන්වහන්සේ නැවත උච්චාරණය කරන්නේ. 'රූපං උපාදාය' රූපය අල්ලාගැනීමෙන්, රූපයක් අල්ලා ගත්තු තැනයි. වෙමි කියන එක තියෙන්නේ. වේදනාව අල්ලගත්තු තැනයි. සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ අල්ලගත්තු තැනයි 'අස්මි' කියන වචනය එන්නේ. නිකං නොවේ. අල්ලා නොගැනීමෙන් නොවේ. අන්න එතැන පෙන්නුම් කරන්නේ අර උපාදානය නිසයි. එතකොට උපාදානය තුළිනුයි මේ 'අස්මි' කියන වචනය පෝෂණය වෙන්නේ.

ඊළඟට පුණ්ණමන්තානිපුත්ත ස්වාමීන් වහන්සේ පුදුම උපමාවක් දෙනවා. ඒක ඇති මේ පින්වතුන්ට හොඳට හිතන්න. හිතන්න හිතන්න ගැඹුරු එකක්. යම් කිසි හැඩවැඩ ඇතිව ඉන්න කැමැති තරුණ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ඒ ස්ත්‍රියට හෝ පුරුෂයාට 'අස්මි' කියන හැඟීම එන්නේ. ඒ කියන්නේ ඔන්න එයා ඒ පුද්ගලයා හිතන්නේ ඒ කාලයේ හැටියට පිරිසිදු කණ්ණාඩියක හෝ පැහැදිලි වතුරක හෝ තමන්ගේ මුඛ නිමිත්ත - තමන්ගේ මුහුණ - දිහා බලලා තමයි 'උපාදාය අස්මීති හොති' මේ ඉන්නේ මමය කියලා සලකාගන්නේ. ඔන්න එතකොට අර උපාදාය යමක් අල්ලාගැනීමෙනුයි එතන අල්ලා ගත්තේ කණ්ණාඩියයි. කණ්ණාඩිය ඉස්සරහට අල්ලා ගත්තහම තමයි මේ මමයි කියන හැඟීම එන්නේ. ඒ අන්න එතනත් දැන් කිට්ටු කරගන්න අපි කියාපු නාසිසස් කතාව. නාසිසස් කවදාවත් තමන්ගේ මුහුණ දැකලා නැති නිසානේ අර වතුරේ එක පාරට දැක්ක හැටියේ හිතුවේ දෙවඟනක් කියලා. දෙවඟනක් කියලා හිතාගැනීම වගේම තමයි පින්වතුනි 'මේ මමය' කියලා හිතාගැනීම. මොකද කණ්ණාඩියේ පෙනෙන පුද්ගලයා නොවේනේ ඇතුළත තියෙන කුණුකන්දල් පෙනෙනවාද? බඩවැල්වල තියෙන දේවල් කුණුකන්දල් - අර මේ හොඳට හැඩවැඩ දාපු ටික විතරනේ කණ්ණාඩියේ වැටෙන්නේ. පින්තූරයේ වැටෙන්නේ. ඡායාවේ වැටෙන්නේ. ඒකනේ ලෝකයා අල්ලාගන්නේ. අන්න ඒක තමා 'උපාදාය අසමීති.'

එතකොට රූපය එහෙම අල්ලාගන්නවා. වේදනාවත් අල්ලාගන්නවා. ඒ කොහොමද වේදනාව අල්ලාගන්නේ? ඒකත් සමහර වේලාවට ප්‍රකාශ කරනවා බලන්න බුදුරජාණන් වහන්සේ කෙටියෙන්ම ප්‍රකාශ කරලා තියෙනවා එක එකක් ස්කන්ධ හැටියට දක්වන එක. ඒක කලින්

අවස්ථාවකත් කිව්වා පංචඋපාදානස්කන්ධ කියන්නේ මොකද, ගොඩවල් පහ කියන්නේ මොකද, ඒකත් එකොළොස් ආකාරයටයි. අන්න එතෙන්ට බහිමු අපි. මේ එක ස්කන්ධයක් එකොළොස් ආකාරයක් බව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරලා තියෙනවා. මොකක්ද එකොළොස් ආකාරය. "යංකිංචි රූපං අතීත අනාගත පච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා සබ්බං රූපං"[12] කියලා ඔය විධියට විදර්ශනාවට නගනකොට රූපස්කන්ධය මොනවද කියලා විග්‍රහ කරලා හිත යොදන්න කියන එකයි කියන්නේ.

කොහොමද ඒ? එකොළොස් ආකාරයට බෙදිලා යන්නේ. 'යං කිංචි රූපං අතීත අනාගත පච්චුප්පන්නං' අතීත රූපයත් මගේ අන්න බලන්න. අර දැන් මේ පින්වතුන්ගේ ඡායාරූප අලවපු පොත්වල පුංචි එකා ලස්සන කාලයේ මේත් මම අන්න අතීත රූප. ඊළඟට අනාගත රූපයට නිදර්ශනයක් කීවොත් මේ  පින්වතුන්ට අමුතුවෙන් සලකාගන්න. දැන් මේ පින්වතුන් ඔය මගුල් ගෙදරවල එහෙම යන්න ලෑස්ති වෙලා - පින්වතුන් පමණක් නොවේ පින්වතියන් - කණ්ණාඩියක් ඉස්සරහට ගිහිල්ලා මම එතැනට ගියාම කොහොමට හිටීද' ආයිත් හැරිලා බලලා ඊට වැඩිය ලස්සනට හිටින්න - ඉතින් අනාගත රූපයත් අල්ලාගත්තා. අන්න ඒ වගේ තමා අතීත අනාගත පච්චුප්පන්න අමුතුවෙන් කියන්න දෙයක් නැහැ. අජ්ඣත්තං වා බහිද්ධා වා ඇතුළත හෝ පිටත තමාගේ රූපය පමණක් නොවේ පිට එකත් අල්ලා ගන්නවා හිතෙන්. 'අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා ගොරෝසු එකක් වේවා සියුම් එකක් වේවා ඊළඟට 'හීනං වා පණීතං වා' - පහත් එකක් වේවා ලස්සන වටිනා එකක් වේවා "යං දූරෙ සන්තිකෙ වා" ළඟ තියන එකත් ඈත තියෙන එකත් කියලා ඔන්න ඔය විධියට එකොළොස් ආකාරයක් එතැන දක්වනවා. එක ස්කන්ධයක් පාසා. ඒ විධියට තමයි මේ පුද්ගලයා තමාගේ ජීවිතය පිළිබඳව සිතේ රඳවාගෙන ඉන්නේ. ඔය එකොළොස් ආකාරයට. ඒක මේ ජීවිතයට පමණක් නොවේ දීර්ඝ කාලයක් සංසාරයේ - ඒ තමයි අනුසය වශයෙන් තිබෙන්නේ.

එතකොට මහා පුදුම සංසාර අවුලක් මෙතන තියෙන්නේ. එතකොට මේ භාෂාවට දොස් කියනවා නොවේ. භාෂාව හදාගත්තෙත් අපි. හදාගත්තට පස්සේ අපි ඒකට යට වුණා. ඒ ටික තමා අර කලින් අවස්ථාවක අපි කිව්වේ පපංච ආදිය ගැන කියනකොට,  අර මන්තරකාරයෝ තුන්දෙනෙක්- ඔය පරණ කතන්දර - මන්තරකාරයෝ තුන්දෙනෙක් විජ්ජා මන්ත්‍ර හොඳට

ඉගෙනගෙන කැලේ මැදින් යනකොට එක්කෙනෙක් තමන්ගේ හපන්කම පෙන්වන්න ව්‍යාඝ්‍ර ඇටකටු වගයක් දැකල ඒ ඇටකටු ටික එකතු කර තමාගේ ශක්තිය පෙන්නුව. අනිත් එක්කෙනා ඒකට මස් පිරෙව්වා. තුන්වෙනි එක්කෙනා ඒකට පණ දුන්නා. පණ දුන්නාට පස්සේ ව්‍යාඝ්‍රයා පැනලා තුන්දෙනාවම කාලා දැම්මා. අන්න ඒ වගේ දෙයක් තමා අපේ මේ භාෂාව තර්කය. අපිම ගොඩනගාගත්තු දෙයක්. අපිම ගොඩනඟා ගත්තු භාෂාවටත් තර්කයටත් හිර වෙලා අපි මේ සංසාරයේ. ඒක නිසා තමා අපි කීවේ මේ සංසාරයේ ගැටලුව - ඉස්සර වෙලා දේශනාවක කිව්වා - ව්‍යවහාරය තුළ ගැබ් වෙලා තියෙනවා. ඒකට බනින්න නොවේ නමුත් ඒක අපිට පාවිච්චි කරන්න වෙනවා. බුදුරජාණන් වහන්සේත් පාවිච්චි කළා අර එක් අවස්ථාවක වටිනා සූත්‍රයක් ඉවර කරන්නේ පොට්ඨපාද සූත්‍රය වගේ මහ ගැඹුරු සූත්‍රයක් අවසාන කරන්නේ බුදුරජාණන් වහන්සේ 'ඉතීමා ඛො චිත්ත ලොක සමඤ්ඤා ලොක නිරුත්තියො ලොක වොහාරා ලොක පඤ්ඤත්තියො යාහි තථාගතො වොහරති අපරාමසං'[13] චිත්ත කියන ඒ එක්කෙනාට ආමන්ත්‍රණය කරලා කියන්නේ චිත්ත මේ හැම එකක්ම ලොක සමඤ්ඤා ලෝකයේ පිළිගත්තු මත විතරයි. සම්මුති විතරයි. ලෝක පඤ්ඤත්ති විතරයි. ලෝක නිරුත්ති විතරයි. තථාගතයන් වහන්සේ ඒවා ව්‍යවහාර කරනවා. නමුත් 'අපරාමසං' පරාමර්ශනය කරන්නේ නැහැ. අල්ලාගන්නේ නැහැ. අන්න එතැනයි. මේ ධර්මයෙ අපේ ඉලක්කය විය යුත්තේ. එතකොට ඒ නිසා ඇත්ත වශයෙන් මිදෙන්න තියෙන අනික් දේවල් වගේම අන්තිමට අපට මේ භාෂා ව්‍යවහාරය තුළ තියෙන මිච්ඡාවෙනුත් මිදෙන්න වෙනව. ඒක විදර්ශනා ප්‍රඥාව තුළින්, ප්‍රත්‍යක්ෂ ඥානය තුළිනුයි විදර්ශනාත්මක වශයෙන් අර කියාපු ඇති වීම් නැති වීම් නිරන්තරයෙන් දැකීම තුළිනුයි මෙන්න මේ කියාපු මිථ්‍යාවෙන් අපට මිදෙන්න පුළුවන්. ඒකත් **'පච්චත්තං වෙදිතබ්බො'**. ඒකත් තම තමන්මයි. **තමතමන්මයි මිදෙන්න ඕනෑ ප්‍රත්‍යක්ෂයෙන්.**

ඉතින් මේ ටික ඇතැයි කියලා හිතනවා මේ පින්වතුන්ට, අද දවසෙ. ඔය විධියට මට පෙනෙන හැටියට ගැඹුරින් ගැඹුරට යනවා වගේ. නමුත් මේ පින්වතුන් අධෛර්‍ය වෙන්න එපා. මේවා අර විරිදු බණ තරම් ප්‍රිය මනාප නොවන්න පුළුවන්න. නමුත් මෙතනයි ශාසනය තියෙන්නේ. අපි ප්‍රකාශ කළා - මේ පින්වතුන්ට කලිනුත් කිව්වා. බුදුන් දැක නිවන් දකින්න බලාපොරොත්තු වෙනවා නම් පටිච්ච සමුප්පාදය දකින්න කියලා. මොකද

**පටිච්චසමුප්පාදය දක්කොත් ධර්මය දකිනවා. යමෙක් ධර්මය දක්කොත් බුදුන් දකිනවා. ඉතින් පටිච්ච සමුප්පාද ධර්මය දකින කොට බුදුනුත් දකින්න පුළුවන් ධර්මයත් දකින්න පුළුවන්.** ඔන්න ඔය ටිකයි. මේ පින්වතුන් නුවණින් සලකාගන්න.

ඉතින් අද දින මේ පින්වතුන් තම තමන්ගේ ප්‍රමාණයෙන් වටිනා සීලයක් සමාදන් වෙලා ඊළඟට බණ භාවනා ආදියෙහි යෙදෙන්න ඇති. අද මේ තමන්ගේ විදර්ශනා භාවනාවට විශේෂයෙන් උපකාර වන යමක් කියවුණා. මේවාත් උපකාර කරගෙන හැකි තාක් මේ පින්වතුන් අධෛර්ය නොවී මේ ධර්ම මාර්ගයේ යමින් බුදුරජාණන් වහන්සේ දක්වපු සලකුණු තුළින් මේ අති භයානක සංසාරයෙන් මිදිලා - 'සනතාප ජාතො' කියලා කිව්වේ - ඒ අති භයානක සංසාරයෙන් මිදිලා උතුම් අමා මහ නිවනින් සැනසීමට සෝවාන් ආදී මාර්ග ඥානවලින් මේ ජීවිතය තුළදීම මේ පින්වතුන්ට ශක්තිය, බලය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා. අවීචියේ සිට අකනිටාව දක්වා යම් සත්ත්ව කෙනෙක් ධර්ම දේශනාමය ධර්ම ශ්‍රවණමය කුසලයක් අනුමෝදන් වීමට කැමති නම් ඒ අනුමෝදන් වීම තුළින් ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවනින් සැනසෙත්වා කියා ප්‍රාර්ථනා ඇති කරගෙන මේ ගාථා කියන්න.

**එත්තාවතා ච අම්හෙහි ...**

## පාදක සටහන්

1. ද්වයතානුපස්සනා සූත්‍රය, සුත්ත නිපාතය, ඛුද්දක නිකාය, 228 පිට(බු.ජ.ත්‍රි. 25)
2. කච්චානගොත්ත සූත්‍රය, සංයුත්ත නිකාය 2-28 පිට (බු.ජ.ත්‍රි. 14)
3. ධම්මචක්කප්පවත්තන සූත්‍රය, සංයුත්ත නිකාය 5(2), 270 පිට (බු.ජ.ත්‍රි. 17(2))
4. බාහිය සූත්‍රය, උදාන පාළි, ඛුද්දක නිකාය 1-142-146 පිටු (බු.ජ.ත්‍රි. 24)
5. චතුත්ථනිබ්බාන සූත්‍රය. උදාන පාළි, ඛුද්දක නිකාය, 1, 294 පිට (බු.ජ.ත්‍රි. 24)
6. මහානිදාන සූත්‍රය, දීඝ නිකාය 2, 92 පිට (බු.ජ.ත්‍රි. 8)
7. ලොකවොලොකන සූත්‍රය, උදාන පාළි, ඛුද්දක නිකාය, 1-192 පිට (බු.ජ.ත්‍රි. 24)
8. එම - එම - එම - එම
9. මහාපදාන සූත්‍රය, දීඝනිකාය 2, 46 පිට (බු.ජ.ත්‍රි. 8)
10. යවකලාපී සූත්‍රය, සංයුත්ත නිකාය 4, 384 පිට (බු.ජ.ත්‍රි. 16)
11. ආනන්ද සූත්‍රය, සංයුත්ත නිකාය 3, 180 පිට (බු.ජ.ත්‍රි. 15)
12. ඛන්ධ සූත්‍රය, සංයුත්ත නිකාය 3, 84 පිට (බු.ජ.ත්‍රි. 15)
13. පොට්ඨපාද සූත්‍රය, දීඝ නිකාය 1, 436 පිට (බු.ජ.ත්‍රි. 7)

# 07 වන දේශනය

# 07 වන දේශනය

**(පහන් කණුව ධර්ම දේශනා අංක 189)**

**'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'**

අනත්තනි අත්තමානිං - පස්ස ලොකං සදෙවකං
නිවිට්ඨං නාමරූපස්මිං - ඉදං සච්චන්ති මඤ්ඤති

යෙන යෙන හි මඤ්ඤන්ති - තතො තං හොති අඤ්ඤථා
තං හි තස්ස මුසා හොති - මොසධම්මං හි ඉත්තරං

අමොස ධම්මං නිබ්බානං - තදරියා සච්චතො විදූ
තෙ වෙ සච්චාභිසමයා - නිච්ඡාතා පරිනිබ්බුතා[1]

-ද්වයතානුපස්සනා සු. සු.නි.

සැදැහැවත් පින්වතුනි,

ආත්මයක් නැති තැනක ආත්මයක් ඇත යන මානයෙන් ලෝක සත්ත්වයා සසරට බැඳී තිබෙන බව තිලෝගුරු සම්මා සම්බුදු රජාණන් වහන්සේ හෙළි කර වදාළා. මානයෙන් කෙරෙන හිතාගැනීම මඤ්ඤනා නමින් හැඳින්වෙනවා. නාම රූපය සත්‍ය හැටියට සලකන මේ මඤ්ඤනාවෙන් මිදීම මාර බන්ධනයෙන් මිදීමයි, නිවනයි. ඒ බව ප්‍රකාශ කෙරෙන ගාථා තුනකුයි අද අපි මේ හත්වෙනි පටිච්ච සමුප්පාද ධර්ම දේශනාවට මාතෘකාව හැටියට ඉදිරියට ගත්තේ. මේ ගාථා තුනත් දකින්න ලැබෙන්නේ සුත්ත නිපාතයේ ද්වයතානුපස්සනා සූත්‍රයේයි. ගිය වර දේශනයේ දී අපි ඒ සූත්‍රය හඳුන්වලා දුන්නේ මහා ධර්ම තේජසක් පිළිබිඹු වන සූත්‍රයක් හැටියටයි. 'ද්වයතා' කියන වචනයෙන් හැඟෙන අන්දමට යුගළවශයෙන් පිහිටි ධර්ම කාරණා දහසයක් ඒ සූත්‍රයේ විග්‍රහ කෙරෙනවා. පටිච්ච සමුප්පාද ධර්මයේ අනුලෝම වාරයත්, පටිලෝම වාරයත් සිහිගැන්වෙන අන්දමින් බැඳීම සහ මිදීම පිළිබඳ සනාතන ධර්මතාව බුදුරජාණන් වහන්සේ ඒ සූත්‍රයේදී දහසය ආකාරයකින් විග්‍රහ කරල දක්වනවා.

අද අපි මේ ඉදිරියට ගත්තේ පහළොස් වෙනි ද්වයතානුපස්සනාවට අදාළ ගාථා තුනයි. ඒ ගාථා තුන ඉදිරිපත් කරන්න කලින් බුදුරජාණන් වහන්සේ ගද්‍ය පාඨ කීපයකින් ඒ පහළොස්වෙනි ද්වයතානුපස්සනාව හඳුන්වා දෙනවා මෙන්න මේ විදියට. 'යං භික්ඛවෙ සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය ඉදං සච්චන්ති උපනිජ්ඣායිතං තදමරියානං එතං මුසාති යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨං' මහණෙනි යමක් දෙවියන් මරුන් බඹුන් සහිත ලෝකයා විසින් මහණ බමුණන් දෙවියන් සහිත ප්‍රජාව විසින් මෙය සත්‍ය යයි කල්පනා කරන ලදද, එය ආර්යයන් විසින් යථාභූත වශයෙන් මෙය මුසාව යයි මනා ප්‍රඥාවෙන් දකින ලදී. 'අයං එකානුපස්සනා' මෙය එක අනුපසසනාවකි කියලා ඊළඟට දෙවෙනි අනුපසසනාව ඉදිරිපත් කරනවා. 'යං භික්ඛවෙ සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය ඉදං මුසාති උපනිජ්ඣායිතං තදමරියානං එතං සච්චනති යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨං. අයං දුතියානුපස්සනා'. මහණෙනි, යමක් දෙවියන් මරුන් බඹුන් සහිත ලෝකයා විසින් මහණ බමුණන් දෙවියන් සහිත ප්‍රජාව විසින් මෙය මුසාව යයි කල්පනා කරන ලදද එයම ආර්යයන් විසින් යථාභූත වශයෙන් මෙය සත්‍ය යයි සම්‍යක් ප්‍රඥාවෙන් දකින ලදී. මෙය දෙවෙනි අනුපස්සනාවයි. මේ විදියට අනුපස්සනා දෙක ඉදිරිපත් කරලා අනිකුත් අනුපස්සනාවල කළා වගේම බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා යම් භික්ෂූන් වහන්සේ නමක් මේ අනුපස්සනාවෙහි සිත යොදාගෙන කෙලෙස් තවන වීර්යයෙන් යුතුව කටයුතු කරනවා නම් ඒ භික්ෂුවට ඵල දෙකකින් එකක් බලාපොරොත්තු විය හැකියි. දිට්ඨදම්යෙහිම රහත් ඵලය හෝ උපාදාන යමක් ඉතිරිව ඇතොත් අනාගාමී ඵලය. ඒ තරම් ආනිශංස සම්පන්න බව ඒ අනුපස්සනාව පිළිබඳව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා.

ඊළඟට එහෙම ප්‍රකාශ කරල තමයි අර ගාථා තුන බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කරන්නේ ඒ අදහස සම්පිණ්ඩනය කරලා.

**අනත්තනි අත්තමානිං - පස්ස ලොකං සදෙවකං**
**නිවිට්ඨං නාමරූපස්මිං - ඉදං සච්චන්ති මඤ්ඤති**

ආත්මයක් නැති තැනක ආත්මයක් ඇත යන මානය ගත්තා වූ මේ දෙවියන් සහිත ලෝකයා දෙස බලව. 'නිවිට්ඨං නාමරූපස්මිං - ඉදං සච්චන්ති මඤ්ඤති' නාම රූපය තුළට ඇතුල් වෙලා, නාම රූපය තුළට

රිංගාගෙන, මෙය සත්‍ය යයි හඟී'. ඔය ලෝකයාගේ තත්ත්වයයි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නෙ. ඊළඟට ප්‍රකාශ කරනවා,

**යෙන යෙන හි මඤ්ඤන්ති - තතො තං හොති අඤ්ඤථා**
**තං හි තස්ස මුසා හොති - මොසධම්මං හි ඉත්තරං**

යම් යම් ආකාරයකින් යම් කෙනෙක් මඤ්ඤනා කරත්ද ඒ මඤ්ඤනා කිරීමෙන්ම - එයින්ම - එය මුසාවක් බවට පත් වෙයි. 'යෙන යෙන හි මඤ්ඤන්ති - තතො තං හොති අඤ්ඤථා' යම් යම් දේකින් මඤ්ඤනා කරත්ද එයින්ම එය අඤ්ඤථා භාවයට අන් සේ බවට පරිවර්තනය වෙයි. 'තං හි තස්ස මුසා හොති - මොසධම්මං හි ඉත්තරං' එයම එහි මුසාව වෙයි. ඒ ළාමක වූ දෙය මුළා කරන ස්වභාවය ඇති නිසයි. ඊළඟට තුන්වෙනි ගාථාවෙන් කියනවා,

**'අමොස ධම්මං නිබ්බානං - තදරියා සච්චතො විදූ'**

නිවන මුළා නොකරන ස්‍වභාවය ඇති දෙයක්. එය ආර්යයෝ සත්‍යය වශයෙන් දුටහ.

**'තෙ වෙ සච්චාභිසමයා - නිච්ඡාතා පරිනිබ්බුතා'**

ඒ ආර්යයෝ ඒ සත්‍යය අවබෝධ කරගැනීම තුළින් කෙලෙස් කුසගින්න නිවාගෙන 'නිච්ඡාතා පරිනිබ්බුතා' පරිනිර්වියාහූය. ඔන්න ගාථා තුනේ අදහස.

ඉතින් මෙයිනුත් අපට පැහැදිලි වෙනවා බුදුරජාණන් වහන්සේගේ වචනයට අනුව මුළු මහත් ලෝක සත්ත්වයාම - දෙවියන්, බඹුන් සහිත හැම කෙනෙක්ම - නාමරූපය සත්‍ය හැටියට අරගෙන මඤ්ඤනා කිරීම තුළින් මේ මාර බැම්මට බැඳිල ඉන්න බව. අපි ගිය වර දේශනයේදී මතු කර ගත්තු වේපචිත්ති අසුරේන්ද්‍රයා පිළිබඳ කථාවෙනුත්[2] පැහැදිලි වුනේ ඒකයි. කෙටියෙන් සලකාගන්න කලින් අපි කියාපු කාරණය. බුදුරජාණන් වහන්සේ එක් අවස්ථාවක සංඝයා වහන්සේලා අමතලා ප්‍රකාශ කරනවා සුරාසුර යුද්ධය අතීතයේ ඉඳල තිබුණා. ඒ කථාන්තරයත් ඉදිරිපත් කරගෙන සුරාසුර යුද්ධයෙන් අසුරයින් පැරදුණා, සුරයින් දිනුවා. එතකොට වේපචිත්ති අසුරේන්ද්‍රයා දෑත්, දෙපා, ගෙල කියන පස් තැනකින් බැඳලා, දෙවියන් සුධර්මා දිව්‍ය සභාවට අරගෙන ආවා. ඒ අසුරේන්ද්‍රයා බැඳපු පඤ්ච බන්ධනය කොයි විදියේ එකක්ද කියලා බුදුරජාණන් වහන්සේ වදාරනවා. යම් විදියකින් වේපචිත්ති අසුරේන්ද්‍රයා සිතුවොත් අසුරයින් අධාර්මිකයි, දෙවියන් ධාර්මිකයි

මම දිව්‍ය ලෝකයේ නවතින්න ඕන කියල ඒ බන්ධන පහෙන්ම මිදිලා දිව්‍ය සම්පත් ලබනවා. නමුත් යම් වේලාවක හිතුවොත් දෙවියන් අධාර්මිකයි අසුරයින් ධාර්මිකයි මම යනවා ආපසු අසුර ලෝකෙට කියලා ඒ බැමි පහෙන් නැවතත් බන්ධනයට අහු වෙනවා. එහෙම ප්‍රකාශ කරල බුදුරජාණන් වහන්සේ වදාරනවා මෙන්න මේ විදියට සියුම් ඒ වේපචිත්ති බන්ධනය 'එවං සුඛුමං ඛො වෙපචිත්තිබන්ධනං'. නමුත් 'තතො සුඛුමතරං මාර බන්ධනං' ඊට වඩා සියුම් මාර බන්ධනය. එහෙම කියලා මාර බන්ධනය හඳුන්වලා දෙනවා. 'අස්මීති භික්ඛවෙ මඤ්ඤිතමෙතං'. වෙමි කියන මේ පැවැත්ම පිළිබඳ මූලික ප්‍රස්තුතය - පැවැත්ම පිළිබඳ මූලික හැඟීම - පවා මඤ්ඤිතයක් හැටියට බුදුරජාණන් වහන්සේ දක්වනවා. එතන නව ආකාරයකින් මඤ්ඤනාවක් බුදුරජාණන් වහන්සේ දක්වනවා. වෙමි කියන එකත් මඤ්ඤිතයක්. මෙය මම වෙමි කියන එකත් මඤ්ඤිතයක්. වන්නෙමි කියන එකත් මඤ්ඤිතයක්. නොවන්නෙමි කියන එකත් මඤ්ඤිතයක්. රූපී වන්නෙමි කියන එකත් මඤ්ඤිතයක්, අරූපී වන්නෙමි කියන එකත් මඤ්ඤිතයක්. සඤ්ඤී වන්නෙමි කියන එකත් මඤ්ඤිතයක්. අසඤ්ඤී වන්නෙමි කියන එකත් මඤ්ඤිතයක්. නෙවසඤ්ඤීනාසඤ්ඤී වෙන්නෙමි කියන එකත් මඤ්ඤිතයක් කියලා මුළුමහත් භවයම නෙවසඤ්ඤානාසඤ්ඤායතනය දක්වා විහිදිලා තියන කාම, රූප, අරූප, ලෝක සේරම අහු වෙලා. ඒ මුළු මහත් භවයම මේ මඤ්ඤිතය තුළ බැඳී සිටින බව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරලා අන්තිමට කියනවා 'මඤ්ඤිතං භික්ඛවෙ රොගො, මඤ්ඤිතං ගණ්ඩො, මඤ්ඤිතං සල්ලං, 'මඤ්ඤිතය රෝගයක්, ගඩක්, උලක්' කියලා. අන්න එහෙම ප්‍රකාශ කරලා සංඝයා වහන්සේලාට කියනවා ඒක නිසා 'අමඤ්ඤිත මනෙන චෙතසා' මඤ්ඤනාවෙන් මිදුණ සිතකින් වාසය කරන්න කියලා සංඝයා වහන්සේලාට උපදේශයක් දෙනවා.

මෙයින් අපට හිතාගන්න තියෙන්නේ මේ ලෝකයා - දැන් අපි නාමරූප ගැන කොතෙකුත් මේ පින්වතුන්ට කියලා දීල තියෙනවා. සලකාගන්න පුළුවන් මේ වේදනා, සඤ්ඤා, චෙතනා, ඵස්ස, මනසිකාර කියන පංචවිධ නාම ධර්මයන් තුළින් පඨවි, ආපො, තෙජො, වායො කියන මහාභූත ධර්ම ග්‍රහණය කරගෙන ලෝකයා මේ සංසාරයේ ආත්ම ස්නේහයෙන් රඟදක්වන ශෝකාන්ත ප්‍රේම ජවනිකාවක හොඳ නිදර්ශනයක් අපි මේ පින්වතුන්ට කීප වරක් මතක් කරලා දුන්නා නාසිසස් ග්‍රීක තරුණයා පිළිබඳ කථාව.

නාසිසස් නමැති ග්‍රීක තරුණයා තමන්ගේ මුහුණ දැකලා නැහැ කවදාවත්. වනයේ ඇවිදින අතරේ පොකුණකට නැඹුරු වෙලා මුහුණ හෝදන්න ගියහම තමන්ගේ මුහුණ දැකලා රැවටුණා දෙවඟනක්ය කියලා. දෙවඟන වැළඳගන්න උත්සාහ ගන්න වාරයක් පාසාම දිය රැළිවලින් ඒක ආවරණය වුනා. දෙවඟන වැහිල ගියා. අන්න ඒ උපමාව මෙතනට කිට්ටු කර ගත්තොත් ලෝකයා දෙයක් කියලා මඤ්ඤනා කිරීම තුළින් 'දෙයක්' කියල යමක් හිතා ගන්නවත් එක්කම එය අඤ්ඤථා භාවයට පරිවර්තනය වෙනවා. දෙයක් කියලා හිතාගත්තම කියන්නේ **'මෙසේ බව'**. අනිත්‍යතා දිය රැළි ඇවිල්ලා ඒක **'අන් සේ බවට'** පරිවර්තනය වෙනවා. දැන් ටිකකට හිතා ගන්න මේ ඔරලෝසුව අපි 'දෙයක්' කියල ගත්තා. අපට ඒක අර්ථවත් දෙයක් වෙලාව බලාගන්න. ඒක යම් වෙලාවක ක්‍රියා විරහිත වුණහම අන් සේ බවට පරිවර්තනය වුණා. අපි ඒක ඔරලෝසුවක් හැටියට නොගෙන මේ කුණුගොඩේ තියන මොකක් හරි කියලා ගත්ත නම් එහෙම දෙයක් වෙන්නෙ නැහැ. මඤ්ඤනාවක් ඇති කරගත්තෙ නැහැ නේ. ඔන්න පොඩි නිදර්ශනයක් කිව්වෙ. ඔන්න ඔය විදියේ දෙයක් තුළින් බුදුරජාණන් වහන්සේ මේ සත්‍යය අපට ප්‍රකාශ කරනවා. ඒක තවත් වඩා ගැඹුරින් ගිය වර දේශනාවෙදිත් අපි මතක් කළා. ඒත් මහ ප්‍රබල දේශනාවක් බුදුරජාණන් වහන්සේ සම්බෝධිය ලබාගෙන ලෝකය දිහා බලලා සංවේගයෙන් යුක්තව රාග, ද්වේෂ, මෝහවලින් පීඩිත සත්ත්වයින් දිහා බුදු ඇසින් බලලා දේශනා කළ මහ පුදුම ගාථාවක්, ගද්‍යයත්, පද්‍යයත් අතර විදියේ උදාන පාඨයක් එයින් කොටසක් අපි ගනිමු.

**'අයං ලොකො සනතාපජාතො ඵසසපරෙතො රොගං වදති අතතතො'**[3]

ආදී වශයෙන් කියන්නේ මේ ලෝකයා සන්තාපයට වැටිලා මේ රෝගයකට, ලෙඩකට, ආත්මය කියල කියනවා. ඊළඟට කියනවා 'යෙන යෙනහි මඤ්ඤති තතො තං හොති අඤ්ඤථා' යම් යම් ආකාරයකින් මඤ්ඤනා කරයිද එයින්ම එය අඤ්ඤථා භාවයට පත් වෙයි කියල. ඊළඟට කියනවා,

**'අඤ්ඤථාභාවි භවසත්තො ලොකො**<br>
**භවපරෙතො භවමෙවාභිනන්දති**<br>
**යදභිනන්දති තං භයං යසස භායති තං දුකඛං**<br>
**භව විප්පහානාය ඛො පනිදං බ්‍රහමචරියං වුසසති'**

මහ පුදුම කියමනක් එතන තියෙන්නෙ.

'අඤ්ඤථාභාවි භවසත්තො' භවය කියලා කියන පැවැත්ම තුළම තිබෙන්නේ අන් සේ බවට පරිවර්තනය වන සවභාවයයි. ඒ පරිවර්තනය වෙන සවභාවය ඇති භවයට ලෝක සත්ත්වයා ඇලිලා ඉන්නවා, ඒකට ගැති වෙලා ඉන්නවා. **'අඤ්ඤථාභාවි භවසත්තො ලොකො භවපරෙතො භවමෙවාභිනන්දති'** භවය ගැනම සතුටු වෙනවා. 'යදභිනන්දති තං භයං' ඒ භවය ගැන සතුටු වීමම අන්තරාවක්, උපද්‍රවයක්, භයක්. මොකද හේතුව? 'යස්ස භායති තං දුක්ඛං' මොකටද බය වෙන්නේ ඒ භවය 'මෙසේය' කියල හිතාගත්තු එක අන් සේ බවට පරිවර්තනය වන එකට බයයි. නමුත් අන් සේ බවට පරිවර්තනය වෙනවා. ඒක වළක්වන්න බැහැ. ඔන්න ලෝකයාගේ තත්ත්වය. අන්න ඒක නිසා තමයි මේ මඤ්ඤනා කියන වචනය ඉතාමත්ම වැදගත් වචනයක් වන්නේ මේ ධර්මයේ.

එහෙම නම් කොතනද විමුක්තිය කියල කෙනෙකුට හිතෙන්න පුළුවන්. ඒකට අපි මතු කරන්න කැමතියි මේ අවසථාවේ ඔය මඤ්ඤනා කරන්නේ - දැන් අපි කිව්වනෙ දෙයක් හැටියට හිතාගන්නව කියල. ඉන්ද්‍රිය හයක් තියන බව කවුරුත් දන්නවා. බාහිර ඉන්ද්‍රිය පහ තමයි ඇස, කන, නාසය, දිව, කය කියන ඒවා. ඔය ඉන්ද්‍රිය පහෙන් ගන්න අරමුණු මනසට එනකොට ඒවා අමුතු සවරූපයක් ගන්නවා. මනසට එන ඔක්කොම අරමුණු 'ධම්ම' නමින් හඳුන්වනවා. 'ධම්ම' කියන්නේ අපි බුද්ධ ධර්මය කියනකොට යෙදෙන අදහස නොවෙයි. 'දෙය' කියන අදහසයි. සිංහලෙන් කිව්වොත් 'දෙය.' මනසට එය 'දෙයක්' විදිහටයි ඉදිරිපත් වෙන්නේ. ඇහැට දකින රූපය, කනට ඇසෙන ශබ්දය. ඒ ඔක්කොම ඇවිල්ලා මනසට එනකොට මනසට අරමුණු හැටියට ඉදිරිපත් වන්නේ 'ධම්ම' - දෙයක්. එතකොට මේ ප්‍රශ්නය තිබෙන්නේ අන්න ඒ මනසට එන අරමුණු වන දෙය පිළිබඳව බව ඉස්සෙල්ලා සලකාගන්න. ඊළඟට අපට කියන්න වෙන්නේ මනසට අරමුණු වන දෙය පිළිබඳව මූලික ආකෘතිය ප්‍රකාශ කෙරෙන ඉතාමත්ම වටිනා සූත්‍රයක් මැදුම් සඟියේ මුලටම දකින්න ලැබෙනවා මූලපරියාය සූත්‍රය නමින්. සංගීතිකාරක ඒ මහා රහතන් වහන්සේලා ඒ සූත්‍රයේ වැදගත්කම සලකල වෙන්ට ඕන මූලපරියාය සූත්‍රය මජ්ඣිම නිකායේ මුලටම දැම්මේ. නමුත් අවාසනාවකට වාගේ මේ කාලේ ආචාර්යවරු මජ්ඣිම නිකාය ගෝලයින්ට උගන්වනකොට කියනවා ඔය පළවෙනි දේශනාව අතහැරලා ඊළඟ එකේ ඉඳලා කියන්න, ඒක අහන් හිටිය අයටත් තේරුණෙ නැහැ

කියලා. අපි නම් කියන්න කැමතියි මේ පළවෙනි දේශනාව තමයි මුළු මහත් බෞද්ධ දර්ශනයම මුළු මහත් සද්ධර්මය හරියාකාරව තේරුම් ගන්න උපකාර වන හෝඩිය. මොකද එහෙම කියන්නේ? ඒ මූලපරියාය සූත්‍රයේ මේ මනසට අරමුණු වන හැම දෙයක් පිළිබඳවම මුල් ආකාරය මුල් ආකෘතිය පෙන්නුම් කරනවා. 'මූල පරියාය'.

ඊළඟට ඒ දේශනාව ඉදිරිපත් කරන ආකාරය කියමු. ඒ සූත්‍රයේ තියෙන්නෙ කෙටි නිදානයක්. උක්කට්ඨා කියන නගරයේ සුභග වනයෙහි සල් ගසක් මුල වැඩ ඉඳගෙන බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලා අමතලා - ප්‍රශ්නයක් ඉදිරිපත් වුණ නිසා නොවෙයි - වැදගත් කාරණයක් සංඝයා වහන්සේලාට ප්‍රකාශ කිරීම් වශයෙන් මෙන්න මෙහෙම දේශනා කරනවා 'සබ්බධම්ම මූලපරියායං වො භික්ඛවෙ දෙසිස්සාමි. තං සුණාථ සාධුකං මනසි කරොථ භාසිස්සාමි' ආදී වශයෙන් මහණෙනි මම නුඹලාට හැම දෙයකම මුල් ආකාරය, මුල් ආකෘතිය දේශනා කරනවා. හැම දේකම මුල් ආකෘතිය කියලා කියන්නේ පින්වතුනි, දැන් මේ අපේ මනසට අරමුණු වන හැම දෙයකම ඒවා හිතට වැටහෙන ආකාරයක් තියනවා. ඒ මූලික ආකාරය තමයි ව්‍යාකරණය තුළ ගැබ් වෙලා තියෙන්නේ. භාෂා ව්‍යවහාරය තුළ මේ මනසට අරමුණු වන හැම දෙයක්ම යම්කිසි ව්‍යාකරණ රටාවකට අනුවයි ඉදිරිපත් වන්නේ. අන්න ඒ ව්‍යාකරණ රටාව පිළිබඳව සාමාන්‍ය ධර්මය නොඇසූ - පෘථග්ජන පුද්ගලයා දක්වන ආකල්පයත්, රහත්බව නොලැබූ සේඛ පුද්ගලයා ආර්ය පුද්ගලයා දක්වන ආකල්පයත්, රහතන් වහන්සේ දක්වන ආකල්පයත්, තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ දක්වන ආකල්පයත් මේ මූලපරියාය සූත්‍රයේ විග්‍රහ වෙනවා. මේ එක් එක් ප්‍රඥප්තිය හෝ සංකල්පය කියල කියමු. ඒවා පිළිබඳව මේ කොටස් හතර දක්වන ආකල්ප හතරක් සඳහන් වෙනවා. නමුත් අපට පුළුවන් මේක තුනක් කරගන්න. මොකද රහතන් වහන්සේගේ ආකල්පයත්, තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ආකල්පයත් එකයි. ඒ කියන්නේ අර්හත්වයෙන් සමානයි. තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ ශාස්තෘන් වහන්සේ වශයෙන් ප්‍රකට කළ නිසා ඒ ප්‍රධාන තැන දුන්නා. ඒ රහතන් වහන්සේගේ ආකල්පය තමයි බුදුරජාණන් වහන්සේ තුළත් තියෙන්නෙ. එතකොට මේක ආකල්ප තුනක් හැටියට හඳුන්වන්න පුළුවන්. දැන් මේ සූත්‍රය ටිකක් තේරුම් ගන්නයි අපි මේ විග්‍රහ කරන්න යන්නේ. අපි කිව්වා මේ සූත්‍රයේ තියෙන්නේ පෘථග්ජන පුද්ගලයා ලෝකයේ ව්‍යවහාර

වන ව්‍යාකරණ රටාව දිහා බලන ආකාරයත් මේ ධර්මයේ හික්මෙන සේඛ නමින් හැඳින්වෙන සෝවාන් ඉඳලා අනාගාමී දක්වා ආර්ය පුද්ගලයින් ඒ ව්‍යාකරණ රටාව දිහා බලන ආකාරයත්, රහතන් වහන්සේල බලන ආකාරයත්.

ඒ සියලුම ධර්ම නියෝජනය කරන්න බුදුරජාණන් වහන්සේ මෙතන ධර්ම විසි හතරක් ඉදිරිපත් කරනවා. ඒක බුද්ධ ඥානයට ගැළපෙන ආකාරයට ඔක්කොම ධර්ම නොවෙයි. යමකට නිදර්ශන දක්වනකොට ඔක්කොම දක්වන්න බැහැනෙ. නමුත් 24 ක් දක්වනවා. ඒවා කෙටියෙන් මෙහෙම සලකාගන්න පුළුවන්. පළමුවෙන්ම පඨවි, ආපො, තෙජො, වායො කියන මහාභූත ධර්ම හතර. ඊළඟට භූතා දෙවා පජාපතී බ්‍රහ්මා ආභස්සරා, සුභකිණ්හා, වෙහප්ඵලා අභිභූ කියන සත්ත්ව කොට්ඨාශ අට. ඊළඟට ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන. ආකිඤ්චඤ්ඤායතන, නෙවසඤ්ඤානාසඤ්ඤායතන' කියන අරූප සත්ත්ව හතර ඊළඟට කියනවා දිට්ඨ, සුත, මුත, විඤ්ඤාත කියන හතර. දුටුව, ඇසුණ, දැනුණ, දතුව. අන්තිමට කියවෙනවා එකත්තං, නානත්තං, සබ්බං, නිබ්බානං කියන ප්‍රඥප්ති හතර.

ඔය විදියට විසිහතරක් මෙතන බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කරල. ඒ එක එකක් පිළිබඳව අන්න අර කියාපු කොටස්- අපි දැන් කියමු- කොටස් තුනක් දක්වන විවිධ ආකල්ප විග්‍රහ කරනවා. දැන් අපි එකක් නිදර්ශනයට ගත්තාම මේ පින්වතුන්ට ඒ අනුව සලකාගන්න පුළුවන්. දැන් මුලටම අපි කිව්වනේ මේ විසිහතරෙන් පළමුවෙන් තියෙන්නෙ පඨවී, ආපො, තෙජො, වායො කියලා මහාභූත ධර්ම හතර බව. එයින් පඨවි- ඔන්න පඨවිය ගැන ධර්මය නොදත් සාමාන්‍ය පෘථග්ජනයා පඨවි ගැන හිතන ආකාරය- පඨවි පිළිබඳව මේ විදියටයි දක්වන්නෙ. ඒ පෘථග්ජනය 'පඨවිං පඨවිතො' පෘථිවිය පෘථිවිය හැටියට හඳුනාගන්නවා. අර මුවා වතුර හඳුනගන්නවා වගේ - එහෙම හිතාගන්න. 'පඨවිං පඨවිතො සඤ්ජානාති, පඨවිය පඨවියයි හඳුනාගන්නවා. පඨවිං පඨවිතො සඤ්ඤත්වා ඒ සඤ්ඤාව තුළින් ඒ පඨවි සඤ්ඤාව ඇති කරගෙන ඊළඟට මොකක්ද කරන්නේ? පඨවිං මඤ්ඤති. අන්න මඤ්ඤනාව. පෘථිවිය යයි හඟී. මඤ්ඤනා කරයි. මානයෙන් හිතාගනී. පඨවියා මඤ්ඤති. පෘථිවියෙහි යයි හඟී. පඨවිතො මඤ්ඤති. පඨවියෙන් යයි හඟී. පඨවිං මෙති මඤ්ඤති පෘථිවිය මගේ යයි හඟී. පඨවිං අභිනන්දති. පෘථිවිය පිළිබඳව සතුටු වෙයි. ඊළඟට

බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. 'තං කිස්ස හෙතු?' මොකද එයට හේතුව. 'අපරිඤ්ඤාතං තස්සාති වදාමි' මේ පෘථග්ජනයාට යථා අවබෝධය නැති නිසයි, පිරිසිඳ දැනගත්තේ නැති නිසයි. ඔන්න එතකොට පෘථග්ජනයාගේ ආකල්පය.

ඔන්න ඊළඟට සේඛ පුද්ගලයා පිළිබඳව මෙහෙමයි ප්‍රකාශ කරන්නෙ.සේඛ - ඒ කියන්නෙ රහත් වුනේ නැති ආර්ය පුද්ගලයා - රහත් බව සඳහා හික්මෙන ඒ පුද්ගලයා පිළිබඳව සඳහන් වෙන්නේ,'පඨවිං පඨවිතො අභිජානාති-සඤ්ජානාති නොවේ අභිජානාති'. මොකද මාර්ග ඵල අවබෝධය තුළින් සත්‍යාවබෝධයක් මොහොතකට හරි ලැබුනා. ඝන අන්ධකාර රාත්‍රියක විදුලි කෙටීම තුළින් යමක් දකින්න වගේ නිවන දුටුවා යන්තමට. ඒක තුළින් යම් අවබෝධයක් ආවා සඤ්ඤාවට වඩා ඉහළ. මේකයි යථා තත්ත්වය කියල. මේකයි අභිජානාති කියන්නේ. හැබැයි පූර්ණ අවබෝධය ඇවිල්ල නැහැ. මෙහෙමයි කියන්නේ. පඨවිං පඨවිතො අභිජානාති. පඨවිං පඨවිතො අභිඤ්ඤාය පඨවිං. ඔන්න අමුතු වචනයක් තියෙනව 'මා මඤ්ඤි' පඨවිං මා මඤ්ඤි, පඨවියා මා මඤ්ඤි, පඨවිතො මා මඤ්ඤි, පඨවිං මෙති මා මඤ්ඤි, පඨවිං මාභි නන්දි. ඔන්න ඔය විදියේ 'මා' කියන වචනයක් යොදනවා. ඕක අටුවාවට ලොකු ගැටලුවක්[4]. මොකක්ද මේ 'මා' කියන්නේ කියල. මේක පැහැදිලි කාරණයක්. 'මා' කියන නිපාතය පාලි භාෂාවේ යෙදෙන්නේ ප්‍රතිෂේධාර්ථයෙන්-වැළැක්වීමේ අර්ථයෙන්. මේ පින්වතුන් අහල තියෙනවානෙ "මා නිවත්ත අභික්කම" කියන්නෙ නොනැවතී ඉදිරියට යව. මොහොකට හරි 'කරන්න එපා' කියන එකට 'මා' කියල කියනවා. මේක තෝරගන්න බැහැ අටුවාවට. අටුවාව කියනවා මේක ආර්ය පුද්ගලයා මඤ්ඤනා නොකරනවාත් නොවෙයි කරනවාත් නොවෙයි. එහෙම නොවෙයි මේක ගන්න තියෙන්නේ ආර්ය පුද්ගලයා සේඛ කියල හඳුන්වන්නේ හික්මෙන තැනැත්තෙක්. ඒ හික්මීමට අදාළව ඒ ආර්ය පුද්ගලයා නිරන්තරයෙන් හිතට ඉදිරිපත් කරගන්නවා සඤ්ඤාවෙන් මිදුණ නමුත්, අභිඤ්ඤාව ලබාගෙන ඇති නමුත්, පරිඤ්ඤාව කියන පිරිසිඳ දැනීම තාම ලැබිල නැහැ. ඒ සඳහා හික්මෙන නිසා නිතර මතක් කරගන්න සිදු වෙනවා. හික්මෙන්න සිද්ධ වෙනවා අර අභිඤ්ඤාවට අනුව මඤ්ඤනා නොකරන්න. ඒක නිසා තමයි පඨවිං මා මඤ්ඤි කියන්නේ. පෘථිවිය යයි නොහඟුව. 'පෘථිවිය' යයි කල්පනා නොකරව කියල තමාටම කියාගන්නවා වගේ. පෘථිවියෙහි යයි නොහඟුව. පෘථිවියෙන්

යයි නොහඟුව පඨවිං මාභිනන්දි. පෘථිවිය පිළිබඳ සතුටක් ඇති නොකරගන්න උත්සාහ කරනව. මොකද හේතුව? පරිඤ්ඤෙය්‍යං තස්සාති වදාමි. ඔහු විසින් පිරිසිඳ දතයුතු නිසා, තව ඉදිරියට කරන්න තිබෙන නිසා.

ඔන්න එතකොට ඒ ආර්ය පුද්ගලයා පිළිබඳව. ඔන්න ඊළඟට අපි කිව්වා රහතන් වහන්සේගේ ආකල්පයත් තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ආකල්පයත් එක සමානයි. මෙහෙමයි තියෙන්නේ රහතන් වහන්සේ ගැන කියන්නේ මෙහෙමයි. පඨවිං පඨවිතො අභිජානාති. පඨවිං පඨවිතො අභිඤ්ඤාය පඨවිං න මඤ්ඤති, පඨවියා න මඤ්ඤති, පඨවිතො න මඤ්ඤති, පඨවිං මෙති න මඤ්ඤති, පඨවිං නාභිනන්‍දති. ඒ කියන්නේ රහතන් වහන්සේත් බුදුරජාණන් වහන්සේත් අර කියාපු පඨවි කියන සංකල්පය පිළිබඳව අනුගමනය කරන්නේ මේ විදියටයි. උන්වහන්සේගේ හිතට වැටහෙන්නේ ඒ පිළිබඳ අභිඤ්ඤා වශයෙන් තේරුම් අරගෙන තිබෙන නිසා ඒවායේ ශූන්‍යත්වය. පෘථිවිය පෘථිවිය යයි මඤ්ඤනා කරන්නේ නැහැ. පෘථිවියෙහි යයි මඤ්ඤනා කරන්නෙ නැහැ. පෘථිවියෙන් යයි මඤ්ඤනා කරන්නේ නැහැ. පෘථිවිය මගේ යයි මඤ්ඤනා කරන්නෙ නැහැ. පෘථිවිය පිළිබඳව සතුටක් ඇති කරගන්නෙත් නැහැ. ඔන්න එතකොට ඒ අනුව හිතාගන්න අපි කිව්වනේ 24 ක් තියනව කියල. මේ එක් එක් මඤ්ඤනාව පිළිබඳව අර විදියටයි බුදුරජාණන් වහන්සේ දක්වන්නේ. ඒ දේශනාව ඉවර වෙන්නේ මෙහෙමයි. තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ ගැන විශේෂයෙන් දක්වන්නේ උන්වහන්සේ තමයි මේ ධර්මය හෙළි කරල දුන්නේ. ඒක නිසා මේ විදියට දක්වන්න හේතුව බුදුරජාණන් වහන්සේ අන්තිමට ප්‍රකාශ කරනවා 'නන්දි දුක්ඛස්ස මූලන්ති ඉති විදිත්වා භවා ජාති භූතස්ස ජරාමරණං' දුකට මුල 'නන්දි' නම් වූ සතුටු වීමයි. ඒක නිසයි කිසිම සංකල්පයක් පිළිබඳව අභිනන්‍දනයක් නොකරන්නේ. 'නන්දි දුක්ඛස්ස මූලං' සතුටු වීම තමයි දුකේ මුල. සතුටු වීම තුළ තමයි භවයක් හැදෙන්නේ ඒ භවය අර කියාපු විදියට අන් සේ බවට පරිවර්තනය වෙනවා. ඒක දුකට මුලයි. උපත ජාති, ජරා, මරණ ඔක්කොම එන්නේ ඒකයි.

ඉතින් මෙන්න මේ සූත්‍රය දැන් මේ පින්වතුන්ට තේරෙන අන්දමට ගත්තොත් ටිකකට හිතාගන්න මුවා පිළිබඳ උපමාව. අපි නිතර කථා කරල තියනවනේ ඒ මුවාට පෙනෙන දර්ශනය මුවා වතුර කියලා හිතාගෙන ඒ

ඔස්සේ දුවනවා. නමුත් යම් කිසි කෙනෙකුට හිතුනා නම් මේක වතුර නොවෙයි යම් කිසි කාලගුණික හේතුවක් නිසා අර මිරිඟුව දැක්කත් වතුරයි කියල හිතුණත් 'ආ වතුර නම් වෙන්න බැහැ'අන්න ඒ විදියට හික්මෙනවා. සම්පූර්ණ පරිඥාව ඇති කෙනා අර විදියටවත් හිතන්නෙ නැහැ. ඒක සම්පූර්ණයෙන්ම දන්නවා. ඒ ආකාරයෙන්ම. අපි ඔය කෙටි නිදර්ශනයක් දැක්වූවේ. අටුවාව මේවා ඔක්කොම පටලවාගෙන අටුවාව කල්පනා කරනවා මා මඤ්ඤි කියන එක තේරුම් ගන්න බැරිව මේ දෙකට අතරෙයි කියල හිතනවා. අපි කිව්වේ ඒක හික්මීමෙ කොටසක්. ඊළඟට තවත් පටලැවිල්ලක් තියෙනවා. මේ සංකල්ප 24 අගටම තියනවා 'නිබ්බාන' කියලා එකක්. අන්න ඒක තේරුම් කරන්න ගියහම තමයි ලොකු පටලැවිල්ලක පැටලෙන්නේ. ඇයි මේ නිබ්බාන ගැන අපිට සතුටු වෙන්න බැරි නම් අපි කොහොමද නිවන් දකින්නේ? ඔන්න එතන ප්‍රශ්නයක් එනවා. ඒක නිසා අටුවාචාරීන් වහන්සේලා කියනවා මෙතන මේ කියන නිබ්බානය අපේ නිවන නොවේ. අන්‍යාගමිකයන්ගේ නිවන කියලා[5]. එහෙම කියලා බුදුරජාණන් වහන්සේ මුළු මහත් භාෂා ව්‍යවහාරයට එල්ල කළ ප්‍රහාරයෙන් නිබ්බාන කියන වචනය බේරගන්න අටුවාචාරීන් වහන්සේලා උත්සාහ කරනවා. නමුත් ඒක නිශ් ඵල ප්‍රයත්නයක්. මොකද හේතුව? නිවන පිළිබඳව මඤ්ඤනා කරන තාක්, නිවනින් නිවනෙහි නිවන කියල නිවන පිළිබඳව සතුටු වෙන තාක්, නිවන ලැබෙන්නෙ නැහැ. මේක කෙනෙකුට පුදුමයක් වෙන්න පුළුවන්. අපි මේ කවුරුත් නිවන නේ බලාපොරොත්තුවෙන් ඉන්නේ. ඉතින් නිවන ගැන සතුටු වෙන්නෙ නැතිව මොකක් ගැන ද සතුටු වෙන්නෙ. ඕක තමයි අටුවාචාරීන්ටත් ප්‍රශ්නෙ. නමුත් මෙතන ඉතාමත්ම ගැඹුරු කාරණයක් තියෙන්නෙ භාෂා ව්‍යවහාරය පිළිබඳව. ඒක ටිකක් තේරුම් කරගන්න අපි නිදර්ශනයක් දෙමු ශාසන ඉතිහාසය ආශ්‍රයෙන්.

මේ පින්වතුන්ට කලිනුත් යම් පමණකට දේශනාවකදී විග්‍රහ කළා ශාසනයේ වාර්තාගත වෙච්ච කාරණයක්. සම්බුද්ධ පරිනිර්වාණයෙන් පස්සේ ප්‍රථම සංගායනා අවස්ථාව වෙනකොට ධර්ම විනය සංගායනා කරන්න මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ පන්සිය නමක් තෝරාගැනීමේදී ලොකු ගැටලුවකට මුහුණ පාන්න සිදුධ වුණා. මොකක්ද? මේ ධර්මය ඔක්කොම කටපාඩම් කරගෙන හිටියේ ආනන්ද ස්වාමීන් වහන්සේ. නමුත් තාම රහත් වෙලා නැහැ. ඒ නිසා හාරසිය අනූනව නමක් තෝරාගත්තා. ගැටලුවක්

තියෙනවා ආනන්ද හාමුදුරුවෝ නොගෙනත් බැහැ. අරගෙනත් බැහැ. රහත් නොවුන නිසා. අන්තිමට කොහොම හරි අගතියට යන්නෙ නැහැයි කියල තෝරගත්තා. නමුත් මෙහෙමයි සඳහන් වෙන්නෙ පොත පතේ[6]. සංගායනාවට කලින් දවසේ රහතන් වහන්සේලා ආනන්ද ස්වාමීන් වහන්සේට කිව්වලු 'ඇවැත්නි හෙටයි අපේ සංගායනාව රහත් නොවී සංගායනාවට එන එක හොඳ නැහැ, ඒ නිසා අප්‍රමාද වන්න.' දැන් මේ පින්වතුන්ට 'හෙටයි විභාගේ' කිව්වහම කොහොමද දන්නවනෙ. මේ විභාග පාස් කළ පින්වතුන් දන්නව ඇතිනෙ ඒවට දඟලපු හැටි. ඒ වගේ ආනන්ද ස්වාමීන් වහන්සේත් දැඩිව වීර්යය අධිෂ්ඨාන කරගෙන 'කායගතා සතිය අධිෂ්ඨාන කරගෙන' එතන කියවෙන්නේ රැයේ වැඩි කාලයක්ම සක්මනේ භාවනා කරමින් හිටියා. ඊළඟට මේ විදියටයි සඳහන් වෙන්නෙ[7] වෙහෙස නිසා හෝ එළිවෙන යාමයේ හිතුවා මම දැන් ටිකක් සැතපෙන්න ඕන කියල. ගිහිල්ලා ඇඳට වැටිලා පා දෙක එස වුනා කොට්ටෙ තාම හිසට ආවෙ නැහැ. ඒ අතරතුර සියලු කෙලෙසුන්ගෙන් මිදිල රහත් වුනා.

මේක තුළ තියන ධර්මතාව එක එක්කෙනා එක එක විදියට විග්‍රහ කරනවා. අටුවාචාරීන් වහන්සේලා කියනවා දැන් මම වීර්යය කරනව වැඩියි. වීර්යය සම කරගන්න ඕන කියලා හිතුවා කියලා. එහෙම නොවෙයි මෙතන සියුම් ධර්මතාවක් තියනවා. දැන් ආනන්ද ස්වාමීන් වහන්සේට නිවන පෙනුණේ සංගායනාවට ඇතුළු වීමේ 'සර්ටිපිකට්' එකක් හැටියට. සහතික පත්‍රයක් හැටියට. එතකොට නිවන සර්ටිපිකට් එකක් කරගත්තා නේද? නිවන 'දෙයක්' කරගත්තා. සියල්ලම අත හැරීමෙන් ලැබෙන නිවීම පෙන්නුම් කරන **වචනය අල්ලා ගත්තා - "නිවන"**. මම නිවන් දකින්න ඕන කියල. 'මට මදිකමක් රහත් නොවී යන එක.' එතනම මානය තියනවා. ඊළඟට දැඩි වීර්යය අධිෂ්ඨාන කරගත්තා. එතන උද්ධච්චය තියනවා. නිවන අර විදියට මඤ්ඤනා වශයෙන් "දෙයක්" කරගත්තා. එතන අවිද්‍යාව. ඒ නිසා තමයි උන්වහන්සේට අච්චර වීර්යය කරලා බැරි වුණේ නිවන් දකින්ට. නමුත් මොකක්ද වුනේ? අර ඉරියවු හතරට නේ අධිෂ්ඨාන කළේ වීර්යය. සමහර විට ඇඳේ හාන්සි වුණා නම් ඒත් වීර්යය කරන්න තිබුණා. භාවනා කරන්න තිබුණා. නමුත් යම් කිසි ධර්මතාවක් අනුව - ඒ ඉරියවු අතර තියනවා 'සන්ධි' කියල එකක්. **ඉරියාපථ සන්ධි**. ඒ ඉරියවු සන්ධිය ගැන උන්වහන්සේත් කලින් සිතුවේ නැතිව ඇති. **මෙතනදී ඉරියවු සන්ධියේදී දන්නෙම නැතිව විරාමයක් ආවා. ඒ විරාමය තුළ සමහර**

**විට උන්වහන්සේට වැටහෙන්න ඇති අපොයි මම මේ නිවන දෙයක් කරගත්තනෙ.** සමහර විට සුළු මොහොතකට අවබෝධ වෙන්න ඇති මම මේ දඟලන්නෙ මොකටද අතහැරීමනෙ නිවන කියන්නේ.අන්න ඒ අවබෝධය ආව නිසා උන්වහන්සේ ඒ අවස්ථාවේ රහත් වුණා කියන එකයි අපට හිතන්න තියෙන්නේ.

මීට කලින් අවසථාවක නොයෙකුත් උපමා දක්වූවා. ඔය හදිස්සියේ ගමනක් යන කෙනෙක් **හතරමං හංදියට** ආවහම කොච්චර ඉක්මන්කම තිබුණත් වාහනේ ටිකක් හෙමින් යවන්ට සිදු වෙනවා නේ. අන්න ඒ වගේ මෙතෙන්දීත් **ඉරියාපථ සන්‍ධියේදී** ආනන්ද සවාමීන් වහන්සේට විරාමයක් ලැබුණා. ඒක තුළයි අපට හිතාගන්න තියෙන්නේ ඒ නිවන ලැබුණෙ. නිවන පවා ඒ විදියට සතුටු වෙන්න දෙයක් නොවේ.මමත්වය තියනවනේ. දැන් මේ කියාපු කාරණේ සමහර විට පැහැදිලි නොවෙන්න පුළුවන්. ඒකට අපි තව ගමේ ගොඩේ නිදර්ශනයක් දෙමු මේ පින්වතුන්ට. දැන් අවුරුද්ද ළඟයි නේද? අවුරුදු ක්‍රීඩාවල එකක් තියනවා 'කණා කළේ බිඳීම' කියලා. දන්නව නේ? අන්න ඒ වගේ කලයක් බිඳින්න නැතත් අපි පොඩි උපමාවක් දෙමු ටිකක් ඒකට සමාන. දැන් මේ පින්වතුන් දකින්න ඇති බිත්තියේ එහා කොනේ තියනවා **'නිබ්බානං පරමං සුඛං'** කියල ලස්සනට ලියල තියනව කලාකාර මහත්තයෙක්. ඕකනෙ අපේ ඉලක්කය? නේද? **'නිබ්බානං පරමං සුඛං'.** එතකොට අර බිත්තියේ තියනවා නිවන. දැන් මම මෙතන ඉන්න පොඩි උපාසක මහත්තයෙකුගේ සිල් රෙද්දෙන් ඇස් දෙක බැඳලා මේ පිරිසට බිත්තියේ දෙපැත්තට වෙන්න කියලා මෙතන ඉඳලා ඒ උපාසක උන්නැහේට යන්න පාර හරි ගස්සලා ටිකකට හිතන්න අර උපාසක මහත්තයට මම කියනවා දැන් හැරෙන්න නිවන පැත්තට - නිවනනෙ ඕන කරන්නෙ. හැබැයි ඇස් වහල තියෙන්නෙ. මම කියනවා අඩියක් ඉස්සරහට තියන්න. මම කියන හැටියට කරන්නත් ඕන. ඊළඟ අඩියත් තිව්වා. ඊළඟ අඩියත් තිව්වා. ඊළඟ අඩියත් තිව්වා. ඔහොම ඔහොම තියාගෙන තියාගෙන යනවා. මේ අනිත් අය බලාගෙන ඉන්නවා, දැන් ඔන්න බිත්තිය ළඟටම ආවා. මේ උපාසක උන්නැහැ දන්නෙ නැහැ බිත්තිය ළඟට ආ බව. හැබැයි මම කියනවා ''තවත් පියවරක් ඉස්සරහට තියන්න.'' මොකක්ද එතකොට වෙන්නෙ? අර උස්සපු කකුල ආපස්සට හරවන්න වෙනව නේද. මේ උපමාවක් කියන්නේ ගැඹුරෙන් කල්පනාවට ගන්න. ඇත්ත වශයෙන් මේක තේරුම්ගත්තොත් - සංස්කාරත් කලේකට උපමා කරල තියනවනෙ.

**ඒ සංස්කාර කලෙත් බිඳගන්න පුළුවන් මේ කාරණය හරියට තේරුම් ගත්තොත්.** මේ කියන්නෙ අර නිබ්බාන කියන වචනය. ඒක ඉලක්කය කර ගත්තෙ ඉලක්කය **අල්ලගන්න** නොවේ. **ග්‍රහණය කරගන්න** නොවේ. ඒක **විනිවිද යන ඉලක්කයක්.** නිබ්බාන කියන වචනය - එතනදී මඤ්ඤනාව අතහරින්න ඕන. හිත මඤ්ඤනාවෙන් මුදාගන්න ඕන.

ආපස්සට හැරෙනව කියල කියන්නෙ මොකක්ද? තව ටිකක් විග්‍රහ කරල දක්වනව නම් මීට කලින් අවස්ථාවල පෙන්වල තියනව. මේ පින්වතුන්ට ඇඟිලි ගැනලා උගන්වපු කාරණයක් තියනවනෙ. නාම ධර්ම. වේදනා සංඥා චේතනා ඵස්ස මනසිකාර කියලා. ඒවා ආයෙත් මතක් කර ගත්තොත් ඒ ගැන්න ඇඟිලි පහ වේදනා සංඥා චේතනා ඵස්ස මනසිකාර. මනසිකාරය ළඟ තමයි ඵස්ස තියෙන්නේ, මහපටැඟිල්ල ළඟ නේද දබරැ ඟිල්ල තියෙන්නේ. දබර කාරයා තමයි ඵස්ස. එතකොට මේ **ලොකුම දබරය තියෙන්නෙ මනසිකාරයත් ඵස්සයත් අතරෙයි.** ඊළඟට අපි කල්පනා කරල බලමු. මේ මනසිකාරය ගැන. අපි නොයෙකුත් විදියට විග්‍රහ කළා බුදුරජාණන් වහන්සේ මේ මුළු මහත් විඤ්ඤාණය පිළිබඳ මායාව හෙළි කරගන්න ගත්තු මැදුම් පිළිවෙත විග්‍රහ කිරීමේදී අපි පෙන්නුම් කළා ඒකටත් ලෞකික උපමාවක් අපි උපකාර කරගත්ත. දැන් සමහර නඩු තියනවා මිනී මැරුම් නඩු, සොරකම් නඩු, සාක්කිකාරයෙක් නැති අවස්ථා. එතකොට මොකක්ද කරන්නේ? විත්තිකාරයින්ගෙන් එක්කෙනෙකුට සමාව දීලා රජයේ සාක්කි කාරයෙක් කරගෙන කතාව අහගන්නවා. අපි පෙන්නුම් කරල දුන්න බුදුරජාණන් වහන්සේත් කළේ ඒ වගේ දෙයක්. මේ නාම ධර්ම පහෙන් මනසිකාරය මේ සංසාරයේ අපව අරගෙන ආවෙ 'අයෝනිසෝ' හැටියට. ඒ අයෝනිසෝ මනසිකාරය තුළ තමයි මුවා මිරිඟුව ඔස්සේ දුවල කවදාවත් කෙළවරක් නැහැ. අයෝනිසෝ මනසිකාරයෙ කවදාවත් කෙළවරක් නැහැ. දුවන්න දුවන්න මිරිඟුව වතුර වගේ පේන එක තව ඉස්සරහට යනවා. නමුත් බුදුරජාණන් වහන්සේ මේ 'මනසිකාරයා' යෝනිසෝ කළා. මොකද යොනිසෝ කියන්නේ? යෝනි කියන්නේ යමක් හටගන්න තැන. ප්‍රභව ස්ථානය. මේ පැත්තට හැරෙන්න කිව්වා මේ පැත්තට හැරෙව්වා. මේ පැත්තට හැරෙනකොට මොකක්ද කරන්න වෙන්නේ. දැන් මුවා වතුරෙයි කියල, හිතාගෙන වතුර බොන්න - හොඳ ලස්සනට තියනවා වතුර කියලා එහෙම හිත හිතා ප්‍රපඤ්ච කර කර යනවා. මෙතනදී යෝනිසෝ මනසිකාරය තුළින් දැන් හිතන්න යෝගාවචරයා කරන්නේ මොකක්ද? යෝගාවචරයා අර විදියෙ ප්‍රපඤ්චවලින් මිදිලා

විතර්කත් කපා හැරලා සංඥාවෙනුත් මිදිලා. වේදනාවෙනුත් මිදිලා ඔන්න ස්පර්ශය ළඟට ආවට පස්සෙ අන්න එතන තමයි බිත්තිය ඉස්සරහට ආව වගේ වෙලාව.

මනසිකාරය කියන වචනය විග්‍රහ කරල බැලුවොත් 'මනසි' කියන්නේ හිත ඇතුළේ. 'කාර' කියන්නේ ක්‍රියාව. මනසිකාරය කියන්නේ හිත ඇතුළෙම කෙරෙන ක්‍රියාව. **ඇත්ත වශයෙන්ම මේ මනසිකාරයා තමයි ඔක්කොම ප්ලෑන් එක ගැහුවෙ සංසාරෙට.** මනසිකාරය කියන්නේ හිත ඇතුළෙම කෙරෙන වැඩක්. අපට ඒක තේරෙන්නෙ නැහැ. **හිත ඇතුළෙ කෙරෙන වැඩේට උපකාර කරගන්න අරමුණ අපි ඉස්සරහට දානවා.** ඒ ටිකම තමයි බුද්ධ වචනය හැටියට පළමුවෙන්ම මේ අපි කවුරුත් ධම්ම පදයේ කියවලා තියෙන්නේ. **'මනො පුබ්බංගමා ධම්මා මනො සෙට්ඨා මනොමයා'**[7] ලෝකයා හිතන්නේ අනිත් පැත්තට. ලෝකයා ධම්ම පදයක් ලිව්වා නම් ලියන්නේ **'ධම්ම පුබ්බංගමා මනො'** 'දේ' ඉස්සරහ තියෙන්නේ - මනස පස්සේ. බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරල දුන්නා **'මනො පුබ්බංගමා ධම්මා'** 'මනොමයා' කියලත් කිව්වා. මනසින්මයි මේ 'දේ' හදාගන්නේ. **අන්න මනසින්ම හදාගත්තු දෙයක් බව ආනන්ද හාමුදුරුවන්ට වැටහුණා.** මේ නිවන කියන වචනය ඉලක්කයක් පමණයි. සංකේතයක් පමණයි සියල්ල අතහැරීමට. දැන් බලන්න නිවන කියන එකට තවත් වචන රාශියක් මේ පින්වතුන් අහල ඇතිනෙ 'සබ්බසංඛාරසමථො, සබ්බූපධි පටිනිස්සග්ගො, තණ්හක්ඛයො, විරාගො, නිරොධො, නිබ්බානං' මේ එක එක වචනයක් ගත්තත් ඇති. සබ්බසංඛාරසමථ කියන්නේ සියලු සංස්කාර සංසිඳීම නෙ. එතකොට අතන තියෙන්නේ සංස්කාරයන් නෙ. මම දැන් කොහොම හරි මේ සහතික පත්තරය අරගෙන යන්න එපායැ සංගායනාවට. **යන්න ඕන කියලා හිතුවොත් එතන සංස්කාරයක්.** එතකොට **සියලු සංස්කාර අතහැරියෙ නැහැ නෙ.** සබ්බූපධි පටිනිස්සග්ගො මේ මගේ පඤ්චඋපාදානස්කන්ධය අරගෙන ගිහිල්ලා එතන වාඩි කරවන්න ඕන කියල. **උපධි අතහැරියෙ නැහැනෙ.** ඔන්න ඔය විදියට **තණ්හාවත් අතහැරියෙ නැහැනෙ.** ඒ නිසා අපට හිතාගන්න තියෙන්නේ 'නිවන' කියන වචනයේ තියෙන්නේ - සියල්ල අතහැරීමත්, නිවීමත් හඟවන පදයක් පමණයි. නමුත් ලෝකයා ඒක ග්‍රහණය කරනවා. ඒක **වචනයක්** නිසා. අන්න ඒකයි අපි කිව්වේ භාෂා ව්‍යවහාරයේ තියන මුළාව තුළයි ලෝකයා ජීවත් වෙන්නේ.

ඒක බුදුරජාණන් වහන්සේ කදිමට පෙන්නල දීල තියෙනවා. නමුත් අපේ අටුවාචාරීන් වහන්සේලා ඇතුළු - අපට කියන්න සිද්ධ වෙනවා - මේ මුළු මහත් බෞද්ධ නිකායන් රාශියක්ම මේ භාෂාව පිළිබඳ බුදුරජාණන් වහන්සේ දක්වපු ඒ පුදුම අන්දමේ දර්ශනය තේරුම් නොගැනීම නිසා මුළාවට වැටිලා ආයෙත් අර ආත්ම පාරේ ගිහිල්ල තියෙනවා. නමුත් මෙතන අපි පෙන්නුවා මනසිකාරය. එතකොට මනසට එන අරමුණ 'දෙයයි'. මෙතනදී මනසට එන අරමුණ 'නිබ්බාන'. ඒක වචනයක් පමණයි කියලා එන ඒ අවබෝධය එක්කම මොකක්ද වෙන්නේ? **මනෝ විඤ්ඤාණය කිඳා බහිනවා.** අපි කිව්වනේ විඤ්ඤාණය කියල කියන්නේ දෙකක් වෙන් කරගැනීමයි කියලා. කොහොමද දෙකක් වෙන් කරගන්නේ. මේක මනසින්ම හදාගත්ත නම්? **මනසින්ම හදාගත්තයි කියන ප්‍රත්‍යක්ෂ අවබෝධය එනවාත් එක්කම වෙන් කර ගන්න බැරි අවස්ථාවක් එනවා. විඤ්ඤාණය එතනම නිරුද්ධයි.** තේරුම්ගන්න බලන්න. මේ පින්වතුන් විඤ්ඤාණය කියලා කියන්නේ දෙකක් වෙන් කරල ගැනීමනෙ. **ඇසත් රූපයත් වෙන් කරගත්තු තැනනෙ මුවාට අතන වතුර පේන්නෙ. මෙතන මම - අතන වතුර,** එතන **පරතරය** ආයිත් එන්නේ දෙකොනයි මැදයි කථාවට - කොන් දෙකයි. මැදයි කථාව. **දෙකොනක් ඇති තැනයි මැදක් තියෙන්නේ.** මෙතන මම - අතන වතුර. මේ පරතරය ගෙවිවට පස්සේ මට වතුර ගන්න පුළුවන්. වතුරට ළං වෙන්න පුළුවන්. අන්න ඒ වගේ තමයි ලෝකයා හිතන්නෙ. අරමුණ ඉස්සරහට දානව. අරමුණ ඉස්සරහට දාල මෙතන මම - අතන අරමුණ. ඔන්න ලෝකයාගේ චින්තනය.

නමුත් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා ඒ විදියට ඒ චින්තනය නොවෙයි මෙතන තියෙන්නේ ඒ මඤ්ඤනාව තුළ. මඤ්ඤනාව කියන්නේ අරක 'දෙයක්' කරගත්තා. පඨවිය දෙයක් කරගත්තා. පඨවි, ආපො, තෙජො, වායො පමණක් නොවෙයි සබ්බධම්ම මූලපරියාය කියන කොට, දැන් අපි කිව්වනේ 24 ක් තියනවා කියලා එක ප්‍රඥප්තියක්වත් නිත්‍ය නෑ. දෙව, භූත, පජාපතී බ්‍රහ්මයෝ පවා. දැන් අර නිත්‍යයි කියල හිතාගත්තු බක බ්‍රහ්මයාව අන්තිමට මෙල්ලකරගත්තනෙ බුදුරජාණන් වහන්සේ[8]. ඒ ගොල්ලො දීර්ඝ කාලයක් හිටපු පමණින් මාන්නය ඇති කරගත්ත 'අපි සදාකාලිකයි' කියල - ඒ සත්ත්ව කොටස්. ඊළඟට දිට්ඨ සුත මුත විඤ්ඤාත. බාහිය සූත්‍රය ගැන මේ පින්වතුන් අහල තියනවා. බාහිය දාරුචීරිය තාපසතුමා ඒ හික්මීම හරි වේගයෙන්ම කළා. දුටුවෙහි දුටුමතින් නැවතුනා. නමුත් අපි දුටුව පුටුවක්

කරගන්නවා දුටුවෙන් නවතින්නෙ නැහැ. ඒක පුටුවක් - අපිට ඉඳගන්න පුළුවන්නෙ. අන්න ඒ වගේ ඇසුණ දේ ඇසුණ මතින් නවතින්නෙ නැහැ. ඒක සංගීතයක්. ඒක හොඳ සංගීතයක්. අන්න එහෙම අපි දෙයක් කර ගන්නවා. ඔය දෙයක් කරගැනීම තුළයි සංසාරයේ රැඳෙන්නේ. **'දෙයක්' කරගත්තු හැටියෙම අනිත්‍යතා දිය රැළිවලට වැහිලා ඊළඟට 'අන් සේ බවට' පත් වෙනවා.** එතනමයි භවයේ ශෝකාන්ත නාට්‍යය.

'දෙයක්' කරගත්තු හැටියේම ඒක 'අන් දෙයක්' බවට පරිවර්තනය වෙනවා. ඒකයි අපි කිව්වේ අර නාසිසස්ගේ ප්‍රේම ජවනිකාව වගේ මේ සංසාරයේ අපි කරල තියෙන්නෙත් ආත්ම ස්නේහයෙන් අවසාන මොහොතේ අපි අල්ලගන්නවා - මොකක් හරි අල්ලගන්නවා. ඒකම තමයි ඊළඟට මවුකුසක ආයිත් නාමරූප විඤ්ඤාණ පටලැවිල්ල යනවා. ඉතින් ඔය ඩිංග කියන්නයි අපට ඕන කළේ. කෙනෙකුට ආයිත් අහන්න පුළුවන් නිවන ගැන සතුටු වෙන්න බැරි නම් මොන නිවනක්ද? නිවනින් වැඩක් නැහැ වගේ පේනවනේ. මෙච්චරත් අමාරුවෙන් ලබාගත්තු නිවන ගැන සතුටු වෙන්න බැරි නම් මොකක්ද මේකෙන් ඇති වැඩේ කියල හිතන්න පුළුවන්. අපි විතරක් නොවෙයි කකුධ කියන දේව පුත්‍රයෙකුත් එහෙම හිතපු බව අපට පේනවා. එක සූත්‍රයක් තියනවා සංයුත් සඟියේ. බුදුරජාණන් වහන්සේ අංජන වනයේ මිගදායේ වැඩ වාසය කරන අවස්ථාවක මහා රාත්‍රියේ කකුධ කියල දේව පුත්‍රයෙක් ඇවිල්ල බුදුරජාණන් වහන්සේ උපේක්ෂාවෙන් වැඩ ඉන්න නිසා වෙන්න ඇති ඇහුවෙ **'නන්දසි සමණ'** මහණ ඔබ සතුටු වන්නෙහිද? එතකොට බුදුරජාණන් වහන්සේ අහනවා **'කිං ලද්ධා ආවුසො?'** මොකක් ලබාගත්තට ද? ඊළඟට අහනවා 'තෙනහි සමණ සොචසි?' එහෙනම් මහණ ඔබ දුක් වෙනවද? **'කිං ජීයිත්ථ ආවුසො?'** මොකක්ද නැති වුණේ? තෙනහි සමණ නෙව නන්දසි න සොචසි? එහෙනම් මහණ ඔබ සතුටු වන්නෙත් නැහැ දුක් වන්නෙත් නැහැ. 'එවං ආවුසො' එසේය ඇවැත්නි කියලා. දේවතාවා අහනවා 'ඔබ සිටින්නේ පැවිද්ද ගැන කලකිරීමෙන්ද අරතියකින්ද මේ ඉන්නේ - සතුටක් වත් දුකක්වත් නැතිව? එතකොට බුදුරජාණන් වහන්සේ හොඳ වටිනා ගාථාවක් ප්‍රකාශ කරනවා.

**'අඝ ජාතස්ස වෙ නන්දි - නන්දිජාතස්ස වෙ අඝං**
**අනන්දි අනිඝො භික්ඛු - එවං ජානාහි ආවුසො'**

දුකට පත් වූ කෙනාටයි සතුටින් වැඩක් ඇත්තේ. සතුටට පත් වූ කෙනාටයි දුක තියෙන්නේ. නමුත් භික්ෂුවට නන්දි අඝ කියන දෙකෙන්ම නිදහස් වුණ උපේක්ෂාව. උපේක්ෂා සුවය. ඒක නිසා තමයි මේ පින්වතුන් අහල තියනවා **නිවන අවේදයිත සුඛයක්** කියල දක්වනවා. මොකද බුදුරජාණන් වහන්සේ දක්වනවා වේදනා තුනම දුකක් හැටියට[10]. ඒක නිසා දන් ඒ ඩිංගෙන් අනිත් හරිය හිතාගන්න. නිවන කියන එක අල්ල ගන්න දෙයක් නොවෙයි. ඒක ඉලක්කයක්. ඒක අල්ලගන්න ඉලක්කයක් නොවෙයි. ඒක සඳහා වීර්යය දැරීම තුළින් අන්තිම අවසථාවේ උඩු යටිකුරු වීමක් වගේ වෙනවා - අවසාන අවබෝධය. ඒක නිසා තමයි අනාගාමී පුද්ගලයින් හඳුන්වන්නේ **'ධම්මරාග ධම්මනන්දි'** කියන එක තියනවා කියලා. ඒ නිවන කියන එක තමයි හිතේ බලපවත්වන්නේ. නමුත් ඒකටත් ඇල්මක් තියනවා. ඒක නිසා තමයි සියලු දුක් කෙළවර කිරීමක් නොකර ඊළඟට සුදධාවාසවල උත්පත්තිය ලබන්නේ **'තෙනෙව ධම්මරාගෙන තාය ධම්මනන්දියා[11]'**

ඒ 'ධම්මරාග ධම්මනන්දි' කියන එකයි අන්තිමට අත හරින්නේ. මොකද බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරල තියෙනව. මේ පින්වතුන් අහල ඇති මේ ධර්මය උපමා කරල තියෙන්නේ **'නිත්ථරණත්ථාය නො ගහණත්ථාය'**[12] පහුරකට උපමා කරල තියෙන්නේ. එතර වීම සඳහා මිසක් ග්‍රහණය කිරීම සඳහා නොවෙයි. ඒ වගේම ප්‍රකාශ කරල තියෙනවා **'ආජානනෙතහි ධම්මාපි වො පහාතබ්බා පගෙව අධම්මා'** ධර්මය හරියට තේරුම්ගත්ත නම් ධර්මයත් අතහරින්න ඕන. අධර්මය පමණක් නොවේ. අන්න එතකොට ධර්මයට අදාළ දෙයක් තමයි නිබ්බාන කියන එක. ඒකත් යම් වෙලාවක අතහරින්න සිද්ධ වෙනවා. මොකද මේකෙ **ප්‍රායෝගික අර්ථයක් සඳහා විතරයි මේ භාෂාව පාවිච්චි කරන්නේ.** ග්‍රහණය කිරීම සඳහා නොවෙයි. ග්‍රහණය කළ හැටියේ එතන අමාරුවේ වැටෙනවා. ඔන්න ඔය ඩිංගයි බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ.

ඉතින් අපි මේ නොයෙකුත් උපමාවලින් කියාපු කථාන්තරය තුළ තවත් ගැඹුරක් තියනවා. සූත්‍ර අතර දක්නට ලැබෙනවා සම්බුද්ධ පරිනිර්වාණයෙන් පස්සේ බුදුරජාණන් වහන්සේ නැති උනාට පස්සේ ආනන්ද ස්වාමීන් වහන්සේට ලොකු තැනක් ලැබිච්ච බව. රහත් වෙච්ච මෙහෙණින් වහන්සේලාත් භික්ෂූන් වහන්සේලාත් ඇවිල්ල තමන්ගේ රහත් බව ප්‍රකාශ කරන්නේ ආනන්ද සවාමීන් වහන්සේට. ඒ නිසා ආනන්ද හාමුදුරුවන්ම

දේශනා කළ විශේෂ සූත්‍රයක් තියනවා. ඝෝසිතාරාමයේදී තමන්ගේ හිතවත් සංඝයා වහන්සේලාට දේශනා කළා. මෙහෙම 'යම් භික්ෂුවක් හෝ භික්ෂුණියක් තමන්ගේ රහත් බව ඇවිල්ලා මා ඉදිරියේ ප්‍රකාශ කරනවා නම් ඒ ප්‍රකාශ කරන්නේ අංග හතරකින් එකකින්' - චතුහි අඞ්ගෙහි'[13] ඒ අංග දක්වන්නේ මෙහෙමයි. ඒ භික්ෂුව හෝ භික්ෂුණිය මෙන්න මේ ප්‍රතිපදාවේ ගිහිල්ල තියනවා. **'සමථ පුබ්බංගමං විපස්සනං භාවෙති'** පළවෙනි එක සමථය පෙරටු කර ගෙන විපස්සනාව වඩනවා. එහෙම විපස්සනා වඩාගෙන යනකොට යම් වෙලාවක ලෝකෝත්තර මාර්ගය පහළ වෙනවා. ඒක දියුණු කර ගැනීම තුළින් සංයෝජන ප්‍රහීන කරලා අනුසය නැති කරලා රහත් වෙනවා. දෙවෙනි ක්‍රමය **'විපස්සනා පුබ්බංගමං සමථං භාවෙති'** විපස්සනාව පෙරටු කරගෙන සමථය වඩනවා. එහෙම කරගෙන යනකොටත් ඇතැම් භික්ෂුවකට හෝ භික්ෂුණියකට යම් අවස්ථාවක අනුසය සංයෝජන ආදිය ගෙවා දාන්න පුළුවන්. තුන් වෙනුව දක්වන්නේ යුගනද්ධ ක්‍රමය. **'සමථං ච විපස්සනං ච යුගනද්ධං භාවෙති'** සමථයත් විපස්සනාවත් එකට වඩනවා. එහෙම වඩලත් අර විදියටම යා හැකියි. හතර වෙනුව දක්වන්නේ විශේෂම දෙයක්. අමුතුම දෙයක්. ඒක බොහෝ දෙනාට ගැටළුවක් වෙලා තියනවා. මෙහෙමයි දක්වන්නේ යම් භික්ෂුවකගේ හිත **'ධම්මුද්ධච්ච විග්ගහිත මානසං හොති'** අමුතු වචනයක් එතන තියෙන්නේ යම්කිසි භික්ෂුවකගේ හිත සිතිවිලිවලින් උද්ධච්චයට ගිහිල්ලා එතන මහා විග්‍රහ තත්ත්වයක් ඇති වන හිතක් තියනවා. නමුත් ඊළඟට 'හොති සො සමයො' නමුත් යම් වේලාවක් තියනවා ඒ භික්ෂුවගේ හිත තැන්පත් වෙනවා. සංසිඳෙනවා. සමාධිමත් වෙනවා. අන්න එතකොට ඒ මාර්ගය පහළ වෙනවා. ඒ මාර්ගය දියුණු කරගෙන ගිහිල්ලා අරහත්වයට පත් වෙනවා.

**මෙතන ආනන්ද ස්වාමීන් වහන්සේ දක්වන්න ඇත්තේ තමන්ගේ ප්‍රත්‍යක්ෂයයි.** එච්චරයි කියන්න තියෙන්නේ. තමන් අත්දුටුවා අමුතු ක්‍රමයක් සාමාන්‍ය රීතිය - සමථය පෙරටු කරගෙන විපස්සනා වඩනවා. විපස්සනාව පෙරටු කරගෙන සමථය වඩනවා. එහෙම නැත්නම් ඒ දෙකම එකට වඩනවා. මෙතන මේක බොහෝ දෙනාට ගැටලුවක්. අපට හිතන්න තියෙන්නේ ආනන්ද ස්වාමීන් වහන්සේ තමන්ගේ අත් දැකීම තුළින් ප්‍රත්‍යක්ෂ කරගත්තා මෙහෙමත් අවස්ථාවක්. අර උද්ධච්චකම නිසා, නිවනට දැඩි ඕනෑකම නිසාම, අනිත් ඔක්කොම සම්පූර්ණයි - නමුත් ඒ ටික අඩුයි. ඒක

අහවල් වෙලාවේ කියල නෑ. යම් වෙලාවක සිත සමාධිමත් වෙනවා. තැන්පත් වෙනවා. අන්න එතකොට මාර්ගය පහළ වෙනවා. ඕකෙනුත් අපට හිතාගන්න පුළුවන් මේ ධර්මයේ ගැඹුර. මේවා නොතේරුන නිසා තමයි අපි මෙච්චර තේරුම් කරන්නේ. මොකද නිවන පිළිබඳ මහා විකෘති මතිමතාන්තර දෘෂ්ටි රාශියක් මේ ලෝකයේ පවතිනවා. මට ඇත්ත වශයෙන්ම කියන්ට සිදු වෙනවා බුද්ධ කාලයේ හිටිය බමුණන් දැනගෙන හිටියා බුදුරජාණන් වහන්සේ කථා කරන්නේ මොනවද කියලා මේ කාලයේ සිටින සමහර විට - කියන්න ඕන නැහැ - බොහෝදෙනාටත් වැඩිය. මොකද **බමුණන් හරියාකාරව දැනගත්තා කිසි සේත් බුදුරජාණන් වහන්සේ භවයට ආවඩන විදියේ දෙයක් නොවෙයි නිවන යනුවෙන් දක්වූවේ - භව නිරෝධය.** භව නිරෝධය බමුණන්ට පෙනුණේ උච්ඡේදයක් හැටියට. එතනයි වැරැද්ද. උච්ඡේදයක් නොවේ. උච්ඡේදයක් වෙන්න ආත්මයක් නැහැනෙ. ආත්මයක් තියනවා නම්නෙ උච්ඡේදයක් වෙන්නෙ. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළේ මෙච්චරයි. **'මම එදත් කිව්වෙ අදත් කියන්නේ දුකක් සහ දුකෙහි නිරෝධයක් පමණයි.' 'පුබ්බෙචාහං එතරහිච දුක්ඛඤ්චේව පඤ්ඤාපෙමි දුක්ඛස්ස ච නිරොධං'**[14]

මෙන්න මේ කාරණය අපි පෙන්නුවා. අන්තිමට ඉතුරු වෙන්නේ **'අස්මි'** කියන - **'වෙමි'** කියන - භවය පිළිබඳ මූලික ප්‍රස්තුතය තමයි අන්තිමට අහක් කරන්න වෙන්නේ. ඒකෙ සියුම් බව - අනාගාමී තත්ත්වයේ ඉඳලා රහත් බව දක්වා යන ගමනේ සියුම් බව - ප්‍රකාශ කරන වටිනා සූත්‍රයක් සංයුත් සඟියේ ඛන්ධසංයුත්තයේ තිබෙනවා. කලින් අවස්ථාවකත් මේ පින්වතුන්ට කියන්නත් ඇති ඒක. ඛෙමක සූත්‍රය[15] නමින් හඳුන්වනවා. ඒකෙ මෙන්න මෙහෙම සිද්ධියක් සඳහන් වෙනවා. ස්ථවිර භික්ෂූන් වහන්සේලා සමූහයක් ඝෝසිතාරාමයේ වැඩ වාසය කළා කොසඹෑ නුවර. කොසඹෑ නුවරම බදරිකාරාමයේ සිටියා ඛෙමක කියලා ස්වාමීන් වහන්සේ නමක්. බොහොම ගිලන්ව රෝගීව. අර තෙරුන් වහන්සේලා දාසක කියන එක භික්ෂුවකට පැවරුවා ගිහිල්ලා ඒ ස්වාමීන් වහන්සේගේ සුව දුක් විචාරන්න කියල. ඔන්න දාසක භික්ෂූන් වහන්සේ ගිහිල්ල ඇහුවහම කියනවා ඒ ඛෙමක ස්වාමීන් වහන්සේ මට ඉතාමත්ම අමාරුයි. බොහෝම රෝගීව ගිලන්ව ඉන්නෙ කියලා. වේදනා බහුලයි කියලා ප්‍රකාශ කළා. ඔන්න දාසක ස්වාමීන් වහන්සේ ස්ථවිර භික්ෂූන් වහන්සේලාට ඇවිල්ල කිව්වහම ඒ භික්ෂූන් වහන්සේලා කියනවා ආයිත් අර භික්ෂුව ළඟට ගිහිල්ලා මෙන්න

මෙහෙම අහන්න. ඇවැත්නි රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ කියන පඤ්චඋපාදානස්කන්ධයක් තියනවා. මේවා එකක් පිළිබඳවවත් ඔබ 'මෙය මගේ - මෙය මම වෙමි' ආදී වශයෙන් දකිනවද කියලා. අර දාසක භික්ෂුව ගිහිල්ලා ඒ ප්‍රශ්නය ඇහැව්වා. එතකොට ඛෙමක ස්වාමීන් වහන්සේ කියනවා මම එක ස්කන්ධයක්වත් මගේ ආත්මය හැටියට දකින්නෙ නැහැ. **නමුත් මම රහත් වෙලත් නැහැ.** දාසක භික්ෂුව ඒක තෙරුන් වහන්සේලාට ඇවිල්ල කිව්වහම ඒ ගොල්ලන්ට ඒක තේරුම්ගන්න බැහැ. එහෙනම් රහත් වෙන්න එපායැ.

ඔය විදියට කීප වරක්ම අර දාසක භික්ෂුව යැව්වා ඔය ප්‍රශ්නෙ අහන්න. අපි කෙටි කරල කිව්වොත් මෙහෙම කියන්න තියෙන්නේ. ඛෙමක ස්වාමීන් වහන්සේ කියනවා මම එක ස්කන්ධයක්වත් ආත්මය හැටියට දකින්නෙ නැහැ. නමුත් මා තුළ තියනවා ඉතාමත්ම සියුම් 'අස්මි' කියලා මානයක්. ඒක මේ අහවල් එකය කියලා කියන්න බැහැ. නැවතත් ඇහුවහම ඛෙමක ස්වාමීන් වහන්සේ ''මේ විදියට මට සැරින් සැරේ කියල එවන එක කරදරයක්'' කියලා හැරමිටියත් අරගෙන ගියා අර සංඝයා වහන්සේලා ළඟට. ගිහින් ඔන්න කාරණේ තේරුම් කරනවා තෙරුන් වහන්සේලාට. මම කියාපු කාරණය හරි. මම රහත් වෙලා නැහැ. නමුත් මෙහෙම එකක් තියනවා. මම එක ස්කන්ධයක්වත් මගේ කියල දකින්නේ නැහැ. නමුත් මා තුළ තියනවා සියුම් **'අස්මි' කියලා මානයක් ඡන්දයක් ඉතිරි වෙලා තියනවා.** ඒක මට අහවල් ස්කන්ධය කියලා කියන්න බැහැ. ඒ කට්ටිය අහනවා රූපය පිළිබඳවද 'අස්මි' වෙන්නේ? ඒ එකක්වත් නැහැ. ඔන්න ඊළඟට උපමාවයි මෙතන වැදගත් වන්නේ. උන්වහන්සේ උපමාවකින් ප්‍රකාශ කරනවා. ඇවැත්නි හරියට ඒක සුදු නෙළුම් මලක හෝ රතු නෙළුම් මලක හෝ මහනෙල් මලක හෝ **සුවඳ** තියනවා. කවුරුන් හෝ කිව්වොත් මේ **සුවඳ** නෙළුම් මලේ පෙත්තෙන් එනව කියල, එහෙම නැත්නම් වර්ණයෙන් එනව කියල, එහෙම නැත්නම් රේණුවලින් එනව කියල - ඒ කීම හරිද? අර භික්ෂූන් වහන්සේලාගෙන් අහනවා. නැහැ කියනවා. එහෙම නැත්නම් කොහොමද කියන්න ඕන. ඒක පියුමේ සුවඳ කියලා කියනවා. **මලේ සුවඳ කියනවා හැර කියන්න දෙයක් නැහැ.**

අන්න ඒ වගේ මම මේ එක ස්කන්ධයක්වත් මමය කියල දකින්නෙ නැහැ. නමුත් මා තුළ තියනවා සියුම් අන්දමින් 'වෙමි' කියලා මානයක්. එහෙම කියලා ඊළඟට තවත් උපමාවක් දෙනවා. ඊළඟට කියනවා එහෙම

මානයක් තිබුණට - ඒ ඕරම්භාගිය සංයෝජන කියන මුල් සංයෝජන පහ සිඳපු භික්ෂුවකට ඉදිරියට තියන සංයෝජන පහේ සියුම් බව පෙන්නුම් කරන්නේ ඔන්න ඔය මලේ සුවඳ පිළිබඳ උපමාවෙන්. එහෙම කියලා ප්‍රකාශ කරනවා. යම් අවස්ථාවක ඒ අනාගාමී භික්ෂුව නැවත නැවතත් අර පඤ්චඋපාදානස්කන්ධයේ ඇතිවීම් නැතිවීම් සලකන කොට යම් වෙලාවක් එනවා අර කියාපු 'අස්මි' කියන මාන ටිකත් ගෙවිල යනව. ඔන්න ඕකට උපමාවක් කියනවා. යම් කෙනෙකුට තියනවා කිලිටි වස්ත්‍රයක්. ඒක රදවුන්ට දෙනවා සෝදන්න. රදවුන් ඒක සෝදනවා. යම් කිසි - ඒ කාලයේ තිබුණ සබන් වගේ දෙයක්. ගොමත් මිශ්‍ර සමහර විට ලුණු ආදියෙන් සෑදුණු-අමුතු වචන දක්වනවා. ඒවා යොදලා වස්ත්‍රය පිරිසිදු කරල ගේනවා. වස්ත්‍රය පිරිසිදු නමුත් ඒව සෝදන්න යොදාගත් ද්‍රව්‍යවල සුවඳ ටිකක් ඉතුරු වෙලා තියනවා. නමුත් වස්ත්‍රය අයිතිකාර ස්වාමිවරු මොකද කරන්නේ - සුවඳ කරඬුවක ඒ වස්ත්‍රය තැන්පත් කරලා තිබ්බට පස්සේ ටික කලකට පස්සේ අර සෝදපු ද්‍රව්‍යවල තිබුනු අමුතු ගඳත් නැති වෙලා යනවා. අන්න ඒ වගේ යම් වෙලාවක අස්මි කියන එකත් පඤ්චඋපාදානස්කන්ධය පිළිබඳව  නැවත නැවත බැලීම තුළින් ඒකත් ගෙවිල ගිහිල්ල ඒ මානයෙනුත් මිදිල රහත් බවට පත් වෙනව කියල ප්‍රකාශ කළා. සූත්‍රයේ විශේෂත්වය තියෙන්නේ මේ විවරණය දීල ඉවර වෙනකොට ඒ අහන් හිටිය හැට නමම රහත් වුණාය ඒක ප්‍රකාශ කළ ඛෙමක ස්වාමීන් වහන්සේත් තමන් දේශනා කළ ඒ විවරණය තුළ සිත යවලා අර කියාපු අස්මිමානය නැති කරලා රහත් උනාය කියලා.

ඔන්න ඔය විදියේ සියුම් දෙයක් මෙතන තියෙන්නේ, මේ නිවන පිළිබඳ කථාන්තරයේ. මේ පින්වතුන් සලකාගන්න භාෂා ව්‍යවහාරය අපි උපකාර කරගන්නවා. අපි බොහෝ විට **සාපේක්ෂක ප්‍රායෝගික** කියන වචන දෙක යොදනවා - **මැදුම් පිළිවෙත**. බුදුරජාණන් වහන්සේ යෙදූ මැදුම් පිළිවෙත තුළ මේ ඔක්කොම අහක දාන්නෙත් නෑ. බදා ගන්නෙත් නැහැ. ඒ වෙනුවට එකකින් එකකට - එකකින් එකකට උපකාර කරගන්නවා. ඒකයි මේ නිවන් දක්වා යන ගමන. ඇතැම් සූත්‍රයක් බුදුරජාණන් වහන්සේ ඉවර කරන්නේ මෙහෙමයි. **ඉතිඛො භික්ඛවෙ ධම්මාව ධම්මෙ අභිසන්දෙන්ති ධම්මාව ධම්මෙ පරිපූරෙන්ති අපාරා පාරං ගමනාය.**[16]

අපි දැන් කිව්වට මෙතෙරින් මම එතරට යනවා කිව්වට 'මම' කථාවක් නැහැ අන්තිමට. බුදුරජාණන් වහන්සේ වදාරන්නේ මේ ශාසනය තුළ තියෙන්නේ - මෙසේ, මහණෙනි, 'ධම්මාව ධම්මෙ අභිසන්දෙන්ති' **ධර්මයෝම ධර්මයන් තුළට ගලාගෙන යනවා** 'ධම්මාව ධම්මෙ පරිපූරෙන්ති' **ධර්මයෝම ධර්මයන් පරිපූරණය කරනවා**. 'අපාරා පාරං ගමනාය' **මෙතෙර ඉඳලා එතරට යන ගමනෙදි** කියලා. ඔන්න දැන් මේ පින්වතුන්ට කිව්වෙ

ගැඹුරු කාරණා කීපයක් - මේ පටිච්චසමුප්පාදයටම අදාළයි. නාමරූප ධර්මයන් තුළ තියන ගැඹුර කල්පනා කරල බලන්න. අර කිව්ව මනසිකාරය පිළිබඳ කථාව හිත ඇතුළෙ කෙරෙන වැඩේ. ඒකට අදාළ දේවල් තමයි මූලපරියාය සූත්‍රයේ දේශනා කරල තියෙන්නේ. ඒ අනුව කල්පනා කරගෙන තමන්ගේ සම්‍යක් දෘෂ්ටිය හරිගස්ස ගන්නේ නැත්නම් නිවන කියල යන්නේ වෙන පාරක. ඒක නිසා තමාගේ සම්මා දිට්ඨිය සකස් කරගැනීමට මේ දේශනාව උපකාර වේ යයි කියල කල්පනා කරනවා. තව ඉදිරියට පටිච්ච සමුප්පාද ධර්මයට අදාළව ඒ ඒ තැන්වලින් අපි කාරණා ඉදිරිපත් කරනවා. අපි කලිනුත් කීප වරක් ප්‍රකාශ කළා බුදුරජාණන් වහන්සේ වදාළ පාඨයක් **'යමෙක් පටිච්ච සමුප්පාදය දකීද හේ ධර්මය දකී'.** අන්න ඒක කල්පනා කරගෙන මේ පින්වතුන් අධෛර්ය නොවී මේ ධර්ම මාර්ගය ගැන හිත යොදලා මේක තව තවත් පැහැදිලි වෙන්න මේ අර කියාපු පඤ්ච උපාදානස්කන්ධය පිළිබඳව අනිත්‍යතාව නිරන්තරයෙන් සිහිපත් කරන්ට ඕන. සිහිපත් කරන්න කරන්න නාම රූප ධර්මයන් අවබෝධයත් පැහැදිලි නම් අර කියාපු විපස්සනා මාර්ගයේ ඉදිරියට යන්න පුළුවන්. මේව කතින් අහල ඉවත් කරන්නෙ නැතිව තමන්ගේ ජීවිතයට අදාළ අන්දමින් - පඤ්ච උපාදානස්කන්ධය කියන්නේ වෙන කොහේවත් තියන එකක් නොවේ. තමා ළඟ තියන එකක්. මේවා එන යන හැටි - එන යන හැටි 'උදයබ්බය' කියල කියන ඇතිවීම් නැති වීම් දෙක නිරන්තරයෙන් සියුම්ව බලන්න බලන්න යෝනිසෝ මනසිකාරයෙන්. මේකෙ යථා තත්ත්වය වැටහෙන්න ඕන. යථාභූත අවබෝධය කියන්නේ ඒකයි.

ඒ නිසා මේ පින්වතුන් මේ ධර්ම දේශනාවත් තම තමන්ගේ භාවනාවට උපකාර කරගන්න උත්සාහ ගන්න. අපි මේ පින්වතුන්ට ප්‍රාර්ථනා කරනවා අද දින පිරූ ශීලයත් තමන් කළ භාවනාවත් මේ ධර්ම දේශනයත් උපකාර කරගෙන මේ සම්බුද්ධ ශාසනය තුළම හැකි තාක් ඉක්මනින් තමාගේ බණ භාවනා සමථ විපස්සනා කියන දෙපැත්තෙන්ම දියුණු කරගෙන තමන් බලාපොරොත්තු වන උත්තමාර්ථයට මේ ජීවිතයේදීම පැමිණීමට මේ ධර්ම දේශනාව උපකාර වේවා කියල. එසේම අවීචියේ සිට අකනිට්ඨා දක්වා යම් තාක් කෙනෙක් ධර්ම දේශනාමය ධර්ම ශ්‍රවණමය කුසලය අනුමෝදන් වීමට කැමති නම් ඒ අනුමෝදන් වීම තුළින් ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවනින් සැනසෙත්වා කියා ප්‍රාර්ථනා කරගෙන මේ ගාථා කියා පින් දෙන්න.

**එත්තාවතා ච අමෙහහි ...**

## පාදක සටහන්

1. දවයතානුපස්සනා සූත්ත, ගාථා: 759-761. සුත්ත නිපාත ඛුද්දක නිකාය - 5 -236- 238 පිටු (බු.ජ.ත්‍රි. 25)
2. යවකලාපී සූත්ත, සළායතන වග්ග, සංයුත්ත නිකාය - IV 384 - 388 පිටු (බු.ජ.ත්‍රි. 16)
3. ලොකවොලොකන සූත්ත - උදාන පාළි, නන්දවග්ග - 192-194 පිටු ඛුද්දක නිකාය I - (බු.ජ.ත්‍රි. 24)
4. පපඤ්චසූදනී I - 38 පිට (හේ.මු. 35)
5. පපඤ්චසූදනී I - 35 පිට (හේ.මු. 35)
6. සමන්තපාසාදිකා - 7 පිට (හේ.මු. 28)
7. යමක වග්ග, ධම්මපද-ගාථා 1, 2 ඛුද්දක නිකාය - 2 (බු.ජ.ත්‍රි. 24)
8. බ්‍රහ්මනිමන්තනික සූත්ත, මජ්ඣිම නිකාය I - 764 පිට (බු.ජ.ත්‍රි. 10)
9. කකුධ සූත්ත, සගාථ වග්ග, සංයුත්ත නිකාය I - 102 පිට (බු.ජ.ත්‍රි. 13)
10. දවයතානුපස්සනා සූත්ත, ගාථා: 741-742. ඛුද්දක නිකාය - 5 -230 පිට (බු.ජ.ත්‍රි. 25)
11. අට්ඨකනාගර සූත්ත, මජ්ඣිම නිකාය 2 - 24 පිට (බු.ජ.ත්‍රි. 11)
12. අලගද්දූපම සූත්ත, මජ්ඣිම නිකාය I - 338 පිට (බු.ජ.ත්‍රි. 10)
13. භික්ඛුනී සූත්ත, අංගුත්තර නිකාය 2 - 280 - 282 පිටු (බු.ජ.ත්‍රි. 19)
14. අලගද්දූපම සූත්ත, මජ්ඣිම නිකාය I - 350 පිට (බු.ජ.ත්‍රි. 10)
15. ඛෙමක සූත්ත, සංයුත්ත නිකාය, 3 - 218-226 පිටු (බු.ජ.ත්‍රි. 15)
16. චෙතනාකරණීය සූත්ත, අංගුත්තර නිකාය 6 පිටුව (බු.ජ.ත්‍රි. 23)

# 08 වන දේශනය

# 08 වන දේශනය

## (පහන් කණුව ධර්ම දේශනා අංක 190)

## 'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

රූපා සද්දා රසා ගන්ධා - ඵස්සා ධම්මා ච කෙවලා
ඉට්ඨා කන්තා මනාපාච - යාවතත්ථීති වුච්චති

සදෙවකස්ස ලොකස්ස - එතෙ වො සුඛසම්මතා
යත්ථ චෙ තෙ නිරුජ්ඣන්ති - තං තෙසං දුක්ඛසම්මතං

සුඛන්ති දිට්ඨමරියෙහි - සක්කායස්සුපරොධනං
පච්චනීකමිදං හොති - සබ්බලොකෙන පස්සතං[1]

-ද්වයතානුපස්සනා සු. සුනි

සැදැහැවත් පින්වතුනි,

ඇස, කන, නාසය, දිව, කය, මන යන ඉන්ද්‍රිය හයට අරමුණු වන රූප සද්ද ගන්ධ රස ඵොට්ඨබ්බ ධම්ම යන දේවල් දෙවියන් සහිත ලෝකයා ඇත්ත වශයෙන්ම තිබෙන හැටියටත්, සැප ගෙන දේ හැටියටත්, සලකනවා. යම් තැනක මේවා නිරුද්ධ වෙනවා නම් එතන දුකක් හැටියටත් සලකනවා. නමුත් ආර්යයන් වහන්සේලා, ලෝකයා ඇතැයි ගන්නා, සැප යයි ගන්නා, මේ දේවල් නැති වන තැනම සැපයක් හැටියට සලකනවා. මෙන්න මේ එකිනෙකට ප්‍රතිවිරුද්ධ දෘෂ්ටි කෝණ දෙක ප්‍රකාශ වෙන ගාථා තුනක් තමයි අද අපි මේ අටවෙනි පටිච්ච සමුප්පාද දේශනාවට මාතෘකාව හැටියට ඉදිරියට ගත්තේ. සුත්ත නිපාතයේ ද්වයතානුපස්සනා සූත්‍රයේ දහසය වෙනි ද්වයතානුපස්සනාවට අදාළවයි මේ ගාථා තුන සඳහන් වෙන්නේ. මීට කලින් දේශනා දෙකකදී අපි මේ ද්වයතානුපස්සනා සූත්‍රයේ ද්වයතානුපස්සනා දෙකක් විග්‍රහ කළා මේ පින්වතුන්ට, විවරණය කළා. අදත් මේ ප්‍රකාශ වෙන සූත්‍රයෙන් කියවෙන්නේ ලෝකයාගේ දෘෂ්ටි කෝණයත් ආර්යයන් වහන්සේලාගේ දෘෂ්ටි කෝණයත් අතර ඇති පරතරයයි. මේ කාරණය පළමුවෙන්ම බුදුරජාණන් වහන්සේ ඒ ගද්‍යපාඨවලින් මෙහෙමයි ප්‍රකාශ කරන්නේ, අපි ඒකේ සිංහල පරිවර්තනය

කිව්වොත් - ගිය වර අපි ඒකෙ පාළි පාඨයත් කිව්වා. ''මහණෙනි, යමක් දෙවියන්, මරුන්, බඹුන්, සහිත ලෝකයා විසින් දෙවි මිනිසුන්, මහණ බමුණන්, සහිත ප්‍රජාව විසින් සැපයයි කල්පනා කරන ලදද, එය ආර්යයන් වහන්සේලා විසින් දුකකැයි යථාභූත වශයෙන් සම්‍යක් ප්‍රඥාවෙන් මැනවින් දකින ලදී. ඊළඟට ඒකෙ අනිත් පැත්ත ප්‍රකාශ කරනවා. මහණෙනි යමක් දෙවියන්, මරුන්, බඹුන් සහිත ලෝකයා විසින් මහණ බමුණන්, දෙවි මිනිසුන් සහිත ප්‍රජාව විසින් මෙය දුකකැයි කල්පනා කරන ලදද, එය ආර්යයන් වහන්සේලා විසින් මෙය සැපයකැයි යථාභූත වශයෙන් සම්‍යක් ප්‍රඥාවෙන් මැනවින් දකින ලදී.'' කියල මේ අනුපස්සනා දෙක බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කරනවා. ඉදිරිපත් කරලා අර අනික් ඒවායේදී කළා වගේම දක්වනවා යම් භික්ෂූන් වහන්සේ නමක් කෙලෙස් තවන වීර්යයෙන් යුතුව මේ අනුපස්සනා දෙක අතර ඇති පරතරය මෙනෙහි කරනවා නම්, ඒක අනුව ජීවිතය සකස් කරගන්නවා නම්, ඒ භික්ෂුවට රහත් වෙන්න පුළුවන්. රහත් වෙන්න බැරි නම් අනාගාමී වෙන්න පුළුවන් කියල එහෙම ප්‍රකාශ කරල ඉවර වෙලා ඒ කාරණයම තමයි ගාථා පෙළකින් ඉදිරිපත් කරන්නේ. ඒ ගාථා පෙළේ මුල් ගාථා තුනයි අපි මේ උද්ධෘත කරලා උපුටා දැක්වූවේ. පළමුවෙන්ම ඒ ගාථා තුනේ අර්ථය තේරුම් ගන්න බලමු.

**රූපා සද්දා රසා ගන්ධා - ඵස්සා ධම්මා ච කෙවලා**
**ඉට්ඨා කන්තා මනාපාච - යාවතත්ථීති වුච්චති**

රූප සද්ද රස ගන්ධ ස්පර්ශ ධර්ම කියන ඉෂ්ට කාන්ත මනාප යම් දෙයක් ලෝකයා ඇතැයි කියනු ලැබේද **සදෙවකස්ස ලොකස්ස - එතෙ වො සුඛසම්මතා** දෙවියන් සහිත ලෝකයා මේවා සැප යයි සම්මත කරනවා.

**'යත්ථ චෙතෙ නිරුජ්ඣන්ති - තං තෙසං දුක්ඛසම්මතං'** යම් තැනක මේ අරමුණු හය නිරුද්ධ වෙනවා නම් ඒ තැන ඔවුන් විසින් දුක යයි සම්මත කරගෙන තියනවා. ඊළඟට කියනවා **'සුඛන්ති දිට්ඨමරියෙහි - සක්කායස්සුපරොධනං'** නමුත් ආර්යයන් වහන්සේලා විසින් සක්කාය නම් වූ මේ පඤ්චඋපාදානස්කන්ධය උපරෝධනය කිරීම වළක්වාලීම - සැපයකැයි දකින ලදී. **' පච්චනීකමිදං හොති - සබ්බලොකෙන පස්සතං'** මේ සත්‍යය දකින උන්වහන්සේලාගේ දර්ශනය මුළු ලෝකයාගේ දර්ශනයට ප්‍රතිවිරුද්ධයි කියල ඔය විදියට ප්‍රකාශ වෙනවා ඔය ගාථා තුනෙන්. ඔය ගාථා තුනෙන් ප්‍රකාශ වෙන කාරණයම ඊළඟට තව දුරටත් ගාථා පෙළකින්ම සඳහන්

වෙනවා. අපි මුල් ගාථා තුන පමණයි උපුටා දැක්වුවෙ. මේ පින්වතුන්ට මතක ඇති අපේ දේශනාවලට ඇහුම්කන්දුන්න අයට ද්වයතානුපස්සනා සූත්‍රය පළමුවෙන්ම හඳුන්වා දෙන අවස්ථාවේදී අපි ප්‍රකාශ කළා මේ සූත්‍රය පුදුම විදියේ ධර්ම තේජසක් පිළිබිඹු වන සූත්‍රයක්ය කියල. ඒ වගේම මේ දහසය වන ද්වයතානුපස්සනාවෙන් තමයි මේ දීඝ සූත්‍රය කෙළවර වන්නේ. ඒ කෙළවර වෙන ගාථා මාලාවෙන් තුනක් පමණයි අපි මේ උපුටා දැක්වූවේ. සාමාන්‍යයෙන් මේ කාලයේ පාලි ගාථාවලට වැඩි රුචියක් නැති නිසා අපි මේ අවස්ථාවේ කල්පනා කළා ඒ ගාථා එක එක අරගෙන තේරුම් කරනවාට වැඩිය බුදුරජාණන් වහන්සේගේ ඒ ධර්ම තේජස යම්තමින් වත් මේ පින්වතුන්ට තේරුම් ගන්න පුළුවන් වෙන විදියට සිංහල කවියෙන් ඒක ඉදිරිපත් කරන්න. ඒක අපි මේ වෙලාවේ කරපු එකක් නොවෙයි අපි එක්තරා පොතක පරිච්ඡේදයක් අගට මේ ගාථා පෙළ සිංහල කවියට නගලා තියෙනවා[2]. ඒක මේ අවස්ථාවේ මේ පින්වතුන්ට ප්‍රකාශ කරනවා යම්තමින් හරි මේ ධර්ම තේජස තේරුම්ගන්න.

රූ-සද-රසද-ගඳ - පහස මනසට එන දෑ
ඉටු තුටු වඩන මන නඳ - මේ හැම ඇතැයි ගත්දෑ

සදෙව් ලොව හැමදෙන - එකැතින් සැපැයි ගන්නෝ
මෙහැම නැති වන තැන - දුකකැයි මතය දරණෝ

අරි මගට පත් දන - පස්කඳ ඇලුම හරණෝ
එයමැ සැපතැයි දක්වන - කලැ ලොව එරෙහි වන්නෝ

අන් දන සැපැයි කීදෑ - අරි දන දුකැයි කීවෝ
අන් දන දුකැයි කීදෑ - අරිදන සැපැයි කීවෝ
බලව දහමෙක ගැඹුරෙක් - මුළා වෙති නොම දතුවෝ
මොහඳුර තුළ කොටුවැ - නොදකිති නැණැස නැතියෝ
නැණ'ලු තුළ විවටවැ - දකිති නැණ ඇස ඇතියෝ
ළඟමැ ඇති මුත් නොදකිති - දහම් මග නොම රිසියෝ

භව ඇලුමෙහි ගිලුණ - භව දිය වැලට හසු වුණ
මරු වසයෙහි රැඳුණ - රැසෙකි මෙදහම නොදකින

අරිමඟට පිළිපන් - පුඟුලන් මැ මිස වෙන අන්
කවුරු දකිතිද මෙනිවන් - මුලසුන් කැරැමැ කෙලෙසුන්

ඔය අපි පුළුවන් තරමින් ඒ බුදුරජාණන් වහන්සේගේ ධර්‍ම තේජසයි ප්‍රකාශ කළේ මේ පින්වතුන්ට යමක් දැනගන්නට. මීට කලින් දේශනාවෙදි අපි පහළොස්වෙනි ද්වයතානුපස්සනාව ප්‍රකාශ කළා. ඒකෙත් මේ විදියටම එකිනෙකට ප්‍රතිවිරුද්ධ දෘෂ්ටිකෝණ දෙකක් ඉදිරිපත් වුණා. ඒක යම්තමින් මතක් කරගත්තොත් මේ විදියටයි 'මහණෙනි යමක් දෙවියන්, මරුන්, බඹුන් සහිත ලෝකයා විසින් මහණ බමුණන් දෙව් මිනිසුන් සහිත ප්‍රජාව විසින් මෙය සත්‍ය යයි කල්පනා කරන ලදද එය මුසාවකැයි ආර්යයන් වහන්සේලා විසින් යථාභූත වශයෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දකින ලදි. ඊළඟට ඒකෙ අනිත් පැත්ත. මහණෙනි යමක් දෙවියන්, මරුන්, බඹුන් සහිත ලෝකයා විසින් මහණ බඹුණන්, දෙව් මිනිසුන් සහිත ප්‍රජාව විසින් මෙය මුසාවකැයි කල්පනා කරන ලදද, එයම ආර්යයන් වහන්සේලා විසින් මෙය සත්‍ය යයි යථාභූත වශයෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දකින ලදි.' ඒ ප්‍රකාශ වුණේ අපි ඒ අවස්ථාවේ මේ පින්වතුන්ට මතක් කරල දුන්න ඒ නාම රූපය - ලෝකයා නාම රූපය සත්‍ය හැටියට ගන්නවා, මේ විඤ්ඤාණයේ පිළිබිඹු වන නාම රූපය. නමුත් ආර්යයන් වහන්සේලා ඒක මුසාවක් හැටියට දක්වනවා. දැන් එතකොට පටිච්ච සමුප්පාද ධර්‍මයේ නාම රූපය ළඟට තියෙන්නේ සළායතනය බව මේ පින්වතුන් දන්නවා. මේ දේශනාවේදී කියවෙන්නේ අන්න ඒ සළායතනයට අදාළ ටිකයි. රූප, සද්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම කියන ඒ අරමුණු ඒ සළායතනයට අදාළ දේවල්නෙ. සළායතනය කියල කියන්නේ ඇස, කන, නාසය, දිව, කය, මන සහ ඒවාට අදාළ රූප, සද්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම යන අරමුණු. ලෝකයා ඒවා සැප යයි සලකනවා. ඒවා නැති වුණ තැන දුකක් හැටියටත් සලකනවා. නමුත් ආර්යයන් වහන්සේලා ඒවා දුකක් හැටියටත් ඒ නැති වුණ තැන සැපයක් හැටියටත් දකිනවා. මේ කියාපු අරමුණු හය නැති වෙන්නෙ කොතනද? වෙන ලෝකයකද? **ඒවා නැති වෙන්නෙ පින්වතුනි සළායතන නිරෝධය පිළිබඳ ප්‍රත්‍යක්ෂය හැටියට සලකන නිවනේදී. නිවන හඳුන්වන්නේ ඇත්ත වශයෙන්ම සළායතන නිරෝධය පිළිබඳ ප්‍රත්‍යක්ෂය හැටියටයි.**

ඒ සළාතනය නිරෝධය පිළිබඳ ප්‍රත්‍යක්ෂය තමයි නිවන කියල කියන්නේ. වෙන අමුතු ලෝකයක් නොවෙයි. අන්න ඒ තැනදි තමයි මේ කියාපු ප්‍රත්‍යක්ෂ අවස්ථාව ආර්යයන් වහන්සේලා සැප හැටියට සළකන්නේ. ඒ

මෙලොවම අත්විඳිය හැකි ප්‍රත්‍යක්ෂ කාරණයක්. ඒක බොහෝදෙනා සැක කරන්න පුළුවන්, මේ කාලයේ බොහෝ උගතුන්. අපි කොච්චර ලිව්වත් කිව්වත් බොහෝ දෙනා අර පැරණි මතය **'සියදෝරිස් නිවන'** අල්ල ගත්තු අය ඉන්නවා. දැන් මේකට ඉතාම හොඳ සාධකයක් ,නිවන සළායතන නිරෝධය බව පෙන්නුම් කෙරෙන වටිනා සූත්‍රයක් තියනවා සංයුත් සඟියේ සළායතන සංයුත්තයේ කාමගුණ සූත්‍රය[3] කියලා. ඒ සූත්‍රයේ මෙන්න මෙහෙම ප්‍රකාශ වෙනවා තවත් කාරණා අතර. හිටි ගමන්ම බුදුරජාණන් වහන්සේ මහ ප්‍රහේලිකා විදියේ දේශනා පාඨයක් මේ විදියට ප්‍රකාශ කරනවා **'තස්මාතිහ භික්ඛවෙ සෙ ආයතනෙ වෙදිතබ්බෙ, යත්ථ චක්ඛුඤ්ච නිරුජ්ඣති රූපසඤ්ඤා ච විරජ්ජති, සෙ ආයතනෙ වෙදිතබ්බෙ, යත්ථ සොතඤ්ච නිරුජ්ඣති සද්දසඤ්ඤා ච විරජ්ජති සෙ ආයතනෙ වෙදිතබ්බෙ, යත්ථ ඝානඤ්ච නිරුජ්ඣති ගන්ධසඤ්ඤා ච විරජ්ජති සෙ ආයතනෙ වෙදිතබ්බෙ, යත්ථ ජිව්හා ච නිරුජ්ඣති රසසඤ්ඤා ච විරජ්ජති සෙ ආයතනෙ වෙදිතබ්බෙ, යත්ථ කායොච නිරුජ්ඣති ඵොට්ඨබ්බසඤ්ඤා ච විරජ්ජති සෙ ආයතනෙ වෙදිතබ්බෙ, යත්ථ මනො ච නිරුජ්ඣති ධම්මසඤ්ඤා ච විරජ්ජති සෙ ආයතනෙ වෙදිතබ්බෙ සෙ ආයතනනෙ වෙදිතබ්බෙ'**

මේක මේ පින්වතුන්ට ඇහෙනකොට මහ පුදුම හිතෙනව. මෙතන බුදුරජාණන් වහන්සේ යම්කිසි පාඨයක් නැවත නැවත අවධාරණය කරනවා. මොකක්ද ඒ පාඨයේ තේරුම. 'සෙ ආයතනෙ වෙදිතබ්බෙ' කියන්නේ පින්වතුනි, පරණ පාලි භාෂාවේ හැටියට 'තං ආයතනං වෙදිතබ්බං' කියන එකයි. ඒ ආයතනය දත යුත්තේය. එතකොට බුදුරජාණන් වහන්සේ අවධාරණය කරලා පුදුම විදියට මේ සංඝයා වහන්සේලා අමතලා ප්‍රකාශ කරන්නේ ඒ ආයතනය දත යුතුයි. ඒ ආයතනය දත යුතුයි කියලා කිව්වේ මොකක්ද? එකක් තේරුම්ගත්තහම හැම එකම තේරෙනවා. 'චක්ඛුඤ්ච නිරුජ්ඣති රූපසඤ්ඤා ච විරජ්ජති'. යම් ආයතනයක ඇස නිරුද්ධ වේද රූප සඤ්ඤාව මැකී යේද ඒ ආයතනය දත යුතුයි. ඒවාගේම කන නිරුද්ධ වේද සද්ද සඤ්ඤාව මැකී යේද ඒ ආයතනය දත යුතුයි. ඒ විදිහට හිතාගන්න නහයත්, දිවත්, කයත් අවසානයේ මනසත්. එතනයි පුදුම වැඩේ තියෙන්නේ 'යත්ථ මනොච නිරුජ්ඣති' යම් තැනක, යම් ආයතනයක මනත් නිරුද්ධ වේද ධම්ම සඤ්ඤාවද මැකී යේද අන්න ඒ ආයතනය දත යුතුයි. ඒ ආයතනය දත යුතුයි කියල ඔන්න ඊළඟට අමුතු දෙයක් සිද්ධ වෙනවා.

බුදුරජාණන් වහන්සේ මේ ප්‍රහේලිකා වගේ සූත්‍රය දේශනා කරලා ආසනයෙන් නැගිටල විහාරයට වැඩම කළා. බුදුරජාණන් වහන්සේ බොහෝ අවස්ථාවල කරන එක්තරා උපක්‍රමයක් ශෝලයින්ට මේවා විවරණය කරන්ට අවස්ථාවක් දීමට.

එතකොට මේ සංඝයා වහන්සේලා කල්පනා කරනවා දැන් මේ භාග්‍යවතුන් වහන්සේ කෙටියෙන් දේශනාවක් කළා අර්ථය විවරණය නොකර. අපි කාගෙන්ද මේක අහගන්නෙ කියලා ඒ සංඝයා වහන්සේලා සාකච්ඡා කරලා කල්පනා කළා මේ ආනන්ද ආයුෂ්මතුන් වහන්සේ බුදුරජාණන් වහන්සේත් බොහොම වර්ණනා කළ කෙනෙක්. අනිත් සංඝයා වහන්සේලාත් බොහොම ගරු කරන කෙනෙක්. අපි යමු ආයුෂ්මත් ආනන්ද ස්වාමීන් වහන්සේ ළඟට කියලා ඒ සඟ පිරිස ගිහිල්ලා ආනන්ද ස්වාමීන් වහන්සේට ආරාධනා කළා භාග්‍යවතුන් වහන්සේ මෙන්න මෙහෙම දේශනාවක් අපිට කළා කෙටියෙන්. ඒකෙ අර්ථය අපිට තේරුම් කරල දෙන්න සවිස්තරව. මුලදී - මෙබඳු තැන්වල බොහෝ විට කියවෙනවා - ශ්‍රාවකයින් වහන්සේලා ඒ ශාස්තෘ ගෞරවය නිසා ටිකක් අදි මදි කරනවා මැලිකම් දක්වනවා නැවත නැවතත් ඇවිටිලි කළහම ආනන්ද ස්වාමීන් වහන්සේ කියනවා. හොඳයි මම එහෙනම් මට තෙරෙන හැටියට කියන්නම් ඔබවහන්සේලා ගිහිල්ලා ශාස්තෘන් වහන්සේගෙන් අහල ස්ථිර කරගන්න, සහතික කරගන්න. ඔන්න ආනන්ද ස්වාමීන් වහන්සේ දෙන අටුවාව මොකක්ද, එකම වාක්‍යයයි: **'සළායතන නිරොධං බො ආවුසො භගවතා සන්ධාය භාසිතං'** ඒකෙ තේරුම, ''ඇවැත්නි ඔය භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කළේ සළායතන නිරෝධය පිළිබඳවයි.'' එතෙන්දි අටුවාවත් පිළිගන්නව මේ සළායතන නිරෝධය නිවන බව[4]. ආනන්ද ස්වාමීන් වහන්සේ කිව්වෙ එච්චරයි. ඒකෙන්ම අපට හිතාගන්න පුළුවන් නිවන සළායතන නිරෝධ නාමයෙන් හඳුන්වන බව. සළායතන නිරෝධ තත්ත්වය ආයතනයක් වශයෙන් මෙතන අවධාරණය කිරීම ඉතාම වැදගත්. මේක අපට තව සාධකයක් කරගන්න පුළුවන් අවස්ථාව ඔන්න ඊළඟට කියනවා.

උදානපාළියේ පාටලීගාම වග්ගයේ නිබ්බාන පටිසංයුත්ත සූත්‍ර කීපයක් සඳහන් වෙනවා. ඒවා ආරම්භ වෙන්නේ මේ විදියටයි - භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් වහන්සේලාව නිබ්බාන පටිසංයුත්ත ධර්ම කථාවකින් උත්සාහවත් කළා. ඒ නිබ්බාන පටිසංයුත්ත සූත්‍රයක් හැටියට සම්මත සූත්‍රයක්

තියනවා අටුවාචාරීන් වහන්සේලාටත් පෙර අපරදිග උගතුන්ටත් මහා ගැටලුවක් වුණ. ඒක මේ විදියටයි තියෙන්නේ 'අත්‍ථි භික්‍ඛවෙ තදායතනං යත්‍ථ නෙව පඨවී න ආපො, න තෙජො, න වායො, න ආකාසානඤ්චායතනං න විඤ්ඤාණඤ්චායතනං, න ආකිඤ්චඤ්ඤායතනං න නෙවසඤ්ඤානාසඤ්ඤායතනං නායං ලොකො න පරලොකො න උභො චන්දිම සුරියා. තත්‍රපාහං භික්‍ඛවෙ නෙව ආගතිං වදාමි න ගතිං න ඨිතිං න චුතිං න උපපත්තිං, අප්පතිට්ඨං, අප්පවත්තං, අනාරම්මණමෙවෙතං එසෙවන්තො දුක්ඛස්ස'[5] ඔන්න සූත්‍රය. ඒක තේරුම් කරගන්න බලමු. 'අත්‍ථි භික්‍ඛවෙ තදායතනං' මහණෙනි මෙබඳු ආයතනයක් ඇත. ඔන්න ඔතනයි උගතුන් හිර වෙන්නේ. මේ කියන ආයතනය මරණින් මතු ලෝකයක් කියලයි මේ අය තෝරන්නේ. කලිනුත් කියාපු සූත්‍රයෙන් පැහැදිලි වුණා මේ පින්වතුන්ට අර සළායතන නිරෝධයම ආයතනයක් හැටියට බුදුරජාණන් වහන්සේ අවධාරණයෙන් වදාළ බව. මේ සූත්‍රය තව තේරුම්ගන්න බලමු. මහණෙනි, මෙහෙම ආයතනයක් ඇත. 'යත්‍ථ' යම් තැනක ඊළඟට ආයතනයේ සවභාවය කියනවා. 'නෙව පඨවී' යම් තැනක පඨවිත් නැත. මෙහෙම හිතාගන්න පඨවි, ආපො, තෙජො, වායො කියල ලෝකයේ තියනවයි කියල හිතන මහාභූත ධර්ම ඒවත් නැහැ. ඊළඟට අරූප තත්ත්ව ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන නෙවසඤ්ඤානාසඤ්ඤායතන ඒවත් නැහැ. ඊළඟට මෙලොවත් නැහැ පරලොවත් නැහැ. ඉරත් නැහැ හඳත් නැහැ. මහ පුදුමයි. ඕක නිසා තමයි කවුරුත් පටලැවෙන්නේ. ඊළඟට කියනවා තවත් ගැඹුරු කාරණයක්. මහණෙනි. එතන මම කියනවයි - මේ බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ - මම කියනව ඒ කියාපු ආයතනයේ ඒමක්ද නැත. යාමක් නැත. සිටීමක්ද නැත. චුතියක්ද නැත. උත්පත්තියක්ද නැත කියලා. අන්තිමට කියනවා අප්පතිට්ඨං, අප්පවත්තං, අනාරම්මණං. ඒ ආයතනයේ තත්ත්වය ප්‍රකාශ කරනවා අන්තිමටම තව පද තුනකින්. 'අප්පවත්තං' ඒ ආයතනය තුළ පැවැත්මක් නැත. 'අප්පතිට්ඨං' ඒ ආයතනය කොහේවත් පිහිටපු එකක් නොවේ. 'අනාරම්මණං' ඒ ආයතනයට අරමුණක්ද නැත. අන්තිමට ඉවර කරන්නේ 'එසෙවන්තො දුක්ඛස්ස' කියලා. මේකම දුකේ කෙළවරයි කියලා.

ඉතින් මේ පාඨය දීර්ඝ කාලයක් - ශතවර්ෂ ගණනක් - උගතුන් ඒ අතට පෙරළලා මේ අතට පෙරළලා තේරුම්ගන්න බලනවා. තෝරන්නේ බොහෝ

විට ඉර, හඳ, තාරකා නැති අමුතු ලෝකයක් හැටියටයි. නමුත් අපි පෙන්නුව මේ කියන මනසත් නිරුද්ධ වෙනව නම් මනසට එන ධර්ම සංඥාත් නිරුද්ධ වෙනව නම් ඉර, හඳ, තාරකාවලට කොහෙද තැනක්? ඒමක් යාමක් මොකවත් නැහැනෙ. ඒ ටිකවත් මේ අපේ උගතුන්ට තේරුණේ නැහැ. මොකද භව තණ්හාව නිසාම ලෝකයා පෙළඹෙන්නේ නිවන කියල කියන්නේ 'මරණින් මතු එන තත්ත්වයක්.' කොහොම හරි එයින් අපට ප්‍රත්‍යක්ෂ වුනා සළායතන නිරෝධයම නිවන බව. ඒ නිවන ගැන - මේ නිබ්බාන පටිසංයුත්ත ධර්ම කතාවක්නෙ බුදු හාමුදුරුවෝ කියන්නේ වෙන එකක් නොවෙයිනෙ. ඒක හොඳටම පැහැදිලි වෙන එක තමයි ඒක දුකේ කෙළවරයි කියන එක. දුක කෙළවර වෙන්නේ එතන නේ. අමුතු ලෝකයක නොවෙයිනෙ. කෙසේ හෝ වේවා ඒ කියාපු සූත්‍රය අති විශේෂයි. ඊළඟට අපි ටිකින් ටික නූලක මුතු ඇට අමුණන්න වගේ මේ පින්වතුන්ට අහන් ඉන්න ටිකේදි හරි යම්කිසි අවබෝධයක් ලැබෙන හැටියට එතනින් මෙතනින් සූත්‍ර අමුණල පෙන්නුම් කරනවා. ඔන්න ඊළඟට මේකට තවත් සාධක වෙන අමුතුම සූත්‍රයක් තියනවා ඒකත් අර වගේ ප්‍රහේලිකා අවසථාවක්.

බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලා අමතලා ප්‍රකාශ කරනවා **'නාහං භික්ඛවෙ ගමනෙන ලොකසස අනතං ඤාතයයං දට්ඨයයං පත්තයයනති වදාමි. නච පනාහං' අපපත්වා ලොකසස අනතං දුකඛසස අනතකිරියං වදාමි'**[6] එතනත් පොඩි ප්‍රහේලිකාවක්. ඒකෙ තේරුම - මහණෙනි, මම කියනවා ගමන් කිරීමෙන් ලෝකයෙහි කෙළවරට නොපැමිණිය හැකිය කියල. නමුත්, ලෝකයෙහි කෙළවරට නොපැමිණ දුකෙහි කෙළවරක් ඇතැයිද නොකියමි, පරස්පර විරෝධී වගෙයි බැලුවහම. නියම ප්‍රහේලිකාවක්. ලෝකයේ කෙළවර කියනකොට එක පාරටම හිතෙන්නේ මේ පින්වතුන්ට වුණත් ගමන් කිරීමෙන් යන්න පුළුවන් තැනක් කියලා. නමුත් බුදුරජාණන් වහන්සේ කියනවා, මම කියනවය ගමන් කිරීමෙන් ලෝකයෙ කෙළවරට යන්නත් බැරිය. ඊළඟට අනිත් පැත්තටත් කියනවා. හැබැයි ලෝකයේ කෙළවරට නොගිහින් දුකේ කෙළවරක්ද නැතැයි කියමි. **ලෝකයේ කෙළවරට යන්නත් වෙනව. යන්නේ ගමනින් නොවෙයි.** එතනදීත් බුදුරජාණන් වහන්සේ ඒක ප්‍රකාශ කරල නැගිටලා විහාරයට වැඩිය. ඔන්න පටලැවිල්ල. ආයිත් අර වගේම සංඝයා වහන්සේලා අතර කථා කරලා අපි යන්නේ කවුරුන් ළඟටද කියලා අර විදියටම

ආනන්ද හාමුදුරුවෝ ළඟටම වැඩම කරලා මේක තේරුම් කරලා දෙන්න කිව්වා. ආනන්ද සවාමීන් වහන්සේ ඒ අවසථාවේදී ටිකක් දිග විවරණයක් - ඉතාම වටිනා විවරණයක් කළා. ඒ විවරණය කරන්නේ ලෝකය කියන්නේ මොකක්ද කියල හඳුන්වල දුන්නා. ආර්ය ව්‍යවහාරයට අනුව ලෝකය කියන්නේ මොකක්ද? මෙහෙමයි ප්‍රකාශ කරන්නේ **'යෙන ඛො ආවුසො ලොකසමිං ලොකසඤ්ඤී හොති, ලොකමානී අයං වුච්චති අරියසස විනයෙ ලොකො'** ඇවැත්නි යමකින් ලෝකයෙහි ලෝකය පිළිබඳ සංඥාවක් ඇති කරගන්නව නම් - **'ලොක සඤ්ඤී'** - යමක් උපකාර කරගෙන ලෝකයක් පිළිබඳ මානයක් - මැනීමක් - ඇති කරගන්නවා නම් - **'ලොක මානී'** - ඒ වචන දෙක විශේෂයි. එය මේ ආර්ය ව්‍යවහාරයට අනුව ලෝකයයි. ඊළඟට තමන්ම ප්‍රශ්න කරලා ඒක තව පැහැදිලි කරනවා. 'කෙන නුඛො ආවුසො ලොකසමිං ලොකසඤ්ඤී හොති ලොකමානී' මොකකින්ද මේ ලෝකය පිළිබඳව ලෝක සංඥාවක් ලෝක මානයක් ඇති කරගන්නේ? 'චක්ඛුනා ආවුසො ලොකසමිං ලොකසඤ්ඤී හොති ලොකමානී' ඇසෙනුයි ලෝකය පිළිබඳව සංඥාවක් ලෝක මානයක් ඇති කරගන්නේ. ඒ වගේම කනෙන්, නැහැයෙන්, දිවෙන්, කයෙන්, මනසින්. මේ කියාපු හයෙන් තමයි ලෝකය පිළිබඳ සංඥාවක් හෝ මානයක් ඇතිකර ගන්නේ. ඒ ඇති කරගත්ත එකම තමයි මේ ධර්මය තුළ ලෝකය හැටියට හඳුන්වන්නේ. ඔන්න එතකොට ඒකෙන් මේ පින්වතුන්ට තවත් පැහැදිලි වෙනවා - **මේ සළායතනයමයි මේ ආර්ය ව්‍යවහාරයට අනුව ලෝකය හැටියට දක්වන්නෙ.** ඊළඟට ඔන්න එතන ඉඳලා අපි තව ටිකක් ඈතට යනවා මේ සූත්‍රයටත් සම්බන්ධ එකක්. මීට කලින් අවසථාවල ඇත්ත වශයෙන් අපි ඒ සූත්‍රයට අදාළව ඒක උද්ධෘත කරලා දක්වන්නත් සිද්ධ වුනා. නමුත් මේ පටිච්ච සමුප්පාද දේශනා මාලාවට ගැළපෙන නිසා අපි ප්‍රකාශ කරනවා. මොකක්ද ඒ සූත්‍රය? **රොහිතසස සූත්‍රය**[7]. මේ සූත්‍රයේ වැදගත් කම කියතොත් මේ සූත්‍රය සංයුත්ත නිකායෙත් දකින්න ලැබෙනවා. අංගුත්තර නිකායෙත් දකින්න ලැබෙනවා. මොකක්ද ඒ සූත්‍රයේ තියෙන්නේ - මෙහෙමයි.

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර වැඩ වාසය කරන අවසථාවක රාත්‍රි කාලයේ රෝහිතසස නමැති දිව්‍ය පුත්‍රයා ඇවිල්ල බුදුරජාණන් වහන්සේට වන්දනා කරලා ප්‍රකාශ කරනවා මෙහෙම එකක්. **'සවාමීනි, යම් තැනක නූපදීද, නොදිරයිද, නොමියෙයිද, චුත නොවෙයිද නැවත නූපදීද එබඳු ලෝකාන්තයට ලෝකයේ කෙළවරට ගමන්**

**කිරීමෙන් පැමිණිය හැකිද?'** කියලා මේ රෝහිතස්ස දිව්‍ය පුත්‍රයා අසනවා. බුදුරජාණන් වහන්සේ එක පාරටම කියනවා. 'ඇවැත්නි ඔය කියන ඉපදීමක් දිරීමක් මැරීමක් චුත වීමක් නැවත ඉපදීමක් නැති ඒ ලෝකාන්තයට ගමන් කිරීමෙන් යන්න බැහැ. ''ඒ ටික කිව්ව හැටියෙම මේ දිව්‍ය පුත්‍රයා කියනවා'' ආශ්චර්යයි. ස්වාමීනි අද්භූතයි ස්වාමිනී' කියලා - මොකද ඒ තමන්ගේ මතයට එකඟවුන නිසා. ඔන්න ඊළඟට ඒ අතීත ප්‍රවෘත්තියත් ප්‍රකාශ කරනවා ඊළඟට මේ රෝහිතස්ස දිව්‍ය පුත්‍රයා කියනවා 'ස්වාමීනි මම ඒක ප්‍රත්‍යක්ෂ කරගෙන තියනවා. ඒ සිද්ධිය කියන්නේ මෙහෙමයි. මම මීට කලින් භෝජ නමැත්තෙකුගේ පුතෙක්ව ඉපදිලා මහා ඍද්ධියක් ඇතිව අහසින් යන්න ශක්තිය තිබුණා මට. අහසින් ගමන් කිරීමේ වේගය උපමාවකට දක්වල තියෙන්නේ දක්ෂ දුනුවායෙක් බොහොම පහසුවෙන්ම ඇතට ඊතලයක් විදින්න වගේ ඒ තරම් වේගයි මගේ ගමන. මේ කාලයේ අභ්‍යවකාශ යානා පරාද ඇති. ඊළඟට කියනවා මගේ පියවර මාරු කිරීම මේ විදියටයි. පෙරදිග සයුරේ එක අඩියක්, අවරදිග සයුරේ එක අඩියක්. ඒ තරම් වේගයකින් ඇවිදින්න පුළුවන් මට. එහෙම ඇවිදලා අර තරම් වේගයෙන් අර තරම් පියවර මාරු කිරීමේ හැකියාවක් තිබෙද්දී මේ ඍද්ධි බලයෙන් මට මෙහෙම අදහසක් ආවා නිකමට. මම ලෝකෙ කෙළවරට යන්න ඕනෑ. එහෙම හිතාගෙන මම අවුරුදු සියයක් ඇවිද්දා. ඒ ඇවිද්දෙ මුළු කාලය නොවෙයි.එතන කියනවා ඒ රෝහිතස්ස දිව්‍ය පුත්‍රය ආහාර ගන්නා වේලාවත් මල මුත්‍ර පහ කරන වේලාවත් නිදාගන්න වේලාවත් හැර මම අවුරුදු සියයක් ලෝකයේ කෙළවර හොයාගන්න ඇවිදලා අතර මඟදීම මැරුණා. මැරිලා තමයි මේ ආත්මයට ආවේ කියලා. ආයිත් ආශ්චර්යයි අද්භූතයි. ස්වාමීනි මේ ප්‍රකාශ කළ එක කියලා බුදුරජාණන් වහන්සේට ප්‍රශංසා කළහම ඔන්න බුදුරජාණන් වහන්සේ අති විශේෂ ප්‍රකාශයක් කරනවා. කොහොමද, අරක නැවතත් තහවුරු කරලා 'එසේය ඇවැත්නි යම් තැනක නූපදීද නොදිරයිද, නොමියේද චුත නොවේද නැවත නූපදී ද එබඳු ඒ ලෝකාන්තයට ගමන් කිරීමෙන් පැමිණිය හැකැයි මම නොකියමි.' එසේම ඊළඟට කියනවා කලින් කියපු සූත්‍රයේ කිව්ව වගේ 'නමුත් ලෝකයේ කෙළවරට නොපැමිණ දුක් කෙළවර කිරීමක් ද නැතැයි කියමි.' අර කලින් කියපු පරස්පර විරෝධී වගේ ප්‍රකාශය කරනවා. කරලා ඔන්න ඊළඟට කියන පාඨය තමයි අපි කලිනුත් උපුටා දැක්වූවේ. මේ කාලයේ උගතුන්ට ඇත්ත වශයෙන්ම මේ වගේ යුගයක අපි ගැඹුරින් හිතන්න ඕන ප්‍රශ්නයක් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. **'අපිචාහං**

**ආවුසො ඉමසමිං යෙව බ්‍යාමමත්තෙ කලෙබරෙ සසඤ්ඤිමහි සමනකෙ ලොකං ච පඤ්ඤපෙමි ලොක සමුදයං ච ලොක නිරොධං ච ලොක නිරොධගාමිනිං ච පටිපදං'** නමුත් ඇවැත්නි මෙම බඹයක් පමණ වූ, සඤ්ඤාවත් මනසත් සහිත වූ ශරීර කූඩුවේම මම ලෝකයත් ලෝකයේ හටගැන්මත් ලෝක නිරෝධයත් ලෝක නිරොධ ගාමිනී ප්‍රතිපදාවත් දක්වනවාය. මෙන්න මේ තරම් මහ පුදුම වාක්‍යයක් ප්‍රකාශ කරලා තියනවා. අවාසනාවකට වගේ අටුවාචාරීන් වහන්සේ ඒ ප්‍රකාශය ගැන නිහඬයි. මේ නිහඬ බව ගැන බටහිර උගතුනුත් පුදුමය ප්‍රකාශ කරල තියෙනවා. මේ තරම් වටිනා ප්‍රකාශයක් ගැන ඇයි අටුවාචාරීන් වහන්සේ නිහඬ? නිහඬ අරකයි. අපිට හිතන්න තියෙන්නේ ඒ වෙනකොට අර **'සියදෝරිස් නිවන'** සම්මත වෙලා ඉවරයි. **මරණින් මතු.** ඉතින් **මෙලොවම** නිවනක් ඇතැයි කියන එක, මේ විදියේ ප්‍රත්‍යක්ෂයක් ඇතැයි කියන එක, බොහෝදෙනා පිළිගන්නවත් කැමති නැහැ. ඔන්න ඔය ටිකයි අපි සිංහලට නගල තියෙන්නේ.

**මොහඳුර තුළ කොටුවැ - නොදකිති නැණැස නැතියෝ**

**නැණ'ලු තුළ විවටවැ - දකිති නැණ ඇස ඇතියෝ**
**ළඟමැ ඇති මුත් නොදකිති - දහම් මඟ නොම රිසියෝ**

නැණලු කියන්නේ ඥානාලෝකය තුළ - ළඟමැ ඇති මුත් කිව්වෙ ඒකයි. මේ බඹයක් පමණ වු, සංඥාවත් මනසත් සහිත වූ ශරීර කූඩුව තුළම දුකත් දුකේ නිරෝධයත්. ලෝකය කිව්වේ ඒකමයි. ලෝකයයි දුකයි එකමයි. එහෙම නැත්නම් ලෝකයත් ලෝකයේ හටගැනීමත් ලෝක නිරෝධයත් ලෝක නිරෝධගාමිනී පටිපදාවත් කියන ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්‍ගය මේ ඔක්කොම තියෙන්නෙ මෙතනයි කියලා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා. අන්න ඒක අනුව අපි කල්පනා කරන්න ඕන. අර ගාථාවල තියන ධර්‍ම තේජසින් හැඟෙන්නේ ඒකයි. මේ ළඟම තියාගෙන - අර එකිනෙකට ප්‍රතිවිරුද්ධ හැටියට පෙනුණෙ - ලෝකයා හිතනවා මේ ආයතන හයෙන් ලැබෙන අරමුණු ටික තමයි සැප, එහෙම නැත්නම් සත්‍යය මේ නාම රූපයයි. ආර්යයන් වහන්සේලා කියනවා එතන නොවෙයි ඒවා නිරුද්ධ වුණ තැනයි ඒ නිරුද්ධ වුණ තැනයි - මේ පින්වතුන්ට අපි නිවන දේශනාවල මාතෘකාව හැටියට ගත්තු පාඨය මතක් කරගත්තොත් **'එතං සනතං එතං පණීතං යදිදං සබබසංඛාරසමථො සබබූපධි**

**පටිනිසසගෙගා තණ්හකඛයො විරාගො නිරොධො නිබබානං'** කියන උපසමානුස්සති පාඨයෙන්[8] හැඟෙන්නෙත් ඔය කියාපු තත්ත්වයයි. මෙය ශාන්තය මෙය ප්‍රණීතය කියල කිව්වෙ අර ලෝකයාට හිතාගන්න බැරි විදියේ ශාන්ත ප්‍රණීත තත්ත්වයක්. මොකක්ද? සබබසංඛාරසමථො සියලු සංස්කාර සංසිඳීම. අරවා සංස්කාරනෙ - සළායතනයට එන ඒව. සබබුපධිපටිනිස්සගෙගා සළායතනයෙන් ගොඩනඟාගත්තු පඤ්ච උපාදානස්කන්ධය උපධි, වත්කම් ටික. සබ්බූපධි පටිනිස්සගෙගා තණ්හකඛයො තණ්හාවට අදාළ දේවල්නෙ අර කියාපු ඉන්ද්‍රිය අරමුණු. විරාගො නොඇල්ම, නිරොධො නිරෝධ වීම. සළායතන නිරෝධයත් ගන්න පුළුවන්. දුකඛ නිරෝධය ලෝක නිරෝධය කිව්වත් සළායතන නිරෝධය කිව්වත් එකයි. ඊළඟට නිබබානං - නිවීම ඔන්න ඔය විදිහෙ තත්ත්වයක්, මේක ලෝකයාට තේරුම්ගැනීමට බැරි බවයි මේ ගාථාවලින් හෙළි වෙන්නේ. මේ ළඟම තියන නමුත් ලෝකයා තේරුම්ගන්න කැමැති නෑ. මොකද ඒකට හේතුව. ඒක කියවුණෙත් අන්තිම ගාථාවල. ඒක සිංහලට දැම්මෙ **භව ඇලුමෙහි ගිලුණ - භව දිය වැලට හසු වුන මරුවසයෙහි රැඳුන - රැසෙකි මෙ දහම නොදකින.** අරිමඟට පිළිපන් පුගුලන්මැ මිස - වෙන අන් කවුරු දකිතිද මෙනිවන් - අන්න බුදුරජාණන් වහන්සේ සංවේගයෙන් ප්‍රකාශ කරනවා. මේකයි ලෝක තත්ත්වය. මේකයි නියම තත්ත්වය. නමුත් ලෝකයාට මේක පිළිගන්න බැහැ. ඉතින් මේක බැලූ බැල්මට මහා පරතරයක් තියනවා වගේ. නමුත් ප්‍රකාශ කරල තියෙන්නේ මේ පරතරය තුළ හිත විහිදවා ගෙන කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව මේ ධර්ම මාර්ගයේ ප්‍රතිපදාවේ හික්මෙන භික්ෂුව එක්කො රහත් වෙනවා. එක්කො අනාගාමී වෙනවා. මේක නිකම්ම පාඨයක් - විද්වතුන්ගේ නුවණැත්තන්ගේ කුතුහලය දනවන්න ප්‍රකාශ කරපු එකක් නොවෙයි. මේ ප්‍රතිපදාවේ හික්මෙන සංඝයා වහන්සේලාට ඇත්ත මොකක්ද, බොරුව මොකක්ද, සැප මොකක්ද, දුක මොකක්ද කියල තේරුම් කරල දෙන්නයි බුදුරජාණන් වහන්සේ ඔය දෘෂ්ටි කෝණ දෙකේ වෙනස ප්‍රකාශ කරල තියෙන්නේ. මේ පාලි පාඨම කිව්වහම හැමදාම සමහර විට මේ පින්වතුන්ට අපි ගැන අසහනයකුත් ඇති වෙන්න පුළුවන්. ඒක නිසා අපි අර වෙනදා කළා වගේ පොඩි නිදර්ශනයක් දෙමු.

ගැමි කථාවක් - මේ පින්වතුන් අහල තියන එකක්. කියාගෙන යනකොට තේරෙයි. ගමරාළලගෙ ගෙදර තොවිලයක්. තොවිලෙ පටන් ගන්න ලෑස්ති

වෙන කොටම මහ වැහි වලාවක් ආවා, මහ වැස්සක් කළු කරා. ඉතින් ගමරාලයි ඇදුරොයි ලබු ගෙඩියක් ඇතුළට වැදුණා. ලබු ගෙඩිය ඇතුළට වැදිලා තොවිලෙ පටන්ගත්තා. මහා වැස්සක් වැහැලා අර ලබු ගෙඩිය ඇලට ගහගෙන ගිහිල්ලා, ඇලෙන් දොළට ගහගෙන ගිහිල්ලා, දොළෙන් ගඟට ගහගෙන ගිහිල්ලා, ගඟෙන් මුහුදට ගහගෙන ගියා. මුහුදට ගහගෙන ගියාට පස්සෙ මෝරෙක් මේ ලබු ගෙඩිය ගිල්ලා. ඊට පස්සේ අර දැල්දාන මිනිසුන්ගේ දැලකට මේ මෝර අහු වුණා. මේ අතරේ මගුල් ගෙදරකින් මාළු සොයාගෙන එන කාණ්ඩයක් ඇවිල්ලා මේ මෝරා සල්ලිවලට ගත්තා. අරගෙන මඟුල් ගෙදර කුස්සියට ගෙනිහිල්ලා අර මෝරගෙ බඩ පැලුවා. එතකොට 'ඬෙන්න- ඬෙනා- ඬෙනෝ' කියල - අර තොවිලෙ තාම ඉවර නැහැ. ගමරාළයි ඇදුරොයි එළියට ඇදුණා. මොකද මේකෙ තේරුම? ගමරාළවත්, ඇදුරොවත් දන්නෙ නැහැ ලබු ගෙඩියට වෙච්ච දේ. ලබු ගෙඩිය අර විදියට වැස්සට අහු වෙලා ගහගෙන ගිහිල්ලා ඇලෙන් දොළෙන් ගහගෙන ගිහිල්ලා අන්තිමට මුහුදට ගහගෙන ගිහිල්ලා දැලකට අහු වෙලා ඒ ටික මොකුත් දන්නේ නැහැ. ඉතින් මේ කිව්වෙ මොකද? මේ ලෞකික දාර්ශනිකයිනුත්, දෘෂ්ටිගතිකයනුත්, භෞතික විද්‍යාඥයනුත් - මේ ගමරාළලත් ඇදුරනුත් ඔක්කොම - **හැම තොවිලයක්ම නටන්නේ මේ සළායතන ලබු ගෙඩිය ඇතුළෙයි. සළායතන ලබු ගෙඩිය ඇතුළෙයි.** එයින් පිට දෙයක් තියනවයි කියලවත් පිළිගන්න සූදානමක් නැහැ. ඒ ලබුගෙඩිය කෙළවරටවත් යන්න බැරි වුණා අභ්‍යවකාශ යානාවලට. තවම අඩු ගණනේ චාතුර්මහාරාජිකය අහලටවත් යන්න බැරි වුණා කියලයි අපට අහන්න ලැබිල තියෙන්නේ.

ඉතින් ඔන්න ඔය වගේ තත්ත්වයක් තියෙන්නේ. නමුත් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා, සළායතන නිරෝධය කියලා ලෝකෝත්තර තත්ත්වයත්. **ලෝකෝත්තර** කියල කියන්නේ මොකක්ද? ලෝකයෙන් එතර වීමනෙ. ඉතින් ලෝකය සළායතනය නම් ඒකෙන් එතර වුණ තත්ත්වයක් තියෙන්න ඕන නේද? ඒ එතර වුණ තත්ත්වය තමයි නිවන. ඒකම තමයි දුකේ කෙළවර. ඒ ටික තේරුම් ගන්න බැරි මොකද? අන්න අර භව ඇලුමට ගිලුණහම, භව දිය වැලට අසුවුණාට පස්සේ නිවනේ නාමයෙන් භවය පතනවා. **නිවනේ නාමයෙන් භවය පතනවා.** අපට අර බොහෝ වෙලාවට උපහාසාත්මකව නමුත් කියන්න සිද්ධ වුන අර සියදෝරිස් උපාසක උන්නැහේගේ මරණ දැන්වීමේ තියන 'නිත්‍ය මංගල

පරම රමණීය සදාකාලික නිර්වාණය' තමයි දන් කවුරුත් සොයන්නේ. නමුත් බුදුරජාණන් වහන්සේ දක්වූවේ එහෙම එකක් නොවෙයි. බුදුරජාණන් වහන්සේ, ප්‍රකාශ කරල තියනවා අරියපරියේසන සූත්‍රයේම[9] ලෝකයාට මේක තේරුම් ගන්න අමාරු නිසයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්න මැළි වුණේ. අර බ්‍රහම රාජයා ආරාධනා නොකළ නම් අපට මේ ධර්මය අහන්නවත් ලැබෙන්නෙ නැහැ.

බුදුරජාණන් වහන්සේ ධර්ම ගම්භීරත්වය ගැන හිතනකොට මේ විදියටයි ප්‍රකාශ කළේ. ඒක අපි කලිනුත් පටිච්ච සමුප්පාද දේශනාවක ප්‍රකාශ කළා අරිය පරියේසන සූත්‍රය ගැන කියනකොට - කාරණා දෙකක්. බුදුරජාණන් වහන්සේට තේරුණා මේ භවාරාමා භවරතා භව සම්මුදිතා - භවයට ඇලෙන භවයටම උදම් වෙන මේ ලෝක සත්ත්වයාට තේරුම් ගන්න බැරි තැන් කාරණා දෙකක් තියෙනවා. මොනවද තැන් දෙක? ඉදප්පච්චයතා පටිච්ච සමුප්පාදය මෙය නිසා මෙය වෙනවා කියන අපි නොයෙකුත් විදියට විග්‍රහ කරල පෙන්වූ, මෙය ඇති කල්හි මෙය වෙයි ආදී වශයෙන් කියවෙන පටිච්ච සමුප්පාද ධර්මතාව. මේක අපි කියල දුන්නා. ඒකාන්ත අසත්ථිත්වයක් ඒකාන්ත නාසත්ථිත්වයක් - ඒකාන්තයෙන් ඇත. ඒකාන්තයෙන් නැත කියන අන්ත දෙකට මැදින් තියන ඒක ඉක්මවාලූ මධ්‍යම ප්‍රතිපදාව මොකක්ද? සමුදයො සමුදයො - නිරොධො නිරොධො[10]. එතකොට ඒ ටිකවත් තේරුම් ගන්න ලෝකයාට අමාරුයි. ඒ පළවෙනි කාරණය. සමුදයයි නිරොධයයි කියල ඒ විදියට නිරන්තරයෙන්ම ඇති වීමක් සහ නැති වීමක් තියනවා කියන එක පළමුවෙන්ම ලෝකයාට තේරුම්ගන්න බැහැ. ඊළඟට දෙවන කාරණය තමයි බුදුරජාණන් වහන්සේ අරිය පරියේසන සූත්‍රයෙ දක්වන්නේ 'සබ්බසංඛාරසමථො, සබ්බූපධිපටිනිස්සග්ගො, තණ්හක්ඛයො, විරාගො නිරොධො, නිබ්බානං' කියන මෙන්න මේ කාරණයත් තේරුම් ගන්න අමාරුයි ලෝකයාට. සියලු සංස්කාර සංසිඳීම සියලු උපධීන් අතහැරීම තණ්හාව ක්ෂය කිරීම, විරාගය, නිරෝධය. එතකොට සමුදය නිරෝධ කියල දෙකක් තියනවා පටිච්ච සමුප්පාදයේ. එයින් ලෝකයා ඉන්නේ සමුදය පක්ෂයේ. **ලෝකයා සමුදයෙන් සමුදයට පනිනවා. නිරෝධය අමතක කරලා.** ඒක නිසා නිරෝධයට බයයි. නිරෝධය දකින්න කැමතිත් නැහැ. නමුත් අන්න **විමුක්තිය තියෙන්නේ නිරෝධයේ.** ඒ බව බුදුරජාණන් වහන්සේ බොහෝ තැන්වල ප්‍රකාශ කරලා තියනවා.

**යෙ ච රූපූපගා සත්තා - යෙ ච අරූපට්ඨායිනො**
**නිරොධං අප්පජානන්තා - ආගන්තාරො පුනබ්භවං**

රූප ලෝකවලට යන අයත් අරූප ලෝකවල ඉන්න අයත් නිරෝධය තේරුම් නොගැනීම නිසා 'ආගන්තාරො පුනබ්භවං' නැවත නැවත භවයට එනවා. එන්න ඒ විදියේ තත්ත්වයක් තියෙන්නේ.

**යෙ ච රූපෙ පරිඤ්ඤාය - අරූපෙසු අසණ්ඨිතා**
**නිරොධෙ යෙ විමුච්චන්ති - තෙ ජනා මච්චුහායිනො[11]**

නමුත් යම් කෙනෙක් රූපය හරියාකාරව තේරුම් අරගෙන, අරූපයේවත් නොරඳනවා නම් ඒ අය 'නිරොධෙ යෙ විමුච්චන්ති' නිරෝධය තුළ විමුක්ත වෙනවා. ඒ අය තමයි 'මච්චුහායිනො'. මාරයාගෙන් නිදහස් වෙන්නේ. ඔන්න ඔය විදියේ තත්ත්වයක් තියෙන්නේ. ඉතින් අපි අර ලබු ගෙඩිය තුළ යාගය කියල කිව්වෙ. ඒ ලබු ගෙඩිය මාළුකාරයා අල්ලපු කථාවට මාළු දැලට සම්බන්ධව තවත් ඊළඟට උපමාවක් අපි කියනවා. ඒක අපි හදපු එකක් නොවෙයි. බුදුරජාණන් වහන්සේගේ උපමාවක්. බ්‍රහ්මජාල සූත්‍රයේ. බ්‍රහ්මජාල සූත්‍රය නොදන්නා කෙනෙක් බෞද්ධ උගතුන් අතර නැහැ. මොකද දීඝ නිකායේ මුලටම තියන සූත්‍රය. ඒ තරම්ම වැදගත් සූත්‍රයක් නිසා ඒක මුලටම දාල තියෙන්නේ. අපි කලිනුත් කියල තියනවා යම් තාක් ලෝකයේ තියනවා නම් දෘෂ්ටි, ඇති වන්න පුළුවන් නම් දෘෂ්ටි, ඒ හැම එකක්ම අහු වෙන්න බඹ දැලක් බුදුරජාණන් වහන්සේ බ්‍රහ්මජාල සූත්‍රයෙන් දාල තියනවා. හැටදෙකක් (62) දෘෂ්ටි දක්වල තියනවා. එයින් පිට නැහැ ලෝකයේ කිසිම දෘෂ්ටියක්. ඊළඟට ඒ දෘෂ්ටිවල තියන අඩුපාඩුව - ඔන්න දැන් ගැඹුරු කාරණයක් කියන්න යන්නේ. ඒ හැම දෘෂ්ටියක්ම බුදුරජාණන් වහන්සේ ප්‍රතික්ෂේප කරන්නේ වචන තුනකින්. මොනවද වචන තුන? **'තදපි ඵස්ස පච්චයා, තදපි ඵස්ස පච්චයා, තදපි ඵස්ස පච්චයා'** ඒකෙ තේරුම - යම් කිසි දෘෂ්ටියක් ඉදිරිපත් කරලා බුදුරජාණන් වහන්සේ කියනවා 'එයත් ස්පර්ශය ප්‍රත්‍යයෙන්' එයත් ස්පර්ශය ප්‍රත්‍යයෙන් 'එයත් ස්පර්ශය ප්‍රත්‍යයෙන්' ඒ තුළින්ම ඒක නිෂ්ප්‍රභා වෙනවා.

මොකද හේතුව? අන්තිමට එන සමාලෝචනාත්මක පාඨය - බ්‍රහ්මජාල සූත්‍රයේ සමාලෝචනාත්මක පාඨය - ඉතාම වැදගත්. ඒ සමාලෝචනාත්මක පාඨයෙන් හෙළි වෙනව මේ 'ඵස්ස' එකේ තියන දෝෂය. ඔක්කොම දෘෂ්ටිගතිකයින් පිළිබඳව මෙන්න මෙහෙම පාඨයක්

තියනවා අවසාන වශයෙන් බුද්ධ වචනයක් **'සබ්බ තෙ ඡහි ඵස්සායතනෙහි ඵුස්ස ඵුස්ස පටිසංවෙදෙන්ති.** තෙසං ඵස්ස පච්චයා වෙදනා. වෙදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවො, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරා මරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති'. ඒකෙ තේරුම අර කියාපු දෘෂ්ටි ගතිකයන් හැම දෙනෙක්ම - අභිඥාලාභීන් ඇතුළු හැමදෙනෙක්ම - බුදුරජාණන් වහන්සේ ඔක්කොම එකට අල්ලලා ඒ අය හඳුන්වන්නේ අවසාන සමාලෝචනාත්මක පාඨයෙන් මෙහෙමයි. ඒ හැමදෙනෙක්ම 'ඡහි ඵස්සායතනෙහි ඵුස්ස ඵුස්ස' ඒකෙ තේරුම මේ ආයතන හයෙන් - සළායතනයෙන් කියන එකයි. - නැවත නැවතත් ස්පර්ශ කරමින් 'ඵුස්ස ඵුස්ස' නැවත නැවතත් ස්පර්ශ කරමින් ඒ ස්පර්ශ කිරීම නිසාම 'පටිසංවෙදෙන්ති' වේදනාව තියනවා. ඔන්න එතන ඉඳලා පටිච්ච සමුප්පාදයට අහු වෙලා ඉවරයි. 'තෙසං වෙදනා පච්චයා තණ්හා', වේදනා නිසා තණ්හාව 'තණ්හා පච්චයා උපාදානං' තණ්හාව නිසා උපාදානය, උපාදානය නිසා භවය, භවය නිසා ජාතිය, ජාතිය නිසා ජරා මරණ සොක පරිදෙව ඔක්කොම.

එයින් මොකක්ද පෙන්නුම් කරන්නෙ? **බුදුරජාණන් වහන්සේ මේ ඵස්ස කියන අවස්ථාවෙන් එහාට ගිහිල්ල.** අර ඔක්කොම දෘෂ්ටි හැට දෙකම ප්‍රතික්ෂේප කළේ නිෂ්ප්‍රභා කළේ අර පාඨය නිසා නම් 'ඡහි ඵස්සායතනෙහි ඵුස්ස ඵුස්ස' එහෙම නැතිනම් 'ඵස්ස පච්චයා' කියන එක - එයින් අපට හැඟෙන්නේ මොකක්ද? **ස්පර්ශ කියන අවස්ථාවෙන් එහාට බුදුරජාණන් වහන්සේ ගිහිල්ල තියෙනවා. ඇත්ත වශයෙන් පටිච්ච සමුප්පාදය කියල කියන්නේ ඒකයි. පටිච්ච සමුප්පාදය තේරුම් ගැනීම පටිච්ච සමුප්පාදයෙන් මිදීමයි.** ඒක ගැටලුවක් වෙන්න පුළුවන්. පටිච්ච සමුප්පාදය නොදැනීම කියන අවිද්‍යාව නිසා ඒ මුළාව තුළ අන්න විඤ්ඤාණ නාමරූප දෙකට අහු වෙලා. නාසිසස් ගැන කියල තියනව. ඒ දණ්ඩ උඩ බල්ල ගැන මේ පින්වතුන්ට කියල තියෙනවා. අන්න ඒ විදියේ දෙයක් තමයි, නාසිසස් කරපු දේ තමයි, අපි මෙච්චර කාලයක් සංසාරයේ කරල තියෙන්නේ. **අපේම හෙවණැල්ල වැළඳගන්න උත්සාහ කිරීම. හෙවණැල්ල මොකක්ද? නාමරූප.** එතෙන්ට යන්නෙ ඵස්ස පච්චයා. එතනත් ගැඹුරු කාරණයක්. තාම අර උපමාව කිව්වෙ නැනේ. ඊළඟට බුදුරජාණන් වහන්සේ දේශනාව ඉවර කරන්නේ ආයිත්

අර මාළු අල්ලන දැලේ උපමාවෙන්. බුදුරජාණන් වහන්සේ ලස්සන උපමාවක් දෙනවා 'මහණෙනි, යම් සේ දක්ෂ මසුන් මරන්නෙක් හෝ මසුන් මරන්නකුගේ අත වැසියෙක් ඉතාමත්ම සියුම් ලෙස වියන ලද මාළු දැලක් අරගෙන කුඩා දිය කඩිත්තකට බහිනවා. එතකොට ඒ මසුන් මරන්නාට හොඳටම ස්ථිරයි, ඒ දැල සියුම් හැටියට වියල තියන නිසා - මේ දිය කඩිත්තෙ යම්තාක් ලොකු මාළුවන් ඉන්නවා නම් ඒ හැම මාළුවාම මේ දැලට අහුවෙලා ඉවරයි. ඒ මාළු බේරෙන්න ඔළුව උඩට දාන කොට 'උම්මුජ්ජමානා උම්මුජ්ජන්ති නිමුජ්ජමානා නිමුජ්ජන්ති' ඒ වචන හිටන් හරි ගැඹුරුයි. දැන් මාළු දැලක් දැම්මහම ඒ මාළු දැලෙන් බේරෙන්න මාළුවෝ බලනවනෙ දැලෙන් උඩට එන්න බේරෙන්න. නමුත් හිරවෙනවා. ඒ හිරවෙන්නෙ **දැල් ඇසේ.** හිතාගන්න පුළුවන්නෙ. මේ පින්වතුන්ට එතකොට **දැල් ඇස සියුම් ලෙස වියල තියනවා නම්** මාළුවාට උඩහට එන්න බැහැ. උඩහට එන්න හදනවා. හිර වෙනවා. හිරවෙන්න කොතනින්ද අන්න '**තදපි ඵස්ස පච්චයා**' එතන හිර වෙනවා.

ඒකනෙ කිව්වෙ අර දෘෂ්ටි හැටදෙකම ඵස්සය ප්‍රත්‍යය කරගෙන ඇති වෙච්ච ඒවයි කියල. දැන් මේ පින්වතුන් ටිකක් තේරුම්ගන්න බලන්න මේ කියන එක. උපමාව කියන්නෙ උපකාර කරගන්නයි. මේ උපමාව අහල නිකම් ඉන්න නොවේ. උපමාවෙන් තේරුම්ගන්න බලන්න. මේ මම කියන උපමාවක් නොවේ. බුදුරජාණන් වහන්සේ දුන්න උපමාවක්. එතකොට මේ මාළුකාරයාගේ දැලින් බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නෙ මොකක්ද? මේ දෘෂ්ටි හැටදෙකට ඔක්කොම අහු වෙනවා ලෝකයේ ඇතිතාක් දෘෂ්ටි. ඒකයි අපි කිව්වෙ ඔක්කොම දෘෂ්ටි ගතිකයින් - අතීත ගමරාළලයි දැන් ඉන්න ඇදුරනුයි - ඔක්කොම අහු වෙලා ඉවරයි. විද්‍යාඥයින් ඇතුළු ඔක්කොම, මොකද '**ඵුස්ස ඵුස්ස පටිසංවෙදෙන්ති.**' එතන ඉඳලයි ඒගොල්ලො කරන්නෙ. ඇහැට පේන්නෙ නැති එකට අණු දක්නයක් දුර දක්නයක් උපකාර කරගන්නවා. **ඒත් ස්පර්ශය.** එහෙම නේද? අනිත් ඒවා - එක පාරම හිතට නොවැටහෙන ටිකට ඊළඟට තර්ක විතර්ක ඔස්සේ සොයාගෙන යනවා. ඒත් බැහැ ලෝකයේ කෙළවරවත් මොකක්වත් අල්ලගන්න. **තාම ඉන්නෙ ලබු ගෙඩිය ඇතුළෙ.** ඉතින් ඇත්ත බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා. ඊළඟට අවසාන පාඨය ඊටත් වඩා වැදගත්. ඒ විදියට නිෂ්ප්‍රභා කරල ඔන්න බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා මෙන්න මෙහෙම '**යතො ඛො භික්ඛවෙ භික්ඛු ඡන්නං**

**ඵස්සායතනානං සමුදයංච අත්ථගමංච අස්සාදංච ආදීනවංච නිස්සරණංච යථාභූතං පජානාති අයං ඉමෙහි සබ්බෙහෙව උත්තරීතරං පජානාති'** ඒ සූත්‍රය ඉවර වෙන්නේ මේ පාඨයෙන්. ''මහණෙනි යම් භික්ෂුවක් - මෙතන රහතන් වහන්සේ කියල හිතාගන්න කියන්නේ - මේ කියපු ස්පර්ශ ආයතන හයෙහිම 'සමුදය' - හටගැනීමත් 'අත්ථගමං' - අස්තයට යාමත් 'අස්සාදං' - ආස්වාද පක්ෂයත් 'ආදීනවං' - ආදීනව පක්ෂයත් අන්තිමට කියන්නේ 'නිස්සරණං' - නිස්සරණයත් - නිස්සරණ කියන්නේ ආයතන නිරෝධය එයින් නික්මීමත් කියන මේ කාරණා පහම යථාභූත වශයෙන් තේරුම් ගත්ත නම් අන්න ඒ භික්ෂුව අර කියාපු දෘෂ්ටිගතිකයින් ඔක්කොටම වඩා 'උත්තරීතරං පජානාති' උත්තරීතර ඥානය එතනයි.

ඉතින් බුදුරජාණන් වහන්සේගෙ විමුක්තිය ගැන කියනකොටත් ඔය පහ සඳහන් වෙනවා මේ අංග පහ පිළිබඳව. දූන් කෙනෙකුට හිතෙන්න පුළුවන් හැම තිස්සෙම අරහත් ඵල සමාපත්තියෙන් ඉන්නව කියල. නැහැ අර අවබෝධය ලබාගත්තා. මේ ආයතන හය ඇති වන හැටි තේරුම් ගත්තා. මේක නැති වී යන හැටි තේරුම්ගත්තා. ඊළඟට ඇති වන හැටි සමුදය. සමුදය - ඉර නගින හැටි. අත්ථගමය - ඉර බහින හැටි. සළායතන හය පැන නගින හැටි තේරුම්ගත්තා. මේක ගෙවී යන හැටි දූනගත්තා. මේ සළායතනයේ ආස්වාද පක්ෂයත් තේරුම්ගත්තා. ආදීනව පක්ෂයත් තේරුම්ගත්තා. බුදුරජාණන් වහන්සේ දානය වළඳන කොට මේ රස නහරවලින් රස නහර ක්‍රියා කරනවා. ඒවා නැතිවා නොවෙයි නෙ. ඇහැට පේනවා රූප. ඒවයි ඇලෙන්නෙ නැතුව විතරයි. ආස්වාද පක්ෂයත් දන්නවා ආදීනව පක්ෂයත් දන්නවා අන්තිමට නිස්සරණ. අන්න නිස්සරණ කියන එක තමයි අපට විශේෂ. ඒක තමයි රහතන් වහන්සේලාට නියම අයිති ඵල සමාපත්ති තත්ත්වය. ඒ ඵල සමාපත්ති තත්ත්වය මේ සූත්‍රවල නොයෙකුත් තැන්වල දක්වල තියෙනවා. මහා ප්‍රහේලිකා හැටියටයි දක්වලා තියෙන්නෙ. ඒක නිසා මේ උගතුන්ට තේරුම්ගන්න බැරිව ඒ වෙනුවට මරණින් මතු නිවනක් ගැනයි මේ හැම තැනම කථා කරන්නේ විදේශික උගතුන් පවා. ඉතින් බලන්න කොයි තරම් මුළාවක්ද කියල. සම්මා දිට්ඨියක් නැහැනෙ එතන. ඉතින් ඒ ටික අපි පෙන්නල දෙන්නයි මෙච්චර වෙහෙසුණෙ. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා වගේ ලෝකයා මේ පටිච්ච සමුප්පාද ධර්මතාව තේරුම්ගන්න දක්ෂත් නැහැ. ඒ වගේම ඒ ධර්මතාව තුළ තියන වැදගත්ම දේ තමයි නිරෝධ පක්ෂය. ඒකට ඇස වහනවා. සමුදයෙන්

සමුදයට පනිනවා. ඒකයි කියන්නේ ලෝකයා ඉන්නේ සමුදය පක්ෂයෙයි කියලා. එතකොට ආර්යයන් වහන්සේලා නිරෝධය දකිනවා.නිරෝධයේ සත්‍යය, සැපය, දකිනවා.

ඔන්න ඊළඟට තව ටිකක් කියමු. අර කියාපු එසස පිළිබඳ කථාන්තරය. එතෙන්දි අපි වෙන විදියක සූත්‍රයක් ඉදිරිපත් කරනවා.[12] උණ්ණාභ කියල බ්‍රාහමණයෙක් වරක් බුදුරජාණන් වහන්සේ දකින්න ඇවිල්ල - ඒ බ්‍රාහමණයා ශ්‍රද්ධාවන්ත කෙනෙකුත් නොවෙයි. භන්තෙ කියල බුදුරජාණන් වහන්සේට ස්වාමීන් වහන්සේ කියල ආමන්ත්‍රණය කළෙත් නැහැ. 'භවත් ගෞතමය' කියලයි ආමන්ත්‍රණය කළේ. ප්‍රශ්නයක් අහනව බුදුරජාණන් වහන්සේගෙන් ''භවත් ගෞතමය ඉන්ද්‍රිය පහක් තියනවා. මේ එක එක ඉන්ද්‍රියයන්ට අයිති ගොදුරු විෂයයන් තියනවා. ඒ කියන්නේ ඇසට රූප බලන්න පුළුවන් මිසක් කනින් කරන දේවල් බැහැනෙ. ඒ වගේ කනට රූප බලන්න බැහැ අහන්න පුළුවන්. ඒකයි කියන්නේ. මේ බාහිර පංචේන්‍ද්‍රියන්ට එක එකකට අයිති වැඩ කොටසක්, ගෝචරයක්, ගොදුරු බිමක්, තියනවා. ඒවාට 'අඤ්ඤමඤ්ඤස්ස ගෝචර විසයං' ඔවුනොවුන්ගේ ගොදුරු විෂයයන් අනුභව කරන්න බැහැ. ඇහැට රූප දකිනවා ඇරෙන්න ශබ්ද අහන්න බැහැ. දිවට රස විඳිනවා මිසක් ශබ්ද අහන්න බැහැ. ඒ ඒ විදියට එක එක ඉන්ද්‍රියයන්ගේ ස්වභාවය එහෙමයි. ඊළඟට මේ බමුණා අහනව මේ කියාපු ඉන්ද්‍රිය පහට - පටිසරණ - පිළිසරණ වෙන්නෙ මොකක්ද? ඒ පහට පිළිසරණ වෙන්නෙ කිව්වේ මේ පහම ගිහිල්ලා එකතු වෙන්නේ කොතනද? ඒ වගේම තව කාරණයක් කියනවා. මේ පහෙන් එන ගොදුරු ඔක්කොම අනුභව කරන්න සමත් කවුද? සමහර විට බමුණා හිතනවා ඇති ආත්මය ගැන. නමුත් බුදුරජාණන් වහන්සේ මොකද කියන්නේ. මේ පංචේන්‍ද්‍රියයන්ගෙන් එන අරමුණු අනුභව කරන්නේ මනසයි. හිතාගන්න පුළුවන්නෙ මේ පින්වතුන්ට. ඇහැ, කන, නාසය, දිව, කය කියන පංචේන්‍ද්‍රියයන්ගෙන් එන අරමුණු ඒවා ඔක්කොම භුක්ති විඳිනවා මනස. ඊළඟට බමුණා අහනවා මනසට පිළිසරණ මොකක්ද? එහෙම ඇහුවහම බුදුරජාණන් වහන්සේ කියනවා මනසට පිළිසරණ සතියයි. සතියට පිළිසරණ මොකක්ද කියල අහනවා. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා සතියට පිළිසරණ විමුක්තියයි කියලා. විමුක්තියට පිළිසරණ මොකක්ද කියල අහනවා. බුදුරජාණන් වහන්සේ විමුක්තියට පිළිසරණ නිබ්බානයයි කියල පිළිතුරු දෙනවා.

ඔන්න බමුණා අහනවා තව දුරටත්, නිබ්බානයට පිළිසරණ මොකක්ද? බුදුරජාණන් වහන්සේ පිළිතුරු දෙනවා 'බමුණ ඔබ ඉලක්කයෙන් ඉවතට ගියා. සීමාව ඉක්මවා ගියා මේ ප්‍රශ්නයේ. නිවනින් තමයි මුළු මහත් බ්‍රහ්මචර්යාවම කෙළවර වන්නේ. නිවනින් එහා දෙයක් නැහැ' කියලා ප්‍රකාශ කළා. නමුත් මහ පුදුම දෙයක් කියල තියනවා ඒ සූත්‍රයේ. බුදුරජාණන් වහන්සේ ඒ බමුණා පිටත්ව ගියාට පස්සේ සංඝයා වහන්සේලාට ප්‍රකාශ කරනවා ඒක අහල ඒ බමුණා මාර්ග ඵල ලැබූ බව. ඉතින් මේක මහ ගැඹුරු කාරණයක්. අපට මෙහෙම යම්තමින් හිතාගන්න තියෙන්නේ බමුණන්ගේ දර්ශනය අනුව වෙනස් එකක් තියෙන්නේ. ඒක හින්දු දර්ශනය. උද්ධෘත කරල නොදැක්වුවත් මෙන්න මෙහෙම හිතාගන්න. හින්දු දර්ශනයේ කියනවා මේ පංචේන්ද්‍රිය තමයි බොහොම බලසම්පන්න. හැබැයි පංචේන්ද්‍රියන්ට ඉහළින් තියනවයි මනස. මනසට ඉහළින් තියනවයි බුද්ධිය. බුද්ධියට ඉහළින් තියනවයි ආත්මය.[13] ඔන්න හින්දු දර්ශනයේ ඉන්ද්‍රියයන් පිළිබඳ අවබෝධය භගවත්ගීතාදී ග්‍රන්ථවල තියනවා. ඉතින් හින්දු දර්ශනය කියන්නේ ඒ විදියටයි. පංචේන්ද්‍රියයන්ට ඉහළින් මනස, මනසට ඉහළින් බුද්ධිය, බුද්ධියට ඉහළින් ආත්මය. මෙහේ ආත්ම කථාවක් මොකවත් නැහැ. ඒ වෙනුවට තියෙන්නේ සතියයි.

ඔන්න ඔතනින් තේරුම්ගන්න කාරණයක් තියනවා. ඇයි මේ සතර සතිපට්ඨානය ඒකායන මාර්ගයක් හැටියට දක්වල තියෙන්නේ බුදුරජාණන් වහන්සේ? නිවන දක්වාම යන ඒකායන මාර්ගයක් හැටියට දක්වල තියෙන්නේ මේකයි. මනසට පිළිසරණ සතියයි. **මනසට පිළිසරණ සතියයි කිව්වේ මොකද?** දැන් අපි කලින් කියපුවාත් ටික ටික සිහියට නඟා ගන්න. 'මනසිකාර සම්භවා සබ්බෙ ධම්මා[14]' කියලා අපි යම් අවස්ථාවක ප්‍රකාශ කළා. හැම දෙයක්ම හටගන්නේ මනසිකාරය තුළින්. මෙනෙහි කිරීම තුළිනුයි දෙයක් හටගන්නේ. ලෝකයා හිතන්නේ අරමුණ ඇත තියනවා කියලා. අපි ගිය වර කලේ බිඳින උපමාව කිව්වෙ ඒකයි. නිවන ළඟට ගියාට පස්සෙ නිවන කියන සංකල්පයත් අතහරින්න වෙනවා. අර බිත්තිය ළඟට ගියාට පස්සෙ ආපහු හැරෙන්න වෙනවා වගේ. අන්තිමට තේරෙන්නේ මනසිකාරය තුළිනුයි මේ **'දෙයක්'** නිෂ්පාදනය වෙන්නේ. ඉතින් මේක තවත් අපේම උපමාවක් ආශ්‍රයෙන් කියතොත් අර ඇඟිලි අකුළන්න කියපු අවස්ථාව මේ පින්වතුන්ට මතකයිනෙ. නාම ධර්ම ගැන එක එක්කෙනා විග්‍රහ කරනව. අපි ගැන ප්‍රශ්න කරන නිසා අපි මේ පින්වතුන්ට අභ්‍යාසයක් දුන්නා. ඇඟිලි පහෙන් හඳුනාගන්න වේදනා සඤ්ඤා, චෙතනා, ඵස්ස, මනසිකාර. ඉතින් මනසිකාරය තමයි මහපට ඇඟිල්ල. මහපට ඇඟිල්ල

ළඟම ඉන්නෙ ඵස්සයයි. දැන් ටිකක් හිතාගන්න මේ කියන්නෙ මොකක්ද කියල. දැන් අපි කිව්වනෙ පංචේන්ද්‍රියයන්ගෙන් එන අරමුණු මනසට ඔක්කොම එකතු වෙලා එනවයි කියල. මනස ඒවා භුක්ති විඳිනවාය කියල. **පංචේන්ද්‍රියයන්ගෙන් එන අරමුණු ඔක්කොම මනස භුක්ති විඳින්නේ ඒවා 'ධම්ම' බවට පත් කරගෙන. 'දේ' බවට පත් කරගෙන.** රූප සද්ද ගන්ධ රස ඵොට්ඨබ්බ කියන ඔක්කොම දේවල් බවට පත් කරගෙනයි. එතකොට ඒවා දේවල් කරගන්නෙ මනසිකාරය තුළින්. ඒකයි අපි අර කිව්වෙ. අපි නොයෙකුත් උපමා දැක්වූවා මේ විසඳගන්න බැරි විඤ්ඤාණ මායාව පිළිබඳ නඩුව - සංසාරයේ මාරයා කරපු භීෂණ නඩුව - විසඳගන්න බුදුරජාණන් වහන්සේ ගත්තු මැදුම් පිළිවෙත මොකක්ද? අර විත්තිකාරයින් පස්දෙනාගෙන් ලොකුම වැරදිකාරයාට සමාවක් දීලා - ලොකුම වැරදිකාරයා කවුද? වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, **මනසිකාර**. අර **මනසිකාරයා** වැරැද්ද කළේ අයෝනිසෝ මනසිකාර හැටියටයි. එයා රජයේ සාක්කිකාරයා කරගත්තේ යෝනිසෝ කරගෙන, යෝනිසෝ මනසිකාරය.

එතකොට යෝනිසෝ මනසිකාරය ක්‍රියාත්මක වෙන්නේ සතිය තුළයි. මේ කියාගන යන ටික තේරුම්ගන්න බලන්න. ඒක නිසා මේ විදර්ශනාව තුළ යෝනිසෝ මනසිකාරයම තමයි ප්‍රඥාවේ බීජය. ඒ යෝනිසෝ මනසිකාරය, සතිය උපකාර කරගෙන යන ගමන තමයි සතර සතිපට්ඨානය තුළ තියෙන්නේ. සතර සතිපට්ඨානය, සතර සම්මප්පධාන, සතර ඉද්ධිපාද, පඤ්ච ඉන්ද්‍රිය, පඤ්ච බල, සත්ත බොජ්ඣඞ්ග ඔස්සේ ගිහිල්ල අන්තිමට ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයෙන් කෙළවර වෙලා තමයි නිවන් කරා යන්නේ. අන්න එබඳු ගමනක්. එතකොට ඒකයි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළේ මනසට පිළිසරණ සතියයි. **මනසට පිළිසරණ සතියයි.** එතකොට ඒ සතිය හරියාකාරව යෙදුණොත්, සම්මා සතිය හරියාකාරව යෙදුණොත්, අර විත්තිකාරයාගේ හොරේ අහු වෙනවා. අන්තිමටම අහු වෙන්නේ අර සතර දෙනා විතරක් නොවෙයි වැරදිකාරයො, මනසිකාරයා තමයි ලොකුම වැරදිකාරයා. මොකද අපි අර එක දේශනාවකදි කිව්වා **'බඩුත් එක්ක හොරු අහු වුණා වගේ'** කියලා මොකක්ද බඩුව? 'දේ'. එතකොට මනසිකාරයා හදාගත්ත දේ'. ඒක තුළින් තමයි මේ සංසාර අවුල සිද්ධ වුණේ. ලෝකයා හිතන්නේ දේවල් වෙනම තියනවා. අපි ආයිත් එන්නෙ ධම්මපද ගාථාවට 'මනො පුබ්බංගමා ධම්මා - මනො සෙට්ඨා මනොමයා'. ඒ ටික මතක් කරගන්න. ලෝකයාගේ දෘෂ්ටිය 'ධම්ම පුබ්බංගමො මනො'

ලෝකයා ධම්මපදයක් ලිව්ව නම් ලියන්නේ 'ධම්ම පුබ්බංගමො මනො'. කියලා. මනසට කලින් ධර්මය තියනවා. ඒකනෙ අපි කිව්වෙ ඉස්සරහට යන්න යන්න කියලා. අන්තිමට යම් වේලාවක තේරෙනව යෝනිසෝ මනසිකාරයෙන් ආපසු හැරෙනකොට - අර සඤ්ඤා මිරිඟුව ඔස්සේ දුවන ගමන වගේ තමයි අරමුණක් ඔස්සේ දුවන ගමන. ඒ වෙනුවට බුදුරජාණන් වහන්සේ ආපහු හැරෙන්න කිව්වා යෝනිසෝ මනසිකාරය තුළින් - ආපහු හැරිල - ඒකයි අපි කිව්වේ මහාපදාන සූත්‍රය ආදියේ[15] බෝධිසත්වයන් වහන්සේලා පටිච්ච සමුප්පාදය හෙළිකර ගත්තේ අග කෙළවරේ ඉඳලා ඇවිල්ලා ජරා මරණවලට හේතුව මොකක්ද කියලා. යෝනිසෝ මනසිකාරය කියන්නේ ප්‍රභව වෙන ස්ථානය කරා එන්නෙ මේ ඉන්න තැන ඉඳලා ආපස්සට එනවා. නිමක් නැති කෙළවරක් නැති ගමනේ අන්තිමට අහු වෙන්නේ සාක්කිකාරයා. එහෙම නැත්නම් අර ලොකුම විත්තිකාරයා කරපු වැරැද්ද තමයි 'දෙයක්' හදාගත්තු එක. එතන තමයි කිව්වෙ 'ධම්ම සඤ්ඤා ච විරජ්ජති', දැන් මතක් කරගන්න 'මනො ච නිරුජ්ඣති ධම්ම සඤ්ඤා ච විරජ්ජති මනසත් නිරුද්ධ වෙනවා. ධම්ම සඤ්ඤාවත් මැකී යනවා. ඉන්ද්‍රිය නිරුද්ධ වෙනකොට ඒකෙ තියන අරමුණත් මැකී යනවානෙ ආයිත් මතක් කරගන්න මුලින් අපි දැක්වූ ගාථාව. ඒ තත්ත්වය තමයි නිවන පිළිබඳ ප්‍රත්‍යක්ෂය. වෙන විදියකින් කියනවා නම් භව නිරෝධය පිළිබඳ ප්‍රත්‍යක්ෂය. එතකොට භව නිරෝධය කියන එක වෙන ලෝකයක තියන විමුක්තියක් නොවෙයි. මෙතනම අත්දකින ප්‍රත්‍යක්ෂයක්. ඒකම තමයි සත්‍යය - පරම සත්‍යය. ඒකම තමයි පරම සුඛය. ඒක තමයි 'නිබ්බානං පරමං සුඛං' කියන්නේ.

එතකොට මේ පින්වතුන් කල්පනා කරගන්න මේ පැයක් තුළම අපි කියාපු කාරණාවලට - සමහර විට දිග අටුවාවක් ලියන්න වෙන තරම් දේවල් කියවුණේ. මේ පින්වතුන්ගේ තරමින් තේරුම්ගන්න බලන්න. අපිට කියන්න තියෙන්නේ මේවා නිකන්ම දෘෂ්ටිගතිකයින් විද්‍යාඥයින් කරන්න වගේ කුතුහලයක් සංසිඳවාගැනීමේ ප්‍රයත්නයක් නොවෙයි. අපේ ප්‍රතිපදාවට මේකෙන් ගත යුත්ත ගන්න ඕන. ඒකයි බුදුරජාණන් වහන්සේ කිව්වේ මේ කියාපු පරතරය ගැන හිත යොදනකොට කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව අර කියාපු ලෞකික තත්ත්වයෙන් ඉබේටම ලෝකෝත්තර තත්ත්වයට පත් වෙනවා. ලෞකික තත්ත්වය අර විදියේ දෙයක් නම් බුදුරජාණන් වහන්සේ කියනව ඒක අසත්‍යයයි. සත්‍යය මෙතනයි. අන්න එතකොට සත්‍යය කරා යනවා. අසත්‍යයෙන් සත්‍යයට යනවා. ලෝකයා සැපයි කියලා ගත්තු ඒ දුක දුක්ඛ සත්‍යය බව තේරුම් අරගෙන නිවන

පරම සැප හැටියටම අරගෙන අපි නිවන දේශනාවල මුලින් දක්වූ 'එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං'. එතනම තමයි ඵස්ස නිරොධය. ඵස්ස නිරෝධය. මොකද ඇසත් රූපයත් නිසා චක්ඛු විඤ්ඤාණය ඇති වෙනවා වගේ මනසත් ධර්මයත් නිසයි මනෝවිඤ්ඤාණය ඇති වන්නේ[16]. මනසත් ධර්මයත් නිසා මනෝවිඤ්ඤාණය ඇති වුණාම දෙක බෙදාගන්නවා. මනස වෙනමයි දේ වෙනමයි කියල ඔන්න ප්‍රපඤ්චයට යනවා. යමෙක් දැක්ක නම් 'පටිච්ච සමුප්පන්න' වශයෙන් - ප්‍රත්‍යක්ෂයක් වශයෙන් - වචනයක් හැටියට නොවෙයි, තර්කයක් හැටියට නොවෙයි. මනසිකාරය සියුම් කළ අන්තිම අවසථාවෙ වැටහෙන්නෙ මොකක්ද? **මනසට එන අරමුණ මනසින්ම නිර්මාණය කර ගත්තු එකක්. ඒ වැටහෙනවාත් එක්කම විඤ්ඤාණය නිරුද්ධ වෙනවා. විඤ්ඤාණයට වැඩක් නැහැ ඊට පස්සෙ.** විඤ්ඤාණය කියන්නේ දෙකට බෙදීම නේ. කොහොමද දෙකක් වෙන්කර ගන්නේ ඒ තත්ත්වය දැක්කට පස්සේ? මනසේ මායාවෙදි අපි කිව්වෙ මායාව දැක්කට පස්සෙ ඒ විජ්ජාව නැති වෙනවානෙ[18] ආලෝකය ආවහම. ඒකයි කිව්වෙ **'මොහඳුර තුළ කොටුවැ නොදකිති නැණැස නැතියෝ'** ඒ කථාව කිව්වේ. මේ පින්වතුන් කෙටියෙන් සළකා ගන්න බලන්න. වැදගත්ම කාරණය තමයි අර බ්‍රහ්මජාල සූත්‍රයෙ කිව්වෙ. අනික් හැම දෘෂ්ටියක්ම ලෞකික දාර්ශනිකයනුත් අනිකුත් විද්‍යාඥයනුත් හැම දෙනාම යම් යම් දෘෂ්ටීන් නිෂ්පාදනය කළා. ඒ ඔක්කොම ඵස්ස පච්චයා. නමුත් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා මේ සළායතන ලබු ගෙඩියෙන් ඉවත් වුන මහා ලෝකෝත්තර ලොව්තුරු ප්‍රත්‍යක්ෂයක්. ඒක තුළයි - ඒක නිකම්ම එකක් නොවෙයි. එතනයි ජාතියත්, ජරාවත්, මරණයත් ඔක්කොම නිරුද්ධ වන්නේ. දුක් කෙළවර වෙන්නේ එතනයි. ඒකයි බුදුරජාණන් වහන්සේ කිව්වේ 'එසෙවන්තො දුක්ඛස්ස'. මෙයම දුකේ කෙළවරයි කිව්වේ. අපි අද කළ දේශනාවේ ප්‍රායෝගික පැත්ත උපකාර කරගෙන තමන් රකින ශීලය, කරන භාවනාව, සාර්ථක කරගෙන හැකි තාක් ඉක්මනින් මේ ශාසන පහන නිවෙන්න කලින් තමන් බලාපොරොත්තු වන සංසාර විමුක්තිය සෝවාන් සකදාගාමි අනාගාමි අර්හත් මාර්ග තුළින් ප්‍රත්‍යක්ෂ කරගන්න මේ පින්වතුන්ට ශක්තිය, ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. අවීචියේ සිට අකනිටා දක්වා යම් තාක් සත්ත්ව කෙනෙක් මේ ධර්ම දේශනාමය කුසලය අනුමෝදන් වීමට කැමති නම් ධර්ම දේශනාමය ධර්ම ශ්‍රවණමය කුසලය අනුමෝදන් වීම තුළින් තමන්ගේ ප්‍රාර්ථනීය බෝධියකින් අමා මහ නිවනින් සැනසෙත්වා කියන ප්‍රාර්ථනාවෙන් මේ ගාථා කියා පින් දෙන්න.

**එත්තාවතා ච අම්හෙහි ...**

## පාදක සටහන්

1. ධ්‍රයතානුපස්සනා සුත්ත, ගාථා 762-764 සුත්ත නිපාත, 238 පිට (බු.ජ.ත්‍රි. 25)
2. මනසේ මායාව, 82-83 පිටු (ධ.ග්‍ර.මු.භා. 2010)
3. සංයුත්ත නිකාය, 4-206 පිට (බු.ජ.ත්‍රි. 16)
4. සාරත්ථප්පකාසිනී, III 25 පිට (හේ.මු. 31)
5. උදාන පාළි, ඛු.නි., 1-290 පිට (බු.ජ.ත්‍රි. 24)
6. ලොකනතගමන සුත්ත, සංයුත්ත නිකාය, 4-198 පිට (බු.ජ.ත්‍රි. 16)
7. රොහිතස්ස සුත්ත, සංයුත්ත නිකාය, I 18-120 පිටු. (බු.ජ.ත්‍රි. 13) අංගුත්තර නිකාය, 2-92-96 පිටු (බු.ජ.ත්‍රි. 19)
8. අංගුත්තර නිකාය, 6-602 පිට (බු.ජ.ත්‍රි. 23)
9. මජ්ඣිම නිකාය, 1-408 පිටු (බු.ජ.ත්‍රි. 10)
10. ගොතම සුත්ත, සංයුත්ත නිකාය, 2-16-18 පිටු (බු.ජ.ත්‍රි. 14)
11. සනතතර සුත්ත, ඉතිවුත්තන පාළි, 402 පිට ඛුද්දක නිකාය - (බු.ජ.ත්‍රි. 24)
12. උණ්ණාභ බ්‍රාහමණ සුත්ත, සංයුත්ත නිකාය, 5-1, 384-386 පිටු (බු.ජ.ත්‍රි. 17)
13. ඉන්ද්‍රියානි පරාණ්‍යාහුරින්ද්‍රියෙභ්‍යඃ පරං මනඃ - මනසස්තු පරා බුද්ධිර්යො බුද්ධෙඃ පරතස්තු සඃ - භගවද්ගීතා III අධ්‍යාය, 42 'ඉඳුරන් ශ්‍රේෂ්ඨයයි කියත්, ඉඳුරන්ටත් වඩා මනස ශ්‍රේෂ්ඨය. මනසට වඩා බුද්ධිය ශ්‍රේෂ්ඨය. යමක් බුද්ධියටත් වඩා ශ්‍රේෂ්ඨද, ඒ ආත්මයයි.'
14. මූලක සුත්ත, අංගුත්තර නිකාය - 6-192 පිට (බු.ජ.ත්‍රි. 23)
15. දීඝ නිකාය, 2-46 පිට (බු.ජ.ත්‍රි. 8)
16. මධුපිණ්ඩික සුත්ත, මජ්ඣිම නිකාය - 280 පිට (බු.ජ.ත්‍රි. 10)

# 09 වන දේශනය

# 09 වන දේශනය

**(පහන් කණුව ධර්ම දේශනා අංක 191)**

**'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'**

යො උභන්තෙ විදිත්වාන
මජ්ඣෙ මන්තා න ලිප්පති
තං බ්‍රෑමි මහා පුරිසොති
සොධ සිබ්බනිමච්චගා[1]

-මජ්ඣෙ සුත්ත, අංගුත්තර නිකාය

සැදැහැවත් පින්වතුනි,

තිලෝගුරු භාග්‍යවත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ අද වගේ වෙසක් පුර පසළොස්වක පොහොය දවසකයි සංසාර විමුක්තිය ප්‍රත්‍යක්ෂ කර ගත්තේ. ඒ සම්මා සම්බෝධිය තුළින් ලබාගත්තු ඒ අවබෝධය ආශ්‍රයෙන් බුදුරජාණන් වහන්සේ සසර පැවැත්මේ රහසත් හෙළි කර ගත්තා. අවිජ්ජා නීවරණයෙන් වැහිලා තණ්හා සංයෝජනයෙන් බැඳිලා අනන්ත කාලයක් ලෝක සත්ත්වයා සසර සැරිසරන බව වටහාගත්තා. අවිද්‍යාව දුරු කරගෙන තණ්හා බැම්මෙන් මිදීමට උපකාර වෙන ගම්භීරාර්ථවත් ගාථාවකුයි අද අපි මේ නව වෙනි පටිච්චසමුප්පාද දේශනාවට මාතෘකාව හැටියට තෝරාගත්තේ. සුත්ත නිපාතයේ පාරායණ වග්ගයේ දක්වෙන හැටියට තිස්ස මෙත්තෙය්‍ය බ්‍රාහමණ මානවකයාට බුදුරජාණන් වහන්සේ වදාළ මේ ගාථාව කොයි තරම් අර්ථවත්ද කියතොත් බුදුරජාණන් වහන්සේ බරණැස ඉසිපතන මිගදායේ වැඩ වසන අවසථාවක එහි සංඝයා වහන්සේලා පිරිසක් මේ ගාථාව ධර්ම සාකච්ඡාවකට මාතෘකාව කරගත් බව අංගුත්තර නිකායේ ඡක්ක නිපාතයේ මජ්ඣෙ සූත්‍රයෙන් පෙනී යනවා. පිණ්ඩපාතයෙන් පස්සේ මණ්ඩල මාලයේ රැස්වූ ඒ තෙරුන් වහන්සේලා පිරිස ඒ සාකච්ඡාවට අතුරු කථාවක් වශයෙන් මෙන්න මේ ගාථාව මතු කරගත්තා. සාකච්ඡාවට මාතෘකාව හැටියට උන්වහන්සේලා මෙහෙම ප්‍රකාශ කළා.

භාග්‍යවතුන් වහන්සේ පාරායණයේ මෙත්තෙය්‍ය ප්‍රශ්නයේදී මෙන්න මෙහෙම ගාථාවක් වදාරලා තියනවා.

**යො උභන්තෙ විදිත්වාන**
**මජ්ඣෙ මන්තා න ලිප්පති**
**තං බ්‍රෑමි මහා පුරිසොති**
**සොධ සිබ්බනිමච්චගා**

ඒ ගාථාවේ සාමාන්‍ය අර්ථය 'යමෙක් අන්ත දෙක තේරුම් අරගෙන ප්‍රඥාවෙන් මැද නොඇලේද ඔහුට මම මහා පුරුෂයා යයි කියමි. ඔහු මෙහි මැහුම්කාරිය ඉක්මවා ගියේ වෙයි' කියලා. මේ ගාථාව ඉදිරිපත් කරගෙන ඒක තුළින් ප්‍රශ්න හතරක් මතු කරගත්තා ඒ ස්වාමීන් වහන්සේලා. මේ ගාථාවේ කියවෙන එක අන්තය කුමක්ද? දෙවන අන්තය කුමක්ද? මැද කුමක්ද? මැහුම්කාරිය කවුද? මේ කාලයේ වචනයෙන් කියනවා නම් සම්මන්ත්‍රණයකට මාතෘකාව වගෙයි මේ ප්‍රශ්න හතර. මේ ප්‍රශ්න හතර ඉදිරිපත් කරගත්තහම එක තෙරුන් වහන්සේ නමක් මේ ගාථාවට විවරණය මේ විදියට ඉදිරිපත් කරනවා. උන්වහන්සේ ප්‍රකාශ කරනවා මේ ගාථාවේ කියවෙන එක අන්තයක් ඵස්සයයි. දෙවන අන්තය ඵස්ස සමුදයයි - ඵස්සය හටගැනීම කියන එකයි. මැද ඵස්ස නිරෝධයයි. මැහුම්කාරිය තණ්හාවයි. මක්නිසාද යත් ඒ ඒ භවයට මැස්ම දමන්නේ තණ්හාවයි. ඊළඟට එහෙම ප්‍රකාශ කරල උන්වහන්සේ තව දුරටත් සංඝයා වහන්සේලා අමතලා කියනවා, මෙතෙකින්මත් භික්ෂුවක් අභිඤ්ඤාවෙන් දත යුත්ත අභිඤ්ඤාවෙන් දැන ගනී. පරිඤ්ඤාවෙන් දත යුත්ත පරිඤ්ඤාවෙන් දැනගනී. අභිඤ්ඤාවෙන් දත යුත්ත අභිඤ්ඤාවෙන් දැනගන්නේ පරිඤ්ඤාවෙන් දත යුත්ත පරිඤ්ඤාවෙන් දැනගන්නේ. දිටු දැමියෙහිම දුක් කෙළවර කරගන්නෙක් වෙයි.

ඒ කියන්නේ මේ ගාථාව අර්හත්වය දක්වාම කර්මස්ථානයක් කියන එකයි - මෙයින් පෙන්නුම් කරන්නේ. පින්වතුනි, මේ අභිඤ්ඤා කියන්නේ විශිෂ්ට ඥානය. පරිඤ්ඤා කියන්නේ පරිපූර්ණ ඥානය. මේ ගාථාව හරියටම අර්හත්වය දක්වාම යන කමටහනක් කියන එකයි මේ තෙරුන් වහන්සේ සඳහන් කරන්නේ.

ඊළඟට දෙවෙනි තෙරුන් වහන්සේ නමක් තමන්ගේ මතය ඉදිරිපත් කරනවා මේ ගාථාව පිළිබඳව. උන්වහන්සේ දෙන විවරණය අනුව එක අන්තයක් අතීතය. දෙවෙනි අන්තය අනාගතය. මැද වර්තමානය. මැහුම්කාරිය තණ්හාව. ඒ තෙරුන් වහන්සේ ප්‍රකාශ කරනවා, මක්නිසාද යත්, ඒ ඒ භවයට ඉපදීම සඳහා මැස්මක් දමන්නේ මේ තණ්හාවය කියලා. අර ස්වාමීන් වහන්සේ කිව්ව වගේම මෙතෙකින්මත් භික්ෂුවක් අභිඥාවෙන් දත යුත්ත අභිඥාවෙන් දැනගනී. පරිඥාවෙන් දත යුත්ත පරිඥාවෙන් දැනගනී. අභිඥාවෙන් දත යුත්ත අභිඥාවෙන් දැනගන්නේ, පරිඥාවෙන් දත යුත්ත පරිඥාවෙන් දැනගන්නේ, දිටු දැමියෙහිම දුක් කෙළවර කරගන්නෙක් වෙයි. ඔන්න දෙවෙනි ස්වාමීන් වහන්සේ දුන්න විවරණය

තුන්වෙනි ස්වාමීන් වහන්සේ නමක් මේ ගාථාව පිළිබඳව වෙන විවරණයක් ඉදිරිපත් කරනවා. උන්වහන්සේ දක්වන හැටියට මේ ගාථාවේ කියන එක අන්තයක් 'සුඛා වෙදනා' - සැප වේදනාවයි. දෙවෙනි අන්තය 'දුක්ඛා වෙදනා' - දුක් වේදනාවයි, මැද අදුක්ඛමසුඛ නම් වූ නොදුක් නොසුව වේදනාවයි, මධ්‍යස්ථ වේදනාවයි. මැහුම්කාරිය තණ්හාවයි. මක් නිසාද තණ්හාව තමයි ඒ ඒ භවයට ඉපදීම සඳහා මැස්ම දමන්නේ. එහෙම කියල උන්වහන්සේත් ප්‍රකාශ කරනවා මෙතෙකින්මත් භික්ෂුවක් අභිඥාවෙන් දත යුත්ත අභිඥාවෙන් දැන ගනී. පරිඥාවෙන් දත යුත්ත පරිඥාවෙන් දැනගනී. අභිඥාවෙන් දත යුත්ත අභිඥාවෙන් දැනගන්නේ, පරිඥාවෙන් දත යුත්ත පරිඥාවෙන් දැනගන්නේ, දිටු දැමියෙහිම දුක් කෙළවර කරගන්නෙක් වෙයි. ඒ තුන්වෙනි විවරණය.

හතරවෙනි තෙරුන් වහන්සේත් තමන්ගේ මතය ඉදිරිපත් කරනවා. උන්වහන්සේගේ මතයට අනුව එක අන්තයක් 'නාමය'. දෙවෙනි අන්තය 'රූපය'. මැද 'විඥානය'. මැහුම්කාරිය තණ්හාව. මක් නිසාද යත්, ඒ ඒ භවයක ඉපදීම සඳහා මැස්ම දමන්නේ තණ්හාවයි. මෙතෙකින්වත් භික්ෂුවක් අභිඥාවෙන් දත යුත්ත අභිඥාවෙන් දැනගනී. පරිඥාවෙන් දත යුත්ත පරිඥාවෙන් දැන ගනී. අභිඥාවෙන් දත යුත්ත අභිඥාවෙන් දැනගන්නේ පරිඥාවෙන් දත යුත්ත පරිඥාවෙන් දැනගන්නේ දිටු දැමියෙහිම දුක් කෙළවර කරගන්නෙක් වෙයි. ඔය හතරවෙනි විවරණය.

පස්වෙනි සවාමීන් වහන්සේ නමක් ඔන්න තමන් වහන්සේගේ මතය ඉදිරිපත් කරනවා. උන්වහන්සේගේ අදහස අනුව මේ ගාථාවේ කියවෙන එක අන්තයක් ආධ්‍යාත්මික ආයතන හය. ආධ්‍යාත්මික ආයතන හය කියන්නේ. පින්වතුනි, ඇස, කන, නාසය, දිව, කය, මන. දෙවෙනි අන්තය බාහිර ආයතන හය - රූප සද්ද ගන්ධ රස ඵොට්ඨබ්බ ධම්ම. මැද විඤ්ඤාණය. මැහුම්කාරිය තණ්හාව. මක් නිසාද යත් ඒ ඒ භවයක ඉපදීම සඳහා මැස්ම දමන්නේ තණ්හාවයි. මෙතෙකින්මත් භික්ෂුවක් අභිඤ්ඤාවෙන් දත යුත්ත අභිඤ්ඤාවෙන් දැනගනී. පරිඤ්ඤාවෙන් දත යුත්ත පරිඤ්ඤාවෙන් දැනගනී. අභිඤ්ඤාවෙන් දත යුත්ත අභිඤ්ඤාවෙන් දැනගන්නේ පරිඤ්ඤාවෙන් දත යුත්ත පරිඤ්ඤාවෙන් දැනගන්නේ, දිටු දැමියෙහිම දුක් කෙළවර කරගන්නෙක් වෙයි. ඒ පස්වෙනි සවාමීන් වහන්සේ දුන්න විවරණයයි.

හයවෙනි තෙරුන් වහන්සේ නමක් මේ ගාථාවට තවත් විවරණයක් ඉදිරිපත් කරනවා. උන්වහන්සේගේ මතයට අනුව මේ ගාථාවේ කියවෙන එක අන්තයක් 'සක්කායො'. සක්කායො කියල කියන්නේ පින්වතුනි පඤ්ච උපාදානසකන්ධයටම නමක් - සක්කාය දිට්ඨිය කියල කියන්නේ. සක්කාය තමයි එක අන්තයක් සක්කාය සමුදය - පඤ්ච පාදානස්කන්ධය හටගැනීම දෙවෙනි අන්තයයි උන්වහන්සේගේ විවරණය අනුව මැද සක්කාය නිරෝධයයි. මැහුම්කාරිය තණ්හාවයි. මක්නිසාද යත් ඒ ඒ භවයක ඉපදීම සඳහා මැස්ම දමන්ගේ තණ්හාවයි. මෙතෙකින්මත් භික්ෂුවක් අභිඤ්ඤාවෙන් දත යුත්ත අභිඤ්ඤාවෙන් දැන ගනී. පරිඤ්ඤාවෙන් දත යුත්ත පරිඤ්ඤාවෙන් දැන ගනී. අභිඤ්ඤාවෙන් දත යුත්ත අභිඤ්ඤාවෙන් දැනගන්නේ, පරිඤ්ඤාවෙන් දත යුත්ත පරිඤ්ඤාවෙන් දැනගන්නේ, දිටු දැමියෙහිම දුක් කෙළවර කරගන්නෙක් වෙයි. ඒ හයවෙනි සවාමීන් වහන්සේ දුන් විවරණයයි.

ඉතින් ඔය විදියට විවරණ හයක් මේ ගාථාවට ඉදිරිපත් වුණහම එක්තරා තෙරුන් වහන්සේ නමක් මෙන්න මෙහෙම අදහසක් ඉදිරිපත් කළා. ඇවැත්නි දැන් අපි අපට වැටහෙන හැටියට මේ ගාථාව දැන් තෝරලයි තියෙන්නෙ. අපි මේ විවරණය - මේ සම්මන්ත්‍රණයේ වාර්තාව - අරගෙන යමු බුදුරජාණන් වහන්සේ ළඟට, ගිහිල්ල උන්වහන්සේට ඉදිරිපත් කරලා උන්වහන්සේ යම් විදියකින් මේක විවරණය කරනවා නම් ඒ ආකාරයෙන්ම දරාගනිමු කියල. ඒ තෙරුන් වහන්සේලා පිරිස

බුදුරජාණන් වහන්සේ හමු වෙන්න ගිහිල්ලා බුදුරජාණන් වහන්සේට ප්‍රකාශ කළා මේ සාකච්ඡාවේ විස්තරය. ප්‍රකාශ කරල ඉවර වෙලා උන්වහන්සේලා භාග්‍යවතුන් වහන්සේගෙන් අහනවා 'කස්ස නු ඛො භන්තෙ සුභාසිතං' ස්වාමීනි කාගේ භාසිතයද සුභාසිතය? කවුරු කියාපු එකද හරි? කියලා ඇහුවා. බුදුරජාණන් වහන්සේ පිළිතුරු දෙනවා 'සබ්බසං වො භික්ඛවෙ සුභාසිතං පරියායෙන' මහණෙනි නුඹලාගේ විවරණ හයම ඒ ඒ ආකාරයෙන් බලනකොට හරි - සුභාසිතයි. ඔක්කොම 'සුභාසිතයි'. ඔක්කොම හරි. නමුත් යම් අර්ථයක් සඳහා ද මම ඒ ගාථාව තිස්ස මෙත්තෙය්‍ය බ්‍රාහමණයාට වදාළේ, අන්න ඒ අර්ථය මම කියනවා. ඇහුම්කන් දෙන්න කියලා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා මම අදහස් කළේ මේ විදියටයි. ඒ ගාථාවේ අර්ථය එක අන්තයක් ස්පර්ශයි, දෙවන අන්තය ස්පර්ශය හටගැනීමයි ඵස්ස සමුදයයි. මැද ඵස්ස නිරෝධයයි, මැහුම්කාරිය තණ්හාවයි මක්නිසාද යත් ඒ ඒ භවයට ඉපදීම සඳහා මැස්ම දමන්නේ තණ්හාවයි. මෙතෙකින්මත් භික්ෂුවක් අභිඥාවෙන් දත යුත්ත අභිඥාවෙන් දැනගනී. පරිඥාවෙන් දත යුත්ත පරිඥාවෙන් දැනගනී. අභිඥාවෙන් දත යුත්ත අභිඥාවෙන් දැනගන්නේ, පරිඥාවෙන් දත යුත්ත පරිඥාවෙන් දැනගන්නේ, දිටු දැමියෙහිම දුක් කෙළවර කරගන්නෙක් වෙයි. මෙයින් අපට පේනවා බුදුරජාණන් වහන්සේ දුන්න විවරණය තෙරුන් වහන්සේලා හය නමගෙන් පළමුවෙන්ම අදහස ඉදිරිපත් කළ භික්ෂූන් වහන්සේ දුන්න විවරණය හා සැසඳෙන බව - ස්පර්ශය පිළිබඳ කථාව. නමුත් අනිත් ස්වාමීන් වහන්සේලා පස්නමගේ විවරණත් හරි. එයින් අපට පේනවා මේ ගාථාව කොයි තරම් ගැඹුරු අර්ථයක් සහිතද කියලා. අපට හිතාගන්න පුළුවන් උන්වහන්සේලා තම තමන්ගේ කමටහන් ඉදිරිපත් කළා වෙන්න ඇති කියලා. ඒ විවරණ හයම හරි. ඒ අතින් මේ ගාථාවේ වටිනාකමත් අපට පේනවා. ඒ එක්කම මේ විවරණ හයටම පොදු ලක්ෂණය තමයි මැහුම්කාරිය තණ්හාව හැටියට හඳුන්වා දීම.

අපි දැන් මැහුම්කාරිය ගැන හිත යොදල බලමු. ඇයි තණ්හාවට - 'සිබ්බනී' - මැහුම්කාරිය කියල කිව්වෙ? මේ තණ්හාවට නොයෙකුත් වචන යෙදිල තියනවා මේ ධර්මයේ. 'ලේප' කියල කියනවා ලාටුව, 'විසත්තිකා' කියල කියනවා, අලවන්නී කියනවා. ඒ වාගේම

නිරන්තරයෙන්ම ධම්මචක්කප්පවත්තන ආදී සූත්‍රවලත්[2] මේ පින්වතුන් අහල ඇති 'යායං තණ්හා පොනොබ්භවිකා නන්දිරාග සහගතා තත්‍රතත්‍රාභිනන්දිනී. මේ මැහුම්කාරියට උපාධි මාලාවක් තියනවා. 'පොනොබ්භවිකා' කියන්නේ පුනර්භවය ඇති කරවන්නී කියන එක. පින්වතුනි, මේ තණ්හා කියන එක ස්ත්‍රී ලිංගික පදයක්. ඒකයි ඒකට ගැලපෙන විදියට මැහුම්කාරිය කියල කිව්වෙත්.

මේ මැහුම්කාරියගේ ගුණාංග මොනවාද? 'පොනොබ්භවිකා' කියන එක පුනර්භවයක් - නැවත භවයක් - ඇතිකර වන්නී. 'නන්දිරාග සහගතා' 'නන්දි' කියන්නේ තුටු වීම් 'රාග' කියන්නේ ඇලීම්. එතකොට තුටු වීම් ඇලීම් සහිත වූවා. 'තත්‍රතත්‍රාභිනන්දිනී' ඒ ඒ තැන සතුටු වන්නී. එතකොට මේ තණ්හාවගේ ගුණාංග තුන මොනවාද, පුනර්භවයක් ඇති කරවනවා, නන්දිරාග සහගතා තුටු වීම් ඇලීම් සහිතයි. ඒ වගේම ඒ ඒ තැන සතුටු වීම් සවභාවය තියනවා. එතකොට හිතල බලන්න දැන් ඔය මැහුමක් මහන කොට ඒ ක්‍රියා දාමයට ගැලපෙනවා මේ වචන ටික. රෙදි දෙපොටක් තුළින් ඉදිකටුව යවනවනෙ. යවමින්නෙ මහන්නේ. මේ පින්වතුන් දන්නවනේ. එතකොට ඒකත් හරියට 'තත්‍රතත්‍රාභිනන්දිනී' ඒ ඒ තැන සතුටු වීම. ඒ වගේම ඒ මැස්ම තුළින් ඒ දෙපට එකතු වෙනවා. ඇලෙනවා.

තණ්හාවගේ ක්‍රියා දාමයත් ඒවගේමයි. ඒ තණ්හාවගේ කාරිය, මැහුම්කාරියගේ කාරිය, දැන් ඉෂ්ට කරන්නේ **මහන මැසීමයි**. මහන මැසීමක ක්‍රියාවලිය තමයි ඉදිකටුව යට යනකොට, යටි නූල ඉස්සරහට පැනල ගැටයක් දානවා. එහෙමනේ මැහෙන්නෙ. කොහොම නමුත් මේ තණ්හාවට දීපු උප පදය - මැහුම්කාරිය කියන එක - ඉතාමත්ම අර්ථවත්. භවය ගැට ගහන්නී. දෙකොනක් අරගෙන මැද අමතක කරලා රෙදි දෙපොටක් එකතු කරන්න වගේ දෙකොන ගැටගහන සවභාවයක් තණ්හාවේ තියනවා.

දැන් අපි මේක හෙළි කරගන්න බලමු - මේ ධර්මතාව - දීපු විවරණ හය ආශ්‍රයෙන්. පළමුවෙන්ම බුදුරජාණන් වහන්සේත් අනුමත කළ පළමුවෙනි සවාමීන් වහන්සේ ඉදිරිපත් කළ විවරණය වන එක අන්තයක් ඵස්සයයි. අනෙක් අන්තය ඵස්ස සමුදයයි. මැද ඵස්ස නිරෝධයයි. මැහුම්කාරිය තණ්හාවයි. ඒ විවරණය ඉස්සරහට ගනිමු.

එතකොට එතන කියවෙන මේ ස්පර්ශය එක අන්තයක් කියන එක අපි තේරුම් ගන්න බලමු. දැන් ලෝකයාගේ මතය අනුව ස්පර්ශය කියන කොටම එක පාරටම හිතෙනවා ස්පර්ශ කරන තැනැත්තෙක් ඉන්නවා කියලා. දැන් මගේ ඇගේ ගැටුණයි කියල කියන්නෙ, මම ගිහිල්ල හැපුනයි කියල කියන්නේ, අන්න ඒ වගේ ඒ මතය ඉදිරිපත් කරන අවසථාවක් අපට අහුවෙනවා නිදාන සංයුත්තයේ මොලිය එගගුණ කියන සවාමීන් වහන්සේ බුදුරජාණන් වහන්සේගෙන් අහනවා ප්‍රශ්නයක් 'කො නුඛො හනෙත ඵුසති'[3] සවාමීනි කවුද ස්පර්ශ කරන්නේ? එතකොට බුදුරජාණන් වහන්සේ කියනවා 'න කලෙලා පඤ්හා'.

'ඒ ප්‍රශ්නය ගැළපෙන්නෙ නැහැ. මම කියන්නෙ නැහැ කෙනෙක් ස්පර්ශ කරනව කියල'. බුදුරජාණන් වහන්සේ ඒ වෙනුවට ඉදිරිපත් කරනවා පටිචච සමුපපාද ක්‍රමයෙන් ඒක තේරුම්ගත යුතු බව. උන්වහන්සේ අර භික්ෂුවට කියනවා මම කියන්නෙ නැහැ කෙනෙක් ස්පර්ශ කරනවා කියලා. 'සළායතන පචචයා ඵසෙසා, ඵසස පචචයා වෙදනා'. අන්න පටිචච සමුපපාදය ඉදිරිපත් කළා. එතකොට ප්‍රත්‍ය වශයෙන් සිදු වන දෙයක් ලෝකයා සකකාය දිටඨිය නිසා කෙනෙක් හැටියට හිතනවා. එතකොට 'යො උභනෙත විදිත්වාන' කියන්නේ කොන් දෙක හරියට තේරුම් අරගන්න ඕන. කොන් දෙක හරියට තේරුම් අරගැනීම තුළින් ප්‍රඥාවෙන් මැද ඇලෙන්නෙ නැහැ. ඒ ස්පර්ශය හරියාකාරව තේරුම්ගන්නවා නම්, බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළ ආකාරයට 'සළායතන පචචයා ඵසෙසා' - ස්පර්ශය එන්නෙ සළායතන ආශ්‍රයෙන්.

ඊළඟට ඵසස සමුදය කියන එක ඊටත් වඩා ගැඹුරට යනවා. ස්පර්ශය හටගැනීම කියන ප්‍රශ්නය ඉතාමත් සංකීර්ණ දෙයක්. කෙනෙකුට එක පාරටම තේරුම්ගන්න බැරි විදියේ දෙයක් ස්පර්ශය හටගන්නේ කොහොමද කියල. අපට ඒකට හොඳ සාධකයක් ලැබෙනවා මැදුම් සඟියේ මධුපිණ්ඩික සූත්‍රයෙන්[4]. මීට කලින් අවස්ථාවල අපි මේකට අදාළව නොයෙකුත් විදියට මේ පින්වතුන්ට විග්‍රහ කරන්නත් ඇති ඒක - මහා කචචාන සවාමීන් වහන්සේ ඉදිරිපත් කරන විවරණය ආයතන ආශ්‍රයෙන් ඉන්ද්‍රිය ක්‍රියාකාරිත්වය පිළිබඳව. මෙන්න මෙහෙම ප්‍රකාශ කරනවා. 'චකඛුඤචාවුසො පටිචච රූපෙච උපපජජති චකඛුවිඤඤාණං තිණණං සඞගති ඵසෙසා, ඵසස පචචයා වෙදනා', ඔන්න

ඔහොම තියනවා පාඨයක්. එයින් 'චක්ඛුඤ්ච පටිච්ච රූපෙච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං'. ඇසත් රූපයනුත් නිසා චක්ඛු විඤ්ඤාණය උපදී. එතන ඒ වචන ටිකත් මතක තියාගන්න 'චක්ඛුඤ්ච පටිච්ච රූපෙච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං' එතන තියනවා **පටිච්ච** කියන වචනය ඊළඟට තියනවා **උප්පජ්ජති** ඒකෙන් මතක් කරල දෙනවා පටිච්ච සමුප්පාද කියන වචනය. ඒකෙන් අපිට පේන්නෙ චක්ඛු විඤ්ඤාණය ඉපදීමම පටිච්ච සමුපපාදය තේරුම්ගන්න උපකාර වන දෙයක්. විඤ්ඤාණයත් පටිච්ච සමුප්පන්නයි. ලෝකයා හිතන්නේ විඤ්ඤාණය ආත්මයයි කියල. නමුත් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා ඇසත් රූපයනුත් නිසයි චක්ඛු විඤ්ඤාණය හටගන්නේ කියලා. එයින් පෙන්නුම් කරනවා චක්ඛු විඤ්ඤාණය පවා පටිච්ච සමුප්පන්නයි. ඒක තවත් ඈතට තේරුම් ගන්න උපකාර වන විවරණයක් සාරිපුතත මහ රහතන් වහන්සේ මහාහත්ථිපදොපම සූත්‍රයෙ[5] දක්වනවා. දැන් අපි හිතන්නේ ඇස ඉදිරියට රූපයක් ආවොත් පෙනෙනවාය කියලා. නමුත් එහෙමම නොවෙයි. ඊට වඩා සියුම් කාරණයක් සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරනවා. අවස්ථා වශයෙන් දක්වන්නේ උන්වහන්සේ. ඔන්න ඉස්සෙල්ලම යමක් පේන්න නම් ඇස නොබිඳී තියෙන්න ඕන. ඇස නොබිඳී තිබුණත් ඇසට පෙනෙන මානයට රූපයන් ආවත් ඒත් එපමණකිනුත් චක්ඛු විඤ්ඤාණය පහළ වෙන්නෙ නැහැ.

ඊළඟට අමුතු වචනයක් යොදනවා **'තජ්ජො සමන්නාහාරො'** කියල. අමුතුම වචනයක් යොදනවා. 'එයින්ම නිපන් - එයින්ම හටගත්තා වූ යොමු වීමක්, ඒ තුළින්ම හටගත්තා වූ යොමු වීමකුත් ආවට පස්සෙයි චක්ඛු විඤ්ඤාණය ඇති වෙන්නෙ. කෙටියෙන් තේරුම්ගන්න පින්වතුනි. ඇස තිබුණු පලියට පෙනෙන්නෙත් නැහැ. ඇස ඉදිරියට රූප ආව පමණිනුත් පෙනෙන්නෙ නැහැ. ඒ රූප ආවත් ඊළඟට තුන්වෙනි කාරණයක් එතන අත්‍යවශ්‍ය හැටියට දක්වනවා. ඒකට අමුතු වචනයක් යොදා තියෙන්නෙ 'තජ්ජො සමන්නාහාරො'. අමුතුම වචනයක් ඒක.

**'තජ්ජො'** කියන්නෙ එයින්ම හටගත් කියන එකයි. එයින්ම නිපන්. **'සමන්නාහාරො'** කියන්නේ යොමු වීම. එතකොට යොමු වීම කවුරුවත් කළා නොවේ. ඒ අවස්ථාව තුළ හේතු ප්‍රත්‍යයන්ගෙන් සිදු වුණ දෙයක් කියන එකයි සාරිපුත්ත ස්වාමීන් වහන්සේ පෙන්නුම් කරන්නේ, ඒ විදියට බලනකොට චක්ඛු විඤ්ඤාණය පවා හේතු

ප්‍රත්‍යයන්ගෙන් ඇතිවුන දෙයක්. මේක සාමාන්‍ය ලෝකයාට එක පාරටම තේරෙන්නෙ නැහැ. ඒ වෙනුවට ආත්ම කථාවක් ගන්නවා. ඒක යම් අවස්ථාවක තේරුම් ගත්ත නම් - මේ පටිච්ච සමුප්පාදය අනුව චක්ඛු විඤ්ඤාණය පවා හේතු ප්‍රත්‍යයන්ගෙන් ඇති වෙනවාය කියන එක - ඒක තේරුම්ගත්ත නම් එතකොට අතන කියවෙනව නේ චක්ඛුඤ්ච පටිච්ච රූපෙච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං, තිණ්ණං සඞගති ඵස්සො. තුනක එකතු වීම් ස්පර්ශයයි කියල කියනවා. තුන මොකක්ද? ඇසත්, රූපයත්, චක්ඛු විඤ්ඤාණයත්. **ඇසත් රූපයත් චක්ඛු විඤ්ඤාණයත් තුනක් හැටියට ගන්න සුදුසු නැහැ. මොකද අර කියාපු තුන්වෙනි එක අර දෙකේ ප්‍රතිඵලයයි.** ඒක ලෝකයාට වැටහෙන්නෙ නැහැ අවිද්‍යාව නිසා. තේරුම්ගන්න බලන්න ඇසත් රූපයත් නිසා චක්ඛු විඤ්ඤාණය ඇති වෙනවා. නමුත් ඒ තුනම එකතු කරලයි ස්පර්ශය කියන අවස්ථාව හදාගන්නේ. එතකොට **ස්පර්ශය කියන අවස්ථාව සංඛත දෙයක්. හදාගත්තු දෙයක්.** ඇසත් රූපයත් නිසා හටගත්තු විඤ්ඤාණය ඒ '**නිසා හටගත්තු බව**' අමතක කිරීමෙන් තුනක් හැටියට ගන්නවා. එතකොට යම් අවස්ථාවක ඒ විඤ්ඤාණය අවබෝධ කරගත්ත නම් - විඤ්ඤාණයේ පටිච්ච සමුප්පන්න භාවය - **එතනම ස්පර්ශය නිරුද්ධ වෙනවා.**

ඔන්න **ඵස්ස නිරෝධය**. ඒකට ඉඩ නොදෙන්නේ මොකක්ද? තණ්හාවයි. **තණ්හාව අර මැද තියන අංගය ලෝකයාට වටහාගන්න ඉඩ නොදී ස්පර්ශයත් ස්පර්ශ සමුදයත් ගැට ගහනවා.** උග්‍ර විදර්ශනාවේදියි ඒක වැටහෙන්නේ. ස්පර්ශයක් පාසා ඒකේ අනිත්‍යතාව දැකීමෙනුයි යම් කෙනෙකුට මේකෙන් මිදෙන්න පුළුවන් වෙන්නෙ. ඔන්න එතකොට අපි මේකට වඩාත් විස්තර කිව්වා. බුදුරජාණන් වහන්සේම දීපු විවරණය නිසා ඒක ගැන අපි වැඩියෙනුත් කිව්ව. ඔන්න එතකොට ඒ පළමුවෙනි විවරණය. ඊළඟට අපි බලමු කාල වේලාවත් අනුව කල්පනා කරල බලනකොට දෙවන විවරණය. ඒ සංඝයා වහන්සේ දුන්න විවරණය අනුව එක අන්තයක් අතීතය, අනෙක් අන්තය අනාගතය, මැද වර්තමානය. එතනදිත් තණ්හාව තමයි ගැට ලන්නේ. ඒකට හොඳ නිදර්ශන මේ පින්වතුන්ට අපි කලින් අවස්ථාවකත් පෙන්නුවා. භද්දෙකරත්ත සූත්‍රයේ ප්‍රකාශ කෙරෙන -

**අතීතං නානවාගමෙය්‍ය - නප්පටිකඞ්ඛෙ අනාගතං**
**යදතීතං පහීනං තං - අප්පත්තඤ්ච අනාගතං**[6]

ඒ කියන්නේ අතීතයට යන්න එපා. ඒ වගේම අනාගතය පතන්නත් එපා. 'යදතීතං පහීනං තං' අතීතය ප්‍රහීනයි. අනාගතය තාම ආවෙ නැහැ.

ඊළඟට -

පච්චුප්පන්නඤ්ච යො ධම්මං-තත්ථ තත්ථ විපස්සති. වර්තමානයත් ඒ ඒ තැන විදර්ශනාව යෙදුවොත් එතනත් අල්ලගන්න තැනක් නැහැ. උග්‍ර විදර්ශනාවේදී වර්තමානයත් ඒ ඒ තැන විදර්ශනා කරනකොට එතනත් අල්ලගන්න දෙයක් නැහැ. **නමුත් අර තණ්හාව වර්තමානය නොතකා හැර අතීතයත් අනාගතයත් ගැටලනවා.** වර්තමානය අමතක කරලා. ඔන්න තණ්හාව කරන වැඩේ. ඒ පිළිබඳව ඉතාමත්ම වටිනා සූත්‍රයක් අපි කලින් අවස්ථාවකත් ප්‍රකාශ කළා. උග්ගසේන නට පුත්‍රයා පිළිබඳ කථාව[7], මහ පුදුම විදියේ කමටහනක් බුදුරජාණන් වහන්සේ දෙන්නෙ, හැට රියන් උණ ගහක් උඩ හිටිය උග්ගසේන නට පුත්‍රයාට. සර්කස්කාරයා වගේ ඒ හිටිය අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ වදාළ ගාථාව රහත් වෙන්න කමටහනක් වුනා. අපි සිංහලෙන් කිව්වොත්,

පෙර පසුව හැර දමව
මැදද අතහැර දමව
භවයෙ එතරටම යව
හැම තැනින් විමුත් සිත ඇතිව
යළි උපතකට දිරුමකට පත් නොවෙව
**මුඤ්ච පුරෙ මුඤ්ච පච්ඡතො - මජ්ඣෙ මුඤ්ච භවස්ස පාරගු**
**සබ්බත්ථ විමුත්තමානසො - න පුන ජාතිජරං උපෙහිසි**

ඒ ගාථාව ඇහුව හැටියේ ඒ නට පුත්‍රයා උණ ගස උඩ ඉද්දිම රහත් වුණා. රහත් වුණා කියන්නේ මොකද, අතීතයත් අනාගතයත් පිළිබඳ සිත ඉවත් කරලයි අර විදියට සමබරව හිටියෙ. මහා භයානක අවස්ථාවක්. වැටුණොත් මැරෙනවා. එතකොට වර්තමානය අතහරින්නෙයි

කිච්චෙ මැදද අතහරින්න කියන එක. තේරුම් ගන්න තියෙන්නෙ වර්තමානයත් අතහරින්නය. එතකොට එබඳු අවස්ථාවක වර්තමානය අතහරින්න පහසුයි. අතීතයත් අනාගතයත් අතහැරලා සමාධිමත්ව සිටින නට පුත්‍රයාට, ඒක තුළින් හිතාගන්න පුළුවන්. තණ්හා මැහුම්කාරිය කරන්නේ වර්තමානය අමතක කරලා අතීතයත් අනාගතයත් අතර - අතීත මතක තුළත් අනාගත සිහින තුළත් - අප අතරමං කරනව තණ්හාව. ඒ වෙනුවට උග්‍ර විදර්ශනාවේදී යම් අවස්ථාවක තේරුම්ගත්ත නම්, ඒ ඒ තැනම වර්තමානය සංස්කාර වශයෙන් මෙනෙහි කිරීමේ හැකියාවක් ඇතිවුණ අවස්ථාවේදී, අර මැහුම්කාරියගෙන් මිදෙන්න පුළුවන්. ඔන්න එතකොට ඒ විවරණය.

ඊළඟට අපි ගනිමු. අර තුන්වෙනි විවරණය. ඒකෙ තියෙන්නෙ සැප වේදනාව එක අන්තයක්, දුක් වේදනාව අනික් අන්තය, මැද නොදුක් නොසුව වේදනාව - මධ්‍යස්ථ වේදනාව. ඒකෙදිත් තණ්හාව තමයි මැහුම්කාරිය. ඒ මැහුම්කාරිය එතෙන්දි මොකක්ද කරන්නේ. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව අශ්‍රැතවත් පෘථග්ජනයා දුක් වේදනාවෙන් ස්පර්ශ කරන ලදුයේ සැප වේදනාව - කාම සුඛය ප්‍රාර්ථනා කරයි. ඒ කියන්නේ සැප වේදනාව පතනවා. මක් නිසාද අශ්‍රැතවත් පෘථග්ජනයා කාම සුඛය හැර දුක් වේදනාවෙන් නික්මීමක් නොදකී. මේවා ගැන විවරණය කරන අවස්ථාවෙත් අපි ප්‍රකාශ කළා. සාමාන්‍ය ලෝකයා ඉන්නේ දුකත් සැපත් අතර 'සී සෝ පැදිල්ලක'. මැද නොදුක් නොසුව ගැන තැකීමක් නැහැ. ඒකට බුදුරජාණන් වහන්සේ තවත් විදියකින් ප්‍රකාශ කරල තියනවා සැප වේදනාව පිළිබඳව තියෙන්නේ රාගානුසය. දුක් වේදනාව පිළිබඳව තියෙන්නේ පටිඝානුසය - ඒකෙ යටින් තියෙන්නෙ පටිඝය. නමුත් නොදුක් නොසුව වේදනාව යටින් තියෙන්නේ අවිජ්ජානුසය. ඒ නිසා නොදුක් නොසුව වේදනාව ගැන සාමාන්‍යයෙන් තැකීමක් නැහැ. ඒ ගැන අවිද්‍යාවයි තියෙන්නෙ. **ඒ අවිජ්ජාවෙන් ප්‍රයෝජන අරගෙන තමයි තණ්හාව සැප වේදනාවයි දුක් වේදනාවයි එකට ගැටලන්නේ.**

නමුත් යම් අවස්ථාවක විදර්ශනාවෙන් තේරුම්ගත්ත නම් - එතන බුදුරජාණන් වහන්සේ තවත් විදියකට දක්වනවා. සැප වේදනාවේ අනික් පළුව දුක් වේදනාව. දුක් වේදනාවෙ අනික් පළුව - අනික් පළුව කියන්නෙ පටිභාග - සැප වේදනාවේ පටිභාග හැටියට ගන්න පුළුවන්

දුක් වේදනාව. දුක් වේදනාවේ පටිභාගය සැප වේදනාවයි. ඒ දෙක අතර 'සීසෝවක්' තියනවා. නමුත් මැද තියන නොදුක් නොසුව වේදනාව තුළ තියෙන්නේ අවිද්‍යාව. **අවිද්‍යාවේ අනික් පළුව තමයි විද්‍යාව. විද්‍යාවේ අනික් පළුව විමුක්තිය. විමුක්තියේ අනිත් පළුව නිර්වාණය.** ඔන්න එතකොට හිතාගන්න. සැපත් දුකත් අතර නොවෙයි විමුක්තිය තියෙන්නෙ. මැද නොදුක් නොසුව වේදනාව ළඟයි. මොකද හේතුව? නොදුක් නොසුව වේදනාවට යටින් තියන අවිද්‍යාව ඉවත් කිරීමේදී - **අවිද්‍යාව ඉවත් කරනවා කියල කියන්නේ විද්‍යාව පහළ වෙනවා.** විද්‍යාවත් එක්කම විමුක්තිය, විමුක්තියත් එක්කම නිවන. ඒ බව නොදැනීම නිසා තණ්හාව ලෝකයා රඳවාගන්නවා සැපත් දුකත් අතර සීසෝ පැදිල්ලක. එතකොට මෙතනත් පෙන්නුම් කරන්නේ තණ්හාවෙන් මිදීමට නම්, මැහුම්කාරියගෙන් මිදීමට නම්, අර නොදුක් නොසුව වේදනාව පිළිබඳ විදර්ශනාව යොදල ඒවා සංස්කාර වශයෙන් තේරුම් අරගෙන යම් අවස්ථාවක විමුක්තිය මතු කරගත යුතුව තිබෙනවා. මෙන්න එතකොට ඒ වේදනාව පිළිබඳ කථාව ඒ විදියටයි ගන්න තියෙන්නේ.

ඊළඟ විවරණයේ තියනවා ඒකත් එක්තරා විදියකට ගැඹුරු වශයෙන් ගත යුත්තක්. එක අන්තයක් නාමයයි - හතරවෙනි ස්වාමීන් වහන්සේ දක්වූ විවරණය. අනිත් අන්තය රූපය යි. මැද තියෙන්නේ විඤ්ඤාණයයි. දැන් මේක හොඳ නිදර්ශනයක්. බොහෝදෙනා මේ කාලයේ නාම ධර්‍ම තෝරන්නේ කොහොමද? නාමය කියල කියන්නේ වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණය කියන එකයි. ඒ හතර - පඤ්චුපදාන ස්කන්ධයේ ඒ හතර තමයි නාම ධර්‍ම හැටියට තෝරන්නේ. රූපය රූප උපදානස්කන්ධ කියල. නමුත් මෙතනින් අපට පේනවා නාමයත් රූපයත් අතරට විඤ්ඤාණය දැමීමෙන් කිසි සේත්ම නාමයට විඤ්ඤාණය ඇතුල් කරන්න බැරි බව. නාමය කියන එක බුදුරජාණන් වහන්සේ වගේම සාරිපුත්ත මහ රහතන් වහන්සේත් පෙන්නුම් කරල තියෙන්නේ[9] අපි කලින් අවස්ථාවක මේ පින්වතුන්ට ඇඟිලි ගණින්නය කියල තේරුම් කරපු කාරණය. **වේදනා සඤ්ඤා චේතනා ඵස්ස මනසිකාර කියන ධර්‍ම පහ තමයි නාම ධර්‍ම.** රූප කියල කිව්වෙ ඒකත් රූප සංඥාව. මොකද මහා භූත ධර්‍ම හතර ආශ්‍රයෙන්, ඒ කියන්නේ නාම ධර්‍ම තුළින් මහාභූත ධර්‍ම හඳුනාගන්න කරන ප්‍රයත්නය තුළිනුයි රූප සංඥාවක් ඇති වෙන්නේ. ඒකයි අපි බොහෝ විට කිව්වෙ

නාම ස්වරූපයක් නාම කියල කියන්නේ. නාම මාත්‍ර රූපයක් අනිත් පැත්තෙන් තියෙන්නේ. එතකොට තණ්හාව මේ මැදින් තියන විඤ්ඤාණය අමතක කරලා තණ්හාව කරන්නේ මොකක්ද?

මේ මැහුම්කාරිය නාමයත් රූපයත් ගැටලනවා. අපි කලිනුත් දුන්න නිදර්ශනයක් ගත්තොත් මුවා අර මිරිඟුව ඔස්සේ දුවන්නේ ඒ දේ තියනව කියල හිතාගෙන, රූප ඇත්ත වශයෙන්ම තියනව කියල හිතාගෙන. එහෙම නැත්නම් අපි තව උපමාවක් දක්වූවා මේ පින්වතුන්ට ඔය නාමරූප ගැන කථාවේදී. අර ග්‍රීක තරුණයා පිළිබඳ කථාව. නාසිසස් කියන ග්‍රීක තරුණයා පොකුණේ වතුරට නැඹුරු වෙනකොට තමාගේ මුහුණ දැකලා - කලින් තමාගේ මුහුණ දැකල නැති කෙනෙක් - තමාගේ රූමත් මුහුණ දැකලා දෙවඟනක් කියලා රැවටිලා වැළඳගන්න උත්සාහ කරල මැරුණු කතාන්තරය කිව්ව. එතකොට මෙතනදිත් හිතන්න තියෙන්නේ අර තණ්හා මැහුම්කාරියගේ ගැටේට අහු වුණා මේ නාසිසස් ගැටයා. ඒකයි වෙලා තියෙන්නෙ. ඒ බලන බලන වාරයක් පාසා පෙනෙන රූපය වතුරේ ඉන්න දෙවඟනක් කියල හිතාගත්තා.

ඒක හරියටම ගැලපෙනවා වේදනා සඤ්ඤා චේතනා ඵස්ස මනසිකාර. වේදනාව මොකක්ද ආලය ඇල්ම. ඒක තුළින් සංඥාවක් දෙනවා. ඊළඟට චේතනාව කියනවා නැවත බලන්න කියලා ඊළඟට මනසිකාරය යොදනවා. නමුත් මනසිකාරය යොදන බව දන්නෙ නැතුන අයෝනිසෝමනසිකාරය තුළින්, නාසිසස් දන්නෙ නෑ බලන නිසයි පෙනෙන්නෙ කියල. පෙනෙන නිසා බලනව කියල හිතාගෙන වතුරෙ දෙවඟනක් ඉන්නව කියල කල්පනා කළා. වතුරෙ තියන ඒ පිළිබිඹු කරන ස්වභාවය වගේ තමයි විඤ්ඤාණයෙත් තියෙන්නේ. මායාතමක ස්වභාවයක් තියෙනව. ප්‍රත්‍යවේක්ෂා කියල කියන්නෙ. විඤ්ඤාණයේ තියනවා ආපසු හැරිල බලන්න හැකියාවක්. ඒකම තමයි හොඳටත් යොදන්න පුළුවන් නරකටත් යොදන්න පුළුවන්. නරකට යෙදුවොත් අන්න අර ඒදණ්ඩ උඩ බල්ල, නාසිසස් කථා ආදියෙන් පෙන්නුවේ අයෝනිසෝමනසිකාරය තුළින් කෙරෙන්නේ මුළාව. නමුත් යෝනිසෝමනසිකාර වශයෙන් යෙදුවොත් යම් අවස්ථාවක අන්න අර මුළාව තේරුම්ගන්න පුළුවන්. අපට පැහැදිලිවම පෙනෙනවා එතෙන්දි නාමයත් රූපයත් දෙකට මැදිනුයි විඤ්ඤාණය තියෙන්නේ.

ඒ නිසා කිසි සේත් නාමය ඇතුළට විඤ්ඤාණය ඇතුල් කරන්න බැහැ. එතෙන්දිත් ඒ තණ්හාවගේ ක්‍රියාකාරිත්වය ඉක්මවීමට නම් අපි විඤ්ඤාණය තේරුම්ගන්න ඕන. විඤ්ඤාණයේ යථා ස්වභාවය අර කියාපු මායාත්මක ස්වභාවය තේරුම්ගත්තු අවස්ථාවේ තමයි මේ නාම රූපයෙන් මිදෙන්න පුළුවන් වෙන්නේ. ඔන්න එතකොට ඒ නාමයත් රූපයත් අතර සම්බන්ධතාව.

ඊළඟට පස්වෙනි ස්වාමීන් වහන්සේ පෙන්නුම් කරනවා ආධ්‍යාත්මික ආයතන හයයි බාහිර ආයතන හයයි. ඒ අතර මැදින් විඤ්ඤාණය. එතනදිත් ආධ්‍යාත්මික ආයතන - බාහිර ආයතන මැදින් විඤ්ඤාණය තියෙන්නේ. අවසාන වශයෙන් සක්කාය කියල කියන්නේ පඤ්ච උපාදානසක්ඛන්ධයයි. සක්කාය පිළිබඳ විවරණය බුද්ධ දේශනාවක් ආශ්‍රයෙන් අපට තේරුම්ගන්න පුළුවන්. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා සක්කායො කියල කියන්නේ පඤ්ච උපාදානස්කන්ධයටම අධි වචනයක්ය[10] කියල - වෙන වචනයක්ය කියල. සක්කාය සමුදය කියල කියන්නේ පඤ්ච උපාදානස්කන්ධයේ හටගැනීම - තණ්හාව හැටියටමයි දක්වන්නේ 'තණ්හා පොනොභවිකා'.

ඊළඟට සක්කාය නිරෝධය තණ්හාවගේ නිරෝධයයි. තණ්හාවගේ නිරෝධයම තමයි සක්කාය නිරෝධය හැටියට දක්වල තියෙන්නෙ. එතනදිත් සංඝයා වහන්සේලා දක්වන්න ඇත්තේ සමහර විට තමන්ගේ කමටහන වෙන්න පුළුවන්. පඤ්ච උපාදානස්කන්ධයත් පඤ්ච උපාදානස්කන්ධයේ හටගැනීමත්, ඊළඟට මැදින් තිබෙන්නේ නිරෝධය. නිරෝධය නොදැකීම නිසා තමයි ලෝකයා සමුදයෙන් සමුදයට පනිමින් යන්නේ. බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා ලෝකයා නිරෝධය නොදැකීම නිසා සමුදයෙන් සමුදයට පනිමින් යනවාය කියලා. මේ තත්ත්වය තේරුම්ගැනීමට, අවිද්‍යාව නැති කරගැනීමට උපකාර වෙන්නෙ අනිත්‍ය සංඥාව. අනිත්‍ය සංඥාව වැඩීම තුළින් මේවා සංස්කාර හැටියට තේරුම්ගැනීම. අතීතය හා අනාගතය පිළිබඳ කතාන්තරයේදිත්, අතීත සංස්කාර තේරුම්ගැනීම ඉතාම පහසුයි. අනාගත සංස්කාරවල අනිත්‍යතාව තේරුම්ගැනීමත් පහසුයි. නමුත් වර්තමාන සංස්කාරවල අනිත්‍යතාව තේරුම්ගැනීම තමයි අපහසු. අනිත්‍ය සංඥාව ඉතාමත්ම උපකාර වෙනවා තණ්හා මැහුම්කාරියගෙන් මිදීමට. ඒ බව ප්‍රකාශ වෙන

වටිනා කතාන්තරයක් තියනවා 'අධිමුත්ත' තෙරුන් වහන්සේ පිළිබඳ කථාවේදී[11]. අධිමුත්ත රහතන් වහන්සේ කැලයක් මැදින් යනකොට එක්තරා හොරමුලක දෙටුවෙක් ජීව බිල්ලක් ගැනීම සඳහා ඒ තෙරුන් වහන්සේ මරන්න සූදානම් වෙනවා. උන්වහන්සේ ප්‍රකාශ කළ ගාථාවල ඉතාමත්ම වටිනා විදර්ශනාත්මක අදහස් කීපයක් සඳහන් වෙනවා. උන්වහන්සේ ප්‍රකාශ කරනවා,

**න මෙ හොති අහොසින්ති - භවිස්සන්ති න හොති මෙ**
**සංඛාරා විභවිස්සන්ති - තත්ථ කා පරිදෙවනා**

මට හිතෙන්නෙ නැහැ මම හිටියා කියලා. 'භවිස්සන්ති න හොති මෙ' - මම අනාගතයේ වෙනව කියලත් මම හිතන්නෙ නැහැ. 'සංඛාරා විභවිස්සන්ති' හුදෙක් සංස්කාරම ඇති වෙලා නැති වෙලා යනවා. 'තත්ථ කා පරිදෙවනා' මොකක්ද මෙතන වැලපෙන්න තියෙන්නෙ?

ඊළඟට ගාථාවක් දක්වනවා ඒක අපේ මේ මැහුම්කාරියගේ උපමාවටත් ගැළපෙන එකක්,

**සුද්ධං ධම්මසමුප්පාදං - සුද්ධං සංඛාරසන්තතිං**
**පස්සන්තස්ස යථාභූතං - න භයං හොති ගාමණි**

**'සුද්ධං ධම්මසමුප්පාදං'** තනිකර පිරිසිදු ධර්ම - ආශ්‍රව ධර්ම නොවේ. ධර්ම ඇති වෙලා නැති වෙලා යන බව දකිනවා. තනිකර පිරිසිදු සංස්කාර සන්තතියක් කියල පස්සන්තස්ස යථාභූතං න භයං හොති ගාමණි. යථාභූත වශයෙන් දකින විට, ගාමණි, භයක් ඇති වන්නේ නැත.

මේක අපි උපමාවක් හැටියට ගත්තොත් මහන මැසිමකින් මහගෙන යන අතරේ සමහරවිට යටි නූල නැති වෙනවා. යටි නූල නැතිවුණහම අර රෙදිපට ඉස්සරහට යනවා. ඉදිකටුවත් යට යනවා. නමුත් මැස්මක් නැහැ. හේතුව, ගැට වැටෙන්නෙ නැහැ. අන්න ඒක නිසා තමයි බුදුරජාණන් වහන්සේ දක්වන්නේ මේ තණ්හා මැහුම්කාරියගෙන් මිදීම සඳහා - තණ්හාවම ගැටයක් ලනවා. නමුත් උපාදානය කියන ඒ ගැටය නැති වන ආකාරයට ක්‍රියා කළොත් උපාදානය නැති වුණ තැන අන්න විමුක්තිය තියනවා. ඒ අර රෙදි දෙපොට මැහිල වගේ පේන්නෙ. නමුත් මැහිල නැහැ. අන්න ඒ

තත්ත්වය තමයි තව ටිකක් ගැඹුරින් කියනව නම් ඔය රහතන් වහන්සේලාගේ අරහත් ඵල සමාපත්තිය ගැන කියවෙන අවස්ථාවල භව නිරෝධය පිළිබඳ ප්‍රත්‍යක්‍ෂය කියන්නෙ මොකක්ද? තණ්හාව උපමාවක් හැටියට ගත්තොත් අපට හිතාගන්න පුළුවන් ඉදිකටුව යට යනව මැහිල වගේ පේනවා. නමුත් මැහිල නැහැ. ඒ වගේ කාලයෙනුත් දේශයෙනුත් මිදුණු තත්ත්වයක්. කාලයත් දේශයත් පිළිබඳ ඒ කාරණය නිසා තමයි ලෝකයා මේ සංඛත ලෝකයක ඉන්නේ.

නමුත් යම් අවස්ථාවක අර උපාදානය නැති වුණ හැටියේ මේ හිත කාලයෙනුත් මිදිල, දේශයෙනුත් මිදිල, විමුක්ත තත්ත්වයකට පත් වෙනවා. ඉදිකටුව යට යනවා නමුත් මැහෙන්නෙ නැහැ. ඒ වගේ තමයි ඵල සිත ඒ මාර්ග ඵල ආදියේදී කාලයෙනුත් විමුක්ත තත්ත්වයක්. හිත උපාදානයෙන් මිදුණා. උපාදානයෙන් මිදුණට පස්සේ ජීවිතය නැති වෙන්නෙ නැහැ. අන්න ඒ විදියෙ තත්ත්වයක්. ඒකට සංස්කාර සම්මර්ශනය අවශ්‍ය වෙනව. සංස්කාර ඒ ඒ තැන දැකීමයි. නාම ධර්ම ගැන හිතුවත්, රූප ධර්ම ගැන හිතුවත්, ආයතන ගැන හිතුවත්, ඒ හැම තැනම තියෙන්නේ අන්ත දෙකක් හා මැදක්, ඒ මැද තමයි ලෝකයා හිර වෙන්නේ. එහි යථා තත්ත්වය පේන්නෙ විදර්ශනාවේදී. ඒ අන්ත දෙක තේරුම්ගැනීම සඳහා අනිත්‍යතා දර්ශනය අවශ්‍ය වෙනවා. මොකද, සක්කාය දිට්ඨිය ඉවත් කරල ඒ ඒ තැන සියුම්ව දකිනවා.

දැන් අයෝනිසෝ මනසිකාරයට ස්පර්ශය පවා වැටහෙන්නෙ කෙනෙක් කරන දෙයක් හැටියට. නමුත් යෝනිසෝ මනසිකාර තත්ත්වයට ආවහම තේරෙනවා මේක හේතු ප්‍රත්‍යයන්ගෙන් ඇති වන දෙයක්. හේතු ප්‍රත්‍ය තුළිනුයි මේ හැම එකක්ම සිද්ධ වෙන්නේ, ඒ හේතු ප්‍රත්‍ය අවබෝධය තුළිනුයි තණ්හාවට තැනක් නැති වෙන්නෙ.

තණ්හාව බලන්නේ ඝන සංඥාව කියන නිත්‍ය සංඥාව පිහිට කරගෙන අන්ත දෙකක් ගැටලන්න. ඒ අන්ත දෙක අපි කලින් කිව්ව වගේ ස්පර්ශය හා ස්පර්ශ සමුදය වෙන්න පුළුවන්. ලෝකයා සමුදය පක්‍ෂයේ ඉන්නවා කියල කියන්නේ ලෝකයාට පේන්නෙ නැහැ ස්පර්ශ නිරෝධයක්. නමුත් උග්‍ර විදර්ශනාවේදී ඔය භංග ඥානය කියන ඒ අවස්ථාවේදී දක්වෙන්නේ 'ඵුසස ඵුසස වයං පසසං, කියල කියනව[12]. ස්පර්ශයක් ස්පර්ශයක් පාසා ගෙවීයාමක් දකිනවා. එක් එක් ස්පර්ශයක්

පාසා නිරෝධය දකිනවා. නිරෝධය දැකීම තුළින් විමුක්තිය සැලසෙන බවයි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ. ඒකම නන්දකොවාද සූත්‍රයෙ එහෙම[13] නන්දක ස්වාමීන් වහන්සේ තෙරණින් වහන්සේලාට ප්‍රකාශ කරනවා. ආධ්‍යාත්මික ආයතන හයත් අනිත්‍යයි බාහිර ආයතන හයත් අනිත්‍යයි කොහොමද ඒ දෙක නිසා ඇති වන විඤ්ඤාණය නිත්‍ය වෙන්නේ කියල. එහෙම ප්‍රකාශ කළහම ඒ දෙක අනිත්‍ය නම් කොහොමද ස්පර්ශ ආදිය නිත්‍ය වෙන්නේ කියල ඇහුවහම ඒ මෙහෙණින් වහන්සේලා ඒකට ප්‍රතිචාරය දක්වන්නේ. ''**තජ්ජං තජ්ජං භනෙත පච්චයං පටිච්ච තජ්ජා තජ්ජා වෙදනා උප්පජ්ජන්ති. තජ්ජස්ස තජ්ජස්ස පච්චයස්ස නිරොධා තජ්ජා තජ්ජා වෙදනා නිරුජ්ඣන්ති.**'' කියලා. ඒ ඒ ප්‍රත්‍යයන් නිසා ඒ ඒ වේදනාවෝ ඇතිවෙත්. ඒ ඒ ප්‍රත්‍යයන්ගේ නිරෝධයෙන් ඒ ඒ වේදනාවෝ නිරුද්ධ වෙත්. අන්න අර විදියට සංස්කාර සම්මර්ශනය තුළින් තේරුම්ගන්නවා එක් එක් ස්පර්ශය පවා ඉතාම සුවිශේෂ දෙයක්. ඇසත් අනිත්‍යයි රූපයත් අනිත්‍යයි. ඇස නිසා ඇති වන විඤ්ඤාණයත් අනිත්‍යයි. ඒ විදියට අනිත්‍ය සංඥාව වැඩෙන්න වැඩෙන්න තේරෙනවා.

එතන එතන මෙනෙහි කරන්න හැකියාවක් එනවා. සාමාන්‍ය අයෝනිසෝමනසිකාරය තුළ මමත්වයක - මම මගේය කියන හැඟීමෙන් - මෙනෙහි කිරීම වෙනුවට යෝනිසෝමනසිකාරය තුළ සංස්කාර ඇති වන නැති වන දේවල් හැටියට, සංස්කාර හැටියට මෙනෙහි කරන්න පුළුවන් වෙනවා. ඒ මෙනෙහි කිරීම උග්‍ර වුන අවස්ථාවෙ ඒකට යම් උපමාවක් කියනව නම්, යම් කෙනෙක් එක්ක කඩුවෙන් සටනක් කරනවා නම් - පලිහක් නැතිව - කොයි තරම් වේගයෙන් කඩුව හරවන්න යොදන්න ඕනද? අන්න ඒ වගේ වේගයෙන් යම් අවස්ථාවක මාරයාට කිට්ටු වෙන්න බැරි විදියට වේගයෙන් මෙනෙහි කරනවා නම් අන්න එතකොට ඒ සංස්කාරයන් ඒ ඒ තැන දකින්න පුළුවන් වෙනවා. ඒකයි භද්දෙකරත්ත සූත්‍රයේ ප්‍රකාශ කළේ '**තත්ථ තත්ථ විපස්සති**[14]' ඒ ඒ තැන්වලම - වර්තමාන සංස්කාරයන් ඒ ඒ තැන්වලම දකින කොට මාරයාට තැනක් නැති වෙනවා. තණ්හා මැහුම්කාරියට කරන්න දෙයක් නැතිව යනවා. අතීත දේවල් අතීත බව තේරුම්ගැනීම පහසුයි. අනාගත දේවල් අනාගතය හැටියට තේරුම්ගැනීම පහසුයි. නමුත් වර්තමානය තමයි ලෝකයාට තිබෙන ලොකුම ගැටලුව. වර්තමානය සත්‍ය හැටියට

පෙනෙනවා. උග්‍ර විදර්ශනාවේදී, අනිත්‍ය සංඥාව දියුණු කරපු කෙනාට, මෙනෙහි කිරීම ශීඝ්‍ර වෙනකොට එතන එතනම ඉවර වෙනවා. අන්න අර ඉවර වෙන එක නිසාම කලකිරීමක් එනවා. එතන එතනම බිඳෙනවා කියන එක අපි උපමාවකට කියනවා නම් යම් කිසි කෙනෙක් ගිරි ශිඛරයක් උඩින් යනවා ප්‍රපාත දෙකක් දෙපැත්තෙ තියෙන්නෙ. අතීතය එක පැත්තක. අනාගතය අනිත් පැත්තෙ. ප්‍රපාත දෙකක් දෙපැත්තේ තියෙද්දී කෙනෙක් ගිරි ශිඛරයක් උඩින් යනව නම් තමන්ට පිහිටට තියෙන්නේ අල්ලගන්න යම් කිසි වැටක්. නමුත් ඈතට යනකොට තේරෙනවා **මේ වැටත් බිඳෙන එකක් කියලා.** අන්න ඒ වගේ තමයි. **මේ වැට තමයි සංස්කාර.**

සංස්කාර තුළිනුයි මේ මෙනෙහි කිරීම ගෙනයන්නේ. නමුත් අවසාන අවස්ථාවේදී තේරෙනවා මේ සංස්කාරත් බිඳෙන බව. අන්න ඒක තුළින් තමයි කලකිරීම එන්නේ. විදර්ශනාවේදී බුදුරජාණන් වහන්සේ දක්වන මැදුම් පිළිවෙත ඒකයි. මේවා සංස්කාර හැටියට මෙනෙහි කරන්න කියනව. සංස්කාර මෙනෙහි කිරීමේදී යම් අවස්ථාවක් එනවා ඒවා බිඳෙනව දකිනකොට බයක් එනවා. ඒකට තමයි 'භංග ඥානය' කියල කියන්නේ. ඉස්සෙල්ල දකිනවා - අනිත්‍යතාවේ මූලිකම අවබෝධය තමයි ඇති වීම් නැති වීම් දැකීම. ඇති වීම් නැති වීම් දැකීමේදී ඒවා උග්‍ර වෙනකොට අන්තිමට නැතිවීම් වැඩියෙන් පේනව. නිරෝධ පැත්ත පෙනෙන්න පටන්ගන්නවා.

ඒ නිරෝධ පැත්ත පේන්න පටන්ගන්නවත් එක්කම ඉස්සෙල්ල ඇති වෙන්නේ බයක්. මොකද, තමන් අල්ලගන ඉන්න දේ බිඳෙනවා. අල්ලගන ඉන්න දේ බිඳෙනවා නම් මොකක්ද කරන්න තියෙන්නේ කියලා ඊළඟට ප්‍රශ්නය එනවා. ඊට පස්සෙ සංස්කාරයන්ගේ අනිත්‍යතාව මෙනෙහි කරනව. සංස්කාරවල නිත්‍ය ස්වභාවයක් නැහැ. **මමය මගේය කියලා ගැනීම තුළිනුයි භයක් ඇති වෙන්නේ කියලා. ඊළඟට ඒව අතහැරිය අවස්ථාවෙයි විමුක්තිය.** ගැඹුරු දෙයක් ඔතන තියෙන්නේ.

මේ කියාපු කමටහන් හය තුළම තියෙන්නේ ඔය අනිත්‍ය සංඥාව. එක පැත්තකින් ගත්තොත් 'යො උභන්තෙ විදිත්වාන' කියන්නේ අන්ත දෙක. ඒ අන්ත දෙක තේරුම්ගැනීම කියල කියන්නේ ඒවායේ අනිත්‍ය ස්වභාවය අවිද්‍යාව ක්‍රියාත්මක වෙන්නේ ඝන සංඥාව තුළින්, නිත්‍ය

සංඥාව තුළින්. ඒ වෙනුවට යෝගාවචරයා මේවා අනිත්‍ය බව නිතර මෙනෙහි කරන කොට යම් අවස්ථාවක තේරෙනවා අර නාමරූප ධර්‍ම හැටියට සලකන අවස්ථාවේදී මේ හැම එකක්ම ඇති වෙන නැති වෙන ස්වභාවයයි. ඒ නැති වෙන ස්වභාවය ගැන වැඩියෙන් හිත යොදනකොට ඔන්න ඊළඟට වැඩියෙන් පේන්නේ බිඳෙන එක. ඒකත් එක්කම තමයි භංග භය ආදී වශයෙන් විදර්ශනා ඥාන පරම්පරාව ඇවිල්ලා යම් අවස්ථාවක අනුපාදා පරිනිබ්බානං කියන්නේ - එතකොට උපාදාන පච්චයා භවො, අල්ලාගැනීම තුළිනුයි භවයක් ඇති වෙන්නේ. අතහැරීම තුළිනුයි භව නිරෝධයක්. ඒ තත්ත්වයයි. අපි අර තණ්හාව ගැන කිව්ව තණ්හාවේ මැහුම්කාරිය ගැන කියනකොට මැහුම්කාරිය ගැට දාන කෙනෙක් හැටියටයි පෙනෙන්නෙ. නමුත් යම් අවස්ථාවක ඒ ගැටයට අහු නොවන විදියට සිත සකස් කරගත්තොත් අන්න විමුක්තිය.

ඒ ඒ භවයාගේ ඉපදීමට තණ්හාවම උපාදානයක් වෙනවා කියන එක අපට පැහැදිලි වන එක සූත්‍රයක් තියනවා. සංයුත් සඟියේ කුතුහලසාලා සූත්‍රයේ[15] ඒ වච්ඡගොත්ත පරිබ්‍රාජකයා බුදුරජාණන් වහන්සේගෙන් මෑත කාලයේ අන්තරාභව කථාවකටත් හේතු වුණ එක්තරා උපමාවක් බුදුරජාණන් වහන්සේගෙන් අහනවා. ගිනි සිලක් සුළඟකින් වීසි වෙනකොට එතන උපාදානය මොකක්ද කියල. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා ලැව් ගින්නක් ආදී අවස්ථාවක ගිනිසිලට උපාදාන වුණේ වාතයයි කියල, සුළඟයි කියල. ඊළඟට මේ වච්ඡගොත්ත පරිබ්‍රාජකයා අහන ප්‍රශ්නය - යම් කිසි සත්ත්වයෙක් මේ කය අතහැරල නැවත කයකට එළඹෙනකොට නැවත කයකට ළං වෙන විට, එතනදි උපාදානය මොකක්ද කියල බුදුරජාණන් වහන්සේගෙන් අහනවා. එතනදී බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා තණ්හාවම උපාදානයක් වෙනවා කියලා. මේක වරදවල තේරුම් අරගෙනයි සමහරු අන්තරා භව කථාවක් කියන්නේ. අන්තරා භවයක් නැහැ මෙතන. භවය ගැට ගහන්නේ තණ්හාව. කමටහන් භය ගැනම කියනකොට කියවුනානේ තණ්හාවේ ක්‍රියාවලියක් තමයි ඒ ඒ භවය ගැටගැහීම කියන එක. වච්ඡගොත්ත කථාවෙනුත් ඒක හෙළි වෙනවා. **මැරෙණ අවස්ථාවෙදි තණ්හාවමයි උපාදානය වන්නේ. ජීවත්ව ඉන්න අවස්ථාවේ උපාදානය අත නොහැරියේ නම් මැරෙණ අවස්ථාවේ ඒ තණ්හාව නැවත භවයක් පතනවා නාමරූප ධර්‍ම අල්ලගෙන**

**ඉන්න නිසා.** නමුත් යම් කිසි අවස්ථාවක ජීවත්ව ඉන්න අවස්ථාවේදී තමන්ගේ පඤ්චු උපාදානස්කන්ධය පිළිබඳ ඇලීම අත හැරිය නම්, එතකොට නැවත භවයකට අල්ලගන්න දෙයක් නැහැ.

සක්කායො කියල කියන ඒ පඤ්චු උපාදාන සකන්ධය පිළිබඳවත් එක්තරා අවස්ථාවක සංඝයා වහන්සේ නමක් බුදුරජාණන් වහන්සේගෙන් අහනවා[16]. පඤ්චු උපාදානසකන්ධයත් උපාදානයත් එකමද එහෙම නැතිනම් පඤ්චු උපාදානස්කන්ධය වෙනමද උපාදානය වෙනම එකක්ද කියලා බුදුරජාණන් වහන්සේගෙන් අමුතු විදියේ ප්‍රශ්න දෙකක් ඇහුවා. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා පඤ්චු උපාදානස්කන්ධයත් උපාදානයත් එකමත් නොවේ. උපාදානය පඤ්චු උපාදාන ස්කන්ධයෙන් වෙන් වූ දේකුත් නොවේ. **නමුත් පඤ්චු උපාදානස්කන්ධය පිළිබඳව ඡන්ද රාගයක් තිබෙනවා නම් අන්න ඒකයි උපාදානය.** එතන හරි අමුතු විදියේ කාරණයක් කියවෙන්නේ. **පඤ්චු උපාදානස්කන්ධය පිළිබඳව ඡන්දරාගයයි උපාදානය.** බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ පඤ්චු උපාදානස්කන්ධය පිළිබඳ ඡන්දරාගය දුරු කරන්නයි කියල. ඡන්දරාගය දුරු කළ අවස්ථාවේ නැවත භවයකට යන්නෙ නැහැ. නැවත භවයකට යන්නෙ නැති බව ප්‍රත්‍යක්ෂ වෙන අවස්ථාව තමයි අපි අර කිව්ව ඵල සමාපත්තිය. රහතන් වහන්සේ භව නිරෝධය ප්‍රත්‍යක්ෂ කරනවා කියල කිව්වෙ අර ඉදිකටුවේ උපමාවෙන් අපි කිව්ව වගේ ඒවයින් හිත මිදෙනවා. උපාදානස්කන්ධ කියන්නෙ හැම කෙනෙක්ම අල්ලගෙන ඉන්න ගොඩවල් පහ-රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ. ඒක එකොළොස් ආකාරයකට දක්වනවා. අතීතානාගත පච්චුප්පන්නං අජ්ඣත්තංවා බහිද්ධාවා ඔළාරිකං වා සුඛුමං වා, හීනං වා පණීතං වා, යං දූරෙ සන්තිකෙ වා. අතීත අනාගත වර්තමාන, ඇතුළත හෝ පිටත හෝ, රළු හෝ සියුම් හෝ, පහත් හෝ උසස් හෝ, දුර හෝ ළඟ හෝ, අන්න ඒ විදියට එකොළොස් ආකාරයක ස්කන්ධ අපි අල්ලගෙන ඉන්නෙ හිතෙන්. තමන්ගේ රූපය තමන්ගේ වේදනාව කියන ඒවා මතකයේ රැඳිල තියෙන්නෙ තමන්ගෙ දේවල් හැටියට.

යම් අවස්ථාවක ඒවා පිළිබඳව ඡන්දරාගය දුරු කළා නම් මැරෙණ අවස්ථාවේ අර උපාදානය ගන්නෙ නැහැ. **මැරෙණ අවස්ථාවෙ**

**පමණක් නොවෙයි මේ ජීවිතයේදීම - ඒ ඵල අවස්ථාවේදී වෙන්නේ, අමෘතත්වය ප්‍රත්‍යක්‍ෂ කළැයි කියන්නේ, සාමාන්‍යයෙන් මැරෙනව වගේ හැඟීමක් එනව. නමුත් භය නැහැ. මොකද හේතුව? අතහැරල ඉවරයි. අතහැරෙන අවස්ථාවේ මැරෙණවා වගේ දැනෙනවා. නමුත් මැරිල නැහැ. ඒකට තමයි අමෘතය කියල කියන්නේ.** භවයෙන් විමුක්තයි. භවය කියන අපි නාමරූප හැටියට සලකන හැම දේම ඒ අවස්ථාවේ හිතට එන්නෙ නැහැ. හිත විමුක්තයි. එතකොට ඒ වෙනුවට - ලෝකය තිබෙන්නේ සළායතනය තුළ, ආයතන දෙක තුළ, එහෙම නැත්නම් නාමය හා රූපය තුළ, අතීතය හා අනාගතය තුළ, **ඔන්න ඔය දෙක තුළ, හිර වෙලා ඉන්නෙ.**

ලෝකය තියෙන්නෙ ද්වයතාවක් උඩ. **'ද්වයං භික්ඛවෙ පටිච්ච විඤ්ඤාණං සම්භොති'** විඤ්ඤාණය ඇති වන්නේත් ඔය දෙකක් මුල් කරගෙන. විඤ්ඤාණ නිරෝධය වන්නේ අන්න ඒවායේ අනිත්‍යතාව දැකීමෙන්, විඤ්ඤාණ නිරෝධය කියල කියන්නේ විඤ්ඤාණය සංසිඳීමයි[18]. විඤ්ඤාණය කියන්නේ දෙකක් හැටියට ගැනීම නෙ. මුවා ඈත පෙනෙන දේ - මිරිඟුව - වතුර කියල ගැනීම නිසා තමයි ඉදිරියට යන්නෙ. ඉදිරියට යන්න පොළඹවන්නේ තණ්හාවයි. ඒ පිපාසයයි. තියන තියන අඩියක් පාසාම මුවා හිතනවා වතුරට ළං වෙනවා කියලා. නමුත් මිරිඟුව ඈත් වෙනවා. **බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරල තියනවා ඇහැට පෙනෙන දේ පමණක් නොවෙයි. ඉන්ද්‍රිය හයටම ගෝචර වන දේවල් මිරිඟුව වගේ යන්න යන්න ඈත් වෙනවා.** නමුත් ලෝකයා ඒක තේරුම්ගන්නෙ නැහැ. ඒ වෙනුවට තෘෂ්ණාව කියනවා 'අතන තියනවා', ඈතට යන්න කියලා.

තෘෂ්ණාවෙන් කරන්නේ නිත්‍ය සංඥාවෙන් ඇති වෙන අවිද්‍යාව උපකාර කරගෙන ගැටලන එක. අතීතය අනාගතය පිළිබඳව හෝ වේවා එහෙම නැත්නම් නාම රූපය පිළිබඳව හෝ වේවා හැම තිස්සෙම තියෙන්නේ ගැටලෑමයි. ලෝකයාට පෙනෙන්නෙ නැහැ ඒ සංස්කාරවල ක්‍රියාකාරිත්වය. ඒ වෙනුවට සක්කාය දිට්ඨියෙන් 'මේ මමය මගේය' කියල අල්ලගන්නවා. ඒ අල්ලාගැනීම තුළ - උපාදානය තුළ - විමුක්තිය වෙනුවට භවයෙන් භවයට ඇදිල යනවා. 'සංසාර ගමන' කියල කියන්නේ. **මේ මොහොතක් පාසා සිදුවන දේම තමයි මරණ**

**අවස්ථාවේදිත් සිදු වෙන්නේ.** මේ අවස්ථාවේ හිත එකිනෙක අල්ලාගන යන්න වගේ අන්තිම මැරෙණ අවස්ථාවේ අතහැරියෙ නැත්නම් භව රාගය තිබෙන තාක් කර්මානුරූපව ඉදිරිපත් වන දේ අල්ලගන්නවා. **තණ්හාවම උපාදානයක් වෙනව කියන්නේ ඒකයි.**

මෙයින් අපට තේරුම්ගන්න පුළුවන් මේ සංඝයා වහන්සේලා හය නමම ඉදිරිපත් කරල තියෙන්නේ අර්හත්වය දක්වාම ප්‍රයෝජනවත් වෙන කර්මස්ථාන හයක්. එයින් පළමුවෙනි එකයි බුදුරජාණන් වහන්සේ කෙළින්ම අනුමත කළේ. **ලෝකයා ස්පර්ශයත් ස්පර්ශ සමුදයත් අතරයි ඉන්නේ. ඒ සමුදය පක්ෂයේ ඉඳගෙන නිරෝධය අමතක කරනවා. තණ්හාව ගැටලනවා. තණ්හාව ඒක වහල දානවා.** ඊළඟට ඒ වගේම තමයි අතීතයත් අනාගතයත් අතර. අතීත මතක තුළ, අනාගත සිහින තුළ, ඉන්නව වර්තමානය අමතක කරලා. ඊළඟට සැප වේදනාවත් දුක් වේදනාවත් අතර සී සෝ පැදිල්ලක් තියනවා. නොදුක් නොසුව වේදනාව තුළින් විමුක්තිය සොයන්නෙ නැහැ. ඊළඟට නාමයත් රූපයත් අතර. නාසිසස් වතුරෙ පෙනෙන රූපය වැළඳගන්න ගියා වගේ නාමයත් රූපයත් ගැටලනවා මැද තියන විඤ්ඤාණයේ මායාව නොතකා. ඊළඟට ආධ්‍යාත්මික ආයතන හයත්, බාහිර අරමුණු හයත්. ඒ දෙක අතර තියනවා ද්වයතාවක්. මැද තියන විඤ්ඤාණය නොතකා හරිනවා. ඊළඟට අන්තිමට තියනවා සක්කාය පඤ්චඋපාදානස්කන්ධයේ නිරෝධය පේන්නෙ නැහැ. මොහොතක් පාසා සිදු වෙන නිරෝධය පේන්නෙ නැතුව පඤ්චඋපාදානස්කන්ධය වැඩෙනවා. බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා යම් අවස්ථාවක ඇසෙත් රූපයේත් විඤ්ඤාණයේත් හැම දේකම අනිත්‍යතාව දකිනවා නම් පඤ්ච උපාදානස්කන්ධය ගෙවී යනවා කියලා. පඤ්ච උපාදානස්කන්ධය එකතු වෙනවා මොහොතක් පාසා. නමුත් ඒක ගෙවී යන්න උපකාර වෙන්නේ අනිත්‍ය සංඥාව. ඒ ඒ තැනම ඒ අනිත්‍ය සංඥාව ඇති කර ගන්නවා නම් ඒක එකතු වෙන්නෙ නැහැ.

අපි කීව නේ එකොළොස් ආකාරයයි කියල ගොඩවල් පහ. මේ ගොඩවල් පහ ගොඩ නැගෙන්නේ නිත්‍ය සංඥාව උඩයි. එතන එතනම අනිත්‍ය හැටියට දකිනවා නම් ඒවා ගිහිල්ල එකතු වෙන්නෙ නැහැ. පඤ්ච උපාදානස්කන්ධය ගැන **උපචය** සහ **අපචය** කියල වචන දෙකක්

යොදල තියනවා[19]. උපචය කියන්නේ රැස් වීම, එකතු වීම. එකතු වීම වැළැක්වීමට නම් අනිත්‍ය සංඥාව දියුණු කරන්න ඕන. ඇස පිළිබඳව, රූපය පිළිබඳව, ඊළඟට අනිකුත් ආයතනයන් පිළිබඳව අනිත්‍ය සංඥාව වඩන්න වඩන්න එතන එතනම එයා නිරෝධය දකිනවා. **'තත්‍ථ තත්‍ථ විපස්සති'** කියල කියන්නේ එබඳු අවස්ථාව තමයි. එතකොටයි විමුක්තිය තියෙන්නෙ,

**යො උභන්තෙ විදිත්වාන**
**මජ්ඣෙ මන්තා න ලිප්පති**
**තං බ්‍රෑමි මහා පුරිසොති**
**සොධ සිබ්බනිමච්චගා**

මහා පුරුෂ කියල කියන්නේ රහතන් වහන්සේ පිළිබඳව. මෙතන අභිඥාව හැටියට ගන්න තියෙන්නේ ඒ අනිත්‍යතාව මේ කියාපු කාරණාවල අනිත්‍ය ස්වභාවය නිසා දුක්ඛ ස්වභාවය, දුක් ස්වභාවය නිසා අනාත්ම ස්වභාවය වටහාගැනීම. ඒ වටහාගැනීම සම්පූර්ණ වූ අවස්ථාවයි පරිඥාව කියල කියන්නේ. අභිඥා අවස්ථාව, සෝවාන් ආදී මාර්ග ඵල ලැබුණහම ලැබෙනවා. නමුත් ඒක සම්පූර්ණ වෙන්නේ, පරිඥාවක් වෙන්නේ, අරහත් ඵල අවස්ථාවේදීයි[20] පරිපූර්ණ වෙන්නේ. ඒ දක්වාම යන ක්‍රියා මාර්ගය මේ ගාථාව තුළ තියනවා. මේ තුළින් මේ පින්වතුන් කල්පනා කරන්න ඕන අපේ මේ පඤ්ච උපාදානස්කන්ධය එක්කෝ පඤ්ච උපාදානස්කන්ධය වශයෙන් අරගෙන අනිත්‍ය සංඥාව, එහෙම නැත්නම් ආයතන හයක් හැටියට, එහෙම නැත්නම් නාමරූප හැටියට ඒවා නිරන්තරයෙන් මෙනෙහි කරනකොට අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් - මෙන්න මේ කියාපු ප්‍රත්‍යක්ෂය කරා ළඟා වෙන්න පුළුවන්.

බුදුරජාණන් වහන්සේ සංසාර විමුක්තියට මාර්ගය ප්‍රකාශ කරල තියනවා. අපි සමහර අවස්ථාවල කියල තියනවා අවිද්‍යාව පියා වගේ තණ්හාව මෑණියන් වගේ[21] සංසාරයේ සත්ත්වයාට. අවිද්‍යාවෙන් වැහිල තණ්හාවෙන් බැඳිල ලෝක සත්ත්වයා දුවනවා. බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා මේකට විසඳුමක් අනිත්‍ය දුක්ඛ අනාත්ම යන ත්‍රිලක්ෂණයම ඉදිරිපත් කරලා. මේ හැම එකක්ම අනාත්ම හැටියට දකලා යම් අවස්ථාවක විදර්ශනාවෙන් මේ තත්ත්වයෙන් හිත මුදාගත්තොත්

තණ්හා ගැටයට අසු නොවී, අන්න ඒ අවස්ථාවේ මෙලොවම භව නිරෝධය ප්‍රත්‍යක්ෂ කරගන්න පුළුවන්. **'භව නිරොධො නිබ්බානං'**[22] කියල ප්‍රකාශ කරල තියෙන්නේ ඒකයි.

මේ ආශ්‍රයෙන් මේ පින්වතුන් කල්පනා කරන්න. ලෝකයා අනන්ත කාලයක් සංසාරයේ සැරිසරන බව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරල තියනවා. ඒ සැරිසැරුවේ අවිද්‍යාව නිසාත් තණ්හාව නිසාත් බව බුදුරජාණන් වහන්සේ පැහැදිලිව ප්‍රකාශ කරල තියනවා. මේ ගාථාවෙත් තියෙන්නේ ඒ අන්ත දෙක තේරුම් අරගෙන මැද නොඇලෙනවා නම් තණ්හාවට ඉඩ නොදී - අන්න ඒ අවස්ථාවේ විමුක්තිය ලබාගන්න පුළුවන්. තමන් කරන භාවනා භාවනාවට මෙයින් යමක් ගත හැකි නම් එය උපකාර කරගෙන මේ පින්වතුන් අද වටිනා ශීලයක් සමාදන් වෙලා තම තමන්ගේ භාවනා භාවනා කරන්න ඇති. මේ ධර්ම දේශනාවත් උපකාර කරගෙන හැකි තාක් ඉක්මනින් මේ සංසාර දුකින් මිදීමට - සෝවාන් සකදාගාමි අනාගාමි අර්හත් යන මාර්ගඵල ප්‍රතිවේධයෙන් සංසාර දුකින් මිදීමට - උත්සාහ කරන්නට ඕන. ඒ කරන ප්‍රයත්නය සාර්ථක වේවා කියා අපි ප්‍රාර්ථනා කරනවා.

ඒ වගේම අවීචියේ සිට අකනිටා දක්වා යම් තාක් සත්ත්ව කෙනෙක් මේ ධර්ම දේශනාමය ධර්ම ශ්‍රවණමය කුශලයන් අනුමෝදන් වීමට කැමති නම් ඒ අනුමෝදන් වීම තුළින් තමන්ගේ ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවන සාක්ෂාත් කරගනිත්වා! ඒ වගේම මේ පින්වතුන්ටත් තමන් බලාපොරොත්තු වන උත්තමාර්ථයන් මේ ජීවිතයේදීම සාක්ෂාත් කරගැනීමට ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. මේ ගාථා කියා පින් අනුමෝදන් කරන්න.

**එත්තාවතා ච අම්හෙහි ...**

## පාදක සටහන්

1. අංගුත්තර නිකාය - 4-186 පිට (බු.ජ.ත්‍රි. 21)
2. සංයුත්ත නිකාය - 5(2) - 270 පිට (බු.ජ.ත්‍රි. 17-2)
3. මොළියඵග්ගුන සූත්‍ර, සංයුත්ත නිකාය 2-22 පිට (බු.ජ.ත්‍රි. 14)
4. මජ්ඣිම නිකාය - 1 - 280 පිට (බු.ජ.ත්‍රි. 10)
5. මජ්ඣිම නිකාය - 1-460 පිට (බු.ජ.ත්‍රි. 10)
6. මජ්ඣිම නිකාය -3-398 පිට (බු.ජ.ත්‍රි. 12)
7. ධම්මපදට්ඨ කථා - 2-605-608 පිටු (හේ.මු. 13)
8. සංයුත්ත නිකාය - 4 - 396-398 පිටු (බු.ජ.ත්‍රි. 16)
9. සංයුත්ත නිකාය - 2-6 පිටුව (බු.ජ.ත්‍රි 14 සම්මා දිට්ඨි සූත්‍ර, මජ්ඣිම නිකාය 1-126 පිට (බු.ජ.ත්‍රි. 10)
10. සක්කාය සූත්‍ර - සංයුත්ත නිකාය 3-274-276 පිටු (බු.ජ.ත්‍රි. 15)
11. ථේරගාථා - 186 පිට (බු.ජ.ත්‍රි.28) පරමත්ථදීපනී - 2-11-17 පිටු (හේ.මු. 18)
12. ද්වයතානුපස්සනා සූත්‍ර - සූත්‍ර නිපාත - 230 පිට (බු.ජ.ත්‍රි. 15)
13. මජ්ඣිම නිකාය -3-552-572 පිටු (බු.ජ.ත්‍රි. 12)
14. මජ්ඣිම නිකාය -3- 398 පිට (බු.ජ.ත්‍රි. 12)
15. සංයුත්ත නිකාය 4-702 පිට (බු.ජ.ත්‍රි. 16)
16. මහාපුණ්ණම සූත්‍ර - මජ්ඣිම නිකාය -3-116 පිටුව (බු.ජ.ත්‍රි. 12)
17. මහාපුණ්ණම සූත්‍ර - මජ්ඣිම නිකාය - 3-118 පිටුව (බු.ජ.ත්‍රි. 12)
18. ද්වයතානුපස්සනා සූත්‍ර ගැ. 738 සූත්‍ර නිපාත ඛුද්දක නිකාය -5-230 පිට (බු.ජ.ත්‍රි 25)
19. මහාසළායතනික සූත්‍ර - මජ්ඣිම නිකාය -3-594-600 පිටු (බු.ජ.ත්‍රි. 12)
20. මූලපරියාය සූත්‍ර - මජ්ඣිම නිකාය -1-1-18 පිටු (බු.ජ.ත්‍රි. 10)
21. පඨම ජනෙති සූත්‍ර, දුතිය ජනෙති සූත්‍ර, තතිය ජනෙති සූත්‍ර - සංයුත්ත නිකාය -1-68 පිට (බු.ජ.ත්‍රි. 13)
22. අංගුත්තර නිකාය -6-18 පිට (බු.ජ.ත්‍රි. 13)

# 10 වන දේශනය

# 10 වන දේශනය

## (පහන් කණුව ධර්ම දේශනා අංක 192)
## 'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

ලොභජං දොසජං චෙව - මොහජං චාපවිද්දසු
යං තෙන පකතං කම්මං - අප්පං වා යදි වා බහුං
ඉධෙව තං වෙදනීයං - වත්ථු අඤ්ඤං න විජ්ජති

තස්මා ලොභං ච දොසං ච - මොහජං වාපි විද්දසු
විජ්ජං උප්පාදයං භික්ඛු - සබ්බා දුග්ගතියො ජහෙ[1]

-දෙවදූත වග්ග, අංගුත්තර නිකාය, තිකනිපාතය

සැදැහැවත් පින්වතුනි,

පොසොන් පෝය දවස මේ රටේ බෞද්ධ ජනතාවට ලොකු ධර්ම ප්‍රබෝධයක් ඇති කරවන දවසක්. මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රධාන ධර්ම දූත පිරිස එදා මේ රටේ පිහිටවපු සම්බුද්ධ ශාසනය තුළින් දෙවනපෑතිස් රජතුමාත් රට වැසියනුත් සම්‍යක් දෘෂ්ටියට අනුව ගිය ජීවන දර්ශනයක් ගොඩනගාගත්තා. හොඳ නරක කුසල් අකුසල් පින් පව් පිළිබඳව හරි දැක්මක් පහළ කරගත්තා.

ඒ ජීවන දර්ශනයට අදාළ ගාථා දෙකක් මාතෘකා කරගැනීමෙන් අපි මේ දහවෙනි පටිච්ච සමුප්පාද දේශනාව පොසොන් දෙසුමක් හැටියටම ඉදිරිපත් කරන්නයි බලාපොරොත්තු වෙන්නේ. මේ ගාථා දෙක දකින්න ලැබෙන්නේ අංගුත්තර නිකායේ ඒකක නිපාතයේ දේවදූත වග්ගයේ එන සූත්‍රයකයි. ඒ සූත්‍රය ආරම්භ වන ජේදයෙනුත් කර්මයත් පටිච්ච සමුප්පාදත් අතර සම්බන්ධතාව පැහැදිලි කෙරෙනවා. බුදුරජාණන් වහන්සේ මෙහෙමයි ඒ සූත්‍ර දේශනාව ආරම්භ කරන්නේ ''මහණෙනි, කර්මයන්ගේ හටගැනීමට මේ නිදාන තුනක් ඇත. කවර තුනක්ද?

ලෝභය කර්මයන්ගේ හටගැනීමට නිදානයකි හේතුවකි.

ද්වේශය කර්මයන්ගේ හටගැනීමට නිදානයකි.

මෝහය කර්මයන්ගේ හටගැනීමට නිදානයකි.

ඊළඟට ප්‍රකාශ කරනවා ''මහණෙනි ලෝභයෙන් කරන ලද, ලෝභයෙන් උපන්, ලෝභය නිදාන කරගත්, ලෝභය නිසා හටගත් යම් කර්මයක් වේද, ඒ ලෝභයෙන් හටගත් කර්මය යම් ආත්ම භාවයක උත්පත්තිය ලබයිද, ඒ ආත්ම භාවය තුළ ඒ කර්මය පැසෙයි. යම් ආත්ම භාවයක් තුළ ඒ කර්මය පැසෙයිද, එතැන ඒ කර්මයෙහි විපාකය අත් විඳී. මේ ආත්ම භාවයේම හෝ දෙවන ආත්ම භාවයේ හෝ ඊට පසුව තිබෙන ආත්ම භාවවල හෝ'' මේ විදියේම ප්‍රකාශයක් බුදුරජාණන් වහන්සේ දක්වනවා. ද්වේෂය පිළිබඳව ''මහණෙනි, ද්වේශයෙන් කරන ලද, ද්වේෂයෙන් උපන්, ද්වේෂය නිදාන කරගත්, ද්වේශයෙන් හටගත් යම් කර්මයක් වේද, යම් තැනක ආත්ම භාවය උපදීද එතැන ඒ කර්මය පැසේ. යම් තැනක ඒ කර්මය පැසෙයිද එතැන ඒ කර්මය විපාක දෙයි. ඒ ද්වේෂය පිළිබඳව. ඒ වගේම මෝහය පිළිබඳවත් ප්‍රකාශ කරනවා. මෝහයෙන් කරන ලද, මෝහයෙන් උපන්, මෝහය නිදාන කරගත්, මෝහයෙන් හටගත් යම් කර්මයක් වේද, යම් ආත්ම භාවයක උත්පත්තිය ලබයිද, ඒ ආත්ම භාවයේ ඒ කර්මය පැසේ. යම් තැනක ඒ කර්මය පැසේද එතන ඒ විපාකය අත් විඳී. මේ ආත්ම භාවය තුළ හෝ ඊළඟ දෙවන ආත්ම භාවයේ හෝ ඉන් පසු ආත්ම භාවවල හෝ'' ඊළඟට ඒකට එක්තරා උපමාවක් දෙනවා මේ විදියට. මහණෙනි, නොකැඩුණු කුණු නොවූ සාරය ඇති බීජ වෙත්ද, ඒ බීජ හොඳින් පිරියම් කරන ලද කෙතක පැළ කරන ලද කල්හි ඊට හොඳින් වර්ෂාව ලැබේද එවිට ඒ බීජය වැඩීමට විපුලත්වයට පත් වේ. එසේම අර කියාපු විදියටම ලෝභයෙන්, ද්වේෂයෙන්, මෝහයෙන් කරන ලද කර්ම මේ ආත්ම භාවයේදී හෝ ඊළඟ ආත්ම භාවවල පැහිලා විපාක දෙනවා කියලා. මේ විදියට ප්‍රකාශ කළා. ඒ උපමාව අනුව අපට හිතාගන්න පුළුවන් අර හේතුඵල සම්බන්ධතාවට අදාළ උපමාවක් ඒ බීජ උපමාව. බුදුරජාණන් වහන්සේ අර කිව්වේ අකුසල කර්ම පිළිබඳව ඊළඟට කුසල කර්ම පිළිබඳව මෙහෙම සඳහන් කරනවා.

මහණෙනි කර්මයන්ගේ හටගැනීමට මේ නිදාන තුනක් ඇත. ඒ මොනවාද? අලෝභය මහණෙනි කර්මයන්ගේ හටගැනීමට නිදානයකි.

අද්වේෂය මහණෙනි කර්මයන්ගේ හටගැනීමට නිදානයකි. අමෝහය මහණෙනි කර්මයන්ගේ හටගැනීමට නිදානයකි. ඊළඟට ඒ පිළිබඳව මෙහෙම ප්‍රකාශ කරනවා. මහණෙනි. අලෝභයෙන් කරන ලද, අලෝභයෙන් උපන් අලෝභ නිදාන කරගත්, අලෝභයෙන් හටගත් යම් කර්මයක් වේද, ලෝභය පහ වූ කල්හි ඒ කර්මය මුළුමනින්ම ප්‍රහීණ වේ. උගුලා තබන ලද තල් ගසක් මෙන් වේ. මුලිනුපුටා දමන ලද්දක් වේ. නැවත නූපදින තත්ත්වයකට පත් වේ.

ඒ විදියටම ප්‍රකාශ කරනවා අද්වේෂය පිළිබඳවත්, මහණෙනි අද්වේෂයෙන් කරන ලද යම් කර්මයක් වේද ඒ කර්මය ද්වේශය සම්පූර්ණයෙන් ප්‍රහීන වූ කල්හි ඒ කර්මයද මුලිනුපුටා දමන ලද තල් ගසක් මෙන් විනාශයට පත් වේ. නැති වී යයි. ඒ වගේම අමෝහයෙන් කරන ලද කර්මය පිළිබඳවත් එහෙම ප්‍රකාශ කරනවා. එහෙම ප්‍රකාශ කරලා ඊළඟට දෙන උපමාව ටිකක් අමුතුයි. මහණෙනි, යම් සේ නොකැඩුණු, කුණු නොවූ හරය ඇති බීජයක් හොඳින් අව් සුළඟින් ආරක්‍ෂා වූ බීජයක් වේ ද, ඊළඟට කියන්නේ පැළ කිරීමක් පිළිබඳව නොවේ.

යම් පුරුෂයෙක් ඒ බීජය ගින්නෙන් දවා අළු කෙරේද අළු බවට පත් කර ඒ බීජය තද සුළඟෙහි පොළා හරින්නේද? එහෙම නැත්නම් සැඩ පහර ඇති නදියක ඒවා පා කර හරින්නේද, එවිට ඒ බීජය නැවත නූපදින තත්ත්වයකට 'නැවත නොපැළවෙන තත්ත්වයකට' මුලිනුපුටා දමන ලද තත්ත්වයකට පත් වේ කියලා ඒ උපමාව දෙන්නේ. එතකොට අලෝභය පිළිබඳවත් අද්වේෂය පිළිබඳවත් අමෝහය පිළිබඳවත් අමුතු උපමාවක් බුදුරජාණන් වහන්සේ දෙන්නේ. ඒකෙ අදහස පින්වතුනි අලෝභයෙන් කරන ලද කර්ම ලෝභය අවසන් වූ විට අවසන් වෙනවා. මොකද? අලෝභයෙන් කරන ලද කර්මයේ අවසන් ප්‍රතිඵලය ලෝභය නැතිවීමයි.

ඒ වගේම අද්වේෂයෙන් කරන ලද කර්ම ප්‍රහීන වෙනවා ද්වේශය සම්පූර්ණයෙන්ම නැති වුන අවස්ථාවේ. අමෝහයෙන් කරන ලද කර්මවල විපාක නැති වෙනවා, මෝහය සම්පූර්ණයෙන්ම නැති වුනහම. මෙතන තියෙන්නේ බැලුවහම සමුදය වය ධර්මතාවමයි. මේක ටිකක් ගැඹුරු කාරණයක් බොහොම සරල වගේ පෙනුණට. ලෝභ, දෝස, මෝහයෙන් කරන ලද කර්ම හරියට බීජයකට වර්ෂාව වැටුණහම පැළ වෙනව වගේ.

ඇතැම් තැන්වල ඇත්තටම වර්ෂාව කියන එක දක්වල තියෙන්නෙ තණ්හාව හැටියට. තණ්හාව තමයි සිනෙහ කියල කියන්නේ[2]. තණ්හා නමැති තෙතමනය ලැබුණහම - මේ සංසාරගත සත්ත්වයා යන්නේ ලෝභ ද්වේශ මෝහ නිසා.

එතකොට ඒවායේ විපාක මේ ආත්ම භාවයේ ලබන්න පුළුවන්. එහෙම නැත්නම් ඊළඟ ආත්ම භාවයේ හෝ එහෙම නැත්නම් ඊට පසු ආත්ම භාවවල ලැබෙනවාමයි. නමුත් අලෝභ, අදොස, අමෝහ කියන කුසල් මුල්වල ස්වභාවය වෙනස්. ඒ කුසල් මුල්වලින් කරන ලද කර්ම සම්පූර්ණයෙන්ම ලෝභය ඉවර වූ කල්හි අලෝභයෙන් කරන ලද කර්ම ප්‍රහීණ වෙනව. නැති වෙලා යනවා. මුලිනුපුටා දමන ලද්දක් වෙනවා. විනාශ වෙලා යනවා. හරියට යම් කිසි පුරුෂයෙක් පැළ වෙන්න තිබුණ බීජ, නමුත් පැළ නොකර ඒවා දවලා අළු කරලා - බුදුරජාණන් වහන්සේ දෙනකොට උපමාවක් ආයෙ ඉතුරු කරන්නෙ නැහැ.- සුළඟේ පොළා හරිනවා, එහෙම නැත්නම් නදියේ පා කර හරිනවා. ඊට පස්සෙ ඒ බීජ පැළවෙන්නෙ නැහැ.

මෙතන ගැඹුරු කාරණයක් තියෙන්නෙ. එතකොට මේ සංසාරය පවතින්නේ ලෝභ ද්වේෂ මෝහ උඩයි. ඒක නැතිකර ගන්න යොදන කර්ම තමයි අපි කුසල කර්ම කියල කියන්නේ - අලෝභ අදෝස අමෝහ. ඒවා අවසානයේදී සංසාර විමුක්තිය සඳහා උපකාර වෙනවා. එතනත් තියෙන්නේ අර සමුදය වය වගේ සංසාරයත් එහි අවසානයත්. ඊළඟට අපි කර්මය ගැන බලමු. කර්මය කලින් කිව්ව වගේ පටිච්ච සමුප්පාදයට එල්ල කරලයි අපි මේ විග්‍රහ කරන්න බලාපොරොත්තු වෙන්නේ. කර්මය පිළිබඳව ඉතාම වැදගත් කාරණා දක්වන සූත්‍රයක් තමයි නිබ්බේධික පරියාය සූත්‍රය[3] අංගුත්තර නිකායේ ඡක්ක නිපාතයේ දකින්න ලැබෙන. ඒකෙදි බුදුරජාණන් වහන්සේ සය ආකාර විග්‍රහයක් දක්වනවා කර්මය පිළිබඳව. අපි සිංහලෙන් කිව්වොත්,

''මහණෙනි, කර්මය දත යුත්තේය. කර්මයන්හි හටගැනීමට හේතුව දත යුත්තේය. කර්මයන්ගේ විවිධත්වය දත යුත්තේය. කර්මයන්ගේ විපාකය දත යුත්තේය. කර්මයන්ගේ නිරෝධය දත යුත්තේය. කර්ම නිරොධ ගාමිණී ප්‍රතිපදාව දත යුත්තේ ය.'' කියලා ඔන්න ඔහොම මාතෘකා හයක් ඉදිරිපත් කරලා එයින් එක එකක් විග්‍රහ කරනවා. බුදුරජාණන් වහන්සේම. කර්මය දත යුත්තේය කියන එකට දෙන විග්‍රහය බුදුරජාණන්

වහන්සේ මේ පින්වතුන් බොහෝ විට අහල තියන එකක්. 'චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි චෙතයිත්වා කම්මං කරොති කායෙන වාචාය මනසා' මහණෙනි, මම චේතනාවම කර්මය යයි කියමි. චේතනාවක් ඇති කරගෙනයි කෙනෙක් කයින් වචනයෙන් හෝ මනසින් කර්ම කරන්නේ. මේ කියමන තුළ ඉතාමත්ම වටිනා අදහස් රාශියක් ගැබ් වෙනවා.

අපි මේක මීට කලින් පටිච්ච සමුප්පාදය පිළිබඳව කළ විග්‍රහය හා සම්බන්ධ කරනවා නම්, මෙතන අලුතින් ආපු පින්වතුන් ඉන්න නිසා කෙටියෙන් කියමු. නාමරූප ධර්ම විග්‍රහයේදී අපි ඉදිරිපත් කළා එක්තරා උපමාවක්. මේ නාම ධර්ම අපි සමාන කළා අතේ ඇඟිලි පහට. වේදනාව දඟකාර සුළැඟිල්ලයි. සංඥාව හැඩකාර මුදු ඇඟිල්ලයි චේතනාව හිතුවක්කාර මැද ඇඟිල්ලයි. ස්පර්ශය දබරකාර දබරැඟිල්ලයි. මනසිකාර කියන ඒ පස්වෙනි නාම ධර්මය අපට කියන්න පුළුවන් ක්‍රියා කර මහපට ඇඟිල්ලයි. ඉතින් මේ වේදනා සඤ්ඤා චේතනා ඵස්ස මනසිකාර කියන නාම ධර්ම තුළින් තමයි රූප ධර්ම අල්ලන්නේ. නා නා විධ උපමා අපි දීල තියනවා. මෙතනදී අපි මතු කරගත්ත චේතනාව කර්මය හැටියට බුදුරජාණන් වහන්සේත් දක්වූයේ. අපි අර කිව්ව උපමාව ධර්මයේ එන එකක් නම් නොවෙයි.

නමුත් හිතුවක්කාර මැද ඇඟිල්ල කියන එකත් එක්ක ගැළපෙනවා. හිතුවක්කාර මැද ඇඟිල්ල වගේ තමයි චේතනාව. ඒ අවස්ථාවේදි තමයි අර පෞද්ගලිකත්වය මතු වෙලා කර්ම විපාක විඳින්න සූදානම් වෙන්න වෙන්නේ. ඊළඟට දෙවෙනි කාරණය බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නෙ කර්මයන්ගේ නිදාන සම්භවය. කර්මයන්ගේ හටගැනීමට හේතුව හැටියට දක්වන්නේ ස්පර්ශයයි. ඵස්සය - ඔන්න බලන්න එතනත් යෙදිල තියන හැටි. අර කිව්ව නේ දබරකාර දබරැඟිල්ල කියල. එතකොට ස්පර්ශය කර්මයන්ගේ හටගැනීමට ඉතාම කිට්ටුම තැන. මොකද ඊළඟට තියෙන්නේ මනසිකාරයනේ. මෙනෙහි කිරීමනෙ. මෙනෙහි කිරීම ආශ්‍රයෙන්නෙ යමකට යොමු වෙන්නෙ. අර කලින් දේශනා අහපු පින්වතුන්ට නාසිසස් ආදී උපමා ආශ්‍රයෙන් අපි කිව්වෙ. ඒ තමන්ගේම ප්‍රතිබිම්බයට - එහෙම නැත්නම් වතුරේ පෙනෙන ඡායාව වැළඳගැනීමට පෙළඹුණේ අර චේතනා අවස්ථාවේදී. ඊළඟට ඵස්ස මනසිකාර. කොහොම හරි ස්පර්ශය කර්මයන්ගේ නිදානය හටගැනීමට හේතුව හැටියට දක්වල තියනවා බුදුරජාණන් වහන්සේ.

ඊළඟට කර්මයන්ගේ විවිධත්වය - ඒක වෙන විදියකට ප්‍රකාශ කරන්නෙ. 'වෙමත්තතා' කියන එක තෝරන්නේ ''මහණෙනි, නිරයේ විඳිය යුතු කර්ම තියනවා, තිරිසන් යෝනියේ විඳිය යුතු කර්ම තියනවා. ප්‍රේත ලෝකයේ විඳිය යුතු කර්ම තියනවා. මනුෂ්‍ය ලෝකයේ විඳිය යුතු කර්ම තියනවා. දිව්‍ය ලෝකයේ විඳිය යුතු කර්ම තියනවා. ඔය විදියට ඒ විඳින ස්ථානය අනුව කර්මයන්ගේ විවිධත්වයක් දක්වනවා.

ඊළඟට කර්මයන්ගේ විපාකය දත යුත්තේය. කියන එක තෝරන්නේ මෙහෙමයි. මහණෙනි, කර්මයන්ගේ විපාක ත්‍රිවිධයි කියල මම කියනවා. තුන් ආකාරයි කියල කියනවා. තුන් ආකාර වෙන්නේ විඳින තැන අනුව. දිට්ඨෙව ධම්මෙ දිටු දැම්යෙහිම, මේ ආත්ම භාවයේම හෝ දෙවන ආත්ම භාවයේදී හෝ ඉන් මතු ආත්ම භවයන්හි හෝ විපාකය ත්‍රිවිධාකාරයි. ඊළඟට කර්ම නිරෝධය දත යුත්තේය. කියන එක තෝරන්නේ **කර්ම නිරෝධය ඵස්ස නිරෝධයයි.** එතකොට හිතාගන්න පුළුවන් **කර්මය ඇති වුනේ ස්පර්ශය නිසා නම් නිරෝධයත් ස්පර්ශ නිරෝධයෙනුයි.**

ඊළඟට අවසානයේදි දක්වනවා කර්ම නිරෝධගාමිනී ප්‍රතිපදාව. ඒක නම් කෙටියෙන්ම දක්වන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. අරියො අට්ඨංගිකො මග්ගො, ආර්ය අෂ්ටාංගික මාර්ගයයි කර්ම නිරෝධගාමිනී ප්‍රතිපදාව. ඔය විදියේ හය ආකාර විග්‍රහයක් එතන තියනවා. ඊළඟට මේක පිළිබඳව තව වැදගත් සූත්‍ර රාශියක් තියනවා. අපි අවස්ථානුකූලව ටික ටික මතු කරන්නෙ. දැන් නිගණ්ඨ මතය අනුව කාය කර්ම, වචී කර්ම, මනෝ කර්ම කියලා තුනක් තියනවා. නිගණ්ඨයන්ගේ විග්‍රහයට අනුව කාය කර්මයට මුල් තැන ලැබෙනවා. ඒගොල්ලො කර්ම කියලා කියන්නෙත් නැහැ. කාය දණ්ඩ වචීදණ්ඩ මනො දණ්ඩය කියලා කියන්නේ. නමුත් බුදුරජාණන් වහන්සේගේ විග්‍රහයට අනුව මනෝ කර්මයට මුල් තැනක් ලැබෙනවා. ඒක උපාලි සූත්‍රයේ[4] දීඝතපස්සි නිගණ්ඨ ශ්‍රාවකයත් එක්ක බුදුරජාණන් වහන්සේ කළ සාකච්ඡාවේදී ප්‍රකාශ කරනවා මම කියනවය මනෝ කර්මය මහා සාවද්‍යයි කියල. මනසින් කෙරෙන කර්ම මහා සාවද්‍යයි. ඒකට හේතුව හිතාගන්න පුළුවන්. මේ පින්වතුන් අහල තියනවා ධම්ම පදය පටන් ගන්න ගාථාව,

**මනො පුබ්බංගමා ධම්මා - මනො සෙට්ඨා මනොමයා**
**මනසා චෙ පදුට්ඨෙන - භාසති වා කරොති වා**
**තතො නං දුක්ඛමනෙවති - චක්කංව වහතො පදං**

ඒ ගාථාවේ කියවෙන්නේ, ධර්මයේ තියෙන්නෙ මනෝ මූලික මනසට මුල් තැන දීලා. නිගණ්ඨ අය කියන්නේ කයට මුල් තැන. මනෝ මූලික නිසා දූෂිතව වචනයක් හෝ ක්‍රියාවක් කළොත් ඒකෙ විපාක විඳින්න වෙනවා. සංචේතනික කර්ම. නිගණ්ඨයින් චේතනාවට තැනක් නොදෙන නිසා තමයි අන්තගාමීව අතතකිලමථානුයෝග ආදී දේවලට ගියේ. බුදුරජාණන් වහන්සේගේ මධ්‍යම ප්‍රතිපදාවට හේතුවම කර්මය චේතනාව හැටියට දක්වීමයි. ඊළඟට තවත් ඒ වගේම වටිනා සූත්‍රයක් අපි එළියට ගත්තොත් අර නිගණ්ඨයින් ගැන කිව්ව වගේම කර්ම විපාක ගැන වැදගත් සූත්‍රයක් තමයි දේවදූත සූත්‍රය කියන එක. මැදුම් සඟියේ දේවදූත සූත්‍රය[5]. ඇත්ත වශයෙන් මේ පින්වතුන් අහල ඇති මිහිඳු මහ රහතන් වහන්සේ අනුරාධපුරයේදී මේ රටේ ජනතාවට කර්ම විපාකවල භයානකත්වය පෙන්නුම් කරන්න දේශනා කළ සූත්‍රයක් තමයි ඒ දේවදූත සූත්‍රය.

බුදුරජාණන් වහන්සේ ඒ දේවදූත සූත්‍රයේ දී සුචරිතයත් දුශ්චරිතයත් අනුව සත්ත්වයා ඒ ඒ භවවල උපදින ආකාරය විග්‍රහ කරනවා. ආරම්භ කරන්නේ දිව්‍ය ලෝක, මනුෂ්‍ය ලෝක, ප්‍රේත ලෝක, තිරිසන් ලෝක, අන්තිමට නිරය. නිරය ගැනයි බුදුරජාණන් වහන්සේ දේවදූත සූත්‍රයේ වැඩියක් විස්තර කරන්නේ, නිරයේ තියන ගොරතර මහා භයානක දුක් විවිධ නිරයවල අපායවල විඳින දුක් ගැහැට බුදුරජාණන් වහන්සේ පුදුම අන්දමට විස්තර කරල තියනවා. ඒක නිසා වෙන්න ඇති මිහිඳු මහ රහතන් වහන්සේ මේ රටේ ජනතාවට හොඳ නරක ඒ වගේම සංසාර භය ඇති කරන ඒ සූත්‍රය දේශනා කළේ. ඒවා ඇත්ත වශයෙන්ම පොසොන් පොහොය දවසක අපි සිහිපත් කර ගන්න ඕන.

ඔය විදිය දේවල්, සාමාන්‍යයෙන් ඔය චූළහත්ථිපදොපම සූත්‍රය වාගේ සූත්‍ර බොහොම බුද්ධි ගෝචර දේවල් තමයි. නමුත් අපි අරකත් කල්පනා කරන්න ඕන. මිහිඳු මහ රහතන් වහන්සේ ඇයි දේවදූත සූත්‍රය වැනි සූත්‍ර දේශනා කළේ මේ මනුෂ්‍යයින්ට. මේ මනුෂ්‍යයින් පාපකර්ම වලින් මුදාගෙන කුසල් පැත්තට යොමු කරන්න ඒ බුද්ධ වචනය මුල්කරගෙන. අපායවල තියන මහා භයානක දුක් පීඩා ආදිය ඒ සූත්‍රයේ විස්තර කරල

තියනවා. ඒ කර්ම විපාක පැත්ත එහෙමයි. ඊළඟට බෞද්ධ දර්ශනයේ දක්වෙන කර්ම වාදය නිගණ්ඨයින්ගේ මතවලට වඩා වෙනස් එකක් බව තේරුම්ගන්න තවත් සූත්‍ර රාශියක් තියනවා. තවත් ඒ වගේ ඉදිරියට ගන්න පුළුවන් චූලකම්ම විභඞ්ග සූත්‍රය[7] කියල එකක් තියනවා සුභ කියන මාණවකයාට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළ. කර්මයේ තියන ආධිපත්‍යය, සංසාරික සත්ත්වයන්ගේ ජීවිත තුළ කර්මය බලපාන ආකාරය දක්වල තියනවා. 'කම්මස්සකා'. එතෙන්දි සුභ මානවකයා අහන්නේ මේ සත්ත්වයින් අතර තිබෙන විවිධත්වයට හේතුව. ඇතැම් අය දුගී, ඇතැම් අය පොහොසත්, ඇතැම් අය රෝගී, ඇතැම් අය නිරෝගී ඔය විදියට සමාජයේ දක්වෙන විවිධත්වයට හේතුව ප්‍රශ්න කළහම බුදුරජාණන් වහන්සේ ඒකට දක්වන්නේ කර්මයයි. ඒකට හේතුව කවුරුත් අහල ඇති ''කම්මස්සකා මානව සත්තා කම්ම දායාදා කම්මයොනි කම්මබන්ධු කම්මපටිසරණා කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පණීතතායාති.'' උස් පහත් භේදයට හේතුව කර්මයයි කියල දක්වන්නේ. සත්ත්වයන් කර්මය තමාගේ කොට ඇත්තාහ. වෙන අයිති කරගන්න දේපොළ ධන ධාන්‍ය නොවේ අරගෙන යන්නේ කර්මයයි.

'කම්මස්සකා' කර්ම යයි තමන්ට අයිති කියල කියන්න පුළුවන්. 'කම්මදායාදා' දායාදය හැටියට තියෙන්නෙත් ඒකයි. 'කම්මයොනි' ගිහිල්ල උපදින තැන - උපදින තැනත් තීරණය වෙන්නෙ කර්ම අනුවයි. 'කම්මබන්ධු' තමන්ගේ නියම නෑයත් කර්මයයි. 'කම්මපටිසරණා' කර්මය තමන්ගේ පිළිසරණයි. කර්මයයි සත්ත්වයන් උස් පහත් භේදයට බෙදන්නෙ කියල අන්න ඒ කාරණයත් අපි බෞද්ධයින් කර්මය ගැන හිතනකොට නිතර සිහිපත් කරගත යුතු දෙයක්. ඒ නිසාම දුශ්චරිතයෙන් වැළකී සිටීමට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරල තියනවා නිතරම මෙනෙහි කරන්න කියලා (අභිණ්හං පච්චවෙක්ඛිතබ්බානි). ඨාන සූත්‍රයේ[8] නිතර මෙනෙහි කළ යුතු කාරණාවලින් එකක් තමයි 'කම්මස්සකොම්හි කම්ම දායාදො කම්මයොනි කම්මබන්ධු කම්මපටිසරණො යං කම්මං කරිස්සාමි කල්‍යාණං වා පාපකං වා තස්ස දායාදො භවිස්සාමී'ති.

මටෙයි කියල තියෙන්නේ කර්මය පමණයි. කර්මය මගේ දායාදයයි, මගේ නෑයයි. මගේ පිළිසරණයි. යමක් කරනවා නම් හොඳ හෝ නරක හෝ කර්මයක් එය මම විඳින්න ලැස්ති වෙන්න ඕන කියන එක. තස්ස දායාදො භවිස්සාමි. එහෙම අපි කිව්වට මොකද අපේ ධර්මයේ තියනවා

මෙයින් මිදීමේ ක්‍රමයකුත්. ඒ වෙනුවට නිගණ්ඨ ආදීන්ගේ මතයේ තියෙන්නේ කර්‍මය කියන එක ගැන එක්තරා අන්තගාමී අදහසක්. 'සබ්බං පුබ්බෙකතහෙතු'[9] සියල්ලම පෙර කරන ලද කර්‍මය නිසාය කියන මතය අරගෙන නිගණ්ඨයෝ ඒ කියන්නේ ජෛන ආගමික කට්ටිය, ප්‍රකාශ කරනවා සත්ත්වයා විඳින සැප දුක් - අපි විඳින සැප දුක් - සියල්ලම අතීතයේ කරන ලද කර්‍ම නිසාය. ඒක නිසා අපට කරන්න තියෙන්නේ මෙච්චරයි කියලා ඒ අය කියන්නේ මොකක්ද?

තපස් රැකීමෙන් කයට දැඩි දුක් දීමෙන් අතීත කර්‍ම ගෙවා දාන්න ඕන. අත්ත කිලමථානුයොග කියල කියන්නේ. දැඩි දුක් දීමෙන් අතීත කර්‍ම ගෙවා දානවා. අලුත් කර්‍ම රැස් කිරීමෙන් වළකිනවා. ඕකට කියන්නේ නිජ්ජරා ප්‍රතිපදාව කියලා. කර්‍මය දිරවා හැරීමේ ප්‍රතිපදාව. නමුත් බුදුරජාණන් වහන්සේ ඒ නිගණ්ඨයින්ගෙන් ප්‍රශ්න කරලා ප්‍රශ්නෝත්තර වශයෙන් ඒ අයගේ මතය නිෂ්ප්‍රභා කරනවා. නුඹලා ඒ විදියට කර්‍මය ගෙවන්ට බලාපොරොත්තු වුණත් තමන්ටම කියන්න පුළුවන්ද ඔය ශරීරයට දුක් දීම තුළින් කොයි තරම් ප්‍රමාණයක් අතීත කර්‍ම ගෙවිල තියනවද, තව කොච්චර ගෙවන්න තියනවද කියල හරියට දන්නෙ නැතුව නිෂ්ඵලයිනෙ තමන් කරන මේ කයට දුක් දීම කියල බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කළා. 'පුබ්බෙකතහෙතු' වාදය බුදුරජාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළා හැම දෙයක්ම අතීත කර්‍මය නිසා වුණා කියන. ඒ වගේම තමයි කර්‍ම වාදය ගත්තු ඇතැම් අය ඒ කාලයේ හිටියා සත්ත්වයින් විඳින සැප දුක් හැම එකක්ම තමා විසින්ම කරගත් දෙයක් කියන අය. 'සයං කතං සුඛ දුක්ඛං' ඒ කියන්නේ තමා විසින්ම කරන ලද්දක් මේ සැප දුක්. තවත් කොටසක් කිව්වා 'පරං කතං' තමන් නොවෙයි වෙන අය නිසයි මේ සැප දුක් හැම එකක්ම විඳින්නේ. තවත් කොටසක් කිව්වා 'සයං කතං ච පරං කතං ච' ඒ දෙක එකතු කරලා භාගයක් දුරට තමන්, භාගයක් දුරට අනුන්. තවත් කොටසක් කිව්වා තමනුත් නොවෙයි අනුනුත් නොවෙයි. ඉබේ වෙන දෙයක්ය මේ සැප දුක් විඳීම කියන එක - 'අධිච්ච සමුප්පන්න' කියලා.

බුදුරජාණන් වහන්සේ මේ සියල්ලම ප්‍රතික්ෂේප කරලා ඔන්න කර්‍මය පිළිබඳව නියම දර්‍ශනය ඉදිරිපත් කළා ඒ අවස්ථාවේදී. 'පටිච්ච සමුප්පන්නං කම්මං' කර්‍මය කියන එක පටිච්ච සමුප්පන්නයි. කර්‍මය පටිච්ච සමුප්පන්න දෙයක්. 'කිං පටිච්ච' බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ

කළා - කුමක් නිසාද 'ඵස්සං පටිච්ච' අන්න එතනදිත් ස්පර්ශය, ස්පර්ශය නිසා ඇති වන දෙයක්. එතකොට මේක වෙන කෙනෙක් කළත් නොවෙයි. තමන් කළත් නොවෙයි. දෙන්නම එකතු වෙලා කළත් නොවෙයි. කවුරුවත් නැතුව ඉබේ වුණත් නොවෙයි. නමුත් **ස්පර්ශය නිසා.** අර 'නිසා' කියන වචනය එතන පටිච්ච සමුප්පාදයට සම්බන්ධයි **ස්පර්ශය නිසයි**. ඒක නිසාම තමයි ස්පර්ශය නිරෝධ වන තැන කර්මයත් නිරෝධයි කියන්නෙ. ඔන්න ටික ටික ගැඹුරට එන්නෙ. නමුත් මෙහෙම වුණාට මොකද, අපට නිගණ්ඨ මතයටම සමාන කරන්න බැරි නමුත්, අපේ පටිච්ච සමුප්පාද විග්‍රහය තුළ අවාසනාවන්ත විදියේ සම්මත මතයක් තියනවා.

දැන් මේ පින්වතුන් අහල තියනවා, අවිජ්ජා පච්චයා සංඛාරා ආදී අංග දොළහක්. එයින් විසුද්ධි මග්ගය ආදී මෑත කාලීන ග්‍රන්ථවල පටිච්චසමුප්පාද විග්‍රහයේදී කාල තුනකට බෙදනවා මේ අංග දොළහ[11]. අවිජ්ජා සංඛාර අතීත කාලයේය. ඊළඟට විඤ්ඤාණ නාමරූප සළායතන ඵස්ස වේදනා තණ්හා උපාදාන භව කියන අංග අට වර්තමානය. ජාති, ජරා මරණ කියන ඒවා අනාගතය කියලා ඒ දොළහ අතීත වර්තමාන අනාගත කියන කාලත්‍රයකට බෙදනවා. ඒකත් යම් කිසි විදියකට අතීත හේතුවකින් මේ විඤ්ඤාණය ඇති වුණා කියලා ඔන්න ඔය විදියට අදහසක් දක්වන්නේ. ඒක කිසි සේත්ම පිළිගන්න බැරි බව අපි මීට කලිනුත් දේශනාවලදි පෙන්නුවා.

විඤ්ඤාණයත් නාමරූපයත් අතර දිය සුළියයි මෙතන මේ පටිච්ච සමුප්පාදයේ වැදගත්ම තැන. ඒ වගේම බුද්ධ දේශනාව අනුව බැලුවත් පටිච්ච සමුප්පාදය විග්‍රහ කරන නිදාන සංයුත්තයේ බුදුරජාණන් වහන්සේ සංඛාරා කියන වචනය තෝරන්නේ පසු කාලීනව සංඛාරා තෝරන හැටියට නොවෙයි. පසුකාලීනව සංඛාරා තෝරන්නේ අතීත කර්ම විදියට. එහෙම එකක් නොවෙයි මෙතන සංඛාරා කියන එක. බුදුරජාණන් වහන්සේ තෝරන්නේ මහණෙනි සංස්කාර තුන් වර්ගයක් ඇත. මොනවද තුන් වර්ගය කාය සංඛාරෝ, වචී සංඛාරෝ, චිත්ත සංඛාරෝ. ඒක විග්‍රහ කරන්න සිද්ධ වෙනවා. ඒකෙ විශේෂත්වය තියෙන්නේ ඒක ''ඒක වචනයෙන්'' තිබීමයි. කාය සංඛාරෝ වචී සංඛාරෝ. චිත්ත සංඛාරෝ, ඒ තුන ධර්මයේ තෝරල තියෙන්නේ මෙහෙමයි. කාය සංඛාරෝ කියන්නේ ආශ්වාස ප්‍රශ්වාස. එතකොට

හුස්ම ගන්න පලියට ඊළඟ ආත්මයක් හැදෙන්නෙ නැහැනෙ.

ඊළඟට වචී සංඛාරො කියන්නේ විතක්ක විචාර. චිත්ත සංඛාරො කියන්නේ සඤ්ඤා වේදනා. අර කියාපු කර්ම නොවෙයි. එතකොට පටිච්ච සමුප්පාද ධර්මයේ අංග දොළහ එක එකක් බුදුරජාණන් වහන්සේ විග්‍රහ කරන විභංග සූත්‍රයේ සංඛාරා කියන එක තෝරල තියෙන්නේ කාය සංඛාරො වචී සංඛාරො චිත්ත සංඛාරො. එයින් පෙන්නුම් කරන්නේ ආශ්වාස ප්‍රශ්වාස විතක්ක විචාර සඤ්ඤා වේදනා, ඇත්ත වශයෙන් භවය නිරෝධ කරන්න බලාපොරොත්තු වන කෙනා ඒවා සංසිඳවන්න ඕන. ඒකයි ඒවට සංස්කාර කියල කියන්නේ. තවත් ඒකට නිදර්ශනයක් තමයි ඔය කියාපු විසුද්ධි මාර්ගය ආදී ඒවායේදී විඤ්ඤාණය කියන එක තෝරන්නේ පටිසන්ධි විඤ්ඤාණය හැටියට. අර කියාපු කර්ම නිසා ඇති වන පටිසන්ධි විඤ්ඤාණය, අවිජ්ජා සංඛාර නිසා ඇති වන පටිසන්ධි විඤ්ඤාණයක් හැටියට තෝරන්නේ. එහෙම තෝරන්නත් ඉඩක් නැත්තෙ මොකද, බුදුරජාණන් වහන්සේ විඤ්ඤාණය තෝරල තියෙන්නේ විඤ්ඤාණය හය ආකාරයි කියල. 'ඡයි මෙ භික්ඛවෙ විඤ්ඤාණකායා, කියල දක්වල තියනවා. චක්ඛු විඤ්ඤාණං සොත විඤ්ඤාණං ඝාන විඤ්ඤාණං. ජිව්හා විඤ්ඤාණං කාය විඤ්ඤාණං මනො විඤ්ඤාණං. එතකොට සංඛාරා තෝරල තියෙන්නේ අර විදියට. විඤ්ඤාණයත් තෝරල තියෙන්නේ මේ විදියට. ඒ නිසා කිසි සේත් අර දෙක අතීතයට දාන්න බැහැ. අපි පෙන්වල දුන්නා මේ අංග දොළහම වර්තමානයට අදාළයි. වර්තමානයට අදාළයි. එතකොට කෙනෙක් අහන්න පුළුවන් කෝ අවිද්‍යාවට සංස්කාරවලට තැනක් නැද්ද? ඒක අපි පෙන්නුවා.

අර විඤ්ඤාණයත් නාමරූපයත් අතර ඇති අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යතාව නොදැනීමමයි අවිද්‍යාව. ඒ නොදැනීම නිසා ඇතිවන ක්‍රියාවලිය තමයි සංස්කාර. ඒකට ආයිත් මතක් කරගත්තොත් අර නිදර්ශනය අර නාසිසස් කියන ග්‍රීක තරුණයා වතුරෙ දැක්ක තමන්ගේ ලස්සන රූපය දැකලා රැවටිලා දෙවඟනක් කියලා නැවත නැවත වැළඳගන්න පෙළඹුණේ - ඒ ක්‍රියාවලිය සිදු වුනේ - අවිද්‍යාව නිසා නොදැන්ම නිසා. අන්ධකාරය, මෝහාන්ධකාරය නිසා. අන්න ඒ වගේ තමයි ලෝක සත්ත්වයා. මේ අවිජ්ජා සංස්කාර තුළ තියෙන්නේ අර පසුබිමයි. කොටින්ම කියතොත් පසුබිමයි. මූලිකම තැන දිය සුළිය හැටියට අපි පෙන්නුවේ.

විඤ්ඤාණයත් නාමරූපයත් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයි. ඒක වර්තමානයටම අදාළ දෙයක්. ඒක නිසා තමයි වර්තමානයේම සසර දුක් කෙළවර කර ගන්න පුළුවන්. භව නිරෝධය ප්‍රත්‍යක්ෂ කරගන්න පුළුවන්. ඔය ටික අපි විශේෂයෙන් කිව්වෙ පටිච්ච සමුප්පාදයේදි කර්මය ආදිය තෝරන්න ගිහිල්ල අවුලක් වෙලා තියනවා. අතීත දේවල් නිසා ඇතිවන දෙයක් හැටියට. නමුත් ඇත්ත වශයෙන්ම කෙනෙකුට අහන්න පුළුවන් ධර්මයේ සඳහන් වෙනවා පුඤ්ඤාභිසංඛාර අපුඤ්ඤාභිසංඛාර ආනෙඤ්ජාභිසංඛාර[13] කියල සංස්කාර ගැන කියවෙන කොට ඒ වචනත් යෙදෙනවා. එතන නම් අභිසංස්කාර කියල කියන්නේ විශේෂයෙන්ම කරන ලද කර්ම. අතන කිව්වෙ - සංස්කාර කිව්වෙ - ආශ්වාස ප්‍රශ්වාස ආදී සංස්කාරවල යට තට්ටුව වගේ දෙයක්. දැන් මෙතන අභිසංස්කාර කියල කියනකොට දැනුවත්ව චේතනාවෙන් ඇති කරන සංස්කාර. ඒව එතනදී දක්වනවා පුඤ්ඤාභිසංඛාරා අපුඤ්ඤාභිසංඛාරා අනෙඤ්ජාභිසංඛාරා. ආනෙඤ්ජාභි සංඛාර කියල කියන්නේ බ්‍රහ්ම ලෝකවල උපදින්න හේතුවන ධ්‍යාන වලට අදාළ සංස්කාර කොටසක්. අන්න ඒ සංස්කාර වේග තුනම ඇත්ත වශයෙන්ම අවිද්‍යාවෙන් ඇති වෙනවා. ඒ කාරණය ඇත්ත නමුත් මේ ජීවිතයේදීම අවිද්‍යාව නැති කිරීම තුළින් ඒ සංස්කාර වේග සංසිඳෙනව. මමත්වය තුළින් ක්‍රියාත්මක වන දේවල් තමයි ඒ සංස්කාර කියල කියන්නේ. - අභිසංස්කාර - ඔන්න ඔය විදියට කල්පනාකර බලනකොට එතනත් පළමුවෙන්ම හිතන්න තියෙන්නෙ කර්මය පටිච්ච සමුප්පන්නයි. ඊළඟට කර්ම නිරෝධයයි අපේ ඉලක්කය විය යුත්තෙ.

කර්ම නිරෝධගාමිනී ප්‍රතිපදාව ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. එතකොට ආර්ය අෂ්ටාංගික මාර්ගයෙ තියෙන්නෙ - මේ පින්වතුන් දන්නවා ආර්ය අෂ්ටාංගික මාර්ගයෙ තියන සම්මා දිට්ඨිය දුක්ඛ සමුදය නිරොධ මාර්ග. නමුත් තවත් සම්මා දිට්ඨියක් තියනවා. මේ පින්වතුන් අහල ඇති 'කම්මස්සකතා සම්මාදිට්ඨි, කියල. කම්මස්සකතා සම්මාදිට්ඨිය කියන්නේ, පින්වතුනි ඒක දස ආකාරයකින් දක්වනවා. දානයෙහි විපාක ඇත. යාගයෙහි විපාක ඇත. පුද සත්කාර ආදියෙහි විපාක ඇත. හොඳ නරක කර්මවල විපාක ඇත. මෙලොවක් ඇත. පරලොවක් ඇත. මවට ඇප උපස්ථාන කිරීමේ විපාක ඇත. පියාට උපස්ථාන කිරීමේ විපාක ඇත. ඕපපාතික වශයෙන් මවුපියන්ගේ සම්බන්ධය නැතිව හටගන්නා

සත්ත්වයෝ ඇත. අවසාන වශයෙන් දක්වන්නෙ මෙලොවත් පරලොවත් අභිඥාවෙන් දැනගෙන ප්‍රකාශ කරන සම්‍යක් ප්‍රතිපදාවට බැස්ස මහණ බමුණන් ඇත කියන ඔය දස වස්තුක සම්මා දිට්ඨිය දක්වන්නේ කම්මස්සකතා සම්මා දිට්ඨිය කියලා. මොකද සංසාරයට අදාළව සංසාරයේ සිටින සත්ත්වයාට දුගතියකට නොගිහින් සුගතියට යාමට උපකාර වන දර්ශනය ඒකයි. ඒකෙ විරුද්ධ පැත්ත විපරීත දර්ශනයක් හැටියට දක්වනවා. විපරීත දර්ශනය තමයි මේකෙ අනිත් පැත්ත[14].

හිතාගන්න පුළුවන්නේ, දානයෙහි ඵලයක් නැත. යාගයෙහි විපාක නැත. පුද සත්කාරයන්හි විපාක නැත. කරන හොඳ නරක කර්මයන්හි විපාක නැත. මවෙක් නැත. පියෙක් නැත. මෙලොවක් නැත. පරලොවක් නැත කියන ඒ 'නැත නැත' කියන කථාව - ඒ 'නැත නැත' කථාව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ විපරීත දර්ශනයක් හැටියට. නමුත් සංසාරය තුළ සිටින සත්ත්වයා දුගතියට නොගිහින් සුගතිගාමී වීමට උපකාරී වෙනවා අර කියාපු කම්මස්සකතා සම්මා දිට්ඨිය. කම්මස්සකතා කියන වචනයේත් ගැඹුරු අදහසක් තියනවා. කර්මය තමාගේ කොට ඇති දර්ශනය.

එතකොට ආයිත් හිතමු කර්මය තමාගේ කොට ඇතිය කියල කියන්නෙ අර 'හිතුවක්කාර මැදගිල්ල' ඒ 'හිතුවක්කාරකමේ' විපාක විඳිය යුතුයි. ඒ 'හිතුවක්කාරකම' නිසා පින් කරන්නත් පුළුවන්. පව් කරන්නත් පුළුවන්. ඒ දෙකටම මැද ධ්‍යාන තත්ත්වයක් ලබන්නත් පුළුවන්. ගැඹුරින් ලෝකෝත්තර දෘෂ්ටි කෝණයකින් බැලුවොත් මේ පින්වතුන් දන්නවනේ ආළාරකාලාම උද්දකරාම පුත්‍ත ආදී ගුරුවරුන් ගැනත් කලකිරිලා බුදුරජාණන් වහන්සේ ඉවත වැඩිය බව[15]. ඒකට හේතුව ආනෙඤ්ජාභිසංඛාරවලත් නැහැ විමුක්තියක්. පුඤ්ඤාභිසංඛාර වලත් නැහැ සංසාර විමුක්තියක්. අපුඤ්ඤාභිසංඛාරවලත් නැහැ. ආනෙඤ්ජාභිසංඛාරවලත් නැහැ. නමුත් ඒවා උපකාර වෙනවා සංසාරයේ. අපුඤ්ඤාභිසංඛාර අතහැරලා පුඤ්ඤාභිසංඛාර වැඩිය යුතුයි. ඊටත් ඉහළින් ආනෙඤ්ජාභිසංඛාර. මේ අපේ හිත දියුණු කරගන්න උපකාර වෙනවා සංසාරය තුළ. නමුත් සසරින් මිදීම සඳහා අන්න ආර්ය අෂ්ටාංගික මාර්ගයයි ඒකෙදි තියෙන්නේ. ලෝකෝත්තර ආර්ය සම්‍යක් දර්ශනයයි. මේ දෙක පටලවාගන්නත් හොඳ නැහැ.

අර කම්මස්සකතා සම්මා දිට්ඨිය ඉවත දාල දූන් සමහර විට බුද්ධිවාදීන් කියනවා මෙලොවක් නැහැ, පරලොවක් නැහැ. අම්මෙක් නැහැ, පියෙක් නැහැ. මොකද මේ? ශූන්‍යතාව කියලා ඒ අන්තයට යනවා සමහරු. නමුත් බුදුරජාණන් වහන්සේ කියනවා ඒක විපරීත දර්ශනයක්. සංසාරගත ලෝකයා වැරදිලා ගියොත් අපායටමයි යන්නෙ. අර කම්මස්සකතා සම්මා දිට්ඨිය තුළ කෙනෙක් හික්මෙනවා නම් ඒ තැනැත්තාට අඩු ගණනේ සුගතිගාමීවත් වෙන්න පුළුවන්. හොඳ නරක පිළිබඳව විපාක දන්නවා, ඒවා අනුව ක්‍රියා කිරීම නිසා. **නමුත් ගැඹුරින් කල්පනා කරල බැලුවොත් මේ ඔක්කොම සංස්කාර නිසා අවසාන ඉලක්කය සංස්කාරවලින් මිදීමයි.**

අපි අර කිව්වෙ භව නිරෝධයක් නේ අපේ බලාපොරොත්තුව - 'භව නිරොධො නිබ්බානං'. එතකොට භව නිරෝධය කරා යන ගමනේදී බුදුරජාණන් වහන්සේට මැදුම් පිළිවෙතක් ගන්න සිද්ධ වුණා. **ඒ මැදුම් පිළිවෙතටම අයිතියි ඔය කම්මස්සකතා සම්මා දිට්ඨිය කියන එක.** අන්තගාමී වුනේ නැහැ. විපරීත දර්ශනයක් ගත්තෙ නැහැ. ඒ කියන්නේ උච්ඡේදවාදීන් වගේ එහෙම නැත්නම් චාර්වාකවාදීන්ය කියන්නේ එහෙම පිටින්ම කාමසුඛල්ලිකානුයෝගයට කැප වුණු අය. බුදුරජාණන් වහන්සේට පෙනුණා උන්වහන්සේ දෙවදූත සූත්‍රයේ ප්‍රකාශ කරනවා, හරියටම ගෙවල් දෙකක් මැද ඉඳගෙන ඒ ගෙවල් වලට ඇතුල් වන සත්ත්වයින් දකින්න වාගේ බුදුරජාණන් වහන්සේට පෙනුනා දිවැසින්, සත්ත්වයන් කර්මානුරූපව දිව්‍ය ලෝක ආදී තැන්වල උපදිනවත්, අපාය ආදී තැන්වල උපදිනවත්. එතකොට ඒක බොරු කරන්නත් බැහැ. ඒ ලෝක තත්ත්වයයි.

ඒ ලෝක තත්ත්වය අනුව තමයි බුදුරජාණන් වහන්සේ කම්මස්සකතා සම්මා දිට්ඨියට තැනක් දුන්නේ. අපි ඒවා දූන් මතක් කරගන්න ඕන. මොකද මේවා අවුල් කරගෙන සමහරු. ගැඹුරු අර්ථයෙන් ගත්තොත් මෙයින් මිදීම සඳහා අන්න අර කියාපු ආර්ය අෂ්ටාංගික මාර්ගය. ඒක ආරම්භ වෙන්නේ මේක තනිකර දුකක්. මෙතන 'මමෙක්' වත් 'පරෙක්' වත් නැහැ. **ඇත්ත වශයෙන් ඒ දර්ශනය මතු වෙන්නේ අන්න අර ලෝකෝත්තර මාර්ගක්ෂණයේදී.** යම් කිසි ප්‍රමාණයකින් ඒක ක්‍රියාත්මක වුණේ වී නමුත් හරියාකාරව මතු වන්නේ ලෝකයෙන් එතර වන අවස්ථාවේදීයි. ඔන්න ඔය විදියෙ තත්ත්වයක් තියෙනවා. අපි මේ

ගැඹුරෙන් කිව්වේ පටිච්ච සමුප්පාද ද්වාදසාංගය අර විදියට කාලත්‍රයට බෙදීම වැරදි බව පෙන්නුම් කරන්නයි. අනිත් පැත්තට මේ කර්‍මය පටිච්ච සමුප්පන්න බව පෙන්නුම් කරන්නයි. පටිච්චසමුප්පන්න නිසාම පටිච්ච සමුප්පාදයෙන් මිදීම තමයි සංසාරයෙන් මිදීම. **පටිච්ච සමුප්පන්න වෙන්නේ ඒක නොදැකීම නිසා. පටිච්ච සමුප්පාදය දැකීම එයින් මිදීමයි.** ඒ කියන්නෙ අපි අනිත් අතට කිව්වොත් අර වැරදි ක්‍රියාදාමය ඇති වෙන්නේ විඤ්ඤාණයත් නාමරූපයත් අතර අන්‍යොන්‍ය සම්බන්ධතාව නොදැනීමෙන්. **එතකොට යම් අවස්ථාවක අවබෝධ කරගත්ත නම් අවිද්‍යා අන්ධකාරයට ඉඩක් නැහැ. කොටින්ම කියතොත් ප්‍රඥා ආලෝකය තුළ දකිනවා මේ ක්‍රියා දාමය නිෂ්ඵල දෙයක් බව.**

ඒ ලෝකෝත්තර විමුක්තියයි. සසරින් මිදීමයි. ඔන්න ඔය මැදුම් පිළිවෙත පිළිබඳව කල්පනා කරල බලන කොට **බුදුරජාණන් වහන්සේ නිගණ්ඨයින්ගේ අන්තයට ගියෙත් නැහැ. උච්ඡේදවාදීන්ගේ අන්තයට ගියෙත් නැහැ.** මහ පුදුම විදියේ මැදුම් පිළිවෙතක් බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරල දුන්නා. මේ සත්ත්වයා ක්‍රම ක්‍රමයෙන් අනුපිළිවෙලින් සසර දුගතියට නොගිහින් සුගතියට යාමටත්, අන්තිමට දුගතියත් සුගතියත් දෙකම ඉක්මවලා මේ මුළු මහත් සංසාරයෙන් මිදවීමටත් අන්න බුදුරජාණන් වහන්සේ මැදුම් පිළිවෙත අනුව අර කියාපු දෙයාකාර සම්මා දිට්ඨිය ඉදිරිපත් කළා. කම්මස්සකතා සම්මා දිට්ඨිය එක පැත්තකින්. අනික ආර්‍ය්‍ය නෛර්යානික ඒ චතුරාර්ය සත්‍යය. ඉතින් තව දුරටත් අපි මේ කර්‍මය ගැන ප්‍රකාශ කරනවා නම් බුදුරජාණන් වහන්සේ සූත්‍ර රාශියකම කර්‍මය ගැන වදාරලා තියනවා.

ඒ වගේම වැදගත් සූත්‍රයක් තියනවා කර්‍මයත් දෘෂ්ටියත් අතර ඇති සම්බන්ධය පෙන්නුම් කරන - ඒකත් උපමාවකින් බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරල තියනවා. මිථ්‍යා දෘෂටිය, මිථ්‍යා සංකල්ප, මිථ්‍යා වචන ආදිය ඇති පුද්ගලයා යම් කාය කර්‍මයක් වාක් කර්‍මයක් මනෝ කර්‍මයක් කරනවා නම්, ඒ හැම එකක්ම ඒ තමන් ගත්තු දෘෂටිය අනුවම යනවා[17]. මිථ්‍යා දෘෂටිය ගත්තු පුද්ගලයාගෙන් බලාපොරොත්තු වෙන්න බැහැ හොඳ ක්‍රියා, හොඳ වචන, හොඳ සිතිවිලි. එපමණක් නොවෙයි එතන ප්‍රකාශ කරනවා ''යා ච චෙතනා යා ච පත්ථනා යො ච පණිධි යෙ

ච සංඛාරා'' මිථ්‍යා දෘෂ්ටික පුද්ගලයා තුළ යම් චේතනාවක් ඇති වෙනවා නම්, ප්‍රාර්ථනාවක් ඇති වෙනවා නම්, ප්‍රණිධි කියල කියන සිත යොමු කිරීමක් ඇති වෙනවා නම්, සංඛාර කියන්නෙ ක්‍රියා ශක්තියක් ඇති වෙනවා නම්, ඒ හැම එකක්ම අනිෂ්ට අහිත දුක පිණිස හේතු වෙනවා කියල ප්‍රකාශ කළා. ඔන්න ඒකට දක්වන උපමාව මේ පින්වතුන්ට හිතාගන්න පුළුවන්.

බුදුරජාණන් වහන්සේ දක්වන්නේ යම් සේ කොහොඹ ඇටයක් හෝ කරිවිල ඇටයක් හෝ තිත්ත ලබු ඇටයක් හෝ තෙත් පොළවක පැළ කළහම යම් තාක් පෘථිවි සාරයක් ඇදගන්නවා නම්, ඒ බීජය - දිය සීරාවක් ඇදගන්නවා නම් ඒ හැම එක්කම තිත්ත බවට පත් වෙනවා. තිත්ත ඵලයක් ලබා දෙනවා. අන්න එසේම මිථ්‍යාදෘෂ්ටි ගත් පුද්ගලයාගේ යම් තාක් කාය කර්ම තියනවා නම්, වාක් කර්ම තියනවා නම්, මනෝ කර්ම තියනවා නම් ඒ හැම එකක්ම කටුක තිත්ත විපාක ගෙන දෙනවා. ඊළඟට අනිත් පැත්ත දක්වනවා. සම්‍යක්දෘෂ්ටිය ගත්තු පුද්ගලයාගේ කාය කර්ම, වාක් කර්ම, මනෝ කර්ම, චේතනා ප්‍රාර්ථනා ප්‍රණිධි හැම එකක්ම සැප පිණිස හේතු වෙනවා. මධුර ඵලයක් ලබා දෙනවා. ඊළඟට ඒකට දක්වන උපමාව මොකක්ද, යම් සේ උක් බීජයක්, හැල් බීජයක්, මිදි බීජයක්, තෙත් පොළවක තැන්පත් කළහම ඒ උරාගන්නා පෘථිවි සාරයත්, දිය සීරාවත් මිහිරි ඵලයක්ම ලබාදෙනවා. එයින් අපට පේනවා දෘෂ්ටියේ වැදගත්කම. ඒක නිසා තමයි අපි නිරන්තරයෙන් උත්සාහවත් වෙන්න ඕන අර මිථ්‍යාදෘෂ්ටිවලින් බේරිලා අන්තගාමී නොවී ඉන්න. ලෞකික වශයෙන් බලනවා නම් සංසාරයේ පැවැත්ම සඳහා අර කියාපු කම්මස්සකතා සම්මා දිට්ඨිය උපකාර වෙනවා.

ලෝකයෙන් එතර වෙන්න බලපොරොත්තු වෙන අවස්ථාවේදී අර ආර්‍ය අෂ්ටාංගික මාර්ගය උපකාර වෙනවා. එතෙන්දි පුද්ගල කථාවක් නැහැ. 'මම-අනුන්' කථාවක් නැහැ. තනිකර දුක් ගොඩක්. පඤ්චඋපාදානස්කන්ධය කියන්නේ දුක් ගොඩක්. ඒකට හේතුව තණ්හාවයි. මේ පින්වතුන් අහල තියනවනෙ - තණ්හා නිරෝධය - ඊළඟට ඊට මාර්ගය ආර්‍ය අෂ්ටාංගික මාර්ගයයි. ඔය දෙක කලවම් කර ගන්න නරකයි. ඒ දෙකම බුදුරජාණන් වහන්සේ දක්වල තියෙන්නේ මධ්‍යම ප්‍රතිපදාවටම අදාළ නිසයි, ඒ දෘෂ්ටිය හා සම්බන්ධ ටික. තවත්

ඒ වගේම මහ ගැඹුරු සූත්‍ර තියනවා. ඇතැම් ඒවා අපට සලකාගන්නත් අමාරු තරම් ගැඹුරු කාරණා.

බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. මහණෙනි, මම නව පුරාණ කර්ම එහෙම නැත්නම් අලුත් කර්ම හා පරණ කර්ම දේශනා කරනවා කියලා එක් අවස්ථාවක සංඝයා වහන්සේලාට ප්‍රකාශ කරනවා, කුමක්ද මහණෙනි පුරාණ කර්ම? ඇස, කන, නැහැය, දිව, කය මන. මේවා පුරාණ කර්ම කියල කියන්නේ මොකද? අභිසංඛතං අභිසංචෙතයිතං මේවා මේ සංස්කාර තුළින්ම ඇති කරගත්තු දේවල්. ඉබේ පහළ වුණ දේවල් නොවේ. ඊළඟට නව කර්ම කියල කියන්නේ යම් කෙනෙක් වර්තමානයේ කයින් වචනයෙන් මනසින් කර්ම කරනවා නම් ඒකට නව කර්ම කියල කියනවා. ඔන්න නව පුරාණ කර්ම හඳුන්වපු හැටි බුදුරජාණන් වහන්සේ. මේ සත්ත්වයා කර්මානුරූපය පහළ වෙච්ච බව ඇත්ත. මේ ඉන්ද්‍රියයන් ආදිය. නමුත් යම් අවස්ථාවක මේ සංඛත සකස් කරගත්තු ඉන්ද්‍රියයන්ගෙන් මිදෙන්නත් ඕන. ඉතින් ඒ විමුක්තිය තමයි. අපි බොහෝ අවස්ථාවල දක්වල තියනවා, මෙලොවම ප්‍රත්‍යක්‍ෂ කළ හැකි විමුක්තියක්. අවසානයේ අරහත් ඵල සමාපත්තිය ගැන කියනකොට කියන්නේ ඇසත් නිරුද්ධ වෙනවා රූපත් මැකී යනවා. ඔන්න ඔය විදියට යන්නේ. ඇස, කන, නැහැය, දිව, කය, මන කියන අර කියාපු සංඛත, සකස් කරන ලද, සංසාරයේ චේතනා ශක්ති තුළින් කර්ම ශක්තීන් තුළින් ඇති කරන ලද මේ ඉන්ද්‍රිය හය පවා යම් අවස්ථාවක මෙලොව ම එහි නිරෝධය ප්‍රත්‍යක්‍ෂ කරගන්න පුළුවන්. ඒකට තමයි සළායතන නිරෝධය කියල කියන්නේ. **සළායතන නිරෝධය ප්‍රත්‍යක්‍ෂයක් හැටියට දැකීම තුළින් අර කර්මයෙන් හටගත්තු ඉන්ද්‍රිය හයෙන්ම මිදුනු අවස්ථාවක් රහතන් වහන්සේලා ප්‍රත්‍යක්‍ෂ කරගන්නවා. සංඛතයෙන් මිදීම ඒ ආශ්‍රයෙන් අපට හිතාගන්න පුළුවන්.**

බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ, මේ සත්ත්වයා 'කම්මස්සකා' කියන්නෙ, ඒ වගකීම තමන්ම අවිද්‍යාවත් තෘෂ්ණාවත් නිසා කරන ලද කර්මයේ විපාක විඳින්න සිද්ධ වෙනවා ධර්මතාවක් වශයෙන්. ඒක බුදු රහතුන්ටත් පොදුයි. අහල තියනවනෙ මුගලන් මහ රහතන් වහන්සේ, අතීතයේදී කරන ලද කර්මයක් නිසා අවසාන අවස්ථාවේ - දෙමාපියන් මැරූ කර්මය මතු වුණා. මේ ශරීරය කර්මයෙන්

දීපු එකක්. කොටින්ම කියතොත් අපි ලේසියට කියන්නේ මාරයා කියලා. මාරයා විඥපන් කියලා දීපු එකක්. 'වෙදනීයං දට්ඨබ්බං' එතන අර පුරාණ කර්ම ගැන කියන්නේ 'චක්ඛුං භික්ඛවෙ අභිසංඛතං අභිසංචෙතයිතං වෙදනීයං දට්ඨබ්බං' මහණෙනි, ඇස - අභිසංඛතං අභිසංචෙතයිතං - සංස්කාර විසින් සකස් කරන ලද, චේතනාව විසින් මවන ලද දෙයක්. ඒ වගේම 'වේදනීයං දට්ඨබ්බං' කියන්නේ විඳිය යුතු දෙයක්.

ඇහැ විඳින්න දීපු දෙයක්. මාරයා හරියට 'විඥපන්' කියලා දුන්න දෙයක් අපි ලොකු දෙයක් හැටියට සැලකුවට - බුදුරජාණන් වහන්සේ වදාළ වචනයෙන් පෙන්නුම් කරන්නේ. දැන් ටිකකට හිතන්න ඇස් නැති කෙනෙක්, එහෙම නැත්නම් එක ඇහැක් පමණක් තියනකෙනා කොයි තරම් දුකක්ද විඳින්නේ කියලා. ඒ වගේම තමයි අනික් ඉන්ද්‍රියනුත්. මේවා අප කරන ලද කර්මානුරූපව පහළ වෙච්ච දේවල්. නමුත් ඒවත් සමතික්‍රමණය කරන්න වෙනවා. අන්න ඒ ටිකටයි ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය ඕන වෙන්නේ.

ඊළඟට තවත් කාරණයක් තමයි අපි කිව්වනේ කාය සංස්කාර වචී සංස්කාර චිත්ත සංස්කාර කියන ඒවා. ඒ ආශ්වාස ප්‍රශ්වාස කාය සංස්කාර වෙන්නෙ මොකද? කයක් සකස් වෙන්නේ ආශ්වාස ප්‍රශ්වාස තුළින්. හුස්ම ගත්තට කාටවත් දොස් කියන්න බැහැ. නමුත් ඒක යට තියනවා තණ්හාව අවිද්‍යාව හැංගිලා. ඒක නිසා තමයි හැම බුදු කෙනෙක්ම ආනාපාන සතිය තුළින් ඒ තත්ත්වය ලබනවා කියලා කියන්නෙ. ආනාපාන සතිය තුළ තියනවා මහා පුදුම දෙයක්. සාමාන්‍ය ලෝකයා ඒක ප්‍රාණය කියලා ආත්මයක් හැටියට ගන්නවා. ඒ විදියේ මෝඩ දෘෂ්ටිත් ඇති කර ගන්නවා. නමුත් බුදුරජාණන් වහන්සේ පෙන්නුවා **ඇතිවීම් නැතිවීම් පෙන්නුම් කරන මේ ආශ්වාස ප්‍රශ්වාසය දුකක්. මහම දුකක්.** ලෝකයා ඒක දන්නෙත් නැහැ. ආශ්වාස ප්‍රශ්වාස කරන බව දන්නෙත් නැහැ. අනිත් බාහිරව කෙරෙන ක්‍රියා තමයි - අපි කිව්වෙ - අභිසංස්කාර කියල. ඒ ටිකයි පෙනෙන්නෙ. හරියට අර හිම කන්දක උඩ තියන හරිය වගේ. හිම කන්දක යට තියන හරිය තමයි අර කියාපු 'කාය සංඛාරො' ආශ්වාස ප්‍රශ්වාස කාය සංස්කාරයකි. ඒ වගේම වචී සංඛාරො කිව්වෙ විතක්ක විචාර ආදිය. දැන් කෙනෙක් කථා කරනවට වැඩිය හිත ඇතුළෙ

හිතනවනේ. ඒ හිත ඇතුළෙ කථා කරනව වගෙ තමයි විතක්ක විචාර කියන්නෙ. විතක්ක විචාර කරල ඉවර වෙලයි කෙනෙක් කථා කරන්නෙ. ඒ නොපෙනෙන හරිය තමයි විතක්ක විචාර. ඒකත් සංස්කාර. ඒකයි සංඛාරො කියල කිව්වෙ.

ඊළඟට සඤ්ඤා වේදනා. සඤ්ඤා වේදනා තුළින් තමයි හිත සකස් කෙරෙන්නෙ. අපේ චේතනා සකස් වෙන්නෙත් සඤ්ඤා වේදනා වලින්. අන්තිමට ඒවත් ජයගන්න වෙනවා. ඒවත් සංසිඳවන්න වෙනවා. ඒක නිසා තමයි මේ පින්වතුන් අහල තියෙනවා ඔය ධ්‍යාන මාර්ගයේ යනකොට ආශ්වාස ප්‍රශ්වාස කරදරකාරී බව දැනිල ඒකත් සංසිඳවනවා. ඉස්සෙල්ලම හිත ඇතුළෙ කෙරෙන විතක්ක විචාර සංසිඳවනවා. ඊළඟට ආශ්වාස ප්‍රශ්වාස සංසිඳවනවා. ඊළඟට සඤ්ඤා වේදනා ඒවත් සංසිඳවනවා. **ඒ සංසිඳවීමේ මාර්ගයේ අන්තිම කෙළවර තමයි බුදුරජාණන් වහන්සේ ලෝකයාට හෙළි කළේ සඤ්ඤා වේදයිත නිරෝධ සමාපත්තිය තුළින්.** එතෙක් ලෝකයා ගිහිල්ලා අර සඤ්ඤාව තුළ හිරවෙලා හිටියා. ඊට එහාට යන්න බැහැ. මොකද මමත්වය නිසා. මමය මාගේය කියන හැඟීම නිසා. සඤ්ඤා වේදයිත නිරෝධය තුළින් තමයි බුදුරජාණන් වහන්සේ විමුක්තිය දක්වා වදාළේ. එයින් පෙන්නුම් කරනවා අපට නොපෙනෙන සංස්කාර කොටසකුත් තියනවා.

**සංස්කාර කියන වචනය තනිකර කර්මය හැටියට ගැනීම වැරදියි.** සංඛාර කියන වචනය මහා පුළුල් අර්ථයක් ඇති එකක්. බොහෝ දෙනා සංස්කාර කියන්නේ කර්මය හැටියටම තෝරනවා. නමුත් සංස්කාර කියන වචනයේ සියුම් කොටසක් තියනවා. අපි මේ සාමාන්‍යයෙන් කර්මය හැටියට ගන්න දේවල්වලට වඩා සියුම් කොටසක්. ඒක භව සංස්කාර. භවය ගෙනයන්නේ ඒක තුළින්. අවසානයේදී සඤ්ඤා වේදනා කියන ඒ සංස්කාරත් සංසිඳවනවා. මේ සියල්ලම අන්තිමට බුදුරජාණන් වහන්සේ සංස්කාර වශයෙන් වටහා ගත්තා. අපි මේ ලේසියෙන් කියන සබ්බෙ සංඛාරා අනිච්චා කියන වචනය තුළ මුළු මහත් ධර්මයම තියනවා. මේ හැම එකක්ම සංස්කාර ගොඩක්. බාහිරව පෙනෙන කර්ම ටික විතරක් නොවෙයි. ඊට යටින් තිබෙන ආශ්වාස ප්‍රශ්වාස විතක්ක විචාර සඤ්ඤා වේදනා - ඒවත් සංසිඳවීම තුළින් තමයි අවසානයේ 'සබ්බ සංඛාර සමථ' කියන

තත්ත්වය එන්නේ. ඒක නිසා අපි කල්පනා කරන්න ඕන කර්මයේ දෙපැත්තම.

සංසාරගත සත්ත්වයාට තමන්ගේ ක්‍රියාකාරිත්වය මිථ්‍යාදෘෂ්ටියට නැඹුරු නොකොට සම්‍යක් දෘෂ්ටිය තුළින් දුගතිවලින් මිදිලා සුගතියට පත් වෙන මාර්ගය බුදුරජාණන් වහන්සේ පෙන්නාදුන්නා. අනිත් පැත්තෙන් සුගති දුගති දෙකම සමතික්‍රමණය කරලා මුළු මහත් සංස්කාර ස්කන්ධයෙන්ම - සංස්කාර ගොඩින්ම - මිදෙන හැටිත් බුදුරජාණන් වහන්සේ ආර්‍ය අෂ්ටාංගික මාර්ගය තුළින් පෙන්නාදුන්නා. එතනදී පුද්ගල කථාවක් නැහැ. එතනදී දක්වන්නේ මේක තනිකර දුකක්. තනිකර දුකක් - ඇතුළත හෝ වේවා පිටත හෝ වේවා. ඊළඟට යට තියෙන්නේ තණ්හාව. ඒ තණ්හාව නිරුද්ධ කිරීම - තණ්හා නිරෝධයම තමයි සංසිඳීම, නිවීම, කියල කියන්නේ. ඒ දක්වා යන මාර්ගයයි මේ. කර්මය ගැන කථා කරනකොට අපි කල්පනාකාරී වෙන්න ඕන.

ඒ විදියට සම්පූර්ණයෙන්ම සන්සිඳුන අවස්ථාව දක්වන මහ පුදුම සූත්‍රයක් තියනවා[19]. සාරිපුත්ත ස්වාමීන්වහන්සේ ප්‍රකාශ කරනවා ''ආනන්ද, කය කියල දෙයක් තිබෙන තාක් කය පිළිබඳව සංචේතනා ඇති කර ගැනීමෙන් කෙනෙකුට සැප දුක් කියල දෙයක් තිබෙනවා. වචනය කියල දෙයක් තිබෙනතාක් වචී සංස්කාර ඇති කරගැනීමෙන් කෙනෙක් සැප දුක් විඳිනවා. මනස කියල දෙයක් තිබෙනතාක් මනෝ සංස්කාර ඇති කරගැනීමෙන් කෙනෙක් සැප දුක් විඳිනවා.'' නමුත් උන්වහන්සේ පෙන්නුම් කරනවා අවිද්‍යාව සම්පූර්ණයෙන්ම නිරුද්ධ වුන තැන ඒ කයත් නැහැ. ඒ වචනයත් නැහැ. ඒ මනසත් නැහැ.

''සො කායො න හොති යම්පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛ දුක්ඛං, සා වාචා න හොති යම්පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛ දුක්ඛං. සො මනො න හොති යම්පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛ දුක්ඛං''. ඊළඟට කියනවා එහෙම නැති වෙනකොට - ඛෙත්තං තං න හොති, වත්ථුං තං න හොති, ආයතනං තං න හොති, අධිකරණං තං න හොති, යම්පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛ දුක්ඛං'. ඇතුළත සැප දුක් ඇති වන කෙත ඉඩම ඔක්කොම ඉවරයි. මොකද මේ කියමනේ තේරුම? දැන් අපි මේ කය කියන එක ඒකකයක්

හැටියට ගැනීම තුළයි - මේ මගේ කය කියල ගැනීම තුළයි - හැම සැප දුකක්ම ඇති වෙන්නේ. මේක ගොඩක් කියලා අපි තේරුම් ගන්නෙ නැහැනෙ. මේ ගොඩ එකක් හැටියට ගන්නවනෙ. විදර්ශනා වශයෙන් සියුම්ව රාශියක් තියනව කියන හැඟීම නැහැනෙ.

එකක් හැටියට ගැනීම තුළ අන්න අර සැප දුක් වින්දනය තියනව. වචනය ගැන හිතුවත් එහෙමයි. වචනය කියන්නේ භාෂාව. යම් කිසි භාෂාවකට දෙන අර්ථය අනුවනෙ - දැන් අපි හිතමු කිසිම භාෂාවක් දන්නෙ නැති කෙනෙකුට අපි හොඳ හිනා මූණෙන් බනිනවා. කොච්චර බැන්නත් ඒ මිනිහා දන්නෙ නැහැනෙ බනින බව. එහෙම නැත්නම් අපි යොදන සමහර වචනවල අර්ථය අනුවනෙ අපට සැප දුක් ඇතිවෙන්නෙ. වචනය කියන එක තියනතාක් වචනය ආශ්‍රය කරගෙන සැප දුක් විඳිනවා. මනස කියන එකත් එහෙමනෙ. මේ ඇතිව නැතිවන සිතුවිලි ධාරාවක් අපි මනස කියල එකක් හැටියට ග්‍රහණය කරගෙන තියනවා සක්කාය දිට්ඨිය තුළින්. ඒකත් යම් අවස්ථාවක නැති වෙනවා. ඒක තිබෙනතාක් තමයි දුක තියෙන්නේ. ඔන්න ඔය විදියේ මහ ගැඹුරු දේශනාවක් බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරල තියෙන්නේ.

මේ භව නිරෝධය කරා යන ගමනක්. නමුත් අපි තේරුම් ගන්න ඕන අර සංසාරගත සත්ත්වයා අන්ත දෙකක ගියයි කියන්නෙ බුදුරජාණන් වහන්සේ ඒකයි. කාමසුඛල්ලිකානු යෝගයයි අත්තකිලමථානු යෝගයයි. ඒ දෙකට මැදිනුයි ආර්‍ය අෂ්ටාංගික මාර්‍ගය යන්නෙ. එක පැත්තකින් ශාස්වත දෘෂ්ටිය අනික් පැත්තෙන් උච්ඡේද දෘෂ්ටිය. ආත්මයක් තියනවා කියලා දැඩිව අරගෙන 'සයං කතං දුක්ඛං' හැම එකක්ම තමාම කළයි කියල ගත්තොත් එතනත් විමුක්තියක් නැහැ. ඒ ආත්ම දෘෂ්ටිය තුළ නැවත නැවතත් සංසාරයේ ඉපදෙනව. අනික් පැත්තෙන් මේව ඉබේ කෙරෙන දෙයක් කියල හිතලා තමන්ගේ වගකීම ගැන අමතක කළොත් ඊළඟට ගිහිල්ලා අපායේ ඉපදෙනවා. ඔය දෙකට මැද බුදුරජාණන් වහන්සේ ශාස්වත දෘෂ්ටිය ගත්තෙත් නැහැ. උච්ඡේද දෘෂ්ටිය ගත්තෙත් නැහැ. ඒ අන්ත දෙකම ඉවත් කරල තමයි ආර්‍ය අෂ්ටාංගික මාර්‍ගය ඉදිරිපත් කළේ. ආර්‍ය අෂ්ටාංගික මාර්‍ගය ගැන කියන කොටත් අපි අර කම්මස්සකතා සම්මාදිට්ඨිය කියල කිව්වෙ ඒක ඉතාමත්ම ගැඹුරු කාරණයක්. එතනදී බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා එදිනෙදා

ජීවිතයේ ලෝකයා තමා හා අනුන් කියන ඒ දෙකොටස තුළයි ඉන්නේ. එතකොට ආත්මාර්ථකාමීව ලෝභ ද්වේශ මෝහ කියන ඒ කෙලෙස් මුල් තුනට නතු වෙලා ක්‍රියා කළොත් අපායටයි යන්නේ. ඒ වෙනුවට බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා අන්න අර **'අත්ත හිත පර හිත'** කියන තමන්ගේත් අනුන්ගේත් සුවය ගෙන දෙන පිළිවෙතක්.

දැන් ශීලාදී ගුණ ධර්ම තුළ තිබෙන්නේ ඒකනෙ. මේ පින්වතුන් දන්නවනෙ ප්‍රාණඝාතය සතුන් මැරීම අපට ප්‍රියයි. ආහාර සඳහා හෝ ද්වේෂය පිරිමසා ගැනීමට හෝ සතුන් මැරීම ප්‍රියයි. හොරකම් කිරීම ප්‍රියයි. නමුත් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා අනික් සත්ත්වයාට ඒක හිංසාවක්. එතනදි උන්වහන්සේ සමාජය ගැන හිතලා බලනකොට තමාත් අනුනුත් දෙපක්ෂයටම හිත සුව සැලසෙන දේ තමයි එතන කුසලයක් හැටියට දක්වන්නේ. ඉතින් අපි කල්පනා කරගන්න ඕන මේ කුසලය කියන වචනය. දැන් ඒකත් හුඟක් දුරට පටලවාගෙන. **කුසල කියන වචනයේ මූලික අර්ථය තමයි දක්ෂ වීම. ඒ දක්ෂ වීම සංසාරයේ ඉන්නවා නම් අපායට නොවැටී සුගතිගාමී වීම. ඉහළම අර්ථයෙන් දක්ෂ වීම තමයි මුළු මහත් සංසාරයෙන්ම - පින් පව් දෙකෙන්ම - එතෙර වෙල 'පුඤ්ඤපාප පහීන' - පින් පව් දෙකෙන්ම එතර වෙලා මුළු මහත් සංසාරයෙන් එතර වීම.** එතකොට මේ කුසල කියන වචනයේ ගැඹුරු අර්ථයක් තියනවා පින් පව් වලට වඩා. සාමාන්‍යයෙන් ඒ වචන දෙකත් ඇතැම් තැන්වල යෙදෙනවා එකට. පුඤ්ඤාභිසන්දා කුසලාභිසන්දා ආදී වශයෙන් සූත්‍රවල සඳහන් වෙනවා. නමුත් පුඤ්ඤ කියන වචනයට වඩා ප්‍රබල වටිනාම වචනය තමයි කුසලය. කෙලින්ම සිතට සම්බන්ධයි.

මොකද, මේ පින්වතුන් දන්නවා දැන් අපි පටන්ගත්තෙත් අකුසල් මුල් කුසල් මුල්වලින්. **අකුසල් මුල්** තමයි ලෝභ දෝස මෝහ. **කුසල් මුල්** තමයි අලෝභ අදෝස අමෝහ. නමුත් මේ පින්වතුන් කවදාවත් අහල තියනවද, **'පින් මුල්, පව් මුල්'** කියලා, 'පින් මුල් පව් මුල්' කියන එකක් අහල තියෙනවද? අන්න එයින් පේනවා එතකොට පිනත් කුසලයත් අතර තියන වෙනස. යම් කෙනෙක් හිතනවා නම් අන්න ඒ පැත්තෙන් හිතන්න ඕන. කෙලින්ම සිතට සම්බන්ධයි මේ කුසලය.

අර කියාපු නිදාන හේතූන් ගැන හිතල බලනකොට පුණ්‍ය පාප කියන එක අතීතයේ ඉඳලම එන ඒ වචන දෙක - ඒ සැප දුක් විපාක ගැන හිතලා ඒ යෙදෙන වචන. මේ පින්වතුන් දන්නවා 'දස පින් කිරිය වත්, කියල තියෙනව දාන සීල භාවනා පත්ති පත්තානුමෝදනා වෙය්‍යාවච්චාපචායඤ්ච දෙසනා සුති දිට්ඨිජු' කියල. දස පින් කියල දාන, ශීල, භාවනා, පින් අනුමෝදන් කිරීම, පින් අනුමෝදන් වීම, පිදිය යුත්තන් පිදීම, වතාවත් කිරීම, බණ දෙසීම, බණ ඇසීම, දෘෂ්ටිය ඍජු කිරීම, ඒව පුණ්‍ය ක්‍රියා හැටියට දක්වනවා. නමුත් කුසල හැටියට දක්වන්නේ දස කුසල්. මොනවාද? බැලුවහම දෙයක් නැහැ වගෙයි. ප්‍රාණඝාතයෙන් **වැළකීම** අදින්නා දානයෙන් **වැළකීම.** කාමමිථ්‍යාචාරයෙන් **වැළකීම මොකද? අමාරු වැඩේ තමයි වැළකීම. පහසු වැඩේ කිරීම. අමාරු වැඩේ කරන්න දක්ෂ වෙන්න ඕන.** අන්න ඒ ගැනත් හිතල බලන්න.

දස පින් කිරියවත් කියල පුණ්‍ය ක්‍රියා දහයක් තිබීමත් දස කුසල් දස අකුසල් කියල වෙනම තිබීමත් අතර අපට පේනවා කුසලයත් පිනත් අතර ඇති වෙනස. ඒ වගේම අපි දක්වූවා කුසල් කියන එක ලෝකෝත්තර අර්ථයෙන් ගත්තොත් ඉහළම කුසලය තමයි අර කිව්ව පුඤ්ඤ පාප පමණක් නොවෙයි, ආශ්වාස ප්‍රශ්වාස විතක්ක විචාර සඤ්ඤා වේදනා කියල කියන භවය ගෙන යන අපට නොදැනෙන ඉතාමත්ම සියුම් සංස්කාර පවා බුදුරජාණන් වහන්සේ අවසාන වශයෙන් සංසිඳෙව්වා, සඤ්ඤා වේදයිත නිරෝධ සමාපත්තියේදී. බුදුරජාණන් වහන්සේ පෙන්නුවා අරහත් ඵල සමාධියෙදි අර සංඛත වූ ඇහැ කන නාසය දිව කය මන ඒවා ඔක්කොමත් සංසිඳවලා මහ පුදුම විදියේ භව නිරෝධ තත්ත්වයත් උන්වහන්සේ හඳුන්වලා දුන්නා.

කර්මය ගැන මේ යුගයේ නා නා විධ මිථ්‍යා මත පැතිරෙනවා. ලෝකයා අනිත් ලොකු ලොකු දේවල් ගැන හිතනවා. කර්මය ගැන හිතන්නේ නැහැ. **ඇත්ත වශයෙන් බුද්ධිවාදී ආකල්පයයි දූන් ලෝකයේ වැඩියෙන් බලපවත්වන්නේ.** ඒ බුද්ධිවාද තුළ කර්මාදී දේවල් ගැන උදාසීන වීම තුළින් අවසානයේදී යන්නෙ අපායටයි. මිහිඳු මහ රහතන් වහන්සේ චූළහත්ථිපදොපම සූත්‍රය පමණක් නොවෙයි දේශනා කළේ. සංසාර භය සත්ත්වයා තුළ ඇති කිරීමට දේවදූත සූත්‍රයත් දේශනා කළා. බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ දිවැසින්

දුටු මේ භයානක අපායේ දුක මිහිඳු මහ රහතන් වහන්සේ ලෝකයාට කියාදුන්නේ සුචරිතය දුශ්චරිතය හඳුනාගැනීමටයි. මෙබඳු යුගයක මේ පින්වතුන්, මේව කල්පනාවට ගන්න ඕන.

අද වැනි දවසක, දිගටම ගෙනයන පටිච්ච සමුප්පාද දේශනා මාලාවේ එකක් - අද මේ පැවැත්තුවෙ දහවෙනි දේශනාව - පොසොන් දවස හා සම්බන්ධ වූ නිසා විශේෂයෙන්ම අපි කර්මයට අදාළව කිව්වා. එයින් ගත යුතු දේ පොසොන් දවසේ හැටියට ගත යුතු දේ ගනිමින් අනාගතයේ මේ ශාසනයේ පැවැත්මටත් තම තමන්ගේ නිවන් දැකීම සඳහාත් උපකාරී වන දෙයක් අපි මේ දේශනා කළ කාරණාවල තිබෙනවා නම් ඒවා තමන් ධාරණය කරගෙන, ඒවා උපකාර කරගෙන, තමන්ගේ දෘෂ්ටියේ යම් දෝෂයක් තිබෙනවා නම් කම්මස්සකතා සම්මා දිට්ඨිය වෙනුවට අර විපරීත දර්ශන ගන්නවා නම් අනික් ආර්ය අෂ්ටාංගික මාර්ග දර්ශනයේ දක්වන චතුරාර්ය සත්‍යය පිළිබඳ ඒවායෙත් යම් සැකයක් තිබේ නම් ඒ දෙකම සංසිඳවාගන්න උත්සාහ කරන්න.

බුදුරජාණන් වහන්සේ දේශනා කළ ඒ මැදුම් මග තේරුම් අරගෙන අසන්ට ලැබුණු මේ දේශනාව තුළින් මේ පින්වතුන්ට ශීලාදී ගුණ ධර්ම රැකීමටත් සමාධිය ප්‍රඥාව දියුණු කරගැනීමටත් උපකාරවත් වේවා කියා ප්‍රාර්ථනා කරනවා. හැකි තාක් ඉක්මනින් මේ අතිඝෝර සංසාරයෙන් මිදීමටත් මේ කුසල ශක්තිය හේතු වාසනා වේවා! ඒ වගේම අවීචියේ සිට අකනිට්ඨා දක්වා යම් තාක් සත්ත්ව කෙනෙක් මෙබඳු ධර්ම දේශනාමය ධර්ම ශ්‍රවණමය කුසලයක් අනුමෝදන් වීමට කැමති නම් ඒ අනුමෝදන් වීම තුළින් ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවනින් සැනසෙත්වා කියන ප්‍රාර්ථනාව ඇති කරගෙන මේ ගාථා කියන්න.

**එත්තාවතා ච අම්හෙහි ...**

## පාදක සටහන්

1. අංගුත්තර නිකාය -1-250 පිට (බු.ජ.ත්‍රි. 18)
2. මුනි සුත්ත - සුත්ත නිපාත - ගා. 211-64 පිට (බු.ජ.ත්‍රි. 25)
3. නිබ්බේධික සුත්ත අංගුත්තර නිකාය 4-200-211 පිටු (බු.ජ.ත්‍රි. 21)
4. මජ්ඣිම නිකාය 2-60-62 පිටු (බු.ජ.ත්‍රි. 11)
5. මජ්ඣිම නිකාය 3-384-396 පිටු (බු.ජ.ත්‍රි. 12)
6. මජ්ඣිම නිකාය 1-426-446 පිටු (බු.ජ.ත්‍රි. 10)
7. මජ්ඣිම නිකාය - 3-432-442 පිටු (බු.ජ.ත්‍රි. 12)
8. අංගුත්තර නිකාය 3-112-118 (බු.ජ.ත්‍රි. 20)
9. දෙවදහ සුත්ත මජ්ඣිම නිකාය 3-2 පිටුව (බු.ජ.ත්‍රි. 12)
10. අංගුත්තර නිකාය 2-52-58 (බු.ජ.ත්‍රි. 14)
11. විසුද්ධිමගග 435 පිටුව (හේ.මු. 8)
12. සංයුත්ත නිකාය 2-6 පිට (බු.ජ.ත්‍රි. 14)
13. සංගීති සුත්ත - දීඝ නිකාය 3-366 පිට (බු.ජ.ත්‍රි. 9)
14. මහාචත්තාරීසක සුත්ත - මජ්ඣිම නිකාය 3-212 පිට (බු.ජ.ත්‍රි. 12)
15. අංගුත්තර නිකාය 1-68-480 පිටු (බු.ජ.ත්‍රි. 18)
16. අරියපරියෙසන සුත්ත, මජ්ඣිම නිකාය - 400-402 පිටු (බු.ජ.ත්‍රි. 10)
17. අංගුත්තර නිකාය 1-66 පිට (බු.ජ.ත්‍රි. 18)
18. සංයුත්ත නිකාය 4-266 පිට (බු.ජ.ත්‍රි. 16)
19. සඤ්චෙතනා සුත්ත, අංගුත්තර නිකාය 2-306 (බු.ජ.ත්‍රි. 19)

# 11 වන දේශනය

# 11 වන දේශනය

## (පහන් කණුව ධර්ම දේශනා අංක 193)
## 'නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස'

යෙ ච රූපූපගා සත්තා - යෙ ච අරූපට්ඨායිනො
නිරොධං අප්පජානන්තා - ආගන්තාරො පුනබ්භවං

යෙ ච රූපෙ පරිඤ්ඤාය - අරූපෙසු අසණ්ඨිතා
නිරොධෙ යෙ විමුච්චන්ති - තෙ ජනා මච්චුහායිනො

කායෙන අමතං ධාතුං - ඵුසයිත්වා නිරූපධිං
උපධිපටිනිස්සග්ගං - සච්ඡිකත්වා අනාසවො
දෙසෙති සම්මා සම්බුද්ධො - අසොකං විරජං පදං

-ඉතිවුත්තක, තික නිපාත[1]

සැදැහැවත් පින්වතුනි,

ඇසළ පුර පසළොස්වක පෝය දවසක තිලෝගුරු භාග්‍යවත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලෝකයා හමුවේ තැබූ චතුරාර්ය සත්‍ය ධර්මය එතෙක් ලෝකයා නොඇසූ විරූ අන්දමේ ආශ්චර්යවත් ධර්මයක්.

දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග කියන ආර්ය සත්‍ය හතරම පදනම් වෙලා තියෙන්නේ පටිච්ච සමුප්පාද ධර්ම නියාමතාව මතයි. ඒක නිසා අද මේ ඇසළ පෝය දවසේ අපි අපේ එකොළොස් වෙනි පටිච්ච සමුප්පාද දේශනාවට මාතෘකාව හැටියට නිරෝධ සත්‍යය ඉදිරිපත් කරගන්න බලාපොරොත්තු වෙනවා. ඒ නිරෝධ සත්‍යය ලෝකයා එතෙක් නො ඇසූ විරූ එකක් බව ප්‍රකාශ කෙරෙන ගාථා තුනකුයි අපි ඉදිරියට ගත්තේ. ඉතිවුත්තක පාළියේ තික නිපාතයේ මේ ගාථා තුන හඳුන්වලා දෙන්නේ මෙන්න මෙහෙම පාඨයකින්: 'වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං' අරහත් භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ වදාරන ලදැයි මා විසින් අසන ලදි. වදාරපු කාරණය කෙටියෙන් සඳහන් වෙන්නේ මේ විදියටයි.

**'රූපෙහි භික්ඛවෙ අරූපා සන්තතරා**
**අරූපෙහි නිරොධො සන්තතරොති'**

මහණෙනි, රූප තත්ත්වයන්ට වඩා, රූප ධ්‍යානවලට වඩා, අරූප ධ්‍යාන ශාන්තය. අරූප ධ්‍යානවලට වඩා නිරෝධය ශාන්තය. ඊළඟට ප්‍රකාශ වෙනවා කෙටියෙන්, 'මෙන්න මේ කාරණයත් භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කළා. එහිලා මෙසේද කියනු ලැබේ' කියලා. ඔන්න ඊළඟටයි අර ගාථා තුන දක්වන්නේ. ඒ ගාථාවල අර්ථය අපි බලමු. '**යෙ ච රූපූපගා සත්තා යෙ ච අරූපට්ඨායිනො**' රූප ධ්‍යානවලට රූප භවවලට එළඹෙන යම් සත්ත්වයෝ වෙත්ද ඒ වගේම '**යෙ ච අරූපට්ඨායිනො**' අරූප භවයන්හි රඳා සිටින යම් සත්ත්වයෝ වෙත්ද '**නිරොධං අප්පජානන්තා**' නිරෝධය තේරුම් නොගැනීම නිසා '**ආගන්තාරො පුනබ්භවං**' නැවත නැවත භවයට පැමිණෙනවා.

'**යෙ ච රූපෙ පරිඤ්ඤාය**' යම් කෙනෙක් රූපයේ තත්ත්වය පිරිසිඳ දැනගත්තා නම්, ඒ වගේම '**අරූපෙසු අසණ්ඨිතා**' අරූපයන්හිත් රඳන්නේ නැත්නම්, '**නිරොධෙ යෙ විමුච්චන්ති තෙ ජනා මච්චුහායිනො**' ඒවායේත් නොරඳා යම් කෙනෙක් නිරෝධයෙහි විමුක්ත වෙත්ද ඒ සත්ත්වයින් තමයි මාරයා පලවා හරින්නේ. ඊළඟට

**කායෙන අමතං ධාතුං - ඵුසයිත්වා නිරූපධිං**
**උපධිපටිනිස්සග්ගං - සච්ඡිකත්වා අනාසවො**
**දෙසෙති සම්මාසම්බුද්ධො - අසොකං විරජං පදං**

කයින් නිරූපධි නම් වූ අමෘත ධාතුව ස්පර්ශ කරලා උපධි පටිනිස්සග්ග කියල කියන උපධීන් අතහැරීම සාක්ෂාත් කරගෙන අනාශ්‍රව වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ 'දෙසෙති සම්මාසම්බුද්ධො අසොකං විරජං පදං' නික්ලේශී වූ කෙලෙස් රජස් රහිත වූ ඒ නිර්වාණ තත්ත්වය දේශනා කළා.

ඕකයි ඒ ගාථාවල අදහස. මේ ගාථාවලින් කියවෙන අදහස අපට ඉතාමත්ම පැහැදිලිව ප්‍රකාශ කෙරෙන වටිනා සූත්‍රයක් තමයි දීඝ නිකායේ එන පොට්ඨපාද සූත්‍රය[2]. දීඝ නිකායේ පොට්ඨපාද සූත්‍රයේදී නිදාන කථාව හැටියට දක්වෙන්නේ මෙහෙමයි. බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වාසය කරන කාලයක පොට්ඨපාද කියන

පරිබ්‍රාජකයා සිය ගණන් පරිබ්‍රාජක පිරිසක් එක්ක මල්ලිකාරාමය නමැති ඒ මල්ලිකා දේවිය අන්‍ය තීර්ථකයින් සඳහා කරන ලද ශාලාවෙහි වාසය කළා. බුදුරජාණන් වහන්සේ එක දවසක් සැවැත් නුවරට පිණ්ඩපාතය පිණිස ඇතුල් වෙලා කල්පනා කරනවා ''සැවැත් නුවරට පිණ්ඩපාතය පිණිස ඇතුල් වෙන්න කල් වැඩියි. මම යන්න ඕනෑ මේ පොට්ඨපාද පරිබ්‍රාජකයා ඉන්න මල්ලිකාරාමයට පොට්ඨපාද පරිබ්‍රාජකයා හමු වෙන්න.'' එහෙම අදහස් කරලා බුදුරජාණන් වහන්සේ ඒ දිසාවට වඩින කොට පොට්ඨපාද පරිබ්‍රාජකයා ඒ අවස්ථාව වන විට - බොහෝ තැන්වල එහෙම සඳහන් වෙනවා ඒ අන්‍ය තීර්ථකයින් පිළිබඳව - අර ඒ පරිබ්‍රාජක පිරිස් එක්ක ධර්මානුකූල නොවන දෙතිස් කථාවෙන් යුක්තව උස් හඬින් හඬ නඟමින් කථා කරමින් හිටියා. පොට්ඨපාද පරිබ්‍රාජකයා ඈත තියාම දුටුවා භාග්‍යවතුන් වහන්සේ වඩිනවා, දැකලා තමන්ගේ පිරිස නිහඬ කළා. ''භවත්නි, නිහඬ වෙන්න, නිහඬ වෙන්න. ඔන්න භාග්‍යවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ වැඩම කරනවා. උන්වහන්සේ නිහැඬියාව ප්‍රිය කරන කෙනෙක්. නිහැඬියාව වර්ණනා කරන කෙනෙක්'' කියල කිව්වහම මේ පිරිසත් නිහඬ වුණා.

බුදුරජාණන් වහන්සේ එතනට වැඩම කළා. එතකොටම පොට්ඨපාද පරිබ්‍රාජකයා 'ස්වාගතං' කියලා පිළිගත්තා. වඩින්න භාග්‍යවතුන් වහන්සේ බොහොම කාලෙකින්ය මේ පැත්තට ආවෙ කියලා උස් ආසනයක් බුදුරජාණන් වහන්සේට පනවලා, බුදුරජාණන් වහන්සේ වැඩ හුන්නට පස්සේ මිටි ආසනයක හිඳගත්තා. ඉඳගත්තහම බුදුරජාණන් වහන්සේ පොට්ඨපාද පරිබ්‍රාජකයාගෙන් අහනවා, ''පොට්ඨපාද, මම එන වෙලාව වෙනකොට ඔබ හැම මොන වගේ කථාවකද, කොයි විදියේ කථාවකද යෙදිල හිටියේ'' කියලා. එතකොට පොට්ඨපාද පරිබ්‍රාජකයා කියනවා, ''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, එබඳු කථාවල් භාග්‍යවතුන් වහන්සේට අහන්න දුර්ලභ නැහැ. ඒ කථාව තිබීයේවා'' කියල වෙන මාතෘකාවක් මතු කරනවා. මොකක්ද ඒ? ඉතාම වැදගත් මාතෘකාවක්. ස්වාමීනි, මේ පසුගිය දවස්වල කුතුහල ශාලාව නමැති ඒ කාලයේ නොයෙකුත් ශ්‍රමණ බ්‍රාහ්මණයින්ට එකතු වෙලා රැස්වීම් පවත්වන්න ඉඩ තිබුණු කුතුහල ශාලාවේ රැස් වූ ශ්‍රමණ බ්‍රාහමණ පිරිස අතර මෙන්න මෙබඳු කථාවක් මතු වුණා. 'කෙසේද අභිසඤ්ඤා

නිරෝධය වෙන්නේ'. අභිසඤ්ඤා නිරෝධය කියල කියන්නේ පින්වතුනි සඤ්ඤාවේ ඉහළ මට්ටම් නිරුද්ධ වීම. ඒක කෙසේ වෙන එකක්ද කියල. පොට්ඨපාද තව දුරටත් කියනවා මේ මාතෘකාව මතු උනහම ඇතැම් කෙනෙක් මේ විදියට කිව්වා 'අහෙතු අප්පච්චයා' ඒ කියන්නේ හේතු ප්‍රත්‍ය කිසිවක් නැතිවයි සඤ්ඤාව පුරුෂයකු තුළට ඇතුල් වෙන්නෙත් පිට වෙන්නෙත්, සඤ්ඤාව ඇතුල් වුණහම ඒ පුද්ගලයා සඤ්ඤී වෙනවා. පිට උනහම අසඤ්ඤී වෙනවා. ඔන්න එකගොල්ලක් කියාපු මතය.

එතකොට තව ගොල්ලක් කියනවා ''නැහැ ඒක එහෙම නොවෙයි වෙන්නෙ. සඤ්ඤාව පුරුෂයාගේ ආත්මයයි. ඒ ආත්මය ඇතුල් වෙනවා පිට වෙනවා. ඇතුල් වෙන අවස්ථාවේදී ඒ පුද්ගලයා සඤ්ඤී වෙනවා. පිට උනහම අසඤ්ඤී වෙනවා.'' ඔන්න ඒගොල්ලො කියන අභිසඤ්ඤා නිරෝධය. තුන්වෙනි ගොල්ලක් කියනවා. ''නැහැ නැහැ එහෙම නොවෙයි වෙන්නේ. බොහොම ඍද්ධිමත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවා. මහානුභාව සම්පන්න. ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයින් අර පුද්ගලයා තුළට සඤ්ඤාව ඇතුල් කරනවා පිට කරනවා. සඤ්ඤාව ඇතුල් කළ හැටියෙම ඒ පුද්ගලයා සඤ්ඤී වෙනවා. පිට කළහම ඒ අවස්ථාවේදී අසඤ්ඤී වෙනවා.'' හතරවෙනි කොටසක් කියනවා ''නැහැ නැහැ එහෙම නොවෙයි. මහා ඍද්ධිමත් මහානුභාව සම්පන්න දේවතාවුන් ඉන්නවා. දේවතාවුන් අර පුද්ගලයාගේ හිත ඇතුළට සඤ්ඤාව ඇතුල් කළහම සඤ්ඤී වෙනවා. පිට කළහම අසඤ්ඤී වෙනවා.'' මේ කථාවල් අහන් හිටියම භාග්‍යවතුනි, -මේ පොට්ඨපාද කියනවා- මට භාග්‍යවතුන් වහන්සේ සිහිපත් වුනා. මේ අභිසඤ්ඤා නිරෝධය පිළිබඳ පිරිසිදු අවබෝධයක් ඇති භාග්‍යවතුන් වහන්සේ මට සිහියට නැගුණා කියලා ඊළඟට කෙළින්ම ප්‍රශ්නය ඉදිරිපත් කරනවා. **''කෙසේද භාග්‍යවතුන් වහන්ස, කෙසේද ස්වාමීනී, අභිසඤ්ඤා නිරෝධය වන්නේ?''**

දැන් බුදුරජාණන් වහන්සේගේ පිළිතුර පිළිබඳ කථාන්තරය ඉදිරිපත් කරන්න කලින් මේ පින්වතුන්ට අතුරු කාරණයක් මතු කරන්න වෙනවා බුදුරජාණන් වහන්සේගේ දේශනාවල් ඇගැයීමට උපකාර වෙන. මේ කාලය වන විට භාරතයේ යෝගී චින්තනය එක්තරා තීරණාත්මක තැනකට ඇවිල්ලා, ප්‍රශ්නකර තැනකට ඇවිල්ලා, උභතෝකෝටික

තත්ත්‍වයකට පත් වෙලයි හිටියේ. ඒ අය සඤ්ඤාවේ ඉතාම ඉහළ මට්ටමට ගියා. දැන් මේ පින්වතුන් අහල තියනවා ඒ යුගය වෙනකොට භාරතයේ නෙවසඤ්ඤානාසඤ්ඤායතන කියන උතුම් තත්ත්වයට ගිය අයත් හිටියා. අහල තියනවනෙ අපේ බෝධිසත්ත්ව සිද්ධාර්ථ කුමාරයෝ අභිනිෂ්ක්‍රමණය කරල සොයාගෙන ගිය ආචාර්යවරු දෙන්න ගැන, ආළාරකාලාම උද්දකරාමපුත්ත. ඉන් ආළාරකාලාම කියන ආචාර්යවරයා ආකිඤ්චඤ්ඤායතන කියන අරූප ධ්‍යාන තත්වය ලබාගෙන හිටියා. උද්දකරාම පුත්ත ආචාර්යවරයා නෙවසඤ්ඤා නාසඤ්ඤායතන කියන ඉහළම අරූප ධ්‍යාන තත්ත්‍වය ලබාගෙන හිටියා. නමුත් මේ පින්වතුන් අහල තියනවා අපේ බෝධිසත්ත්වයන් වහන්සේ ඒ ආචාර්යවරු දෙන්නා තොල් සොලවන කොට, වචන කීපයක් කථා කරනකොට, ඒ ඔක්කොම තත්ත්‍ව ලබාගෙන ඒ අය ආචාර්ය තත්ත්‍වයෙන් පුදද්දීම 'මෙතන නිවන නෑ' කියලා නික්මිලා ගියා. අන්න ඒකෙන් අපට යමක් හිතාගන්න තියෙනවා. ඒ අය හිටියේ එක්තරා තීරණාත්මක තැනක, උත්තරයක් නැති ප්‍රශ්නයක. ඒ උත්තරයක් නැති ප්‍රශ්නය මැදුම් සඟියේ පඤ්චත්තය සූත්‍රයෙ[3] කෙටියෙන් සඳහන් වෙනවා මෙන්න මෙහෙම,

**''සඤ්ඤාරොගො, සඤ්ඤා ගණ්ඩො, සඤ්ඤා සල්ලං, අසඤ්ඤා සම්මොහො, එතං සන්තං එතං පණීතං යදිදං නෙවසඤ්ඤානාසඤ්ඤන්ති''** ඒකෙ තේරුම - ඒ අයට තේරුණා මේ සඤ්ඤාව මහා කරදරයක්. සඤ්ඤාව රෝගයක්, සඤ්ඤාව ගඩක්, සඤ්ඤාව උලක්, නමුත් අනිත් පැත්ත බලනකොට අසඤ්ඤා සම්මොහො, සඤ්ඤාව නැති වීම තුළින් මෝහයට වැටෙනවා. ඒක නිසා ඒකට අතරමැදි තත්ත්‍වයක් හැටියට විසඳුම මොකක්ද නෙවසඤ්ඤානාසඤ්ඤාවයි. සඤ්ඤාව ඇත්තෙත් නැහැ නැත්තෙත් නැහැ. අපි පසුගිය දේශනයකින් මේ පින්වතුන්ට ඒක උපමා කළේ 'සී සෝ' පැදිල්ලක් කියලා. කොටින්ම කියතොත් ඒ යෝගීන් 'සී සෝ' පදිමින් හිටියේ සඤ්ඤාවද අසඤ්ඤාවද කියලා. ඔන්න ඔහොම තත්ත්‍වයක් පවතිමින් තිබියදී බුදුරජාණන් වහන්සේ ඉදිරියේ මේ ප්‍රශ්නය තැබුවේ. බුදුරජාණන් වහන්සේ පිළිතුරු දෙන ආකාරය බලමු. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා පළමුවෙන්ම 'පොට්ඨපාද, යම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් කිව්ව නම් අහේතු අප්‍රත්‍යව, හේතු ප්‍රත්‍ය කිසිවක් නැතිව සඤ්ඤාව ඇති වනවය පුරුෂයෙකුට කියලා, ඒ අය මුලම වරද්දා

ගත්තා. මොකද හේතුව, බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. ධර්මානුකූල නිගමනය ''සහෙතුහි පොට්ඨපාද සප්පච්චයා පුරිසස්ස සඤ්ඤා උප්පජ්ජන්ති පි නිරුජ්ඣන්ති'පි'', හේතු ප්‍රත්‍ය සහිතවයි, පුරුෂයෙකුට සඤ්ඤාව ඇති වෙන්නෙත් නිරුද්ධ වෙන්නෙත්. ඔන්න ඊළඟට වටිනා සිද්ධාන්තමය පාඨයක් සඳහන් වෙනවා. මේ පින්වතුන් හොඳට ඒක සිතෙහි දරාගන්න නැවත නැවත සින්දුවක ධ්‍රැව පදය වගේ. නැවත නැවත බුදුරජාණන් වහන්සේගේ විවරණයේ ඒ සිද්ධාන්ත පාඨය මතු වෙනවා. මොකක්ද ඒ පාඨය ''**සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජන්ති සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣන්ති**''. ''**සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජන්ති**'' කියන්නේ ශික්ෂාව තුළින් ශික්ෂණය තුළින් ඇතැම් සඤ්ඤාවෝ උපදිත්. ''**සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣන්ති**'' කියන්නේ ශික්ෂාව තුළින් ඇතැම් සඤ්ඤාවෝ නිරුද්ධ වෙත්.

ඔන්න ඒ සිද්ධාන්තය මතු කරලා ඊළඟට බුදුරජාණන් වහන්සේ විසින්ම ඒ සිද්ධාන්තය ස්ඵුට කිරීමට, ඒක ඔප්පු කිරීමට ප්‍රකාශ කරනවා මෙන්න මෙහෙම. කුමක්ද ඒ ශික්ෂාව කියලා බුදුරජාණන් වහන්සේ දක්වනවා. ඒක බොහෝ තැන්වල සඳහන් වෙන නිසා, ප්‍රකාශ කෙරෙන නිසා, අපි කෙටියෙන් දක්වුවොත්/තථාගත සම්මා සම්බුදු කෙනෙක් ලෝකයේ උපදිනවා. උන්වහන්සේ ඉපදිලා දෙවියන් මරුන් බඹුන් සහිත, ශ්‍රමණ බ්‍රාහ්මණයින් සහිත, මේ ලෝකයේ යථා ස්වභාවය අභිඤ්ඤාවෙන් ප්‍රත්‍යක්ෂ කර දැන වදාරලා, මුල මැද අග යහපත් වූ ධර්මයක් දේශනා කරනවා. ඒ දේශනාව අහනවා යම් කිසි ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක්, අහල ශ්‍රද්ධාව ඇති කරගන්නවා. ශ්‍රද්ධාව ඇති කරගෙන ශාසනයේ පැවිදි වෙනවා. ශාසනයේ පැවිදි වෙලා සීල සම්පන්න වෙනවා. ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත වෙනවා. සති සම්පජඤ්ඤයෙන් යුක්ත වෙනවා. සන්තුට්ඨි ගුණයෙන් යුක්ත වෙනවා. එහෙම යුක්ත වෙලා විවේකයට ගිහිල්ලා තමන්ගේ හිත අභිජ්ඣා, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා කියන නීවරණ ධර්මයන්ගෙන් මුදාගන්නවා. අභිජ්ඣා කියන්නේ කාමච්ඡන්දය හැටියට සමහර තැන්වල සඳහන් වෙනවා. මේ නීවරණ ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරගන්නවා. එතන ඉඳලම තියනවා පටිච්ච සමුප්පාදය ක්‍රියාත්මක වෙන හැටි. මේ පින්වතුන්ට බලාගන්න පුළුවන් ධ්‍යානයට ළං වන ආකාරය මේ විදියටයි සඳහන් වෙන්නේ. ඒ

භික්ෂුව තමා තුළ නීවරණ ප්‍රහීණ වූ බව ප්‍රත්‍යවේක්ෂා කරල බලනකොට, හිතල බලනකොට, ප්‍රමෝදයක් එනවා දැඩි සතුටක්. ඒ දැඩි සතුට සන්සුන් කරගෙන ප්‍රීතියක් බවට හරවාගන්නවා.

ප්‍රීතිය ඇති සිතෙහි කය සන්සුන් වෙනවා. ප්‍රීතිමත් සිතක් ඇති නිසා සන්සුන් වූ කය තුළින් සියුම් සුවයක් විඳිනවා. ඒ සුවය තුළින් සිත සමාධිමත් වෙනවා. ඊළඟට ඒ භික්ෂුව පිළිබඳව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ මෙහෙමයි. ඒ භික්ෂුව කාමයන්ගෙනුත් අකුසල ධර්මයන්ගෙනුත් සිත මුදාගෙන විතක්ක විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීති සුඛය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරනවා. ඔන්න එතනදී ආයෙත් අර සිද්ධාන්තය මතු කරනවා බුදුරජාණන් වහන්සේ. ඒ භික්ෂුවගේ කලින් යම් කාම සඤ්ඤාවක් තිබුණ නම් එය නිරුද්ධ වුනා අර ශික්ෂණය තුළින්. ඒ වෙනුවට විවේකජපීතිසුඛ සුඛුමසච්ච සඤ්ඤා කියල කියන ප්‍රථම ධ්‍යානයට අයිති ඒ කාමයන්ගෙන් ඉවත් වීම කියල කියන විවේකයෙන් හටගත් ප්‍රීති සුඛය ඇති සියුම් සච්ච සඤ්ඤාව ඇතෙයි කියල කියන සඤ්ඤාව ඒ භික්ෂුව තුළ ඇති වෙනවා. බුදුරජාණන් වහන්සේ ආයිත් තහවුරු කරනවා අර පාඨයෙන් 'එවම්පි සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජන්ති සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣන්ති'. මෙසේමය පොට්ඨපාද මේ විදියට තමයි ශික්ෂාවෙන් ඇතැම් සඤ්ඤා උපදින්නේත් ඇතැම් සඤ්ඤාවල් නිරුද්ධ වෙන්නෙත්. ඔන්න ඊළඟට දෙවෙනි ධ්‍යානයට යන හැටි කෙටියෙන් සලකාගන්න මේ පින්වතුන්. ඒ ගැන කොතෙකුත් කියලත් ඇති. ඒකෙ ගොරෝසු පැත්ත ඒ ප්‍රථම ධ්‍යානය නැවත නැවත පුරුදු කරනකොට ඒ යෝගියාට තේරෙනවා ඇතැම් අංග ගොරෝසු, රළු, හැටියට. ඒවා තමයි පළමුවෙන්ම විතක්ක විචාර. ඒක නිසා ඒ දෙවෙනි ධ්‍යානයේදී කරන්නේ ඒ විතක්ක විචාර සංසිඳවීමෙන් ඒ වෙනුවට සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයක් මතු කර ගන්නවා. ඒ භික්ෂුව පිළිබඳව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ, ඒ භික්ෂුවට කලින් තිබුණු විවේකජපීතිසුඛ සුඛුමසච්ච සඤ්ඤා කියන විවේකයෙන් හටගත් ප්‍රීති සුඛය ඇති ප්‍රථම ධ්‍යානය පිළිබඳ සඤ්ඤාව නිරුද්ධ වෙනවා. ඒ වෙනුවට සමාධියෙන් හටගත් ප්‍රීතිය පිළිබඳ සමාධිජපීති සුඛ සුඛුමසච්ච සඤ්ඤාව ඇති වෙනවා.

'එවම්පි සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජන්ති, සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣන්ති.' ඔන්න ඔය විදියටයි එක ශික්ෂාවකින් සඤ්ඤා මට්ටමක්

අතහැරෙන්නේ. එක සඤ්ඤා මට්ටමකට පත් වෙන්නේ. ඊළඟට තුන්වෙනි ධ්‍යානය. ඒකෙදිත් කෙටියෙන් සලකගන්න භික්ෂුවට තේරෙනවා ප්‍රීතිය කියන එකත් ගොරෝසු වැඩියි. ප්‍රීතිය ඉවත් කිරීමෙන් එතන කියන්නේ 'උපෙක්ඛා සුඛ' අමුතු විදියේ උපෙක්ඛා සුඛයක් භුක්ති විඳිනවා. ඒ තුන්වන ධ්‍යාන අවස්ථාවේ ඒ භික්ෂුව පිළිබඳව කියවෙනවා. උපෙක්ඛාසුඛ සුඛුමසච්ච සඤ්ඤාව ඇති වෙනවා කියලා. අර කලින් තිබුණු සමාධිජපීතිසුඛසුඛුමසච්ච සඤ්ඤාව නැති වෙනවා. ඒක නිරුද්ධ වෙනවා. ඒ වෙනුවට උපෙක්ඛාසුඛසුඛුමසච්චසඤ්ඤා කියන තෘතීය ධ්‍යානයට අයිති ඒ සඤ්ඤාව ඒ භික්ෂුවට ඇති වෙනවා. ඒ පිළිබඳව සඤ්ඤී වෙනවා ඒක දැනගන්නවා. ඔන්න ඊළඟට කියනවා තෘතීය ධ්‍යානයේ තියන ඒ සැපත් දුක් සොම්නස් දොම්නස් සියල්ලමත් ඉවත් කරලා ඊටත් වඩා සියුම් වූ අදුක්ඛමසුඛ සුඛුමසච්ච සඤ්ඤාව ඇතිකර ගන්නවා චතුර්ථ ධ්‍යාන අවසථාවේදී. ඒ භික්ෂුව ගැන කියවෙන්නේ අර කලින් තිබුණු උපෙක්ඛා සුඛ සුඛුමසච්ච සඤ්ඤාව නිරුද්ධ වෙනවා. ඒ වෙනුවට 'අදුක්ඛමසුඛ' නොදුක් නොසුව සියුම් සච්චසඤ්ඤාව ඇති වෙනවා. එතකොට ඒ වෙනකොට සතරවෙනි ධ්‍යානයට ඇවිල්ලා.

රූප ධ්‍යාන සමතික්‍රමණය කරන හැටි ඊළඟට දැක්වෙනවා. ඒ භික්ෂුව රූප සඤ්ඤාවන් ඉක්මවීමෙන් රූප සඤ්ඤාවත් එක්ක යන පටිඝ සඤ්ඤාව කෙළවර කිරීමෙන් ඒ එක්කම යන නානත්තසඤ්ඤා යන විවිධත්වය පිළිබඳ සඤ්ඤාව මෙනෙහි නොකිරීමෙන් ආකාශය අනන්තයි ආකාශය අනන්තයි කියලා ඒ නිමිත්ත අරගත්තු ආකාසානඤ්චායතන සමාපත්තියට සමවදිනවා. ඒ භික්ෂුව පිළිබඳව තිබෙන ධර්මතාව පටිච්ච සමුප්පාද ධර්මයට අනුව දැක්වෙනවා. ඒ භික්ෂුවට කලින් තිබුණු රූපසඤ්ඤාව නිරුද්ධයි. ඒ වෙනුවට ආකාසානඤ්චායතන සුඛුමසච්ච සඤ්ඤාව, ආකාසානඤ්චායතනය පිළිබඳ සියුම් සැප සඤ්ඤාව ඇති වෙනවා. ඔය අරූප ධ්‍යාන වශයෙන් තියන පළවෙනි එක.

ඊළඟට කියවෙනවා ඒ භික්ෂුව ආකාසානඤ්චායතනය කියන එකත් ඉක්මවලා ඒ ආකාසයට යොමු වුණ විඤ්ඤාණය අනන්තයි විඤ්ඤාණය අනන්තයි කියලා විඤ්ඤාණඤ්චායතනයට පත් වෙනවා. පත් උනහම ඒ භික්ෂුව පිළිබඳ වෙනස දක්වන්නේ කලින් තිබුණ ආකාසානඤ්චායතනය

පිළිබඳ සුඛුමසචච සඤ්ඤාව නිරුද්ධ වෙනවා. ඒ වෙනුවට විඤ්ඤාණඤ්චායතනය පිළිබඳ සුඛුමසචච සඤ්ඤාව මතු වෙනවා. ඒකත් බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා 'එවමපි සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජති. සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣති.' පොට්ඨපාද මෙන්න මේ විදියටයි ශික්ෂාවෙන්ය, සඤ්ඤාමට්ටමක් නිරුද්ධ වෙන්නෙත් උපදින්නෙත් කියල ඊළඟට එනවා අමුතු අවස්ථාවක්. ඒ භික්ෂුව විඤ්ඤාණඤ්චායතනයත් ඉක්මවල කිසිවක් නැත කියන 'නත්ථි කිඤ්චි' නත්ථි කිඤ්චි' කියන එක නිමිත්ත කරගෙන ඉතාමත්ම සියුම් වූ ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට පත්වෙනවා. ඒ භික්ෂුව පිළිබඳව මෙන්න මෙහෙමයි සඳහන් වෙන්නේ.

කලින් තිබුන විඤ්ඤාණඤ්චායතන සුඛුමසචච සඤ්ඤාව නිරුද්ධයි. ඒ වෙනුවට ආකිඤ්චඤ්ඤායතනය පිළිබඳ සුඛුමසචච සඤ්ඤාව ඇති වෙනවා අර ශික්ෂාව තුළින්. එතන ඉඳල තියනව අමුතුම සන්ධිස්ථානයක්. ඇතැම් පින්වතුන් අහලත් ඇති අර අරූප ධ්‍යාන නෙවසඤ්ඤානාසඤ්ඤායතනය තිබුණට මොකද ඒක සියුම් වැඩියි විදර්ශනාවට පාදක කරගන්න. ආකිඤ්චඤ්ඤායතනය තමයි මධ්‍යස්ථානය. එතන ඉඳලයි නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට අධිෂ්ඨාන කරගන්නේ, ඒක කරනව නම්. එහෙම නැත්නම් නිරෝධයට පත් වෙන්නෙ. එතකොට නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙ ඒ 'සී සෝ' පැදිල්ල වෙනුවට මේ භික්ෂුව කරන ඒ චින්තනය ඉතාමත්ම වටිනවා හොඳට මතක තියාගන්න. මේ ශාසනයේ යන භික්ෂුව යෝගීන් වගේ නොවෙයි. ඒ භික්ෂුව කල්පනා කරනව මෙහෙම. ඒ ආකිඤ්චඤ්ඤායතනය දක්වල තියෙන්නේ ශාසනයේ 'සඤ්ඤග්ග' කියල. මොකද ලෞකික සඤ්ඤාවල කෙළවරයි. 'නත්ථි කිඤ්චි' 'නත්ථි කිඤ්චි තමයි' ලෞකික සඤ්ඤාවල කෙළවර. එතකොට ඒකට සඤ්ඤග්ග නාමය ලැබෙනවා. සඤ්ඤග්ගයේ සිටියා වූ ඒ භික්ෂුවට මෙහෙම සිතිවිල්ලක් ඇති වෙනවා. '**චෙතයමානස්ස මෙ පාපියො අචෙතයමානස්ස මෙ සෙය්‍යො**' මේ චේතනා ඇති වීම මහ කරදරයක්, චේතනා නැති කරනවා නම් හොඳයි කියල. මම චේතනා අභිසංස්කාර ඇති කරගන්නව නම් මේ ඇති වුණ සියුම් සඤ්ඤාවල් නිරුද්ධ වෙනවා ඒ වෙනුවට ඕළාරික ගොරෝසු සඤ්ඤා ඇති වෙන්න පුළුවන්. ඒ නිසා ඔන්න කල්පනා කරලා තීරණයක් ගන්නවා,

අධිෂ්ඨානයක් ඇතිකර ගන්නවා **'යනූනාහං න චෙව චෙතෙය්‍යං න චාභිසංඛරෙය්‍යන්ති'**. මම චෙතනාභිසංඛාර නූපදවන්නෙම් නම් යෙහෙකි කියල හිතලා සාමාන්‍ය කෙනෙකුට කරන්න බැරි දෙයක් ඒ අවස්ථාවේ දී කරනවා. ඒ භික්ෂුව ඉතාම සියුම් සඤ්ඤා තත්ත්වයක් නිසා **'සො න චෙව චෙතෙති න චාභිසංඛරොති'**. ඒ භික්ෂුව චේතනාව ඇති කරන්නෙත් නැහැ. අභිසංස්කරණය කරන්නෙත් නැහැ. එතකොට මොකක්ද වෙන්නේ?

ඔන්න බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා. ඒ භික්ෂුවට අර කලින් තිබුණ ආකිඤ්චඤ්ඤායතන සඤ්ඤාව නිරුද්ධ වුණා. ඒ වෙනුවට වෙන සඤ්ඤාවක් මතු උනෙත් නැහැ. ඒ වෙනුවට මොකක්ද වුනේ. **'සො නිරොධං ඵුසති'**. ඒ භික්ෂුව නිරෝධය ස්පර්ශ කරනවා. එතකොට තමයි ඒ විස්තර ඉවර කරලා හකුළුවා දක්වන්නේ බුදුරජාණන් වහන්සේ මෙන්න මේ වාක්‍යයෙන්. **''එවං ඛො පොට්ඨපාද 'අනුපුබ්බාභිසඤ්ඤානිරොධසම්පජානසමාපත්ති හොති''** මහ දිග වාක්‍යයක්, ඒක විග්‍රහ කරල තේරුම් කරගන්න වෙනවා. මෙසේය පොට්ඨපාද අනුපුබ්බා'භිසඤ්ඤා නිරොධසම්පජානසමාපත්තිය වෙන්නේ. අනුපුබ්බ කියන්නේ අනුපිළිවෙලින්. අභිසඤ්ඤා කියන එක අපි කිව්වා ඒ සඤ්ඤාවල උසස් මට්ටම්. අනුපුබ්බාභි සඤ්ඤා නිරෝධය ඒක. නිරෝධය කිරීම පිළිබඳ සම්පජානසමාපත්ති. සම්පජඤ්ඤයෙන් යුක්තව කෙරෙන සමවැදීම සිදු වන්නේ මේ ආකාරයෙන්. අනුපුබ්බ කියන වචනය ගැනත් පොඩි අටුවාවක් දුන්නොත් මේ අවස්ථාවේදී, මේ ශාසනයේ ඉතාම වටිනා වචනයක් ප්‍රතිපදාව පිළිබඳව 'අනුපුබ්බ' කියන එක. ඇතැම් තැන්වල දකල ඇති මේ පින්වතුන් අහල ඇති. **අනුපුබ්බ සික්ඛා, අනුපුබ්බ කිරියා, අනුපුබ්බ පටිපදා**4. මේ ශාසනය තුළ තියෙන්නේ අනුපිළිවෙළින් යන ශික්ෂණයක්. අනුපිළිවෙළින් යන ක්‍රියා පටිපාටියක්. අනුපිළිවෙළින් යන ප්‍රතිපදාවක්. අනුපුබ්බ කියන වචනය තුළ තියනවා පටිච්ච සමුප්පාදය. හිතල බලන්න පඩි පෙළක් ගැන. එකින් එකට, එකින් එකට. ඒකනෙ වෙන්නෙ. අනුපුබ්බාභිසඤ්ඤා ඒ විදියට අනුපිළිවෙළින් ගිහිල්ලා මහ පුදුම විදියට අපි නැවත කියපු ටිකකුත් මතක් කළොත් මේ සූත්‍රයේ නැතත් මේ පින්වතුන් දන්නව ඇති නාමධර්ම ගැන කියනකොට **වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර** ගැන කිව්වා. වේදනා,

සඤ්ඤා, සඤ්ඤා වේදයිත නිරෝධයනෙ එතකොට වේදනා සඤ්ඤා නිරුද්ධ වෙන එකයි මේගොල්ලන්ට ප්‍රශ්නයක් වුණේ. සඤ්ඤාව අතහරින්න බැහැ මුළාවට වැටෙයි කියලා.

**හේතුව මොකද, සංස්කාරයේ එල්ලී සිටිය නිසා. ඒ සංස්කාර එතනදී හඳුන්වන්නේ චේතනා නමින්.** අන්න ඒකයි මෙතන තියෙන්නේ. භික්ෂුව ගත්තු තීරණය පිළිබඳව ''මට චේතනා ඕනත් නැහැ. සංස්කාර ඕනත් නැහැ'' කියලා සිතීම තුළ ඊළඟට වෙන්නෙ මොකක්ද? නිරෝධය ස්පර්ශ කරනවා. රූපය ඔක්කොම ගිහිල්ල ඉවරයිනෙ. නාමධර්ම අනුව ඊළඟට හිතා ගන්න දිගින් දිගට කියන්න බැහැ. විවරණ තව හුඟක් සූත්‍රයේ තිබෙන නිසා. ඒ ඩිංග හිතාගන්න. එතෙක් තිබුණ යෝගීන්ගේ දර්ශනයත් අපේ බෞද්ධ දර්ශනයත් - මධ්‍යම ප්‍රතිපදාත්මක පටිච්ච සමුප්පාදය උඩ යන දර්ශනයත් - අතර වෙනස ඔය ඩිංගෙන් වටහාගන්න. මේ විදියට ප්‍රකාශ කරලා බුදුරජාණන් වහන්සේ අහනවා. **''පොට්ඨපාද, මේ වගේ අනුපුබ්බාභිසඤ්ඤානිරොධ සම්පජානසමාපත්තියක් මීට කලින් අහල තියනවද,'' ''නැතමය ස්වාමීනි. නැතමය ස්වාමීනි.''**

ඔන්න ඒක කිව්වට පස්සෙ පොට්ඨපාද තවත් ප්‍රශ්න කීපයක් මතු කරනවා. එකිනෙක අපි ඉදිරිපත් කරන්න බලමු. පළමුවෙන්ම අහන ප්‍රශ්නයඃ ස්වාමීනි එක සඤ්ඤග්ගයක්ද තියෙන්නේ නැත්නම් සඤ්ඤග්ග කීපයක්ද, ''සඤ්ඤග්ග'' ගැන කිව්වනෙ සඤ්ඤාවන්ගේ කෙළවර ගැන. බුදුරජාණන් වහන්සේ අමුතු පිළිතුරක් දුන්නා. එක සඤ්ඤග්ගයකුත් තියනවා සඤ්ඤග්ග කීපයකුත් තියනවා. එතකොට පොට්ඨපාද අහනවා ''කෙසේද භාග්‍යවතුන් වහන්ස එක සඤ්ඤග්ගයකුත් සඤ්ඤග්ග කීපයකුත් තියෙන්නෙ?'' බුදුරජාණන් වහන්සේ එක්තරා කෙටි පාඨයක් සඳහන් කරනවා. ඒක ඇත්ත වශයෙන් අටුවාවටත් ගැටලුවක්. ''පොට්ඨපාද යම්, යම්, ආකාරයකින් නිරෝධය ස්පර්ශ කරයිද, අන්න ඒ ඒ ආකාරයෙන් සඤ්ඤග්ගත් තියනවා.'' ඕක තේරුම්ගන්න වෙන්නේ මෙහෙමයි අපට වැටහෙන හැටියට. දැන් ධර්මයේ දක්වනවා '**යාවතා සඤ්ඤාසමාපත්ති තාවතා අඤ්ඤාපටිවෙධො**'.[6] යම් තාක් සඤ්ඤා සමාපත්ති තියනවා නම් ඒ තුළින් පුළුවන් අඤ්ඤා කියල කියන අර්හත්වයට, ඒ විනිවිද යන විදර්ශනාව යොදල නිරෝධයට යන්න, නිවන් ලබන්න. ඒක නිසයි මේ

කිව්වේ. මේ කියාපු අනුපිළිවෙලින් යන නිරෝධය පමණක් සඤ්ඤග්ගය නොවේ. එක් එක් ධ්‍යාන තුළින් උනත් පුළුවන් අර කියාපු ඒ සඤ්ඤා කෙළවර කරන්න, අර චේතනා අභිසංඛාර නැති කරලා. ඒකයි එතන ඒ අදහස ගන්න තියෙන්නේ. ඊළඟට දෙවෙනි ප්‍රශ්නයක් අහනවා පොට්ඨපාද, ''ස්වාමීනි සඤ්ඤාව පළමුවෙන් ඇති වෙනවද ඤාණය පසුව ඇති වෙනවද?, එහෙම නැත්නම් ඤාණය මුලින් ඇති වෙලා සඤ්ඤාව පසුව ඇති වෙනවද, එහෙම නැත්නම් ඒ දෙක එකටම ඇති වෙනවද?'' ඒ කියන්නේ සඤ්ඤාවද පළමුවෙන් ඇති වෙන්නේ. ඤාණය පසුවද? එහෙම නැත්නම් ඤාණය පළමුවෙන් සඤ්ඤාව පසුවට, එහෙම නැත්නම් දෙකම එකට වේද? ඒකට බුදුරජාණන් වහන්සේ කෙලින්ම ප්‍රකාශ කරනවා. ''පොට්ඨපාද සඤ්ඤාව පළමුවෙන් ඇති වෙන්නේ, ඤාණය පසුවයි ඇති වෙන්නේ. සඤ්ඤාව හටගැනීම තුළිනුයි ඤාණයක් ඇති වෙන්නේ.'' ඒ භික්ෂුව තේරුම්ගන්නවා එතනත් පටිච්ච සමුප්පාද ධර්මතාවක් තියන බව. සඤ්ඤුප්පාදා ච පන ඤාණුප්පාදො හොති. සඤ්ඤාවක් හටගැනීමෙනුයි මට ඒ පිළිබඳ ඤාණයක් ඇතිවෙන්නෙ. අපට මෙතනත් අටුවාව ආචාර්ය මත කීපයක් දක්වනවා මේ සියුම් පාඨය ගැන.[7] අපට නම් පෙනෙන හැටියට කියන්න තියෙන්නේ මෙහෙමයි. අතීතයේ තිබුණු ඒ යෝගීන්ගේ ප්‍රශ්නය මොකක්ද, සඤ්ඤාව ගුප්ත දෙයක් හැටියට හිතාගත්තා. එක්කො ආත්මය කිව්වා. නැත්නම් කවුරු හරි ඇතුල් කරන දෙයක් කියලා කිව්වා. ඒ වෙනුවට බුදුරජාණන් වහන්සේ මේ සූත්‍රයේ තවත් වටිනා වචනයක් සඳහන් කරනවා.

යම් අවස්ථාවක භික්ෂුවක් '**සකසඤ්ඤී**' වේද, මේ කියන්නේ තමාගේ සඤ්ඤාව පිළිබඳව. මෙතන කියනව නේ **සම්පජඤ්ඤය** කියල. **එතකොට මුල ඉඳලම යන්නේ සතිසම්පජඤ්ඤය තුළයි. ඒ නිසා අර ගූඪ සංකල්පවලට, ආත්මවලට, තැනක් නැහැ.** ඒ වෙනුවට මොහොතින් මොහොත පටිච්ච සමුප්පාදය අනුවයි යන්නේ කියන එක තේරෙනවා. **මෙතන ග්‍රහණය කරන්න දෙයක් නැහැ. පඩි පෙළක් නගින්න වගේ.** ඒ සඤ්ඤාව සහ ඤාණය පිළිබඳ කථාන්තරයයි තියෙන්නේ. දැන් දිගටම කියනව ඒ සූත්‍රයේ මේ පින්වතුන්ට දැනගන්න මේ පළවෙනි එකයි කියන්නෙ. '**විවේකජපීතිසුඛ සුඛුමසච්ච සඤ්ඤා හොති**' **විවේකජ පීතිසුඛසුඛුමසච්චසඤ්ඤී හොති**' ඔය වචන දෙක බුදුරජාණන් වහන්සේ

යොදනවා, **සඤ්ඤා** හා **සඤ්ජානනා** කියන දෙක, සඤ්ඤාව ඇති වුණා. සඤ්ඤාව ඇති වුන බව. **දැනගැනීම තමයි 'සඤ්ජානනා' කියන්නේ. ඔන්න ඕක තමයි ඤාණය කියල කියන්නේ.** දැන් සඤ්ඤාව ඇති වුනා, සඤ්ඤාව ඇති වුණ බව නොදැනීම නොවෙයි. ඒ සම්පජඤ්ඤය තියන නිසා දැනගන්නවා. ඒකයි මෙතන කියන ඤාණය. නමුත් මේක නොයෙකුත් විදියට අටුවාවෙ එක එක විදියට ආචාර්ය මත දක්වනවා.[8] ඒව ගැන දිගට යන්න ඕන නැහැ. ඒ ප්‍රශ්නෙටත් උත්තර දුන්නා. එතනිනුත් ඉවර වුණේ නැහැ පොට්ඨපාදගේ ප්‍රශ්න.

ඊළඟට අහනවා බොහොම බැරෑරුම් ප්‍රශ්නයක්. සවාමීනි, මේ සඤ්ඤාව පුරුෂයකුගේ ආත්මයද, එහෙම නැත්නම් සඤ්ඤාව වෙන එකක් ආත්මය වෙන එකක් කියන එකද නියම තත්ත්වය. මේක ගැටලු ප්‍රශ්නයක්. නීතිඥයෝ අහනව වගේ. ඒ කියන්නේ සඤ්ඤාව පුරුෂයකුගේ ආත්මයද එහෙම නැත්නම් සඤ්ඤාව වෙන එකක්ද ආත්මය වෙන එකක්ද? කොහේවත් නැති ආත්මයක් මේ ඇතුළට අරගෙන. මොකද තාම සක්කායදිට්ඨිය තියනවනේ. මෙතන ආත්මයක් ගැන කියවුණෙ නැහැනේ. අන්න ඒකයි බුදුරජාණන් වහන්සේට ඉදිරිපත් කළේ ඒ ප්‍රශ්නය. එබඳු ප්‍රශ්න උභතෝකෝටික ප්‍රශ්න. ඒ ප්‍රශ්නවලට කෙලින් උත්තර දෙන්න ගියොත් අමාරුවේ වැටෙනවා. ටිකකට හිතන්න පොඩි නිදර්ශනයක් - අපි කලිනුත් කියාපු එකක්. කිසි දාක මත්පැන් නොබිව්ව රියැදුරෙක් උසාවියේදී නීතිඥයාට ඕනෑකම තියනවා මෙයා මත්පැන් බිව්ව කෙනෙක් කියලා කියවගන්න. කෙටියෙන් උත්තර දෙන්න කියලා 'ඔව්' හෝ 'නෑ' හෝ කියන්න කියලා මිනිහගෙන් අහනවා ''යුෂ්මතා තාම මත්පැන් බොනවද එහෙම නැත්නම් මත්පැන් බීම නවත්තලද'' ඕකට ඔව් කිව්වත්, නෑ කිව්වත්, අමාරුවේ වැටෙනවා. අන්න ඒ වගේ ප්‍රශ්නයක් මේ බුදුරජාණන් වහන්සේ හමුවට ඉදිරිපත් කළේ. බුදුරජාණන් වහන්සේ ඒ ප්‍රශ්නයට අහුවුණේ නැහැ. ඒ වෙනුවට හරි පුදුම වැඩක් උන්වහන්සේ කළේ. **'කුමක්ද පොට්ඨපාද නුඹ ආත්මය කියන්නේ?'** ඔන්න ඔය ආත්මය කියන වචනය කිව්වනෙ. බුදුරජාණන් වහන්සේ දෙන්නේ නැහැ ආත්මයට නිර්වචනයක්. ඇයි බුදුරජාණන් වහන්සේට ආත්ම සංකල්පයක් නැහැනෙ. අලගද්දූපම ආදී සූත්‍රවලදී බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා ආත්මය කියන සංකල්පය **'කෙවල පරිපූරෝ බාල ධම්මො'**[9]

තනිකර මෝඩ අදහසක්- මේ ලෝකයා එල්ලිලා ඉන්න. බුදුරජාණන් වහන්සේට ආත්ම කථාවක් නැහැ. ඒ අටුවාවේ ඊටත් වඩා බරපතළ විදියට පොට්ඨපාදට ගැරහීමක් කරන උපමාවක් දෙනවා[10] අටුවාචාරීන් වහන්සේලා.

ඌරෙක් අරගෙන හොඳට සරසලා නාවලා සුවඳ ආලේප කළාට පස්සේ ඌරා ආයිමත් ගිහිල්ල අශුචි ගොඩේ ලගින්න වගේ පොට්ඨපාද පරිබ්‍රාජකයා මේ තරම් බුදුරජාණන් වහන්සේ අනුපිළිවෙලින් සඤ්ඤා මට්ටම් දක්වලා තියෙද්දිත් ආයිත් ගිහිල්ලා ආත්ම දෘෂ්ටියට පැන්නා. නමුත් බුදුරජාණන් වහන්සේ උත්තර දුන්නේ මෙහෙමයි. මොකක්ද ඔබ ආත්මය හැටියට සලකන්නේ? එතකොට පොට්ඨපාදට උත්තර දෙන්න උනා. ඕවට කියන්නේ **පටිපුච්ඡා ව්‍යාකරණීය ප්‍රශ්න** කියලා. සමහර ප්‍රශ්න තියනවා කෙලින්ම උත්තර දෙන්න පුළුවන්. සමහර ඒවා අර විදියට ප්‍රශ්න අහලා පිරිසිදු කරගන්න ඕන මොකක්ද කියන්නෙ කියල. ඒ විදියේ ප්‍රශ්නයක් මේ. මොකක්ද මේ ආත්මය කියන්නේ? ඔන්න පොට්ඨපාද ඒකට නිර්වචනයක් දෙනවා. මම කියනවා ආත්මය ඕළාරික, රූපී, සතරමහාභූතයන්ගෙන් සමන්විත, රළු ආහාර අනුභව කරන එකක් කියල. කොටින්ම කියතොත් මේ ශරීරය. මේ ශරීරයේ සාමාන්‍ය තත්ත්වයයි එතෙන්දි පොට්ඨපාද ආත්මය හැටියට ගත්තේ. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා ''පොට්ඨපාද ඒක නම් ඔබගේ ආත්මය ඒ ඔබ කියන ආත්මය වෙන එකක්. මේ මම කියන සඤ්ඤාව වෙන එකක්.'' මොකද, හේතුව ඔන්න දක්වනවා. මම කියන සඤ්ඤාවේ තියෙන්නේ මෙන්න මේ විදියේ ධර්මතාවක්. ඔබගේ කථාව කෙසේ වෙතත් තත්ත්වය මේකයි. ඇතැම් සඤ්ඤාවෝ උපදිත්, **ඇතැම් සඤ්ඤාවෝ නිරුද්ධවෙත්. 'අඤ්ඤා'ව සඤ්ඤා උප්පජ්ජන්ති අඤ්ඤාව සඤ්ඤා නිරුජ්ඣන්ති'**. ඒ කියන්නේ එක සඤ්ඤාවන් කොටසක් ඇතුල් වෙලා වෙන සඤ්ඤාවන් කොටසක් නිරුද්ධ වෙනවා. මේක හරි ගැඹුරු කාරණයක්. මොකද ඒ ක්ෂණයෙන් මොහොතක් මොහොතක් පාසා වෙනස් වෙනවනෙ. අපි ටිකකට හිතමු.

ප්‍රථම ධ්‍යානයට පත් වූ අවස්ථාවේ තිබුණ සඤ්ඤාව නොවෙයි ඒක ඉක්මවන අවසථාවේ තියෙන්නේ. ශික්ෂණය තුළින් වෙනස් වෙනවනෙ. අන්න ඒකයි මේ කියන්නේ. **'අඤ්ඤා'ව සඤ්ඤා උප්පජ්ජන්ති අඤ්ඤා'ව**

**සඤ්ඤා නිරුජ්ඣන්ති'** කියන එක සිංහලට නැගුවොත් කියන්න තියෙන්නේ එක සඤ්ඤා මට්ටමක් ඇති වෙනවා වෙන සඤ්ඤා මට්ටමක් නැති වෙලා යනවා, ඒක තුළ ආත්ම කථාවට ඉඩක් නැහැ කියන එකයි. එතකොට පොට්ඨපාද කියනවා ''නැහැ නැහැ මම කියනව මේ ආත්මය මනෝමයයි කියල. මනෝමය අඟ පසඟ ඉන්ද්‍රිය ඇති'' ඒ කියන්නේ රූප ධ්‍යාන තත්ත්වයයි. ඒ හඟවන්නේ ඒගොල්ලන්ගෙ සංකල්පය. එතකොට බුදුරජාණන් වහන්සේ කියනවා මම කියන සඤ්ඤාව වෙන එකක්, ඔබ කියන ආත්මය වෙන එකක්. ඊළඟට කියනවා ඒක බැරි වුනහම ''මම කියනව ඒ ආත්මය 'අරූපී සඤ්ඤාමය' සඤ්ඤාව ඇති අරූපී තත්ත්වයක් කියලා. ඒකටත් බුදුරජාණන් වහන්සේ කියනවා ඒකත් නොවෙයි මෙතනදී තියෙන්නේ සඤ්ඤා ප්‍රශ්නයක් කියල. එහෙම කිව්වට පස්සෙ පොට්ඨපාදට කර කියාගන්න දෙයක් නැතිව අහනව බුදුරජාණන් වහන්සේගෙන් ''භාග්‍යවතුන් වහන්ස, මට දැනගන්න බැරිද මේ සඤ්ඤාව පුරුෂයාගේ ආත්මයද, නැත්නම් සඤ්ඤාව වෙන එකක්ද ආත්මය වෙන එකක්ද කියල.''

බුදුරජාණන් වහන්සේ කියනවා. ''ඔබට ඒක තේරුම්ගන්න බැහැ. මොකද ඔබ අන්‍ය දෘෂ්ටියක් අරගෙන අන්‍ය ආචාර්යවරුන් යටතේ ඉන්නෙ. එවැනි කෙනෙකුට මේ ධර්මය තේරුම්ගන්න බැහැ.'' ඔන්න එතකොට පොට්ඨපාද අහනවා, ''භාග්‍යවතුන් වහන්ස මට ඒ ටික තේරුම් ගන්න බැරිනම් මට මේ ටිකට උත්තර දෙන්න'' කියලා. මේ පොත්පත් කියවන පින්වතුන් දන්නවා ඇති බුදුරජාණන් වහන්සේට බොහෝ දෙනා ඉදිරිපත් කරපු අව්‍යාකත ප්‍රශ්න කියලා පැත්තක තැබූ ප්‍රශ්න දහය. අපි මේවා ගැන කලින් දේශනාවල කියල තියනවා, ඇයි බුදුරජාණන් වහන්සේ මේවා පැත්තකින් තිබ්බෙ කියලා. කෙසේ නමුත් පොට්ඨපාද මේ ප්‍රශ්න ඉදිරිපත් කරනවා. ඒ මොනවද - කෙටියෙන් සළකගන්න ලෝකය සදාකාලිකද, මෙය පමණක් සත්‍යය අනික් සියල්ල බොරුය, එහෙම නැත්නම් ලෝකය සදාකාලික නොවේද ඒ දෙක -උභතෝකෝටික ප්‍රශ්නයක් එතන තියෙන්නේ. ඊළඟට කියනවා ලෝකයේ කෙළවරක් තියෙනවද ලෝකයේ කෙළවරක් නැද්ද, ආයිත් උභතෝකෝටික ජෝඩුවක්. ඊළඟට කියනවා 'තං ජීවං තං සරීරං, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං' ජීවයයි ශරීරයයි එකමයි එහෙම නැත්නම් (ජීවය

කියල කියන්නේ ආත්මය.) ආත්මය අනිකක් ශරීරය අනිකක්. ඒකත් උභතෝකෝටිකයි. ඊළඟට කියනවා චතුෂ්කෝටික කියල කියන සතර කොන් ප්‍රශ්නය. තථාගත තෙම මරණින් මතු වෙයි. මරණින් මතු නොවෙයි. මරණින් මතු වෙයි සහ නොවෙයි. මරණින් මතු වෙයිත් නොවෙයි, නොවෙයිත් නොවෙයි. **මේ දෙකොන් සතරකොන් ප්‍රශ්නවලින් එකකින්වත් බුදුරජාණන් වහන්සේ කොන් කරන්න බැරි වුනා.** ඒ නිසා බුදුරජාණන් වහන්සේ ඒ ඔක්කොම පැත්තකින් තිබ්බා, හැම තැනම මේ ප්‍රශ්න නගන අවස්ථාවලදී ඒවා පැත්තකින් තිබ්බා. ඒවා අව්‍යාකත කියලා. මම ඒවාට පිළිතුරු දෙන්නෙ නැහැ කියලා. ඒ ප්‍රශ්න ඉවත් කළේ ඒවායේ පදනම වැරදි නිසා.

හැබැයි පොට්ඨපාද අහනවා භාග්‍යවතුන් වහන්සේ ඒකාන්ත වශයෙන් යමක් දේශනා කරල තියනවද, ඔව්, මම දේශනා කරල තියනවා දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග, ඒ ඒකාන්ත දේශනායි. අරවා මම පැත්තකින් තියනවා. ඊළඟට පොට්ඨපාද කියනවා 'එවමෙතං භගවා, එවමෙතං සුගත' ''එහෙම වෙන්න පුළුවන්. එහෙම තමයි භාග්‍යවතුන් වහන්ස'' කියලා. භාග්‍යවතුන් වහන්සේ වැඩියට කමක් නැහැ කියලා, යම් කිසි සඥාඥාවක් දුන්නා බුදුරජාණන් වහන්සේ තවම පිණ්ඩපාතයට වැඩියෙත් නැහැනේ. උන්වහන්සේ ආසනයෙන් නැගිටලා පිටත් වුණා විතරයි. පොට්ඨපාදගේ පිරිස පොට්ඨපාද වට කරගෙන - එතන කියවෙන හැටියට -වචන නමැති උල්වලින් අනින්න පටන්ගත්තා. විවේචනය කරන්න පටන්ගත්තා. ''හා හා ඇයි ශ්‍රමණ ගෞතමයන් කියන කියන එකට 'එවමෙතං භගවා, එවමෙතං සුගත' කිව්වෙ. අපට නම් පේන්නෙ නැහැ එකකටවත් කෙලින් පිළිතුරු දුන්න කියල.'' එහෙම ගර්හා කළහම පොට්ඨපාද කියනවා, මටත් පේන්නෙ නැහැ ඒ අව්‍යාකත ප්‍රශ්නවලට කෙලින්ම ඒකාන්තව පිළිතුරු දුන්න බවක්. නමුත් ශ්‍රමණ භවත් ගෞතමයින් සත්‍ය වූ ප්‍රතිපදාවක් දේශනා කරනවා. ධර්ම නියාමතාවක් මතු කරල දෙනවා. ඒ නිසා කෙසේද මා වැනි නුවණැත්තෙක් එබඳු දේවල් කියනකොට ඒවා අනුමෝදන් නොවී ඉන්නෙ?''

ඔන්න ඒ සාකච්ඡා වාරය එතනින් ඉවරයි. ඔන්න එතන ඉඳලා වෙන සිදුවීම් ඒ සූත්‍රයේ සඳහන් වෙන්නේ මෙහෙමයි. දින දෙක තුනකට පස්සේ චිත්තහත්ථිසාරිපුත්ත - ඒ කියන්නේ ඇත්ගොවුවෙකුගේ පුතෙක් - ඒ

චිත්තහත්ථිසාරිපුත්ත සහ පොට්ඨපාද පරිබ්‍රාජකයා කියන දෙන්නම බුදුරජාණන් වහන්සේ දකින්න ආවා. ඇවිල්ලා පළමුවෙන්ම පොට්ඨපාද පරිබ්‍රාජක කිව්වෙ ''භාග්‍යවතුන් වහන්ස එදා භාග්‍යවතුන් වහන්සේ වැඩිය හැටියේම මගේ මේ පිරිස එකතු වෙලා මට හොඳටම අනින්න පටන්ගත්තා'' කියලා. ඒ කතන්දරය කිව්වාම බුදුරජාණන් වහන්සේ කියනවා. ''පොට්ඨපාද ඒ ඔක්කොම අන්ධයි අචක්ඛුකයි, ඒ අයට ඇස් නැහැ. ඔබට විතරයි ඇස් තියෙන්නේ'' කියල ඔන්න ඊළඟට ප්‍රකාශ කරනවා. ''මා විසින් ඒකංසිකවත් ධර්‍ම දේශනා කරල තියනවා අනේකංසිකවත් ධර්‍ම දේශනා කරලා තියනව'' කියල අර කාරණය තහවුරු කරල බුදුරජාණන් වහන්සේ ඒ අවස්ථාවේදී අමුතු කාරණයක් ඉදිරිපත් කරනවා. ඔය ආත්ම ප්‍රශ්නය පිළිබඳව තමන් වහන්සේගේ අත්දැකීමක් වගේ ප්‍රකාශ කරනවා. ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවා මෙන්න මෙහෙම දෘෂ්ටියක් ඉදිරිපත් කරන, මෙහෙම වාදයක් නගන. මොකක්ද 'එකන්ත සුඛී අත්තා හොති, අරොගො පරම්මරණාති' ඒ කියන්නේ මරණින් මතු ඒ ආත්මය නිරෝගී ඒකාන්ත සුඛ තත්වයකට පත්වෙනවා කියලා. එහෙම කියන ශ්‍රමණ බ්‍රාහමණයින් ඉන්නවා. ඊළඟට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා පොට්ඨපාද, මම එහෙම කියන අය ළඟට ගිහිල්ලා අහනවා ඔයගොල්ලො කියනවා ආත්මය මරණින් මතු ඒකාන්ත සුඛ ආත්ම තත්වයකට පත් වෙනවා කියල. ඔයගොල්ලො ළඟ යම් ඥාන දර්‍ශනයක් තියනවද එහෙම එකක් තියන බවට? එතකොට ඒ ගොල්ලො නැතෙයි කියනවා. බුදුරජාණන් වහන්සේ අහනවා. ඔය කට්ටිය එක දවසක්, එක රැයක්, අඩ දවසක් අඩ රැයක් ඒකාන්ත සුඛයක් වින්දනය කරනවද, නැත කියනවා. ඊළඟට අහනවා ඔයගොල්ලො දන්නවද ඒකාන්ත සුඛ වින්දනය කරන ලෝකයට යන ප්‍රතිපදාව ගැන? නැහැ කියනවා. ඊළඟට අහනවා එහෙනම් අහන්න ලැබිල තියනවද ඒකාන්ත සුඛ ලෝකයක උපන්න දේවතාවෙක් කියනවා, මෙන්න අපිත් මෙතෙන්ට ආවා, ඔයගොල්ලොත් මෙතෙන්ට එන්න කියලා. ඒත් නැතය කියනවා.

ඊළඟට බුදුරජාණන් වහන්සේ කියනවා, එහෙම නම් එතෙන්දි අර පරණ කථාව කියල පොට්ඨපාදගෙන් අහන්නෙ එබඳු ඒ කථාව එහෙම නම් හේතු යුක්ති නැති, උදාහරණ පදනම් නැති කථාවක් නේද, කියන

එකට අමුතු වචනයක් එතන ඉදිරිපත් කරල තියනවා, 'අප්පාටිහීරක' කියලා. අපපාටිහීරක කියන්නේ පින්වතුනි, ගෙනහැර දක්වන්න හේතු සාධක නැති මතයක් කියන එක. පදනම් නැති මතයක්. එතකොට පොට්ඨපාදත් එකඟ වෙනවා. ඒක අනුමත කරනවා. එසේය, ඒකාන්තයෙන්ම ස්වාමීනි ඒක අප්පාටිහීරකයි. ඒ වචනය තේරුම් කරන්න අමුතු උපමා දෙකක් දෙනවා. ඒ උපමා නම් මේ පින්වතුන්ට අමතක වෙන්නෙ නැහැ. මොකක්ද මෙන්න පළමුවෙනි උපමාව යම්කිසි පුරුෂයෙක් කියනවා මම මේ ජනපදයේ ජනපද කළ්‍යාණිට කැමතියි බොහොම ඇලුම් කරනවා කියලා. එතකොට අනිත් අය අහනවා ඔබ දන්නවද ඒ ජනපද කල්‍යාණි ක්ෂත්‍රිය ආදී යම් කුලයකද, කුලගෝත්‍ර ගැන කියල. තමා ඒවා මොකුත් දන්නෙ නැහැ. උසද, මිටිද කළුද තලෙළුයිද, ඒකත් දන්නෙ නැහැ. කොහේ ඉන්නවද කියල- ඒකත් දන්නෙ නැහැ. එහෙනම් ඔය නොදන්න නොදකින ජනපද කළ්‍යාණියකට නේද ඔය ඇලුම් කරන්නේ. අන්න ඒක තමයි 'අප්පාටිහීරක' කියල කියන්නේ. තමාට ගෙනහැර දක්වන්න බැරි විදියෙ දෙයක්. තව උපමාවක් ගෙනහැර දක්වනවා.

යම්කිසි පුරුෂයෙක් සතරමං හන්දියක ඉණිමගක් හදනවා ප්‍රාසාදයකට නගින්න. මිනිස්සු ඇවිල්ල අහනව දැන් ඔබ ඉණිමග හදන්නෙ ප්‍රාසාදයකට නගින්නනෙ. ඒ ප්‍රාසාදය කොහෙද තියෙන්න, නැගෙනහිරද, බටහිරද, උතුරෙද, දකුණෙද? දන්නෙ නැහැ. ඒක උසද මිටිද? ඒකත් දන්නෙ නැහැ. එහෙනම් ඔබ නොදන්නා ප්‍රාසාදයකටයි මේ ඉණිමග බඳින්නේ. එතනිනුත් පෙන්නුම් කරන්නේ අර පදනම් නැති කථාවක් කියන එකයි. ඉතින් ඔය ටික ප්‍රකාශ කළාට පස්සේ බුදුරජාණන් වහන්සේ ශාසනයේ රූප අරූප ධ්‍යාන පිළිබඳ සංකල්පය මේ විදියටයි ඉදිරිපත් කරන්නේ. ''පොට්ඨපාද මම කියනවා ආත්ම ප්‍රතිලාභ තුනක් තියනවා. ''අමුතුම වචනයක් ඉදිරිපත් කරනව. **ආත්ම කථාව නෙවෙයි දැන් කියන්නෙ 'අත්තපටිලාභා' 'ආත්ම ප්‍රතිලාභ'**. අමුතුම වචනයක් එතන තියෙන්නෙ පොට්ඨපාද **ආත්ම ප්‍රතිලාභ** තුනක් තියෙනව. මොනවද තුන? 'ඕළාරිකො රූපී'' අර කියාපු ඒවම තමයි. නමුත් ඒවා ඉදිරිපත් කරන්නේ ආත්ම ප්‍රතිලාභ හැටියට. ඕළාරික ආත්ම ප්‍රතිලාභය කියන්නේ ගොරෝසු, ආහාරයෙන් යැපෙන, ශරීරය. මනෝමය ආත්ම ප්‍රතිලාභය කියල

කියන්නේ අර රූප තත්වය. ඊළඟට අරූපී, අරූපී සඤ්ඤාමය ආත්ම ප්‍රතිලාභයයි.

බුදුරජාණන් වහන්සේ කියනවා ආත්ම ප්‍රතිලාභ තුනක්. මේ ප්‍රතිලාභ කියන වචනය ගැන හිතල බලන්න. ප්‍රතිලාභ කියන වචනය මේ සමාජයේ තියන දෙයක්නෙ. **ප්‍රතිලාභයක් ලැබෙන්නේ යම් කිසි දෙයක් කළාට පස්සෙ නෙ. මෙතන මොකක්ද කරන්නේ? ශික්ෂණයක්. මේක ශික්ෂණයක් තුළින් ඇති වන දෙයක් කියල හඟවන්නටයි බුදුරජාණන් වහන්සේ 'අත්තපටිලාභ' කියන වචනය මෙතෙන්ට යෙදුවේ.** පොට්ඨපාදලත් අනිත් කට්ටියත් යෙදූ අත්තා කියන වචනය වෙනුවට මේ ධ්‍යාන තත්ත්වය විස්තර කිරීමට බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කරන්නේ '**අත්තපටිලාභ**' කියන වචනය. මොකද, **ශික්ෂාව තුළින් ඇති වන්නක්. ඒක තුළින් ආකල්පය පිළිබඳ විශාල වෙනසක්.** මේ ආත්ම ප්‍රතිලාභ අර විදියටමයි බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ. කලින් කිව්වනේ සතරමහ භූතයින්ගෙන් හටගත් රූපී ආත්ම ප්‍රතිලාභය එකක්. ඊළඟට මනෝමය ඉන්ද්‍රියයන් සහිත ආත්ම ප්‍රතිලාභය දෙවෙනි එක. තුන්වෙනි එක අරූපී සඤ්ඤාමය ආත්ම ප්‍රතිලාභය. නමුත් එහෙම කියල එතනින් නැවැත්තුවෙ නැහැ. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා මම ඒ ඕළාරික ආත්ම ප්‍රතිලාභය ප්‍රහාණය කිරීම සඳහාත් ධර්මය දේශනා කරනවා. ඒ ප්‍රහාණ කිරීම තුළින් කෙලෙස් ධර්ම ඉවත් වෙලා සිත පිරිසිදු වෙලා ප්‍රඥාව එතනම ලබාගන්නවා. අන්න දැන් මතක්කර ගන්න. මම සඤ්ඤාග්‍රය ගැන කියාපු කථාව. ඒ ප්‍රථම ධ්‍යානයෙනුත් පුළුවන්, එහෙම නැත්නම් රූප ධ්‍යානවලිනුත් පුළුවන්. එහෙමත් නැත්නම් අර අරූපී තත්ත්වයෙන් උනත් ඒ විදර්ශනාව යෙදුව නම් යන්න පුළුවන් නිවනට. ඊළඟට කියනවා මනෝමය ආත්ම ප්‍රතිලාභයෙත් ප්‍රහාණය මම දක්වනවා. ඊළඟට අරූප ධ්‍යාන, ඒවායේ ප්‍රහාණයත් මම පෙන්නුම් කරනවා. ඒ තුළින් ප්‍රඥා පාරිශුද්ධිය මතු කරගන්න පුළුවන් කියල. එහෙම ප්‍රකාශ කළහම ඔන්න ඊළඟට එන්නේ චිත්තහත්ථිසාරිපුත්තගේ ප්‍රශ්න වාරය. එතන ඉඳල තමයි ඇත්ත වශයෙන්ම ගැඹුරු හරිය එන්නේ. චිත්තහත්ථිසාරිපුත්ත අහනවා ''ස්වාමීනි යම් අවස්ථාවක ඔය කියන ඕළාරික ආත්ම ප්‍රතිලාභය තියනවා නම්, ඒ අවස්ථාවේ මනෝමය ආත්ම ප්‍රතිලාභය අසත්‍යද? ඒකට යොදනව '**මෝඝ**' කියල 'හිස්'. අරූප ආත්ම

ප්‍රතිලාභය ඒ වෙලාවේ 'හිස්ද?' ඒ වෙලාවෙ නැද්ද? ඒ වගේම අනික් පැත්තටත් අහනවා දැන් යම් වෙලාවක මනෝමය ආත්ම ප්‍රතිලාභය තියනවා නම් ඒ වෙලාවට ඕළාරික ආත්ම ප්‍රතිලාභය නැද්ද, අරූප ආත්ම ප්‍රතිලාභය නැද්ද, ඊළඟට අරූප ගැනත් කියනවා යම් වෙලාවක අරූප ආත්ම ප්‍රතිලාභය තියනවද, ඒ වෙලාවේ අර අනික් දෙක නැද්ද, ඔන්න ගැඹුරු පැත්තකටයි යන්නේ.

එතකොට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. ''චිත්ත, යම් අවස්ථාවක ඕළාරික ආත්ම ප්‍රතිලාභය තිබේද, ඒ අවස්ථාවේ ඒක මනෝමය ආත්ම ප්‍රතිලාභය කියලා - අන්න අමුතු වචනයක් තියෙනවා හොඳට මතක තියාගන්න - **සංඛං ගච්ඡති**.' හොඳ වචනයක්. සංඛං ගච්ඡති කියන්නේ ''**ගිණීමට යේ**'' කියන එක. **සංඛා, සමඤ්ඤා පඤ්ඤත්ති,** කියන්නේ ලෝකයේ ව්‍යවහාර වචනවලට යෙදෙන පදයක්. 'සංඛං ගච්ඡති' කියන්නේ හඳුන්වනු ලැබේ, කියනු ලැබේ කියන එකයි.

බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා යම් අවස්ථාවක ඕළාරික ගොරෝසු ආත්ම භාවය තියනවද ඒ වෙලාවේ ඒකට මනෝමය ආත්ම ප්‍රතිලාභය කියල **ගිණීමට නොයේ**. ඒ ව්‍යවහාරය ගන්නෙ නැහැ. අරූප ආත්ම ප්‍රතිලාභය කියලත් යොදන්නෙ නැහැ. ඒ වගේම අනිත් ඒව ගැනත් කියනවා. යම් අවස්ථාවක මනෝමය ආත්ම ප්‍රතිලාභය තිබේද, ඒ වෙලාවේ ඒක **ගණන් ගනු ලබන්නේ නැහැ** ඕළාරික ආත්ම ප්‍රතිලාභය කියල. අනිත් එක ගැනත් හිතාගන්න. අරූප ආත්ම ප්‍රතිලාභය තිබෙනකොට අනිත් දෙක නැහැ. ඔය ගැඹුරු කාරණයක් එතන තියෙන්නේ. **ඔය කාලත්‍රය පටලවාගැනීම පිළිබඳ කාරණයයි** මේ බුදුරජාණන් වහන්සේ චිත්තහත්ථිසාරිපුත්තට තේරුම් කරන්න යන්නේ. ඒක තව දුරටත් තේරුම් කිරීමට බුදුරජාණන් වහන්සේ ඊළඟට ප්‍රතිප්‍රශ්න නඟනව චිත්තහත්ථිසාරිපුත්ත ගෙන්. ''දැන් චිත්ත යම් කෙනෙක් ඔබගෙන් ඇහුවොත් ඔබ අතීතයේ සිටියද, නොහිටියා නොවෙයි නේද අනාගතයේ ඔබ ඉන්නවා නේද, ඔබ නොඉන්නවා නොවෙයි නේද, වර්තමානයේ ඔබ සිටිනවද. නොසිටිනවා නොවෙයි නේද?'' මෙතැනදී අමරුයි සිංහල ව්‍යාකරණයේ තිබෙන හැටියට ඒක නිසා මට පොතේ එන භාෂාවෙන් කියන්න වෙනවා සිංහලට නගන කොට. චිත්තහත්ථි සාරිපුත්ත

කියනවා එහෙම ඇහුවහම, භාග්‍යවතුන් වහන්ස මම මෙහෙමයි පිළිතුරු දෙන්නේ. **මම අතීතයේ වූයෙම් නොවූයෙම් නොවෙමි. මම අනාගතයේ වන්නෙමි, නොවන්නෙම් නොවෙමි, මම වර්තමානයේ වෙමි නොවෙම් නොවෙමි,** තේරුම්ගන්න පුළුවන්ද මේ පින්වතුන්ට? මේ කාලත්‍රය පටලවාගත්තු එක පෙන්නන්නයි බුදුරජාණන් වහන්සේ මේ ප්‍රතිප්‍රශ්න නැගුවේ. එතකොට චිත්ත එහෙම කියනව කවුරුවත් ඇහුවොත් අතීතයේ සිටියද කියල අතීතයේ මම වූයෙමි, නොවූයෙම් නොවෙමි. අනාගතයේ වන්නෙමි, නොවන්නෙම් නොවෙමි. වර්තමානයේ වෙමි නොවෙම් නොවෙමි. ඔන්න එතකොට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා ''එසේම යම් වේලාවක ඕළාරික ආත්ම ප්‍රතිලාභය වෙයිද ඒ වෙලාවේ ඒකට මනෝමය ආත්ම ප්‍රතිලාභය කියන සංඛ්‍යාවට ගැනෙන්නෙ නැහැ. ගිණීමට යන්නෙ නෑ. අරූප ආත්ම ප්‍රතිලාභය කියලත් ගිණීමට යන්නෙ නෑ.'' **දැන් ලෝකයා තුළ තියන මුළාව, ආත්මදෘෂ්ටියට හේතු උනේ, කාලත්‍රය පටලවාගැනීමයි. අතීතයත් තියනවා, අනාගතයක් තියනවා කියලා හිතාගෙන සිටීමයි.** ඒ දෘෂ්ටියයි මේ බුදුරජාණන් වහන්සේ බිඳින්න හදන්නේ. ඉතින් මෙන්න මෙහෙම ප්‍රකාශ කළහම ඊළඟට මහ පුදුම උපමාවක් දෙනවා මේක තේරුම් කරන්න. ඒක නම් මේ පින්වතුන්ට ඉතාමත්ම උපකාරවත් වේවි මේ කියාපු ගැඹුරු ධර්මය තේරුම්ගන්ට.

බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව චිත්තහත්ථි සාරිපුත්තට මේ කාරණය ඒත්තු ගන්වන්න ''**යම් සේ චිත්ත, එළදෙනගෙන් කිරිත්, කිරිවලින් දීකිරිත්, දීකිරිවලින් වෙඬරුත්, වෙඬරුවලින්, ගිතෙලුත්, ගිතෙල්වලින් ගිතෙල් මණ්ඩයත් ලැබේද, යම් වෙලාවක කිරි තිබේද, ඒ වෙලාවට ඒක දීකිරි කියන සංඛ්‍යාවට ගැනෙන්නෙ නැහැ. ගිණීමට යන්නෙ නැහැ. ඒකට දීකිරි කියල කියන්නෙ නැහැ. වෙඬරු කියල කියන්නෙ නැහැ. ගිතෙල් කියල කියන්නෙ නැහැ. කිරිවලට කිරි කියලමයි කියන්නෙ. 'ඛීරංත්වෙව තස්මිං සමයෙ සංඛං ගච්ඡති'** ඒ විදියටම තමයි ඒක දී කිරි බවට පත් උනහම, යම් කිසි ක්‍රියා සන්තතියක් තුළින්, ඒකට දී කිරි කියනවා මිසක් ඒක තුළ කිරි තියනවා කියලවත් ඒක ඇතුළෙ අනාගතයේ එන්න ගිතෙල් තියනවා කියලවත් හිතන්නෙ නැහැ. ඒක මේ පින්වතුන්ට තේරුම්ගන්න මම පුංචි උපමාවක් කියන්නම්. අතීතයේ

කථාවක් තියනවා - ඒක බටහිර සාහිත්‍යයේ - එක්තරා ලෝභ මනුෂ්‍යයකුට හිටියලු රත්තරන් බිත්තර දමන තාරාවියක්. දවසට එක බැගින්නෙ දාන්නෙ. මේ ලෝභ මනුෂ්‍යයට හිතුණා හෙට, අනිද්දට දාන බිත්තරත් ගන්න ඕන කියල අර සතාගෙ බඩ පැලුවා. අන්න ඒ වගේ දෙයක් තමයි, අනාගතයත් තියනවා කියල හිතීම. අතීතයත් තියෙනවා කියල හිතීම. මේවා ව්‍යවහාර පමණයි. කිරි අනාගතයේ දී අර තත්ත්වයට පත් වෙන පමණින් ඒක තුළ ගිතෙල් තියෙනව කියල හිතාගන්න එක වැරදියි. **එහෙම ප්‍රකාශ කරල බුදුරජාණන් වහන්සේ හකුළුවලා දක්වනව මහ පුදුම පාඨයකින් ''ඉතීමා ඛො චිත්ත ලොකසමඤ්ඤා, ලොක නිරුත්තියො ලොක වොහාරා, ලොකපඤ්ඤත්තියො යාහි තථාගතො වොහරති අපරාමසං''**. මහ පුදුම පාඨයක්. චිත්ත මේ ඔක්කොම ලෝක ව්‍යවහාර ලෝකනිරුක්ති, ලෝක ප්‍රඥප්ති. තථාගතයන් වහන්සේ මේවා පාවිච්චි කරනවා විතරයි. ව්‍යවහාර කරනවා පමණයි. මේවා ග්‍රහණය කරන්නෙ නැහැ. '**අපරාමසං**'- මේවා ග්‍රහණය කිරීම තුළින් තමයි අර අවුල හදාගත්තේ. තමන්ම මේවාට නම් දාගත්තා. එක අවස්ථාවක අපි මේකට කිරි කියමු. එක අවස්ථාවක දීකිරි කියමු. වෙඬරු කියමු. එහෙම හදාගෙන ඉවරවෙලා ඕක තුළ දී කිරි වලින් වෙඬරු ආවද, වෙඬරු වලින් දී කිරි ආවද? **ඔතනම තමයි භාරතීය දර්ශනය හිර වෙලා තිබුණේ. ගැඹුරින් ආත්ම දර්ශනය ගැන කියනව නම්.** ඒකත් තෛත්තිරීය ආදී උපනිෂද් ග්‍රන්ථවල සඳහන් වෙනවා, පංච කෝෂ කියන මතයක්. මේ ආත්ම තත්ත්ව පහක් එතන දක්වනවා. එකක් තුළ එකක්. අන්නමය, ප්‍රාණමය ආදී වශයෙන් එකක් තුළ එකක්. හරියට ඇදල ගන්නව වගේ, කොපු තියනව වගේ. **අන්න ඒ විදියේ කොපු සංකල්පයකට යනවා ආත්ම සංකල්පය අර කියාපු කාලත්‍රය පටලවාගත්තොත්.**

බුදුරජාණන් වහන්සේ මේ පාඨයෙන් දක්වන්නේ මේවා ලෝකසමඤ්ඤා ලෝකනිරුක්ති ලෝක ප්‍රඥපති පමණයි කියලා. තථාගතයන් වහන්සේ මේවා පාවිච්චි කරනවා, ව්‍යවහාර කරනවා. **නමුත් ග්‍රහණය කරන්නෙ** නැහැ. දැඩිව ගන්නෙ නැහැ. දැඩිව ගැනීමෙන් තමයි අර හේතු ඵල ප්‍රශ්නය ඇති වෙන්නේ. හේතුවයි ඵලයයි අතර ප්‍රශ්නය ඇති වෙන්නේ. හේතුව කලින් උපන්නද? හේතුව තුළ ඵලය තියනවාද? ඔන්න ඔය පටලැවිල්ලයි භාරතීය දර්ශනයේ තියෙන්නේ.

ඉතින් මේ ටික කිව්වට පස්සෙ වෙන ආශ්චර්යය බලන්න. මේ කියාපු පාඨයේ වටිනාකමත් මම කෙටියෙන් සඳහන් කරන්නම් ඊට කලින්. කොයි තරම්ද කියතොත්, නූතන වාග් විද්‍යාඥයින් දෙදෙනෙක් ලියාපු ඉතාමත්ම ප්‍රාමාණික ග්‍රන්ථයක උපුටා දක්වනව මෙන්න මේ පොට්ඨපාද සූත්‍රයේ කිරි උපමාව.[11] දක්වලා ඒ අය පුදුමය ප්‍රකාශ කරනවා. අවුරුදු 2500 කට පෙර මේ විදියේ, අද වාග්විද්‍යාඥයින් අවදි වෙන තත්ත්වයක් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරල තියනවා කියලා.

බුදුරජාණන් වහන්සේගේ ප්‍රකාශයෙන් පස්සේ පළමුවෙන්ම පොට්ඨපාද ප්‍රකාශ කරන්නේ මේකයි. **අති විශිෂ්ටයි, ස්වාමීනි අති විශිෂ්ටයි ස්වාමීනි, යම් සේ ස්වාමීනි යටිකුරු කළ දෙයක් උඩුකුරු කරන්නේද, වැසී තිබුණ දෙයක් විවෘත කරන්නේද, මංමුළා වූවකුට මාර්ගය දක්වන්නේද, ඇස් ඇත්තෝ රූප දකිත්වායි, යම් සේ අඳුරෙහි තෙල් පහනක් දල්වන්නේද, එසේම භාග්‍යවතුන් වහන්සේ නොයෙක් ආකාරයෙන් මේ ධර්මය දේශනා කළා. මම භාග්‍යවතුන් වහන්සේ සරණ යනවා. මම දිවි හිමියෙන් සරණ ගිය උපාසකයෙක් ලෙස දරාගන්න** කියලා පොට්ඨපාද පරිබ්‍රාජක ප්‍රකාශ කළා. ඊටත් එහා ගිය **චිත්තහත්ථිසාරිපුත්ත, ඒ වගේම වාක්‍යයකින් ප්‍රසාදය පළ කරලා චිත්තහත්ථිසාරිපුත්ත මේ ශාසනයේ පැවිදි උපසම්පදාව ඉල්ලා සිටියා.**

බුදුරජාණන් වහන්සේ පැවිදි උපසම්පදාව දී වදාළා. උපසම්පදාවට පත්වූ නොබෝ කලකින් චිත්තහත්ථි සාරිපුත්ත ස්වාමීන් වහන්සේ විවේකයට ගිහිල්ලා දැඩිව වීර්යය අරගෙන භාවනා කරලා අර්හත්වයට පත්වුනා. ඔන්න සූත්‍රය කෙළවර වෙන ආකාරය. ඉතිරිව තිබෙන විනාඩි කීපය තුළ තවත් ගැටළු විදිහේ දේවල් තියනවා නම් අපි මෙන්න මෙහෙම ටික ටික කියමු. අර කියාපු සංඛා සමඤ්ඤා පඤ්ඤත්ති කියන ඒ වචන කීපය සඳහන් වන වටිනාම සූත්‍රයක් තියනවා සංයුත් සඟියේ නිරුත්ති පථ සූත්‍රය[12] හැටියට. එතෙන්දි කෙලින්ම බුදුරජාණන් වහන්සේ මේ කාලත්‍රය පටලවාගැනීමේ අවුල පිළිබඳව ප්‍රකාශ කරනවා.

මෙන්න මේ විදියට ''**තයො මෙ භික්ඛවෙ නිරුත්තිපථා අධිවචන පථා පඤ්ඤත්තිපථා**''. නිරුක්ති, අධිවචන, ප්‍රඥප්ති, කියල කියන්නේ ලෝකයේ පාවිච්චි කරන භාෂාවටයි. ''මහණෙනි, නිරුක්ති මාර්ග,

අධිවචන මාර්ග, ප්‍රඥප්ති මාර්ග, තුනක් තියනවා එකකට එකක් පටලවා නොගත්තු.'' වෙන් වෙන්ව ඒවා පෙන්නුම් කරන්නේ මෙහෙමයි. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා එතනදී යම් රූපයක් අතීතද, නිරුද්ධද වෙනස් වෙලා තියනවද? ඒකට කියන්න ඕන 'අහෝසි' කියලයි. 'විය' කියන එකයි, ඒකට කියන්නේ නැහැ 'වන්නේය' වෙනව කියල කියන්නෙත් නැහැ. එහෙම නැත්නම් 'තියනව' කියල කියන්නෙත් නැහැ. ඒකට යෙදෙන සංඛාව 'අහෝසි' කියලයි. ඒ වගේම හිතාගන්න යම් රූපයක් අනාගත නම් ඒකට කියන්නෙ 'භවිස්සති' පාලි වචනය 'වන්නේය' කියනවා. වන්නේය කියනවා මිසක් ඒකට වුනයි. කියල කියන්නෙත් නැහැ. තියෙනවයි කියල කියන්නෙත් නැහැ. ඒ විදියටම සළකාගන්න. වර්තමානයේත් යම් රූපයක් තියෙනවා නම් ඒකට අර කියාපු අනික් කාල දෙක යොදන්නේ නැහැ. ඒ විදියටම පඤ්ච උපාදානස්කන්ධය පිළිබඳව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. ඒක තහවුරු කරනවා. අතීතයේත්, අනාගතයේත් වර්තමානයේත් යම් ඥානවන්ත ශ්‍රමණ බ්‍රාහමණයින් ඉන්නවා නම් ඒ අය මේ කාලත්‍රය පටලවා ගත්තේ නැහැ. අතීතය ගියා. ගිය දේට තියනවා කියන එක මුළාවක්. අනාගතය ආවෙ නැහැ. අනාගතය ඒ වෙලාවට සත්‍ය වෙන්න පුළුවන්.

එතෙන්දියි බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ එක් එක් ආත්ම ප්‍රතිලාභය ඒ ඒ අවස්ථාවේ - එතන විශේෂ වචනයක් '**තස්මිං සමයෙ**' 'ඒ අවස්ථාවෙ' අන්න එතන සුවිශේෂයි. අරූප ආත්ම ප්‍රතිලාභය තියන වෙලාවේ '**තස්මිං සමයෙ**' ඒ මොහොතේ ඒ වෙලාවේ ඒකට කියන්නේ නැහැ අනික් නම්. මෙතන කාලත්‍රය පටලවා නොගතයුතු බවයි බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ. ඒ පටලවාගැනීම තුළින් තමයි මේ සක්කාය දිට්ඨිය ඇති වුණේ. ඒක භාෂාවේ දෝෂයක් නොවේ. මනුෂ්‍යයාගේ කෙලෙස්වල දෝෂයයි. **අම්මගෙයි තාත්තගෙයි වැරැද්ද. අම්ම කවුද තණ්හාව. තාත්තා අවිද්‍යාව.** අවිද්‍යා නීවරණය තුළින් ඝන සංඥාව තුළින් ලෝකයේ රාශි සංඥාව වහලා ඒක 'දෙයක්' කරලා

පෙන්නනවා. තණ්හාව තුළින් අරව අලවනවා. තණ්හා ලාටුවෙන්. අන්න ඒක තුළ ලෝකයා මේ ශරීරය පිළිබඳව -සක්කාය දිට්ඨිය කියන්නේ 'සත්-කාය', මේ ශරීරය තියනවා කියල හිතාගන්නවා. මේක තුළ ඉතාම

ශීඝ්‍රයෙන් සිදු වන ක්‍රියාදාමය අමතක කරලා. ඒවගේම තමයි අනික් දේවලුත්. ඔන්න ඔතනයි මේ ආත්ම දෘෂ්ටිය හැංගිලා තියෙන්නේ. ඕක හෙළි කරන්නයි මේ පොට්ඨපාද සූත්‍රය දේශනා කරල තියෙන්නේ. මහ පුදුම දේශනාවක්. පොට්ඨපාදගේ සාකච්ඡාව තුළින් පොට්ඨපාද අහන්නෙත් චිත්තහත්ථිසාරිපුත්ත අහන්නෙත් ධර්මය නොදැනගත්ත නම් අපිත් අහන ප්‍රශ්නයක්. **ඒක තුළම තමයි අර යෝගීනුත් හිරවෙලා හිටියේ. ඒ අය යම් තත්ත්වයක් ලැබුවා. නමුත් ඒක ගුප්ත ගූඪ දෙයක් කියලා හිතුවා. අර විදියට හේතු ප්‍රත්‍යයන්ගෙන් ඇති වන දෙයක් කියලා හිතුවේ නැහැ. ඒ වෙනුවට මෙතන තියනව නොදන්න ආත්මයක් කියලා හිතුවා.** එහෙම නැත්නම් දෙවියෙක් බ්‍රහමයෙක් මේකට ඇතුල් කරනවා මොකක් හරි සඤ්ඤාවකින්. මේ සඤ්ඤාවෙන් මිදෙන්න බැරි වුනේ මොකද, මේකයි හේතුව. සංස්කාර හඳුනාගෙන හිටියේ නැහැ. **බුදුරජාණන් වහන්සේගේ ධර්මයේ විශේෂම දේ තමයි - පටිච්ච සමුප්පාදය ධර්මයත් එක්කම යන අති විශේෂම වචනය සංස්කාර.** අර සුවිශේෂ තීරණය ගත්තේ අර භික්ෂූන් වහන්සේ **'යන්නූනාහං න චෙව චෙතෙය්‍යං නචාභිසංඛරෙය්‍යන්ති'** මම චේතනා සංස්කාරවලින් මිදෙන්න ඕන. චේතනා සංස්කාරවලයි ඒක තුළයි එල්ලිලා හිටියේ. මේක සාමාන්‍යයෙන් ගොඩේ උපමාවකින් කිව්වොත්, ඒකත් විසුද්ධි මාර්ගයෙන් ගත්ත උපමාවක්.[13] දැන් හිතන්න සැඩ දිය පහරකින් එතෙර වෙන්න වෙනවා. දොළ පහරක් ගලනවා පාලමක් නැහැ. මොකක්ද කරන්නේ, මෙහා පැත්තේ තියන වැලක් අල්ලාගන පැද්දෙනවා. පැද්දිලා, පැද්දිලා, පැද්දිලා එහා පැත්තට වුණ හැටියෙ අතහරින්න ඕන. අතහැරියෙ නැත්නම් ආපහු මෙහා පැත්තට එනවනෙ. ඔන්න ඕක තමයි බුදුරජාණන් වහන්සේ මේ ධර්මය පහුරක් කිව්වෙ.

සමථ, විදර්ශනා ආදිය අර විදියට අල්ල ගන්න වැලක් විතරයි. අර විදියට එල්ලිලා එහා පැත්තට ගිය හැටියේ අතහරින්න ඕන. හැබැයි අත හරින්න බයයි. ඒකනෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනයේ සී සෝ පැදිල්ලක හිටියේ. අතහරින්න බයයි. මොකද ආත්ම සඤ්ඤාව ඇතුළත තියන නිසා. 'මමෙක්' නැති වෙයි කියලා. **නැති වෙන්නෙ 'මමෙක්' නැති බව බුදුරජාණන් වහන්සේ මෙන්න මේ 'සික්ඛා එකා සඤ්ඤා' ප්‍රඥප්තිය තුළින් පෙන්නුවා. පටිච්ච සමුප්පාදය ධර්මය තුළිනුයි මේ ආත්ම දෘෂ්ටිය බිඳෙන්නේ.** ඒකයි මේ සූත්‍රයේ මුල ඉඳල අගටම තියෙන්නේ. මහා පුදුම සූත්‍රයක්. ඉතින් මෙන්න මේ උපමා හැම

එකක්ම මතක තියාගන්න, ඒක තුළින් කල්පනාවට ගන්න. මේ සක්කාය දිට්ඨිය කැඩීම කියල කියන්නේ සද්ද ඇහිල වෙන දෙයක් නොවෙයි. මේ ධර්‍ම මාර්‍ගයේ විදර්ශනාවෙ යෙදීමෙන් මේ පඤ්ච උපාදානස්කන්ධය පිළිබඳව, ඒක තුළින් යම් අවස්ථාවක මේවායේ නිස්සාරත්වය හෙළි වෙලා **අත හැරෙනවා. අතහරිනවා නොවෙයි අතහැරෙනවා** මේවායේ තත්ත්වය තේරුණහම. අන්න එබඳු තත්ත්වයක්. ඒක තුළින් නිරෝධය ස්පර්‍ශ කරනවයි කියල කියන්නේ. සඤ්ඤාවේදයිත නිරෝධයෙන් නැගිටින්නේ නිවනටයි. අර්හත්ත්වයටයි. මොකද සඤ්ඤාවේදයිත නිරෝධයෙන් නැගිටිනකොට ඒ භික්ෂුවට ඇති වන්නේ **අනිමිත්ත අප්පණිහිත සුඤ්ඤත** කියන ඒ අවබෝධයයි. ඒ කියන්නේ නිවනයි. එතකොට සඤ්ඤාවේදයිත නිරෝධ සමාපත්තියට සම වැදුණ නම් යම් කිසි කෙනෙක්, නැගිටින්නේ නිවනටයි මොකද? **ප්‍රඥාවයි කෙළවර.** ''**ඛීණා ජාති වුසිතං බ්‍රහමචරියං කතං කරණීයං**'' ආදී ඒ හැම එකක්ම අවබෝධ කරගන්නවා.

ඉතින් මේ ටික ඇති මේ පින්වතුන්ට. තව ඉදිරි දේශනාවලදී මේවායේ අතුරු දේවල් අපෙන් කියවෙන්න ඉඩ තිබෙනවා පණ තිබුණොත්. මේ පින්වතුන් කල්පනා කරන්න. අද වැනි මේ වටිනා ඇසළ පොහොය දවසක අපි චතුරාර්‍ය සත්‍යයට පදනම වන පටිච්ච සමුප්පාදය අල්ලලයි මේ පින්වතුන්ට යමක් කිව්වෙ මේ පැයක් ඇතුළත. මේ පින්වතුන් භාවනාවට ගත හැකි යමක් තියනවා නම් මේ දේශනාව තුළ තමන්ගේ සමථ, විදර්‍ශනා, භාවනාවන්ට උපකාර කරගෙන තමන් මේ අති භයානක සංසාර දුකෙන් මිදෙන්න මේ බණ භාවනා දියුණු පවුණු කරගෙන ඒ උතුම් සෝවාන්, සකදාගාමී, අනාගාමී, අර්හත් කියන ඒ මාර්‍ග ඵල ප්‍රතිවේධයෙන් අමා මහ නිවන් සාක්ෂාත් කරගන්න මේ දේශනාව උපකාර වේවා කියලා ප්‍රාර්ථනා කරගන්න. අවීචියේ සිට අකනිටා දක්වා යම්තාක් සත්ත්ව කෙනෙක් ඉන්නවා නම් මේ ධර්‍ම දේශනාමය ධර්‍ම ශ්‍රවණමය කුසලය අනුමෝදන් වීමට කැමති ඒ අනුමෝදන් වීම තුළින් ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් වූ අමා මහ නිවනින් සැනසෙත්වා කියා මේ ගාථා කියන්න.

**එතතාවතා ච අමෙහහි...**

## පාදක සටහන්

1. සන්තතර සූත්‍රය, ඉතිවුත්තක පාළි, ඛුද්දක නිකාය -1-402 පිට (බු.ජ.ත්‍රි.24)
2. පොට්ඨපාද සූත්‍රය, දීඝ නිකාය -1-388-436 පිටු (බු.ජ.ත්‍රි.7)3. පඤ්චත්තය සූත්‍රය, මජ්ඣිම නිකාය -3, 34 පිට (බු.ජ.ත්‍රි.12)
4. ගණක මොග්ගල්ලාන සූත්‍රය, මජ්ඣිම නිකාය -3, 90 පිට (බු.ජ.ත්‍රි.12)
5. විභඞ්ග සූත්‍රය, සංයුත්ත නිකාය -2,6 පිට (බු.ජ.ත්‍රි.14)
6. ඨාන නිස්සය සූත්‍රය, අංගුත්තර නිකාය -5,492 පිට (බු.ජ.ත්‍රි.22)
7. සුමඞ්ගල විලාසිනී 1-246 පිට (හේ.මු)
8. සුමඞ්ගල විලාසිනී 1-243 පිට (හේ.මු)
9. අලගද්දූපම සූත්‍රය, මජ්ඣිම නිකාය 1-344 පිට (බු.ජ.ත්‍රි.10)
10. සුමඞ්ගල විලාසිනී 1.246 පිට (හේ.මු)
11. The Meaning of Meaning - Ogden and Richards
12. නිරුත්තිපථ සූත්‍රය, සංයුත්තනිකාය -3-122 පිට (බු.ජ.ත්‍රි.15)
13. ඤාණදස්සන විසුද්ධිනිද්දෙස, විසුද්ධිමග්ග -505 පිට (හේ.මු.)

# 12 වන දේශනය

# 12 වන දේශනය

## (පහන් කණුව ධර්ම දේශනා අංක 194)
## 'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

චිරස්සං වත පස්සාමි - බ්‍රාහ්මණං පරිනිබ්බුතං
අප්පතිට්ඨං අනායූහං - තිණ්ණං ලොකෙ විසත්තිකං[1]

- ඕඝතරණ සුත්ත, සංයුත්ත නිකාය

සැදැහැවත් පින්වතුනි,

සසරින් එතෙර වීම සැඩ වතුර සතරකින් එතෙර වීමක් බව තිලෝගුරු බුදුරජාණන් වහන්සේ බොහෝ අවස්ථාවල පෙන්වා දෙනවා. කාම, භව, දිට්ඨි, අවිජ්ජා කියන සැඩ වතුරු සතරට අහු වෙලා ගසාගෙන යන ලෝක සත්ත්වයාට ඒ සැඩ වතුරෙන් එතෙර වීමේ ක්‍රමය බුදුරජාණන් වහන්සේ මැදුම් මගකින් දක්වා වදාළා. ඒ මැදුම් මග තුළිනුත් පටිච්ච සමුප්පාද ධර්මය ඉස්මතු වෙනවා. ඒ නිසා අද අපි මේ දොළොස්වෙනි පටිච්ච සමුප්පාද දේශනාවට සැඩ වතුරෙන් එතෙර වීම පිළිබඳ ප්‍රශ්නයට අදාළ ගාථාවක් මාතෘකාව හැටියට ඉදිරිපත් කරගත්තා. සංයුත් සඟියේ මුලටම එන ඕඝතරණ සූත්‍රයේ මේ ගාථාව සඳහන් වෙන්නේ. ඒ සූත්‍රය ආරම්භ වන්නේ මෙහෙමයි. බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වාසය කරන අවස්ථාවක එක් රාත්‍රියක එක්තරා දේවතාවෙක් බුදුරජාණන් වහන්සේ දකින්න පැමිණිලා වැඳලා එකත් පසෙක සිටගෙන මෙන්න මෙහෙන ප්‍රශ්නයක් ඇසුවා.

''කථන්නු ත්වං මාරිස ඔඝං අතරි'' කෙසේද නිදුකාණෙනි, ඔබ වහන්සේ සැඩ වතුරෙන් එතෙර වුණේ. එතකොට බුදුරජාණන් වහන්සේ ඒකට දෙන පිළිතුර ''**අප්පතිට්ඨං ඛ්වාහං ආවුසො අනායූහං ඔඝං අතරිං**'' ඇවැත්නි, මම නොනවතිමින් නොදඟලමින් සැඩ වතුරෙන් එතෙර වුණා. මේක එක පාරටම තේරුම් ගන්න බැරිව දේවතාවා අහනවා, ''හරියටම කොහොමද නිදුකාණෙනි ඔබ නොනවතිමින් නොදඟලමින් සැඩ වතුරෙන් එතෙර වුණේ? එතකොට බුදුරජාණන් වහන්සේ ඒක

ටිකක් විස්තර කිරීම් වශයෙන් ප්‍රකාශ කරනවා, ''ඇවැත්නි, යම් අවස්ථාවක මම නැවතුණා නම් ඒ අවස්ථාවේ මා ගිලා බැස්සා. යම් අවස්ථාවක මා දඟලුවා නම් ඒ අවස්ථාවේ මා ගසාගෙන ගියා. ඒ නිසා මම නොනවතිමින් නොදඟලමින් සැඩ වතුරෙන් එතෙර වුණා''. ඒක අහල පැහැදිලා ඒ දේවතාවා මෙන්න මේ ගාථාව ප්‍රශංසා වශයෙන් ප්‍රකාශ කරලා බුදුරජාණන් වහන්සේ පැදකුණු කරලා අතුරුදහන් වුනා. අපි ඒ ගාථාවේ අර්ථය ගනිමු.

**''චිරස්සං වත පස්සාමි - බ්‍රාහමණං පරිනිබ්බුතං''**

බොහොම කාලයකට පස්සෙයි මට දකින්නට ලැබෙන්නේ පිරිනිවියා වූ බ්‍රාහ්මණයෙක්.

**'අප්පතිට්ඨං අනායූහං - තිණ්ණං ලොකෙ විසත්තිකං''**

නොනවතිමින් නොදඟලමින් ලෝකයේ ''විසත්තිකා'' නම් වූ ඇලෙනසුලු තණ්හාවෙන් එතෙර වූ බ්‍රාහ්මණයකු කාලෙකට පස්සේ දකින්නට ලැබුණයි කියන එකයි අදහස. ඉතින් මෙන්න මේ සැඩ වතුර පිළිබඳ කථාන්තරයේදී කලින්ම මේ පින්වතුන්ට ඒක ගැටලුවක් වෙන එකක් නැහැ. අපි කවුරුත් දන්නවා වේගයෙන් ගලාගෙන යන සැඩ වතුරකින් එතර වෙනකොට අපි නතර උනොත් සැඩ වතුරේ ටිකක් දුර ගිහිල්ලා, ගිලා බහිනවා. දඟලුවොත් ගසාගෙන යනවා. ඒ වෙනුවට අපට කරන්න තියෙන්නේ ක්‍රමානුකූලව දරන මධ්‍යස්ථ වීර්යයකිනුයි සැඩ වතුරකින් එතර වෙන්නේ. ධර්මයේ අර කියාපු සැඩ වතුර වර්ග හතර පිළිබඳවම එක්තරා මැදුම් පිළිවෙතක් බුදුරජාණන් වහන්සේ දක්වා වදාළා. අපි එකින් එක අරගෙන විග්‍රහ කරන්න බලමු. කාම ඕඝ කියන කාම සැඩ වතුරෙන් එතර වීම පිළිබඳ ප්‍රශ්නයේදී බුද්ධ කාලයේ සිටි මහණ බමුණන් අතර අන්තගාමී විසඳුම් දෙකක් තිබුණා. විසඳුම් දෙකක් ඉදිරිපත් කළා.

කාමසුඛල්ලිකානුයෝගය, අත්තකිලමථානුයෝගය කියන මේ පින්වතුන් අහල තියන ඒ අන්ත දෙක. ෂට් ශාස්තෘන් අතරින් කාමසුඛල්ලිකානුයෝගය ඉදිරිපත් කළ පකුධ කච්චායන, මක්ඛලී ගොසාල, අජිත කෙසකම්බලී ආදී ඇතැම් අය කර්මය කර්ම ඵලය ගැන ඇදහීමක්

නැතිව, මෙලොවක් පරලොවක් ගැන කථාන්තරයක් නැතිව, හොඳ නරක කුසල් අකුසල් පිළිබඳ ඒ මතයට විරුද්ධව, එක්කෝ උච්ඡෙද වාදයක් එහෙම නැත්නම් නාස්තික වාදයක් එහෙම නැත්නම් අහෙතු අප්පච්චය වාදයක්, ඉදිරිපත් කළා. ඒකෙ ප්‍රතිඵලය වුණේ, සාමාන්‍ය ලෝකයා එයින් නැඹුරු උනේ ඉබේටම කාමසුඛල්ලිකානු යෝගයටයි. පරලොවක් නැත්නම්, හොඳ නරක කථාවක් නැත්නම්, කරන්න තියන දේ - ඒක සූත්‍ර දේශනාවල එන එකක් නූනත් - පසුකාලීනව ඔය චාර්වාකවාදීන් කියල කියන දැඩිව කාමසුඛල්ලිකානුයෝගයක් අනුගමනය කළ අය ප්‍රකාශ කළ අදහසක් සංස්කෘත ශ්ලෝකයකින් කියවෙනවා. ඒක බොහෝදෙනා අතර ප්‍රසිද්ධ ශ්ලෝකයක්.

**යාවත් ජීවෙත් සුඛං ජීවෙත්**
**ඍණං කෘත්වාපි ඝෘතං පිවෙත්**
**භස්මී භූතස්‍ය දෙහස්‍ය**
**පුනරාගමනං කුතඃ**

මේ කාලයේත් ඔය තරුණ තරුණියින් කියනවා ඇහෙනවා මේකට සමාන අදහසක්. කියන කොට තේරේවි. ''යාවත් ජීවෙත් සුඛං ජීවෙත්'' ඉන්නකම් හොඳින් සැපෙන් ඉන්න එකයි තියෙන්නේ. සැප විඳින එකයි තියෙන්නේ, ''ඍණං කෘත්වාපි ඝෘතං පිවෙත්'' ණය වෙලා හරි ගිතෙල් බොන්න ඕන. ඒ කාලයේ තිබුණ වටිනා බීමක් තමයි ගිතෙල්. ''භස්මී භූතස්‍ය දෙහස්‍ය පුනරාගමනං කුතඃ'' මැරුණට පස්සේ ඒ ශරීරය දැව්වට පස්සේ ආපහු එන්නේ කොහොමද? අන්න ඒ දර්ශනයයි. එතකොට ඒ දර්ශනය එක පැත්තක. අනිත් පැත්ත තමයි අත්තකිලමථානුයෝගය. ඒ දර්ශනය අනුගමනය කළේ නිගණ්ඨනාත පුත්ත බව මේ පින්වතුන් අහලා තියෙනවා. වස්ත්‍ර ඇඳීමත් ආහාර ගැනීමත් ප්‍රතික්ෂේප කරල දැඩි ව්‍රත සහිත මහ පුදුම ප්‍රතිපදාවක් ඒ අය දැක්වූයේ. ඒකට හේතුව ඒ අයගේ දර්ශනය මොකක්ද?, අතීත කර්ම තියෙනවා. පුබ්බෙකත හෙතු[2] කියල කියන්නේ අතීතයේ කරන ලද කර්ම තියෙනවා. ඒවා ගෙවා දාන්න ඕන. අළුත් කර්ම රැස් නොකර ඉන්න ඕන. ඒක සඳහා මහා දැඩි ව්‍රත වගයක් ඒ අය අනුගමනය කළා. ඒක තමයි  අත්තකිලමථානුයෝගය. ඉතින් ඔය අන්ත දෙක. ඇත්ත වශයෙන් බුදුරජාණන් වහන්සේත් මේ පින්වතුන් අහලා තියෙනවා දුෂ්කර ක්‍රියා කිරීම තුළින් අත්තකිලමථානුයෝගය පිළිපැද්ද

බව.

අවසාන අවස්ථාවේදී උන්වහන්සේට තේරුණා. සමාජ සම්මතය තිබුණ නිසා ඒ රජ සැප අන්තය අතහැරියට පස්සේ ඊළඟට තිබෙන අන්තය තමයි අර සමාජ සම්මත ඉතා රූක්ෂ ප්‍රතිපදාව. ඒකේ කෙළවරටම ගිහිල්ලා අවුරුදු හයකට පස්සේ බුදුරජාණන් වහන්සේ යම් අවස්ථාවක මේ කටුක දුෂ්කර ක්‍රියා වලින් මගේ පරමාර්ථය ඉෂ්ට වෙන්නේ නැහැ කියලා මහා සච්චක සූත්‍රයේ සඳහන් වෙනවා. උන්වහන්සේගේ සිතේ ඇති වුණු පරිවර්තනය. යම් අවස්ථාවක කල්පනා කළා කියනවා මේ වෙනුවට බෝධිය සඳහා යම් වෙන මාර්ගයක් තිබෙනවාද කියලා.[3] එහෙම හිතනකොට මතක් වෙලා තියෙනවා පියරජුගේ වප් මඟුල් අවස්ථවේදී තමන් ජම්බු ගහයට සීතල සෙවණේ ප්‍රථම ධ්‍යානයට සමවැදුණු අවස්ථාව. ඒ ප්‍රථම ධ්‍යානයට පත් වුණ අවස්ථාව සිහිපත් වෙලා උන්වහන්සේ කල්පනා කළ බව කියනවා මක් නිසාද මම කාමයන්ගෙනුත් අකුසල ධර්මයන්ගෙනුත් වෙන් වුණ සැපයට බය වෙන්නේ ''කින්නු ඛො අහං තස්ස සුඛස්ස භායාමි යන්තං සුඛං අඤ්ඤත්‍රෙව කාමෙහි අඤ්ඤත්‍ර අකුසලෙහි ධම්මෙහි'' කියලා. ඒ අදහස අරගෙන ඊට පස්සේ තමයි මධ්‍යම ප්‍රතිපදාවට බැස්සේ. ඒ පිළිබඳව මේ පින්වතුන්ට කෙටියෙන් කියනවා නම් කාමසුඛල්ලිකානු යෝගය ගත් අය ඇත්ත වශයෙන්ම ඒ නැවතීම තුළ එහෙම පිටින්ම අපායට ගිලා බැස්සා. අත්තකිලමථානුයෝගය ගත්ත අයත් ශරීරයට දුක් දීම ආදිය තුළින් දඟලුවා. ඒඅයට ඒකත් සම්බෝධිය සඳහා උපකාර වුණේ නැහැ.

බුදුරජාණන් වහන්සේ පෙන්නුවේ ඒ දෙකෙන්ම ඉවත්වූ මේ පින්වතුන් අහල තියන මධ්‍යම ප්‍රතිපදාව හැටියට දක්වන ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයයි. ඒ ආර්‍ය අෂ්ටාංගික මාර්ගය තුළ තියන පටිච්ච සමුප්පාදය එක පාරටම කෙනෙකුට පෙනෙන්නේ නැහැ. නමුත් ඒක අපට ප්‍රකට වන එක්තරා සූත්‍රයක් තියෙනවා. මැදුම් සඟියේ මහාචත්තාරීසක සූත්‍රය[4] කදිමට ඒ ආර්‍ය අෂ්ටාංගික මාර්ගය තුළ තියන පටිච්ච සමුප්පාද ස්වරූපය පෙන්නුම් කරනවා මෙන්න මෙහෙම. '**සම්මා දිට්ඨිස්ස සම්මා සංකප්පො පහොති. සම්මාසඞ්කප්පස්ස සම්මාවාචා පහොති. සම්මාවාචස්ස සම්මා කම්මන්තො පහොති. සම්මා කම්මන්තස්ස සම්මා ආජීවො පහොති. සම්මා ආජීවස්ස සම්මා වායාමො පහොති. සම්මා**

**වායාමස්ස සම්මා සති පහොති. සම්මා සතිස්ස සම්මාසමාධි පහොති. සම්මා සමාධිස්ස සම්මාඤාණං පහොති. සම්මා ඤාණස්ස සම්මා විමුත්ති පහොති කියලා.**

ඒ විදියට අංග දහයම එකිනෙකට බැඳිලා තිබෙන ආකාරය ලස්සනට පෙන්නුම් කරනවා. ඒ එකක් කිව්වහම අනික් ඒවා තේරුම් ගන්න පුළුවන් මේ පින්වතුන්ට. ''සම්මා දිට්ඨිස්ස සම්මා සඞ්කප්පො පහොති'' කියන්නේ සම්‍යක් දෘෂ්ටිය ඇති කෙනාට සම්‍යක් සංකල්පය පහළ වෙනවා. සම්‍යක් දෘෂ්ටිය වැඩීම තුළින් ඒ දෘෂ්ටිය අනුවම සම්‍යක් සංකල්ප හොඳ කල්පනා ඇති වෙනවා. ඉතින් ඒ විදියටමයි යන්නේ. හොඳ කල්පනා තුළින් හොඳ වචන බිහි වෙනවා. හොඳ වචන තුළින් හොඳ ක්‍රියා බිහි වෙනවා. අන්න ඒ විදියට පුදුම විදියට එකිනෙකට සම්බන්ධ වෙලා යන ප්‍රතිපදාවක් තමයි ආර්‍ය අෂ්ටාංගික මාර්‍ගය. ඒකම මැදුම් පිළිවෙත. අපි මැදුම් පිළිවෙත කිව්වම ඒක තුළ පටිච්ච සමුප්පාදයක් තිබෙන බවවත් සාමාන්‍යයෙන් බැලූ බැල්මට පෙනෙන්නෙ නැහැ. අපි පටිච්ච සමුප්පාදය ගැන කථා කරන කොට කෙනෙක් කියන්න පුළුවන්, කෝ ඒක නැහැනෙ. අපි කවුරුත් ලොකු හැටියට වටිනා හැටියට සළකන ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ පටිච්ච සමුප්පාදය නැහැ කියලත් කෙනෙකුට තර්ක කරන්න පුළුවන්. නමුත් එහෙම නම් ඒක නැතිනම් කොහොමද ඒ සෝවාන් වුණු අවස්ථාව පිළිබඳව ප්‍රකාශ කරන්නේ අඤ්ඤාකොණ්ඩඤ්ඤ සවාමීන් වහන්සේ පිළිබඳව **''යං කිංචි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මං''** කියන දහම් ඇස පහළ වුණා කියලා? ''යං කිංචි සමුදය ධම්මං සබ්බං තං නිරොධම්මං''[5] කියන්නේ පටිච්ච සමුප්පාද න්‍යායයයි. අපි කොතෙකුත් මේ පින්වතුන්ට විස්තර කරල ඇති, යම් තාක් දෙයක් හටගන්නා ස්වභාව ඇත්තේද, ඒ හැම දෙයක්ම නිරුද්ධ වන සවභාවයක් ඇත්තේය. අන්න ඒක හොඳට පැහැදිලි වෙනවා ඇත්ත වශයෙන්ම චතුරාර්‍ය සත්‍යයෙන් පටන්ගෙන යන ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්‍ගය තුළ පටිච්ච සමුප්පාදය අනුවමයි ඒක යන්නේ.

ඒ වගේම දැන් මේක කිව්ව නිසා අපට හිතාගන්න පුළුවන් බුදුරජාණන් වහන්සේ ගත්ත මැදුම් මග තවත් පැතිවලින් අපට පෙන්නුම්

කරනවා. දැන් නිගණ්ඨයින් වස්ත්‍රත් ප්‍රතික්ෂේප කරලා ආහාරත් ප්‍රතික්ෂේප කරලා මහා දැඩි දුක් දෙන ප්‍රතිපදාවක් අනුගමනය කළා. නමුත් බුදුරජාණන් වහන්සේගේ මධ්‍යම ප්‍රතිපදාව කොයි තරම්ද කියතොත් මේ පින්වතුන් අහල තියෙනවා නිගණ්ඨයින් වස්ත්‍රත් ආහාරත් ප්‍රතික්ෂේප කළා. ඒ වෙනුවට බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලාට - සිවුපසය කියන වචනය තුළත් තියෙනවා ප්‍රත්‍යය කියන වචනය. ප්‍රත්‍යය කියන්නේ යමකට හේතු වන දේවල් කියන එකයි. ආහාර පාන ආදිය ගන්නේ සංඝයා වහන්සේලා තවත් දේකට උපකාර වෙන්න. සාමාන්‍ය ගිහි පින්වතුන්, සාමාන්‍ය ලෝකයා, ඒක තනිකර විනෝදය සඳහායි පාවිච්චි කරන්නේ. නමුත් සංඝයා වහන්සේලා මේ පින්වතුන් අහල තියෙනවා. ප්‍රත්‍යවේක්ෂා කරලා පාවිච්චි කරනවා කියලා කියන්නේ එතකොට ඒ ආහාරය ගැන අපි කිව්වොත් කෙටියෙන් එක නිදර්ශනයක් ගත්තොත් සංඝයාවහන්සේලාට නියම කරල තියෙන්නේ ආහාර ගැනීමේදී ඒකෙ පරමාර්ථය සලකන්න කියලා 'නෙව දවාය, න මදාය න මණ්ඩනාය, න විභූසනාය', මේ ආහාර ගන්නේ විනෝදයට ශරීරය අලංකාර කරගන්න හැඩ කරගන්න නොවේ. 'යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහමචරියානුග්ගහාය' හුදෙක් මේ කය පවත්වාගෙන යාම සඳහා, යාපනය යැපීම සඳහා, ගෙනයාම සඳහා, බ්‍රහ්මචරියාව සඳහා, ඒ අදහස. ඒ විතරක් නෙවෙයි නිගණ්ඨයින් ප්‍රතික්ෂේප කළ දේවල්, බුදුරජාණන් වහන්සේ ඒ සිව්පසය පාවිච්චි කරන්නේ භාවනාවක් බවට හරවාගෙන. ඒකත් මේ පින්වතුන් අහල ඇති මේ ආහාරය තුළ තියන ධාතු පිළිබඳව ධාතු මනසිකාරය ගැන ලොකු පාඨයක් තියෙනවා සංඝයා වහන්සේලාට.

ඒකේ සාමාන්‍ය අර්ථය මේ ආහාරය සකස් වෙලා තියෙන්නේ පඨවි, අපො, තෙජො, වායො, කියන ධාතුන්ගෙන්. පිරිසිදු වූ ආහාරය මේ පිළිකුල් වූ කයට පැමිණිලා ඒකත් අපිරිසිදු වෙනවයි කියලා භාවනාවක් බවට හරවා ගන්නවා. අන්න ඒ විදියේ පුදුම මැදුම් පිළිවෙතක් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරල තියෙන්නේ. අර අන්ත දෙකින් කාමසුඛල්ලිකානුයෝගී අන්තයට යන්නේ නැහැ. මේ ආහාරය ශරීරය අලංකාර කරගැනීම පිණිස ගන්නව කියන ඒ පරමාර්ථය අහක් කරනවා. අනිත් පැත්තෙන් ධර්මයට භාවනාවට හරවාගන්නවා. ඒක

සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. ඒ එක්කම වටිනා දෙයක් තමයි මේ පින්වතුන් අහලා ඇති විශේෂයෙන්ම සංඝයා වහන්සේලාට හොඳ යෝගාවචර බෞද්ධයින්ට නියමිත ප්‍රතිපදාව තමයි අල්පේච්ඡතාව, ආශාවන් අඩු බව, 'සන්තුට්ඨි' ලද දෙයින් සතුටු වීම. වීර්යය පිළිබඳව කල්පනකර බලනකොටත් අර විදියට නිගණ්ඨයින් කළා වගේ තේරුමක් නැතිව ව්‍රතවලින් ශරීරයට දුක් දීම නොවෙයි. මධ්‍යස්ථ ප්‍රතිපදාව ඒකට කියන්නේ වීර්ය සමතාව. ඒ අතින් බලන කොට බුදුරජාණන් වහන්සේගේ මධ්‍යම ප්‍රතිපදාව එක පැත්තකින් පටිච්ච සමුප්පාදය පෙන්නුම් කරන අතර, අර කියාපු අන්ත දෙකෙනුත් මිදුනා. ඔන්න එතකොට කෙටියෙන් කිව්ව කියලා හිතාගන්න කාමෝඝය ගැන.

ඊළඟට භව ඕඝය ගැන - භව නමැති සැඬ වතුර ගැන - කියනවා නම් විශේෂයෙන් ඒ ගැන සඳහන් සූත්‍රයක් තියෙනවා. ඉතිවුත්තකයේ දෙවෙනි නිපාතයේ දෙවෙනි කොටසේ බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා ''**ද්වීහි භික්ඛවෙ දිට්ඨිගතෙහි පරියුට්ඨිතා දෙවමනුස්සා ඔලීයන්ති එකෙ අතිධාවන්ති එකෙ**''[6] ඒ විදියටයි සංඝයා වහන්සේලා අමතලා ප්‍රකාශ කරන්නේ. මහණෙනි, දෘෂ්ටි දෙකකින් මඩනා ලද දෙවියන් හා මනුෂ්‍යයින් අතරින් ඇතැම් කෙනෙක් පසුබසිනවා. ඇතැම් කෙනෙක් ඉක්මවා දුවනවා. පසුබැසීමත් ඉක්මවා දිවීමත් යන දෙක තේරුම් කරන්නේ මෙහෙමයි. ''**භවාරාමා භික්ඛවෙ දෙවමනුස්සා භවරතා භව සම්මුදිතා**'' මේ දෙවි මිනිසුන් භවයට ඇලුම් කරනවා. භවය ගැන උදම් වෙනවා. ඒ කියන්නේ පැවැත්ම ගැන ලොකු ආශාවක් ඇති අය, එබඳු අය භව නිරෝධය පිණිස ධර්මය දේශනා කරනකොට, ඒ ගැන ප්‍රසාදයක් ඇති කරගන්නේ නැහැ, ඒ ගැන පසුබසිනවා. ඒකට කැමති නැහැ.

භව නිරෝධය පිළිබඳව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන මධ්‍යම ප්‍රතිපදාත්මක දේශනාවලට කැමති නැහැ ශාස්වත දෘෂ්ටිය ගත්තු ආත්මවාදී අය. සාමාන්‍යයෙන් භවයට කැමති අය භව නිරෝධයට කැමති නැහැ. ඒ අය භව ඕඝයේ යට යනවා. භව සැඬ වතුරේ යට යනවා. මිදෙන්න උත්සාහයක් කරන්නේ නැහැ. ආත්මය හැටියට ගත්තු නිසා. අනික් පැත්තෙන් ප්‍රකාශ කරනවා ''**භවෙනෙව ඛො පන එකෙ අට්ටීයමානා, හරායමානා**''. ඇතැම් අය භවය ගැන පිළිකුලක් හිරිකිතයක්

ඇති කරගෙන උච්ඡේදවාදීන්, ඒ අය ඒ වෙනුවට කල්පනා කරනවා. මේ ශරීරය තමයි ආත්මය. මේක නැති උනාට පස්සේ අයෙ ඉපදීමක් නැහැ කියලා උච්ඡේදවාදී වීම ඒක ඉක්මවා යෑමක්. ඒකට කියන්නේ ''විභව''. එතකොට අරගොල්ලන් භවය දැඩිව අල්ලාගැනීම නිසා භව ඕඝයට යට වෙනවා. උච්ඡේදවාදීන් විභව කියලා කියන මේ ශරීරය නැති උනාට පස්සේ ඉවරයි කියලා කියන ඒ හැඟීම තුළ අනික් අන්තයට යනවා. ඒ අය තමයි අතිධාවනය කරන්නේ.

මේක අපි උපමාවකට ඇතැම් අවස්ථාවල කියල තියනවා. ධර්මයේ නැතත් - හරියට ඇතැම් කෙනෙක් තමන්ගේ හෙවනැල්ල අල්ලාගැනීමට දුවනවා. ඉස්සරහට දුවනවා, දුවනවා, කවදාවත් හෙවනැල්ල පාගගන්න බැහැ. පුංචි ළමයි සෙල්ලමටත් කරන්නෙ. සෙවනැල්ල පාගගන්න බැහැනෙ. තවත් කෙනෙක් සෙවනැල්ලට බයේ දුවනවා. දුවලා දුවලා ආපහු හැරිලා බලනකොට සෙවනැල්ල එතනමයි. ඔන්න ඒ වගේ තමයි. අන්ත දෙක. නමුත් බුදුරජාණන් වහන්සේ කළේ මොකක්ද? එතකොට අර විදියට අන්ත දෙක කියලා මැදුම් මග ප්‍රකාශ කරනවා ඒ අන්ත දෙකම අතහැරලා. බුදුරජාණන් වහන්සේ කරන්නේ මොකක්ද? අපි කිව්වනේ **''ඔලීයනති එකෙ අතිධාවනති එකෙ''** තුන්වෙනුව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා **''චකඛුමනෙතාව පසසනති''** ඇත්ත වශයෙන් බුදුරජාණන් වහන්සේ ආරම්භ කරන්නේ මෙහෙමයි. **''ද්වීහි භික්ඛවෙ දිට්ඨිගතෙහි පරියුට්ඨිතා දෙව මනුසසා ඔලීයන්ති එකෙ අතිධාවන්ති එකෙ චක්ඛුමනෙතාව පසසන්ති.'' තුන්වෙනි කාරණය''** චක්ඛුමනෙතාව පසසන්ති''. ඒ කියන්නේ ඇස් ඇත්තෝමැ දකිත්. අර අන්ත දෙක අත්හැරලා බුදුරජාණන් වහන්සේ දක්වන්නේ ඇස් ඇත්තෝම දකිත් කියලා කියන්නේ මොකක්ද? අන්න බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා. ඒක මෙහෙමයි ප්‍රකාශ කරන්නේ. **''භූතං භූතතො දිසවා''** අරගොල්ලෝ භවය විභවය දෙක අල්ලගෙන ඒ අන්ත දෙකට ගියා. බුදුරජාණන් වහන්සේ ඒ වෙනුවට මතු කළා අමුතු වචනයක් ''භූත''.

''භූත'' කියලා කියන්නේ ''හටගත්''. දැන් මේ පින්වතුන්ට ඒ වචනය හුරු වෙච්චි මෙන්න මේක කිව්වහම. අහලා තියෙනවානේ **''යථාභූත**

**ඤාණදස්සන**'' කියලා. යථාභූත කියලා කියන්නේ හටගත් දෙයට අනුව දැකීම. ඒ නිසා ධර්මය භවාන්තයට යන්නෙත් නැහැ ශාස්වතවාදීන් වගේ. විභව අන්තයට යන්නෙත් නැහැ උච්ඡේදවාදීන් වගේ. ඒ වෙනුවට 'හටගත්තු දෙය' හටගත් හැටියට දැකීම යථාභූත දස්සනයයි. හටගත්තු දෙය හටගත්තු හැටියට දැකීම කියන එක අර හෙවණැලි උපමාවෙන් කිව්වොත් **හෙවණැල්ල හෙවණැල්ලක්** බව අවබෝධ කර ගන්නවා. හෙවණැල්ල හෙවනැල්ල බව අවබෝධ කරගත්තට පස්සේ ඒක ඔස්සේ දුවන්නෙත් නැහැ. ඒකට බයේ දුවන්නෙත් නැහැ. **මොකක්ද හෙවණැල්ල කියන එක අපි කලින් ප්‍රකාශ කරල තියෙනවා නාමරූපයයි. නාමරූපයයි.**

අර '**ඒදණ්ඩ උඩ බල්ලා**' උපමාවෙන්, '**නාසිසස්' උපමාවෙන්,** නානා විධ උපමාවලින් මේ පින්වතුන්ට ඉගැන්නුවා. බුදුරජාණන් වහන්සේ ඒක තුළිනුයි මේ ''ඕස'' ප්‍රශ්නය - භවය පිළිබඳව කථා කරනවා නම් - විසඳුවේ. මොකද ලෝකයා දැඩිව ගත්තු විඤ්ඤාණ ආදිය බුදුරජාණන් වහන්සේ පෙන්නුවා විඤ්ඤාණයට අන්‍යෝන්‍ය ප්‍රත්‍ය වශයෙන් පවතිනවයි නාම රූපය. ඒක ගැන අපි කොතෙකුත් කිව්වා. නාමරූප හෙවනැල්ල. එතකොට හෙවණැල්ල හෙවණැල්ල බව දැකීම තුළින් අන්න බුදුරජාණන් වහන්සේ අර කියාපු අන්තයටත් ගියේ නැහැ. එතනත් මැදුම් පිළිවෙතක් තියෙනවා. කාම භව, ඊළඟට දිට්ඨි කියන එක. අපට මේවා ගැන කෙටියෙන් කියන්න වෙන්නේ කාරණා හතරක් තියන නිසා. දිට්ඨි ගැන ප්‍රකාශ කරනකොට එතනත් බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා කච්චානගොත්ත කියන සූත්‍රයේ[7]. ඒක ගැන අපි කලින් අවස්ථාවකත් ප්‍රකාශ කරලා තියෙනවා. මේ ප්‍රශ්නයට අදාළ නිසා නැවතත් කෙටියෙන් කියමු.

බුදුරජාණන් වහන්සේ ළඟට එක්තරා අවස්ථාවක කච්චායන ගොත්ත ස්වාමීන් වහන්සේ ඇවිල්ලා ඇහුවා කොතෙකින්ද භාග්‍යවතුන් වහන්ස සම්මා දිට්ඨිය වන්නේ කියලා. ඇත්ත වශයෙන් සම්මා දිට්ඨියට නානා විධ විවරණ ඒ ඒ අවස්ථාවලදී දීලා තියෙනවා. විශේෂයෙන්ම සාරිපුත්ත ස්වාමීන් වහන්සේත් බුදුරජාණන් වහන්සේත් අවස්ථානුකූලව. ඒ එකක්වත් එකිනෙකට විරුද්ධ නැහැ. දැන් අවස්ථානුකූලව හරි

මෙතෙන්දි බුදුරජාණන් වහන්සේ සමමා දිට්ඨිය ප්‍රකාශ කරන්නේ මෙහෙමයි. ''**ද්වයනිස්සිතො ඛ්වායං කච්චායන ලොකො යෙභුයොයන අත්ථිතඤ්චෙව නත්ථිතඤ්ච**'' කච්චායන මේ ලෝකයා වැඩි වශයෙන්ම අන්ත දෙකකට යනවා. ද්වයනිසසිත කියල කියන්නේ දෙකක් අල්ලා ගෙනයි ඉන්නේ. මොකක්ද දෙක අත්ථිතඤ්ච නත්ථිතඤ්ච. එක්කෝ අසතිත්වය එහෙම නැත්නම් නාසතිත්වය. ලෝකයා නිරන්තරයෙන්ම ඔය අන්ත දෙක තුළයි ඉන්නෙ. ඇතැම් අය අස්තිත්වය සියල්ල ඇතෙයි කියනවා ඇතැම් අය කියනවා කිසිවක් නැත කියලා. ඔය අන්ත දෙක. නමුත් ඔන්න ධර්මයේ දක්වෙන මැදුම් පිළිවෙත මොකක්ද කියලා ඊළඟට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. ''**ලොක සමුදයං ඛො කච්චායන යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො යා ලොකෙ නත්ථිතා සා න හොති**'' ලොකයේ නිරන්තරයෙන්ම හටගන්නා ස්වභාවය දකිනකොට ලෝකය පිළිබඳ නාස්තික දෘෂ්ටිය ඉවත් වෙනවා. ඊළඟට අනිත් පැත්ත ප්‍රකාශ කරනවා. ''**ලොක නිරොධං ඛො කච්චායන යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො යා ලොකෙ අත්ථිතා සා න හොති**'' ලෝක නිරෝධය ඇති හැටියටම සම්‍යක් ප්‍රඥාවෙන් දකින්නහුට යථාභූත වශයෙන් ලෝකය පිළිබඳ අස්තිත්වය නැති වෙනවා. දැන් සලකා බලන්න. මහ පුදුමයි මේක. ලෝකය නිරන්තරයෙන් ඇති වෙමින් නැති වෙමින් යනවා. අරගොල්ලො අන්ත වශයෙන් සිතාගන්නවා ලෝකය එක්කො සම්පූර්ණයෙන්ම ඇත්ත වශයෙන්ම තියෙනවා, එහෙම නැත්නම් නැතෙයි කියලා. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ ලෝකය නිරන්තරයෙන්ම ඇති වන බව සම්‍යක් ප්‍රඥාවෙන් යථාභූත වශයෙන් දකිනකොට නැතෙයි කියන අන්තය අතහැරෙනවා ඉබේටම. අනිත් පැත්තෙන් ලෝක නිරෝධය ලෝකය නිරුද්ධ වෙතැයි නිරන්තරයෙන් ප්‍රඥාවෙන් දකිනකොට ඇතෙයි කියන අස්තිත්වය නැති වෙලා යනවා. ලෝකය හටගන්න ස්වභාවය දකිනකොට නාස්තිත්ව අන්තය නැති වෙනවා. ලෝකය නිරුද්ධ වෙන අන්තය දකින කොට අස්තිත්වය කියන අන්තයට වැටෙන්නෙත් නැහැ. ඒ විදියට ඒ දෙකට මැදින් - ඒ දෙකට මැදින් මොකක්ද කියන එකත් මීළඟට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. ''**එතෙ තෙ උභො අන්තෙ අනුපගම්ම**'' මේ අන්ත දෙකටම නොයා ''**මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති**'' මධ්‍යම මාර්ගයකින් බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කරනවාය කියලා. මධ්‍යම මාර්ගය

තමයි අපි මෙතෙක් ප්‍රකාශ කළ පටිච්චසමුප්පාද දේශනාව. ඊළඟට ඉදිරිපත් කරනවා ඒක. මේ පින්වතුන් අහල තියෙනවානෙ. ඒකෙ කියන්නේ අවිජ්ජා පච්චයා සංඛාරා ආදී වශයෙන්, අවිද්‍යාව ප්‍රත්‍යයෙන් සංස්කාර ඇති වෙනවා. එහෙම ගිහිල්ලා මුළු පඤ්ච උපාදානස්කන්ධ දුක්ඛය ඇති වෙනවයි කියලා. අවිද්‍යාවගේම නැති වීම තුළින් ඒක නැති වෙනවාය. එතකොට ඒක මධ්‍යස්ථ දර්ශනයක්. ඇති වීමත් නැති වීමත් - අවිද්‍යාවෙන් පටන්ගන්න මුළු මහත් දුක ඇති වීම. ඊළඟට ඒක නැති වන ආකාරය එතෙන්දි පෙන්නුම් කරනවා.

ඔය විදියට එතකොට බුදුරජාණන් වහන්සේ ඒ අන්ත දෙකම ප්‍රතික්ෂේප කරලා, දිට්ඨි වශයෙන් තියෙන අස්ති නාස්ති දෙකම අත හැරියට පස්සේ, ඊළඟට පෙන්නුම් කරන්නේ එතන අන්තිමට ඉතුරු වෙන්නේ දුක පිළිබඳ ප්‍රශ්නයක්. ආත්ම කියන සංඥාව එතනම ඉවරයි. **ආත්මය වෙනුවට ඇත්ත වශයෙන්ම තියෙන්නේ දුකක් හා එහි නිරුද්ධ වීමක් පමණයි.** ඒකයි එතන මධ්‍යම ප්‍රතිපදාව. එතකොට **අස්ති නාස්ති දෘෂ්ටි දෙකෙන් මිදුණු සමුදය වය - ඇති වීම හා නැති වීම.** දැන් එතෙන්දි කෙනෙකුට හිතෙන්න පුළුවන් අර අපි කලින් කිව්ව වගේ ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ මේව කිසිවක් නැහැ කියලා. නමුත් අපි දන්නවා ආර්‍ය අෂ්ටාංගික මාර්ගයේ සම්‍යක් දෘෂ්ටිය හැටියට දක්වලා තියෙන්නේ දුක්ඛ, සමුදය, නිරොධ, මාර්ග. දුක්ඛ සමුදය නිරොධ මාර්ග තුළ තියෙන්නේ අර ඒකාන්ත අස්තිත්වයෙනුත් ඒකාන්ත නාස්තිත්වයෙනුත් මිදුනු සම්‍යක් දෘෂ්ටියක්. සම්‍යක් දර්ශනයක්. බොහෝ දෙනා ඒක කල්පනා කරන්නේ නැහැ. **මොකද සම්මා දිට්ඨිය පටන් ගන්නෙම බුදුරජාණන් වහන්සේ දක්වූ මැදුම් පිළිවෙතින්.** ඒ අතින් බලනකොට අපට කියන්න පුළුවන් ධම්මචක්කප්පවත්තන සූත්‍රයට පුංචි අටුවාවක් වගෙයි කච්චායන ගොත්ත සූත්‍රය.

හොඳට හිතල බලන්න මේ පින්වතුන්. එහෙම කිව්වෙ මේකයි. තනිකර ගත්තොත් ධම්මචක්කප්පවත්තන සූත්‍රයෙ බැලූ බැල්මට පටිච්ච සමුප්පාදය නෑ වගේ. නමුත් අපි පෙන්නුම් කරන්නේ සම්මා දිට්ඨිය තුළ තියනවා අර පටිච්ච සමුප්පාදයේ මධ්‍යම ප්‍රතිපදාව. අපි පෙන්නුම් කළේ ඒකනේ. ඒකාන්ත අස්තිත්වයකුත් නැහැ ඒකාන්ත නාස්තිත්වයකුත් නැහැ.

ඒ වෙනුවට හේතු ප්‍රත්‍යයන් නිසා ඇති වීමක් හා නැති වීමක් තියනවා. **ඇති වෙනව නම් ඇති වෙන්නේ තනිකර දුකක්. නැති වෙනවා නම් නැති වෙන්නේ තනිකර දුක් ගොඩක්.** කොටින්ම ඒ කච්චායන ගොත්ත සූත්‍රය අවසාන කරන්නේ - ඒ විදියට විග්‍රහය සම්පූර්ණයෙන් නොකිව්වත් මෙහෙම හිතාගත්ත - ඒ සූත්‍රයේ තව දුරටත් බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා අර කියාපු දෘෂ්ටි ගත්තු අය ඒවායින් ඒ දෘෂ්ටිවලට ළංවීම් තුළින් ආත්මයක් පිළිබඳ අදහස ඇති කරගන්නවා. ශාස්වත වාදියා සදාකාලික ආත්මයක් පිළිබඳව විශ්වාස කරනවා. උච්ඡේද වාදියා මේ ශරීරය ආත්මය කියලා හිතාගන්නවා. **ඒ හැම එකකටම හේතුව ස්ථාවරයක් ගැනීමයි. දැඩිව දෘෂ්ටියක් ගැනීමයි.** ඒ වෙනුවට ඒ සම්‍යක් දර්ශනයේ තිබෙන්නේ දෘෂ්ටිය ගත්තු නැති තැන. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. ''**දුක්ඛමෙව උප්පජ්ජමානං උප්පජ්ජති, දුක්ඛං නිරුජ්ඣමානං නිරුජ්ඣති**' උපදින්නේ දුකක්ම උපදියි නිරුද්ධ වන්නේ දුකක්ම නිරුද්ධ වෙයි කියලා.

ඒක නිසයි ඒ තැනැත්තාට කිසිම කංඛා විචිකිච්ඡා සැක දෙගිඩියා අතීතය පිළිබඳව හෝ අනාගතය පිළිබඳව කිසිවක් ඇති වෙන්නේ නැත්තේ. අතීතයේ තිබුනා නම් තිබුණේ මේ පඤ්ච උපාදානස්කන්ධය මයි. අනාගතයේත් මේකමයි. මෙතන ගන්න දෙයක් නැහැ කියන ඒ අවබෝධය ඇති වෙනවා. ඒ වෙනුවට දුකයි තියෙන්නේ. අන්න ඒ කියාපු දුක පිළිබඳව චතුරාර්‍ය සත්‍යය තුළ තියෙන්නේ අර මධ්‍යම ප්‍රතිපදාවමයි. අපි සාමාන්‍යයෙන් මධ්‍යම ප්‍රතිපදාව කියනකොට පටිච්චසමුප්පාදය එතන නෑ වගෙයි පෙනෙන්නේ. ඒක පෙන්නුම් කරන්නයි මේ කිව්වේ. කච්චායන ගොත්ත සූත්‍රය ඇත්ත වශයෙන්ම පුංචි අටුවාවක් වගෙයි ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා දිට්ඨියට. දැන් එතකොට අපි කිව්වා කාමොඝ කාම සැඩ වතුරෙන් මිදීමටත් බුදුරජාණන් වහන්සේ මැදුම් පිළිවෙතක් දක්වූවා. භව සැඩ වතුරෙන් මිදීමටත් මැදුම් පිළිවතක් දක්වූවා. ඊළඟට දෘෂ්ටි පිළිබඳවත් අර කියාපු අත්ථිත්ව නාත්ථිත්ව දෘෂ්ටි දෙකම ඉවත් කරලා අර සමුදය වය දුක පිළිබඳ කථාන්තරය එතෙන්දි මතු වුණා. ''දුක්ඛමෙව උප්පජ්ජමානං උප්පජ්ජති දුක්ඛං නිරුජ්ඣමානං නිරුජ්ඣති''. එතනත් පටිච්ච සමුප්පාදය.

ඔන්න ඊළඟට කියනවා. මේක ටිකක් අමුතු දෙයක් වෙන්න පුළුවන්. අවිජ්ජාසව කියන එක. අවිද්‍යාවත් සැඬ වතුරක් හැටියට දක්වලා තියනවා. ඒක ටිකක් තේරුම්ගන්න අමාරු දෙයක් සැඬ වතුර හතරෙන්. සැඬ වතුරක් හැටියට දැක්වූයේ මොකද කියන එක තේරුම් ගන්න අපට උපකාර වෙනවා සාරිපුත්ත ස්වාමීන් වහන්සේ දේශනා කළ සම්මා දිට්ඨි සූත්‍රය.[8] ඇත්ත වශයෙන් සම්මා දිට්ඨිය පිළිබඳ හැඳින්වීම් කීපයක්ම තියනවා. එකක් නොවෙයි. එක එක මට්ටමින්, එකකට එකක් පරස්පර විරෝධී නොවෙයි. නමුත් එක එක පැත්තෙන් බලන කොට හරි. ඔන්න එකක් තමයි මේක. ඒ කියන්නේ, ඇවැත්නි යම් අවස්ථාවක ආර්ය ශ්‍රාවකයෙක් අවිද්‍යාව දන්නවා නම්, අවිද්‍යාවේ හට ගැනීම දන්නවා නම්, අවිද්‍යාවේ නිරෝධය දන්නවා නම් අවිද්‍යා නිරෝධගාමිනී ප්‍රතිපදාව දන්නවා නම් එපමණකිනුත් සම්මා දිට්ඨිය ඇත්තෙක් වෙයි. යම් අවස්ථාවක ''**අවිජ්ජං ච පජානාති, අවිජ්ජා සමුදයං ච පජානාති, අවිජ්ජා නිරොධං ච පජානාති අවිජ්ජා නිරොධගාමිනී පටිපදං ච පජානාති**''. මේ හතර දැනගත්තොත් එපමණක් ඇති සම්මා දිට්ඨියට කියලා. එතනදී අවිදාව කියන්නේ මොකක්ද? අවිද්‍යාව කියන්නේ මොකක්ද කියලා ඉස්සෙල්ල විග්‍රහ කරලා තියනවා. අවිද්‍යාව හැටියට හඳුන්වලා දීලා තියෙන්නේ දුක්ඛෙ අඤ්ඤාණං, දුක්ඛසමුදයෙ අඤ්ඤාණං, දුක්ඛ නිරොධෙ අඤ්ඤාණං, දුක්ඛ නිරොධ ගාමිනියා පටිපදාය අඤ්ඤාණං, ඒ කියන්නේ දුක පිළිබඳව නොදැනීම, දුක්ඛ සමුදය දුකේ හටගැනීම පිළිබඳ නොදැනීම, දුකඛ නිරෝධය පිළිබඳ නොදැනීම, දුකඛ නිරෝධ ගාමිනී ප්‍රතිපදාව ගැන නොදැනීම. ඒක අවිද්‍යාව. ඊළඟට අවිද්‍යා සමුදය මොකක්ද? ඔන්න ඔතනයි ගැටලුව. අවිද්‍යාවේ හටගැනීම මොකක්ද?

අන්න එතන අමුතු දෙයක් සඳහන් වෙනවා. **ආසව සමුදයා අවිජ්ජා සමුදයො.** ආශ්‍රවයන්ගේ හටගැනීමෙනුයි අවිද්‍යාව හටගන්නෙ. මේක පටිච්ච සමුප්පාදය විග්‍රහ කරන හැමෝටම පටලැවිල්ලක්. අවිද්‍යාවනෙ මුලටම තියෙන්නේ. එතකොට හිතාගන්නවා අවිද්‍යාවට මූල හේතුවක් නැත. ඔහේ අවිද්‍යාව ඉස්සෙල්ලා තියෙනවා. ඊට පස්සේ අනිත් ඒවා ඇති වෙනවා. ඔන්න මෙතන විසඳුම තියෙනවා. බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් ශාරිපුත්‍ර ස්වාමීන්වහන්සේ ප්‍රකාශ කරනවා. ''**ආසව සමුදයා අවිජ්ජා සමුදයො ආසව නිරොධා අවිජ්ජා නිරොධො.**'' ආශ්‍රවයන් හට

ගත්තම අවිද්‍යාව හටගන්නවා. ආශ්‍රව නිරුද්ධ වෙනකොට අවිද්‍යාවත් නිරුද්ධ වෙනවා. ඊළඟට අවිද්‍යා නිරෝධගාමිනී ප්‍රතිපදාවට දක්වෙන්නේ වෙන එකක් නොවේ. ඒත් ආර්‍ය අෂ්ටාංගික මාර්ගයමයි. ඔන්න එතන ඉඳලා අපට විශේෂ දෙයක් කියන්න වෙනවා.

දැන් මේ පින්වතුන් ඇතැම් විට දන්නවත් ඇති, අහලත් ඇති, කියවලත් ඇති, මැදුම් සඟියේ දෙවෙනියට සඳහන් වන **සබ්බාසව සූත්‍රය.**[9] සියලුම ආශ්‍රව සංවර කිරීමේ ක්‍රමය ඒ මැදුම් සඟියේ දෙවන සූත්‍රයෙන් දක්වෙනවා. **ඒ තරම් වැදගත් තැනක් ඒ සූත්‍රයට ලැබිලා තියෙන්නේ ඔන්න ඔය කාරණය නිසා. අවිද්‍යාවට හේතුව අවිද්‍යාවේ සමුදය හැටියට දක්වලා තියෙන්නේ ආශ්‍රවයයි.** මේ ආශ්‍රව කියන වචනය ඇත්ත වශයෙන් තේරුම් කරල දෙන්න ටිකක් අමාරුයි. බොහෝ දෙනා එක එක විදියට ඕක විග්‍රහ කරනවා. අපි ටිකකට හිතමු. මේ එක ක්‍රමයක් තේරුම් ගන්න. අපි නොයෙකුත් උපමා හැම අවස්ථාවකම දක්වනවා නේ. අපි 'ඕඝ' කියන එක හඳුන්වන්නේ **ගලාගෙන යන සැඩ වතුරක්** හැටියට. **ගලාගෙන යන** සැඩ වතුරක් ගැන කියනකොට ඒක කොයි විදියට තිබුනත් අපට වැඩක් නැහැ. අපට හානියක් නැහැ. ඔහේ ගලාගෙන යනවනෙ. අපි යම් වෙලාවක මේකෙන් එතර වෙන්න හිතාගෙන සැඩ වතුරට බැස්සා නම් - බැස්සා කියලා හිතමු. එතකොට කොහොමද ඒ සැඩ වතුර පිළිබඳව හිතෙන්නේ.

**ඒක ගලාගෙන එන සැඩ වතුරක්. ඒ ඒම තමයි අපට බාධාවකට තියෙන්නේ. ඒක ගලාගෙන එනවා. අපි මෙතෙක් ගලාගෙන යනවා දැක්කා.** දැන් ඒකට බැස්සාට පස්සේ එතර වෙන්න, ඒකෙ ගලාගෙන ඒමක් තියෙනවා. **ඔන්න පින්වතුනි ආශ්‍රව කියන වචනයේ මූලික අර්ථය. ගලාගෙන එනවා.** ඒ ගලාගෙන ඒම හත් ආකාරයකට වෙන බව මේ සබ්බාසව සූත්‍රයේ දක්වනවා. අපි කෙටියෙන් කිව්වොත් මේක මහ ගැඹුරු සූත්‍රයක්. හකුළුවා දැක්වීම් වශයෙන් කිව්වොත්. බුදුරජාණන් වහන්සේ මේ විදියටයි ඒක ආරම්භ කරන්නේ. ''**සබ්බාසව සංවර පරියායං වො භික්ඛවෙ දෙසිස්සාමි**'' මහණෙනි, මම නුඹලාට සියලුම ආශ්‍රව සංවර කිරීම පිළිබඳව දේශනා කරන්නෙමි.

සංවර කිරීම කියල කියන්නේ වැසීම. මේ පින්වතුන් අහල

තියනවනේ ඉන්ද්‍රිය සංවරය පිළිබඳව - වසාගැනීම - ඒ පිළිබඳ ක්‍රමය මම ප්‍රකාශ කරනවා කියලා ඊළඟට ප්‍රකාශ කරනවා බුදුරජාණන් වහන්සේ **''ජානතො අහං භික්ඛවෙ පස්සතො ආසවානං ඛයං වදාමි, නො අජානතො නො අපස්සතො''**. මම ප්‍රකාශ කරනවා මේ ආශ්‍රවයන් ක්‍ෂය කිරීම දැනුවත්ව ඥානයෙන් යුතුව ඒ වගේම දැකීමෙන් යුතුව - අපි කියමු දනිමින්, දකිමින් - **දනිමින්, දකිමින්, තමයි මේ ආශ්‍රව සංවර වෙන්නෙ.** මේ ආශ්‍රව පිළිබඳව යමක් කරන්න සිද්ධ වෙන්නෙ. කුමක් දනිමින් දකිමින්ද කියල බුදුරජාණන් වහන්සේම මේ ප්‍රශ්නය නගලා ඊළඟට තේරුම් කරනවා. මොනවද මේ ආශ්‍රව සංවර කිරීමට උපකාර වන කාරණා දෙක.

අපි නොයෙකුත් අවස්ථාවල මතක් කළ එකක්. **අයෝනිසෝ මනසිකාරයත් යෝනිසෝ මනසිකාරයත් පිළිබඳ අවබෝධයයි.** අන්න ඒකයි එතකොට මේ ආශ්‍රව සංවර කිරීම සඳහා උපකාර වන කරුණු දෙක. පළමුවෙන්ම බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා අයෝනිසෝ මනසිකාරය හඳුනගන්න ඕන. අයෝනිසෝ මනසිකාරය අයෝනිසෝ මනසිකාර හැටියටත්, යෝනිසෝ මනසිකාරය යෝනිසෝ මනසිකාරය හැටියටත්. අපි සාමාන්‍යයෙන් කාටත් තේරෙන හැටියට කිව්වොත් **අයෝනිසෝ මනසිකාරය කියන්නේ අනිසි මෙනෙහි කිරීම, වැරදි විදියට මෙනෙහි කිරීම, වැරදි කොනින් තේරුම්ගන්න උත්සාහ කිරීම. යෝනිසෝ මනසිකාරය කියන්නේ යමක් හටගත්තු තැනට, හේතුවට, හිත යොදල නිසියාකාරව, හරියාකාරව, තේරුම්ගැනීමයි.**

එතකොට නොනිසි මෙනෙහි කිරීමත් හඳුනාගන්න ඕන, නිසියාකාර මෙනෙහි කිරීමත් හඳුනාගන්න ඕන ආශ්‍රව සංවර කිරීම සඳහා. ආශ්‍රව හත් වර්ගයක් ප්‍රකාශ කරන බව අපි කිව්වා ඉස්සෙල්ලා. ඒවා හඳුන්වල දෙමු. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා **''අත්ථි භික්ඛවෙ ආසවා දස්සනා පහාතබ්බා''**. මහණෙනි, ඇතැම් ආශ්‍රවයන් තියනවා ''දස්සන'' කියල කියන්නේ දැකීම දර්ශනය. දැක්ම තුළින් ප්‍රහාණය වන ඒ පළමුවෙනි කොටස. තවත් ආශ්‍රව කොටසක් තියනවා **සංවර කිරීම** තුළින් ප්‍රහාණය වන. තවත් ආශ්‍රව කොටසක් තියනවා **පටිසෙවන** කියල කියන්නේ පාවිච්චි කිරීම තුළින් පරිහරණයෙන්. තවත් ආශ්‍රව කොටසක් තියනවා ''**අධිවාසනා**'' කියල කියන්නේ ඉවසීම තුළින්, දරා ගැනීම

තුළින් සංසිඳවාගන්න. තවත් ආශ්‍රව කොටසක් තියනවා ''**පරිවජ්ජනා**'' වර්ජනය තුළින් ප්‍රහාණය වන. තවත් ආශ්‍රව කොටසක් තියනවා ''**විනොදනා**'' දුරු කිරීම තුළින් ප්‍රහාණය වන. පරිවජ්ජනා කියන කොට අපි කියමු වර්ජනය කිරීම තුළින් කියලා. එහෙම නැත්නම් මගහැරීම කියලා. මේ වචන ටිකක් කිට්ටුවෙන් යන්නේ තේරුම් කරනකොට පැහැදිලි වේවි. හය වෙනුවට තියෙන්නේ ''**විනොදනා**'' දුරු කිරීම තුළින් ප්‍රහාණය වන. අන්තිමට කියනවා '**භාවනා**' වැඩීම. **දස්සනා පහාතබ්බා, සංවරා පහාතබ්බා, පටිසෙවනා පහාතබ්බා, අධිවාසනා පහාතබ්බා, පරිවජ්ජනා පහාතබ්බා, විනොදනා පහාතබ්බා, අවසානයට භාවනා පහාතබ්බා.** මහ පුදුම දෙයක් මෙතන ප්‍රකාශ වෙන්නේ. ගැඹුරු සූත්‍රයක් මේක. යම් යම් තැන්වල ඇතැම් අය පටලවාගෙනත් තියනවා.

ඊළඟට අපි වෙලාව තියන හැටියට මේක ටිකක් විග්‍රහ කරනවා නම් ඉස්සෙල්ලාම ''**දස්සනා පහාතබ්බා**''. බුදුරජාණන් වහන්සේ දර්ශනයෙන් දැකීම තුළින් ප්‍රහාණය කළ යුතු ආශ්‍රව ගැන කියන කොට ලෝකයේ ඇතැම් අය ඉන්නවා නොනිසි ආකාරයෙන් මෙනෙහි කරනවා. අතීතයේ හිටිය ශ්‍රමණ බ්‍රාහ්මණයින්. මොකක්ද නොනිසි ආකාරයෙන් මෙනෙහි කිරීම? ඒ කොහොමද? යම් කෙනෙක් හිතනවා තමා කියලා කෙනෙක් 'මම' ඇත්ත වශයෙන්ම ඉන්නවා කියලා හිතාගෙන මම අතීතයේ වූයෙම්ද, නොවූයෙම්ද, කවරෙක් වූයෙම්ද, කෙසේ වූයෙම්ද, කවරෙක් වී කවරෙක් වූයෙම්ද. ඒ විදියට පස් ආකාරයකින් අතීතය පිළිබඳව. අනාගතය පිළිබඳව, තමා අනාගතයේ වන්නෙම්ද නොවන්නෙම්ද, කවරෙක් වන්නෙම්ද, කෙසේ වන්නෙම්ද, කවරෙක් වී කවරෙක් වන්නෙම්ද, වර්තමානය පිළිබඳව හිතනවා. මම ඉන්නෙම්ද මම නොඉන්නෙම්ද කවරක්ව ඉන්නෙම්ද, කෙසේ ඉන්නෙම්ද, මේ සත්ත්වයා කොතනින් ඇවිල්ලා කොතනට යනවද. ඔන්න ඔය විදියට වර්තමානය. ඒ කියන්නේ, **කාලත්‍රය පිළිබඳව ''මම'' කියන එක ඉස්සරහට අරගෙන, ''මම'' කියන ප්‍රස්තුතය හරි දෙයක් විදියට හිතාගෙන කරන නොනිසි මෙනෙහි කිරීම** තුළින් ඒ අය අන්තිමට එක්කො ''මට ආත්මයක් ඇත'' කියන අන්තයට යනවා. එක්කො ''මට ආත්මයක් නැත'' කියන අන්තයට යනවා. ඒ දෙකම අන්ත දෙකක්. ඒ වෙන්නේ අර නොනිසි මෙනෙහි කිරීම නිසයි. ''මම'' ඉස්සරහට දාගෙන. ඒක කෙළවර වෙන්නේ අයෝනිසෝ

මනසිකාරයෙන්, අතීතයේ වූයෙම්ද නොවූයෙම්ද කියල නොයෙකුත් සැක ඇති වෙනවා. ඒ වෙනුවට බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ **සම්‍යක් දර්‍ශනය තුළින් ආර්‍ය ශ්‍රාවකයාට එහෙම එකක් ඇති වෙන්නෙ නැත්තෙ මොකද, ආර්‍ය ශ්‍රාවකයා හිතන්නේ දුක්ඛ සමුදය, නිරෝධ මාර්‍ග කියන එක  අනුවයි.**

චතුරාර්‍ය සත්‍යය අනුව මෙනෙහි කරනකොට එහෙම ප්‍රශ්නයක් නැහැ. අතීතයේ තිබුණා නම් තිබුණේ පඤ්ච උපාදානස්කන්ධ දුක්ඛයයි. අනාගතයේ තියෙන්නෙත් දුකක්. එතකොට මෙතන තිබෙන්නේ දුකක් එහි හටගැනීමක් එහි නිරුද්ධ කිරීමක් හා එය නැති කිරීමේ මාර්‍ගයක් පමණයි. චතුරාර්‍ය සත්‍යය අනුව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා **යම් කෙනෙක් චතුරාර්‍ය සත්‍යය අනුව යෝනිසෝ මනසිකාරයෙන් මෙනෙහි කරනවා නම් ඒක කෙළවර වෙන්නේ සෝවාන් මාර්‍ග ඥානය පහළ වීමෙන්.** ඊළඟට ඒකෙ ප්‍රතිඵලය සක්කාය දිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාස ප්‍රහාණය වීමයි. එතකොට දස්සනා පහාතබ්බා විදියට දක්වන්නේ අර මුල් සංයෝජන තුන පිළිබඳවයි. ඒ දර්‍ශනය අවසාන වන්නේ ඒක හරියාකාර මෙනෙහි කරනවා නම් චතුරාර්‍ය සත්‍යය පිළිබඳව ඒ තැනැත්තාට අන්තිමේදී සක්කාය දිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාස කියන ඒ සංයෝජන කැඩිල යනවා. **ඔන්න 'දස්සනා පහාතබ්බා'.**

ඊළඟට '**සංවරා පහතබ්බා**' කියන එක. අපි කෙටියෙන් තේරුම් කළොත් මෙහෙමයි. ඉන්ද්‍රිය සංවරය හා සම්බන්ධයි. එතනදීත් බුදුරජාණන් වහන්සේ මේ හැම එකකටම තව පුදුම වචන කීපයකුත් සඳහන් කරනවා. ඒකත් මතු කරල දෙමු. ''**පටිසංඛායොනිසො**'' කියන වචනය දක්වනවා. පටිසංඛායොනිසො කියන්නේ පින්වතුනි නුවණින් සලකා. **දැන් යෝනිසෝ මනසිකාරය අයෝනිසෝ මනසිකාරය හඳුනා ගත්තට පස්සේ  ආර්‍ය ශ්‍රාවකයින් නුවණින් සලකා අවස්ථානුකූලව මෙන්න මේ විදියට පිළිවෙත් ගන්නවා. ඒ ගැනීමේ ආනිශංස එක පැත්තකින් පෙන්නුම් කරනවා. නොගැනීමේ ආදීනව පෙන්නුම් කරන්න බුදුරජාණන් වහන්සේ තව වචන දෙකක් යොදනවා. 'ආසවා විඝාතපරිළාහා.'**

විඝාත පරිළාහා කියන්නේ පින්වතුනි, වෙහෙස සහ දැවිල්ල ආදිය.

අපි ඉන්ද්‍රිය සංවරය ගැන කියනකොට තේරේවි. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා ඇස සංවර කිරීම පිළිබඳව. ඇස හරියට සංවර කර ගත්තෙ නැත්නම් නොයෙකුත් විදියට කෙලෙස් ආශ්‍රව ගලාගෙන එන්න පුළුවන්. ඒවා තුළින් තමන්ගේ ඇතුළත තියන කෙලෙස් ඇවිස්සෙන්න පුළුවන්. විඝාත පරිළාහා කියන වෙහෙස පරිළාහ ආදිය ඇති වෙන්න පුළුවන්. ඒක ගැන නුවණින් සලකලා - පටිසඞ්ඛා යොනිසො - චක්ඛුන්ද්‍රිය සංවරය, ඇස සංවර කරගන්නවා. ඉන්ද්‍රිය සංවර කිරීම ගැනයි මෙතන කියන්නේ, ඇස, කන, නාසය, දිව, කය, මන, කියන ඉන්ද්‍රිය හය පිළිබඳව සංවරය තමයි මෙතන ප්‍රකාශ කරන්නෙ. ඒ සංවරය බුදුරජාණන් වහන්සේ අනුදැන වදාරන්නේ මොකද, ඒවා සංවර කර නොගත්තොත් අන්න අර කියාපු වෙහෙසකර පීඩාකර ආශ්‍රව ගලාගෙන එනවා. ඒක නිසා ඒවා සංවර කරගන්න ඕන. ඔන්න එපමණකින් ''සංවරා පහාතබ්බා'

ඊළඟට '**පටිසෙවනා පහාතබ්බා**' කියල කියන්නේ බුදුරජාණන් වහන්සේ මෙතනදී කියන්නේ සිව්පස පරිභෝගය පිළිබඳව. අපි කලින් කිව්වනේ නිගණ්ඨයින් අන්තයට ගිහිල්ලා වස්ත්‍රත් ඉවත් කරලා, ආහාරත් ඉවත් කරලා මෙපමණකින් මගේ තෘෂ්ණාවෙන් මිදෙන්න පුළුවන් කිව්වා. නමුත් බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා මේ සිව්පසය පාවිච්චි කරන්න සිද්ධ වෙනවා ජීවත් වෙනව නම් ජීවිතය රැකගැනීම සඳහා. චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානපච්චය ආදිය. අපි හිතමු මෙහෙම චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානපච්චය කියන ඒ සිව්පසය හැම එකක්ම 'පටිසෙවනා' කියන්නේ ඒවා පාවිච්චි කරන්න සිද්ධ වෙනවා. **ඒවා පාවිච්චි කරන්නේ පාවිච්චි නොකිරීම නිසා නොයෙකුත් වෙහෙස පීඩා ඇතිවන නිසා.** ඒවා බුදුරජාණන් වහන්සේ අත්දුටුවා, සීමාන්තිකව ඒ ආහාර ආදිය නොගැනීමෙන්. ඒ වෙනුවට අපි කලින් කිව්ව වගේ මධ්‍යම ප්‍රතිපදාවෙන් 'පටිසංඛා යොනිසො'- ඒ වචන සඳහන් වෙනවා අර ප්‍රත්‍යවේක්ෂා පාඨයේ. 'පටිසඞ්ඛා යොනිසො පිණ්ඩපාතං පටිසෙවාමි' මම නුවණින් කල්පනා කරලා පිණ්ඩපාතය පාවිච්චි කරනවා. ඔන්න ඊළඟට පරමාර්ථය කියනවා ''**නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය**'' එහෙම කියලා. මේවා සඳහා නොවේ. හුදෙක් මේ ශරීරය පවත්වාගැනීම සඳහාය කියලා. ඊළඟට කලින් කිව්ව වගේ භාවනාවට හරවාගන්න ආකාරය පෙන්වනවා. ඇතැම් දේවල් තිබෙනවා, පටිසෙවනා කියන පාවිච්චිය තුළින්, පැමිණෙන්න පුළුවන් ඒ දුවිලි ආදිය ඉවත් කරගැනීම.

තේරුම්ගන්න බලන්න මේ පින්වතුන් ''පටිසෙවනා පහාතබ්බා' කියන්නේ සිව්පසය වැනි ජීවිතයට අත්‍යවශ්‍ය දේවල් නුවණින් කල්පනා කරලා - ආවාට ගියාට නොවේ. ඒවායේ පරමාර්ථය සලකාගෙන ඒවා භාවනාවට හරවාගෙන පරිභෝග කිරීම තුළින්, පරිභෝග නොකිරීමෙන් ඇති වන අනවශ්‍ය දුවිලි පීඩා ආදිය වළක්වාගන්නවා. එතර වීමේ කාර්යයේදී යටත් පිරිසෙයින් ශරීරයවත් රැකගන්න එපායැ. තව යන්න තියෙනවනෙ. ඒවා තමයි ආහාර තුළින්, සේනාසන තුළින්, වස්ත්‍ර තුළින් ගිහි ජීවිතයේ නොයෙකුත් කෙලෙස් ගලාගෙන එනවා. අපි ඒවා අවම කරගන්නවා අල්පේච්ඡතාව තුළින් ඔන්න ඔය විදියට හිතා ගන්න. එතකොට ඒ පටිසෙවනා.

ඊළඟට '**අධිවාසනා පහාතබ්බා**' ඉවසීම. ඉවසීම කියන එක එයින් කෙටියෙන් දක්වන්නේ යෝගාවචරයන්ට අවස්ථානුකූලව ශීතලෙන්, උෂ්ණයෙන්, නොයෙකුත් කායික පීඩා, මැසි මදුරු පීඩා, සමහර විට පණ යන තරම් බරපතළ පීඩා විඳ දරාගන්න සිද්ධ වෙනවා. **විඳ දරාගත යුතු වන්නේ මොකද? විඳ දරා නොගැනීම තුළින් නොයෙකුත් වෙහෙස දුවිලි ආදිය ඇති වෙනවා.** අපි මෙහෙම හිතමු. අපට තුවාලයක් ඇති වෙලා අපි කෑගහනවා. විලාප තියනවා. එයිනුත් ඇති වෙන්නේ වෙහෙස දුවිලි. ඒ වෙනුවට ඒක අමාරුවෙන් හරි අපි විඳ දරාගත්තොත් ඒක නිවනටත් උපකාර වෙනවා. අර අනවශ්‍ය කරදර ඇති වෙන්නේ නැහැ. ඒ ටිකෙන් හිතාගන්න. ඒකයි බුදුරජාණන් වහන්සේ කිව්වේ. ඇතැම් දේවල් පිළිබඳව 'අධිවාසනා පහාතබ්බා' ඉවසන්න වෙනවා. ඒ විතරක් නොවෙයි නානා විධ දුක් වේදනා බැනුම් ආදී දේවල් ඒවත් ඉවසන්න, අමාරුවෙන් හරි විඳ දරාගන්න, සිද්ධ වෙනවා. 'දුරුත්තානං දුරාගතානං' ඒවා ඉවසන්න සිද්ධ වෙනවා. අන්න ඒ වගේ දේවල් ඉවසීමත් ආශ්‍රව සංවර කිරීමක්.

ඊළඟට ප්‍රකාශ කරනවා '**පරිවජ්ජනා පහාතබ්බා**'. වර්ජනය කිරීම එහෙම නැත්නම් මග හැරීම. ඒකෙන් දක්වන්නේ මෙහෙමයි. සාමාන්‍ය ලෝකයා ඒක ලොකුවට ගත්තෙ නැතත් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා දැන දැන තමන් චණ්ඩ ඇතුන්, චණ්ඩ අශ්වයන්, බල්ලන්, ගවයන් ආදීන්ගෙන් බේරෙනවා. ඇතුන් ඉස්සරහට යන්නෙ නැහැ, 'ආ, මම හොඳට භාවනාව දියුණු කරල තියනව' කියලා. ඊළඟට

තමන්ට උපද්‍රව වෙන අවස්ථාවලදිත් ඒවා පරිවර්ජනය කරනවා මඟ හරිනවා. ඒ වගේම දක්වනවා නුසුදුසු ස්ථානවල ගැවසීම, සංඝයා වහන්සේලා ගැන අපි හිතමු. අගෝචර ස්ථානවල හැසිරීමෙන් තමන්ට කරදර එනවා. පාප මිත්‍රයන් ඇසුරු කිරීමත් එවැන්නක්. ඒ අය දුරු කරන්න, වර්ජනය කරන්න අපට සිද්ධ වෙනවා. ඒවට කියනවා 'පරිවජ්ජනා පහාතබ්බා'. ඇතැම් දේවල් අපට සිද්ධ වෙනවා පටිසඞ්ඛා 'යොනිසො' නුවණින් සලකලා පරිවජ්ජනය නොකළොත් අපට මේ මේ විදියේ කරදර එනවා කියලා පරිවජ්ජනය කරන්න වෙනවා. ඒවා තමයි නපුරු සතුන් ශරීරයට පීඩාකර දේවල් පාප මිත්‍රයන් ආදීන් පරිවජ්ජනය කිරීම.

ඊළඟට කියනවා '**විනොදනා පහාතබ්බා**' ඒක නම් බොහෝදෙනා අහලත් ඇති. ගිරිමානන්ද ආදී සූත්‍රවල මේක සඳහන් වෙන්නේ පහාන සඤ්ඤා[10] නමින්, මෙතන හැම එකක්ම පහාන කියලා සඳහන් වෙන නිසා විනොදනා කියලා සඳහන් වෙනවා. 'විනොදනා' කියන්නේ විනෝදය නොවෙයි. දුරු කිරීම. මොනවද දුරු කරන්නේ? යම් කිසි ආර්ය ශ්‍රාවකයෙක් එක්කො භික්ෂුවක් "**උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති.**" ඔය විදියෙ පාඨයක් සඳහන් වෙන්නේ. උපන්නා වූ කාම විතර්කය ඉවසන්නෙ නැහැ. ඉවත් කරනවා, දුරු කරනවා. ඒවා කෙළවර කරනවා. අන්න ඒ ටික කියන්නයි 'විනොදනා පහාතබ්බා' කිව්වෙ. ඇතැම් දේවල් එතන දක්වන්නේ කාම විතර්ක, ව්‍යාපාද විතර්ක, විහිංසා විතර්ක, ඊළඟට උපන්නා වූ පාපක අකුසල ධර්ම වහාම ඒවා දුරු කරන්න ඕන, විනෝදනා කියන්නේ එයයි. ඒ දුරු කිරීම තුළින් සංවර කරගත යුතු ආශ්‍රවයි.

ඊළඟට '**භාවනා පහාතබ්බා**' වැඩීම තුළින් දුරු කර ගත යුතු ආශ්‍රව. එතන කියන්නේ බොජ්ඣඞ්ග හතයි. සතිසම්බොජ්ඣඞ්ගය භාවනාවේදී ඒක වඩනවා විවෙකනිස්සිතං, විරාගනිස්සිතං, නිරොධනිස්සිතං, වොස්සග්ගපරිණාමිං, සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා කියන බොජ්ඣඞ්ග හත මේ පින්වතුන් අහල ඇති. ඒ එක එකක් වඩන්නෙ විවෙකනිස්සිතං භාවනාවේදී ඒක වඩනවා.

විවෙකනිස්සිතං, විරාගනිස්සිතං, නිරොධනිස්සිතං, වොස්සග්ගපරිණාමිං, කියල කියන්නේ ඒ ඔක්කොම නිවනට වචන. විරාගය නිරෝධය අතහැරීම මුල් කරගෙන ඒ ඒ එක එක බොජ්ඣඞ්ග වඩනවා. මොකද හේතුව, මේ බොජ්ඣඞ්ග නොවැඩීම තුළින් යම් යම් ආශ්‍රව එන්න පුළුවන් නම් ඒ ආශ්‍රව ඒව වැළකී යන්නේ මේ බොජ්ඣඞ්ග වැඩීමෙන්. දැන් ඒ න්‍යාය අනුව තේරුම්ගන්න බලන්න. අර ඉස්සෙල්ල කිව්ව වගේ තමයි මේ හැම එකක් තුළම තියෙන්නෙ ''පටිසඞ්ඛා යොනිසො'' නුවණින් කල්පනා කරන්න ඕන.

යම් යම් දේවල් හත් ආකාරයකින් දක්වලා තියෙන්නේ ඒකයි. ඒ **ඔක්කොගෙම පරමාර්ථය මොකක්ද? මේකට හේතුව අපි අර කලින් කිව්වෙ - ආසව සමුදයා අවිජ්ජා සමුදයො ආසව නිරොධා අවිජ්ජා නිරොධො.** ඕතනයි බොහෝදෙනාට ගැටලුව තියෙන්නේ. අවිජ්ජා කොයි ලෝකෙන් ආවද කියලා බොහෝදෙනාට ප්‍රශ්නයක්. දැන් කදිමට තේරෙනවා මේ ආශ්‍රව තුළිනුයි අවිද්‍යාව වැඩෙන්නේ. **දැන් අයෝනිසෝ මනසිකාරය තුළින් නූපන්නා වූ ආශ්‍රව උපදිනවා. උපන්නා වූ ආශ්‍රව වැඩෙනවා. නමුත් යෝනිසෝ මනසිකාරය තුළින් උපන්නා වූ ආශ්‍රවයන් ප්‍රහීණ වෙනවා. නූපන්නා වූ ආශ්‍රව නූපදිනවා.** අන්න ඒ විදියේ ආනිශංසයක් තියෙන්නේ. ඉතින් අවසාන වශයෙන් ඔය බොජ්ඣඞ්ග හත දක්වල තියෙනවා. හත් ආකාරයකින්ම මේ ආශ්‍රව ප්‍රහීණ කිරීමේ ක්‍රමයක් ඒ සබ්බාසව සූත්‍රයේ බුදුරජාණන් වහන්සේ දක්වලා තියෙනවා.

මේක තුළින් අපට හිතාගන්න තියෙන්නේ **මේකෙ පරමාර්ථය අන්න අර අවිජ්ජා ප්‍රහාණයයි.** අවිද්‍යාව කියල කියන්නේ නොදැනීමයි. මොහොතක් මොහොතක් පාසා අපට ඇති වෙන ආශ්‍රවවල ගලාගෙන එන සවභාවයක් තියෙනවා. කලින් කිව්වනේ අපි සැඩ වතුර දිහා බලන්නෙ ගඟක් අයිනෙ ඉඳගෙන නිකන් බලන් ඉන්නවා වගේ. ඒකට බැස්සට පස්සෙ තියන ප්‍රශ්නෙ - සැඩ වතුරකින් ගලාගෙන යනකොට අපට හරියට කියන්න බැහැනෙ මම මේ ගොඩේ ඉඳලා හරියටම ඉරක් ගැහුවා වගේ එතරටම යනවා කියලා. ඔය කාටවත් බැහැනේ එහෙම පීනල යන්න. වතුරටත් ඉඩ දෙමින් යන්න ඕන. **වතුරටත් ඉඩ දෙමින් යන්න ඕන.**

**ඒකයි මැදුම් පිළිවෙත. එතනයි තියෙන්නෙ ඔය පටිච්ච සමුප්පාදය.**

**එකකින් එකකට, එකකින් එකකට සම්බන්ධ වෙලා යන එකක්.** ඔන්න ඊළඟට අපි මේව හකුළුවා දක්වනවා නම් අවස්ථානුකූලව, මේ ඔක්කොම හකුළුවා දක්වන පුදුම විදියේ පාඨයක් තියනවා. අපේ ආනන්ද ස්වාමීන් වහන්සේ එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ දක්වපු ප්‍රතිපදාව ගැන ප්‍රශංසාත්මක වාක්‍යයක් ප්‍රකාශ කරනවා. **''නිස්සාය නිස්සාය භන්තෙ භගවතා ඔඝස්ස නිත්ථරණා අක්ඛාතා''**[11] සැඩ වතුරෙන් එතෙර වීම භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කරල තියෙන්නේ ''නිස්සාය නිස්සාය'' කියල. වචන දෙකේ තේරුම පින්වතුනි, යම් යම් දේවල් ඇසුරු කරමින්. එකක්වත් අල්ලගන්නෙ නැහැ. එකක් ඇසුරු කරගෙන අනික් එකට, එකක් ඇසුරු කරගෙන අනික් එකට. ඔන්න ඔහොම ක්‍රමානුකූලව යන ගමනක්. 'නිස්සාය නිස්සාය' කියන්නේ ඒකයි.

මේකෙන් එතර වීම පිළිබඳව කවුරුත් අහල තියෙනවා. 'සද්ධාය තරතී ඔඝං'[12] සද්ධාව තුළිනුත් එතර වෙනවා. නමුත් ඒ එතර වීම වීර්යසමතාවකින් කරන්න ඕන. ඊළඟට ඇතැම් අවස්ථාවලදී බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරල තියෙනවා ඒ සැඩ වතුර පිළිබඳ ප්‍රශ්නයේදීත්, 'කප්ප' කියන ඒ මානවකයා බුදුරජාණන් වහන්සේගෙන් සැඩ වතුර පිළිබඳව ප්‍රශ්න කළ අවස්ථාවේදී[13] බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ අවසන් වශයෙන් කියනව නම් මේ මුළු මහත් සංසාර සැඩ වතුරෙන් මිදීම ඒ අවස්ථාවේදී දක්වන්නේ,

**මජ්ඣෙ සරස්මිං තිට්ඨතං - ඔඝෙ ජාතෙ මහබ්භයෙ**
**ජරාමච්චුපරෙතානං - දීපං පබ්‍රෑහි මාරිස**
**ත්වඤ්ච මෙ දීපං අක්ඛාහි - යථයිදං නාපරං සියා**

ඒ කප්ප මානවකයා අහන ප්‍රශ්නය අපි කවියට නගල තියනවා යම් අවස්ථාවකඃ

**සැඩ ගං වතුරු හමුවෙහි - ජර මරු දෙදෙන වසයෙහි**
**විල මැද සිටින සතහට - කිව මැන කිම්ද දිවයින**

**නිදුකාණෙනි, කිව මැන කිම්ද දිවයින**
**එවන් අනෙකක් නැති සෙයින්**

**නිදුකාණෙනි, දිවයින මෙමට කිව මැන**

'කපප' කියන බ්‍රාහමණ මානවකයා බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලීමක් කරනවා සැඩ ගංවතුර හමුවේ විල මැද සිටින ජනයාට කිව මැන කිම්ද දිවයින, මේ අයට සැඩ වතුරෙන් බේරෙන්න තියන දිවයින මොකක්ද? ඒ විදියට බුදුරජාණන් වහන්සේගෙන් කරන ඉල්ලීමට බුදුරජාණන් වහන්සේ මහ පුදුම පිළිතුරක් දෙන්නේ,

**අකිඤ්චනං අනාදානං - එතං දීපං අනාපරං**
**නිබ්බානමිති කං බ්‍රෑමි - ජරා මච්චු පරික්ඛයං**

**අකිඤ්චනං අනාදානං කියන්නේ කිසිවක් අයත් නැති බවත් කිසිවක් අල්ලගන්නෙ නැති බවත්,** ඉහළම අර්ථයෙන් කියනකොට රහත් බවයි එතන කියන්නේ, අකිඤ්චනං කියන්නේ යම් කිසි දෙයක් තමාගේ කියලත් නැත්නම්, අනාදානං කියන්නේ අල්ලගත්තු දේකුත් නැත්නම්, සැඩ වතුරෙන් ගහගෙන යාම ගැන ප්‍රශ්නයකුත් නැහැනෙ. ඒකයි මේ කියන්නේ.

අකිඤ්චනං අනාදානං - එතං දීපං අනාපරං
නිබ්බානමිති කං බ්‍රෑමි - ජරා මච්චු පරික්ඛයං

මේ විදියටයි ඒක සිංහලට නගල තියෙන්නේ,

**රැකගන්න කිසිත් නැති - ඇදගන්න රිසිත් නැති**
**බව මැ දිවයිනයි එමැ - අනෙකකට නොවන සම**
**නිවන යැයි එයමැ මම - හඳුන්වමි එයයි නම**

බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. එතකොට කප්ප ඇහුවෙ මේ සැඩ වතුරෙන් එතර වෙලා යන දිවයින මොකක්ද කියල. ඒ දිවයින අපි හිතනව වගේ ලස්සන දිවයිනක් නොවෙයි. බොහෝ දෙනා නිවන කියල කියන්නේ ලස්සන දිවයිනක්. සියදෝරිස්ගේ නිවන. ඒ වගේ එකක් සාමාන්‍ය ලෝකයේ කියන්නේ. නමුත් මෙතන තියෙන්නේ අකිඤ්චනං අනාදානං **රැකගන්න කිසිත් නැති, ඇදගන්න රිසිත් නැති බවම දිවයිනයි එම - අනෙකකට නොවන සම. නිවන යයි එයම මම හඳුන්වමි එයයි නම.**

මීළඟට අවසාන කරන්නේ - **ජරද එහි දිරුණු වැනි - මරුද එහි මැරුණු වැනි.** ජරා මච්චු පරික්ඛයං කියන එක අපි කියන්නේ ජරාවත් දිරුවා, මරණයත් මැරුණා, ඒ විදියට මහ පුදුම ගාථාවලින් බුදුරජාණන් වහන්සේ පිළිතුරු දෙන්නේ. ඒ කියන්නේ අකිඤ්චනං අනාදානං කියන්නේ **අයිති කිසිවක් නැත්නම් දිරාපත් වෙන්නෙ කොහොමද? අල්ල ගන්න දෙයක් නැත්නම් අතහැර දාන්නෙ - ඒ කියන්නේ මරණය එන්නෙ කොහොමද?** ගැඹුරින් හිතන්න බලන්න. '**අකිඤ්චනං අනාදානං**' කියන්නේ නිවනටම නමක්. ඒකමයි දිවයින, වෙන දිවයිනක් නැහැ.

**රැකගන්න දෙයක් නැත්නම් සැඩ වතුරට ගහගෙන යන්න දෙයක් නැහැනෙ. අල්ලගත්තු දෙයක් නැත්නම් ඒත් ගහගෙන යන්න දෙයක් නැහැනේ. ඒකමයි** බුදුරජාණන් වහන්සේ නිවන හැටියට දක්වන්නේ. සැඩ වතුරෙන් එතර වීම පිළිබඳ අවසාන ප්‍රතිඵලය අකිඤ්චනං අනාදානං. එතං දීපං අනාපරං. ජරා මච්චු පරික්ඛයං කියන එක අපි තේරුවේ ජරද එහි දිරුණු වැනි, මරුද එහි මැරුණු වැනි, ජරාවත් දිරාපත් වුණා. මරණයත් මැරුණා. සැඩ වතුරකින් එතර වීම පිළිබඳ කථාන්තරය අපි පැයකින් හකුළුවා දැක්වූයේ කෙටියෙන් සලකා ගන්න අර කිව්ව වගේ කාම භව දිට්ඨි අවිජ්ජා කියන සතර සැඩ වතුරම එකක් හැටියට ගත්තොත් තියෙන්නේ සංසාරයෙන් එතර වීම. **අවසන් වශයෙන් තියෙන්නේ එකක්වත් අල්ලගන්නෙ නැතිව, එකක්වත් අයිති කරගන්නෙ නැතිව, එකකටවත් හේත්තු වෙන්නේ නැතිව, එකකින් එකකට, එකකින් එකකට, උපකාර කරගෙන යන මහ පුදුම මැදුම් පිළිවෙතක් තිබෙන්නේ.**

එකකින් එකකට හේතු වෙනවා. උපකාර වෙනවා කියලා කියන්නේ ඒ ප්‍රතිපදාව තමයි ධර්මයේ වචන තුනකින් දක්වලා තියෙන්නේ. **අනුපුබ්බ සික්ඛා, අනුපුබ්බ කිරියා. අනුපුබ්බ පටිපදා.** අනුපිළිවෙළින් යන ශික්ෂණයක්. අනුපිළිවෙළින් යන ක්‍රියා පටිපාටියක්, අනුපිළිවෙළින් යන ප්‍රතිපදාවක්. ඒ අනුපිළිලෙව තුළ පටිච්ච සමුප්පාදය තියනවා. අර කලින් කිව්වෙ 'සම්මා දිට්ඨිස්ස සම්මා සංකප්පො පහොති'. සම්මාදිට්ඨිය ඇති කෙනාට සම්මා සංකල්ප වශයෙන් එකකින් එකකට යන ප්‍රතිපදාවක්.

බුදුරජාණන් වහන්සේ මහ පුදුම දෙයක් කරල තියෙන්නේ. එක අන්තයකටවත් යන්නෙ නැතිව, මේ සසරින් එතර වන, සැඩ වතුරෙන් එතර වන, ආකාරය පෙන්නල තියෙනවා. සැඩ වතුරෙන් එතර වෙලා කොහෙටද යන්නෙ කියන එක. ඒ දිවයින තමයි අපි අවසානයේ ප්‍රකාශ කළේ. අපි හිතනවා වගේ භවයක්, ඊළඟ ආත්ම භාවයක්, අමුතු ලෝකයක් නොවෙයි. **මේ සැඩ වතුරට අසු වීමට හේතු වන යමක් අයිති කරගැනීමත්, යමක එල්බගැනීමත් කියන ඒ දෙක අතහැරිය තැන - අන්න එතනමයි නිවන.**

මේ පින්වතුන්ට අපි කෙටියෙන් දැක්වූවේ මහා දීර්ඝ වශයෙන් දැක්විය යුතු කාරණා රාශියක්. මේ පින්වතුන් සෑහෙන්න අපේ දේශනා අහල තියෙනවා, පටිච්ච සමුප්පාදය පිළිබඳවත් අනිත් ඒවා පිළිබඳවත්. ඒවා ආශ්‍රයෙන් - නා නා නයින් - නොයෙකුත් ආකාරයෙන් තම තමන්ගේ භාවනාවලට ළං කරගන්න ඕන. අද වගේ දවසක මේ පින්වතුන් පටන් ගත යුතු තැනින් පටන්ගෙන තියෙනවා. ශීලයෙන්. ඊළඟට එතන ඉඳලා සීල, සමාධි, පඤ්ඤා. ඒ ධර්ම මාර්ගයේ යමින් අද දේශනා කළ මේ දේශනාවත් යම් ප්‍රමාණයකට මේ පින්වතුන්ගේ සමථ විදර්ශනා ආදී භාවනාවලට උපකාර උනානම් ඒවත් උපකාර කරගෙන අපි නිතරම කියනව වගේ ශාසන පහන නිවී යන්නට පෙර ඒ බලාපොරොත්තු වන උතුම් සංසාර විමුක්තිය සෝවාන්, සකදාගාමී, අනාගාමී, අරහත් යන මාර්ග ඵල ප්‍රතිවේධයෙන් ලබාගැනීමට මේ දේශනාවද උපකාර වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. එසේම අවීචියේ සිට අකනිටා දක්වා සියලුම සත්ත්වයිනුත් මේ ධර්ම දේශනාමය ධර්ම ශ්‍රවණමය කුසලය අනුමෝදන් වීමට කැමති නම් ඒ අනුමෝදන් වීම තුළින් ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවනින් සැනසෙත්වා කියා ප්‍රාර්ථනා කරමින් මේ ගාථා කියන්න.

**එත්තාවතාච අම්හෙහි ...**

## පාදක සටහන්

1. ඕඝතරණ සූත්‍රය, සංයුත්ත නිකාය - 2 -2 පිට (බු.ජ.ත්‍රි.13)
2. දෙවදහ සූත්‍රය, මජ්ඣිම නිකාය - 3 -2 පිට (බු.ජ.ත්‍රි.12)
3. මහා සච්චක සූත්‍රය, මජ්ඣිම නිකාය -1 -582 පිට (බු.ජ.ත්‍රි.10)
4. මහාචත්තාරීසක සූත්‍රය, මජ්ඣිම නිකාය - 3 -218 පිට (බු.ජ.ත්‍රි.12)
5. ධම්මචක්කප්පවත්තන සූත්‍රය, සංයුත්ත නිකාය -5(2)-274 පිට (බු.ජ.ත්‍රි.17)
6. දිට්ඨිගත සූත්‍රය, ඉති වුත්තක පාළි, ඛුද්දක නිකාය -1-374 පිට (බු.ජ.ත්‍රි.24)
7. කච්චාන ගොත්ත සූත්‍රය, සංයුත්ත නිකාය - 2 - 28 පිට (බු.ජ.ත්‍රි.14)
8. සම්මාදිට්ඨි සූත්‍රය, මජ්ඣිම නිකාය - 1 - 110 පිට (බු.ජ.ත්‍රි.10)
9. සබ්බාසව සූත්‍රය, මජ්ඣිම නිකාය - 1 - 18 - 28 පිටු (බු.ජ.ත්‍රි.10)
10. ගිරිමානන්ද සූත්‍රය, අංගුත්තර නිකාය - 6 - 198 පිට (බු.ජ.ත්‍රි.23)
11. අනෙඤ්ජසප්පාය සූත්‍රය, මජ්ඣිම නිකාය - 3 - 88 පිට (බු.ජ.ත්‍රි.12)
12. ආලවක සූත්‍රය, සුත්ත නිපාතය - 58 පිට (බු.ජ.ත්‍රි.25)
13. කප්ප සූත්‍රය, සුත්ත නිපාතය - 336 පිට (බු.ජ.ත්‍රි.25)

# 13 වන දේශනය

# 13 වන දේශනය

## (පහන් කණුව ධර්ම දේශනා අංක 195)
## 'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

යං කිඤ්චි දුක්ඛං සම්භොති - සබ්බං සංඛාර පච්චයා
සංඛාරානං නිරොධෙන - නත්ථි දුක්ඛස්ස සම්භවො

එතමාදීනවං ඤත්වා - දුක්ඛං සංඛාරපච්චයා
සබ්බසංඛාරසමථා - සඤ්ඤාය උපරොධනා
එවං දුක්ඛක්ඛයො හොති - එතං ඤත්වා යථාතථං

සම්මද්දසා වෙදගුනො - සම්මදඤ්ඤාය පණ්ඩිතා
අභිභුය්‍ය මාරසංයොගං - නාගච්ඡන්ති පුනබ්භවං[1]

- ද්වයතානුපස්සනා සු. සුත්ත නිපාත

සැදැහැවත් පින්වතුනි,

නිවනේ ශාන්ත ප්‍රණීත බව ප්‍රකාශ කරන පද මාලාවේ මුලටම සඳහන් වෙන්නේ ''**සබ්බ සංඛාර සමථ**'' නම්වූ සියලු සංස්කාරයන්ගේ සංසිඳීමයි.[2] අවිද්‍යා අන්ධකාරය තුළ සසර දුකට මුල පුරන්නෙත් සංස්කාරයි. ඒ නිසා පටිච්ච සමුප්පාද ධර්මය හරියාකාරව වටහා ගැනීමට සංස්කාර කියන වචනය තුළ ඇති ගැඹුරු වූත් පුළුල් වූත් අර්ථ සමුදාය හෙළි පෙහෙළි කරගන්න සිද්ධ වෙනවා.

ඒකට මූලාරම්භයක් වශයෙන් අද අපි මේ දහතුන් වෙනි පටිච්චසමුප්පාද දේශනාවට මාතෘකාව කරගත්තේ සුත්ත නිපාතයේ ද්වයතානුපස්සනා සූත්‍රයේ දැක්වූ ගාථා තුනක්. කලිනුත් අපේ දේශනා තුනකට මේ ද්වයතානුපස්සනා සූත්‍රය මාතෘකා කරගත්තු නිසා මේ පින්වතුන්ට මතක ඇති ඒ සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ අනුගමනය කළ දේශනා විලාසය, දේශනා රටාව. ද්වයතාවක් වශයෙන්, අනුපස්සනා දෙකක් වශයෙන්, ප්‍රස්තුත ධර්ම කාරණා ඉදිරිපත් කිරීම මේ සූත්‍රයේ විශේෂත්වයයි. මෙතෙන්දි බුදුරජාණන් වහන්සේ ඒ සංස්කාර පිළිබඳ

කථාන්තරය සංඝයා වහන්සේලාට මෙහෙමයි ඉදිරිපත් කරන්නේ. මහණෙනි, මැනවින් ද්වයතානුපස්සනාවේ යෙදීමේ තවත් ක්‍රමයක් තිබිය හැකිදැයි අසන අයට, තිබිය හැකි යයි පිළිතුරු දිය යුතුයි. කෙසේද තිබිය හැක්කේ කියල ඔන්න ඊළඟට ප්‍රකාශ කරනවා.

''යං කිඤ්චි දුක්ඛං සම්භොති. සබ්බං සංඛාර පච්චයා' අයං එකානුපස්සනා' යම් තාක් දුකක් හටගන්නවා නම් ඒ සියල්ල සංස්කාර ප්‍රත්‍යය කරගෙනයි යන මෙය එක අනුපස්සනාවකි. ''සංඛාරානංචෙව අසෙස විරාග නිරොධා නත්ථි දුක්ඛස්ස සම්භවො''. සංස්කාරයන්ගේම නිරවශේෂ විරාග නිරෝධයෙන් දුකෙහි හටගැනීමක් නැත. ''අයං දුතියානුපස්සනා'' මේක දෙවෙනි අනුපස්සනාවයි. එහෙම ප්‍රකාශ කරලා ඒ අදහස වඩාත් පැහැදිලිව අපි කලින් සඳහන් කළ ගාථා තුනෙන් බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලාට ඉදිරිපත් කරනවා බුද්ධ වචනයක් වශයෙන්,

**යං කිඤ්චි දුක්ඛං සම්භොති - සබ්බං සංඛාර පච්චයා**
**සංඛාරානං නිරොධෙන - නත්ථි දුක්ඛස්ස සම්භවො**

යම් තාක් දුකක් ඇති වෙනවා නම් ඒ සියල්ල සංස්කාර ප්‍රත්‍යයෙනි. සංස්කාරයන්ගේ නිරෝධ වීමෙන් දුකෙහි හටගැනීමක් නැත.

**එතමාදීනවං ඤත්වා - දුක්ඛං සංඛාරපච්චයා**

සංස්කාර ප්‍රත්‍යයෙන් වන දුකෙහි මේ ආදීනවය දැන,

**සබ්බසංඛාරසමථා - සඤ්ඤාය උපරොධනා**
**එවං දුක්ඛක්ඛයො හොති - එතං ඤත්වා යථාතථං**

සියලු සංස්කාරයන්ගේ සංසිඳවීමෙන්, සඤ්ඤාව වළක්වාලීමෙන් මෙන්න මේ විදියටයි දුඃඛක්ෂය වෙන්නේ. මෙන්න මේ කාරණය 'යථාතථං' ඇති තතු පරිදි දැනගෙන

**සම්මද්දසා වෙදගුනො - සම්මදඤ්ඤාය පණ්ඩිතා**
සම්‍යක් දර්ශනය ඇති නියම විද්‍යාවේ පරතෙරට ගිය පණ්ඩිතයෝ මේ කාරණය හරියාකාර තේරුම් අරගෙන,
**අභිභුය්‍ය මාරසංයොගං - නාගච්ඡන්ති පුනබ්භවං**

මාරයාගේ බන්ධනය ජය අරගෙන නැවත පුනර්භවයකට එන්නේ නැත. ඔන්න ගාථාවේ අර්ථය. එතකොට සංස්කාර පිළිබඳ කාරණයේදී අපි ඉස්සෙල්ලාම කල්පනා කරලා බලන්න ඕන සංඛාර කියන වචනය පටිච්ච සමුප්පාද ධර්මයේ දෙවන තැනටයි යෙදිල තියෙන්නේ අවිද්‍යාවෙන් පස්සේ. මේ පින්වතුන් කොතෙකුත් දන්නවා අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං, ආදී වශයෙන් අපි කොතෙකුත් මේ පටිච්ච සමුප්පාදය ගැන කියනකොට ප්‍රකාශ කළා. එතකොට මේ සංඛාර කියන වචනය බුදුරජාණන් වහන්සේම හඳුන්වලා දීලා තියෙනවා සංයුත් සඟියේ නිදාන සංයුත්තයේ විභංග සූත්‍රයේදී[3]. බුදුරජාණන් වහන්සේම සංඝයා වහන්සේලාට හඳුන්වා දෙනවා සංඛාරා කියන වචනයේ නිර්වචනය.

''**කතමෙ ච භික්ඛවෙ සංඛාරා, තයො මෙ භික්ඛවෙ සංඛාරා කාය සංඛාරො වචී සංඛාරො, චිත්ත සංඛාරො**'' මහණෙනි, සංඛාර යනු කවරේද මහණෙනි? මේ සංස්කාර තුනකි. ''කාය සංඛාරය, වචී සංඛාරය, චිත්ත සංඛාරය''. මේ ඒක වචන බවත් මතක තියාගන්න. එතකොට කාය සංඛාර, වචී සංඛාර, චිත්ත සංඛාර කියලා බුදුරජාණන් වහන්සේ ත්‍රිවිධ වශයෙන් දක්වූ මේ සංඛාර ගැන වඩා පැහැදිලි වශයෙන් විවරණයක් අපට ලැබෙනවා මැදුම් සඟියේ චූල වෙදල්ල සූත්‍රයෙන්[4] ධම්මදින්නා රහත් මෙහෙණින් වහන්සේ විසාඛ උපාසකතුමාගේ ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් හොඳ ලස්සනට මේ කාරණය පැහැදිලි කරල දෙනවා. ඉස්සෙල්ලාම විසාඛ උපාසකතුමා අහනවා මොනවද මේ කාය සංඛාර, මොනවද මේ වචී සංඛාර, මොනවද චිත්ත සංඛාර කියලා.

ඒකට ධම්මදින්නා රහත් මෙහෙණින් වහන්සේ ප්‍රකාශ කරනවා ''**අස්සාස පස්සාසා ඛො ආවුසො විසාඛ කාය සංඛාරො, විතක්ක විචාරා වචී සංඛාරො, සඤ්ඤා ච වෙදනා ච චිත්ත සංඛාරො,**'' ඒකෙ තේරුම ඇවැත්නි විසාඛය, ආශ්වාස ප්‍රශ්වාස දෙක කාය සංස්කාරයකි. විතක්ක විචාර දෙක වචී සංස්කාරයකි. සඤ්ඤා වේදනා කියන දෙක චිත්ත සංස්කාරයකි. ආයෙමත් විසාඛ උපාසකතුමා අහනවා - අපි අවශ්‍ය ටික විතරක් පාලියෙන් කියමු. ආර්යාවනි, කෙසේද ආශ්වාස ප්‍රශ්වාස කාය

සංඛාරයක් වන්නේ? කෙසේද විතක්ක විචාර වචී සංඛාරයක් වන්නේ? කෙසේද සඤ්ඤා වේදනා දෙක චිත්ත සංඛාරයක් වන්නේ? එතකොට ඒ රහත් මෙහෙණින් වහන්සේ පිළිතුරු දෙනවා.

**'අස්සාස පස්සාසා ඛො ආවුසො විසාඛ, කායිකා එතෙ ධම්මා, කාය පටිබද්ධා. තස්මා අස්සාස පස්සාසා කායසංඛාරො'** ඇවැත්නි විසාඛය ආශ්වාස ප්‍රශ්වාස දෙක කායිකයි. මේ කියන ධර්ම, කය පිළිබඳවයි. එහෙම නැත්නම් කය හා සම්බන්ධයි. ඒ නිසා ආශ්වාස ප්‍රශ්වාස දෙක කාය සංඛාරයකි. ඊළඟට ප්‍රකාශ කරනවා **'පුබ්බෙ ඛො ආවුසො විසාඛ, විතක්කෙත්වා විචාරෙත්වා පච්ඡා වාචං භින්දති. තස්මා විතක්ක විචාරා වචී සංඛාරො'** ඔන්න එතන අමුතු දෙයක් කියනවා. ඇවැත්නි විසාඛය 'පුබ්බෙ' කියන්නෙ කලින්ම විතර්ක කරලා විචාර කරලා ඊට පස්සෙයි වචනයක් නිකුත් කරන්නේ. ඒ නිසා විතක්ක විචාර දෙක වචී සංඛාරයි. ඊළඟට **'සඤ්ඤා ච වෙදනා ච ආවුසො විසාඛ චෙතසිකා එතෙ ධම්මා චිත්තපටිබද්ධා. තස්මා සඤ්ඤාච වෙදනා ච චිත්ත සංඛාරො'**සඤ්ඤාවත් වේදනාවත් චෛතසිකයි. ඒවා සිත පිළිබඳ දේවල්. එම නිසා සඤ්ඤාවත් වේදනාවත් චිත්තසංඛාරයි.

එතකොට දැන් මෙයින් තේරුම්ගන්න පුළුවන් අපි සාමාන්‍යයෙන් **සම්මත පටිච්චසමුප්පාද විවරණ අනුව සලකන්නේ මේ සංඛාරවලින් තමයි පටිසන්ධි විඤ්ඤාණයක් සකස් වෙන්නේ කියලා. නමුත් මෙතනින් පෙන්නුම් කරන්නේ අමුතුම දෙයක්.** දැන් කවුරුත් දන්නවා මේ පින්වතුන් හුස්ම ගත්තට දිව්‍ය ලෝකයට යන්නෙත් නැහැ. අපායට යන්නෙත් නැහැ. ආශ්වාස ප්‍රශ්වාස කියන එක කර්ම වශයෙන් සැලකිය යුතු දේවල් නොවෙයි. නමුත් ආශ්වාස ප්‍රශ්වාස දෙක තමයි මේ සංසාර භව රැඟුමට පෙරහුරුව. මොකද ආශ්වාස ප්‍රශ්වාසය තමයි - මේ පින්වතුන් දන්නවා - උපදින අවස්ථාවේ වායුගෝලයත් එක්ක පළමුවෙන්ම කරන ගනුදෙනුව.

සියුම්ම උපාදානයත් ආශ්වාස ප්‍රශ්වාසයයි. ඒ වගේම මරණ අවස්ථාවේදී අන්තිම ප්‍රයත්නයත් ආශ්වාස ප්‍රශ්වාසයයි. එතකොට අපි උපමාවක් වශයෙන් කියනවා නම් මේ පින්වතුන් අහල ඇති මුහුදෙ තියන හිම කන්දක වතුර යට තියෙන්නේ දහයෙන් නමයක්. උඩින්

පෙනෙන්නේ දහයෙන් එක් කොටසක් කියලා කියනවා. ඒ වගේ අපි මේ ලොකුවට සලකන කුසල කර්ම අකුසල කර්ම ආදිය උඩ තට්ටුවයි. යට තට්ටුව තමයි ආශ්වාස ප්‍රශ්වාස. දැන් අපි කිව්වා හුස්ම ගත්තට අපායට යන්නේ නැහැ කියලා. නමුත් හොඳ හුස්මක් අරගෙන පොල්ලක් අරගෙන කාටවත් තඩිබෑවොත් එතකොට නම් අපායේ යනවා. අපි කියන්න උත්සාහ කරන්නේ මේ ආශ්වාස ප්‍රශ්වාසය මේ භව රැඟුමේ යට තට්ටුව වගේ පෙරහුරුව වගේ. ඊළඟට ඒ වාගේ තමයි විතක්ක විචාර. මෙතන විශේෂයෙන් කියවුණා. **කලින් විතක්ක විචාර කරලයි වචනයක් පිට කරන්නේ. එයින් අපට පේන්නේ අර කියාපු පෙරහුරුව කියන එක හරියට ගැලපෙනවා.** නාට්‍යයක පසුබිමේ කරන සැරසිල්ල වගේ දෙයක් තමයි. වචනයක් පිට කරන්න කලින් විතක්ක විචාර වශයෙන් වචනයට සිත යොදවනවා, එහි සිත හසුරුවනවා කියන එකයි විතක්ක විචාර කියන්නේ. ඒක කරලයි වචනයක් පිට කරන්නේ. කුසල අකුසල ආදී දේවල් නොවේ. මේකෙ යටින් තියෙන්නේ විතකක විචාර. ඒක නොපෙනන කොටස. ඊළඟට සඤ්ඤා වෙදනා පිළිබඳව, එතනත් චිත්තය සිත කියන එක බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරල තියනවා **'චිත්තඤ්ඤෙව චිත්තතරං'**[5] කියල ඇතැම් තැන්වල චිත්‍රයකටත් වඩා විචිත්‍රයි මේ සිත කියන එක. නමුත් ඒ විචිත්‍ර සිත සකස් කරන්නේ සඤ්ඤාවත් වේදනාවත් විසින්.

ඒක නිසා ඒකත් මූලික සකස් කිරීමක්. එතකොට අරඇඳීමක්, සකස් කිරීමක් පෙරහුරුවක් වගේ. **ඊළඟට අපි කල්පනා කරල බලමු මේ පෙරහුරුවට පසුබිම මොකක්ද කියලා. අවිද්‍යාවනෙ. 'අවිජ්ජා පච්චයා සංඛාරා'.** ඒක කොතෙකුත් මේ පින්වතුන් දන්නවා. ඒකත් අර කියාපු විභංග සූත්‍රයෙන්ම උපුටා දක්වමු. බුදුරජාණන් වහන්සේ අවිජ්ජා කියන වචනය තෝරන හැටි. දුක්ඛෙ **අඤ්ඤාණං**, දුක්ඛ සමුදයෙ **අඤ්ඤාණං**, දුක්ඛ නිරොධෙ **අඤ්ඤාණං**, දුක්ඛ නිරොධ ගාමිනියා පටිපදාය **අඤ්ඤාණං** කියල කියන්නේ චතුරාර්ය සත්‍යය පිළිබඳ නොදැන්ම. **අඤ්ඤාණං කියන්නේ නොදැන්මනෙ.** ඒකයි එතකොට පසුබිම. **ඒ අන්ධකාර පසුබිමේ තමයි ඔය පෙරහුරුව කෙරෙන්නේ. ආශ්වාස ප්‍රශ්වාස. විතක්ක විචාර, සඤ්ඤා වේදනා.** එතකොට මේ පෙරහුරුව මොකක් සඳහාද කියන එක. ඒකත් විමසල බලමු.

සංඛාර ළඟට තියෙන්නේ විඤ්ඤාණනෙ. විඤ්ඤාණ ළඟට තියෙන්නේ නාම රූපනෙ. ඒ දෙක ගැන අපි කොතෙකුත් කථා කරලා තියෙනවා. විඤ්ඤාණයත් නාමරූපයත් ගැන. **පොතපතේ තෝරන්නේ පටිච්ච සමුප්පාද කියනකොට පටිසන්ධි විඤ්ඤාණයක් ගැන. නමුත් විඤ්ඤාණය කියන එක බුදුරජාණන් වහන්සේ තෝරලා තියෙන්නේ අර කියාපු සූත්‍රයෙ හය ආකාරයකට. ''කතමංච භික්ඛවෙ විඤ්ඤාණං, චක්ඛු විඤ්ඤාණං සොත විඤ්ඤාණං ඝාන විඤ්ඤාණං ජිව්හා විඤ්ඤාණං කාය විඤ්ඤාණං මනො විඤ්ඤාණං.''** එතකොට විඤ්ඤාණය හය ආකාරයි. විඤ්ඤාණය කියන එක තේරුවේ එහෙමයි. නාම රූප කියන එකේ විවරණය අපි කලිනුත් කියල තියෙනවා. සාරිපුත්ත ස්වාමීන් වහන්සේගේ වචනය. මෙතන බුදුරජාණන් වහන්සේගේ වචනයෙන් කිව්වොත් මෙහෙමයි.

**''කතමංච භික්ඛවෙ නාම රූපං වෙදනා සඤ්ඤා චෙතනා ඵස්සො මනසිකාරො. ඉදං වුච්චති භික්ඛවෙ නාමං. චත්තාරො ච මහාභූතා. චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං. ඉදං වුච්චති භික්ඛවෙ රූපං''**[6]. ඔන්න තේරුව හැටි. බුද්ධ වචනය. එතකොට අපි ඉස්සෙල්ල කිව්ව වගේ **ඵස්ස ඉස්සරහට දාන්න** බැහැ. වේදනා සඤ්ඤා චේතනා ඵස්ස මනසිකාර කියන ඒ නාම ධර්ම පහ අපි ඇඟිලි පහට සමාන කළේ ඒක නොයෙකුත් විදියට පසුකාලීනව තේරුවත්. 'චත්තාරොච මහාභූතා චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං' කියන්නේ සතර මහා භූතයින්ට සාපේක්ෂව, එහෙම නැත්නම් ඒවා උපාදානය කරගෙනයි රූප කියන ඒ සංකල්පය ඇති වෙන්නේ. රූප සඤ්ඤාවක් ඇති වෙන්නේ එතකොට එක පැත්තකින් විඤ්ඤාණය. අනිත් පැත්තෙන් නාම රූපය. ඔය දෙක අතර තමයි අපි කොතෙකුත් කිව්ව දිය සුළිය, එහෙම නැත්නම් නොයෙක් ආකාරයෙන් කියන ඒ භව රැඟුම තියෙන්නේ මේ දෙක අතරෙයි.

අඤ්ඤමඤ්ඤ පච්චයතාව කියන්නේ ඒකයි. ඒ **අඤ්ඤමඤ්ඤ පච්චයතාවට පෙරහුරුවක් වශයෙන් තමයි අර කියාපු ඒවා හඳුන්වලා දීලා තියෙන්නේ. කාය සංඛාරො වචී සංඛාරො චිත්ත සංඛාරො කියලා ඒක වචනයෙන්.** ඒ විඤ්ඤාණයත් නාම රූපයත් අතර ඒ අන්‍යොන්‍ය ප්‍රත්‍ය

වශයෙන් කෙරෙන රඟපෑමේ අවසන් ප්‍රතිඵලය තමයි පඤ්ච උපාදානස්කන්ධයක් සකස් වීම. ඒ විඤ්ඤාණයේ තියන දෙකක් හැටියට සැලකීම අපි කොතෙකුත් මේ පින්වතුන්ට මතක් කරලා දීල ඇති නොයෙකුත් විදියේ උපමා. දාං ඇදිල්ල, ක්‍රිකට් ක්‍රීඩාව, ආදිය. නොයෙකුත් ඒවයින් අපි පෙන්නුව දෙපිලක් වෙලා කරන මෙන්න මේ රැඟුම තුළයි භවය පවතින්නේ. පැවැත්මක් කියන එකක් අන්තිමට සකස් වන්නේ. පඤ්ච උපාදානස්කන්ධයක් මේක තුළින් පෙරිල යන්නේ අන්තිමට. අර සළායතන කියන්නේ එතනත් දෙකක් හැටියට බෙදිලා යනවා. විඤ්ඤාණයත් දෙකක් හැටියට වෙන් කරගැනීම නිසාම. සළායතනය තුළ තමයි මේවා නිෂ්පාදනය වෙන්නේ මේ භවයක් ගොතන භවයකට හේතු වන සංස්කාර ආදිය. ඒ වගේ මතක තියාගන්න ඕන **මේ නාමධර්ම අතර චේතනාව සඳහන් වීම විශේෂයි.** ඇත්ත වශයෙන් බුදුරජාණන් වහන්සේට කලින් හිටිය ඒ ධ්‍යාන වඩපු යෝගීන් වහන්සේලාත් තේරුම්ගත්තා මේ කියාපු ආශ්වාස ප්‍රශ්වාස කියන එක දුකක් බව. ඒ වගේම විතක්ක විචාර දුකක් බව. සඤ්ඤා වේදනා දුකක් බව. ඒවා සංස්කාර හැටියට හිතලම නොවෙයි. අවිද්‍යා පසුබිමක් දන්නේ නැතත් ඒ ධ්‍යාන වැඩීම තුළින් ඔවුන්ට තේරුණා ඒවා ගොරෝසුයි කියලා.

ඒක නිසා ඔවුන් - මේ පින්වතුන්ට අපි කලිනුත් කිව්වා - සී සෝ පැදිල්ලක හිටියයි කියලා. බුදුරජාණන් වහන්සේම දක්වල තියනවා බුද්ධ දේශනාව අනුව **සංසිඳීම් හය වර්ගයක් තියනවා.**[7] ඒක කියන කොට ඕවා තේරේවි. මොනවද ඒ සංසිඳීම් හය? **ප්‍රථම ධ්‍යානයට සමවැදුණු කෙනාට වචනය සංසිඳෙනවා, දෙවන ධ්‍යානයට සමවැදුණු කෙනාට විතක්ක විචාර සංසිඳෙනවා. තුන්වන ධ්‍යානයට සමවැදුණු කෙනාට ප්‍රීතිය සංසිඳෙනවා. හතරවෙනි ධ්‍යානයට සමවැදුණු කෙනාට ආශ්වාස ප්‍රශ්වාස සංසිඳෙනවා. සඤ්ඤාවෙදයිත නිරෝධ සමාපත්තියට සමවැදුණු කෙනාට සඤ්ඤාවත් වේදනාවත් සංසිඳෙනවා. අවසාන වශයෙන් කියනවා ක්ෂීණාශ්‍රව භික්ෂුවට රාගයත් සංසිඳෙනවා ද්වේෂයත්** [P] **සංසිඳෙනවා මෝහයත් සංසිඳෙනවා.**

ඔය විදියට පස්සද්ධි කියන සංසිඳීම් හයක් බුදුරජාණන් වහන්සේ දක්වලා තියනවා සංයුත් සඟියේ. මේවා අතරින් අතීතයේ සිටි යෝගීන්

ඔය විදියට ඒ ධ්‍යාන තුළින් වචනය විතක්ක විචාර ආශ්වාස ප්‍රශ්වාස සංසිඳවමින් ගිහිල්ලා ඔන්න එක තැනකට පැමිණියා. ඔවුන්ට ප්‍රශ්නය වුනේ සඤ්ඤාව. සඤ්ඤාවෙන් මිදීම පිළිබඳ ගැටළුව. ඒකනෙ අපි කිව්වෙ සී සෝ පැදිල්ල කියලා. ඔවුන් අන්තිමට ගිය කෙළවර තමයි නෙවසඤ්ඤානාසඤ්ඤායතනය. ඒක දක්වන්නේ මැදුම් සඟියේ පඤ්චත්තය සූත්‍රයේ ''**සඤ්ඤා රොගො, සඤ්ඤා ගණ්ඩො, සඤ්ඤා සල්ලං අසඤ්ඤා සම්මොහො එතං සන්තං එතං පණීතං යදිදං නෙවසඤ්ඤානාසඤ්ඤං.**''[8] ඒ කියන්නේ ඔවුන්ට තේරුණා සඤ්ඤාව රෝගයක් ගඩක් උලක්. නමුත් සඤ්ඤාව නැති වීම මෝහයක්. සඤ්ඤාව අතහරින්න බැහැ.

අන්න ඒක නිසා තමයි සී සෝ පදිමින් සිටියේ. නෙවසඤ්ඤානාසඤ්ඤා ඒක නිසා හොඳයි මේක ශාන්තයි. සඤ්ඤාවක් නැති සඤ්ඤාවක් නොවන්නෙත් නැති තත්ත්වයක්. නමුත් එයින් එහාට ගිය හැටි අපි මීට කලින් දේශනා කළ සූත්‍රය මේ පින්වතුන්ට මතක ඇති පොට්ඨපාද සූත්‍රය. මහ පුදුම දේශනාවක් දීඝ නිකායෙ[9]. ඒකෙදි පෙන්නුම් කළා ඒ අනිකුත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටියා කොහොමද මේ අභිසඤ්ඤා නිරෝධය වෙන්නේ කියලා. ඒ **අවස්ථාවේදී බුදුරජාණන් වහන්සේ පෙන්නුවා කොහොමද වෙන්නේ, අන්න චේතනාවත් අතහැරිය අවස්ථාව** ඒක කලින් කියවුනා. මේ පින්වතුන්ට මතක ඇත්නම් මේ යෝගීන්ට වුන පටලැවිල්ල මේකයි. දැන් සාමාන්‍යයෙන් අපි හිතන්නේ 'නත්ථි කිඤ්චි' කියන්නේ කිසිවක් නැත කියන එකනෙ. ඉතින් බලන්න කොයි තරම් පුදුමද මේ සංසාරයේ මේ භවයට තියන ඇල්ම. **'කිසිවක් නැත' කියන එකත් 'දෙයක්' කරගත්තා.**

කිසිවක් නැත කියන එක 'දෙයක්' කරගෙන ඒක අමුතුම සමාපත්තියක් කරගෙන. ඒ සමාපත්තියේ විපාකය මොකක්ද? ගිහිල්ලා ලගින්න වෙනවා බ්‍රහ්ම ලෝකවල. නමුත් ඊට එහාට ඔවුන්ට යන්න බැරිවුණා. මොකද, අවිද්‍යාව, සංස්කාර ගැන අවබෝධයක් නැති නිසා. නමුත් අන්න බුදුරජාණන් වහන්සේ පොට්ඨපාද සූත්‍රයේ දැක්වූවා අපි කලින් කියල තියෙනවා යම් භික්ෂුවක් ආකිඤ්චඤ්ඤායතනයට ආවට පස්සෙ කල්පනා කරනවා - පුදුම විදියේ පාඨයක් සඳහන් වෙනවා.

**'චෙතයමානස්ස මෙ පාපියො, අචෙතයමානස්ස මෙ සෙයෙයා. යන්නූනාහං න චෙව චෙතෙය්‍යං න චාභිසංඛරෙය්‍යන්ති'[10] මම චේතනාව පාවිච්චි කළොත් මේ අවස්ථාවේදී ඒක නරකයි. චේතනාව නොකර හිටියොත් හොඳයි.** මොකද ඒක ඕළාරිකයි කියල ඊළඟට හිතනවා. මම චේතනා නොකර ඉන්න ඕන.

සංස්කාර උපදවන්නෙ නැතිව ඉන්න ඕන කියලා ඒ අධිෂ්ඨානය තුළින් තමයි අන්තිමට නිරෝධය ස්පර්ශ කරන්නේ - සඤ්ඤා වෙදයිත නිරෝධය. ඉතින් මෙයින් අපට පෙන්නුම් කරනවා - ඇත්ත වශයෙන්ම මට කියන්න හොඳ නැහැ ඒක බුද්ධ දේශනාවක් කියලා - අපි ඇඟිලි පහේ උපමාව මේ පින්වතුන්ට කිව්වේ ඒ වෙදනා සඤ්ඤා ආදිය තේරුම් කරන්නයි. ඒ උපමාවල යම් වටිනාකමක් තියනවා නම් අපි කිව්වා වේදනාව සුළැඟිල්ලය කිව්වා. සඤ්ඤාව මුදු ඇඟිල්ලය කිව්වා **හිතුවක්කාර මැදැඟිල්ල තමයි චේතනාව. චේතනාවත් සංසිඳෙව්වොත් මැද ඇඟිල්ලත් අකුළිගත්තු අවස්ථාවේ තමයි නිරෝධය ස්පර්ශ කරන්නේ. ඊට පස්සේ ස්පර්ශ කරන්න වෙන්නේ 'දෙයක්' නොවෙයි. නිවන කියන්නේ අනිමිත්ත අප්පණිහිත සුඤ්ඤත. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම කියල කියන ත්‍රිලක්ෂණයේ අන්තිම කෙළවර. නිවන කියන්නේ ඒකයි.**

විමොක්ඛ කියල කියන්නේ ඒ නිරෝධයට වැටිල නැගිටිනකොට මනසිකාරයට ගොදුරු වෙන්නේ අනිමිත්ත භාවය. නිමිත්තක් නැති බව. අප්පණිහිත කියන්නේ ප්‍රණිධියක් නැති බව. ඊළඟට ආත්මයක් පැවැත්මක් නැති තත්ත්වය සුඤ්ඤතාව. ඔය විදියට සාමාන්‍යයෙන් තේරුම්ගන්න. ඔය ගැඹුර තමයි යෝගීන්ට තේරුණේ නැත්තේ. බුදු රජාණන් වහන්සේ මතු කරල දුන්න විශේෂ පණිවුඩය ලෝකයාට. අපි සංස්කාර ගැන කථා කරන නිසා තව ටිකක් කාලවේලා තියන හැටියට කියන්න බලමු. මුලින් කියාපු හිම කන්දේ යට තට්ටුව වගේ සියුම් ඒ සංස්කාර හඳුන්වලා තියෙන්නේ ඒක වචනයෙන්. ඒ සංඛාර කියන පසුබිම තුළ විඤ්ඤාණයත් නාමරූපයත් අතර භව රැඟුමක් තියනවා. ඒ භව රැඟුම තමයි අපි නොයෙක් උපමාවලින් පෙන්නුවේ අර දාංඇදිල්ල පමණක් නොවෙයි. **නාසිසස් වතුරත් එක්ක කරපු ප්‍රේම**

**ජවනිකා.** ඒ හැම එකකින්ම අන්තිමට පඤ්ච උපාදානස්කන්ධයක් එකතු වෙනවා.

එහෙම සලකා ගන්න. පඤ්ච උපාදානස්කන්ධ ගැන ඔන්න අමුත්තක් එනවා. **පඤ්ච උපාදානස්කන්ධයේත් තියනවා සංඛාර.** හැබැයි **බහු වචනයෙන්.** ඔය ටික තමයි පටලවාගන්නේ. ඉතාම ගැඹුරු ටිකක් මේ. හුඟක් දෙනා පටිච්ච සමුප්පාදය පිළිබඳව පටලවාගන්නා තැනක්. එතකොට අවසානයේ ප්‍රතිඵලය පඤ්ච උපාදානස්කන්ධය. අවිද්‍යාව කියල කිව්වේ චතුරාර්‍ය සත්‍යය පිළිබඳ නොදැනීමනේ. ඒ නොදැනීම නිසා තමයි අර ආශ්වාස ප්‍රශ්වාස ආදී ඒ සංස්කාර ඇතුළතින් ඇති වෙන්නේ. ඊළඟට අර අවිද්‍යාව නිසාම විඤ්ඤාණය නමැති මායාවෙන් පෙන්නුම් කරනවා විඤ්ඤාණ නාමරූප දෙක දෙපිලක් වෙලා. ඊට පස්සේ යනවා යම් කිසි රැඟුමක්.

**ඒ රැඟුමේ අවසාන ප්‍රතිඵලය හැටියට රූප ගොඩක් එකතු වෙනවා. වේදනා ගොඩක් එකතු වෙනවා. සඤ්ඤා ගොඩක් එකතු වෙනවා. සංඛාර ගොඩක් එකතු වෙනවා. විඤ්ඤාණ ගොඩක් එකතු වෙනවා. ඒවා සංඛත සංඛාර කියලා තේරුම්ගන්න ඕන. එතන බහු වචනය.** පඤ්ච උපාදානස්කන්ධයේ **සංඛාරා** කියන එක මොකක්ද කියලත් බුදු රජාණන් වහන්සේ දක්වලා තියනවා.[11] **''කතමෙච භික්ඛවෙ සංඛාරා? ඡයිමෙ භික්ඛවෙ චෙතනා කායා. රූප සංචෙතනා, සද්ද සංචෙතනා, ගන්ධ සංචෙතනා, රස සංචෙතනා, ඵොට්ඨබ්බ සංචෙතනා, ධම්ම සංචෙතනා.''** එතන පඤ්ච උපාදානස්කන්ධයේ සංඛාරා කියන එක බුදුරජාණන් වහන්සේ තෝරන්නේ කොහොමද? අර කියාපු වචී සංඛාර විදියට නොවෙයි ඒව තෝරන්නේ. ''**චෙතනා කායා**'' කියන්නේ පින්වතුනි කායා කියන්නේ සමූහයටයි.

චේතනාවල් හය වර්ගයක් තියනවා. රූප සංචේතනා - රූපය පිළිබඳ ඇති කරගන්න, රූපය මුල් කර ගත්තු චේතනාව. ඒ වගේම ශබ්දය මුල් කර ගත්තු චේතනාව අනික්වා හිතාගන්න සළායතන ආශ්‍රයෙන්. අන්න ඒ චේතනා තුළින් තමයි මේ සංස්කාර එකතු වෙන්නේ. ඒවාට **'සංඛත සංඛාර'** කියල කියන්නේ. ඒවා සකස් කරගත්තු දේවල්. **අපි දන්නවා**

**නාට්‍යයක පසුබිමේ කෙරෙන සැරසිල්ල වගේ තමයි ආශ්වාස ප්‍රශ්වාස, විතක්ක විචාර, සඤ්ඤා වෙදනා, ඒවායේ අවසානයේ අර වේදිකාවට ආවට පස්සේ භව රැඟුමේ අවසාන ප්‍රතිඵලය තමයි පඤ්ච උපාදානසක්කන්ධය.** ඒ බවත් හොඳට හෙළි වෙනව මහාසළායතනික සූත්‍රයෙන්.[12] ඒකෙ දක්වෙනවා මේ පඤ්ච උපාදානස්කන්ධය එකතු වෙන හැටිත් ගෙවී යන හැටිත්. වචන දෙකක් යෙදෙනවා **'උපචය, අපචය'** කියලා. ඒ ආයතන හය බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා සළායතනය. ඇස පිළිබඳව, රූපය පිළිබඳව, ඒ දෙක නිසා ඇති වන විඤ්ඤාණය පිළිබඳව, ඒකෙන් ඇති වන සමඵස්සය පිළිබඳව, ඒ නිසා ඇති වන වේදයිතය පිළිබඳව.

ඒවා යථාභූත වශයෙන් තේරුම්ගත්තේ නැත්නම් ඒ තුළින් ඇලීම් ගැටීම් මුළා වීම් ඇති වෙලා - කෙටියෙන් කියනවා නම් ඒ ඇතිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් **උපාදාන ස්කන්ධ පහක් එකතු වෙනවා. යම්කිසි අවස්ථාවක ඒ සිද්ධි සමූහය පුද්ගලයා 'මේ මගේ රූපයයි මේ මගේ වේදනාවයි මේ මගේ සඤ්ඤාවයි මේ මගේ සංඛාරයි මේ මගේ විඤ්ඤාණයයි' කියලා එහෙම ගන්නවා.** මේ කාරණය ඉතාමත් පැහැදිලි වන මහ ගැඹුරු සූත්‍රයක් තියනවා. සංයුත් සඟියේ ඛජ්ජනීය සූත්‍රය[13] නමින්. ඒ ඛජ්ජනීය සූත්‍රය ආරම්භයේදී බුදුරජාණන් වහන්සේ මෙන්න මෙහෙම ප්‍රකාශ කරනවා.

''මහණෙනි, යම් තාක් ශ්‍රමණ බ්‍රාහ්මණයින් තම තමන්ගේ අතීත භව, අතීත ආත්ම, සිහි කළා නම් ඒ සිහි කළේ එක්කො පඤ්ච උපාදානසක්කන්ධයම මුල් කරගෙන එහෙම නැත්නම් එයින් එකක් හෝ මුල් කරගෙන, ඔවුන්ගේ අතීත භව පිළිබඳ අවබෝධය පිරිසිදු නැති බවයි බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ. ඒ අයට පේනවා අතීතයේ රූප ගොඩක්. ඒ රූප ගොඩ පේනකොට 'මම' කියල හිතා ගන්නවා. 'අතීතයේ මම හිටියා' කියල හිතාගන්නවා. අතීතයේ මම හිටියා කියන්නේ අතීතය ස්මරණය කරනකොට, අතීතය සලකන කොට රූප හැටියට පෙනිච්ච දේ. ඒ වගේම වේදනා ආදිය. එයින් අපට පේනවා, සංඛත රටාව. ඛජ්ජනීය සූත්‍රයේ එහෙම ආරම්භ කරලා ඔන්න බුදුරජාණන් වහන්සේ මහ පුදුම විග්‍රහයක් දෙනවා, මේ එක එක වචනය පිළිබඳව

නිරුක්ති වශයෙන්. ඒක ඇත්ත වශයෙන්ම ගැඹුරුයි.

මේ පින්වතුන් කල්පනා කරලා බලන්න ගැඹුරුයි කිව්වට භය වෙන්න එපා. මෙතෙන්දි බුදුරජාණන් වහන්සේ මහ පුදුම දේශනාවක් කරන්නේ. රූප කියන එක දූන් අපි කිව්වනේ රූපය උපාදානස්කන්ධයක් වශයෙන් සලකනකොට 'උපාදානය කියන්නේ අල්ලගත්තු ගොඩක්'. ග්‍රහණය කිරීමේදී අපි කොතෙකුත් කියන්න ඇති සාමාන්‍ය ලෝකයා තුළ තියෙන්නේ 'ඝන සඤ්ඤාව'. සක්කාය දිට්ඨිය තුළ තියෙන්නේ 'ඝන සඤ්ඤාව'. 'සක්කාය' කියන වචනයම හිතල බලන්න. සක්කාය කියල කියන්නේ 'සත්' කියන්නේ තියෙනවා. 'කාය' කියන්නේ සමූහය. එතකොට 'සමූහය තියනව' කියලා හිතාගෙන මම ඉන්නවා කියලා අනන්‍යතාව ඔප්පු කරන්න පෙන්නුම් කරන්න හදනවා. රූපයේ තියෙන්නෙ මොනවද? ඒ රූප ගොඩක් එකතු කරල ගත්තු එකක්නෙ. අන්න ඒ වගේ අනික් ඒවත් එහෙමයි.

ඉතින් මෙන්න මේ එක එක සකන්ධ. ඊළඟට මේ පින්වතුන් කොතෙකුත් අහල තියන උපමා අපි මතක් කරමු. රූපය පෙණ පිඬුවක් බව දන්නවනෙ.[14] ඒක බුද්ධ වචනය හැටියට ගත්තොත් ඊළඟට වේදනාව දිය බුබුළ. අපි එහෙම ගනිමු. කෙටියෙන්. ඊළඟට සඤ්ඤාව මිරිඟුව, සංඛාර කෙසෙල් කඳ. අපි කොතෙකුත් කියල තියෙනවනේ. විඤ්ඤාණය මායාව. **මොකද මේවට 'සංඛත සංස්කාර' කියන්නේ? මේවා රවටනසුලුයි. රවටනසුලු බව පෙන්නුම් කරන්න තමයි ඔය උපමා යෙදිල තියෙන්නේ.** සුදු පෙණ පිඬක් ඈතට පෙනෙන්නේ ගලක් වගේ. කිට්ටුවට ගිහිල්ල බලනකොට, පරීක්ෂාකාරීව බලනකොට, කිට්ටුවටම ගිහිල්ල බැලුවොත් පෙණ පිඬක් බව වැටහෙනවා. නමුත් රූපය සාමාන්‍ය ලෝකයාට තේරෙන්නේ නැහැ. ඒ වගේම වේදනාව දිය බුබුලක් කිව්වෙ මොකද? සබන් බෝලයක් වගේ පිම්බිල යනකොට ඒක තේරෙන්නේ නැහැ. නමුත් බිඳුණට පස්සේ තේරෙනවා **ළං උනාට පස්සේ තේරෙනවා රූපය පෙණ පිඬක් බව. බිඳුණට පස්සේ තේරෙනවා වේදනා දිය බුබුලක් බව. පස්සෙන් එළවගෙන ළඟට ගියහම මිරිඟුවත් තේරෙනවා මිරිඟුවක් බව. ඊළඟට කෙසෙල් කඳ පතුරු ගහන තුරු අරටුවක් තිබෙනවා. පතුරු ගැහුවට පස්සේ තේරෙනවා අරටුවක් නැති බව. විඤ්ඤාණයත් ඇතුළත**

**දැක්කට පස්සේ තේරෙනවා ඒ මායාව මායාවමයි.** එතකොට බුද්ධ වචනය අනුව මේ උපමා දුන්නේ ඉතාම ගැඹුරින්. විදර්ශකයාට යම් අවස්ථාවක වැටහෙන විදියට. නමුත් ලෝකයා ඒක පිළිගන්න සූදානම් නැහැ. මෙතෙන්දි අපි කියන්න ගියේ අර කියාපු රූප වේදනා ආදිය ගැන පුදුම විදියේ නිරුක්තියක් දෙනවා බුදුරජාණන් වහන්සේ. 'කිඤ්ච භික්ඛවෙ', රූපං වදෙථ මහණෙනි රූපය කියල කියන්නේ කුමකටද? **රූප්පතීති ඛො භික්ඛවෙ තස්මා රූපන්ති වුච්චති.** 'රුප්පනය වේය' යන අදහසින් ඒකට රූපය කියල කියනවා.

ඊළඟට බුදුරජාණන් වහන්සේම මේක විග්‍රහ කරනවා. **'කෙන රුප්පති, සීතෙන'පි රුප්පති උණ්හෙන'පි රුප්පති, ජිඝච්ඡාය'පි රුප්පති පිපාසාය'පි රුප්පති ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙන'පි රුප්පති'** ඒ කියන්නේ මේ රූපය කියා ගත්තු - අපි හිතමු කය කියල - මේ කය රුප්පනය වෙනවා. මොනවයින්ද රුප්පනය වෙන්නෙ? සීතයෙන් උෂ්ණයෙන් බඩගින්න පිපාසය මැසි උවදුරු නිසා. මේ රුප්පනය කියන වචනයට වචනයක් සොයාගන්න තියන අපහසුකමට අපි ඒකට ඇතැම් අවස්ථාවල කිව්වා **'ඉද්දෙනවා'** කියලා. තුවාලයක් තියන කෙනෙකුට කවුරුවත් **'රිද්දවනවනෙ'** රිද්දෙනවා කියන එකට ඉද්දෙනවා කියලා සමහර විට කියනවා. බුදුරජාණන් වහන්සේ එයින් අදහස් කළේ **රූපය තුවාලයක්. රූපය තුවාලයක්. කය ගැන අවධානය යොමුවන්නේ අර කියාපු සීතල දැනෙන කොට - උෂ්ණය දැනෙනකොට - කුසගිනි දැනෙනකොට නේ.**

මහ පුදුම ගැඹුරක් මෙතන තියනවා, 'රුප්පනය' වෙනවා කියන වචනයේ. රිද්දෙනවා රිද්දෙනවා කියන අර්ථයෙන් මේකට රූපය කියනවා. ඔන්න ඊළඟට වේදනා කියන එක තෝරන්නේ වෙදියතී'ති. විඳිනවා විඳිනවා කියන අදහසින් වේදනා කියනවා. ඒක තේරුම්ගන්න අපහසු නෑ. ඊළඟට සඤ්ඤා කියන එක තෝරන්නේ සඤ්ජානාතී'ති සඤ්ජානාතීති. හඳුනාගන්නවා හඳුනගන්නවා. අරකත් කියමු. මොකක්ද විඳින්නේ කියලා අහනවා බුදුරජාණන් වහන්සේ. විඳීන්නේ සැප, දුක්, නොදුක්නොසුව. එතකොට වේදනා කියන එක තෝරන්නෙ 'විඳීන්නේය විඳින්නේය' කියන අර්ථයෙන් වේදනාව වෙනවා. විඳින්නේ

මොනවද? සැප, දුක්, නොදුක් නොසුව. ඊළඟට සඤ්ඤාව කියල කියන්නේ සඤ්ජානාති, සඤ්ජානාති. හඳුනාගන්නව හඳුනාගන්නවා. මොනවද හඳුනාගන්නෙ? නිල්ය කියල, රතුය කියල, කහය කියල, සුදුය කියල, වර්ණ වශයෙන් හඳුනගන්නවා.

ඔන්න සඤ්ඤාව හඳුන්වපු හැටි. ඔන්න ඊළඟට සංඛාර ගැන හැඳින්වීම - ඒක ඉතාම ගැඹුරුයි. ඒක අමුතු විදියකටයි බුදුරජාණන් වහන්සේ තෝරන්නේ, සංඛාර තෝරන්නේ මෙහෙමයි. **කිඤ්ච භික්ඛවෙ සංඛාරෙ වදෙථ, සඞ්ඛතං අභිසඞ්ඛරොන්තී'ති සංඛාරා** - මහණෙනි, සංඛාරා කියන්නේ කුමකටද? සඞ්ඛතං අභිසඞ්ඛරොන්තී'ති සංඛාරා'. සඞ්ඛතය අභිසංස්කරණය කරන අර්ථයෙන් ඒකට සංඛාර කියලා කියනවා. **මෙතන අභිසංස්කරණය කරනවා කියලා කියන්නේ ඒ ක්‍රියා පදයට අවශ්‍ය හැටියට අපට කියන්න පුළුවන් වෙසෙසින් සකස් කරනවය කියලා.** සංස්කාර කියන එකෙත් තියෙන්නෙ සකස් කිරිල්ල. අභිසංස්කරණය කියන්නේ වෙසෙසින් සකස් කිරීම. **එතකොට පඤ්ච උපාදානසකන්ධයේදී සංඛාර කියන එක තෝරන්න ගිහිල්ල බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ සඞ්ඛතං 'අභිසඞ්ඛරොන්තී'ති සඞ්ඛාරා'** - සංඛතය අභිසංස්කරණය කරනවා කියන අර්ථයෙනුයි මේකට සංඛාර කියන්නේ. ඊළඟට අහනවා කිඤ්ච සඞ්ඛතං අභිසඞ්ඛරොනතී. ඔන්න ඔතනයි ඊළඟට මහ ගැඹුරක් තියෙන්නේ.

**'රූපං රූපත්තාය සඞ්ඛතං අභිසඞ්ඛරොන්ති'** රූපය රූපයක් බවට සංඛතයක් කොට සංස්කරණය කරනවා. ඒ වගේම 'වෙදනං වෙදනත්තාය සඞ්ඛතං අභිසඞ්ඛරොන්ති' වේදනාව වේදනාවක් බවට සංඛතයක් කොට සකස් කරනවා. ඊළඟට සඤ්ඤාවත් සංඛතයක් බව හිතාගන්න. වෙන එකක් තබා සංඛාර පවා **'සඞ්ඛාරෙ සඞ්ඛාරත්තාය සඞ්ඛතං අභිසඞ්ඛරොනතී'ති සංඛාරා'** මහ පුදුම දෙයක්. අපේ උගතුන් කරකැවිල යන විදියේ දෙයක්. සංඛාර යන පදය එතන තෝරන්නේ සඞ්ඛාරෙ සඞ්ඛාරත්තාය සඞ්ඛතං අභිසඞ්ඛරොනතී'ති සංඛාරා' ඒ කියන්නේ **සංස්කාර සංස්කාර බවට 'සංඛතයක්' වශයෙන් 'සකස් වූවක් හැටියට' සකස් කරන අර්ථයෙන් සංඛාර කියනවා.** ඊළඟට විඤ්ඤාණය ගැන කියන්නේ විඤ්ඤාණං විඤ්ඤාණත්තාය සඞ්ඛතං අභිසඞ්ඛරොන්ති.

විඤ්ඤාණය විඤ්ඤාණය බවට පමුණුවයි. මෙයින් අපට පේනවා මේ සංඛාර කියන වචනයේ වැදගත්කම.

**මේ හතර වෙනුවට කියන සංස්කාරවලින් තමයි මේ හැම එකක්ම සංඛත තත්ත්වයට, සකස් වූ තත්ත්වයට පත් වෙන්නේ.** එතකොට ලෝකයා ඉන්නේ ඒ සංඛත තත්ත්වය තුළයි. සංඛතය කියල කියන්නේ සකස් කරපු බව. ඝන සඤ්ඤාව තුළ ලෝකයාට වැටහෙන්නේ නැහැ. ඒ ඝන සඤ්ඤාව පෙන්නුම් කරන්න තමයි බුදුරජාණන් වහන්සේ අර උපමා දුන්නේ පෙණ පිඬ, මිරිඟුව ආදී වශයෙන්. මේ අභිසංස්කාර කියන වචනය ගැනත් යමක් කියමු. දැන් මෙතනදී මතු වුණා වචන කීපයක්. චේතනා, සංචේතනා, සංඛාර, අභිසංඛාර, සංඛත. අනික් පැත්තෙන් කියනවා අසංඛත. අපි මේ වචන ගැනත් යමක් කියමු. **චේතනා කියන වචනය. ඒකෙත් නිරුක්ති වශයෙන් බැලුවොත් චේතනා කියන්නේ එකතු කිරීම. එකතු කරනවා. දැන් චේතනාවේදී මේ පින්වතුන්ට හිතා ගන්න පුළුවන් සඤ්ඤාවෙන් යම් සඤ්ඤාවක් ලැබෙනවා. වේදනාවත් ඉස්සෙල්ලා එනවා. ඒ වේදනාව අනුව සඤ්ඤාවක් ගන්නවා. සඤ්ඤාව අරගෙන අපි ඊළඟට ක්‍රියාත්මක වෙනකොට ඔක්කොම එකතු කරලා ගන්නවා. චේතනාව.** අපි හිතුවක්කාරයි කියල කිව්වෙ චේතනාව. **සංචේතනාව කියල කියන්නේ රූප සංචේතනා සද්ද සංචේතනා වශයෙන් රූපය දෙයක් හැටියට හිතල ඒ අනුව චේතනා ඇති කර ගන්නවා. ශබ්දය දෙයක් හැටියට අරගෙන ඒ අනුව චේතනා ඇති කර ගන්නවා. එහෙම හිතාගන්න. ඒකයි අර සංඛාරා කියන පදය පඤ්ච උපාදානසකන්ධයේදී සංචේතනා වචනයෙන් තේරුවේ බුදුරජාණන් වහන්සේ.** ඡයිමෙ භිකඛවෙ චේතනා කායා චේතනා හයක් කියනවා. රූප සංචේතනා සද්ද සංචේතනා ආදී වශයෙන් තේරුවේ. ඔන්න එතකොට සංචේතනා ගැනත් යමක් කිව්වා. ඊළඟට සංඛාර ගැන අපි කලින්ම කියල තියනවනෙ සකස් කිරීම. ඒක ගැනත් යමක් කියනවා නම් ඇත්ත වශයෙන් භාරතීය ඉතිහාසය, සාහිත්‍යය දන්න අය දන්නවා ඔය නළු නිළියන් වේදිකාවට එන්න කලින් කරන අංග සංස්කාර මූණ ලස්සන කරගැනීම ආදිය එක එක විදියට. දැන් කාලේ ඔය ටෙලි නාට්‍ය බලන අයට අමුතුවෙන් කියන්න දෙයක් නැහැනේ. මිනිහා හඳුනාගන්නත් බැහැ වේදිකාවට ආවාහම.

අන්න ඒ රවටන ස්වභාවය. සංස්කාර කියන වචනයෙ තියෙන්නේ ඒ රවටන ස්වභාවය. ඒ වගේම ව්‍යාජ ස්වභාවය. එතකොට සංස්කරණය කිරීම කියන එක නාට්‍ය ආශ්‍රයෙනුත් යොදනවා. ඒ වගේම තවත් ඒ විදියට රවටන එකක් තමයි මේ පින්වතුන් - පින්වතියන් විශේෂයෙන් දන්නව ඇති මේසෙට එන්න කලින් කරන සංස්කරණය කුස්සියේදී. ආහාර පිළියෙල කිරීම් ආදිය. ඒවටත් කියනවා 'සංඛතියො'[15] කියලා, සුසංඛතං කියල කියන්නේ හොඳට සකස් කරපු භෝජනය කියන එකයි. මේසෙට ආවහම අඳුනගන්න බැහැ කොහෙන් ආ එකක්ද කියල.

අන්න එතනත් රැවටිල්ල. එතකොට සංඛාරා කියන වචනයේ ඔය රැවටිලි ස්වභාවය තියනවා. එහෙම රවටන විදියට හදපු දේ කියන එකයි සංඛත කියන්නේ. සකස් කරන ලද්ද කියන එක. ඒකට එහෙම පිටින්ම රැවටුණා. අභිසංඛතං 'කියන්නේ වෙසෙසින් සකස් කිරීම කියන අර්ථය. අභිසංස්කාර කියන වචනයේ ටිකක් ගැඹුරු අර්ථයක් තියනවා. අභිසංස්කාර කියන එක තව විදියකට තෝරන්න බලමු. සූත්‍ර දේශනා ආශ්‍රයෙන්මයි මේ නිරුක්ති දෙන්නේ. ඇතැම් තැනක තියනවා. **පබ්බජ්ජාභිසංඛාරො**[16] කියන්නේ යම් කෙනෙකුට පැවිදි බවට උත්සුක වීම - මම කොහොම හරි පැවිදි වෙන්න ඕන කියල. සිංහල ව්‍යවහාරයේ කියන්නේ 'තදියම' කියලා. ඒත් වරදක් නැහැ. පැවිදි බවට තියන තදියම අමුවෙන්ම කිව්වොත්. ඒක විතරක් නොවෙයි '**ගමිකාභිසංඛාරො**' කියනවා යම් ගමනක් මම කොහොම හරි යන්න ඕන නොගිහින් බැහැ. අන්න ඒකට ගමිකාභිසංඛාරො ඒ තදියම තුළ, ඒ උත්සුක භාවය තුළ ඉබේටම යැවෙනවා.

බුදුරජාණන් වහන්සේගේ දේශනාවක් තියනවා, අංගුත්තර නිකායෙ පචේතන රථකාර වර්ගයේ[17] උපමාවක් යොදල තියනවා. ඒ උපමාව ආශ්‍රයෙන් අපි මේ නිරුක්තිය ගත්තෙ. පචේතන රජ්ජුරුවන්ගේ රිය වඩුවා රෝද දෙකක් හැදුවා. එක රෝදයක් පෙරළුවා. රෝදයක් පෙරළන කොට ඒ රෝදයට කැවෙනවානේ යම් ජවයක්. මෙන්න මෙහෙම සඳහන් වෙනවා. ''**යාවතිකා අභිසංඛාරස්ස ගති තාවතිකං ගන්ත්වා චිඞ්ගුලායිත්වා භූමියං පපති**'' ඒ කියන්නේ යම් තාක් ඒ රෝදයට කැවුණු ජවයක් තිබුණද, ඒ ජවය ඇති තාක් ඒ රෝදය පෙරළිලා පෙරළිලා ඇවිල්ලා කරකැවිලා සුරුංඩු ගැහිලා එතනම වැටුණා. අපට ඕන

කරන්නේ අභිසංස්කාර කියන වචනය. **අභිසංස්කාර කියන එකේ තියනවා අර ජවය, තදියම, උත්සුක බව. ඉතින් ඒකම තමයි කර්ම ගැන කියනකොට නිතරම වගේ අභිසංස්කාර කියන වචනය යොදන්නේ.**

**'කාය සංඛාරං අභිසංඛරොති. වචී සංඛාරං අභිසංඛරොති. මනො සංඛාරං අභිසංඛරොති'**[18]. ඒ කියන්නේ මොකද? අන්න එතෙන්දි තමයි කර්ම විපාක පක්ෂයට අහු වෙන්නේ. ඒක ප්‍රබලව චේතනාව හරියටම යෙදිල තියනවා. අපි කිව්වනෙ හුස්ම ගත්ත පලියට අපායෙ යන්නෙ නැහැයි කියල. නමුත් මෙතෙන්දි නම් අපි කෙටියෙන් කිව්වොත් මේ පින්වතුන් කොතෙකුත් අහල තියනව පින් පව් ආදිය පිළිබඳව ධර්මයේ සඳහන් වෙන්නේ **පුඤ්ඤාභිසංඛාර අපුඤ්ඤාභිසංඛාර ආනෙඤ්ජාභිසංඛාර** කියලා අභිසංස්කාර තුන් වර්ගයක් තියනවා. පුඤ්ඤාභිසංඛාර කියන්නේ දිව්‍ය ලෝක මනුෂ්‍ය ලෝක ආදියෙහි උපදින්න හේතු වන ඒ සංස්කාර ශක්තිය තුළින් ඊළඟ භවයක් සකස් වෙනවා. හොඳ භවයක්. අපුඤ්ඤාභි සංඛාර තුළින් අපාය ආදී තැන්වල උපදින්න සකස් වෙනවා.

ඊළඟට ආනෙඤ්ජාභි සංඛාර කියන එක ගැඹුරු කාරණයක්. ඒක ධ්‍යාන සිත හා සම්බන්ධ එකක්. ආනෙඤ්ජ කියන්නේ නොසෙල්වෙන බව. හිතලා බලන්න **නොසෙල්වෙන බව පවා, ඒකත් ජවයක්.** ඒකත් ජවයක් වන හැටි උපමාවට කිව්වොත් මේ පින්වතුන් විශේෂයින් ළමයින් දන්නවා බඹර කරකවන්න. බඹරයක් ගහන්නෙ කොහොමද? **නූල ඔතල ගස්සල අතහැරිය හැටියේ ඒකේ ජවය තුළ බඹරය කෙලින්,** හැබැයි **කරකැවෙනවා. බඹරය කෙලින් - කරකැවෙනවා.** අන්න ඒ වගේ තමයි හිතාගන්න ඔය අරූප ලෝකවල කල්ප ගණන්. **කල්ප ගණන්. ඒ ධ්‍යාන තුළින් ගහපු බඹර තමයි ඒ කට්ටිය කල්ප ගණන් විඳින්නේ.** හිතන්න කොයි තරම් භයානකද සංස්කාර කියල. සංස්කාරවල භයානකත්වය ඒකෙන් පේනවනේ. නරක පවක් කළේ නැහැ. නමුත් බ්‍රහ්ම ලෝකවල ගිහිල්ලා බඹරෙ වගේ කරකැවි කරකැවි ඉන්නවා. ඒක තමයි ආනෙඤ්ජාභිසංඛාර.

ඔන්න ඔහොම සලකාගන්න. ඒ හැම එකකින්ම පේන්නේ මේ සංස්කාරවල භයානකත්වයයි. ඊළඟට ටිකක් කල්පනා කරල බලන්න මේ කිව්ව භයානකත්වය වගේම දුක් ස්වභාවය බුදුරජාණන් වහන්සේ

ප්‍රකාශ කරල තියෙනවා. මෙහෙම ප්‍රකාශ කරල තියෙනව ඇතැම් තැන්වල **'ජිඝච්ඡා පරමා රොගා - සංඛාර පරමා දුඛා - එතං ඤත්වා යථාභූතං - නිබ්බානං පරමං සුඛං'**[19] ඒකත් අපි කලින් අවස්ථාවක දේශනාවකදී පෙන්වා දීල තියෙනවා. ''ජිඝච්ඡා පරමා රොගා'' කියන්නේ මොකද, ''ජිඝච්ඡා'' කියන්නේ කුසගින්න. කුසගින්න ලොකුම රෝගය කියල කිව්වොත් දැන් වෛද්‍යවරු ඕකට විරුද්ධ වෙනවා. දැන් කාලේ ලොකුම රෝග කියල කියන්නේ කාටත් පේන දැන් කාලේ තියන විවිධාකාර රෝග. නමුත් ඒ ඔක්කොම රෝග සංසිඳෙව්වට පස්සේ ඉතිරි වන අන්තිම කෙළවර තියන රෝගය තමයි කුසගින්න. **'ඉබේ කෙඳිරි ගෑවෙන ලෙඩකි බඩගිනි'** කියල කිව්වෙ ඒකනෙ.

බඩගිනි හැදුණහම ඉබේ කෙඳිරි ගෑවෙනවා. ලෙඩක් නෑ වෙන. අන්න ඒකත් හිතාගන්න. 'ජිඝච්ඡා පරමා රොගා' කිව්වෙ ඒකයි. ඒ වාගේම තමයි 'සංඛාර පරමා දුඛා'. ඒකෙත් ගැඹුරක් තියනවා. අපි මේ දුක් කියල කෑගහන්නෙ, බාහිරව උඩින් තියන දුක් ටිකට තමයි අපි මේ දුකයි කියල කෑගහන්නෙ. ඒක කොයි තරම් ගැඹුරුද කියල අන්න අර බඹර කථාවෙන් හිතාගන්න. **'සංඛාරා පරමා දුඛා' කිව්වෙ අනිත් ඔක්කොම දුක් ජයගත්තට පස්සේ ඉතුරු වන ටික තමයි සංස්කාර දුක.** ඒ සංස්කාර තුළින් තමයි අර බඹරෙ කරකැවෙන්නෙ. ඔන්න භවය ගෙනියන්නෙ ඕකයි කියල හිතාගන්න **'සංඛාරා පරමා දුඛා. එතං ඤත්වා යථාභූතං' මේ කාරණය හරියට තේරුම්ගත්ත නම් 'නිබ්බානං පරමං සුඛං'** නිබ්බාන කියන එක අපි පෙන්නුවෙ මුලින් පටන්ගත්තෙ කොහොමද, නිවනේ ශාන්ත ප්‍රණීත බව පෙන්වන මුල්ම වචනය **'සබ්බ සංඛාරසමථ'**. ඒක කොයි තරම් ගැඹුරුද?

එතකොට අර කියාපු කුසල් අකුසල් අභිසංස්කාර පමණක් නොවෙයි. ආශ්වාස ප්‍රශ්වාසත් සංසිඳෙන්න ඕන, විතක්ක විචාරත් සංසිඳෙන්න ඕන. සඤ්ඤා වේදනා දෙකත් සංසිඳෙන්න ඕන, සංසාර භවයෙන් ගැලවෙන්න. භව තෘෂ්ණාවෙන් බැඳුණු ලෝකයාට ඕක තේරෙන්නෙ නැහැ. ඒකටත් ඉතාම ගැඹුරු වටිනා සූත්‍රයක් බුදුරජාණන් වහන්සේ දේශනා කරල තියෙනවා. ඒකත් ගැඹුරු එකක්. **සංචේතනා සූත්‍රය**[20] නමින් අංගුත්තර නිකායෙ චතුක්ක නිපාතයේ සඳහන් වෙනවා. මෙන්න මෙහෙමයි ප්‍රකාශ කරන්නේ. ඒක මහා අමුතු අන්දමේ

දේශනාවක්. '**කායෙවා භික්ඛවෙ සති කාය සඤ්චෙතනා හෙතු උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං. වාචාය වා භික්ඛවෙ සති වචී සඤ්චෙතනා හෙතු උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං. මනෙ වා භික්ඛවෙ සති මනො සංඤ්චෙතනා හෙතු උප්පජ්ජති අජ්ඣත්තං සුඛ දුක්ඛං අවිජ්ජාපච්චයාව**'

අපි කෙටියෙන් මේ අවස්ථාවේදී තේරෙන මට්ටමට ගන්න බලමු. කයෙයි කියල දෙයක් ඇති කල්හි 'කායෙ වා සති' කියන්නේ 'කයක් ඇති කල්හි' ඒ ඇත්තා වූ කය පිළිබඳ චේතනාව 'සංචේතනාව' නිසා ඇතුළත සැප දුක් ඇති වෙනවා. වාචාය වා භික්ඛවෙ සති වචනය කියන එක, භාෂාව කියන එක, වාග් ව්‍යවහාරය කියන එක, ඒකට අපි සත්‍යතාවක් දුන්නොත්, වචනය පිළිබඳ සංචේතනා නිසා ඇතුළත සැප දුක් උපදිනවා. ඊළඟට මනස පිළිබඳවත් කියනවා. මනස කියල දෙයක් ගත්තොත්, ඇත්ත වශයෙන් මනසක් තියනව කියල, ඒ මනෝ සංචේතනා හේතුවෙන් ඒත් ඇතුළත සැප දුක් උපදිනවා. ඒක තවත් ගැඹුරින් ප්‍රකාශ කරනවා. ඒවා තමනුත් ඒ සංස්කාර රැස් කරගන්නවා ඒ වගේම අනිත් අයත් තමන්ට ඒවා සකස් කරලා දෙනවා. ඒ සැප දුක් ආදිය ඒ වගේම දැනුවත් වත් කරනවා, නොදැනුවත් වත් කරනවා. එහෙම කියලා අවසානයට කියන ටිකයි අපට වැදගත් වන්නේ.

බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා මේ හැම එකක්ම '**අවිජ්ජා පච්චයාව**' **අවිද්‍යා ප්‍රත්‍යයෙනුයි මේ අපි කයක් තියනවා කියල ගන්නෙ. 'වචනයක්' තියනවා කියලා ගන්නේ. 'මනසක් තියනවා කියලා ගන්නේ.** ඊළඟට අනිත් පැත්ත කියනවා. **අවිජ්ජායත්වෙ අසෙස විරාග නිරොධා සො කායො නහොති යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛ දුක්ඛං සා වාචා න හොති යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛ දුක්ඛං සො මනො න හොති යං පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛ දුක්ඛං**

මහ පුදුම දේශනාවක් ඒක. අවිද්‍යාවගේම නිරවශේෂ නිරෝධයෙන් පස්සේ අර කියාපු කයත් නැහැ, වචනයත් නැහැ, මනසත් නැහැ. ඒ කියාපු තුනෙන් යම් සැප දුක් ඇති වෙනවා නම් ඒවත් නැහැ. ඊළඟට සූත්‍රය ඉවර කරන්නේ කොහොමද? '**ඛෙත්තං තං න හොති, වත්ථුං තං න හොති 'ආයතනං තං නහොති'** අධිකරණං **තං න හොති, යම්පච්චයාස්ස**

**තං උප්පජ්ජති අජ්ඣත්තං දුඛදුක්ඛං'** එතන අමුතු උපමා කීපයක් බුදුරජාණන් වහන්සේ දෙනවා.

ඇතුළත සැප දුක් ඇති වීමට හේතු වන යම් කෙතක් තිබුණා නම් ඒ කෙතත් ඉවරයි. යම් ඉඩමක් තිබුණා නම් ඒ ඉඩමත් ඉවරයි. යම් ආයතනයක් තිබුණා නම් ඒ ආයතනයත් ඉවරයි. යම් හේතුවක් තිබුණා නම් ඒකත් ඉවරයි. ඔන්න දුක් කෙළවර කරන හැටි. ඒකෙන් අපට එහෙම පිටින් පෙන්නුම් කරන්නේ සංස්කාර කියන වචනයේ ගැඹුරු පැත්ත. අපි පුළුල් පැත්ත කියල කිව්වෙ ඒ දෙකම පෙරහුරුව වගේම අන්තිමට භව රැගුමට උපකාර වන නැවත භවයක් මවන අභිසංස්කාර. ඒ සංඛතය. ඉතින් මෙන්න මේ විදියේ මහ පුදුම කාරණා රාශියක් මෙතන තියනවා. ඊළඟට තව ටිකක් හිතල බැලුවොත් බොහෝදෙනාට ගැටලු තියන ගාථා තියනවා මේ සංස්කාර පිළිබඳව සඳහන් වන. හැමදෙනාම වගේ අහන එකක් තමයි

**'සබ්බෙ සංඛාරා අනිච්චාති**
**යදා පඤ්ඤාය පස්සති**
**අථ නිබ්බින්දති දුක්ඛෙ**
**එස මග්ගො විසුද්ධියා'**[21]

පළවෙනි ගාථාවේ සියලු සංස්කාර අනිත්‍යයයි කියල ගත්තොත් යම් අවස්ථාවක ප්‍රඥාවෙන් දැක්කොත් මේ දුක ගැන කලකිරෙනවා. ඒකයි මේ විසුද්ධියට මාර්ගය කියල පළවෙනි ගාථාවේ එහෙම සඳහන් වෙනවා. දෙවෙනි ගාථාවෙ **'සබ්බෙ සංඛාරා දුක්ඛාති යදා පඤ්ඤාය පස්සති'** දෙවෙනි ගාථාවේ තියෙන්නේ සියලු සංස්කාර දුකක් බව විදර්ශනාවෙන් දැක්කොත් මේක තමයි විසුද්ධියට මාර්ගය. නමුත් තුන්වෙනි ගාථාව ගැටලුවක් වෙලා තියෙනවා. **'සබ්බෙ ධම්මා අනත්තාති යදා පඤ්ඤාය පස්සති'** එතෙන්දි 'ධම්මා' මොකද කියන එක යෙදුවෙ කියන එක හැමෝටම ගැටලුවක්. අනාත්මය කියලා කියනකොට සියලු ධර්මයන්. මුල් ගාථාවේ තියෙන්නේ සියලු සංස්කාර අනිත්‍යයි. දෙවන ගාථාවේ තියෙන්නේ සියලු සංස්කාර දුකයි. තුන්වන ගාථාවේ කියනවා සියලු ධර්මයන් අනාත්මයි. ඔන්න ඔතෙන්දි ගැටලුව වෙන්නේ මේකයි. **'ධම්ම' කියන එක අපි කලින් පෙන්නුම් කරල තියනවා. මනසට අරමුණු වන**

**දේවල්.** එතකොට 'හැම දෙයක්ම' කියනකොට අපේ පැරැන්නන් නම් කියන්නේ - ඒක නිසා තමයි මූල පරියාය සූත්‍රය දුරවබෝධ වෙලා තියෙන්නේ - නිවන දෙයක් නොවෙයි කියලා. නමුත් **නිවන 'දෙයක්' කරගෙන තියෙනවා.** මෙතන තියෙන්නේ සංඛත අසංඛත ධර්ම ඔක්කොම නිවන කියන එකත් අසංඛත ධර්මයක් කරගෙන, අසංඛත ධාතුවක් කරගෙන, අන්තිමට සියදෝරිස් නිවනක් කරගෙන තියන බව අපි පෙන්නුවනෙ. **නමුත් අසංඛතය කියල කියන්නේ මොකක්ද? සංඛතය නැති වුණු අවස්ථාව.**

ඒක තමයි ගාථාවක් තියෙනවා ඒකත් තේරුම් ගන්න පුළුවන්. - **'සංඛාරානං ඛයං ඤත්වා අකතඤ්ඤූසි බ්‍රාහමණ'**[22] ධම්ම පදයෙ තියෙනව සංස්කාරයන්ගේ ක්ෂය වීම තේරුම්ගත්තොත් 'අකත' කියල කියන අසංඛත තත්ත්වය ලැබෙනවා. එතකොට අමුතු දෙයක් නොවේ. හිතන්න මේ පැදුරක රටාවක් ගැන. ඒ රටාව තුළ හිත බැඳෙන්නේ ඝන සඤ්ඤා නිසානේ. මේක ඒ අතට මේ අතට හැදිච්ච දේවල් කියලා හිතනකොට ඒ රටාවෙන් මිදෙනවා. අන්න එහෙම දෙයක් මේ අසංඛත කියල කියන්නේ. ඒකත් 'දෙයක්' කරගෙන අන්තිමට ඒකයි මේ භයානකකම. **'සබ්බෙ ධම්මා අනත්තා' කියන්නේ නිවනත් ඇතුළුව.** 'නිවන' කියන එක අපි ඉලක්කයක් හැටියට ගන්නකොට ගන්නේ මනසට අරමුණක් හැටියට. එහෙම නේද? මනසට අරමුණක් නේද? එහෙම නැතුව බැහැ. නමුත් අවසානයේ නිවනත් 'දෙයක්' කරගත්තොත් අන්න අර යෝගීන්ට වෙච්ච දේමයි වෙන්නේ.

**'නත්ථි කිඤ්චි' කියන එකත් 'කිසිවක් නැත' කියන එකත් දෙයක් කරගත්ත වගේ. නිබ්බාන කියන එකත් 'දෙයක්' කරගත්තොත් එතන ඉඳලා මඤ්ඤනාවට වැටිලා ආයිත් සංසාරයට එනවා.** හරිම ගැඹුරු ධර්මයක්. මහපුදුම ධර්මයක්. එතකොට අසංඛත කියන එක ඒ විදියට තේරුම්ගන්න නරකයි. ඒ නිසා තමයි ඇත්ත වශයෙන් බුදුරජාණන් වහන්සේ 'අනෙකජාති සංසාරං' කියන ගාථාව අවසන් කළේ **'විසංඛාරගතං චිත්තං** - තණ්හානං ඛය මජ්ඣගා'[23]. එතන අමුතු වචනයක් යොදනවා **'විසංඛාර ගතං චිත්තං'**. සංස්කාරවලට නතු වෙලා තිබුණ හිත 'විසංඛාර' වෙනව. හිත මිදුණා. චිත්ත විමුක්තිය ප්‍රකාශ කරන වචනයක්

'විසංඛාරගතං චිත්තං'. හිත සංස්කාරයන්ගෙන් මිදුණා. ඒකනෙ චේතනා අභිසංස්කාර අතහැරිය හැටියෙ නිරෝධය ස්පර්ශ කළයි කියන්නේ. ඒක තවත් පැත්තකින් කියනවා නම් විසංඛාරගතං චිත්තං කියනවා වගේ. ඇතැම් තැන්වල තියනවා, '**විඤ්ඤාණං ච අනභිසංඛච්ච විමුත්තං**' කියල. සාමාන්‍යයෙන් ලෝකයාගේ විඤ්ඤාණය සංඛතයි. සකස් කරපු එකක්. නමුත් යම් අවස්ථාවක එය නාමරූප සංස්කාරයන්ගෙන් මිදුණොත් ඒකට කියන නම මේ පින්වතුන්ට අපි කියල තියනවා. '**අනිදස්සන විඤ්ඤාණය**' නාමරූපයක් පෙන්නුම් කරන්නෙ නැති විමුක්ත විඤ්ඤාණය තමයි අනිදස්සන විඤ්ඤාණය. එතකොට 'අනභිසංඛච්ච විමුත්තං'[24] කිව්වේ ඒකටයි. ඔය විදියට 'අසංඛත' කියල කියන්නේ අමුතු දෙයක් නොවෙයි. අර සන සඤ්ඤාවෙන් මිදිලා රාසි සඤ්ඤාව තුළින් යම් අවස්ථාවක විමුත්තිය ලැබුව නම්.

තවත් කාරණයක් මෙතන මේ පින්වතුන්ට මතක් කරන්න ඕන. අපි අර මුලදී අවධාරණය කළා. 'කාය සංඛාරෝ වචී සංඛාරෝ චිත්ත සංඛාරෝ'. නමුත් කර්ම ගැන කථා කරන කොට අමුතු වචනයක්. සුළු වෙනසක් තියනවා. එතන කර්ම ගැන කථා කරනකොට බහු වචනයක් එනවා. කාය සංඛාරා වචී සංඛාරා නමුත් **චිත්ත සංඛාරා නොවෙයි 'මනො සංඛාරා'** එතනත් යම් ගැටලුවක් තියනවා. මොකද අපි කිව්ව නේද ආශ්වාස ප්‍රශ්වාස, විතක්ක විචාර, සඤ්ඤා වෙදනා ආදිය යට තට්ටුවය කියලා. නමුත් මේක **උඩ තට්ටුවට එන්නේ අන්න මනසට තැනක් ලැබුණහම.** මොකද මනසට ධම්ම, මනසට එන අරමුණ තමයි ධම්ම අරමුණ. **මනසට එන අරමුණ දෙයක් කර ගත්තු අවස්ථාවෙ තමයි චේතනාව එන්නේ. හිතුවක්කාර මැද ඇඟිල්ල ක්‍රියාත්මක වෙන්නේ මනසට එන අරමුණුවලින්.** ඒක නිසා තමයි ටිකකට හිතන්න මේක පෙළ ගස්සවල ගත්තොත් අපි ඉස්සෙල්ල කිව්වෙ කාය සංඛාරෝ. වචී සංඛාරෝ, චිත්ත සංඛාරෝ, නමුත් ඊට යටින් ලියන්න වෙනවා කර්ම ගැන කථා කරනවා නම්, **පුනර්භවයක් සකස් වෙන කර්මය ගැන කථා කරනවා නම්, 'කාය සංඛාරා, වචී සංඛාරා බහු වචන. නමුත් තුන්වෙනි එක චිත්ත සංඛාරා නොවෙයි. ඒක මනෝ සංඛාරා.** මොකද අර පංචේන්ද්‍රියයන්ගෙන් ගත්තු දේවල් හිතට එනකොට ඒක 'දෙයක්' කරගෙන ඉවරයි. '**ඡන්දමූලකා ආවුසො සබ්බෙ ධම්මා**'[25] හැම දෙයක්ම

ඡන්දයෙන් වෙනවා කියන්නේ. ඒව ගැඹුරටම යන කාරණා මේ කෙටියෙන් කියන්නෙ. එහෙම සලකාගන්න. එයින් පේනවා සංස්කාර කියන වචනය කොතරම් ගැඹුරක් තියන වචනයක්ද කියලා. සංඛත සකස් කිරීම කියන එක. මේ සකස් කිරීමට යටින් තියෙන්නේ තණ්හාව. ඒකත් ඇතැම් තැන්වල බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා **''අවිජ්ජාසම්ඵස්සජෙන භික්ඛවෙ, වෙදයිතෙන ඵුට්ඨස්ස අස්සුතවතො පුථුජ්ජනස්ස තණ්හා උප්පන්නා තතොජො සො සංඛාරො''**[26] අවිද්‍යාව ස්පර්ශ කරන ලද අශ්‍රැතවත් පෘථග්ජනයාට 'සාමාන්‍ය පෘථග්ජනයාට' තණ්හාවක් ඇති වෙනවා. ඒ තණ්හාව තුළින් තමයි මේ සංස්කාර ඇති වෙන්නේ. බලන්න ආශ්වාස ප්‍රශ්වාස. අනික් ඔක්කොම අතහැරියත් හුස්ම නොගෙන ඉන්න බැහැ. මූලිකම උපාදානය කිව්වෙ ඒකයි. ඒ මැරෙන අවස්ථාවේ කොයි තරම් හුස්ම අල්ලගන්න දඟලනවද? එතකොට භවය තියෙන්නේ ඔය කියාපු සියුම් වූ සංස්කාර තුන උඩයි. අනික් බාහිර දේවල් ඒකට පස්සෙ. භවයේ දිගින් දිගට යන ඒවා. නමුත් මූලික වශයෙන් තියෙන්නේ සංස්කරණය කරන්නේ අවිද්‍යාව තුළින්. අවිද්‍යාව කියල කියන ඒ අන්ධකාරය තුළින් කෙරෙන සංස්කාර ත්‍රිවිධයි කාය සංඛාර, වචී සංඛාර, චිත්ත සංඛාර. ඒ සංස්කරණය තුන්වෙනි එක මනෝ සංස්කරණයක් බවට පත් වෙන්නේ ඕළාරික අවස්ථාවට, ගොරෝසු අවස්ථාවට පත් වෙලා. සංඛත වුණ අවස්ථාවේ. මනෝ සංචේතනා කියල කිව්වෙ. වෙදනා සඤ්ඤා ඇති වුණ පමණට කර්මයක් රැස් නූනත් මනෝ සංචේතනා - මේ පින්වතුන් දන්නවා ධම්ම පදයේ මුල්ම ගාථා දෙක. බොහෝ විට අන්තිමට එන්නේ ධම්මපද මුල්ම ගාථා දෙකට නේ. මුලටම එන ගාථා දෙකට නේ.

**මනො පුබ්බංගමා ධම්මා**
**මනො සෙට්ඨා මනොමයා**
**මනසා චෙ පදුට්ඨෙන**

දූෂිත මනසින් කරන, එතන මනස ගැන කථාවයි එන්නෙ. මොකද එතෙන්දි වගකීමක් ගත්තා. මනසට ඉස්සරහින් තියනවා 'දෙයක්'. එතනයි චේතනාව ක්‍රියාත්මක වෙන්නේ. මනසට තියනවා ඉස්සරහින් කෙලින්ම 'දෙයක්'. ඒ 'දෙය' කුසල් හෝ අකුසල් වෙන්න පුළුවන්. ඒක තුළයි කර්ම රැස් වන්නේ.

ඔන්න හොඳට තේරුම්ගන්න. හුඟක් කාරණා මෙතන කියවුණා අපි පෙළගස්වල ගත්තු වචන ටික තම තමන්ම හිතාගන්න සංඛාරා කියන වචනය තියනවා, අභිසංඛාර කියන වචනය තියනවා. චේතනා කියන වචනය තියනවා, සංචේතනා කියන වචනය තියනවා. සංඛත කියන වචනය තියනවා, අසංඛත කියන වචනය තියනවා. ඔය වචන තුළ තියනවා අපි කියාපු ඒවායේ සාරාංශය. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළේ නිකම් නොවෙයි එතකොට '**යං කිඤ්චි දුක්ඛං සමෙහාති සබ්බං සංඛාර පච්චයා**' ඒක නිසාම තමයි තව ටිකක් කියනවා නම් ඒ ගාථාවට වැඩිදෙනෙක් කැමති නැහැ. හැබැයි මේ ශාසනයේ තියන වටිනාම ඉතාම රසවත්ම සිංදුව තමයි අවසානයේ කාටත් අහන්න ලැබෙන්නේ.[27]

**අනිච්චා වත සංඛාරා**
**උපපාද වය ධම්මිනො**
**උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති**
**තෙසං වූපසමො සුඛො**

ඇත්ත වශයෙන් මට හිතුණා මේ දේශනාව මුල පටන්ගන්න මේකෙන්. නමුත් මම දැනගත්ත මේ කවුරුත් නැගිටල යාවි කියල. ඒ නිසා අගට කිව්වා. ''අනිච්චා වත සංඛාරා'' කියන ගාථාව තරම් ගැඹුරු ගාථාවක් තවත් නැහැ. දැන් ඒකට සතිපට්ඨාන සූත්‍රයට ගිහිච්ච කල ගිහින්. සතිපට්ඨාන සූත්‍රය 'වට්ටක්කා ගෙඩිය' වුණා වගේ මේකත් මරණ ගෙදර සිහිපත් කරනවා. නමුත් මේකෙ කොයි තරම් ගැඹුරක් තියනවද? අනිච්චා වත සංඛාරා - උප්පාද වය ධම්මිනො. ඒකාන්තයෙන්ම සංස්කාරයෝ අනිත්‍යයහ. 'උප්පාද වය ධම්මිනො' ඇති වීම් නැති වීම් සභාවය ඇත්තාහ.

'උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති' ඇති වෙලා නැති වෙනවා. 'තෙසං වූපසමො සුඛො' ඒවායේ සංසිඳීම සැපයකි. ආශ්වාස ප්‍රශ්වාස විතක්ක විචාර ඔක්කොම අයිතියි ඒකට.

ඔන්න ඊළඟට තවත් එකක් අපි එකතු කරමු. ඒකට - එතන කිව්වෙ

**අනිච්චා වත සංඛාරා**
**උප්පාද වය ධම්මිනො**
**උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති**
**තෙසං වූපසමො සුඛො**

නමුත් තවත් එකක් තියනවා ඒ වගේම ඔය සංස්කාරවල අභිසංඛත කියල කියන ගොරෝසු සංස්කාර ඒවා පිළිබඳව. ඒ හැම එකක්ම ආශ්වාස ප්‍රශ්වාස පමණක් නොවේ. 'අනිච්චා වත සංඛාරා උප්පාද වය ධම්මිනො' **සංස්කාර පිළිබඳව තියෙන්නේ උප්පාද වය සභාවය. ඇතිවීම් නැතිවීම් සභාවය. නමුත් සංඛතය පිළිබඳව පුදුම විවරණයක් බුදුරජාණන් වහන්සේ වදාරනවා.** සංඛතය තෝරල තියෙන්නේ මෙහෙමයි.[28] **තීණිමානි භික්ඛවෙ සංඛතස්ස සංඛත ලක්ඛණානි** මහණෙනි, සංඛතය කියන එකේ ලක්ෂණ තුනක් තියනවා. මොනවද ඒ ලක්ෂණ තුන **උප්පාදො පඤ්ඤායති වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති,** ඒකේ තේරුම සංඛතයේ හට ගැනීමක් දකින්න ලැබෙනවා, ගෙවී යාමක් දකින්න ලැබෙනවා. තවත් එකක් තියනවා '**ඨිතස්ස අඤ්ඤථත්තං**' කියන්නේ පින්වතුනි, '**ඨිති**' කියල කියන්නේ පැවැත්ම. පැවැත්ම කියල අපි ගන්න දේ අඤ්ඤථා භාවයක් වෙනස් වීමක් තියනවා. **එතකොට සංස්කාර නම් ඇති වීම් නැතිවීම් පමණයි. නමුත් සංඛතය නම් ඇති වීම් නැති වීම් දෙකට අමතරව ඨිති කියල අපි හිතාගත්තු පැවැත්මක් තියනවා.** ඒ පැවැත්ම ගැන බුදුරජාණන් වහන්සේ කියන්නේ 'ඨිතස්ස අඤ්ඤථත්තං' - **ඨිති කියල ගත්තු දේ අඤ්ඤථා භාවයට පත් වෙනවා. වෙනස් වෙනවා.** අන්න ඒක නිසා එතන ඉතාම ගැඹුරු කාරණයක් තියෙන්නේ. ඊළඟට කියනවා අසංඛත ධාතුව ගැන. අසංඛත කියන්නේ නිවන බව මේ පින්වතුන් අහල තියනවනෙ. අසංඛතය ගැන ඒ අවස්ථාවේදී ප්‍රකාශ වෙන්නේ මෙහෙමයි.

'**තීණිමානි භික්ඛවෙ අසංඛතස්ස අසංඛත ලක්ඛණානි**' අසංඛතයේ ලක්ෂණ මොනවාද? **න උප්පාදො පඤ්ඤායති, න වයො පඤ්ඤායති න ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති. එතකොට සංඛතයේ අර කියාපු තුන තියනවා. නමුත් අසංඛතයේ 'උප්පාදයකුත්' නැහැ. 'ව්‍යය වීමකුත්' නැහැ.**

**'ඨිතියක වෙනස් වීමක්' පිළිබඳ කථාන්තරයකුත් නැහැ.** මොකද අපි පෙන්වල තියනවා, **සළායතන නිරෝධයත් එක්ක විඤ්ඤාණ නිරෝධයත් එක්ක, නාමරූප නිරෝධයත් එක්ක ඔක්කොම නිරුද්ධයි.** ආයෙත් ඇති වෙන්න නැති වෙන්න දෙයක් නැහැ. ඒක තමයි නිවන දේශනාවලින් බොහෝදෙනාට තේරුම් ගන්න තිබුණෙ. එක්තරා ආයතනයක් තියෙනවා.[29] ඒ ආයතනය කියන වචනයට රැවටුණා කට්ටිය. ඒ ආයතනයේ යාමකුත් නැහැ. ඊමකුත් නැහැ. සිටීමකුත් නැහැ. පැවැත්මකුත් නැහැ. අරකත් නැහැ. මේකත් නැහැ.

එහෙම කියන්නේ මොකද, ඔන්න ඔය කියාපු අසංඛත තත්ත්වය. එතකොට මේ පින්වතුන්ට මේ පැය තුළ අපට කියන්න පුළුවන් තරමක් කිව්වා. මේවා හොඳින් ජීර්ණ කර ගන්න බලන්න. දහසක් නයින් තේරුම් ගන්න බලන්න. මේ කිව්වෙ මොකද? **මෙච්චර කාලයක් සම්මත පටිච්චසමුප්පාද විවරණය තුළ මේ සංස්කාරවලින් සකස් කරන්නේ පටිසන්ධි විඤ්ඤාණයක් කියල මතයක් තිබුණා. පටිසන්ධි විඤ්ඤාණයක් නොවෙයි,** දැන් අපි පෙන්නුම් කළා ඒකෙ අර්ථ දෙකක් තියෙන බව. සංස්කාර, අභිසංස්කාර සංඛත ආදී වශයෙන්. මේවා උපකාර කරගන්න සාමාන්‍යයෙන් තර්ක විතර්කයට ගෙනයන්නෙ නැතිව කාරණය පැහැදිලිව කරන්න ඕන නිසා අපි කිව්වෙ, තමන්ගේ භාවනාවට උපකාර කරගන්න වැරදි වැටහීම් තියනවා නම් මිථ්‍යාදෘෂ්ටි තියාගන බැහැ. මේ ගමන යන්න. දෘෂ්ටිය කෙලින් කරගන්න උත්සාහ කරන්න.

මේ පින්වතුන් කවුරුත් අද දවසේ වටිනා සීලයක් සමාදන් වෙලා වෙනද වගේම මා හිතනවා භාවනාවක යෙදිල හිටියා කියල. සතිසම්පජඤ්ඤයත් දියුණු කරගන්න. අද දින මේ අසන්ට ලැබුණ විශේෂයෙන්ම විදර්ශනාවට උපකාර වන මේ දේශනාවත් තම තමන්ගේ බණ භාවනාවලට එකතු කරගෙන ඒ තුළින් හැකි තාක් ඉක්මනින් මේ ශාසන පහන නිවී යන්නට කලින් සෝවාන්, සකදාගාමී, අනාගාමී, අර්හත් යන මාර්ග ඵල ප්‍රතිවේධයෙන් උතුම් වූ අමා මහ නිවන සාක්ෂාත් කර ගැනීමටත් මේ පින්වතුන්ට ධෛර්යය හා බලය ලැබේවා කියල ප්‍රාර්ථනා කරනවා. එසේම අවීචියේ සිට අකනිටා දක්වා යම් සත්ත්ව කෙනෙක් මේ දේශනාමය හා ශ්‍රවණමය කුසලය අනුමෝදන් වීමට

කැමති නම් ඒ අනුමෝදන් වීම තුළින් ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් වූ අමා මහ නිවනින් සැනසෙත්වා කියල මේ ගාථා කියා පින් දෙන්න.

**එත්තාවතා ච අම්හෙහි ...**

## පාදක සටහන්

1. ද්වයතානුපස්සනා සූත්‍රය, සුත්ත නිපාතය -228 පිට (බු.ජ.ත්‍රි 25)
2. ගිරිමානන්ද සූත්‍රය, අංගුත්තර නිකාය -6-198 පිට (බු.ජ.ත්‍රි 23)
3. විභංග සූත්‍රය, සංයුත්ත නිකාය - 2-6 පිට (බු.ජ.ත්‍රි 14)
4. චූල වෙදල්ල සූත්‍රය, මජ්ඣිම නිකාය -1-706 පිට (බු.ජ.ත්‍රි 10)
5. දුතිය ගද්දුලබද්ධ සූත්‍රය, සංයුත්ත නිකාය -3-260 පිට (බු.ජ.ත්‍රි 15)
6. විභංග සූත්‍රය, සංයුත්ත නිකාය -2-6 පිට (බු.ජ.ත්‍රි 14)
7. රහොගත සූත්‍රය, සංයුත්ත නිකාය -4-412 පිට (බු.ජ.ත්‍රි 16)
8. පඤ්චත්තය සූත්‍රය, මජ්ඣිම නිකාය -3-34 පිට (බු.ජ.ත්‍රි 12)
9. පොට්ඨපාද සූත්‍රය, දීඝ නිකාය - 1-388-436 පිට (බු.ජ.ත්‍රි 7)
10. පොට්ඨපාද සූත්‍රය, දීඝ නිකාය - 1-404 පිට (බු.ජ.ත්‍රි 7)
11. උපාදාන පරිවත්ත සූත්‍රය, සංයුත්ත නිකාය -3-106 පිට (බු.ජ.ත්‍රි. 15)
12. මහා සළායතනික සූත්‍රය, මජ්ඣිම නිකාය -3-594 පිට (බු.ජ.ත්‍රි. 12)
13. ඛජ්ජනීය සූත්‍රය, සංයුත්ත නිකාය -3-148 පිට (බු.ජ.ත්‍රි. 15)
14. ඵෙණපිණ්ඩුපම සූත්‍රය, සංයුත්ත නිකාය -3-24 පිට (බු.ජ.ත්‍රි 15)
15. ලටුකිකොපම සූත්‍රය, මජ්ඣිම නිකාය - 2 - 192 පිට (බු.ජ.ත්‍රි. 11)
16. සොණ සූත්‍රය, උදාන පාළි - ඛු.නි. -1-242 පිට (බු.ජ.ත්‍රි. 24)
17. අංගුත්තර නිකාය - 1-212 පිට (බු.ජ.ත්‍රි. 18)
18. කුක්කුරවතිය සූත්‍රය - මජ්ඣිම නිකාය -2-88 පිට (බු.ජ.ත්‍රි. 11)
19. සුඛ වග්ග, ධම්ම පදය ගා. 203, ඛුද්දක නිකාය -1-76 පිට (බු.ජ.ත්‍රි. 24)
20. සංචේතනා සූත්‍රය, අංගුත්තර නිකාය -2-306 පිට (බු.ජ.ත්‍රි. 19)
21. මග්ග වග්ග, ධම්ම පදය, ගා.277 ඛුද්දක නිකාය -1-94 (බු.ජ.ත්‍රි. 24)
22. බ්‍රාහ්මණ වග්ග, ධම්ම පදය, ගා.383, ඛුද්දක නිකාය -1-64 පිට (බු.ජ.ත්‍රි.24)
23. ජරා වග්ග, ධම්ම පදය, ගා. 154, ඛුද්දක නිකාය -1-64 පිට (බු.ජ.ත්‍රි. 24)
24. උදාන සූත්‍රය, සංයුත්ත නිකාය -3-102 පිට (බු.ජ.ත්‍රි. 15)
25. කිංමූලක සූත්‍රය, අංගුත්තර නිකාය -5-344 පිට (බු.ජ.ත්‍රි. 22)
26. පාරිලෙය්‍යක සූත්‍රය, සංයුත්ත නිකාය 3-164 (බු.ජ.ත්‍රි. 15)
27. මහා පරිනිබ්බාන සූත්‍රය, දීඝ නිකාය -2-246 පිට (බු.ජ.ත්‍රි. 8)
28. අංගුත්තර නිකාය -1-274 පිට (බු.ජ.ත්‍රි. 18)
29. පඨම නිබ්බාන සූත්‍රය, උදාන පාළි, ඛුද්දක නිකාය -1-290 පිට (බු.ජ.ත්‍රි 24)

# 14 වන දේශනය

# 14 වන දේශනය

## (පහන් කණුව ධර්ම දේශනා අංක 196)
## 'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

ඉදං ජාතු වෙදගූ - ඉදං ජාතු සබ්බජී
ඉදං ජාතු අපලිබත්තං - ගණ්ඩමූලං පලිබණ්ණන්ති[1]

-උදක සුත්ත, සංයුත්ත නිකාය

සැදැහැවත් පින්වතුනි,

සාංසාරික සත්ත්වයාගේ ජීවිත පැවැත්මට අදාළ ක්‍රියාකාරකම් සියල්ල ආයතන හයක් තුළ සිදු වන බව ලෝකය දිහා විමසුම් ඇසින් බලන කෙනෙකුට පෙනී යනවා. ඇස, කන, නාසය, දිව, කය, මන කියන ආධ්‍යාත්මික ආයතන හය පටිච්ච සමුප්පාද ධර්මයේ හැඳින්වෙන්නේ සළායතන නාමයෙනුයි. විඤ්ඤාණ නාමරූප දිය සුළිය තුළින් මතු වන ආකූල, ව්‍යාකූල ක්‍රියාකාරිත්වය රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම කියන බාහිර ආයතන හයත් එක්ක සම්බන්ධීකරණයෙන් ලෝකයාට හඳුන්වාදෙන්නේ මේ සළායතනයයි.

සංයුත්ත නිකායේ සළායතන සංයුත්තයේ උදක සූත්‍රයේ එන ගාථාවකුයි අද අපි මේ දහහතරවෙනි පටිච්ච සමුප්පාද දේශනාවට මාතෘකාව හැටියට ඉදිරිපත් කර ගත්තෙ. තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ එක් අවස්ථාවක සංඝයා වහන්සේලා අමතලා මෙන්න මෙහෙම ප්‍රකාශයක් කරනවා. මහණෙනි, උදක රාමපුත්ත මෙන්න මෙහෙම කියමනක් කියනවා.

ඉදං ජාතු වෙදගූ - ඉදං ජාතු සබ්බජී
ඉදං ජාතු අපලිබත්තං - ගණ්ඩමූලං පලිබණ්ණන්ති

මේකෙ තේරුම 'ඉදං ජාතු වෙදගූ' කියල කියන්නේ මේක තමයි

ඇත්තෙන්ම වේදයේ පරතෙරට ගියයි කියන්නේ 'ඉදං ජාතු සබ්බජී' කියන්නේ. මේක තමයි ඇත්තෙන්ම සියල්ල ජයගත්තයි කියන්නේ 'ඉදං ජාතු අපලිබ්තං ගණ්ඩමූලං පලිබණ්හිං' කියන්නේ. මේක තමයි ඇත්තෙන්ම මෙතෙක් මුල නොසෑරූ ගඬුවෙහි මුල සෑරුවයි කියන්නේ. එහෙම මේ ගාථා ප්‍රකාශ කරලා බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලා අමතලා කියනවා. ''මහණෙනි, උද්දක මේ උදාන ගාථා ප්‍රකාශ කළාට මොකද, ඒක හරි හැටියටම ප්‍රකාශ කරන්න අයිතිය තියෙන්නේ මේ ශාසනයේ භික්ෂුවකටයි. ඊළඟට බුදුරජාණන් වහන්සේ මේ ප්‍රහේලිකා විදියේ ගාථාවේ අර්ථය තෝරන විදිය මෙහෙම ප්‍රකාශ කරනවා. ''මහණෙනි, කෙසේද කෙනෙක් වෙදගූ වෙන්නේ?'' ඒක තෝරන්නේ මෙහෙමයි. **'යතො ඛො භික්ඛවෙ භික්ඛු ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච, අත්ථගමඤ්ච, අස්සාදඤ්ච, ආදීනවඤ්ච, නිස්සරණඤ්ච, යථාභූතං පජානාති, එවං ඛො භික්ඛවෙ භික්ඛු වෙදගූ හොති'**

යම් හෙයකින් යම් භික්ෂුවක් ස්පර්ශ ආයතන හයේ සමුදය හටගැන්ම, අස්තයට යාම, ආස්වාද පක්ෂය, ආදීනව පක්ෂය, එයින් නික්මීම කියන නිස්සරණය යථාභූත වශයෙන් ඇති තතු පරිදි ප්‍රඥාවෙන් අවබෝධ කරගනීද, අන්න එපමණකිනුයි භික්ෂුවක් 'වෙදගූ' වෙන්නේ. ඊළඟට කෙසේද මහණෙනි, **'සබ්බජී'** වෙන්නේ. සියල්ල ජයගත්තා වෙන්නේ? ඒකත් අර විදියටම ප්‍රකාශ කරනවා. **'යතො ඛො භික්ඛවෙ භික්ඛු ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච, අත්ථගමඤ්ච, අස්සාදඤ්ච, ආදීනවඤ්ච, නිස්සරණඤ්ච, යථාභූතං විදිත්වා අනුපාදාය විමුත්තො හොති'** අර කියාපු ස්පර්ශ ආයතන හයේ හට ගැනීම, අස්තයට යාම, ආස්වාදය, ආදීනවය, නිස්සරණය, යථාභූත වශයෙන් දැනගෙන උපාදානයෙන් තොරව හිත මුදාගත්තු තැනැත්තාට තමයි 'සබ්බජී' කියන්නේ. ''සියල්ල ජය ගත්තය'' කියන්නේ.

කෙසේද මහණෙනි, මෙතෙක් මුල නොසෑරූ ගඬුවෙහි මුල හෑරුවයි කියන්නේ? ඒක ඊටත් වැඩිය ප්‍රහේලිකා විදියේ පදයක්. මහණෙනි, 'ගණ්ඩ' ගඬුව කියන්නේ මේ පඨවි, ආපො, තෙජො, වායො කියන සතර මහා භූතයින්ගෙන් හැදුණු, මව් පියන් නිසා හටගත්, බත්

කොමු පිඬු එකතුවක් වන අනිත්‍ය සවභාවය ඇති ඉලීම් පිරිමැදීම් බිඳීම් විසිරීම් සභාවය ඇති මේ කයටම වෙන නමක්. කුමක්ද මහණෙනි, ගඩුවේ මුල කියන්නේ? ගඩුවේ මුල කියන්නේ තණ්හාවටම වෙන නමක්. කොතෙකින්ද මහණෙනි, ඒ ගඩුවේ මුල හැරුවයි කියන්නේ? ඒක තෝරන්නේ මෙහෙමයි. යම් කිසි භික්ෂුවක් තුළ තෘෂ්ණාව ප්‍රහීණද, මුලිනුපුටා දමන ලද්දේද, උගුලා තබන ලද තල්ගසක් මෙන් නැති කරන ලද්දේද, නැවත නූපදින තත්ත්වයට පත් කරන ලද්දේද, ඒ භික්ෂුව තමයි මෙතෙක් මුල නොහැරූ ගඩුවේ මුල හැරුවයි කියන්නේ. බුදුරජාණන් වහන්සේ දුන් මේ විවරණයෙන් අපට පේනවා මේ 'වෙදගූ' කියන එක බමුණන්ගෙන් ගත්තු වචනයක්. අපි ශාසනික අර්ථයෙන් කියනවා නම් දත යුතු සියලු දැනුමෙන් පරතෙරට ගිය කියන එකයි. සියලු දැනුමෙන් පරතෙරට ගියයි කියල බුදුරජාණන් වහන්සේ හඳුන්වන්නේ අර ආයතන හයේ පස් ආකාර අවබෝධය සම්පූර්ණ වීමයි. සියල්ල ජයගත්තා කියන්නේ ඒත් අර පස්ආකාර අවබෝධය ලබාගෙන සළායතනය පිළිබඳව උපාදානයෙන් තොරව විමුක්ත වීමයි. **මෙයින් අපට පේනවා සියල්ල දැනගැනීමත් සියල්ල ජය ගැනීමත් කියන දෙකම සළායතන ආශ්‍රයෙන් තේරුම් ගත යුතු බව.** අපි මේ 'සියල්ල' කියලා කිව්ව නිසා මෙතන ඉඳලා සාධක සූත්‍රයක් ඉදිරිපත් කරනවා. පින්වතුනි, සළායතන සංයුත්තයේම තියනවා 'සබ්බ' කියලා සූත්‍රයක්.[2]

'සබ්බ' කියන්නේ සියල්ල. එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලා අමතලා කියනවා '**සබ්බං වො භික්ඛවෙ දෙසිස්සාමි**' මහණෙනි, නුඹලාට 'සියල්ල' මම කියලා දෙනවා, දේශනා කරනවා, හොඳට ඇහුම්කන් දෙන්න. '**කිඤ්ච භික්ඛවෙ සබ්බං**' මොකක්ද සියල්ල? '**චක්ඛුඤ්චෙව රූපා ච, සොතඤ්ච සද්දා ච, ඝානඤ්ච, ගන්ධා ච, ජිව්හා ච, රසා ච, කයො ච ඵොට්ඨබ්බා ච මනොච ධම්මා ච.** ඇසත්, රූපත්, කනත්, ශබ්දත්, නාසයත්, ගඳ සුවඳත්, දිවත්, රසත්, කයත් ස්පර්ශ කළ යුතු දේවලුත්, මනසත් ධම්මයනුත්, මේකයි සබ්බ, එහෙම කියල නැවැත්තුවේ නැහැ බුදුරජාණන් වහන්සේ. ඊළඟට මහා පුදුම විදියේ අභියෝගයක් කළා 'යො භික්ඛවෙ එවං වදෙය්‍ය, මහණෙනි යමෙක් මෙන්න මෙහෙම කියනවා නම් 'අහමෙතං සබ්බං පච්චක්ඛාය අඤ්ඤං

සබ්බං පඤ්ඤාපෙස්සාමි.'මම ඔය කියන සබ්බය අත හැරලා ප්‍රතික්ෂේප කරලා වෙන සබ්බයක් පෙන්නුම් කරනවා කියලා කිව්වොත් මහණෙනි, ඒක කටමැත දෙඩිල්ලක් පමණයි. නිකන්ම 'හබ්බයක්' පමණයි. ඒක ප්‍රශ්න කළහම ඒ තැනැත්තාට කට උත්තරත් නැහැ. මොකද ඒ තැනැත්තාට ඒක ගැන අවබෝධයක් නැති නිසා. එයින් තහවුරු කරනවා බුදුරජාණන් වහන්සේ 'සබ්බ' කියන එක. ඉතින් මේ පරිසරය තුළ ඊළඟට මේ වගේම පුදුමාකාර දේශනාවක් තියනවා ඒත් සළායතන සංයුත්තයේම. සමිද්ධි කියන ස්වාමීන් වහන්සේ බුදුරජාණන් වහන්සේ ළඟට ඇවිල්ලා ප්‍රශ්නයක් අහනවා **'ලොකො ලොකොති භන්තෙ වුච්චති කිත්තාවතා නුඛො භන්තෙ ලොකො වා අස්ස ලොකපඤ්ඤත්ති වාති'**[3] 'ස්වාමීනි ලෝකය ලෝකය කියල කියනවා. කොතෙකින්ද ලෝකයක් හෝ ලෝක ප්‍රඥප්තියක්, ලෝකය කියල පැනවීමක්, දක්වන්න පුළුවන් වෙන්නේ?

එතකොට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා **'යත්ථ ඛො සමිද්ධි අත්ථි චක්ඛු, අත්ථි රූපා, අත්ථි චක්ඛුවිඤ්ඤාණං, අත්ථි චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා අත්ථි තත්ථ ලොකො වා ලොකපඤ්ඤත්ති වා'** එක ඉන්ද්‍රියක් ආයතනයක් ගැන කිව්වහම අනිත් හරිය මේ පින්වතුන් සලකාගන්න. හයම තිස්සෙම කියන්න ඕන නැහැනේ. ඇස ගැන කිව්වෙ මෙහෙමයි. සමිද්ධි යම් තැනක ඇසක් ඇද්ද, රූප ඇද්ද, චක්ඛු විඤ්ඤාණයක් ඇද්ද, චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන් ඇද්ද, එතන ලෝකයක් හෝ ලෝක ප්‍රඥප්තියක් ඇත. ඒ විදියට හය ගැනම කියලා අවසාන කරන්නේ මෙහෙමයි. යම් තැනක මනසක් ඇද්ද ධර්මයන් ඇද්ද, මනෝ විඤ්ඤාණයක් ඇද්ද, මනො විඤ්ඤාණයෙන් දත යුතු දේවල් ඇද්ද, එතන ලෝකයක් හෝ ලෝක ප්‍රඥප්තියක් ඇත. ඊළඟට ඒකෙ අනිත් පැත්තක් තියනවා. සමිද්ධි යම් තැනක ඇසක් නැද්ද, රූපයක් නැද්ද, චක්ඛු විඤ්ඤාණයක් නැද්ද, චක්ඛු විඤ්ඤාණයෙන් දත යුතු දේවල්ද නැද්ද, එතන ලෝකයක්වත් ලෝක ප්‍රඥප්තියක් වත් නැත. **එයින් පෙන්නුම් කරනවා මේ සළායතනය නැති වෙන අවස්ථාවකුත් තියන බව.**

අපි ඊළඟට මාරු වෙමු මීට කලිනුත් අපි නොයෙකුත් අවස්ථාවල

ප්‍රකාශ කළ සූත්‍ර පිටකයේ දීඝ නිකායේ පළවෙනි සූත්‍රය. ඉතාම ශ්‍රේෂ්ඨයි අපි කියල තියෙනවා. අර හැටදෙකක් දෘෂ්ටි ප්‍රතික්ෂේප කරන බඹදැල- බ්‍රහ්මජාල සූත්‍රය. ඒ සූත්‍රය අවසාන කරන්න බුදුරජාණන් වහන්සේ මෙහෙම ප්‍රකාශ කළා. ඔක්කොම සම්පිණ්ඩනය කරලා පෙන්වලා යම් තාක් දෘෂ්ටි ලෝකයේ තියනවා නම්, ඇතිවුණා නම්, ඉදිරියට ඇති වෙනවා නම්, ඒ හැම එකක්ම මේ හැටදෙකට අයිති වෙනවාය කියල බුදුරජාණන් වහන්සේ මෙහෙම ප්‍රකාශ කරනවා. මහණෙනි, ඔය කියාපු ශ්‍රමණ බ්‍රාහ්මණයින් යම් මතවාද ඉදිරිපත් කරනවා නම් ඔය හැටදෙකට අයිති, ඒ හැම කෙනෙක්ම ඔන්න ඊළඟට පාලි වචනත් කියන්න වෙනවා '**සබ්බෙ තෙ ඡහි ඵස්සායතනෙහි ඵුස්ස ඵුස්ස පටිසංවෙදෙන්ති**'[4] ස්පර්ශ ආයතනයන්ගෙන් ස්පර්ශ කරලා ලැබෙන වින්දනයක් තුළිනුයි ඒ දෘෂ්ටි සියල්ල ඉදිරිපත් කරන්නේ. එහෙම ඒ ස්පර්ශ ආයතනයන් ආශ්‍රයෙන් එන වේදනාව තුළින් මේ දෘෂ්ටි ඉදිරිපත් කිරීම නිසා සිදු වෙන දේ ඊළඟට කියනවා. ඒ අයට 'වෙදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවො, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරා මරණ සෝක පරිදෙව' ඒ ඔක්කොම ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඒ ස්පර්ශ ආයතන තුළින් උපදවාගත්තු දෘෂ්ටි නිසා ඒ අය වේදනාව තුළින් තණ්හාවට යනවා, තණ්හාවෙන් උපාදානයට යනවා, උපාදානය තුළින් භවය. ඔන්න සංසාරෙන් මිදෙන්නෙ නැහැ.

ඔන්න ඊළඟට කියනවා නියම භික්ෂුව ගැන. හිතාගන්න පුළුවන්. '**වෙදගූ' කියන වචනය දත යුතු සියල්ල දැනගත්තාය කියල අරගොල්ලො හිතුවෙ දෘෂ්ටි තුළින්නෙ.** නමුත් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ යම් අවස්ථාවක භික්ෂුවක් අර කලින් කියාපු ආකාරයට ඡන්නං ඵස්සායතනානං සමුදයං ච අත්ථගමං ච අස්සාදං ච ආදීනවං ච නිස්සරණං ච යථාභූතං පජානාති, අයං ඉමෙහි සබ්බෙහෙව උත්තරීතරං පජානාති' යම් කලෙක මගේ ශාසනයේ **යම් භික්ෂුවක් සළායතනයන් පිළිබඳ හටගැනීම අස්තයට යාම ආස්වාද පක්ෂය ආදීනව පක්ෂය නිස්සරණ පක්ෂය කියන ඒ පහම හරියාකාර ප්‍රඥාවෙන් තේරුම්ගත්ත නම් ඒ භික්ෂුව ඔය කියාපු දෘෂ්ටිවාදීන් හැම කෙනාටම වඩා උත්තරීතර ප්‍රඥාවෙන් යුක්ත තැනැත්තායි.** අන්න වෙදගූ කියන එක තේරුම් කළ

ආකාරය.

ඊළඟට තව තවත් සළායතන පිළිබඳ කතන්තරය යනවා. ඔන්න ඊළඟට කියනවා ඒත් අර කියාපු 'සබ්බ' සූත්‍රය වගේ සූත්‍රයක්. එතෙන්දී බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලාට හිටි ගමන්ම කියනවා.[5] **'ද්වයං වො භික්ඛවෙ දෙසිස්සාමි'** මහණෙනි, මම නුඹලාට **'දෙකක්'** දේශනා කරනවා. **කුමක්ද දෙක? චක්ඛුඤ්චෙව රූපා ච සොතඤ්චෙව සද්දා ච ඝානඤ්චෙව ගන්ධා ච ජිව්හාචෙව රසාච කායො චෙව ඵොට්ඨබ්බා ච, මනොචෙව ධම්මා ච** ආදී වශයෙන් එක එක ආධ්‍යාත්මික ආයතන හයත් බාහිර ආයතන හයත්. ඇසත් රූපයත් කනත් ශබ්දයත්, නැහැයත් ගඳ සුවඳත් දිවත් රසයත්, කයත් ස්පර්ශයත් මනසත් ධම්මත්.

එතෙන්දිත් බුදුරජාණන් වහන්සේ අර වගේම අභියෝගයක් ඉදිරිපත් කරනවා. 'මේකයි දෙක' යම් කිසි කෙනෙක් කිව්වොත් මේ දෙක හැර වෙනත් දෙකක් තියනවයි කියල ඒක හිස් ප්‍රලාපයක්, මැත දෙඩවිල්ලක් පමණයි. එයාට ඒක ඔප්පු කරන්න බැහැ. ඔන්න එතකොට ද්වයං සූත්‍රයෙනුත් ඒක තහවුරු වෙනවා. ඊළඟට මේ සළායතනය පිළිබඳ සලකල බලනකොට දැන් මෙතන කියවුනා **සළායතන නිරෝධයක් ගැන.** අපේ දේශනාවලදී අපි කොච්චරවත් පෙන්නුම් කරල තියනවා මේ **'නිවන' කියල කියන එක මෙලොවම සළායතනයන්ගෙන් විමුක්ත වීම බව. ඒක තමයි නිස්සරණය කියන්නේ. සළායතන නිරෝධය මෙලොවම ප්‍රත්‍යක්ෂ කරගත හැකි දෙයක්. ඒ ප්‍රත්‍යක්ෂය ඇත්ත වශයෙන්ම අරහත් ඵල සමාපත්තිය තුළයි ලබන්නේ. ඒ සමාපත්තිය තමයි ඇත්ත වශයෙන්ම නිවන කියල කියන්නේ.**

ඒක පිළිබඳව ඒකට අදාළව වටිනා සූත්‍රයක් තියනවා. එක් අවස්ථාවක මහා කොට්ඨිත ස්වාමීන් වහන්සේ සාරිපුත්ත ස්වාමීන් වහන්සේ හමු වන්න ආවා හැන්දෑවේ භාවනා කරලා ඉවර වෙලා. ඇවිල්ලා අහනවා ගැඹුරු විදියේ ප්‍රශ්නයක්.[6] ඇවැත්නි සාරිපුත්ත, **ඡන්නං ඵස්සායතනානං අසෙස විරාග නිරොධා අත්ථඤ්ඤං කිඤ්චි,** ''ස්පර්ශ ආයතන හය නිරවශේෂ වශයෙන් නිරෝධ වුණාට පස්සේ අන්

**කිසිවක් තිබේද?** සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ඒකට දක්වන ප්‍රතිචාරය මොකක්ද 'මාහෙවං ආවුසො' එහෙම අහන්න එපා, ප්‍රශ්නයම අවලංගු කරනවා. එතකොට මහා කොට්ඨිත ස්වාමීන් වහන්සේ අහනවා අර විදියටම අපි සිංහලෙන් කිව්වොත් මේ සළායතන සම්පූර්ණයෙන්ම නිරුද්ධ කළාට පස්සෙ **එහෙම නම් කිසිවක්ම නැද්ද?** ඒකටත් කියනවා එහෙම ප්‍රශ්නයක් අහන්න එපා.

ඊළඟට අහනවා මේ දෙකම එකතු කරලා එහෙම නම් නියම තත්ත්වය සළායතනය සම්පූර්ණයෙන්ම නිරෝධ කළාට පස්සෙ **යමක් ඇත සහ නැත කියන දෙකමද?** 'එහෙම කියන්න එපා' කියනවා. 'මාහෙවං ආවුසො' ඊළඟට හතර වෙනුව අහනවා එහෙම නම් තත්ත්වය සළායතන නිරෝධයෙන් පස්සේ කිසිවක් **ඇතිත් නැත නැතිත් නැත කියන එකද?** 'මාහෙවං අවුසො' එහෙමත් අහන්න එපා. එතකොට මහා කොට්ඨිත ස්වාමීන් වහන්සේ අහනවා, ''කොහොමද ආයුෂ්මතුන් වහන්ස, මම ඔය කියන දේ තේරුම්ගන්නේ?'' ඔන්න සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරනවා.

යම් කෙනෙක් කිව්වොත් ස්පර්ශ ආයතන හයේ සම්පූර්ණ නිරෝධයෙන් පස්සේ කිසිවක් ඇතෙයි කියලා එයින් කරන්නේ - එතන අමුතු වචනයක් ප්‍රකාශ කරනවා - '**අප්පපඤ්චං පපඤ්චෙති**'. පපඤ්ච කියන වචනය මේ පින්වතුන්ට කලින් තේරුම්කරල ඇති. 'අප්පපඤ්චං පපඤ්චෙති' කියල කියන්නේ කොටින්ම **භාෂා ව්‍යවහාරය එකතු කර ගන්න සුදුසු නැති තැනක ඒක යොදනවයි කියන එක.** ගැඹුරින් කිව්වොත් පපඤ්ච, තර්ක ආදිය නොකළ යුතු තැන පපඤ්ච කිරීමක් වෙනවා. සළායතනය නිරුද්ධ වුණාට පස්සේ යම් කිසිවක් තියනවද කියන ප්‍රශ්නයම වැරදියි. ඒ වගේම අනික් ප්‍රශ්න ගැනත් කියනවා, මේ හතරකොන් ප්‍රශ්න ගැන මේ පින්වතුන්ට අපි කොතෙකුත් කියල තියනවා ඔය උභතෝකෝටික චතුෂ්කෝටික ප්‍රශ්න කියන දෙකොන් සතරකොන් ප්‍රශ්න ඕවා ඔක්කොම තර්කකාරයන්ගේ ප්‍රපඤ්ච.

ඒ නිසා තමයි සාරිපුත්ත හාමුදුරුවෝ ඔක්කොම අවලංගු කළේ. අර හතර ගැනම කියනවා 'අප්පපඤ්චං පපඤ්චෙති'. එහෙම කියන

එක්කෙනා ප්‍රපඤ්ච නොකළ යුතු දෙයක් ගැන ප්‍රපඤ්ච කරනවා. එහෙම ප්‍රකාශ කරලා අවසාන වශයෙන් කියන්නේ **'යාවතා ආවුසො ඡන්නං ඵස්සායතනානං ගති තාවතා පපඤ්චස්ස ගති. යාවතා පපඤ්චස්ස ගති තාවතා ඡන්නං ඵස්සායතනානං ගති'** ඒකෙ තේරුම ඇවැත්නි යම් තාක් දුරට මේ සළායතනය විහිදෙයිද, ඒ තාක් දුරටම ප්‍රපඤ්චය විහිදෙනවා. යම් තාක් දුරට ප්‍රපඤ්චය විහිදෙනවා නම් ඒ තාක් දුරට සළායතනය විහිදෙනවා. ඊළඟට කියනවා 'ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙස විරාග නිරොධා පපඤ්ච නිරොධො පපඤ්ච වූපසමො'. ඇවැත්නි සළායතන හයම නිරුද්ධ වුනාට පස්සෙ ප්‍රපඤ්ච සංසිඳෙනවා, ප්‍රපඤ්ච නිරෝධ වෙනවා. ප්‍රපඤ්ච නිරෝධය කියන වචනය නිවනටම නමක්. ප්‍රපඤ්ච කරන්න ඉඩක් නැහැ. එතන ආයතන හයම නිරුද්ධ නිසා, ගැඹුරු නමුත් ඒක ඉතාම වටිනාම සූත්‍රයක්. තවත් මේකට එකතු කරනවා නම් අපි මීට කලින් සවිස්තරව කියූ සූත්‍රයක් කෙටියෙන් දක්වනවා නම්, බුදුරජාණන් වහන්සේ යම් කිසි දේශනාවක අග හරියේදී සංඝයා වහන්සේලාට මේ විදියට ප්‍රකාශ කරනවා. **'තස්මාතිහ භික්ඛවෙ සෙ ආයතනෙ වෙදිතබ්බෙ යත්ථ චක්ඛුඤ්ච නිරුජ්ඣති, රූපසඤ්ඤා ච විරජ්ජති සෙ ආයතනෙ වෙදිතබ්බෙ, යත්ථ සොතඤ්ච නිරුජ්ඣති සද්ද සඤ්ඤා ච විරජ්ජති'**[7] ඔය විදියටයි කියවෙන්නේ. මුල් එක කිව්වහම අනික්වා තේරුම් ගන්න බලන්න.

මහණෙනි, ඒ ආයතනය තේරුම්ගත යුතුයි. කොයි විදියේ ආයතනයක්ද, අමුතුම ආයතනයක්, ඒ කියාපු ආයතනයේ ඇස නිරුද්ධයි. රූපය මැකිල යනවා. 'විරජ්ජති'. කන නිරුද්ධයි, ශබ්දත් මැකිල යනවා. නැහැය නිරුද්ධයි. ගඳ සුවඳත් මැකිල යනවා. ඒ විදියට කියාගෙන ගිහින් අන්තිමට කියන්නේ **'මනො ච නිරුජ්ඣති ධම්ම සඤ්ඤා ච විරජ්ජති'** මනසත් නිරුද්ධ වෙනවා ධර්‍මයනුත් මැකිල යනවා. ඔහොම ප්‍රකාශ කරලා අන්තිමට තහවුරු කරන්නේ 'සෙ ආයතනෙ වෙදිතබ්බෙති සෙ ආයතනෙ වෙදිතබ්බ' කියල. ඒ ආයතනය දත යුතුයි. ඒ ආයතනය දත යුතුයි. එහෙම ප්‍රකාශ කරලා බුදුරජාණන් වහන්සේ නැගිටලා විහාරයට වැඩියා. තේරුම් කළේ නැහැ. සංඝයා වහන්සේලා කල්පනා කළා අපට ප්‍රහේලිකා විදියේ දේශනාවක් බුදුරජාණන්

වහන්සේ දේශනා කළේ. අපට අර්ථය දැනගන්න ලැබුණෙත් නැහැ. භාග්‍යවතුන් වහන්සේ වැඩියා. අපි මොකද කරන්නේ? කියලා හිතලා ආනන්ද හාමුදුරුවෝ මේ විදියේ දේවල්වලට බුදුරජාණන් වහන්සේත් ප්‍රශංසා කළ කෙනෙක්. යන්න ඕන ආනන්ද සවාමීන් වහන්සේ ළඟට කියලා උන්වහන්සේ ළඟට ගිහිල්ලා අර්ථකථනය ඉල්ලුවහම උන්වහන්සේ ටිකක් අදිමදි කරල කිව්වා. මට පේන හැටියට මම අටුවාවක් දෙන්නම් කියලා. ලොකු අටුවාවක් නොවෙයි උන්වහන්සේ කළේ. මෙන්න මෙහෙමයි කියන්නේ '**සළායතන නිරොධං බො ආවුසො භගවතා සන්ධාය භාසිතං**' සළායතන නිරෝධයයි එතනින් පෙන්නුම් කරන්නේ. සළායතන නිරෝධය කියන්නේ නිවන බව අපි විස්තර කරල තියනවා. **එතෙන්දි බුදුරජාණන් වහන්සේ සළායතන නිරෝධය හැඳින්වූයේ අමුතුම ආයතනයක් හැටියට.** ඔතන උගතුන්ට බොහොම ගැටලු තැනක්.

ඔය ආකාරයට **සළායතන නිරෝධය තමයි ලෝකයෙන් එතර වීම.** ඒකයි අර ඔක්කොම දැනුම් පරාදයි කියන්නේ. අන්න ඒ විදියේ තත්ත්වයක්. තව දුරටත් මේ පිළිබඳව සූත්‍ර ඉදිරියට හමු වෙනවා. එක් අවස්ථාවක ඒත් මහා කොට්ඨිත සවාමීන් වහන්සේ සාරිපුත්ත සවාමීන් වහන්සේ ළඟට ඇවිල්ලා - ඇත්ත වශයෙන් උන්වහන්සේලා දෙනමම මේ ශාසනයේ ඇත්තු වගෙයි. මහා ප්‍රඥා ඇති අය. මේ විවරණ උන්වහන්සේලා ඉදිරිපත් කරන්නේ අප සඳහා කියලා හිතාගන්න ඕන. මහා කොට්ඨිත සවාමීන් වහන්සේ ඇවිල්ලා සාරිපුත්ත සවාමීන් වහන්සේගෙන් අහනවා.[8] සංයෝජන කියල කියන්නේ බන්ධනය, 'මේ ඇස රූපයන්ට බන්ධනයක්ද, එහෙම නැත්නම් රූප ඇසට බන්ධනයක්ද, කන ශබ්දයන්ට බන්ධනයක්ද, එහෙම නැත්නම් ශබ්ද කනට බන්ධනයක්ද, ගඳ සුවඳ නැහැයට බන්ධනයක්ද, එහෙම නැත්නම් නැහැය ගඳ සුවඳට බන්ධනයක්ද, ඔන්න ඔය විදියට හිතාගන්න.

අවසානයේ කියනවා මනසට ධර්මය බන්ධනයක්ද, එහෙම නැත්නම් ධර්මය මනසට බන්ධනයක්ද? එතෙන්දි සාරිපුත්ත සවාමීන් වහන්සේ කියනවා ''නැහැ ඇවැත්නි, ඇසට රූප බන්ධනයක් නොවේ. රූපවලට ඇස බන්ධනයක් නොවේ. කන ශබ්දවලට බන්ධනයක් නොවේ. ශබ්ද

කනට බන්ධනයක් නොවේ. **නමුත් ඒ දෙක නිසා යම් ඡන්දරාගයක් උපදිනවා නම් ඒකයි බන්ධනය.**''

ඊළඟට ඒකත් පෙන්නුම් කරන්න සාරිපුත්ත ස්වාමීන් වහන්සේ පොඩි උපමාවක් ප්‍රකාශ කරනවා. යම් සේ ඇවැත්නි, කළු ගොනෙකුයි, සුදු ගොනෙකුයි එකම දම් වැලකින් හරි, යොතකින් හරි, දෙන්න ඇඳලා තියනවා. ඒ ඇඳල තියන අවස්ථාවේ යම් කෙනෙක් කිව්වොත්, මේ කළු ගොනාට සුදු ගොනා බන්ධනයක්ය එහෙම නැත්නම් සුදු ගොනාට කළු ගොනා බන්ධනයක්ය එහෙම කීම හරිද? නැහැ ඇවැත්නි කියනවා. ඒක නොවේ බන්ධනය මේ මැදින් තියන යොතයි. යොතයි. ඒ බැම්ම අන්න ඒ වගේ ඇවැත්නි, ඇහැට රූප බන්ධනයක් නොවේ. රූපවලට ඇස බන්ධනයක් නොවේ. ඒ දෙක නිසා හටගන්නා **ඡන්දරාගයයි බන්ධනය, ඇල්මයි බන්ධනය.**

තවත් ඒ වගේ උපමා කථාවක් කියනවා නම් - මේ පින්වතුන් කැමති නිසා උපමා කථාවලට - ඒත් බුදුරජාණන් වහන්සේ එක් අවස්ථාවක අපට කියන්න වගේ හොඳ උපමාවක් සංඝයා වහන්සේලාට කිව්වා,[9] මහණෙනි, එක් අවස්ථාවක ඉබ්බෙක් හැන්දෑ යාමයේ ගඟෙන් එගොඩට ඇවිල්ලා ආහාර සොයමින් යනවා. ඒ වෙලාවේම හිවලෙකුත් ආහාර සොයමින් ඇවිල්ලා ගං තෙර ඇවිදිනවා. ඉබ්බා දැක්කා ඈතදීම හිවලා එනවා. දැකලා මොකද කළේ. දන්නවනේ ඉබ්බගෙ හැටි. කකුල් හතරත් ඔළුවත් කටුව ඇතුළට ගත්තා. ඇතුළට අරගෙන හාංකවිසියක් දන්නේ නැතිව වගේ ඔහේ ඉන්නවා සද්ද නැතිව. හිවලත් දැක්කා ඈතදීම ඉබ්බා. හිවලා ආව ළඟට, ඇවිල්ලා හිටගෙන ඉන්නවා. යම් වේලාවක මේ ඉබ්බා මේ අංග පහෙන් එකක් හරි එළියට දැම්මොත් මම ඇදලා කඩලා කනවා. නමුත් ඉබ්බා එකක්වත් එළියට දැම්මෙ නැහැ. අන්තිමට හිවලා බලාගෙන ඉඳලා, ඉඳලා හරියන්නේ නැහැ වැඩේ කියලා යන්න ගියා.

ඊළඟට උපමේය කියනවා. එසේම මහණෙනි, හිතාගන්න මාරයා නුඹලා ළඟ නිතරම බලාගෙන ඉන්නවා. ඇහැ තුළින් කඩා වදින්දෝ, කන තුළින් කඩා වදින්දෝ, ඔය ආදී වශයෙන් මාරයා බලාගෙන

ඉන්නවා අර හිවලා වගේ. ඒ නිසා ඒකෙන් ආරක්ෂා වෙන හැටි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. බොහෝ තැන්වල දක්වන අර ඉන්ද්‍රිය සංවරය පිළිබඳ කථාවෙන්, නිතර සඳහන් වෙන පාඨයක් 'චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති, නානුබ්‍යඤ්ජනග්ගාහී' ආදී වශයෙන් ඉන්ද්‍රිය සංවරය පිළිබඳව මහණෙනි, නුඹලා ඇසින් රූපයක් දැකලා, ඒ පිළිබඳව නිමිති හා අනුව්‍යඤ්ජන ඒ වචන දෙකත් කෙටියෙන් කියනව නම්, ඔන්න අපි උපමාවක් කියනවා, ලස්සන රූපයක් දැක්කා. ඒ ලස්සන රූපයට හිත ගියාට පස්සේ ඒ ලස්සන කොහොමද කියල හිතන්න අපි තව ඕවට එකතු කරනවා, ව්‍යඤ්ජන දානවා. අන්න **අනුව්‍යඤ්ජන** කියලා හිතාගන්න. ඒ විදියට අපි රූපයක් දැකලා නිමිති, අනුව්‍යඤ්ජන ගත්තොත්, ඒ ගැනීම තුළින් වෙන්නේ මොකක්ද කියන එකයි බුදුරජාණන් වහන්සේ මෙතන ප්‍රකාශ කරන්නේ. ඒක තුළින් ආශ්‍රව ධර්ම මතු වෙලා පරිහානි තත්ත්වයකට යනවා. නමුත් බුදුරජාණන් වහන්සේ මෙතෙන්දි ප්‍රකාශ කරන්නේ, මහණෙනි, නුඹලා ඉන්ද්‍රිය දොරටු හයම වහගත්තොත් මාරයා බලන් ඉඳලා යයි. වැඩේ හරියන්නෙ නැහැ කියලා. ඒ ඉන්ද්‍රිය සංවරය තුළින් සළායතනයෙන් වෙන්න පුළුවන් අකුසල්, හැදෙන්න පුළුවන් අකුසල්, නැති වෙනව අර ඉබ්බා කටුව ඇතුළට වදින්න වගේ.

ඊළඟට ඒ උපමාව ලස්සනට ගාථාවකින් බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කරනවා.

**කුම්මොව අඞ්ගානි සකෙ කපාලෙ**
**සමොදහං භික්ඛු මනොවිතක්කෙ**
**අනිස්සිතො අඤ්ඤමහෙඨයානො**
**පරිනිබ්බුතො න උපවදෙය්‍ය කඤ්චි**

හරියට ඉබ්බෙක් තමන්ගේ කටුව ඇතුළට අඟ පසඟ දාගන්නවා වගේ එසේම භික්ෂුවක් හිතේ ඇති වන මනෝ විතර්ක - මනෝ විතක්ක අර පඤ්ච ඉන්ද්‍රියයන් ආශ්‍රයෙන්නෙ එන්නෙ. ඇසින් දැක්ක දේවල් ඔස්සෙ යනවා, කනින් අහන දේවල් ඔස්සේ ආදී වශයෙන්. මනෝ විතර්ක 'සමෝදහං' කියන්නේ ඒක ඇතුළට දාගන්නවා. පිටට යන්න දෙන්න නොදී. එහෙම කළොත් 'අනිස්සිතො අඤ්ඤමහෙඨයානො'

මොහොකටවත් හේත්තු වෙන්නෙත් නැහැ. 'න උපවදෙය්‍ය' කාටවත් දොස් කියන්නෙත් නැහැ. කාටවත් හිරිහැර කරන්නෙත් නැහැ. **'පරිනිබ්බුතො' පිරිනිවෙනවා.**

ඒ ඉන්ද්‍රිය සංවරය ආශ්‍රයෙන් සළායතනය පිළිබඳව නිස්සරණය කියල කියන නිරෝධය දක්වා යන මාර්ගය එතනදී ප්‍රකාශ කළා. මේ සළායතන ගැන කියන කොට ඉබේටම ස්පර්ශ කථාවත් එනවා. ස්පර්ශ ආයතන ගැන මේ පින්වතුන්ට පටිච්ච සමුප්පාදය ගැන කිව්ව නිසා මෙන්න මේ සූත්‍රය ඉතාම වැදගත් වෙන්න පුළුවන්. ටිකක් ගැඹුරුයි. ස්පර්ශ ආයතන ගැන සඳහන් වෙන අවස්ථාවක මොලියඵග්ගුණ ස්වාමීන් වහන්සේ බුදුරජාණන් වහන්සේගෙන් ප්‍රශ්නයක් අහනවා.[10] **කො නුඛො භන්තෙ ඵුසති'** කවුද ස්වාමීනි ස්පර්ශ කරන්නේ? ස්පර්ශ කරන කෙනෙක් ඉන්නවා කියල හිතන නිසා ආත්ම සඥාව වෙන්න ඇති ඒ භික්ෂුව තුළ තියෙන්නෙ. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා, ''මම කියන්නේ නැහැ කවුරුවත් කෙනෙක් ස්පර්ශ කරනවා කියලා. මම කිව්ව නම් කෙනෙක් ස්පර්ශ කරනවා කියලා, එහෙනම් ඔය ප්‍රශ්නෙ ගැලපෙනවා. නමුත් මම එහෙම කියන්නේ නැහැ. එහෙම නොකියන මගෙන් අහන්න ඕන ප්‍රශ්නය මේකයි.'' ඔන්න බුදුරජාණන් වහන්සේ ප්‍රශ්නය හරිගස්සලා දෙනවා මොලියඵග්ගුණ භික්ෂුවට අහන්න ඕන. **'කිම්පච්චයා නු ඛො භන්තෙ ඵස්සො'** නියම ප්‍රශ්නය විය යුත්තේ 'කුමක් ප්‍රත්‍යය කරගෙනද ස්පර්ශය? කෙනෙක් ස්පර්ශ කිරීමක් නොවේ. එහෙම නම් ප්‍රශ්නය, මම දෙන පිළිතුර මේකයි. බුදුරජාණන් වහන්සේ පුදුම විදියට පිළිතුරු දෙන්නේ. **'සළායතන පච්චයා ඵස්සො ඵස්ස පච්චයා වෙදනා'** වේදනා ගැන ඇහුවෙත් නැහැ. 'සළායතන ප්‍රත්‍යය කරගෙන ස්පර්ශය ඇති වෙනවා. ස්පර්ශය ප්‍රත්‍යය කරගෙන වේදනා ඇති වෙනවා කියල කිව්වා. මොලියඵග්ගුණ භික්ෂුව නොඇසූ කාරණාවක් වේදනාව. එතෙන්දි මොලියඵග්ගුණ භික්ෂුව වේදනාව අල්ලගත්තා.

'කො නු ඛො භන්තෙ වෙදෙති' කවුද ස්වාමීනි වේදනා විඳින්නේ. එතනදීත් බුදු රජාණන් වහන්සේ ප්‍රකාශ කළා. මම කියන්නෙ නැහැ කෙනෙක් විඳිනව කියල. එහෙම කියනව නම් තමයි ඔය ප්‍රශ්නය හරි. මම එහෙම නොකියනකොට ඔහොම ප්‍රශ්න අහන එක වැරදියි. අහන්න

ඕන මෙහෙමයි. 'කිං පච්චයා නුබො භනෙත වෙදනා' වේදනාවට ප්‍රත්‍යය කුමක්ද? එහෙම ප්‍රශ්නය ඇහැව්වොත් මම උත්තර දෙන්නෙ මෙහෙමයි. **'ඵස්ස පච්චයා වෙදනා වෙදනා පච්චයා තණ්හා'**. නොකියපු තණ්හාවකුත් එවේලේ එළියට ගත්තා. එහෙම ප්‍රකාශ කළහම ආයිත් මොලියඵග්ගුණ භික්ෂුව කියනවා - දැන් තණ්හාව ගැන කිව්වනෙ. 'කො බො භනෙත තසති' කවුද මේ තණ්හාව කරන්නේ. එතනදීත් පිළිතුරු දෙනවා. මම කියන්නෙ නැහැ කෙනෙක් තණ්හාව කරනවා කියලා. අහන්න ඕන ප්‍රශ්නය 'කිම්පච්චයා භනෙත තණ්හා' කියලා. එතනදීත් කියනවා. 'වෙදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං' ඔන්න ඔය කියන පිළිතුරු ශෛලිය තුළ මහ පුදුම දෙයක් ගැබ් වෙනවා. මේ පින්වතුන් තේරුම්ගන්න බලන්න. මම උපමාවක් දෙන්නම්. දැන් ඔය චිත්‍රකාරයො ඉන්නවනෙ. අපි හිතමු දම්වැලකින් පුරුකක් චිත්‍රයකට නගන්න කියනවා. එක පුරුකක් විතරක් ඇන්දොත් ඒක දම්වැලකට අයිතියි කියල හිතනවද? පුරුකක් බව තේරෙන්න එක පුරුකක් එක්කම වම් පැත්තෙනුත් දකුණු පැත්තෙනුත් අඩු ගණනේ පුරුක් භාගය බැගින්වත් දක්වන්න ඕනනෙ ඒක දම්වැලක පුරුකක් බව පෙන්නන්න. බුදුරජාණන් වහන්සේ දෙන පිළිතුරේ මොලියඵග්ගුණ භික්ෂුව නෑසූ කාරණයකුත් එකතු කළේ මොකද මේක දම්වැලක් බව පෙන්නන්න.

'සළායතන පච්චයා ඵස්සො' සළායතන ප්‍රත්‍යයෙන් ඵස්සයක් ඇති වෙනවා කියලා එතනින් නැවතුණේ නැහැ. 'ඵස්ස පච්චයා වෙදනා' ත් ගත්තා. අන්න හිතාගන්න එතනදී බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ මේ එක එකක්ම ප්‍රත්‍යය ධර්ම. එතකොට උත්තරයට වැඩියෙන් දෙයක් කිව්වෙ වේදනාව එකතු කරගෙන. එතකොට ඒක ඇල්លුවනෙ මොලියඵග්ගුණ ස්වාමීන් වහන්සේ. එයින් ගියා තණ්හාවට ඔහොම ඔහොම ගිහිල්ලා අන්තිමට උපාදානය දක්වා. කොහොම කොහොම හරි ඒකෙන් පෙන්නුම් කරනවා එදිනෙදා ව්‍යවහාරයේ අපි කොහොම කිව්වත් බුදුරජාණන් වහන්සේ පටිච්ච සමුප්පාදය ආශ්‍රයෙන් ගැඹුරු අර්ථය ප්‍රකාශ කරනවා. **කවුරුවත් ස්පර්ශ කරනව නොවෙයි. සළායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය. ස්පර්ශ ප්‍රත්‍යයෙන් වේදනාව. වේදනාව ප්‍රත්‍යයෙන් තණ්හාව.** ඔන්න ඔහොම යන්නේ. ඉතාම වටිනා සූත්‍රයක්

මේක.

ඉතින් තවත් කල්පනා කරල බලනවා නම්, තවත් අවසථාවක සංඝයා වහන්සේලා පිරිසක් ඇවිල්ලා බුදුරජාණන් වහන්සේට කියනවා උන්වහන්සේලාට වෙච්ච ප්‍රශ්නයක්.[11] මේ අන්‍ය තීර්ථක ශ්‍රමණ බ්‍රාහ්මණයින් අපෙන් අහනවා මොන අර්ථයක් වැඩක් සඳහාද ඔබ වහන්සේලා භාග්‍යවතුන් වහන්සේ ළඟ ශාසන බ්‍රහ්මචරියාව පුරන්නේ? මහණ වෙලා ඉන්නෙ මොකද? එතකොට සවාමීනි අපි කියනවා ''දුක පිරිසිඳ දැනගැනීම සඳහා මහණ වුණේ. - දුක හරියට තේරුම් ගන්න'' කියලා. මේ භික්ෂූන් වහන්සේලා බුදුරජාණන් වහන්සේගෙන් අහනවා අපි එහෙම පිළිතුරු දීම තුළින් භාග්‍යවතුන් වහන්සේ නොකියපු දෙයක් කියනවද, එහෙම නැත්නම් අපි දීපු පිළිතුරු හරිද? ඒක දැන ගන්නයි මේ අහන්නේ.

බුදුරජාණන් වහන්සේ වදාරනවා හරි, හරි, හරියටම හරි. මහණෙනි, ඒ දුන්න පිළිතුර හරි. හැබැයි **ඒ අය නුඹලාගෙන් ඇහුවොත් කුමක්ද ඒ නුඹලා පිරිසිඳ දැනගන්න යන දුක කියලා. අන්න එතකොට නුඹලා මෙහෙම කියන්න.** ඒ ටික අපි සිංහලට නැගුවොත්, **ඇසත් දුකක්, රූපත් දුකක්, චක්‍ඛු විඤ්ඤාණයත් දුකක්, චක්‍ඛු සම්ඵස්සයත් දුකක්, චක්‍ඛු සම්ඵස්සය නිසා ඇති වන සැප දුක් වේදනා ඔක්කොම දුකක්.** ඒ අනුව හිතාගන්න අනික් ඒවා. සාමාන්‍යයෙන් මේ පින්වතුන් දන්නවා. දුක ගැන හඳුන්වන්නේ චතුරාර්‍ය සත්‍යයේ පඤ්ච උපාදානසකන්ධයයි. මෙතෙන්දී පඤ්ච උපාදානසකන්ධය වෙනුවට සළායතන ආශ්‍රයෙන් පෙන්වන්නේ. දුක හැඳින්වූයේ සළායතනයේ දුක් සවභාවයයි එතන පෙන්නුම් කරන්නේ.

ඒවාගේ වටිනා සූත්‍ර රාශියක් තියනවා මේ සළායතනයේ තියන අනිත්‍යතාව පෙන්නුම් කරන්න. ඒත් ද්වයං කියන සූත්‍රයකින්. අර ද්වයං සූත්‍රයට පස්සෙයි එන්නෙ. දුතිය ද්වයං සූත්‍රය.[12]

එතෙන්දි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා '**ද්වයං භික්ඛවෙ පටිච්ච විඤ්ඤාණං සම්භොති**'. මහණෙනි, දෙකක් නිසා විඤ්ඤාණය ඇති වෙනවා. විඤ්ඤාණය නිකන්ම පහළ වෙනවා නොවේ. දෙකක්

නිසයි විඤ්ඤාණය ඇති වෙන්නේ. 'චක්ඛුඤ්ච පටිච්ච රූපෙච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං', ඇසත් රූපයත් නිසයි චක්ඛු විඤ්ඤාණය උපදින්නේ. ඒ වගේම කනත් ශබ්දත් නිසයි සොත විඤ්ඤාණය උපදින්නේ, ඒ හැම එකක්ම '**නිසා ඉපදීමක්**'. ඒකෙන් පෙන්නුම් කරන්නේ හැම තිස්සෙම දෙකක් නිසා ඇති වෙනවා කියලා. ඊළඟට ප්‍රකාශ කරනවා '**තිණ්ණං සඞ්ගති ඵස්සො**' ඒක ටිකක් ගැඹුරු කාරණයක්.

ඇසත් රූපයත් නිසා චක්ඛු විඤ්ඤාණය ඇති වෙනවා. යම් වේලාවක **ඇසත් රූපයත් නිසා චක්ඛු විඤ්ඤාණය ඇති වුණ බව දන්නෙ නැතිව, ඒක තේරුම්ගන්නෙ නැතිව මේක 'තුනක්' හැටියට ගත්තු හැටියේ ඒක ස්පර්ශයක් වෙනවා.** ඇසත් රූපයත් නිසා චක්ඛු විඤ්ඤාණය ඇති වෙනවා. **නමුත් එතෙන්දි තුනක් හැටියට ගත්තොත් ඒ තැනැත්තාට 'තිණ්ණං සඞ්ගති ඵස්සො' ස්පර්ශයක් ඇති වෙනවා.** එතෙන්දි ස්පර්ශය පිළිබඳ ඉතාම ගැඹුරු පැත්තක් තියෙන්නෙ. අපි සාමාන්‍යයෙන් කියන්නෙ කෙනෙක් ස්පර්ශ කළා කියලා. ඒ වෙනුවට මෙතන පෙන්නුම් කරන්නේ යථා තත්ත්වය නොදැනීම නිසා - ඇත්ත වශයෙන් 'නිකං විඤ්ඤාණයක්' නෑ කියල අපි බොහෝ අවස්ථාවල කිව්ව, නිකම් ගින්නක් නැතුව වගේ. විඤ්ඤාණයක් නම් එක්කො චක්ඛු විඤ්ඤාණය වෙන්න ඕන. සොත විඤ්ඤාණය වෙන්න ඕන. ඝාණ විඤ්ඤාණය වෙන්න ඕන. ජිව්හා විඤ්ඤාණය වෙන්න ඕන. කාය විඤ්ඤාණය, අවසාන වශයෙන් මනො විඤ්ඤාණය වෙන්න ඕන. **හැබැයි ඒ එකක්වත් 'ස්ටෝර්' කරල නැහැ. ඒවා හැදෙන්නේ දෙකක් එකතු උනාමයි. එතෙන්දි 'ද්වයං' කථාව තියෙන්නේ. ඕකමයි පටිච්ච සමුප්පාදයේ රහස.** නිකම් ගින්නක් නැතුව වගේ ගින්න යම් යම් ප්‍රත්‍ය ආශ්‍රයෙන් ඇති වෙනවද ඒකට ඒ නමම යෙදෙනවා.[13] කඩදාසි ගින්නක්ද, දර ගින්නක්ද, පිදුරු ගින්නක්ද, දහයියා ගින්නක්ද. ඒ වගේම ඇසත් රූපයත් නිසා ඇති වුණ විඤ්ඤාණය චක්ඛු විඤ්ඤාණයයි.

නමුත් ඒක නොදන්නාකම නිසා, අවිද්‍යාව නිසා, විඤ්ඤාණය ඒ දෙක නිසා ඇති වුණ බව නොතකා ඒ ඔක්කොම එකක් හැටියට ගත්තොත් එහෙම එතෙන්දි ස්පර්ශය. ඊට පස්සෙ ඉතින් අර මිරිඟුව ඔස්සෙ දුවනවා. ඇස මෙතනයි, රූප අතනයි, ඔය කථාවයි ඔය

ගැඹුරින් පෙන්නුම් කරන්නේ. ඔය සළායතන කථාවේ වටිනා අංශ රාශියක් පෙන්නුවා. අපි මුලදී කිව්වනේ ඔය සළායතනයන් පිළිබඳව සම්පූර්ණ පරිපූර්ණ දැනීම එන්න නම් මේවා හටගන්න ආකාරය දැනගන්න ඕන. අස්තයට යන ආකාරය දැනගන්න ඕන. මේවායේ ආස්වාද පක්ෂය දැන ගන්න ඕන. ආදීනව පක්ෂය දැනගන්න ඕන. ඒවා දැනගෙන නිස්සරණය කියන්නේ නික්මීම. ඒවාට අදාළවයි දැන් මේ හැම එකක්ම කියන්නේ. ඊළඟට සළායතන පිළිබඳව ඉතාමත්ම වටිනා දේශනාවක් තියනවා මැදුම් සඟියේ මහා සළායතනික සූත්‍රය[14] කියලා මහා ශ්‍රේෂ්ඨ දේශනාවක්. සළායතනය පිළිබඳව තියන ශ්‍රේෂ්ඨතම දේශනාව. ඒකෙදි බුදුරජාණන් වහන්සේ දක්වනවා සාමාන්‍ය පෘථග්ජන ලෝකයා සළායතනය දිහා බලන ආකාරයත්, ඒ නිසා ඒ අය ඇති කරගන්න ආස්වාදයත්, ඒ ආස්වාදය නිසා ඇතිවන ආදීනවයත්, එක පැත්තකින් පෙන්නුම් කරනවා. අනික් පැත්තෙන් සළායතනය පිළිබඳව යථාභූත වශයෙන් හරියාකාර අවබෝධයක් ලබන කෙනෙක් අර වගේ ආස්වාදයන්ගේ අස්ථිර බව තේරුම් අරගෙන ආදීනවය තේරුම් අරගෙන මේ සළායතනයන්ගෙන් මිදෙන ආකාරයත් පෙන්නුම් කරනවා. මෙන්න මෙහෙමයි පටන්ගන්නේ. '**චක්ඛුං භික්ඛවෙ, අජානං අපස්සං යථාභූතං, රූපෙ අජානං අපස්සං යථාභූතං, චක්ඛුවිඤ්ඤාණං අජානං අපස්සං යථාභූතං**' ඔය විදියට කියනවා.

අපි තේරුම කිව්වොත්, ඇස යථාභූත වශයෙන් නොදන්නාකමින්, නොදක්නාකමින් - ජානං පස්සං කියන්නේ දැනුමත්, දැකුමත් - ඇස ගැන හරි හැටි යථාභූත වශයෙන් ඇති තතු පරිදි නොදැනීමෙන්, රූපයන් පිළිබඳව ඇති තතු හරියට තේරුම් නොදැනීමෙන්, - ඇති තතු කියන කොට මතක් කරගන්න පින්වතුනි **අනිත්‍යතාව** - ඒ අනිත්‍යතාව නොදැනීමෙනුත්, ඒ දෙක නිසා ඇති වන චක්ඛු විඤ්ඤාණය යථාභූත වශයෙන් නොදැනීමෙනුත්, චක්ඛු විඤ්ඤාණය නිසා ඇතිවන චක්ඛු සම්ඵස්සය ඇසින් එන ස්පර්ශය යථාභූත පරිදි නොදැනීමෙනුත් ඒ ස්පර්ශය නිසා ඇති වන සැප හෝ දුක් හෝ නොදුක් නොසුව වේදනාව යථාභූත වශයෙන් නොදැනීමෙන් එබඳු පුද්ගලයා '**චක්ඛුස්මිං සාරජ්ජති**' ඇසෙහි ඇලෙනවා, රූපයෙහි ඇලෙනවා, චක්ඛුවිඤ්ඤාණයෙහි ඇලෙනවා, චක්ඛු සම්ඵස්සයෙහි ඇලෙනවා චක්ඛු සම්ඵස්සය නිසා ඇති වන සැප දුක්

නොදුක් නොසුව වේදනාවන්හි ඇලෙනවා.

ඒ විදියටම හිතාගන්න සළායතන පිළිබඳව. එතන දක්වනවා මනසත් ඇතුළත්ව. මනසත් යථාභූත වශයෙන් නොදැනීම නිසා මනසෙහි ඇලෙනවා, මනසට අරමුණු වන දේවල්වල ඇලෙනවා. මනෝ විඤ්ඤාණයෙහි ඇලෙනවා. මනෝ සම්ඵස්සයෙහි ඇලෙනවා. වේදනාවන්හි ඇලෙනවා. ඊළඟට ආදීනව පක්ෂය ගැන කියනවා. ඇලෙනවානේ ඇලුනහම කියනවා '**තස්ස සාරත්තස්ස සංයුත්තස්ස සම්මූළ්හස්ස අස්සාදානුපස්සිනො විහරතො ආයතිං පඤ්චුපාදානක්ඛන්ධා උපචයං ගච්ඡන්ති.**' ඒ පෘථග්ජන පුද්ගලයා ඒ නොදැනීම නිසා අර කියාපු ඇස රූප විඤ්ඤාණ ආදියෙහි සාරත්ත කියන්නේ තදින් ඇලුණා වූ ඒ නිසාම බැඳුණා වූ ඒ නිසාම මුළාවූ අස්සාදානුපස්සිනො එයින් ලැබෙන ආස්වාදයම බලමින් සිටින ඒ තැනැත්තාට මොකක්ද වෙන්නේ? ආයතිං පඤ්චුපාදානක්ඛන්ධා නැවතත් පඤ්ච උපාදානස්කන්ධයම වැඩෙනවා.

අර එන යන අනිත්‍ය දේවල් ග්‍රහණය කිරීම තුළින් අන්තිමට එකතු වෙනවා පඤ්ච උපාදානස්කන්ධයක්. ඊළඟට ආදීනවය දක්වනවා. **තස්ස කායිකාපි දරථා පවඩ්ඪන්ති. චෙතසිකාපි දරථා පවඩ්ඪන්ති. කායිකාපි සන්තාපා පවඩ්ඪන්ති. චෙතසිකාපි සන්තාපා පවඩ්ඪන්ති. කායිකාපි පරිළාහා පවඩ්ඪන්ති. චෙතසිකාපි පරිළාහා පවඩ්ඪන්ති. සො කායදුක්ඛම්පි චෙතොදුක්ඛම්පි පටිසංවෙදෙති.** එබඳු ඒ පුද්ගලයාට ඒකෙන් ලැබෙන ප්‍රතිඵලය, ආදීනව පක්ෂය, කුමක්ද? ඔහුගේ කායික පීඩාවෝ වැඩෙත්, චෛතසික පීඩාවෝ වැඩෙත්. කායික තැවිලි වැඩේ. චෛතසික තැවිලි වැඩේ. කායික දැවිලි වැඩේ. චෛතසික දැවිලි වැඩේ. ඒ නිසා ඔහු කායික දුකටත් චෛතසික දුකටත් පත් වේ. ඒ ප්‍රකාශය කරන්නේ ලෞකික පැත්ත ගැනයි. ඊළඟට අනික් පැත්ත කියනවා.

''චක්ඛුඤ්ච ඛො භික්ඛවෙ ජානං පස්සං යථාභූතං, රූපෙ ජානං පස්සං යථාභූතං, චක්ඛුවිඤ්ඤාණං ජානං පස්සං යථාභූතං, චක්ඛුසම්ඵස්සං ජානං පස්සං යථාභූතං'' ඒ විදියට ප්‍රකාශ කරනවා. ඒකෙ තේරුම යම්කිසි කෙනෙක් ඇස හරියාකාරව යථාභූත වශයෙන් දකිනවා නම් **දැන් මතක්**

'**කරගන්න යථාභූත වශයෙන් කියන්නේ අනිත්‍ය වශයෙන් දැකීම** රූපයත් අනිත්‍ය වශයෙන් යථාභූත වශයෙන් දන්නවා නම් දකිනවා නම්, ඒ වගේම ඇසත් රූපයනුත් නිසා ඇති වන චක්ඛු විඤ්ඤාණයත් අනිත්‍යයි කියල යථාභූත වශයෙන් දන්නවා නම් දකිනවා නම් ඒ විදියට ස්පර්ශයත් වේදනාවත් යථාභූත වශයෙන් දන්නවා නම් දකිනවා නම් එබඳු පුද්ගලයා, ඒ කියන්නේ මේ ශාසනයේ හික්මෙන භික්ෂුව, ඒ ආදීනව දැකීමෙන් වාසය කරන්නා වූ ඒ භික්ෂුව ගැන ඒ පරිවර්තනය ගැන මෙහෙමයි කියන්නේ.

**තස්ස පඤ්චුපාදානක්ඛන්ධා අපචයං ගච්ඡන්ති.** අනික් එක්කෙනාට පඤ්චුපාදානක්ඛන්ධ එකතු වෙනවා, ඒ හැම අත්දැකීමක් තුළින්ම සිතේ එකතු වෙනවා, මේකට අදාළ රූප තමයි මගේ රූප උපාදාන සකන්ධය. ඒකට අදාළ වේදනා ටික මගේ වේදනා ගොඩ කියලා එකතු කරනවා. ඕක තමයි සංසාරේ දිගට යන්නේ. **මේ භික්ෂුව එතන එතනම අනිත්‍යතාව දකිනවා. එතකොට මේවායේ ඉතුරුවක් නැහැ. ඒක නිසා 'අපචයං ගච්ඡන්ති'** කියන්නේ ඒවා ගෙවිල යනවා. එතකොට **උපචය අපචය** කියන වචන දෙකෙන් **සංසාරයත් නිබ්බානයත්** කියන දෙකම පෙන්නනවා. නිවන පැත්තට හැරුණු මනසෙහි **අපචය** පඤ්චුපාදානක්ඛන්ධය ගෙවී යන ශික්ෂණයයි මෙතනින් බුදුරජාණන් වහන්සේ දක්වන්නේ. ඊළඟට ඒකෙ ප්‍රතිඵලය බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා **තස්ස කායිකාපි දරථා පහීයන්ති. චෙතසිකාපි දරථා පහීයන්ති. කායිකාපි සන්තාපා පහීයන්ති, චෙතසිකාපි සන්තාපා පහීයන්ති, කායිකාපි පරිළාහා පහීයන්ති, චෙතසිකාපි පරිළාහා පහීයන්ති, සො කායසුඛම්පි චෙතොසුඛම්පි පටිසංවෙදෙති.**

මේ ප්‍රතිපදාවෙහි හික්මෙන භික්ෂුව අනිත්‍යතාව මුල් කරගෙන, **ඒ භික්ෂුවගේ කායික විඩාවෝ ප්‍රහීණ වෙත්, චෛතසික විඩාවෝ ප්‍රහීණ වෙත්, කායික තැවිලි ප්‍රහීණ වෙත්, චෛතසික තැවිලි ප්‍රහීණ වෙත්, කායික දැවිලි ප්‍රහීණ වෙත් චෛතසික දැවිලි ප්‍රහීණ වෙත්. ඒ භික්ෂුව කාය සුඛයත් චෛතසික සුඛයත් විඳී.** ඊළඟට ඒකේ තවත් ගැඹුරට යනවා බුදුරජාණන් වහන්සේ. මේ විදියට වාසය කරන භික්ෂුවක් තුළ මෙතෙන්දි පුදුම විදියට ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය වැඩෙන හැටි පෙන්නුම් කරනවා. සළායතනය ආශ්‍රයෙන් භාවනා කරන පින්වතුන්ට

මේ සූත්‍රය ඉතාම උපකාර වෙනවා.

මේ විදියට භික්ෂුවක් යෙදීම තුළින් වෙන දේ ඊළඟට ප්‍රකාශ කරනවා. **'යා තථාභූතස්ස දිට්ඨි සාස්ස හොති සම්මාදිට්ඨි'** මෙබඳු ඒ හික්මෙන භික්ෂුවගේ යම් දෘෂ්ටියක් තිබෙනවා නම් එය සම්මා දිට්ඨියයි. දැන් ඔය හඳුන්වන සම්මා දිට්ඨිය නොවෙයි. **එතන මාර්ග සම්මා දිට්ඨියයි ගැඹුරුම සම්මා දිට්ඨියයි.** එබඳු ඒ භික්ෂුවගේ යම් සංකල්ප තියනවා නම් ඒවා **සම්මා සංකල්පයයි.** එබඳු ඒ භික්ෂුව යම් ව්‍යායාමයක් යම් වීර්යයක් දරනවා නම් ඒක **සම්මා වායාමයයි.** එබඳු ඒ භික්ෂුව තුළ යම් සතියක් තිබෙනවා නම් එය **සම්මා සතියයි.** එබඳු ඒ භික්ෂුව යම් සමාධියක් ලබනවා නම් එය **සම්මා සමාධියයි.** දැන් බලන්න මේ පින්වතුන්ට තේරෙනවා ඇති ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් පහයි ඔතන කියවුණේ.

ඊළඟට බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා අනික් තුන නොකීවෙ මොකද කියල. **'පුබ්බෙව ඛො පනස්ස කායකම්මං වචී කම්මං ආජීවො සුපරිසුද්ධො හොති'** මේ ප්‍රතිපදාවේ යෙදෙන භික්ෂුවගේ කලින්ම- මේවා ඖළාරික වූ දේවල් ලෝකෝත්තර සිතේ මේවාට ඉඩක් නැහැනෙ. කථා කර කර, වැරදි වැඩ කර කර, ඉන්නෙ නැහැනේ - කලින්ම කාය කර්ම, වාක් කර්ම, ආජීවය ඒවා කලින්ම පිරිසිදු වෙලා ඉවරයි. ඒවායින් පාස්. මේ පහයි අර මාර්ග අවස්ථාවේ පෙනී සිටින්නේ. සම්මා දිට්ඨි, සම්මා සඞ්කප්ප, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි. ඊළඟට ඒකෙ තව ඈතට යනවා බුදුරජාණන් වහන්සේ. මේ විදියට ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩන භික්ෂුවක් තුළ **'තස්ස එවං ඉමං අරියං අට්ඨංගිකං මග්ගං භාවයතො චත්තාරොපි සතිපට්ඨානා භාවනා පාරිපූරිං ගච්ඡන්ති, චත්තාරොපි ඉද්ධිපාදා භාවනා පාරිපූරිං ගච්ඡන්ති. පඤ්චපි ඉන්ද්‍රියානි භාවනා පාරිපූරිං ගච්ඡන්ති, පඤ්චපි බලානි භාවනා පාරිපූරිං ගච්ඡන්ති සත්තපි බොජ්ඣඞ්ගා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.'**

'මේ වැඩීම තුළින් අන්න සත්තිස් බෝධිපාක්ෂික ධර්ම පිරෙන හැටි පෙන්නුම් කරනවා. මේ භික්ෂුව මෙහෙම හික්මෙන අවස්ථාවේදී ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩන ඒ භික්ෂුව තුළ ඉබේම සතර සතිපට්ඨානයත් වැඩුනා වෙනවා. භාවනාව තුළින් වැඩිලා පරිපූර්ණත්වයට පත් වෙනවා.

ඒ භික්ෂුව තුළ වෙන දේවල් මේ කියන්නේ සතර සම්‍යක්ප්‍රධානය සතර ආකාර වීර්යය ඉබේම මේ සළායතනය පිළිබඳව හික්මෙන මේ ප්‍රතිපදාව තුළින් ඉබේටම වාගේ සතර සතිපට්ඨානය, සතර සම්‍යක්ප්‍රධානය සම්පූර්ණ වෙනවා. සතර ඍද්ධිපාදත් සම්පූර්ණ වෙනවා. පඤ්චඉන්ද්‍රියයන් සම්පූර්ණ වෙනවා. පඤ්චබලත් සම්පූර්ණ වෙනවා. සත්තබොජ්ඣඞ්ගත් සම්පූර්ණ වෙනවා. මේ විදියට ඒ ලෝකෝත්තර අවස්ථාව ගැනයි මේ කියන්නේ.

ඒ සියල්ලම සම්පූර්ණ වුණ ඒ භික්ෂුව පිළිබඳව බුදුරජාණන් වහන්සේ මෙහෙම ප්‍රකාශ කරනවා. '**තස්සිමෙ දෙව ධම්මා යුගනද්ධා වත්තන්ති සමථො ච විපස්සනාච**' මෙබඳු භික්ෂුවක් තුළ ධර්ම දෙකක්. 'යුගනද්ධ කියන්නේ පින්වතුනි, එක වියගහේ බැන්ද ගොන්නු දෙන්නෙක් කරත්තය අදිනකොට එක සැරේට අඩිය තියල යන්න එපායැ. ඒ විදියට සමථ විපස්සනා දෙක ගැන භාවනා කරන මේ පින්වතුන් කොතෙකුත් අහල තියනවනෙ සමථයෙන් සමාධියත්, විපස්සනා කියන එකෙන් ත්‍රිලක්ෂණය පිළිබඳ ගැඹුරු දැනීමත්.

මෙතන ක්‍රම තුනක් තියනවා. ඉස්සෙල්ල සමථය වඩල ඊළඟට විපස්සනා වඩනවා. '**සමථපුබ්බංගම විපස්සනං**' එහෙම නැත්නම් කලින් විපස්සනා වඩලා සමථය වඩනවා. '**විපස්සනා පුබ්බංගමං සමථං**' නමුත් තවත් ක්‍රමයක් තියනවා. '**සමථං ච විපස්සනං ච යුගනද්ධං භාවෙති**' හරියට කරත්තයේ වියගහේ බැන්ද ගොන්නු දෙන්නෙක් වගේ එකට අද්දනවා. එබඳු භික්ෂුවගේ සමථයත් විපස්සනාවත් දෙකම යුගනද්ධ වශයෙන් වැඩෙනවා. ඔන්න ඊළඟට අවසාන ප්‍රතිඵලය ප්‍රකාශ කරනවා එබඳු භික්ෂුව '**සො යෙ ධම්මා අභිඤ්ඤා පරිඤ්ඤෙය්‍යා, තෙ ධම්මෙ අභිඤ්ඤා පරිජානාති, යෙ ධම්මා අභිඤ්ඤා පහාතබ්බා, තෙ ධම්මෙ අභිඤ්ඤා පජහති. යෙ ධම්මා අභිඤ්ඤා භාවෙතබ්බා, තෙ ධම්මෙ අභිඤ්ඤා භාවෙති. යෙ ධම්මා අභිඤ්ඤා සච්ඡිකාතබ්බා, තෙ ධම්මෙ අභිඤ්ඤා සච්ඡිකරොති**' එබඳු ඒ භික්ෂුවක් තුළ යම් ධර්මයන් තිබෙනවා නම් අභිඤ්ඤාවෙන් තේරුම්ගත යුතු, පිරිසිඳ දත යුතු, ඒ භික්ෂුව ඒ පිරිසිඳ දත යුතු දේ අභිඤ්ඤාවෙන් පිරිසිඳ දැනගන්නවා. (හිතාගන්න චතුරාර්‍ය සත්‍යයේ පළමුවන සත්‍යය වගේ) ඊළඟට යෙ ධම්මා අභිඤ්ඤා පහාතබ්බා,

අභිඤ්ඤාවෙන් ප්‍රහීණ කළයුතු ධර්ම මේ භික්ෂුව තුළ ප්‍රහීණ වෙනවා. යම් ධර්මයන් අභිඤ්ඤාවෙන් වැඩිය යුතු නම් ඒවා වැඩෙනවා. යම් ධර්මයන් අභිඤ්ඤාවෙන් සාක්‍ෂාත් කළ යුතුද ප්‍රත්‍යක්‍ෂ කළ යුතුද, ඒ ධර්ම ප්‍රත්‍යක්‍ෂ වෙනවා.

තව දුරටත් තේරුම් කරනවා බුදුරජාණන් වහන්සේ මොනවද ඒ **අභිඤ්ඤාවෙන් පිරිසිඳ දතයුතු ධර්ම පඤ්ච උපාදානසකන්ධයයි. ඊළඟට අභිඤ්ඤාවෙන් ප්‍රහාණය කළ යුතු අවිද්‍යාවත් භව තණ්හාවත් යන දෙකයි. අභිඤ්ඤාවෙන් වැඩිය යුතු ධර්ම සමථයත් විපස්සනාවත් යන දෙකයි. අභිඤ්ඤාවෙන් සාක්‍ෂාත් කළ යුතු, ප්‍රත්‍යක්‍ෂ කළ යුතු, ධර්ම විජ්ජාවිමුක්ති යන නමින් හඳුන්වන අරහත් ඵල ඥානයත් අරහත් ඵල විමුක්තියත්** එතකොට මෙයින් සම්පූර්ණයි. මහ පුදුම සූත්‍රයක්. ඇත්ත වශයෙන් නිවනට යන මාර්ග වශයෙන් බොහෝ දෙනා අතර ජනප්‍රිය ක්‍රම කීපයක් තියනවා.

නිවනට යන මාර්ග කීපයක් තියනවා කියන එක නිවැරදි නැහැ. තම තමන්ගේ කමටහන ආශ්‍රිතව ඇතැම් කෙනෙක් පඤ්ච උපාදානසකන්ධයේ අනිත්‍යතාව ත්‍රිලක්‍ෂණය ආශ්‍රයෙන්, ඇතැම් කෙනෙක් ධාතු මනසිකාර ආශ්‍රයෙන්, ඇතැම් කෙනෙක් සළායතන ආශ්‍රයෙන් එදිනෙදා ජීවිතයේදී අනිත්‍යතාව ඒ විදියට පුරුදු කරනකොට අවසානයේ ඔක්කොම එකතු වෙලා එනවා. සමථ විපස්සනා දෙකම එකට අදින ගොනුන් දෙන්නෙක්ගේ ඇදීම වගේ ඇදිල යනවා අන්තිමට. ආර්‍ය මාර්ගයෙන් අංග තුනක් කලින්ම ප්‍රහීණ වෙනවා. අංග පහක් ඒ අවස්ථාවේ ප්‍රහීණ වෙනවා. ලෝකෝත්තර ආර්‍ය අෂ්ටාංගික මාර්ගයයි මෙතන ප්‍රකාශ වෙන්නේ. කාය කර්ම, වචී කර්ම, පිළිබඳ කථාන්තර නැහැ. භාවනා කරන කෙනාගේ ලෝකෝත්තර හිත් පහළ වෙනකොට අර පහ විතරයි ක්‍රියාකාරී වෙන්නේ. අනිත් ඒවා කලින්ම ශුද්ධ කරලා ඉවරයි. එහෙම කරලා අන්තිමට විජ්ජා විමුත්ති ඵල දක්වාම ඒ ප්‍රතිපදාව අන්න සළායතන ආශ්‍රයෙන් බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළා. අනිත්‍යතාව ගැන කිව්ව නිසා ඒකට අදාළ මහ පුදුම සූත්‍ර තියනවා මේ කාරණය තවත් තහවුරු කර ගන්න.

එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලා

අමතලා ප්‍රකාශ කරනවා[15] **චක්ඛුං අනිච්චං විපරිණාමී අඤ්ඤථාභාවී, රූපා අනිච්චා විපරිණාමිනො අඤ්ඤථාභාවිනො, චක්ඛුවිඤ්ඤාණං අනිච්චං විපරිණාමී අඤ්ඤථාභාවී'** ආදී වශයෙන් ඔය විදියටයි කියන්නේ, එක එකක් ගැන. ඇස අනිත්‍යයි විපරිණාමී කියන්නේ වෙනස් වනසුලුයි. අඤ්ඤථාභාවී කියන්නේ 'අන්සේ බවකට' කලින් තිබුණ තැනට වඩා අන්සේ බවට පත් වෙනසුලුයි. අනිත්‍යතාවෙම පැති තුනක් වගේ අනිත්‍යයි කියල විතරක් ඉවර කරන්නෙ නැහැ. අනිත්‍ය නිසාම ඒක විපරිනාමයට පත් වෙනවා, අන්තිමට අන් සේ බවකට පත් වෙනවා. අඤ්ඤථාභාවී, ඒක වෙන ආකාරයකට පත් වෙනවා. රූපත් එහෙමයි අනිත්‍යයි වෙනස් වෙනසුලුයි. අන්‍ය ස්වභාවයකට පත් වෙනවා. චක්ඛු විඤ්ඤාණයත් අනිත්‍යයි, වෙනස් වෙනවා, අඤ්ඤථා භාවයට පත් වෙනවා. ඊළඟට ප්‍රශ්නයක් විදියට ඉදිරිපත් කරනවා. කෙසේද මහණෙනි, අනිත්‍ය වූ දෙයකින් නිත්‍ය දෙයක් පැන නගින්නේ? ඇසත් අනිත්‍ය නම්, රූපත් අනිත්‍ය නම්, කොහොමද චක්ඛු විඤ්ඤාණය නිත්‍ය වෙන්නේ. ඊළඟට කියනවා චක්ඛු විඤ්ඤාණය නිසා ඇති වෙන චක්ඛුසම්ඵස්සය ඒකත් අනිත්‍යයි. ඊළඟට චක්ඛු සම්ඵස්සය නිසා ඇති වන වේදයිතය ඒකත් අනිත්‍යයි. ඔය විදියට දක්වනවා හිතට කාවදින අන්දමින් **'අනිච්චං විපරිණාමී අඤ්ඤථාභාවී'** ඔක්කොම කියලයි නවත්වන්නෙ. මේ හැම එකක්ම **චලා චෙව, වයා ච, අනිච්චා, විපරිණාමිනො, අඤ්ඤථාභාවිනො,** එතන වචන කීපයක්ම කියනවා අනිත්‍යතාව අඟවන. සැලෙනවා ගෙවී යනවා අනිත්‍ය ස්වභාවයට පත් වෙනවා. දැන් අපි 'ආ' මම හොඳට බලන්නන්කො කියලා. යම් රූපයක් බලනකොටම ඒවා දෙකම වෙනස් වෙලානෙ හරි වේගයෙන්. ඒවා අපට තේරෙන්නෙ නැහැනෙ. ඒවා චලනය වෙනවා. ඒ නිසානෙ චලන චිත්‍රය කියලා කියන්නේ. මේ චලන රාශියක් බව තේරුම්ගන්නෙ නැතිකමින් ඝන සඤ්ඤාවේ පිහිටලා චලන බව තේරුම් නොගැනීමෙන් ග්‍රහණය කර ගන්නවා එකක් කියලා. ''මේ මගේම ඇහින් දැක්ක රූප. ඒ තිබුණු රූපම තමයි'' මොහොතක් පාසා වෙනස් වෙන එක තේරෙන්නේ නැහැ. අන්න ඒ විදියට බුදුරජාණන් වහන්සේ මේක මතු කරල දෙනවා. අනිත්‍යතා භාවනාවට ඉතාම වටිනා විදියේ සූත්‍රයක් මේ සංයුත්ත නිකායේ සළායතන වග්ගයේ දෙවෙනි ද්වයං සූත්‍රය. ඒ අන්තිමට කියන්නේ **චලා චෙව, වයා ච අනිච්චා, විපරිණාමිනො, චලනය වෙනවා ගෙවී යනවා ඒක සාමාන්‍ය මසැසට පේන්නේ නැහැ**

**පැණැසට පෙනෙනවා.**

විදර්ශකයා ඈතට යන්න යන්න විදර්ශනාව තුළින් පේනවා. **විදර්ශකයාට ලෝකය පෙනෙන්නේ අමුතුම විදියකට.** ථෙර, ථේරී ගාථා බලාගෙන යනකොට දැක්වෙන්නේ මහ පුදුම කමටහන්. ගලාගන යන වතුරක්, ගින්නක්, ඔය විදියේ දේවල්. ඒ මොකද **අනිත්‍යතාව නිරන්තරයෙන් වැඩූ කෙනාට ලෝකයේ තියන හැම දෙයක්ම අනිත්‍යයි.** වැටුණු කොළය පිපෙන පර වෙන මල අනිත්‍යයි. ඒ අනිත්‍යතාව මහ ප්‍රබලයි. ඇතැම් අවස්ථාවල බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරල තියනවා '**අනිච්චසඤ්ඤා භික්ඛවෙ භාවිතා බහුලීකතා සබ්බං කාමරාගං පරියාදියති, සබ්බං රූපරාගං පරියාදියති, සබ්බං භවරාගං පරියාදියති, සබ්බං අවිජ්ජං පරියාදියති සබ්බං අස්මිමානං පරියාදියති සමූහනති.**[16] අනිත්‍යතාව හරියට වැඩුවොත් සියලුම කාම රාගය එහෙම පිටින්ම ඉවර වෙනවා. රූප රාගය, භව රාගය, අවිද්‍යාව අන්තිමට අස්මිමානයත් මුලිනුපුටා දමනවා. බුදුරජාණන් වහන්සේ අනිත්‍යතාව වැඩීම කොයි තරම් වර්ණනා කරල තියනවද කිව්වොත් එක තැනක සඳහන් වෙනවා. නිවනට මාර්ග දෙකක් තියනව කියන එක සුදුසු නැහැ. මොකද අන්තිමට ඒ දෙකම එකතු වෙනවා. මෙහෙම දෙකක් තියනවා. **එක්කො සතර සතිපට්ඨානය වැඩිය යුතුයි. එහෙම නැත්නම් අනිත්‍යතාව වැඩිය යුතුයි.** ඒක හෙළි වෙනවනෙ මහා සළායතනික සූත්‍රයෙන්. මෙතන පරස්පර විරෝධී බවක් නැහැ. දෙකෙන්ම කෙරෙන්නෙ එකම වැඩේ. බැලූ බැල්මට එක්කෙනෙක් සාමාන්‍ය රීතිය අනුව සතර සතිපට්ඨානය වඩනවා. ඒක තුළින් තමයි ඒකායන මාර්ගයෙන් ගිහිල්ලා අන්තිමට නිවන ප්‍රත්‍යක්ෂ කරන්නේ. ඕක තමයි සම්මත ක්‍රමය. නමුත් මෙතනදී අනිත්‍යතාව මාර්ගය වශයෙන් ප්‍රකාශ කරනවා. **ක්‍රම දෙකක් තියනවා කෙලෙස් ජය ගන්න. එකක් සතර සතිපට්ඨානය වැඩීම අනික අනිත්‍ය සඤ්ඤාව.** අනිත්‍ය සඤ්ඤාව තුළින් අර කිව්ව දේවල් වැඩෙනවානෙ. සතර සතිපට්ඨානය සතර සම්මප්පධාන ආදිය. බැලූ බැල්මට ඒ තරම් පුදුම විදියේ දෙයක් අනිත්‍ය සඤ්ඤාව පිළිබඳව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ. අපි මේ කියන්න තියන තාක් ඔක්කොම කියනව නොවෙයි. යම් ප්‍රමාණයක් කිව්වා.

මේ කාරණයෙන් හිතාගන්න ඕන බුදුරජාණන් වහන්සේ විවිධ

උපමාවලින් දක්වන්නේ මෙන්න මේ සළායතන තමයි. අර පටන් ගත්ත තැනට ආවොත් **'වෙදගු'** කියන වචනයෙන් මේ ශාසනයේ හඳුන්වන්නේ රහතන් වහන්සේයි. ත්‍රිවේදය කියල කියන්නේ අරගොල්ලන්ගේ ත්‍රිවේදය නොවෙයි. ත්‍රිවිද්‍යා කියල වචනයක් අහල තියනවනෙ. 'තෙවිජ්ජ' කියන්නේ අපේ රහතන් වහන්සේලාට. බුදුරජාණන් වහන්සේ හඳුන්වලා දීලා තියනවා **නියම විද්‍යා තුන පුබ්බෙනිවාසානුස්සති, දිබ්බචක්ඛු, ආසවක්ඛය.** ඒ තුළ ඔක්කොම සළායතනයේ නිස්සරණ පැත්තත් අහු වෙනවා. අරගොල්ලන්ට අහු වුණේ නැහැනෙ නිස්සරණය, නික්මීම. ඒ විතරක් නොවෙයි. හට ගැනීමත් අහු වුණේ නැහැ සළායතනයේ. බුදුරජාණන් වහන්සේ 'වෙදගු' තත්ත්වය තියෙන්නෙත් මෙතනයි, සියල්ල තියෙන්නෙත් මෙතනයි කියල දේශනා කළා. විශේෂයෙන් මේ මහා සළායතනික සූත්‍රයෙන් කුළුගැන්වෙනවා මේ සළායතන දේශනාව, අපට ජේන හැටියට. තව හුඟක් දේවල් කිව්වෙ නැතත් මේ පින්වතුන් මේ ටික ආශ්‍රයෙන්, විශේෂයෙන්ම භාවනාවටම එල්ල කරලයි මේ කිව්වෙ.

**භාග්‍යවතුන් වහන්සේ සොයාගත් අනිච්චතා ධර්මය සුළුපටු දෙයක් නොවේ. ඒක තුළ හැම දෙයක්ම අඩංගු වෙනවා. අනිත් පැත්තෙන් ආයතන තුළයි ලෝකයේ හැම දෙයක්ම සිද්ධ වෙන්නේ. ඒ යථා ස්වභාවය අපි දන්නෙ නැහැ මිරිඟුවක් ඔස්සෙ අපි දුවන නිසා. යම් අවස්ථාවක හරි හැටියට තේරුම්ගත්ත නම් ඔක්කොම, එතනින්ම වැඩේ අවසානයි.** මේ අදට ප්‍රමාණවත් කියලා හිතනවා. මේ පින්වතුන් මේ කියන දේවල් නිතර නිතර අහල හෝ කියවලා හොඳට හිතට කාවද්ද ගෙන මේවා ක්‍රියාවට නංවන්න උත්සාහවත් වෙන්න ඕන. එතකොට අපට යම් ප්‍රමාණයක් දුර යා හැකියි මේ නිවන් මග විද්‍යා විමුක්ති දක්වාම, අනිත්‍යතාවත් සළායතනත් ආශ්‍රයෙන් ප්‍රකාශ කරල තියනවා. අද දින මේ පටිච්ච සමුප්පාද දේශනා මාලාවේදී අපි සළායතනය මුල් කරගෙන කිව්වා. තව ඉඩ තියනව නම් ඉතුරු අංග ගැනත් මෙවැනි දේශනා පවත්වන්න බලාපොරොත්තු වෙනවා.

මේ පටිච්චසමුප්පාද දේශනා මාලාව තුළින්, මේ පින්වතුන්ගේ භාවනාවට මේකත් උපකාර කරගෙන තම තමන්ගේ ඒ ප්‍රතිපදාවට

ඉක්මනින් ළඟා වෙනු ඇතැයි ප්‍රාර්ථනා කරනවා. අප නිතර මතක් කරන ආකාරයට මේ භවය තුළම, දිටු දැමියෙහිම, සෝවාන්, සකදාගාමි, අනාගාමි, අර්හත් යන මාර්ග ඵල ප්‍රතිවේධයෙන් කළ යුතු සියලු කාර්යය නිම කිරීමට මේ පින්වතුන්ට ශක්තිය, ධෛර්යය, බලය, ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම යම් තාක් සත්ත්ව කෙනෙක් අවීචියේ සිට අකනිටා දක්වා මෙබඳු විදර්ශනා ධර්ම දේශනා ඇසීමටත්, ධර්ම දේශනාමය. ධර්ම ශ්‍රවණමය කුශලය අනුමෝදන් වීමටත් කැමති නම් ඒ අනුමෝදන් වීම තුළින් ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවන සාක්ෂාත් කර ගනිත්වා. මේ හැම දෙනාටම ඉක්මනින්ම මේ නිර්වාණ ධර්මය සාක්ෂාත් වේවා කියා ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාම මේ ගාථා කියන්න.

**එත්තාවතා ච අම්හෙහි...**

## පාදක සටහන්

1. උදක සූත්‍රය, සංයුත්ත නිකාය - 4-176 පිට (බු.ජ.ත්‍රි.16)
2. සබ්බ සූත්‍රය, සංයුත්ත නිකාය - 4-30 පිට (බු.ජ.ත්‍රි.16)
3. සමිද්ධි සූත්‍රය, සංයුත්ත නිකාය - 4-88 පිට (බු.ජ.ත්‍රි.16)
4. බ්‍රහමජාල සූත්‍රය, දීඝ නිකාය -1-78 පිට (බු.ජ.ත්‍රි.7)
5. ද්වය සූත්‍රය, සංයුත්ත නිකාය 4-146 පිට (බු.ජ.ත්‍රි.16)
6. මහා කොට්ඨිත සූත්‍රය, අංගුත්තර නිකාය -312 පිටු (බු.ජ.ත්‍රි.19)
7. කාමගුණ සූත්‍රය, සංයුත්ත නිකාය -4-206 පිට (බු.ජ.ත්‍රි.16)
8. කොට්ඨිත සූත්‍රය, සංයුත්ත නිකාය -4-322 පිට (බු.ජ.ත්‍රි.16)
9. කුම්මෝපම සූත්‍රය, සංයුත්ත නිකාය -4-348 පිට (බු.ජ.ත්‍රි.16)
10. මොළිය ඵග්ගුන සූත්‍රය, සංයුත්ත නිකාය -2-22 පිට (බු.ජ.ත්‍රි.14)
11. සම්බහුල භික්ඛු සූත්‍රය, සංයුත්ත නිකාය -4-114 පිට (බු.ජ.ත්‍රි.16)
12. දුතිය ද්වය සූත්‍රය, සංයුත්ත නිකාය -4-148 (බු.ජ.ත්‍රි.16)
13. මහාතණ්හාසංඛය සූත්‍රය, මජ්ඣිම නිකාය -1-608 (බු.ජ.ත්‍රි.10)
14. මහාසළායතනික සූත්‍රය, මජ්ඣිම නිකාය -3-594 (බු.ජ.ත්‍රි.12)
15. දුතිය ද්වය සූත්‍රය, සංයුත්ත නිකාය -4-148 (බු.ජ.ත්‍රි.16)
16. අනිච්චසඞ්ඛා සූත්‍රය, සංයුත්ත නිකාය -3-266 (බු.ජ.ත්‍රි.15)

# 15 වන දේශනය

# 15 වන දේශනය

## (පහන් කණුව ධර්ම දේශනා අංක 197)

## 'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

තෙසං ඵස්සපරෙතානං - භවසොතානුසාරිනං
කුම්මග්ගපටිපන්නානං - ආරා සංයොජනක්ඛයො

යෙච ඵස්සං පරිඤ්ඤාය - අඤ්ඤාය උපසමෙ රතා
තෙ වෙ ඵස්සාභිසමයා - නිච්ඡාතා පරිනිබ්බුතා[1]

- ද්වයතානුපස්සනා සූ. සුත්ත නිපාත

සැදැහැවත් පින්වතුනි,

තිලෝගුරු භාග්‍යවත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලෝකයා හමුවේ තැබූ ධර්මය පටිසෝතගාමී ධර්මයක්. භවසෝත නම් වූ විපරීත පටු භව දිය වැලට එරෙහිව ගලා යන ඒ ධර්මය භව නිරෝධය කරා ගෙන යන ධම්ම සොත නම් වූ මහ දිය කඳයි. **භව දිය වැලට අසු වුන ලෝක සත්ත්වයා සංසාර දිය සුළි තුළම කරකැවෙනවා. ධම්ම සොතයට වැටුණු ආර්ය පුද්ගලයා භව නිරෝධය නම් වූ නිවනට ළඟා වෙනවා. මේ දෙක අතර සන්ධිස්ථානය ස්පර්ශයයි.**

ඒ නිසා අද අපි මේ පසළොස්වෙනි ධර්ම දේශනාවට සුත්ත නිපාතයේ ද්වයතානුපස්සනා සූත්‍රයේ එන ස්පර්ශය පිළිබඳ ගාථා දෙකක් මාතෘකා කරගත්තා. මීට කලින් පටිච්ච සමුප්පාද දේශනා කීපයකදීම අපි මේ ද්වයතානුපස්සනා සූත්‍රයේ ගාථා මාතෘකා කරගත් නිසා සමහර විට මේ පින්වතුන්ට මතක ඇති ඒකෙදි බුදුරජාණන් වහන්සේ අනුගමනය කළ දේශනා රටාව. දෙපැත්තකට නැඹුරුව ඇති ඒ ඒ ධර්ම ඉදිරිපත් කරමින් ඒවායේ සමුදය පැත්තත් නිරොධ පැත්තත් වෙන් කර දැක්වීම ඒ සූත්‍රයේ දේශනා ශෛලියයි. දැන් ඵස්සය පිළිබඳ ඒ දෙපැත්ත පළමුවෙන්ම බුදුරජාණන් වහන්සේ ගද්‍ය පාඨයකින් සංඝයා වහන්සේලාට දක්වනවා.

ඒකේ සිංහල පරිවර්තනය මේකයි. 'මැනවින් ද්වයතානුපස්සනාවේ යෙදීමේ තවත් ක්‍රමයක් තිබිය හැකිදැයි යම් කෙනෙක් ඇසුවොත් ඒ අයට මෙසේ පිළිතුරු දිය යුතුයි. තිබිය හැකියි. කෙසේද තිබිය හැක්කේ? **යම් තාක් දුකක් හටගනීද, ඒ සියල්ල ස්පර්ශය ප්‍රත්‍යයෙනි. මේ එක් අනුපස්සනාවකි. ස්පර්ශයේම නිරවශේෂ විරාග නිරෝධයෙන් දුකෙහි හට ගැනීමක් නැත.** මේ දෙවෙනි අනුපස්සනාවයි. මෙහෙම ප්‍රකාශ කරලා බුදුරජාණන් වහන්සේ මේ දක්වාපු ද්වයතානුපස්සනාවේ යෙදීමේ ආනිශංස ඊළඟට ප්‍රකාශ කරනවා. අප්‍රමාදීව කෙලෙස් තවන වීර්යයෙන් යුතුව යම් කිසි භික්ෂුවක් මේ ද්වයතානුපස්සනාවේ යෙදුණොත් ඒ භික්ෂුවට එක්කෝ මෙලොවදීම, දිට්ඨධම්මයෙහිදීම, රහත් ඵලය ලබාගන්න පුළුවන්. එහෙම නැත්නම් උපාදාන ශේෂයක් ඉතිරිව ඇතොත් අනාගාමී ඵලය ලබාගන්න පුළුවන්.

මේ විදියට ප්‍රකාශ කරලා තමයි බුදුරජාණන් වහන්සේ අර ගාථා දෙක වදාළේ.

තෙසං ඵස්සපරෙතානං - භවසොතානුසාරිනං
කුම්මග්ගපටිපන්නානං - ආරා සංයොජනක්ඛයො

යෙ ච ඵස්සං පරිඤ්ඤාය - අඤ්ඤාය උපසමෙ රතා
තෙ වෙ ඵස්සාභිසමයා - නිච්ඡාතා පරිනිබ්බුතා

ස්පර්ශයට ගැති වූ භව දිය වැලට අනුව යන්නා වූ වැරදි මගට පිළිපන්නා වූ ඔවුන්ට සංයෝජනක්ෂය කිරීම කියල කියන භව බැම් සිඳලීම ඈතය. බොහෝ දුරය. නමුත් 'යෙ ච ඵස්සං පරිඤ්ඤාය' යම් කෙනෙක් ස්පර්ශය පිරිසිඳ දැනගෙන 'අඤ්ඤාය උපසමෙ රතා' ප්‍රත්‍යක්ෂ ඥානය තුළින් සංසිඳීමෙහි ඇලුණාහුද 'තෙවෙ ඵස්සාභිසමයා' ඔවුන් ඒකාන්තයෙන්ම ඒ ස්පර්ශය තේරුම්ගැනීම නිසා 'නිච්ඡාතා පරිනිබ්බුතා' තෘෂ්ණා කුසගින්න නිවාගෙන පිරිනිවියාහුය.

මෙන්න මේ ගාථා දෙක ආශ්‍රයෙන් අපි යම් කිසි විශේෂ ධර්ම දේශනාවක් අද පවත්වන්න බලාපොරොත්තු වෙනවා. මොකද අද විශේෂ දවසක් නිසා. සංඝයා වහන්සේලාගේ වස්සානය අවසාන නිසා, සංඝයා වහන්සේලාගේ වස්සානය අවසාන වන පවාරණය කෙරෙන

වප් පෝය දවසේ, තවත් හේතු නිසා අපට හිතුනා මේ යෝගාවචර පිරිසට - අනිත් ඒවත් කමටහන් බණ තමයි - මේක ටිකක් වඩා එල්ල කරලා ප්‍රායෝගික මට්ටමින් ඉදිරිපත් කරන්න. ඒ නිසා විශේෂයෙන් ඉල්ලා සිටිනවා මෙතන ඉඳලා ප්‍රකාශ කරන කාරණාවලට ඉතාමත්ම සාවධානව වැකියක් වැකියක් පාසා, වචනයක් වචනයක් පාසා, ශ්‍රවණය කරන හැටියට. මේ ස්පර්ශය පිළිබඳ කථාන්තරයේදී පළමුවෙන්ම කිව යුතු කාරණයක් තමයි, අපි දේශනා කීපයකදීම දීඝ නිකායේ පළමුවෙනි සූත්‍රය වන බ්‍රහ්මජාල සූත්‍රය ගැන මතු කරල දුන්න කාරණයක් මොකක්ද, බුදුරජාණන් වහන්සේ ඒ සූත්‍රයේ දී හැටදෙකක් මිථ්‍යා දෘෂ්ටි ප්‍රතික්ෂේප කළේ ඉතාමත්ම කෙටි පාඨයකින් බව.

මොකක්ද ඒ පාඨය '**තදපි ඵස්ස පච්චයා, තදපි ඵස්ස පච්චයා,**'[2] ඒකත් ස්පර්ශ ප්‍රත්‍යයෙන්, ඒකත් ස්පර්ශ ප්‍රත්‍යයෙන්, කියල ඒ විදියටයි නිෂ්ප්‍රභා කළේ හැම දෘෂ්ටියක්ම. ඒ වගේම සූත්‍රය අවසාන හරියේදී බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා, යම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඒ දෘෂ්ටි ප්‍රකාශ කළා නම් ඔවුන් පිළිබඳව මෙන්න මෙහෙම වාක්‍යයක් කියනවා. '**සබ්බෙ තෙ ඡහි ඵස්සායතනෙහි ඵුස්ස ඵුස්ස පටිසංවෙදෙන්ති**' ඒ හැම කෙනෙක්ම ස්පර්ශ ආයතන හයෙන් නැවත නැවතත් ස්පර්ශ කරමින් ප්‍රතිසංවේදනය කරනවා. ඒකෙ ඊළඟට විපාක කියනවා. ඒ වේදනාව නිසා තණ්හාව ඔවුන්ට ඇති වෙනවා. තණ්හාව නිසා උපාදානය, උපාදානය නිසා භව, භවය නිසා ජාති, ජාති නිසා ජරා මරණ දුක්ඛ සියල්ලම. ඉන් කියවෙන්නේ මොකක්ද? අර මුල් ගාථාවෙන් කිව්ව වගේ ඒ හැටදෙකක් දෘෂ්ටි ගත්ත හැම ශ්‍රමණ බ්‍රාහ්මණයෙක්ම ස්පර්ශයට ගැති වෙලා, භව දිය වැලට අහු වෙලා, වැරදි මාර්ගයට වැටිලා, භව බැම්මවලින් මිදිලා නොවෙයි සිටියේ. බුදුරජාණන් වහන්සේගේ ධර්මය කොයි විදියද කියලා ඊළඟට අවසානයේ ප්‍රකාශ කරනවා. මේ ශාසනයේ රහත් භික්ෂුව පිළිබඳව ඊළඟට ප්‍රකාශ කරනවා. ඒ රහත් භික්ෂුව ස්පර්ශය පිළිබඳව, ස්පර්ශ ආයතන හය පිළිබඳව පස් ආකාර විශේෂ අවබෝධයක් ඇති කරගෙන පිරිනිවීමට පත් වෙලා තියෙනවා. මොකක්ද ඒ? අපි කලිනුත් දේශනාවකදී මතක් කළා **ස්පර්ශය ආයතන හයේ සමුදය, අත්ථගම, අස්සාද, ආදීනව, නිස්සරණ. ඒ කියන්නේ ස්පර්ශ ආයතන හයේ හටගැනීම, අස්තයට යාම, ආස්වාද පක්ෂය, ආදීනව පක්ෂය, නිස්සරණ**

**කියන්නේ නික්මීම.** ඔන්න ඕකයි මේ ශාසනයේ විශේෂත්වය ස්පර්ශය පිළිබඳව. දැන් ඔන්න එතන ඉඳලා ස්පර්ශය ගැන වඩ වඩාත් පැහැදිලි කර ගන්න අපි ඉදිරියට සූත්‍ර කීපයක් ගන්නවා. **හිතාගන්න මේක එක්තරා විදියක වන්දනා ගමනක් කියලා. නිවන් කරා යන වන්දනා ගමනක් කියලා හිතාගෙන මේ පැය තුළ මෙයට සාවධානව ඇහුම්කන් දෙන්න උත්සාහ කරන්න.** ස්පර්ශය ගැන පළමුවෙන්ම අපි අමුතුවෙන් කියන්න ඕන නැහැ. මේ පින්වතුන් හොඳට දන්නවා ද්වාදසාංග පටිච්ච සමුප්පාද සූත්‍රය. කවුරුත් ඔය හොඳට දන්න අවිජ්ජා පච්චයා කියල පටන් ගන්න සූත්‍රයේ ස්පර්ශය සඳහන් වන්නේ මෙහෙමයි.

සළායතන පච්චයා ඵස්සො, ඵස්ස පච්චයා වෙදනා. සළායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය, ස්පර්ශ ප්‍රත්‍යයෙන් වේදනාව. ඔය ආදී වශයෙන් තියෙන්නේ, නමුත් ස්පර්ශය පිළිබඳව වඩාත්ම පැහැදිලි ගැඹුරුම දර්ශනයක් අපට ඉදිරිපත් කරනේනේ **මී පිඬක් වැනි අර්ථ රසයෙන් පොහොසත් මධුපිණ්ඩික 'සූත්‍රයෙන්'.**[3] මජ්ඣිම නිකායේ මධුපිණ්ඩික සූත්‍රය කලින් අවස්ථාවල අපි සම්පූර්ණයෙන් විග්‍රහ කරල තියනවා. මෙතෙන්දි මීට අදාළ වශයෙන් කිව්වොත් මෙහෙමයි. බුදුරජාණන් වහන්සේ වදාළ එක්තරා කෙටි දේශනා පාඨයක් සංඝයා වහන්සේලාගේ ඉල්ලීම පරිදි, කෙටියෙන් කළ දේශනා සවිස්තරව දේශනා කිරීම පිළිබඳව 'එතදග්ග' තනතුර ලබා ගත්තු මහාකච්චායන මහ රහතන් වහන්සේයි තේරුම් කරල දෙන්නේ. ඒකෙදි මෙන්න මේ වාක්‍යය යෙදෙනවා.

**'චක්ඛුඤ්චාවුසො පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං තිණ්ණං සඞ්ගති ඵස්සො'** ඔතන මහා ගැඹුරු දර්ශනයක් ඉදිරිපත් කරනවා. 'චක්ඛුඤ්චාවුසො පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං' ඇවැත්නි ඇසත් රූපයනුත් නිසා චක්ඛු විඤ්ඤාණය හටගනී. ඊළඟට කියනවා. '**තිණ්ණං සඞ්ගති ඵස්සො**' ඒ තුනේම එකට යාම ස්පර්ශයයි. මෙතන හොඳින් කල්පනා කළොත් මහ ගැටලුවක් පෙනෙනවා. සියුම් ගැටලුවක්. මොකක්ද මතක තියාගන්න මෙතන කියවුනා. 'පටිච්ච' කියන වචනයත් '**උප්පජ්ජති**' කියන වචනයත්, එයින් පේනවා **පටිච්ච සමුප්පාද ධර්මයේ තියෙන්නේ විඤ්ඤාණය හටගැනීම පිළිබඳව බව.** ඇසත් රූපයනුත් නිසා චක්ඛු විඤ්ඤාණය හටගන්නවා. නමුත් හටගත්තට

පස්සෙ ලෝක සත්ත්වයා තුළ තියන මුළාව නිසා, අවිද්‍යාව නිසා, මේක තුනක් හැටියට ගන්නවා.

තුනක් හැටියට ගන්න ඉඩක් නැහැ. මොකද අර ඇසත් රූපයනුත් නිසාමයි චක්ඛු විඤ්ඤාණය හටගත්තේ. චක්ඛු විඤ්ඤාණය කියන එක අපි තේරුම් කරල දුන්නා. විඤ්ඤාණය යට තියන ඒ ධර්මතාව දෙකක් හැටියට වෙන් කර ගැනීමමයි. එතෙක් ඇසත් රූපයත් දෙකක් කියන අදහස පහළ වුණෙත් නැහැ. චක්ඛු විඤ්ඤාණය පහළ වුණහමයි 'මේ මගේ ඇස' අර තියෙන්නේ 'රූප' ඔන්න ඔය විදියට.

ඒකයි මේ කියන්නේ ඔය දෙක අතර පරතරය තමයි විඤ්ඤාණය. නමුත් ඒ අනවබෝධය තුළින් ඇසත්, රූපයත් චක්ඛුවිඤ්ඤාණයත් කියල තුනක්, ඒ තුන එකට යාම පිළිබඳ හැඟීමක් ඇති කර ගත්තු තැන අන්න ස්පර්ශය හටගන්නවා. එතන ඉඳලමයි මුළාව. ඒකයි අපි ස්පර්ශය සන්ධිස්ථානයයි කිව්වේ. එතකොට මේ ස්පර්ශය පිළිබඳ කාරණයේදීත් කියවුණානෙ දෙකක් හා මැදක් පිළිබඳව. ඔන්න ඒ පිළිබඳව අපි මීට කලින් නොයෙකුත් අවස්ථාවල විස්තර කරල තියනවා මහ බලසම්පන්න සූත්‍රයක් අංගුත්තර නිකායේ ඡක්ක නිපාතයේ - ඒ කියන්නේ හයවෙනි නිපාතයේ - මජ්ඣ සූත්‍රය.[4] - අපි ඉස්සෙල්ල නිදාන කථාව කියල ඉඳිමු නොදන්න අයට. බරණැස ඉසිපතනයේ මිගදායේ බුදුරජාණන් වහන්සේ වැඩ වසන අවස්ථාවක ස්ථවිර භික්ෂූන් වහන්සේලා පිරිසක් පිණ්ඩපාතයෙන් පස්සේ මණ්ඩල මාලයේ රැස්වෙලා ධර්ම සාකච්ඡාවක් ආරම්භ කළා. මේ කාලයේ වචනයෙන් කියනවා නම් ධර්ම සම්මන්ත්‍රණයක්. මොකක්ද හේතුව? සභාවේදී ඉදිරිපත් වුණා මෙන්න මෙහෙම ප්‍රශ්නයක්. මොකක්ද? භාග්‍යවතුන් වහන්සේ පාරායණයේ මෙත්තෙය්‍ය පඤ්හයේ මෙන්න මෙහෙම දේශනා කරල තියනවා.

**'යො උභන්තෙ විදිත්වාන**
**මජ්ඣෙ මන්තා න ලිප්පති**
**තං බ්‍රෑමි මහා පුරිසොති**
**සොධ සිබ්බනිමච්චගා'**

ඔය ගාථාව ඉදිරිපත් කරලා මේක තුළින් සාකච්ඡාව සඳහා ප්‍රශ්න හතරක් ඉදිරිපත් කරගත්තා, සම්මන්ත්‍රණය සඳහා මේ ස්වාමීන් වහන්සේලා. මොකක්ද ප්‍රශ්න හතර? දැන් ගාථාව තේරුම් කරල දෙමු. සාමාන්‍ය අර්ථය 'යො උභන්තෙ විදිත්වාන' කියන්නේ යමෙක් කොන් දෙක තේරුම් අරගෙන 'මජ්ඣෙ මන්තා න ලිප්පති' ප්‍රඥාවෙන් - මන්තා කියන්නේ ප්‍රඥාව - ප්‍රඥාවෙන් මැද නොඇලේද, 'තං බ්‍රෑමි මහා පුරිසොති' බුදුරජාණන් වහන්සේ වදාරනවා එයාට මම කියනවා මහා පුරුෂයයි කියලා මොකද **'සොධ සිබ්බනිමච්චගා'. ඔහු මේ ලෝකයේ මැහුම්කාරිය ඉක්මවා ගියා.**

මේ තේරවිලි වගේ ගාථාවෙන් කාරණා හතරක් ඔන්න ප්‍රශ්න හැටියට ඉදිරිපත් වුණා. මේ ගාථාවේ සඳහන් වන **එක කොනක් මොකක්ද, දෙවෙනි කොන මොකක්ද, මැද මොකක්ද, මැහුම්කාරිය කවුද,** මේ ප්‍රශ්න හතරට ස්ථවිර සංඝයා වහන්සේලා හය නමක් ඉදිරිපත් කරනවා විවරණ හයක්. මහ පුදුම කමටහන් විවරණ වගේ ඒවා. අපට අදාළ දේ විතරක් මෙතෙන්දි ඉස්සරහට ගනිමු. ආයතන පිළිබඳ ප්‍රශ්නයේදී පස්වෙනි ස්ථවිරයන් වහන්සේ දුන්න විවරණය මේකයි. **එක් කොනක් ආධ්‍යාත්මික ආයතන හය** ඒ කියන්නේ ඇස, කන, නාසය, දිව, කය, මන **දෙවෙනි කොන බාහිර ආයතන හය** රූප ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම. **මැද විඤ්ඤාණය. මැහුම්කාරිය තණ්හාව.** දැන් ඔය මැහුම්කාරිය ගැන කියනකොට මේ කාලයේ ඇඟළුම් කර්මාන්ත ආදි දක්ෂ මැහුම්කාරියන් ඉන්න පුළුවන්. ඒ ඔක්කොම පරාදයි මේ මැහුම්කාරියට. මොකද? මේ තණ්හා නමැති මැහුම්කාරියට උපාධි තුනක් තියනවා. මොනවද **'පොනොභවිකා'** භවයක් මහනවා ඒ මැහුම්කාරිය. ඊළඟට **'නන්දිරාග සහගතා'** තුටු වීම් ඇලීම් සහිතයි. ඊළඟට **'තත්‍රතත්‍රාභි නන්දිනී'** ඒ ඒ තැන සතුටු වෙනවා. ඔන්න තණ්හා මැහුම්කාරියගේ හපන්කම්. එබඳු ඒ තණ්හා මැහුම්කාරිය තමයි අර දෙකොනම ගැටලන්නේ මැද නොතකා හරිමින්. **මැද තියන විඤ්ඤාණය අර දෙක නිසා ඇතිවුණේ. නමුත් ඒක අමතක කරලා කොන් දෙක ගැටලනවා.** නිදසුනක් වශයෙන් කිව්වොත් ඇසත් රූපයත් ගැටලනවා.

ඇසත් රූපයත් ගැටලෑම පිළිබඳ කතාන්තරය අපි නොයෙකුත්

අවස්ථාවල ප්‍රකාශ කරල තියනවා. පහසුවෙන්ම තේරුම්ගන්න පුළුවන් උපමාවක් කිව්වොත් - මිරිඟුව. කොටින්ම කිව්වොත් බුදුරජාණන් වහන්සේ මුළු මහත් සඤ්ඤා ස්කන්ධයම මිරිඟුවට උපමා කළා. අපට මිරිඟුව කියනකොට හිතෙන්නේ ඇහැයි රූපයයි විතරයි. නමුත් මුළු මහත් සඤ්ඤා ස්කන්ධයම මිරිඟුවට උපමා කිරීම හරි ගැඹුරු කියමනක්. නමුත් මෙතනදී සරලව ඒක නිසා ඇසත් රූපයත් පිළිබඳ ප්‍රශ්නය ගනිමු. මිරිඟුව පිළිබඳව බොහෝදෙනා දන්නවා නමුත් යන්තම් මතක් කරමු. මිරිඟුව කියන එකට පින්වතුනි සංස්කෘත වචනයක් තියනවා 'මෘගතෘෂ්ණිකා' කියලා, මුවාට තණ්හාව පිපාසය ඇති කරවන දර්ශනයක්. මොකක්ද, නියං සමයේ ඈත වතුර ගලන්න වගේ දර්ශනයක් පෙනෙනවා. මුවා හිතා ගන්නවා මේ වතුර කියලා. මේ මුවාගේ ස්ථාවරය මොකක්ද 'මම මෙතන, අතන වතුර'. මම මෙතන, අතන වතුර කිව්වට මොකද, යන යන පියවරක් පාසා ඇහැත් අරගෙනයි යන්නෙ. ඒත් කියන්නෙ 'මම මෙතන වතුර අතන'. වතුරෙයි කියල හිතන එකත් ඈත් වෙනවා. මිරිඟුවේ ස්වභාවය ඒකයි. මේක කෙළවරක් නැති දිවිල්ලක්. **මිරිඟුවේ ස්වභාවය රැවටිල්ල. ඒක කෙරෙන්නේ මොකකින්ද, මායාත්මක චක්ඛු විඤ්ඤාණය තුළින්.** අර පරතරය නොතකා හරිමින් මේ දුවන්නෙ. පරතරය ගැන හැඟීමක් නැහැ මුවාට. මම මෙතන වතුර අතන, දිගින් දිගට යන අඩියක් පාසා ඒ මුළාව තුළ මුවා දුවල දුවල වෙහෙසට පත් වෙනවා. මුවා පමණක් නොවෙයි මේ මුළු මහත් ලෝක සත්ත්වයාම මුලා වෙලා ඉන්නෙ මුවා වගේ මිරිඟුව තුළින්, කියලා බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා. මෙන්න මේ කියාපු තණ්හා මැහුම්කාරිය තමයි මේ සියුම් වැඩේ කරන්නේ. තණ්හා මැහුම්කාරිය ගැටලනවාය කිව්වා. මේ ගැටවලින් බේරෙන්නෙ කොහොමද? බේරෙන්න පණිවුඩයක් මේ ගාථාවෙම තියනවා. 'යො උභන්තෙ විදිත්වාන - මජ්ඣෙ මන්තා න ලිප්පති' 'මන්තා' කියන්නෙ පින්වතුනි ප්‍රඥාව. එතකොට කියන්න පුළුවන්, 'කෝ අපට ප්‍රඥාව නැහැනෙ ඒක රහතන් වහන්සේලාට ඉබේ පහළ වන එකක්නෙ.' එහෙම කියන්න එපා. **ප්‍රඥාවේ මූල බීජය අප කා තුළත් තියනවා. යෝනිසෝ මනසිකාරය.**

**'යෝනිසෝ මනසිකාරය'** කියන එක මහ ප්‍රබල වචනයක් මේ ශාසනයේ විශේෂයෙන්ම විදර්ශකයින්ට. නමුත් අවාසනාවකට වගේ අපට කියන්න වෙනවා මේක ගැන අටුවාවල පැහැදිලි විවරණයක් නැහැ. යෝනිසෝ මනසිකාරය තෝරන්නේ 'උපාය මනසිකාර' 'පථ මනසිකාර' ආදී වශයෙන්. අපි කෙටියෙන් ලෙහෙසියට කියන්නේ 'නුවණින් මෙනෙහි කිරීම'. නමුත් මේකේ තියනවා මහ ගැඹුරක්. 'යෝනි' කියන්නේ පින්වතුනි ප්‍රභව ස්ථානය, යමක් හටගන්න ස්ථානය. එතකොට **'යෝනිසෝ' කියන්නේ යමක් හටගන්න ස්ථානය අනුව මෙනෙහි කිරීමටයි.** ඉතින් හටගන්න ස්ථානය මොකක්ද කියලා දැනටම මේ පින්වතුන්ට පැහැදිලි ඇති. **ස්පර්ශයයි, ස්පර්ශයයි. සඞ්ස්ථානය කියල කිව්වෙ ඒකනෙ.** බ්‍රහ්මජාල සූත්‍රයේ **'තදපි ඵස්සපච්චයා'** කියල කිව්වෙ. මොන කාරණයකින් හෝ ඒක යටපත් වෙලා තියන බවයි අපට නම් පෙනෙන්නෙ. **ස්පර්ශය තමයි 'යොනි' හැටියට, ප්‍රභව ස්ථානය හැටියට පෙනෙන්නෙ. එතකොට ස්පර්ශය අනුව මෙනෙහි කිරීමයි යෝනිසෝ මනසිකාරය කියල කියන්නේ.** ඔන්න ඔතන ඉඳලා නොයෙකුත් උපමා දෙන්න සිද්ධ වෙනවා. ඒකට මගේ භාෂා ඥානය අඩුපාඩුකම නිසා හෝ සමහර විට ඕළාරික දේවල් කියවෙන්න පුළුවන්. මට සමා වෙන්න. අපි ඒකට පළමුවෙන්ම ඉදිරිපත් කරන උපමාව - මට දැන් ප්‍රශ්නය තියෙන්නේ පාරිභාෂික ශබ්දයයි ව්‍යවහාරික ශබ්දයයි අතර. ව්‍යවහාරික ශබ්දය නම් බොහෝ විට ඉංග්‍රීසියට නැඹුරුයි. කෙසේ වෙතත් මට දැන ගන්න ලැබුණා එක්තරා ක්‍රීඩාවක් තියනවනෙ ඉංග්‍රීසියෙන් 'ටේබල් ටෙනිස්' කියලා. ඒකට කියන්නේ 'මේස පන්දු' කියලලු. හොඳයි අපි මේස පන්දු ක්‍රීඩාව සිහියට නගාගනිමු. ඒකෙදි කෙරෙන්නෙ මොකක්ද. පිං පොං බෝලයයි රැකට් දෙකයි තමයි උපකරණ හැටියට තියෙන්නේ. මේසෙ මැද තියනව කෙටි දැලක්. ඉතින් මේකෙ කරන්න තියෙන්නෙ මොකක්ද, එහා පැත්තෙ ඉන්න කෙනා රැකට් එකෙන් මෙහා පැත්තට ගහල එවන බෝලේ මේසෙන් මෙහා පැත්තට වැටෙන්න කලින් රැකට් ඒකෙන් එහා පැත්තට දමන්න ඕන. ඉතින් අර අදක්ෂයා - මේක පහසුවෙන් තේරුම්

ගන්න මේ විදියට හිතාගන්න. **එහා පැත්තෙ ඉන්න ක්‍රීඩකයා කවුද දන්නවද? මාරයා. මෙහා පැත්තෙ ඉන්නෙ යෝගාවචරයා.** මාරයාත් යෝගාවචරයාත් අතර මේස පන්දු ක්‍රීඩාවක් කියල හිතාගන්න. **මාරයා තරම් 'රැකට්කාරයෙක්' තවත් නැහැ.** 'රැකට්' කියන වචනයේ සමාජ අර්ථය මතක් කරගන්න. මාරයාගේ 'රැකට් එකට' අහු වෙලා තමයි මේ සංසාරෙ මෙච්චර කාලයක් ඇවිල්ල තියෙන්නෙ. දැන් ඉතින් මේ මාරයා පරද්දන්නයි හදන්නෙ. මාරයා පරද්දන්නත් යෝගාවචරයා අතට ගන්නේ රැකට් එක. ඒ රැකට් එක අරගෙන අදක්‍ෂ ක්‍රීඩකයා කරන්නේ මොකක්ද අරයා බෝලෙ එවනකොට **ඒක පොළා පැනල යනකම් බලන් ඉඳල මේසෙ ඒ අතට මේ අතට නැමි නැමී රැකට් එකෙන් එහා පැත්තට දමනවා.** ඒක හරියන්නෙ නැහැ වැඩේ. එයා එතකොට පරාද වෙනවා. ඒ වෙනුවට දක්‍ෂයා මොකක්ද කරන්නෙ **කෙලින්ම හිටගෙන අර බෝලෙ කොයි තරම් වේගයෙන් එව්වත් එතෙන්දිම අනිත් පැත්තට හරවනවා රැකට් එක තියලා. පොළා පැනල යන්න දෙන්නෙ නැහැ.** පොළා පැනල යනව කියන එකට උපමාව හිතා ගන්න **'ප්‍රපඤ්චය'.** ධර්මයේ හැටියට ප්‍රපඤ්චය තමයි පොළා පැනල යෑම. **පොළා පැනල යන්න නොදී එතන එතනම මෙනෙහි කිරීම.** මොකද 'එතන' කියල කියන්නේ? වදින තැන. අන්න **'ස්පර්ශය'.** එතකොට ස්පර්ශය අනුව මෙනෙහි කිරීම කියල කියන්නෙ බෝලය වදිනවාත් එක්කම පොළා පැනල යන්න නොදී එතනින්ම හරවල යවනවා එහා පැත්තට. ඔහොම ඔහොම කරගෙන ගියොත් - ඉතාම ශීඝ්‍රයෙන් ඒක කරන්න ඕන. ඒ ශීඝ්‍රයෙන් කරන එක්කෙනා අන්තිමට මාර පරාජය කරන්නෙ. මාරයාට රැකට් එක වීසි කරන්න සිද්ධ වෙනවා.

තව උපමාවක් ගනිමු. මම වැඩිය වැඩිය කියන්නෙ නැත්තෙ මහ ගොඩක් තියනවා කියන්න. පැයක් තුළ කෙටියෙන් මේ කියන්නෙ, අනික් හරිය හිතාගන්න. ඊළඟට අපි ගනිමු. ඒත් ක්‍රීඩාවක්. ඒක ක්‍රීඩාවක් නොවේ සටනක්. කඩු දුනු යුගයේත් තිබුණු සටනක්. ඒකට කියන්නේ ද්වන්ද්ව සටන කියලා ඒ කාලේ සිරිතක් තිබුණා, ලංකාවේ පමණක් නොවෙයි, එංගලන්ත ආදී රටවල්වලත්, හැමදෙනා ළඟම

ආයුධය හැටියට තියෙන්නේ කඩුවක්. කඩුව එල්ලලා තියනවා. මොකක් හරි ගැටුමක් වුණ හැටියේ 'සටනට එව' කියල අභියෝග කරලා ඔන්න පටන්ගන්නවා සටන. **පළිහ නැහැ. පළිහ නැතිව කඩුවෙන්මයි අනින්නෙත්. කඩුවෙන්මයි ආරක්ෂා වෙන්නෙත්.** ටිකකට හිතල බලන්න. කොයි තරම් වේගයෙන් කඩුව මෙහෙයවන්න ඕනද. බැලූ බැල්මට පිටින් ඉඳල බැලුවොත් කඩු කාප්පයක්. අරහෙන් එන හැම පාරටම ලෑස්තියි. කඩු කරකවනවා. අන්න ඒ වගේ මේක වෙන්නෙත්. කොයි තරම් ශීඝ්‍රයෙන් මෙනෙහි කරනවද කියන එක පෙන්නන්නයි මේ උපමා දෙකම දුන්නෙ. රැකට් එක හෝ වේවා කඩුව හෝ වේවා ඒ තරම් ශීඝ්‍රයෙන් මෙනෙහි කිරීම තුළින් තමයි යම් අවසථාවක අර ගැට වැටීම නවත්වන්න පුළුවන් වෙන්නෙ. ගහන ගහන එකක් ඇත්නම් එහා පැත්තට හරවන්න ඕන. අපි පිං පොං බෝල ගැන කිව්ව නිසා අපි නිදසුනක් කියමු. මාරයා 'රූප බෝලයක්' එවනවා. මේ නිදශීනය දෙන්නේ ප්‍රායෝගික අර්ථයකින්. රූප බෝලය එනවත් එක්කම ඒක ප්‍රපඤ්චයට යන්න නොදී පොළා පැනල යන්න නොදී එතනම අනිත් පැත්තට හරවනවා. කොහොමද අනිත් පැත්තට හරවන්නෙ. මේ පැත්තෙ රැකට් එක මොකක්ද? බුදු පිළේ රැකට් එක '**අනිත්‍යයි අනිත්‍යයි**' ආයිත් මාරයා මේ පැත්තට ගහනවා. ආයිත් '**අනිත්‍යයි අනිත්‍යයි, අනිත්‍යයි' අනිත්‍යයි**'. ඔන්න අපි දිනන හැටි. ඒ රැකට් එකෙන් අනිත්‍යයි කියලා එහා පැත්තට හරවනවා. ඔන්න ඕක තුළින් තේරුම්ගන්න. මොකක්ද, මෙතෙන්දි අපි දුන්න උපමාව තුළින් තේරුම්ගන්නෙ **අනිත්‍යානුපස්සනාව**,

අනිත්‍යානුපස්සනාව පිළිබඳ මහා ප්‍රබල දේශනාවක් කලිනුත් අපි යන්තමට සඳහන් කළා සංයුත් සඟියේ සළායතන වග්ගයේ තියනවා '**ද්වයං**' කියන නමින් සූත්‍ර දෙකක්. ඉන් එකක් ගිය සැරේ අපි විස්තර කළා. දැන් මෙතෙන්ට අදාළ සූත්‍රය **දෙවෙනි ද්වයං සූත්‍රය.**[5] දෙවෙනි ද්වයං සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ මෙහෙමයි ප්‍රකාශ කරන්නේ, පටන් ගන්නේ '**ද්වයං භික්ඛවෙ පටිච්ච විඤ්ඤාණං සමෙහාති**' මහණෙනි, දෙකක් නිසා විඤ්ඤාණය හටගන්නවා. 'කථඤ්ච භික්ඛවෙ, ද්වයං පටිච්ච විඤ්ඤාණං සමෙහාති? කෙසේද මහණෙනි, දෙකක් නිසා විඤ්ඤාණය හටගන්නෙ? 'චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති

චක්ඛුවිඤ්ඤාණං' ඇසත් රූපත් නිසා චක්ඛු විඤ්ඤාණය හටගන්නවා. ඔන්න ඊළඟට එනවා හොඳ වචන ටිකක්. **චක්ඛුං අනිච්චං විපරිණාමී, අඤ්ඤථාභාවී, රූපා අනිච්චා විපරිණාමිනො අඤ්ඤථාභාවිනො'.** ඇස අනිත්‍යයි විපරිණාමි කියන්නේ වෙනස් වෙනවා අන්‍යාකාරයකට පත් වෙනවා. රූපයනුත් අනිත්‍යයි. වෙනස් වෙනවා, අන්‍යාකාරයකට පත් වෙනවා. ඊළඟට ප්‍රකාශ කරනවා **ඉත්ථෙතං ද්වයං චලඤ්චෙව වයඤ්ච අනිච්චං විපරිණාමි අඤ්ඤථාභාවී'** මෙසේ මේ දෙකම සැලෙනවා. චලනය වෙනවා, ගෙවී යනවා, වෙනස් වෙනවා, අන්‍යාකාරයට පත් වෙනවා. ඔහොම කියල එතනින් නවතින්නෙ නැහැ. ඊළඟට කියනව චක්ඛු විඤ්ඤාණං අනිච්චං විපරිණාමී අඤ්ඤථාභාවී, චක්ඛු විඤ්ඤාණයත් අනිත්‍යයි. විපරිණාම වෙනවා, අන්‍යාකාරයට පත් වෙනවා. ඊළඟට කියනවා **'යොපි හෙතු යොපි පච්චයො චක්ඛුවිඤ්ඤාණස්ස උප්පාදාය.'** චක්ඛු විඤ්ඤාණය හටගැනීමට යම් හේතුවක් ප්‍රත්‍යයක් තියනවා නම් ඒකත් අනිත්‍යයි. ඊළඟට සංඝයා වහන්සේලාගෙන් අහනවා ප්‍රශ්නයක්. **මහණෙනි, අනිත්‍ය වූ ප්‍රත්‍යය උපකාර කරගෙන ඇති වන දේ කොහොමද නිත්‍ය වන්නේ?** ප්‍රත්‍යයන් අනිත්‍ය නම් ඒකෙන් උපදින චක්ඛු විඤ්ඤාණය කොහොමද නිත්‍ය වන්නේ? ඊළඟට කියන ටික සිංහලෙන් කියමු. මේ කියාපු ධර්ම තුනේ එකතුවට එතන වචන කීපයක් යෙදෙනවා. **'තිණ්ණං ධම්මානං සඞ්ගති සන්නිපාතො සමවායො' ඒ කියන්නේ මේ ධර්ම තුනම එක්ව යාම, එකතු වීම, එක්රැස් වීම තමයි ස්පර්ශය.** ඊළඟට එහෙම කියල ප්‍රකාශ කරනවා. චක්ඛුසම්ඵස්සොපි. අනිච්චො විපරිණාමී අඤ්ඤථාභාවී' චක්ඛුසම්ඵස්සයත් අනිත්‍යයි. වෙනස් වෙනවා. අඤ්ඤථා භාවයට පත් වෙනවා. ආයිත් ප්‍රශ්නයක් අහනවා. අනිත්‍ය වූ ප්‍රත්‍යයන් නිසා ඇති වන චක්ඛු සම්ඵස්සය කොහොමද නිත්‍ය වෙන්නේ? ඊළඟට ඔන්න අමුතු දෙයක් ප්‍රකාශ කරනවා. **'ඵුට්ඨො භික්ඛවෙ වෙදෙති, ඵුට්ඨො සඤ්ජානාති ඵුට්ඨො චෙතෙති'** ස්පර්ශ කරන ලද්දුයේ වින්දනයක් ලබනවා. ඒ වගේම ස්පර්ශය තුළින්ම සඤ්ඤා ඇති වෙනවා, ස්පර්ශය තුළින්ම චේතනා ඇති වෙනවා. ආයිත් මතක් කරගන්න එතකොට **'වේදනාවටත් සඤ්ඤාවටත් චේතනාවටත් මුල, යෝනිය, ස්පර්ශයමයි.** නිකම් නොවෙයි කිව්වෙ, යෝනිසෝමනසිකාර කියන්නේ ස්පර්ශ වෙන තැනට හිත යෙදීම බව. අන්තිමට කියනවා **'ඉත්ථෙතෙපි ධම්මා'** මේ ඔක්කොම ධර්ම **'චලා චෙව වයාච අනිච්චා විපරිණාමිනො**

**අඤ්ඤඤාතාභාවිනො'.**

ඔන්න අනිච්චානුපස්සනාව, බුදුරජාණන් වහන්සේ පුදුම විදියකට ඉදිරිපත් කරන්නේ. දැන් එතකොට ඒක ආශ්‍රයෙන් හිතාගන්න පුළුවන් රැකට් එක හෝ වේවා, කඩුව හෝ වේවා මනසිකාර වේගයයි. මනසිකාර වේගය උග්‍ර කළ අවස්ථාවේ තමයි තේරුම්ගන්න පුළුවන් අර මිරිඟුවේ රහස. අපි දැන් සැහෙන්න ඇහැ ගැන කිව්වා. හයක් තියනවනෙ. ඊළඟට අපි කන ගැන බලමු. ඒකත් උපමාවලින් කියන්න බලාපොරොත්තු වෙනවා. ඊට කලින් කියන්න ඕන, හැම ඉන්ද්‍රියයක්, නැත්නම් ආයතනයක් පිළිබඳවම කියනකොට මට සිද්ධ වෙනවා මජ්ඣේ සූත්‍රයේ විවරණයට යන්න. මජ්ඣේ සූත්‍රයේ විවරණයට අනුව කන ගැන මෙහෙමයි සඳහන් වෙන්නේ. කන එක අන්තයක්, ශබ්දය තව අන්තයක්. සොත විඤ්ඤාණය මැද. ඊළඟට මැහුම්කාරිය සුපුරුදු තණ්හාව. මැහුම්කාරිය කරන්නේ මොකක්ද? **කනයි ශබ්දයයි ගැටලනවා. සොත විඤ්ඤාණය නොතකා හරිනවා.** මේකෙදිත් මනසිකාරය ශීඝ්‍ර කිරීම තමයි උපකාරී වෙන්නෙ. මනසිකාරය ශීඝ්‍ර කිරීම ගැන උපමාවක් දෙන්න මම කැමතියි. අර කියාපු සම්මත උපමාවක් නොවෙන්න පුළුවන්.

මේ පින්වතුන් දන්නවා ගස්වල ඉන්නවා **රැහැයියා** කියල කෘමියෙක් අඟල් දෙක තුනක විතර. ඒ සතා සවස හතරට හතරහමාරට විතර සංගීතයක් ආරම්භ කරනවා. එක් කෙනෙක් ආරම්භ කරන කොට අනික් අයත් ඒකට එකතු වෙනවා. පුදුමාකාරයකට මහ කන් රිදවන රළු ගොරෝසු සංගීතයක්. මට සමා වෙන්න **මෙහෙමයි යන්නෙ ශබ්දය. ර්.ර්.ර්.. ශබ්දයෙන් ඊළඟට ඒක දිගට යන්නේ. ර්ර්ර්ර්ර්...ර්ර්** සමහර වෙලාවට මම කල්පනා කරනවා. 'රැහැයියා' කියන වචනය හැදුනේ කොහොමද කියලා. මම දන්නෙ නැහැ නිරුක්තියක්. මට හිතෙන්නෙ 'ර්' යන්න හොඳට 'ඇහෙන්න' සලස්වන සතා '**රැහැයියා**'. බලන්න ර් යන්නම නේ දිගටම තියෙන්නෙ. **රැහැයියගෙ මේ සංගීතය සමථයට මහ බාධාවක්. කන භාරගෙන යනවා. හැබැයි ඒක මතක් කරල දෙනවා 'කන් බෙරයක්' කියල එකක් තියනව කියලා. ලෝකයේ තියන පුදුම විදියේ සංගීත භාණ්ඩය තමයි කන් බෙරය.** කන් බෙරයක් තියන බව මතක් කරල දෙනවා මේ රැහැයියා. කන් බෙරයට මහ වදයක් වගේ.

ඉතින් සමථයට වදේ. **සමථයේ හතුරා විදර්ශනාවේ මිතුරා කරගන්න පුළුවන්, සති සම්පජඤ්ඤයෙන් යුතුව යෝනිසෝමනසිකාරය යෙදුවොත්.** මේ ශබ්ද දෙකක්, ර්..ර්.. දෙකක්, තුළ තියනවා අන්න නිවන, මනසිකාරය එතනට යෙදුවොත්. තණ්හා ගැටේට අහු වුණොත් තමයි මේක 'අමිහිරි සංගීතයක්' වෙන්නෙ. අන්තිමට 'ර්' යනු මාලාවක් විතරයි ඒක තුළ. **විදර්ශනා භාෂාවෙන් කියනවා නම් ඝන සංඥාවෙන් මිදිලා රාසි සංඥාව මතු කරගන්න පුළුවන් හරියට සති සම්පජඤ්ඤය තුළ එතන එතනම මෙනෙහි කළොත්.** රැහැයියා අපට නිවන් ලබා දෙන සතෙක්, සමාධියට බාධාවක් වුනත්. 'ර්' කාරය තුළ තියනවා අපි කියාපු නිවන.

කෙසේ හෝ වේවා අපි මේ කෙටියෙන් කියන්නෙ. මට එකක් කියන්න බැරි වුණා. ඇස ගැන මම දීපු උපමා පරාදයි බුදුරජාණන් වහන්සේ ඉන්ද්‍රිය භාවනා සූත්‍රයේදී ඇස ගැන දක්වන උපමාවට. ඉන්ද්‍රිය භාවනා සූත්‍රය මැදුම් සඟියෙ අවසාන සූත්‍රය. මහ පුදුම සූත්‍රයක් ඒක. බුදුරජාණන් වහන්සේ ආනන්ද හාමුදුරුවන් ආමන්ත්‍රණය කරල දේශනා කරපු ඉන්ද්‍රිය භාවනා සූත්‍රයෙ[6] ඒකෙ සාරය හැටියට ගත්තොත් දක්වන්න තියෙන්නේ 'අනුත්තරා ඉන්ද්‍රිය භාවනා' උත්තරීතර ඉන්ද්‍රිය භාවනාව පිළිබඳව උපමා රැසකින් දක්වන්නේ. එතනදී බුදුරජාණන් වහන්සේ ඇස පිළිබඳව දක්වන උපමාවට අපි දැක්වූ උපමා පරාදයි. අර ශීඝ්‍රව මෙනෙහි කිරීම කියන එකට යෙදෙන උපමාව. **ඇස් ඇති කෙනෙක් කොයි තරම් වේගයෙන්ද ඇරගත්තු ඇස වහගන්නේ. වහගත්තු ඇස අරින්නේ, ඒ කියන්නේ ඇසිපිය හෙළන වේගයෙන් මෙනෙහි කරන්න කියන එකයි.**

බුදුරජාණන් වහන්සේගේ ඒ උපමාවට අපේ කඩු ආදී උපමා පරාදයි. ඇසිපිය හෙළන වේගයෙන් මෙනෙහි කරන්න කියල **ඇසෙන්ම උපමාවක්** බුදුරජාණන් වහන්සේ ඇස ගැන දුන්නා. කන ගැන කියනකොට බුදුරජාණන් වහන්සේ මෙහෙමයි දක්වන්නේ **කන පිළිබඳ උපමාවක්** දෙන්නේ. යම් සේ ශක්තිමත් පුරුෂයෙක් ඉතාමත්ම පහසුවෙන් අසුරක් ගහනවා. ඒ කියන්නේ මහපට ඇඟිල්ලයි මැදැගිල්ලයි එකතු කරලා ක්ෂණයකින් ගහන 'ක්ෂණයක්' හඟවන ශබ්දයක්නෙ.

එසේ ඇඟිලිවලින් ගහන අසුරක් ගසන්නේ යම් සේද, අන්න ඒ තරම් වේගයකින් මෙනෙහි කිරීම තුළින් යම් කිසි භික්ෂුවකට ශබ්දයක් ඇසුණහම මනාප බවක් හෝ අමනාප බවක් ඇති වෙනවා. එක්කො ඒ දෙකේ සංකලනයක් ඇති වෙනවා. ඒ අවස්ථාවේදී වහාම උපේක්ෂාවට ගන්න වේගයයි ඔය දක්වන්නෙ ඉන්ද්‍රිය භාවනා සූත්‍රයේ. එතකොට ඇසිපිය හෙලන වේගයෙන් ඇස පිළිබඳ කාරණය. කන පිළිබඳව බුදුරජාණන් වහන්සේ දක්වල තියන උපමාව අසුරක් ගහන වේගයයි. බලන්න පුදුමයි, ඒක කනට ඇහෙන එකක්.

ඊළඟට නැහැය. ඒකෙදිත් මජ්ඣෙ සූත්‍රය මතක් කරගත්තොත් නැහැය එක කොනක්, අනික් කොන ගඳ සුවඳ, ඝාන විඤ්ඤාණය මැද. ඝාන විඤ්ඤාණය අමතක කරමින් මේ මැහුම්කාරිය ගැටලනවා. ඒක හිතාගන්න පුළුවන්නෙ. දැන් යමක් ආඝ්‍රාණය කරනවා කියන්නෙ ඉඹිනවනෙ. ඉඹිනකොට ඇත්ත වශයෙන්ම මොකක්ද කරන්නෙ? සුවඳ කැවෙන වාතය නේද අපි ඇතුළට ගන්නෙ. වාතය තමයි 'වාහකයා' සුවඳ පිළිබඳව. අපි ආශාවෙන් ඇතුළට ගන්නේ අර සුවඳ මිශ්‍ර වාතයයි. ඒක අපට තේරෙන්නෙ නැහැ.

තව කථාන්තරයක් තියනවා සංයුත් සඟියේ සගාථක වග්ගයේ වන සංයුත්තයේ[7]. කෙටියෙන් කිව්වොත් කොසොල් රටේ ආරණ්‍යයක භික්ෂූන් වහන්සේ නමක් වන ලැහැබක වාසය කළා. උන්වහන්සේ පිණ්ඩපාතයෙන් පස්සේ ඇවිල්ලා පොකුණකට බැහැලා මොන හේතුවක් නිසා හෝ නෙළුම් මලක් ඉම්බා. මේක දැක්ක වන දේවතාවෙක්, දැකල දොස් කිව්වා. 'ඔබ මේ නෙළුම් මලක් ඉඹිනවා. ඔබ සුවඳ හොරෙක්ය' කිව්වා. 'ඔබ සුවඳ හොරෙක් කියලයි චෝදනා කළේ'. මේ භික්ෂූන් වහන්සේ කියනවා ''කොහොමද මම සුවඳ හොරෙක් වන්නෙ. මම මල කැඩුවෙත් නැහැ. මල ගත්තෙත් නැහැ.'' එතකොට පහදල දුන්නා දේවතාවා. සාමාන්‍ය කෙනෙක් මල කඩනවට මම එහෙම කියන්නෙ නැහැ. නමුත් ඔබ වහන්සේ ඉන්නෙ ඉතාමත්ම සියුම් විදියට සිත පිරිසිදු කරගනිමින්. එතකොට මේ සුළු පාපයකුත් මහ ලොකු හැටියට පේනවා. ඒකයි මම එහෙම කිව්වෙ කියල කිව්වහම උන්වහන්සේ දේවතාවට ස්තුති කළා. මලක් ඉඹගැනීම තුළ පවා ක්ලේශ තියන බවයි එයින් පෙනෙන්නේ. ඒක තුළ තියෙන්නේ මුළාවයි දිගටම යන්නේ අර

කියාපු මිරිඟුවේ මුළාව තමයි. **මලේ මේ දෙය තියනවා කියලා හිතාගන්නවා.**[8]

ඊළඟට දිව ගැන කියනකොට මජ්ඣිම සූත්‍රයේ දිව ගැන කියන්නේ මෙහෙමයි. දිව එක කොනක්, රස අනික් කොන. ජිව්හා විඤ්ඤාණය මැද. අපි නිදර්ශන කියන්න ගියොත් රස පිළිබඳ නිදර්ශන ඉස්සරට වඩා රස ඒවා දැන් ඇති. අපි ලේසියට ඉස්සර කියන්නේ අයිස්ක්‍රීම් එක හිම කිරම. සමහර විට හොඳ හැටි තුනපහ යෙදූ ක්ෂණික චිකන් කෑල්ල ඊට වැඩිය රහ ඇති. ඉතින් කෙසේ හෝ වේවා චිකන් කෑල්ල හරි, අයිස්ක්‍රීම් එකහරි, දැක්ක හැටියේ මොකක්ද වෙන්නේ. දිව අගට කෙළ උනනව නේද? **එතකොට කෙළ තමයි වාහකයා රසේ, වාතය සුවඳ ගෙන යන වාහකයා වගේ කෙළ ලෑස්ති වෙනවා පිළිගන්න රසය. කෙළ උනල ඉවරයි දිව අගට.** ඉතින් ඉක්මනට ඉක්මනට ගිජුව අරක ගිල දානවා. රස තෘෂ්ණාව කොයි තරම් බලසම්පන්නද කිව්වොත් බුදුරජාණන් වහන්සේ ඒක නිසයි පිණ්ඩපාත ප්‍රත්‍යවේක්ෂාවේ ධාතු මනසිකාර, පිළිකුල් මනසිකාර දීලා තියෙන්නේ. මේ ආහාරය පිළිබඳව ඊටත් වඩා මහ ප්‍රබල උපමා දීලා තියනවා. එක තැනක තියනවා '**රසතණ්හාය ගධිතො හදයං නාවබුජ්ඣති**[9]' රස තණ්හාවට ගිජු වුන කෙනා කවදාවත් හෘදය අවදි කරගන්නේ නැහැ නිවනට. ඊළඟට තියනවා මහ සංවේගජනක උපමාවක්. අහනකොට බය හිතෙනව ඒක.

සුත්ත නිපාතයේ නාළක සූත්‍රයේ මුනි ප්‍රතිපදාව ගැන කියනකොට බුදුරජාණන් වහන්සේ කෙටියෙන් කියනවා '**ඛුරධාරූපමො භව**[10]' ඒ කෙටියෙන් කියවෙන්නේ දැළිපිහි තලය උපමාවට ගන්න. දැළි පිහි තලයේ උපමාව මෙහෙමයි තියෙන්නේ. **බුදුරජාණන් වහන්සේ දීපු උපමාව - දිව කැපෙන උපමාවක්** මේ දීල තියෙන්නේ. දැළි පිහියක මී පැණි තවරනවා. මී පැණි කන්න ආස කෙනෙකුට දැළි පිහිය දෙනවා. එතකොට දිව කපාගන්නෙ නැතිව දැළි පිහිය ලොවින්න පුළුවන්ද? අන්න රස තෘෂ්ණාව පිළිබඳ තියන මහ සංවේගජනක උපමාවක්. ඒ තරම් සියුම් දෙයක් මේ රස තෘෂ්ණාව. නමුත් බුදුරජාණන් වහන්සේ එහෙම කියන්නේ මොකද, රස තෘෂ්ණාව ජය ගත්ත නිසා. අනිකුත් රහතන් වහන්සේලා පවා බුදුරජාණන් වහන්සේ ගැනයි

කියන්නේ. රස තෘෂ්ණාව ජය ගත්තු ආකාරය, කොයි තරම්ද කියතොත් ලෝකයාට මේ කාලෙ හිතාගන්න බෑ බුදුරජාණන් වහන්සේ ගැන සඳහන් කෙරෙන පාඨයක් තියනවා **'රසපටිසංවෙදී ඛො පන සො භවං ගොතමො ආහාරං ආහාරෙති නො ච රසරාගපටිසංවෙදී**[11] බුදුරජාණන් වහන්සේගෙත් අපගේ වගේම රස නහර ක්‍රියාත්මක වෙනවා. ඒවා මැරෙන්නෙ නැහැ රහත් වෙනකොට. රස පටිසංවේදී - රස දැනෙනවා. නමුත් රස රාගයක් නැහැ. **රසය දැනෙනවා, රස රාගයක් නැහැ.** මහ පුදුමයි. මේ කාලයේ ලෝකයාට මේක හිතාගන්නත් බැහැ. **එයින් අපට පේන්නේ දිව අගත් නිවන තියනවා.** ඒක යම් පමණකින් යෝගාවචරයාට අත්දකින්න පුළුවන් සතිසම්පජඤ්ඤයෙන් ආහාර ප්‍රත්‍යවේක්ෂාවෙන්, ඉතාමත්ම හෙමින් ආහාර ගන්නකොට යම් අවස්ථාවකදී තේරෙනවා චිකන් කෑල්ලෙත් නැහැ රස. **ඒකටත් 'චික්' කියන්න පුළුවන්.** ඊළඟට අයිස් ක්‍රීම් එකෙත් නැහැ රස. **මේ දෙක එකතු වෙන තැන ඉතා සුළු ක්ෂණයකයි රසය ක්‍රියාත්මක වෙන්නෙ.** මේ කෙළ ගැන කියාපු කථාව බලන්න, පුදුම විදිහට බුදුරජාණන් වහන්සේ මේකට දීපු උපමාව ගැලපෙන හැටි. ඇහැ ගැන කියනකොට ඇහැට ගැලපෙන උපමාව, කන ගැන කියනකොට කනට ගැලපෙන උපමාව. ඔන්න ඊළඟට දිව ගැන කියපු උපමාව බලන්න. **යම් සේ ශක්තිමත් පුරුෂයෙක් ඉතාමත්ම පහසුවෙන් දිව අගට කෙළිත්තක් අරගෙන 'තූඃ' ගාල දාන්නේද** අන්න ඒ වගේ ඉක්මණින්ම රස තෘෂ්ණාව ඇති වුන හැටියේ මනාප බව ආදිය අහක් කරලා උපේක්ෂාවට හිත ගන්න කියල බුදුරජාණන් වහන්සේ වදාරණවා. ඒ උපමා ඉතාමත් පුදුමයි. දැන් ඇස කන නාසය දිව ගැන කිව්වා, ඊළඟට අපි යමු කයට.

කය ගැන කියනකොට මජ්ඣෙ සූත්‍රයට අනුව කය එක කොනක් ඵොට්ඨබ්බ කියල කියන්නේ පින්වතුනි ස්පර්ශ කළ යුතු දේ. මොකක් හෝ වේවා කයේ අරමුණ තමයි ඵොට්ඨබ්බය කියන එක. කය එක කොනක් ස්පර්ශ කළ යුතු දේ දෙවෙනි කොන. මැද තියෙන්නේ කාය විඤ්ඤාණය. **එතෙන්දි කයත් ස්පර්ශ කළ යුතු දෙයත් නිසාමයි කාය විඤ්ඤාණය පැන නගින්නේ. නමුත් තණ්හා මැහුම්කාරිය ඔය දෙක ගැටලනවා.** දිගටම හිත ඇතුළෙ තියාගන්න මේ උපමා ටික. ඒකයි මම කිව්වෙ කල්පනාවෙන් ඇහුම්කන් දෙන්න කියලා. එතකොට වැඩිය

කියන්න ඕන නැහැ. එකකට එකක් ආශ්‍රයෙන් 'ඒ වගත් මෙසේම' කියල හිතාගන්න. කයයි පැහැසිය යුතු - ස්පර්ශය කළ යුතු - දෙයයි ඔය දෙක ගැටලනවා. එතෙන්දි තමයි අපි ඇත්ත වශයෙන්ම ස්පර්ශ කියලා කියන්නේ. කයට ස්පර්ශ කරන දේ නෙ. ඒක නිසා තමයි බුදුරජාණන් වහන්සේ ස්පර්ශය ආහාරයක් හැටියට දැක්වූවේ. 'චත්තාරො ආහාරා'[12] ආහාර හතරක් තියනවා සත්ත්වයින්ගේ පැවැත්මට. කබලිංකාර ආහාර කියල කියනවා, ගොරෝසු ආහාර. ස්පර්ශය දෙවෙනි ආහාරයයි. මනෝ සංචේතනා ආහාර - සිතින් කරන සිතිවිලි. අවසානයේ විඤ්ඤාණ ආහාරය. එතන ගැඹුරු ධර්ම විග්‍රහයක් තියෙන්නෙ. නමුත් ඒකෙදි ස්පර්ශය ගැන බුදුරජාණන් වහන්සේ දීපු උපමාව අර වගේම මහ සංවේගජනක උපමාවක්. ඒක **පුත්තමංස සූත්‍රයේ** තියෙන්නේ ඔක්කොම නොකිව්වත් මෙහෙමයි උපමාව විස්තර වෙන්නේ. 'නිච්චම්මා ගාවී' කියන්නේ පින්වතුනි හම ගහපු ගව දෙනක්. හම ගහපු කිව්වට අපට හිතාගන්න තියෙන්නේ මැරෙනකම් හම ගහපු නොවෙයි. අපි හිතමු ගව දෙනකගේ ශරීරයේ කොටස්වල හම ගිහිල්ලා තියනවා. එතකොට ඒ හම ගිහිච්ච එළදෙන ගැනයි බුදුරජාණන් වහන්සේ කියන්නේ. ඒ එළදෙන බිත්තියක් ළඟ හිටියත් බිත්තියේ ඉන්න තාක් සතුන් පහත් වෙලා අර එළදෙනගේ තුවාලය කනවා. ගහක් ළඟ හිටියත් ගහේ ඉන්න සත්තු ඇවිල්ලා එළදෙන කා දමනවා. වතුරට බැස්සොත් වතුරේ ඉන්න මාළු අර එළදෙන කා දමනවා. එළිමහනේ හිටියොත් අහසේ ඉන්න කුරුල්ලො ඇවිල්ලා කා දමනවා. යම් යම් තැනක අර 'නිච්චම්මා ගාවී' ඒ හම ගහපු ගව දෙන ඉන්නවා නම්, ඒ ඒ තැන සත්තු ඒ ගව දෙන කා දමනවා. මේකෙ තියන ගැඹුර හිතල බලන්න. අප මේ ස්පර්ශයේ රස විඳින්නේ කොහොමද, ඒකෙදි මෙහෙම හිතාගන්න. ස්පර්ශය ළඟට තියෙන්නේ වේදනාව නේ, ටිකකට මේ වාක්‍යය ගැන හිතන්න. **'හම තිබුනහම දැනෙන වේදනාවත් හම ගියහම දැනෙන වේදනාවත් අතර වෙනස'**. අපි හිතමු යම් තැනක් තුවාල වුණා. දැන් ලෝකයේ අනික් දේවල් තිබියේවා. විල්ලූද රෙද්ද ඉතාම මොළොක්නෙ. **විල්ලූද රෙද්දක් තුවාලයක් ළඟට කිට්ටු කළහම සැපයක් දැනෙනවද?** මොකද වෙලා තියෙන්නේ? මේකටම තව ටිකක් එකතු කරමු.

අර්ථ වශයෙන් බුදුරජාණන් වහන්සේ මුළු මහත් ශරීරයම වණයක්

හැටියට, තුවාලයක් හැටියට හඳුන්වනවා[13]. තුවාලයක් නම් මුළු මහත් ශරීරයම - හම කියන්නේ මොකක්ද කියල හිතල බලන්න. හම කියන්නේ තුවාල වෙළුමක්. **මේ තුවාල වෙළුම සරසගන්න නේද මේ ලෝකයා මෙච්චර වියදම් කරන්නේ. මේක පාට කරගන්න, තුවාල වෙළුම හැඩ වැඩ දාගන්නයි මේ ලෝකයා විශේෂයෙන්ම ස්ත්‍රී පක්ෂය වෙහෙසෙන්නේ.** තුවාල වෙළුමක් මේක. පොඩ්ඩක් හම ගියහම ඉවරයි වැඩේ. උපමා කියන්න ඕන නැහැනෙ මේ පින්වතුන්ට. හම තිබුණහම දැනෙන වේදනාවත් හම ගියහම දැනෙන වේදනාවත් ගැන හිතාගන්න. බුදුරජාණන් වහන්සේ දීපු ඒ උපමාව හරිම ගැඹුරුයි. නිච්චම්මා ගාවී' කියන උපමාව. අපි යමු බුදුරජාණන් වහන්සේ ඉන්ද්‍රිය භාවනා සූත්‍රයේ දෙන උපමාවට ස්පර්ශය පිළිබඳ මනාපයක් අමනාපයක් ඇති වුණහම කොයි තරම් ශීඝ්‍රයෙන් ඒක ඉවත් කරලා සිත උපේක්ෂාවෙහි පිහිටවනවද? උපේක්ෂාවේ සිත පිහිටුවන අවස්ථාවේ සංඝයා වහන්සේලා විසින් යෙදිය යුතු පාඨයකුත් එතන තියනවා. උපේක්ෂාවට හිත ගන්න සංඝයා වහන්සේලා පාවිච්චි කරන ඒ විදර්ශනාත්මක හැඟීම මෙහෙමයි. මට මේ මනාප බවක් ඇතිවුණා. අමනාප බවක් ඇති වුණා. මනාප අමනාප දෙකේ මිශ්‍රණයක් ඇතිවුණා. එය සංඛතයි, ඕළාරිකයි. පටිච්ච සමුප්පන්නයි. ඒක ගොරෝසුයි. ඒ වගේම සකස් කරගත්තු දෙයක් පටිච්ච සමුප්පන්න දෙයක්.

ඊළඟට කියනවා '**එතං සන්තං එතං පණීතං යදිදං උපෙක්ඛා**'. මේකයි ශාන්ත, 'මේකයි ප්‍රණීත', එනම් උපේක්ෂාව, කියලා එහෙම හිතල තමයි ශීඝ්‍රයෙන්ම උපේක්ෂාවට ගන්නේ. ඒක හිතාගන්න අනෙක් ඒවටත් ඒකයි න්‍යායය. උපේක්ෂාවට ගන්න ශීඝ්‍රයෙන්ම. කය පිළිබඳවත් අර විදියටමයි. 'එතං සන්තං එතං පණීතං යදිදං උපෙක්ඛා'. මේකයි ශාන්ත, මේකයි ප්‍රණීත, එනම් උපේක්ෂාව කියලා. එහෙම හිතල තමයි ශීඝ්‍රයෙන්ම උපේක්ෂාවට ගැනීම. ඒකට ඉන්ද්‍රිය භාවනා සූත්‍රයේ දෙන උපමාව මේකයි. **යම් කිසි ශක්තිමත් පුරුෂයෙක් වක් කළ අතක් දික් කරන්නේද, දික් කළ අතක් වක් කරන්නේද ඒ සැණින්.** මේ උපමාව කොතෙකුත් ධර්ම සාහිත්‍යයේ සඳහන් වෙනවා. ඍද්ධි පහළ වෙලා එක තැනක ඉඳලා අනික් තැනට යනකොට උපමාවට දෙන්නේ. ඒ තරම් ශීඝ්‍රයෙන් පුළුවන් ශක්තිමත් පුරුෂයකුට අත හකුළන්න. **කය ගැන**

**කියනකොට කයෙන්ම උපමාවක්** ඔන්න බුදුරජාණන් වහන්සේ දුන්නා. ඊළඟට එනවා මනසට. මනස ගැන කාලය ඉතුරුකර ගන්නයි අර ටික කෙටියෙන් කිව්වෙ. **මනස තමයි තණ්හා මැහුම්කාරියගේ බරපතළම ගැටළු තැන. එතන තමයි අන්තිම තුරුම්පුව මාරයාගේ. විද්‍යාඥයත් දාර්ශනිකයත් ලෝක සත්ත්වයා හැම දෙනෙක්මත් හිරවෙලා තියෙන්නේ මෙතන.** එතනදීත් අපි ඉස්සෙල්ලාම ගනිමු. මජ්ඣෙ සූත්‍රයේ කොන් දෙක. මනස එක කොනක්. 'ධම්මා' අනික් කොන. ධම්මා කියන්නේ බුද්ධ ධර්මය ආදිය නොවේ. මෙතන 'ධම්ම' කියන්නේ මනසට එන අරමුණු. මනස එක කොනක්. 'ධම්මා' මනසට එන දේ අනික් කොන. ඒ කොන් දෙක ගැටලන්නේ තණ්හා මැහුම්කාරිය. එතෙන්දි මහ ගැඹුරු කාරණයක් කියන්න තියනවා. මනසිකාර කියන වචනයට අපි ආයිත් එමු. පාලි භාෂාවේ මනසිකාර කියන එකේ නිරුක්තිය වන්නේ 'මනසි' කියන්නේ ආධාර විභක්ති පදයක් - මනස තුළ. මනසිකාරය කියන්නේ 'මනස තුළ කෙරෙන ක්‍රියාව'. එතකොට මනසිකාරය කියල ගත්තහම මනස තුළ ක්‍රියාවක් කෙරෙනවා. ඒ මනස තුළ කෙරෙන ක්‍රියාව අපි යොමු කරනවා යම්කිසි දෙයකට. ඒක ඉතා ගැඹුරු කාරණයක්. මනසිකාරය ගැන කියූ නිසා මෙයට කලිනුත් කියූ තව සූත්‍රයක් මේකට එකතු කරමු. කලින් මේක විග්‍රහ කරල තියනවා. නම කිව්වහම අහපු කට්ටියට තේරුම්ගන්න පුළුවන් 'කිංමූලක සූත්‍රය'[14] ඒකත් මහ ආශ්චර්යවත් සූත්‍රයක්.

බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලාගෙන් අහනවා මහණෙනි, අන්‍ය තීර්ථක බ්‍රාහ්මණයින් පරිබ්‍රාජකයින් නුඹලාගෙන් මේ විදියේ ප්‍රශ්න මාලාවක් ඇහුවොත් කොහොමද උත්තර දෙන්නේ කියලා. සංඝයා වහන්සේලා කියනවා, අනේ භාග්‍යවතුන් වහන්ස අපට නම් තේරෙන්නේ නැහැ. ඔබ වහන්සේම කිව්වොත් මිසක්.

බුදුරජාණන් වහන්සේ ඒ ප්‍රශ්න මාලාවම වදාරනවා. මහණෙනි එහෙම ඇහුවොත් මෙන්න මෙහෙම කියන්න කියලා. ඒ තරම් ගැඹුරු කාරණා ටිකක් මෙතෙන්දි ඉදිරිපත් කරන්නේ. ඒ සූත්‍රය අපි කලින් විස්තර කරල තියනවා. 'කිංමූලක සූත්‍රය'. ඒකෙ ප්‍රශ්නය තියෙන්නෙ මෙහෙමයි. 'කිං මූලකා සබ්බෙ ධම්මා' හැම දෙයකම මුල කුමක්ද? 'කිං

සමභවා සබ්බෙ ධම්මා' කුමකටද ඒක හම්බ වෙන්නේ? හැම දෙයකම හටගැන්ම ප්‍රභවය කුමක්ද? 'කිං සමුදයා සබ්බෙ ධම්මා' කුමක්ද එය පැනනගින තැන. ඒ තුන විතරක් ගනිමු. ඒකට උත්තර දිය යුත්තේ - ඡන්දමූලකා ආවුසො සබ්බෙ ධම්මා' ඡන්දයයි හැම දේකම මුල. 'ඡන්ද' කියන එක අපි හැඳින්වූයේ තණ්හාවේම ළා පාට වශයෙන්. අඳුනගන්නත් බැරි ළා පාට. අපේ සම්මත විවරණ ක්‍රමය අනුව. 'තණ්හාව හොඳ නැහැ. හැබැයි කුසලච්ඡන්දය හොඳයි.' නමුත් ඒකත් අත අරින්න ඕන.

ඒක නිසා තමයි ධර්මයේ සඳහන් වෙන්නේ '**ඡන්දං නිස්සාය ඡන්දං පජහථ**' කියලා මහා පුදුම මැදුම් පිළිවෙතක් ඒක. ඡන්දයම උපකාර කරගෙන ඡන්දය අතහරින්න. අවසාන අවස්ථාවේදී ඒකත් අල්ලනවා. කුසලච්ඡන්දය හොඳයි. ඒක නැතුව බැහැ. සමථ විදර්ශනාවන්ට ආසාව තියෙන්න ඕන. නමුත් ඒකත් අතහරින්න වෙලාවක් එනවා අවසාන අවස්ථාවේදී. එයින් අපට පේනවා ඡන්දයයි මුල හැම දේකටම. හිතල බලන්න කොහේවත් නැති ප්‍රශ්නයක්. සමහර විට අපට හිතට එන්නේ මොන ආකාරයකින් හරි, සියුම් අන්දමින් හරි, මේ ඡන්දයයි යන්නේ. ඊළඟට ඒ දේ අපට හම්බ වෙන්නේ මනසිකාරයෙන්. 'මනසිකාර සම්භවා'. නමුත් ඒක පැන නගින්නේ ස්පර්ශයෙන්.

දැන් මෙතෙන්දි මට ආයෙමත් සමාව ඉල්ලන්න වෙනවා. මගේ වචන වරදින්න පුළුවන්. මට සමහරුන්ගේ උපකාරත් ලබා ගන්න සිද්ධ වෙනවා. පරිගණක ශාස්ත්‍රය දන්න අයගෙන්. මම ඕව ගැන වැඩිය දන්නෙ නැහැ. හැබැයි උපමාවලට ගන්නවා සමහර වෙලාවට දන්නෙ නැති වුනාට. ඡන්දය ගැන කිව්වා. මනසිකාර ගැන කිව්වා. ඵස්ස ගැන කිව්වා. අපි කියන එක හරිද බලන්න. මට නම් පේන හැටියට පරිගණක යන්ත්‍රය තුළ ඔය ඔක්කොම තියනවා. **ඡන්දය තමයි 'මූසිකයා' - 'මවුස්' කියල කියන්නේ. මූසිකයා හොරෙන් ක්‍රියා කරන්නේ. පේන්නෙත් නැහැ. මූසිකයා ක්‍රියා කරනකොට මොකක්ද වෙන්නේ - 'කර්සර්' එක දුවනවා.** ඒක තමයි මනසිකාරය. එතකොට ඡන්දය මුල. හැංගිලා මොකක්ද කරන වැඩේ. ඔන්න මනසිකාරය දුවනවා - කර්සර් එක. මනසිකාරයට තමයි හම්බ වෙන්නෙ.' මොකක්ද හම්බ වෙන්නෙ. **ආහාර ලේඛනය - 'මෙනු එක'**. ඒ වගේ තමයි ඵස්ස සමුදය. එතන ඉඳල

තමයි රස විඳින්නෙ පරිගණක යන්ත්‍රයෙ. මේ පරිගණක උපමාවත් වැරදි නම් හරිගස්ස ගන්න. මේ කොයි එකෙනුත් කිව්වේ අපි පුළුවන් තරම් ප්‍රායෝගික කරන්න ඕන නිසා. බලන්න ලෝකයේ තියන ඒ ද්‍රව්‍යවලින් පෙන්නුම් කරන්නේ අපේ චිත්ත සන්තානයේ තිබෙන දේවල්මයි.

අපි තේරුම්ගන්නෙ නැහැ. ඒක විජ්ජාව හෝ වේවා අවිජ්ජාව හෝ වේවා. ඉතින් මේ ඩිංග ගන්න. එයින් අපට පේනවා 'ඡන්දමූලක - ඡන්දයයි මුල. අපට ඒක තේරෙන්නෙ නැහැ. බුදුරජාණන් වහන්සේ පෙන්නා දෙන තුරු ලෝකයා දන්නෙ නැහැ. අපි හැම තිස්සෙම වගේ ගැඹුරු දේශනාවක් කෙළවර කරන්නේ ඉතාමත්ම සරල, කවුරුත් දන්න ධම්මපද ගාථා දෙකකින්. මෙතෙන්දි ඒ ගාථා දෙක මතක් කරන්න වෙනවා.[15] ඒ ගාථාවල අවශ්‍ය ටික '**මනො පුබ්බංගමා ධම්මා. මනො සෙට්ඨා මනොමයා**' ඔය ටික තමයි මෙච්චර කාලයක් අපට අටුවා සම්ප්‍රදායේ වෙන විදියකටයි තේරුම් කරන්නේ. 'මනො පුබ්බංගමා ධම්මා' කියන්නේ පින්වතුනි. මනස එක පැත්තකින් තියනවා, ධම්ම අනික් පැත්තෙන් තියනවා මේ දෙකෙන් මනසයි පෙරටු වෙන්නේ, මනස අරමුණට පෙර තියෙන්නේ. 'මනො සෙට්ඨා' ඒ දෙකෙන් මනසයි ශ්‍රේෂ්ඨ, ප්‍රධාන. ඊළඟට '**මනොමයා' අරමුණ මනසින්ම සකස් වුන දෙයක්. ඒකනෙ මනසිකාරය කියන්නෙ. මෙනෙහි කිරීම.** අපට තේරෙන්නෙ නැහැ ඒක. **අරමුණ හිතෙන්ම හදාගත්තු දෙයක්. එතකොට හිතෙන්ම හදාගන්න දෙයක් එක්කයි මේ හරඹෙ කෙරෙන්නේ.** මොන තරම් සියුම් දෙයක්ද තණ්හා මැහුම්කාරියගේ ගැටලෑම. අර ටේබල් ටෙනිස් ක්‍රීඩාවේදී වගේ ඉක්මනින් මනසිකාරය යෙදීමෙන් මෙනෙහි කිරීමෙන්මයි මෙනෙහි කිරීම තුළින්මයි ඒක අල්ලගන්නෙ. **මෙනෙහි කිරීම පිළිබඳ රහස හඳුනාගන්නෙත් ශීඝ්‍රව යෝනිසෝ මනසිකාරයේ යෙදීමෙන්.** එතන එතනම මෙනෙහි කිරීම තුළින්. හිතාගන්න බැරි විදියෙ දෙයක්.

යම් අවස්ථාවක අර මනසිකාරයේදී සිතුවිල්ලක් පැන නැගුණු තැන - ඒකත් ධර්මයෙන්ම කිව්වොත් මෙන්න මෙහෙම පාඨයක් තියනවා - සමහර සූත්‍රවල එන පාඨ අටුවාවලත් හරියට තේරුම් නොගත් තැන් තියනවා '**දිස්වා ආයතනුප්පාදං සම්මා චිත්තං විමුච්චති**[16]'

යම් අවස්ථාවක සළායතනයන්ගේ උපත දැක්ක නම් ඒ වෙලාවේ හිත මිදෙනවා කියන්නේ මොකද? අර සළායතනයන්ගේ උපත පේන්නෙ නැති තරම් ශීඝ්‍රයෙන් සිද්ධ වෙනවා. ඉතාම ශීඝ්‍රයෙන් සිද්ධ වෙන්නෙ මනසත් අරමුණත් අතර. ඒක තෝරගන්න බැහැ. හැම කෙනෙක්ම හිතන්නේ අරමුණ ඉස්සරහින් තියනවා අරමුණ නැතිව අපි කොහොමද හිතන්නෙ කියලා. **නමුත් 'මනසිකාර' වචනයෙන් තේරෙනවා, මේ අරමුණත් හිතෙන්ම හදාගත් එකක් බව.** ඒකයි 'මනෝමයා' කිව්වෙ. ඒ තත්ත්වය යම් අවස්ථාවක තේරෙනකොට ඔන්න විඤ්ඤාණ මායාව හෙළි වෙනවා. මේ විඤ්ඤාණ මායාකාරයානේ මේක ගැටලන්නෙ. **මේ මායාව තුළ තියෙන්නේ මනසත් මනසින්ම හදාගත් ධර්මත්.** එතනත් අර මුවාගේම වගේ දෙයක් අන්තිමට කෙරෙන්නේ. ඒක තේරෙන්නෙ නැහැ. අන්තිමට යම් අවස්ථාවක යෝනිසෝමනසිකාරය ඉතාමත්ම ශීඝ්‍රයෙන් යෙදුවොත්, ඒක තේරෙනවා.

ඒකට අපි උපමාවක් දෙන්න ඕන නැහැ. අපි දෙන උපමා පරාදයි. ඒකට බුදුරජාණන් වහන්සේ දෙන උපමාව පුදුමයි - මනස පිළිබඳව. 'යම් සේ මහණෙනි, මුළු දවසක් රත් කළ යකඩ කටාහයකට යම්කිසි කෙනෙක් වතුර බිංදු දෙකක් තුනක් උඩ සිට දානවා. මහණෙනි ඒ වතුර බිංදු වැටීම හෙමින්. නමුත් ඒක වියළී යාම ඊට වඩා ක්ෂණිකයි. ටිකකට හිතන්න උඩ ඉඳල වතුර බිංදු දෙක තුනක් දානවා. **ඒ වතුර බිංදු වැටෙන වේගය ඒක දිහා බලන් හිටියොත් ඒක පිච්චෙනවා පේන්නෙ නැහැ. කොයි තරම් ක්ෂණිකවද කියලා.** මේ උපමාවට සරිලන උපමාවක් අපට කියන්න බැහැ. දවසක් රත් වෙච්ච යකඩ තලියකට වතුර බිංදු උඩින් දානකොට හෙමින් බිංදුව වැටෙන්නෙ. වැටෙනවත් එකක්ම පිළිස්සෙනවා.

අන්න ඒකයි. ඒකෙ හැංගිලා තියෙන්නෙ මනසත් ධර්මයනුත්. නමුත් ඒක පවා යෝගාවචරයා යම් අවස්ථාවක අවබෝධ කර ගත්තොත් යොනිසෝ මනසිකාරය ඉතාම ශීඝ්‍රයෙන් යෙදීමෙන් **ඔන්න වැටහෙනවා ආයතන උපදින හැටි. මේ දෙක එකතු වෙන හැටි. විඤ්ඤාණය හටගන්න හැටි. විඤ්ඤාණය හටගැනීම දැකීම තමයි පටිච්ච සමුප්පාදය දැකීම. 'චක්ඛුංච පටිච්ච රූපෙච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං'**

මතක් කර ගන්න 'පටිච්ච උප්පජ්ජති' ඇසත් රූපයනුත් නිසා චක්ඛු විඤ්ඤාණය උපදිනවා. බුදුහාමුදුරුවෝ දේශනා කළා විඤ්ඤාණය මායාවක් කියලා. ඒකනෙ කිව්වෙ 'මජ්ඣෙ මන්තා න ලිප්පති. යො උභන්තෙ විදිත්වාන' කොන් දෙක හරියට තේරුම් අරගෙන මැද නොඇලෙන්නෙ මොකද? ප්‍රඥාව තියනවා. තේරුම්ගත්ත විඤ්ඤාණ මායාව. අපි කොතෙකුත් කියල තියනවා මැජික් එකක් - විජ්ජාවක් - ඇතුළෙ ඉඳල දැක්කොත් මැජික් එක නැති වෙනවානෙ. **අන්න ඒ අවස්ථාවෙ තමයි ඒක සිද්ධ වෙන්නෙ. කොහොමද අන්න ඒ අවස්ථාවේ යෝනිසෝමනසිකාරය - අර ප්‍රඥාවේ බීජය - ප්‍රඥාවක් හැටියටම ඵල දෙනවා. ප්‍රඥාව තුළ විඤ්ඤාණයට තැනක් නැහැ.**

ඒකයි බුදුරජාණන් වහන්සේ වදාළේ '**පඤ්ඤා භාවෙතබ්බා විඤ්ඤාණං පරිඤ්ඤෙය්‍යං**[17]' කියල. විඤ්ඤාණයත් ප්‍රඥාවත් අතර වෙනස දක්වන්නේ එහෙමයි. විඤ්ඤාණය හරියට පිරිසිඳ දැනගන්නට ඕන. පිරිසිඳ දැන ගන්න නම් 'පඤ්ඤා භාවෙතබ්බා' ප්‍රඥාව වැඩිය යුතුයි. **ප්‍රඥාව ඉහළටම වැඩූ අවස්ථාවේ විඤ්ඤාණයේ හොරේ අහු වෙනවා.** අහුවෙන්නේ අන්න අර විදිටයි. **ආයතනයන් හටගන්නවා එතන එතනම දකිනවා. ආයතනයන් හටගැනීම දකිනවාත් එක්කම නිරෝධය ඉබේටම සිහිවෙලා ඉවරයි - හටගන්න දෙයක් නිරුද්ධ වෙන බව. ඒ නිරෝධය ප්‍රත්‍යක්ෂ කළා කියන්නේ ඒකයි. ඒ වෙලාවෙ අන්න ශාන්ත ප්‍රණීත නිවන 'එතං සන්තං එතං පණීතං' කතාව කිවුවෙ ඒකයි.** හුඟක් දේවල් ඉක්මනට කිව්වා. පින්වතුන් මේවා හරියට ධාරණය කරගත්ත නම්, ඊළඟට අපි තව ටිකක් කියනවා ඔතන ඉඳලා.

ඊළඟට එන ප්‍රශ්නය, දැන් අපි කිව්වානේ ධම්මාරම්මණය ගැන. අපි කිව්වනේ යෝගාවචරයාට ඒක නැතිවම බැහැ කියලා. නමුත් පොතපතේ හොඳට සඳහන් වෙනවා ඉතාමත්ම වටිනා සූත්‍රයක් තියනවා, ඒක විග්‍රහ කිරීමේදි අලගද්දූපම සූත්‍රය[18] කියලා. ඒකෙදි බුදුරජාණන් වහන්සේ පහුරේ උපමාව දීල තියනවා. '**කුල්ලූපමං වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි**' බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා මම මේ මුළුමහත් සද්ධර්මයම පහුරකට උපමා කරනව කියලා. ඒක මේ විදියටයි සඳහන් වෙන්නෙ. යම් කෙනෙක් දීර්ඝ මාර්ගයක යන කොට දිය

කඩක් හමු වෙනවා. නැවක් නැහැ, පාලමක් නැහැ. කරන්න දෙයක් නැති නිසා අරහෙන් මෙහෙන් ගස්වලින් අතු ටිකක් එකතු කරලා වැල් වලින් බැඳලා ඒකත් උපකාර කරගෙන අතින් පයින් පහුර පදවාගෙන එහා පැත්තට යනවා. එහා පැත්තට ගියාට පස්සෙ පහුරෙන් වැඩක් නැහැ ඒක පා කරල හරිනවා. **'කුල්ලූපමො මයා භික්ඛවෙ ධම්මො දෙසිතො නිත්ථරණත්ථය නො ගහණත්ථාය'** මේ ධර්මය දේශනා කළේ හුදෙක් එතර වීම සඳහායි. කර ගහගෙන යාම ග්‍රහණය කිරීම සඳහා නොවේ කියලා දේශනා කරනවා. ඒ එක පැත්තකින් කියාපු එක. ඒ එක්කම කියනවා ඒ උපමාව හරියට දන්නව නම් **'ආජානන්තෙහි ධම්මාපි වො පහාතබ්බා, පගෙව අධම්මා' මේ මං කියාපු උපමාව හරියට තේරුම්ගත්ත නම් ධර්මයනුත් අතහරින්න ඕන. අධර්මයන් ගැන කවර කථාද?**

ඒක කෙටියෙන් තේරුම්ගන්න තව උපමාවක් කියනවා නම් මේ පින්වතුන්ට විස්තර කරල දීල තියනවා කලිනුත් 'රථවිනීත' සූත්‍රයේ[19]' තියන රථ හතේ උපමාව. දැන් මේ කාලේ සහාය දිවීම වගේ උපමාවක්. ඒකෙදි කියවෙන්නෙ හදිසි ගමනක් යන්න, කොසොල් රජ්ජුරුවෝ සැවැත් නුවර සිට සාකේත නුවරට යන්න. ඒ කාලේ අශ්වයින්ට වෙහෙස නිසා අශ්ව රථ හතක් සූදානම් කරල තියනවා. පළමු රථයෙන් ගියා. අශ්වයින්ට වෙහෙස නිසා ඒකෙන් අනික් එකට මාරු වුණා. දෙකෙන් තුන්වෙනි එකට, තුනෙන් හතරට, හතරෙන් පස්වෙනි රථයට ඔහොම ගිහිල්ල හත්වෙනි රථයෙන් ගිහිල්ලා බැහැලයි සාකේත නුවරට යන්නේ. ඒකට දෙන උපමා ටික විසුද්ධි හත. සීල විසුද්ධිය හුදෙක් දිට්ඨි විසුද්ධිය සඳහා, දිට්ඨි විසුද්ධිය හුදෙක් චිත්ත විසුද්ධිය සඳහා, ඔය විදියට විසුද්ධි පරම්පරාවක් දක්වලා අවසාන විසුද්ධිය තමයි ඤාණදස්සන විසුද්ධිය. ඤාණදස්සන විසුද්ධියත් අත හරිනවා. මොකද, නිවන හඳුන්වන්නේ අනුපාදා පරිනිබ්බානය නමින් කිසිවක් අල්ලා නොගන්න නිවන. මහ පුදුමයි කිසිම ධර්මයක නැහැ එහෙම එකක්. **අතහැරීම තමයි නිවන.**

අපි ඒ ටික පෙන්නන්නයි අපේ දේශනාවල පොත්වල වචන දෙකක් මතු කරල පෙන්නුවේ. මේ ධර්මය වචන දෙකකින් දැක්වූවා. **ප්‍රායෝගික, සාපේක්ෂක. ප්‍රායෝගික නිසා ප්‍රයෝජනයට ගන්නවා**

**සාපේක්ෂක නිසා අතහරිනවා.** එකක් අනික සඳහා පමණයි. දැන් ආයිත් මට කියන්න වෙනවා අලුත් උපමාවක්. මේ පින්වතුන් අහල නැති විදියේ උපමාවක් වෙන්න පුළුවන්. මගේ වචනවල අඩුපාඩුවක් තියනවා නම් කියන්න. දැන් සහාය දිවීම කියල එකක් තියනවා. කඩින් කඩ ධාවකයෙක් දුවනවා. සහාය දිවීම් පිල් දෙකක් තියනවා කියලා හිතාගන්න - මාර පිලයි බුද්ධ පිලයි. මාර පිලේ කවුද දුවන්නේ කියල අපි බලන්නෙ නැහැ. බුද්ධ පිලේ ධාවකයන් හතරදෙනෙක් දුවනවා. ක්‍රීඩකයින් හතරදෙනෙක්. මේ විදියේ සහාය දිවීමකදී යම් කිසි උපකරණයක් උපකාර වෙනව. යෂ්ටිය කියලා කියන්නේ. මේ යෂ්ටිය යන්න ඕන දිනුම් කණුව දක්වා. එතකොටයි ඒ පිල දිනන්නෙ. හිතාගන්න **පළමුවෙනි ධාවකයා දුවනවා. ජීවිත පරිත්‍යාගයෙන් දුවනවා. හතිදාගෙන දුවනවා. දුවල දුවල ගිහිල්ලා දෙවැන්නට අර යෂ්ටිය දෙනවත් එක්කම මැරිල වැටෙනවා. දෙවැන්න බලන්නෙ නැහැ අරය මැරුණද කියලා. ඒක අරගෙන මුළු වෙර දාල දුවගෙන දුවගෙන ගිහිල්ල තුන් වෙනියට යෂ්ටිය දෙනවා. දෙනවත් එක්කම දෙවෙනියත් මැරිල වැටෙනවා. ඊළඟට තුන්වැන්නා ඒක අරගෙන දුවල දුවල ගිහිල්ල හතර වෙනියට දෙනවා. හතරවෙනියට දෙනවත් එක්කම අරයත් මැරිල වැටෙනවා. හතරවෙනියත් ඒක අරගෙන දිනුම් කණුව ළඟට ගිහිල්ලා දිනුම් කණුවට යම්තම් යෂ්ටිය දෙනවත් එක්කම එයත් මැරිල වැටෙනවා. කාටද තෑග්ග? කවුද දිනුවෙ? යෂ්ටියද? කවුද දිනුවෙ? තෑග්ග ගන්න කෙනෙක් නැහැ. නිවනත් එහෙමයි කියල හිතාගන්න.** කාටත් තියෙන්නේ ආත්ම අනාත්ම ප්‍රශ්නයනෙ, කවුද නිවන් දකින්නේ? ඔය ටික බුදුරජාණන් වහන්සේ ලස්සනට කියනවා. මට උච්ඡේදවාදියෙක් කියල චෝදනා කරනවා මේ බමුණෝ. අපිටත් එහෙම කියනවා. අපි දේශනා කරන ධර්මය ගැන. නමුත් බුදුරජාණන් වහන්සේ ඒ උච්ඡේදවාදියෙක් කියල දක්වන දෝෂ දර්ශනයට පිළිතුරු දෙන්නේ මෙහෙමයි. **'එදත් මම පෙන්නුවේ දුකක් සහ දුකේ නිරෝධයක් පමණයි. 'දුක්ඛමෙව උප්පජ්ජමානං උප්පජ්ජති දුක්ඛං නිරුජ්ඣමානං නිරුජ්ඣති.**[21]

**උපදින්නේ දුකක්ම උපදී. නිරුද්ධ වන්නේ දුකක්ම නිරුද්ධ වේ. පුද්ගල කථාවක් මොකුත්ම නැහැ.** එහෙම නම් අඬන්න දෙයක් නැහැ කියලා අපි කියන්නෙ. එතකොට එහෙම අඬන්නෙ නොදැනීම නිසා. උපදින්නේත් දුකක්. එදත් ප්‍රකාශ කළේ අදත් ප්‍රකාශ කරන්නේ දුකක්

හා එහි නිරෝධයක් පමණයි. ඒක නිසා උච්ඡෙදවාදී චෝදනාවකට ඉඩ නැහැ කියන එකයි බුදුරජාණන් වහන්සේ පෙන්නල දුන්නේ. දැනට හිතාගන්න **මේ කියාපු ටික ආශ්‍රයෙන් මේ වන්දනා ගමන ආවා නම් මේ වන්දනා ගමනේ සිද්ධස්ථානය තමයි මනස.** එහෙම කිව්වට මොකද අර කියාපු භයෙන්ම පුළුවන් නිවන් දකින්න. ඒකනෙ අපි කිව්වෙ දිව අගත් තියනව කියල නිවන, හරියට මනසිකාරය යෙදුවොත් යෝගාවචරයා. අතීත කතාන්තර සමහර විට ඇත්ත වෙන්න පුළුවන් තරමක් දුරට හරි - අටුවාවල අතිශයෝක්ති තිබුනත් - අතීතයේ මුලු රැයක් කුසගින්නෙ ඉඳල අනුරාධපුර මිහින්තලා ආදී තැන්වල උදෑසන කැඳ වළඳන අවස්ථාවේ රහත් නොවුණ ආසනයක් නැතෙයි කියනව අර ආහාර ප්‍රත්‍යවේක්ෂාව ආදියෙන්. ඒක නිරතුරුව වඩල ඉතින් අර රහස අල්ල ගත්තු තැන කෙලින්ම එන්නෙ මනසට. අන්තිමටම එන්නේ මනසයි. **ඉන්ද්‍රියයන්ගෙන් එකතු වෙලා ගිහිල්ලා මනසයි ධර්මයි. එතෙන්දි තමයි විදර්ශනාව සම්පූර්ණ වෙන්නේ.** ඒ ටිකේ රහස අහු වුනා නම් **විඤ්ඤාණ මායාව එතනම ඉවරයි. ඊළඟට ප්‍රඥාව සම්පූර්ණයි. ගමන අවසානයි. බුදු පිල දිනුවා. මාර පිල පරාදයි.**

දැන් මේ පින්වතුන් ඔය කියාපු ටික ආශ්‍රයෙන් බුදු පිල දිනවන්න. රහත් වෙලා කොහෙවත් යනවා කියලා ඔය සියදෝරිස් නිවනක් බලාපොරොත්තු වෙන්න එපා. බුදු පිල දිනවන්න උත්සාහ කරන්න. අර මැරිච්ච ක්‍රීඩකයෝ ගැන හිතලා. ඔන්න එතකොට සතර මග සතර ඵලය. අර හතරදෙනා කවුද කියල හඳුනගන්න උත්සාහ කරන්න. මේ දේශනය මෙයින් අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. මෙතෙක් පැවැත්වූ දේශනා අතරින් මට හිතෙන හැටියට ප්‍රායෝගික පැත්තට එල්ල කරල කළ දේශනාවක්. මේකෙ අඩුපාඩු තියනවා නම්, භාෂා ව්‍යවහාරයේ හරි පොඩි පොඩි අඩුපාඩුකම්, සමාධිය භජනය කරන්න. උපරිම ප්‍රයෝජනය ගන්න. මේ ධර්ම ශ්‍රවණය කළ පින්වතුන්ට අපි පින් අනුමෝදන් කරනවා. පළමුවෙන්ම මේ පින්වතුන්ට මේ ධර්ම ශ්‍රවණ ආනිශංසය ඈතදී ලැබෙන එකක් නොවේ. අද අදම නිවන් සැප අත්පත් කරගැනීමට හේතු වාසනා වේවා කියල ප්‍රාර්ථනා කරනවා. අවීචියේ සිට අකනිටා දක්වා යම් තාක් සත්ත්ව කෙනෙක් ධර්ම දේශනාමය ධර්ම ශ්‍රවණමය කුසලය අනුමෝදන් වීමට කැමති නම් මේ කියාපු කර්මස්ථාන දේශනාව උපකාර කරගෙන උපනිශ්‍රය කරගෙන ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවනින් සැනසෙත්වා කියල ප්‍රාර්ථනා කරමින් මේ ගාථා කියන්න.

## පාදක සටහන්

1. ද්වයතානුපස්සනා සූත්‍රය, සුත්ත නිපාත, - 230 පිට (බු.ජ.ත්‍රි.25)
2. බ්‍රහ්මජාල සූත්‍රය, දීඝ නිකාය - 1-72 පිට (බු.ජ.ත්‍රි.7)
3. මධුපිණ්ඩික සූත්‍රය, මජ්ඣිම නිකාය -1-280 පිට (බු.ජ.ත්‍රි.10)
4. මජ්ජෙසධ සූත්‍රය, අංගුත්තර නිකාය -4-186 පිට (බු.ජ.ත්‍රි.21)
5. දුතිය ද්වය සූත්‍රය, සංයුත්ත නිකාය -4-148 පිට (බු.ජ.ත්‍රි.16)
6. ඉන්ද්‍රිය භාවනා සූත්‍රය, මජ්ඣිම නිකාය -3-616 පිට (බු.ජ.ත්‍රි.12)
7. පදුම පුප්ඵ සූත්‍රය, සංයුත්ත නිකාය -1-364 පිට (බු.ජ.ත්‍රි.13)
8. ඉන්ද්‍රිය භාවනා සූත්‍රයෙහි එන උපමාවඃ

   ''යම්සේ ආනන්ද, මඳක් නැඹුරු කළ පියුම් පතෙහි දිය බිඳු පෙරළේද, පිහිටා නොසිටීද, එසේම ආනන්ද යම් කෙනකුට මෙසේ ශීඝ්‍රයෙන්, මෙසේ ඉක්මනින්, මෙසේ පහසුවෙන් උපන් මනාපය, උපන් අමනාපය, උපන් මනාපාමනාපය නිරුද්ධ වේද, උපේක්ෂාව පිහිටා සිටීද, ආනන්ද, මේ ආර්‍ය විනයෙහි නැහැයෙන් දත යුතු ගඳ සුවඳ පිළිබඳව මෙය අනුත්තර ඉන්ද්‍රිය භාවනාව යයි කියනු ලැබේ.''

9. පාරාසරිය ථෙරගාථා, ථෙරගාථා - 190 පිට (බු.ජ.ත්‍රි.28)
10. නාළක සූත්‍රය, සුත්ත නිපාතය, -222 පිට (බු.ජ.ත්‍රි.25)
11. බ්‍රහ්මායු සූත්‍රය, මජ්ඣිම නිකාය -2-584 පිට (බු.ජ.ත්‍රි.11)
12. ආහාර සූත්‍රය, සංයුත්ත නිකාය -2-20 පිට (බු.ජ.ත්‍රි.14)
13. උද්දක සූත්‍රය - සං යුත්ත නිකාය -4-178 පිට (බු.ජ.ත්‍රි.16)
14. කිංමූලක සූත්‍රය, අංගුත්තර නිකාය -5-344 පිට (බු.ජ.ත්‍රි.22)
15. යමක වග්ග, ධම්මපද ගා, 1, 2 බු.නි. -1-26 පිට (බු.ජ.ත්‍රි.24)
16. සොණ සූත්‍රය, අංගුත්තර නිකාය -4-152 පිට (බු.ජ.ත්‍රි.21)
17. මහාවෙදල්ල සූත්‍රය, මජ්ඣිම නිකාය -1-686 පිට (බු.ජ.ත්‍රි.10)
18. අලගද්දූපම සූත්‍රය, මජ්ඣිම නිකාය -1-338 පිට (බු.ජ.ත්‍රි.10)
19. රථවිනීත සූත්‍රය, මජ්ඣිම නිකාය - 1-368 පිට (බු.ජ.ත්‍රි.10)
20. අලගද්දූපම සූත්‍රය, මජ්ඣිම නිකාය -1-342 පිට (බු.ජ.ත්‍රි.10)
21. කච්චාන ගොත්ත සූත්‍රය, සංයුත්ත නිකාය -2-28 පිට (බු.ජ.ත්‍රි.14)

# 16 වන දේශනය

# 16 වන දේශනය

### (පහන් කණුව ධර්ම දේශනා අංක 198)
### 'නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස'

සුඛං වා යදිවා දුක්ඛං - අදුක්ඛමසුඛං සහ
අජ්ඣත්තඤ්ච බහිද්ධා ච - යං කිඤ්චි අත්ථි වේදිතං
ඒතං දුක්ඛන්ති ඤත්වාන - මෝසධම්මං පලෝකිනං
ඵුස්ස ඵුස්ස වයං පස්සං - ඒවං තත්ථ විරජ්ජති
වේදනානං ඛයා භික්ඛු - නිච්ඡාතෝ පරිනිබ්බුතෝ[1]

- ද්වයතානුපස්සනා සුත්ත, සුත්ත නිපාත

සැදැහැවත් පින්වතුනි,

සසර දුකින් මිදිලා නිවන් සුවය වෙත ළඟා වීම බෞද්ධයාගේ ප්‍රතිපදාවේ ඉලක්කය හැටියට සාමාන්‍යයෙන් සැලකෙනවා. දුක සැප පිළිබඳ ප්‍රශ්නයේදී නිරායාසයෙන්ම අපේ අවධානය වේදනාව ගැන යොමු වෙනවා. වේදනාව සම්බන්ධයෙන් ඉතාමත්ම ගැඹුරු දර්ශනයක් ඇතුළත් මේ මාතෘකා කළ ගාථා දෙක අපි අද මේ දහසයවෙනි පටිච්ච සමුප්පාද දේශනාවට මාතෘකා කරගන්නේ පටිච්ච සමුප්පාද ධර්මයේ අංග දොළහ ඇතුළත වේදනාවට හිමි තැන සාකච්ඡා කිරීමේ මූලාරම්භයක් වශයෙනුයි. සුත්ත නිපාතයේ ද්වයතානුපස්සනා සූත්‍රයේ දකින්නට ලැබෙන මේ ගාථා දෙකත් බුදුරජාණන් වහන්සේ වදාළේ සමුදය වය කියන ද්වයතාව ඉස්මතු කර දැක්වීමටයි. අපේ පටිච්ච සමුප්පාද දේශනා කීපයකදීම අපි මේ සූත්‍රය ආශ්‍රයෙන් විවරණ මාර්ගය පාදා ගත්තා. දැන් මේ අවස්ථාවෙත් වේදනාව පිළිබඳ විවරණ මාර්ගය පාදා ගැනීමට උපකාර වෙන පාඨයකින්මයි බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලාට මේ ගාථා දෙක හඳුන්වලා දුන්නේ. "මහණෙනි, මැනවින් ද්වයතානුපස්සනාවේ යෙදීමේ තවත් ක්‍රමයක් තිබිය හැකිදැයි අසන්නවුන් ඇතොත් තිබිය හැකි යයි කිව යුතුයි.

කෙසේද තිබිය හැක්කේ? යම් තාක් දුකක් හටගනීද ඒ සියල්ල

වේදනාව ප්‍රත්‍යයෙනි. මේ එක අනුපස්සනාවකි. වේදනාවන්ගේ නිරවශේෂ විරාග නිරෝධයෙන් දුකෙහි හටගැන්මක් නැත. මේ දෙවෙනි අනුපස්සනාවයි. මහණෙනි, යම් භික්ෂුවක් අප්‍රමාදීව කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව මේ ද්වයතානුපස්සනාවේ සිත යොදනවා නම් ඒ භික්ෂුවට ඵල දෙකකින් එකක් බලාපොරොත්තු විය හැකියි. මෙලොවම රහත් ඵලය හෝ උපාදාන යමක් ඉතිරිව ඇතොත් අනාගාමි ඵලය.'' මේ විදියට හඳුන්වලා තමයි බුදු රජාණන් වහන්සේ අර ගාථා දෙක වදාළේ. මේ ගාථාවල අර්ථය අපි දැන් බලමු.

**සුඛං වා යදි වා දුක්ඛං - අදුක්ඛමසුඛං සහ**
**අජ්ඣත්තඤ්ච බහිද්ධා ච - යං කිඤ්චි අත්ථි වෙදිතං**

සැප හෝ, දුක් හෝ, නොදුක්නොසුව සමගින් ඇතුළතත් පිටතත් යම්කිසි වේදයිතයක් ඇද්ද

**එතං දුක්ඛන්ති ඤත්වාන - මොසධම්මං පලොකිනං**
මෙය මුළා කරවන ස්වභාවය ඇති බිඳෙනසුලු දෙයකැයි දැන
**ඵුස්ස ඵුස්ස වයං පස්සං - එවං තත්ථ විරජ්ජති**

ස්පර්ශයක් පාසා එහි ගෙවී යාම දකින්නේ මෙසේ ඒ වේදනාවන්හි කලකිරෙන්නේය.

**වෙදනානං ඛයා භික්ඛු - නිච්ඡාතො පරිනිබ්බුතො'**
වේදනාවන්ගේ ක්ෂය වීමෙන් භික්ෂුව
තෘෂ්ණා කුසගින්න නැතිව පිරිනිවියේ වෙයි.

ඔන්න ඕකයි මේ ගාථා දෙකේ අර්ථය. ඉතින් මෙයින් අපට පේනවා මේ ගාථාවලින් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ සැප දුක් නොදුක් නොසුව සියලුම වේදනාවන් ඒවායේ, මුළා කරනසුලු, බිඳෙන සුලු, ස්වභාවය නිසා දුකක්ම බවත් ඒ සියලු වේදනාවන්ගේ ක්ෂය වීම පිරිනිවීම බවත්ය. දැන් අපි පටිච්ච සමුප්පාද ධර්මයට කිට්ටු කරලා මේ වේදනාව පිළිබඳව හඳුනාගන්න බලමු. මේ පින්වතුන් කොතෙකුත් අහලා තියෙනවා අවිජ්ජා සංඛාරා ආදී පටිච්ච සමුප්පාදයේ අංග දොළහ. ඒවා

අතර වේදනාව ගැන සඳහන් වන්නේ මෙහෙමයි. 'ඵස්ස පච්චයා වෙදනා, වෙදනා පච්චයා තණ්හා' කලින් අවස්ථාවක අපි මේ පින්වතුන්ට මතක් කළා මේ පටිච්ච සමුප්පාදයේ එක අංගයක් විවරණය කරන්න නම් ඊට කලින් තියන අංගයත්, පිටිපස්සෙන් තියන අංගයත් සම්බන්ධ කරගන්න ඕන බව. මොකද අපි උපමාවට කිව්වේ දම්වැලක එක පුරුකක් චිත්‍රයකින් පෙන්නුම් කරන්න යනව නම් ඒක දම්වැලක පුරුකක් බව පෙන්නුම් කරන්න ඉස්සරහ තියන පුරුකේ භාගයකුත් පස්සෙන් තියන පුරුකේ භාගයකුත් පෙන්නුම් කරන්න වෙනවා. උපමාවකට මම ඒ කිවුවෙ. ඒ අනුව මෙතනදිත් අපට ඵස්ස එක පැත්තකින් වේදනාව අනික් පැත්තෙන් තණ්හාව. ඒ දෙක ගැනත් යමක් කියන්න ඕන. අපි කලින් දේශනාවේදී ප්‍රකාශ කළේ ස්පර්ශය ගැනයි. ඒකෙදිත් අපි මතු කළා පටිච්ච සමුප්පාද විග්‍රහයේදී බුදුරජාණන් වහන්සේ ස්පර්ශය හය ආකාරයකට විග්‍රහ කළා.[2] චක්ඛු සම්ඵස්ස සොත සම්ඵස්ස ආදී වශයෙන්. ඒ වගේම මේ වේදනාව පිළිබඳව කියනකොට ඒත් හය ආකාරයකින් බුදුරජාණන් වහන්සේ විග්‍රහ කරනවා. මහණෙනි, මේ වේදනාව හය ආකාරයයි. කොහොමද චක්ඛු සම්ඵස්සජා වෙදනා, සොත සම්ඵස්සජා වෙදනා, ඝාණ සම්ඵස්සජා වෙදනා, ජිව්හා සම්ඵස්සජා වෙදනා, කාය සම්ඵස්සජා වෙදනා, මනො සම්ඵස්සජා වෙදනා, චක්ඛු සම්ඵස්සයෙන් උපන්, 'ජා' කියල කියන්නේ උපන්නා වූ වේදනා සොත සම්ඵස්සයෙන් උපන්නා වූ වේදනා. ඒ ආකාරයෙන් හිතාගන්න, ඇස, කන, නැහැය, දිව, කය, මන, කියන ඒවා ආශ්‍රිතව ඇති වන වේදනා. එහෙම හඳුන්වලා දීලා තියනවා.

ඇත්ත වශයෙන් වේදනාව පිළිබඳ ඉතාමත්ම ගැඹුරු විග්‍රහයක් දකින්න ලැබෙන්නේ මැදුම් සඟියේ චූලවෙදල්ල සූත්‍රයෙ.[3] මේ චූලවෙදල්ල සූත්‍රයේ නිදානය හැටියට කියන්න තියෙන්නේ විසාඛ කියන අනාගාමී උපාසකතුමා ධම්මදින්නා කියන රහත් මෙහෙණින් වහන්සේගෙන් ගැඹුරු ප්‍රශ්න මාලාවක් අහනවා. ඒවාට බොහොම ව්‍යක්ත අන්දමින් ධම්මදින්නා තෙරණියන් වහන්සේ පිළිතුරු දෙනවා. ඒ සාකච්ඡාව අවසාන හරියේදී විසාඛ උපාසකතුමා වේදනාව ගැන ප්‍රශ්න කීපයක් යොමු කරනවා. ඒවායි දැන් මෙතෙන්දි අපි ඉදිරිපත් කරන්න යන්නේ. ඉස්සෙල්ලාම අහනවා ආර්යාවෙනි, වේදනා කීයක් තියනවද වේදනාව කී වැදෑරුම්ද කියලා. ඒකට ධම්මදින්නා තෙරණියන් වහන්සේ

කෙටියෙන් ප්‍රකාශ කරනවා වේදනා තුනක් තියනවා. සුඛා වෙදනා, දුක්ඛා වෙදනා, අදුක්ඛමසුඛා වෙදනා. ඊළඟට විසාඛ උපාසකතුමා අහනවා මොකක්ද මේ සුඛ වෙදනා කියන්නේ-හරියට නොදන්නවා වගේ, ඒක ගැන හැඳින්වීම බලාපොරොත්තුවෙන්. සුඛා වෙදනා සැප වේදනාව කියන්නේ මොකක්ද, දුක් වේදනාව මොකක්ද නොදුක්නොසුව වේදනාව මොකක්ද? ධම්මදින්නා තෙරණියන් වහන්සේ මෙහෙමයි පිළිතුරු දෙන්නේ. යම් කිසි කායික හෝ චෛතසික සුවදායක වේදයිතයක් තියනවද ඒක සුඛා වෙදනා, සැප වේදනාව. කායික හෝ චෛතසික සුව දායක නොවන වේදයිතයක් තියනවද ඒක දුක්ඛා වෙදනා, දුක් වේදනාව. කායික හෝ චෛතසික දුක්ඛදායකත් නොවන සුවදායකත් නොවන වේදනාවක් ඇතොත් ඒක අදුක්ඛමසුඛ නොදුක් නොසුව වේදනාව ඔන්න එහෙම හැඳින්වූවා. ඔන්න ඊළඟට විසාඛ උපාසකතුමා තව ප්‍රශ්නයක් අහනවා. මේ සැප වේදනාවේ තියන සැපය මොකක්ද? දුක මොකක්ද? පිළිතුර ඇහෙනකොට තේරුම්ගන්න පුළුවන් මේ පින්වතුන්ට, සැප වේදනාව පිළිබඳව කියනකොට ඒකේ තියන සැපය මොකක්ද, දුක මොකක්ද? දුක් වේදනාව පිළිබඳව ඒකෙ තියන සැපය මොකක්ද දුක මොකක්ද? නොදුක් නොසුව වේදනාව පිළිබඳව තියන සැපය මොකක්ද දුක මොකක්ද?

රහත් මෙහෙණින් වහන්සේ පිළිතුරු දෙනවා සැප වේදනාව පිළිබඳව-පාලි වචනයෙන් කිය වෙන්නේ මෙහෙමයි-ඨිතිසුඛා විපරිණාම දුක්ඛා. ඒකේ තේරුම සැප වේදනාව තියනකම් සැපයි. වෙනස් වෙනකොට දුකයි. දුක් වේදනාව පිළිබඳව මෙහෙමයි ප්‍රකාශ කරන්නේ ඨිතිදුක්ඛා විපරිණාම සුඛා, දුක් වේදනාව තියනකම් දුකයි, වෙනස් වෙනකොට සැපයි. නොදුක් නොසුව වේදනාව පිළිබඳව මෙන්න මෙහෙම ප්‍රකාශ කරනවා. 'ඤාණසුඛා අඤ්ඤාණ දුක්ඛා, නොදුක් නොසුව වේදනාව පිළිබඳව අවබෝධය, ඥානය, සැපයක්. අනවබෝධය, අඥාන බව දුකක්. ඔන්න හැඳින්වීම. ඊළඟට විසාඛ උපාසකතුමා අහනවා ප්‍රශ්නයක් සැප වේදනාවට යටින් මොකක්ද තියන අනුසය ධර්මය? මේ පින්වතුන් අතර අනුසය කියන වචනය නොපුරුදු අය ඉන්න පුළුවන්. අපි ඉස්සෙල්ලා හැඳින්වීමක් කරමු. මේ ධර්මයේ කෙලෙස් ගැන කථා කරනකොට වචන තුනක් යෙදෙනවා. කෙලෙස් වල නිදිගත් අවස්ථාව තමයි 'අනුසය'. අවදි උන අවස්ථාව පරියුට්ඨාන, ඒ අවදි වෙලා ශික්ෂා

පදයක් කඩාගෙන යන අවස්ථාව වීතික්කම. අනුසය, පරියුට්ඨාන, වීතික්කම, කියලා කෙලෙස් පිළිබඳව වචන තුනක් තිබෙනවා. දැන් මෙතන අනුසය ගැනය කථාව. සුඛ වේදනාව පිළිබඳව තියන අනුසය මොකක්ද? දුක්ඛ වේදනාව පිළිබඳව තියන අනුසය මොකක්ද? නොදුක් නොසුව වේදනාව පිළිබඳව තියන අනුසය මොකක්ද? ඔන්න රහත් මෙහෙණින් වහන්සේ පිළිතුරු දෙනවා. ඇවැත්නි, විසාඛ, සැප වේදනාවට යටින් රාගානුසය තියනවා හැංගිලා. දුක් වේදනාවට යටින් පටිඝානුසය තියෙනවා. නොදුක් නොසුව වේදනාවට යටින් අවිජ්ජා අනුසය තියනවා. ඊළඟට අහනවා විසාඛ උපාසකතුමා ප්‍රශ්නයක්. ආර්යාවෙනි, හැම සැප වේදනාවකටම යටින් රාගානුසය තියනවද? හැම දුක් වේදනාවකටම යටින් පටිඝානුසය තියෙනවද? හැම නොදුක් නොසුව වේදනාවකටම යටින් අවිජ්ජා අනුසය තියෙනවද? ඉස්සෙල්ලා ඒකට පිළිතුරු දෙන්නේ ධම්මදින්නා තෙරණියන් වහන්සේ. නැහැ ඇවැත්නි, විසාඛ හැම සැප වේදනාවකටම යටින් රාගානුසය නැහැ. හැම දුක් වේදනාවකටම යටින් පටිඝානුසය නැහැ. හැම නොදුක්නොසුව වේදනාවකටම යටින් අවිජ්ජානුසය නැහැ. ඒක විස්තර වෙනවා ඉදිරියට අහන ප්‍රශ්නවලින්. ඊළඟට විසාඛ උපාසකතුමා අහනවා සැප වේදනාව පිළිබඳව කුමක්ද ප්‍රහාණය කළ යුත්තේ? දුක් වේදනාව පිළිබඳව කුමක්ද ප්‍රහාණය කළ යුත්තේ? නොදුක් නොසුව වේදනාව පිළිබඳව කුමක්ද ප්‍රහාණය කළ යුත්තේ? ඔන්න පිළිතුරු ධම්මදින්නා තෙරණියන් වහන්සේ ප්‍රකාශ කරනවා. සැප වේදනාව පිළිබඳව රාගානුසය ප්‍රහාණය කළ යුතුයි. දුක් වේදනාව පිළිබඳව පටිඝානුසය ප්‍රහාණය කළ යුතුයි. නොදුක් නොසුව වේදනාව පිළිබඳව අවිජ්ජානුසය ප්‍රහාණය කළ යුතුයි. ඊළඟට අහනවා ප්‍රශ්නයක් විසාඛ උපාසකතුමා. හැම සැප වේදනාවක් පිළිබඳවම රාගානුසය ප්‍රහාණය කළ යුතුද? හැම දුක් වේදනාවක් පිළිබඳවම පටිඝානුසය ප්‍රහාණය කළ යුතුද? හැම නොදුක් නොසුව වේදනාවක් පිළිබඳවම අවිජ්ජානුසය ප්‍රහාණය කළ යුතුද? එතනදී පිළිතුරක් දෙනවා. කෙටියෙන් කියනවා නම් නැහැ ඇවැත්නි හැම සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ නොදුක් නොසුව වේදනාවක් පිළිබඳවම එහෙම අනුසය ප්‍රහාණය කරන්න ඕන නැහැ කියලා අමුතු විස්තරයක් දෙනවා. සුවිශේෂී කාරණා තුනක් පෙන්නුම් කරනවා.

යම් කිසි භික්ෂුවක් කාමයන්ගෙනුත් අකුසල ධර්‍මයන්ගෙනුත් සිත මෑත් කරගෙන විතක්ක විචාර සහිත විවේකයෙන් හටගත් පීති සුඛ සහිත ප්‍රථම ධ්‍යානයට සමවදිනවා. ඒ ප්‍රථම ධ්‍යානය තුළ රාගානුසයක් නැහැ. ඒ ප්‍රථම ධ්‍යානය ලබාගැනීමෙන් රාගය නැති වෙනවා. අන්න එතකොට එතන සුවිශේෂ දෙයක්. ඒ කියන්නේ ප්‍රථම ධ්‍යානයේ පීති සුඛය තිබුණට එතන රාගානුසය නැහැ. දෙවනුව පටිඝය පිළිබඳව අමුතු දෙයක් ප්‍රකාශ කරනවා. යම් කිසි භික්ෂුවක් කල්පනා කරනවා කවදා නම් මම ඒ ආර්යයන් වහන්සේලා දන් එළඹ වාසය කරන - එතන අරහත් ඵල සමාධිය ගැනයි කියන්නේ - අනුත්තර විමෝක්ෂ කියලයි කියන්නේ, අනිමිත්ත, අප්පණිහිත, සුඤ්ඤත, කියන ඒ විමෝක්ෂ තත්ත්ව මා කවදා නම් ලබා ගනිම්ද කියල ආශාවක් බලාපොරොත්තුවක් ඇති වෙනවා යම් කිසි යෝගාවචර භික්ෂුවක් තුළ, ඒක ධර්‍මයෙ හඳුන්වන්නේ නෙක්ඛම්ම සිත දොමනස්ස' කියලා[4] ගෙහසිත දෝමනස්ස නොවෙයි, නෙක්ඛම්මසිත දොමනස්ස. ඊළඟට ධම්මදින්නා තෙරණියන් වහන්සේ වදාරණවා. එබඳු ඒ දෝමනස්සය යටින් පටිඝයක් නැහැ. ඒක සුවිශේෂ දෙයක්. මේ තත්ත්වය කවදා නම් ලබාගනිම්ද කියක එක තුළින් දෝමනස්සයක් ඇති වෙනවා. තාම ලබාගත්තෙ නැහැනෙ. නමුත් එතන පටිඝයක් නැහැ. ඒක පැහැදිලියි නෙ. ඊළඟට තුන්වෙනි කාරණය කියනවා. යම් කිසි භික්ෂුවක් සැප දුක් සොම්නස් දොම්නස්වලින් හිත මෑත් කරගෙන නොදුක් නොසුව සබාවය ඇති චතුර්ථ ධ්‍යානයට සතරවෙනි ධ්‍යානයට සමවදිනවා. ඒක යටින් අවිජ්ජානුසය නැහැ. ඒක නොදුක් නොසුව වේදනාව නමුත් එයට යටින් අවිජ්ජානුසය නැහැ. ඒක සුවිශේෂ අවස්ථාවක්.

ඔය ටික ප්‍රකාශ කළාට පස්සෙ විසාඛ උපාසකතුමා අමුතු විදියෙ ප්‍රශ්නයක් අහනවා. ආර්යාවෙනි, සැප වේදනාවේ පටිභාගය මොකක්ද? ඕක ටිකක් තේරුම් කරන්න වෙනවා. ටිකකට හිතන්න පළු දෙකක් ඇති දෙයක-පොල් ගෙඩිය කියල හිතමු. ඒකේ අනිත් පළුව  එහෙම නැත්නම් දෙබෑ යම්කිසි දෙයක අනිත් බෑය කියන එකයි පටිභාග කියන වචනයේ අර්ථය-කෙලින්ම ඉස්සරහින් තියන එක. එතකොට ඉස්සෙල්ලා අහන ප්‍රශ්නය සැප වේදනාවේ පටිභාගය මොකක්ද? ඒකට රහත් මෙහෙණින් වහන්සේ පිළිතුරු දෙනවා සැප වේදනාවේ පටිභාගය - අනික් පළුව - දුක් වේදනාව. ඊළඟට අහනවා දුක් වේදනාවේ පටිභාගය මොකක්ද? ඒකට

පිළිතුරු දෙනවා දුක් වේදනාවේ පටිභාගය සැප වේදනාව. ඔන්න ඒ දෙක අතරේ එක්තරා විදියකට සම්බන්ධයක් තියනවා. ඊළඟට අහනවා නොදුක් නොසුව වේදනාවේ පටිභාගය මොකක්ද? ඒක අමුතු දෙයක්. නොදුක් නොසුව වේදනාවේ පටිභාගය අවිජ්ජාව.

ඔන්න ඒකෙන් තව ප්‍රශ්න මතු කරගන්නවා විසාඛ උපාසකතුමා. අවිජ්ජාවේ පටිභාගය මොකක්ද? ඒකේ අනිත් පළුව මොකක්ද විජ්ජාව. විජ්ජාවේ පටිභාගය මොකක්ද විමුක්තිය. විමුක්තියේ පටිභාගය-අනිත් පළුව-මොකක්ද? 'නිබ්බාන', ඒක කිව්වට පස්සේ විසාඛ උපාසකතුමා තවත් ඈතට අහනවා. නිබ්බානයේ පටිභාගය මොකක්ද? එතෙන්දි රහත් මෙහෙණින් වහන්සේ කියනවා ''උපාසක තුමනි, ඇවැත්නි, ඔබ මේ ප්‍රශ්නවල කෙළවර අල්ලගන්න බැරිව සීමාව ඉක්මවලා ගියා. නිවනින් කෙළවරයි ඔක්කොම බ්‍රහමචරියාව. එතනින් කෙළවරයි. ඒ ප්‍රශ්නයම වැරදියි.'' නමුත් මේ කාරණය තුළින් ගැඹුරින් මේ පින්වතුන්ට හිතනකොට පේනවා **සැපත් දුකත් අතරෙයි ලෝකයා ඉන්නෙ. නොදුක් නොසුව කියන මැද තත්ත්වය තුළිනුයි විමුක්තිය මතු වෙන්නේ.**

එතකොට සැපයේ පටිභාගය දුකයි. දුකේ පටිභාගය සැපයි. නමුත් නොදුක් නොසුව වේදනාවේදී ඒක යටට ගැඹුරට යනවා. ඒක යටින් තියන අවිජ්ජාව ඉවත් කරනකොට විජ්ජාව මතු වෙලා. විජ්ජාව ඉවත් කරනකොට විමුක්තිය මතු වෙලා. විමුක්තියෙන් නිවන. එතනම ඉවරයි. ඉතින් මේකට අදාළ තවත් වටිනා සූත්‍රයක් තියනවා වේදනා සංයුත්තයේ සලල කියන සූත්‍රය.[5] ඒකේදී බුදු රජාණන් වහන්සේ කෙලින්ම මෙහෙම ප්‍රකාශ කරනවා. අශ්‍රැතවත් පෘථග්ජනයා කියලා කියන්නේ පින්වතුනි ධර්මය නොදත් පුද්ගලයා. ධර්මය නොදත් පෘථග්ජනයා දුක් වේදනාව ස්පර්ශ කරන ලදුයේ, දුක් වේදනාව ආවහම, කාම සුඛය ගැන සතුට ඇති කරගන්නවා. මොකද ඒකට හේතුව අශ්‍රැතවත් පෘථග්ජනයා කාම සුඛය හැර දුක් වේදනාවෙන් නික්මීමක් මිදීමක් දකින්නේ නැහැ.

ඒවාගේම එතන කියවෙනවා අශ්‍රැතවත් පෘථග්ජනයාට අදුක්ඛමසුඛ වේදනාව පිළිබඳව අවිද්‍යාව තියනවා. මෙන්න මේක තේරුම් කරන්න ගිහිල්ලා අපි යම් අවස්ථාවක මේ පින්වතුන්ට වෙන දේශනාවකදී පෙන්නුවා සී සෝ පැදිල්ල. සීසෝ එක කියන්නේ ඉස්සර පොල් පිත්ත

පැදිල්ල වගේ එකක්. දැන් ඒකට ඉංග්‍රීසි වචනයක් පාවිච්චි කරනවා. සීසෝ එක කියලා. එතකොට සාමාන්‍ය ලෝකයා පෘථග්ජන ලෝකයා සැපත් දුකත් අතර සීසෝ පදිමින් ඉන්නේ. 'සීසෝ' එක මැද තියන නොදුක් නොසුව ගැන දන්නෙත් නැහැ. ඔන්න ඕක නිසා තමයි සතිපට්ඨාන සූත්‍රයේ ඇත්ත වශයෙන් සතිපට්ඨානයට බැහැලා වේදනානුපස්සනාවට ගිය ආර්ය ශ්‍රාවකයා පමණයි නොදුක් නොසුව වේදනාව පවා හඳුනාගන්නේ. සාමාන්‍ය ලෝකයා ඒක දන්නෙත් නැහැ. ඔවුන්ට මධ්‍යස්ථ වේදනාවක් නැහැ. අර දෙක අතරෙයි යන්නෙ.

ඒක අටුවාවෙත් දක්වනවා මුව පද උපමාවකින් අටුවාචාරීන් වහන්සේලා. යම් තැනිතලාවක ගල් තලාවක් තියෙනවා. මුවෙක් මේ ගල්තලාවට එක පැත්තකින් ඇවිල්ලා ගොඩ වෙලා අනික් පැත්තෙන් බැහැල යනවා. ගල් තලාවෙ දෙපැත්තෙම අඩි පාරවල් තියනවා. ගල් තලාවෙ අඩි පාරවල් නැහැ. ගල් තලාව වගෙයි අන්න නොදුක් නොසුව වේදනාව. ඒක ප්‍රකට නැහැ සාමාන්‍ය ලෝකයාට. නමුත් එතනයි විමුක්තිය තියෙන්නේ. ඔන්න එතෙන්දි අපි දැන් මේ දෙකයි මැදයි ආව නිසා අපි බොහොම අවස්ථාවල උපකාර කරගත්තු සූත්‍රයක්. අලුතෙන් ආව අයට කෙටියෙන් කියමු මජ්ඣෙ සූත්‍රය.[6] අපි බොහොම උපකාර කරගත්තා අපේ දේශනාවලදී. මහ පුදුම සූත්‍රයක්.

බරණැස ඉසිපතනයේ බුදුරජාණන් වහන්සේ වැඩ වසන අවස්ථාවක පිණ්ඩපාතයෙන් පස්සේ ස්ථවිරයන් වහන්සේලා පිරිසක්, බුදුරජාණන් වහන්සේ දේශනා කළ ප්‍රහේලිකා විදියේ ගැඹුරු ගාථාවක් සුත්ත නිපාතයේ මෙත්තෙයා පඤ්හයේ[7] තියෙන. ඒක එළියට අරගෙන හරියට මේ කාලෙ සම්මන්ත්‍රණයක් වගේ ඒකෙන් ප්‍රශ්න හතරක් මතු කර ගත්තා.

**යො උභන්තෙ විදිත්වාන**
**මජ්ඣෙ මන්තා න ලිප්පති**
**තං බ්‍රෑමි මහා පුරිසොති**
**සොධ සිබ්බනිමච්චගා**

යමෙක් කොන් දෙක තේරුම් අරගෙන ප්‍රඥාවෙන් මැද නොඇලේද ඔහුට මම මහා පුරුෂයා යයි කියමි. ඔහු මේ ලෝකයේ මැහුම්කාරිය ඉක්මවා ගියේ වේ.

මේකෙන් ප්‍රශ්න හතරක් සංසයා වහන්සේලා මතු කරගත්තා. මොකක්ද පළමුවෙනි කොන? මොකක්ද දෙවෙනි කොන? මොකක්ද මැද? කවුද මැහුම්කාරිය? ඔය ප්‍රශ්න හතරට ස්ථවිර භික්ෂූන් වහන්සේලා හය නමක් විවරණ දුන්නා මහ පුදුම විවරණ. ඒ හැම එකක්ම කමටහන් වගෙයි. අන්තිමට බුදුරජාණන් වහන්සේ ළඟට මේ විවරණ හය අරගෙන ගියහම බුදුරජාණන් වහන්සේ හයම අනුමත කළා. හයම හරි. එබඳු ඒ ගැඹුරු විවරණ. මෙතෙන්දි අපි ගනිමු තුන්වන විවරණය - අපට අදාළ හැටියට. මේ ප්‍රශ්නය පිළිබඳව කථා කළ තුන්වෙනි ස්ථවිරයන් වහන්සේ අර කොන් දෙකයි මැදයි තේරුවේ මෙහෙමයි. එක කොනක් සැප වේදනාව, දෙවෙනි කොන දුක් වේදනාව, මැද නොදුක් නොසුව වේදනාව. මැහුම්කාරිය තණ්හාව. දැන් ඔන්න හිතාගන්න එතකොට සාමාන්‍ය ලෝකයා සැපත් දුකත් අතර කරකැවෙන්නෙ මොකද, තණ්හාව නිසයි. තණ්හාව ගැටලනවා. තණ්හාව නොදුක් නොසුව වේදනාව අමතක කරලා අර දෙක ගැටලනවා. ඔන්න තණ්හාව මැහුම්කාරිය හැටියට කරන වැඩේ හොරෙන්, නොදුක් නොසුව වේදනාව අප්‍රකටව තියලා අර දෙක ගැටලනවා. ඒකනේ අපි කිව්වෙ 'සීසෝ' පැදිල්ල යන හැටි ලෝකේ අර මැද තියන විමුක්තිය නොදැන.

ඊළඟට අපි ඒ වගේම ඉතාම වැදගත් සූත්‍රයක් ගනිමු මේ දේශනාවට උපකාර වන. ඒත් වේදනා සංයුත්තයේ තියෙන්නෙ. ඵස්සමූලක සූත්‍රය.[8] ඒකේදී බුදුරජාණන් වහන්සේ මෙන්න මෙහෙමයි ආරම්භ කරන්නේ. මහණෙනි, වේදනා තුනක් තියනවා. ඒවා පිළිබඳ පාලි වචන කියන්න වෙනවා. අමුතු වචන කීපයක් බුදුරජාණන් වහන්සේ මේ වේදනාව පිළිබඳව හඳුන්වන්න යොදනවා. ''තිස්සො ඉමා භික්ඛවෙ වෙදනා, ඵස්සජා ඵස්සමූලකා, ඵස්සනිදානා, ඵස්සපච්චයා''. වේදනා තුනක් තියනවා ස්පර්ශයෙන් හටගත්, ස්පර්ශය මුල් කොටගත්, ස්පර්ශය නිදාන කොටගත්, ස්පර්ශය ප්‍රත්‍යය කොටගත්. මොනවද - සැප, දුක්, නොදුක් නොසුව. ඒක ගැන තව විවරණය කරනවා බුදුරජාණන් වහන්සේ. ඒවා හටගන්න

හැටි වදාරනවා. මහණෙනි, සැප වේදනාවකට තුඩු දෙන අන්දමේ ස්පර්ශයක් නිසා සැප වේදනාවක් උපදිනවා. ඒ ස්පර්ශය-මෙතනදී අමුතු වචනයක් යෙදෙනවා 'තජ්ජං' කියලා. ඒක විග්‍රහ කරන්න ඕන. පාරිභාෂික වචනයක් වගෙයි බැලුවහම. 'තජ්ජ' කියන්නෙ පින්වතුනි, 'තත්' කියන්නේ 'එය' කියන එකනෙ. 'තජ්ජ' කියන්නේ එයින්ම උපන්, එයින්ම නිපන්. එතකොට ස්පර්ශය තුළින්ම නිපන් ඒ සැප වේදනාවට තුඩු දෙන ස්පර්ශයේ නිරෝධයෙන්, එයින්ම උපන් සැප වේදනාව නැති වෙනවා ස්පර්ශය නැති වෙනකොට. ඒ කියන්නේ යම් ස්පර්ශයක් නිසා සැප වේදනාවක් ඇති වුණා නම් ඒ ස්පර්ශය නැති වෙනකොට වේදනාවත් නැති වෙනවා. ඒකයි බුදුරජාණන් වහන්සේ මතු කරන්නේ. සැප වේදනාව පිළිබඳව කියන්නෙ එහෙමයි. ඒ වගේම හිතාගන්න 'දුක්ඛවෙදනියං භික්ඛවෙ ඵස්සං පටිච්ච උප්පජ්ජති දුක්ඛා වෙදනා' මහණෙනි දුක් වේදනාවට තුඩු දෙන අන්දමේ ස්පර්ශයක් නිසා දුක් වේදනාවක් ඇති වෙනවා. ඒ දුක් වේදනාවට තුඩු දෙන ස්පර්ශය නිරුද්ධ වීමත් හා සමගම ඒ දුක් වේදනාවත් සංසිඳෙනවා. නොදුක් නොසුව වේදනාව පිළිබඳවත් ඒ විදියටම ප්‍රකාශ කරනවා. නොදුක් නොසුව වේදනාවට තුඩු දෙන අන්දමේ ස්පර්ශයක් නිසා නොදුක් නොසුව වේදනාවක් ඇති වෙනවා. ඒ ස්පර්ශයේ නිරෝධයෙන් එය සංසිඳෙනවා.

ඔන්න අමුතු උපමාවක් දෙනවා. මේක වේදනානුපස්සනාවට ඉතාමත්ම වටිනා උපමාවක් එතෙන්දි බුදුරජාණන් වහන්සේ දෙන්නේ. යම් සේ මහණෙනි, ලී කැබලි දෙකක් ගැටීමෙන් උෂ්ණයක් ඇති වෙයිද, රත් වීමක් ඇති වෙයිද, ඒ ලී කැබලි දෙක වෙන් කිරීම තුළින්-අන්න එතනදිත් 'තජ්ජ' කියන වචනය යෙදෙනවා - 'යා තජ්ජා උස්මා සා නිරුජ්ඣති' එයින් හටගත්තා වූ උෂ්ණය එතෙන්දීම නැති වෙනවා. අර ඇතිල්ලීම තුළින්නෙ උෂ්ණයක් හටගත්තෙ, රත් වීමක් හටගත්තෙ. ඒ ලී කැබලි දෙක වෙන් කිරීමෙන් එය සංසිඳෙනවා. මෙතන ගැඹුරු ධර්මයක් තියෙනවා. ඒක සිද්ධාන්තයක් හැටියට බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කරනවා. වේදනානුපස්සනාව පිළිබඳ ඉතාමත්ම වැදගත් සිද්ධාන්තයක්. එතෙන්දි මේ ඵස්සමූලක සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව. ඒක ටිකක් සිංදුවක් වගෙයි. පාලි වචන. නමුත් මතක තියාගන්නත් අමාරු නැහැ. මෙහෙමයි තියෙන්නෙ. '**තජ්ජං තජ්ජං ඵස්සං පටිච්ච තජ්ජා තජ්ජා**

**වෙදනා උප්පජ්ජන්ති. තජ්ජස්ස තජ්ජස්ස ඵස්සස්ස නිරොධා තජ්ජා තජ්ජා වෙදනා නිරුජ්ඣන්ති'**. ඒ කියන්නේ 'තජ්ජං තජ්ජං ඵස්සං පටිච්ච තජ්ජා තජ්ජා වෙදනා උප්පජ්ජන්ති' අපි 'තජ්ජ' කියන වචනයට කියමු සුවිශේෂ කියලා. ටිකක් ඒකට කිට්ටුවෙන් යන සිංහල වචනයෙන් කියනව නම් කියන්න වෙන්නේ මෙහෙමයි. ඒ ඒ ස්පර්ශය නිසා ඒ ඒ සුවිශේෂ වේදනාවෝ උපදිත්. ඒ ඒ ස්පර්ශයන්ගේ නිරෝධයෙන් ඒ ඒ සුවිශේෂ වේදනාවෝ නිරුද්ධ වෙත්'. ඔන්න සාමාන්‍ය අර්ථය. අර 'තජ්ජ' තියන එක තමන්ම තේරුම්ගන්න. ඒක සුවිශේෂයි.

ඒ ඒ ස්පර්ශයන්ගේ ප්‍රත්‍යය නිසා ඒ ඒ වේදනා ඇති වෙනවා. ඒවා නැති වෙනකොට ඒ ඒ වේදනාවෝත් නැති වෙනවා. ඔය ධර්මතාව යට වේදනානුපස්සනාව තියනවා. මොකද හේතුව, සාමාන්‍ය ලෝකයාට අනිත්‍යතාව පේන්නෙ නැහැනෙ. අර කියාපු මැද නොතකා හරිනවානෙ. ඒක නිසා සමුදය පැත්තෙමයි ලෝකයා ඉන්නෙ. ඕකටත් අදාළව ආයිත් අපි ගනිමු මජ්ඣෙ සූත්‍රයේ පළමුවෙනි විවරණය. විවරණ හයක් තියනවා කිව්වනෙ. මෙතෙන්දි උපකාර වෙනවා ස්පර්ශය පිළිබඳ පළමුවෙනි විවරණය. පළමුවෙන්ම ඒක පිළිබඳව පිළිතුරු දෙන සංඝයා වහන්සේලාගේ පිළිතුර තමයි බුදුරජාණන් වහන්සේ කෙලින්ම අනුමත කළේ. මම අර ගාථාව දේශනා කරන විට මේකයි අදහස් කළේ නමුත් අනිත් විවරණත් හරි කියලා වදාළා. මොකක්ද ඒ පළමුවෙනි විවරණය. ස්පර්ශය එක කොනක්, ඵස්ස සමුදය ඒ කියන්නේ සපර්ශයේ හටගැන්ම දෙවෙනි කොන. ඕක එක පාරට තේරුම්ගන්න අමාරුයි. මැද ඵස්ස නිරෝධය. දැන් හිතාගන්න අර මැහුම්කාරිය කරන්නේ මොකක්ද? හැම තිස්සෙම මැද අමතක කරලා. **දැන් රෙදි පටක් මහනකොට එහෙමනෙ. මැද අමතක කරලනේ හැම තිස්සෙම එකතු කරන්නේ. ඒ වගේ ලෝකයාත් ස්පර්ශයත්, ස්පර්ශ සමුදයත් අතර ඉන්නෙ. ස්පර්ශයක් යන්න යන්න තව ස්පර්ශයක් මතු කරගන්නවා. ඒක මැද තියන නිරෝධය දකින්නෙ නැහැ.** තණ්හා මැහුම්කාරිය කරන්නෙ මොකක්ද අර උපමාවට අනුව බුදුහාමුදුරුවො කියන්නෙ ස්පර්ශයක් නිසා නම් වේදනාව ඇති වෙන්නෙ, අර ගිනිගාන උපමාව අනුව ස්පර්ශය නැති වෙනකොට වේදනාව නැතිවෙන්න ඕන. නමුත් නැති වෙන්න දෙන්නෙ නැහැ. ලෝකයා ඉන්නේ සමුදය පක්ෂයේ. එකක් නැති වෙනකොට තව එකක්

මතු කරගන්නවා ශීඝ්‍රයෙන්. ඉතාමත්ම ගැඹුරු දෙයක් මෙතන තියෙන්නේ. **ඒක යට තියෙන්නේ අනිත්‍ය සංඥාව. යෝනිසෝ මනසිකාරයටයි ඒක අහු වෙන්නෙ අර 'තජ්ජං' කථාව. ඒ ඒ ස්පර්ශය නිසා ඒ ඒ වේදනාවෝ හටගනිත්. මේ ටික මතක තියාගන්න. ඒ ඒ ස්පර්ශයන්ගේ නිරෝධයෙන් ඒ ඒ වේදනාවෝ නිරුද්ධ වෙත්.**

දැන් සෑහෙන පමණ ඒ වේදනානුපස්සනාවට අදාළ දේවල් කියවුණා. ඊළඟට අපි පසුබිමක් හැටියට මතක තියාගනිමු. මේ පින්වතුන් කවුරුත් අහල තියන පඤ්ච උපාදානස්කන්ධයට බුදුරජාණන් වහන්සේ දුන්න උපමා බොහොම දෙනෙක් අහල තියෙනවා. රූපය පෙණ පිඬක්, වේදනාව දිය බුබුළු, සඤ්ඤාව මිරිඟුවක්, සංස්කාර කෙසෙල් කඳ විඤ්ඤාණය මායාව[9]. හැම එකකින්ම පෙන්නුම් කරන්නේ අනිත්‍යතාව, අනාත්ම ස්වභාවය, නිස්සාර බව. වේදනාව ගැන කියාපු උපමාව ටිකක් විස්තර කළොත් මෙහෙමයි කියන්න තියෙන්නේ. 'මහණෙනි, යම් සේ සරත් සමයෙහි දැඩි පොද ඇති වැස්සක් වසින කල්හි දිය මතුපිට දිය බුබුළු ශීඝ්‍රයෙන් පැන නගිමින් නිරුද්ධ වෙනවා, පැන නගිමින් නිරුද්ධ වෙනවා. ඒක දකින නුවණැති පුද්ගලයා 'යෝනිසෝ' නුවණින් දකිනවා ඒක කොයි තරම් නිස්සාරද කියලා. **එතන එතනම නිරුද්ධ වෙනවා එතන එතනම නිරුද්ධ වෙනවා.' ඔන්න ඕකයි එතකොට වේදනාව පිළිබඳ එහි නිස්සාරත්වය පෙන්නන්න බුදුරජාණන් වහන්සේ දීපු උපමාව.** ඒකත් හිතේ පිටිපස්සෙන් තියාගන්න.

ඔන්න ඊළඟට අපි යනවා සූත්‍ර දේශනා අතර තියන සුවිශේෂ දේශනාවකට මේ වේදනානුපස්සනාවට අදාළව. මැදුම් සඟියේ නන්දකොවාද සූත්‍රය.[10] ඒක අමුතුම දේශනාවක්. ඒකේ නිදානය කිව්වොත් - බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ වාසය කරන අවස්ථාවක - ඒ කාලයේ සිරිතක් තිබුණා බුදු රජාණන් වහන්සේගේ විනය නීතියක් අනුව ස්ථවිර භික්ෂූන් වහන්සේලා අඩ මසකට වරක් භික්ෂුණීන් වහන්සේලාට අවවාද කරන්න යා යුතුයි. ප්‍රජාපතී ගෝතමියත් ඇවිල්ල කියලා මතක් කළා, දැන් අවවාද කරන්න වෙලාව ඇවිල්ලා කියලා. බුදුරජාණන් වහන්සේ ඇහුවා කාගෙද වාරය. මේ වාරය නන්දක තෙරුන් වහන්සේගේ-භික්ෂූන් වහන්සේලා කිව්වා. ඒ උනාට නන්දක තෙරුන්

වහන්සේ කැමති නැහැ භික්ෂුණීන් වහන්සේලාට අවවාද කරන්න යන්න කියලා. බුදුරජාණන් වහන්සේ කියනවා ''නන්‍දක, යන්න. ගිහිල්ලා අනුශාසනා කරන්න, භික්ෂුණීන්ට ධර්‍ම කථා කරන්න. හොඳමයි ස්වාමීනි කියල නන්‍දක ස්‌වාමීන් වහන්සේ ඒ මෙහෙණවරට-රාජකාරාමය කියන මෙහෙණින් වහන්සේලා වැඩවාසය කරන තැනට-වැඩම කළා. ඒ මෙහෙණින් වහන්සේලාත් වැඳලා ඉඳගත්තා බණ අහන්න. ඔන්න ධර්‍ම දේශනාව යන හැටි. පළමුවෙන්ම කිව්ව, ''නැගණිවරුනි දැන් මේ දේශනාව යන්නේ ප්‍රශ්නෝත්තර වශයෙන්. මං අහනකොට දන්නවා නම් දන්නවා කියන්න ඕන. නොදන්නවා නම් නොදන්නවා කියන්න ඕන. සැක ඇති තැනක් තියෙනවා නම් මගෙන්ම අහන්න ඕන''. බොහොම හොඳයි කියලා සතුටු වෙලා අහන් ඉන්නවා. ඊළඟට සාමාන්‍යයෙන් කොතනත් වගේ කියන ත්‍රිලක්ෂණ දේශනාවෙන් පටන්ගන්නවා. නැගණිවරුනි, ඇස නිත්‍යද අනිත්‍යද? අනිත්‍යයි සවාමීනි, යමක් අනිත්‍ය නම් එය දුකද සැපද? දුකයි ස්‌වාමිනි, යමක් අනිත්‍ය නම් දුක නම් වෙනස්වනසුලු නම් එයට මමය මාගේය කියන්න සුදුසුද? නැතමය ස්‌වාමීනි, ඇස ගැන ඇහුව වගේ හිතාගන්න, කන නැහැය දිව කය මන කියන ඒ ආධ්‍යාත්මික ආයතන හය පිළිබඳවම එකින් එක මේ නන්‍දක ස්‌වාමීන් වහන්සේ ප්‍රශ්න කළා. තෙරණියන් වහන්සේලා පිළිතුරු දීලා ඉවර කරන්නෙ මෙහෙමයි. අපි එහෙම පිළිතුරු දෙන්නේ මොකද කියලත් කියනවා. "ස්‌වාමීනි, අපි කලින්ම ආර්‍ය ප්‍රඥාවෙන් යථාභූත වශයෙන් දැක්කා, ආධ්‍යාත්මික ආයතන හයම අනිත්‍ය බව''.

ඔන්න ඊළඟ ප්‍රශ්න වාරය බාහිර ආයතන පිළිබඳව. නැගණිවරුනි, රූප නිත්‍යද, අනිත්‍යද? අනිත්‍යයි. ශබ්‍ද, ගන්‍ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම කියන බාහිර ආයතන ගැනත් අර විදියටම ප්‍රශ්න කරනවා. ඒවටත් අර විදියටම පිළිතුරු දෙනවා. අනිත්‍ය බවත්, අනාත්ම බවත්. එතෙන්දිත් අන්තිම කරන්න අපි මෙහෙම පිළිතුරු දෙන්නේ එක පාරම ඒකත් අපි කලින්ම දැකල තියන නිසා කියලා. ඊළඟට තුන්වෙනි ප්‍රශ්නෝත්තර වාරය, විඤ්ඤාණ හය ගැන. නැගණිවරුනි, චක්‍ඛු විඤ්ඤාණය නිත්‍යද, අනිත්‍යද? අනිත්‍යයි. අනිත්‍ය නම් දුකද. ඒ විදියට හිතාගන්න විඤ්ඤාණ හයෙත් අනිත්‍යතාව ඒ විදියට මතක් කරලා දුන්නා. එතනදීත් අර මෙහෙණින් වහන්සේලා කියනවා, අපි මේක කලින්ම දැකලා තියෙනවා.

ඔන්න ඊළඟට එනවා අමුතුම උපමා තුනක්. එතනයි මේ සූත්‍රයේ වටිනාකම තියෙන්නේ. පළමුවෙනි උපමාව මේකයි. ''නැගණිවරුනි, දැල්වෙන තෙල් පහනක් තියනවා. ඒ දැල්වෙන තෙල් පහනේ තෙලුත් අනිත්‍යයි, වැටියත් අනිත්‍යයි, පහනේ දැල්ලත් අනිත්‍යයි, ආලෝකයත් අනිත්‍යයි. නමුත් යම් කෙනෙක් කියනවා නම් මේ දැල්වෙන පහනේ තෙලුත් අනිත්‍යයි, වැටියත් අනිත්‍යයි, දැල්ලත් අනිත්‍යයි, හැබැයි ආලෝකය නිත්‍යයි සදාකාලිකයි ස්ථිරයි කියලා කියනවා නම් ඒ කීම හරිද? ඒකට උත්තර දෙන්නේ කොහොමද, මෙහෙණින් වහන්සේලා. ''නැතමය ස්වාමීනි, මොකද අරවා අනිත්‍ය නම් මේකත් අනිත්‍ය වෙන්න එපායැ.'' ඔන්න එතෙන්දි එළියට එනවා අර කියාපු සිද්ධාන්තය. බුදුරජාණන් වහන්සේ ''තජ්ජං තජ්ජං ඵස්සං'' කියලා වදාළනෙ. අර මෙහෙණින් වහන්සේලා එක හඬින් උත්තර දෙනවා මොකද හේතුව කියලා. ''**තජ්ජං තජ්ජං භන්තෙ, පච්චයං පටිච්ච තජ්ජා තජ්ජා වෙදනා උප්පජ්ජන්ති. තජ්ජස්ස තජ්ජස්ස පච්චයස්ස නිරොධා තජ්ජා තජ්ජා වෙදනා නිරුජ්ඣන්ති.**'' ස්වාමීනි, මේකයි හේතුව. ඒ ඒ ප්‍රත්‍යයන් නිසා ඒ ඒ වේදනාවෝ ඇති වෙත්. ඒ ඒ ප්‍රත්‍යයන්ගේ නිරෝධයෙන් ඒ ඒ වේදනාවෝ නිරුද්ධ වෙත්. ප්‍රත්‍යය කියන්නේ එතන ස්පර්ශය - සූත්‍රයේ එහෙම කියල නැහැ. සාමාන්‍යයෙන් හිතන්න තියෙන්නේ ඒ තෙරණියන් වහන්සේලා නිකම්ම අහන් හිටිය නොවෙයි. අපි නිදසුනකට කියතොත් එක විදියට ඉඳගත් ඉරියව්වෙන් ඉඳගෙන ඉන්නවා නම් වේදනා ආදිය එනවනෙ. අර දේශනාව ආශ්‍රයෙන් වේදනානුපස්සනාව කළා වෙන්න ඇති. එක හඬින් කිව්වා - තජ්ජං තජ්ජං - ඒ ඒ ස්පර්ශ නිරෝධයෙන් ඒ ඒ වේදනාවෝ නිරුද්ධ වෙත්. ඔන්න ඒ සිද්ධාන්තය මතු වුණා ඇත්ත වශයෙන් ඒක කිව්වෙ මෙහෙමයි. ඒක සම්බන්ධ කළා අර උපමාවට. උපමාවට සම්බන්ධ කළේ මෙහෙමයි.

යම් කෙනෙක් කියනවා නම් ඇස කන නාසය ආදී ආධ්‍යාත්මික ආයතන අනිත්‍යයි. නමුත් ඒවා නිසා ඇති වන සැප දුක් ආදී වේදනා නිත්‍යයි කියලා. ඒ ප්‍රකාශය හරිද කියල ඇහුවමයි අන්න අර ටික කිව්වෙ අර උපමාවට ගලපල කිව්වෙ. එයින් පෙන්නුම් කරන්නේ අර තෙල් පහනේ උපමාව දුන්නෙ ආධ්‍යාත්මික ආයතන වන ඇස, කන, නාසය, දිව, කය, මන කියන එකේ අනිත්‍යතාව පෙන්වන්නයි. ඊළඟට දෙවන

උපමාව දුන්න නැගණිවරුනි හරවත් ලොකු ගහක් තියනවා. ගසේ මුල අනිත්‍යයි, කඳ අනිත්‍යයි. අතුපතර ආදියත් අනිත්‍යයි. සෙවණැල්ලත් අනිත්‍යයි. නමුත් යම් කෙනෙක් කියනවා නම් මේ ගහේ මුල අනිත්‍යයි, කඳ අනිත්‍යයි නමුත් සෙවණැල්ල නිත්‍යයි කියල ඒක හරිද? නැතමය ස්වාමීනි, මොකද හේතුව, අරවා අනිත්‍ය නම් මේකත් අනිත්‍ය වෙන්න ඕන, ඔන්න ඒකට ගලපල කියනවා. එසේම නැගණිවරුනි බාහිර ආයතන ගැනයි ඊළඟට කියන්නේ. රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම කියන ඒවා අනිත්‍ය නම් ඒවා නිසා ඇති වන සැප දුක් නොදුක් නොසුව ඒවාත් අනිත්‍ය වෙන්න ඕන. එහෙම කිව්වහම එතනදිත් හේතුව වශයෙන් අර 'තජ්ජං තජ්ජං' කථාව කියනවා. ''**තජ්ජං තජ්ජං භනෙත, පච්චයං පටිච්ච තජ්ජා තජ්ජා වෙදනා උප්ප ජ්ජන්ති. තජ්ජස්ස තජ්ජස්ස පච්චයස්ස නිරොධා තජ්ජා තජ්ජා වෙදනා නිරුජ්ඣන්ති.**'' එතකොට ආධ්‍යාත්මික ආයතන හයත් බාහිර ආයතන හයත් පිළිබඳව අර 'තජ්ජ කථාව' ඉදිරිපත් කරලා තියෙන්නෙ ඒ තෙරණින් වහන්සේලාට ඒ දේශනාව කරන අතර ඒක ප්‍රත්‍යක්ෂ වෙන්න ඇති. ඒක දකින්න ඇති. ඒ ගැන ඉඟියක් සූත්‍රයේ නම් නැහැ.

ඔන්න ඊළඟට අමුතුම උපමාවක් දෙනවා. නැගණිවරුනි, යම් කිසි ගව ඝාතකයෙක් හෝ ගව ඝාතකයකුගේ අතවැසියෙක් ගව දෙනක් මරලා තියුණු ගව කැත්තකින් අර ගව දෙන හම ගහනවා. මස් කැපිල මස්වලට තුවාලයක් නැති වෙන්නත් හමට තුවාලයක් ඇති නොවන ලෙසත් ඉතාම සියුම් අන්දමින්. ටිකක් හිතාගන්න බලන්න මස් කුට්ටිය එන්නෙ නැති විදියට හම වෙනම ගැලෙව්වා. හැබැයි ඒ දෙක අතර තියන සන්ධි නහර පමණක් කැපුවා. එතකොට හිතාගන්න මැරිච්ච ගව දෙනක්නෙ. මරල ඉවරවෙලා හමගැහුවා. අර මසට සම්බන්ධ නහර. කපලා ඔන්න ඊළඟට ඒ ගව ඝාතකයා මෙහෙම එකක් කරනව. හම එහෙම වෙන් කරලා ඉවර වෙලා ආයිමත් අර ගව දෙනගේ ශරීරය උඩ  ඒක අතුරල වහල ඉවර වෙලා අර ගව ඝාතකයා කියනවා "ඔය ඉතින් ගවදෙන හිටිය හැටියටම ඔය ඉන්නෙ. වෙනසක් නැහැ. හමෙන් වැහිල තියෙනව" එහෙම කීම හරිද කියලා මෙහෙණින් වහන්සේලාගෙන් අහනවා. ''නැතමය ස්වාමිනි'' කියලා පිළිතුරු දෙනවා. **මොකද හේතුව හමයි මසයි අතර නහර සිඳලනෙ.** ඒ ටික කැපුවනෙ ගව කැත්තෙන්. එතකොට ඒ උපමාව හරි. ස්වාමීන් වහන්සේ කියනවා නැගණිවරුනි,  මම මේ උපමාවක් දුන්නේ.

ඔබට දැන් අර්ථය දෙන්නම්. **ඇතුළත තියන මස් ගොඩ කියන්නේ ආධ්‍යාත්මික ආයතන හයට වෙන නමක්, පිටින් තියන හමයි කියල කියන්නේ බාහිර ආයතන හයට වෙන නමක්. මේ දෙක සම්බන්ධ වෙලා තියන නහරින් හැඳින්වෙන්නේ නන්දිරාගයයි.** නන්දිරාග කියන්නේ පින්වතුනි තණ්හාවට නමක්. නන්දි කියන්නේ තුටු වීම, රාග කියන්නේ ඇල්ම. එතකොට නන්දිරාගය තමයි හමත් මසත් සම්බන්ධ වෙන නහර එතකොට ඒවා කැපුවා. ඒ කැපූ නිසා බැලූ බැල්මට අර හිටිය ගව දෙන වගේ පෙනුණට මොකද වෙනසක් තියෙනවා. හම ඔහේ දාලා තියනවා.

ඊට කලින් දේශනාවේදී අපි සඳහන් කළ කරුණු ටික සිතට නගා ගන්න පුළුවන් දැන්. බුදුරජාණන් වහන්සේගේ රස තෘෂ්ණාව ගැන කියන කොට කිව්වනේ "රස පටිසංවෙදී භගවා හොති, නො ච රසරාග පටිසංවෙදී". භාග්‍යවතුන් වහන්සේට රස නහර ක්‍රියාත්මක වෙනවා. රස දැනෙනවා. නමුත් රස රාගය නැහැ. මේ උපමාවට කිට්ටු කරගන්න ඕන. **නහර කැපුවෙ නිවනෙන්. නහර තමයි නන්දිරාගය. තෘෂ්ණාව.** නහර කපන්න ඕනෙ නැහැ. නන්දිරාගයයි ඉවත් කරන්නේ. අන්තිමට කියනවා ගව කැත්ත මොකක්ද. ගව කැත්ත කියන්නේ **ආර්ය ප්‍රඥාවටම නමක්. ආර්ය ප්‍රඥාව නමැති ගව කැත්තෙනුයි අර එළදෙනගේ හමයි මසයි සියුම් අන්දමින් වෙන් කරන්නේ. නහර විතරක් කපලා.** බැලූ බැල්මට ඒ එළදෙන වගේ නමුත් වෙනසක් තියෙනවා. **ලෞකික ලෝකෝත්තර අතර වෙනස තේරුම්ගන්න බලන්න. අර නෙළුම් පතේ දිය බිංදුව ආදී උපමාවන්ටත් සම්බන්ධ කරන්න.** ඔන්න දේශනාව ඉවර වෙන්න ළඟයි. නන්දක ස්වාමීන් වහන්සේ ඔය ටික කියලා මෙහෙණින් වහන්සේලාට මතක් කරලා දෙනවා බොජ්ඣඞ්ග. මෙහෙම බොජ්ඣඞ්ග හතක් තියෙනවා නැගණිවරුනි, සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා. ඒ එක එකක්ම නිවනට නැඹුරු කරලා වැඩුවොත් - ඒකට වචන කීපයක් තියනවා. නිවනට නැඹුරු කරලා වැඩීම ගැන 'විවෙක නිස්සිතං, විරාග නිස්සිතං, නිරොධ නිස්සිතං, වොස්සග්ගපරිණාමිං' මේ එක් එක් සම්බොජ්ඣඞ්ගය - විවේක, විරාග නිරොධ ඔක්කොම නිවනටම නම් - නිවනට නැඹුරු කරලා වැඩුවොත් රහත් ඵලය ලබාගන්ට පුළුවන්. ඔය ටික කියලා නන්දක ස්වාමීන් වහන්සේ භික්ෂුණීන් වහන්සේලාට කියනවා ''ආ දැන් කාලෙ හරි නැගණිවරුනි, දැන් යන්න''. භික්ෂුණීන් වහන්සේලා

නැගිටල වන්දනා කරලා බුදුරජාණන් වහන්සේ ළඟට වැඩම කළා. බුදුරජාණන් වහන්සේට වන්දනා කරලා හිටගෙනම ඉන්නකොට බුදුරජාණන් වහන්සේත් කියනවා නැගණිවරුනි 'යන්න'. වැඩි කතාවක් නැහැ 'යන්න' කිව්වා. ඒ අයත් ගියා. ගියාට පස්සේ බුදුරජාණන් වහන්සේ උපමාවක් දෙනවා සංඝයා වහන්සේලාට. 'මහණෙනි' තුදුස්වක් පෝය කියන්නේ දහ හතරවෙනි දවස. පසළොස්වක කියන්නේ පසළොස්වෙනි දවස ඔන්න උපමාව දෙන්නේ මෙහෙමයි. ''මහණෙනි තුදුස්වක් පෝය දවසක හඳ දිහා බලනකොට වැඩිදෙනෙකුට සැකයක් ඇති වෙන්නෙ නැහැ. හඳේ අඩුවක් තියනවද පිරිල තියනවද කියල. ඇත්ත වශයෙන්ම අඩුවක් තියනවා. අන්න ඒ වගේ මේ පන්සියයක් භික්ෂුණීන් වහන්සේලාට නන්දකගේ දේශනාවෙන් සතුටක් ඇති වුනා. නමුත් බලාපොරොත්තු ඉෂ්ට වුනේ නැහැ. එහෙම කියලා බුදුරජාණන් වහන්සේ නන්දක ස්වාමීන් වහන්සේට කියනවා "නන්දක හෙටත් ගිහිල්ලා මේ දේශනාවම පවත්වන්න" කියලා. දැන් මේ කාලයේ වගේ යන්ත්‍ර තිබුන නම් එහෙම උන්වහන්සේට හරිම ලෙහෙසියි. බුදු රජාණන් වහන්සේ ''ඒ දේශනාවම එහෙමම හෙටත් පවත්වන්න භික්ෂුණීන්ට'' කියල වදාළා.

ඊළඟ විස්තරය පොතේ තියෙන්නෙ කෙටියෙන්. ඊළඟ දවසේ නන්දක ස්වාමීන් වහන්සේ පිණ්ඩපාතයේ වැඩම කරලා පිණ්ඩපාතයෙන් පස්සෙ ආයෙත් මෙහෙණවරට ගියා. භික්ෂුණීන් වහන්සේලාත් ඉඳගත්තා. අර විදියටම මුල ඉඳලම ප්‍රශ්න කරලා අර දේශනාව සම්පූර්ණයෙන්ම අකුරෙන් අකුරටම දේශනා කළා. දේශනා කරලා ආයිත් ''නැගණිවරුනි, දැන් වෙලාව හරි'' යයි වදාළා. භික්ෂුණීන් වහන්සේලා නැගිටලා ගියා. අර විදියටම බුදුරජාණන් වහන්සේ ළඟට ගියා. භික්ෂුණීන් වහන්සේලාටත් බුදුරජාණන් වහන්සේත් ''හා හොඳයි යන්න'' කිව්වා. ගියාට පස්සේ බුදුරජාණන් වහන්සේ වෙන උපමාවක් දුන්නා සංඝයා වහන්සේලාට. මහණෙනි, පසළොස්වක් පොහොය දවසේ හඳ දිහා බැලුවහම වැඩිදෙනෙකුට සැකයක් නැහැ හඳ පිරිලද අඩුද කියලා. පිරිලමයි. අන්න ඒ වගේ මේ භික්ෂුණීන් වහන්සේලාගේ සතුට පමණක් නොවෙයි මනදොළත් පිරිලා. කොටින්ම කියතොත් බලාපොරොත්තු ඉෂ්ට වෙලා. එතනදි ප්‍රකාශ කරන අන්තිම වාක්‍යය මෙහෙමයි. මේ පන්සියයක් දෙනාගෙන් අඩුම අධිගමයක් ලැබූ මෙහෙණිය සෝවාන්. මේක මහ පුදුම

සිද්ධියක්. එකම දේශනාව අහලා මුල් දවසේ මාර්ග ඵල ලැබුණේ නැහැ. දෙවන දවසේ අඩුම ප්‍රතිඵල ලැබූ මෙහෙණිය සෝවාන්. එයින් අපට හිතාගන්න තියෙන්නෙ අර 'තජ්ජං තජ්ජං' වේදනානුපස්සනාවයි ඒකේ යට තියෙන්නේ. ඒ අතින් අමුතුම දේශනාවක් මේක.

ඔන්න ඊළඟට අපි යන්නේ මාර සංයුත්තයේ තිබෙන මාරක දේශනාවකට. පරිස්සම් වෙන්න, 'පරිස්සම් වෙන්න' කියන්නේ ඒ දේශනාව වරදවල තේරුම් අරගෙන සමහර උගත්තු අපේ ධර්මයටත් නිග්‍රහ කරනවා. සමහර අය වරදවල තේරුම් අරගෙන දිවි නසාගන්නවා. ඔන්න ඔහොම බොහොම පටලැවිලි තියනව. නමුත් ගැඹුරු ධර්මයක් සඳහන් වෙන දේශනාවක් තමයි සංයුත් සඟියේ එන ගෝධික සූත්‍රය.[11] ගෝධික ස්වාමීන් වහන්සේ පිළිබඳ සූත්‍රය. මෙහෙමයි ඒකේ තියෙන්නෙ. බුදුරජාණන් වහන්සේ රජගහ නුවර වැඩ වාසය කරන කාලයේ ගෝධික සවාමීන් වහන්සේ ඉසිගිලි පර්වතයේ එක බෑවුමක කුටියක් හදාගෙන වැඩ වාසය කළා. උන් වහන්සේ බොහොම වීර්යය වඩලා - එතන පොතේ තියෙන්නේ 'සාමයික චෙතො විමුත්ති' - තාවකාලික යම් කිසි ලෞකික සමාධියක් ලබාගත්තා. බොහොම වීර්යය වඩලා ලබාගත්තු හැටියෙ මොන යම් හේතුවක් නිසා හෝ ඒ සමාධියට හිත ස්පර්ශ කරනවත් එක්කම ඒ සමාධිය ගිලිහිලා ගියා. සමාධිය නැති වුණා. දෙවන වරටත් සමාධිය නැති වුණා. තුන්වෙනි හතරවෙනි පස්වෙනි හයවෙනි වරත් සිත සමාධියට යනවා ඒකෙන් ගිලිහෙනවා. හයවෙනි වරට මේ සමාධිය ගිලිහිලා ගියාට පස්සේ ගෝධික ස්වාමීන් වහන්සේ කල්පනා කළා. හය සැරයක්ම සමාධියෙන් පිරිහුණා. මහ පුදුම දෙයක් කල්පනා කළා. මම ගෙල කපාගන්නවා. **ගෙල කපාගන්නවා.** ඉතින් මේ සිතිවිල්ල පොතේ සඳහන් වෙන හැටියට මෙහෙමයි.

මේ සිතිවිල්ල මාරයා දැකලා බුදුරජාණන් වහන්සේ හමු වන්න ගිහිල්ලා එතන ගාථාවකින් දක්වනවා. බුදුරජාණන් වහන්සේට බොහොම ගෞරව දක්වනවා වගේ කියවනවා. "මහා වීරයාණන් වහන්ස, ඔබ වහන්සේගේ (සේඛ කියන වචනයෙන් පෙනෙනවා ගෝධික ස්වාමීන් වහන්සේ ඒ වෙනකොට සෝවාන් තත්ත්වයේ සේඛ පුද්ගලයෙක්. රහත් වෙලා නැහැ) සේඛ තත්ත්වයේ සිටින ඔබවහන්සේගේ ශ්‍රාවකයෙක් දිවි

නසාගන්න හිතනවා. ඒක වළක්වාලන්න කියලා. බුදුරජාණන් වහන්සේට මේ මාරයා කියන්නේ. මාරයා කියන්නේ වළක්වන්න කියලා. මේක මහා පුදුම කතාවක්. මාරයා නොකියන දෙයක් මෙතනදි කියන්නේ, කපටිකම නිසා. තේරුම්ගන්න බලන්න. ඊළඟට එහෙම කියන අතරෙම ගෝධික ස්වාමීන්වහන්සේ යම් කිසි තියුණු ආයුධයකින් ගෙල කපා ගත්තා. මේක බුදුරජාණන් වහන්සේ දැකල මේ මාරයාගේ අභියෝගයට අමුතුම උත්තරයක් බුදුරජාණන් වහන්සේ දෙන්නේ. මේක විවාදාපන්නයි. මහ පුදුම ගාථාවක්.

**එවං හි ධීරා කුබ්බන්ති - නාවකඞ්ඛන්ති ජීවිතං**
**සමූලං තණ්හං අබ්බුය්හ - ගොධිකො පරිනිබ්බුතො**

බුදු රජාණන් වහන්සේ ඒකට දොස් කිව්වා නොවෙයි ප්‍රශංසා කළා. 'එවං හි ධීරා කුබ්බන්ති' මෙහෙම තමයි ප්‍රාඥ කට්ටිය වැඩ කරන්නේ, ක්‍රියා කරන්නේ. 'නාවකඞ්ඛන්ති ජීවිතං' ජීවිත අපේක්ෂාවකුත් නැහැ. 'සමූලං තණ්හං අබ්බුය්හ' තණ්හාව මුලත් එක්කම උදුරලා දාලා. මතක තියාගන්න තණ්හාවේ මුල වේදනාවනෙ. **එතකොට තණ්හාව මුලින් උදුරා දැමීමේදී වේදනාවත් එක්කම ඇදල දැම්ම.** 'සමූලං තණ්හං අබ්බුය්හ - **ගොධිකො පරිනිබ්බුතො'** **ගෝධික පිරිනිවන් පෑවා.** මේක බොහොම විවාදාපන්නයි. ඔන්න ඊළඟට තියන ටිකත් කියමු. ඊට පස්සේ බුදුරජාණන් වහන්සේ මේ සිද්ධිය සංඝයා වහන්සේලාට කියලා කාලසිලා කියන ඒ ඉසිගිලි පර්වතයේ උන්වහන්සේ වැඩ සිටි තැනට වැඩම කළා සංඝයා වහන්සේලාත් එක්ක. ඈතදීම දුටුවා අර භික්ෂූන් වහන්සේලා ගෝධික ස්වාමීන් වහන්සේගේ ශරීරයෙන් ගෙල වෙන් වෙලා තියනවා. අමුතු සිද්ධියක් එතන තියනවා. ඒ වෙලාවේ යම් කිසි අඳුරු දුමාරයක් - පොතේ සඳහන් වෙන්නේ මෙහෙමයි - නැගෙනහිර දිසාවට යනවා, බටහිර දිසාවට යනවා. උතුරට, දකුණට, අනු දිසාවලට, උඩට, යටට යනවා අඳුරු දුමාරයක්. බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලාගෙන් අහනවා.

''මහණෙනි, පේනවද මේ අඳුරු දුමාරයක් ඒ අතට මේ අතට යනවා.'' ''එසේය ස්වාමීනි'', ඔය මාරයා ගෝධික කුල පුත්‍රයාගේ විඤ්ඤාණය සොයනවා. ගෝධික කුල පුත්‍රයාගේ විඤ්ඤාණය කොහේ පිහිටියාද කියලා සොයනවා. ඔන්න ඊළඟට එනවා අන්තිම වාක්‍යය

බුදුරජාණන් වහන්සේගෙ. **'අප්පතිට්ඨිතෙන විඤ්ඤාණෙන ගොධිකො පරිනිබ්බුතො'** ගෝධික කුල පුත්‍රයා පිරිනිවන් පෑවා **නොපිහිටි විඤ්ඤාණයකින්.** අපේ නිවන දේශනා කියවපු පින්වතුන් දන්නවා ඇති ඔය භවයට යන හිත පිළිබඳවයි කියන්නෙ. ඒක අපි තේරුම් කරමු. දැන් සාමාන්‍ය පෘථග්ජනයා කියන්නෙ හැම තිස්සෙම අල්ලගන ඉන්න කෙනෙක්නෙ. ඇදගෙන ඉන්න කෙනෙක්නෙ. පඤ්ච උපාදානස්කන්ධය කියන්නේ මොකක්ද? උපාදාන කියන්නේ අල්ලගන ඉන්න එකනෙ. ගොඩවල් පහක් අල්ලගන ඉන්නවා. දැන් පණ අදිනවා කියල කියන්නේ මරණ අවස්ථාවේ මාරයා අරහෙන් අදිනකොට මෙහෙන් අදිනවා. පණ අදිනවා කියලා කියන්නේ ඒකනේ. මේ මනුස්සයා කොහොම හරි මෙහේ ඉන්න බලනවා. එතකොට මාරයාට වැඩේ හරි. මාරයා කරන්නෙ මොකක්ද. එහෙම මැරෙන වෙලාවෙ මේ පැත්තට ඇද්දොත් - මාරයා හරි කපටියි - මාරයා 'ඉඳා' කියල අතහරිනවා. **'ඉඳා' කියල අතහරිනවා.** අර පුද්ගලයා ගිහිල්ලා භවයේ වැටෙනවා. භවයත් එක්කම ජාතිය තියනවා. ජාතියක් එක්කම උපන් දින තෑගි තියනවා ජරා, ව්‍යාධි, මරණ. ඔන්න මරණ අවස්ථාවේදී කඹේ අතහැරියෙ නැත්නම් වෙන දේ. **අල්ලගන හිටියොත් මාරයා දිනයි. නමුත් අතහැරියොත් මොකද වෙන්නේ? අත හැරීම තමයි ගෝධික ස්වාමීන් වහන්සේ කළේ.** ඒ ටික තේරුම්ගන්න බැහැ බොහොම බටහිර උගතුන්ටත්. ඉතාම සියුම් කාරණයක්. ඉතින් ඒ අවස්ථාවේ ගෝධික ස්වාමීන් වහන්සේ **තණ්හාව පමණක් නොවෙයි තණ්හාවට සම්බන්ධ වේදනාවත් අතහැරියා.** හිතන්න ගෙල කපාගන්නා එක සාමාන්‍යයෙන් හිතාගන්නත් බැරි දෙයක්. උන්වහන්සේට ධර්ම ශක්තියක් මොකක් හරි තිබුණ නිසා අර සමාධිය හය සැරයක් පිරිහිලා ගියා. සමාධිය උපකාර කරගෙන විදර්ශනා වඩන්නයි බලාපොරොත්තුව තියෙන්නෙ ඇත්තේ. ඒ නිසා ඊළඟට කල්පනා කළා මේ සමාධියත් එක්කම විදර්ශනාවට යන්න කියලා. අපට හිතාගන්නත් අපහසුයි.

විදර්ශනාවෙන් අන්තිමට ජයගත්ත බවයි පේන්නෙ. මේවා බොහොම විවාදාපන්නයි. අපට අහන්න ලැබිල තියනවා ඇතැම් සංඝයා වහන්සේලා වරදවල මේක තේරුම් අරගෙන සිය දිවි හානි කර ගත් බව. ඒ මෝඩ අදහස මොකක්ද? මට මේ ජීවිතයේ මීට එහා ඉස්සරහට යන්න බැහැ. මට අසනීප වැඩියි. මීට වඩා හොඳ ශරීරයක් ලබාගන්න ඕන කියල

හිතුවොත් මාරයට අහු වෙලා ඉවරයි. ප්‍රාර්ථනාවත් එක්ක. ඔක්කොම අතහරින්නයි ඕනෙ. දිවැස් හුල හිටවපු කට්ටිය හිටන් අවසාන මොහොතේදී අතහැරල නිවන් දුටුව කියල කියනවා. අතිශයෝක්ති සහිත නමුත් අටුවාවේ කියනවා. මේ පින්වතුන් අහලත් ඇති සමහර කථා. නමුත් යම් ධර්මතාවක් තියනවා. එක් යෝගාවචර ස්වාමීන් වහන්සේ නමක් කොටියා කන අතරේ එක එක මාර්ග ඵල ලබලා හදවත කනකොට රහත් වුනයි කියලා.

ඒවා සීමාන්තික උපමා. නමුත් වේදනානුපස්සනාව ඉතාම ප්‍රබල කර්මස්ථානයක්. අපි සමහර විට ඒක හඳුන්වන්නේ නිවනට දුර්ග මාර්ගයක් ලෙස. කවුරුත් ඒකේ යන්නත් බයයි. නමුත් හරියට ගියොත් අන්න දිනුවා. තවත් උපමාවක් අපි කියමු. සමහර අශ්ව රේස් තියනවා. කොයි අශ්වයද දිනන්නෙ කියලා තීරණය කරන්නේ ක්ෂණික ඡයා රූපයකින්. බැලුවහම පරදින්න වගේ ගිහිල්ල අන්තිමට දිනුම් කණුව ළඟදි පොඩ්ඩක් ඉස්සර වෙනවා. අන්න ඒ වගේ දෙයක් ගෝධික ස්වාමීන් වහන්සේ කළේ. නමුත් ඕක වැරදියට තේරුම් අරගෙන යම් කෙනෙක් නිවන් දකින්න හොඳම වැඩේ බෙල්ල කපාගන්න එකය කියල හිතුවොත් අන්න වැරදියි. එහෙම කරලා තියනව ඇතැම් අය. මම එහෙම කිව්වෙ ඔය දේශනාව විවේචනයට භාජන කරන්න පුළුවන් කෙනෙක්, වේදනානුපස්සනාවට අදාළ එකක් බව නොදැනීම නිසයි. මෙතන මහා උග්‍ර දෙයක් තියෙන්නෙ. හිතාගන්න මාරයාගේ කඹ ඇදිල්ල. ඒ අවස්ථාවෙ කොච්චර කිව්වත් සාමාන්‍ය පෘථග්ජනයා කරන්නේ මොකක්ද? දුක් වේදනාව ආපුවම කාම සුඛය සැපය හිතනවා එක්කො දිව්‍ය ලෝක ගැන හිතනවා. එක්කො ගෙදර තියන සැප ගැන හිතනවා. මරණ වෙලාවේ ඔන්න අල්ලාගත්තා. මාරයා 'ඉඳා' කියල අතහරිනවා. ගෝධික ස්වාමීන් වහන්සේ කළේ මොකක්ද? ඒකෙ අනිත් පැත්ත. ඒක අපි නිවන දේශනාවලත් යම් ප්‍රමාණයකට කියලා තියනවා. **මාරයා අදින කොට ගෝධික ස්වාමීන් වහන්සේ අතහැරියා. එතකොට මාරයාට මොකක්ද වෙන්නෙ. 'කොන්දම් මාරුවක්නෙ'.** මාරයාගෙ පස්ස ගිහිල්ලා බිම ඇනෙන්න ඇති. අන්න ඒකයි මෙතනින් ගන්න තියන පාඩම. වේදනානුපස්සනාවේ ඉතාම ගැඹුරු පැත්තක් අපි අපේ මට්ටමින් කියමු. වේදනානුපස්සනාවේ යෝගාවචරයෙකුට උපකාර වන ටික ඊළඟට තම තමන්ට අත්දකින්න පුළුවන්.

දැන් යෝගාවචරයකුට තියෙන ලොකුම බාධකයක් තමයි පර්යඞ්කයේ වැඩි වේලාවක් හිඳීම. පර්යඞ්කය සඳහා අපි බොහෝදෙනාට උපදෙස් දෙන්නෙත් මෙහෙමයි, ඇතැම් කෙනෙක් කියනවා විනාඩි තිහකට වැඩිය ඉන්නම බැහැ කියලා. අපි කියනවා තව විනාඩි පහක් වැඩි කරන්න. ඔහොම ඔහොම ටිකින් ටික වෙලාව වැඩි කරගෙන යම් වෙලාවක කියනව තවත් නම් ඉන්නට බැහැ කියලා, අන්න ඒ වේලාවේ තමයි මතක් කරගන්න තියෙන්නේ බුදුරජාණන් වහන්සේගේ චතුරංග සමන්නාගත වීර්යය[12]

**'කාමං තචො ච නහාරු ච අට්ඨීච අවසිස්සතු සරීරෙ**
**උපසුස්සතු මංස ලොහිතං, යං තං පුරිස ථාමෙන**
**පුරිසවිරියෙන පුරිසපරක්කමෙන පත්තබ්බං,**
**න තං අපාපුණිත්වා විරියස්ස සණ්ඨානං භවිස්සති'**

''ඇත්ත වශයෙන් හම නහර ඇට තිබියේවා! මස් ලේ වියළේවා පුරුෂ ථාමයෙන්, පුරුෂ වීර්‍යයෙන් පුරුෂ පරාක්‍රමයෙන් යමකට පැමිණිය හැකිද එයට නොපැමිණ වීර්‍යයාගේ බහාතැබීමක් නොවන්නේය.'' අන්න ඒ විදියට අධිෂ්ඨානයක් අරගෙන ඕන නම් කැඩිල පලච්චාවේ කියල අර වේදනාව තියන තැනට හිත යොදල කමටහනින් නිවාඩුවක් අරගෙන ඒ වේදනාව තුළ අන්තිමට ඒකට හරියටම හිත යෙදුවොත් ඒ වීර්යය තුළ බොජ්ඣංග වැඩෙනවා. දාඩිය දායි ඇඟෙන්. කමක් නැහැ ඔයිට වැඩිය දේවල්වලටනෙ අපි ජීවිතේ මුහුණ දීල තියෙන්නෙ. වේදනාවන් දරාගෙන ඉන්නවා. ඕන එකක් කැඩෙනව නම් කැඩිච්චාවෙ. එහෙම ඉන්න කොට ඇතැම් අවස්ථාවල මහ පුදුම දේවල් වෙනවා.

අපි නොකියාම ඇතැම් යෝගාවචරයෝ ගිහි යෝගාවචරයෝ පවා මේක කරලා සාර්ථක ප්‍රතිඵල ලැබූ අය ඉන්නවා. එතකොට එහෙම දෙකක් වෙනවා. අර වේදනාව දරාගන්න බැරි තරම් පිච්චිලා පිච්චිලා ගිහිල්ලා එක පාරටම සිසිල් වෙනවා. සිසිල් වුණාට පස්සෙ හරියටම කොන්ක්‍රීට් දැම්ම වගේ. ඊට පස්සෙ පැය ගාණක් වුණත් ඉන්න පුළුවනි. ඒ පැත්තෙන් සමථය දියුණු වෙනවා. ඊළඟට ඒක තුළ අවබෝධය - අර වේදනානුපස්සනාවත් ඒ එක්ක යනවනෙ. වේදනාව

එකක් කියල ගත්තු එක අන්න අර වැහි බිංදු උපමාව ඉබේටම තේරෙනවා ඒ වෙලාවෙ. **මම මේ එක වේදනාවක් කියලා අරගෙනයි මේකත් එක්ක ගැටුණේ. දැන් බලනකොට මෙතන පුපුරු ගැහිල්ලක්. එක එක පුපුරක් තුළ නාම රූප අවබෝධය තියනව. පින්වතුනි නාමරූප අවබෝධය තියනවා.** අන්තිමට අපි අර නිතර යොදන වචන දෙක **ඝනසඤ්ඤාව දිය වෙලා රාසි සඤ්ඤාව මතු වෙනවා.** එතන විදර්ශනාව. ලෝකයා ඝන සඤ්ඤාව තුළයි ඉන්නෙ. එකක් හැටියට ගන්නවා. ඒක ප්‍රත්‍යක්ෂ වෙනවා. එකක් නොවෙයි මෙතන අර දිය බුබුළු ඇති වෙලා නැති වෙනවා. අන්න බුදුහාමුදුරුවන්ගේ උපමාවත් දැක්වෙනවා. ඒක තුළ විදර්ශනාව හුඟක් දුර ගිහිල්ලා. ඇත්ත වශයෙන් ඇතැම් කෙනෙක් ඒක හරියට කළොත් එක පැත්තකින් සමාධිය. අනිත් පැත්තෙන් සමහර විට ඒ ආසනයේම රහත් වෙන්න උනත් පුළුවන්. ඔන්න වේදනානුපස්සනාව. ඒ ආශ්‍රයෙන් තමයි අතීත පොත්වල තියෙන්නෙ කොටිය කන කතාන්තර. කෙසේ වෙතත් අපි තේරුම් ගන්න ඕන මේ යෝගාවචරයන්ට එන ඉතාමත්ම ප්‍රායෝගික දෙයක් මෙතන තියෙන්නෙ. ඒක මතක තියාගන්න. **අර ගෝධික ස්වාමීන් වහන්සේ ආදර්ශයක් හැටියට ගන්න - වැරදි විදියට නොවෙයි. දිවි නසාගන්න කරන ආරාධනාවක් නොවෙයි.** මෙතන ගන්න තියෙන්නේ තණ්හාව නසාගන්න කරන ආරාධනයක් ලෙස. **තණ්හාව නසාගන්න ආරාධනාවක් පමණයි.** මේකෙදි යම් ප්‍රයෝගික දේකුත් කියවුණා. යෝගාවචරයන්ට ප්‍රයෝජනවත් දෙයක්. මේ දේශනාව තුළින් අපි වේදනාව ගැන කිව්වෙ ඒකට ස්පර්ශයත් තණ්හාවත් ඉබේම සම්බන්ධ වෙනවා.

අද දින මේ දේශනාව තුළින් මේ පින්වතුන්ට තම තමන් කරන බණ භාවනාවලට යම් ජවයක් යම් ධෛර්යයක් ලැබුණා නම් ඒක අපි වැදගත් හැටියට සළකනවා. මේන නිකං උගතුන්ට විතරක් ගෝචර වෙන දෙයක් හැටියට සළකන්නෙ නැතිව එදිනෙදා ජීවිතයෙ තම තමන්ගේ බණ භාවනාවන්ට වේදනානුපස්සනාව ළංකර ගත්තොත් හුඟක් දුර යන්න පුළුවන්. සමථ පැත්තෙන් පර්යඞ්ක වේලාවත් වැඩි කරගෙන සමාධියක් ලබාගන්න පුළුවන්. විදර්ශනා පැත්තෙන් ලෝකෝත්තර මාර්ගඵල ලබාගෙන මේ ජීවිතයේදීම රහත් ඵලය පවා ලබාගන්න පුළුවන්. මේ පින්වතුන්ටත් ආශීර්වාද වශයෙන් අද දින මේ

විශේෂයෙන් කමටහන්වලට උපකාර වන මේ ධර්ම දේශනාව උපකාර කරගෙන හැකි තාක් ඉක්මනින් අපි නිතර සඳහන් කරන හැටියට ශාසන පහන නිවෙන්න කලින්-අර තෙල් පහන ගැන කිව්ව වගේ-ශාසන පහනත් දැන් නිවෙන්න ළඟයි. ඊට කලින් තම තමන් මේ සංසාරයෙන් මිදෙන්න බලාපොරොත්තු වෙනවා නම් අර ගෝධික ස්වාමීන් වහන්සේ වගේ ජීවිත පරිත්‍යාගයෙන් යෙදුනොත් තමන්ට ප්‍රතිඵල ලබාගන්ට පුළුවන්. ලබාගන්න හැකි වේවා! කියා අපි ආශීර්වාද කරනවා. අවීචියේ සිට අකනිටා දක්වා යම්තාක් සත්ත්ව කෙනෙක් මෙබඳු ධර්ම දේශනාමය ධර්ම ශ්‍රවණමය කුශලය අනුමෝදන් වීමට කැමති නම් අනුමෝදන් වීම තුළින් ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවනින් සැනසෙත්වා කියා ප්‍රාර්ථනා කරමින් මේ ගාථා කියන්න.

**එත්තාවතා ච අම්හෙහි...**

## පාදක සටහන්

1. ද්වයතානුපස්සනා සුත්ත, සුත්ත නිපාත, 230 පිට (බු.ජ. ත්‍රි. 25)

2. විභඞ්ග සුත්ත, සංයුත්ත නිකාය, 2-6 පිට (බු.ජ. ත්‍රි. 14)

3. චූල වෙදල්ල සුත්ත, මජ්ඣිම නිකාය, 1-710-716 පිටු (බු.ජ. ත්‍රි. 10)

4. සළායතන විභඞ්ග සුත්ත, මජ්ඣිම නිකාය, 3-460 පිටු (බු.ජ. ත්‍රි. 12)

5. සල්ල සුත්ත, සංයුත්ත නිකාය, 4-396 පිට (බු.ජ. ත්‍රි. 16)

6. මජේඣ සුත්ත, අංගුත්තර නිකාය, 4-186 පිට පිට (බු.ජ. ත්‍රි. 21)

7. තිස්ස මෙත්තෙය්‍ය සුත්ත, සුත්ත නිපාත, 318 පිට (බු.ජ. ත්‍රි. 25)

8. ඵස්සමූලක සුත්ත, සංයුත්ත නිකාය, 4-410 පිට (බු.ජ. ත්‍රි. 16)

9. ඵෙණපිණ්ඩූපම සුත්ත, සංයුත්ත නිකාය, 3-240 පිට (බු.ජ. ත්‍රි. 15)

10. නන්දකොවාද සුත්ත, මජ්ඣිම නිකාය, 3-552 පිට (බු.ජ. ත්‍රි. 12)

11. ගොධික සුත්ත, සංයුත්ත නිකාය, 1-220-222 පිටු (බු.ජ. ත්‍රි. 13)

12. උපක්කිලෙස සුත්ත, අංගුත්තර නිකාය, 1-100 පිට (බු.ජ. ත්‍රි. 18)

# 17 වන දේශනය

# 17 වන දේශනය

## (පහන් කණුව ධර්ම දේශනා අංක 199)
## 'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

තණ්හා දුතියො පුරිසො - දීඝමද්ධාන සංසරං
ඉත්ථභාවඤ්ඤථාභාවං - සංසාරං නාතිවත්තති
එතමාදීනවං ඤත්වා - තණ්හා දුක්ඛස්ස සම්භවං
වීතතණ්හො අනාදානො - සතො භික්ඛු පරිබ්බජෙ[1]

- ද්වයතානුපස්සනා සුත්ත, සුත්ත නිපාත

සැදැහැවත් පින්වතුනි,

සත්ත්වයා භවයෙන් භවයට සැරිසරන්නේ තෘප්තියක් නැති සෙවිල්ලක යෙදෙමින් බව තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලෝකයාට හෙළි කර වදාළා. සසර පැවැත්ම දුකක් බව නොතේරෙන්නෙත් ඒ සෙවිල්ලෙන් තෘප්තියක් ලැබිය හැකිය කියන අවිද්‍යාව නිසයි. තෘප්තියක සේයාවක් පෙන්වමින් පිටිපස්සෙන් ඉඳගෙන සත්ත්වයා පොළඹවන ඒ බලවේගය තණ්හාවයි. තණ්හාව දෙවෙනියා කරගෙන දීඝ කාලයක් සත්ත්වයා සසර සැරිසරන බව ප්‍රකාශ කෙරෙන මේ ගාථා දෙක අද අපි දහහත්වෙනි පටිච්ච සමුප්පාද දේශනාවට මාතෘකා කරගෙන පටිච්ච සමුප්පාද ධර්මය තුළ තණ්හාව වැදගත් වෙන හැටි සාකච්ඡා කරන්නයි බලාපොරොත්තු වෙන්නේ. මේ ගාථා දෙකත් දකින්න ලැබෙන්නේ සුත්ත නිපාතයේ ද්වයතානුපස්සනා සූත්‍රයේයි. මේ සූත්‍රයේ දේශනා රටාව මීට කලින් අපි පැවැත්වූ පටිච්ච සමුප්පාද දේශනා ගණනාවකදීම මේ පින්වතුන්ට පැහැදිලි කරල දීල තියනවා. ද්වයතාවක් පිළිබඳ අනුපස්සනාවකට තුඩුදෙන අන්දමින් ධර්ම කාරණා එකිනෙක ඉදිරිපත් කරන මේ සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ තණ්හාව පිළිබඳ ද්වයතාව ඉදිරිපත් කරන්නේ මෙහෙමයි.

"මහණෙනි, මැනවින් ද්වයතානුපස්සනාවේ යෙදීමේ තවත් ක්‍රමයක් තිබිය හැකිදැයි අසන්නවුන් ඇතොත් තිබිය හැකියයි කිව යුතුය. කෙසේද

තිබිය හැක්කේ? යම් තාක් දුකක් හටගනී ද, ඒ සියල්ල තණ්හාව ප්‍රත්‍යයෙනි. මේ එක අනුපස්සනාවකි. තණ්හාවගේම නිරවශේෂ විරාග නිරෝධයෙන් දුකෙහි හටගැනීමක් නැත. මේ දෙවෙනි අනුපස්සනාවයි. මහණෙනි, මැනවින් මේ ද්වයතානුපස්සනාවේ යෙදෙමින් අප්‍රමාදීව කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව වෙසෙන භික්ෂුවකට ඵල දෙකකින් එකක් බලාපොරොත්තු විය හැකියි. දිට්ඨ දම්යෙහිම රහත් ඵලය හෝ උපාදාන යමක් ශේෂව ඇතොත් අනාගාමි ඵලය හෝ. මේ විදියට හඳුන්වල තමයි බුදුරජාණන් වහන්සේ අපි මාතෘකා කළ ගාථා දෙක වදාළේ.

**තණ්හා දුතියො පුරිසො - දීඝමද්ධාන සංසරං**

තණ්හාව දෙවෙනියා කරගත් පුරුෂයා දීර්ඝ කාලයක් තිස්සේ සැරිසරන්නේ

**ඉත්ථභාවඤ්ඤථාභාවං - සංසාරං නාතිවත්තති**

'මෙසේ' බවත් 'අන් සේ' බවත් අතර තියන මේ සංසාරය නොඉක්මවයි.

ඊළඟට ප්‍රකාශ කරනවා -

**එතමාදීනවං ඤත්වා - තණ්හා දුක්ඛස්ස සම්භවං**

දුකෙහි හටගැනීම වන තණ්හාවේ මේ ආදීනවය දැන

**වීතතණ්හො අනාදානො - සතො භික්ඛු පරිබ්බජෙ**

තණ්හාව දුරු කරලා අල්ලාගැනීමෙන් තොරව සතිමත්ව භික්ෂුව හැසිරෙන්නේය.

ඉතින් මෙන්න මේ තණ්හාව ගැන කියන කොට පළමුවෙන්ම අපි මතක් කරගන්න ඕන පටිච්ච සමුප්පාද ධර්මයේ තණ්හාව සඳහන් වන ආකාරය. මේ පින්වතුන් කවුරුත් ඒ අංග දොළහෙන් යුක්ත පටිච්චසමුප්පාද ධර්මය දන්නවා. ඒකෙ මෙන්න මේ විදියටයි සඳහන් වෙන්නෙ. වෙදනා පච්චයා තණ්හා, තණ්හා, පච්චයා උපාදානං, තණ්හාව ඇති වෙන්නේ වේදනාව ප්‍රත්‍යයෙන්. ඒ වගේම තණ්හාව උපාදානයට ප්‍රත්‍යයක් වෙනවා. ඔන්න ඔය කාරණය මතක තියාගන්න ඕන -

තණ්හාවේ දෙපැත්තෙ තියන ඒ ප්‍රත්‍ය දෙක. ඊළඟට බුදුරජාණන් වහන්සේ සංයුත් සඟියේ විභංග සංයුත්තයේ[2] පටිච්ච සමුප්පාද විභංග සූත්‍රයේදී තණ්හාව හඳුන්වලා දෙන්නේ හය ආකාරයකටයි. ඉන්ද්‍රිය ආරම්මණ අනුව. මොනවද හය? **රූප තණ්හා, සද්ද තණ්හා, ගන්ධ තණ්හා, රස තණ්හා, ඵොට්ඨබ්බ තණ්හා, ධම්ම තණ්හා.** ඔය විදියට හය ආකාරයකටයි එතෙන්දි දක්වන්නේ.

නමුත් මේ පින්වතුන් වඩාත් අහල තියන ඉතාමත්ම ජනප්‍රිය හැඳින්වීම අපට ලැබෙන්නේ ධම්මචක්කප්පවත්තන සූත්‍රයෙන්.[3] ඔය පිරිත් කියන අහන පින්වතුන් හොඳට දන්නවා ඒකෙදි බුදුරජාණන් වහන්සේ චතුරාර්‍ය සත්‍යය විග්‍රහයේදී දුක්ඛ සමුදය ආර්ය සත්‍යය විග්‍රහ කරන්නෙ තණ්හාව ආශ්‍රයෙන්. ඒ පාඨය අපි බොහෝ අවස්ථාවල මතු කරල දුන්නා මේ පින්වතුන්ට නොයෙකුත් හේතුන් නිසා. '**යායං තණ්හා පොනොභවිකා නන්දිරාග සහගතා තත්‍රතත්‍රාභිනන්දිනී සෙය්‍යථීදං, කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා**'. 'පොනොභවිකා' නැවත භවයක් ඇති කරවන ස්වභාවය මේ තණ්හාවේ තියනවා. 'නන්දිරාග සහගතා' තුටු වීම් ඇලීම් සහිත. 'තත්‍රතත්‍රාභිනන්දිනි' ඒ ඒ තැන සතුටු වන ස්වභාවය ඇති. ඔන්න තණ්හාව හඳුන්වන ඒ පද තුන. ඊළඟට තියනවා කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා. කාම තණ්හා කියන්නේ පඤ්චකාමයන්ට කාම වස්තූන්ට ඇති තණ්හාව. භව තණ්හා කියන එක කෙටියෙන් කියතොත් ඔය ශාස්වත දෘෂ්ටි ආදියේ කියන ආකාරයට ආත්මයක පැවැත්ම දිගට දිගට පවත්වා ගැනීමට තියන තණ්හාව. විභව තණ්හාව කියල කියන්නේ ඒත් ආත්මයක් පිළිබඳ හැඟීම හා සම්බන්ධයි. උච්ඡේද වාදය හා සම්බන්ධයි. ආත්මයක විනාශය, මරණින් මතු විනාශය සිදු වේය යන කරුණ - අන්න ඒ පිළිබඳ තණ්හාව. ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ තණ්හාව ගැන ඒ විදියට හැඳින්වෙනවා. නමුත් විශේෂ කාරණයක් මතු කරනවා මේ පින්වතුන්ට හිත යොදන්න. අංගුත්තර නිකායේ තික නිපාතයේ තිත්ථායතන සූත්‍රයේදී[4] මේ අපේ බුදුරජාණන් වහන්සේම මේ විදියට ප්‍රකාශ කරනවා.

"කතමඤ්ච භික්ඛවෙ දුක්ඛ සමුදයං අරිය සච්චං" මහණෙනි, දුක්ඛ සමුදය ආර්ය සත්‍යය කුමක්ද කියලා ඉදිරිපත් කරන්නේ තණ්හාව නොවෙයි. අර අංග දොළහකින් සමන්විත පටිච්ච සමුප්පාදයයි. 'අවිජ්ජා

පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං' ඔය විදියටයි දක්වන්නේ. ඉතින් කෙනෙකුට මේක ගැටලුවක් වෙන්න ඉඩ තියනවා. ඇයි බුදුරජාණන් වහන්සේ පරස්පර විරෝධී දේශනාවක් වගේ එකක් කළේ? අතෙන්දි ධම්මචක්කප්පවත්තන සූත්‍රයේදී තණ්හාව කියලා වදාළා දුක්ඛ සමුදය හැටියට. මෙතෙන්දි වදාරනවා අවිජ්ජා පච්චයා සංඛාරා ආදී මේ අංග දොළහ. අපි මේක කොහොමද තේරුම් ගන්නේ? කෙනෙකුට හිතෙන්න පුළුවන් ඇයි බුදුරජාණන් වහන්සේ දුක්ඛ සමුදය ගැන කියනකොට අවිජ්ජා ගැන කිව්වෙ නැත්තෙ කියලා. දැන් මේ පින්වතුන් හොඳින් දන්න කාරණයක්. **අම්ම ගැන කියනකොට තාත්ත කෙනෙක් කොහේ හරි ඉන්න බව දන්නවනෙ. අන්න ඒ වගේ ඒ තාත්ත ගැන කියවෙන්නෙ ඔන්න අවිජ්ජා පච්චයා ආදී පටිච්ච සමුප්පාද ධර්මයෙන්.** මම ඒක තේරුම් කරලා දෙන්නම්. මීට කලින් අපේ පටිච්ච සමුප්පාද දේශනාවලදී මතු කරලා දුන්න විශේෂ කාරණය තමයි **මේ පටිච්චසමුප්පාද ධර්මයේ ඉතාමත්ම වැදගත් තැන අවිජ්ජා නොවෙයි. විඤ්ඤාණ නාම රූප අන්‍යෝන්‍ය ප්‍රත්‍ය සම්බන්ධතාවයි.** අපි දිය සුළිය කියල හැඳින්වූවේ ඒ අන්‍යෝන්‍ය ප්‍රත්‍ය සම්බන්ධතාවයි - පටිච්චසමුප්පාදයේ කේන්ද්‍රස්ථානය. එතකොට අවිජ්ජාව කියන්නේ මොකක්ද? මේ පින්වතුන්ට මෙන්න මෙහෙම තේරුම් ගත්තොත් වැඩිය පහසු වෙයි.

අවිද්‍යාව කියන අන්ධකාරය තුළ 'සංස්කාර' කියන '**අඳුරේ - අතපත ගෑමක්**' කෙරෙනවා. ඒ අඳුරේ අතපත ගෑමට අහු වෙන දෙකක් තියනවා - විඤ්ඤාණයයි නාමරූපයයි. ඔය **විඤ්ඤාණ නාමරූප දෙක අතර ඇත්ත වශයෙන් තියෙන්නෙ අන්‍යෝන්‍ය ප්‍රත්‍ය සම්බන්ධතාවක්. නමුත් සාමාන්‍ය ලෝකයා මේක තේරුම්ගන්නේ නැහැ. ඒ වෙනුවට මේක දෙකක් හැටියට ගන්නවා. ඒ දෙකක් හැටියට ගැනීම නිසා තමයි ලෝභ, දෝස, මෝහ, ඇලුම් ගැටුම් මුළා වීම් ඔක්කොම තියෙන්නේ.** මේක තේරුම් කරන්න ඕන උපමා අපි කොතෙකුත් කියල තියනවා. යම්තමින් මතක් කරගැනීම සෑහෙනවා. සරලම උපමාව අපගේ නිවනේ නිවීම දේශනා ඇතුළත් පොත්වල දක්වලා තියනවා. '**ඒදණ්ඩ උඩ බල්ලා**'. ඒදණ්ඩ උඩ යන බල්ලෙක් තමාගේම ඡායාව දැකලා වෙන බල්ලෙක් කියල හිතලා විටෙක වල්ගෙ හොලවාවි. එහෙම නැත්නම් ගොරවාවි. එහෙම නැත්නම්

කුතුහලයෙන් බලාවි. අන්න ලෝභ, දෝස, මෝහ. ඒ උපමාව තවත් නවීකරණයක් කරලා අපි ඉදිරිපත් කරලා තියනවා. දැන්, ඒකබොහෝ දෙනාට රසවත් කථාවක් බවට පත් වෙලා තියනවා - වඩා කලාත්මක අන්දමින් ඉදිරිපත් කළා **නාසිසස් කථාවෙන්** - ඒකේදි කිව්වේ ඒ පැරණි ග්‍රීක දේව කතාවක් ආශ්‍රයෙන්. නාසිසස් නමැති ග්‍රීක තරුණයා තමාගේ රූමත් මුහුණ කවදාවත් දැකල නැහැ. කැලේදී පොකුණකට නැඹුරු වෙනකොට ඒකෙ පිළිබිඹුව වතුරෙ තියනව දැකලා රැවටුණා දෙවඟනක් කියලා. රැවටිලා දෙවඟන වැළඳගන්න දින ගණනක්ම නිරර්ථක උත්සාහයක් කරලා එතනම මළා. ඒකෙදි තමාගේම ඡායාව බව නොදැනීම නිසයි එහෙම වුණේ.

තවත් මේකට නොයෙකුත් උපමා අපි දීලා තියනවා. මෙතන දෙකක් පිළිබඳ හැඟීම පෙන්නුම් කරන්න, මේ පින්වතුන්ට මතක ඇති අපි ආරම්භක දේශනාවේදී **අජිත් සුමිත් දාම් ඇදිල්ල** ගැන කිව්වා. දෙන්න එකතු වෙලා දාම් ඇදලා අන්තිමට ජය පරාජය පිළිබඳ මහ පටලැවිල්ලක් වුනා - අජිත් සුමිත් දාං ඇදිල්ල. ඒ වගේමයි දැන් මේ පින්වතුන් බොහෝදෙනා දන්න **ක්‍රිකට් ක්‍රීඩාවේ පිල් දෙකක් බෙදුණ හැටියේ ප්‍රත්‍ය සම්බන්ධතාව අමතක වෙනවා.** ඒ වගේම තමයි **සිනමා උපමාව.** නා නා ප්‍රකාර උපමා අපි දීලා තියනවා. ලෝකයාට තේරුම් ගන්න බැහැ මේ අන්‍යෝන්‍ය ප්‍රත්‍ය සම්බන්ධතාව. ඒක ඉතාම සියුම් දෙයක්. සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ඒක කදිමට පෙන්නුම් කළා. අර **බට කෝටු මිටි දෙකේ උපමාවෙන්.** බට කෝටු මිටි දෙකක් එකකට එකක් උඩින් හේත්තු වන විදියට තිබ්බොත් ඒක ඇද්දහම මේක වැටෙනවා. මේක ඇද්දහම ඒක වැටෙනවා. ඔන්න අන්‍යෝන්‍ය ප්‍රත්‍ය සම්බන්ධතාව. **මේක දෙකකුත් නොවෙයි එකමත් නොවෙයි.** මේක තෝරන්න මම සමහර විට ගොඩේ උපමාවක් බැරිම තැන කියනවා. විඤ්ඤාණයෙන් ඇහුවොත් තමුසෙ කවුද කියලා. නාමරූපයෙන් අහන්න යයි කියාවි. නාමරූපයෙන් ඇහැව්වොත් තමුසෙ කවුද කියල විඤ්ඤාණයෙන් අහන්නයි කියාවි. ඒ තරමට ඒ දෙක එකකට එකක් සම්බන්ධයි. නමුත් ලෝකයා ඒක දන්නේ නැහැ. අර විදියට පිල් දෙකකට බෙදෙනවා. ඔන්න ඔය විදියට ඒ කිව්වෙ - විඤ්ඤාණයත් නාමරූපයත් අතර අන්‍යෝන්‍ය ප්‍රත්‍ය සම්බන්ධතාව.

ඊළඟට හිතල බලන්න මම මේ කියන දේ වැරදිද කියල බලන්න. නාමරූපයම තමයි ආයතන හයට බෙදිල යන්නෙ. එතකොට ආයතන හය තුළ හරියටම අර තණ්හාවේ ක්‍රියාත්මක බව හොඳට පැහැදිලි වන බව දැනටම අපි කියල තියනව, රූප තණ්හා, සද්ද තණ්හා, ගන්ධ තණ්හා ආදී වශයෙන්, **ඇසත් රූපයත් නිසයි චක්ඛු විඤ්ඤාණය පහළ වෙන්නේ. ''නිසා බව'' අමතක වෙලා ඇස රූපය ඔස්සේ දුවනවා.** කන ශබ්දය ඔස්සේ දුවනවා - දෙකක් හැටියට අරගෙන. එතකොට ඒ මුළාව තමයි අන්තිමට පඤ්ච උපාදානස්කන්ධය - ලෝභ, දෝස, මෝහ එකතු වෙලා පඤ්චඋපාදානස්කන්ධය එකතු වෙන්නේ. මේ අපි දක්වන විග්‍රහය පොතපතේ එන ඇතැම් විග්‍රහවලට ගැලපෙන්නෙ නැති වෙන්න පුළුවන්. මොකද අටුවාචාරීන් වහන්සේලා වෙහෙසෙනවා අවිද්‍යාවේ මූල හේතුව සොයන්න. අවිද්‍යාවේ මූල හේතුවක් සෙවිල්ල අවශ්‍ය නැහැ. **අවිද්‍යාව තමයි තාත්ත** - වෙන විදියකින් කියනව නම් - එතකොට **අවිද්‍යා පසුබිම තුළ කෙරෙන සංස්කරණයෙන් විඤ්ඤාණ නාමරූප ද්වයතාව මතු වුනා. එතන ඉඳලා දෙකක් හැදුනා - දෙකක් හැටියට ගත්ත ලෝකයා. එතැන ඉඳලා තමයි තණ්හාව ක්‍රියාත්මක වෙන්නේ.** ඒක නිසා සමිද්ධි සූත්‍රය[5] ආදී ඇතැම් තැන්වල කියවෙන්නේ '**අච්ඡෙච්ඡි තණ්හං ඉධ නාම රූපෙ**' තණ්හාව කපා හරින්නේ මේ නාමරූපය පිළිබඳවයි. එතකොට මේ නාමරූපයම තමයි අර සළායතන හැටියට බෙදිලා යන්නේ. ඒ ටික ඒ පිළිබඳව සෑහෙයි කියල හිතනවා. පරස්පර විරෝධීත්වයක් මෙතන නැහැ. බුදුරජාණන් වහන්සේ පටිච්ච සමුප්පාද දේශනාව ඉදිරිපත් කළ ඇතැම් තැන්වල දුක්ඛ සමුදය ආර්ය සත්‍යය හැටියට කෙලින්ම සඳහන් වෙන්නේ පටිච්ච සමුප්පාදයයි. දැන් අපි කිව්වෙ තණ්හාවෙ පසුබිමයි. **කොටින්ම පටිච්ච සමුප්පාද ධර්මය තුළ තියෙන්නෙ, තණ්හාවෙ පසු බිමයි - අවිද්‍යා පසුබිමයි.** ඒක අර විදියට දිය සුළියට හැරිලා. අන්තිමට ඒක තුළින් අන්‍යෝන්‍ය ප්‍රත්‍යතාව ලෝකයාට වැටහෙන්නෙ නැහැ. ලෝකයා හැම තිස්සෙම ඉන්නේ කොන් දෙකක් අන්ත දෙකක් - තුළ. ඒ තුළින් ඇලීම් ගැටීම් මුළා වීම් ඇති වෙනවා. අවසාන ප්‍රතිඵලය දුක - පඤ්චඋපාදාන ස්කන්ධයක් ගෙතීම. චතුරාර්‍ය සත්‍ය දේශනාවේදී බුදුරජාණන් වහන්සේ දුක්ඛ සමුදය ආර්ය සත්‍යය කියල කිව්වේ තණ්හාවයි. ඊළඟට දුක්ඛ නිරෝධය ගැන කියනකොට ඒත් අවිද්‍යාව සඳහන් කළේ නැහැ.

**'තස්සා යෙව තණ්හාය අසෙස විරාග නිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො'** ආදී වශයෙන් එම තණ්හාවගේම නිරවශේෂ විරාග නිරෝධය දුක්ඛ නිරෝධයයි. කෙනෙක් අහන්න පුළුවන් කෝ අවිද්‍යාව කියල. ඊළඟට මේ කියාපු **තිත්ථායතන සූත්‍රයේ දුක්ඛ නිරෝධය දක්වන්නේ අර පටිච්ච සමුප්පාද ධර්මයේ පටිලෝම වාරයෙන්** 'අවිජ්ජායත්වෙව අසෙස විරාග නිරොධා සංඛාර නිරොධො' ආදී වශයෙන්. අවිද්‍යාව නිරුද්ධ කරනකොට අනිත් ඔක්කොම නිරුද්ධ වෙලා යනවා. ඇත්ත වශයෙන් ත්‍රිපිටකයේ ඉතාමත්ම සවිස්තර විග්‍රහය තියෙන්නේ දුක්ඛ සමුදය ආර්ය සත්‍යය පිළිබඳව දීඝ නිකායේ මහාසතිපට්ඨාන සූත්‍රයේ.[6] එතනදී බුදුරජාණන් වහන්සේ තණ්හාව ඇති වන තැනත් රිංගාගෙන හැංගිලා ඉන්න තැනත් ප්‍රකාශ කරනවා. මෙන්න මේ විදියට 'සා ඛො පන එසා තණ්හා කත්ථ උප්පජ්ජමානා උප්පජ්ජති කත්ථ නිවිසමානා නිවිසති' සංසයා වහන්සේලා අමතලා ප්‍රශ්නයක් හැටියට ඉදිරිපත් කරනවා. තේරුම් කරන්න කලින් ඒ මේ තණ්හාව - තණ්හා කියන වචනය පාලි භාෂාවේ ස්ත්‍රී ලිංගිකයයි. ඒක අපට උපකාර වෙනවා 'අම්මා' කියන කථාවත් එක්ක. ඇත්ත වශයෙන් ඇතැම් සූත්‍රවල තියනවා 'තණ්හා ජනෙති පුරිසං'[7] කියලා. පුරුෂයා උපදවන්නේ තණ්හාවයි. **තණ්හාව තමයි අම්මා.** මෙතනදිත් 'සා ඛො පන එසා තණ්හා' කියන එක පැරණි ක්‍රමයට ලිංග භේදය සැලකිල්ලට ගෙන කියනව නම් මෙහෙම කියන්න ඕන. ඒ මේ තණ්හාව 'තෙමෝ' උපදින්නී කොතනක උපදීද? 'නිවිසමානා' කියන වචනයේ තේරුම පින්වතුනි 'වැදගෙන හැංගිලා ඉන්නවා. රිංගගෙන ඉන්නවා' කියල කියන්නත් පුළුවනි. 'වැදගෙන සිටින්නී' කියල කියමු. එතකොට උපදින්නී කොතැනක උපදීද. වැදගෙන සිටින්නී කොතනක වැදගෙන සිටීද? ඊළඟට බුදුරජාණන් වහන්සේ පිළිතුරු දෙනවා 'යං ලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති' ලෝකයේ යමක් ප්‍රිය නම්- මේ වචන දෙක මතක තියාගන්න. 'පිය රූපං' කියල කියන්නේ පින්වතුනි 'රූප' කියල එතන යෙදිල තියෙන්නේ පාලි භාෂාවේ හැටියට ප්‍රිය ස්වභාවය කියන එකයි. යමක් ප්‍රිය ස්වභාවය ඇද්ද 'සාතරූපං' කියන වචනයත් ටිකක් තෝරන්න අමාරුයි. 'සාත' කියල කියන්නේ සුවදායක නැත්නම් මිහිරි කියල සාමාන්‍යයෙන් කියන්න පුළුවන්.

එතකොට මෙහෙම හිතාගන්න. උපදින තැනනෙ මේ කියන්නෙ. යමක් ලෝකයේ ප්‍රිය ස්‍වභාවය ඇද්ද, සුවදායක ස්‍වභාවය ඇද්ද අන්න එතනයි තණ්හාව උපදින්නෙත් හැංගිලා ඉන්නෙත්. ඊළඟට බුදුරජාණන් වහන්සේ විග්‍රහ කරනවා මේ විදියට. 'කිඤ්ච ලොකෙ පියරූපං සාතරූපං' මොකක්ද ලෝකේ පියරූප සාතරූප? ඔන්න එතන දීඝ ලැයිස්තුවක් උන්වහන්සේ දෙනවා. පළමුවෙන්ම මෙන්න මේ විදියටයි ආරම්භ කරන්නේ. 'චක්ඛුං ලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති එත්ථ නිවිසමානා නිවිසති' ඇස ලෝකයාට ප්‍රියයි මිහිරියි එතනයි තණ්හාව උපදින්නෙත්. එතනයි තණ්හාව ලැගගෙන හැංගිලා ඉන්නෙත්. රිංගාගෙන ඉන්නෙත්.

එතන ඉඳලා මම කෙටියෙන් කියන්නම් තේරුම්ගන්න. ඇස කන නැහැය දිව කය මන කියන ආධ්‍යාත්මික ආයතන හය තුළත් තණ්හාව උපදිනවා. හැංගිලා ඉන්නවා. ඊළඟට දෙවනුව කියවෙනවා බාහිර ආයතන හය - රූප, සද්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම. ඒවත් ප්‍රියරූපයි සාතරූපයි. ප්‍රිය ස්‍වභාවයක් තියනවා ලෝකයාට. ඒ නිසා එතනත් හැංගිලා ඉන්නවා. එපමණක් නොවෙයි. ඊළඟට කියනවා ඒ දෙක නිසා ඇතිවන චක්ඛු විඤ්ඤාණය සොත විඤ්ඤාණය ආදී විඤ්ඤාණ හයෙත් ලෝකයාට ප්‍රිය ස්‍වභාවයක් තියනවා. සුවදායක ස්‍වභාවයක් තියනවා. එතනත් හැංගිලා ඉන්නවා. තණ්හාව උපදින්නේත් එතනයි. ඊළඟට කියනවා ඒ දෙක නිසා ඇති වන චක්ඛු සම්ඵස්ස, සොත සම්ඵස්ස ඝාණ සම්ඵස්ස ආදී වශයෙන්, සපර්ශ හය තුළත් තණ්හාව හැංගිලා ඉන්නවා. ඊළඟට කියනවා චක්ඛු සම්ඵස්සජා වෙදනා. ඒ ස්පර්ශය නිසා ඇති වෙන වේදනාව තුළත් තණ්හාව හැංගිලා ඉන්නවා. ඊළඟට කියනවා රූප සඤ්ඤා සද්ද සඤ්ඤා ගන්ධ සඤ්ඤා ආදී වශයෙන්. ඒ සඤ්ඤාව තුළත් ඒ තණ්හාව හැංගිලා ඉන්නවා. ඊළඟට කියනවා රූප සංචේතනා සද්ද සංචේතනා. සංචේතනා කියන්නේ පින්වතුනි රූපය ගැන හිතීම. ඒකත් ප්‍රියරූපයි. ලෝකයා කැමතියි රූපය ගැන හිතන්න. ශබ්දය ගැන හිතන්න. එතනත් හැංගිලා ඉන්නවා. ඔන්න ඊළඟට කියනවා මහා පුදුම දෙයක් ඒක තේරුම්ගන්නත් අමාරුයි. '**රූපතණ්හා ලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති**' මහ පුදුම කියමනක් ඒක.

ලෝකයාට රූප තණ්හාවත් ප්‍රියයි, රූප තණ්හාවත් සුව දායකයි. ඒ නිසා එතනත් තණ්හාව ලැගගෙන ඉන්නවා. තණ්හාව දෙවරක් කියවෙනවා. මේක හිතාගන්නත් බැරි දෙයක්. ලෝකයාට රූප තණ්හාව ශබ්ද තණ්හාව ඒකත් ප්‍රියයි. **තණ්හාව තුළත් තණ්හාව තියනවා**. කොහොමද වැඩේ! රූප තණ්හාව, සද්ද තණ්හාව තුළත් තණ්හාව තියෙනවා. උපදිනවා. ඒක තුළත් හැංගිලා ඉන්නවා. ඊළඟට කියනවා රූප විතක්කො. රූප විතර්කයත් ඒ වගේම ප්‍රිය සබාවයක් ගන්නවා. රූප ගැන හිතන්නත් කැමතියි. ඊළඟට රූප විචාරො. ඔය දැන් මම කිව්වේ දසවිධ විග්‍රහයක්. මහා සතිපට්ඨාන සූත්‍රයේ ඔය විදියට තණ්හාව ඇති වෙන තැනත් ලැගගෙන ඉන්න තැනත් දක්වනවා. ඊළඟට නිරෝධය පිළිබඳව මේ විදියට කියනව. ටිකක් කිව්වහම ඇති තේරුම්ගන්න බලන්න. 'සා ඛො පනෙසා තණ්හා කත්ථ පහීයමානා පහීයති කත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති' ඒ තණ්හාව කොතනද ප්‍රහීණ වන්නේ? කොතනද නිරුද්ධ වන්නේ? ඒත් අර විදියටමයි. යම් තැනක ඇති වුනා නම් - 'යං ලොකෙ පිය රූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති. එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣතී' - ඒ තැන්වලම තමයි මේක නැති වෙන්නෙත්. මහාසතිපට්ඨාන සූත්‍රයේ ඒ විදියට සවිස්තර විග්‍රහයක් තියනවා.

ඊළඟට අපි යමු වටිනා සූත්‍රයක් තියනවා 'මජ්ඣෙ' සූත්‍රය කියලා. අංගුත්තර නිකායේ ඡක්ක නිපාතයේ.[8] කීප වරක් අපි ඒක ගැන සාකච්ඡා කරල තියනවා. තණ්හාව ගැන කියනකොට අපට ඒ ගැන විශේෂයෙන් සඳහන් කරන්න වෙනවා. ඒ සූත්‍රය ගැන නිදාන කථාව කියනකොට මේ පින්වතුන්ට මතක් වෙයි. බරණැස ඉසිපතන මිගදායේ භාග්‍යවතුන් වහන්සේ වැඩ වාසය කරන අවස්ථාවක ස්ථවිර භික්ෂූන් වහන්සේලා පිරිසක් පිණ්ඩපාතයෙන් පස්සේ මණ්ඩලමාලයේ රැස් වෙලා ධර්ම සාකච්ඡාවක් - සම්මන්ත්‍රණයක් - ආරම්භ කළා. එතනදී සාකච්ඡා කරන්න එළියට ගත්තේ බුදුරජාණන් වහන්සේ මෙත්තෙය්‍ය පඤ්හයේ දේශනා කළ එක්තරා ගාථාවක් - ටිකක් ගැටලු වගේ ප්‍රහේලිකා ගාථාවක් -

**යො උභන්තෙ විදිත්වාන**
**මජ්ඣෙ මන්තා න ලිප්පති**
**තං බ්‍රෑමි මහා පුරිසොති**
**සොධ සිබ්බනිමච්චගා**

යමෙක් කොන් දෙක තේරුම් අරගෙන 'මජ්ඣෙ මන්තා න ලිප්පති' මැද ප්‍රඥාවෙන් නොඇලේද 'තං බ්‍රෑමි මහා පුරිසොති' ඔහුට මම මහා පුරුෂයා යයි කියනවා 'සොධ සිබ්බනි මච්චගා' ඒ පුද්ගලයා මැහුම්කාරිය ඉක්මවා ගියේ වේ.

මේ ගාථාව ඉදිරිපත් කරලා අර ස්ථවිර භික්ෂූන් වහන්සේලා ඒක තුළින් ප්‍රශ්න හතරක් මතු කරගන්නවා. මේ ගාථාවේ තියෙන පළවෙනි අන්තය මොකක්ද? දෙවෙනි අන්තය මොකක්ද? මැද මොකක්ද? මැහුම්කාරිය කවුද? ඔන්න ඔය මාතෘකා උඩ හය නමක් ඒ සභාව ඇමතුවා. එයින් පළවෙනි ස්ථවිර භික්ෂූන් භික්ෂූන් වහන්සේ මෙන්න ඉදිරිපත් කළා මතයක් තමන්ට තේරෙන හැටියට. පළවෙනි කොන ස්පර්ශයයි-ඵස්සයය. දෙවෙනි කොන ඵස්ස සමුදයයි ස්පර්ශය හටගැනීමයි. මැද ඵස්ස නිරෝධයයි. ඊළඟට තණ්හාවේ ක්‍රියාකාරිත්වයත් උන්වහන්සේ ඒ එක්කම ප්‍රකාශ කරනවා. **'තණ්හා හි නං සිබ්බති තස්ස තස්සෙව භවස්ස අභිනිබ්බත්තියා'** තණ්හාව මැහුම්කාරිය කියලා කියන්නේ මොකද? තණ්හාව තමයි භවයට මැහුම දමන්නේ. අපි කෙටියෙන් කියමු ඉතිරි ටික. දෙවෙනි ස්වාමීන් වහන්සේ ඉදිරිපත් කරන විග්‍රහය. එක කොනක් අතීතය. දෙවෙනි කොන අනාගතය. මැද වර්තමානය. මැහුම්කාරිය නැවත තණ්හාවයි. ඒක නම් පහසුවෙන් හිතාගන්න පුළුවන් අපේ සිතුවිලි වැඩ කරන ආකාරයට. අපි අතීතයත් අනාගතයත් තුළනේ ඉන්නේ. වර්තමානය අපි දන්නෙත් නැහැනෙ තියන බව. ඒක කෙරෙන්නේ තණ්හාව තුළින් ගැටලෑමෙන්. ඊළඟ විවරණය කෙටියෙන් කිව්වොත් එක කොනක් සැප වේදනාව. දෙවන කොන දුක් වේදනාව. මැද නොදුක් නොසුව වේදනාව. ඒකත් දැනෙන්නෙ නැහැනෙ අපට ඒකටත් හේතුව තණ්හාවමයි. තණ්හාව තමයි මැහුම්කාරිය.

ඊළඟ එකේ නාමය එක කොනක් රූපය. දෙවෙනි කොන විඤ්ඤාණය. මැද ආයෙමත් සිබ්බනී තණ්හාව. මැහුම්කාරිය මැහුම දමනවා නාමයත් රූපයත් අතර. ඊළඟට කියනවා ආධ්‍යාත්මික ආයතන හය - ඇස කන නාසය දිව කය මන කියන - ඒ ආයතන හය එක අන්තයක්. අනික් අන්තය බාහිර ආයතන හය රූප සද්ද ගන්ධ රස

ඵොට්ඨබ්බ ධම්ම කියන ඒවා. මැද විඤ්ඤාණය. එතෙන්දිත් අර මැහුම්කාරිය මැද නොතකා හැරලා ගැටලනවා. අන්තිමට කියනවා සක්කාය කියන්නේ පඤ්ච උපාදාන ස්කන්ධයයි. එක කොනක් සක්කාය දෙවෙනි කොන සක්කාය සමුදය පඤ්ච උපාදාන ස්කන්ධයේ හටගැනීම. මැද සක්කාය නිරෝධය. **මොහොතක් පාසා මේ පඤ්ච උපාදාන ස්කන්ධය නැති වෙන්න නොදී ගැටලන්නේ කවුද? අන්න සිබ්බනී තණ්හාව.** තණ්හාව තමයි ගැටලන්නේ. ඔය විදියට විග්‍රහයන් හයක් දක්වනවා. ඒක තුළින් අපට පේනවා තණ්හාවගේ ක්‍රියාකාරිත්වය. අපි ඇතැම් අවස්ථාවල මේ තණ්හාව මේ කාලේ හැටියට තෝරන්න මහන මැසිම උපමාවට ගත්තා. මහන මැසිමේ ඉඳිකටුව යට යන යන වාරයක් පාසා හොරෙන්ම ගැටලනවානේ යටි නූල. තණ්හාවටම අයිති දෙයක් මේ ගැට ලෑම. ඒ 'තත්‍රතත්‍රාභිනන්දිනී' කියනකොට හිතට ගන්න පුළුවන් ඔය ඉඳිකට්ට යට යන හැටි. නන්දිරාග සහගතා ආදී වශයෙන් කියන්නේ ඔය මැහුම්කාරියගේ වැඩය. ඔය විදියට තණ්හාවගේ ක්‍රියාකාරිත්වය හොඳට හෙළිවෙනවා ඒ මජ්ජේඩ සූත්‍රයෙන්. තව විදියකින් විග්‍රහ කරනව නම් මේ ගාථාවේම එන කියමනක් දක්වන්න පුළුවන් මේ පින්වතුන්ට නොපැහැදිලි නිසා තේරුම් කරන්ට උත්සාහ කරන්නේ, පළවෙනි ගාථාවේ කියවෙනවා. 'තණ්හා දුතියො පුරිසො දීඝමද්ධාන සංසරං - ඉත්ථභාවඤ්ඤථාභාවං සංසාරං නාතිවත්තති' මේ සංසාරයේ ස්වභාවය දක්වල තියෙන්නේ **'මෙසේ බවත්' 'අන් සේ බවත්'** අතරේ තියන එකක් හැටියට. ඕක තේරුම් කරන්න වෙනවා. පින්වතුන් හිතන්න සත්ත්වයෙක් මේ ලෝකේ උපන්නා කියලා. වෙන කොහේ හරි ලෝකෙක ඉඳලා තිරිසන් ලෝකෙ ඉඳලයි කියල හිතමු. මෙතෙන්ට උපන්නට පස්සේ ඒ පොඩි එකා වටපිට බලනකොට, ඇහෙන් බලනකොට, කනෙන් අහන කොට, එයාට **'මෙතන'** කියල තැනක් ආවා ඊට පස්සෙ. **'මෙසේ බව'** කියල දෙයක් ලැබුණා. ඊට පස්සේ යම් දෙයක් **'මෙසේ'** කියල ගත්ත හැටියෙම එතන ඉඳලම **'අන් සේ බවට'** පරිවර්තනය වෙනවා.

ඒක මහ පුදුම දෙයක්. භවයේ ස්වභාවයම **භවය කියලා කියන එක. උපාදානය නිසා වෙනදෙයක්.** යමක් අල්ලාගත්තා නම් එතනම ඉඳලා තමයි ඒකේ අනිත්‍යතාව පටන්ගන්නෙ. ඕක තේරුම් කරන්න හරි අමාරුයි. තමන්ම හිතලා බලන්න. අපි සමහර වෙලාවට මෙහෙම ප්‍රකාශ

කරනවා, - **'දෙයක්'** වෙලයි 'අන් **දෙයක්'** වෙන්නෙ. **යමක් දෙයක් උන අවස්ථාවේ ඉඳල තමයි ඒක වෙනස් වෙන්න පටන්ගන්නේ.** ඒකට අපි පුංචි උපමාවක් දෙන්න බලමු. මේ උපමාවේ යම් යම් අඩුපාඩු තියෙන්න පුළුවන්. මේ පින්වතුන් ගෙදර පොඩි එකාට සෙල්ලම් බඩුවක් ගන්න යනවා ප්ලාස්ටික් බඩු තියන සාප්පුවකට. ඔක්කොම ප්ලාස්ටික් බඩු. නමුත් ඔන්න ඒ දරුවට ගැලපෙන මොකක් හරි සෙල්ලම් බඩුවක් ඒකට සල්ලි ගෙවලා ගත්තා. ඒකට එතකොට වටිනාකමකුත් එනවා. දැන් ඔන්න අලුත් බඩුවක් ගෙදරට ගෙනාවා. අර පොඩි එකා අරක කැඩුව හැටියේ ඒක එතන ඉඳලා 'අඤ්ඤථා' භාව තමයි, ඒක 'දෙයක්' උනානෙ. මුදලට ගත්තු දේ. ඔය පුංචි උපමාවක් දුන්නෙ. ඒ වගේ ඒක 'දෙයක්' බවට පත් වීමට ධර්මයේ යෙදෙන වචනයක් තියනවා - **මඤ්ඤනා.** මඤ්ඤනා කියල කියන්නෙ **'හඟිනවා'**, ඒක දෙයක් කියල හඟිනවා. ඉතාමත්ම පෞද්ගලික හැඟීමක්. මේක මට උපකාර වන දෙයක්. ඒ විදියට **'දෙයක්'** කියලා ගත්තු තැන ඉඳලම ඒක වෙනස් වෙන්න පටන්ගන්නවා. ඒකයි බුදුරජාණන් වහන්සේ සම්බෝධිය ලැබූ අවස්ථාවේ මහ පුදුම සංවේගාත්මක ප්‍රකාශයක් කළේ[9]

**'අඤ්ඤථාභාවී භවසත්තො ලොකො**
**භවපරෙතො භවමෙවාභිනන්දති'**

මේ භවයේ ස්වභාවයම අන් සේ බවට පරිවර්තනය වීමයි. නමුත් ඒ භවයට ලෝකයා ඇලිල ඉන්නව. ඒ භවයම පතනවා. එතකොට ඒ ටික කරන්නේ අර තණ්හා මැහුම්කාරියයි. ඔන්න යමක් නැති වුණා කියල හිතමු. ඊට පස්සේ 'ආ නෑ නෑ අර අතන තියෙන්නේ එහා එක'. ඒක ගන්න කියල ඒ ටික කරන්නේ තත්‍රතත්‍රාභිනන්දිනී 'තණ්හා පොනොභවිකා' කියන වචන අර්ථවත් වෙන්නේ අන්න ඒ නිසයි. **පුනර්භවය කියන එක අර්ථවත් වෙන්නේ මරණ අවස්ථාවේ පමණක් නොවෙයි. මොහොතක් පාසා සිදුවෙන බව හිතාගන්න.** 'පුනර්භව' කියන වචනය දැක්කහම හිතන්නේ. මේ මරණයෙන් පස්සේ උපත. **''මොහොතක් පාසා - සමහර එකක් 'දෙයක්' වෙනවා. ඒක වෙනස් වෙනවා.''** ඊළඟට ඒක වෙනස් වුන හැටියේ ඒක අමතක කරලා තව එකක් අල්ලනවා, තව එකක් අල්ලනවා. ඔන්න ඒක කරන්නේ තණ්හාවෙන් -

නොපෙනෙන හැටියට. අන්න 'තත්‍රතත්‍රාභිනන්දිනී' මහ පුදුම එකක්. **'මෙසේ බවත්' 'අන් සේ බවත්' අතර තමයි සත්ත්වයා සංසාරේ ගමන් කරන්නේ. ජීවිතයෙන් ජීවිතයට පමණක් නොවෙයි. භවයෙන් භවයට පමණක් නොවෙයි. භවයක් තුළ - භවයක් තුළ ඉතාමත්ම සියුම් අන්දමින් සිදු වෙනවා.** අන්න ඒ අන්දමින් සලකා ගන්න ඉත්ථභාව අඤ්ඤථාභාවය තෝරගන්නයි ඔය ටික කිව්වෙ.

ඒ පිළිබඳව තව දුරටත් කියනව නම් ධම්ම පදයේ තණ්හා වග්ගයේ බොහොම වටින ගාථා තියනවා. අවාසනාවකට වගේ සමහර ගාථාවල අර්ථය යටපත් වෙච්ච බවයි අපට පෙනෙන්නෙ. එක ගාථාවක් අපි මතුකර ගනිමු.

**තසිණාය පුරක්ඛතා පජා**
**පරිසප්පන්ති සසොව බාධිතො**
**සංයොජනසංගසත්තා**
**දුක්ඛමුපෙන්ති පුනප්පුනං චිරාය**[11]

මේකෙ තේරුම 'තසිණාය' කියන්නෙ තණ්හාවටම නමක්. '**තසිණාය පුරක්ඛතා පජා**' කියන්නේ මේ සත්ත්ව ප්‍රජාව තණ්හාව විසින් පෙරටු කරගෙන ඉන්නවා. ඒ කියන්නේ තණ්හාව පිටුපස්සෙන් තියනවා. ඊළඟට ඒ ප්‍රජාව ගැන මොකක්ද කියන්නේ? '**පරිසප්පන්ති සසොව බාධිතො,** උගුලකට බැඳුණු හාවෙක් වගේ. අටුවාවේ 'පරිසප්පන්ති' කියන වචනය තෝරන්නේ උගුලක පටලැවුණු හාවෙක් වගේ බිය වෙනවා කියලා 'භායන්ති' කියලා. නමුත් මෙතෙන්දි වටිනා අර්ථයක් යටපත් වෙලා. හාවා උපමාවට ගත්තෙ මොකද? හාවාට පුළුවන් ඈතට පනින්න. ටිකකට හිතන්න හාවාගෙ පසු පය වැලක උගුලක අහු වුණා කියලා. ඌ දන්නෙ නැහැ අහු වෙච්ච බව. ඌ ඈතට පනිනවා. පැනල බලනකොට වැලට අහු වෙලා ඉවරයි. ආයිත් ඒක බැරි උනහම වෙන පැත්තකට පැනල බලනවා. තව පැත්තකට පනිනවා. කොච්චර ඈතකට පැන්නත් හාවා ඒකට අහු වෙලා. ඒ වගේ තමයි අන්න තණ්හාවේ සංයෝජනය. '**සංයොජනසංගසත්තා**' තණ්හාවේ සංයෝජනයට ඇලිලා ඒ සංයෝජනය නිසා '**දුක්ඛං උපෙන්ති පුනප්පුනං චිරාය**' නැවත නැවතත් සත්ත්වයා දුකට පැමිණෙනවා. කොටින්ම කියතොත් අනාගාමී

නොවුණොත් බ්‍රහම ලෝකෙට ගියත්, අර තණ්හා උගුල නිසා ආයිත් හැරිල එනව මෙහාට. අන්න ඒ තරම් ප්‍රබලයි ඒ තණ්හාව. ඒ තණ්හා සංයෝජනය ඉතාම ප්‍රබල බව මේ ධම්මපද ගාථාවේ හොඳට මතු කරල තියනව. මේ පින්වතුන් හොඳට දන්න ගාථාවක්.

**යථාපි මූලෙ අනුපද්දවෙ දළ්හෙ**
**ඡින්නොපි රුක්ඛො පුනරෙව රූහති**
**එවම්පි තණ්හානුසයෙ අනූහතෙ**
**උප්පජ්ජති දුක්ඛමිදං පුනප්පුනං**

'යථාපි මූලෙ අනුපද්දවෙ දළ්හෙ' යම්සේ මුල නොසිඳින තාක්, මුලට උපද්‍රවයක් නොවී තිබෙන තාක්, 'ඡින්නොපි රුක්ඛො පුනරෙව රූහති' උඩින් කපල කප්පාදු කරල තිබුණත් නැවත නැවතත් ගහක් වැඩෙනව වගේ 'එවම්පි තණ්හානුසයෙ අනූහතෙ' තණ්හා අනුසය උපුටලා නොදමන තාක් 'උප්පජ්ජති දුක්ඛමිදං පුනප්පුනං' නැවත නැවත මේ දුකම උපදිනවා. අර හාවගේ කථාව වගේ තමයි. ඉතින් මේක තුළින් පෙන්වනවා තණ්හාව කොතරම් ප්‍රබල දෙයක්ද කියලා. හැම දෙයක්ම මේ අවස්ථාවේ කියනව නොවෙයි. නමුත් ඒ වටිනා ගාථාවල අර්ථය මතු කරන්නයි උත්සාහ කරන්නේ. මේ සමහර ගාථාවල අර්ථය හරියට එළියට ඇවිල්ල නැති නිසා.

ඊළඟට අපි තව පැත්තක් බලමු. තණ්හාව ගැන කියවෙන වටිනා සූත්‍රයක් තියනවා. අපි කිව්වනේ තණ්හාව උපාදානයට ප්‍රත්‍ය වෙන බව. **ඇතැම් තැන්වල තණ්හාවම උපාදානයක් හැටියට දක්වලත් තියනවා.** ඔන්න ඒකට අපි නිදර්ශනයක් කියනව නම්-මේක හුඟක් විවාදාපන්න සූත්‍රයක් - සංයුත් සඟියේ තියනවා. 'කුතුහලසාලා සූත්‍රය' කියලා එකක්[12]. මෙහෙම කෙටියෙන් කියමු වච්ඡගොත්ත කියන පරිබ්‍රාජකයා බුදුරජාණන් වහන්සේ හමු වෙන්න ඇවිල්ලා එක දවසක් ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා. මොකක්ද ප්‍රශ්නය? පූරණකස්සප, මක්ඛලීගොසාල අජිතකෙසකම්බලී ආදී ඒ ෂට් ශාස්තෘවරු තම තමන්ගේ ශාසනයේ සාමාන්‍ය ශ්‍රාවකයා මියගියහම ඒ අය උපදින තැනක් තියෙනවා. ඒ ශාසනයේ උතුම් තත්ත්වයට පරම තත්ත්වයට පත් වුණ. ශ්‍රාවකය මිය

ගියහම ඒ අය උපදින තැනක් කියනවා. මේ භවත් ගෞතමයන් සාමාන්‍ය ශ්‍රාවකයින් උපදින තැන කියනවා. නමුත් අර විමුක්ත පුද්ගලයා පිළිබඳව, ඉහළ තත්ත්වයට ගිය පුද්ගලයා පිළිබඳව භවත් ගෞතමයන් ඒ අය උපන්න තැන කියන්නෙ නැහැ කියලා බුදුරජාණන් වහන්සේට මේ පැමිණිලි කරන්නෙ. ඒ වෙනුවට බුදුරජාණන් වහන්සේ මෙහෙම පාඨයක් වදාරනවා කියලා වච්ඡගොත්ත කියන්නේ ...

**'අච්ඡෙච්ඡි තණ්හං වාවත්තයි සඤ්ඤොජනං සම්මා මානාභිසමයා අන්තමකාසි දුක්ඛස්ස'**

වච්ඡගොත්තගෙන් කියවුණු ඒ දේ මේ කාලේ සාමාන්‍ය බෞද්ධයෙක්වත් දන්නෙ නැහැ. '**අච්ඡෙච්ඡි තණ්හං**' කියන්නෙ විමුක්ත පුද්ගලයා ගැන උපන්න තැන කියන්නෙ නැහැ. මෙච්චරයි ප්‍රකාශ කරන්නේ 'තණ්හාව කපා හැරියා '**වාවත්තයි සඤ්ඤොජනං**' සංයෝජන කොකු අනිත් පැත්තට හැරෙව්වා. '**සම්මා මානාභිසමයා අන්තමකාසි දුක්ඛස්ස**' මානය හරියට තේරුම්ගැනීම තුළින් දුක කෙළවර කළා. ඔන්න බුදුරජාණන් වහන්සේ විමුක්ත පුද්ගලයා පිළිබඳව කියන එක. ඉතින් මේක වච්ඡගොත්තට ගැටලුවක්. එයා කියනවා ''මට මේක නිසා - කංඛා - සැකයක් විමතියක් ඇති වුණා භාග්‍යවතුන් වහන්ස''. බුදුරජාණන් වහන්සේ වදාරනවා- ''හරි. එහෙම කියපු එක හරි. විමතියක් සැකයක් ඇති විය යුතු තැන ඇති වෙන්න ඕන.'' ඊළඟට බුදුරජාණන් වහන්සේ තේරුම් කරන්නේ මෙහෙමයි.

**'සඋපාදානස්ස ඛ්වාහං වච්ඡ උපපත්තිං පඤ්ඤපෙමි නො අනුපාදානස්ස'**

මම උපාදාන සහිත වූවහුටයි, උපාදානයක් තියන කෙනාටයි උත්පත්තියක් පෙන්වාලන්නේ. උපාදානයක් නැති වූවහුට උත්පත්තියක් පෙන්වන්නෙ නැතෙයි කියන එකයි ඒ කිව්වේ. ඊළඟට බුදුරජාණන් වහන්සේ යම් කිසි උපමාවක් දෙනවා. 'යම් සේ වච්ඡ ගින්නක් - 'සඋපාදානො ජලති'. එතන ගින්නට යොදන වචනය 'උපාදාන සහිත' ඒක තෝරන්න අවශ්‍යයි. උපාදාන කියන වචනය පාලි භාෂාවේ, දන් කාලේ ඉන්ධන ද්‍රව්‍ය යන තේරුමෙත් යෙදෙනවා. කොටින් කියනව නම්

ගින්නක් නිකම් දල්වෙන්නෙ නැහැ. ගින්න මොකක් හරි අල්ල ගත්තහමනෙ දල්වෙන්නේ. දර හෝ වෙනත් ඉන්ධන ද්‍රව්‍යයක් අල්ලගත්තහම තමයි ගින්න දල්වෙන්නේ. **මෙතනදී බුදුරජාණන් වහන්සේ වදාරනවා 'සඋපදානො' ඒ කියන්නේ උපාදාන සහිතවමයි ගින්නක් දල්වෙන්නේ. 'නො අනුපාදානස්ස' උපාදානයක් නැතිව නොවේ.** උපාදානය නැතිව ගින්නක් දල්වෙන්නෙ නෑ. බුදුරජාණන් වහන්සේ ඒ ගින්නෙ උපමාවයි දුන්නෙ. ඒක ආශ්‍රයෙන් වච්ඡගොත්ත ඊළඟට අමුතු ප්‍රශ්නයක් අහනවා. 'භවත් ගෞතමයිනි, යම්කිසි විදියකින්- 'අච්චි' කියල කියන්නේ ගිනි සිලක්. යම් කිසි ගිනිසිලක් සුළඟින් තල්ලු වෙලා දුරට යනවා. මේ පින්වතුන් හිතාගන්න කැලෑවල තියන ලැව් ගින්නක් ගැන. ඒවගේ දෙයක් ගිනි සිලක් සුළඟ ඇවිළිලා ඈත තියන ගහකට උනත් තල්ලු කරනවා. අන්න ඒ උපමාවයි දෙන්නෙ. එතකොට ගිනිසිලක් - සුළඟින් තල්ලු කරනු ලැබ ඈතට යන්නේද, ඒ අවස්ථාවේ භවත් ගෞතමයින් මොකක්ද උපාදානය හැටියට දක්වන්නේ? එතකොට බුදුරජාණන් වහන්සේ වදාරනවා ඒ අවස්ථාවේ උපාදානය වාතයමයි සුළඟමයි උපාදානය. **හුළඟ අල්ලලයි කියලා කියන්නේ අපි.** හුළඟ අල්ලල තමයි ඒ ගිනි සිල ඈතට ගියේ. ඔන්න ඊළඟට ඒක ආශ්‍රයෙන් වච්ඡගොත්ත ඉදිරිපත් කරනවා අමුතු ප්‍රශ්නයක්. භවත් ගෞතමයිනි, යම් අවස්ථාවක සත්ත්වයා මේ කය බහා තබලා වෙන කයකට - ඔන්න එතන තියෙනව ගැටලු තැනක් - පැමිණියේ වෙයිද, ඒ සූත්‍රයේ සඳහන් වෙන්නේ මෙහෙමයි '**අඤ්ඤතරං කායං අනුපපන්නො හොති**'. '**අඤ්ඤතරං**' කියන්නේ පින්වතුනි '**එක්තරා**' එතකොට එක්තරා කයකට පැමිණිලා යම් කිසි සත්ත්වයෙක් මේ කය බහා තැබුවා කියන්නේ මේ කය අතහැරලා **එක්තරා** කයකට පැමිණියේ වෙයිද, ඒ අවස්ථාවේ භවත් ගෞතමයින් මොකක්ද උපාදානය හැටියට දක්වන්නේ? බුදුරජාණන් වහන්සේ වදාරනවා ඒ අවස්ථාවේ මම තණ්හාවම උපාදානය කියල කියනවා. එතකොට තණ්හාවේ ක්‍රියාකාරිත්වය කොයි තරම් ගැඹුරුද කියල පේනවා. තණ්හාවම උපාදානය හැටියට දක්වනවා. **නමුත් පින්වතුනි, අවාසනාවකට වගේ මේ උපමාවත් මේ ඡේදයත් වරදවා තේරුම්ගැනීම නිසා පසු කාලීන කට්ටිය සේරම අහන්නේ අන්තරා භවයක් ගැන.**

අන්තරා භව වාදය වැරදි බව අපි නොයෙක් පොත්වල පෙන්වල දීලා තියෙනවා. ඒක ඇති වුණේ කොහොමද. එකක් මේ උපමාව වැරදියට තේරුම්ගැනීම. **මේ උපමාවේදී වච්ඡගොත්ත අහන්නේ භව දෙකක් අතර පරතරයක් නොවේ. එක භවයකින් අනිත් භවයට සම්බන්ධ වන ආකාරයයි.** ඊළඟට මෙතන තියනවා සියුම් කාරණයක්. ඒක භාෂාව හා සම්බන්ධ එකක්. තේරුම්ගන්න බලන්න. සූත්‍ර දේශනා සමහර විට අතින් අත යාමේදී 'පාඨ' පිළිබඳ ගැටළු ඇති වුණා. සමහර විට එක පොතක එක පාඨයක්. තව පොතක තව පාඨයක්. ඔය කියාපු අන්තරා භව වාදය අල්ලගත්ත කට්ටිය මෙහෙමයි ගත්තේ. දැන් අපි කිව්වනේ 'අනුප්පත්තො' කියන පාඨයේ තේරුම පැමිණියේ වේද, යන්නයි. **'අනුප්පන්නො'** කිව්වොත් ඒකෙ අනිත් පැත්ත **'අනුප්පන්නො'** කියන්නේ නූපන්නේ වේද? අන්තරා භවකාරයෝ තෝරන්නේ කොහොමද, යම්කිසි සත්ත්වයෙක් මේ කය බහා තබනවා. අනිත් කයට උපන්නේ නැද්ද, තාම උපන්නේ නැහැ. 'අනුප්පන්නො'. ඒ අතරතුර මොකක්ද උපාදානය? කියන විදියටයි මේගොල්ලො තෝරන්නේ. නමුත් අපි පෙන්නල දුන්නා මෙතන **අඤ්ඤතරං** කියලා විශේෂ වචනයක් යෙදෙන බව. **අඤ්ඤතරං කියන්නේ පින්වතුනි 'එක්තරා'. දැන් හිතල බලන්න එක්තරා කියන වචනය අපි යොදන්නෙ නිතරම ඇති දෙයක් පිළිබඳවනෙ. නැති දෙයක් ගැන 'එක්තරා' කියල කියන්නේ නැහැනේ. ඇති දේවල්වලින් එකක් තෝරලා.** එතන 'අඤ්ඤං' කියල යෙදෙනව නම් අන්න ඒක හරි. හරි සියුම් කාරණයක් මෙතන. කොහොම නමුත් එච්චර දුර යන්න ඕන නැහැ. **මෙතනදී වච්ඡ අහන්නේ භවයෙන් භවය ඈඳෙන හැටි. මේගොල්ලො ඒක තුළ පරතරයක් ඇති උනයි කියලා අන්තරා භවයක් හදාගෙන දිගින් දිගට වාද විවාද කළා පසුගිය කාලයේ ඔය සූත්‍ර හරියට තේරුම් නොගැනීම නිසා.** කෙසේ හෝ අපට එක කාරණයක් පැහැදිලි වෙනවා. බුදුරජාණන් වහන්සේ මෙතෙන්දි පෙන්නුම් කරනවා **මරණ අවස්ථාවේදී තණ්හාවම උපාදානය වන බව.** ඒ ටික අපට විවිධ පැතිවලින් පෙන්නුම් කරනවා. තණ්හාවට වෙන නමක් තියනව **'භවනෙත්ති'** කියලා. යමක 'නෙත්තිය' කියල කියන්නේ නෙරා යන එකනෙ. 'භව නෙත්ති' කියලත් කියනවා 'නැමිලා'. දැන් ඔන්න හිතන්න මේ වගේ වැහි කාලවල වෙන දෙයක්නෙ-කවුරු හරි ඔය කණ්ඩියක් කපනවා කණ්ඩියක් කපල මුදුනින් නෙත්තියක් තියනවා.

වැස්ස හැටියේ කඩාගෙන වැටෙනවනෙ. **ඒ වගේ භවයේ නෙත්තිය තමයි තණ්හාව. ඇයි හේතුව? අඩුවක් තියනවනෙ - 'ඌනො ලොකො අතිත්තො තණ්හාදාසො' කියලා වදාරනවා.**[13]

මේ ලෝකයේ හැම තිස්සෙම මොකක්දෝ අඩුවක් තියනවා. 'අතිත්තො' කියන්නේ තෘප්තියක් නැහැ. තණ්හාවට දාස වෙලා. රට්ඨපාල සූත්‍රයේ තියෙන්නේ '**ඌනො ලොකො අතිත්තො තණ්හා දාසො**'. මේ ලෝකයාට නිතරම මොකක්දෝ අඩුවක් තියනවා. මහා කෝටිපතියකුගෙන් ඇහුවත් මොකක්දෝ අඩුවක් තියනවා. 'අතිත්තො' කියන්නේ තෘප්තියක් නැහැ. තණ්හාවට දාසයෙක්. එතකොට තණ්හාවට භවනෙත්ති කියන්නේ **තණ්හාවම ප්‍රමාණවත් භවයක් හදන්න.** ඒක තුළ අර නෙත්තිය තියන නිසාම කොතෙන්ට හරි භවයකට වැටෙනවා. ඒකෙනුත් හිතාගන්න පුළුවන් බුදුරජාණන් වහන්සේ ඇයි මේ තණ්හාවම උපාදානයයි කිව්වේ. එකක් දෙකක් නොවෙයි, කාරණා කීපයක්ම ඒක තුළ තියනවා. ඊළඟට අපි හිතමු තණ්හාව නැති කිරීම පිළිබඳව. තණ්හාව නැති කිරීම පිළිබඳව හිතා බලනකොට නිවන හඳුන්වන ඇතැම් තැන්වල නිවනට කියන්නේ තණ්හක්ඛය. '**තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං**' තණ්හාව ක්ෂය කිරීමම නිවන හැටියට ගන්නවා. තණ්හාව ක්ෂය කිරීමයි. එතකොට දැන් මේ කාලේ බොහොම උගත්තු අහන ප්‍රශ්නයක් තමයි තණ්හාව කියන්නෙ ආසාවනෙ. එතකොට නිවන් දකින්න ආසා කිරීමත් තණ්හාවක්නෙ. ඔය බොහෝදෙනා අහන ප්‍රශ්නයක්. එතනත් තණ්හාවනෙ. කොහොමද මේක විසඳන්නේ? තණ්හාව කියන්නේ ආසාව නම් නිවනට ආසා කිරීමත් තණ්හාවක්නේ. මේක විසඳගන්න බොහොම හොඳ සූත්‍රයක් තියෙනවා.[14] ආනන්ද ස්වාමීන් වහන්සේ කොසඹෑ නුවර ඝොෂිතාරාමයේ වැඩවාසය කරන අවස්ථාවක එක්තරා භික්ෂුණියක් එක්තරා පුරුෂයකුට කිව්වා ගිහිල්ලා මා වෙනුවෙන් ආනන්ද ස්වාමීන් වහන්සේට වන්දනා කරලා මෙහෙම කියන්න. අසවල් භික්ෂුණිය දැඩිව ගිලන්ව ඉන්නවා ආනන්ද ස්වාමීන් වහන්සේ වඩින සේක්වා. 'ආනන්ද ස්වාමීන් වහන්සේ ආරාධනාව අනුව ආවා මේ භික්ෂුණිය බලන්න. මෙහෙණවරට උන්වහන්සේ වඩිනව දැකලම මේ භික්ෂුණිය මොකද කළේ, හිසේ ඉඳලම පොරවගෙන ඇඳේ හාන්සි වුණා - හොර ලෙඩක්. ආනන්ද හාමුදුරුවන් ගැන පිළිබඳ සිතක් ඇතිව කරපු දෙයක් - තේරුම් ගන්න පුළුවන්නෙ මේ පින්වතුන්ට. ආනන්ද ස්වාමීන් වහන්සේට කොයි

ආකාරයෙන් නමුත් තේරුනා මේ තැනැත්තියගේ යටි අදහස. ඒකට ගැළපෙන කදිම දේශනාවක් පැවැත්වූවා. ඇත්ත වශයෙන් ඒ මෙහෙණියගේ වැඩේ නිසා අපට වටිනා ධර්ම දේශනාවක් අහන්න අවසථාව ලැබුණා. මේ විදියටයි ආනන්ද හාමුදුරුවෝ වදාරන්නේ වගන්ති හතරක් ඉස්සෙල්ලා ඉදිරිපත් කරනවා දේශනාවේ සාරය හැටියට.

**ආහාර සම්භූතො අයං භගිනි කායො,**
**ආහාරං නිස්සාය ආහාරො පහාතබ්බො.**
**තණ්හා සම්භූතො අයං භගිනි කායො,**
**තණ්හං නිස්සාය තණ්හා පහාතබ්බා.**
**මාන සම්භූතො අයං භගිනි කායො,**
**මානං නිස්සාය මානො පහාතබ්බො.**
**මෙථුන සම්භූතො අයං භගිනි කායො,**
**මෙථුනෙච සෙතු ඝාතො වුත්තො භගවතා.**

ඊට පස්සේ එක එකක් ගැන ආනන්ද ස්වාමීන් වහන්සේ විග්‍රහ කරනවා. තෝරනව නම් මෙහෙමයි ගන්න තියෙන්නේ. 'ආහාර සම්භූතො අයං භගිනි කායො'. නැගණිය මේ කය ආහාරය නිසා හට ගත්තක්, 'ආහාරං නිස්සාය ආහාරො පහාතබ්බො. ආහාරයම උපකාර කරගෙන ආහාරය ප්‍රහාණය කළ යුතුයි. තණ්හා සම්භූතො අයං භගිනි කායො'. මේ කය ඇති වෙලා තියෙන්නේ තණ්හාව නිසා. නමුත් තණ්හාව උපකාර කරගෙන තණ්හාව නැති කරන්න ඕන. පරස්පර විරෝධී වගේ. ඊළඟට කියනවා 'මාන සම්භූතො අයං භගිනි කායො' නැගණිය මේ කය ඇති වෙලා තියෙන්නේ මාන්නයෙන්. නමුත් මාන්නයම උපකාර කරගෙන මාන්නය නැති කරන්න ඕන. අවසානයේ කියන්නේ මොකක්ද ටිකක් අමුතු එකක්. 'මෙථුන සම්භූතො අයං භගිනි කායො, මේ කය මෛථුනය නිසා ඇති වෙච්ච එකක්. ඇත්ත වශයෙන් ඒකෙදි නම් කියන්නෙ නැහැ 'මෙථුනං නිස්සාය' කියලා. ඒකෙදි කියන්නේ 'මෙථුනෙච සෙතු ඝාතො වුත්තො භගවතා'. භාග්‍යවතුන් වහන්සේ විසින් මෛථුනය පිළිබඳව නම් අර වගේ නොවෙයි කියල තියෙන්නේ. 'සෙතු ඝාත' කියල කියන්නේ පින්වතුනි, පාලම බිඳ දැමීමක්, කඩා බිඳ දැමීමක්. සම්බන්ධතා නැති කිරීමක්. එතකොට මෛථුනය

පිළිබඳව නම් කියන්නේ එහෙමයි. ඊළඟට තෝරනවා ආනන්ද ස්වාමීන් වහන්සේ. ආහාර සම්භූතො අයං භගිනි කායො. මේ පින්වතුන්ට ඒක පහසුවෙන් වටහාගන්න පුළුවන්. යම් කිසි භික්ෂුවක් ජීවත් වෙන්න ඕන නිසා - ආහාරය නැතිව බැහැනෙ. නිගණ්ඨයො වගේ නොකා නොබී ඉන්න බැහැනෙ - ආහාරය ගන්නවා. නමුත් ප්‍රත්‍යවේක්ෂා කරලා, 'නෙව දවාය - න මදාය - න මණ්ඩනාය, ආදී වශයෙන්. ඒකට කියන්නේ 'ඥාණ සංවරය' කියලා.[15] ආහාරය ප්‍රත්‍යවේක්ෂා කරමින් ආහාරය ගන්නවා. ඒකත් භාවනාවක් බවට පත් වෙනවා. අපි කොතෙකුත් කියල තියනවනෙ මේ ආහාරය ක්‍රීඩාව සඳහා නොවේ, විනෝදය සඳහා නොවේ, හුදෙක් මේ කය පවත්වාගෙන බ්‍රහ්මචරිය වාසය සඳහායි කියලා. එහෙම කියලා ආනන්ද ස්වාමීන් වහන්සේ කියනවා එබඳු භික්ෂුව 'අපරෙන සමයෙන' පසු කලෙක ආහාරයම උපකාර කරගෙන ආහාරය ප්‍රහාණ කරනවා.

ඊළඟට තණ්හා සම්භූතො කියන එකත් ටිකක් තේරුම්ගන්න අමාරුයි. ඒක ආනන්ද සවාමීන් වහන්සේ තෝරන්නෙ මෙහෙමයි. යම් කිසි භික්ෂුවකට අහන්න ලැබෙනවා අසවල් නම ඇති භික්ෂුව රහත් වුනා කියලා. ආශ්‍රව ක්ෂය කරලා රහත් වුණා කියලා. මේ භික්ෂූන් වහන්සේ කල්පනා කරනවා ඒ භික්ෂූන් වහන්සේ එහෙම රහත් වුණා. කවදා නම් මමත් රහත් වීම ලබන්නද, උන්වහන්සේ එහෙම බලාපොරොත්තුවක් ඇති කරගන්නවා. ඒක තණ්හාව බව පිළිගන්න ඕන. නමුත් ඒ භික්ෂුව ඒ කියාපු තණ්හාව, ඒ ආසාව, උපකාර කරගෙන යම් දවසක උත්සාහවන්ත වෙලා අර රහත් තත්ත්වයට පත් වෙනවා. මාන සම්භූතො කියන එකත් ටිකක් ඒ වගෙයි. යම් කිසි භික්ෂුවකට අහන්න ලැබෙනවා අහවල් නම ඇති භික්ෂුව රහත් වුනා කියලා. එතකොට ඒ භික්ෂුව කල්පනා කරනවා අර කියන නම ඇති භික්ෂුවත් රහත් වුණා. එතන අමුතු පාලි වචනයක් යෙදෙනවා. 'කිමඞ්ග පන අහං' 'ඇයි මට බැරි'? එතන මානයනේ තියෙන්නේ. අපි කියමු ඒ රහත් වෙච්ච භික්ෂූන් වහන්සේ කිසිම උගත්කමක් නැති සමහර විට අඩු කුලයක භික්ෂූන් වහන්සේ නමක්. මේ හාමුදුරුවෝ කල්පනා කරනවා 'හා එයාට පුළුවන් නම් ඇයි මට බැරි'? එතන මාන්නය තියනවා. ඒ මාන්නය උපකාර කරගෙන යම් දවසක උන්වහන්සේට පුළුවන් රහත් වෙන්න. ඒ කාරණා ටික තේරුම් කරලා

දුන්නා. ඊළඟ කාරණයට නම් විවරණයක් දුන්නේ නැහැ ආනන්ද ස්වාමීන් වහන්සේ. මෙච්චරයි කිව්වේ 'මෙථුනෙව සෙතු සාතො වුත්තො භගවතා' භාග්‍යවතුන් වහන්සේ මෛථුනය පිළිබඳව නම් කියලා තියෙන්නේ අර වගේ නොවේ. ඒක පිළිබඳව සම්බන්ධතා කඩාදමන්න කියලයි. ඒක කිව්ව හැටියෙ අර භික්ෂුණිය ඇඳෙන් පැනලා වැඳ වැටිලා ආනන්ද ස්වාමීන් වහන්සේගෙන් සමාව ඉල්ලනවා. මගේ මෝඩකමට මුළාව නිසා අකුසල් නිසා මම එහෙම ආරාධනයක් කළා කියලා. ඒ සූත්‍රයේ එහෙමයි සඳහන් වන්නේ. නමුත් ඒ තුළින්, ඒ තැනැත්තියගේ හොර ලෙඩේ තුළින්, අපට හොඳ වටිනා බණක් මතු වුණා. එහෙමයි අපට හිතාගන්න තියෙන්නෙ. නමුත් අපි එහෙම කිව්වට මොකද අවාසනාවකට වගේ ඇතැම් බෞද්ධ නිකායයන් මේක වරදවා තේරුම් ගත්තා. මේ පින්වතුන් ඒව ගැන වැඩිය දන්නෙ නැහැ. තන්ත්‍රවාදය කියලා එක්තරා බෞද්ධ නිකායක් තිබුණා. ඒ ගොල්ලන් මේක වරදවා අරගෙන 'මෙථුනං නිස්සාය මෙථුනං පජහති' වගේ අදහසක් ගත්තා. ඕව කියන්නත් හොඳ නැහැ. අසභ්‍ය විදියේ දේවල්. නමුත් මෛථුනය උපකාර කරගෙන මෛථුනය නැති කරන්න පුළුවන් කියන ඒ වැරදි දෘෂ්ටිය ගත්තා. ඒවා අපට වැඩක් නැහැ.

ඊළඟට මේ වගේම වටිනා සූත්‍රයක් තියනවා[16] මේ කාරණයම හෙළිකරන. ආනන්ද ස්වාමීන් වහන්සේ තමයි එතනදීත් දේශකයා. ඒත් කොසඹෑ නුවර ඝෝෂිතාරාමයේදී. මෙහෙමයි සඳහන් වෙන්නේ. උණ්ණාභ කියන බ්‍රාහමණයා දවසක් ආනන්ද ස්වාමීන් වහන්සේව හමුවෙන්න ඇවිල්ලා අහනවා 'කවර අර්ථයක් සඳහාද භවත් ගෞතමයින් වෙත ඔබ වහන්සේලා බ්‍රහමචරියාව ආරක්ෂා කරන්නේ?' උණ්ණාභ බෞද්ධයෙක් නොවෙයි. කුතුහලයට අහන්නේ. ආනන්ද ස්වාමීන් වහන්සේ පිළිතුරු දෙනවා. 'ඡන්ද පහානත්ථං' ඡන්දය ප්‍රහාණය කිරීමටයි මේ ශාසනයේ මේ පිළිවෙත් පුරන්නේ. එතකොට අහනවා මේ ඡන්දය ප්‍රහාණය කිරීමට මේ සාසනයේ යම් කිසි මාර්ගයක් ප්‍රතිපදාවක් තියනවද? ආනන්ද ස්වාමීන් වහන්සේ වදාරනවා 'තියෙනවා. මොකක්ද මාර්ගය - ප්‍රශ්නයක් බලාපොරොත්තු වෙන විදියට ආනන්ද ස්වාමීන් වහන්සේ පිළිතුරු දුන්නේ - එතෙන්දි දක්වන්නේ ආනන්ද ස්වාමීන් වහන්සේ මාර්ගය හැටියට ඉද්ධිපාද හතරයි. ඉද්ධිපාද ගැන මේ

පින්වතුන් සමහර විට දන්නවා ඇති ඡන්ද, විරිය. චිත්ත වීමංසා, ඡන්ද සමාධි පධාන සංඛාර සමන්නාගතං ඉද්ධිපාදං භාවෙති' ඔය විදියටයි කියන්නේ. යම් කිසි භික්ෂුවක් ඡන්ද සමාධිය මුල් කරගෙන යම් උත්සාහයක් දරනවා. ඔය විදියටයි ආනන්ද ස්වාමීන් වහන්සේ විස්තර කරන්නේ සතර ඉද්ධිපාද වැඩීමෙනුයි කෙනෙක් ඡන්දය නැති කරන්නේ. එතන පරස්පර විරෝධී කියමනක්. එතකොට අර බමුණා මේක නම් කරන්න පුළුවන් වැඩක් නොවෙයි. 'ඡන්දෙනෙව ඡන්දං පජහිස්සතීති නෙතං ඨානං විජ්ජති' ඡන්දයෙන්ම ඡන්දය නැති කරන්නෙ කොහොමද ඒක ගැලපෙන්නෙ නැහැනෙ. ආනන්ද ස්වාමීන් වහන්සේ සරල උපමාවක් දෙනවා. ''බමුණ ඔබට මේ ආරාමයට එන්න යම් ඡන්දයක් තිබුණා නේද. ඒ ඡන්දය ආරාමයට ආවට පස්සෙ නැති වුනා නේද?,'' එහෙමයි කිව්වා. ඊළඟට ආරාමයට එන්න යම් වීර්යයක් තිබුණා නේද, ඒ වීර්යය නැති වුණා නේද ආවට පස්සෙ? එහෙමයි කිව්වා. චිත්ත කියල කියන්නේ යම් අධිෂ්ඨානයක් තිබුණා නේද. ඒකත් ආවට පස්සෙ නැතිවුණා නේද? ඊළඟට වීමංසා සමහර විට එන පාර සොයලා ඒ ගැන විමසලා බලන ඒ ප්‍රඥාව ආවට පස්සේ සංසිඳුණා නේද.

අන්න ඒ වගෙයි යම්කිසි භික්ෂුවක්, අර ඉද්ධිපාද හතර උපකාර කරගෙන අවසානයේ **දැන් අපි කිව්වනේ තණ්හාව ක්ෂය කිරීමයි කියල ඉලක්කය, අනිත් ලෞකික ඉලක්ක නම් එකක් ඉෂ්ට කරගන්නකොට තව එකක් මතු වෙනවා. ඔන්න ඔතනයි වෙනස තියෙන්නෙ. ලෞකික ඉලක්ක කියලා කියන්නේ තණ්හාවෙන් මතු කර දෙන ඉලක්ක. තණ්හාව තව තව වඩන ඉලක්ක. නමුත් මෙතනදී ඉලක්කය මොකක්ද? නිවන කියන එකට යෙදෙන වචනය 'තණ්හක්ඛයො'. තණ්හාව ක්ෂය කිරීමට යොදන ඒ වීර්යය යම් තැනකදී කෙළවර වෙනවා.** මීට කලින් මේවට නොයකුත් උපමා දීලා තියනවා මේ පින්වතුන්ට. එතකොට අර තර්ක කාරයින්ට අර විදියට කියන්න බැහැ නිවනට ආශාවත් ආශාවක් කියලා. ඇත්ත කාරණය පිළිගන්න ඕන. මෙතන තියෙන්නේ මැදුම් පිළිවෙතයි. ඒක නොයෙකුත් ආකාරයෙන් අපි පෙන්නල දුන්නා සැඩ පහරකින් එතර වීම ආදියෙන්. මේ මැදුම් පිළිවෙත තුළ තියන මූලධර්මය, ප්‍රායෝගික සාපේක්ෂක කියන ටිකක් ගැඹුරු වචන වලින්. මේක ඔක්කොම අහක දාන්නෙත් නැහැ. නිගණ්ඨයො කළේ

තණ්හාවෙන් මිදෙන්න කියලා ආහාර නොගෙන සිටියා. ඇඳුමේ ගැටේත් ලිහල දැම්මා. නිර්වස්ත්‍රව සිටියා. බුදුරජාණන් වහන්සේ ඒ අන්තයට ගියේ නැහැ අන්තිමට ඒ අවබෝධයට ආවට පස්සෙ. ඒ වෙනුවට අන්න අර කියාපු ප්‍රත්‍යවේක්ෂාව යෙදුවා ප්‍රත්‍යවේක්ෂාව තුළින් මැදුම්පිළිවෙත. ඒවා නැතුව බැහැ. අන්න ඒ වගෙයි සංසාරෙ තත්ත්වය. මේ සැඩ වතුරෙන් එතර වීම කියන එක බොහොම පරිස්සමින් යා යුතු ගමනක්. ඒකමයි බුදුරජාණන් වහන්සේ මැදුම් පිළිවෙත යෙදුවේ. ඒකටම අයිතියි මෙන්න මේ කියාපු 'තණ්හං නිස්සාය තණ්හා පහාතබ්බා' කියන එක. තණ්හාව උපකාර කරගන්න වෙනවා. වෙනස තියෙන්නේ එතනයි. අනික් ලෞකික අර්ථ එකක් සංසිඳෙනකොට, එකක් සම්පූර්ණ වෙනකොට, තව එකක් මතු වෙනවා. නමුත් නිවනින් ඔක්කොම කෙළවර වෙනවා. නිවන කියන්නේ මොකක්ද? අපි කිව්ව අර සියදෝරිස් නිවන වගේ දෙයක් නොවෙයිනෙ. 'තණ්හක්ඛයො' කියන්නේ තණ්හාව ක්ෂය කිරීම. බුදුරජාණන් වහන්සේ චතුරාර්‍ය සත්‍යය දේශනාවේදී දුක්ඛ සමුදය හැටියට පෙන්නුවෙත් 'තණ්හා පොනොභවිකා' ආදී වශයෙන් දුක්ඛ නිරෝධය පෙන්නුවෙත් 'තස්සා යෙව තණ්හාය අසෙස විරාග නිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො' වෙන දෙයක් නොවේ. තණ්හාව ක්ෂය කිරීමමයි.

ඒ වගේම මතක තියාගන්න. අපි කිව්වනේ වච්ඡගොත්ත පරිබ්‍රාජකයා අහපු ප්‍රශ්නයෙන්ම ඉබේම කියවුණානේ එතන බුදුරජාණන් වහන්සේ විමුක්ත පුද්ගලයාගේ උපත ගැන කිව්වේ මෙච්චරයි. නියම වචනෙ එතනයි තියෙන්නෙ '**අච්ඡෙච්ඡි තණ්හං**'. තණ්හාව කපා හැරියා '**වාවත්තයි සඤ්ඤොජනං**' මේ සංයෝජන බැමි අනිත් පැත්තට හැරෙව්වා කියලා හිතාගන්න. මේ සංයෝජන බැමි එකකට එකක් සම්බන්ධ වන හැටි සාමාන්‍ය උපමාවකින් දක්වනවා නම් දැන් ඔය රේල් පෙට්ටි ගැන හිතමු. රේල් පෙට්ටි අමුණන්නේ යම් කිසි කොක්කක් දාලා. ඒ කොක්ක අනිත් පැත්තට හැරෙව්වහම සම්බන්ධයක් නැහැනේ. සංයෝජන කියන එක එහෙම හිතාගන්න. **කොකු අනිත් පැත්තට හැරෙව්වා. භව බැමි.** ඒ වගේම **සම්මා මානාභිසමයා** ඒක ගැඹුරු කියමනක්. මේ සංසාරේ දිගින් දිගට යන්නේ ඒකනෙ. මානයම උපකාර කරගෙන මානය නැති කරන්න කියන්නෙ අවසාන ඉලක්කය තමයි.

අවසාන තුරුම්පුව තමයි මාරයාගේ 'අස්මිමානය' කියන එක. 'වෙමි' කියන මානය. භවය පිළිබඳ තියන ඉතාම සියුම් ඇල්ම. ඒක ඉවත් නොකරන තාක් - දැන් ධර්මය කියවපු අය දන්නව ඇති - අනාගාමී වෙන්නෙ බ්‍රහමලෝකවලට යන්නෙ එතන ඒ ඕංග විතරක් තියන අය. රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා කියන තැන තියෙන්නේ සියුම් අන්දමින් 'වෙමි' කියන මානය. ඒකත් අන්තිමට ප්‍රහාණය කරන්න වෙනවා. තණ්හාවට තියන වැදගත් තැනයි කිව්වෙ. **අම්ම නිසයි.** එච්චරයි හිතන්න තියෙන්නේ.

අර කාරණය බොහෝදෙනා පටලවාගෙන තියෙන්නේ - පටිච්ච සමුප්පාදයත් මේකත් අතර සම්බන්ධය. ඒක නිසාම තමයි ඇතැම් අය, හින්දූන් වගේ අපේ අටුවාචාරීන් වහන්සේලාත් හිතනවා අවිද්‍යාවේ මූල හේතුව මොකක්ද? අවිද්‍යාවට මුල මොකක්ද එහෙම හිතන්න ඕන නැහැ. **අවිද්‍යා අඳුර තුළ කෙරෙන අතපත ගෑම තමයි 'කාය සංඛාරො, වචී සංඛාරො, චිත්ත සංඛාරො' කියන ඒ සංස්කාර. ඒ සංස්කරණය තුළ ඇති වෙනවා විඤ්ඤාණයයි නාම රූපයයි කියල දෙකක්. ඒ දෙක තමයි දිය සුළිය හැටියට අපි දැක්වූවේ.** 'අඤ්ඤමඤ්ඤ පච්චයතාව' තේරුම් නොගැනීම නිසා ලෝකයා ස්ථාවරයක් ගන්නවා. ඒක නොයෙකුත් විදියට කර්තෘ, කර්ම, හැටියට අල්ලගන්න දෙයක් තියනවා. දැන් උපාදානය තුළ ක්‍රියාත්මක වෙන්නේ ඒකනෙ. ඒක තව ටිකක් තේරුම්ගන්න නම් මේ පින්වතුන්ට හිතාගන්න පුළුවන් මිරිඟුව ගැන අපි කොතෙකුත් කියලා තියන. තේරුම්ගන්න උපකාර වෙන්න හිතාගන්න තැනිතලාවක ඒ ඒ තැන්වල ඇතින් ඇතින් කණු හිටවල තියනවා. එතකොට මුවා හිතාගන්නවා අන්න අතන තමයි වතුර තියෙන්නෙ කියලා. පළමුවෙනි කණුව ළඟට දුවනවා. දුවල බලනකොට එතන නැහැ. ඊළඟ කණුව ළඟට දුවනවා. ඔන්න ඔය විදියට පෙන්නුවේ තණ්හා පොනොභවිකා ඒකෙ ක්‍රියාත්මක බව පෙන්වන්නේ ඒ විදියට **මේ තණ්හාව විසින් ඉස්සරහට තල්ලු කරල යවනවා.** මේ හැම එකකින්ම අපි තේරුම්ගන්න ඕන. මේ ධර්මයේ තිබෙන ගැඹුර. මහ පුදුම ධර්මයක් මේක. ඉලක්කය තේරුම් ගන්න ඕන. බොහෝදෙනා නිවන හැටියට භවයක් පතන්නේ. අපි මතු කරල දුන්නා පටිච්ච සමුප්පාද ධර්මය තේරුම් කිරීම් ආදී අවස්ථාවල මේ ධර්මයේ විශේෂත්වය තියෙන්නේ අවසානයේ සියලු දුක්ඛස්කන්ධය නැති කිරීමට

නම් අර කියාපු භව රාගයත් නැති කරන්න ඕන - පැවැත්ම කියන හැඟීමත්. එහෙම නැත්නම් අනාගාමි වුණත් ඒත් යමක් ඉතිරි වෙලා තියනවා. ඒ තරම් සියුම් දෙයක් මෙතන තියෙන්නේ.

ඉතින් මේ පින්වතුන්ට මේ කියාපු ටික තම තමන්ගේ සිත්වලට අරගෙන ඒවා භාවනාවට උපකාර කරගෙන විශේෂයෙන් තණ්හාවේ ආදීනව පක්ෂය බුදුරජාණන් වහන්සේ පෙන්නල දීලා තියෙනවා. තණ්හාව උපදින තැන්, ඒවා ප්‍රහීණ වෙන තැන්, අන්න ඒව ගැන සැලකිලිමත්ව ක්‍රියා කළොත් කවුරුත් බලාපොරොත්තු වන උත්තමාර්ථය වන 'තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං' කියන ඒ අර්ථයට මේ පින්වතුන්ට පැමිණෙන්ට පුළුවන්කම තියෙනවා. ඒ නිසා මේ පින්වතුන් මෙතෙක් මේ ඇසූ දේශනාවේ ප්‍රායෝගික අර්ථය උපයෝගී කරගෙන තම තමන්ගේ බණ භාවනාවන් මුදුන් පමුණුවාගෙන මේ ජීවිතය තුළම සෝවාන් සකදාගාමි ආදී ඒ මාර්ග ඵල ප්‍රතිවේධයෙන් උතුම් අමාමහ නිවනින් සැනසීමට මේ ධර්ම දේශනාව හේතු වාසනා වේවා කියා ප්‍රාර්ථනා කරනවා. අවීචියේ සිට අකනිටා දක්වා යම් තාක් සත්ත්ව කෙනෙක් මෙබඳු ධර්ම දේශනාමය ධර්ම ශ්‍රවණමය කුසලයක් අනුමෝදන් වීමට කැමති නම් අනුමෝදන් වීම තුළින් ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවනින් සැනසෙත්වා කියා ප්‍රාර්ථනා කරමින් මේ ගාථා කියන්න.

**එත්තාවතා ච අම්හෙහි...**

## පාදක සටහන්

1. ද්වයතානුපස්සනා සුත්ත, සුත්ත නිපාත, 230 පිට (බු.ජ.ත්‍රි. 25)
2. විභඞ්ග සුත්ත, සංයුත්ත නිකාය, 2-6 පිට (බු.ජ.ත්‍රි. 14)
3. ධම්මචක්කප්පවත්තන සුත්ත, සංයුත්ත නිකාය, 5(2) - 270 පිට (බු.ජ.ත්‍රි. 17-2)
4. තිත්ථායතන සුත්ත, අංගුත්තර නිකාය, 1-316 පිට (බු.ජ.ත්‍රි. 18)
5. සමිද්ධි සුත්ත, සංයුත්ත නිකාය, 1-22 පිට (බු.ජ.ත්‍රි. 18)
6. මහාසතිපට්ඨාන සුත්ත, දීඝ නිකාය, 2-478-496 පිටු (බු.ජ.ත්‍රි. 8)
7. පඨම-දුතිය-තතිය ජනෙති සුත්ත, සංයුත්ත නිකාය, 1-68 පිට (බු.ජ.ත්‍රි. 13)
8. මජ්ජෙඨ සුත්ත, අංගුත්තර නිකාය, 4-186 පිට (බු.ජ.ත්‍රි. 21)
9. ලොකවොලොකන සුත්ත, උදාන පාළි ඛුද්දක නිකාය 1-192 පිට (බු.ජ.ත්‍රි. 24)
10. තණ්හා වග්ග ධම්මපද, ඛුද්දක නිකාය, 1-110 පිට (බු.ජ.ත්‍රි. 24)
11. තණ්හා වග්ග ධම්මපද, ඛුද්දක නිකාය, 1-108 පිට (බු.ජ.ත්‍රි. 24)
12. කුතුහල සාලා සුත්ත, සංයුත්ත නිකාය, 4-700 පිට (බු.ජ.ත්‍රි. 16)
13. රට්ඨපාල සුත්ත, මජ්ඣිම නිකාය, 2-440 පිට (බු.ජ.ත්‍රි. 11)
14. භික්ඛුනී සුත්ත, මජ්ඣිම නිකාය, 2-440 පිට (බු.ජ.ත්‍රි. 11)
15. සීල නිද්දෙස, විසුද්ධි මග්ග - 6 (හේ.මු)
16. බ්‍රාහ්මණ සුත්ත, සංයුත්ත නිකාය, 5(2) - 30 පිට (බු.ජ.ත්‍රි. 2)

# 18 වන දේශනය

# 18 වන දේශනය

## (පහන් කණුව ධර්ම දේශනා අංක 200)
## 'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

උපාදාන පච්චයා භවො - භූතො දුක්ඛං නිගච්ඡති
ජාතස්ස මරණං හොති - එසො දුක්ඛස්ස සම්භවො
තස්මා උපාදානක්ඛයා - සම්මදඤ්ඤාය පණ්ඩිතා
ජාතික්ඛයං අභිඤ්ඤාය - නාගච්ඡන්ති පුනබ්භවං[1]

-ද්වයතානුපස්සනා සුත්ත, සුත්ත නිපාත

සැදැහැවත් පින්වතුනි,

සසර පැවැත්මේ රහස හෙළි කරගැනීමට ඈත අතීතයේ පටන්ම නොයෙකුත් ආගම් ශාස්තෘවරු නොයෙකුත් දෘෂ්ටි මතවාද ඉදිරිපත් කළා. පැවැත්මේ මූලික හේතුව දෙවියන්ට බ්‍රහ්මයන්ට පවරා දීමට පවා ඇතැම් ශාස්තෘවරු උත්සාහ දැරුවා. ඒ සියලුම දෘෂ්ටි මතවාද ප්‍රතික්ෂේප කරමින් තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලොවටම හෙළි කර වදාළ පටිච්ච සමුප්පාද ධර්මයට අනුව **පැවැත්මේ මූලික හේතුව උපාදානයයි.** ඒ බව පැහැදිලිවම ප්‍රකාශ කෙරෙන ගාථා දෙකකුයි අද අපි මේ දහඅටවෙනි පටිච්ච සමුප්පාද දේශනාවට මාතෘකාව හැටියට තෝරාගත්තේ. අපේ පටිච්ච සමුප්පාද දේශනා කීපයකටම මාතෘකා සපයා දුන්න සුත්ත නිපාතයේ ද්වයතානුපස්සනා සූත්‍රයේමයි මේ ගාථා දෙකත් සඳහන් වෙන්නේ. ඒ සූත්‍රයේ දේශනා රටාව මේ පින්වතුන්ට මීට කලින් අවස්ථාවල කියල ඇති. බුදුරජාණන් වහන්සේ සමුදය නිරෝධය කියන ඒ ද්වයතාව හිතට කාවදින අන්දමින් එක එක ධර්ම ඉදිරිපත් කරමින් විග්‍රහ කරන සූත්‍රයක්. ඒකෙදි උපාදාන කියන ඒ පටිච්ච සමුප්පාද අංගය පිළිබඳ සමුදය නිරෝධය කියන දෙපැත්ත පළමුවෙන්ම බුදුරජාණන් වහන්සේ මේ විදියටයි හඳුන්වල දෙන්නේ. 'මැනවින් ද්වයතානුපස්සනාවේ යෙදීමේ තවත් ක්‍රමයක් තිබිය හැකි දැයි අසන්නවුන් ඇතොත් තිබිය හැකි යයි කිව යුතුය. කෙසේද තිබිය හැක්කේ? යම් තාක් දුකක් හටගනීද ඒ සියල්ල උපාදාන ප්‍රත්‍යයෙනි. මේ එක අනුපස්සනාවකි.

උපාදානයන්ගේ නිරවශේෂ විරාග නිරෝධයෙන් දුකෙහි හටගැනීමක් නැත. මේ දෙවෙනි අනුපස්සනාවයි. මැනවින් මේ ද්වයතානුපස්සනාවේ යෙදෙන, අප්‍රමාදීව කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව වෙසෙන භික්ෂුවකට ඵල දෙකකින් එකක් බලාපොරොත්තු විය හැකියි. දිටුදැමියෙහිම රහත් ඵලය හෝ උපාදාන යමක් ශේෂ වී ඇත්නම් අනාගාමි ඵලය.' එහෙම ප්‍රකාශ කරලා තමයි අර ගාථා දෙක වදාළේ.

**'උපාදාන පච්චයා භවො'** - උපාදානය නමැති අල්ලාගැනීම නිසයි භවය නමැති පැවැත්ම තිබෙන්නේ.
**'භූතො දුක්ඛං නිගච්ඡති'** - පැවැත්මක් ඇත්තා දුකට පැමිණෙයි.
**'ජාතස්ස මරණං හොති'** - උපන්නහුට මරණය වෙයි.
**'එසො දුක්ඛස්ස සම්භවො'** - මේ දුකෙහි හටගැනීමයි.
**'තස්මා උපාදානක්ඛයා'** - එනිසා උපාදාන ක්ෂය කිරීමෙන්
**'සම්මදඤ්ඤාය පණ්ඩිතා'** නුවණැත්තෝ මැනවින් අවබෝධ කරගෙන
**'ජාතික්ඛයං අභිඤ්ඤාය'** - උපතේ ක්ෂය වීම විශිෂ්ට ඥානයෙන් දැනගෙන
**'නාගච්ඡන්ති පුනබ්භවං'** - පුනර්භවයකට නොපැමිණෙත්.

ඒ ගාථා දෙකෙහි අර්ථයයි මේ. උපාදාන කියන වචනය අපි ඉස්සෙල්ලාම තේරුම්ගන්න බලමු. පටිච්ච සමුප්පාදයේ අංග දොළහ අතර උපාදාන කියන වචනය සඳහන් වන ආකාරය මේ බොහෝ පින්වතුන් දන්නවා. 'තණ්හා පච්චයා උපාදානං - උපාදාන පච්චයා භවො' අපි කලිනුත් සඳහන් කළා මේ පටිච්ච සමුප්පාදයේ එක එක අංගයක් විග්‍රහ කිරීමේදී ඒකේ දෙපැත්තේ තියන අංග දෙකත් සිහියට නගාගත යුතු බව. එතකොට තණ්හා ප්‍රත්‍යයෙන් උපාදානය, උපාදාන ප්‍රත්‍යයෙන් භවය. ඊළඟට මේ උපාදාන කියන එකත් බුදුරජාණන් වහන්සේ පටිච්ච සමුප්පාද විග්‍රහයේදීම ප්‍රශ්න කරල සංඝයා වහන්සේලාට තේරුම් කරල දෙනව[2] 'කතමඤ්ච භික්ඛවෙ උපාදානං' කියලා උපාදාන හතරක්. කාමුපාදානං, දිට්ඨුපාදානං, සීලබ්බතුපාදානං, අත්තවාදුපාදානං. කාමයන් අල්ලා ගැනීම, දිට්ඨි අල්ලා ගැනීම ශීලව්‍රත අල්ලාගැනීම. ආත්මවාදයක් අල්ලාගැනීම. මේ උපාදාන කියන වචනය ගැනත් හිතන්න වටිනවා. ඒකේ නිරුක්ති ආශ්‍රයෙන්. 'උප' කියන උපසර්ග පදයේ සාමාන්‍යයෙන් තියෙන්නේ

සමීපාර්ථය, කිට්ටු වීම. ඇතැම් විට 'උපෙති උපාදියති' කියලත් සඳහන් වෙනවා. ළං වෙලා අල්ලා ගැනීම. **ඇත්ත වශයෙන් අල්ලාගෙන සිටීම වගේ දෙයක් මෙතන තියෙන්නේ.** ඒ අල්ලාගැනීම අතින් නොවෙයි සිතින් කරන්නෙ.

ඉතින් මේ උපාදානය ගැන කියන කොට මේ පින්වතුන්ට පහසුවෙන්ම සිහියට නැඟෙනවා ඇති නිතර අහන්න ලැබෙන පඤ්ච උපදානස්කන්ධය. උපාදාන ගොඩවල් පහ - රූප, වෙදනා, සඤ්ඤා සංඛාර, විඤ්ඤාණ. මේ ගොඩවල් පහ තමයි අපි කිට්ටු වෙලා අල්ලගෙන ඉන්නෙ **'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'** මේක මගේ රූප ආදිය, මේ මම තමයි. මේ මගේ ආත්මය කියල දැඩිව අල්ලගෙන ඉන්නෙ ඔය පහ. එක්තරා අවස්ථාවකදී මැදුම් සඟියේ මහා පුණ්ණම සූත්‍රයේ[3] එන හැටියට හඳ එළිය ඇති රාත්‍රියක බුදුරජාණන් වහන්සේ අවසර දුන්නා සංඝයා වහන්සේලාට ප්‍රශ්න අසන්න. එක ස්වාමීන් වහන්සේ නමක් මේ උපාදානයත් උපාදාන ස්කන්ධයත් පිළිබඳව ප්‍රශ්න දෙකක් අහනව. පළමුවෙන්ම අහන්නේ මේ පඤ්ච උපාදානස්කන්ධයේ 'කිංමූලකා' මේකෙ මුල කුමක්ද කියලා. ඒකට බුදුරජාණන් වහන්සේ දුන්න පිළිතුර 'ඉමෙ ඛො භිකඛු පඤ්චුපාදානක්ඛන්ධා ඡන්දමූලකා' මේ පඤ්ච උපාදානස්කන්ධයට මුල ඡන්දයයි. ඡන්දය කියනකොට තණ්හාව ඉබේටම කියවෙනවා. ඡන්දය කියන්නෙ කැමැත්ත කියන එකයි. ඊළඟට අමුතු ප්‍රශ්නයක්. මේ භික්ෂූන් වහන්සේ අහනවා ඒක එක පාරටම තෝරාගන්නත් කෙනෙකුට අමාරු වෙන්න පුළුවන්. 'ස්වාමීනි මේ උපාදානයත් පඤ්ච උපාදානස්කන්ධයත් එකක්මද? එහෙම නැත්නම් පඤ්ච උපාදානස්කන්ධයෙන් වෙන්වූ දෙයක්ද උපාදානය? ඔන්න අමුතු ප්‍රශ්නයක්. බුදුරජාණන් වහන්සේ දෙන පිළිතුර මහණ, උපාදානයත් පඤ්ච උපාදානස්කන්ධයත් එකක්මත් නොවෙයි. පඤ්ච උපාදානස්කන්ධය උපාදානයෙන් වෙන්වූ දෙයකුත් නොවෙයි. ඔන්න ඊළඟට උත්තරේ දෙනවා. **පඤ්ච උපාදානස්කන්ධය පිළිබඳව යම් ඡන්දරාගයක් තියනවා නම් අන්න ඒකයි උපාදානය.** ඒක මතක තියාගන්න. එතකොට පඤ්ච උපාදානස්කන්ධය පිළිබඳව තියන ඡන්දරාගයයි ඒකෙ තියන උපාදාන තත්ත්වය.

ඔන්න අපි ඊළඟට යමු 'උපාදාන පච්චයා භවො' කිව්වනෙ. භව කියන වචනයත් තේරුම්ගන්න බලමු. භව කියන වචනයේ තේරුම පැවැත්ම කියන එකයි සාමාන්‍ය අදහස. නමුත් භව කියන වචනය ඇහෙනකොට බොහෝ දෙනාට එක පාරටම ලෝකයක් මතක් වෙනවා. කාම ලෝක, රූප ලෝක, අරූප ලෝක. මේ ලෝක පිළිබඳ හැඟීමයි හිතට එන්නෙ. මේකෙ හිතට තියන සම්බන්ධය සාමාන්‍යයෙන් කෙනෙකුට ප්‍රකට නැහැ. ඒක නිසා වෙන්න ඇති ආනන්ද ස්වාමීන් වහන්සේ එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේගෙන් අහන්නෙ[4].

'භවො භවොති භන්තෙ වුච්චති. කිත්තාවතා නුඛො භන්තෙ භවො හොති'? මේ භව භව කියලා කියනව. කෙතෙකින්ද ස්වාමීනි මේ භව කියල කියන්නෙ. ඔන්න එතකොට බුදුරජාණන් වහන්සේ දෙන පිළිතුර - මේ විදියටයි ප්‍රකාශ කරන්නෙ. ආනන්ද කාම ධාතුවක - එතන කාම ධාතු කියල කියන්නෙ අපි හිතාගන්න ඕන කාමභව හෝ කාම ලෝකය කියල - කාම ධාතුවක එහෙම නැත්නම් කාම ලෝකයක විපාක දෙන්න උපකාර වෙන අන්දමේ කර්මයක් නැත්නම් ආනන්ද කාම භවයක් දක්විය හැකිද? නැතමය සවාමීනි. ඒක අනුවම බුදු රජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා අන්න ඒ නිසා ආනන්ද - ඔන්න විශේෂ වචන කිහිපයක් - **කම්මං ඛෙත්තං, විඤ්ඤාණං බීජං, තණ්හා සිනෙහො'** කර්මය කෙතයි, විඤ්ඤාණය බීජයයි, තණ්හාව දිය සීරාවයි, අවිද්‍යාවෙන් වැසුණු තණ්හාවෙන් බැඳුණු සත්ත්වයින්ගේ විඤ්ඤාණය කාම ධාතුවක කාම ලෝකයක ඉපදීමට. එතකොට කාම ලෝකයක ඉපදීමට හේතු වෙන්නේ කර්ම නමැති කෙතේ විඤ්ඤාණ බීජය තණ්හාව දිය සීරාව කරගෙනය. දෙවෙනි ප්‍රශ්නයත් අර වගේමයි. ආනන්දය රූප ධාතුවක-ඒ කියන්නේ රූප ලෝකයක-විපාක දෙන අන්දමේ කර්මයක් නැත්නම් රූප භවයක් දක්විය හැකිද? නැතමය සවාමීනි, අන්න එතෙන්දිත් අර විදියටම පිළිතුරු දෙනවා. අවිද්‍යාවෙන් වැසුනු තණ්හාවෙන් බැඳුනු සත්ත්වයින්ට කර්මය කෙතයි. විඤ්ඤාණය බීජයයි, තණ්හාව දිය සීරාවයි විඤ්ඤාණය පිහිටීමට අර රූප ලෝකයේ. ඒ වගේම හිතාගන්න අරූප ලෝකය පිළිබඳවත්. අරූප ලෝකයක ඉපදීමට හේතු වන කර්මයක්

ඇත්නම් තමයි අරූප භවයක් ගන්නෙ. කොටින්ම ඒ පටිච්ච සමුප්පාද විග්‍රහයේදීම භව කියන එකත් බුදු හාමුදුරුවෝ තෝරන්නේ 'තයො මෙ භික්ඛවෙ භවා' මහණෙනි භව තුනක් තියනවා. **කාමභවො, රූපභවො, අරූපභවො.** ඒ විදියට තේරුම් ගන්න.

අපි දැන් භව ගැන කිව්වා. ඊළඟට මෙතන තියනව 'භූතො දුක්ඛං නිගච්ඡති, කියල. 'භූත' කියන්නේ මොකක්ද? 'භවයට පැමිණි තැනැත්තා'. භවයක් ඇත්තා. එකම ගාථාවෙන් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නෙ. 'උපාදාන පච්චයා භවො - භූතො දුක්ඛං නිගච්ඡති' භවයට වැටුණු කෙනා, පැවැත්මක් ලබාගත්තු තැනැත්තා හඳුන්වන්නෙ 'භූත' කියලා. එයා දුකට පැමිණෙනවා. කොහොමද දුකට පැමිණෙන්නේ? එතනදී සලකාගන්න භවයක් කියන එක තුළ තියනවා ඉපදීමකුත් මරණයකුත්. භවයේ ආරම්භය උපතයි. අවසානය මරණයයි. ජාති, ජරා මරණ කියන දෙක ඒකෙන් ඉබේම ගම්‍ය වෙනවා. 'භූතො දුක්ඛං නිගච්ඡති' කියලා කියන්නේ භවයක් ලැබුව නම් එයාට ජාතියක් තියනවා. ජරා මරණයක් තියනවා. මේ ජාති ජරා මරණ කියන දෙක ඇඳුත්තක්. මේක වෙන් කරන්න බැහැ. හැම ශාස්ත්‍රඥවරයෙක්ම බැලුවෙ ජරා මරණ ජාතියෙන් වෙන් කරගන්න. සදාකාලික උපතක්. ඒක කවදාවත් හරියන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ සල්ල සූත්‍රයේත් ප්‍රකාශ කරල තියෙනවා.[5] **'නහි සො උපක්කමො අත්ථි-යෙන ජාතා න මීයරෙ, ජරම්පි පත්වා මරණං - එවං ධම්මාහි පාණිනො.'**

කිසිම උපක්‍රමයක් නැහැ උපන්නා වූ අයට නොමැරී ඉන්න. ජරාවට පත් වෙලා හරි මැරෙනවාමයි. ඔන්න එතකොට මෙයින් අපට පේනව උපාදානය කියනකොට ඒක තුළම භවයත් ඉබේටම තේරෙනවා. භවය කියන එකත් අදහස් වෙනව. භවය කියන එකත් අදහස් වෙනව නම් ඒ එක්කම ජාති ජරා මරණ දෙකත් තියනවා. ඒක නිසා තමයි ගාථාව ඉවර වෙන්නෙ 'එසො දුක්ඛස්ස සම්භවො' ඔන්න එතනම දුකේ හට ගැන්මයි. ඒ කිව්වෙ සමුදය පැත්තනෙ. ඊළඟ ගාථාවේ කියන්නේ 'තස්මා එම නිසා උපාදානය ක්ෂය කිරීමෙන් 'සම්මදඤ්ඤාය පණ්ඩිතා' නුවණැත්තෝ නුවණින් හරියාකාර තේරුම් අරගෙන 'ජාතික්ඛයං අභිඤ්ඤාය'. ඔන්න අමුතු වචනයක් තියෙනව. ඒකත් අපි ඉදිරියට විග්‍රහ

කරන්න යනව. 'ජාතික්ඛයං අභිඤ්ඤාය' කියන්නෙ උපතේ ක්ෂය වීම, උපතේ නැති බව, උපත නැති බව විශිෂ්ට ඥානයෙන් දැනගෙන 'නාගච්ඡන්ති පුනබ්භවං'. නැවතත් පුනර්භවයකට එන්නෙ නැහැ. මේ කාරණය ගැන හිතල බලනකොට මේ පටිච්ච සමුප්පාද දේශනා මාලාවක් නිසා මේ පින්වතුන්ට නිතර කියන්ට සිද්ධ වුණා දැනට නිතර අහල කියවල පුරුදු පටිච්ච සමුප්පාද දේශනාවෙ තියනවා අනුලෝම වාරයක් පටිලෝම වාරයක්. අනුලෝම වාරය ආරම්භ වෙන්නෙ මෙහෙමයි. 'අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාම රූපං කියල ආරම්භ වෙලා ඉවර වෙන්නේ මෙහෙමයි. ජාති පච්චයා ජරාමරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාසා සම්භවන්ති එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.'

අර ටික නොකිව්වත් හිතාගන්න අවසාන වෙන්නේ 'ජාති පච්චයා' ජාතිය ප්‍රත්‍යය කරගෙන ජරාමරණ සොක පරිදෙව දුක් දොම්නස් ඔක්කොම හටගන්නවා. මෙහෙමයි තනිකර දුක් ගොඩක් වන මේ පඤ්ච උපාදානස්කන්ධ දුක් ගොඩ හටගන්නේ කියන අනුලෝම වාරය. ඔන්න පටිලෝම වාරය අනිත් පැත්තට කියන්නෙ කොහොමද. 'අවිජ්ජායත්වෙව අසෙස විරාග නිරොධා' අවිජ්ජාවගේම නිරවශේෂ විරාග නිරෝධයෙන් සංඛාරා නිරොධො, සංඛාර නිරොධා විඤ්ඤාණ නිරොධො, විඤ්ඤාණ නිරොධා නාමරූප නිරොධො ඔන්න ඔහොම ගිහිල්ල ඒත් ඉවර වෙන්නෙ ජාති නිරොධා ජරාමරණ සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාසා නිරුජ්ඣන්ති එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති. ඔන්න නිරොධ පැත්ත.

ජාතිය නිරුද්ධ වෙනකොට ජරාමරණ, සොක, පරිදෙව දුක්ඛ දොමනස්ස ඒවාත් නිරුද්ධ වෙනවා. මෙසේ මුළු මහත් දුක්ඛස්කන්ධයම නිරුද්ධ වෙනවා. නමුත් පින්වතුනි අමුතුම විදියේ පටිච්ච සමුප්පාද දේශනාවක් තියෙනවා. ඒකත් බුද්ධ වචනයක්. මේ කියාපු අනුලෝම පටිලෝම වාරය වෙනුවට අනුලෝම වාරය තුළින්ම නිවන් කරා යන මහ පුදුම දේශනාවක්. ඒක සංයුත් සඟියේ අභිසමය සංයුත්තයේ 'උපනිස සූත්‍රය' නමින් හැඳින්වෙනවා.[6] අර කියාපු පටිච්ච සමුප්පාද දේශනා තුළ ඍණාත්මක බවක් දකින බටහිර උගතුන් මේක බොහොම ප්‍රියකරනව උපනිස සූත්‍රය. මොකද ඒකෙ දිගටම අනුලෝම වාරය එකතු වෙමින්

එකතු වෙමින් ගිහිල්ල අන්තිමට නිවනින් කෙළවර වෙනවා. ඒ දේශනාවට මූලාරම්භය වශයෙන් බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කරන උපමාව අර අනිකුත් පටිච්ච සමුප්පාද දේශනාවල දකින්න ලැබෙන උපමාවමයි. ඒ ටික සිංහලෙන් කිව්වොත් 'යම් සේ මහණෙනි, කඳු මුදුනක දැඩි පොද ඇති වැස්සක් වසින කල්හි වැසි දිය පහත් බිම් අනුව ගලා යන්නේ කඳු බෑවුම් පැළි විවර කුඩා දිය අගල් පුරවා ලන්නේද කඳු බෑවුම් පැළි විවර කුඩා දිය අගල් පිරුණාහු කුඩා වළවල් පුරවද්ද, කුඩා වළවල් පිරුණාහු මහ වළවල් පුරවද්ද, මහ වළවල් පිරුණාහු කුඩා ගංගා පුරවද්ද, කුඩා ගංගා පිරුනාහු මහා ගංගා පුරවද්ද, මහා ගංගා පිරුනාහු මහා සමුද්‍රය පුරවද්ද එසේම මහණෙනි කියලා ඔය විදියටයි පටිච්ච සමුප්පාද අංග මාලාව ඉදිරිපත් කරන්නේ. මේ විදියටයි ඒක යන්නෙ. ඒ ටික පළමුවෙන්ම කියමු. මේ පින්වතුන්ට සම්පූර්ණ අර්ථය නොතේරුණත් ඒක යන ආකාරය දැනගන්න.

මේ විදියටයි පටිච්ච සමුප්පාද දේශනාව විස්තර වෙන්නෙ.

'එවමෙව බො භික්ඛවෙ අවිජ්ජූපනිසා සංඛාරා, සංඛාරූපනිසං විඤ්ඤාණං, විඤ්ඤාණූපනිසං නාමරූපං, නාමරූපූපනිසං සළායතනං සළායතනූපනිසො ඵස්සො, ඵස්සූපනිසා වෙදනා, වෙදනූපනිසා තණ්හා, තණ්හූපනිසං උපාදානං, උපාදානූපනිසො භවො, භවූපනිසා ජාති, ජාතූපනිසං දුක්ඛං...' ඔන්න ඊළඟට එනව මේ පින්වතුන් කැමැති පැත්තක් 'දුක්ඛූපනිසා සද්ධා, සද්ධූපනිසං පාමොජ්ජං පාමොජ්ජූපනිසා පීති, පීතූපනිසා පස්සද්ධි, පස්සද්ධූපනිසං සුඛං, සුඛූපනිසො සමාධි, සමාධූනිසං යථාභූතඤාණදස්සනං, යථාභූතඤාණදස්සනූපනිසා නිබ්බිදා, නිබ්බිදූපනිසො විරාගො, විරාගූපනිසා විමුත්ති, විමුත්තූපනිසං ඛයෙ ඤාණං' ඔන්න දේශනාව හරි අමුතුයි. මොකද අනුලෝම පටිලෝම දෙකක් නැහැ. දිගටම අනුලෝම වශයෙනුයි යන්නෙ. සන්ධිසථානය දුක. නමුත් අවාසනාවකට වගේ මට කියන්න සිද්ධ වෙනවා **ත්‍රිපිටක ග්‍රන්ථ පරිවර්තනයේදී අර 'උපනිසා' කියන වචනය පෙළේ තිබුණට මොකද සිංහලට පරිවර්තනය කරල තියෙන්නෙ ඒ වෙනුවට පච්චය කියන වචනය** දාල. ඒ තුළින් සිංහල පාඨකයින්ට අර 'උපනිසා' කියන විශේෂ වචනයේ වටිනාකම ගිළිහිලා යනවා. අපි පරිවර්තනය කළොත් උපනිසා සූත්‍රය මෙන්න මේ විදියටයි වෙන්නේ. පරිවර්තනයේදී පාලිය නොතේරුනත් මේ

සූත්‍රයේ විශේෂත්වය තේරෙනවා.

මුලින් දක්වූ සූත්‍රය පටන්ගන්නේ අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරය සංස්කාර ප්‍රත්‍යයෙන් විඤ්ඤාණය ඔය ආදි වශයෙන්.

දැන් මේ සූත්‍රය පරිවර්තනය කරන්න වෙන්නෙ ව්‍යාකරණානුකූලව

සංස්කාරයෝ අවිද්‍යාව උපනිශ්‍රය කොට ඇත්තාහ.
විඤ්ඤාණය සංස්කාරයන් උපනිශ්‍රය කොට ඇත්තේය.
නාමරූපය විඤ්ඤාණය උපනිශ්‍රය කොට ඇත්තේය.
සළායතනය නාමරූපය උපනිශ්‍රය කොට ඇත්තේය.
ස්පර්ශය සළායතනය උපනිශ්‍රය කොට ඇත්තේය.
වේදනාව ස්පර්ශය උපනිශ්‍රය කොට ඇත්තේය.
තණ්හාව වේදනාව උපනිශ්‍රය කොට ඇත්තේය.
උපාදානය තණ්හාව උපනිශ්‍රය කොට ඇත්තේය.
භවය උපාදානය උපනිශ්‍රය කොට ඇත්තේය.
ජාතිය භවය උපනිශ්‍රය කොට ඇත්තේය.
දුක්ඛය ජාතිය උපනිශ්‍රය කොට ඇත්තේය.

එහෙම කියල එතන ඉඳල යන්නේ අර විදියට.

ශ්‍රද්ධාව දුක්ඛය උපනිශ්‍රය කොට ඇත්තේය.
ප්‍රමෝදය ශ්‍රද්ධාව උපනිශ්‍රය කොට ඇත්තේය.
ප්‍රීතිය ප්‍රමෝදය උපනිශ්‍රය කොට ඇත්තේය.
පස්සද්ධිය ප්‍රීතිය උපනිශ්‍රය කොට ඇත්තේය.
සුඛය පස්සද්ධිය උපනිශ්‍රය කොට ඇත්තේය.
සමාධිය සුඛය උපනිශ්‍රය කොට ඇත්තේය.
යථාභූතඤාණ දස්සනය සමාධිය උපනිශ්‍රය කොට ඇත්තේය.
නිබ්බිදාව යථාභූතඤාණ දස්සනය උපනිශ්‍රය කොට ඇත්තේය.
විරාගය නිබ්බිදාව උපනිශ්‍රය කොට ඇත්තේය.
විමුක්තිය විරාගය උපනිශ්‍රය කොට ඇත්තේය.
ඛයෙ ඤාණං නම් වූ ආශ්‍රවක්ෂය ඤාණය විමුක්තිය උපනිශ්‍රය කොට ඇත්තේය.

ටිකක් හරි මේ පින්වතුන්ට තේරෙන්න ඇති දැන් මෙතන තියන

ව්‍යාකාරණානුකූල ප්‍රශ්නය. එක පාරටම තේරෙන්නෙ නැති වෙන්න පුළුවන්. මෙතන අමුතු දෙයක් තියෙන්නෙ. ඒකයි අර විදියට පරිවර්තනය කෙරෙන්නෙ. අපි ඒකෙ හේතුව ටිකක් අඟවන්නම්. මේ පින්වතුන් දන්නවා අංග දොළහ පටිච්ච සමුප්පාදයේ 'පච්චයා' කියන වචනය නොවෙනස්ව යනවා. 'අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං' ආදී වශයෙන්. ඒ නිසා අපට බය නැතිව ඒ විදියටම පරිවර්තනය කරන්න පුළුවන්. නමුත් උපනිස කියන වචනය අර විදියට අපි පරිවර්තනය කළේ මොකද, උපනිස කියන වචනය වර නැගෙනවා ඊළඟට තියන වචනයේ විභක්තිය අනුව, ලිංගය අනුව, වචනය අනුව. ව්‍යාකරණ දන්න පින්වතුන් දන්නවා වචනයක් විශේෂණ වශයෙන් යෙදෙනකොටත් ඒ වචනය ලිංග වචන විභක්ති අනුව වෙනස් වෙනවා. ඒකයි අපි කිව්වේ අවිජ්ජූපනිසා සංඛාරා කියන එක පරිවර්තනය කරන්න වෙන්නෙ සංස්කාරයෝ අවිද්‍යාව උපනිශ්‍රය කොට **ඇත්තාහ.** ඊළඟට සංඛාරූපනිසං විඤ්ඤාණං කියන එක පරිවර්තනය කරන්න වෙන්නෙ විඤ්ඤාණය සංස්කාරයන් උපනිශ්‍රය කොට **ඇත්තේය.** අන්න එතනින් පේනවනේ ඒ විතරක් නොවෙයි අර කිව්වෙ ස්ත්‍රී ලිංග පුරුෂ ලිංග යන ඒවත් පරණ සිංහල විදියට පරිවර්තනය කළොත් දක්විය යුතු ආකාරයට නිදර්ශනයක් කියමු. වෙදනූපනිසා තණ්හා කියන එක අපට පරිවර්තනය කරන්න වෙන්නෙ පරණ සිංහලෙන් කිව්වොත් තණ්හා **තොමෝ** වේදනාව උපනිශ්‍රය කොට **ඇත්තීය.** ඔන්න දැන් තේරෙනව ඇති අපි මෙහෙම පරිවර්තනය කළේ මොකද කියල. කොටින්ම උපනිස කියන වචනය වරනැගෙනවා. පච්චය කියන වචනය වරනැගෙන්නෙ නැහැ. ඒ විතරක් නොවෙයි. බොහෝදෙනා දන්නෙත් නැති පැත්තක් තියනවා. උපනිස කියන වචනය අපි නිරන්තරයෙන් යොදනවා. මේ පින්වතුන් දන්නවා උපනිශ්‍රය සම්පත්තිය ගැන. **උපනිසා කියන වචනයේ තේරුම 'සමීපව ඇසුරු කිරීම' කියන එකයි. මෙතනදී බුදුරජාණන් වහන්සේ පච්චයා කියන වචනය නොයොදා ඇයි උපනිසා කියන වචනය යෙදුවෙ කියන එකත් ගැටලුවක්.**

මේක තේරුම් කරන්න අපි පුංචි අටුවාවක් හැටියට ඉදිරිපත් කරනවා මේ අවස්ථාවේ අංගුත්තර නිකායේ ඡක්ක නිපාතයේ - ඒ කියන්නේ හයවෙනි නිපාතයේ - තියන ඉතාමත්ම වටිනා සූත්‍රයක්.

කලිනුත් අපි ඒ ගැන සඳහන් කළා 'නිබ්බේධික පරියාය' සූත්‍රය කියලා[7]. මේ නිබ්බේධික පරියාය සූත්‍රයේ වටිනා ධර්ම කාරණා රාශියක් සඳහන් වෙනවා. එක තැනකදී බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලා අමතලා කියනව '**කතමො ච භික්ඛවෙ දුක්ඛස්ස විපාකො**' මහණෙනි, දුකෙහි විපාකය කුමක්ද? දුකෙහි විපාකය කුමක්ද කියල ඉතිරි කොටස සිංහලෙන්ම කියන්නම්, යම් කිසි දුකකින් මැඩුණු, යම් කිසි දුකකින් අවුරාගත් සිත් ඇති පුද්ගලයෙක් එහි ප්‍රතිඵලය වශයෙන් ශෝක කරයි. ක්ලාන්ත වෙයි. වැලපෙයි, ළෙහි අත් ගසාගෙන හඬයි. 'සම්මොහං ආපජ්ජති' මුළාවට පත් වෙයි. ඊළඟට කියනවා තව පැත්තක්. ඒ වගේම ඇතැම් කෙනෙක් අර වගේම දුකකින් අවුරාගත් සිත් ඇතිව හඬනවා වැලපෙනවා වෙනුවට වෙන දෙයක් කරනව. මොකක්ද කරන්නේ?

'**බහිද්ධා පරියෙට්ඨිං ආපජ්ජති, කො එකපදං ද්විපදං ජානාති ඉමස්ස දුක්ඛස්ස නිරොධායාති**' බැහැර සෙවිල්ලට වැටෙනවා ඒ පුද්ගලයා, ''කවුද මේ දුක නිරුද්ධ කරන්න එක පදයක් දෙපදයක් දන්නෙ?'' අන්න එහෙම සෙවිල්ලට වැටෙනවා. එහෙම කියල බුදුරජාණන් වහන්සේ හකුළුවා දක්වනවා මහ පුදුම සිද්ධාන්තයකින් '**සම්මොහ වෙපක්කං වාහං භික්ඛවෙ දුක්ඛං වදාමි පරියෙට්ඨි වෙපක්කංවා' මහණෙනි, මම කියනවා දුක කියන එකේ විපාක දෙකක් තියනවා. එක්කො සම්මෝහය කියන මුළාව. එහෙම නැත්නම් සෙවිල්ල**. දැන් මේ පින්වතුන්ගේ සිත් තුළ පටාචාරා කිසාගෝතමී වැනි අය රඟපානවා ඇති. එතකොට දෙපැත්තම අහු වෙනවා. දැන් හිතාගන්න පටාචාරාවට අර විදියට ස්වාමි පුරුෂයා නැති වුනා. දරුවො නැති වුනා. මව්පියො නැති වුනා. අන්තිමට පටාචාරාව පිස්සියක් වෙලා ගල්මුල් පහරවල් ලබමින් දිව්වා. දුවනකොට කවුදෝ කල්‍යාණ මිත්‍රයෙක් - නම් සඳහන් නැහැ - ලෝකයේ ඉන්න ශ්‍රේෂ්ඨතම කල්‍යාණ මිත්‍රයන් වහන්සේ දෙසට යොමු කළා. ඒකේ ප්‍රතිඵලය මේ පින්වතුන් දන්නවා. රහත් මෙහෙණින් වහන්සේ කෙනෙක් උනා. ඒ වගේම තමයි කිසා ගෝතමිත්.

මේ උමතු ගැහැනියත් සීතල දරු මළ කුණක් කරගහගෙන බෙහෙත් හොයමින් යනවා. ගල්මුල් ගැහැව්වෙ නැතිවත් ඒ තැනැත්තිටත් හිනා වෙන්න ඇති කට්ටිය. කවුදෝ කල්‍යාණ මිත්‍රයෙක්

ඒත් බුදුරාජණන් වහන්සේ වෙතට යොමු කළා. ඒකේ ප්‍රතිඵලය රහත් වීමයි. එතකොට දැන් තේරෙනවා සම්මෝහයයි, සෙවිල්ලයි, දෙකම තියනවා. **එතකොට ඇයි 'වා' කියල කිව්වෙ. ඒක විකල්ප අර්ථයක්. 'පච්චය' නම් ඒකාන්ත අර්ථයක්.** පච්චය කියන වචනයේ තියනවා ඒකාන්ත අර්ථයක්. ජාති පච්චයා භික්ඛවෙ ජරා මරණං, 'උප්පාදා වා තථාගතානං අනුප්පාදා වා තථාගතානං ඨිතාව සා ධාතු' ඔන්න ඔය විදියට කියනවා. ජාති ප්‍රත්‍යයෙන්මයි ජරා මරණය. බුදුවරු උපන්නත් නැතත් ඒක වෙනස් කරන්න බැහැ. **නමුත් මෙතෙන්දි බුදු රජාණන් වහන්සේ කිව්වා විපාක දෙකක් තියනවා කියල.** විපාක කියන්නේ ප්‍රතිඵලය. එක්කෝ මුළාවට වැටෙනවා දුක තුළින්. කෙනෙක් දුක නිසා මුළාවට වැටෙනවා. එහෙම නැත්නම් සෙවිල්ලට වැටෙනවා.

ඉතින් පින්වතුනි වැඩි කාලයක් අර මුල් එකට තමයි අපි වැටුණේ. **මුළාවට. මොකද හේතුව කල්‍යාණ මිත්‍රයෙක් නැහැ. එතකොට සෙවිල්ල - කවුද එක පදයක් දෙපදයක් දන්නෙ කියල සොයාගෙන ගියත් - ඒකට උත්තර දෙන්න කෙනෙක් නැහැ බුදු කෙනෙක් පහළ වෙන තුරු. ඒක තේරුම්ගන්න.** එයින් අපට පේනවා කිසාගෝතමී පටාචාරා චරිත තුළින් සාමාන්‍ය ලෝකයාගේ ප්‍රතිචාරය තමයි - විපාකය තමයි අර මුළාවට වැටීම ඒක යට තියෙන්න පුළුවන් අර කියූ උපනිශ්‍රය සම්පත්තියක්. අපට නොපෙනෙනා බුදුන් වහන්සේට පෙනෙන යම් කර්ම ශක්තියක් ඇතුළත වෙන්න පුළුවන්.

නමුත් මෙතන උපනිසා කියල කියන්නෙ ඇත්ත වශයෙන් 'ඇසුරු කරගෙන'. 'දුක ඇසුරු කරගෙන' පවතිනවා' ප්‍රතිඵල දෙකක්. එක්කො මුළාව නැත්නම් සෙවීම. අර සෙවිල්ලෙ ප්‍රතිඵල ටික තමයි මෙතන කියවුනෙ. ඒක තුළින් ශ්‍රද්ධාව ඇති වුණා. ශ්‍රද්ධාව තුළින් ප්‍රමෝදය. ප්‍රමෝදයෙන් ප්‍රීතිය. ප්‍රීතියෙන් පස්සද්ධිය කියන සන්සුන් බව. පස්සද්ධිය තුළින් සුඛය. සුඛය තුළින් සමාධිය. සමාධිය තුළින් යථාභූතඤාණදස්සන කියන යථා තත්ත්වය අවබෝධ වීම. ඒ තුළින් නිබ්බිදාව, ඒ තුළින් විරාගය. ඒ තුළින් විමුක්තිය කියන නිවන. විමුක්තිය නිසා 'ඛයෙ ඤාණය' නිදහස් වීම කියන සියල්ල වටහාගැනීමේ නුවණ ලැබෙනවා. ඔන්න ඒ නිසා ඇත්ත වශයෙන් බොහෝ බටහිර උගතුන් මේ දේශනාවට

කැමතියි.

එක්තරා නූතන උගතෙක්[8] මේ දේශනාව හඳුන්වල තියෙන්නෙ චක්‍රාකාර පටිච්ච සමුප්පාද දේශනාව නමින්. 'චක්‍රාකාර' මොකද අනුලෝම පටිලෝම දෙක වෙනුවට අනුලෝම වාරයෙන්ම කෙළවර වෙනවා. රවුමක් වගේ. ඒක විශේෂ දෙයක් - මේ පින්වතුන් කවුරුත් තේරුම් ගන්න. උපනිස සූත්‍රය දන්නව. කවුරුත් කියවල තියෙනවා. නමුත් ඔය ගැඹුර තේරෙන්නෙ නැති නිසා තමයි 'පච්චය' කියන්නෙත් 'උපනිස' කියන්නෙත් දෙකම එකය කියල පරිවර්තනය කරල තියෙන්නෙ. අදවත් තේරුම් ගන්න. එතකොට උපනිසා කියන එක තුළ අපට පේනව යම්කිසි විකල්ප අර්ථයක්. ඒක නිසා තමයි අවිද්‍යාව ඇසුරු කොට කියන වචනය කිව්වෙ. අර ඒකාන්ත ප්‍රත්‍ය සම්බන්ධතාව නොවෙයි.

හොඳයි ඒක එහෙම කිව්ව කියලා හිතමු. ඔන්න එතකොට උපනිස සූත්‍රයෙන් ඒක අපට හිතාගන්න පුළුවන්. ඊළඟට ඒකෙ අවසාන ප්‍රතිඵලය මොකක්ද? අර රහත් මෙහෙණින් වහන්සේලා අවබෝධ කරගත්තෙ මොකක්ද? ජාතික්ඛය, උපත ක්ෂය වීම. **දැන් අපට පිළිගන්න වෙනවා උපාදානය තුළින් භවය එනව නම්, භවය තුළ අනිවාර්යයෙන් ජාති ජරා මරණ දෙක තියෙනවා නම්, වෙන කරන්න දෙයක් නැහැ. නැති කරන්න වෙනවා උපත. උපත නැති කරන්න වෙනවා.** අන්න එයටයි ජාතික්ඛය කියල කියන්නෙ. උපත නැති කිරීමයි. මේ භවය වඩන, භවයට ඇලුම් කරන විශාල පිරිසක්. නිවනට අකමැති ඒකයි. එහෙම නැත්නම් ඒක 'සියදෝරිස් නිවනක්' කරගන්නවා. පිළිගන්න වෙනවා යම් අවස්ථාවක ජරාමරණයට කැමති නැත්නම් උපත විතරක් තියාගන්න බැහැ. උපතත් නැති කරගන්න ඕන.

උපත නැති කරගන්නේ කොහොමද? උපාදානය නැති කිරීමෙන්. අල්ලාගැනීම-අර කිවුව ඡන්ද රාගය-නැති උන අවස්ථාව, තණ්හාව නැතිඋන අවස්ථාව. කොහෙන් කිව්වත් මේ සූත්‍ර දේශනාවේ තියන ගැඹුර ඒ අනුව මේ පින්වතුන්ට සලකාගන්න පුළුවන්. ඒ අනුව අපි තව පැත්තක් බලමු. දැන් අපි කිව්ව නේද උපත නැති වීම-ජාතික්ඛය කියන උපතේ ක්ෂය වීම-විශිෂ්ට ඥානයෙන් දැන ගත්ත කියල. කොහොමද ඒක දැනගන්නෙ? ආයි උපදින්නෙ නැති කෙනෙක් කියන එක? කොහොමද

කෙනෙක් දැනගන්නෙ මේ ජීවිතය තුළ? කරන්න පුළුවන් වැඩක්ද? හැබැයි බුදුරජාණන් වහන්සේ මොන හේතුවකින් හරි '**නත්ථිදානි පුනබ්භවො**' කිව්වා. නැවත පුනර්භවයක් නැතෙයි කිව්වා. ඒ වගේම රහතන් වහන්සේලා ගැන කියනකොට සඳහන් වෙනවා '**ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං**' ආදි වශයෙන් 'ජාතිය ක්‍ෂය විය'. ජාතිය කියන උපත ක්‍ෂය උන බව කොහොමද දැනගන්නෙ? ඔන්න එතනයි ගැටලුව තියෙන්නෙ. බොහෝදෙනාට තෝරගන්න බැරිව දඟලන වටිනාම නිවන පිළිබඳ සූත්‍රවල අර්ථය ගන්න තියෙන්නෙ ඔතනින්. අපි කියමු ඕකට සාධක වන හොඳ සූත්‍රයක් ඉතිවුත්තක පාළියෙ තියනව පින්වතුනි 'අජාත සූත්‍රය' කියල එකක්.[9] ඒක අපි ඉස්සෙල්ල පාලියෙන්ම කියමු. ඒක කියන ආකාරය දැනගන්නත් එක්ක, '**අත්ථි භික්ඛවෙ අජාතං අභූතං අකතං අසඞ්ඛතං - නො චෙ තං භික්ඛවෙ අභවිස්ස අජාතං අභූතං අකතං අසඞ්ඛතං නයිධ ජාතස්ස භූතස්ස කතස්ස සඞ්ඛතස්ස නිස්සරණං පඤ්ඤායෙථ**'

මහා අවධාරණාත්මක කියමනක් එතන තියෙන්නෙ. **සාමාන්‍ය ලෝකයා නොසිතන දෙයක් තියනවයි කියල බුදුරජාණන් වහන්සේ අවධාරණය කරනවා.** මොකක්ද? ඔන්න ඒක තේරේවි මේක පරිවර්තනය කරනකොට.

'**අත්ථි භික්ඛවෙ අජාතං අභූතං අකතං අසඞ්ඛතං**'. මහණෙනි, නූපන්, නොහටගත්, නොකළ, සකස් නොකළ තත්ත්වයක් ඇත. ඊළඟට කියනව '**නො චෙ තං භික්ඛවෙ අභවිස්ස අජාතං, අභූතං, අකතං, අසඞ්ඛතං**'. මහණෙනි ඒ කිව්ව නූපන්, නොහටගත්, නොකළ, සකස් නොකළ තත්ත්වයක් නැතිනම් - **නයිධ ජාතස්ස භූතස්ස කතස්ස සඞ්ඛතස්ස නිස්සරණං පඤ්ඤායෙථ.** මේ ලෝකය තුළ මේ භවයේදීම දිට්ඨධම්මයෙහිදීම උපන්, හටගත්, කළ සකස් කළ තත්ත්වයෙන් නිස්සරණයක් දක්විය නොහැක'. ඊළඟට ඒකේ අනිත් පැත්ත වදාරනවා '**යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි අජාතං අභූතං අකතං අසඞ්ඛතං තස්මා ජාතස්ස භූතස්ස කතස්ස සඞ්ඛතස්ස නිස්සරණං පඤ්ඤායතීති**' යම් හෙයකින් මහණෙනි, ඒ නූපන්, නොහටගත්, නොකළ, සකස් නොකළ, තත්ත්වයක් තිබේද, ඒ නිසාම මේ දැන් තිබෙන ජාත භූත උපන් හටගත්

සකස් කළ තත්ත්වයෙන් නික්මීමක් ඇත. මේක තේරුම් ගන්න උත්සාහ කරන්න. ඇයි බුදුරජාණන් වහන්සේ මේක දෙවරක් කිව්වේ? ඒ මේ අතට පෙරළල කිව්වෙ? සාමාන්‍ය ලෝකයා හිතන්නෙ නැහැ. මෙහෙම තත්ත්වයක් තියෙනවා කියල. ඒ නිසා තමයි නිවන පිළිබඳව අපේ දේශනා මාලාවේ මතුකරලා දක්වූවෙ. ලෝකයාට තේරුම්ගන්න බැහැ භව තෘෂ්ණාව නිසා. මෙතන කියවෙන්නෙ ඵල සමාපත්තිය තුළ රහතන් වහන්සේලා භව නිරෝධය තුළින් අත්දකින ජාති නිරෝධය. සළායතනය තුළින් නම් භවයක් ඇතිවෙන්නෙ, සළායතන නිරෝධය තුළින් භව නිරෝධය අත්දකිනවා උන්වහන්සේලා ලෝකයෙන් වෙන් වූ අවස්ථාවේ. බුදුරජාණන් වහන්සේගේ රහතන් වහන්සේලාගේ අවසාන සිත ඒ ඵල සිතයි.

ඔය නිසා තමයි මේ කවුරු කොහොම කිව්වත් නිවනට 'තාණං ලෙනං, දීපං, සරණං පරායණං'[10] කියල කියන්නේ. ආරක්ෂාව, දිවයින, ලෙන, පිහිට, ඔය හැටියට හඳුන්වන්නේ ඔන්න ඔය කියාපු ප්‍රත්‍යක්ෂයයි. මොකද රහතන් වහන්සේලා බුදුරජාණන් වහන්සේලා විවේක අවස්ථාවල හිත දාන්නේ අර කිව්ව භව නිරෝධ තත්ත්වයට. ඒකයි කිව්වෙ 'භව නිරොධො නිබ්බානං' කියල. නිවන කියන්නේ භව නිරෝධයමයි. භවය ගින්නක් නම් භව නිරෝධය නිවීමක්නේ. එතකොට භව නිරෝධ තත්ත්වයට හිත දැම්මහම උන්වහන්සේලාට හෙණ ගැහුවත් ඇහෙන්නෙ නැහැ. ඕවා අපි කියලා ඇති. හෙණ ගැහුවත් ඇහෙන්නේ නැත්තේ ලෝකයෙන් වෙන් වෙලානේ ඒ වෙලාවෙ. ඒ වෙලාවට ඒ හිතේ තියන වටිනාකම මොකක්ද? ඇත්ත අවබෝධ කරගත්ත. ප්‍රත්‍යක්ෂ කරගත්ත ජාතියෙ කෙළවර. භවය කෙළවර නම් ජාතියත් කෙළවරයි. ජරා මරණයත් කෙළවරයි. ඕක ප්‍රත්‍යක්ෂ කරගත්ත. ඒක කියන්නයි අපි මේ ටික කිව්වෙ. ඒ සූත්‍රය අවසාන කරන ගාථාවත් ඉතාමත් වටිනවා. ඒකේ සාරාංශය වගේ ඉතිවුත්තක පාළියෙහි එන මේ සූත්‍රය තියෙන්නෙ.

ජාත භූතං සමුප්පන්නං - කතං සඞ්ඛතමද්ධුවං
ජරාමරණසඞ්ඝාතං - රොගනිඩ්ඩං පභඞ්ගුරං
ආහාරනෙත්තිප්පභවං - නාලං තදභිනන්දිතුං

තස්ස නිස්සරණං සන්තං - අතක්කාවචරං ධුවං

**අජාතං අසමුප්පන්නං - අසොකං විරජං පදං**
**නිරොධො දුක්ඛධම්මානං - සඞ්ඛාරූපසමො සුඛො**

මේ ගාථා දෙකේ අර්ථය මෙහෙමයි.
**ජාත භූතං සමුප්පන්නං - කතං සඞ්ඛතමද්ධුවං**

මේ ලෝක තත්ත්වයයි කියන්නෙ. උපන් හටගත් කළ සකස් කළ - ඒ කියන්නෙ පටිච්ච සමුප්පන්න කියන අදහසයි. පටිච්ච සමුප්පන්න වශයෙන් හටගත්, **කතං සඞ්ඛත මද්ධුවං** - කළ සකස් කරන ලද, අද්ධුවං කියන්නේ අස්ථිර. '**ජරාමරණසඞ්ඝාතං**' ජරාමරණ හා එකට බැඳුනු '**රොගනිඩ්ඩං පභඞ්ගුරං**' - රෝගවලට කැදැල්ලක් වූ, බිඳෙනසුලු, ඒක කොහොමද සකස් උනේ කියලත් කියනව. '**ආහාරනෙත්තිප්පභවං**' - නෙත්ති කියන්නේ තණ්හාව. ආහාර තණ්හාව නිසයි මේක ඇති උනෙ - මේ භවය. '**නාලං තදභිනන්දිතුං**' - ඒ පිළිබඳව සතුටු වීමට සුදුසු නැහැ. වටින්නේ නැහැ. '**තස්ස නිස්සරණං සන්තං - අතක්කාවචරං ධුවං**' - ඒ තත්ත්වයෙන් නික්මීම නම් වූ නිවන හඳුන්වන හැටි ඔන්න. '**අතක්කාවචරං ධුවං**' **තර්කයට අහු වෙන්නෙ නැති ස්ථිර තත්ත්වයක්.** මොකක්ද ඒ? '**අජාතං අසමුප්පන්නං අසොකං විරජං පදං**' නූපන්නා වූ හේතු ප්‍රත්‍යයන්ගෙන් හට නොගත්තා වූ නිශ්ශෝකී නික්ලේශී තත්ත්වයයි නිවන. ඊළඟට ඉවර කරන්නේ '**නිරොධො දුක්ඛධම්මානං**' සියලුම දුක්ඛ ධර්මයන්ගේ නිරෝධය - **සඞ්ඛාරූපසමො සුඛො** සංස්කාරයන්ගේ සංසිඳීම සැපතකි. ඒක නිසා තමයි අපි නිතර මතක් කරන්නේ නිවන හඳුන්වන පද මාලාවේ ඉස්සෙල්ලාම සංස්කාර සංසිඳීම ගැන කියනවා. '**එතං සන්තං එතං පණීතං යදිදංසබ්බසංඛාරසමථො සබ්බූපධි පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං**' එයින් අපට පේනවනෙ සංස්කාර සංසිඳෙනකොට අනිත් ඒවත් අර කියාපු භවයත් නිරුද්ධයි. සංස්කාර උඩනෙ ඒක පවතින්නෙ. ඊළඟට අපි මේකට තව ටිකක් එකතු කරන්න-කාරණාව මේකයි. අසංඛත තත්ත්වය - **අසංඛතයත් 'දෙයක්' කරගෙන සමහරු, ඒකනෙ පුදුමෙ කියන්නෙ. අසංඛත කියන වචනෙ යොදල තියෙන්නෙ මොකටද? අර සංඛතයෙන් මිදුණු තත්ත්වයනෙ ප්‍රත්‍යක්ෂයක් හැටියට. ඒකත් දූන් අසංඛත ලෝකයක් කරගෙන. නිවනත් ලෝකයක් කරගෙන.** එබඳු තත්ත්වයක්. මේ ධර්මය

තුළම වෙච්ච විපර්යාස. ඒ අවබෝධය තමයි අපි පෙන්නුවේ. ඒ ප්‍රත්‍යක්ෂය **අනිදස්සන විඤ්ඤාණය** නමින්. එක්තරා විඤ්ඤාණයක් තියනවා නාමරූපයක් පෙන්නුම් කරන්නෙ නැති. නාමරූපය කියන්නෙ මුළු මහත් ලෝකයම. සළායතන නිරෝධය කියල කියන එක, වෙන විදියකින් කිව්වොත්. ඒ අනිදස්සන විඤ්ඤාණ තත්ත්වය ප්‍රකාශ කෙරෙන - අපි නිවන දේශනාවලත් විශේෂයෙන්, සමහර පසු ගිය දේශනාවලත් කියන්න ඇති - විශේෂයෙන්ම තෝරා ගන්න බැරුව තිබුණ ඔය අනිදස්සන විඤ්ඤාණ කතාව, අපි පෙන්නුව වෙනම ලෝකයක් කියලා හිතුව තැන, **ලෝකයක් නොවෙයි භවය නිරුද්ධ වීම පිළිබඳ මෙලොවම ලබන ප්‍රත්‍යක්ෂයක්** කියල. ඉතින් ඒකයි රහස. ඒකත් අපි කියමු. ඒකයි ඔන්න දැන් මේ පින්වතුන්ට මේ පටිච්ච සමුප්පාද දේශනාව නිසා අමතක නොවන දෙයක් දැන් පළවෙච්ච පොතෙත් පිට කවරෙ තියෙන්නෙ බටකෝටු මිටි දෙකක් එකකට එකක් හේත්තු කරල තියෙනවා උඩින්. පළමුවන වෙළුම දැන් පිට වෙල තියෙන්නෙ. එකක් ඇද්දම අනික් එක වැටෙනවා ඒක ඇද්දහම අනික් එක වැටෙනවා. සාරිපුත්ත ස්වාමීන් වහන්සේ මේ උපමාව දීලා තියෙන්නෙ විඤ්ඤාණ නාමරූප දෙකේ අඤ්ඤමඤ්ඤ පච්චයතාව පෙන්නුම් කරන්නයි. ඒක පිළිබඳව ඉතාමත්ම වටිනා ගැඹුරු සූත්‍රයක් අපි විග්‍රහ කරල පෙන්නුම් කළා. ඉතාම ගැඹුරු සූත්‍රයක් මහා නිදාන සූත්‍රය.

බුදුරජාණන් වහන්සේ ඔය කියාපු අඤ්ඤමඤ්ඤ පච්චයතාව විඤ්ඤාණයත් නාමරූපයත් අතර හේතුප්‍රත්‍ය සම්බන්ධය හකුළුවල දක්වන පාඨය ඉතාමත්ම ගැඹුරුයි. අර්ථවත්. ඒක මෙහෙමයි තියෙන්නෙ.

> **එත්තාවතා ඛො ආනන්ද ජායෙථ වා ජීයෙථ වා**
> **මීයෙථ වා චවෙථ වා උපපජ්ජෙථ වා. එත්තාවතා**
> **අධිවචන පථො එත්තාවතා නිරුත්තිපථො එත්තාවතා**
> **පඤ්ඤත්තිපථො එත්තාවතා පඤ්ඤාවචරං**
> **එත්තාවතා වට්ටං වට්ටති ඉත්ථත්තං පඤ්ඤාපනාය**
> **යදිදං නාමරූපං සහ විඤ්ඤාණෙන.**[11]

පරිවර්තනය මෙහෙමයි. ''ආනන්දය, මේ තාක් දුරටය කෙනෙක් උපදනේ හෝ දිරනේ හෝ මියෙන්නේ හෝ චුත වන්නේ හෝ නැවත උපදනේ. ඊළඟට තව පැත්තක් කියනවා. මේ තාක් දුරටය අධිවචන

මාර්ගයක්, නිරුක්ති මාර්ගයක් ප්‍රඥප්ති මාර්ගයක්. ඔය වචන තුන තුළ තියනවා පින්වතුනි, භාෂාව තර්කය පිළිබඳ රහස. මේ තාක් දුරටය අධිවචන මාර්ගයක්, නිරුක්ති මාර්ගයක්, ප්‍රඥප්ති මාර්ගයක් දක්විය හැක්කේ. ඊළඟට තව එකක් කියනවා. **'එත්තාවතා පඤ්ඤාවචරං'** ප්‍රඥාවට බැසගත හැක්කේ මෙතෙන්ට පමණයි. ප්‍රඥාවට ඉන් එහාට යන්න බැහැ. **ප්‍රඥාවට බැසගත හැක්කේ මේ දෙක අතරට පමණයි කියන එකයි ඔය කියන්නේ.**

**ඔන්න ඊළඟට එනව අපි දිය සුළිය ගැන උපමාව දක්වන්ට හේතුව. 'එත්තාවතා වට්ටං වට්ටති ඉත්ථත්තං පඤ්ඤාපනාය යදිදං නාමරූපං සහ විඤ්ඤාණෙන'** මෙතෙකින්ය ආනන්දය වට්ටයක් කරකැවෙන්නෙ. මේ 'වට්ට' කතාවෙන් තමයි අපි දිය සුළි උපමාවෙන් මේ කාරණය පැහැදිලි කළේ. ඒක සූත්‍රවල හැංගිලා තියන එකක් අපි මතු කරල ගත්තේ. අපි හදාපු එකක් නොවෙයි. මේ තාක් දුරටය වට්ටයක් කරකැවෙන්නේ. දිය සුළියක් කරකැවෙන්නේ. මොකක් අතරද 'නාමරූපං සහ විඤ්ඤාණෙන' නාමරූපය විඤ්ඤාණයත් සමගින්. අන්න එතනින් ඉවර වෙන්නෙ. **එතකොට නාමරූපයත් විඤ්ඤාණයත් එකට යන තාක් පමණයි - ඒක හොඳට තේරුම්ගන්න බලන්න. නාමරූපයත් විඤ්ඤාණයත් එකට යන තාක් පමණයි - කෙනෙකුට උපදින්න මැරෙන්න දිරන්න චුත වෙන්න නැවත උපදින්න පුළුවන් වෙන්නෙ. ඒතාක් දුරට පමණයි භාෂාවට තර්කයට හපන්කම් දක්වන්න පුළුවන් වෙන්නෙ. ඒ තාක් දුරට පමණයි-ඒ දෙක අතරට පමණයි-ප්‍රඥාවගේ බැසගැනීම. ඊට එහාට යන්න බැහැ ප්‍රඥාවට. ඊළඟට ඒතාක් දුරටයි මුළු මහත් වට්ටය සංසාර දිය සුළිය කරකැවෙන්නෙ. මොකක්ද ඊළඟට එන වචන දෙකයි වැදගත්. 'නාමරූපං සහ විඤ්ඤාණෙන' - නාමරූපයත් විඤ්ඤාණයත් අතර.** අපි නොයෙකුත් ආකාරයෙන් මේ පින්වතුන්ට 'නාසිසස්' උපමාව, 'ඒදණ්ඩ උඩ බල්ල' ආදී උපමාවලින් පෙන්නුවා දෙකක් ගැන. ද්වයතායක් ගැන. ඒ අඤ්ඤමඤ්ඤ පච්චයතාව නොදැනීමම තමයි මුළාව. ඒක නිසානෙ අපි කිව්වෙ ක්‍රිකට් ක්‍රීඩා, දාම් ක්‍රීඩා ඔක්කොම වෙන්නෙ අර ඒගොල්ලො පිල් දෙකකට බෙදුන. නමුත් ඇත්ත වශයෙන් මේ දෙක අඤ්ඤමඤ්ඤ පච්චයතාවක් බව වටහා නොගැනීම තමයි අවිද්‍යාව. ඒ වටහා නොගැනීම තුළින්, අමතක කිරීම

තුළින්, ඇති වන සංස්කරණය-සංස්කාර තුළින් තමයි දෙකක් කරල පිල් දෙකක් බෙදිල ඒ නාමරූප විඤ්ඤාණ දෙකේ සම්බන්ධය තුළින් තමයි සළායතනයක් ආයතන හයක් එළියට එන්නෙ. එතනත් දෙකක් තියනවානෙ. ඇහැයි, රූපයයි, කනයි, ශබ්දයයි. අපි ඕව කියල තියනවනෙ. එතන ඉඳල පටන්ගන්න එක තමයි අන්තිමට ස්පර්ශ, තණ්හා වේදනා වශයෙන් දිගින් දිගට යන්නෙ. අන්තිමට දුක කෙළවර.

ඔය රහසයි අර කියාපු පුදුම දේශනාවේ තියෙන්නේ 'මෙතෙකින් මය ආනන්ද' - එතකොට යම් වෙලාවක මේ සන්ධිය බින්ද නම්, යම් වෙලාවක මේක තේරුම් අරගෙන - මේ පින්වතුන්ට මතක් කරගන්න පුළුවන් විපස්සි බෝසතාණන් වහන්සේ යොනිසෝ මනසිකාරය විහිදුවේ අග කෙළවර ඉඳලනෙ. 'කිං පච්චයා ජරාමරණං', ජරා මරණයට හේතුව මොකක්ද? 'ජාතිය'. ඔහොම ඔහොම ගිහිල්ල අන්තිමට අතෙන්දි නැවතුණානේ. **නාම රූපයට හේතුව බැලුව විඤ්ඤාණය, විඤ්ඤාණයට හේතුව බැලුව නාමරූප. ඊට එහාට යන්න බැහැ. ඒ දෙක අතරෙයි හොරේ තියෙන්නෙ.** ඒ දෙක අතර තියන සම්බන්ධතාව අන්‍යෝන්‍ය සම්බන්ධතාව - අඤ්ඤමඤ්ඤ සම්බන්ධතාව - තේරුම් නොගැනීම තුළින් අර සක්කාය දිට්ඨිය නිසා ආත්මය හැටියට ගන්නවා. ඒ අවිද්‍යාව තුළින් පිල් දෙකක් බෙදෙනවා. දැන් හිතාගන්න අර අජිත් - සුමිත් කොයි තරම් හොඳ යාළුවෝ දෙන්නෙක්ද අර දාම්පෙත තුළින් පටලැවිල්ල වුණේ. ටිකකට හිතාගත්තා අපි දෙන්නා පිල් දෙකක්. ඔන්න ඔය විදියේ දෙයක් ලෝකයේ තියෙන්නේ. නාසිසස් තමන්ගෙ හෙවණැල්ල දෙවඟනක් කියල හිතාගත්ත. ඔන්න ඔතන තමයි සක්කාය දිට්ඨිය. දැන් හිතාගන්න, මුළාව ඔය දෙක තුළයි තියෙන්නෙ. **යම් වෙලාවක ප්‍රඥාවෙන් අවබෝධ කරගත්තොත් නාමරූපය අසත්‍ය දෙයක් හැටියට තේරුම්ගත්තොත්, හෙවණැල්ලක් පමණයි. ඒකනේ අපි වචනවලට නිරුක්ති දුන්නේ. නාමරූපයේ රූපය, නමට රූපයක්, නාමමාත්‍ර රූපයක්, නාමරූපයේ නාමය නාම ස්වරූපයක්.** එතන 'නාම' කියන්නේ ලෝකයේ සම්මත නාම නොවේ. **වේදනා සඤ්ඤා චේතනා ඵස්ස මනසිකාර** කියන ඒ නාම ධර්ම ටිකයි. **ඒක නමට නමක්.** අපි එහෙම කියමු. නමට නමක්. අර රූප කියල කියන්නෙ මහා භූත ධර්ම හතර ආශ්‍රයෙන් රූප **සඤ්ඤාවක්** ගත්ත. ඒකයි අපි කිව්වේ ඒක නාමමාත්‍ර රූපයක්. ඔය දෙක හරියාකාරව

වටහා නොගැනීම නිසා අර විඤ්ඤාණ මායාව තුළයි මේ ක්‍රීඩාව යන්නෙ. සංසාරේ 'තමා-අනුන්' කියල දෙකක් හදාගෙන. තමාත් ලෝකයත් කියල දෙකක් හදාගෙන ඔය ප්‍රශ්නය යන්නෙ දිගට. **ඔන්න ඔතනයි මහා නිදානය. මහා නිදාන සූත්‍රයට මහා නිදානය කිව්වේ ඔය නිසයි.**

ඊළඟට මේක ප්‍රත්‍යක්ෂයක් වෙන හැටිත් අපි ටිකක් විස්තර කරන්න බලමු. වටිනා ගාථා තියනව අතන මෙතන. විශේෂයෙන්ම සුත්ත නිපාතයේ තියනව මහ ගැඹුරු ගාථා. සමහරු ඒවා ගැන හිතන්නෙවත් නැහැ. මුනි සූත්‍රය එවැන්නක්[12].

**සංඛාය වත්ථූනි පමාය බීජං**
**සිනෙහමස්ස නානුප්පවෙච්ඡෙ**
**ස වෙ මුනි ජාතිඛයන්තදස්සී**
**තක්කං පහාය න උපෙති සංඛං**

මහා ගැඹුරු ගාථාවක්. මේ මුනිවරයා ගැන කියන්නේ, රහතන් වහන්සේ පිළිබඳව. පුදුම බුද්ධ දේශනාවක්. 'සංඛාය වත්ථූනි' කියන්නේ පින්වතුනි, වත්ථු කියන්නේ වාස්තු ඒ කියන්නේ ඉඩම්. මෙතන කෙත් කියල ගන්න පුළුවන්. කලින් කියපු දේ මතක් කරගන්න. විඤ්ඤාණය පිහිටන්න උපකාර වුණේ මොකක්ද. **කම්මං ඛෙත්තං විඤ්ඤාණං බීජං. තණ්හා සිනෙහො,** අවිද්‍යාවෙන් වැසුණු තණ්හාවෙන් බැඳුණු සත්ත්වයින්ගේ විඤ්ඤාණය කාම ලෝකයක වේවා, රූප ලෝකයක වේවා, අරූප ලෝකයක වේවා උපදින්නේ කර්ම කමැති කෙතත් විඤ්ඤාණ බීජයත් තණ්හා නමැති දිය සීරාවත් නිසා. අන්න ඒක ගැනයි මේ කියන්නේ, **'සංඛාය වත්ථූනි'** කියල කියන්නේ ඒවා එක එකක් හරියාකාර තේරුම්ගෙන. ඔය ගාථා තෝරන්න ගියොත් වචන අනුව, අන්න එතෙන්දි වැටෙනවා.

**'පමාය බීජං'** අර විඤ්ඤාණ බීජය තේරුම්ගත්ත. ඊළඟට **'සිනෙහමස්ස නානුප්පවෙච්ඡෙ'** ඒකට වතුර වක්කරන්නේ නැහැ. කෙත් හරියට හඳුනාගත්ත. බීජය හරියට හඳුනාගත්ත. තවත් වතුර වක්කරන්නෙ නැහැ. එතකොට ඒකෙ ප්‍රතිඵලය මොකක්ද?

**'ස වෙ මුනි ජාතිඛයන්තදස්සී**
ඒ මුනිවරයා ජාතිය ක්‍ෂය වීම දුටුව
**'තක්කං පහාය න උපෙති සංඛං'**
අන්න අතක්කාවචර කථාව මතක් වෙනවා
**'තක්කං පහාය'** තර්කය අතහැරිය
**'න උපෙති සංඛං'** ගිණීමට නොයේ.

'ගිණීමට නොයේ කියන්නෙ මොකක්ද? **ඇත්ත වශයෙන් ලෝකයා 'ගණන්ගන්නෙ' නැත්තෙ රහතන් වහන්සේලා. මොකද ඒකට හේතුව? ලෝකයා තව කෙනෙක් 'ගණන්ගන්නෙ' උපධි සම්පත්තිය නිසානෙ.** අර වත්තෙ ඉඩමෙ අයිතිකාරයා. මේ නිලතල තියන කෙනා අර වාහන තියන කෙනා. ඔය විදියටනෙ උපධි ආශ්‍රයෙන් නේ හඳුනාගන්නෙ. රහතන් වහන්සේලා, බුදුවරුන් වහන්සේලා පඤ්චඋපාදානසකන්ධය කියන උපධි පහ - සංසාරේ දිගට උස්සගෙන ආපු පහ අතහැරියට පස්සෙ **උන්වහන්සේලා ගණන්ගන්නේ නැහැ කවුරුවත්.** ඒකයි සංඛං නොපෙති කියන්නෙ. අපේ භාෂාවෙන් කිව්වොත්, නමුත් ඒක ගැඹුරින් යන්නෙ. 'තක්කං පහාය' ඒකත් අපි කලින් කියල තියනවා යම් ප්‍රමාණයකට-මහ ගැඹුරු පැත්තක් ඒක. ඔය 'අව්‍යාකත වත්‍ථු' කියල කියන්නේ. බොහෝදෙනාට ගැටලුවක්.

බුදුරජාණන් වහන්සේ පිළිතුරු නොදුන් ප්‍රශ්න දහයකින් හතරක් අපි වෙන් කරලා පෙන්නුවා. තථාගතයන් වහන්සේගේ මරණින් මතු තත්ත්වය, ඒ කාලේ ශාස්තෘවරුන්ට හිතාගන්න බැරි වුණා. මොකද මෙතන නිහඬව හිටියෙ. දැන් කාලෙ උගතුන්ට උනත් තේරුම්ගන්න බැහැ. සමහර බටහිර උගතුන් කිව්ව බුදුරජාණන් වහන්සේට නොතේරුණ නිසයි උත්තර නොදුන්නෙ කියල. ඒක නොවෙයි පින්වතුනි, මේකයි කාරණය, තර්කයෙන් මිදුණ. තර්කය කියන එකේ උභතෝකෝටික ප්‍රශ්න තියනවා. චතුෂ්කෝටික ප්‍රශ්න තියනවා. දෙකොන් තර්ක තියනවා සතරකොන් තර්ක තියනවා. සතරකොන් තර්ක වලින් අල්ලන්න බැහැ රහත් කෙනෙකුගේ මරණින් මතු තත්ත්වය. මොකද බුදුරජාණන් වහන්සේ හෝ රහතන් වහන්සේ කෙනෙක් ආත්මයක් හැටියට අරගෙනයි අර ප්‍රශ්නය අහන්නෙ.

ඒක නිසා තමයි අපි කලින් අවස්ථාවක ඕව ගැන කතා කරන වෙලාවෙ කිව්වෙ. ඒ හතරම බුදුරජාණන් වහන්සේ ප්‍රතික්ෂේප කරන්නේ මෙහෙමයි. **තථාගත තෙම මරණින් මත්තේ 'වෙයි' කියන්නත් බැහැ. 'නොවෙයි' කියන්නත් බැහැ. 'වෙයිත් වෙයි නොවෙයිත් වෙයි' කියන්නත් බැහැ. 'වෙයිත් නොවෙයි නොවෙයිත් නොවෙයි' කියන්නත් බැහැ. තේරුම්ගන්න බලන්න. හතරටම 'ඔව්' කියන්නත් බැහැ. 'නැහැ' කියන්නත් බැහැ. දෙක එකතු කරලා කියන්නත් බැහැ. දෙක ප්‍රතික්ෂේප කරල කියන්නත් බැහැ.** තර්කයට අහු වෙන්නෙ නැහැ. ඒකයි 'සංඛං න උපෙති' කියල කියන්නෙ. තථාගතයන් වහන්සේ පිළිබඳව සමහර විට දක්වනවා '**රූප සංඛා විමුත්තො තථාගතො**' මේ දේශනාවල තිබෙන දේවල් ඉතාම ගැඹුරුයි. මේවා නිකම් ආරූඪ කළ ශූන්‍යතා නොවෙයි. තථාගතයන් වහන්සේ සම්බන්ධයෙන් කියනවා.[13] '**රූපසංඛාවිමුත්තො ඛො තථාගතො ගම්භීරො අප්පමෙය්‍යො දුප්පරියොගාහො සෙය්‍යථාපි මහා සමුද්දො**'. තථාගතයන් වහන්සේ රූප වශයෙන් ගිණීමට ගන්න බැහැ. මොකද රූප සංඛාවෙන් විමුක්තයි - අතහැරිය නිසා. පෙනුමට තියනව රූපයක් - අල්ලගත්තෙ නැති. ඒක නිසාම ලෝකයාට මේක මහා ගැඹුරු දෙයක්. 'ගම්භීරො අප්පමෙය්‍යො'. ප්‍රමාණ කරන්න බැහැ 'දුප්පරියොගාහො' උපමාව දෙන්නෙ හරියට මහා සමුද්‍රය වගේ. **ඒක මේ මහා සමුද්‍රයට උපමා කෙරුවයි කියලයි හිතන්නෙ. නමුත් කාරණය ලෝකයාට තේරුම්ගන්න බැහැ තර්කයෙන් අල්ලන්න බැහැ.** තර්කය තියෙන්නෙ අර විඤ්ඤාණ නාම රූප දෙක අතරේ. ඒක බින්දට පස්සෙ තමයි පින්වතුනි '**අතක්කාවචර**' ධර්මය. **ඒකයි කිව්වෙ 'අතක්කාවචරං ධුවං' අතක්කාවචරයි, ස්ථිරයි. තර්කය අස්ථිරයි. ලෝකයා ඉන්නෙ ඒක තුළ. ඒ ටික තමයි රූප සංඛා විමුත්තො කියන්නෙ. විහිළුවට ගන්න නොවෙයි මේ කියන්නෙ. අපට කියන්න සිදු වෙනවා ලෝකයේ ගණන්ගන්නෙ නැත්නම් ඒ රහතන් වහන්සේලායි. අර කිව්ව දේවල් නැහැනෙ - ගණන් ගන්න දේවල්.** ඒක තමයි දැන් වෙලා තියෙන්නෙ. ලෝකයා නිවන කියන එක හඳුනා ගන්නවත් සූදානම් නැහැ. භව තෘෂ්ණාව නිසා. ඒගොල්ලන්ට තර්කය ඕන. විශේෂයෙන්ම විදේශිකයන්ට ඒක තෝරගන්න බැහැ, බටහිර උගතුන්ට කොච්චර පෙන්නල දුන්නත්. අන්න ඒකයි කාරණය '**රූපසංඛාවිමුත්තො ඛො තථාගතො**' කියන්නේ ඒකයි. ඒකයි කියන්නේ '**සංඛං නොපෙති වෙදගූ**' කියල. දැන් තේරුම්ගන්න ගාථාවේ ගැඹුරු

උපමාව. 'සංඛාය වත්ථුනි' අර කෙත් තුනම හරියට තේරුම්ගත්ත. 'පමාය බීජං' මේ විඤ්ඤාණ බීජයේ යථා තත්ත්වය මායාකාරී තත්ත්වය තේරුම් ගත්ත, ප්‍රමාණ කරගත්ත. 'සිනෙහමස්ස නානුප්පවෙච්ඡෙ' මේකට දියසීරාව තණ්හාව වැස්සෙවුවෙ නැහැ. ඒක නිසා තමයි **'ස වෙ මුනි ජාතිඛයන්තදස්සී'** ඒක නිසා ජාතිය ක්ෂය කිරීම එතනම දුටුව. ඒ අදහස තව නොයෙකුත් තැන්වල කියවෙනවා, සුත්ත නිපාතයෙ.

**යො ජාතමුච්ඡිජ්ජ න රොපයෙ-ජායන්තමස්ස නානුප්පවෙච්ඡෙ** ඒත් සුත්ත නිපාතයේම මුනිවරයා ගැන කියවෙන්නෙ 'ජාතං උච්ඡිජ්ජ' උපන්නා වූ දෙය උගුලල දාලා. 'න රොපයෙය්‍ය' තවත් ඉන්දන්නේ නැහැ 'ජායන්තමස්ස නානුප්පවෙච්ඡෙ' උපදින එකට ජලය වස්වන්නෙ නැහැ. රහතන් වහන්සේලා ජීවත් වෙනවා. නමුත් ඒවාට වතුර වක් කරන්නෙ නැහැ. තවත් කර්ම රැස් කරන්නේ නැහැ. ඒ කියන්නේ අර කියාපු විමුක්ත තත්ත්වයයි. භවයෙන් මිදෙන්නෙ කර්ම කෙතේ අර කිව්ව විඤ්ඤාණ බීජය හරියාකාර තේරුම් අරගෙන තණ්හා දියසීරාවෙන් මිදුණහම - ඔය ටික තමයි නොයෙකුත් ආකාරයෙන් මේ සූත්‍රවල සඳහන් වෙන්නේ. මේක සාරාංශ කරල ගත්තොත්, මේ පින්වතුන් අහල ඇති **'උපාදාන පච්චයා භවො - අනුපාදා පරිනිබ්බානං' උපාදාන ප්‍රත්‍යයෙනුයි භවය තියෙන්නෙ. අත්හැරිය තැන පරිනිබ්බාන'. අන්න එතනත් ගිහිල්ලා හිර වෙනවා බොහෝදෙනා. පරිනිබ්බාන කියනකොට බොහෝ දෙනාට මතක් වෙන්නෙ මහා පරිනිබ්බාන සූත්‍රයයි.** රහතන් වහන්සේලා අපි කියමු 'මැරුණයි' කියල. ඒ අවස්ථාව. ඒක වැරදියි. **පරිනිබ්බුත කියන වචනය යොදන්නේ පින්වතුනි, අර කියාපු අරහත් ඵලය තුළ බුදුරජාණන් වහන්සේ භවයෙ නිරෝධය ප්‍රත්‍යක්ෂ කළ, ජාති නිරෝධය ප්‍රත්‍යක්ෂ කළ, අවස්ථාවය,** පරිනිබ්බුත කියන වචනය තුළ තියෙන්නේ. ඒක පටලවා ගන්න බොහෝ දෙනා පැහැදිලි සූත්‍ර පවා විකෘත කරල දක්වනවා. ඔන්න පැහැදිලි සූත්‍රයක් අපි කියමු. එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේම තමන් වහන්සේ ගැන ප්‍රකාශ කරල තියනවා.

**තිණ්ණො සො භගවා තරණාය ධම්මං දෙසෙති**
**සන්තො සො භගවා සමථාය ධම්මං දෙසෙති**
**දන්තො සො භගවා දමථාය ධම්මං දෙසෙති**
**පරිනිබ්බුතො සො භගවා පරිනිබ්බානාය ධම්මං දෙසෙති**[15]

මේක පළපුරුදු විදියට පරිවර්තනය කරන්න ගියොත් අමාරුවේ වැටෙනවා. **'තිණ්ණො සො භගවා තරණාය ධම්මං දෙසෙති'** සංසාරයෙන් එතර වූ භාග්‍යවතුන් වහන්සේ සංසාරයෙන් එතර වීම පිණිස ධර්මය දේශනා කරනවා. **'සන්තො සො භගවා සමථාය ධම්මං දෙසෙති'** ශාන්ත වූ භාග්‍යවතුන් වහන්සේ ශාන්තිය පිණිස ධර්මය දේශනා කරනවා. **'දන්තො සො භගවා දමථාය ධම්මං දෙසෙති'** දාන්ත වූ භාග්‍යවතුන් වහන්සේ දමනය පිණිස ධර්මය දේශනා කරනවා. **ඔන්න අන්තිම වාක්‍යය 'පරිනිබ්බුතො සො භගවා පරිනිබ්බානාය ධම්මං දෙසෙති' අපි අර්ථය ගත්තොත් පිරිනිවන් පෑවට පස්සෙ කොහොමද බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කරන්නෙ?** හිතලා බලන්න 'පරිනිබ්බුතො සො භගවා පරිනිබ්බානාය ධම්මං දෙසෙති' කියන්නේ පින්වතුනි, පිරිනිවියා වූ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවීම සඳහා ධර්මය දේශනා කරනවා. ඒක තෝරාගන්න බෑ අර විදියට ගත්තොත්. ඒ නිසා හිතාගන්න පින්වතුනි පරිනිබ්බාන කියන්නේ පින්වතුනි, අපි අර කියාපු රහතන් වහන්සේලා, ලෝකයෙන් විමුක්ත වූ උන්වහන්සේලා අර 'දිවයිනට' වඩිනවා. බුදුරජාණන් වහන්සේත් ඇතැම් අවස්ථාවල අරහත් ඵල සමාපත්තියට සමවැදුනහම ලෝකයෙන් ඉවත් වෙලා හෙණ හඬවත් ඇහෙන්න නැහැ. ඒ තත්ත්වයයි මේ කියන්නෙ. පරිනිබ්බුතො සො භගවා පරිනිබ්බානාය ධම්මං දෙසෙති කියල. ඒකයි අපි කිව්වෙ. **මොකද හේතුව? ඇත්ත වශයෙන් අපට නැවත උත්පත්තියක් නොලැබෙන බව මේ ජීවිතයේදීම ප්‍රත්‍යක්ෂ කරගන්න බැරි නම් එතන සැකය ඉතුරු වෙනවනෙ. සැකය කියන්නෙ අවිද්‍යාව. එතකොට අවිද්‍යාව නිරුද්ධ වුණේ නැහැනෙ. මේක තමයි මේ ධර්මයේ තියන වටිනාම වචනය 'දිට්ඨෙව ධම්මෙ'. ඒක කොන් කරනව බොහෝ දෙනා. දිටු දූමියේම, වෙන කිසිම ශාස්තෘවරයකුට පෙන්වන්න බැරි වුණා, මෙතනම භව නිරෝධයක්.**

ජාති නිරෝධයත්, ජරා මරණ නිරෝධයත්, දුක්ඛ නිරෝධයත් බුදුරජාණන් වහන්සේ පෙන්නුවා. ඒ නිසයි කියන්නේ **'ජාතික්ඛයන්ත දස්සී'** ජාතිය ක්ෂය කළ බව දැනගත්තා. **'ඛීණා ජාති'**. **'නත්ථිදානි පුනබ්භවො'** කියලා උදාන ගාථාවේ කියන්නේ ඔය නිසයි. හරියට ප්‍රත්‍යක්ෂ කරගත්තා තවත් උපදින්නෙ නැති බව. මොකද හේතුව? ඒ

**කියාපු ඵල සමාපත්තිය තමයි අන්තිම සිත, රහතන් වහන්සේලාගෙ.** ඒක ලෝකයාට තේරුම්ගන්න බැහැ. අර බන්ධනය කැඩුවනෙ විඤ්ඤාණයත් නාමරූපයත් අතර. නමුත් ලෝකයාට පේනව ජීවත් වෙනව වගේ. ඒක තමයි සඋපාදිසෙස නිර්වාණ ධාතුව කියන්නෙ. ඔය ගැන තේරුම්ගන්න බැරුව බොහෝදෙනා-පඤ්ච ඉන්ද්‍රියයන් ක්‍රියාත්මක වෙනවා. බුදුරජාණන් වහන්සේලාත් ජීවත් වෙනවා. ආහාර ගන්නව වගේ පේනවා. නමුත් අර විමුක්තිය එහෙමමයි. ඒ විමුක්තිය තමයි අවසාන මොහොතේ උන්වහන්සේලාට පිහිට වෙන්නෙ. අද අපට ටිකක් වේගවත්ව කියන්න සිද්ද වුණා. මොකද හේතුව, මේවා බොහෝදෙනා තේරුම් නොගැනීම නිසා ධර්මය විකෘත කරගෙන. **මේකත් භව තණ්හාව වඩන ධර්මයක් බවට පත්කර ගෙන තියනවා. මේ රටේ උගතුනුත් පිටරට උගතුනුත්.** මේවා අපි නොයෙකුත් ආකාරයෙන් පෙන්නුවා. කිව යුත්ත කියන්න සිද්ධ වෙනවා. මේ කාරණා ටික ඇති මේ පින්වතුන්ට. මේ තුළින් ඊළඟට විශේෂයෙන්ම මතක් කරගන්න තම තමන්ගේ ජීවිතවලට අර කියාපු බුද්ධ වචනය **'සම්මොහ වෙපක්කාහං භික්ඛවෙ දුක්ඛං වදාමි, පරියෙට්ඨි වෙපක්කං වා'** එතකොට අපි කිව්වා **බුද්ධොත්පාද කාලයක පමණයි අර විකල්පයෙන් එක පැත්තක් සම්පූර්ණ වෙන්නේ. දීර්ඝ කාලයක් සංසාරයේ දුක සම්මෝහයෙන් කෙළවර වෙනවා. බුදු කෙනෙක් කල්‍යාණ මිත්‍රයෙක් සිටි නිසාමයි අර කිව්ව පටාචාරා කිසා ගෝතමී වැනි අයටත්, තවත් නොයෙක් ඒ වගේ දුකට පත් වුණ අයටත්, 'දුක්ඛූපනිසා සද්ධා, සද්ධූපනිසං පාමොජ්ජං කියන ඒ නිවන් මාර්ගයට අවතීර්ණ වෙන්න පුළුවන් වුණේ.**

ඒ නිසා මේ පින්වතුන් කල්පනා කරගන්න ඕන මේ ලැබුණු අවස්ථාවේ වටිනාකම. ඒකෙන් ප්‍රයෝජන අරගෙන ප්‍රායෝගික වශයෙන් ගත හැකි, **මේ දේශනාව සමහරුන්ට විෂය වෙන්න පුළුවන් සමහරුන්ට 'විෂ' වෙන්න පුළුවන්.** නමුත් මේ පින්වතුන් මේක විෂය කරගන්න ප්‍රායෝගික අර්ථය සලකල - ඒක තේරුම් අරගෙන සැකයක් තිබෙනවා නම් මේ ධර්මය පිළිබඳව, අර කියාපු දිට්ඨුදම්යෙ කථාන්තරය පිළිබඳව, ඒ සැක දුරු කරගෙන මේ ධර්ම මාර්ගයේ අර අනුලෝම වාරය මේ පින්වතුන්ට තේරෙනව නම් දුකක් තුළ ඉන්නව කියල, එතන ඉඳල ඉදිරියට යන්න අද දින අධිෂ්ඨාන කරගන්න ඕන. මේ තාක් මේ

පින්වතුන් අද රැක්ක ශීලයත්, කළ භාවනාවත්, මේ දේශනාවත්, උපකාර කරගෙන මේ ශාසන පහන නිවෙන්න කලින් අපි නිතර කියන ආකාරයට තමන්ගේ භාවනා මුදුන් පමුණුවාගෙන සෝවාන් සකදාගාමී අනාගාමී අර්හත් මාර්ග ප්‍රතිවේධයෙන් අර කියාපු තත්ත්වයට පත් වීමට මේ දේශනාවත් උපකාර වේවා කියා අපි ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම අවීචියේ සිට අකනිටා දක්වා යම් තාක් කෙනෙක් මේ ධර්ම දේශනාමය ධර්ම ශ්‍රවණමය කුසලයක් අනුමෝදන් වීමට කැමති නම් අනුමෝදන් වීම තුළින් ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් වූ අමා මහ නිවනින් සැනසෙත්වා! කියන ප්‍රාර්ථනය ඇති කරගෙන මේ ගාථා කියන්න.

**එත්තාවතා ච අම්හෙහි...**

## පාදක සටහන්

1. ද්වයතානුපස්සනා සුත්ත, සුත්ත නිපාත, 232 පිට (බු.ජ.ත්‍රි. 25)
2. විභඞ්ග සුත්ත, සංයුත්ත නිකාය, 2-6 පිට (බු.ජ.ත්‍රි. 14)
3. මහාපුණ්ණම සුත්ත, මජ්ඣිම නිකාය, 3-116 පිට (බු.ජ.ත්‍රි. 12)
4. අංගුත්තර නිකාය, 1-394 පිට (බු.ජ.ත්‍රි. 18)
5. සල්ල සුත්ත, සුත්ත නිපාත 182 පිට (බු.ජ.ත්‍රි. 25)
6. උපනිස සුත්ත, සංයුත්ත නිකාය, 2-50 පිට (බු.ජ.ත්‍රි. 14)
7. නිබ්බේධික පරියාය සුත්ත, අංගුත්තර නිකාය, 4-200-210 පිට (බු.ජ.ත්‍රි. 21)
8. බී. එම්. බරුවා මහතා
9. අජාත සුත්ත, ඉතිවුත්තක පාළි, ඛුද්දක නිකාය 1-366 (බු.ජ.ත්‍රි. 24)
10. සංයුත්ත නිකාය, 4-664 පිට (බු.ජ.ත්‍රි. 16)
11. මහානිදාන සුත්ත, දීඝ නිකාය, 2-94 පිට (බු.ජ.ත්‍රි. 8)
12. මුනි සුත්ත, සුත්ත නිපාත, 64 පිට (බු.ජ.ත්‍රි. 11)
13. අග්ගිවච්ඡගොත්ත සුත්ත, සුත්ත නිපාත, 62 පිට (බු.ජ.ත්‍රි. 23)
14. මුනි සුත්ත, සුත්ත නිපාත, 62 පිට (බු.ජ.ත්‍රි. 23)
15. චූල සච්චක සුත්ත, මජ්ඣිම නිකාය 1-558 (බු.ජ.ත්‍රි. 10)

# 19 වන දේශනය

# 19 වන දේශනය

**(පහන් කණුව ධර්ම දේශනා අංක 201)**
**'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'**

යං කිඤ්චි දුක්ඛං සම්භොති
සබ්බං ආහාර පච්චයා
ආහාරානං නිරොධෙන
නත්ථි දුක්ඛස්ස සම්භවො

එතමාදීනවං ඤත්වා
දුක්ඛං ආහාර පච්චයා
සබ්බාහාරං පරිඤ්ඤාය
සබ්බාහාරමනිස්සිතො

ආරොග්‍යං සම්මදඤ්ඤාය
ආසවානං පරික්ඛයා
සංඛාය සෙවී ධම්මට්ඨො
සංඛං නොපෙති වෙදගූ[1]

- ද්වයතානුපස්සනා සුත්ත, සුත්ත නිපාත

සැදැහැවත් පින්වතුනි,

සත්ත්වයින්ගේ ජීවිතය රඳා පවතින්නේ ආහාරය මතයි. එහෙම නමුත් භව දුක වඩන තණ්හාව ආහාරය තුළ සැඟවිලා තියනවා. අන්න ඒක නිසා තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේට සිද්ධ වුනා ආහාරය පිළිබඳ ඉතාමත්ම ගැඹුරු දර්ශනයක් ලෝකයා හමුවේ තබන්න. ඒ දර්ශනය කියවෙන ප්‍රකාශ කෙරෙන පටිච්ච සමුප්පාද ධර්මයටම අදාළ ගාථා තුනක් තමයි අද අපි මේ දහනව වෙනි පටිච්ච සමුප්පාද දේශනාවට මාතෘකාව හැටියට ගත්තේ. සුත්ත නිපාතයේ ද්වයතානුපස්සනා සූත්‍රයේ තමයි මේ ගාථා තුන සඳහන් වෙන්නේ. මීට කලින් පටිච්ච සමුප්පාද දේශනා කීපයකදීම අපි මේ සූත්‍රයේ දේශනා රටාව - දේශනා පිළිවෙල - මේ පින්වතුන්ට තේරුම් කරල දීලා තියෙනවා. කෙටියෙන් සලකා ගත්තොත් සමුදය නිරොධ කියන දෙපැත්ත අනුපස්සනාවට නගලා ඒ ඒ ධර්ම කාරණා ඉදිරිපත් කෙරෙන දේශනා රටාවකුයි මේ සූත්‍රය තුළ

තියෙන්නේ. මෙතෙන්දි බුදුරජාණන් වහන්සේ ආහාරය පිළිබඳව අර සමුදය නිරෝධය කියන දෙපැත්ත ද්වයතානුපස්සනාවට නගලා මෙනෙහි කරන ක්‍රමය පළමුවෙන්ම ඉදිරිපත් කරන්නේ. හඳුන්වලා දෙන්නේ මෙහෙමයි. ''මහණෙනි, මැනවින් ද්වයතානුපස්සනාවේ යෙදීමේ තවත් ක්‍රමයක් තිබිය හැකිදැයි අසන්නවුන් ඇතොත් තිබිය හැකියැයි කිව යුතුයි. කෙසේද තිබිය හැක්කේ? යම් තාක් දුකක් හට ගනීද ඒ සියල්ල ආහාර ප්‍රත්‍යයෙනි. මේ එක අනුපස්සනාවකි. ආහාරයන්ගේම නිරවශේෂ විරාග නිරෝධයෙන් දුකෙහි හටගැන්මක් නැත. මේ දෙවෙනි අනුපස්සනාවයි. යම් කිසි භික්ෂුවක් අප්‍රමාදීව කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව මේ ද්වයතානුපස්සනාවේ යෙදෙමින් වාසය කරතොත් ඒ භික්ෂුවට ඵල දෙකකින් එකක් බලාපොරොත්තු විය හැකියි. දිට්ඨ ධම්මයෙහිදීම, මේ ජීවිතයේදීම, රහත් ඵලය හෝ උපාදාන යමක් ශේෂ වී ඇත්නම් අනාගාමි ඵලය. මෙන්න මෙහෙම ඉදිරිපත් කරල තමයි බුදු රජාණන් වහන්සේ ඊළඟට අර ගාථා වදාළේ.

**යං කිඤ්චි දුක්ඛං සම්භොති - සබ්බං ආහාර පච්චයා**
යම් තාක් දුකක් හට ගනීද ඒ සියල්ල ආහාර ප්‍රත්‍යයෙනි.

**ආහාරානං නිරොධෙන - නත්ථි දුක්ඛස්ස සම්භවො**
ආහාරයන්ගේ නිරෝධයෙන් දුකෙහි හටගැන්මක් නැත

**එතමාදීනවං ඤත්වා - දුක්ඛං ආහාර පච්චයා**
ආහාර ප්‍රත්‍යයෙන් වෙන මේ දුක ආදීනව වශයෙන් දැන

**සබ්බාහාරං පරිඤ්ඤාය - සබ්බාහාරමනිස්සිතො**
සියලුම ආහාරයන් පිරිසිඳ අවබෝධ කරගෙන, සියලුම ආහාරයන්හි නොඇලී

**ආරොග්‍යං සම්මදඤ්ඤාය - ආසවානං පරික්ඛයා**
ආශ්‍රවයන් සම්පූර්ණ වශයෙන් පරිපූර්ණ වශයෙන් ක්ෂය කිරීමෙන් නියම ආරෝග්‍ය තත්ත්වය අවබෝධ කරගෙන
**සංඛාය සෙවී ධම්මට්ඨො - සංඛං නොපෙති වෙදගූ**
නුවණින් සලකා ආහාර ගන්නා ධර්මයේ පිහිටියා වූ ත්‍රිවිද්‍යාවේ

පරතෙරට ගිය රහතන් වහන්සේ ගිණීමට නොයේ.

ඉතින් මේ ගාථා තුනෙන් ඉදිරිපත් කරල තියන ආහාරය පිළිබඳ දර්ශනය ඉතාමත්ම ගැඹුරුයි. සාමාන්‍ය ලෝක සම්මත ආහාර ප්‍රඥප්තියට, ආහාර සංකල්පයට, වැඩිය ගැඹුරු සංකල්පයක් බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කරන බව සංයුත් සඟියේ නිදාන සංයුක්තයේ ආහාර වර්ගයේ එන ආහාර සූත්‍රය කියවන කොට කෙනෙකුට පැහැදිලි වෙනවා.[2] ඒකෙදි බුදුරජාණන් වහන්සේ මෙහෙමයි සංඝයා වහන්සේලා අමතා ප්‍රකාශ කරන්නේ '**චත්තාරොමෙ භික්ඛවෙ ආහාරා භූතානං වා සත්තානං ඨිතියා සම්භවෙසීනං වා අනුග්ගහාය. කතමෙ චත්තාරො කබලිඞ්කාරො ආහාරො ඔළාරිකො වා සුඛුමො වා, ඵස්සො දුතියො, මනොසඤ්චෙතනා තතියා, විඤ්ඤාණං චතුත්ථං.**'

මේකේ තේරුම - 'මහණෙනි, හටගත්තා වූ සත්ත්වයින්ගේ පැවැත්මට හෝ හටගැන්මක් සොයන සත්ත්වයින්ට අනුග්‍රහය පිණිස හෝ පවතින ආහාර හතරක් ඇත. කවර සතරක්ද, රළු වූ හෝ සියුම් වූ පිඬු කොට ගන්නා ආහාරය පළමුවැන්නය. ස්පර්ශය දෙවැන්න, මනෝසංචේතනාව තුන්වැන්නය. විඤ්ඤාණය හතරවැන්නය.' ඉතින් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා මේ ආහාර හතරටම හේතුව - නිදානය තෘෂ්ණාව බව, මෙන්න මෙහෙම ප්‍රකාශ කරනවා. 'ඉමෙ ච භික්ඛවෙ චත්තාරො ආහාරා තණ්හා නිදානා තණ්හා සමුදයා, තණ්හා ජාතිකා, තණ්හා පභවා. මේ හතරටම හේතුව නිදානය තණ්හාවයි. සමුදය - ඒක පැනනඟින තැනත් තණ්හාවයි. එහි උපතත් තණ්හාවමයි. එහි ප්‍රභව ස්ථානය පටන්ගන්නා තැනත් තණ්හාවයමයි. ඔය විදියට ආහාර හතර තණ්හාවට සම්බන්ධ කරලා පෙන්නලා තියනවා. ඒ වගේම බුදුරජාණන් වහන්සේ මහ පුදුම දේශනාවක් පවත්වලා තියනවා. ඒත් නිදාන සංයුක්තයේ තියන පුත්‍ර මාංශ උපමාවකින්.[3] මේ ගැන අපි යමක් සාමාන්‍ය වශයෙන් මීට කලින් දේශනාවල ප්‍රකාශ කරල තියනවා. අද කෙලින්ම පටිච්ච සමුප්පාදයට එල්ල කරලා ඒක විග්‍රහ කරන්නයි බලාපොරොත්තු වෙන්නේ. මේ පුත්‍ර මාංශ දේශනාව මහ ප්‍රබල - මනුෂ්‍යයා තුළ සංවේගයක් ඇති කරවන අන්දමේ දේශනාවක්. ඉතාමත්ම කෙටියෙන් නමුත් මහ ගැඹුරු කාරණා කීපයක් බුදුරජාණන්

වහන්සේ ඉදිරිපත් කරනවා කමටහන් වගේ.

මම ඉස්සෙල්ලා බුද්ධ වචනය සූත්‍රයේ එන හැටි ප්‍රකාශ කරනවා. මෙන්න මෙහෙම අපි සිංහලෙන් කියමු. 'යම් සේ මහණෙනි, අඹු සැමි යුවලක් කාන්තාර මාර්ගයකට ඇතුල් වෙනවා. මගට සුළු බතක් ආහාරයක්, මාර්ගෝපකරණයක් සහිතව. ඔවුන්ට ඉන්නවා එක ප්‍රිය මනාප පුත්‍රයෙක්. කාන්තාර මාර්ගයේ අඩක් ගියාට පස්සේ මේ දෙදෙනා ගෙන ගිය ආහාරය කෙළවර වෙනවා. තව හුඟක් ඈතට යන්න මාර්ගය ඉතුරු වෙලත් තියනවා. ඊළඟට මේ අඹු සැමි යුවල මෙන්න මෙහෙම කථා කරනවා. අපි යම් ආහාරයක් ගෙනාව නම් ඒක දැන් කෙළවර වෙලයි තියෙන්නේ. තව යා යුතු මාර්ගයකුත් තියනවා. ඒක නිසා අපි මේ අපේ එකම ප්‍රිය මනාප පුතා මරලා සන මසුත් කටු මසුත් සකස් කරගෙන ඒ පුත්‍රමාංශය අනුභව කරමින් අපි ඉතිරි කාන්තාර මාර්ගයේ යමු. එහෙම නැත්නම් අපි තුන් දෙනාටම මැරෙන්නයි සිද්ධ වෙන්නේ. එහෙම හිතල මහණෙනි, මේ අඹු සැමි යුවල තමන්ගේ එකම පුත්‍රයා මරලා - **එකම පුත්‍රයා මරලා** - සන මසුත් කටු මසුත් සකස් කරගෙන ඒ පුත්‍ර මාංශය කමින් කාන්තාරයේ ඉතිරි කොටස ගෙව්වා. නමුත් ඒ පුත්‍ර මාංශය කන අතරේ මේ දෙදෙනා ලෙහි අත් ගසාගන්නවා පපුවට ගහ ගන්නවා. '**කෝ අපේ එකම පුතා, කෝ අපේ එකම පුතා**' කියල. ඊළඟට බුදු රජාණන් වහන්සේ සංඝයා වහන්සේලාගෙන් අහනව ප්‍රශ්නයක්. 'මොකද මහණෙනි, හිතන්නේ ඒ අඹු සැමි යුවල අර ඒ තමන්ගේ දරුවාගේ මාංශ ආහාරය ගත්තේ ක්‍රීඩාව, විනෝදය සඳහාද? පොර බදන්නවුන් වගේ ශරීර ශක්තිය ඇති කරගැනීම සඳහාද? ශරීරය හැඩ වැඩ ගැන්වීම සඳහාද? අලංකාරය සඳහාද? නැතමය ස්වාමීනි කියල සංඝයා වහන්සේලා පිළිතුරු දෙනවා. "මහණෙනි, ඒ මව් පිය දෙදෙනා දරුවාගේ මාංශ ආහාරයට ගත්තේ හුදෙක් - ඒ වචනය මතක තබා ගන්න - **හුදෙක්** කාන්තාරයෙන් එතර වීම සඳහා නොවේද? එසේමය ස්වාමීනි'යි පිළිතුරු දෙනවා. ඒ උපමා කථාව එතනින් ඉවරයි. ඊළඟට සංඝයා වහන්සේලාට වදාරනවා මහණෙනි, අන්න ඒ අන්දමින්ය කබලිංකාර ආහාරය නම් වූ ඒ රළු ආහාරය දත යුත්තේ. ඒක පිරිසිඳ අවබෝධ කරගත්තොත් ඊළඟට ඒකෙ ආනිශංසත් කියනවා. පිඩුකොට ගන්නා ආහාරය හරියාකාර තේරුම්ගත්තොත් පඤ්ච කාමගුණික රාගයත් තේරුම්ගත්තා වෙනවා.

පඤ්ච කාමය හා සම්බන්ධ රාගය තේරුම්ගත්තා වෙනවා. ඒක තේරුම්ගත්තොත් ඒ ආර්ය ශ්‍රාවකයා නැවත මේ ලෝකෙට එන්නේ නැහැ අනාගාමි වෙනවා. ඉතින් ඔන්න ඔච්චරයි බුද්ධ දේශනාවේ තියෙන්නේ.

නමුත් අපට කියන්න සිද්ධ වෙනවා අවාසනාවකට වගේ **අටුවාචාරීන් වහන්සේ මෙතෙන්ට එකතු කරනව ඉතාමත්ම ළාමක බොළඳ කථාන්තරයක්, මේ වටිනා බුද්ධ දේශනාවේ අගය අඩුවන**[4]. මෙන්න මේ විදියටයි අටුවාචාරීන් වහන්සේ ලස්සන කථාව ඉදිරිපත් කරන්නේ. 'අර කාන්තාරයේ යන ඒ අඹු සැමි යුවළ ආහාරය ඉවර උනාට පස්සේ මොකද කළේ? කාන්තාරයේ තියනවලු කොළ අඩු ගහක්. ඔය ගහ යට දෙන්නා ඉඳගත්තලු. ඉඳගෙන මෙන්න මෙහෙම සාකච්ඡා කරනවා. අර පුරුෂයා කියනවා භාර්යාවට දැන් අපේ ආහාර ටික ඉවරයි. ඊළඟට කියනවා මේ ඉදිරි මාර්ගයේ මට ගොවිතැන් වෙළඳාම් ආදී රක්ෂාවල් කරල යමක් උපදවන්න ක්‍රමයකුත් නැහැ. ඒක නිසා මේ භාර්යාවට කියනවා මාව මරලා මේ දරුවත් එක්ක කාන්තාරයෙන් එතර වෙන්න කියලා. එතකොට භාර්යාව කියනවා මේ කාන්තාරයේ ඉදිරි මාර්ගයේ මට නූල් කටිනව වගේ රක්ෂාවක් කරන්න තැනකුත් නැහැ. ඒක නිසා ඔබ මාව මරල ඔබ දරුවත් එක්ක කාන්තාරයෙන් එතර වන්න. එතකොට ආයිමත් සවාමි පුරුෂයා කියනවා අම්මා මළොත් එහෙම දරුවා ජීවත් වෙන්නෙ නැහැ. ඒක නිසා දැන් කරන්න තියෙන්නේ අපි ජීවත්ව සිටියොත් අපි වෙන දරුවෙක් ලබමු. මේ දරුවා මරලා අපි මස් කමින් යමු. එහෙම කියලා ඔන්න ඊළඟට මෙහෙමයි තියෙන්නේ. අම්මා තාත්තා ළඟට යැව්වලු 'පුතේ, තාත්තා ළඟට යන්න' කියලා. මට නම් මරන්න බැහැ කියලා තාත්තා අම්මා ළඟට යැව්වලු. අනේ මටත් මරන්න බැහැ කියලා. මොකද තාත්තා කියනවා මම මෙච්චර වෙහෙස මහන්සි වෙලා මේ දරුව ඇති දැඩි කළේ. අම්ම කියනවා මම මේ කෝවිල් ගානෙ ගිහිල්ලා ආයාචනා කරල දස මසක් කුසේ තියාගෙන මේ දරුව හැදුවේ. අනේ මටත් මරන්න බැහැ කියලා. ඔහොම ඔහොම දරුවා තාත්තයි අම්මයි ළඟට යන අතරේ - **මේ එක ගහ යට ඉන්නෙ** - එහෙම යන අතරේ දරුවා ඉබේ මැරුණලු. ඔන්න වැඩවල හැටි. ඉබේ මැරුණට පස්සේ ඉතින්

මොකද කරන්නෙ අඬලා දොඩල අර මස් ටික කෑවලු.

**බලන්න අර බුද්ධ දේශනාවේ තියන ඒ සංවේග ජනක අර්ථය එහෙම පිටින්ම නැති වුණා.** නමුත් තව දුරටත් ඒකට එකතු කරන්න සිද්ධ වෙනවා. අද සිංහල පොත පත කියවන පාඨකයන්ට කියවන්න ලැබෙන ධර්ම විනය සංග්‍රහ පොත් හැම එකකම වගේ **හැම-එකකම වගේ-දකින්න** ලැබෙන්නේ අන්න අර බොළඳ කථාන්තරයයි. බුද්ධ දේශනාව නොවෙයි. **බලන්න බුද්ධ දේශනාව යටපත් වෙන හැටි.** මේ විදියට අටුවාචාරීන් වහන්සේ එහෙම එකක් ඈඳගන්න ඇත්තේ මොකක් නිසාද කියලයි හිතන්න තියෙන්නෙ. උන්වහන්සේ හිතන්න ඇති මේ බුද්ධ දේශනාව මෙහෙම තිබුනොත් අම්මලා තාත්තලා දරුවෝ මරන්න පටන්ගනීවි කියලා. ඒක නොවෙයි පින්වතුනි, මහ ගැඹුරු අදහසක් එතන තියනවා. **මේ ආහාරය සමස්තයක් වශයෙන් කොයි තරම් භයානකද. ආහාර තෘෂ්ණාව කියන එක, පෙන්නන්නයි ඒ උපමා කථාව එතන දක්වල තියෙන්නේ බුදුරජාණන් වහන්සේ.** මේ පින්වතුන්ටත් තාම සැකයක් තියෙන්න පුළුවන්. ඒක නිසා අපි ඒකට තව එකක් ඈඳමු.

දැන් මේ පින්වතුන් සමහර විට කියවලා ඇති-සතිපට්ඨාන සූත්‍රයේ ධාතු මනසිකාරය පිළිබඳව තියනව එක්තරා උපමාවක් ගව ඝාතක උපමාවක්.[5] ඒකෙ කියවෙනවා යම් සේ ගව ඝාතකයෙක් හෝ ගව ඝාතක අතවැසියෙක් හෝ ගවදෙනක් මරල කැබලි කරල හතරමං හංදියක තියාගන ඒ මස් විකුණනවා. ඒ විකුණන වෙලාවට ගව දෙනක් කියල හැඟීමක් ඇති වෙන්නේ නැහැ. අන්න ඒ විදියට - යෝගාවචරයාට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා - තමාගේ මේ ශරීරය මේ තිබෙන හැටියෙන්ම මේක පඨවි, ආපො, තෙජො, වායො කියන ධාතු හතරට **ව්‍යවච්ඡේදනය කරලා බලන්න කියල. ඉතින් එතන බුදුරජාණන් වහන්සේ ගව ඝාතනයට අනුබල දුන්න නොවෙයිනේ. ඒක උපමා කථාවක් පමණයිනේ. ගව ඝාතක කියන්නේ නිර්දය පුද්ගලයෙක්. එයා ගවයා මරන්නෙත් නිර්දය හැටියට, කැබලි කරන්නෙත් නිර්දය හැටියට, විකුණන්නෙත් නිර්දය හැටියට. අන්න එහෙම නිර්දය අන්දමින් තමන් ප්‍රිය කරන ආදරය කරන මේ ශරීරය ධාතු හතරට කපලා ව්‍යවච්ඡේදනය**

**කරල මනසිකාරයේ යොදවන්න කියන එකයි බුදුරජාණන් වහන්සේ වදාළේ. අන්න එහෙම උපමාවක් මෙතන තියෙන්නේ.**

ඊළඟට මේ පින්වතුන් සමහර විට හිතන්න පුළුවන් මෙතන මේ පුත්‍ර මාංශ උපමාව දුන් ඔය නිර්මාංශ, මාංශ, කථාත් බොහොම සමාජයේ යන නිසා මෙතෙන්දි බුදුරජාණන් වහන්සේ කිව්වේ මාංශ ආහාරය ගැනයි කියල. නැහැ පින්වතුනි, **සමස්තයක් වශයෙන් ආහාරයේ ඇති භයානකකම පෙන්වන්නයි බුදුරජාණන් වහන්සේ මේ උපමාව දුන්නේ.** අද උනත් හිතල බලන්න පින්වතුනි, මේ මාතෘකාව උඩ දේශනාවක් පවත්වපු අවස්ථාවක මම මේ පින්වතුන්ට කිව්වා, **අපේ බත් පතේ තියන බත් ඇටයකට කථා කරන්න පුළුවන් නම් කියාවි කොයි තරම් ලේ කඳුළු මැද්දෙද තමා උපන්නේ කියල. දැන් ඒ මදිවට පින්වතුනි ඔය රසායනික ද්‍රව්‍යවලින් සිය දහස්ගණන් කුඩා සතුන් මරන කෘෂිකර්මයක් යටතේ බත් ඇටයකට කථා කරන්න නොවෙයි අඬන්න පුළුවන් නම් අඬනවා. අන්න ඒ වගෙ සංවේගජනකයි ආහාරය කියන එක, සමස්තයක් වශයෙන්. මාංශ ආහාරය පමණක් නොවේ, නිර්මාංශ ආහාරය ගැනත් කලකිරෙන්නයි බුදුරජාණන් වහන්සේ මේ උපමාව දුන්නේ.** අපි ඒක වරදවල තේරුම්ගන්න නරකයි. ඔන්න එතකොට ඒ ටික දැනට. අපට ඉදිරියටත් ඒකට අදාළ දේවල් කියන්න වෙනවා. නමුත් දැනට හඳුන්වලා දෙතොත් කබලිංකාර ආහාර නම් වූ රළු හෝ සියුම් හෝ පිඩු කොට ගන්නා ආහාරය පිළිබඳව ඔහොමයි තියෙන්නේ.

ඊළඟට ස්පර්ශ ආහාරය හඳුන්වන්නේ මෙහෙමයි. 'කෙසේද මහණෙනි, ස්පර්ශ ආහාරය දත යුත්තේ. මේකත් අර වගෙ. මහණෙනි, හම ගිහිච්ච ගව දෙනක් ඉන්නවා. 'නිච්චම්මා ගාවී' කියල තියෙන්නේ. හම ගිහිච්ච ගව දෙනක් කියනකොට හිතන්න නරකයි, ඔය ගව ඝාතන මඩුවේ එහෙම පිටින්ම හම ගහපු ගවදෙනක් ගැන. එහෙම නොවෙයි අපට හිතන්න තියෙන්නේ. එළදෙනගේ ඇඟේ කොටස්වල, සමහර තැන්වල, හම ගිහිල්ලා. එතකොට එහෙම තුවාල වෙච්ච එළදෙනක්. බුදුරජාණන් වහන්සේ මෙන්න මෙහෙමයි ප්‍රකාශ කරන්නෙ. ඒ හම ගිහිච්ච එළදෙනක් බිත්තියක් ළඟ ඉන්නව නම් ඒ බිත්තියේ ඉන්න සතුන් ඒ තුවාලවලට ඇනලා ඒ ගවදෙන කාලා දානවා. ගහක් යට හිටියොත්

ගඟේ ඉන්න සතුන් අර තුවාලවලට ඇනලා කාල දානවා. වතුරට බැස්සොත් වතුරෙ ඉන්න සතුන් ඒ තුවාලවලට ඇනල කාල දානවා. එළිමහනේ හිටියොත් අහසේ ඉන්න සතුන් කාල දානවා. යම් යම් තැනක මේ හම ගිහිච්ච එළදෙන සිටිනවා නම් ඒ ඒ තැන්වලදී කාල දානවා. එච්චරයි බුදුහාමුදුරුවෝ වදාරන්නේ. එසේය මහණෙනි ස්පර්ශ ආහාරය දත යුත්තේ කියලා. ඊළඟට ඒක හරියට තේරුම් ගත්තොත් ඒකෙ ලැබෙන ආනිශංස ගැන වදාරනවා. ස්පර්ශ ආහාරය හරියට තේරුම් ගත්තොත් සැප දුක් නොදුක් නොසුව කියන වේදනා තුනම පිරිසිඳ අවබෝධ කරගත්ත වෙනවා. මේ වේදනා තුන හරි ආකාර තේරුම්ගත්තොත් ආයෙත් ආර්ය ශ්‍රාවකයෙකුට කරන්න දෙයක් නැහැ. **රහත් වෙනවා.** අන්න බුදුරජාණන් වහන්සේ ඒ කර්මස්ථානයේ ශක්තිය පෙන්නුවා.

ඉතින් මේකටත් අපි පුංචි අටුවාවක් දනට කිව්වොත් මීට කලිනුත් අපි ප්‍රකාශ කළා උපමාවේ තියන ගැඹුර. අපි කෙටි වාක්‍යයකින් කිව්වොත් දැන් අපි දන්නවා වේදනාව කියන එක ස්පර්ශය ප්‍රත්‍යය කර ගෙනයි තියෙන්නේ. ස්පර්ශය රඳා පවතින්නේ අපේ මේ තුනී හම උඩයි. ඒක කවුරුත් දන්නවනෙ. ඔන්න හිතන්න අපේ වම් අතේ තුවාලයක් නැහැ. දකුණු අතේ තුවාලයක් තියනවා. විල්ලුද රෙද්දක් වම් අතේ ඇතුල්ලන කොට සැපක් දනෙනවා. දකුණු අතට කිට්ටු කරන කොට 'ඌයි' කියයි. අන්න ඒක තේරුම්ගන්න ඕන. ඒක නිසා අපි මේක හකුළුවා දක්වුවා එක්තරා වාක්‍යයකින්. ඒ තව ටිකක් සංශෝධනය කරල කිව්වොත් මෙහෙම කියන්න පුළුවන්. **හම තිබුණහම දනෙන සැප වේදනාවත් හම ගියහම දනෙන දුක් වේදනාවත්** බුදුරජාණන් වහන්සේ සංසන්දනය කරනවා මෙතන. **එතකොට ඇත්ත වශයෙන් බලනවා නම් හම කියල කියන්නේ තුවාල වෙළුමක්. මොකද එහෙම කියන්නේ මුළු ශරීරයම වණයක් හැටියට ගඬක් හැටියට දක්වලා තියනවා** අසුභ භාවනාවේ 'ගණ්ඩභූතො, රොග භූතො වණ භූතො'. එතකොට **මුළු ශරීරයම වණයක් නම් හම තුවාල වෙළුමක්නෙ. තුවාල වෙළුමක්නෙ?** ඒ ඔක්කොම කියන්නෙ මොකටද? අන්න අර ස්පර්ශය පිළිබඳව කලකිරීමටයි. ඒක තුළින් නිවන් දකින්න පුළුවන් නිසා-රහත් වෙන්න. ඔන්න ස්පර්ශ ආහාරය.

ඊළඟට මනෝ සංචේතනා ආහාරය. 'කෙසේද මහණෙනි මනෝ

ස්ංචේතනා ආහාරය දත යුත්තේ?' ඒකටත් දෙනවා උපමාවක්. ඒකත් මහ ගැඹුරු උපමාවක්. ඔන්න පුරුෂයකුගේ උස තරම් ගැඹුරට තියනවා අඟුරු වළක්. දුම්වත් දැල්ලවත් නැති මහ ගැඹුරට තියන අඟුරු වළක්. එතනට එනවා ජීවත් වෙන්න කැමති, මැරෙන්න අකමැති, සැපයට කැමති, දුකට අකමැති පුරුෂයෙක්. ඒ එක්කම ශක්තිමත් පුරුෂයින් දෙන්නෙක් ඇවිල්ලා අර මිනිහගෙ අත් දෙකින් අල්ලලා ඇදගෙන යනවා ගිනි අඟුරු වළ දිහාවට. එතකොට අර මනුස්සයා ඒ ගිනි වළ දිහාවට ඇදිලා ගියාට මොකද ඒ පුද්ගලයාගේ හිත - මෙන්න මේ වචන සඳහන් වෙනවා. - 'චෙතනා, පත්‍ථනා, පණිධි' චේතනාව ප්‍රාර්ථනාව ඉලක්කය ගිනිවලින් මෑතට. ඒ අතට මේ අතට හැරෙනවා බේරෙන්න. නමුත් ඇදගෙන යනවා. එච්චරයි උපමාව. මීළඟට බුදුරජාණන් වහන්සේ වදාරනවා අන්න මහණෙනි, ඒ ආකාරයෙන්ය මනෝ සංචේතනා ආහාරය දත යුත්තේ. මනෝ සංචේතනා ආහාරය හරිහැටි පිරිසිඳ අවබෝධ කරගත්තොත් ඒ ආර්ය ශ්‍රාවකයා කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා කියන තණ්හා තුනම හරියාකාර අවබෝධ කරගත්තා වෙනවා. ඒ තණ්හා තුනම හරියාකාර අවබෝධ කරගතහොත් ඒ ආර්ය ශ්‍රාවකයාට ආයි කරන්න දෙයක් නැහැ රහත් වෙනවා. මේකෙත් අර්ථය අපට ටිකක් විවරණය කරන්න වෙනවා. අටුවාවක් දෙන්න වෙනවා. මොකක්ද මේකෙන් කියන්නේ? මොකක්ද මේ මනෝ සංචේතනාවෙ තියන දුක් සවභාවය? ඒක මේ පින්වතුන්ට අපි පුංචි නිදර්ශනයක් කිව්වොත් දැන් අපි රෑ නින්දට යනවා. **හෙට දවසේ විශාල ණයක් ගෙවන්න සල්ලි හොයාගන්න ඕන. නිදි දෙව් දුව ඒවිද? ඒ අතට යනවා මේ අතට යනවා සිතුවිලි. මනෝ සංචේතනා බලහත්කාරයෙන් ඇදගෙන යනවා.** තව පහසු උපමාවක් කියමු. මුවා මිරිඟුව ඔස්සේ දුවන්නේ ඒ තණ්හාව නිසානෙ. වතුර ටික බොන්න ඕන නිසානෙ. අතන වතුර තියනවා කියල දුවනවා. දුවනවා. දුවනවා. වැටි වැටී දුවන්නේ. දුවන්න බැහැ. **දුවන්න බැරි නමුත් බලහත්කාරයෙන් ඇදි ඇදී යනවා.** තණ්හාව නිසා. මනෝ සංචේතනාව ක්‍රියාත්මක වෙනකොට තෘෂ්ණාවේ සවභාවය තේරුම් ගන්න පුළුවන්. මනෝ සංචේතනා ආහාරය පිළිබඳව ඒ ටික ප්‍රමාණවත්.

ඊට වඩා ගැඹුරු එකක් අන්තිමට එන්නේ. 'කෙසේද මහණෙනි

විඤ්ඤාණ ආහාරය දත යුත්තේ?' ඒකට මෙන්න මෙහෙම උපමාවක් බුදුහාමුදුරුවෝ දෙන්නේ. යම් සේ මහණෙනි, රජ කෙනෙකුගේ ඇමතිවරු හරි, අළුගෝසුවෝ හරි, මං පහරන හොරෙක් කවුරු හරි පල් හොරෙක් අල්ලගෙන ඇවිල්ලා රජ්ජුරුවන් ළඟට ගෙනත් පෙන්නනවා. මෙන්න දේවයන් වහන්ස සුදුසු දඬුවමක් මේ තැනැත්තාට දෙන්න කියලා. රජ්ජුරුවෝ කියනවා ''එම්බල පුරුෂය, මේ හොරා අරගෙන ගිහිල්ලා උදේ වරුවේ ඔහුට දෙන්න අඩයටි පහරවල් සියයක් දඬුවම හැටියට.'' වධකයා ඒ දඬුවම අර මනුස්සයාට දෙනවා. ඊළඟට දවල් අහනවා රජ්ජුරුවෝ, කොහොමද ඒ මනුස්සයා? තාම ජීවත්වනවායි පිළිතුරු ලැබෙනවා. එහෙනම් ආයිත් අරගෙන ගිහිල්ලා දවල්ටත් දෙන්න අඩයටි පහරවල් සියයක්. හැන්දෑවේ අහනවා කොහොමද අර පුද්ගලයා? තාම ජීවත් වෙනවයි කියනවා. ආ එහෙනම් ගිහිල්ලා තවත් සීයේ කසායක් දෙන්න. ඊළඟට බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලාගෙන් අහනවා. ''මොකද මහණෙනි හිතන්නේ? දවසට ඒ විදියේ අඩයටි පහරවල් තුන්සියයක් ලබන ඒ පුද්ගලයා දුකක් විඳිනවද? ''මොකද භාග්‍යවතුන් වහන්ස නොවිඳින්නේ? එක අඩයටි පහරක් උනත් දුකක් දොම්නසක් ඇති කරනවා'' කියල භික්ෂූන් වහන්සේලා උත්තර දුන්නා. එච්චරයි උපමාව. බුදුරජාණන් වදාරනවා. අන්න මහණෙනි, ඒ ආකාරයෙන්ය විඤ්ඤාණ ආහාරය දත යුත්තේ. **විඤ්ඤාණ ආහාරය හරියට පිරිසිඳ දැනගත්තොත් ඒ තැනැත්තා නාම රූපය තේරුම් ගත්තා වෙනවා. නාමරූපය පිරිසිඳ අවබෝධය කර ගත්තොත් ඒ ආර්ය ශ්‍රාවකයාට අමුතුවෙන් කරන්න දෙයක් නැහැ.** ඔන්න විඤ්ඤාණ ආහාරය. ඒක ඔක්කෝටම වඩා අමාරුයි තේරුම් ගන්න. විඤ්ඤාණය දුකක් හැටියට පිළිගන්න කවුරුත් කැමැති නැහැ. ඔන්න ඒකටත් අපි පුංචි නිදර්ශනයක් දෙමු. මේ කාලයේ හැටියට. ඒ කාලයේ අඩයටි කියලා දෙයක් තිබුණා. නමුත් මේ දවස පුරා රූපවාහිනිය නරඹන පින්වතුන්ටත් යම් කිසි ප්‍රහාර එල්ල වෙනවා. ඒකට මේ අමුතු වචනයක් මම යොදන්නේ-තේරුම් ගන්න බලන්න කාලීන භාෂාවට අනුව. **දැන් ඒ රූපවාහිනී නරඹන මේ පින්වතුන්ට උදේ දවල් හවස විඳින්න වෙන්නේ අඩයටි පහරවල් නොවෙයි. 'ඇඩ්' යටි පහරවල්.** ඔය ව්‍යාපාරික ක්ෂේත්‍රයෙන් ව්‍යාපාරික වධකයො එල්ල කරන 'ඇඩ්' යටි පහරවල් කන්න වෙනවා.

ඊළඟට අනිත් පැත්තත් හිතන්න. රාත්‍රියක නගරයේ වීදියකට ඇතුල් වෙන්න. විදුලි බුබුළු තියනවා. 'අපි දිහා බලන්න අපි දිහා බලන්න අපේ ආයතනය දිහා බලන්න කියලා නොයෙකුත් උපක්‍රම වලින් අපේ අවධානය ඇදගන්න. අන්න ඒක දුකක් බවත් සාමාන්‍ය ලෝකයාට තේරෙන්නෙ නැහැ. ඒ විඤ්ඤාණය තියන නිසානෙ. ඒ අඩයටි පහරවල් කමින් දීඝ කාලයක් සංසාරයේ අපි ඇවිල්ල තියෙනවා. ඒක නාම රූපය නිසා වෙන බවවත් දන්නෙ නැහැ. **අපි වැඩිපුර විස්තර කරන්නේ නැත්තේ ඉතිරි හරිය යෝගාවචරයින් භාවනාමය වශයෙන් අවබෝධ කරගන්ට ඕන.** එතකොට ඒ විඤ්ඤාණ ආහාරය එහෙමයි කියලා හිතාගන්න. ඒක තේරුම්ගත්තොත් ඒත් රහත් වෙනව.

ඊළඟට අපි මේ ආහාර පිළිබඳ කථාවේ තවත් පැත්තක් මතු කරන්ට ඕන. අපි කලින් කිව්වා සත්ත්වයින්ගේ ජීවිතය රඳා පවතින්නේ ආහාරය මතයි කියල. එතකොට **ඒක නැතුව බැහැ.** ඒක නැතුව බැහැ. නමුත් ඔන්න ඊළඟට ගැඹුරු කාරණයක් තියෙන්නේ. මේ පින්වතුන් අහල තියනවා බුදුරජාණන් වහන්සේ පවා දුෂ්කර ක්‍රියා කළා හය අවුරුද්දක් තිස්සේ. අර නිගණ්ඨ ක්‍රමයට අනුව ඒ **කාලේ තිබුනේ දුකෙන්මයි මේ සැපය ලබාගන්න පුළුවන් කියන මතයයි.** අත්තකිලමථානුයෝගය තමයි ඒ කාලේ රජ කළේ - ඒ කාලෙ ශ්‍රමණ බ්‍රාහමණයින් අතර. ඒ නිසා බුදුරජාණන් වහන්සේත් අනිත් අන්තයට ගියා ආහාර ප්‍රතික්ෂේප කරලා ක්ලාන්ත වෙනකම්. අර පින්තූර වලින් එහෙම පෙන්නල තියෙන්නේ. ඊට පස්සේ උන්වහන්සේ ඒකේ අන්තගාමී බව දැකලා ඔන්න මැදුම් පිළිවෙතට ආවා. අන්න මැදුම් පිළිවෙත ආශ්‍රයෙනුයි මේ ධර්මයේ තියෙන්නේ විසඳුම. මැදුම් පිළිවෙත ප්‍රකාශ කරන එක්තරා සූත්‍රයක් අපි මීට කලින් කියල තියනවා. ඒක සම්පූර්ණයෙන් කිව්ව නිසා යම්තමින් මතක් කළහම ඇති මේ පින්වතුන්ට. එක් අවස්ථාවක එක්තරා භික්ෂුණියක් හොර ලෙඩ අරගෙන යම්කිසි හොර අදහසකින් ආනන්ද ස්වාමීන් වහන්සේට ආරාධනා කළා බණක් අහන්න ලැස්ති වෙලා වගේ.[6] ආනන්ද ස්වාමීන් වහන්සේට මේ හොරේ තේරිලා එක්තරා දේශනාවක් පැවැත්වූවා. ඒ එක්තරා දේශනාවේ ධර්ම කාරණා හතරක් සඳහන් වෙනවා. එයින් පළවෙනි කාරණාව විතරයි අපට ඕන.

ආනන්ද ස්වාමීන් වහන්සේ මෙහෙමයි ඒ කාරණාව ඉදිරිපත් කරන්නේ. '**ආහාර සම්භූතො භගිණි අයං කායො. ආහාරං නිස්සාය ආහාරො පහාතබ්බො**' නැගණිය මේ ශරීරය හැදිලා තියෙන්නේ ආහාරයෙන්. ආහාරයෙන් හටගත්තේ. නමුත් '**ආහාරං නිස්සාය**' ආහාරයම උපකාර කරගෙන ආහාරය ප්‍රහාණය කළ යුතුයි. තේරුම් ගන්නත් අමාරුයි. මෙතනයි මැදුම් පිළිවෙත තියෙන්නේ. ඊළඟට ඒකට පුංචි විවරණයක් එතෙන්දී ආනන්ද ස්වාමීන් වහන්සේ දෙනවා. කෙසේද ආහාරය උපකාර කරගෙන ආහාරය ප්‍රහාණය කරන්නෙ? මේවා පින්වතුන් අහල තියනවා. භික්ෂූන් වහන්සේලාට අනුදැන වදාරල තියනවා. ආහාර නොගෙන ඉන්න නොවෙයි. ආහාර ගන්නවා නම් ප්‍රත්‍යවේක්ෂා කරල ගන්න. ඥාණ සංවරය තුළින් ඒක භාවනාවට හරවලා ඒකෙ පරමාර්ථය තේරුම් අරගෙන ආහාර ගන්න කියලයි වදාරල තියෙන්නේ. ඒ ටික කෙටියෙන් සඳහන් වෙනවා. යම් කිසි භික්ෂුවක් ආහාර ගන්නකොට මෙහෙම නුවණින් සලකනවා. '**පටිසඞ්ඛා යොනිසො**' නුවණින් සලකලා, මේ ආහාරය මම ගන්නේ '**නෙව දවාය, න මදාය, න මණ්ඩනාය, න විභූසනාය.**' මේක අර කිව්ව වගේ විනෝදය සඳහා ශරීර ශක්තිය වඩාගැනීමට, අලංකාර කරගැනීම් ආදිය සඳහා නොවේ. ඊළඟට කියනවා **යාවදෙව** අන්න වැදගත් වචනයක් **යාවදෙව** හුදෙක් '**ඉමස්ස කායස්ස ඨිතියා**' මේ කය පවත්වාගෙන යාමට '**යාපනාය**' යැපීම සඳහා '**විහිංසූපරතියා**' ආහාරය සම්පූර්ණයෙන් අතහැරීම නිසා ඇති වෙන හිංසාවෙන් බේරීමට '**බ්‍රහ්මචරියානුග්ගහාය**' ආහාරය ගන්නේ ශාසන බ්‍රහ්මචරියාව - මේ නිවන් දක්වා යන ප්‍රතිපදාව - රැකීමටයි. ඊළඟට ඒවා හකුළුවල දක්වනවා '**ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි**' ඒ බඩගිනි වේදනාව මම මේ ආහාරය ගැනීමෙන් කෙළවර කරනවා. 'නවඤ්ච වෙදනං න උප්පදෙස්සාමි' පමණට වැඩිය ආහාරගෙන අලුත් වේදනාවක් ඇතිකර ගන්නෙත් නැහැ. **යාත්‍රා ච මෙ භවිස්සති** මගේ මේ යාත්‍රාව, මගේ මේ ජීවිත ගමන නිරවද්‍යව පහසු විහරණය කියන්නේ භාවනාවට සුදුසු අන්දමින් පමණට ආහාර වැළඳීමෙන් පහසු විහරණයක් ඇතිව ජීවත් වීම. ඔන්න පරමාර්ථය සලකනවා. මේකට සංඝයා වහන්සේලා එකතු කරනවා භාවනා කොටසකුත්. ඒක තියෙන්නේ මේ ආකාරයටයි. ඒකේ පරමාර්ථය

දක්වන්නේ මෙහෙමයි. මේ ආහාරය තනිකර '**ධාතු මත්තකො**' ධාතු මාත්‍රයක්. පඨවි ආපො තෙජෝ වායො යන ධාතු වලින් සකස් වුණ එකක්. ධාතු වශයෙන් බලනකොට මේක පිරිසිදුයි නමුත් '**ඉමං පූතිකායං පත්‍වා**' මේ කුණු කයට ඇතුල් වෙලා, '**අතිවිය ජිගුච්ඡනීයො ජායති**'. ඉතාමත්ම පිළිකුල් සවභාවයට පත් වෙනවා. එතකොට අන්න එතන ධාතු මනසිකාරයත් තියනවා. ආහාරයේ පටික්කූල සඤ්ඤාව කියන පිළිකුල් මනසිකාරයත් තියෙනවා. ඔන්න ඔය විදියට ඒක භාවනාවට නඟනවා. ඒක තුළින්, අන්තිමට ධාතු මනසිකාරය තුළින් යන්නේ සුඤ්ඤතාවට. ධාතු මත්තකො 'සුඤ්ඤො'. මේක ශූන්‍ය හැටියට සලකනවා.

**'යථාපච්චයං පවත්තමානං ධාතුමත්තමෙවෙතං යදිදං පිණ්ඩපාතො, තදුපභුඤ්ජකොච පුග්ගලො ධාතුමත්තකො නිස්සත්තො නිජ්ජීවො සුඤ්ඤො. සබ්බො පනායං පිණ්ඩපාතො අජිගුච්ඡනීයො ඉමං පූතිකායං පත්‍වා අතිවිය ජිගුච්ඡනීයො ජායති'**

'ප්‍රත්‍යය අනුව පවතින ධාතුමාත්‍රයකි මේ පිණ්ඩපාතය. එය අනුභව කරන පුද්ගලයාද සත්ත්වයෙක් ජීවයක් නොවන ශූන්‍ය වූ ධාතුමාත්‍රයකි. පිළිකුල් නොවූ මේ පිණ්ඩපාතය මේ කුණු කය තුළට පැමිණ ඉතාමත් පිළිකුල් කටයුතු බවට පත් වෙයි.'

අන්න එතකොට ඒ ධාතු මනසිකාරය තුළින් ශූන්‍යතාව දක්වාම යනවා. පිළිකුල ගැන මෙනෙහි කිරීම තුළින් මෙතන කලකිරීමක් එනවා - අතහැරීම. ආහාරයෙන් මිදෙනවා කියන එකේ, නිරෝධ කරනවා කියන එකේ, යට තියන තේරුම තණ්හාව නැති කිරීමයි. එතනයි මැදුම් පිළිවෙත තිබෙන්නේ ධර්මයේ. ඒ කාරණය තවත් පැහැදිලි වෙනවා සබ්බාසව සූත්‍රයෙන්. ජීවිතය ගෙවනකොට සමහර දේවල් ඇතුවත් බැරි නැතුවත් බැරි තත්ත්වයක් තියනවා. ආහාරයේ ඒ තත්ත්වය බුදුරජාණන් වහන්සේ තේරුම්ගත්තා යම් අවස්ථාවක. මැදුම් පිළිවෙතට අයිති දෙයක් ඒ. ආහාරය ප්‍රතික්ෂේප කරල බැහැ. ඒ වෙනුවට ඒක ප්‍රයෝජනයට අරගෙන මධ්‍යස්ථව, ඒ කියන්නේ 'මත්තඤ්ඤු' මාත්‍රා වශයෙන් පමණ දැන වැළඳීමෙන් තමන්ගේ නිවන් ගමන යනවා කියන එකයි එයින් ප්‍රකාශ කෙරෙන්නේ. ඒකට අදාළව තව නොයෙකුත් උපමා තියනවා ආහාරය පිළිබඳව කලකිරීමට හේතු වන. ඒකට ලොල් වීම නැති

කරන විදියේ මහ පුදුම උපමාවල් තියනවා. අපි කලිනුත් සඳහන් කළා '**බුරංවමධුනාලිත්තං**'[7] එහෙම නැත්නම් '**බුරධාරූපමො භව**'[8] වැනි මහ පුදුම උපමාවල් බුදු හාමුදුරුවෝ දෙනවා. මීට කලිනුත් අවස්ථාවක ප්‍රකාශ කළා මේ පිළිබඳව මී පැණි කන්න කැමති කෙනෙකුට අපි දැළිපිහියක මී පැණි තවරලා දෙනවා. එතකොට ඒක ලොවින්නෙ කොහොමද දිව කපාගන්න වෙනවනෙ. අන්න ඒ රස තෘෂ්ණාව නැති කරන්නයි බුදු හාමුදුරුවෝ එහෙම කියන්නේ. රස තෘෂ්ණාව සිඳීම සඳහා නොයෙකුත් පුදුම විදියේ උපමා බුදුහාමුදුරුවෝ ප්‍රකාශ කරල තියනවා. එක් අවස්ථාවක මෙහෙම දක්වනවා '**වණස්ස රොපනත්ථාය**' මේ ආහාරය ගන්නේ හරියට තුවාලයකට බෙහෙත් දානවා වගේ. තව දක්වනවා '**අක්ඛස්සබ්භඤ්ජනං යථා**'[9] කියල කියන්නේ කරත්තයේ රෝදය කරකැවෙන තැන බොස් ගෙඩියට, ඒකට තෙල් දානවා වගේ මේ පඤ්චස්කන්ධභාරය සංසාර කාන්තාරයෙන් එතරට ගෙන යාම සඳහා මේ වාහනයට තෙල් දානවා වගේ ආහාර පාවිච්චි කරන්නය කියලා, නොයෙකුත් උපමාවල් දීලා තියනවා ඒ රස තෘෂ්ණාව නැසීම සඳහා. අර පුත්‍ර මාංශ වගේම කෙනෙකුට සංවේගය ඇති වන ආකාරයට, ඒ ආහාරයේ පිළිකුල් බව දක්වීමට ආහාරය ශරීරයට ඇතුල් වීමෙන් සිදුවන දේවල් මෙනෙහි කිරීමෙන්, ආහාරය පිළිබඳ මැදුම් පිළිවෙතක් බුදුරජාණන් වහන්සේ දක්වලා තියනවා.

ඒක ඕස තරණ වගේ සූත්‍රවල තියනවා.[10] **සැඩ වතුරට එතෙර වෙන්න බැස්ස කෙනා බැස්සට පස්සේ නැවතුණොත් ගිලා බහිනවා. දඟලුවොත් ගසාගෙන යනවා. අත්තකිලමථානුයෝගය දඟලීම වගෙයි, ආහාර සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කිරීම. ඊළඟට නැවතීම වගේ තමයි කාමසුඛල්ලිකානුයෝගය අනුව සීමාන්තිකව ආහාර ගැනීම.** ඒ දෙකෙන්ම වැළකිලා 'මත්තඤ්ඤූ හොහි භොජනෙ' කියල කියනවා. පමණ දැන වළඳන්න කියලා ප්‍රකාශ කරනවා. ආහාර ගැනීමේදී පරිස්සම් වෙන්න කියන්නේ මෙහෙමයි. '**චත්තාරො පඤ්ච ආලොපෙ අභුත්වා උදකං පිවෙ**'[11] ආදී වශයෙන් සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරල තියෙන්නේ යෝගාවචර භික්ෂූන්ට ආහාර ගැනීමේදී බත් කටවල් හතරක් පහක් නොගෙන ඒ වෙනුවට වතුර බොන්නය කියල සැහැල්ලු පැවැත්ම සඳහා උපකාර වෙනවය පමණ දැන වැළඳීම. ඒ විදියට නා නා විධ උපමාවලින් ආහාරය පිළිබඳ මධ්‍යස්ථ ප්‍රතිපත්තියක් එතන

දක්වන්නේ. ඒ වගේම ආහාරය පිළිබඳ ප්‍රශ්නය කොයි තරම් වැදගත්ද කියතහොත් මේ පින්වතුන් සමහර විට අහල ඇති හත් අවුරුදු වයසේදී රහත් වුණ ඒ සෝපාක සාමණේරයන් වහන්සේට උපසම්පදාව සඳහා බුදුරජාණන් වහන්සේ අනුදූන වදාළේ ප්‍රශ්න දහයකට උත්තර දෙන්න කියලා.

**පළවෙනි ප්‍රශ්නය 'සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා'**[12] සෑම සත්ත්වයින්ම ආහාරය මත පවතිනවා කියන එක. ඒක දූන් කාලේ විහිළුවට සමහරු ගන්නවා. නමුත් ඒක හරියාකාරව තේරුම්ගත්තොත් ඒකත් ධර්මයේ සඳහන් වෙනවා. ඒ 'සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා' කියන ඒ කාරණය හරියාකාරව තේරුම්ගත්තොත් ඒ තුළින් ආහාරය පිළිබඳව නිබ්බිදාව විරාගය නිරොධය ඇති වෙනවා. අන්න ඒක තුළින් නිවන් දකින්න පුළුවන්. තවත් ඒ වගේම සම්මාදිට්ඨි සූත්‍රයේ සාරිපුත්ත ස්වාමීන් වහන්සේ සම්මාදිට්ඨිය නා නා විධ විදියට විග්‍රහ කරනවා. එක විග්‍රහයක් දීලා තව ක්‍රමයක් තියනවද කියල ඇහුවහම තව එකක් කියනවා. එක ක්‍රමයක් තමයි[13] යම් කිසි භික්ෂුවක් ආහාරය හරියාකාර දන්නවා නම් - දූන් දන්නව මේ පින්වතුන් චතුරාර්‍ය සත්‍යය කියන කොට දුක්ඛ, සමුදය නිරෝධය මාර්ගය යන හතර කියනවා - ඔන්න ඔය ආකාරයටයි ප්‍රකාශ කරන්නේ. යම් කිසි භික්ෂුවක් ආහාරය හරියාකාරව තේරුම්ගත්තොත්, ආහාර සමුදය තේරුම් ගත්තොත්, ආහාර නිරෝධය තේරුම්ගත්තොත්, ආහාර නිරෝධගාමිනී ප්‍රතිපදාව හරියට තේරුම් ගත්තොත් එපමණකිනුත් කෙනෙක් තුළ සම්මාදිට්ඨිය ඇති වෙනවා කියලා. එතකොට මේ කියාපු ටික අර්ථවත් කරගන්න පුළුවන්. ආහාරය තමයි අර සතර ආකාර ආහාරය. කබලිංකාර ආහාර නම් වූ පිඬු කොට ගන්න ඇතුළට ගන්නා ආහාරය පමණක් නොවෙයි ස්පර්ශය, මනොසංචේතනාව, විඤ්ඤාණය කියන ඒ ආහාර හතරම හරියාකාරව තේරුම් ගැනීම එහි පවත්නා දුක් සවභාවය තේරුම්ගැනීමයි. ඊළඟට ඒක යටින් තිබෙන ඒ තණ්හා සවභාවය දෙවෙනි ආර්ය සත්‍යය නියෝජනය කරනවා. ඊළඟට මෙහි නිරෝධය තමයි නිවන. මාර්ගය තමයි ඒ මැදුම් පිළිවෙත. 'පටිසඞ්ඛායොනිසො' කියන ඤාණ සංවරය කියලත් කියනවා. නුවණින් සලකා පරමාර්ථ සලකලා ඒ වගේම භාවනාවකට හරවාගෙන භුක්ති විඳීම තුළින්.

ඔන්න ඊළඟට තව කාරණයක් අවසාන ගාථාවේ ටිකක් ගැඹුරු පැත්තක් කියවුණා. **'ආරොගය්‍යං සම්මදඤ්ඤාය - ආසවානං පරික්ඛයා, සංඛාය සෙවී ධම්මට්ඨො - සංඛං නොපෙති වෙදගූ'** ඒ ගාථාවේ තේරුම **ආයිත් මතක් කරගත්තොත් 'ආරොගය්‍යං සම්මදඤ්ඤාය' අපි ආහාර ගන්නේ නිරෝගීකම සඳහානෙ. නමුත් මෙතන බුදුහාමුදුරුවෝ හරි පුදුම ගැඹුරු අදහසක් කියන්නේ. ඒ කියන නිරෝගි බව නොවෙයි මෙතන කියන්නේ. නියම නිරෝගි බව මොකක්ද, නියම නිරෝගී බව රහත් බව.** එතකොට. **ආරොගය්‍යං සම්මදඤ්ඤාය** නියම නිරෝගී බව තේරුම් අරගෙන **'ආසවානං පරික්ඛයා'** ආශ්‍රවයන් ක්‍ෂය කරලා, **'සංඛාය සෙවී ධම්මට්ඨො'** ධර්මයේ පිහිටියේ, 'සංඛාය සෙවී' කියන්නෙ අර කියාපු පටිසඞ්ඛායොනිසො පිණ්ඩපාතං පටිසෙවාමි' ආදී වශයෙන් පිණ්ඩපාතය පිළිබඳව නුවණින් සලකලා පරිභෝග කරන ඒ රහතන් වහන්සේ **'සංඛං නොපෙති වෙදගූ'** ඔන්න තියනව ගැඹුරු පැත්තක්. 'වෙදගු' කියන්නේ ත්‍රිවිද්‍යාව. බෞද්ධ සංකල්පය අනුව වෙදගු කියන්නේ බ්‍රාහ්මණයන්ගේ ත්‍රිවේදය නොවෙයි. ත්‍රිවිද්‍යාව හැටියට මේ ධර්මයේ දක්වන්නේ රහතන් වහන්සේලා ලබලා තියන තත්ත්වයක්. ඒ ත්‍රිවිද්‍යාව කෙළවරට ගිය රහතන් වහන්සේ 'සංඛං නොපෙති' ගිණීමට නොයේ. අන්න එතන කියවෙනවා ගැඹුරු කාරණයක්. එතකොට ඒ ගිණීමට නොඑන්නේ කොහොමද කියන එක ඊළඟට ටිකක් කල්පනා කරල බලමු.

ඇත්ත වශයෙන් මෙන්න මෙතනදී ආහාර හතර ගැන කියවෙන වෙනත් සූත්‍රයක් තියනවා. අත්ථිරාග සූත්‍රය කියලා.[14] ඒකෙදි ගැඹුරු උපමාවක් දෙනවා, ඒ **අත්ථිරාග සූත්‍රයේ.** මෙහෙමයි තියෙන්නේ. අර සතර ආහාර ගැන කලින්ම විස්තර කරනවා. මහණෙනි, ආහාර හතරක් තියනවා ආදී වශයෙන්. ඒ කියාපු හතරමයි. ඊළඟට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා යම් ශ්‍රාවකයකුට මේ ආහාර සතර පිළිබඳව-වචන තුනක් එතන සඳහන් වෙනවා. රාගයක් තිබෙනවා නම් නන්දි නම් වූ සතුටු වීම තිබෙනවා නම්, තණ්හාව තිබෙනවා නම්, රාග, නන්දි, තණ්හා, කියන මේ කෙලෙස් තියනවා නම් මේ ආහාර පිළිබඳව, එහෙම නම් ඊළඟට වෙන දේ දක්වනවා. අපි හිතමු කබලිංකාර ආහාරය කියලා පිඬු කොට ගන්නා ආහාරය පිළිබඳව යම් කෙනෙකුට රාගය, නන්දිය, තණ්හාව ඇතොත් ඒක උපකාර කරගෙන විඤ්ඤාණය පිහිටලා

වැඩෙනවා යම් තැනක.

ඔන්න ඊළඟට මේ පින්වතුන් මේ කාලෙ බොහෝ විට නැවත උත්පත්තිය පිළිබඳ රහස සොයනව. ගැඹුරු කාරණයක් ඔය එන්නේ. එතකොට ආහාරය පිළිබඳව අර විදියට රාගය, තුටු වීම, තණ්හාව තියනවා නම් ඒ ආහාරය පිළිබඳ විඤ්ඤාණය එතන පිහිටනවා, වැඩෙනවා. ඔන්න එතන ඉඳලා පටිච්ච සමුප්පාදයට යනවා. යම් තැනක විඤ්ඤාණය පිහිටලා වැඩෙනවා නම් එතෙන්ට නාම රූපය බැහැ ගන්නවා. යම් තැනකට නාමරූපය බැහැගන්නවා නම් එතන සංස්කාරයන් වැඩෙනවා. යම් තැනක සංස්කාරයන් වැඩෙනවා නම් එතන මෙන්න මෙහෙම කියනවා. 'ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති' නැවත පුනර්භවයක් ඇති වෙනවා. නැවත පුනර් භවයක් ඇති වෙනවා නම් එතන නැවත ජාති, ජරා, මරණ ඇති වෙනවා. ඔතන හරිම සියුම් කාරණයක් කියන්නේ. මේ හතර ගැනම ඔය විදියට දක්වනවා. බුදුරජාණන් වහන්සේ. අපි ඇතුළට ගන්නා ආහාරය වේවා, ස්පර්ශය වේවා, මනෝ සංචේතනාව වේවා, විඤ්ඤාණය වේවා ඒවා පිළිබඳ කෙනෙකුට රාගය නන්දි තණ්හා යන කෙලෙස් තියනවා නම් නැවත භවයකට යන ආකාරය. ඒ නිසාම ඒ තැනැත්තාගේ විඤ්ඤාණය එතන පිහිටනව. පිහිටල වැඩෙනකොට නාම රූපය බැහැගන්නවා. නාම රූපය බැහැගන්න කොට සංස්කාර වැඩෙනවා. සංස්කාර වැඩෙනකොට නැවත උත්පත්තියක් ඇති වෙනවා. ඔන්න ඔය ටික සලකාගන්න හතරටම.

නමුත් ඔතන ගැඹුරු බව තියෙන්නේ ඊළඟට දෙන අමුතු උපමාවේ. ඒකට දෙන උපමාව මෙහෙමයි බුදුරජාණන් වහන්සේ. යම් සේ මහණෙනි, රජකයෙක් හෝ චිත්‍රකාරයෙක් හෝ ලාකඩ රතු පාට කහ පාට මදටිය පාට වැනි සායමකින් මට්ටම් වූ ලෑල්ලක හෝ බිත්තියක හෝ රෙද්දක හෝ - ඊළඟට කියවෙන ටික හොඳට සලක ගන්න. සියලු අඟ පසඟ සහිත ස්ත්‍රී රූපයක් හෝ පුරුෂ රූපයක් නිර්මාණය කරන්නේද, අන්න ඒ වගේ (දැන් අර කියාපු ටික සම්බන්ධ කරගන්න) එතකොට අර රාගය නන්දි තණ්හාව ආහාරය පිළිබඳව තියනවා නම් නැවත උත්පත්තියක් ලැබෙන ආකාරය. ඒක තුළ සිතුවම් පටයෙ වැටෙන්න වගේ - නැවත සලකා ගත්තොත් මේ පින්වතුන්ට යම්කිසි ප්‍රමාණයකට තේරුම්ගත හැකියි. අපි මව් කුසයේ කළල රූපයට කිව්වේ 'මඩ පැල්ලම'

**කියලනේ. ඔය 'මඩ පැල්ලමේ' සටහන එනවා ස්ත්‍රී රූපයක් හෝ පුරුෂ රූපයක් හෝ උපදින කෙනාගේ රූපය එතනම තියනවා.** මේ පින්වතුන් දන්නවානේ. ඒක මේ බුදුහාමුදුරුවෝ මහ ගැඹුරින් කියන්නේ මෙතන සිතුවම් කිරිල්ලක් වගෙයි. **මෙතන රාගය ආදී ඒ කෙලෙස් තුළින් අර විඤ්ඤාණය යම් පාටක් ගැනෙනවා. ඒක තමයි අපි නාමරූපයක් කියල කියන්නේ. කොටින්ම විඤ්ඤාණයෙ** වැටෙන 'නමට රූපයක්'. අර සිතුවම අඳින පුද්ගලයාගේ උපමාවෙන් දෙන්නේ ඒකයි. රාගය නන්දිය තණ්හාව ඇති තාක් ඔන්න වෙන හැටි. එතකොට ඒ විඤ්ඤාණ ආහාරය පිළිබඳව. අපි කියමු තනිකර ආහාරයට ලොල් පුද්ගලයෙක් කියල. සමහර විට පණුවන් හැටියට උපදින්නේ එබඳු අය වෙන්න ඇති ආහාර වලම. ඌරන් වගේ සතුන් එහෙම ඒ තණ්හාව නිසාම ඒ ආහාරය කෙරෙහි- එතනම උපදිනවා. සමහරවිට ඒකට අදාළව. අන්න ඒක තමයි අර රූපයක් සිතුවම් කිරීම වගේ එතන විඤ්ඤාණයත් නාමරූපයත් අතර සම්බන්ධකම පෙන්නුම් කරන්නේ.

කෙලෙස් නිසා අර සිත්තරාගේ උපමාව දෙන්නේ, එතනින්. ඊළඟට කියනවා ඒකේ අනිත් පැත්ත. ඒක ඊටත් වැඩිය ගැඹුරු උපමාවකින්. ඒක බොහෝදෙනාට ගැටලුවක්. ඇත්ත වශයෙන් හරිම ගැඹුරුයි. **මෙන්න මෙහෙමයි කියන්නේ.** ඒකේ අනිත් පැත්ත කියනවා යම් කිසි විදියකින් ඒ කියාපු ආහාර හතරේ - කෙටියෙන් සලකාගන්න පින්වතුනි අපි ඇතුළට ගන්න ආහාරය පමණක් නොවෙයි. ස්පර්ශය වේවා මනෝසංචේතනා වේවා විඤ්ඤාණය පිළිබඳව වේවා - අර කියාපු රාගයත්, නන්දි නම් වූ සතුටත්, තණ්හාවත් **නැතිනම්** ඔන්න වෙන දේ කියනවා. බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලාගෙන්ම අහනවා උපමාවකින්. ඒ උපමාව තමයි මහ පුදුම. මහණෙනි, ඔන්න තියනවා කූටාගාර ශාලාවක්. කුළුගෙයක් තියනවා-බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා-උතුරු පැත්තෙන්, දකුණු පැත්තෙන් නැගෙනහිර පැත්තෙන් කවුළු තියනවා. එහෙම කවුළු තියන කුළුගෙයක බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලාගෙන් අහනවා, ඉර පායනකොට සූර්ය රශ්මිය කොතනටද වැටෙන්නේ කියලා. සංඝයා වහන්සේලා ප්‍රකාශ කරනවා. ස්වාමීනි අර බටහිර පැත්තේ බිත්තියටයි.''

ඊළඟට බුදුරජාණන් වහන්සේ අහනවා හොඳයි බටහිර පැත්තේ බිත්තියක් නැත්නම්? එහෙම නම් පොළවටයි වැටෙන්නේ කියලා සංඝයා වහන්සේලා උත්තර දෙනවා. ඊළඟට බුදුරජාණන් වහන්සේ අහනවා 'හොඳයි පොළොවත් නැත්නම්?' පොළොව නැත්නම් තියෙන්නෙ වතුරනේ. වතුරටයි වැටෙන්නෙ කියල පිළිතුරු දෙනවා. බුදුරජාණන් වහන්සේ අහනවා හොඳයි වතුරත් නැත්නම්. සංඝයා වහන්සේලා කියනවා **එහෙම නම් ස්වාමීනි ඒ හිරු එළිය කොහේවත් පිහිටන්නේ නැහැ. 'අප්පතිට්ඨිත'** - ඔන්න වචනය. හරි ගැඹුරු තත්ත්වයක් ඔය තියෙන්නේ. එහෙම නම් ස්වාමීනි සූර්යයාගේ රශ්මිය කොහේවත් පිහිටන්නේ නැහැ. බිත්තියත් නැහැ. පොළවත් නැහැ. වතුරත් නැත්නම් මේක පිහිටන්නේ නැහැ. '**අප්පතිට්ඨිත**' ඔච්චරයි උපමාව. ඉතින් ඔන්න ඔතන තියන ගැඹුර හිතලා බලන්න පින්වතුනි. අපි මේවා යම් විදියකින් ප්‍රකාශ කරලා තියනවා '**අනිදස්සන විඤ්ඤාණය**' කියලා. ඒකයි කිව්වේ '**අප්පතිට්ඨිත විඤ්ඤාණය**'. රාගාදියක් නැත්නම් විඤ්ඤාණයට පිහිටන්න හැටියක් නැහැ. 'අනිදස්සන' කියන වචනය තෝරනකොටත් අපි බොහෝ විට දක්වල තියනවා ඒකෙදිත් දක්වනවා සිත්තරකුගේ උපමාවක්. **'අනිදස්සන' කියන්නේ යමක් පෙන්නුම් නොකරන විදහා නොපාන කියන අර්ථයයි.** ඒකත් ඔය කකචූපම සූත්‍රයේ උපමාවක් ආශ්‍රයෙන්[15] අපි පෙන්නුවා. ඒක ගැනත් බුදුරජාණන් වහන්සේ ප්‍රශ්නයක් අහනවා. යම් පුරුෂයෙක් ඔය කියාපු කහ පාට නිල් පාට ආදී සායම් ටිකකුත් බුරුසුවකුත් අරගෙන ඇවිල්ල කියනව මෙන්න මෙහෙම. 'මම අහසේ රූපයක් අඳිනවා'. බුදුරජාණන් වහන්සේ අහනවා සංඝයා වහන්සේලාගෙන් මහණෙනි, ඒක කරන්න පුළුවන් දෙයක්ද? අර මිනිහා සායම් අරගෙන ඇවිල්ල බුරුසුවක් අරගෙන කියනවා 'මම අහසේ රූපයක් අඳිනවා' ඒක කරන්න බැරි වැඩක්ය කියනවා. මක්නිසාද කියල සංඝයා වහන්සේලා තේරුම් කරනවා ඔන්න මෙතන වචන වැදගත්. '**අයංහි භන්තෙ ආකාසො අරූපී අනිදස්සනො' ස්වාමීනි මේ අහස කියන්නෙ අරූපී දෙයක්, රූපී නොවෙයි. ඒ වගේම 'අනිදස්සනො' යමක් විදහා පාන ශක්තියක් අහසේ නැහැ. අන්න අනිදස්සන කියන එකේ තේරුම.** බොහෝදෙනාට තේරුම්ගන්න අපහසු වෙච්ච තැනක් ඔය. අනිදස්සන විඤ්ඤාණය ගැන මීට කලින්

නිවන දේශනාවලදී ප්‍රකාශ කරල තියනවා.

**විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතො පහං**
**එත්ථ ආපොච පඨවි - තෙජො වායො න ගාධති**
**එත්ථ දීඝඤ්ච රස්සඤ්ච - අණුං ථූලං සුභාසුභං**
**එත්ථ නාමඤ්ච රූපඤ්ච - අසෙසං උපරුජ්ඣති**
**විඤ්ඤාණස්ස නිරොධෙන - එත්ථෙතං උපරුජ්ඣති**[16]

ඔන්න ඔය ගාථාව තමයි කාලාන්තරයක් තිස්සේ තේරුම් ගැනීමට අපහසුව තිබුනේ. සමහරු ඒක තේරුවා අමුතු ලෝකයක් හැටියට. අපි පෙන්නලා දුන්නා. 'විඤ්ඤාණ අනිදස්සනං' විඤ්ඤාණයක් තියනවා. **විමුක්ත විඤ්ඤාණය නාම රූපයක් පෙන්නුම් කරන්නේ නැහැ. එතකොට නාමරූපයට ඇතුළත් දේවල් තමයි ඊළඟට කියන්නේ. 'අනන්තං' අර සූර්ය රශ්මිය වැටෙන්න තැනක් නැහැනේ. ඒ වගේ 'අනන්තං සබ්බතො පහං - එත්ථ ආපොච පඨවි තෙජො වායො න ගාධති' අන්න නොරඳන තැන්, ඒ කියන විඤ්ඤාණයෙ පඨවි, ආපො තෙජො, වායො කියන මහා භූත ධර්ම රඳන්නේ නැහැ. මොකද ඒ? ධාතු මනසිකාරය තුළින් ධාතූන් ගැන කලකිරිල** - 'එකතු කරගන්න අර පුනර්භවය පිළිබඳ කථාන්තරයට - යම් විඤ්ඤාණයක් පඨවි ආපො තෙජො වායො දැඩිව ගත්තේ නැත්නම්, ඒවායේ රාගය අතහැරියා නම්, අන්න '**එත්ථ ආපොච පඨවී තෙජො වායො න ගාධති.**' ඒවට ඉඩක් නැහැ ඒ විඤ්ඤාණයේ. එපමණක් නොවෙයි. **පඨවි ආපො තෙජො වායො තියනව නම් දිග කොට කථාවක් තියනවනෙ.** දැන් චිත්‍රකාරයා ගැනත් හිතන්න, **එත්ථ දීඝඤ්ච රස්සඤ්ච කියන්නේ** එයයි. එහෙම නැත්නම් දිගකොට කථාවකුත් නැහැ. **සුභාසුභං** දැන් අර කථාවේ කිව්ව වගේ ලක්ෂණ අඟ පසඟ සහිත ස්ත්‍රී රූපයක් හෝ පුරුෂ රූපයක් නිර්මාණය කරනව සිතුවම් පටක. ඔන්න සිතුවම් පටේ කතාව ඕක ආශ්‍රයෙන් තේරුම් ගන්න. ඒ කියන්නේ ඒ සිතුවම් පට අර රාග නන්දි තණ්හා තියන තාක් සිතුවම් පට අපි හිතුවත් නැතත් ඉබේටම ඇඳෙනවා අර කියාපු සායම තුළින් - රාගය තුළින්. නමුත් අන්න අර අනිදස්සන තත්ත්වයට පත් වුණාට පස්සේ විමුක්ත සිතේ නාමරූපයක් පිළිබිඹු වන්නේ නැහැ. **ඒකයි 'විඤ්ඤාණං අනිදස්සනං' කියන්නේ.** මහ පුදුම ගැඹුරු ගාථාවක් ඒක. අන්තිමට කියන්නෙ '**එත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති**'

**නාමරූප ඔක්කොම ඉවරයි එතනම.** ඒක නිසා '**විඤ්ඤාණස්ස නිරොධෙන**' කියන එකත් බොහෝදෙනාට තේරුම්ගන්න බැහැ. එතන කියන්නේ සාමාන්‍ය ලෝකයාගේ විඤ්ඤාණය සංඛත විඤ්ඤාණයක්- අභිසංඛත විඤ්ඤාණයක්. **අපි විඤ්ඤාණය කියලා කියන්නේ අර නාමරූපයත් එක්ක යන විඤ්ඤාණයට. අනිත් විඤ්ඤාණය ලෝකයා දන්නෙත් නැහැ එහෙම විඤ්ඤාණයක් ඇතෙයි කියලවත්. ඒකට වෙන වචනයක් කියන්න හැකියි. නිරුද්ධ විඤ්ඤාණය කියලා, නිරුද්ධ වුන විඤ්ඤාණය.** නිරුද්ධ වෙන්නේ මොකද? අපට හුරු පුරුදු අරමුණක් නැහැ. ඒ ටිකට තමය ඔය රහත් සිත දක්වනකොට '**අප්පතිට්ඨං අනාරම්මණං**' කියල කියන්නෙ. ඔය පින්වතුන් අහල ඇති සුඤ්ඤත තත්ත්වය දක්වනකොට '**අනිමිත්ත**' වචනය යොදනවා. නිමිත්තක් නැහැ '**අප්පතිට්ඨිත**' පිහිටීමක් නැහැ. ශූන්‍යයි, ආත්ම තත්ත්වයෙන් ශූන්‍යයි. ඒ සුඤ්ඤත තත්ත්වය තමයි ඔතනින් පෙන්නුම් කරන්නේ. එතෙන්ට තව අපි එකතු කරමු. ධම්ම පදයේ ගාථා දෙකක්.[17]

> **යෙසං සන්නිචයො නත්ථි - යෙ පරිඤ්ඤාත භොජනා**
> **සුඤ්ඤතො අනිමිත්තොච - විමොක්ඛො යෙස ගොචරො**
> **ආකාසෙව සකුන්තානං - ගති තෙසං දුරන්නයා**

ඒකත් අර වගේම තේරුම් ගන්න අමාරුයි. ඒ කියන්නෙ. '**යෙසං සන්නිචයො නත්ථි**' රහතන් වහන්සේලාට එකතු කරගත්තු දෙයක් නැද්ද, '**යෙ පරිඤ්ඤාත භොජනා**' ආහාරය පිළිබඳව හරියටම පිරිසිඳ අවබෝධ කරගත්තද, **සුඤ්ඤතො අනිමිත්තො ච විමොක්ඛො යෙස ගොචරො** යම් කෙනෙකුගේ ගොදුරු බිම. ගෝචර කියන්නේ පින්වතුනි, ගොදුරු බිම. **එතකොට යම් කෙනෙකුගේ ගොදුරුබිම සුඤ්ඤත අනිමිත්ත තත්ත්වය. එතකොට ආහාරය නොවෙයි. ආහාරය නොවෙයි ගොදුර. රහතන් වහන්සේලා ආහාරය ගන්නේ ගොදුරක් හැටියට නොවෙයි. උන්වහන්සේලා ඒක තුළ සුඤ්ඤතාව අවබෝධ කරගැනීමෙන් තමන්ගේ 'අනිමිත්ත සුඤ්ඤත ගොදුර බිමේයි' උන්වහන්සේලා හැසිරෙන්නෙ.** ඒ අය **යන ගමන් මාර්ගය සොයාගන්න බැහැ 'ආකාසෙව සකුන්තානං ගති තෙසං දුරන්නයා'**. අහසේ කුරුල්ලෝ ගිය මාර්ගය දක්වන්න බැරුව වගේ රහතන් වහන්සේලාගේ හිත යන හැටි තේරුම් ගන්න බැහැ. අනිමිත්ත නිසා අප්පණිහිත නිසා. ඔය ගැන බොහෝ තැන්වල සඳහන් වෙනවා.

දෙවියන් බඹුන් වඳිනවලු රහතන් වහන්සේලාට, 'අනේ ඔබවහන්සේගේ හිත යන අරමුණ අපට පේන්නෙ නැහැ.' අරහත් ඵල සමාපත්තිය නිසා. ඒ ගැනයි ඔය කියන්නේ. එතකොට ඒ ගොදුරු බිම 'සුඤ්ඤතො, අනිමිත්තො' ඒ කාරණයම ප්‍රකාශ කරන ඊළඟට තියන ගාථාව තමයි:

**යස්සාසවා පරික්ඛීණා - ආහාරෙ ච අනිස්සිතො**
**සුඤ්ඤතො අනිමිත්තො ච - විමොක්ඛො යස්ස ගොචරො**
**ආකාසෙව සකුන්තානං - පදං තස්ස දුරන්නයං**

අර වගේම අදහසක් තියෙන්නේ ආශ්‍රව ක්‍ෂය කළ රහතන් වහන්සේ පිළිබඳව. භෝජන හතර පිළිබඳව හොඳින් තේරුම්ගත්ත නම් උන්වහන්සේලා ගිය මාර්ගය දකගන්න, ඒ කියන්නේ **හිත යන මාර්ගය තේරුම්ගන්න බැහැ. අනිමිත්ත, අප්පණිහිත නිසා.** ඔන්න දැන් තේරුම් ගන්න ඒ නිසා තමයි '**සංඛාය සෙවී ධම්මධෝ සංඛං නොපෙති වෙදගූ**' ඒ රහතන් වහන්සේලා ගිණීමට නොයේ කියන්නෙ. සාමාන්‍ය ලෝකයා ගණන්ගන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ ආහාර ගන්න හැටි බලන්න, උන්වහන්සේගේ චරියාව පරීක්‍ෂා කරන්න. බ්‍රහ්මායු බ්‍රාහ්මණයාගේ ශිෂ්‍ය උත්තර නමැති බ්‍රාහ්මණ තරුණයා හත් මාසයක් බුදුරජාණන් වහන්සේ පිටිපස්සෙන් සෙවණැල්ල වගේ ගියා. ඊට පස්සේ බුදුරජාණන් වහන්සේගේ චරියාව පිළිබඳව මහා පුදුම වර්ණනාවක් බ්‍රහ්මායු සූත්‍රයේ දක්වනවා.[18] ඒකෙ මෙන්න මෙහෙම එකක් තියනවා අර කියාපු ආකාරයට 'නෙව දවාය න මදාය' ආදී වශයෙන් අටඨ්ඞග සමන්නාගතව බුදුරජාණන් වහන්සේ ආහාරය වළඳනවා. එපමණක් නොවෙයි මහා ආශ්චර්යය වන්නේ '**රස පටිසංවේදී භගවා නො ච රස රාග පටිසංවේදී' බුදුරජාණන් වහන්සේගේ රස නහර ක්‍රියාත්මක වෙනවා. බුදුරජාණන් වහන්සේට රස දැනෙනවා. නමුත් රස රාගයක් නැහැ. ඇල්මක් නැහැ. අන්න අර 'සුඤ්ඤත' 'අනිමිත්ත'** කතන්දරේ.

එතකොට ඒක තුළින් හිතාගන්න මේ පින්වතුන් - පුදුම ගාථා දෙකක් - ආහාරය පිරිසිඳ අවබෝධ කරගත්ත කියන්නේ ආහාරය නොගැනීම නොවෙයි. යථා තත්ත්වය තේරුම් අරගෙන තණ්හාව රාගය ආදිය ඉවත් කළ අවස්ථාවයි. ඒවා ඉවත් නොකළ අවස්ථාවේ අපි

බලාපොරොත්තු උනත් නැතත් අර තෘෂ්ණා වේගය තුළින් අපේ විඤ්ඤාණය කොතනක හරි සටහන් වෙනවා, සිතුවම් පටක් ඇඳෙනවා. මව් කුසයේ හෝ වේවා වෙන තැනක හෝ වේවා. එතන තමයි හැමෝම ගිහිල්ල හිර වෙලා ඉන්නේ. 'ආයතිං පුනබ්භවො' නැවත පුනර්භවයක් ඇති වෙන්නෙ. **විඤ්ඤාණයත් නාමරූපයත් එකට යනව නම් විඤ්ඤාණය ඉවත් උනොත් එතන නාමරූපයක් හටගන්නේ** නැහැ. එතකොට ඒ ටික තමයි කිව්වේ, **යම් අවස්ථාවක ජීවත්ව ඉන්න අවස්ථාවෙත් විඤ්ඤාණය නාමරූපයෙන් මිදිල නම්, මරණ අවස්ථාවේ නිමිත්තක් ගන්නේ නැහැ. ඒ නිමිත්තක් නොගන්න සබාවය තමයි අර කියාපු කුළුගේ උපමාවෙන් දක්වූවේ. ඒ සූර්ය රශ්මියට පිහිටන්න තැනක් නැහැ. බිත්තියක්වත්, පොළවක්වත්, වතුරක්වත් මොකවත් නැහැ.** මේ පින්වතුන් සලකගන්න මේ ආහාර ප්‍රඥප්තිය කොයි තරම් ගැඹුරුද කියලා මේ ධර්මයේ තිබෙන. ආහාර පිළිබඳව චතුරාර්ය සත්‍යය ක්‍රමයට ආහාරයත්, ආහාර සමුදයත්, ආහාර නිරොධයත්, ආහාර නිරොධගාමිනී ප්‍රතිපදාවත්, කියන ආකාරයෙන් නිසියාකාරව තේරුම් ගත්තොත් එතන කියවෙනව ඒ තැනැත්තා රහත් වෙනවය කියලා. ආයිත් අමුතුවෙන් කරන්න දෙයක් නැහැ. **ඔය ටික ආශ්‍රයෙන් මේ පින්වතුන් හිතාගන්න මේ දේශනාව කමටහනක් කියලා. කාටත් මේ ගැඹුරු දේවල් පවා කියන්නේ මේවා ගැඹුරුයි කියලා හිතන්න එපා. ඇත්ත වශයෙන් ධර්මය ගැඹුරු තමයි. හරි හැටි තේරුම්ගත්තොත් යම් කෙනෙක් ඒක යෝනිසෝ මනසිකාරය වශයෙන් සිත යොදනව නම් අර කියාපු මාර්ග ඵල ආදිය ඈතක නොවේ.** ඒ නිසා මේ පින්වතුන් අද දින සිල් සමාදන් වෙලා යම් සීලයක පිහිටලා යම් ප්‍රමාණයකට හරි තම තමන්ගේ බණ භාවනා කරගන්නත් ඇති. මේ දේශනාවත් මේ පින්වතුන්ට විදර්ශනාත්මක වශයෙන් උපකාරවත් වේවා!

ඒ ආහාරය පිළිබඳ සංඝයා වහන්සේලා පමණක් නොව යෝගාවචර පින්වතුන්, බෞද්ධ පින්වතුන් ඒ ආහාර ප්‍රත්‍යවේක්ෂාවේ යෙදෙනවා. ඒ ප්‍රත්‍යවේක්ෂාව නියම විදියට, හරියට, ප්‍රත්‍යවේක්ෂාව සම්පූර්ණ කරගත්තොත් අන්න එතනම මාර්ග ඵල තියනවා. මේ දේශනාව තම තමන්ගේ බණ භාවනාවලට උපකාර කරගෙන හැකි තාක් ඉක්මනින් සෝවාන්, සකදාගාමි, අනාගාමි අර්හත් කියන මාර්ග ඵල

ප්‍රතිවේධයෙන් මේ අති භයානක සංසාරයෙන් අත් මිදීමට ශක්තිය බලය ලැබේවා කියල ප්‍රාර්ථනා කරනවා. අවීචියේ සිට අකනිටා දක්වා යම් තාක් සත්ත්ව කෙනෙක් මෙබඳු ධර්‍ම දේශනාමය හා ධර්‍ම ශ්‍රවණමය කුසලයක් අනුමෝදන් වීමට කැමති නම් ඒ අනුමෝදන් වීම තුළින් ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් වූ අමා මහ නිවනින් සැනසෙත්වා කියලා ප්‍රාර්ථනා කරගෙන මේ ගාථා කියල පින් දෙන්න.

**එත්තාවතා ච අම්හෙහි...**

## පාදක සටහන්

1. ද්වයතානුපස්සනා සුත්ත, සුත්ත නිපාත, 234 පිට (බු.ජ.ත්‍රි. 25)
2. ආහාර සුත්ත, සංයුත්ත නිකාය, 2-20 පිට (බු.ජ.ත්‍රි. 14)
3. පුත්තමංස සුත්ත, සංයුත්ත නිකාය, 2-152 පිට (බු.ජ.ත්‍රි. 14)
4. සාරත්ථප්පකාසිනි 11 - 79 පිට (හේ.මු.)
5. සතිපට්ඨාන සුත්ත, මජ්ඣිම නිකාය 1-138 පිට (බු.ජ.ත්‍රි. 10)
6. භික්ඛුනී සුත්ත, අංගුත්තර නිකාය, 2-280 පිට (බු.ජ.ත්‍රි. 19)
7. පාරාසරිය ථෙර ගාථා - ථෙර ගාථා, 190 පිට (බු.ජ.ත්‍රි. 28)
8. නාලක සුත්ත, සුත්ත නිපාත, 222 (බු.ජ.ත්‍රි. 25)
9. රථූපම සුත්ත, සංයුත්ත නිකාය, 4-346 පිට (බු.ජ.ත්‍රි. 16)
10. ඔඝතරණ සුත්ත, සංයුත්ත නිකාය, 1-2 පිට (බු.ජ.ත්‍රි. 13)
11. ඵුස්ස ථෙර ගාථා - ථෙර ගාථා - 228 පිට (බු.ජ.ත්‍රි. 28)
12. කුමාර පඤ්හ, ඛුද්දක පාඨ ඛුද්දක නිකාය, 1-4 පිට (බු.ජ.ත්‍රි. 24)
13. සම්මාදිට්ඨි සුත්ත, මජ්ඣිම නිකාය, 1-112 පිට (බු.ජ.ත්‍රි. 10)
14. අත්ථිරාග සුත්ත, සංයුත්ත නිකාය, 2-158 පිට (බු.ජ.ත්‍රි. 14)
15. කකචූපම සුත්ත, මජ්ඣිම නිකාය, 1-320 පිට (බු.ජ.ත්‍රි. 10)
16. කෙවඩ්ඪ සුත්ත, දීඝ නිකාය, 1-538 පිට (බු.ජ.ත්‍රි. 7)
17. අරහන්ත වග්ග, ධම්මපද, ඛුද්දක නිකාය, 1-44 පිට (බු.ජ.ත්‍රි. 24)
18. බ්‍රහ්මායු සුත්ත, මජ්ඣිම නිකාය, 2-576 පිට (බු.ජ.ත්‍රි. 11)

# 20 වන දේශනය

## (පහන් කණුව ධර්ම දේශනා අංක 202)
## 'නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස'

යෙ මෙ පුබ්බෙ වියාකංසු
හුරං ගොතම සාසනා
ඉච්චාසි ඉති භවිස්සති
සබ්බං තං ඉතිහීතිහං
සබ්බං තං තක්කවඩ්ඪනං
නාහං තත්ථ අභිරමිං

තුවඤ්ච මෙ ධම්මං අක්ඛාහි
තණ්හානිඝාතනං මුනි
යං විදිත්වා සතො චරං
තරෙ ලොකෙ විසත්තිකං

ඉධ දිට්ඨසුත මුත විඤ්ඤාතෙසු
පියරූපෙසු හෙමක
ඡන්දරාග විනොදනං
නිබ්බාන පදමච්චුතං

එතදඤ්ඤාය යෙ සතා
දිට්ඨධම්මාභිනිබ්බුතා
උපසන්තා ච තෙ සදා
තිණ්ණා ලොකෙ විසත්තිකං[1]

-හෙමක සුත්ත, සුත්ත නිපාත

සැදැහැවත් පින්වතුනි,

තිලෝගුරු භාග්‍යවත් තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ සොයාගත්තු පටිච්ච සමුප්පාද ධර්මයේ විශේෂත්වය වර්තමානය තුළම සංසාර ගැටළුවට විසඳුමක් ඉදිරිපත් කිරීමයි. එතෙක් ලෝකයේ පහළ වුණු අන්‍යාගම් කතිවරු අතීතයත් අනාගතයත් තර්කයෙන් ගැටලමින් මේ සංසාර ගැටලුවට විසඳුමක් සෙව්වා. මේ ස්වාක්ඛාත ධර්මයේ සන්දිට්ඨික අකාලික එහිපස්සික යන ගුණ පද තුළිනුත් නිතර යෙදෙන 'දිට්ඨෙව ධම්මෙ' දිටු දැමියෙහි කියන පදයෙනුත්, ප්‍රකට වන්නේ අන්න

ඒ වර්තමාන විසඳුමයි. අපි අද මේ විසිවන පටිච්ච සමුප්පාද දේශනාවට සුත්ත නිපාතයේ පාරායණ වග්ගයේ හේමක සූත්‍රය මාතෘකා කරගත්තේ ඒ විශේෂ ලක්ෂණය ගැන මේ පින්වතුන්ගේ අවධානය යොමු කරන්නටයි. ඒ ගාථාවල අර්ථය මෙහෙමයි.

1. **යෙ මෙ පුබ්බෙ වියාකංසු - හුරං ගොතම සාසනා**

යම් කෙනෙක් මට ගෞතම සාසනයෙන් පිට යම් ධර්මයක් කියා දුන්නාද

**ඉච්චාසි ඉති භවිස්සති**

ඔවුන් කිව්වේ මෙසේ විය මෙසේ වන්නේය කියලයි.

**සබ්බං තං ඉතිහීතිහං**

ඒ ඔක්කොම 'මෙසේ විය මෙසේ විය' කථාවල්

**සබ්බං තං තක්කවඩ්ඪනං**

ඒවා තර්ක වඩන කථාවල්

**නාහං තත්ථ අභිරමිං**

මම ඒවා ගැන සතුටු වුනේ නැහැ. ඊළඟට කියනවා

2. **ත්වඤ්ච මෙ ධම්මං අක්ඛාහි - තණ්හානිග්ඝාතනං මුනි**

මුනිවරයාණෙනි, ඔබවහන්සේ මට තණ්හාව විනාශ කරන ධර්මය කියාදුන මැනවි

**යං විදිත්වා සතො චරං -තරෙ ලොකෙ විසත්තිකං**

යම් ඒ ධර්මය තේරුම් අරගෙන සතිමත්ව හැසිරෙන්නේ ලෝකයේ ඇලෙන සුලු තණ්හාවෙන් එතර වන්නේය.

3. **ඉධ දිට්ඨසුතමුත විඤ්ඤාතෙසු**
**පියරූපෙසු හෙමක**
**ඡන්දරාග විනොදනං**
**නිබ්බාන පද මච්චුතං**

හේමක මේ ලෝකයේ ප්‍රිය ස්වරූප ඇති, දුටු ඇසූ දැනුණ දැනගත් හැම දෙයක් කෙරෙහිම ඡන්දරාගය දුරු කිරීම ගිලිහී නොයන නිවන් තත්ත්වයයි.

**එතදඤ්ඤාය යෙ සතා**

මේ කාරණය තේරුම් අරගෙන යම් කෙනෙක් සතිමත්ව
**දිට්ඨධම්මාභිනිබ්බුතා**
දිටු දැමියෙහිම නිවුණාහුද
**උපසන්තා ච තෙ සදා**
ඔවුහු හැම කල්හිම උපශාන්තය
**තිණ්ණා ලොකෙ විසත්තිකං**
ලෝකයේ ඇලෙනසුලු තණ්හාවෙන් එතර වූවාහුය.

පින්වතුනි, මීට කලින් අපි පැවැත්වූ දේශනාවලදී සඳහන් කළා විසුද්ධි මාර්ගයේ දක්වෙන දනට සම්මත පටිච්ච සමුප්පාද විවරණයට අනුව අඞග දොළහෙන් අවිජ්ජා සඞ්ඛාර කියන අඞග දෙක අතීතයට අයත් හැටියටත් අන්තිමට තියන ජාති, ජරා මරණ, අඞග දෙක අනාගතයට අයිති හැටියටත් ඊළඟට විඤ්ඤාණ නාමරූප සළායතන ඵස්ස වේදනා තණ්හා උපාදාන, භව කියන මැද තියන අඞග අට වර්තමානයට අයිති හැටියටත් දක්වෙනවා. ඉතින් ඒ විවරණය, ඒ මතය, අපි පිළිගත්තොත් හේමක මානවකයා අනිත් ආගම් දර්ශන ගැන කියපු 'මෙසේ විය මෙසේ වන්නේය' කියන 'ඉතිහීතිහ' චෝදනාව අපේ ධර්මයටත් එල්ල වෙනවා. **නමුත් පින්වතුනි, මේ ධර්මය 'මෙසේ මෙසේ' ධර්මයක් වත් 'එසේ මෙසේ' ධර්මයක්වත් නොවෙයි.** මේ කියාපු භව තුනේ විග්‍රහය ඔප්පු කරන්න විසුද්ධි මාර්ග කර්තෘතුමා බුද්ධඝෝෂ ස්වාමීන් වහන්සේ - විසි ආකාර පටිච්ච සමුප්පාද විග්‍රහයකුත් ඉදිරිපත් කරනවා[2] පහේ ගොඩවල්.

අතීතෙ හෙතවො පඤ්ච - ඉදානි ඵල පඤ්චකං
ඉදානි හෙතවො පඤ්ච - ආයතිං ඵල පඤ්චකං

අතීතයේ හේතු පහයි. වර්තමානයේ ඒවායේ ඵල පහයි. වර්තමානයේ හේතු පහයි. අනාගතයට ඵල පහයි. මොනවද මේ අතීත හේතු පහ හැටියට දක්වන්නේ. අවිජ්ජා සඞ්ඛාර, තණ්හා, උපාදාන, භව. වර්තමාන ඵල හැටියට දක්වන්නේ විඤ්ඤාණ නාමරූප සළායතන ඵස්ස වෙදනා. ආයිමත් වර්තමාන හේතු හැටියට දක්වන්නේ අවිජ්ජා සඞ්ඛාරා තණ්හා උපාදාන භව. අනාගත ඵල අර කිව්ව විඤ්ඤාණ නාමරූප සළායතන ඵස්ස වෙදනා. **මේ විග්‍රහය තුළින් පින්වතුනි,** මේ

පටිච්ච සමුප්පාද අඞ්ග දොළහ අතර තියන ඉදප්පච්චයතා කියන ඒ පුදුම සම්බන්ධතාව පලුදු වෙනවා. අපි මීට කලින් මේ පින්වතුන්ට කියාදීලා තියනවා ඒ අඞ්ග දෙකක් අතර තමයි පටිච්ච සමුප්පාද ධර්‍ම න්‍යාය ඉදප්පච්චයතාව. 'මෙය ඇති කල්හි මෙය වෙයි. මෙය හටගැනීමෙන් මෙය හටගනී. මෙය නැති කල්හි මෙය නොවෙයි. මෙය නිරුද්ධ වීමෙන් මෙය නිරුද්ධ වේ කියලා කියන අර ඉදප්පච්චයතා 'මෙය නිසා මෙය වන බව' කියන එක තමයි එතන ධර්‍ම දෙකක් අතර. හැම යුගලයක් අතරම ඒක තියනවා. ඒ නිසා ඒක බිඳින්න බැහැ. ඒකට තව දේවල් එකතු කරන්නත් බැහැ. අඞ්ග දෙක පුදුම විදියට එකට බැඳිලා තියනවා. ඒ ගැන දක්වෙනවා 'යා තත්‍ර තථතා අවිතථතා අනඤ්ඤථතා ඉදප්පච්චයතා' කියලා. 'එය එසේමයි වෙනස් කරන්න බැහැ. අන් සේ බවක් නැහැ' කියල බුදුරජාණන් වහන්සේ ඒ සම්බන්ධතාව තහවුරු කරනවා. විසුද්ධි මාර්ගයේ විස්තරයෙන් මේක බිඳෙන බවයි අපට කියන්න වෙන්නේ.

එපමණක් නොවෙයි බුද්ධඝෝෂ ස්වාමීන් වහන්සේ වට්ට තුනක් ගැනත් කියනවා. කිලෙස වට්ට, කම්ම වට්ට, විපාක වට්ට. නමුත් පින්වතුනි අපි පෙන්නල දුන්නා මහානිදාන සූත්‍රය විග්‍රහ කළ අවස්ථාවේ මේ පටිච්ච සමුප්පාදයට අයිති නියම 'වට්ට' කථාව තමයි විඤ්ඤාණ නාමරූප අතර තියන ඒ 'වට්ටය'. ඒක ප්‍රකාශ කෙරෙන මහ ගැඹුරු බුද්ධ දේශනා කොටස අපි කීප වරක් උද්ධෘත කරල දක්වූවා.[3] මේ අවස්ථාවෙදිත් මේ අලුත් අයටත් දැනගන්න කියන්න වෙනවා. 'එත්තාවතා ඛො ආනන්ද ජායෙථ වා ජීයෙථ වා මීයෙථ වා චවෙථ වා උප්පජ්ජෙථ වා, එත්තාවතා අධිවචන පථො එත්තාවතා නිරුත්තිපථො එත්තාවතා පඤ්ඤත්තිපථො එත්තාවතා පඤ්ඤාවචරං එත්තාවතා වට්ටං වට්ටති ඉත්ථත්තං පඤ්ඤාපනාය යදිදං නාමරූපං සහ විඤ්ඤාණෙන. ඒකේ තේරුම 'මෙතාක් දුරටය ආනන්ද කෙනෙක් උපදනේ හෝ දිරන්නේ හෝ මියයන්නේ හෝ චුත වන්නේ හෝ නැවත උපදනේ, මේ තාක් දුරටය අධිවචන මාර්ගයක්, නිරුක්ති මාර්ගයක්, ප්‍රඥප්ති මාර්ගයක්, දක්විය හැක්කේ. මේ තාක් දුරටය ප්‍රඥාවට බැසගත හැක්කේ. මේ තාක් දුරටය මේ භව තත්ත්වයක් පෙන්නුම් කිරීම සඳහා වට්ටයක් කරකැවෙන්නේ. එනම් නාමරූපය විඤ්ඤාණය සමග. එතකොට ඒකයි නියම වට්ටය.

ඒක තුළ තියනවා ඔක්කොම ජාති ජරා මරණ, ආයෙ අඩුවක් නැහැ. ඉතින් මේක වඩාත් පැහැදිලිව අග්‍රශ්‍රාවක මහා ප්‍රාඥ සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ඉතාම සරල උපමාවකින් නළකලාප සූත්‍රයේ ඉදිරිපත් කරනවා, මහා කොට්ඨිත ස්වාමීන් වහන්සේගේ ප්‍රශ්න මාලාවකට පිළිතුරු වශයෙන්[4]. උන්වහන්සේ පුදුම උපමාවක් දෙනවා. යම් සේ ඇවැත්නි බට කෝටු මිටි දෙකක් ඉහළින් සම්බන්ධ වෙන හැටියට හේත්තු කරලා තියනවා නම් අන්න ඒ විදියටයි නාමරූප ප්‍රත්‍යය කරගෙන විඤ්ඤාණය පවතින්නේ, විඤ්ඤාණය ප්‍රත්‍යය කරගෙන නාමරූප පවතින්නේ. ඊළඟට නාමරූප ප්‍රත්‍යය කරගෙන සළායතන ඵස්ස වෙදනා තණ්හා ආදිය පවතින්නේ. ඊළඟට ඒ බට කෝටු මිටි දෙක අතරින් එකක් අදිනකොට අනික වැටෙනවා. අනික අදිනකොට මේක වැටෙනවා. එතකොට ඒ විදියට නිරෝධ පැත්ත කියන්නේ මෙහෙමයි. නාමරූප නිරෝධයෙන් විඤ්ඤාණ නිරෝධය, විඤ්ඤාණ නිරෝධයෙන් නාමරූප නිරෝධයත් එක්කම සළායතන ඵස්ස වෙදනා තණ්හා උපාදාන ඔක්කොම ඇදගෙන වැටෙනවා. ටිකකට හිතන්න, හිතට නගාගන්න බලන්න පින්වතුනි, බට කෝටු මිටි දෙකෙන් එකක්. වම් පැත්තෙ තියන බට කෝටු මිටිය විඤ්ඤාණය කියල හිතමු. දකුණු පැත්තෙ තියන බට කෝටු මිටිය නාමරූපය කියල හිතන්න. එතකොට නාම රූප බට කෝටු මිටියට තව බට කෝටු මිටි ගොඩක් හේත්තු කරල තියනවා. ඒ ඔක්කොම වැටෙනවා නාමරූප වැටුනොතින්. ඔන්න දැන් තේරුම්ගන්න. ඒක නිසයි සන්දිට්ඨික අකාලික ඒහිපස්සික කියන්නේ. ඒ ගුණ එතනම තියනවා. ආයි ඕක අතීතයට වර්තමානයට අනාගතයට කාලත්‍රයට දාන්න දෙයක් නැහැ.

විසුද්ධිමාර්ග විවරණය ගැන අපි එහෙම කිව්වා. ඔය කියාපු අඤ්ඤමඤ්ඤ පච්චයතාව තුළින් ඒකෙ ප්‍රතිලාභ හැටියට ද්වයතාව කියල දෙයක් මතු වෙනවා. අපි ද්වයතානුපස්සනා සූත්‍රය මාතෘකා කරගත්තා දේශනා රාශියකටම. මේ පින්වතුන්ට මතක ඇති සමුදය, නිරෝධය කියන ද්වයතාවක් තියනවා. ඒ වගේම තවත් ද්වයතාවක් තියනවා. 'අජ්ඣත්ත බහිද්ධා' ඇතුළත පිටත. ඔය ටික තමයි ඔය පින්වතුන්ට සතිපට්ඨාන සූත්‍රයේ හැම තැනම අහු වෙන්නේ 'ඉති අජ්ඣත්තං වා කායෙ බහිද්ධා වා කායෙ' කථාන්තරය ගැන අපි කියලා තියනවා.[5] 'සමුදය ධම්මානුපස්සී වා වයධම්මානුපස්සී' වා කියන ඔය ද්වයතාව. ද්වයතාව

**කියන වචනය අපේ ථෙරවාද සම්ප්‍රදාය ගණන් අරගෙන නැහැ. ඔය වචනය එළියට ඇවිල්ලා නැහැ.** නමුත් ඒකෙ වැදගත්කම අපි පෙන්නුවා. '**ද්වයං**' කියල සූත්‍ර දෙකක් තියනවා එක ළඟ, සළායතන සංයුත්තයේ ද්වයං නාමයෙන්ම. ඔන්න එක 'ද්වයං' සූත්‍රයක තියෙන්නේ මෙහෙමයි.[6] මහණෙනි, මම නුඹලාට 'ද්වයං' දෙකක් දේශනා කරනවා. මොකක්ද දෙක? ඇසයි රූපයයි, කනයි ශබ්දයයි, නැහැයයි ගඳ සුවඳයි, දිවයි රසයි, කයයි සපර්‍ශයයි, මනසයි ධම්මයි. ඔන්න දෙක.

ඊළඟට මහ පුදුම අභියෝගයක් බුදුරජාණන් වහන්සේ වදාරනවා. යම් කෙනෙක් කිව්වොත් මේ දෙක ප්‍රතික්ෂේප කරලා මම වෙන දෙකක් පෙන්වනවා කියලා. ඒක කටහැකර කථාවක් පමණයි. එයාට ඔප්පු කරගන්න බැරිව වෙහෙසට පත් වෙනවා. අන්න බලන්න ද්වයතාව ගැනයි. ඊළඟට තියන අනිත් ද්වයං සූත්‍රයේ මේ විදියටයි සඳහන් වෙන්නේ. 'ද්වයං භික්ඛවෙ පටිච්ච විඤ්ඤාණං සම්භොති දෙකක් නිසයි විඤ්ඤාණය හට ගන්නේ කථඤ්ච භික්ඛවෙ ද්වයං පටිච්ච විඤ්ඤාණං සම්භොති' කොහොමද ඒක? චක්ඛුඤ්ච පටිච්ච රූපෙ උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං ඇසත් රූපයත් නිසයි චක්ඛුවිඤ්ඤාණය ඇති වුණේ. ඊළඟට තව එකක් වදාරනවා චක්ඛුං අනිච්චං විපරිණාමි අඤ්ඤථාභාවි. රූපා අනිච්චා විපරිණාමිනො අඤ්ඤථාභාවිනො ඇසත් අනිත්‍යයි වෙනස් වන සුලුයි අන්‍යාකාරයකට පත් වන සුලුයි. රූපත් එහෙමයි. ඊළඟට වදාරණවා 'ඉත්ථෙතං ද්වයං චලඤ්චෙව වයඤ්ච අනිච්චං විපරිණාමි අඤ්ඤථාභාවි' මේ දෙකම සැලෙනවා සලිත වෙනවා අනිත්‍යයි වෙනස් වෙනවා. අඤ්ඤථා භාවයට පත් වෙනවා. **මේ දෙකක් පිළිබඳ ප්‍රශ්නය විසඳෙන්නේ අනිත්‍යතා ධර්‍මය තුළින් බව කෙටියෙන් සලකාගන්න.** මේ ද්වයං කියන එකේ අජ්ඣත්ත බහිද්ධා කොටස ඔප්පු වෙන තවත් වටිනා සූත්‍රයක් තියනවා. ඒක අර මජ්ඣිම නිකායේ තියන බාල පණ්ඩිත සූත්‍රය නොවේ සංයුත් සඟියේ තියනවා බාල පණ්ඩිත සූත්‍රය කියලා එකක්.[7] ඒකෙ කොටසක් විතරක් අපි මේ වෙලාවේ කියමු. '**අවිජ්ජානීවරණස්ස භික්ඛවෙ, බාලස්ස තණ්හාය සම්පයුත්තස්ස එවමයං කායො සමුදාගතො. ඉති අයඤ්චෙව කායො බහිද්ධාච නාමරූපං ඉත්ථෙතං ද්වයං. ද්වයං පටිච්ච ඵස්සො සළෙවායතනානි යෙහි ඵුට්ඨො බාලො සුඛදුක්ඛං පටිසංවෙදියති එතෙසං වා අඤ්ඤතරෙන**'.

ඒකෙ තේරුම, 'මහණෙනි අවිද්‍යා නීවරණයෙන් වැසුණු තණ්හාවෙන් බැඳුණ බාලයාට මේ කයක් ලැබිල තියනවා. මේ කය එක පැත්තකින්. බහිද්ධාච නාමරූපං - නාමරූපය අනිත් පැත්තෙන්. හිතාගන්න කය කියන්නේ සවිඤ්ඤාණක කය. සවිඤ්ඤාණක කය එක පැත්තකින් අනිත් පැත්තෙන් - 'බහිද්ධා' - නාමරූපය. ඉත්‍යේතං ද්වයං. ද්වයං පටිච්ච ඵස්සො ඒ දෙක නිසා එතන ඉඳලයි ඵස්ස සළායතන ඔය කථාන්තර තියෙන්නේ. ඒ ඩිංග ඇති ඒ ගැන. ඔය ද්වයං කථාවේ වටිනාකම අපි ඒකෙන් පෙන්නුවා.

ඊළඟට අපි යමු හේතු පච්චය කියන වචන දෙකට. බුද්ධ කාලයේ හැම සූත්‍රයකම ඒ දෙක යෙදෙන්නේ සමානාර්ථවත් පද හැටියටයි. 'කො හෙතු කො පච්චයො' කියල ඇහැව්වොත් ඒකට දෙන පිළිතුර දෙකක් නොවෙයි එකක්. ඒක හොඳට ඔප්පු වෙන හොඳ ලස්සන සූත්‍රයක් අපි කියමු වැඩි විස්තර නැතත් තේරෙන හැටියට. මහාපුණ්ණම කියල සූත්‍රයක් තියනවා[8] සඳ එළිය ඇති රාත්‍රියක එළිමහනේ බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා අහන ප්‍රශ්න වලට පිළිතුරු දෙනවා. එක භික්ෂුන් වහන්සේ නමක් මහ පුදුම විදියට එක පිට එක ප්‍රශ්න පහක් ඇහුවා. ඒක සිංහලට නැගුවොත් මෙහෙමයි. 'ස්වාමීනි කුමක්ද හේතුව කුමක්ද ප්‍රත්‍යය රූපස්කන්ධයක් පෙන්නුම් කිරීමට? කුමක්ද හේතුව කුමක්ද ප්‍රත්‍යය වෙදනාස්කන්ධයක් පෙන්නුම් කිරීමට? කුමක්ද හේතුව කුමක්ද ප්‍රත්‍යය සංඥා ස්කන්ධයක් පෙන්නුම් කිරීමට? කුමක්ද හේතුව කුමක්ද ප්‍රත්‍යය සංස්කාර ස්කන්ධයක් පෙන්නුම් කිරීමට? කුමක්ද හේතුව කුමක්ද ප්‍රත්‍යය විඤ්ඤාණ ස්කන්ධයක් පෙන්නුම් කිරීමට? ඔන්න බුදුරජාණන් වහන්සේ පිළිතුර දෙනවා -

'මහාභූත හතර තමයි හේතුව. මහාභූත හතරමයි ප්‍රත්‍යය. රූපසකන්ධයක් පෙන්නුම් කිරීමට, ස්පර්ශයමයි හේතුව ස්පර්ශයමයි ප්‍රත්‍යය වේදනාස්කන්ධයක් පෙන්නුම් කිරීමට, ස්පර්ශයමයි හේතුව ස්පර්ශයමයි ප්‍රත්‍යය සංඥාස්කන්ධයක් පෙන්නුම් කිරීමට. ස්පර්ශයමයි හේතුව ස්පර්ශයමයි ප්‍රත්‍යය සංස්කාර - ස්කන්ධයක් පෙන්නුම් කිරීමට. **නමුත් නාමරූපයමයි හේතුව නාමරූපයමයි ප්‍රත්‍යය විඤ්ඤාණ ස්කන්ධයක්**

**පෙන්නුම් කිරීමට.** අපට ඕනෑ කරන්නේ මෙතනින් අන්න අර කාරණයයි. හේතු ප්‍රත්‍යය කියන එක සමානාර්ථවත් හැටියටයි සූත්‍ර දේශනාවල යෙදිල තියෙන්නේ. නමුත් පින්වතුනි **අපට පේනවා ප්‍රකරණ සාහිත්‍යයෙන් ප්‍රකරණ ග්‍රන්ථවලදී මේ පටිච්ච සමුප්පාදය පිළිබඳ යම්කිසි අර්ථ විපරිණාමයක් සිද්ධ වෙච්ච බව.** පළමුවෙන් අපි නිදර්ශනයක් දෙමු. නෙත්තිප්පකරණයේ[9] පරික්ඛාර හාර විභඞ්ග කියන කොටසේ-එතෙන්ට එනකොට මේ හේතු, ප්‍රත්‍යය දෙකක් ලෙස දක්වනවා. මෙහෙමයි කියන්නේ '**ද්වෙ ධම්මා ජනයන්ති හෙතු ච පච්චයොච**'. යමක් උපදවන්නේ ධර්ම දෙකකින් - හේතුවයි ප්‍රත්‍යයයි. ඒ දෙක අතරින් මෙහෙමයි කියන්නේ 'අසාධාරණො හෙතු සාධාරණො පච්චයො'. දැන් පින්වතුන් සලකාගන්න අසාධාරණ කියන්නේ සමාජයේ දේශපාලනය කරනකොට කියන කථාව නොවෙයි. අසාධාරණ කියන්නේ පොදු නොවන ඒ කියන්නේ විශේෂ. සාධාරණ කියන්නෙ පොදු, එහෙම හිතාගන්න. **එතකොට අසාධාරණො හේතු කියන්නේ හේතුව සුවිශේෂයි, ප්‍රත්‍යය පොදුයි.** ඔන්න නිදසුනකුත් දෙනවා. අංකුරයකින් - අංකුරයක් කියල කියන්නේ පින්වතුනි, ඇටයක් පැළ වෙන අවස්ථාවනෙ - නෙත්තිප්පකරණය කියන්නේ කොහොමද? ඒකේදි **බීජය තමයි හේතුව - අසාධාරණ හේතුව. ඊළඟට ප්‍රත්‍යය තමයි පොළවයි දියසීරාවයි.** ඊළඟට ඔක්කොම හකුළුවා දක්වනවා මේ විදියට. 'ඉති සභාවො හෙතු පරභාවො පච්චයො. අජ්ඣත්තිකො හෙතු බාහිරො පච්චයො. ජනකො හෙතු පරිග්ගාහකො පච්චයො'. ඊළඟට තව එකක් කියනවා අසාධාරණො හෙතු සාධාරණො පච්චයො. ප්‍රත්‍යය කියන වචනය තෝරන්න ගිහිල්ල **සභාවො හෙතු පරභාවො පච්චයො.** ඔන්න අමුතු දෙයක්. අපට ස්වභාව කියන එක සාමාන්‍යයෙන් යෙදෙන වචනයක්. ඔන්න පාරිභාෂික ශබ්දයක් කරගෙන ඒක. **'ස-භාව' කියන්නෙ තමන්ගේ ස්වභාවය. පරභාවො කියන්නේ අනුන්ගේ ස්වභාවය.** ඔන්න බලන්න වැඩවල හැටි. එතකොට 'සභාව' තමයි අංකුරයක බීජය. 'පරභාව' තමයි අර ආපො, පඨවි, තෙජො, වායො ආදිය. නමුත් සේලා තෙරණියගේ කතාන්තරයෙන් එහෙම පේනවා[10] මේ කාරණා තුනම වැදගත් බව. කෙසේ හෝ වේවා. ඔන්න එතකොට ඒ එකක්, ඊළඟට අජ්ඣත්තිකො හෙතු අධ්‍යාත්මික එක හේතුව. බාහිර එක පච්චය. ඊළඟට ජනක **උපද්දවන එක 'හේතුව'. ඒකට උදව් කරන එක 'ප්‍රත්‍යය'.** ඔන්න ඔහොම විග්‍රහයක් හේතු ප්‍රත්‍යය පිළිබඳව

දක්වලා තියනවා.

ඉතින් පින්වතුනි, ඔන්න ඊළඟට අපට කියන්න සිද්ධ වෙනවා. අපි ඊළඟට එමු පට්ඨානප්පකරණයට.[11] එතන තියෙනවා ප්‍රත්‍යය විසි හතරක් වෙලා. හිත්වල සම්බන්ධතාව පෙන්වන්න ගිහිල්ලා ප්‍රත්‍ය විසි හතරක් එතන තියනවා. **ඒකෙන් පළවෙනි එක 'හේතු' කියල නම් කරල තියනවා. අර කියාපු අර්ථයෙන්ම නොවේ. එතකොට හේතු කියන එක අන්තිමට විසිහතරෙන් එකක් වුණා. ඒව අතරින් එකක් තමයි 'අඤ්ඤමඤ්ඤ පච්චය' කියන එක. ඒකත් අපි කියාපු ගැඹුරු අර්ථයෙන් නොවේ. ඒකත් විසි හතරෙන් එකක් වුණා.** ඒ මදිවට දැන් උගතුන් වෙහෙසෙනවා, 'අනන්තර සමනන්තර' කියන ප්‍රත්‍යය දෙකට දීලා තියන එකම විග්‍රහය නිර්වචනය හැඳින්වීම නිසා ඒ දෙකේ අනන්‍යතාව ඔප්පු කරගන්න බැරිව. ඉතින් ඔන්න ඔහොම දෙයක් තියෙනව. **ඊට වැඩිය අපි කියන්න යන්නෙ නෑ.**අපි ඊළඟට මාරු වෙමු පටිසම්භිදාමග්ගප්පකරණයට[12] ඒ හරියට එනකොට තවත් ඒ වගේම විපරිණාමයක් අපට පේනවා. **හේතු, හේතු සමුප්පන්න කියන වචන දෙක තෝරන්නෙ මෙහෙමයි පටිසම්භිදාමග්ගප්පකරණයේ. මෙහෙම කියනවා අවිජ්ජා හෙතු, සංඛාරා හෙතු සමුප්පන්නා, සංඛාරා හෙතු, විඤ්ඤාණං හෙතු සමුප්පන්නං** . ඒ කියන හැටියට අංග දොළහෙන් ඉස්සරහින් තියන එක හේතුවයි. ඊළඟ එක හේතු සමුප්පන්නයි. නමුත් පින්වතුනි අපි පෙන්නල දුන්නා 'යෙ ධම්මා හෙතුප්පභවා තෙසං හෙතුං තථාගතො ආහ' කියන එක ආශ්‍රයෙන් හේතු කියල කියන්නේ අවිද්‍යාවවත් මොකක්වත් නොවේ. අන්න අර ඉදප්පච්චයතාවයි. 'මෙය ඇති කල්හි මෙය වෙයි'. ඒ පටිච්ච සමුප්පාද ධර්ම න්‍යායයයි හේතුව. හෙතු සමුප්පන්න කියන එකත් අපි පෙන්නුවා අර අංග දොළහම හෙතු සමුප්පන්නයි. අර විදියට ගන්න බෑ. අවිජ්ජා ආදි ඒව නිදර්ශන. ඔය කාරණය තවත් පැහැදිලි වෙනවා ඇතැම් තැන්වල කියවෙනව සෝවාන් පුද්ගලයා ගැන. 'හෙතුච සුදිට්ඨො හොති හෙතු සමුප්පන්නෙච ධම්මෙ'. හේතුවත් හොඳින් දැක්කා හේතුවෙන් හටගත් දේත් හොඳින් දැක්කා.

ඊළඟට අපට වඩාත් පැහැදිලි වෙන එක තමයි එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ - මේවා ගැන අපි කලිනුත් කියල තියනවා - පටිච්ච

සමුප්පාදයත් පටිච්ච සමුප්පන්න ධර්මත් අතර ඇති වෙනස දක්වල තියෙනව.[13] පටිච්ච සමුප්පාදය කියන එක හඳුන්වන්නෙ එතෙන්දි මහ පුදුම පාඨයකින් එතන කියනව **ජාති පච්චයා භික්ඛවෙ ජරාමරණං. උප්පාදා වා තථාගතානං, අනුප්පාදා වා තථාගතානං, ඨිතාව සා ධාතු ධම්මට්ඨිතතා ධම්මනියාමතා ඉදප්පච්චයතා'** එතකොට ජාතියත් ජරාමරණයත් අතර ඇති සම්බන්ධතාව ඔප්පු කරන සම්බන්ධකම එතන කියන්නේ 'තථාගතයන් වහන්සේලා උපදනේ හෝ නූපදනේ හෝ 'ඨිතාව සා ධාතු' ඒ ධර්ම ධාතුව එහෙමමයි. ඒක 'තථතා' ආයෙ වෙනස් කරන්න බැහැ. ඉදප්පච්චයතා' ඉදප්පච්චයතාවයි. ඒකයි පටිච්චසමුප්පාදය. ඒකෙ පටිච්චසමුප්පන්න ධර්ම පෙන්නුම් කරන්නේ අන්න අර ඊළඟට කියාපු අංග වලින් අවිජ්ජා ආදී ඒ එක එකක්ම 'හෙතුසමුප්පන්න' එහෙම නැත්නම් පටිච්චසමුප්පන්න ධර්ම. අවිජ්ජාදි හැම එකක්ම 'අනිච්චං සංඛතං පටිච්ච සමුප්පන්නං' පටිච්ච සමුප්පන්න දේවල්. ඒ විග්‍රහයෙදිත් අපට පේනවා කල් යාමේදී යම් කිසි අර්ථ විපරිණාමයක් මේ පටිච්චසමුප්පාද ධර්මය පිළිබඳව සිද්ධ වුන බව.

ඊළඟට අර හේතු පච්චය කතාව වගේම දෙයක් තමයි පටිච්ච සමුප්පාද ධර්මය බොහෝ විට අවිද්‍යාවේ ඉඳල අංග දොළහ අන්තගාමී ප්‍රශ්නවලට, උභතෝකෝටික ප්‍රශ්නවලට, පිළිතුරක් හැටියට ඉදිරිපත් කළ අවස්ථා සූත්‍ර දේශනාවල කොතෙකුත් තියනවා. ලෝකයා ද්වයනිස්සිතයි. දෙකක් පිළිබඳ කථාව. එක්කො 'තියනවා' එක්කො 'නැහැ'. එක්කො 'සියල්ල තියෙනවා' එක්කො 'සියල්ල නැහැ'. එක්කො 'තමන් කරනවා' එක්කො 'අනුන් කරනවා'[14]. ඔන්න ඔහොම ද්වයතාවයක් තුළයි ලෝකයා ඉන්නෙ. ඒ වගේ බ්‍රාහ්මණයින් ඇවිල්ලා අහපු ප්‍රශ්නවලට පිළිතුරු දෙන අවස්ථාවේ විශේෂයෙන් කච්චායන ගොත්ත සූත්‍රයෙ අපි පෙන්නල දීල තියනවා ඒ අන්ත දෙක 'ද්වය නිශ්‍රිත බව'[15] ''සබ්බං අත්ථීති ඛො කච්චාන අයං එකො අන්තො, සබ්බං නත්ථීති අයං දුතියො අන්තො. එතෙ තෙ කච්චාන උභො අන්තෙ අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති යදිදං අවිජ්ජා පච්චයා සංඛාරා......'' ඒ කියන්නේ සියල්ල ඇත කියන එක, එක් අන්තයක්. සියල්ල නැත කියන එක තවත් අන්තයක්. ඒ දෙකටම යන්නෙ නැතිව තථාගතයන් වහන්සේ අර කියාපු අංග දොළහේ පටිච්ච සමුප්පාදය දක්වනවා. එතන අනුලෝම පටිලෝම දෙකම ඇතුළත්.

තේරුම් ගන්න පුළුවන් නේද පින්වතුනි, අවිජ්ජා පච්චයා සංඛාරා කියල, ඊළඟට වදාරනවා අවිද්‍යාවගේම නිරවශේෂ විරාග නිරෝධයෙන්, ඒ කියන්නේ මේ දෙක අතර තියෙන්නේ සමුදය නිරෝධය. **ඒකාන්ත වශයෙන් තියනව කියන්නත් බැහැ. ඒකාන්ත වශයෙන් නැතැයි කියන්නත් බැහැ.** මේවායේ හටගැනීම තියනවා නිරුද්ධ වීම තියනවා. ඇති වීම් තියනවා නැති වීම් තියනවා. ඒක පිළිබඳ ධර්මතාවයි එතකොට මේ 'පටිච්චසමුප්පාද' කියන්නේ. එපමණක් නොවෙයි 'සයං කතං' 'පරං කතං'. තමාද කළේ අනුන්ද කළේ ආදී මේ චතුෂ්කෝටි ප්‍රශ්න හතරකුත් උභතෝකෝටික ප්‍රශ්න හයකුත් ඉදිරිපත් කළා. එතකොට බුදුහාමුදුරුවෝ ඔන්න ඔය දොළහ ඉදිරිපත් කළා. **බොහෝදෙනා මේකෙ තේරුම දන්නෙ නෑ. ඇයි මේ දොළහ ඉදිරිපත් කරන්නේ? ඒක තුළම වර්තමාන විසඳුම තියනවා. ප්‍රශ්නයෙ ව්‍යුහය විග්‍රහ කරල පෙන්වනවා. මොකක්ද ව්‍යුහය? අවිද්‍යා පසුබිම තුළ සංස්කාර ඇති වෙනවා. ඒ සංස්කරණය තුළිනුයි අර විඤ්ඤාණ නාමරූප දිය සුළිය කරකැවෙන්නේ. ඒ දිය සුළිය කරකැවීමේ ප්‍රතිලාභය තමයි ඊළඟට සළායතනය තුළ ආයතන දෙබිඩි වෙලා යනවා.** අන්න අවයං කථාව ඇසත් රූපයත් 'කනත් ශබ්දයත්' ආදී වශයෙන්. ඒ නිසයි අපි කිව්වේ අර අඤ්ඤමඤ්ඤ පච්චයතාව නළකළාප උපමාවෙන්. ඊළඟට ඒක බෙදිලා ගියහම අන්තිමට වෙන්නේ මොකක්ද? වේදනා තණ්හා උපාදාන භව ජාති ඔක්කොම කථාන්තරය එතන තියනවා.

ඉතින් මේක කිව්වට මොකද පින්වතුන්ට පැහැදිලි නොවෙන්න පුළුවන්. දැන් මතක් කරගන්න අපි මේ පටිච්ච සමුප්පාද විවරණවලදී දීපු උපමා. බොහෝ දෙනාට උපමාවලින් තමයි තේරෙන්නේ. නා නාවිධ උපමා අපි දීලා තියනවා. සිනමා උපමාව, මැජික් ලෝකය, ආදී උපමා කීපයක් දක්වල තියනවා. අපි මෙහෙම ගනිමු. **ලෝක කීපයක් හැටියට අපි හිතාගනිමු. සිනමා ලෝකය. ඊළඟට අපි හිතමු අර අජිත් සුමිත් දාම් ඇදිල්ල ගැන කිව්වනේ. ඒකට අපි කියමු සූදු ලෝකය කියලා. ඊළඟට මැජික් ලෝකය තියනවා. ඊළඟට ක්‍රිකට් ලෝකය තියනවා. ඊළඟට තවත් ලෝකයක් තියනවා - අර ඒදණ්ඩ උඩ බල්ල ඉස්සෙල්ල නියෝජනය කළේ, ඊට වැඩිය රසවත් අන්දමින් අපි නාසිසස් උපමාවෙන් ඉදිරිපත් කරලා තියනවා.** ඒක කවුරුත් ප්‍රිය කරන එකක්. ඒක දන්නෙ නැති අයට ඉතාම කෙටියෙන් කිව්වොත් අපි කියවල පුරුදු ග්‍රීක කථාවක්. **නාසිසස්**

**නමැති ඉතාම රූමත් ග්‍රීක තරුණයෙක් තමන්ගේ මුහුණ කවදාවත් දැකල නැහැ. කැලේ ඇවිදින අතරේ පොකුණකට නැඹුරු උනාම ඒ ඡායාව දැකලා රැවටුනා දෙවඟනක් කියලා. දෙවඟන වැළඳගන්න දිය රැලිත් එක්ක දින ගණනක් තිස්සේ මහ පෙම් හටනක් කළා. දින ගණනක් පෙම් හටන කරලා අන්තිමට ආලය වෙනුවෙන් ජීවිතය පූජා කළා. අන්න ආත්ම ස්නේහය. අනිත් ස්නේහත් එහෙම තමයි. ඒකට අපට කියන්න වෙන්නෙ ප්‍රේම ලෝකය.** එතකොට ලෝක ගොඩක් තියනවා. සිනමා ලෝකය, සූදු ලෝකය, මැජික් ලෝකය, ක්‍රිකට් ලෝකය, ඔන්න ප්‍රේම ලෝකය. දැන් මේ එක එක ලෝකවල අර කියාපු අංග ක්‍රියාත්මක වෙන හැටි බලන්න. ඔන්න සිනමා ලෝකය ගැන හිතන්න. සිනමාව චිත්‍රපටිය පටන්ගන්නේ කොයි වෙලාවෙද? මුළු ශාලාවම අන්ධකාරයේ නිමග්න වුනවෙලාවේ. ඒ වෙලාවේ අර අස්ථිර - තිරයට ඇස් දෙක යොමු වෙනවා. එතන ඉඳල පටන්ගන්නවා. ඒ සෙල්ලම තමයි අර අමුතුම ලෝකයක නළු නිළියන්ගේ ඔක්කොම සංස්කාර අර්ථවත් වෙන්නේ අන්ධකාරය තුළයි. විවේකය අවස්ථාවේ ආලෝකය ආ හැටියේ අර වෛවර්ණ බව ඔක්කොම ඉවරයි. සේදිලා යනවා. එතනින්ම ඉවරයි. නමුත් ඒ දෙක අතරේ තමයි අර නළු නිළියන්ගේ හැසිරීම් ආශ්‍රයෙන් රටාවල් මවාගෙන මහ පුදුම ලෝකයක් මැවෙන්නේ. ඒකයි මෝහනය. එතකොට මේ යන්නෙ මොකද, ටිකට් එකක් ගන්නෙ මෝහනයට. මුළා වෙන්න. මොකද, **ලෝකයම කාම ලෝකයක්. කාම ලෝකය තුළ තියනවා පුංචි පුංචි ලෝක රාශියක්.** ඒවා තමයි අපි කිව්වෙ. ඒ සිනමා ලෝකය පහසුවෙන් සලකාගන්න පුළුවන්.

ඊළඟට අපි ගනිමු මැජික් ලෝකය. මැජික්කාරයාගේ නූල් සූත්තර තේරුම්ගන්න තාක් තමයි මැජික් ලෝකෙ පවතින්නේ. දැක්ක හැටියෙ හොරෙන් හරි වේදිකාවෙ හැංගිලා, මැජික් ලෝකෙත් ඉවරයි. ඊළඟට අපි හිතමු අර සූදු ලෝකය. ඒකත් අපි හොඳට පෙන්නල තියනවා අර දාම් අදින අජිත් සුමිත්ගේ කථාව ආශ්‍රයෙන්. කෙටියෙන් කියතොත් ඒ ලෝකෙ තියෙන්නේ දාම් පෙතේ. ඒකයි අර කිසිම වටිනාකමක් නැති ඉත්තන් 'ඇත්තන්' වෙලා අන්තිමට මහ ලොකුවට ජය පරාජයක් පිළිබඳව අර 'සෙන්' ගුරුවරයා කඩුව අමෝරාගෙන පරාද වෙච්ච කෙනා මරණව කියලා සියුම් ධර්ම ගැටළුවක් දීලයි අජිත් සුමිත් යාළුවෝ දෙන්නා තරඟයට පෙළඹුවේ. ඒ අවස්ථාවේ උග්‍ර විදියට එක් කෙනෙක්

ජීවිතේ පූජා කළා අනිත් කෙනා වෙනුවෙන්. ඔන්න මෙන්න පරදින්න තියෙද්දී අන්තිමට මොකක්ද වුණේ. ගුරුවරයා හරියටම දිනුම් පැරදීම තීරණය වෙන - ඒ කියන්නේ මහා උග්‍ර අවස්ථාවේ, එක් කෙනෙක් මරන්න වෙනවා ගුරුවරයාට. පැරදිච්ච ගෝලයා. එතකොට ගුරුවරයා මොකද කරන්නේ? **පහතට නැමිලා අර ඉත්තන් වීසි කළා. ඉවරයි. සූදුව ඉවරයි. සූදු ලෝකය එතනම ඉවරයි. ඔය ඇතිනෙ.**

ඊළඟට ක්‍රිකට් ලෝකය ගැන නම් අමුතුවෙන් කියන්න ඕන නැහැ. මේ පින්වතුන් කවුරුත් දන්නවා. නමුත් මේකයි වැදගත් වෙන්නෙ. තරඟයේ පිල් බෙදුණට පස්සෙ ඔන්න අර උපකරණ පණගැන්වෙනවා. ක්‍රීඩකයන්ට අමුතු නම් දෙනවා. එතන ඉඳලා මෝහනය තමයි. ඔය ක්‍රිකට් ක්‍රීඩා මෝහනය නිසා අන්තිමට දිවි නසාගන්නෙ, ඒකත් ලෝකයක්. ක්‍රිකට් ලෝකය, ජය පරාජය තුළ නා නා ප්‍රකාර දේවල්. ඔක්කොම එතනම තියනවා. උත්පත්තියක් තියනවා මරණයත් තියනවා. ශෝක පරිදෙව දුක්ඛ දොමනස්ස ඔක්කොම තියනවා. ඔන්න ඊළඟට ප්‍රේම ලෝකය ගැන. ඒව ගැන අපට වැඩිය මේ පින්වතුන් දන්නවා. ඒකෙදිත් ආත්ම ස්නේහය එහෙම නැත්නම් වෙන කෙනෙක් පිළිබඳ ස්නේහය ඇති වුණාට පස්සෙ තමයි මෙහෙම කියන්නේ 'ලෝකය නම් දුක තමයි. නමුත් අපි දෙන්නා ඉන්න තැන සැපයි'. ඒ සබන් බෝලය පිපිරුව දවසට එක්කො දිවි නසාගැනීම් නැත්නම් මිනීමරාගැනීම්, ඔන්න ඒ ලෝකය. **ඔය එක එක ලෝකයක් තුළ ක්‍රියාත්මක වෙන්නේ - මතක තියාගන්න - අර අංග දොළහයි. එයින් එතන විශේෂයෙන්ම වැදගත් වන්නේ අර දිය සුළිය - 'වට්ටය'. නියම සන්ධිස්ථානය කේන්ද්‍රස්ථානය තමයි විඤ්ඤාණ නාමරූප සම්බන්ධතාව.** මහ පුදුම මෝහනයක් ඒක තුළ තියෙන්නේ. ඒක නිසා තමයි අපි කිව්වේ විඤ්ඤාණයෙන් ඇහුවොත් 'තමුසෙ කවුද' කියල. නාමරූපයෙන් අහන්නෙයි කියාවි. නාමරූපයෙන් ඇහුවොත් 'තමුසෙ කවුද' කියලා විඤ්ඤාණයෙන් අහන්න කියාවි. මේ දෙක දෙකක්මත් නොවේ. එකක්මත් නොවේ. ඒක මෝහනයක්. ඒකම තමයි අපි පෙන්නුවේ නාමරූප කියල කියන්නේ නාම ස්වරූපයකුත් - නමට රූපයක් - රූප සංඥාවකුත් පමණයි. නමුත් ඒක තුළයි විඤ්ඤාණයට අරමුණක් ඉදිරිපත් කළ හැක්කේ. **ඔන්න ඔතනයි ලෝකයක් හැදෙන්නේ. ඒ ඔක්කොම කෙරෙන්නේ අර අවිද්‍යා අන්ධකාරය තුළයි. ඒ අවිද්‍යා**

අන්ධකාරය තුළ සංස්කරණයක් තියනවා. ඒ සංස්කරණය තමයි ඔය ධර්මයේ දක්වල තියෙන්නේ කායසංස්කාර, වචීසංස්කාර, චිත්තසංස්කාර ආදී වශයෙන්. වෙන එකක් තබා අපි කලින් අවස්ථාවක ප්‍රකාශ කළා මේ භවයෙන් ගැලවෙන්න නම් ඔය සංස්කාර තුනම සංසිඳෙන්න ඕන කියලා. කායසංස්කාර එක පැත්තකින් කිව්වොත් ආශ්වාස ප්‍රශ්වාස. වචීසංස්කාර විතක්ක විචාර. ඊළඟට චිත්ත සංස්කාර සංඥා, වේදනා. මේව තමයි යට තට්ටුව. ඒකයි ඒ සංස්කාර සන්සිඳෙව්වෙ අතීත යෝගීන්. නිවන කියන්නේ 'සබ්බ සංඛාර සමථ'. සියලු සංස්කාර සංසිඳෙන කොට එතන කථාව ඉවරයි. හැබැයි නිකම් සංසිඳෙන්නේ නැහැ. ප්‍රඥා ආලෝකය ආවහමයි සංස්කාර සන්සිඳෙන්නෙ. එතකොට තමයි අපි කිව්වේ 'අනිදස්සන'. විඤ්ඤාණය නිරෝධ වෙනවා. නාමරූපය නිරෝධ වෙනවා. නොයෙකුත් ආකාරයෙන් අපි කිව්වේ. සළායතන නිරෝධය කිව්වත්, විඤ්ඤාණ නිරෝධය කිව්වත්, නාමරූප නිරෝධය කිව්වත්, කොයිවත් එකයි. ඒක තුළින් පෙන්නුම් කරනවා වර්තමානය තුළින්ම මේක විසඳූ බව බුදුරජාණන් වහන්සේ. මහා පුදුම ධර්මයක්. මහා පුදුම ධර්මයක්.

අපි මෙහෙම කිව්වට මොකද පින්වතුනි, මේ පින්වතුන් හිතන්න පුළුවන් ඇයි මෙච්චර කාලයක් මේ කාරණේ එළියට ආවෙ නැත්තෙ. මහ ගැඹුරු සූත්‍ර දේශනා - මූල පරියාය සූත්‍රය, මධුපිණ්ඩික සූත්‍රය, මහා නිදාන සූත්‍රය, මහාපදාන සූත්‍රය, අටුවාචාරීන් වහන්සේලාටත් තෝරන්න බැරි වුණා. බටහිර කට්ටියටත් තෝරගන්න බැරි වුණා.

දුරවබෝධ හැටියට කොන් වුනා. මොකක්ද හේතුව? මොකක්දෝ හේතුවක් තියනවා. මොකක්ද හේතුව? මෙන්න මේකයි පින්වතුනි හේතුව. මේ සාසන ඉතිහාසයේ යම් කිසි අවස්ථාවක අවාසනාවන්ත සිද්ධියක් සිදු වුනා. මේ පරම ගම්භීර සූත්‍ර දේශනා වොහාර දේශනා හැටියට හංවඩු ගැහිලා පිටිපස්සට තල්ලු වුණා. ඒ වෙනුවට වෙන වෙන දේවල් කරලියට ආවා. මේක බුදුරජාණන් වහන්සේ දැකල වෙන්න ඇති අනාගත වාක්‍යයක් ප්‍රකාශ කරල තියනවා. අනාගතයේ මෙන්න මෙහෙම භික්ෂූන් ඇති වෙනවා කියලා. ඒ අනාගත භික්ෂූන්ගේ ආකල්පය වදාරළ තියනවා.[16]

**'යෙ තෙ සුත්තන්තා තථාගත භාසිතා ගම්භීරා ගම්භීරත්ථා ලොකුත්තරා සුඤ්ඤතාපටිසංයුත්තා තෙසු භඤ්ඤමානෙසු න සුස්සූසිස්සන්ති න සොතං ඔදහිස්සන්ති න අඤ්ඤාචිත්තං උපට්ඨාපෙස්සන්ති නතෙ උග්ගහෙතබ්බං පරියාපුණිතබ්බං මඤ්ඤිස්සන්ති.'**

අනාගතයේ භික්ෂූන් වහන්සේලා ඇති වෙනවා තථාගත දේශිත ගම්භීර ශූන්‍යතා ප්‍රතිසංයුක්ත ලෝකෝත්තර සූත්‍ර, දේශනා කරන වෙලාවට ඒවට කන්දෙන්නේ නැහැ. ඒවට හිත යොදවන්නෙ නැහැ. තේරුම්ගන්න උත්සාහ කරන්නෙ නැහැ. ඒව ඉගෙනගන්නෙ නැහැ. හදාරන්නෙ නැහැ. මොකද හේතුව? වොහාර දේශනා කියන එක පින්වතුනි, දැන් තෝරන්නෙ කොහොමද අපි වගේ සාමාන්‍ය අය සඳහා බුදුහාමුදුරුවෝ දේශනා කළේ. මේ පින්වතුන් දන්නවා බාහිය සූත්‍ර ආදී එක දේශනාවකින් මාර්ග ඵල රහත් ඵල ලබාගත්තු අවස්ථා[17]. **නමුත් අවාසනාවකට වගේ, මොකක්දෝ හේතුවක් නිසා පින්වතුනි, ඒවා පස්සට ගියා. වොහාර දේශනා හැටියට මුළුගැන්වුණා. ඕකෙන් තමයි මේ පටලැවිල්ල සිද්ධ වුණේ.**

අපි කල්පනා කරන්ට ඕන පටිච්ච සමුප්පාද ධර්මය කියන එක බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරල තියෙන්නේ - දැන් පටිච්ච සමුප්පාද ධර්මය කියල කියන්නේ අර දොළහ කටපාඩම් කරගෙන ඉහළට පහළට සජ්ඣායනා කිරීමයි. ඊට වැඩි දෙයක් නැහැ. **නමුත් බුදුරජාණන් වහන්සේ මුළු මහත් සංසාර ගැටලුව විසඳන අතර, රූප භව අරූප භව විතරක් නොවෙයි මේ කාම භවය තුළ අර කියාපු පුංචි ලෝකවලටත් අදාළ අභ්‍යන්තර ව්‍යුහය විග්‍රහ කරල දක්වන මහ පුදුම සිද්ධාන්තයක් ඒක තුළ තිබෙන බව බොහෝ දෙනා සලකන්නෙ නැහැ. ඒ නිසයි අර අපි කියූ හේතු ප්‍රත්‍යය වචන පිළිබඳ වෙනස් අර්ථ දැක්වුණේ. බුද්ධ වචනයේ තියන ඒවා අපට වෙනස් කරන්න බැහැ. හේතු ප්‍රත්‍ය කියන එක සමානාර්ථයෙන් තියනව නම් අපි ඒක ඒ හැටියට පිළිගන්න ඕන. මේකෙ කොඳු කඩන්න ගියහම අන්තිමට කෙළවර වෙන්නේ අර බ්‍රහ්මණයින් ගියා වාගේ තමා සහ අනුන්, එක්කො තමන් කළා, එක්කො අනුන් කළා.** ඔය විදියට ගිහිල්ල තමයි 'සභාවො' හෙතු තමන්ගේ හේතුව 'පරභාවො පච්චයො' අනුන්ගේ ප්‍රත්‍යය වගේ අදහස් ඇති වුණේ. **මේවා අද ඊයේ නොවේ කාලයක් තිස්සේ වෙලා තියනවා. මේ අදහස් ටිකක් විප්ලවකාරී**

**වගේ පෙනෙන්ට පුළුවන්. නමුත් අපට කරන්න දෙයක් නැහැ. මේ කාරණය කොයි වෙලාවක හරි එළිදරව් කරන්නට ඕක.** කොයි විදියේ විවේචන එල්ල වුණත්.

දැන් එතකොට මේ පින්වතුන් සලකාගන්න පටිච්ච සමුප්පාද දේශනාවේදී විශේෂයෙන් අවධානය එල්ල කළ යුතු එක තමයි **සංසාර වට්ටය, අඤ්ඤමඤ්ඤ පච්චයතාව, විඤ්ඤාණයත් නාමරූපයත් අතර ඒ සම්බන්ධතාව.** ඒ විඤ්ඤාණයේම තියනවා දෙකක් පිළිබඳ හැඟීම. 'විජානාති' කියල කියන්නේ එකක් අනිකෙන් වෙන් කරන ගතිය. ඒ වෙන් කිරීම තුළින්මයි අන්න නාමරූපය අර විදියට ගන්නේ.

ඒක කෙරෙන්නේ අර අවිද්‍යා අන්ධකාරය තුළයි. ඒක තුළ අර ඡායාව අල්ලගන්නවා. නාමරූපය ඡායාව පමණයි. 'මුවා - මිරිඟුව' කතාන්තරය එන්නෙත් එතනනෙ. ඒක තුළ අර දෙකක් අතරේ හිර වීම සිදු වෙනවා. මෙතන ඇහැයි අතන රූපයයි. ඊළඟට ඒ මුවා දන්නෙ නැහැ ඒ දුවන දුවන වාරයක් පාසා ඇසත් එක්ක යන බව. ඒක නිසා කොන් දෙකක් - කූඤ්ඤ දෙකක් - ගහගත්තා. ඔය කූඤ්ඤ දෙක තුළ ලෝකයා හිර වෙලා 'ද්වය නිශ්‍රිත' වුණා. **බුදුරජාණන් වහන්සේ පෙන්නල දුන්න මේ අන්ත දෙකම අතහැරලා - ඒව එකතු කරලා නොවෙයි, සම්බන්ධ කරලා නොවෙයි - ඒ දෙකටම යන්නෙ නැතිව ගන්නා විසඳුම තමයි ඔන්න ඔය කියාපු ද්වාදසංග පටිච්ච සමුප්පාද විවරණය.** මේ විවරණය තුළින් බුදුරජාණන් වහන්සේ එක පැත්තකින් සංසාර ගැටලුව විසඳුවා. ඔය අතීත ජාති, අනාගත ජාති, කථාන්තර ඇල්ලුවේ මොකද? මේ සංසාරයේ මේ ජාතිය ගැන හරියට තේරුම් ගත්තොත් අතීතයත් එකයි අනාගතයත් එකයි. **හිතන්න පින්වතුනි, කෙහෙල් ගහක හරයක් නැති බව තේරුම්ගන්න පට්ට ගහන්න ඕනද? හොඳට කැපෙන කඩුවක් අරගෙන දෙකට මැදින් කැපුවහම අභ්‍යන්තර ව්‍යුහයෙන් පේනව නේ හරයක් නැති බව.** අන්න ඒකයි සෝවාන් පුද්ගලයා නිවන් දුටුවයි කියන්නේ. අපි කලින් කියල තියනව සෝවාන් පුද්ගලයා නිවන් දුටුවයි කියන්නේ ප්‍රඥා ආලෝකය තුළින් ක්ෂණිකවම මොහොතකට දැක්කා අර සංස්කාර නිරෝධය. අපි අර නීල මහා යෝධයාගේ යගදා උපමා කථාව ආදියෙන් පෙන්නුවේ. ඒක දැක්ක නම් ඒ පුද්ගලයාට අර රහස පොඩ්ඩක් හරි හෙළි වුණා. සංයෝජන එක පාරටම කැඩෙන්නෙ නැහැ. ක්‍රම ක්‍රමයෙන් ගිහිල්ල

තමයි ඒ සත්‍යය දැක්ක නිසා තමයි සෝතාපන්න පුද්ගලයා ආයෙ මෙහාට හැරෙන්නෙ නැහැයි කියල කියන්නෙ. ඒ පුද්ගලයා නිවනින්ම කෙළවර වෙන්නෙ. **අර කියාපු සත්‍ය දර්‍ශනය මොහොතකට හරි දකිනවා. සත්‍ය දර්‍ශනය කියන්නේ ඕකයි. වෙන අමුතු දෙයක් නොවේ පටිච්ච සමුප්පාද ධර්‍මය. 'මෙය ඇති කල්හි මෙය වේ'.**

දැන් සෝවාන් පුද්ගලයා ගැන කියනකොට, බොහෝදෙනා කියනවා අපි හොඳට සිල් රකිනවා ඒ නිසා ඔක්කොම හරි. එහෙම නොවෙයි එතන තියෙන්නෙ. '**යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරොධ ධම්මං' කියන ඒ ධර්‍මතාව දකින්න ඕන.** යම් තාක් දෙයක් හටගන්නා සභාවය ඇත්තේද, ඒ හැම දෙයක්ම නිරුද්ධ වන සභාවයද ඇත්තේය කියන අන්න ඒක තේරුම්ගන්න ඕන. ඒ දර්‍ශනය තුළින්, සමුදය නිරෝධ කියන ධර්‍මතාව දුටුව. මොහොතකට විඤ්ඤාණ නිරෝධය අත්දුටුවා. **මොහොතකට විඤ්ඤාණ නිරෝධය අත්දුටුවා. අන්තිමට අල්ලන්නෙ ඒකනෙ. ඒ නිසා තේරුම්ගත්තා පඤ්චස්කන්ධයේම ඇති වීම් නැති වීම් සභාවය. අන්න ඒ සත්‍ය දර්‍ශනය තුළින් තමයි නිවනට නැඹුරුව. ආයි මෙහාට හරවන්න බැහැ. එපමණකින් සෝවාන් පුද්ගලයාගේ ශ්‍රේෂ්ඨත්වය. තව ඊට එහා යන්න තියන බව ඇත්ත.** නමුත් ඔය විදියේ දෙයක් එතන තියෙන්නේ. බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ ඒ යෝනිසෝමනසිකාරය යෙදූ අවස්ථාවෙයි මේ පැත්ත හෙළි වන්නේ.

එහෙම පිටින්ම නිවන කියන එක ගැන අපි දැන් කිව්වා. අපේ දේශනා මාලාව ගැන දැන් තව එකක් කියන්න ඕන. අපි කිව්වනෙ පටිච්ච සමුප්පාද ධර්‍මයේ යම් කිසි ඓතිහාසික පරිණාමයක් අපි පෙන්නුවා කියලා. මේ දේශනාව පිටට ගියහම සමහර විට නොයෙකුත් විවේචන ඇති වෙන නිසා අපට කියන්න සිද්ධ වෙනවා මේ පුංචි දේශනා මාලාව පිළිබඳ පොඩි ඉතිහාසයක් තියන බව. ඒක ටිකක් පෞද්ගලික දෙයක් වගේ වෙන්න පුළුවන්. නමුත් කියන්න ඕන. මීට අවුරුදු විස්සකට කලින් මීතිරිගල නිස්සරණ වනයේ සංඝයා වහන්සේලාට නිවන පිළිබඳව ගැටලු මතු වුණු අවස්ථාවකදී අපගේ ගුරුදේවයන් වහන්සේ මාතර ශ්‍රී ඤාණාරාම ස්වාමීන් වහන්සේ උන්වහන්සේගේ කුටියේදීම මගෙන් ඉල්ලීමක් කළා **''මේ පිරිසට නිවන පිළිබඳ දේශනා මාලාවක් පවත්වන්න. අපට පටිගත කරගන්න පුළුවන්''** කියලා. මගේ පළමුවන ප්‍රතිචාරය උනේ - හිනහ මුහුණින් - මට කියන්න තියන දේවල් කිව්වොත් මට ප්‍රහාර එල්ල වෙන

බව. නමුත් දෙවන දවසේ උන්වහන්සේ පුදුම විදියට මාව ධෛර්යයවත් කළා. **'මා අරාධනා කළ බව ඒ දේශනාවේදීම කියන්න'** කිව්වා. ඒක නිසයි මේ පින්වතුන්ට නිවන දේශනා අහන්න ලැබුණේ. 'නිවනේ නිවීම' පොත කියවන්න ලැබුණේ. එහෙම නැත්නම් ඒකත් අර කිව්ව කාලයාගේ වැල්ලට යට වෙලා තවමත් එළියට එන්නේ නැහැ. ඒ දේශනා පිළිබඳවත් මුල් කාලයේ අවුරුදු විස්සකට කලින් වපර ඇසින් බැලූ අය දැන් ඇස් ඇරලා බලන බව අපට අහන්න ලැබෙනවා.

ඒ අතර සමහර අය යෝජනා කළා මට පටිච්ච සමුප්පාද ධර්මය පිළිබඳ පොතක් ලියන්න. මට හිතුණා පොතක් ලියනවට වැඩිය ලේසියි මගේ දේශනා සියගණනක් අහපු මේ අයට දේශනා පැවැත්වීම පහසුයි කියල. ඒ අය ගැඹුරු ධර්මය අහන අතරේ නැගිටලා යන්නෙ නැහැ අපට තේරෙන්නෙ නැහැ කියලා. ඉතින් මම බය නැතිව ඒක පටන්ගත්තා. හැබැයි එකක් තියනවා පින්වතුනි, දේශකයාගෙ ප්‍රතිභානය ශ්‍රාවකයාගේ බුද්ධි මට්ටම අනුවයි. එදා ඒ දේශනා පැවැත්වූයේ මීතිරිගල නිස්සරණ වනයේ යෝගාවචර සංඝයා වහන්සේලාටයි. ඒ අවස්ථාවේ අපි දීපු විවිධ උපමා දැන් රටෙත් ගිහිල්ලා. මෙතෙන්දි මේ ගැමි පිරිස සඳහා අපට ගැමි උපමා දෙන්න සිද්ධ වුනා. ගමේ ගොඩේ උපමා දුන්නා. ඒ හින්දා ධර්ම අගෞරවයක් වෙන්නෙ නැහැ. අවස්ථානුකූලවයි. ඒ ඔස්සේ තේරුම්ගන්න බලන්න බුදුරජාණන් වහන්සේගේ මේ ගැඹුරු ධර්මය - ගැඹුරු නිසයි බුදුරජාණන් වහන්සේ පවා මැලි වුණේ මේ ධර්මය දේශනා කරන්න. සහම්පති මහා බ්‍රහ්මයාට දණගහන්න සිද්ධ වුණේ ඒ නිසයි.

මේ කාරණා දෙක අපි කලිනුත් මතක් කරල තියනවා ධර්මයේ දක්වෙනවා ගැඹුරු හැටියට-එකක් අරියපරියෙසන ආදී සූත්‍රවල සඳහන් වෙනවා.[18] **'දුද්දසං ඉදං ඨානං යදිදං ඉදප්පච්චයතා පටිච්චසමුප්පාදො' කෙලෙස්වලට යට වුණු ලෝකයාට පටිච්ච සමුප්පාදය දැකීම අපහසුයි. ඒ වගේම නිරෝධය නම් වූ නිවන. ඒක අමුතු දෙයක් නොවෙයි සමුදය නිරෝධය තියනව නම්. නිරෝධ පැත්ත-ඒකත් ලෝකයාට පෙනෙන්නෙ නැහැ. ඒක සංස්කාර නිරෝධයෙන් වන එකක්.** ඒ වෙනුවට භව තෘෂ්ණාවමයි තියෙන්නෙ. ඒකට අදාළව ඊට පස්සේ අනෙකුත් චින්තන එනවා. ඒ මදිවට - තව දුරටත් කියනව නම් මේ ධර්මයේ පර්‍යාප්ති - ප්‍රතිපත්ති, ප්‍රතිවේධ කියන ත්‍රිවිධ ශාසනයක් තියෙද්දී ප්‍රතිවේධය

මුලින්ම වැටුණා. ප්‍රතිපත්තියත් ටික ටික වැටුණා. අන්තිමට පර්‍යාප්තිය විතරයි. **ඉතින් උගතුන්ට තැන ලැබුණා. එතන ඉඳල පටන්ගත්ත ඉතින් විවරණ විග්‍රහ, ආදිය. අපේ මේ ථෙරවාද සම්ප්‍රදායේ පමණක් නොවෙයි. කොටින්ම කියතොත් සම්බුද්ධ පරිනිර්‍වාණයෙන් අවුරුදු සියයක් යන්න කලින් නිකාය දහඅටක් ඇති වුනා යයි කියනවා. ඒ තරම් ධර්‍මය ගැඹුරුයි.** ඒ විතරක් නොවෙයි. ඒ හැම එකකටම මහා ග්‍රන්ථ රාශියක් - කරත්ත ගණන් ග්‍රන්ථ - ලියවුණා. ඉඳහිටල තමයි ඒවා තේරුම් ගන්නවත් කෙනෙක් උත්සාහ ගත්තේ. අන්න ඒ විදියේ දෙයක් සිද්ධ වෙලා තියනවා.

ඒක නිසා මේ පින්වතුන් කල්පනා කරගන්ට ඕන මේක නිකම්ම අහල එතනින් කෙළවර කරන්නෙ නැතිව තේරුම්ගන්න ඕන. ඒක තේරුම්ගන්න තරම් ප්‍රඥාව අපට නැහැ කියල අපි ඉතින් පෘථග්ජනයො කියල අධෛර්ය වෙන්න එපා. ප්‍රඥාවේ මූල බීජය බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරල දීලා තියනවා - යෝනිසෝමනසිකාරය. **යෝනිසෝමනසිකාරය,** කා තුළත් තියනවා. අපි ඒක පෙන්නුවා අර ඇඟිලි පහේ උපමාවෙන්. නැවත කියන්නේ අලුත් අයට තේරුම්ගන්න. **මේ තාක් නාම ධර්‍ම තේරුවෙ වෙන ආකාරයකට. ඵස්ස ඉස්සරහට දාලා. අපි පෙන්නුවා ඇඟිලි පහෙන්. වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර.** ඔය ධර්‍ම අතුරින් මනසිකාරය මහපටඇඟිල්ල හැටියට අරගෙන අපි පෙන්නුවා අර නඩුවක උපමාවක් අරගෙන. යම් කිසි නඩුවක සාක්කිකරුවන් නැත්නම් මොකක්ද කරන්නේ. විත්තිකාරයකුට සමාව දීලා කථාව අහගන්නවා. ඒ වගේ දෙයක් බුදුරජාණන් වහන්සේට කරන්න සිද්ධ වුණා. මොකද මේ සංසාර ගැටළුව විසඳන්න හරිම අමාරුයි - විඤ්ඤාණ මායාව නිසා.

ඒක නිසයි බුදුරජාණන් වහන්සේ විඤ්ඤාණ මායාවේ අනිත් පැත්තේ තියන නාමරූප ධර්‍මයන් අතුරින් මනසිකාරයට සමාව දීලා රජයේ සාක්ෂිකාරයා කරගත්තා. හැබැයි එයාට කිව්ව හරියට කථාව කියන්න ඕන. අයෝනිසෝ හැටියටයි මෙච්චර කාලයක් ක්‍රියා කළේ. අර අනිත් අයත් එකතු කරගෙන මේ සංසාර අපරාදෙ කළේ, අනන්ත කාලයක් මනුෂ්‍යයින්ට මැරෙන්න වෙන. දැන්වත් 'යෝනිසෝ' වෙන්න. එතන ඉඳල තමයි ආරම්භය. යෝනිසෝමනසිකාරය කරල ඉවර වෙන කොට මොකක්ද වෙන්නේ කියලා අපි පෙන්නල දීලා තියනවා.

යෝනිසෝමනසිකාරය නිසා තමයි පින්වතුනි වේදනාව, වේදනාව හැටියට දැනගන්නේ. සතිපට්ඨාන සූත්‍රයේ කායෙ කායානුපස්සී වෙදනාසු වෙදනානුපස්සී කියල කියන්නෙ මොකද කියල හිතන්න ඕන. සාක්කි දෙනකොට ඇත්ත කියන්න වෙනවා. **ඇත්ත කියන්න වෙනවා.** වේදනාව වේදනාව හැටියට, සඤ්ඤාව සඤ්ඤාව හැටියට, චේතනාව චේතනාව හැටියට. හැබැයි අන්තිමට හොරත් අහු වෙනවා. **ලොකුම හොරත් අහු වෙනවා. අර 'දෙයක්' පිළිබඳ කථාවෙන්. 'මනසිකාර සම්භවා සබ්බෙ ධම්මා'**[19] එතන තමයි ගැඹුරුම තැන. **මනසට 'දෙයක්' හම්බ වෙන්නේ මනසිකාරයෙන්.** එතකොට දැන් කිව්වනේ වේදනා සඤ්ඤා චේතනා ඵස්ස මනසිකාර කියන නාම ධර්ම අතුරෙන් මනසිකාර තමයි මහපටඇඟිල්ල. මහපටඇඟිල්ල අනික් ඇඟිලි හතරත් එකතු කරගෙන තමයි මේ වැඩේ ගෙනියන්නේ. එයා වඩාත් කිට්ටු ඵස්සයට. අපි ඇඟිලි හඳුන්වලා දීලා තියනවා. සුළැඟිල්ල මැදැඟිල්ල ඔය ආදී වශයෙන්. ඒවා ඇත්ත වශයෙන් බුද්ධ දේශනා නම් නොවෙයි. නමුත් උපමාවකින් තේරෙන්න පැහැදිලි කිරීම සඳහායි ඒක යොදාගත්තේ.

එතකොට හිතාගන්න අර යෝනිසෝමනසිකාරය අපි කා තුළත් තියනවා. ඒක අවදි කරගන්න. ඒක අවදි කරගත් අවස්ථාවට තමයි විපල්ලාස ධර්මයන්ගෙන් මිදීම කියල කියන්නේ. මෙතෙක් තිබුණ නිච්ච සඤ්ඤා, සුඛසඤ්ඤා, සුභසඤ්ඤා, අත්තසඤ්ඤා වෙනුවට අනිත්‍ය සඤ්ඤා, අසුභසඤ්ඤා, දුක්ඛසඤ්ඤා අනත්තසඤ්ඤා ඇති වෙනවා, බුදුරජාණන් වහන්සේ දීපු ඉඟි අනුව. ඒ තමන්ගේ මනසිකාරයේ වෙනස් වීමයි. එතකොට තිබෙන ලෝකය අර කියාපු ලෝක නොවෙයි. **මේක ලෝකය විනිවිද යන ධර්මයක්.** ක්‍රම ක්‍රමයෙන් කොන් දෙකක් හැටියට තිබුණු ඒ ඝන සංඥාව දිය වෙලා යනවා අනිච්චානුපස්සනාව තුළින්. ඒ දියවෙලා යනවත් එක්කම මොකක්ද වෙන්නේ? රාශි සඤ්ඤාව මතු වෙනවා. රාශියක් හැටියට පේන්න පටන්ගන්නවා. අන්න ඒක තුළ අනිත්‍යතාව වඩ වඩාත් ගැඹුරට වැටහෙනවා - ඇති වීම් නැති වීම් ප්‍රවාහය. ඒක අවසාන වෙන්නේ කලකිරීමකින්. **නිබ්බිදාව නිවනට දොර ඇරීමක්.** ඔන්න ඔහොම ධර්මතාවක් මේ තුළ තියෙන්නේ. මේව කටපාඩම් කරලවත්, සහතික පත්‍ර ලබාගැනීමෙන්වත් ගන්න පුළුවන් දේවල් නොවෙයි මේ මාර්ග ඵල ආදිය. මේකේ යෙදෙන්ට ඕන. අතීත සංසාරයේ මේවායේ ගැඹුරින් යෙදිච්ච අයට විතරයි අර බාහිය ආදීන් වගේ,

බුදුරජාණන් වහන්සේ බොහොම පොඩි ධර්මයක් 'දුටුවෙහි දුටුමතින් ආදිය' දේශනා කළේ. ඒක හැමෝටම හරියන්නෙ නැති  වෙන්න පුළුවන්. හෝඩියේ ඉඳල පටන්ගන්න ඕන. ඒ නිසා තමයි ශීල සමාධි ප්‍රඥා ඔක්කොම අවශ්‍ය වන්නේ. ඒවා ආශ්‍රයෙන් ක්‍රම ක්‍රමයෙන් යම් අවස්ථාවක අර කිව්ව වගේ '**යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධ ධම්මං**' අන්තිම හිඟන්නෙක් දුප්පතෙක් සුප්පබුද්ධ වගේ කුෂ්ඨ රෝගියෙක් වෙන්න පුළුවන්.[20] අතීත පිනක් ඇතිව ආවා නම් ඇති. බුදුරජාණන් වහන්සේගේ දේශනාව අහල ඉවර වෙන කොට අර කියාපු ධර්මතාව ඇතුළතින් ප්‍රත්‍යක්ෂ කරගන්නවා. අර කියාපු පඤ්ච උපාදානස්කන්ධ මුල් කොට ඇති දර්ශනය. අන්න ඒ දර්ශනයයි පටිච්ච සමුප්පාද ධර්මය.

උන්වහන්සේ වදාරල තියෙන්නේ[21] '**උප්පාදා වා තථාගතානං අනුප්පදාවා තථාගතානං ඨිතාව සා ධාතු ධම්මට්ඨිතතා ධම්මනියාමතා ඉදප්පච්චයතා**'. තථාගතයන් වහන්සේලා උපදනේ හෝ වේවා නූපදනේ හෝ වේවා, ඒ ධර්ම ධාතුව ඒ ධර්ම ස්වභාවය පවතිනව. ධර්මස්ථිතිය කියල දක්වනවා. මේ ඉදප්පච්චයතාව කියන ධර්මතාව තව දුරටත් වදාරණවා. '**තථතා අවිතථතා අනඤ්ඤථතා ඉදප්පච්චයතා**'-ඒ දෙක අතර ඇති සම්බන්ධතාව ගැන කියන්නෙ, එහි එසේ බව, නොඑසේ නොවන බව, අන් සේ නොවන බව, මේ නිසා මේ වන බව, අන්න ඒකයි පටිච්චසමුප්පාද ධර්මය. අන්න ඒ ධර්මතාව දුටු අවස්ථාවේදී අර අනිච්ච අනිච්ච කියාපු කෙනා ඇති වීම් නැති වීම් ප්‍රවාහය දකින්න පටන් ගන්නවා. ඔන්න ඔය විදියටයි මේ ධර්ම මාර්ගය.

මේ නිසා මේ දේශනා මාලාව කාටවත් විභාගවලට උපාධි ලබාගන්න උපකාර කරගන්න නොවෙයි. ඒවත් ලැබෙනවා නම් ලැබිච්චාවෙ.

නමුත් මේකෙ පරමාර්ථය සිතාගන්න, මේකෙ ප්‍රායෝගික පක්ෂය. මෙච්චර කාලයක් සිද්ධ වුනේ අපි කිව්ව වගේ කූඩයක් පාස් කෙරුවා. ඒකයි, අපේ ඒ ගුරුවරයා මෙහෙම කියල තියෙනවා. ඊට එහාට යන්න හොඳ නැහැ. අපේ අටුවාචාරීන් වහන්සේලා මෙහෙම කියල තියනවා. ඊට එහාට හිතන්න හොඳ නැහැ. මහා මෝහයක් තුළ විශාල කාලයක් මහා හොඳ මොළ රාශියක් - වටිනා මොළ රාශියක් ගිහි පැවිදි - මේ පරම ගම්භීර සූත්‍ර දේශනා වෙනුවට අර නානාවිධ දේවල් (මම මොනවද කියල

**කියන්නේ නැහැ) ඔස්සේ දිව්වා. නමුත් සත්‍යය තියෙන්නෙ මෙතනයි. ඒක පෙනෙන්නෙ නැහැ ලෝකයාට.** අපට ඒ නිවන දේශනාවලදිත් කියන්න සිද්ධ වුනා ශතවර්ෂ ගණනාවක් තිස්සේ වල් බිහි වී තිබුණු ධර්ම මාර්ගයක් හෙළි කළා කියලා. මේ අවස්ථාවේදිත් ඒක කියන්න සිද්ධ වෙනවා. මොකද අපි පෙන්නුවා නාමරූපයත් විඤ්ඤාණයත් අතර තියන සම්බන්ධතාව, අර කියාපු සමුදය නිරෝධය දෙකේම. **ලෝකයා ඉන්නේ සමුදය පක්ෂයේ නිරන්තරයෙන්ම.** අද රෑ වුනාට මොකද හෙට **උදෑසන එළි වෙනවනෙ.** අන්න ඒ වගේ සමුදය පක්ෂයේ හැම තිස්සෙම. සමුදය ගැන හිතනව මිසක් නිරෝධය ගැන හිතන්නවත් කැමති නැහැ. ඒ නිසා තමයි අපි නොයෙකුත් උපමා ආදියෙන් පෙන්නුම් කළේ. තණ්හා මැහුම්කාරියගේ උපමා ආදියෙන්. **තණ්හා මැහුම්කාරි අර කොන් දෙක ගැටලනවා. නමුත් යම් අවස්ථාවක මැද දුටු අවස්ථාවෙයි ඒ විමුක්තිය තියෙන්නෙ.** අපි ඒ කොන් දෙක ගැන කියූ නිසා තව ටිකක් ඒ ගැන කියමු. ඒ ගැන අපි කලින් කියල තියනවා. මහා පුදුම බුද්ධදේශනාවක්.

**යො උභන්තෙ විදිත්වාන**
**මජ්ඣෙ මන්තා න ලිප්පති**
**තං බ්‍රෑමි මහා පුරිසොති**
**සොධ සිබ්බනිමච්චගා**[22]

යමෙක් කොන් දෙක තේරුම් අරගෙන ප්‍රඥාවෙන් මැද නොඇලේද ඔහුට මම මහා පුරුෂයා යයි කියනවා. ඔහු මේ තණ්හාව ඉක්මවා ගියේ යයි කියනවා. විවරණ හයක් ඒ කාලෙ දුන්නා. කීපයක් කිව්වොත් සැප වේදනාව එක් කොනක්, දුක් වේදනාව අනික් කොන, නොදුක් නොසුව වේදනාව - කවුරුවත් ගණන්ගන්නෙ නැති එක තමයි මැද. ඊළඟට ඒ වගේ තව තියනවා ආධ්‍යාත්මික ආයතන හය එක කොනක්, බාහිර ආයතන හය අනික් කොන, මැද විඤ්ඤාණය. විඤ්ඤාණය කියන මායාව තුළින් තමයි අර කොන් දෙක වෙන් කරලා තියෙන්නේ.

ඊළඟට කියනවා **නාමය එක අන්තයක්, රූපය තව අන්තයක්. විඤ්ඤාණය මැදින් තියන බවක් දන්නේ නැතිව තමයි ඔය නාමරූප පවා භෞතික විද්‍යාඥයින් තෝරන හැටියටයි දූන් බොහෝදෙනා**

තෝරන්නෙ. අපි මේ මතු කර ටික - 'රූප' ආදිය තෝරන්නේ භෞතික විද්‍යාවේ වේශයක් අරගෙන. මෙතන තියෙන්නේ රූප සංඥාවක්. නාමධර්ම ආශ්‍රයෙනුයි රූපය හඳුනාගන්නේ. යම් කිසි විඤ්ඤාණයකට පදනම එතනයි. මේක අර විදියට විග්‍රහ කරල අල්ලගන්න බැහැ. පරමාණු වාදයකට හරවන්න බැහැ. මෙතන තියෙන එක දකින්න ඕන. දකින්නෙ කොහොමද? අර උපකරණවලින් නොවෙයි. අර කියාපු යෝනිසෝ - මනසිකාරයෙන්. ඒකට තමයි සීල සමාධි ආදිය අවශ්‍ය වෙන්නේ. ඔය ටිකයි මේ දේශනා තුළින් මතු කළේ.

ඒ නිසා මේ පින්වතුන් නිරන්තරයෙන් කල්පනා කරන්නට ඕන මේවා අපට කිට්ටු කරන්ට බැරි දේවල් නොවෙයි. පටිච්ච සමුප්පාදය කියන වචනයටත් බොහෝදෙනා කැමති නැහැ. තේරුම්ගන්න බැරි දෙයක් විසුද්ධි මාර්ගයේ කර්තෘටත්. අනේ අම්මේ බොහොම අමාරු තැනක් හැටියටයි මේකෙ විස්තර වෙන්නෙ. ඒ නිසා අපට කිට්ටු කරන්නවත් බැහැ. විසුද්ධි මාර්ගයේ කර්තෘතුමාටත් බැරි නම් අපි කොහොම කරන්නද? ඒක තමයි හැමෝගෙම ආකල්පය - නමුත් මේ සරල හැටියට හිතන වෝහාර දේශනා හැටියට සැලකෙන මේ දේශනා තුළ සත්‍යය තියනවා. මහානිදාන මහාපදාන ආදී සූත්‍ර තුළ ඔය කියාපු සේරම කාරණා තියනවා. ඒවා දකින්න ඕන-එච්චරයි අඩුව. වචන තුළ හිර වෙලා නොවෙයි. මේවා ඔක්කොම ලෝක වොහාර. මෙතනත් කියවෙනවා අධිවචන මාර්ග, නිරුක්ති මාර්ග, ඒක ගැන කියන්න තියනවා. හැම වටයක්ම කරකැවෙන්නේ ඒකට අදාළ අධිවචන කියල කියන්නේ භාෂාවේ කොටස් නිරුත්ති පඤ්ඤත්ති. හිතල බලන්න ක්‍රිකට් ලෝකය ගැන. ඒකට අදාළ අධිවචන මාර්ගයක්, නිරුක්ති මාර්ගයක්, තියනවනෙ. ඒක ඇතුළෙනෙ වින්දනය තියෙන්නෙ. 'ඉත්ථත්ත' කියන මේ භව තත්ත්වයක් හැදෙන්නෙ එතකොටයි. ඒ භව තත්ත්වය තුළයි උපදින්නේ, දිරන්නේ, මැරෙන්නේ, ඔක්කොම වෙන්නේ ඒ භව තත්ත්වය තුළයි. ඒක පිළිබඳවත් මහ පුදුම සූත්‍රයක් තියනවා.[23] ආයේ දිගට කියන්න බැහැ කෙටියෙන් සඳහන් කරනවා මිසක්. ඒවා අපි නිවන දේශනාවලත් කියලා තියනවා.

**'කායෙ වා භික්ඛවෙ සති කාය සඤ්චෙතනා හෙතු උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං වාචාය වා භික්ඛවෙ සති වචී සඤ්චෙතනා හෙතු උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං මනෙ වා භික්ඛවෙ සති මනො සඤ්චෙතනා හෙතු උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං අවිජ්ජා පච්චයාව'**

ඒකේ සාමාන්‍ය තේරුම, කයක් කියල ගත් කල්හි කය පිළිබඳ සංචේතනා නිසයි ඇතුළතින් සැප දුක් විඳින්නේ. වචනයක් තියනව කියල ගත් කල්හි වචී සංචේතනා තුළින්ද එසේමයි. මනසක් කියල එකක් තියනව කියල ගත්තහම මනෝ සංචේතනා තුළින් ද ඒ ආකාරයටමයි. **අන්තිමට කියනවා 'අවිජ්ජාපච්චයාව'** - **අවිද්‍යා ප්‍රත්‍යයෙන්. අවිජ්ජායත්වෙව අසෙස විරාග නිරොධා සො කායො න හොති, සා වාචා න හොති, සො මනො න හොති,** අවිද්‍යාව ඉවර වෙනකොට කය කියල ගන්න දේකුත් නැහැ. වචන කියල ගන්න දේකුත් නැහැ. මනස කියල ගන්න දේකුත් නැහැ. ඊළඟට වදාරනවා '**ඛෙත්තං තං න හොති, වත්ථුං තං න හොති, ආයතනං තං න හොති අධිකරණං තං න හොති. යම්පච්චයාසස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං.** එතකොට එයාට තිබුණු අරවට උපකාර වුණු කෙත නැහැ. ඒ වාස්තුව - ඉඩම - නැහැ. හේතුව නැහැ. ඒව නැති වුණා අර අවිද්‍යාව නැති වුණත් එක්කම ප්‍රතිෂ්ඨාවක් නැහැ ඒවට. ඔය ටික තමයි අපි නොයෙකුත් ආකාරයෙන් දක්වූවේ. නැවත නැවත කියන්න ඕන නැහැ. මේ පින්වතුන් ඒවා අවස්ථානුකූලව අහන්න ඕන.

දැන් ඉතින් මේ කොයි එකෙත් අවසානයක් තියෙනවා. හැබැයි ඒක මගේ දුර්වලකමක්ද දන්නෙ නැහැ. මේ දේශනා පෙළ පවත්වනකොට නිවන දේශනාවලදි වගේම **මම යම් සැකයක් ඇති කරගෙන හිටියේ මේ දෙසුම් පෙළ ඉවර වෙන්න කලින් සුසුම් පෙළ ඉවර වෙයිද කියල.** දැන් ඒකට ළඟයි. නමුත් මේ ජීවිතය රැකුණා. ඒ නිසා අද දින අපි විශේෂ පුණ්‍යානුමෝදනාවකින් - මේ දේශනාව අවසන් කරන්නයි බලාපොරොත්තු වන්නේ. එතකොට ශතවර්ෂ ගණනක් වල් බිහිවී තිබුණ මේ ධර්ම මාර්ගයක් හෙළි පෙහෙළි කිරීමට අප දැරූ ප්‍රයත්නයෙන් යම් තාක් කුසල සම්භාරයක් අත්පත් වුණා නම් ඒ සියල්ල අප හැදූ වැඩූ දෙමාපියන්ට, නුවණැස පෑදූ ගුරුවරුන්ට, මේ ශරීර කූඩුව පවත්වාගෙන යාමට උදව් වූ දායක කාරකාදීන්ට හැම දෙනාටම, අපි අනුමෝදන් කරනවා. අනුමෝදන් වේවා! එමෙන්ම අවීචියේ සිට අකනිටා දක්වා යම් තාක් සත්ත්ව කෙනෙක් මේ ධර්ම දේශනාමය - ධර්ම ශ්‍රවණමය කුසලය අනුමෝදන් වීමට කැමති නම් ඒ අනුමෝදන් වීම තුළින් ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහා නිවන සාක්ෂාත් කර ගනිත්වා කියන ප්‍රාර්ථනය ඇති කරගන්න ඕන. ඒ වගේම මේ දේශනා මාලාවට අපි ඒ ඒ

තැනින් සූත්‍ර දේශනාවලින් ගත්තා අවස්ථානුකූලව-නොයෙකුත් කොටස් අරගෙන තමයි මේ දේශනාමාලාව සකස් කළේ. ඒකයි අපට දැන් එකතු කරල කියන්න වෙන්නෙ. මේ සූත්‍ර දේශනා ගැඹුරු හැටියට ගත්තත් අපට කියන්න වෙන්නේ **පරම ගම්භීර සූත්‍ර දේශනා නමැති මල් ගොමුවෙන් නෙළාගත්තු සුදේශිත ධර්ම පද පුෂ්පයන් උපකාර කරගෙන ගෙතූ මේ දේශනා මල් දම තිලෝගුරු බුදුරජාණන් වහන්සේගෙන් පවා පිදුම් ලැබූ ධර්ම චෛත්‍ය රාජයාණන් වහන්සේට පූජා කරමි.**

**පූජා වේවා! පූජා වේවා! පූජා වේවා!**

එත්තාවතා ච අම්හෙහි - සම්භතං පුඤ්ඤසම්පදං
සබ්බෙ දෙවා අනුමොදන්තු - සබ්බ සම්පත්ති සිද්ධියා
සබ්බෙදෙවා අනුමොදිත්වා - බුජ්ඣන්තු අමතං පදං

ආකාසට්ඨාච භුම්මට්ඨා - දෙවා නාගා මහිද්ධිකා
පුඤ්ඤං තං අනුමොදිත්වා - චිරං රක්ඛන්තු සාසනං

ආකාසට්ඨාච භුම්මට්ඨා - දෙවා නාගා මහිද්ධිකා
පුඤ්ඤං තං අනුමොදිත්වා - චිරං රක්ඛන්තු දෙසනං

ආකාසට්ඨාච භුම්මට්ඨා - දෙවා නාගා මහිද්ධිකා
පුඤ්ඤං තං අනුමොදිත්වා - චිරං රක්ඛන්තු මං පරං

දුක්ඛප්පත්තා ච නිද්දුක්ඛා - භයප්පත්තා ච නිබ්භයා
සොකප්පත්තා ච නිසොකා - හොන්තු සබ්බෙපි පාණිනො

දුක්ඛප්පත්තා ච නිද්දුක්ඛා - භයප්පත්තා ච නිබ්භයා
සොකප්පත්තා ච නිසොකා - හොන්තු සබ්බෙපි පාණිනො

දුක්ඛප්පත්තා ච නිද්දුක්ඛා - භයප්පත්තා ච නිබ්භයා
සොකප්පත්තා ච නිසොකා - හොන්තු සබ්බෙපි පාණිනො

ඉමිනා පුඤ්ඤ කම්මෙන - මා මෙ බාල සමාගමො
සතං සමාගමො හොතු - යාව නිබ්බාන පත්තියා

ඉමිනා පුඤ්ඤ කම්මෙන - මා මෙ බාල සමාගමො
සතං සමාගමො හොතු - යාව නිබ්බාන පත්තියා

ඉමිනා පුඤ්ඤ කම්මෙන - මා මෙ බාල සමාගමො
සතං සමාගමො හොතු - යාව නිබ්බාන පත්තියා

## පාදක සටහන්

1. හෙමක සුත්ත, සුත්ත නිපාත, 334 පිට (බු.ජ.ත්‍රි. 25)
2. පඤ්ඤාභූමි නිද්දෙස, විසුද්ධිමග්ග, 436 පිට (හේ.මු.)
3. මහානිදාන සුත්ත, දීඝ නිකාය, 2-94 පිට (බු.ජ.ත්‍රි. 8)
4. නළකලාප සුත්ත, සංයුත්ත නිකාය, 2-180 පිට (බු.ජ.ත්‍රි. 14)
5. සතිපට්ඨාන සුත්ත, මජ්ඣිම නිකාය 1-136 පිට (බු.ජ.ත්‍රි. 10)
6. ද්වය සුත්ත, සංයුත්ත නිකාය, 4-146 පිට (බු.ජ.ත්‍රි. 16)
7. බාලපණ්ඩිත සුත්ත, සංයුත්ත නිකාය, 2-38 පිට (බු.ජ.ත්‍රි. 14)
8. මහාපුණ්ණම සුත්ත, මජ්ඣිම නිකාය, 3-118 (බු.ජ.ත්‍රි. 12)
9. පරික්ඛාරහාර විභඞ්ග, නෙත්තිප්පකරණය, 114 පිට (බු.ජ.ත්‍රි. 39)
10. සෙලා සුත්ත, සංයුතත නිකාය, 1-244 පිට (බු.ජ.ත්‍රි. 13)
11. තික පට්ඨාන මාතිකා, පට්ඨානප්පකරණය 1-1 (බු.ජ.ත්‍රි. 50)
12. පටිසම්භිදා මග්ග 1-96 පිට (බු.ජ.ත්‍රි. 35)
13. පච්චය සුත්ත, සංයුත්ත නිකාය, 2-40 පිට (බු.ජ.ත්‍රි. 14)
14. අචෙල කස්සප සුත්ත, සංයුත්ත නිකාය, 2-32 පිට (බු.ජ.ත්‍රි. 14)
15. කච්චාන ගොත්ත සුත්ත, සංයුත්ත නිකාය, 2-28 පිට (බු.ජ.ත්‍රි. 14)
16. ආණි සුත්ත, සංයුත්ත නිකාය, 2-42 පිට (බු.ජ.ත්‍රි. 14)
17. බාහිය සුත්ත - උදාන පාළි, ඛුද්දක නිකාය 1-142 පිට (බු.ජ.ත්‍රි. 14)
18. අරියපරියෙසන සුත්ත, මජ්ඣිම නිකාය, 1-408 පිට (බු.ජ.ත්‍රි. 10)
19. කිං මූලක සුත්ත, අංගුත්තර නිකාය, 5-344 පිට (බු.ජ.ත්‍රි. 22)
20. සුප්පබුද්ධ කුට්ඨි සුත්ත - උදාන පාළි, ඛුද්දක නිකාය 1-222 පිට (බු.ජ.ත්‍රි. 24)
21. පච්චය සුත්ත, සංයුත්ත නිකාය, 2-40 පිට (බු.ජ.ත්‍රි. 14)
22. මජ්ඣෙ සුත්ත, අංගුත්තර නිකාය, 4-186 පිට (බු.ජ.ත්‍රි. 21)
23. සඤ්චෙතනා සුත්ත - අංගුත්තර නිකාය 2-306 පිට (බු.ජ.ත්‍රි. 19)

# කතු හිමියන්ගේ සිංහල කෘති

සැ.යු.: මෙම කෘති ලේඛනය සරලත්වයට මුල් තැන දුන් අංක අනුපිළිවෙලක් සහිතව සකස්වී ඇති බවත්, ලේඛනයේ අගහරියේ එන කෘති බොහෝ දුරට ගැඹුරු විය හැකි බවත්, පාඨකයින් දැනුවත් කිරීම් වශයෙන් සඳහන් කරනු කැමැත්තෙමි.

- සම්පාදක

1. තිසරණ මහිම
2. හිතක මහිම – 1
3. හිතක මහිම – 2
4. හිතක මහිම – 3
5. දිවි කතරේ සැඳෑ අඳුර
6. කය අනුව ගිය සිහිය
7. හිත තැනීම
8. පින් රුකෙක මහිම
9. අබිනික්මන
10. පිළිවෙතින් පිළිවෙතට
11. කයේ කතාව
12. මා-පිය උවැටන
13. ප්‍රතිපත්ති පූජාව
14. පැවැත්ම හා නැවැත්ම
15. කර්ම චක්‍රයෙන් ධර්ම චක්‍රයට
16. මෙත් සිතේ විමුක්තිය
17. ඇති හැටි දැක්ම
18. තපෝ ගුණ මහිම
19. සක්මනේ නිවන
20. පහන් කණුව ධර්ම දේශනා – 1 වෙළුම
21. පහන් කණුව ධර්ම දේශනා – 2 වෙළුම
22. පහන් කණුව ධර්ම දේශනා – 3 වෙළුම
23. පහන් කණුව ධර්ම දේශනා – 4 වෙළුම
24. පහන් කණුව ධර්ම දේශනා – 5 වෙළුම
25. පහන් කණුව ධර්ම දේශනා – 6 වෙළුම
26. පහන් කණුව ධර්ම දේශනා – 7 වෙළුම
27. පහන් කණුව ධර්ම දේශනා – 8 වෙළුම
28. පහන් කණුව ධර්ම දේශනා – 9 වෙළුම

29. විදසුන් උපදෙස්
30. භාවනා මාර්ගය
31. උත්තරීතර හුදකලාව
32. සසුන් පිළිවෙත
33. චලන චිත්‍රය
34. දිය සුළිය
35. බුදු සමය පුද්ගලයා හා සමාජය
36. නිවනේ නිවීම – පළමු වෙළුම
37. නිවනේ නිවීම – දෙවන වෙළුම
38. නිවනේ නිවීම – තෙවන වෙළුම
39. නිවනේ නිවීම – සිවුවන වෙළුම
40. නිවනේ නිවීම – පස්වන වෙළුම
41. නිවනේ නිවීම – සයවන වෙළුම
42. නිවනේ නිවීම – සත්වන වෙළුම
43. නිවනේ නිවීම – අටවන වෙළුම
44. නිවනේ නිවීම – නවවන වෙළුම
45. නිවනේ නිවීම – දසවන වෙළුම
46. නිවනේ නිවීම – එකොළොස්වන වෙළුම
47. නිවනේ නිවීම – පුස්තකාල මුද්‍රණය (1-11 වෙළුම්)
48. පටිච්ච සමුප්පාද ධර්මය – 1 වෙළුම
49. පටිච්ච සමුප්පාද ධර්මය – 2 වෙළුම
50. පටිච්ච සමුප්පාද ධර්මය – 3 වෙළුම
51. පටිච්ච සමුප්පාද ධර්මය – 4 වෙළුම
52. පටිච්ච සමුප්පාද ධර්මය – පුස්තකාල මුද්‍රණය (1-4 වෙළුම්)
53. මනසේ මායාව
54. පැරණි බෞද්ධ චින්තාවේ සංකල්පය සහ යථාර්ථය
55. ස්පර්ශයේ ආශ්වර්යය

---

නැවත මුද්‍රණය කරවීම පිළිබඳ විමසීම්

කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන
කිරිල්ලවලවත්ත, දම්මුල්ල, කරඳන

දුරකථනය: 0777127454

knssb@seeingthroughthenet.net

# By The Same Author

1. Concept and Reality in Early Buddhist Thought
2. Saṁyutta Nikāya – An Anthology
3. Ideal Solitude
4. The Magic of the Mind
5. Towards Calm and Insight
6. From Topsy-turvydom to Wisdom, Volume I
7. From Topsy-turvydom to Wisdom, Volume II
8. Seeing Through
9. Towards A Better World
10. Nibbāna – The Mind Stilled, Volume I
11. Nibbāna – The Mind Stilled, Volume II
12. Nibbāna – The Mind Stilled, Volume III
13. Nibbāna – The Mind Stilled, Volume IV
14. Nibbāna – The Mind Stilled, Volume V
15. Nibbāna – The Mind Stilled, Volume VI
16. Nibbāna – The Mind Stilled, Volume VII
17. Nibbāna – The Mind Stilled, Library Edition
18. Nibbāna and The Fire Simile
19. A Majestic Tree of Merit
20. The End of the World in Buddhist Perspective
21. The Law of Dependent Arising, Volume I
22. The Law of Dependent Arising, Volume II
23. Walk to Nibbāna
24. Deliverance of the Heart through Universal Love
25. Questions and Answers on Dhamma
26. The Miracle of Contact
27. From The Wheel of Kamma To The Wheel of Dhamma

---

All enquiries should be addressed to:

Kaṭukurunde Ñāṇananda Sadaham Senasun Bhāraya
Kirillawala Watta, Dammulla, Karandana
Phone: 0777127454
knssb@seeingthroughthenet.net